පරමාර්ථප්‍රදීප

නම්

අභිධර්මාර්ථ සංග්‍රහ විස්තර භාවනාත්‍රය.

පරමාර්ථප්‍රදීප

නම්

අභිධම්මාවතාර සඞ්ගහ

විසතර භාවසන්නය.

මානව මාරඛ විභාරවාසි

දෙහිඔස්පේ පියදස්සි මහාසඨවිරපාදයන්

වහන්සේ හා

නැදිමාලේ විහාරවාසි

පැපිලියානේ සොමානන්ද සඨවිරයන්

වහන්සේ විසින් ද

ලෙඛක දෘෂ්‍යාපහරණයෙන් සකස්කරණලදී.

අත්තිඩියේ මාලිගාවත්තේ විහාරාධිපති

ආචාර්‍ය්‍ය ආභිධම්මික

වැබොඩ සඞ්ඝරතන මහාසඨවිරපාදයන්

වහන්සේ විසින්

සංශෝධිතයි.

ජී. ආර්ජ්. මුනසිංහ අප්පුහාමි විසින්

සමයවර්ධන යන්ත්‍රාලයෙහි

මුද්‍රාපිතයි.

බු: ව: 2473.

ක්‍රි: ව: 1931.

මහතුවර

උපෝෂිත පුෂ්පාරාම විහාරවංශාධිපති

පහමුණේ ධම්මකිත්ති

ශ්‍රී සරණංකර සුමංගලාභිධාන

මහාවිහාර වංශික

සද්ධාමෝපාලිමහානිකායේ මහානායක

මාහිමියන් වහන්සේ කෘ

බේරුවල සපුමහාඩ විහාරාධිපති

ශ්‍රී මහාවිහාරවංශාලංකාරානන්ද ධම්මවිනයාචාර්‍ය

බදුරලියේ ශ්‍රී ධීරානන්දාභිධාන

සද්ධාමෝපාලිවංශික ශ්‍රී කල්‍යාණී සාමග්‍රිධර්ම

මහාසංඝසභාවෙහි

මහානායක මාහිමියන් වහන්සේ විසින්ද

සමාදරයෙන් පිළිගන්නාලදී.

විඥාපනය.

නමොබුධාය.

ශ්‍රී සබ්බඤ්ඤුත්ඤාණාලංකාරාදි සබ්බගුණසම්පන්න බුදුරජාණන්වහන්සේ පැරැම්
බිම්හි මිට සාරාසංඛ්‍යකප්පයකින් මතු ලොව
නිදහස. පහළවූ දිවකුරු නම් බුදුන් දවස වෙදත්‍රයෙහි පාර
ප්‍රාප්තවූ සුමේධ නම් මහපඬි වැ සත්මුතුපරපු
රෙන් ආ සියලු ධනය දන් දී හිමව් පියසට වැද තවුස් වෙස්
ගෙණ පඤ්චාභිඥ-අෂ්ටසමාපත්ති ලාභීව අහසින් වඩිනුයේ දිව
කුරු බුදුන් රඹගම් නුවරට වඩනා බැවින් මහජනයා රැස් වැ ඒ
සඳහා මග සරසන බැවි දැනැ අහසින් බැසැ බිම්පෙදෙසක් ඉල්වා
මඩවගුරු සහිත පෙදෙසක් ලැබැ මග සකස් කරණුයේ ඒ තෙ
නිම්තාක් මහරහතුන් පිරිවරණ ලද බුදුන් වඩනා බව දැනැ මඩ
මත්තෙහි සම්පාඩ අතුරා සිය සිරැර හෙයක් කොටැ වතුරැවා
හුන්නේ සර්ව්‍වඥයන් වහන්සේ අනාගතංඥානයෙන් බලා
වදාරා බුද්ධාංකුරයෙක් බව දැනැ "මේ මහතා අනාගතයෙහි
ගෞතම නමින් බුදු වන්නේය"යි යනාදීන් නියත විවරණ ශ්‍රී
දෙවා වදාරා දැ සමන් අටමිටකින් පිදූ සේක. සදනනතර වැ
මහරහතුන් ප්‍රමුඛවූ දෙවිබඹුන් විසින් පුදන ලදුවැ බුදුන්වෙතැ
පැවිදිවැ අතව පත් නිවන් සැපත් හැර අසාර සත්‍යප්‍රජාව කෙ
රෙහි පතල මහකුලුණුනැණින් මෙහෙයන ලදුවැ සියලු බුදු
කුරු දම් පිරික්සා කොටැ සසරසයුරට වැද එතැන් පටන් ලෝ
පහළවූ කොඬඤ්ඤ 2. නම් බුදුන් සමයෙහි විජිතාවී නම් සක්
විනිරජවැද, සුමඛිල 3. බුදුන් කලැ සුරැවි බ්‍රාහ්මණවැද, සුමන
4. බුදුන් කලැ අතුල නාරද වැද, රෙවත 5. බුදුන් කලැ අති
දෙව බමුණුවැද, සොභිත 6. බුදුන් කලැ අජිත බමුණුවැද
අනවමදර්ශී 7. බුදුන් කලැ යක් සෙනෙවි රද වැද, පදුම 8.
බුදුන් කලැ අභිඥ ලාභී තවුසෙක් වැද, නාරද 9 බුදුන් කලැ
ජටිල තවුස් වැද, පියුමතුරා 10 බුදුන් කලැ ජටිල මහරැවි
වැද, සුමෙධ 11. බුදුන් කලැ උතුරු මෙණෙවි වැද, සුජාත
12. බුදුන් කලැ සක්විනිරජ වැද, පියදස්සි 13. බුදුන් කලැ
සසුප්මණෙවි වැද, අත්‍ථදස්සි 14. බුදුන් කලැ සුසීම තවුස්
වැද, ධම්මදස්සි 15 බුදුන් කලැ සක්දෙව්රජවැද, සිද්ධත්ථ 16
බුදුන් කලැ මඬගල නාපස වැද, තිස්ස 17 බුදුන් කලැ සුජාත
රාජර්ෂිවැද, පුස්ස 18. බුදුන් කලැ විජිතාවිරජ වැද, විපස්සි
19 බුදුන් කලැ අතුල නාරද වැද, සිඛී 20. බුදුන් කලැ අරිඳම

රජ වැද, වෙස්සභූ 21 බුදුන් කලැ සුදස්සන්රද වැද, කකුසඳ 22. බුදුන් කලැ ඛෙමරජ වැද, කොණාගමන 23. බුදුන් කලැ පඹිත රජ වැද, කස්සප් බුදුන් 24 කලැ දෙපල් මෙණෙවි වැද, ඉපිදූ ඒ නෙවිසි බුදුවරයන් විශෘයෙහිද මහදන් පැවැත්වීම් ආදියෙන් ප්‍රමාණාතික්‍රාන්ත පින්කම් කොටැ "තොප අනාගතයෙහි ගෞතම නමින් බුදු වන්නේහ"යි ඝනාදියෙන් මෙසේ සුවිසි නියත විවරණ ශ්‍රී ලැබැ ගණනපථාතික්‍රාන්තඅසංඛ්‍යකොටි සත සහස්‍රයෙහි පූරණලද සමතිස් පැරැමි මුදුන් පමුණුවා පඤ්චමහා පරිත්‍යාගයෙන් මේ මහපොළොව සතරවස්සහස්‍රාධිවයෙන්කම්පා කරවා වෙසකුරැ අත් බැවින් චුතවැ තුසි පුරයෙහි ඉපිදූ දස දහසක් සක්වළැ දෙවිබඹුන් විසින් බුදුබව විණිස සමාරාධිත වූයේ පස්මහබැලුම් බලා දෙව්ලොවින් සැවැ කිඹුල්වත්පුර සුද්ධොදුන් මහරජහු නිසා මහාමායාදේවියන් කුසැ පිළිසිඳගෙණැ දස එකඛමසක්හුගේ ඇවැමෙන් මව් කුසින් බිහිවැ අනුක්‍රමයෙන් වැඩී යොවුන්විය පැමිණැ සතළිස් දහසක් දෙවඟනන් වැනි වරඟනන් පිරිවර කොට ඇති සෙසාඛරා දේවියන් හා සරණබැඳි නයට පැමිණැ රජසිරි අනුභව කරණුයේ උද්‍යානක්‍රීඩානමනසම යෙහි කෙමෙන් තුන් පෙර නිමිති දැනැ සඤ්ජාත සංවේග ඇත්තේ පෙරළා අවුත් පැවිදිරැව දැකැ පැවිද්ද මැනවැ ඝන සිත උපදවා උයනට ගොස් එහි දහවල් දවස ගතකොටැ මහුල් පොකුණු ඉවරෙහි හුන්නේ මහුල් කපුවෙස් ගෙණැ ආ විස්කම් දෙව් පිෑ විසින් සරඝන ලද්දේ රහල් කුමරැ උපන් ගසුන් අසා පුත් සෙනෙහෙ බලවත් බව දැනැ මෙඝ වැඩෙන්ට මත්තෙන් සිදිමහසි සිතා සවස නුවරට එනුයේ කිඹාගොපාමි විසින් අස්වක ලද නිබ්බුතපදඝ ඇත්තේ ලක්ෂයක් අඟනා මුත්හර ගෙළන් ගළවා ඇට සතුටු පඹුරැ කොටැ යවා තමාගේ භවනයට වැදූ සිරියහන් මතැ වැද හොත්තේ මැදුම් රැයැ නිදි ගත් නළඟනන්ගේ විකාර දැකැ කළකිරැණු සිත් ඇත්තේ ඡන්න නම් ඇමතියන් බණවා කන්ඨක නම් අසු ඵලවා ඒ අසුපිට පැන නැඟී ජනනෂත් සහාය කොටැ ගෙණැ දඹුවැට පහන් ගත් දසදහස්ලෝදුවැසි දෙවියන් පිරිවරා දෙවියන් විසින් ම හරණලද මහදෙරින් මහබිනික්මන් නොවැ අනෝමා නම් ගඟින් එතරවැ මහුල්කඩුවෙන් හිසකේ වැටිය කපා අහසට දමා හන්පළඟ් වසන්නාභරණ පොදියක් කොටැ අසුන් සමඟ සන්තට පාවාදී නුවරට යවා මහබඹු විසින් පිළිගන්වන ලද අවපිරිකර පිළිගෙණැ පැවිදිවැ අනුක්‍රමයෙන් රජගහනුවරට වැඩැ පිඬු සිහා පාණ්ඩව පර්වතප්‍රාග්භාරයෙහි වැඩහුන්නේ

බිම්සර මහරජු විසින් රාජ්‍යයෙන් නිමන්ත්‍රණය කරණු ලබ නුයේ ඒ පිළිකෙව් කොටැ බුදුවැ පළමුවැ ඔහුගේ විජිතයට වඩනා පිණිස දෙනලද ප්‍රතිඥා ඇතිවැ සැවුරැද්දක් මහා ප්‍රධන්වියයිය කොටැ වෙසක් මස පුණුපොහෝ දවස්හි උදැ සනම් සුජාතා නම් සිටුදියණියන් විසින් පිළිගන්වන ලද ක්ෂීර පායාසය වළඳා නෙරඤ්ජරා ගඟාවෙහි උඩුකං බලා රන්තලිය යවා එම ගංතෙර මහවනලැහැබෙහි දුවල් දවස ගෙවා සවස බෝධිය නම් බමුණහු විසින් පිළිගන්වන ලද කුසතණ පිළි ගෙණැ බෝමැඩව වැඩැ එය අතුටැ පැන නැංගාවූ තුදුස්රියන් විදුරසුන් අරා චතුරාඛවිය්‍යාධිඥානයෙන් පළඟ බැඳැ වැඩහිඳැ හිරුඅස්තයට යන්ට මත්තෙන් මරසෙන් පිරිවැරැ දෙවපුත්‍ර මාරබල විද්ධංවනය කොටැ පෙරයම් පූජේනිවාසානුස්සතිඥානය, මැදුම්යම් ව්‍යුතූපපාතඥානය, ලැබැ පශ්චිමයාමය සානයෙහි දශබලඤාණතේජෝභාරද්‍යඥානාදී සකල බුද්ධගුණප්‍රති මණ්ඩිත සර්ව්ඥතාඥානය පිළිවිදීමෙන්ම අබිඳුම්නය සුරව බැස ගත් සේක.

තදනන්තරවැ ඒ පළඟින් නොනැගී එකැනින් ම විසින් මේ පළඟ හිඳැ සවිනේ ගෙවා දනිමි. එයින් කෘතඥවිය යුතුයි සිතා වදුරා සමවත් සමවදිමින් සතියක් එහිම වැඩසිටිසේක.

තදනන්තරවැ "අදත් භිඳුහන්කුවරුන්ගේ කිස එකැ කින් නොනිමිය-පළඟෙහි ආලය මේතාක් නොහළේවනැයි" දෙවඟවන්ට උපන් විසකීය දූනවදුරා ඔවුන්ගේ කාංක්ෂා විනෝ දනය පිණිස අහසට නැඟී යමාමහපෙළහර දක්වා එයින් බැසැ අනිමිසලොවනයෙන් බෝදුමිදුන් දෙස බලා සතියක් වැඩසිටි සේක.

නැවත පළඟට හා සිටි තැනටද අතරැ රුවන්සක්ම— ණක් මවා එහි සතියක් සක්මන් කළසේක.

සිව්වන සතියෙහි වඩඹදිගැ දෙවනිර්මිත රුවන්ගෙහි වැඩහිඳැ ධම්මසම්මශීනය කළසේක.

එහි වැඩහිඳැ වීජම්පෙළ සම්මශීනය කරණසේක් යම් කලෙකැ අභිධම්මසම්මශීනයෙන් බුදුරැස් නික්මිම.

මහාප්‍රකරණයට බැසැ සුවිසි ප්‍රත්‍යය යෙන් සමන්විතවූ අනන්තනයසමන්ත පට්ඨාන මහාප්‍රකරණය සම්මශීනය කරත් කරත් තථාගතයන්වහන්සේගේ ශ්‍රී ශරීරයෙන් සවණක් ඝන බුදුරැස් නික්මෙන්නට වන්හ.

එයෙත් අටින් පස්පොළොව ජලපොළොව වා පොළොව විනිවිදූ අජටාකාසය දක්වා වන්හ. උඩින් නෙවසඤ්ඤානාස-

සුසුදුයතනයෙන් පැණ ගොස් අජවාභාශයට වන්හ. වටින් අනන්නා ධර්මාණ ලෝකධාතූන්දුයි මෙසේ දහදිගුන් එකළු කොවැ බැබලූහ.

මේ බුඩරශ්මීන්ගේ පැතිරීමට කාරණා කවර ඇත්? සූක්ෂම නිපුණවූ අභිධම්පිටකය සම්මශීනය කරණ සමීඥයන් වහන්සේගේ සොමඤසමය සුඛණය කරණකොටගෙණ හෘදයවසතු-ලොහිතය ප්‍රසන්නවිය. ප්‍රණීත චිත්තජ රූපයන්ගේ පැතිරයා මෙන් ඡවිවණීය ප්‍රසන්නාවූයේය. ඒ හෙතුවෙන් චිත්තපවවය උතුසමුට්ඨාන දණීාගතනය හාත්පසින් අසූරියන් පමණ පෙදෙසැ නිඇලවැ සිටියේය.

තථාගතයන් වහන්සේ බුදුවූ සත්වෙනි දිසැ තිසීකමථනය පිණිස ගණඩනම් අඹරුකමුල යමාමහපෙළ

දෙව්ලොව අභිධම්දේශනාව

හර පා තුන්පියවරින් නවිතිසා වැඩැ සක් දෙව්රජහුගේ පඬුඅඹිල්සලස්තෙහි වැඩ හිඳැ දසදහසක් සක්වළින් රැස්වූ දෙව් බඹුන් මැද මායාදිවතරාජසා ප්‍රමුඛ කොවැ තෙමසක් මුරැනට අභිදම් දෙසී

ධම්දේශනා කරණ භාග්‍යවත් තෙමේ උතුරැ කුරැදිවසිනට වැඩැ පිඬු සිහා අනවතප්පාවිල සම්පයෙහි වළඳ

මිනිස් ලොව අභිදම් දෙසීම.

දිවාවිහාරය පිණිස සඳුන් වනතට වඩනේය. දම්සෙනෙවැරියුන් මහතෙරුන් වහන්සේ එහි වැඩැ තථාගතයන් වහන්සේට වත් සපයා වැඩසිටි කල්හි ශාරිපුත්‍රය! අද මා විසින් මෙපමණ ධම් යක් දෙවියන්ට දෙශිනයයි වදුරා නවිතිසා භවනයට වඩනේය.

සැරියුන් මහතෙරුන් වහන්සේ උහත් උහත් ධම්ය තමන් වහන්සේගේ අනවැසි පන්සියයක් හිඤුන්ට දෙශනා කළසේක.

මෙසේ අභිධම්ය සැරියුත් මහතෙරුන් වහන්සේගේ පවත් ශිෂ්‍යානු ශිෂ්‍යසන්විරපරම්පරාවෙන් විාවොදුනවම උපාලිය දසබලය සොණකය සිගගවය මොගගලිපුත්තතිස්සය යනාදී මහ රහන්පරපුර දක්වා, ත්‍රිවිධ සඞ්ගායනාරූඪව සුපරිසුබවැ දඹදිවැ පැවැත්තේය.

තවද බුදුන් පිරිනිවී දෙසිය්‍යකින් වනවසැ ලක්දිවැ රජ පැමිණි දේවනපැනිස් මහරජු දවසැ

දඹදිවින් ලක්දිවට අභිධම්ය උදුවීම

සිරිලකැ බුදුසසුන් පිහිටුවා වදාල දම් සෝ මහරජාණන්පිත් මහම්හිදු මහ රහන්වහන්සේගේපවත් ඉටිය මහා

සට්ඨිරුදී* තෙරපරපුරෙන් මුඛපාලි වශයෙන් ලක්දිව්ෑ පැවත ආ ත්‍රිපිටකධම්ය සිරිලකා රජ පැමිණි වලගම් අබා මහරජු දවසැ එක්තරා ජනපදාධිපතියෙකුගේ ආරක්ෂාවෙන් පන් සියයක් මහරහතුන් වහන්සේ මාතුල දනව්වෙහි අළුලෙණැ වැඩහිඳැ සඛ්‍යායනා කොටැ පුස්තකාරුළ කරවී.

ලක්දිව්ෑ මහාමහිඳු සට්ඨිරයන් වහන්සේ ආදී මහරහතුන් විසින් ප්‍රතිෂ්ඨාපිත මහාවිහාරාධිෂ්ඨානගත ලඞ්කාද්වීපදක්ෂිණ ජම්බුද්වීපවාසී මහාසට්ඨිරපරම්පරාව විසින් මෙසේ නොයෙක් අභිධම්මීඅට්ඨකථා පිටානුපිටිකා ප්‍රකරණ ග්‍රන්ථිපද අට්ඨ ව්‍යාඛ්‍යානා දිය උපදවා මේ අභිධම්මපිටකය ගෙණෙන ලදැයි දතයුතු.

මෙසේ ලක්දිව්ෑ ඇදුරැ පරපුරෙන් පැවත ආ වාචනාමාර්ගී සහිත අභිධම්මපිටකය ඇතුළු පඨ්‍යාපත්ති-ප්‍රතිපත්ති ශාසනවය ලක්දිවින් දඹදිවට නැවත සංක්‍රමණය කළ පරිදි සැකෙවින් මතු දක්වමි:—

බුරුමරට අරිමද්දන නුවර උත්තරාජීව මහතෙරුන් වහන්සේ බොහෝ භික්ෂූන් හා ජපදසාමණේරයන්

ලක්දිවින් දඹදිවට අභිධම්ය නෙණෙයාම.

ද කැටුව මෛත්‍රීය වඳිනු පිණිස ලක්දිව් බැසැ වන්දනාදී කිස නිමවා සිහරව වැඳිනු වෝ ජයවර්ධනපුර ශ්‍රී සඞ්ඝබෝධි විජය බාහු පරිවේණාධිපති ඡඩභාෂාපරමේශ්වර තොටගමුවේ ශ්‍රී රාහුලසංඝරාජ මාහිම්පාණන් වහන්සේට අත වැසි ජපද හෙරණුන් හා රටකොටැ බුරුමරට වැඩියෝය.

ඉක්බිති ජපදසාමණේරයන් වහන්සේ විජයබාහිරැවන්හි වැසැ ත්‍රිපිටකධර තොටගමුවේ ශ්‍රී රාහුලඝඞ්කරාජ මාහිම්පාණන් වෙතින් අටුවා ටීකා සහිත පිටකත්‍රය හා සිහළු ථේරවාදයන් මොනවට ඉගෙණැ තත්කාලශාසනානුසාරක ත්‍රිපිටකධර විද්‍යාගම මෙමෙන්ෙය මහාසට්ඨිරයන් වහන්සේ ද ඇසුරැ කොටැ ව්‍යාකරණබහුශ්‍රැත වූයේ කල්‍යාණිනදී උදකුක්ඛේපසීමාවෙහි උපසම්පදාව ලැබැ දසවස් පිරුණේ ථේරසම්මුතියෙන් ''සඞ්ඝම්මවර ජෝතිපාල'' යන උපාධිය ලැබැ "සඞ්ඛ්‍යපවණ්ණනා" නම් අභි

---

* ඉට්ටිය උත්තිය සම්බල භද්‍රසාල අරිට්ඨ තිස්ස ඤාත කාල සුමන දීඝනාම දීඝසුමන ii කාලසුමන මහානාග බුද්ධරක්ඛිත තිස්ස දෙව සුමන චුල්ලනාග ධම්මපාලිත ඛේම උපත්තිස්ස ථූස්සදෙව ii සුමන පුපඵනාම මහාසීව ii උපාලි ii මහානාග අභය ii තිස්ස ii ථූස්සනාම චුල්ලාභය iii තිස්ස චුල්ලදෙව සීවසට්ඨිර.

ධම්මසඞ්ගහ ටීකාව රචනා කොටැ දුන් කතෘත්වයට පැමිණ අරිමද්දන නගරයට පෙරළා යනු කැමති‍ව තාවලිත්තපවුනෑ ඉපිදූ ලක්දිවැ මහාවිහාරයෙහි වැඩුනු සිවලී තෙරුන්ද, කාසුවී පුරික ආනන්ද තෙරුන්ද, සීහලික රාහුල තෙරුන්ද යන මේ ත්‍රිපිටකධර සිව් මහතෙරුන් සමඟ නාවිකයා ක්‍රමයෙන් අරිමද්දන නුවරට සම්ප්‍රාප්ත වූවෝය.

මෙසේ ඡපදවාසීන් ත්‍රිපිටකධර මහතෙරුන් පස්දෙනා වහන්සේ විසින් ලක්දිවැ පැවති මහිඳුවංශාගතත්‍රිපිටකවාචනා මාර්ගය හා පාලිඅට්ඨකථා-ටීකානුටීකා-ප්‍රකරණාදිය දඹදිවට ගෙණගිය නියා දනයුතු.

තවද බුදුවසින් දෙදහස් එක්සිය පන්තිස් වැන්නෙන් යට පිතෘ ඝාතක ශිනාඩ්කරාජසිංහ රජුගේ ශාසන ලක්දිවැ නාඝට්ප්‍රදේශ විලොපයෙන් ලක්දිවැ දුලබ වූ අභිධම්මය අභිධම්මය දඹදිවින් සුලබ කරණු පිණිස ඇම. ධම්මරත්න පඬි ගෙනවුන් තුමාගෙන් බුරුම රට ගොස් අට්ඨකථා-ටීකා ව්‍යාප්තකිරීම ඝණ්ඨ අභිධම්මපිටකය ඇදුරු පරපුරෙන් මොනවට ඉගෙන් ව්‍යකත බහුශ්‍රැත වූයේ "බුද්ධශාසන මහාසුරසෙනාපති" යන රාජදත්තඋපාධිධාරීව ලක්දිවි බැසැ බොහෝ ගිහි පැවිදි ශිෂ්‍යවරයන් ඇතිකරමින් පරමාර්ථ ධම්මයාගේ සංවර්ධනය කරණුවෝ "මූලමහාශාමය" මෙම අභිධම්මත්ථසංග්‍රහශාස්ත්‍රවර්ණනාව හෙළදිව්බසට පෙරළා අඛ්‍යාපනය කරවමින් විශුද්ධිමාර්ග සන්නය, පරමාර්ථසුධානිධිය, බුද්ධාගම, ප්‍රතීත්‍යසමුත්පාද විභාගය, සත්තවාත්පත්ති විනිශ්චය ප්‍රතිසන්ධිදීපනිය, අභිධම්මත්ථසංග්‍රහප්‍රකාශනාත්තරය, ඝනපරිච්ඡේදය, සීලපරිච්ඡේදය, භාවනාපරිච්ඡේදය ආදී ග්‍රන්ථනිර්මාණයන් හා ශෝධනයෙන් ද බොහෝ ශාසනසංග්‍රහ කළෝ.

අබ්දම් සයුරෙන් එතර වන්නවුන්ට කුඩා සවණේ නෙතකාවක් වැනි අනුරුද්ධ මහාඅට්ඨ ප්‍රණීත අභි පරමාර්ථප්‍රදීප සම ධම්මත්ථසංග්‍රහයෙහි පරිවාර ග්‍රන්ථ රත්නයක් අභිධම්මත්ථ සංග්‍රහ වූ මෙය වනාහි භාවාත්ථව්‍යාඛ්‍යානයිනියෙන් විභාවනර සම්පාදිත වුවත් සංක්ෂිප්තපදත්ථව්‍යාඛ්‍යානය භාවසන්නය. කින් හා සප්පප්‍රකරණාගත පාලිඅට්ඨකථා ටීකා නයින් සමුපලක්ෂිත බැවින් මෙය

පරිශීලනයෙහි නියැලියන්ට සාකල්‍යයෙන් ම අවිකලවූ චතුරතර පරමාර්ථධම්මඥානාලෝකයක් උදාවීමෙහි ප්‍රදීපායමාන වෙයි.

ඝනවර්ෂයක් ප්‍රමාණයෙන් පැරණිවූ මේ ග්‍රන්ථරත්නය කවිර කලෙක කිනම් ආචාර්යවරයෙක් විසින්

ග්‍රන්ථ කර්තෘ හා ග්‍රන්ථනදූයි අවිනීශ්චිත කි. එහෙත් ශ්‍රී නිමිංණ කාලය. බුඩ වර්ෂ දෙදහස් දෙසියඅටකින් මොබ යටකී තෙවළා දත් ගත්කරු මහතෙරුන් මෙන් ම සවඝමඝඝමයාත්තරයන්හි විශාරද බුඩිමත් සම්භාව්‍ය තර පඩිරුවනක් බැව් ග්‍රන්ථවිෂයෙහි නිර්දිෂට ගභීරසාරධර්මාථ යන්හෙන් හා උපමාහෙතොදාහරණාදියෙන් මොනවට හැඟේ.

පණ්ඩිතාවාර්ය්‍ය ඇම්. ධම්මරත්න ලක්මිණිපහන් කතුතුමාණන් ගේ අධ්‍යාපනාවසරයෙහි දී ලිඛිත පිටපත් කිපයක් සවලප දෙනෙක් අතරැ ගුප්තව තිබී මෙන මහජනයාගේ ධර්මාවබෝධයට බාධා බැවින්මෙය මුද්‍රණයෙන් ප්‍රකට කරණු සඳහා සංශෝධනය කළ නොත්මැනවැයි බොහෝ ගිහි පැවිදි හවතුන් විසින් සම්මාදිතවූ අපි විරාගත ලෙඛකාදින් දුශ්‍ය දෙශාපහරණයෙන් හුදු ශාසනා ලය පෝදූරිව සංශොධනය කෙළෙමු.

පිරිසිදීම් කවයකින් පරිමිත වූ මෙහි 1-චැත්තෙන් චිත්තානුත්පාද ක්‍රමය ද, 2-චෛතසිකොත්පාද ක්‍රමය ද, 3-චිත්ත චෛතසිකයන්ගේ මෙ වේදනාදී භෙදනිත්‍ය වූ මිශ්‍රක ක්‍රමය ද, 4-පස්දෙර හා මුනිදෙර පැවති චිත්තවීථික්‍රමය ද; 5-භූමි-ප්‍රතිසන්ධි-කම්-මරණ යන සිව්වතුෂ්කයන්ගේ විභජනය ද, 6-රූපය හා නිමිංණයාගේ විභාගය ද, 7-චිත්ත-චෛතසික-නිෂ්පන්නරූප-නිමිංණ වශයෙන් දෙසැත්තෑවක් ප්‍රභෙද වූ සවභාව ධර්මයන්ගේ අකුශල-මිශ්‍රක-බොධිපාක්ෂික-සීඝසංග්‍රහ යන සිව් පරිදිදකින් බෙදීම ද, 8-ප්‍රත්‍යය-ප්‍රත්‍යයොත්පන්න නාමරූප ධර්මයන්ගේ ප්‍රතීත්‍යසමුත්පාද න්‍යාය-ප්‍රස්ථාන න්‍යාය වශයෙන් ප්‍රත්‍යයාකාරය දැක්වීම් ද, 9-සම්ථවිදර්ශනානුකර්ෂස්ථාන භාවනා වන්ගේ විභජනය ද, ප්‍රකාශ වේ.

තවද මෙම ව්‍යාඛ්‍යානය සම්බන්ධයෙන් ආශ්‍රිතවූ ග්‍රන්ථයෝ තම්:-

ආශ්‍රිත ග්‍රන්ථ. ධම්සඛණී ප්‍රකරණය, 2-විභඞ්ග ප්‍රකරණය 3-මධ්‍යම නිකාය, 4-යමකප්‍රකරණය, 5-විභාවිනිය, 6-අභිධර්මාවතාරය, 7-සුවිත්තාලඞ්කාරය, 8-දීඝනිකාය, 9-ප්‍රතිසම්භිදාව, 10-නිර්දේශය, 11-අර්ථසාලිනිය, 12-විශුඞ්ධිමාර්ගය, 13-සත්‍යසංක්ෂේපය, 14-නාමරූපපරිච්ඡේදය, 15-සංක්ෂේපවර්ණනාව, 16-මූලටීකාව, 17-මණිසාරමංජූසාව, 18-අභිධර්මාවතාරනිය, 19-අභිධර්මඅනුටීකාව, 20-ප්‍රස්ථානප්‍රකරණය, 21-විශුඞ්ධිමාර්ගටීකාව, 22-පරමාර්ථවිනිශ්චය, 23-ධාතුකථා ප්‍රකරණය, 24-සමන්තපාසාදිකාව යනාදීනු වේත්.

ලිඛිල් බසින් රචිතවූ මෙය සම්බුද්ධත්‍වාගමනයෙන් සාමාන්‍යයෙන් පර මාර්ථධර්මාභිලාෂී සකල බෞද්ධ මහජනයාට සවස ප්‍රයෝජනය. මග විෂයෙහි පවත්නා තත්ත්වඥානාභිවර්ධිය පිණිසද, විශේෂයෙන් ධර්මකථිකයන්වහන්සේලාට සතරපරමාර්ථ ධර්මයෙහි මනාපටුත්වයක් ඇතිකර ගැනීමට හා ඇප්පනප්‍රකරණය පිළිබඳ ප්‍රාමාණික දැනීමකටත් ආභිධර්මික සම්මුතියට බැසගැනීමටත් අතිශයොපකාර බැව් අතිශයෝක්තියක් නොවේ.

මේ සද්ව්‍යාපාරයෙහි ලා බෙල්ලන්විල ශ්‍රී මහාබෝධි සම්පවිහාරාධිපතිව වැඩවසූ ශ්‍රී කල්‍යාණසිරිමහා ආචාර්‍යාභිවන්දනය. ධර්ම මහාසඞ්ඝසභාවෙහි ගණාචාර්‍යත්වූ අග්ගමහාපණ්ඩිත ශෞරවනීය **උඩුගම්පල ධම්මක්ඛන්ධාභිධාන** මාහිමියන් වහන්සේද, රත්මලානෙහි පරම ධර්මාවේනික පරිවේණාධිපතිව වැඩවසූ ආචාර්‍ය ශෞරවනීය **වලාංගේ ශ්‍රී ධම්මානන්දාභිධාන** නායක මාහිමියන් වහන්සේද බුද්ධ ශාසනමහාසූර සෙනාපති ආභිධර්මිකාචාර්‍ය පණ්ඩිතශිරෝමණි ඇමි. ධම්මරතන ලක්මිණි පහන් කතු තුමානන්ද, පුණ්‍යානුමෝදනා පූජාකෘ අනුග්‍රහණය කෙරෙමින් කෘතඥ වෙමු.

අපගේ මේ කෘතිය සම්බන්ධයෙන් **නාදිමාළේ විහාරාධිපති ගරු නාවල බෙමානන්ද මහාසංඝරත්නයන් වහන්සේගෙන්** තදධීන කෘත්‍යසම්පාදන-සංවිධානාදී බොහෝ ආධාර ලැබුනුබවත් කෘතඥතා පූජාකෘ සිඟිපත් කරමු.

කාලානන්තරයක් නිසරුවූ මසුරුපටලයෙන් වැසී තුබූ ඒ මේඝ්‍රන්ථය පරමාර්ථ ධර්මාභිලාෂී ගිහි පැවිදි සියල්ලන්ගේ **ඉෂ්ටාශංසනය.** චිත්තාරාධනය කෙරෙමින් නොමසුරුවූ භාවිත ඵට හාජනව ලෝඝසුන් චිරකාලක් වැඩිමෙහි සමත් වේවා යනු අපගේ ඉෂ්ටාශංසනයයි.

අසමත්තුගේ මේ ශෝධනය සර්ථතොභද්‍රයයි අපි නොකියමු. කෘතීන් පිළිබඳ සර්ථතොභද්‍රභාවය බුදුවරයන්වම ආවේණිකවූවකි සියලු පුහුදුන් වරදිනසුල්ලන් බැව් තත්ත්වඥයන්ගේ නිගමනයයි. ඉදින් මෙහි අපගේ ප්‍රමාදදියෙන් ජනිත අශුද්ධ සංඝනයක් දුටහොත් ලෝඝසුන් වැඩ කැමති සුධිනු සමාධිව අප වෙත දන්වත්වා. එය මතු මුද්‍රණවාරයේදී ඇතුලත් කරන්නෙමු.

වැබොඩ සඞ්ඝරතන සථවිර.

W. Sangaratana.

ශ්‍රී බුද්ධ වර්ෂ දෙදහස්සාරසිය සතළෙන්කෑ
වැන්නෙහි දුරුතුමස පුරපසළොස්වක්
ලත් සඳුදින අත්තිඩියේ මාලිගාවත්තේ
විහාරස්ථානයේදීය.

සූචි පත්‍රය.

(1) වෙනි පරිච්ඡේදය.

		පිට
ප්‍රාරම්භ ගාථා	වර්ණනා	1
උද්දේස ගාථා	,,	5
අකුශල චිත්ත	,,	12
අහෙතුක චිත්ත	,,	22
කාමාවචර කුශල චිත්ත	,,	34
රූපාවචර චිත්ත	,,	41
අරූපාවචර චිත්ත	,,	53
අෂ්ටඅභිභ්වායතන	,,	64
අෂ්ටවිමෝක්ෂ	,,	71
ලෝකොත්තර චිත්ත	,,	78
ශුෂ්කවිදර්ශීක පුද්ගල	,,	91
සමථයානික පුද්ගල	,,	94

(2) වෙනි පරිච්ඡේදය.

සචිත්ත සාධාරණ චෛතසික	වර්ණනා		100
ප්‍රකීර්ණක	,,	,,	110
අකුශල	,,	,,	119
ශොභණ සාධාරණ	,,	,,	126
විරති	,,	,,	134
අප්‍රමාණ්‍ය	,,	,,	142
ප්‍රඥා	,,	,,	144
චිත්ත චෛතසිකයන්ගේ සම්ප්‍රයෝග ක්‍රමය			149
අකුශල විපාකාත්පත්ති		,,	157
අහෙතුක චිත්ත විභාගය			163
අඞ්ගපංගුන්‍යාය			166
කාමාවචර කුශල විපාක ක්‍රියා විභාගය			168
රූපාවචර කුශල		,,	175
අරූපාවචර		,,	182
ලෝකොත්තර චිත්ත		,,	185
ලෞකික ලෝකොත්තරවිරතීන්ගේ වෙනස			207
අප්‍රමාණ්‍ය චෛතසිකයන්හි මත භෙද			210
මහද්ගත චිත්තයෙහි සඞ්ග්‍රහනය			212
මහාකුශල	,,		221
කාමාවචර ක්‍රියා	,,		,,
කාමාවචර මහාවිපාක	,,		,,
අකුශල	,,		223
අහෙතුක ක්‍රියා විපාක	,,		,,

(3) වෙනි පරිච්ඡේදය.

		පිට
වේදනා සඞ්ග්‍රහ විභාගය		226
හේතු ,,	,,	230
කෘත්‍ය ,,	,,	237
වාර ,,	,,	242
ආරම්මණ ,,	,,	248
වස්තු ,,	,,	256

(4) වෙනි පරිච්ඡේදය.

පවත්තාරමෙහි චිත්ත ප්‍රවෘත්ති ක්‍රමය	263
පරිත්තජවනවාරය	275
මනොවාරමෙහි චිත්ත ප්‍රවෘත්ති ක්‍රමය	279
තදාලම්බණ නියමය	282
ජවන නියමය	288
භූම්විභාගය	296

(5) වෙනි පරිච්ඡේදය.

භූමි චතුෂ්කය	300
ප්‍රතිසන්ධි ,,	329
කර්ම ,,	337
චුතිප්‍රතිසන්ධි ක්‍රමය	367

(6) වෙනි පරිච්ඡේදය.

රූපසමුද්දේශය	390
රූපවිභාගය	398
රූපසමුට්ඨාන ක්‍රමය	400
කලාපයොජනා	407
රූපප්‍රවෘත්තික්‍රමය	409
නිර්වාණවර්ණනා	413

(7) වෙනි පරිච්ඡේදය.

අකුශල	සංග්‍රහය	417
මිශ්‍රක	,,	425
බොධිපාක්ෂික	,,	445
සප්ත	,,	453

(8) වෙනි පරිච්ඡේදය.

ප්‍රතීත්‍යසමුත්පාද ක්‍රමය	464
ප්‍රපඤ්චය ,,	501

(9) වෙනි පරිච්ඡේදය.

සමථකර්මස්ථාන	සංග්‍රහය.	514
විදර්ශනා	,,	531

ශුද්ධි පත්‍රය.

පිට	පෙළ	අසුඛ	සුඛ
2	10	තථාගතෙහි	තථාගතෙන
5	3	ඛඞ්ගාදිවසෙන	ඛඞ්ගාදිවසෙන ච
7	4	ලොභසහගතවෙයි.	ලොභසහගත වේ ද.
17	33	චිත්තතෝ	චිත්තයන්
18	5	සොදනලද්දේයයි	සොදනලද්දේයි.
19	8	යතුවේ	යතුවෙන්
20	15	නොපවත්නාහෙයින්	පවත්නාහෙයින්
,,	25	යෙදෙත්	නෙදේ.
23	4	ව්‍යතිථාරෙ	ව්‍යතිහාරෙ ව
,,	23	සත්වයෝම	සත්වයන්
25	17	චිත්තවිපලලාස වශයෙන්	චිත්තවිපලලාසාදී වශයෙන්
28	19	සඞ්ඛාරයෙහි	ඡඩ්වාරයෙහි
32	10	එකුන්සැටක් හෝ	එකුන්සැටක් හෝ; අථ, නැවත; එකුනතවුතිවා, එකුන්අනූවක් හෝ;
41	8	නවානුපූබ්බිහාර සමාපත්තියයි කියති	"නවානුපූබ්බිහාර සමාපත්ති ය"යි ද වතුඤ්ඤානයින් අඤ්ඤ සමාපත්තියහා නිරොධ සමාපත්තියද නවානුපූබ්බිහාර සමාපත්තියයි කියති.
41	11	වදරණලද්දේයි	වදරණලදහ.
,,	13	දෙශනකාරණලද්දේයි	දෙශනාකාරණලදහ.
,,	14	සුඛෙඛාග්‍රතා	උපෙක්ඛාඑඛාග්‍රතා
52	37	තෙල	තෙල්
54	27	සත්වයෝ ඉමූ	සත්වයන්
55	27	නිනනිකාය	නිකානතිය
56	37	මාවිසිබනලද්දුවූ	මාවිසින් ලබනලද්දුවූ
59	24	නොකට හැක්කේය.	නොකට හැක්කෝය.
66	15	නිමිත්තාලම්බණයෝ	නිමිත්තාලම්බණයන්
67	14	ධ්‍යානතෝන්	ධ්‍යානඅනුත්
72	5	සත සතරවණී	සතරවණී
112	36	චිතකීයට අපිණායයි නොකියති.	චිතුකීයට අපිණායයි කියති.
121	30	කටුලුකරති	කටුලුකරණ ලද්දේ මෙත්.
123	31	මාවිසින්	මම
131	36	කැඩීම	කැළඹිම
133	15	ශුඛකිරීමට	සිඛකිරීමට

පිට	පෙළ	අසුබ	සුබ
144	8	වසඟයෙහි	වසඟයෙහි පැවැත්වීම
151	22	නවයක්	සතක්
152	18	මනොවාරාවජ්ජන	පවවාරාවජ්ජන
156	3	නියාවෙන්සොළොස්	නියාවෙන් පසළොස්
161	14	සඳුලම්බණ	ඡඩ්ඩාලම්බණ
,,	19	අනන්තාපරිමාණවෙයි	අනන්තාපරිමාණ වේත්.
164	24	ක්‍ෂුද්‍රාඡට	ශුඛාඡටක
170	22	සිගක්අව්රෑද්දක්	අසුඅවුරුද්දක්
,,	24	මහාලොකොත්තර	ලොකොත්තර
181	5	ලද්දේයි	ලද්දහුය.
182	11	දතයුතුයි	දතයුත්තාහුය.
186	21	නොලැබෙන්නේයයි	නොලැබෙන්යයි
187	4	නොලැබෙන්නේමැයි	එනම්ව නොලැබෙන්මැයි.
207	8	ඛබත්ථ	සබ්බත්ථ
,,	26	අජීයෝ	අජීයන්
224	13	නෙපඤ්ඤ	නෙපඤ්ඤ
,,	17	ඛයඅ	භෙදඅ
226	29	එවැදෑරුම්	එක් වැදෑරුම්
232	14	කුසලාකුසල	කුසල
237	,,	ජලශ්‍රොතඅ මෙන්ද	ජලශ්‍රොතඅ මෙන්ද
257	6	සත්ථයන්	සත්ථවයන් විසින්
,,	10	නොවන්නාහුදයත්?	නොවේදයත්?
260	16	වැටඟෙන්නාවූ	ප්‍රකටව වැටහෙන්නා වූ
,,	17	නොවැටඟෙන්නාවූ	ප්‍රකටව නොවැටහෙන්නා වූ
262	31	ඕඝවාඅ	ඕඝවාරඅ
263	28	කියඅලදී	කියන ලදහු.
264	31	එඅ එනඤ්ඤණඅකට	උත්පාදඛඛඤ්ඤණ දෙකකට
274	12	අභිභූතාලම්බණ නම්වෙයි.	අවිභූතාලම්බණ නම් වෙත්.
279	1	පෙඤ්ඤාතව	සෙඤ්ඤාතව
289	8	උපදනාහු වෙත්	උපදනේ වෙයි.
294	27	වෙදිතබ්බා	වෙදිතබ්බං
296	31	ඒයුඤ්ඤාවූ	යුඤ්ඤ වූ
304	34	මහාශ්‍රාවකාතුමූදිහු	මහාශ්‍රාවකාදීහු තුමූ
362	25	අභිම්ඛිතහුං	අභිමුඛීභූතං
264	29	පවවාරඟඛිතං	ඡවාරඟඛ්තං

අක්ෂර යොජකයන්ගේ වඤ්චිපයත්‍යාඟ උෆණාධික-හ්‍රස්වාදී තවත් බොහෝ ප්‍රමාද දෙස ඇතත් එය ප්‍රාඥයන්ට සුඛාඛ බැවින් මෙහි සඳහන් නොකෙළෙමු.

ප්‍රාරම්භ ගාථාවෙහි

(භාවය.)

සුපරිසුඛබුඛි හොවර පරමවිචිත්‍රපිටකත්‍රය සහිත සකල ශාසත්‍රපාරාවාර දර්ශි සුප්‍රසිඛාචාර්‍ය්‍ය **අනුරුඛමහාස්ථවිරයාණන්** ආශීර්තමස්ක්‍රියා වසතුනිදේශ මුඛත්‍රය අතුරෙන් තම ස්ක්‍රියාමූඛයෙන් ග්‍රන්ථාරම්භය කරැවිව ඉෂ්ටදේවතානුස්මරණ මඛලාවරණය සදුවාරානුරක්ෂණයවද, විශෙෂයෙන් අනිෂ්ට ග්‍රන්ථාගේ විඝතවිරහයෙන් පරිසමාප්තියවද, හෙතුයයි විශිෂ්ට ඉෂ්ටදෙවතා සංඛ්‍යාත රත්නත්‍රයප්‍රණාමයi පූර්වකොට ඇති අභිඛෙය්‍ය ii කරණප්‍රකාර iii ප්‍රකරණාභිධාන iv ප්‍රයොජන v ඝන අර්ථපඤ්චකය දක්වනුවෝ "සම්මාසම්බුඛවකුලං" යනාදී ප්‍රාරම්භ ගාථාව වදුලෝ.

"සම්මාසම්බුඛවකුලං සඝඛමමඝණුත්තමං අභිවාදිය" යන පාඨයෙන් රත්නත්‍රයප්‍රණාමයද, "අභිඛම්මපථ සඝහං" යන පාඨයෙන් ග්‍රන්ථාර්ථයද, කරණප්‍රකාරයද, ප්‍රකරණාභිධානයද, ප්‍රයොජනයද, යන අර්ථවතුෂ්කය දර්ශිතය.

"තෙසං පටිපාදනඛඛ භාවදසසනතො ච" යනු විභාවනී ටීකා හෙයින් අභිධම්මාර්ථයන් ප්‍රතිපාදනය කවයුතු බව දැක්වීමෙන් අභිධෙය්‍යාර්ථය දර්ශිතය. වාග්භෙද ශබ්දව්‍යාපාරයේද අර්ථවශයෙන් අවිනාභාවය ඇති හෙයින් අභිධෙය්‍ය නම්වූ සතර පරමාර්ථ ඇති ග්‍රන්ථාර්ථයද "දසසන" ශබ්දයෙන් වාච්‍යවේ.

"එකපථ සඝහයතා කථනාකාරදිපනාතොව" යනු ටීකා හෙයින් අභිධම්මපථප්‍රකරණයෙහි විස්තරයෙන් දෙශිතවූ සතර අභිධම්මාර්ථයන් සැසෙවින් මෙහි දක්වන ලද හෙයින් කරණ ප්‍රකාරය වනාහි "සඝහහ" ශබ්දයෙන් වාච්‍යවේ.

"අථවා නුගතානසමනුසසා පකිදිපතතොව" යනු ටීකා හෙයින් "අභිඛම්මපථා සඝහයතනති එතථ එතතානි වා-අභිඛම්මපථේ සඝහතහා. නං අභිඛම්මපථේ සඝහහං" යන නිර්වචනයට සුදුසුවූ තාවය ප්‍රකාශ කරණ හෙයින් "අභිධම්මපථසඝහහං" යන ප්‍රකරණාභිධානය වාච්‍යවෙයි.

ග්‍රන්ථකරණ ප්‍රයෝජනය කවර පාඨයකින් සලිතද? යත්: **"පයෝජනම්පන-පෙ-දස්සිතමේව"** යනු ටීකා හෙයින් ග්‍රන්ථ කරණප්‍රයෝජනය "සඞ්ඝහං" යන පදයකුරණමනාවහෙණ ශබ්ද ශක්තියෙන් දර්ශිත මැයි. නෙසේද? යත්: සපනප්‍ර ාරණයෙහි විසතරදෙශිත අභිධම්මාථියන් එකම අභිධම්මාථි නම් ප්‍රකරණ යෙහි සංක්ෂෙපසංග්‍රහනයක් ඇති කල්හි ඒ අභිධම්මාථිසංග්‍රහ නම් ප්‍රකරණය උද්ග්‍රහණපෘවජාප්‍රතිපෘවජ්ඨාදියෙන් ඒ සතර අභි ධම්මාථියන්ගේ ලක්ෂණ රස ප්‍රත්‍යුපස්ථාන පදස්ථානාවබොධයට ද, ඒ ලක්ෂණාදි අවබොධයෙන් චතීමාන ආත්මභාවයෙහි හටගන් නාවූ අථිසංසිඩිය නිරුයාසයෙන් සිඩවන හෙයින්ද, "සඞ්ඝහං" යන පදයෙන් ප්‍රයෝජනය දර්ශිත මැයි.

ඒ ප්‍රයෝජනය චතාභි:-මුඛ්‍යප්‍රයෝජනය ආනුසංගික ප්‍රයෝ ජනයයි දෙවැදෑරුම්. ඒ දෙකින් සතර පරමාථිාවබොධය මුඛ්‍ය ප්‍රයෝජනයවේ. ඒ හෙතුවෙන් ඇති වන දිෂවධාර්මික-සාම්පර යික අථිසංසිඩිය ආනුසංගික ප්‍රයෝජනයවේ.

උකතප්‍රකාර රතනත්‍රය ප්‍රණාමාදින් අතුරෙන් ග්‍රන්ථාරම්භ යෙහි රතනත්‍රයට ප්‍රණාමයෙහි ප්‍රයෝජනය චනාහි අනතරාය නිවාරණ ප්‍රයෝජනය-විශුඩ්ධිප්‍රකිවෙධප්‍රයෝජනය-පණ්ඩිතයන් ගේ ගෞරවභාජනත්වප්‍රයෝජනය-රතනත්‍රය කෙරෙහි ශ්‍රොත්‍රාජන යාගේ ප්‍රසාදජනනප්‍රයෝජනය යනාදී නොයෙක් ප්‍රයෝජන යන් අතුරෙන් අනතරායනිවාරණ ප්‍රයෝජනය විශෙෂයෙන් අථි කථාචාර්යීවරයෝ කැමති වෙති.
එයින් කිහුඃ-

"ඉවෙවවවවවන නමස්සනියං-පෙ-නස්සානුභාවෙන හත නනරායෙ" යි ප්‍රණාමචෙතනාසහගතඥානයන් නසන ලද අනත රාය ඇතිව යනාදීයි.

ප්‍රණාමසඞ්ඛාවවූ විඥප්තිරූපය හා ප්‍රණාමචෙතනාව ද යන දෙකින් කවරක් මෙහි ප්‍රණාම නම් වේද? යත්: **රතනත්තය පණාමෝ හි-පෙ-කුසලචෙතනා** යනු ටීකාහෙයින් ප්‍රණාම ක්‍රියාව නිපදවන කාමාවචර කුශලචෙතනා තොමෝ රතනත්‍රය ප්‍රණාම නම් වන්නීය. විඥප්තිවය සමුඞ්ඨාපක චෙතනාව හා මනොචාරික කාමාවචරකුශලචෙතනා තොමෝද ප්‍රණාම නම් වන්නීය. ඒ ප්‍රණාමචෙතනා තොමෝ වන්දනෙය-වන්දකයන්ගේ

ක්ෂේත්‍රාධ්‍යාශය සම්පත්තියෙන් ඉහාත්මභාවයෙහි විපාකය දෙන්නීය,

තවද යථාලබ්ධවූ සම්පත්තියට හෙතුවූ දුරුණ කම්ම්ඥක පරම්පරාවට රුකුල්දීමෙන්ද, ඒ පුරුණ කර්මය විසින් උපදවන ලද විපාකපරම්පරාවට අන්තරායකරවූ උපපීඩක-උදවෙච්දකාදී කර්මයන් ප්‍රතිබාහනය කිරීමෙන් යථාභිප්‍රේතවූ ග්‍රන්ථපරිසමාප්තිය සිදින රොගාදී අනෙකප්‍රකාර අන්තරාය නිවාරණයද සිඛකරන්නීය.

ඒ රොගාදින්ගේ අප්‍රවෘත්තිය සිඛකළහැකි බැවින් ග්‍රන්ථාරම්භයෙහි තුණුරුවන්ට වැඳීම යඳ්ාරබ්ධප්‍රකරණය නිරුයාස යෙන් සමාප්තකිරීම පිණිසද ආචාර්‍ය්‍ය අනුරුඛ්මහා සවාම්පාද යන් වහන්සේගේ සතුති නමස්කාර පූජාඛ්හමවූ ප්‍රතිපදාවෙන් අන්තරායකර ධර්මයන් නොපැවැත්මෙන්ද ධර්මාභිලාෂින්ගේ ඉගෙණීම-දැරීම්දිය සිඛකිරීම පිණිසද වෙයි.

අභිධෙය දැක්වීම් කිමසීද? යත්: "අභිධෙය්‍ය කථනං-පෙ-පරිපජ්ජිතබ්බභාවතෝ" යනු පිකා හෙයින් අභිධෙය කථනය වන්හි විදිතාසීග්‍රන්ථය ප්‍රාඥයන් විසින් උද්ග්‍රහණාදියෙන් නැවත නැවත භාවිතයන් පිළිපැදිය යුතු හෙයිනි.

කරණප්‍රකාර ප්‍රයෝජනය හා අභිධානකථනප්‍රයෝජනය කෙසේද? යත්: "කරණපකාර-පෙ-සුබත්ථං" යනු විභාවනී පිකා හෙයින් ග්‍රන්ථකරණපරිදිය ග්‍රන්ථකරණයාගේ ප්‍රයෝජනය යන මොවුන්ගේ දැක්වීම ශ්‍රෝත්‍රුජනයාගේ මෝනවට උත්සාහ දනවීම ප්‍රයෝජනකොට ඇත්තේවේ.

ග්‍රන්ථනාම කථනය වන්හි ව්‍යවහාර කෞශල්‍යය ප්‍රයෝජන කොට ඇත්තේ වෙයි. එසේ අන්තරාය නිවාරණයෙන් ග්‍රන්ථපරිසමාප්තිය ආදී අර්ථයන්ගේ නිෂ්පත්තිය වන හෙයින් රත්නත්‍රය ප්‍රණාමාදී අර්ථපචකය අනුරුඛාචාරීන්වහන්සේ විසින් දර්ශිතයි. මේ "සම්මාසම්බුඛ මතුලං" ඉත්‍යාදී වාක්‍යයෙහි පිණ්ඩාර්ථය වෙයි.

එහි "සම්මාසම්බුඛ" ශබ්දය විස්තර කෙරෙමි:—බුඛ ශබ්දයෙන් වාච්‍යවූ "සුත බුඛ-චතුසවවබුඛ" යන්ද, "සම්බුඛ ශබ්දයෙන් වාච්‍යවූ ප්‍රත්‍යෙකබුඛයන්ද, "සම්මාසම්බුඛ" ශබ්දයෙන් වලක්වා සර්ඥබුඛ තෙවේම වාච්‍යවේ.

බුදුහු සම්‍යක් සම්බුද්ධ වන පරිදි මෙසේ දක්වත්:-"බුධ" ධාතුහුගේ ඥාන‍ාර්ථ වශයෙන්:-ඒ භාග්‍යවත් තෙමේ සංඛත-අසංඛත ප්‍රභේදවූ සියලු ධර්මසමූහයම ලක්ෂණාදී සාක්ෂාත්කාර පිළිවිදීමෙන් අවිපරීතකොට තමන්වහන්සේ විසින්ම උපචිත-සමුපචිත පාරමිතා බලයෙන් මෝනවට පහලවූ පරොපදේශ රහිත සවයම්භූඥානයෙන් තෙමේම දැනබොධ කළසේක්ද එසින් සම්‍යක්සම්බුද්ධයන. තමන්වහන්සේගේම රූවිවශයෙන් සංස්කාර-විකාර-ලක්ෂණ-නිර්‍වාණ-ප්‍රඥප්තිසංඛ්‍යාත සකලඥෙය ධර්ම මණ්ඩලය අවබොධකළ පරිදි "සයං අභිඤ්ඤාය කමුද්දිසෙයය" යන ශ්‍රී මුඛදේශනාපාඨයෙන් ප්‍රකාශවේ.

"බුධ" ධාතුහුගේ ඥානාර්ථ වශයෙන්:—"සම්මා සාමං සඬ සබ්බඤ්ඤුතඤාණේනාභිසම්බුද්ධා ඒතස්සාති=සම්මා සම්බුද්ධෝ" යනු විග්‍රහයෙසින් "එකාන්තයෙන් අනිකෙකු විසින් නුපුබුදුවනු ලදුව තෙමේම විසනා සහිතවූ මොහනිද්‍රායෙන් අතිශයින් පහවූ කෙසින් සම්‍යක්සම්බුද්ධයන.

"බුධ" ධාතුහුගේ විකාසනාර්ථ විශයෙන්:—"සම්මාසාමං සඬ බුද්ධා විකසිතා තී=සම්මාසම්බුද්ධෝ" යනු විග්‍රහයෙසින් සූර්‍යරශ්මිසමූහයෙන් අතිශයින් සිත්කලුවූ ශ්‍රී ශෞභාග්‍යයට පැමිණීමෙන් පදමයක් ප්‍රබොධවූවාක් මෙන් අතීත්මාතීඥානය හා එක්වීමෙන් ප්‍රමාණාතික්‍රාන්තවූ ගුණ සමූහයෙන් සමලඩකෘතවූ සර්‍වඥතාඥාන යට පැමිණීමෙන් මනාකොට තෙමේම ප්‍රබොධවූ සේක්ද ප්‍රබොධනයට පැමිණ වදාළසේක්ද එසින් සම්‍යක්සම්බුද්ධයන.

සම්‍යක් සම්බුද්ධයන් වහන්සේට විශෙෂ ගුණයකින් සතුති කරණු කැමැති අනුරුද්ධාචාරීන් විසින් "අතුලං" යන ඒ විශෙෂණය කරණලදී. යම් පුද්ගලයෙක් තෙම මහත්වූ තරාදිය කට සමානවූ ප්‍රඥාවෙන් කිරණ ලද්දේවේද, නොහොත් යමෙක් තරාදියෙන් කිරණ ලද්දේවේද, එසින් ඒ පුද්ගල තෙමේ තුල නම්වේ. යම් සම්‍යක්සම්බුද්ධයෙක් තෙම යම්කිසි පුද්ගලයෙකු හා සදෘශවූයේ නොවේද එසින් ඒ සම්‍යක්සම්බුද්ධ තෙමේ අතුල නම්වේ.

භාග්‍යවත් තෙමේ දෙවියන් සහිත සත්ත්වලොකයෙහි අසදෘශ උත්තම පුද්ගලයෙක් වෙයි. "සාවතා-පෙ-අඤ්ඤාසති" යනාදි ශ්‍රී මුඛපාලිය ඒව සාධනයි.

ආදී ගුණත් අනුරුද්ධාදීන් විසින් "සම්මා සම්බුද්ධ මතුලං" යන පෙදෙසින් හෙතුසම්පදා-ඵලසම්පදා-සත්තූපකාර සම්පදාවන්ගේ වශයෙන් තුන්ප්‍රකාර ගුණයකින් භාග්‍යවත්හට සතුති කරණලදී.

ඒ ත්‍රිවිධසම්පත්තීන් අතුරෙන් මහාකරුණාසමාපත්ති යෙහි නැවත නැවත යෙදීමද, සච්ඡිකාතබ්බානිප්පත්තියට හෙතු වූ සම්භාරයන් පාරමී ධර්මයන්ගේ සම්පූර්ණ කිරීමද, හෙතුසම්පදා නම්වේ. ඵලසම්පදා තොමෝ වර්ණාදී ඝනසන්තානගත රූපකායසම්පදා-පභාසම්පදා-ආනුභාවසම්පදා-රූපකායසම්පදාවන්ගේ වශයෙන් සිව්වැදෑරුම් වන්නීය. ඒ ඵලසම්පදා සතරෙන් සච්ඡිකාතබ්බානයට ආසන්න කාරණාවූ අතීත්මානාගතඥානයද, ඒ අතීත්මානාගතඥානයම මුල්කොට ඇති දශබල-චතුවෛශාරද්‍යඥානාදී අනන්තාපරිමාණඥානයෝද, ඝනාණසම්පත්ති නම්වේ. කාය-වාග්වාසනා සහිතවූ කෙලෙශ ධර්මයන් නැවත අනුශයයින් නූපදනා සභාවයට පැමිණවීම පභාණසම්පත්ති නම්වේ. යථාභිමතානුප්පාදනයෙහි ඊශ්වරභාවය ආනුභාවසම්පත්ති නම්වේ. සියලු සත්වයන්ට නෙත් තෙපුලක් බඳුවූ ත්‍රිභවාග්‍රස්ථිත පුරුෂලක්ෂණයෙන් හා අසීත්‍යනුව්‍යඤ්ජනයෙන්ද සර්ජිතවූ ආත්මභාවසම්පත්ති තොමෝ රූපකායසම්පත්ති නම්වේ.

සත්තූපකාරසම්පත්තියෙහි වනාහි උත්තමාධ්‍යාශය උත්තම විෂයීයයි දෙවැදෑරුම්වේ. ඒ දෙවැදෑරුම් ආශය-ප්‍රයෝගයන් අතුරෙන් දෙවිදත් ආදී නිත්‍ය විරෝධී ප්‍රතිවිරෝධී සත්වයන් කෙරෙහි පවා නිරන්තරයෙන් හිතාධ්‍යාශය ඇතිබවද, නොමුහු කෘත්‍ස්‍රාදී පඤ්චේන්ද්‍රියයන් ඇති සත්වයන්ගේ ඉන්ද්‍රියපරිපාකාගමනයද, ආසයසම්පත්ති නම්වේ. ඒ දෙවදාහාදී ප්‍රතිපක්ෂසත්වයන් කෙරෙන් අන්‍ය සත්වයන්ට ලාභවිශෙෂ පූජා සත්කාරාදියෙහි නිරපේක්ෂකව සියලු වෘත්ත දුඃඛනිර්මානයට හෙතුවූ ධර්මදේශනා තොමෝ ප්‍රයෝගසම්පත්ති නම්ය.

ඒ ත්‍රිවිධ වූ හෙතු-ඵල-සත්තූපකාරසම්පත්තීන් අතුරෙන් පූර්ව වූ ඝනුණ-පභාණ යන ඵලසම්පත්තීහු දෙදෙන "සම්මා සම්බුද්ධං" යන පෙදින් දක්වන ලදහ. මෙයින් අන්‍යවූ ආනුභාව-රූපකායසම්පත්තීහු දෙදෙනද, ඔවුන් කෙරෙන් අන්‍ය වූ සත්තූපකාරසම්පත්තියද, "අතුලං" යන පෙදින් දක්වන ලදහ. ඒ දෙවැදෑරුම් ඵලසම්පදා-සත්තූපකාරසම්පදාවන්ට කාරණා වූ

හෙතුඋපපත්තියය වනාහි දෙපෙදින්ම අසීඝශකතියෙන් දක්වයා ලදී.

කුමක්හෙයින් හෙතුසම්පත්තියය දෙපෙදින්ම දක්වනලදද? යත්: එබඳු සවභාව ඇති මහාකරුණාසමායොගය- බොධි සම්භාරසම්භරණය යි කියනලද හේතූන්ගේ විරහයෙන් ඒ විප්‍ර කාරවූ ඵලසම්පත්ති- සත්ථොපකාරසම්පත්තීන්ගේ සම්භවප්‍රයඔගය වන හෙයින් ද දෙපෙදින්ම හෙතුසම්පත් තොමෝ දක්වන ලද්දීය.

"සම්මාසම්බුඩ්ඨමතුලං" යන දෙපෙදෙන් බුඩරත්නය ත්‍රිවිධා කාර සම්පත්තියකින් මොනවට සංග්‍රහකොට දැන් ඉතර රත්න යන්ට ද ප්‍රණාමය කරණු කැමති අනුරුඩාචාර්‍යයන් මාහිමියෝ "සඝඩම්මඝණුත්තමං" යි කිහු.

අන්‍යවූ ධම් සඩඝ රත්නයන්ට ද නමස්කාර කටයුතු බව "සඝඩිම්මඝණුත්තමං" ශබ්දයෙන් දක්වයි. "සඵුත්තාදුරෝ ආඝ නෝ"යි ටීකාවෙහි ආ සාධකපාඨයෙන් "දූදරු භාඝ්‍යීවන් සම්ඝ ආරේඝ"යි කී තන්හි මෙන් "සඝඩම්මඝණුත්තමං" යන පදයාගේ සහ ශබ්දය හා යෙදීමෙහි ලැබෙන ගුණ-ද්‍රව්‍ය-ක්‍රියා යන ත්‍රිවිධ සම්වායයන් අතුරෙන් නාමස්කාර කටයුතුබව සමාන හෙයින් ක්‍රියා සම්වායයේ සවභාව දක්වනලදී.

දැන් වනාහි "සඝඩම්මඝණුත්තමං" යන පදයෙහි ඇතුලත් "ධම්ම" ශබ්දයාගේ විවනාර්‍ථය දක්වනු කැමති ටීකාචාරීන් විසින් "නපථ-පෙ-ධම්මමා" යන පාඨය කියනලදී. ඝම් සවභාව ධර්‍මයක් ඉතමේ තඹා දරණ සත්වයන් සිව් අඩාසෙහිද ජාත්‍යාදී වෘත්තදුක්ඛයෙහිද නොවැටෙන්නවුන් කොට දරන්නේ වේද එසින් ඒ සවභාවධම්මතමේ "ධම්ම" නම් වේ. ඒ ධම් ශබ්දයෙන් සතරමඟ- සතරඵල- නිර්‍වාණයන්ගේ වශයෙන් නවප්‍රකාර වූ ධම්ය නොහොත් ත්‍රිපිටකපරියාපතිය සඞ්ඝ දශප්‍රකාර වූ ධම්ය ලැබේ. මෙහි සතර අපායෙහි නොවැටෙන බව සෝවාන්මාර්ගය සඳහාද, ජාත්‍යාදී වෘත දුක්ඛයෙහි නොවැටෙන බව සතරමාර්ගී යන් සඳහාද දක්වනලදී. "බාරණඋපපෙතත්ථා-ඵප-ව්බා ඝනං" යනු ටීකා හෙයින් "අපායාදියෙහි ඉපදවිය හැකිවූ කෙ ලෙසුන්ගේ නැසීම ම ඒ ධම්යාගේ දූරිමද" වෙයි.

තවද ආර්‍ය්‍ය මාර්ගය හා නිර්‍වාණය කරණකොටගෙණ ඒ කෙලෙසුන් අනුත්පාද නිරොධයෙන් නසන හෙයින්ද නිර්‍වාණය

අරමුණුකිරීමෙන්ද කෙලෙසුන් අනුත්පාද නිරොධයෙන් කැසි මැස සි කියනලද අජීසිඞ්ඨට කාරණාවන බැවින්ද ආර්‍යමාර්ගයට හා නිර්‍වාණයට මුඛ්‍යවශයෙන් ධර්ම ශබ්දය ලැබේ. සතර ඵලයෙන් ක්ලෙශයන් සංසිදවීම් වශයෙන් මාර්ගයට සුදුසු පරිද්දෙන් පවත්නා හෙයින් ද ත්‍රිපිටකපර්‍යාපන්න තදජීසිඞ්ඨහේතුවෙන්ද ඒ ආර්‍යමාර්ගඵල-නිර්‍වාණයන්ට පැමිණීමට හෙතුවන බැවින්ද පර්‍යාපන්න අමුඛ්‍යවශයෙන් ධර්ම නම් වේ.

මෙසේ ධර්ම "ශබ්දයාගේ වචනාර්‍ථ දක්වා දැන් වනාහි "සඞ්ඝං" යන පදයෙහි "ස" ශබ්දයාගේ නොහොත් "සහ" ශබ්දයාගේ වචනාර්‍ථ දක්වනු කැමති ටීකාචාර්‍යයෝ "**සන්තං සප්පුරිසානං-සෙ-සඞ්ඝරතනං**" යන පාඨය කිහු

"**සන්තං ධර්‍මමා=සඞ්ඝරතනං**"යි විග්‍රහ කෙසින් සාධුසත්පුරුෂවූ බුඩාදී ආර්‍ය්‍ය පුද්ගලයන්ගේ ධර්මයක්නුයි; නොහොත් "**සංවිජ්ජමානෝ ධර්‍මමා=සඞ්ඝරතනං**" යන විග්‍රහ නයින් තිර්‍ථකයන් විසින් පරිකල්පිතවූ ආත්මයක් මෙන් නොව අවිපරිතාර්‍ථයෙන් විද්‍යමානවූ ධර්මයක් නුයි; නොහොත් "**පසත්ථෝ ධර්‍මමා=සඞ්ඝරතනං**" යන විග්‍රහ නයින් සවකධාතාදී ගුණයෙන් යුක්තබැවින් බුඩාදීන් විසින් පසස්තාලද ධර්මයක් නුයි සඞ්ඝරතන නම් වේ.

මෙසේ සඞ්ඝරතනශබ්දයාගේ වචනාර්‍ථ දක්වා දැන් වනාහි ගණුත්තම ශබ්දයාගේ වචනාර්‍ථය දක්වනු කැමති ටීකාචාර්‍යයෝ "**ගණෙණා ව-සෙ-ගණුත්තරතමා**" යන පාඨය කිහු.

"**ගණෙණා ව සො උත්තරතමා වා'නි=ගණුත්තරතමා**" යනු විග්‍රහ හෙයින් අජාචාර්‍ය්‍ය පුද්ගලයන්ගේ සමූදායවූ හෙයින්ද ඒ සමූහය සුපිළිසන් බැව් ආදි විවිධගුණගණාඩ්‍යතාඩ්‍යතා හෙයින් උතුම් වූයේ වේද එයින් ගණුත්තරතම නම් වේ. නොහොත් "**ගණානං උත්තරතමා=ගණුත්තරතමා**" යනු විග්‍රහ හෙයින් දිව්‍ය මනුෂ්‍යාදී සමූහයා අතුරෙන් උතුම්වූ හෙයිනුදු නොහොත් "**ගණෙසු උත්තරතමා=ගණුත්තරතමා**" යනු විග්‍රහ හෙයින් දිව්‍ය මනුෂ්‍ය සමූහවූ ගණයන් අතුරෙහි යථොක්ත ගුණසමූහ විද්‍යමානබවයෙන් උතුම් වේද එයින් ගණුත්තර නම් වේ.

"**අභිඤාදිඝ**" යන පූර්‍වක්‍රියාවෙන් දර්ශිතවූ විශෙෂ ප්‍රණාමය නම්:—ලාභ-කුලා'වාරාදී විරහිතයෙන් අනිශය භක්තියෙන් කායාදී වාරත්‍රයෙන් වැඳ යන අර්‍ථයි.

"අභිධම්මපඤ්ඤත්තිසඞ්ගහං" යන්නෙහි විස්තර දක්වමි:- "අභිවිසිට්ඨා ධම්මා අභිධම්මා, අභිවිසිට්ඨා ධම්මා එත්ථා'ති අභිධම්මෝ"යි විග්‍රහ කෙසින් ඒ අභිධම් පිටකයෙහි අවිපරීතවූ පරමාර්ථයාගේ සවභාවයෙන් අතිශය විශිෂ්ටවූ ධර්මයතෙම වරදුණුලද්දේ වේද, එයින් ඒ පිටකය තෙම අභිධම් නම් වේ. දම්සඟුණුආදි සත්ත්වප්‍රකරණයයි කියතලද අභිධම්පිටකය ලැබේ. එහෙයින් අර්ථකථාචාර්‍ය්‍ය බුද්ධඝෝෂ මාහිමියෝ:—

"ධම්මසඞ්ගණී විභඞ්ගප්පකරණං—කථාවත්ථු ච පුග්ගලං,
ධාතුයමකපට්ඨානං—අභිධම්මොති වුච්චති"යි කිහු.

"සඞ්ඛේපවණ්ණනා" ටීකායෙහි "අභි අතිරේකෝ ධම්මෝ සුත්තවිනයාධිකා පාලී'ති අත්ථෝ" යනුවෙන් මෙහි "අභි" ශබ්දය අධිකාර්ථ බැවින් "සූත්‍ර විනය දෙකට අධික (උතුම්) වූ පාලිය" අභිධම්ම යි කිහ. නුමුත් අර්ථසාලිනියෙහි:— කෙන අට්ඨන අභිධම්මෝ? ධම්මාතිරේකත ධම්මවිසෙසභාවත්ථන" යනුවෙන් සූත්‍රාන්තයට මුත් විනයට අධික බවක් අභිධම්යේ ඇති බව නොකියයි. එම අර්ථය මූලටීකාවෙහි: —"ධම්මාතිරේකත ධම්මවිසෙසභාවත්ථනා'ති එත්ථ ධම්මෝ අතිරේකෝ=ධම්මාතිරේකෝ. සුත්තන්තාධිකා පාලී'ති අත්ථෝ" යනු කිහ. සච්චත්තපකාසාදිකා වෙහි:—සත්තා පණ්ණත්තයෝ වා විඤ්ඤත්තියෝ වා නත්ථි" යනුවෙන් "විනයට වඩා විශිෂ්ට ධර්මයක් නැති" බව කීබැවින් හා බුදුන්ගේ මාතෘකාව ආශ්‍රයකොට ගෙණ කථාවස්තු ප්‍රකරණය මොග්ගලීපුත්තතිස්ස මහරහතුන් වහන්සේ විසින් දෙශනා කළාක්මෙන් මාතෘකා පදයන් ආශ්‍රයකොටගෙණ ප්‍රත්‍යේකබුද්ධ-මහාශ්‍රාවකාදීන්ට පවා විනයශික්ෂාවක් නො පැණවිය හැකි බැවින් හා විනයපිටකයෙහි වරදට සුදුසු ශික්ෂා පැණවීම සම්බුද්ධ වරයන්වම විෂය බැවින් ද සඞ්ඛේපවණ්ණනා ආචාර්‍යන්ගේ මතය පිළිගැණීමට කරුණු නො පැණේ යි.

"අභිධම්ම වුත්තා අත්ථා=අභිධම්මත්ථා" යනු විග්‍රහ කෙසින් "ඒ අභිධම්සඤ්ඤාප්‍රකරණයෙහි වදාළ අර්ථයෝ අභිධම්ාර්ථ නම් වෙත්. "අභිධම්මත්ථා සඞ්ගහයන්තීති එත්ථ එසනා'ති වා=අභිධම්මත්ථසඞ්ගහෝ" යි විග්‍රහ කෙසින් "මේ අභිධම්ාර්ථ සංග්‍රහ නම් ප්‍රකරණයෙහි නොහොත් මේ ප්‍රකරණයෙන් ඒ අභිධම්සඤ්ඤා ප්‍රකරණයෙහි විස්තරයෙන් වදාරණලද අභිධම්ාර්ථයෝ සැකෙවින් සංග්‍රහකරණු ලැබෙන්නුයි අභිධම්ාර්ථසංග්‍රහ නම්.

පරමාර්ථ ප්‍රදීප

නම්

අභිධම්මාර්ථ සඞ්ග්‍රහ විසඳුම භාවසන්නය.

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස.

සම්මා සම්බුද්ධ මතුලං සසඞ්ඝම්මගණුත්තමං,
අභිවාදිය භාසිස්සං අභිධම්මත්ථසඞ්ගහං.

තත්ථවුත්තානි ධම්මත්ථා චතුධා පරමත්ථතෝ,
චිත්තං චෙතසිකං රූපං නිබ්බානමිති සබ්බථා.

පදඝනාර්ථ

අහං, මම; **සසද්ධම්මගණුත්තමං**, සත්පුරුෂයන්ගේ ධර්මය; පරමාර්ථයෙන් ප්‍රකටව පවත්නාවූ ධර්මය, සතුතිකටයුතුවූ ධර්මය, ප්‍රසිද්ධවූ පෘථුජ්ජන පුද්ගලයන් කෙරෙන් විශෙෂයෙන් ප්‍රසිද්ධවූ ප්‍රභාණය කරණලද අවිද්‍යාව ඇත්තාවූ උතුම්වූ ආර්‍ය්‍ය පුදගල සමූහයා සමග හටගත්තාවූ නොහොත් **සසඞ්ඝම්මගණුත්තමං**, සත්පුරුෂයන්ගේ ධර්මය, පරමාර්ථ වශයෙන් ප්‍රකටව ඇත්තාවූ ධර්මය, පසස්නාලද ධර්මය, දිව්‍ය මනුෂ්‍ය සමූහයා **අතුරෙන්** නොහොත් දිව්‍ය මනුෂ්‍ය සමූහයා කෙරෙහි උතුම්වූ ආර්‍ය්‍යපුදගලයන් හා සමග පැවැත්තාවූ; **අතුලං**, සීලාදී ගුණසමූහයෙන් යම්කිසිවෙක් හා සදෘශ කොවන්නාවූ නොහොත් **සීලාදිගුණයන්** හෙතුකොටගෙන තුලාවකට බඳුවූ ඥානය කරණකොට ගෙන යම්කිසිවෙක්හා සදෘශ නොකොටහැකිවූ නොහොත් සීලාදී ගුණයන්ගෙන් තුලාවකට බඳුවූ කාරණයෙන් සදෘශකටයුතුවූ යම්කිසිවෙක් නැත්තාවූ; **සම්මා සම්බුද්ධං**, සඞ්ඛත අසඞ්ඛතාදී වශයෙන් ප්‍රභෙදවත්වූ සියලු ධර්ම සමූහය අවිපරීතකොට සවයම්භූ ඥානයෙන් තමන්වහන්සේම දැනවදලාවූ භාග්‍යවතුන්වහන්සේ නොහොත් අන්‍යාප්‍රතිබොධිතව **තමන්වහන්සේම** වාසනා සහිතවූ මොහනිද්‍රාවෙන් එකාන්තයෙන් පිබිදගියාවූ නොහොත් සුගන්ධරශ්මිසමාගමයෙන් පරම රුචිර ශ්‍රීසෞභාග්‍යයට පැමිණි මෙන් ප්‍රබොධවී ගියාවූ පද්මයක් මෙන් අතීත්මාගීඥාන සමාගමයෙන් අපරිමිත ගුණසමූහයෙන් සැරසුනාවූ සර්ව්ඥතාඥානයට පැමිණීමෙන් **තමන්වහන්සේම අවබොධකොට** වදලාවූ

තථාගතයන්වහන්සේ, අභිවාදිය, අභිවන්දිත්වා, විශෙෂයෙන් නමස්කාරකොට; නොහොත් භය, ලාභ, කුලා, චාරවශයෙන් නොසලකා සම්‍යක් ඥාණවශයෙන් මෙනෙහිකොට ත්‍රිවිධචාරයෙන් විශෙෂයෙන් නමස්කාරකොට; අභිධම්මත්ථසඞ්ගහං, අභිධම්මී සත්ත ප්‍රකරණයෙහි දෙශනා කොට වදාළාවූ; අභිධම්මාවතාරයන් සංක්‍ෂෙප වශයෙන් සඞ්ග්‍රහ කොට රචනා කරණහෙයින් අභිධම්මාවතාර සංග්‍රහ නම්වූ ප්‍රකරණයක්; භාසිස්සං, කථෙස්සාමි, කියන්නෙමි

තත්ථ, තසම්ං අභිධම්මෙ, ඒ අභිධම්ම සත්තප්‍රකරණයෙහි; සඞ්ඛථා, සඞ්ඛ්‍යාපකාරෙ රත්ත, කුශලාදිවූද, සඤ්ඤාදීන්ද, සියලු ප්‍රභෙදයන් කරණකොටගෙණ: තථාගතෙහි, තථාගතයන් විසින්; වුත්තා, වදාරණලද්දාවූ; අභිධම්මත්ථා අභිධම්ම සත්ත ප්‍රකරණයෙහි වදාළාවූ අර්ථයෝ තුන්; පරමත්ථතො, පරමත්ථවසෙ නෙව, නොපෙරලෙන්නාවූ උතුම් සභාවයාගේ වශයෙන්ම නොහොත් උතුම්වූ සම්‍යක්ඥානයට ගොචරවීම් වශයෙන්ම නොහොත් සම්මුති ප්‍රඥප්තිය තබා සම්මුති ප්‍රඥප්තියෙන් වෙන වෙනම උඩරණයකොට ගන්නාලද්දාවූ පරමාර්ථයාගේ වශ යෙන්ම; චිත්තං, විඤ්ඤාණඛන්ධෙෂා, එකුන්අනූවක් චිත්තයයි කියනලද විඥානස්කන්ධයද: චෙතසිකං, වෙදනාදිඛන්ධත්තයං, වෙදනාදීස්කන්ධත්‍රයාගේ සමූහයද, රූපං, භූතොපාදායහෙද භින්නොරූපඛන්ධොා, භූතොපාදාය භෙදවශයෙන් වෙනස්වූ හෙවත් සතරභූතරූපය සුවිසිඋපාදාය රූපය යන ප්‍රභෙදයෙන් වෙනස්වූ රූපස්කන්ධයද; මඟඵලානමාලම්බණභූතො අසඞ්ඛත ධම්මොා, මාර්ගඵලයන්ට අරමුණුවන්නාවූ නිර්‍වාණ සඞ්ඛ්‍යාතවූ අසඞ්ඛතධර්මයද; ඉතිඉම්නාපහෙදෙන, මේ ප්‍රභෙදය කරණකොට ගෙණ; චතුධා, චතුකිආකාරෙහි, සතරාකාරයකින්; සිතා සිපීයාහුය. තත්ථ, තෙසු යථාඋද්දිට්ඨෙසු චතූසු අභිධම්මෙසු, යම් යම් ප්‍රකාරයකින් සංක්‍ෂෙපයෙන් උදෙසන ලද්දාවූ, ඒ සතර කාරවූ අභිධර්මයෙහි දෙශනාතර වදාරණලද්දාවූ අර්ථයන් අතු රෙන්; තාව, පළමුකොට; මයා, මාවිසින්; උද්දිට්ඨං, සංක්‍ෂෙප වශයෙන් දක්වනලද්දාවූ; චිත්තං, චිත්තය තෙමේ; කාමාවචරව, කාමාවචර චිත්තයද; රූපාවචරව, රූපාවචරචිත්තයද; අරූපා වචරව, අරූපාවචර චිත්තයද, ලොකුත්තරව, ලොකොත්තර චිත්තයද; !මේ ච ශබ්දය ලුප්ත නිර්දිෂ්ටයි. ඉතිඉම්නා පහෙදෙන, මේ ප්‍රභෙදයෙන්; චතුබ්බිධං මහාති, සතරවැදෑරුම්වේ, තත්ථ තෙසු චතූසු චිත්තෙසු, ඒ සතර වැදෑරුම් චිත්තයන් අතු රෙන්; කතමං චිත්තං, කවරචිත්තයක් තෙමේ; කාමාවචරං, කාමාවචරනම් වන්නේද; නොහොත් කාමාවචරං, කාමාවචර චිත්තයතෙමේ; කතමං, කවරයත්;—

සොමනස්සසහගතං, සොමනස්වේදනාව හා එකොත්පාදදී වශයෙන් මිශ්‍රවූ නොහොත් සොමනස්වේදනාවහා එකොත්පාදදීභාවයට පැමිණියාවූ; දිට්ඨිගතසම්පයුත්තං, මිත්‍යාදෘෂ්ටියහා එකොත්පාදදී ප්‍රභේදයෙන් යුක්තවූ; අසඞ්ඛාරිකං, මෙහෙයුම් රහිතවූ; චිත්තං, චිත්තය; එකං, එකෙකි; සොමනස්සසහගතං, සොමනස්වේදනාවහා එකොත්පාදදීවශයෙන් මිශ්‍රවූ නොහොත් සොමනස්වේදනාවහා එකොත්පාදදීභාවයට පැමිණියාවූ; දිට්ඨිගතසම්පයුත්තං, මිත්‍යාදෘෂ්ටියහා එකොත්පාදදීප්‍රභේදයෙන් යුක්තවූ; සසඞ්ඛාරිකං, මෙහෙයුම් සහිතවූ; චිත්තං, චිත්තය; එකං, එකෙකි; සොමනස්සසහගතං, සොමනස්වේදනාවහා එකොත්පාදදීවශයෙන් මිශ්‍රවූ නොහොත් සොමනස්වේදනාවහා එකොත්පාදදීභාවයට ගියාවූ; දිට්ඨිගතසම්පයුත්තං, මිත්‍යාදෘෂ්ටියහා යුක්තනොවූ; අසඞ්ඛාරිකං, මෙහෙයුම් රහිතවූ; චිත්තං චිත්තය; එකං එකෙකි; සොමනස්සසහගතං, සොමනස්වේදනාවහා එකොත්පාදදීවශයෙන් මිශ්‍රවූ නොහොත් එකොත්පාදදීභාවයට ගියාවූ; දිට්ඨිගතවිප්පයුත්තං, මිත්‍යාදෘෂ්ටියහා යුක්තනොවූ; සසඞ්ඛාරිකං, මෙහෙයුම් සහිතවූ; චිත්තං, චිත්තය; එකං එකෙකි; උපෙක්ඛාසහගතං, උපෙක්ෂාවේදනාව හා එකොත්පාදදීභාවයෙන් මිශ්‍රවූ නොහොත් උපෙක්ෂාවේදනාව හා එකොත්පාදදීභාවයට ගියාවූ; දිට්ඨිගතසම්පයුත්තං, මිත්‍යාදෘෂ්ටියහා එකොත්පාදදීභාවයෙන් යුක්තවූ; අසඞ්ඛාරිකං, මෙහෙයුම් රහිතවූ; චිත්තං, චිත්තය; එකං, එකෙකි; උපෙක්ඛාසහගතං, උපෙක්ෂාවේදනාව හා එකොත්පාදදීභාවයෙන් යුක්තවූ; සසඞ්ඛාරිකං, මෙහෙයුම් සහිතවූ; චිත්තං, චිත්තය; එකං, එකෙකි; උපෙක්ඛාසහගතං, උපෙක්ෂාවේදනාව හා එකොත්පාදදීවශයෙන්, මිශ්‍රවූ නොහොත් උපෙක්ෂාවේදනාව හා එකොත්පාදදීභාවයට ගියාවූ; දිට්ඨිගතවිප්පයුත්තං, මිත්‍යාදෘෂ්ටියහා නොයෙදුනාවූ; අසඞ්ඛාරිකං, මෙහෙයුම් රහිතවූ; චිත්තං, චිත්තය; එකං, එකෙකි; උපෙක්ඛාසහගතං, උපෙක්ෂාවේදනාව හා එකොත්පාදදීවශයෙන් මිශ්‍රවූ නොහොත් උපෙක්ෂාවේදනාව හා එකොත්පාදදීභාවයට ගියාවූ; දිට්ඨිගතවිප්පයුත්තං, මිත්‍යාදෘෂ්ටිය හා එකොත්පාදදීවශයෙන් මිශ්‍රනොවූ නොහොත් මිත්‍යාදෘෂ්ටියහා එකොත්පාදදීභාවයට නොගියාවූ; සසඞ්ඛාරිකං, මෙහෙයුම් සහිතවූ; චිත්තං, චිත්තය; එකං, එකෙකි; ඉති ඉමිනා පභෙදෙන,; මේ ප්‍රභේදයෙන් අට්ඨ, අටප්‍රකාරවූ ද; ඉමානි චිත්තානි, මේ චිත්තයෝතුමූ; ලොභසහගත චිත්තානි නාම, ලොභසහගතය චිත්තය යන නම් ඇත්තාහු; හොන්ති, වෙත්.

දෙමනස්සසහගතං, දෙම්නස්වෙදනාවහා එකොත්පාදදි වශයෙන් මිශ්‍රවූ නොහොත් දෙම්නස්වෙදනා වහා එකොත්පාදදි භාවයට පැමිණියාවූ; පටිඝසම්පයුත්තං, වෙෂය හා එකොත්පාදදි වශයෙන් මිශ්‍රවූ; අසඞ්ඛාරිකං, මෙහෙයුම් රහිතවූ; එකං, එක් චිත්තයෙකි; සසඞ්ඛාරිකං, මෙහෙයුම් සහිතවූ; චිත්තං, චිත්තය එකං,එකෙකි; ඉති ඉම්නා පභෙදෙන, මේ ප්‍රභෙදයෙන්; වෙපි, විප්‍රකාරදද; ඉමානි චිත්තානි, මේ චිත්තයෝතුමූ; පටිඝසම්පයුත්තචිත්තානි නාම, ප්‍රතිඝසම්ප්‍රයුක්තචිත්තය යන නම් ඇත්තාහු; හොත්හි, වෙත්.

උපෙක්ඛාසහගතං, උපෙක්ෂාවෙදනාවහා එකොත්පාදදි වශයෙන් මිශ්‍රවූ; නොහොත් එකොත්පාදදිභාවයට ගියාවූ; විචිකිච්ඡාසම්පයුත්තං, විචිකිච්ඡාව හා එකොත්පාදදි වශයෙන් යුක්තවූ; චිත්තං, චිත්තය තෙමේ; එකං, එකෙකි; උපෙක්ඛාසහගතං, උපෙක්ෂාවෙදනාවහා එකොත්පාදදි වශයෙන් මිශ්‍රවූ නොහොත් එකොත්පාදදි භාවයටගියාවූ; උඛච්චසම්පයුත්තං, උඛච්චයහා එකොත්පාදදි භාවයෙන් යුක්තවූ; චිත්තං, චිත්තය තෙම්; එකං, එකෙකි; ඉති ඉම්නාපභෙදෙන, මේ ප්‍රභෙදයෙන් වෙපි, දෙවැදෑරුම්වූ; ඉමානි චිත්තානි, මේ චිත්තයෝතුමූ; මොමූහචිත්තානිනාම, මොහමූලිකා චිත්තයෝය යන නම් ඇත්තාහු හොත්හි, වෙත්.

ඉවෙවං, ඉති'එවං යථාවුත්තනයෙන, යම් යම් පරිද්දකින් කියනලද ක්‍රමයෙන්; සොමනස්ස උපෙක්ඛාදිඞිසම්පයොගාදි දෙළොස්අකුශලචිත්තයෝතුමූ; සමත්තානි, සමාප්තාකරණලද්දු හුය. නොහොත් සමත්තානි, සංක්ෂෙපවශයෙන් සංග්‍රහකොට අදීඝන්නාලද්දුහුය.

ලොභමූලානි, ලොභසඞ්ඛ්‍යාත මුල්ඇත්තාවූ; චිත්තානි, චිත්තයෝතුමූ; වෙදනාදි භෙදතො, වෙදනාදි ප්‍රභෙද වශයෙන්; අඤ්ඣා, අෂ්ටප්‍රකාර ඇත්තාහු; සියුං, වන්නාහුය; දෙසමූලානි, වෙෂසඞ්ඛ්‍යාත මුල්ඇත්තාවූ; චිත්තානි, චිත්තයෝද; සඞ්ඛාර භෙදතො, සංස්කාරප්‍රභෙදයෙන්; විධා, විප්‍රකාරවූවාහු; සියුං, වන්නාහුය; මොහමූලානි, මොහසහගත මුල්ඇත්තාවූ; චිත්තානිව, චිත්තයෝද; සම්පයොගභෙදතො, සම්ප්‍රයොගභෙද වශයෙන්; වෙ, විප්‍රකාරවූ ඛාහු; සියුං, වන්නාහුය; ඉති, මෙසේ; අකුශලා, අකුසලභූතානි, අකුශල්නම්වූ හෙවත් අකුශල සභාව ඇත්තාවූ; චිත්තානි, චිත්තයෝතුමූ; වාදස, වාදසඑව, දෙළොස් දෙනෙක්ම; සියුං, වන්නාහුය; තතො, ඒ දෙළොස්දෙනා කෙරෙන් අඩුවූහෝ නොහොත් දෙළොස්දෙනාකෙරෙන් වැඩිවූ හෝ; ඌනාධිකානි, ඌනාධිකවූවාහු; න සියුං, නොවන්නාහුය;

මෙහි භාවාර්ථ.

අභිධම්මාදී සංග්‍රහයෙහි උද්දෙශ ගාථාවෙහිවූ "**තත්‍රවුත්තානි ධම්මත්තා**" යනාදී ගාථාවෙහි භාවය කෙසේදයත්? "වුත්තා" යන පදයට "**කුසලාදිවසෙන බඛ්ඛාදිවසෙන**" යනුවෙන් ටීකාවෙහි කුමක්හෙයින් අර්ථවණ්නා කෙළේදයත්? අභිධම්ම සඞ්ගහප්‍රකරණ යන් අතුරෙන් ධම්මසඞ්ගණිප්‍රකරණය සඳහා "කුසලාදිවසෙන" යනුද විභඞ්ගප්‍රකරණය සඳහා බඛ්ඛාදිවසෙන යනුද කීහ. කුමක් හෙයිනයත්? ධම්මසඞ්ගණිප්‍රකරණයෙහි "**කුසලා ධම්මා-පෙ-අඛ්‍යා කතා ධම්මා**" යනුවෙන් කුසලය මූලභූතකොට චිත්තචෛතසික රූප නිබ්බාණසඞ්ඛ්‍යාත සතර පරමාර්ථයන්ගේ ප්‍රභෙද දක්වා වදළහ. විභඞ්ගප්‍රකරණයෙහි "**රූපක්ඛන්ධා-පෙ-විඤ්ඤාණක්ඛන්ධා**" යනුවෙන් රූපමූලභූතකොට චිත්තචෛතසික රූප ධර්ම යන්ගේ විභාගය ප්‍රකාශකොට වදළහ. එහෙයින් 'කුසලාදිවසෙන ඛඛ්ධාදිවසෙන' යනුවෙන් වදළහෙයින් ධම්මසඞ්ගණී. විභඞ්ග යන ප්‍රකරණවය මූලභූතකොටගෙණ එම අර්ථකථාවන්ගේ ව්‍යාම ප්‍රමාණ ප්‍රදේශයෙක්හි විෂයීභූත අර්ථය කතිපයාඞ්ගුලිමාත්‍රයක සංග්‍රහකිරීම් වශයෙන් අනුරුඬාචාර්යන් වහන්සේ විසින් මේ අභිධම්මාදී සංග්‍රහ නම්වූ අඩඞ්ගුල්‍යාදීකථාසංග්‍රහව රචනා කරණ ලද්දේසි. අභිධම්මසඞ්ග ප්‍රකරණයෙහි දෙශනාකරණලද්දාවූ සියලු අර්ථයන් පරමාර්ථයයි ව්‍යවහාරකෙරෙයි. කුමක්හෙයින් පරමාර්ථ වන්නේදයත්? "පරමෝ අත්ථෝ අවිපරීතොති-පරමත්ථෝ," යනු නිර්වචන බැවින් නොපෙරළීමෙන් උතුම්වූ හෙයින් පරමාර්ථයම වන්නේයි. නොපෙරළීමෙන් උතුම්වූ අර්ථය නොසලකා උත්ත මාර්ථයෙන්ම පරමාර්ථයයි ගත්තේනම් භාග්‍යවතුන්වහන්සේ විසින් "අභිධම්මාතෘකාව" වදාරණ සමයෙහි "**ඛීනාධම්මා මජ්ඣිමා ධම්මා පණීතා ධම්මා**" යනුවෙන් වදළාවූ හීනත්‍රිකයෙහි හීනධර්ම ශෝභන දෙළොස්අකුශල චිත්තයෝය. ඒ දෙළොස් අකුශල චිත්තයෙහි ගෙදුනාවූ සත්විසිචෛතසිකයෝය යන මෙතෙක් ධර්මයෝ ලැබෙත්. ඒ ධර්මයෝ උත්තමාර්ථයෙන් පරමාර්ථයයි ගතහොත් සතරඅපායෙහි උපදවන්නාවූ ධර්මයෝද උතුම්වූ පරමාර්ථ ධර්මයෝය යන දෙඅප්‍රසඞ්ගය පැමිණෙන්නේයි. එහෙයින් ඒ දෙළොස් අකුශල චිත්තයෝ විපාක දීම් වශයෙන් උත්තමය හීනය යන විශෙෂය කල්පණා නොකොට නාම වශයෙන් අවිපරිතවන සභාව වශයෙන් උත්තමනම්වෙයි කීයේයි, කුමක් හෙයින් නාම වශයෙන් විපරීත නොවන්නේදයත්? ඒ පරමාර්ථ තෙමේ ප්‍රඥප්තියමෙන් නොවෙයි, ප්‍රඥප්තිය වනාහි තාවූසඞ්ඛ්‍යා

තවූ වසතුව වනාහි යම්කිසි උපකරණයක් සදනු පිණිස කම්කරු වන්ට දුන්කල්හි ඔවුන් විසින් පහන් පහ්ක්කම් ආදිවූ යම්කිසි භාණ්ඩයක් නිපදවූකල්හි ඒ තාමූ යන නාමය පෙරළී පහන් පහ්ක්කම් ආදිවූ නාම ලැබෙයි ඒ පහන්පහ්ක්කම් ආදී භාණ්ඩ යන් කැඩී බිඳීගිය කල්හී නැවතත් උදුනෙහි දමා විරිගිය කල්හි පහන් පහ්ක්කම් යන ප්‍රඥප්තිය විනාශවී තාමූ යන ප්‍රඥප්තියට පැමිණේ පරමාර්ථය වනාහි එසේ නොවෙයි. මනුෂ්‍ය සන්තානයෙහි විද්‍යමානවූ ලොභය ලොභනම් වෙයි. සුනඛසන්තානයෙහි විද්‍යමානවූ ලොභය දෝසනම්වෙයි, මෙසේ පෙරළීමෙක් නොවෙයි, කවර පුද්ගලයෙකුගේ සන්තානයෙහි වුවත් අරමුණෙහි ඇලෙන්නාවූ සවභාව ඇති ලොභය ලොභනම්වෙයි, මෙසේ විකාරනොවෙන්නාවූ නම් වශයෙන් නොපෙරළෙන්නේයයි කිහ. හෙවත් මනුෂ්‍ය සන්තානයෙහි විද්‍යමානවූ ලොභය සතර අපා දුක ඵලවන්නාක්මෙන් සියලු සත්ත්වයන්ගේ සන්තානයෙහිම විද්‍යමානවූ ලොභය තෙමේ අනිෂ්ට විපාක ඵලවන්නේමවෙයි. මෙසේ තමාගේ සවභාව නොපෙරළීමෙන් උතුම්වන හෙයින් පරමාර්ථ නම්වෙයි. මේ පරමාර්ථ ශබ්දයාගේ නිරුක්තියාය විකෘති යයි. පඨීයාය විග්‍රහය මෙසේයි. "පරමස්ස සබ්බඤ්ඤුත ඤාණස්ස ගොචරෝ අත්ථෝ පරමත්ථෝ"යනුයි. භාග්‍යවත්වූ සම්මැදියන් වහන්සේට අරමුණු වනහෙයින් නොහොත් සම්මැදිතාඥානයෙන් ම මේ ධර්මවිනය දතයුතු හෙයින් පරමාර්ථ නම්වෙයි. එසේහත් කල්හි මධ්‍ය පදලෝප සමාසවශයෙන් කලපණා කටයුතුයි. පරමාර්ථයෙන් අන්‍යවූ ප්‍රඥප්ති ධර්මය තථාගතයන්වහන්සේට අරමුණු නොවන්නේදයත් ? අරමුණු වන්නේමැයි. කුමක්හෙයින් පරමාර්ථ ධර්මයම විශෙෂ වශයෙන් සම්මැදිතාඥානයට ගොචර වන්නේයයි කියේදයත් ? සම්මැදිතාඥානයට ප්‍රඥප්තිධර්මය අරමුණුවන්නේනමුදු අප්‍රකටවෙයි. පරමාර්ථ ධර්මයම ප්‍රකට වශයෙන් අරමුණු කරණ හෙයින් උතුම්වූ සම්මැදිතාඥානයට අරමුණුවන ධර්මය නිසයි. ඊට උපමා කවරයත් ? "පඞ්කජාතං පඞ්කජං' "මණ්ඩූකරවනීති මයූරෝ"යනාදී උදාහරණයෙහි මැඩෙහිහටහන්නා බැවින් පඞ්කජයයි නොයෙක් වස්තූන්ට සාධාරණවූ නාමය එකම පද්ම විශෙෂයෙහි ආරොපණයකොට ව්‍යවහාර කරන්නාක්මෙන්ද, පොළොවෙහි ශබ්දකරණ අඳීයෙන් මයුරනම් වෙයි. ඒ මයුර ශබ්දය නොයෙක් සතුන්ට සාධාරණ වන නමුදු මයුර සඞ්ඛ්‍යාත පක්ෂි විශෙෂයෙහි ආරොපණයකොට ව්‍යවහාර කරන්නාක්මෙන්ද, සම්මැදියන් වහන්සේගේ සම්මැදිතාඥානය පරමාර්ථ ධර්මයෙහි ප්‍රකටව පවත්නාහෙයින්ද, සම්මැදිතාඥානයට

ගොචරවූ ධම්ම යන අර්ථයෙන් පරමාර්ථයයි රූඩිවශයෙන් ව්‍යවහාර කෙරෙත්. චිත්ත චෛතසික රූප සඞ්ඛ්‍යාත ධර්මයෝතුමූ ප්‍රඥප්ති ධර්ම නම්වෙයි, ඒ ප්‍රඥප්තීන් අතුරෙන් ඒ පුද්ගලතෙම් ලොහසහගතවෙයි. ඒ ලොභයෙන්ද අසඞ්ඛාරික සිත්වෙයි. සසඞ්ඛාරික සිත්වෙයි යනාදීන් පෘථග්ජනයන් විසින් නොදත යුත්තේය. නොදැක්ක යුත්තේය. තථාගතයන් වහන්සේගේම සර්වඥතාඥානයට ඒ අර්ථය ගොචරවෙයි. නොහොත් සම්මුති ප්‍රඥප්තීන් කෙරෙන් සර්වඥතාඥානය වෙක්කොට නිදර්ශන කට යුතුහෙයින් පරමාර්ථයයි ව්‍යවහාරකෙරෙයි ඒ කෙසේමෙනෙහි කටයුතු වන්නේදයත්? විභාර ප්‍රාසාද ගෘහාදිය සම්මුති ප්‍රඥප්ති යයි ව්‍යවහාර කෙරෙති, ඒ සම්මුති ප්‍රඥප්ති සඞ්ඛ්‍යාතවූ විභාරාදියෙහි ඇත්තාවූ ධර්මය නම් අර්ථනිෂ්ඨාගතඥාඛ්‍යාත රූපමාත්‍රයකි. ඒ රූපය යන ව්‍යවහාරය කිසිකලෙකත් විපරීත නොවෙයි, මනුෂ්‍ය සඞ්ඛ්‍යාත ප්‍රඥප්තියෙහි විද්‍යමානවූ චිත්ත චෛතසික රූප සඞ්ඛ්‍යාත ධර්මයෝතුමූ පරමාර්ථනාම්වෙයි. ඒ පරමාර්ථ ධර්මතෙමේ ප්‍රභෙද තැත්තේද යන වොදනා වමෙනෙහි කොට 'චතුබ්බිධං" යනු කීහ. එහි අභිප්‍රාය චිත්තචෛතසික රූපනිර්වාණ සඞ්ඛ්‍යාතවූ සතරාකාරවූ අර්ථය පරමාර්ථ නම් වෙයි යනුයි. ඒ සතර පරමාර්ථයන් අතුරෙන් උතුම්වූ නිර්වාණ ධර්මය ආදියෙහි නොයොදා, අවසානයෙහි කුමක්හෙයින් යෙදූසේක්ද යත්? ඒ ඒ චිත්ත චෛතසිකයන්ගේ නිරෝධය නිර්වාණ ධර්මාව බොධයෙන් වන්නේයයි යන අර්ථය හඟවනු පිණිස අවසාන යෙහි යොදනලද්දේයයි දතයුතුයි. ඉදින් නිර්වාණ ධර්මය ආදියෙහි යෙදූසේක්විනම් චිත්ත චෛතසික රූප ධර්මයෝතුමූ නොවිය යුත්කාහුය. එහෙයින් නිර්වාණධර්මය ආදියෙහි නොයොදා, අවසානයෙහිම යොදනලද්දේයි. නිර්වාණධර්මය වනාහි සියලු ධර්මයන්ගේ නිරොධසථානයවන හෙයින් අවසාන යෙහි තබනලද්දේයයි කියේනම් එසේ කියනසේක්වා. රූපය ආදියෙහි තබා චිත්ත චෛතසික නිර්වාණධර්මයෝ අවසානයෙහි තබා ගාථාව රචනා කෙළේවිනම් නිර්වාණය අවසානයෙහි යෙදෙන්නේවෙයි. නාමධර්මයෝ තුන්දෙන එකසම්බන්ධයෙන් කැබියයුතු නොවේදැයි ප්‍රශ්න කටයුතුවෙයි. එසේකැබූ කල්හි මූලභූතවූ විභඞ්ග ප්‍රකරණය සඳහා 'ඛන්ධාදිවසෙන"යනු කීහ. ඒ විභඞ්ග ප්‍රකරණයද "රූපක්ඛන්ධෝ"යනාදීන් රූපය ආදියෙහි තබා දෙශනා කළහෙයින් මේ ප්‍රකරණයද ඒ විභඞ්ග ප්‍රකරණයට අනුව රූපය ආදියෙහි තබා දෙශනා නොකොට ධම්මහදය ප්‍රකරණය නිශ්‍රය කොටගෙණ චිත්තචෛතසික ධර්මවල

ආදියෙහි තබා විභඞ්ග ප්‍රකරණය ආශ්‍රය කොටගෙණ තදනන්තරව රූපය තබා මේ ප්‍රකරණය වෙනාකෙළේයයි දතයුතුයි. තවද ධම්මසඞ්ගණී ප්‍රකරණය වනාහි අභිධම්ම සප්ත ප්‍රකරණයාගේ මූලයක්මෙන්ද, විභඞ්ග ප්‍රකරණය වනාහි ශාඛාවක් මෙන්ද, වනාහෙයින් ඒ මූලභූතවූ ධම්මසඞ්ගණී ප්‍රකරණය ආදියෙහි තබා "චිත්තං චෙතසිකං" යන පදයද ශාඛාවකට බඳුවූ විභඞ්ග ප්‍රකරණය තදනන්තරව තබා "රූපං"යනුද යොදා මේ ප්‍රකරණය රචනා කෙළේයයි දතයුතුයි. "චිත්තං චෙතසිකංරූපං නිබ්බානං"යන උද්දෙශ ගාථාවෙහි "චිත්තං" යන්නට සිතයයි අර්ථනොදී "චිත්තං ඒසඞ්ඛණිකඤ්ඤෝ"යනු කුමක්හෙයින් අර්ථ වණ්ණනා කෙළේදයත්? "චිත්ත" ශබ්දතෙමේ විචිත්‍රාර්ථය, චිත්‍ර කර්මනාමය, චිත්‍රනම් නක්ෂත්‍රය, චිත්‍රනම් වෘෂභයාය. චිත්‍රනම් ගෘහපතියාය, චිත්‍රනම් උද්‍යානයයන මෙතෙක් අර්ථයෙහි පවත්නා හෙයින් ඒ අර්ථයෙන් වලක්වා ආලම්බණ විජානනස්වභාව ඇත්තාවූ චිත්තයෙහි පවත්නා බව හඟවන පිණිස ,,විසඞ්ඛණිකඤ්ඤෝ"යනු කීහ. ඒ විසඞ්ඛණිකඤ්ඤ පදයෙන් විචිත්‍රාර්ථය යනාදී අවශෙෂ අර්ථයන් වලක්වයි. "චෙතසිකං" යන පදයෙහි චෛතසිකයයි අර්ථනොදී "වෙදනාදී ඛන්ධත්තයං"යී කුමක් හෙයින් අර්ථවණ්ණනා කෙළේදයත්? නිශ්‍රය නිශ්‍රිත දෙදෙනා අතුරෙන් චිත්තය නිශ්‍රය නම්වෙයි. චෛතසිකය නිශ්‍රිත නම් වෙයි. ඒ නිශ්‍රිතවූ චෛතසිකය වනාහි සිත හා එක්ව උපදනා හෙයින් චෛතසික නම්වේයි අර්ථගන්නා කල්හි "ජාණන්තමෙව සම්පඨාපෙති"යන වචනය සවන පරිච්ඡේදයෙහි කීහෙයින් සිත හා එක්ව උපදනාවූ චිත්තජ රූපයද, චිත්තයාගේ උත්පාදක්ෂණයක් පාසා උපදනා හෙයින් චෛතසිකයන්ට ඇතුලත්වෙයි. මෙසේ චෛතසිකය යන පරනාමධෙයයක් ඇත්තාවූ චිත්තජ රූපය චෛතසිකය ගන්නාහෙයින් ඒ චිත්තජරූපය වලක්වනු පිණිස "වෙදනාදී ඛන්ධත්තයං"යී අර්ථවණ්ණනාකෙළේය. "රූපං" යන්නට රූපයයි අර්ථනොදී "රූපං භූතොපාදය හෙදඤ්ඤෝ රූපක්ඛන්ධෝ"යයි කුමක්හෙයින් අර්ථවණ්ණනා කෙළේදයත්? ප්‍රිය වඩන්නාවූ මනවඩන්නාවූ සවරූපයද, "පියරූපං සාතරූපං' යනුවෙන් ව්‍යවහාර කෙරෙති. විකාරවීම ලක්ෂණකොටඇත්තාවූ භූතරූපය උපාදය රූප වශයෙන් ඕප්‍රකාරවූ රූපසඤ්ඤයද මෙම රූපශබ්දයෙන් වාචකවෙයි එහෙයින් "පියරූපං සාත රූපං" යන රූපය වලක්වන පිණිස "භූතොපාදය හෙදඤ්ඤෝ රූපක්ඛන්ධෝ" යනුවෙන් අර්ථවණ්ණනා කෙළේයි. "නිබ්බානං" යන්නට නිවනැයි අර්ථනොදී "මග්ගඵලානමාලම්බන භූතෝ

අසඞ්ඛතධම්මෝ" යනුවෙන් කුමක්හෙයින් අර්ථ වණ්ණනා කෙළේද යත්? මේ "නිබ්බාණ" ශබ්දය තෙමේ සන්සුන්වීමට ඇත්තාවූ ප්‍රත්‍යයද, හෙවත් එකොළොස්ගිනිනිවීමට හෙතුවූ උපාදඤ්ඤ හඞ්ගයන්ගෙන් විරහිතවූ නිර්‍වාණ ධර්‍මයද, උපාදඤ්ඤ හඞ්ගයන්ගෙන් විරහිතවූ ප්‍රඥප්තියද, උපාදඤ්ඤ හඞ්ගයන්ගෙන් විරහිතවූ බැවින් නිර්‍වාණනම් වේදෝහෝයි යන චෝදනාව වලක්වන පිණිස මාර්‍ගඵලයන්ට අරමුණු වන්නාවූ නිර්‍වාණ ධර්‍මයම ගන්න. පිණිස ප්‍රඥප්තිය නොගන්නා පිණිස **"නිබ්බාණං -පෙ- අසඞ්ඛත ධම්මෝ"** යනුවෙන් අර්ථවණ්ණනාකෙළේය. **"නිබ්බාණං මග්ගඵලාන මාලම්බන භූතං"** යන මාත්‍රයක්කී පමණකින් අභිප්‍රේතාර්‍ථය නොලැබෙන්නේද "අසඞ්ඛත ධම්මෝ"යන පදය කුමක්හෙයින් කියන ලද්දේද යත්? "නිර්‍වාණය" යනු තෘෂ්ණාවෙන් වෙන්වූ හෙයින්ද තෘෂ්ණාවෙන් වෙන්වීමට ප්‍රත්‍යයවූහෙයින්ද නිර්‍වාණයයි කියත්. ඉදින් තෘෂ්ණාවෙන් වෙන්වූ මාත්‍රයකින් නිර්‍වාණයයි කියන්නේනම් අර්‍හත්මාර්‍ග අර්‍හත්ඵලයෝද තෘෂ්ණාවෙන් වෙන්වූවාහුය. තෘෂ්ණාවෙන් වෙන්වීමට කාරණත්වෙයි. කම් චිත්ත ඍතු ආහාර සඞ්ඛ්‍යාතවූ සතර ප්‍රත්‍යයන් විසින් සකස් කරණලද්දාවූ අර්‍ථයම් මාර්‍ග ඵලයන්ට ඇතිහෙයින් අසඞ්ඛත ධර්‍මයයි නොකියත්. සඞ්ඛත ධර්‍මයෝමවෙත්. නිර්‍වාණය වනාහි තෘෂ්ණාවෙන් නික්ම ගියේය. තෘෂ්ණාවෙන් නික්මීමට කාරණත් වෙයි. එනකුදුවුවත් කම් චිත්ත ඍතු ආහාර සඞ්ඛ්‍යාත සතර ප්‍රත්‍යයන් විසින් නොසකස්කළ බැවින් අසඞ්ඛත ධර්‍ම නම් වෙයි. අර්‍හත්මාර්‍ග අර්‍හත්ඵලයෝ තුමූ අසඞ්ඛත නොවෙත්. සඞ්ඛතම්වෙත්. එහෙයින් අර්‍හත්මාර්‍ග ඵලයෝ තුමූ තෘෂ්ණාවෙන් නික්මීමට කාරණාවුවද තෘෂ්ණාවෙන් නික්ම ගියේත්වේද, එනකුදුවුවත් නිර්‍වාණනම් නොවෙත්. ඒ අර්‍හත් මාර්‍ග ඵලයන් වලක්වන පිණිස "අසඞ්ඛත ධම්මෝ" යනු කීහ. මැදුම් සඟියෙහි රාධ සූත්‍රයෙහි අර්‍හත්මාර්‍ග ඵලයෝද නිර්‍වාණයයි ව්‍යවහාරකෙරෙත්. එනකුදුවුවත් සතරවන පරමාර්‍ථයවූ අසඞ්ඛත ධාතු සඞ්ඛ්‍යාත නිර්‍වාණය ඒ මාර්‍ග ඵලයන්ට අරමුණුවන්නාවූ ධර්‍මයවෙයි දතයුතුයි. ඒ සතර පරමාර්‍ථයන් පළමුකොට වදාළේදැයි යන චෝද්‍යය සඳහා "තාව චිත්තං" යන වචනය කීහ. ඒ වචනයාගේ අභිප්‍රාය නම්:- චෛතසිකාදීන්ට පූර්‍වයෙහි චිත්තය කියේය යනුයි. ඒ චෛතසිකාදීන්ට පූර්‍වයෙහි දක්වනලද්දාවූ චිත්තය තෙමේ ප්‍රභේදයක් නැත්තේදැයි යන චෝද්‍යය සඳහා" චතුබ්බිධං" යනවචනය කීහ. එහි අභිප්‍රාය නම්:-ඒ චිත්තය වනාහි සතරාකාරවන්නේය

යනුයි. නොකොත් "වතුබ්බිධං" යන සඞ්ඛ්‍යාවගේ සඞ්ඛෙය වනාහි කෙසේදැයි යන චොදනය සඳහා "**කාමාවචරං රූපාවචරං අරූපාවචරං ලොකුත්තරං**" යනා පාඨය කීහ. ඒ පාඨයාගේ අභිප්‍රායනම්:- කාමාවචර චිත්තය, රූපාවචර චිත්තය, අරූපාවචර චිත්තය, ලොකුත්තර චිත්තයයි සතරාකාර වන්නේය යනු භාවයි ඒ සතරාකාර චිත්තය අතුරෙන් පළමුවන චිත්තය කුමක්හෙයින් කාමාවචර වන්නේද යත්? "කාමෙ අවචරතීති කාමාවචරං" යනු නිර්වචන බැවින් කාමාවචර භූමියෙහි බොහෝසෙයින් හැසිරෙන බැවින් කාමාවචරයයි කියත්. කාම භූමියෙහි හැසිරෙන හෙයින් කාමාවචර නම්වූ චිත්තය රූපාරූප භූමියෙහිත් නොහැසිරෙන්නේදයත්? සවලප වශයෙන් රූපාරූප භූමියෙහිද කාමාවචර චිත්තය හැසිරෙන්නේමැයි ඒ චිත්තය තෙමේ රූපා රූප භූමියෙහි සවලප වශයෙන් හැසිරෙන නමුත් කාමාවචර නාමය අත්නොහරිමැයි. ඊට උපමා කවරයත්? වනයෙහි ඇවිද උරු මූව හොණදී සිව්පාවන් මරා ජීවත්වෙන වැදි තෙමේ බොහෝසෙයින් වනයෙහි හැසිරෙන බැවින් වනචරක යයි ව්‍යවහාර කරණු ලැබෙයි. එතකුදු වුවත් ඒ වැදි පුරුෂ තෙම කලින් කල නගර ග්‍රාමාදියෙහි හැසිරෙන කල්හිද වනචරක නාමය අත්නොහරිමැයි. එපරිදිදෙන්ම රූපාරූප භූමියෙහි මදවශයෙන් හැසිරෙන්නාවූ මේ කාමාවචර චිත්තය කාමාවචර නාමය අත්නොහරියි. තවද යුඩභූමියෙහි හැසිරෙන්නාවූ හස්ති සමූහයා අතුරෙන් අතිශයින් දක්ෂවූ හස්ති තෙමේ සඞ්ඝාමාවචරයයි ව්‍යවහාර කරණු ලැබේ. එතකුදුවුවත් ඒ හස්තිතෙමේ නගර ග්‍රාමාදියෙහි හැසිරෙන කල්හිද සඞ්ඝාමාවචර නාමය අත්නොහරියි. එපරිදිදෙන්ම රූපාවචර භූමියෙහි මද වශයෙන් උපදනාවූ කාමාවචර චිත්තය කාමාවචර නම අත් නොහරියි. තවද දියෙහි හැසිරෙන්නාවූ හංස තෙමේ ජලචර යයි ව්‍යවහාර කරයි. එතකුදුවුවත් ඒ හංසතෙමේ ගොඩ භූමි යෙහිද හැසිරෙයි. එසේවුවත් ජලචර නාමය අත්නොහරියි. එපරිදිදෙන්ම රූපා රූප භූමියෙහි මදවශයෙන් උපදනාවූ මේ කාමාවචර චිත්තය තෙමේ කාමාවචර නම අත්නොහරිමැයි. **ලොකොත්තර චිත්තය** වනාහි කවර අර්ථයකින් ලොකොත්තර දැයි ව්‍යවහාරකරන්නේද යත්? "ලොකතෝ උත්තරතීති ලොකු ත්තරෝ" යනු නිර්වචන බැවින් ලොකය එතරකරණ අර්ථයෙන් ලොකුත්තර නම්වෙයි. ඒ ලොකය තෙමේ සඞ්ඛාර ලොකය සත්ව ලොකය, ඔකාසලොකයයි තුන්වැදෑරුම්වේ. ඒ ත්‍රිවිධ ලොක යෙන් එතරවන අර්ථයෙන් ලොකොත්තරයයි ව්‍යවහාරකරයි,

"සඞ්ඛාරලොකය" යනු උපපාද, ඨිති, භඞ, සඞ්ඛ්‍යාතවූ ත්‍රිවිධ ලක්ෂණයන් අතුරෙන් භඞ්ගාභිමුඛ අවසථා තොමෝ සඞ්ඛාර ලොකයයි කියත්. සත්වලොකය යනු එක්තිස් භූමියෙහි උපද නාවූ නරක තිරිසන් ප්‍රේත අසුර දිව්‍ය බ්‍රහ්මාදී සත්වයෝ සත්ව ලොක නම්වෙයි. ඔකාසලොකය යනු ඒ එක්තිස් භූමියයි. එහෙයින් ලොකොත්තර චිත්තය වනාහි මේ ත්‍රිවිධ ලොකයෙන්ම එතර කරයි. එහෙයින් ලොකොත්තරයයි ව්‍යවහාරකරත්. එතර වීමට කාරණාවූහෙයින්ද, එතරවූ ධර්මයද, ලොකුත්තරයයි ව්‍යව හාරකරත්නම් හෙවත් රාග ද්වේෂ මොහාදී කෙලෙස් නැසීමෙන් ලොකය එතරකරණහෙයින් ලොකුත්තරවන්නේ නම් කාමා වචර මහග්ගත ධර්මයෝද, තදඞ්ග ප්‍රහාණ විෂ්කම්භන ප්‍රහාණවශ යෙන් කෙලෙස් නැසීමට හෙතුවෙයි. එහෙයින් ඒ කාමාවචර මහද්ගත ධර්මයන්ට ලොකුත්තරයයි ව්‍යවහාර නොකොට මේ සතරමග ඵල චිත්තයන්වම ලොකුත්තර නාමය කුමක්හෙයින් ව්‍යවහාරකෙළේද යත්? කාමාවචර මහද්ගත කුශලයෝ තුමූ තදඞ්ග විෂ්කම්භණාදීවශයෙන් කෙලෙස් නසත්මැයි. එතකුදු වුවත් හෙතු ඵල දෙදෙනාගේ සම්බන්ධය ඉතා දුරවෙයි. ලොකොත්තර ධර්මයෝ වනාහි එසේ නොවෙත්. හෙතු ඵල සම්බන්ධය අතිශයින් ලන්ව පවතිත්. එහෙයින් ලොකොත්තර චිත්තයෝම වෙනම උඩරණයකොට ලොකය එතර කාරන්නාහුයයි කීවාහුය. ඒට උපමා කවර යත්? භාග්‍යවතුන්වහන්සේ වනාහි සච්චයමක යෙහි අනාගත පුද්ගලවාර දෙශනාකරන්නාවූ අතීතමාගීය යම් පුද්ගලයෙකු විසින් ලබන ලද්දේනම් ඒ පුද්ගලයාගේ විභඞ්ග වාරයෙහි උඩරණයකරන්නාහු "යස්ස විභඞ්ගස්ස අනාගතං අග්ග මග්ගං පරිලභිස්සති" යනුවෙන් අතීතමාගීයට පූර්භාගයෙහිවූ වොදාන චිත්තයෙන් සම්පූර්ණවූ අනාගාමී ඵලය උඩරණයකොට දෙශනාකෙළේයි. ඒ අනාගාමී පුද්ගල තෙමේ අතීතමාගීය ලබ න්නේනොවෙයි. පශ්චිම භවික පුද්ගල තෙමේද අතීතමාගීය ලබන්නේමැයි. එතකුදුවුවත් විභඞ්ගවාරයෙහි ඒ පශ්චිමභවික පුද්ගලයා උඩරණය නොකොට අනාගාමී පුද්ගලයාම උඩරණය කොට සච්චයමකය වදාළේයි. ඒ පුද්ගලයා වනාහි "යස්ස මග්ගං පරිලභිස්සති" යනුවෙන් විභඞ්ගවශයෙන් මාගීය ලබන්නාවූ පුද්ගලයාම උඩරණයකොට දෙශනාකෙළේයි. එපරිද්දෙන්ම ලෞකික කුශලයන් නොවදාරාම ලොකොත්තර චිත්තයම ත්‍රිවිධ ලොකය එතරකිරීමට හෙතුයයි දෙශනාකෙළේයි. මේ වනාහි සූත්‍ර ඒකාන්තයන්ගේ විශෙෂාර්ථයි.

ආයුෂ්මත්වූ අනුරුඬාචාරීන්වහන්ස! **සතරාකාරයයි** කිය නලද චිත්තයන් අතුරෙන් කවර චිත්තයක් පළමුකොට දක්වන ලද්දේදැයි යන වොදාය සඳහා **"තත්ථ කතමං කාමාවචරං"** යනපාඨය කීහ. ඒ පාඨයෙහි අභිප්‍රාය නම්:-**සුපණස්** කාමාවචර චිත්තය කවරේද යනුයි. මේ **"තත්ථ කතමං"** යන පාඨය ආචාර්‍ය්‍ය අනුරුඬ මහාසාමිපාදයන් විසින් මේ ප්‍රකරණයෙහි නොදක්වන ලද්දේය. ඊට හෙතු කවරේද යත්? විභාවනී ටීකාවෙහි වනාහි සඞ්ග්‍රහයෙහි ආවාවූ සියලු පදයන්ගේ ක්‍රමයෙන් අර්‍ථ වණ්ණනා කෙරෙති. එතකුදුවුවත් පළමු අර්‍ථවණ්ණනා කළ පදයක් නැවත අර්‍ථ වණ්ණනානොකිරීම අර්‍ථකථා ටීකාචාරීන්ගේ සවභාව ධර්‍මයක්වෙයි. එතකුදුවුවත් මේ **"තත්ථකතමං"** යන පදය විභාවනී ටීකායෙහි වණ්ණනා නොකළ බැවින් විභාවනීටීකාවෙන් මෑත භාගයෙහි යම්කිසිවෙකු විසින් ඇතුලත්කරණලද වචනයකැයි හැගේ. ඒ **සුපණස්** ප්‍රකාරවූ කාමාවචර චිත්තයන් අතුරෙන් නොහොත් **දෙළොස්** අකුශල්ය, අටළොස් **අ**හෙතුක චිත්තය, **සුවිසි** කාමාවචර **සෝ**භන චිත්තය, යන මොවුන් අතුරෙන් අකුශල චිත්තය දක්වනලද්දේය. ඒ අකුශල චිත්තය **කෙ**තෙක් ප්‍රකාරවන්නේදැයි යන වොදාය සඳහා **දෙ**ළොස් ප්‍රකාරයයි කීහ. ඒ **දෙ**ළොස් ප්‍රකාරවූ චිත්තයන් අතුරෙන් ලොභ මූලික චෙෂ මූලික මොහ **මූ**ලික චිත්තයන්ගේ වශයෙන් මූල භෙද යෙන් ත්‍රිවිධාකාරවෙයි. ඒ ත්‍රිවිධාකාර චිත්තයන් අතුරෙන් කවර චිත්තයක් පළමුකොට දක්වනලද්දේද යත්? චෙෂ මූලික මොහ මූලික චිත්තයන්ට පූර්‍වභාගයෙහි ලොභ මූලික චිත්තය දක්වන ලද්දේයයි කිනියැයි. ලොභ මූලික චිත්තය පළමුකොට නොදක්වා චෙෂ මූලික මොහ මූලික චිත්තයන් පළමුකොට ඇමක්හෙයින් නොදක්වන ලද්දේද යත්? ලොභය වනාහි සියලු සත්වයන්ගේ පටිසන්ධිචිත්තයට අනතුරුව භවාඞ්ග සිත් පසළොසක් හෝ සොළසක් හෝ තදනන්තරව මනොවාරාවජ්ජන චිත්තය ඉපිද තමා උපන් භවයට ඇලුම්කිරීම්වශයෙන් මේ ලොභ මූලික සිත් අටදෙනා අතුරෙන් යම්කිසි චිත්තයක් භවනිකාන්ති ජවන වශ යෙන් සත්වරක් ඉපිද නිරුඬවේ. අව්චිමහානරකයෙහි උපන් සත්වයාගේ පටන් නෙවසඤ්ඤා නාසඤ්ඤායතන සඞ්ඛ්‍යාත භවා ග්‍රයෙහි උපන්නාවූ සත්වයාහටද පළමුකොට ඒපි චිත්තවශයෙන් මේ ලොභ මූලික චිත්තය ඉපදීම සවභාව ධර්‍මයක්වේ. මෙසේ භව යෙහි උපදනා සත්වයන්ට පළමුකොට ලොභ ජවනයම උපදනා හෙයින් මේ ප්‍රකරණයෙහිද චෙෂ මූලික මොහ මූලික චිත්ත ශන්ට පූර්‍වභාගයෙහි ලොභ මූලික චිත්තයම දක්වනා ලද්දේයි.

ලොභ මූලික චිත්තයට අනතුරුව වෙෂ මූලික චිත්තය කවර අවීථියක් සඳහා දක්වන ලද්දේද යත්? ලොභමූලික චිත්තය "ලොභ මොහ" යන හෙතුවයකින් යුකතවූවාක්මෙන්ම වෙෂ මූලික චිත්තයද "දොස, මොහ" යන හෙතුවයකින් යුකතවෙයි. එහෙයින් හෙතූන්ගේ සමානත්වය කරණකොටගෙණ වෙෂ මූලික චිත්තය තදනතරව දක්වනලදී. මොහ මූලික චිත්තයද දුහෙතුක චිත්තයට අනතුරුව එකහෙතුක චිත්තය දැක්වීම යුකති යුකත බැවින් මොහ මූලික චිත්තවය අවසානයෙහි දක්වනලදී. ඒ ලොභ මූලික චිත්තයද සොම්නස් උපෙක්ෂාවයකින් යුකත හෙයින් කවර වෙදනාවකින් යුකතවූ චිත්තය ආදියෙහි යොදන ලද්දේදැයි යන ප්‍රශනයට පරිහාරවශයෙන් "සොමනසස සහගතං" යනාදිය කීහ. ඒ සොම්නස් උපෙක්ෂාවය අතුරෙන් සොම්නස් වෙදනාව පළමුකොට කුමක්හෙයින් කියනලද්දේද යත්? භාගාවතුන්වහන්සේ විසින් අභිධම් මාතෘකාවෙහි "සුඛාය වෙදනාය සම්පයුත්තාධම්මා" යනුවෙන් සොම්නස් වෙදනාව පළමු කොට වදුළහෙයින් මේ ප්‍රකරණයෙහිද සොම්නස් වෙදනාව පළමුකොට තබනලද්දේයි. "දිට්ඨිගත සම්පයුත්ත විප්පයුත්ත,, යන දෙයාකාරයකින් යුකතවූ චිත්තයන් අතුරෙන් දෘෂ්ටිසම්පු යුකතවූ චිත්තය පළමුකොට කුමක්හෙයින් කීදැයි නලද්දේද යත්? දෘෂ්ටිය විද්‍යමානවූ චිත්තය දැක්වූකල්හී දෘෂ්ටිය අවිද්‍යමානවූ චිත්තයද සුඛාවබොධවනහෙයින් දෘෂ්ටි සම්ප්‍රයුකතවූ චිත්තයම ආදියෙහි කියනලදී. දෘෂ්ටිය විද්‍යමානවූ චිත්තය පළමුකොට දැක්වීමෙන් දෘෂ්ටි විප්‍රයුකතවූ චිත්තයද සුඛොධවන්නේයයි කියේනම් අසඞ්ඛාරික සසඞ්ඛාරික චිත්තයන් දෙදෙනා අතුරෙන් දෘෂ්ටියට කීවාක්මෙන්ම සඞ්ඛාරය විද්‍යමානවූ චිත්තය පළමු කොට නොදක්වා අසඞ්ඛාරික චිත්තය කුමක්හෙයින් පළමුකොට කියේදැයි චොදෘයක්වෙයි අසඞ්ඛාරික චිත්තය තෙමේ මෙර මාගේ මෙහෙයුම් රහිතව උපදී. එහෙයින්ම ඒ චිත්තය අති ශයින්ම බලවත්වේ. සසඞ්ඛාරික චිත්තය වනාහි අනුන්ගේ මෙහෙයුම් සහිතව උපදී. එහෙයින් ඒ චිත්තය අතිශයින් දුබල ලවේ. බලසම්පන්න දුබල දෙදෙනා අතුරෙන් කිසිකලෙකත් දුබල ලයා ඉදිරියෙහි ගමන් නොකරයි. බලසම්පන්නයා දැක්වීමෙන් දුබලයාද හැඟේ. එහෙයින් ඒ අසඞ්ඛාරික චිත්තයම පළමුකොට දක්වනලදැයි දතයුතු. ආයුෂ්මත් අනුරුඬාචාරීන්වහන්ස! ඒ ලොභ මූලික චිත්තය හා යෙදුනාවූ සසඞ්ඛාරිකවූ ධම්මයන් නොගෙණ "සොමනසසසහගතං" යනාදීන් වෙදනාව කරණකොටගෙණ කුමක්හෙයින් වෙසෙසන්නේවේදැයි චොදෘයක්වේ. ඊට පරිහාර

මෙසේයි. වේදනාව වනාහි සොම්නස් වේදනාය, දොම්නස්වේදනාය, උපෙක්ෂා වේදනායයි ප්‍රභෙදවෙති. එසේ ප්‍රභෙදවත්වූ වේදනාවෙන්ම චිත්තයාගේ වෙනස දැක්වීම මුත් ද්‍රව්‍යභේද නැත්තාවූ සපර්‍යායෙන් චිත්තයාගේ වෙනස දැක්වීම නොයෙදෙයි. ඉදින් සපර්‍යායෙන් මේ චිත්තය වෙනස් කෙළේනම් මේ චිත්තයන්ගේ නිගමනයෙහි "අඪ" යන සඞ්ඛ්‍යාවගේ සඞ්ඛ්‍යය විසඳිය නොහැකිවෙයි. කුමක්හෙයින ගත්? සපර්‍යාය අටක් නොව එකුන් අනූවක් හෝ එකසිය විසිඑකක් හෝ වෙයි. එහෙයින් ඒ චිත්තයාගේ සඞ්ඛ්‍යය විසඳිය නොහැකිවෙයි. වේදනාව වනාහි සොම්නසෙහි යෙදුනාවූ වේදනාව සොමනස්ස වේදනාය උපෙක්ෂාවෙහි යෙදුනාවූ වේදනාව උපෙක්ෂාවේදනාවයයි යනාදීන් ප්‍රභෙදවත්වූහෙයින් ප්‍රභෙද නැත්තාවූ සපර්‍යාය නොගෙණ ප්‍රභෙදවත්වූ වේදනාවෙන්ම වෙනස දක්වනලද්දේයි. මේ 'සොමනස්ස සහගතං දිට්ඨිගත සම්පයුත්තං අසඞ්ඛාරිකං සසඞ්ඛාරිකං" යන පාඨ සමූදය අතුරෙන් අසඞ්ඛාරික සසංඛාරිකයම මෙහි අභිමතාර්ථවෙයි. එහෙයින් ඒ අසඞ්ඛාරික සසඞ්ඛාරිකයම නොදක්වා කුමක්හෙයින් අනභිමතවූ "සොමනස්සසහගතං" යනාදී වචකය යෙදුයේද ගත්? සොමනස්සය වනාහි මෙහි අභිමතාර්ථය නොවෙයි. එතකුදුවුවත් අසඞ්ඛාරික සසඞ්ඛාරිකය සොමනස්සයාගේ අසඞ්ඛාරිකය, සසඞ්ඛාරිකය; උපෙක්ෂාවගේ අසඞ්ඛාරිකය සසඞ්ඛාරිකයයි ප්‍රභෙදවත්වෙයි. එසේ ප්‍රභෙදවනහෙයින් මේ අසඞ්ඛාරික සසඞ්ඛාරිකය සොම්නස්වේදෝ උපෙක්ෂාවේදෝ යන සැකයට කාරණාවනහෙයින් ඒ සැකය වලක්වනු පිණිස අසඞ්ඛාරික සසඞ්ඛාරිකයෝ තුමූ සොම්නස් උපෙක්ෂා දෙකම ඇත්තේ නමුදු මේ අසඞ්ඛාරික සසඞ්ඛාරිකය උපෙක්ෂා සහගත නොවෙයි. සොම්නස් සහගතමවෙයි. යන බව හඟවන පිණිස "සොමනස්ස සහගතං" යනුකීහ. මෙසේ සොමනස්ස උපෙක්ෂා යන වේදනාවගේ විප්‍රකාරය ඇතිහෙයින් සොමනස්සය ලබන පිණිස "සොමනස්ස සහගතං" යනු කීහ. අසඞ්ඛාරික සසඞ්ඛාරිකයාගේ සොමනස්සය වලක්වනු පිණිස එසේ කියේනම් එසේ කියනසේක්වා,'දිට්ඨිගත සම්පයුත්තං" යනාදී පාඨය කුමක්හෙයින් කියේදැයි යන චොද්‍යය සඳහා මේ "දිට්ඨිගත සම්පයුත්තං" යන පාඨය දැක්වීම සොමනස්සයාගේ අසඞ්ඛාරික සසඞ්ඛාරික තෙමේ දිට්ඨිගේ අසඞ්ඛාරික සසඞ්ඛාරික විප්‍රයුක්තයයි. මෙසේ අසඞ්ඛාරික සසඞ්ඛාරිකවශයෙන් විප්‍රකාරවන්නේයයි කීහ. ඒ විප්‍රකාරයන් අතුරෙන් මේ අසඞ්ඛාරික සසඞ්ඛාරිකය තෙමේ දෘෂ්ටියෙන් විප්‍රයුක්තවූ අසඞ්ඛාරික සසඞ්ඛාරිකයද, දෘෂ්ටියෙන් විප්‍රයුක්තවූ

අසඞ්ඛාරික සසඞ්ඛාරිකයදැයි මෙබඳු සංසයක් වියයුතුහෙයින් ඒ සංසය වලක්වනු පිණිස මේ අසඞ්ඛාරික සසඞ්ඛාරිකය දෘෂ්ටි යෙන් යුක්තයයි හඟවනු පිණිස "දිට්ඨිගත සම්පයුත්තං" යන පාඨය කිහ සොමනස්සයාගේ අසඞ්ඛාරිකය සසඞ්ඛාරික තෙමේ දිට්ඨිහුගේ අසඞ්ඛාරික සසඞ්ඛාරිකය, දිට්ඨිසම්පයුත්තයාගේ අසඞ්ඛාරික සසඞ්ඛාරිකයදැයි දෙවැදෑරුම්වේ. ඔවුන් අතුරෙන් මේ අසඞ්ඛාරික සසඞ්ඛාරික තෙමේ දෘෂ්ටි සම්ප්‍රයුක්ත අසඞ්ඛාරික සසඞ්ඛාරිකදෝහෝයි සැකයක් ඉපදිය යුතුහෙයින් ඒ සංසය වලක්වනු පිණිස මේ අසඞ්ඛාරික සසඞ්ඛාරික තෙමේ දෘෂ්ටිසම්ප්‍රයුක්තවූ අසඞ්ඛාරික සසඞ්ඛාරිකයයි හඟවනු පිණිස "දිට්ඨිගත සම්පයුත්තං" යන පාඨය කිහ ඊට උපමා කවරයත්? එසාවිකාදී සඞ්ඛ්‍යාක්ෂරයක් පූර්වයෙන් යම් වචනයක් නොමැතිව යෙදුයේවී නම් කවර වසතුවෙක සඞ්ඛ්‍යාවෙක්දැයි නොදතහැකිවේ. එහෙයින් ඒ සඞ්ඛ්‍යාක්ෂරයන්ට මුලින් රන් රිදී ආදී ද්‍රව්‍යයන් සඳහන් නොලේනම් එක් කහීාපණය, කහීාපණ දෙකය, යනාදීන්ද, මනුෂ්‍යාදී යම් නමක් යෙදූයේනම් එහෙක්ය දෙදෙනෙක්ය යනාදීන් ව්‍යවහාර කරන්නාක්මෙන්ද මෙහි උපමා උපමෙය සම්බන්ධ දත යුතුයි. දෘෂ්ටිගත සම්ප්‍රයුක්ත චිත්තයද කවර දෘෂ්ටියකැයි නියම යක් නැතිව "දිට්ඨි" යන සාමාන්‍යය යෙදූහෙයින් සම්‍යක් දෘෂ්ටි යදෝ මිත්‍යාදෘෂ්ටියදෝයි සැකකටයුතුවෙයි "චිත්ත" යන විශෙෂණය යෙදූසේක්චිතම් සම්‍යක් දෘෂ්ටිය නොවනබවද, "සම්මා" යන විශෙෂණය යෙදූයේනම් මිත්‍යාදෘෂ්ටිය නොවන බවද, අවබොධවෙයි. මෙහි වනාහි විශෙෂණ පදයක් නොයොදා "දිට්ඨි" යන සාමාන්‍යය යෙදූහෙයින් කවර දිට්ඨියක් ගතයුත්තේ දැයි චොද්‍යයක්වේ. මේ චිත්තයන්ගේ නිගමනයෙහි වනාහි "ඉමානි අට්ඨිලොභසහගත චිත්තානි නාම" යන්නෙහි ලොභය දුටුකල්හි ඒ ලොභය සමග මිත්‍යාදෘෂ්ටියමුත් සම්‍යක්දෘෂ්ටිය නොයෙදෙනබව හැඟෙයි. ඊට උපමා කවරයත්? තෙතක් වපුරන්නාවූ යම් කසසතයෙක් තෙමේ ඒ තෙත් කහීාන්නකොට තමාගේ සවකීය ගෙදරට පැමිණිකල්හි මහත් මෙඝයක් නැගී වස්නට පවන්ගත්කල්හි ඒ ගොවි තෙමේ මාගේ කෙතෙහි දණක් පමණ හෝ උකුලක් පමණ හෝ ජලය ගලා ඇත්තේයයි සමතෙ හිකරයි. ඔහු නැවත පහන්වූකල තෙතට යන්නාහු සියලු ජලය සිඳිගොස් වියලී තිබෙයි එතකුදුවුවත් ගංඉවුරු ආදියෙහි රැඳී තිබෙන්නාවූ පරඩලාපත් දියසෙවෙල් ආදිය දැක මේ කෙතෙහි මෙපමණ ජලය ගැලූයේයයි දැනගණිද, එපරිද්දෙන්ම දිට්ඨි සාමාන්‍යය කියේද නියමනයෙහි ලොභපදය දුටු පමණකින් සම්මා

දිට්ඨිය නොව මිථ්‍යාදෘෂ්ටියයි දැනගණිද, ඒ කුඹුරෙහි ජලය නැති කලක්මෙන් දිට්ඨි ශබ්දයාගේ මිථ්‍යා යන විශෙෂණ පදය නැති බවද, ගංඉවුරු ආදියෙහි රැඳී තිබෙන්නාවූ දියසෙවෙල් ආදිය මෙන් නිගමනයෙහි ලොභ සහගත පදයද, ගොවියකුමෙන් මේ ප්‍රකරණය අධ්‍යයනයකරන්නාවූ ආඩ්ඪණිකා ජනයාද, උපමා උපමෙය සම්බන්ධකොට අර්ථ දතයුතුයි. "ඉමානි අට්ඨ ලොභ සහගත චිත්තානිනාම" යන්නෙහි "ඉ"ශබ්දය කුමක් අර්ථකොට ඇත්තේද යත්? මේ ලොභ සහගත චිත්තයාගේ අනන්ත අප්‍රමාණවූ භෙදය සම්පිණ්ඩණය කෙරේ. අදත්තාදාන, කාමමිථ්‍යාචාර, මුසාවාද, පිසුනාවාච, සම්ඵප්පලාප, අභිද්‍යා මිථ්‍යාදෘෂ්ටි, යන සප්තනාම්පථයෙහි මේ එකී එකී අකුශල චිත්තයක් යෙදෙන හෙයින් පළමුකොට මේ අට සතින් ගිණිය යුතුයි. ඒ ගුණිතකළාවූ සඞ්ඛ්‍යාව අතීතානාගත වර්තමාන යන කාලත්‍රයවශයෙන් පවත්නාහෙයින් තුණින් ගිණියයුතුයි. ඒ තුණින් ගුණිතකළ සඞ්ඛ්‍යාව සවසන්තාන පරසන්තානවශයෙන් පවත්නාහෙයින් දෙකින් ගිණියයුතුයි ඒ දෙකින් ගුණිතකළ සඞ්ඛ්‍යාව රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ, ධම්ම යන සාරම්මුණුවශයෙන් පවත්නා හෙයින් සතින් ගිණිය යුතුයි. ඒ සතින් ගුණිතකළ සඞ්ඛ්‍යාව නානර ජනපදවශයෙන් පවත්නා හෙයින් දෙකින් ගිණියයුතුයි. මෙසේ ගුණිතකරණලද සඞ්ඛ්‍යාවන් අතුරෙන් අතීතානාගත යනකාල වශයෙන් ලැබියයුතු ගණන් මාත්‍රයම අනන්ත අප්‍රමාණ වෙයි. ඒ සියලු සංඛ්‍යාවෝ මේ "ඉ"ශබ්දයෙන් සංග්‍රහවෙත්. මේ ලොභ මූලික විඤ්ඤාණයෝ අටදෙනාවනාහි ලොභ, මොහ, යන හෙතු මූලවශයින් යුක්තවූවද මොහය නොගෙණ ලොභය කුමක්හෙයින් ගත්තේද යත්? මොහය වනාහි සර්‍වාකුශලසාධාරණවෙයි. ලොභය මේ සිත් අටෙහිම යෙදෙයි. එහෙයින් සර්‍වාකුශල සාධාරණවූ මොහය නොගෙණ ලොභයෙන්ම විශෙෂය දැක්වූයේයි. සොම්නස්වීමට හේතු තුණක්වෙයි. ඒ කවර තුනෙක්ද යත්? සොමනස්සසහගත පටිසන්‍ධි සතරින් යම්කිසි චිත්තයකින් පිළිසිඳීම්ය, ඉෂ්ටාලම්බනයක්වීමය, නොඟැබුරු ප්‍රඥා ඇතිබවය, මේ කාරණාත්‍රයයි. උපෙක්ෂාසහගත වීමට හෙතුත්‍රයක් ඇතිවේ. කවර තුණක්ද යත? උපෙක්ෂා සහගත පටිසන්‍ධි සදෙන අතුරෙන් යම්කිසි චිත්තයකින් පටිසන්‍ධිගැණීම්ය, ඔඩ්‍ය සථවශයෙන් යහපත් අරමුණක් ලැබීමය, ගැඹුරු ප්‍රඥාව ඇතිබවය, යන මේ කාරණා තුනයි. දෘෂ්ටි සම්ප්‍රයුක්තවීමට කාරණා දෙකක් ඇතිවෙයි. එනම්:-තමාහට චිත්තවිපල්ලාසාදී විපල්ලාසයකින් යුක්තව ශාස්ත්‍රන උවෙසිද අදහස් ඇත්නොක්වේද, එබඳුවූ

චිත්තවිපල්ලාසාදිය ඇත්තාවූ මිසදිටු පුද්ගලයන් හජනාදිය කිරීමය, යන මේ කාරණාදෙකින් දිට්ඨිගතසම්ප්‍රයුක්ත සිත් උපදී. මේ කාරණාදෙකින් යුක්තවිනම් දිට්ඨිගත සම්ප්‍රයුක්ත අකුශල්උපදී. ඒ දෙකින් වෙන්වීනම් දෘෂ්ටිවිප්‍රයුක්ත අකුශල් උපදී. අසඞ්ඛාරික සසඞ්ඛාරික සිත් ඉපදීමට හෙතු පසක් ඇති වේ. ඒ කවරහුද යත්? ඊට යොග්‍යවූ සෘතුවක් ලැබීමය, ඊට යොග්‍යවූ වාසස්ථානයක් ලැබීමය, ඊට යොග්‍යවූ හොජ්ජනයක් ලැබීමය, ඊට යොග්‍යවූ විවර වස්ත්‍රාදිය ලැබීමය, ඊට යොග්‍යවූ මිත්‍රයන් ලැබීමය, යනමේ කාරණා පස ඇතිකල්හි අසඞ්ඛාරික අකුශල් සිත් උපදී. මෙයින් යමක් අඩුවීමෙන් සසඞ්ඛාරික සිත් උපදී. මේ පළමුවන දෙවන අකුශල් දෙක කෙසේ උපදනේදයත්? යමෙක් සන්තක යම් වසතුවක් දැක ඒ වසතුව ප්‍රණීතවිනම් සොම්නස් සහගතවෙයි. ඊට අනතුරුව ඒ වසතුව පැහැරගණිමියි සිතා ඒ වසතු සවාමි පුද්ගලයා අතීත ජාතියෙහි මාසතුවසතුව පැහැරගත්තේයයි. එහෙයින් මම දැන් මොහුගේ වසතුව ණය ගැණිමිවශයෙන් පැහැරගත්තේනම් වරද නොවේ යයි යනමේ මිත්‍යාදෘෂ්ටිය පෙරටුකොටගෙණ ඒ වසතුව පැහැරගන්නාකල්හි සොම්නස් සහගත දෘෂ්ටිසම්ප්‍රයුක්ත පළමුවන අකුශල චිත්තය සත්වරක් ජවන්වශයෙන් උපදී. ඒ පැහැරගැණීම යමෙක් විසින් නො මෙහෙයනලද්දේවිනම් අසඞ්ඛාරික සිත්වෙයි. මෙහෙයනලද්දේවිනම් සසඞ්ඛාරික සිත්වෙයි. ඒ අනුන් සන්තක වසතුව දැක පෙරමෙන්ම සොම්නස්සහගත ලොභයෙන් පැහැරගන්නාවූකල්හි මේ අන්වසතුව පැහැරගැණීම අකුශල්වෙයි. එසකුදුවුවත් මේ වසතු සවාමියාහට බොහෝ වසතු ඇත්තේය. මාගේ හෝ අඹුදරුවන්ගේ හෝ ජීවිත ආරක්ෂාවට මේ වසතුව පැහැරනොගෙණ ජීවත්විය නොහැකියයි සිතා පෙරමෙන්ම අනුන්ගේ මෙහෙයුම් රහිතව පැහැරගන්නාකල්හි සොම්නස්සහගත දිට්ඨිගත විප්පයුත්ත අකුශල චිත්තය උපදී. ඒ වසතුව අනුන්ගේ මෙහෙයීමෙන් පැහැරගන්නාකල්හි සසඞ්ඛාරික චිත්තය උපදී. මේ සතරස්ථානයෙහිම ඒ අනුන් සන්තක වසතුව අප්‍රණීතවිනම් උපෙක්ෂා සහගතවෙයි. අනුන්ගේ මෙහෙයීමක් ඇතිකල්හි සසඞ්ඛාරිකවෙයි. මෙසේ ඒ ලොභ මූලික චිත්තයෝ අටදෙන අවබොධකොට දොමනස්සහගත පටිඝසම්ප්‍රයුක්ත චිත්තයද, ලොභසහගත චිත්තයට කීනයින් යොදාගතයුතුයි. දොම්නස් පටිඝදෙදෙනා එකානන්ත සහවාරී ධම්මතාවෙයින් දොමනස්සය හෝ ප්‍රතිඝය හෝ යෙදූකල්හි අනිත් ධම්ය අත්තනොගැර පවත්නාවෙයින්

අභිමතාර්ථය ලැබේ. එසේවිනම් කුමක්හෙයින් මේ පාඨය යෙදූ සේදැයි ප්‍රශ්නයක් වෙයි. ඊට පරිහාරනම්:—සියලු චිත්තයන්ගේ වෙදනාභේදද දැක්වීම උපලක්ෂණ බැවින් හෙවත් සිත් ඇදිනීමට කාරණයක්වන බැවින් "දෙමනස්සසහගත" පදය හා "පටිඝ සම්පයුත්ත, පදයද යොදනලද්දේයයි. ඒ දෙමනස් පටිඝදේදනාගේ ඉපදීමට හෙතුහු කවරහුයත්? තමන්ට නොකැමති යම් අරමුණක්ලැබීමය, නවප්‍රකාර ආඝාතවස්තූන්හෙන් යම් වස්තුවක් හා ගැටීමය යන කාරණාවයෙන් මේ චිත්තය උපදනේයි. ඒ නවවිධ ආඝාත වස්තුහුනම්:- තමා නිසා තුණෙක, තමාගේ හිත මිත්‍රයන් නිසා තුණෙක, තමාගේ සතුරන් නිසා තුණෙ කැයි, මෙසේ නවයක් වෙත්. තමානිසාවන්නාවූ ආඝාතවස්තුහු තුණනම්:-මේ තෙමේ අතීතජාතියෙහිත් මට නිහඟාකෙළේය අනභිවෘඩියක් කෙළේය, දැනුදු එසේ කරයි. මතුමත්තෙහිත් එසේමකරණවා ඇතැයි මේසේ ආඝාතවස්තු තුණක්වෙති. මේ තෙමේ මාගේ හිතමිත්‍රයන්ට ජාතිජාතියෙහි නිහඟාකෙළේය, අනභිවෘඩියක් කෙළේය, දැනුදු එසේම කරයි. මතුමත් තෙහිත් එසේම කරණවාඇතැයි මෙසේ ආඝාත වස්තුතුණෙක, මේ තෙමේ මාගේ සතුරාව අතීතජාතියෙහිත් සතුති ප්‍රශංසා කෙළේය, අභිවෘඩියක්කෙළේය. දැනුදු එසේම කරයි, මතුමත් තෙහිත් එසේම කරණවාඇතැයි මෙසේ ආඝාත වස්තු තුණ කැයි නවආඝාතවස්තුහු වෙත්. අසඞ්ඛාරික සසඞ්ඛාරිකයට කියන නයින් "ඉමානිවෙපි" යන තන්හි "පි" ශබ්දයෙන් මෙහි නොකී අනන්තා ප්‍රමාණ අකුශල චිත්තයන් සම්පිණ්ඩනය කෙරේ ඒ කෙසේ සම්පිණ්ඩනකරන්නේද යත්? මේ දෙමනස්සහගත දෙසිත ප්‍රාණඝාත ඵරුෂ වචන, ව්‍යාපාද, යන කර්ම පථත්‍රයෙහි පවත්නා බැවින් තුණින් ගුණිතවේ. ඒ තුණින් ගුණිතකළ සඞ්ඛ්‍යාව අතීත අනාගත වර්තමාන යන කාලත්‍රයෙන් ගිණිය යුතුවෙයි. ඉක්බිති ඒ ගුණිතකළ සඞ්ඛ්‍යාව සවඝ්‍යාඝාන පර සන්තාන වශයෙන් පවත්නා හෙයින් දෙකින් ගිණියයුතුයි. නැවත ඒ ගුණිත කළ සඞ්ඛ්‍යාව රූපාදී සාරම්මණ වශයෙන් පවත්නා හෙයින් සයින් ගිණියයුතුයි. ඒ ගුණිතකළ සඞ්ඛ්‍යාව නගර ජනපදවශයෙන් පවත්නාහෙයින් දෙකින් ගිණියයුතුයි. මේ ගුණිතකළ චිත්තයන් අතුරෙන් එක් සඞ්ඛයෙක්හට අනාදිමත් සංසාරයෙහි උපන්නාවූ අතීතවූ චිත්තයන්ට සතරමහා සාගරජලය අබපියල්ලකින් මැන්නේද මහාපෘථිවියෙහි සියලු පස අබඇට ප්‍රමාණ ගුලිකෙළේද අතීතවූ දෙමනස් සහගත චිත්තයන්ට උපමානොවෙයි. මෙසේ අනන්ත අපරිමාණ දෙම

මූලික චිත්තයන් 'පි" ශබ්දයෙන් සංග්‍රහ කෙරේ. උපෙක්ඛා සහ ගත අකුශල චිත්තයන් දෙදෙනා අතුරෙන් දෙලොස්වන චිත්තය පමණක් සසීකුශල සාධාරණ උඩවගෙන් යුමක් හෙයින් ඇවසෙසා වදුලේද යත්? ධම්මසඞ්ගණී ප්‍රකරණයෙහි වනාහි සෙසු එකොලොස් චිත්තයෙහි මේ උඩවගය අප්‍රධාන බැවින් "යංවාපනඤ්ඤම්පි" යන වචනයට ඇතුලත්කොට යෙවාපනක දෙශනාවශයෙන් වදුලේසි. මේදෙලොස්වා චිත්ත යේහිම් "තඤ්ච සබ්බෙ-පෙ-උඩවගං උපපජ්ජති" යනුවේ සරූපදෙශනාවෙන් වදුරණලද්දේසි. මෙසේ දෙලොස්වන චිත්තයෙහිම උඩවගය බලවත් බැවින් ප්‍රධාන බැවින් "උඩවග සම්පයුත්තං" යනුවෙන් අනුරුඛාවරින් විසින් මෙසේකොට දක්වනලදී. මේ ප්‍රකරණයෙහි වනාහි විත්තාර රුචික මන්දප්‍රාඥ පුද්ගලයන් සඳහා "සොමනස්ස සහගතං" යනාදී පාඨයෙන් දෙලොස් අකුශල චිත්තයන්ගේ විසතර කථාව දක්වා සංක්ෂෙප රුචික තීක්ඛ ප්‍රාඥපුද්ගලයන් සඳහා ඒ දෙලොස් චිත්තය හකු එවා "අට්ඨධා ලොභමූලානි" යනාදී ගාථාව දක්වනලද්දේයසි දතයුතුයි. ඒ දෙලොස් අකුශල චිත්තයෝනම් කවරහයත්? සොමනස්ස සහගත දිට්ඨිගත සම්පයුත්ත අසඞ්ඛාරික එක්චිත්ත යෙක්ද, සොමනස්ස සහගත දිට්ඨිගත සම්පයුත්ත සසඞ්ඛාරික එක් චිත්තයෙක්ද, සොමනස්ස සහගත දිට්ඨිගත විප්පයුත්ත අසඞ්ඛාරික එක්චිත්තයෙක්ද, සොමනස්ස සහගත දිට්ඨිගත විප්ප යුත්ත සසඞ්ඛාරික එක් චිත්තයෙක්ද, උපෙක්ඛා සහගත දිට්ඨිගත සම්පයුත්ත අසඞ්ඛාරික එක් චිත්තයෙක්ද, උපෙක්ඛාසහගත දිට්ඨිගත සම්පයුත්ත සසඞ්ඛාරික එක් චිත්තයෙක්ද, උපෙක්ඛා සහගත දිට්ඨිගත විප්පයුත්ත අසඞ්ඛාරික එක් චිත්ත යෙක්ද, උපෙක්ඛා සහගත දිට්ඨිගත විප්පයුත්ත සසඞ්ඛාරික එක් චිත්ත යෙක්දැයි මෙසේ සොමනස් සහගත සතරෙක, උපෙක්ඛාසහගත සතරෙකැයි ලොභ මූලික චිත්තයෝ අටදෙනෙක් වෙති. දෙමී නස්සහගත පටිඝසම්පයුත්ත අසඞ්ඛාරික චිත්තයෙක, දෙමීනස් සහගත පටිඝසම්පයුත්ත සසඞ්ඛාරික චිත්තයෙක්දැයි මේසේ වෙෂ මූලික චිත්තයෝ දෙදෙනෙක් වෙති. උපෙක්ඛාසහගත විචි කිච්ඡාසම්ප්‍රයුක්ත එක්සිතෙක, උපෙක්ඛාසහගත උඩවගසම්ප්‍ර යුක්ත එක් සිතෙක්දැයි මෙසේ මොහ මූලික චිත්තයෝ දෙදෙ නෙක් වෙති. එහෙයින් අභිධම්මාවී සංග්‍රහයෙහි "අට්ඨධා ලොභ මූලානි" යනාදී සංග්‍රහ ගාථාව දක්වනලදී. ඒ ගාථායෙහි අභි ප්‍රාය මෙසේසි:-ලොභ මූලික චිත්තයෝ තුමූ සොමනස්ස වෙදනා සහගත සතරෙක, උපෙක්ඛා වෙදනාසහගත සතරෙකැයි යන අටදෙනාගේවශයෙන්ද, දිට්ඨිගත සම්ප්‍රයුක්ත සතරෙක, දිට්

ගත විප්‍රයුක්ත සතරෙකැයි යන අවදෙනාගේ වශයෙන්ද, අසඞ්ඛාරික සහරෙක, සසඞ්ඛාරික සතරෙකැයි යන අව දෙනා ගේවශයෙන්දැයි මේසේ ත්‍රිවිධාකාරයකින්ම අටවැදෑරුම් වෙත්. දෙස මූලික චිත්තයෝ තුමූ අසඞ්ඛාරික එකෙක, සසඞ්ඛා රික එකෙකැයි යනදෙදෙනාගේවශයෙන් දෙවැදෑරුම් වෙත්. මොහමූලික චිත්තයෝ තුමූ විචිකිච්ඡාසම්ප්‍රයුක්ත එකෙක, උඛ්ධච්චසම්ප්‍රයුක්ත එකෙකැයි යන දෙදෙනාගේවශයෙන් දෙවැ දෑරුම් වෙත්, මේ දෙළොස් චිත්තයන් අතුරෙන් ලොභ දෙස මූලික චිත්තයෝ දසදෙන කායකම්ම වචිකම්වශයෙන් පවත්නා හෙයින් දශාකුශල කම්මාදිවශයෙන් අනෙක ප්‍රකාර වෙති. මොහ මූලික චිත්තයෝ දෙදෙන කායකම් වචිකම්වශයෙන් නොප වත්නාහෙයින් සුඛමනොවාරිනම් වෙති. ඔවුන් අතුරෙන් විචි කිච්ඡා සම්ප්‍රයුක්ත චිත්තය ඡොඩශවිධ කාංඛාවශයෙන් පවත්නා හෙයින් සොළොස් වැදෑරුම් වෙත්. ඒ මොහමූලික චිත්තයෝ දෙදෙනවනාහි සවභාවයෙන් ඤාණවිප්පයුත්ත නොපවත්නාහෙයින් අසඞ්ඛාරිකයයිද නොකියයුතුයි. උත්සාහකටයුතු නොවන හෙයින් සසඞ්ඛාරිකයයිද නොකියයුතුයි. එහෙයින් විභාවනියෙහි **"තඤ්ච ඛෝ එවං සඞ්ඛාරිකඤ්චාපි උස්සාහනලක්ඛණාය අභා වනාය සඞ්ඛාරහෙදූපි නෙසං නත්ථී"** යනු කියනලදී.

මේ දෙළොස් අකුශල චිත්තයන්ගේ සවරූප විභාගයයි.

පදභාජනීය.

උපෙක්ඛා සහගතං, උපෙක්ඛා වෙදනාව හා එකොත්පා දාදිවශයෙන් මිශ්‍රවූ නොහොත් එකොත්පාදාදිබවට පැමිණියාවූ; චක්ඛුවිඤ්ඤාණඤ්ච, චක්ෂුර්විඥාන චිත්තයෙක්ද; මෙහි නිගමන යෙහි,, 'ච" ශබ්දය සිංහාවලෝකනන්‍යායෙන් ප්‍රථම පදාදියෙ හිද යෙදෙත්; තථා, එපරිද්දෙන්, සොතවිඤ්ඤාණඤ්ච, ශ්‍රෝත්‍ර විඥානචිත්තයෙක්ද; ඝාණවිඤ්ඤාණඤ්ච, ඝ්‍රාණවිඥාන චිත්තයෙක්ද; ජිව්හාවිඤ්ඤාණඤ්ච; ජිවහාවිඥාන චිත්තයෙක්ද; දුක්ඛසහගතං දුක්ඛවෙදනාව හා එකොත්පාදාදිවශයෙන් මිශ්‍රවූ නොහොත් එකොත්පාදාදී බවටගියාවූ; කායවිඤ්ඤාණඤ්ච, කායවිඥානචිත්ත යෙක්ද; උපෙක්ඛාසහගතං, උපෙක්ඛාවෙදනාව හා එකොත්පාදාදී වශයෙන් මිශ්‍රවූ නොහොත් එකොත්පාදාදිබවට ගියාවූ; සම්පටි ච්ඡන චිත්තඤ්ච, අරමුණු පිළිගැණීම් වශයෙන් පවත්නාසම්ප්‍රත්‍යෙ ක්ෂණ චිත්තයෙක්ද; උපෙක්ඛා සහගතං, උපෙක්ඛාවෙදනාව හා

එකොත්පාදදීවශයෙන් මිශ්‍රවූ නොහොත් එකොත්පාදදී බවට ගියාවූ;සන්තීරණ චිත්තය, අරමුණුතීරණය කරගැණීම්වශයෙන් පවත්නා සන්තීරණ චිත්තයෙක්ද;ඉති ඉමිනාපහෙදෙන, මේකීය නලද ප්‍රභෙදයෙන්ද; සත්තපි, සත්දෙනෙක් ප්‍රභෙදවූද; ඉමානි චිත්තානි, මේ චිත්තයෝ තුමූ; අකුශල විපාක චිත්තානීනාම්, අකුශල විපාක චිත්තයෝනම්වූවාහු; හොනති, වෙත්. උපෙක්ඛා සහගතං, උපෙක්ෂාවෙදනාව හා එකොත්පාදදීවශයෙන් මිශ්‍රවූ නොහොත් එකොත්පාදදීබවට ගියාවූ; කුසල විපාකං, කාමාවචර කුශලයන්ගේ විපාකවූ; චක්ඛුවිඤ්ඤණංච, චක්ඛුර්විඤ්ඤාන චිත්තයෙක්ද; තථා, එපරිද්දෙන්; සොතවිඤ්ඤණංච, ශ්‍රොතාවිඤ්ඤාන චිත්තයෙක්ද; ඝාණවිඤ්ඤණංච, ඝ්‍රාණවිඤාන චිත්තයෙක්ද; ජිවහාවිඤ්ඤණංච, ජිවහාවිඤාන චිත්තයෙක්ද, සුඛසහගතං,සුඛවෙදනාව හා එකොත්පාදදීවශයෙන් මිශ්‍රවූ නොහොත් එකොත්පාදදීබවට ගියාවූ; කායවිඤ්ඤණංච; කායවිඤාන චිත්තයෙක්ද; උපෙක්ඛාසහගතං, උපෙක්ෂාවෙදනාව හා එකොත්පාදදීවශයෙන් මිශ්‍රවූ; නොහොත් එකොත්පාදදීබවට ගියාවූ: සම්පටිච්ඡන චිත්තය, අරමුණුපිළිගන්නා ආකාරයෙන් පවත්නා සම්ප්‍රත්‍යෙෂණ චිත්තයෙක්ද: සොමනස්ස සහගතං, සොමනස්ස වෙදනාව හා එකොත්පාදදීවශයෙන් මිශ්‍රවූ නොහොත් එකොත්පාදදීබවට ගියාවූ; සන්තීරණ චිත්තය, අරමුණුතීරණයකරගන්නා ආකාරයෙන් පවත්නා සන්තීරණ චිත්තයෙක්ද, උපෙක්ඛාසහගතං, උපෙක්ෂාවෙදනාව හා එකොත්පාදදී වශයෙන් මිශ්‍රවූ නොහොත් එකොත්පාදදීබවට ගියාවූ සන්තීරණ චිත්තය, අරමුණු තීරණයකරගන්නාවූ ආකාරයෙන් පවත්නා සන්තීරණ චිත්තයෙක්ද; ඉති ඉමිනා පහෙදෙන, මේ ප්‍රභෙදයෙන්; අට්ඨපි, අෂ්ටප්‍රකාරවූද; ඉමානි චිත්තානි, මේ චිත්තයෝ තුමූ; කුසල විපාක අහෙතුක චිත්තානි නාම, කුශල විපාක අහෙතුක චිත්තයෝනම්වූවාහු; හොනති, වෙත්. උපෙක්ඛාසහගතං, උපෙක්ෂාවෙදනාව හා එකොත්පාදදීවශයෙන් මිශ්‍රවූ නොහොත් එකොත්පාදදීබවට ගියාවූ; පඤ්චාරාවජ්ජන චිත්තය, චක්ඛුරාදී පඤ්චාරයෙහි රූපාදී ආලම්බණයන් ආවජ්ජනාකරන්නාවූ පඤ්චාරාවජ්ජනනම් චිත්තයෙක්ද; තථා, එපරිද්දෙන්; මනොද්වාරාවජ්ජන චිත්තය; පඤ්චාරයෙහි වැටහුනාවූ ඒ අරමුණු නැවත මනොද්වාරයෙන් ආවජ්ජනාකිරීම් වශයෙන් පවත්නාවූ වොට්ඨපනයන පරනාමධෙයකින් යුක්තවූ මනොද්වාරාවජ්ජනනම් චිත්තයෙක්ද; සොමනස්සසහගතං, සොමනස්වෙදනාව හා එකොත්පාදදීවශයෙන් මිශ්‍රවූ නොහොත් එකොත්පාදදීබවට ගියාවූ;

හසිතුපපාද චිත්තඤ්ච, රහතුන්ට අනොළාරික අරමුණෙහි සිනා උපදවන්නාවූ හසිතුපපාදනම් චිත්තයෙක්ද; ඉති ඉමිනා පදෙන, මේ පදයෙන්; තීණිපි, තුන්වැදෑරුම්වූද, ඉමානි චිත්තානි, මේ චිත්තයෝ තුමූ, අහෙතුක ක්‍රියා චිත්තානි නාම, සම්ප්‍රයුක්ත හෙතු රහිත බැවින් අහෙතුක ක්‍රියා චිත්තයෝනම්වූ වාහු; හොනති, වෙත්. ඉච්චෙවං ඉති එවං ඨපාවුත්තනයෙන, මේසේ මේකියනලද ක්‍රමයෙන්; සබ්බථාපි, අකුශල විපාකය, කුශල විපාකය, ක්‍රියාය යන සම්ප්‍රකාරයෙන්ද, අඨාරස, අටළොස් වැදෑරුම්වූ; අහෙතුක චිත්තානි, අහෙතුක චිත්තයෝ තුමූ; සමත්තානි, සමාපනකරණලද්දාහුය. නොහොත් අඨාරස, අටළොස් ප්‍රකාරවූ; අහෙතුක චිත්තානි, අහෙතුක චිත්තයෝ; සමත්තානි, සංක්ෂේපයෙන් සංග්‍රහකොටගන්නාලද්දාහුය. අකුසලපාකානි, අකුශල විපාක චිත්තයෝ තුමූ; චක්ඛාදීනිඤ්ච සම්පටිච්ඡනාදි කිච්චභෙදතො, චක්ෂුරාදී නිශ්‍රය සම්ප්‍රත්‍යෙෂණාදී කෘත්‍යය යන මොවුන්ගේ ප්‍රභෙදයෙන්; සත්තසියුං, සත්දෙයෙක්වෙති. පුඤ්ඤපාකානි, අහෙතුක කුසල විපාක චිත්තයෝ තුමූ; චක්ඛාදිනිඤ්ච සම්පටිච්ඡනාදි කිච්චභෙදතො, චක්ෂුරාදී නිශ්‍රයන්ගේද, සම්ප්‍රත්‍යෙෂණාදී කෘත්‍යයන්ගේද, ප්‍රභෙදවශයෙන්; අඨසියුං, අටදෙනෙක්වෙත්. අහෙතුක ක්‍රියා චිත්තානි; අහෙතුක ක්‍රියා චිත්තයෝ තුමූ; ආවජ්ජනාදි භෙදතො, ආවජ්ජණාදී කෘත්‍ය භෙදවශයෙන්; තීණි සියුං, තුන්දෙනෙක්වෙති. ඉති, මෙසේ "අහෙතුකා, අහෙතුක භූතානි, අහෙතුකවූ: චිත්තානි, චිත්තයෝ තුමූ; අඨාරස, අඨාරස එවසියුං, අටළොස්දෙනෙක්ම වෙති. තතො, ඒ අවළොසින්; ඌනාධිකානි, ඌනාධිකවූවාහු; නසියුං, නොවෙත්.

මෙහි භාවය.

මේ අවළොස් අහෙතුක චිත්තයන් අතුරෙන් අකුශල විපාකයෝ සත්දෙන අහෙතුක ශබ්දයෙන් නොවෙසෙසා "සත්තපි අකුශල විපාක චිත්තානිනාම" යනුවෙන් සංක්ෂේපයෙන් දක්වා කුශල විපාක නිගමනයෙහි හා ක්‍රියානිගමනයෙහිද, "ඉමානි අඨපි කුසල විපාකා හෙතුකචිත්තානි නාම" ඉමානි තීනිපි අහෙතුක ක්‍රියා චිත්තානි නාම" යනුවන් අහෙතුක ශබ්දයෙන් කුමක්හෙයින් වෙසෙසනලද්දේද යත්? අකුශලවිපාකයෝ වනාහි එකාන්ත අහෙතුකම්වෙති. එහෙයින් අකුශල විපාකයන්ගේ සහෙතුක විපාක ඇත්තේදෝයි ව්‍යභිචාරය නැත්තේයි. කුශල විපාකයන්ගේ හා ක්‍රියාවන්ගේද සහෙ

තුක විපාකය, සහෙතුක ක්‍රියාය යන භෙදය ඇත්තේවෙයි. එහෙයින් කුශල විපාක ක්‍රියාවන්ගේ **අහෙතුකදෝහෝයි සහෙතුකදෝහෝයි** ව්‍යභිචාරය ඇතිවේ. **"සන්තීරණසම්පටිච්ඡනතදාලම්බනාදිවසෙන විසෙසනං යාචිතබ්බං"** යනුන්‍යායය බැවින් ව්‍යභිචාරය ඇත්තාවූ කුශල විපාක ක්‍රියාවන් හා අහෙතුක යන විශෙෂණයකෙළේයයි දතයුතු. යට දක්වනලද දෙලොස් අකුශලයන් අතුරෙන් එකෙකී අකුශල චිත්තයට පටිසන්ධි **ප්‍රවෘත්තීහි** විපාකවශයෙන් මේ අකුශල විපාකයෝ සත් දෙනම් ලැබෙත්. ඒ කෙසේ ලැබෙන්නේද යත්? දෙලොස් අකුශලයන් අතුරෙන් යම්කිසි අකුශලකර්මයක් රැස්කළාවූ සත්වයාගේ මරණින් මත්තෙහි නරකතිරශ්චීන් ප්‍රෙත අසුර නිකායයි කියනලද්දාවූ සතර අපායෙන් යම් අපායකපටි සන්ධිය ගන්නේවීනම් මේ සප්තාකුශල විපාකයන්කෙරෙන් අවසානයෙහි කී උපෙක්ඛාසන්තීරණ චිත්තයෙන් පටිසන්ධිය ලැබ ඒ භවයෙහි වසනතාක්කල් එම චිත්තයම භවාඞ්ගවශයෙන් ඉපිද ඒභවයෙන් චුතවන්නාවූකල්හී එම චිත්තයම චුතිවශයෙන් ඉපිද නිරුඬවේ. ඒ සත්වයා අපායෙහි වසනතාක්කල් මුලුල්ලෙහි ලැබෙන්නාවූ නොකැමතිවූ රූපාදී අරමුණු පස හෙතුකොටගෙණ ඒ විපාක චිත්තයෝ සත්දෙනම ප්‍රවෘත්ති විපාක වශයෙන් උපදිත්. සතරඅපායෙහි ගණන පථාති ක්‍රාන්තවූ නොයෙක් සත්වයන්ගේ පටිසන්ධිය මේ උපෙක්ඛා සන්තීරණයෙන් හටගන්නා බැවින් ඒ සියලු සත්වයෝම එක්කොට "නානත්තකායා එකත්තසඤ්ඤිනි"යයි ව්‍යවහාර කෙරෙත්. නොයෙහාත් නානාප්‍රකාර ශරීර ඇත්තාවූ එකම චිත්තයකින් පටිසන්ධිගන්නා සත්වයෝයයි කියත්. මෙහි "චක්ඛුවිඤ්ඤාණං" යන්නට අනතුරුව යොදනලද්දාවූ 'තථා" ශබ්දයෙන් දර්ශන කෘත්‍යය ඇත්තාවූ ශ්‍රොතවිඥානාදිඝුයයි අර්ථගන්නාලැබේද යත්? එසේ අර්ථනොගතයුතුයි. "උපෙක්ඛා සහගතං" යන පාඨය පමණක් සොතවිඤ්ඤාණාදියෙහිද යොදන බව දතයුතුයි. එහෙයින් ටීකායෙහි "තථාති ඉමිනා උපෙක්ඛාසහගත භාවං අතිදිසති" යනුකිහ. කුශල විපාකවාරයෙහි යොදනලද්දාවූ තථා ශබ්දය උපෙක්ඛා සහගතං කුසල විපාකං" යන දෙපදයම "සොතවිඤ්ඤාණං" යනාදියෙහිත් අතිදෙශය කෙරෙයි. ක්‍රියාවාරයෙහි දක්වනලද්දාවූ තථා ශබ්දයෙන් උපෙක්ඛාසහගත භාවමාත්‍රයක් අතිදෙශ කෙරෙයි. මෙසේ මේ තුන් තන්හි යොදනලද්දාවූ "තථා"ශබ්දයෝ තුන්දෙන විප්‍රකාරවූ අර්ථයක්ම අතිදෙශකරණ බව සැලකියයුතුයි. කුශල විපාකවූ චක්ඛු විඤ්ඤාණාදී අටදෙන වැනි

ත්‍රිහෙතුක උත්කෘෂ්ටය, ත්‍රිහෙතුක ලාමකය, දුහෙතුක උත්කෘෂ්ටය, දුහෙතුක ලාමකය,යි යන සිව් වැදෑරුම් කාමාවචර කුශලයන්ගේම සාධාරණ විපාකයයි දතයුතුය. ඔවුන් අතුරෙන් දානානිශංස නොදැන මිථ්‍යාවෙන් උපයනලද්දාවූ වස්තූන්ගෙන් දුශ්ශීලයන් විසයෙහි දෙනලද්දාවූ දානාදීවූ දුහෙතුක ලාමක කුශලකර්මයන්ගේ බලයෙන් මේ මනුෂ්‍ය භූමියෙහිම ජාත්‍යන්ධ ජාතිබධිර ජාතිමූග ජාතිපණ්ඩක පීඨසප්පි ආදීවූ අහේතුක සත්වයන්ගේ හා සම්පූර්ණ අවයව ඇත්තාවූ වැදි සෙවුල් වණ්ඩාලාදී හීන සත්වයන්ගේද, අනුන්ට බැලුමෙහෙකොට ජීවත් වන්නාවූ කාලකණ්ණි මනුෂ්‍යයන්ගේද, විනිපාතික අසුරසඞ්ඝයා තවූ ඤූතිප්‍රේත මලයකුන්ගේද, පටිසන්ධිය මේ අහේතුක විපාකයන් අවදෙනා අතුරෙන් උපේක්ඛාසහගත සන්තීරණ චිත්තයෙන්ම ලැබේ. සතරාකාරවූ, කාමාවචර කුශලකර්මයන්ටම ප්‍රවෘත්ති විපාකවශයෙන් මේ විපාක අටම ලැබේ. ත්‍රිහෙතුක උත්කෘෂ්ට, ත්‍රිහෙතුක ලාමක, දුහෙතුක උත්කෘෂ්ට, යන මේ ත්‍රිවිධ කාමාවචර කුශලකර්මයන්ට විපාක හා විපාක ආනිශංස යෝද ඇත්තාහුයි. විපාක ආනිශංසයෝ නම්:- ගම් බිම් කෙත්වත් රන්රිදී මුතු මැණික් ආදීවූ උපභොග පරිභොග සම්පත් යනාදියයි. යටකී දුගති අහේතුක විපාකයට හා සුගති අහේතුක විපාකයටද විපාක ආනිශංස නැත්තේමැයි. එහෙයින් මේ විපාක වශයෙන් පටිසන්ධිගත්තාවූ අපායික සත්වයන්ට හා සුගති අහේතුක නීවසත්වයන්ටද රන්රිදී මුතු මැණික් ආදීවූ උපභොග පරිභොග සම්පත් නොලැබෙන්නේමැයි. චක්ඛුරාදී සතරඋභය විපාකයෝ දුක්ඛ සුඛ සහගතනොවී කුමක්හෙයින් උපේක්ඛා සහගතවූවාහුද යත්? චක්ඛු, සොත, ඝාණ ජිවහා, යන සතර උභය විපාකවිඤ්ඤාණයන්ට නිශ්‍රයස්ථානවූ චක්ඛුරාදි ප්‍රසාදයෝ සතරදෙනද, ඔවුන්ට ගොචරවන්නාවූ, රූපාදී ආලම්බණයෝ සතරදෙනද, සතරමහාභූතයන් නිසා පවත්නා උපාදාරූපයෝ අටදෙනෙක්මැයි. ඒ උපාදාරූපයෙන් උපාදාරූපයගැටීම පුළුන් පිඬකින් පුළුන් පිඬක් ගැටීමක්මෙන් ශීඝ්‍රයෙමින් ගැටෙයි. ඒ ගැටීම කරණකොටගණ දුක්වේදනාවක් හෝ සැප වේදනාවක් හෝ නොවියයුතුයි. එහෙයින් මේ උභයවිපාකයෝ සතරදෙන උපේක්ඛාසහගතවෙති. එසේවීනම් කායවිඤ්ඤාණයෝ දෙදෙන උපේක්ඛාසහගතනොවී අකුශල පක්ෂයෙහි දුක්ඛවේදනාව හා කුශලපක්ෂයෙහි සුඛවේදනාවත් කුමක්හෙයින් වන්නේදයත්? කායප්‍රසාදයට නිශ්‍රයස්ථානවූ සසම්භාර කායසඞ්ඛ්‍යාතවූ මේ ශරීරය සතරමහාභූතයන්ගේම සමූහයක්වෙයි. තදලම්බණවූ සප්‍රතීය ආපොධාතු වර්ජිතකොට ඇත්තාවූ භූතත්‍රයක්ම වෙයි.

කිණිහිරක් විට පුළුන් පිඬක් තබා යකුළකින් පහලකල්හි පුළුන් පිඬ විනිවිදගෙණගොස් යකුළ කිණිහිරේ හැපේද, එපරිද්දෙන්ම ආපොධාතු වර්ජිත භූත ය සඞ්ඛ්‍යාත සපතිනාමති යකුළ සසම්භාර කාය සඞ්ඛ්‍යාතවූ ශරීර නැමති කිණිහිරට හැපෙතැකල්හී කායප්‍රසාද සඞ්ඛ්‍යාතවූ පුළුන් පිඬ විනිවිදගෙණ ගොස් සසම්භාරකායෙහිම හැපිසිටීද, එපරිද්දෙන්ම අකුශල පක්ෂයෙහි දුක්සහගතවූද, කුශලපක්ෂයෙහි සුඛසහගතවූද කායවිඤ්ඤාණය උපදනේයසි දතයුතුයි අකුශල විපාකයෝ සත්දෙනහට අනිෂ්ටවූ නොහොත් නොකැමැතිවූ අරමුණක්ම අරමුණුවෙයි. කුශලවිපාක අට දෙනාහට ඉෂ්ටවූ නොහොත් කැමැත්තවූ අරමුණ ම අරමුණුවෙයි මේ ඉෂ්ටානිෂ්ටයවෙන්කිරීම සඤ්ඤාවිපල්ලාස චිත්ත විපල්ලාස වශයෙන් ඉෂ්ටවූ අරමුණත් අනිෂ්ටවෙයි. අනිෂ්ටවූ අරමුණත් ඉෂ්ටවෙයි. ඒ කෙසේයත්? ගෙරිකුණු අසුචි ආදී අපවිත්‍රය ප්‍රකෘතියෙන් අනිෂ්ටවූවද ඔවුන්ගේ සඤ්ඤාවිපල්ලාස වශයෙන් පෙරළී ඉෂ්ටාලම්බණ වශයෙන් දැටහී කුශල විපාක චක්ඛුවිඤ්ඤාණාදිය උපදී. ප්‍රකෘතියෙන් ඉෂ්ටාලම්බණවූ බුඬරූපාදිය ඔවුන්ගේ චිත්තවිපල්ලාස වශයෙන් පෙරළී අනිෂ්ටාලම්බණවශයෙන් වැටහී අකුශල විපාක චක්ඛුවිඤ්ඤාණාදිය උපදී. එහෙයින් මේ ඉෂ්ටානිෂ්ටාලම්බණ වෙන්කිරීම මධ්‍යස්ථ සත්වයන්ගේවශයෙන් දතයුතුයි. ඒ ඉෂ්ටාලම්බණයද එක්වාරයකට ඉෂ්ටාලම්බණව අනික් වාරයකට අනිෂ්ටාලම්බණවන්නාවූ අරමුණුද ඇතිවෙයි. ඒ කෙසේදයත්? රන්රිදී මුතුමැණික් ආදියෙන් කරණලද්දවූ කඩු දුනු තුවක්කු ආදී ආයුධයෝ චක්ඛුවාරයට ඉෂ්ටාලම්බණවශයෙන් වැටහී කායවාරයට අනිෂ්ටාලම්බණවශයෙන් වැටහේ. ඉතා සියුම්වූ අසුචි ආදී ද්‍රව්‍යය කායවාරයට ඉෂ්ටාලම්බණවශයෙන් දැටහී ඝ්‍රාණවාරයට අනිෂ්ටාලම්බණවශයෙන් වැටහේ. ඒව උපමා කවරයත්? පෘථග්ජනයෙහිට අසුචි මලමූත්‍රාදිය චක්ඛුවාරයට හමුවූකල්හී අකුශල විපාක චක්ඛුර්විඤ්ඤාණය උපදී. ඒව අනතුරුව වෙහෙමුලිඳා ජවන් උපදී. ඒ අසුචි මලමූත්‍රාදිය සුනඛ සූකරාදීන්ට හමුවූකල්හී කුශල විපාක චක්ඛුවිඤ්ඤාණය උපදී. ඒව අනතුරුව ලොභ සහගත ජවන් උපදී. ගම්කිසි පෘථග්ජනයෙක්හට ඒ අසුචි දර්ශනයෙන් මාගේ ශරීරාබ්භ්‍යන්තරයෙහිත් මෙබඳු අසුචි ඇත්තේය. එහෙයින් මාගේ ශරීරය පිළිකුල්යයි මෙනෙහිකොට හැකිවේනම් කාමාවචර කුශල් ජවන් උපදී. බුදු පසේබුදු මහරහතුන්ට ඒ අසුචි දර්ශනයෙන් අකුශල විපාක චක්ඛු

විඤ්ඤාණයම ඉපද කාමාවචර මහාක්‍රියාජවන් උපදී. ඒ රහතුන්ට වෙෂමූලික ලොභ මූලික ජවන් හෝ කාමාවචර කුශල් හෝ නූපදින්. එහෙයින් ජවනයන්ගේ නියමකිරීම මේ විපාකයෙන් විය යුතුයි. මේ චක්ඛුරාදී පඤ්චවිඤ්ඤාණයන්ගේ ඉපදීමට හෙතු කවරයත්? චක්ඛුප්පසාදයාගේ නොපිරිහීමය, රූපාලම්බණයක් හමුබවට පැමිණීමය. ආලෝකයෙන් උපනිශ්‍රය ප්‍රත්‍යයලැබීමය, මනසිකාර හෙතුය යනමේ සතරකාරණයන්ගේ එක්වීමෙන්ම සසම්ප්‍රයුක්ත චක්ඛුර්විඤ්ඤාණය උපදී. එහෙයින් කිහ. අභිධම්මාවතාරයෙහි:—

අසමෙහදෙන චක්ඛුස්ස රූපාපාථ ගමේනව
ආලොකනිස්සයෙනාපි සමනසකාර හෙතුනා.
පඤ්චයෙහි පනෙතෙහි සමෙතෙහි චතූහිපි
ජායතෙ චක්ඛු විඤ්ඤාණං සම්පයුත්තෙනහිතං සහ.

— ——

ශ්‍රොත විඤ්ඤාණය ඉපදීමට හෙතුවූ කවරයත්?

ශ්‍රොත ප්‍රසාදයාගේ නොපිරිහීමය, ශබ්දාලම්බණයක් හමුබවට පැමිණීමය, කර්ණච්ඡිද්‍රයෙහි විවරාකාශයෙන් උපනිශ්‍රය ප්‍රත්‍යය ලැබීමය, මනසිකාරය යනමේ හෙතූන් සතරදෙනා එක්වූකල්හි සසම්ප්‍රයුක්ත ශ්‍රොත විඤ්ඤාණ චිත්තය උපදී. එසින් කිහ:—

අසමෙහදෙන සොතස්ස සද්දපාථමෙනව
ආකාසනිස්සයෙනාපි සමනසකාර හෙතුනා.
පඤ්චයෙහි පනෙතෙහි සමෙතෙහි චතූහිපි
ජායතෙ සොත විඤ්ඤාණං සම්පයුත්තෙනහිතංසහ.

— ——

ඝ්‍රාණ විඤ්ඤාණය ඉපදීමට හෙතුවූ කවරයත්?

ඝ්‍රාණ ප්‍රසාදයාගේ නොපිරිහීමය, ගන්ධාලම්බණයක් හමුවීමය, නාසිකාවච්ඡිද්‍රයෙන් වැදගන්නාවූ වායොධාතුහුගේ උපනිශ්‍රයලැබීමය මනසිකාරය යනමේ හෙතූන් සතරදෙනාගේ එක්වීමෙන් සසම්ප්‍රයුක්තවූ ඝ්‍රාණවිඤ්ඤාණ චිත්තය උපදී. එසින් කිහ:—

අසමෙහදෙන ඝාණස්ස ගන්ධාපාථමෙනව
වායොසනිස්සයෙනාපි සමනසකාර හෙතුනා.
පඤ්චයෙහි පනෙතෙහි සමෙතෙහි චතූහිපි
ජායතෙ ඝාණ විඤ්ඤාණං සම්පයුත්තෙනහිතංසහ.

——

ජිව්හා විඤ්ඤාණය ඉපදීමට හෙතු කවරයන්?

ජිව්හාප්‍රසාදයාගේ නොපිරිහීමය, රසාලම්බණයක් හමුවීමය, මුඛගත බෙලසඞ්ඛ්‍යාතවූ ආපොධාතුහුගේ උපනිශ්‍රය ප්‍රත්‍යය ලැබීමය, මනසිකාරය යනමේ හෙතූන් සතරදෙනාගේ එක්වීමක් ඇතිකල්හී සසම්ප්‍රයුක්තවූ ජිව්හාවිඤ්ඤාණය උපදී. එහෙයින් කීහ:—

අසමෙහදෙන ජිව්හාය රසාපාථගමෙනව
ආපොසන්නිස්සයෙනාපි සමනන්තරපච්චයෙන හෙතුනා.
පච්චයෙහි පඤ්චහෙහි සමෙතෙහි චතූහිපි
හොති ජිව්හාය විඤ්ඤාණං සම්පයුත්තෙහිතංසහ.

කාය විඤ්ඤාණය ඉපදීමට හෙතු කවරයන්?

කාය ප්‍රසාදයාගේ නොපිරිහීමය, භූතත්‍රය සඞ්ඛ්‍යාතඵස්පෂ්ඨව්‍ය හමුවීමය, තමාගේ සසමහාරකායෙහි පෘථිවි ධාතුහුගේ උපනිශ්‍රය ලැබීමය, මනසිකාරය යන මේ හෙතූන් සතරදෙනාගේ එක්වීමෙන් සසම්ප්‍රයුක්තවූ කාය විඤ්ඤාන චිත්තය උපදී. මේ පච්චිඤ්ඤාන යන්ට කියනලද්දුවූ සතර ප්‍රත්‍යයයන්ගෙන් එක එකක්වත් අඩුවූයේවිනම් විඤ්ඤාණය නූපදී. එහෙයින් කීහ:—

අසමෙහදෙන කායස්ස ඵොට්ඨබ්බාපාථ සඞ්ගමා
පඨවීනිස්සයෙනාපි සමනන්තරපච්චයෙ හෙතුනා.
පච්චයෙහි පඤ්චහෙහි සමෙතෙහි චතූහිපි
ජායතෙ කාය විඤ්ඤාණං සම්පයුත්තෙහිතංසහ.

හෘදය වස්තුව ආශ්‍රයකොටගෙණ පවත්නාවූ මනොධාතු මනොවිඤ්ඤාණ ධාතූන්ගේ ඉපදීමට හෙතු කවරයත්? හවාඞ්ග චිත්තයාගේ නොපිරිහීමය, ධර්මාලම්බණයක් හමුවීමය, හෘදය වස්තුහුගේ උපනිශ්‍රය ප්‍රත්‍යය ලැබීමය, මනසිකාරය, යනමේ හෙතූන් සතරදෙනාගේ එක්වීමක් ඇතිකල්හී සසම්ප්‍රයුක්තවූ මනොවිඤ්ඤාණ ධාතුචිත්තය උපදී. එහෙයින් කීහ:-

අසමෙහදෙ මනස්සාපි ධම්මාපාථගමෙනව
වත්ථුනනිස්සයෙනාපි සමනන්තරපච්චයෙ හෙතුනා.
පච්චයෙහි පඤ්චහෙහි සමෙතෙහි චතූහිපි
මනොවිඤ්ඤාණ මෙවනතු සම්පයුත්තෙහි ජායතෙ සහ.

මෙහි "අඤ්ඤමඤ්ඤාපි" යන තන්හී "මනසස" යනු භවාඞ්ග චිත්තයයි දැනගැනීමත්තන් පිණිස දතයුතුයි. චක්ඛු රාදී පඤ්චවිඤ්ඤාණයන්ගේ ඉදිරිපිටෙහි "සම්පටිච්ඡනකිච්චං" යන පදයෙන් පඤ්චද්වාරාවජ්ජන ක්‍රියාචිත්තය දක්වනලදී. මනොධාතුහුගේ උත්පත්තිය දක්වන තන්හී "සම්පටිච්ඡනකිච්චං හෙතුනා" යන පදයෙන් මනොද්වාරාවජ්ජන චිත්තයලැබේ. "චක්ඛුසනනිස්සයෙන" යන පදය පඤ්චවොකාර භවයෙහි මුත් චතුවොකාර සඞ්ඛ්‍යාතවූ සතර අරූපලයෙහි නොලැබේ. එහෙයින් "චක්ඛු සනනිස්සයෙන" යන පදය රූපය සමඟ හටගන්නාවූ පඤ්චවොකාර භවය සඳහාම දක්වනලදී. චතුවොකාර භවයෙහි විනාහි ධාරාලම්බණයක්හුගේ හමුබවට පැමිණීමය, හඬාඞ්ගයාගේ නොපිරිහීමය, මනොද්වාරාවජ්ජන සඞ්ඛ්‍යාතවූ මනසකාරය යන ප්‍රත්‍ය යන් තුන්දෙනාගේ එක්වීමක් ඇතිකල්හිම මනොවිඤ්ඤාණ ධාතුව උපදනේයි. එහෙයින් කිහ:—

මනොභවඞ්ග චිත්තනති වෙදිතබ්බං විභාවිභා
ආවජ්ජනං ක්‍රියා චිත්ත සමනකකාරොති සඤ්ඤිතං.
චක්ඛුසනනිස්සයෙනාති නායං සබ්බත්ථ භවජති
භවනතු පඤ්චවොකාරං සඞ්ගය කථිතොපන.

මේසේ සඞ්ඛාරයෙහි සත්තවිඤ්ඤාණ ධාතූන්ගේ හටගැනීම දතයුතුයි.

තදාලම්බණවන ක්‍රමය කෙසේ යත්? අනිෂ්ටාලම්බණ යෙක් හමුවීනම් ජවන්කෙළවර අකුශල විපාක සන්තීරණ චිත්තය තදාලම්බණවශයෙන් උපදී. ඉෂ්ටාලම්බණයක් හමුවූ කල්හී ජවන් කෙළවර අවශෙෂ තදාලම්බණ දසදෙනා අතු රෙන් එකක් තදාලම්බණවශයෙන් උපදී. ඉෂ්ටාලම්බණය වනාහි අතිඉෂ්ටය, ඉෂ්ටමධ්‍යසථයයි දෙයාකාරවනහෙයින් අතිඉෂ්ටා ලම්බණයක් හමුවීනම් ජවන් කෙළවර සොම්නස් සහගත මහා විපාක සතරය. සොම්නස් සහගත සන්තීරණය යන පස්දෙනා අතුරෙන් එක්තරා චිත්තයක් තදාලම්බණවශයෙන් උපදී. ඉෂ්ට මධ්‍යසථාලම්බණයක් හමුවීනම් ජවන්කෙළවර උපෙක්ඛා සහ ගත මහාවිපාකයෝ සතරදෙනය, උපෙක්ඛා සහගත කුශල විපාක සන්තීරණය, යන පස්දෙනා අතුරෙන් එක්තරා චිත්තයක් තදාලම්බනවශයෙන් උපදී. අතිඉෂ්ට ඉෂ්ටමධ්‍යසථ ආලම්බණ යන්ට උදාහරණයක් නම්:—ජීවමානවූ සම්බුදයන්වහන්සේගේ රූපය අතිඉෂ්ටාලම්බණයයි සම්බුදප්‍රතිමාව ඉෂ්ටමධ්‍යසථාලම්බ ණය. මේ ක්‍රමයෙන් අතිඉෂ්ට ඉෂ්ටමධ්‍යසථ සියලු අරමුණුවෙන්

කරගතයුතුයි. පවවාරාවජ්ජනය යනු චක්ඛුරාදී පවවාරයන්ට ඉෂ්ටවූ හෝ අනිෂ්ටවූ හෝ අරමුණු ගැටුණුකල්හි සාධාරණවශ යෙන් ඒ අරමුණු ආවජ්ජනාකිරීම්වශයෙන් උපදනා අහෙතුක ක්‍රියා චිත්තයයි. මනොවාරා වජ්ජනා යනු මනොවාරයෙහි ගැවෙන්නාවූ ඉෂ්ට අනිෂ්ට සියලු අරමුණු ආවජ්ජනාකිරීම්වශ යෙන් උපදනා ක්‍රියා හෙතුක මනොවිඤ්ඤාණ ධාතු චිත්තයයි. ඒ චිත්තයම චක්ඛුරාදී පවවාරයෙහි සන්තීරණ ජවන චිත්ත යන්ගේ මධ්‍යයෙහි අරමුණු නියමකරගැනීම් වශයෙන් උපදනා කල්හි ව්‍යවස්ථාපන චිත්තයයි ව්‍යවහාරකරත්. ගම්බද රජගෙයි දෙර ආරක්ෂාකරන්නාවූ දෙවාරික තෙමේ ඒ වාරය ආරක්ෂා කරණකල්හි දෙවාරිකයයි කියාද, ප්‍රත්‍යන්තයෙන් ඉගෙණෙන්නාවූ පුදපඬුරු ආදිය ඔහුම ඔසවාගෙණ රජගෙට යන්නාවූ කල්හි පරිහාරයයි ඔහුට ව්‍යවහාර කරන්නාක්මෙන්ද මෙම චිත්තය මනොවාරයෙහි උපදනාකල්හි මනොවාරාවජ්ජනයම් න්ද, පවවාරයෙහි අරමුණු නියමකරගැනීම්වශයෙන් උපදනා කල්හි ව්‍යවස්ථාපන නමින්ද, ව්‍යවහාරකෙරෙත්. මේ චක්ඛු විඤ්ඤාණාදී දෙපස් විඤ්ඤාණයන් අතුරෙන් චක්ඛුර්විඤ්ඤාණය සපී යෙකුට බදු උපමා ඇත්තේවෙයි. කුමක්හෙයින යත්? සපී තෙමේ සූනුපිරියම් ආදිය කරණලද්දාවූ මට සිලුටු භූම්ප්‍රදෙශාදි යෙහි නොලැග තුඩස් රුක් සිදුරු ආදී සම්භාධස්ථානයෙහි සිත් අලවා වාසයකෙරේද, එසේම චක්ඛුර්විඤ්ඤාණයද මට සිලුටු භිඤ්ඤාදියෙහි නොඇලි නොයෙක් මාලාකම් ලතාකම්මාදි යෙන් විසිතුරුවූ ආකිණ්ණසථානාදියෙක්හිම ඇලෙයි. සොත විඤ්ඤාණ තෙමේ කිඹුලෙකුට බදු උපමා ඇත්තේවෙයි. කුමක් හෙයින යත්? කිඹුල් තෙමේ නොගැඹුරු දියෙහි හෝ දියපිට හෝ සිත් නොඇලවා අතිශයින් ගැඹුරුවූ දියෙහි ගල්සිදුරු ගල්බෙන් ආදියෙහිම සිත් අලවාවසේද, එපරිද්දෙන් සොත විඤ්ඤාණයද ශ්‍රොතබිලය ඇතුලත්හි සිහින් තඹවන් රොම යෙන් ගැවසීගත්තාවූ ඇඟිලි මුදුවකට බදු සථානයන් ඇත්තාවූ ශ්‍රොත ප්‍රසාදයෙහිම සිත් අලවා වෙසේ. ඝ්‍රාණ විඤ්ඤාන තෙමේ උකුසුපක්ෂියෙකුට බදු උපමා ඇත්තේවෙයි. කුමක්හෙයින යත්? උකුසු පක්ෂියෙ මේ පෘථිවියෙහි සිත් නොඇලවා ඉහල ආකාශ කුක්ෂියෙහිම වායොධාතුවෙන් උපනිශ්‍රය ලැබ පියාඹම් න් සිත් අලවා වෙසේ. එපරිද්දෙන් ඝ්‍රාණ විඤ්ඤාණයද නාසා බිලයට ඇතුල්ව එසන්නාවූ වායොධාතු උපනිශ්‍රය ලැබ සිත් අලවාවෙයි. ජිව්හා විඤ්ඤාණයවනාහි ඖෂධ සුනඛයෙකුට බදු උපමා ඇත්තේවෙයි. ඖෂධ සුනඛ තෙමේ කොට්ට මෙට්ට ආදි

ඇතිරිලි ආදියෙහී සයනයකරවූයේද, එහි නොඇලී උදුනක් සාරාවකගසා වැදගොත්කල්හිම සිත් ඇලෙයි. එපරිදෙන් ජීවිතාවිඤ්ඤාණයද සසම්භාර ජීවිතාවයගේ මඬ්ඩයෙහි නිලුපුල් මල්පෙති අගක් බඳුවූ ජීවිතාවිඤ්ඤාණය පැතිරපවත්නා තන්හිම සිත් අලවාවෙයි. කායවිඤ්ඤාණය වනාහි වන සුනඛයෙකුට නොගොත් සිවලෙකුට බඳු උපමා ඇත්තේවෙයි. ඒසිවල්තෙමේ ගම් ගෙවතු ආදියෙහි සිත් නොඇලවා අමුඅසොහොනටවැද මිනීමස් බුදිමින් මලසිරුරු පහසලබමින් වැදගොත්කල්හිම සිත් ඇලෙයි. එසේම කායවිඤ්ඤාණයද භූතත්‍රය සඞ්ඛ්‍යාතවූ සපඤ්ඤලඞ්ඛණ සඞ්ඛ්‍යාතවූ උපාදින්නකාය සපඤ්ඤයෙහි ඇලිපවත්නේයි. හසිතොත්පාද චිත්තයවනාහි බුදුන් රහතුන්වම ඡවිවාරයෙහිම සිනාපහළවනකල්හී උපදනේයයි කුමක්ෂහයින් ඒවසෙසකියන ලද්දේදැයි සිනා පහළකරන්නාවූ සිත් වනාහි තෙළෙස් දෙනෙක්වෙත්. ඒ තෙළෙස් චිත්තයෝ මෙහිකුමක්හෙයින් සංග්‍රහනාකලාහුද යත්? සිනාපහළකරන්නාවූ තෙළෙස් චිත්තයෝනම් සොම්නස්සහගත ලොභමූලික අකුශල් සතරය, සොම්නස් සහගත මහාකුශල් සතරය, සොම්නස් සහගත මහාක්‍රියා සතරය, මෙම හසිතොත්පාද චිත්තය, යන තෙළෙස් චිත්තයෝ සිනාපහළකරණ චිත්තයෝනම්වත්. ඔවුන් අතුරෙන් ලොභමූලික අකුශල චිත්තයෝ සතරය, මහාකුසල් සතරය යන චිත්තයෝ අටදෙන සියලු පෘථග්ජන සත්වයන්ට සිනාපහළකරන්නාවූ චිත්තයෝනම්වෙත්. සොවාන් ශකෘදාගාම් අනාගාම් යන ශෛක්ෂ්‍ය පුද්ගලයන්ට දිට්ඨිප්‍රයුක්ත සොම්නස් සහගත අකුශල් සිත්දෙකින් හා සොම්නස් සහගත මහාකුශල්සතරින්ද සිනාපහළ කෙරෙත්. සියලු රහතුන්ට හා පසේ බුදුවරයන්වද සොම්නස් සහගත මහාක්‍රියා සතරින් හා මෙම හසිතොත්පාද චිත්තයෙන්ද සිනාපහළකෙරෙත්. ලොවුතුරා බුදුවරයන්ට වනාහි සොම්නස් සහගත ඥානසම්ප්‍රයුක්ත මහාක්‍රියා දෙසිතෙන් සිනාපහළකෙරෙත්. මේ තෙළෙස් චිත්තයන් අතුරෙන් හසිතොත්පාද චිත්තය හැර අවශෙෂ චිත්තයෝ තුමූ සිනාමාත්‍රයක්ම නොව අවශෙෂ නොයෙක් ක්‍රියාවන්දකරවත්. මේ හසිතොත්පාද චිත්තය වනාහි පවවාරයෙහි රහතුන්ට සිනාපහළකිරීම්විශයෙන්ම උපදී. මේ චිත්තය අන් ක්‍රියාවක්කොකොට නැකිවෙයි. එහෙයින් හසිතුපපාද යන නාමය මෙම චිත්තයටම අසිතිවෙයි. සම්ප්‍රයුක්ත හෙතු රහිත බැවින් අහෙතුකාහසිතාර යෙහි දක්වනලදී. රහතුන්ට පවවාරයෙහි කෙසේ සිනාපහළ කෙරේදයත්? ප්‍රඥන්ත්‍රියට සරුප්වූ සෙනසුනක් දුටු ඇත්හි

මේ සෙනසුන විදර්ශනා භාවනාකරන්නවුන්ට යොගාසයයි වක්ෂු වාරයෙහි සිතාපහලකිරීම්වශයෙන් උපදී. පෘථග්ජන භික්ෂූන්ගේ ඝණභාජන ස්ථානයෙහි ඔසුන් අසුවූ කෙවුලුන්ගේ ශබ්දයක්මෙන් මහත්වූ උස්වූ ශබ්දය අසා අහෝ මේ ලාලුප තාභණ්ඩය මා විසින් නසනලද්දේ නොවේදැයි සොත වාරයෙහි සිතාපහලකිරීම්වශයෙන් උපදී. කසතුරි කපුරු සුවඳමල් ආදී සුගන්ධයක් රහතුන්ගේ ඝ්‍රාණපුශාදයෙහි ගැටුනාක්හී අහෝ මේ සුගන්ධය බුඩපූජාවට ලැබුනේනම් මැනවැයි ඝ්‍රාණවාරයෙහි සිතාපහලකිරීම්වශයෙන් උපදී. රහතුන්ට රසසම්පන්නවූ විශිෂ්ඨ පානයක් ලැබී සබ්‍රහ්මචාරීන් සමඟ බෙදා වළඳනාක්හී ජිව්හා වාරයෙහි සිතාපහලකිරීම් වශයෙන් උපදී. රහතුන්ට සබ්‍රහ්මචාරීන් විසින් අත්පා ආදී කායිකවතාවත්කරණාක්හී කායවාරයෙහි සිතාපහළකිරීම් වශයෙන් උපදී. මෙසේ මේ චිත්තය පවවාරයෙහි කුඩා අරමුණෙහි සිතාපහළකිරීම්වශයෙන්මූත් සෙසු දෙළොස් චිත්තයන්මෙන් දශඅකුශල කර්මපථාදිවශයෙන්හෝ නුපදනාහෙයින් හසිතුපපාදයයි කම්කරණලද්දේයි. මේ සිතාවවනාහි සිතය, හසිතය, විහසිතය, උපහසිතය, අපහසිතය, අතිහසිතයයි සඝාකාරවේ. ඔවුන් අතුරෙන් මුඛනඝනාදියෙහි ප්‍රීතිමත් ආකාර දැක්වීම සිතනම්වෙයි. සර්ඥවරඝන්ට වත්‍රාහි ඒ සිතයමූත් අවශෙෂ පස් සිතාව නුපදී. එහෙයින් "සිතං පාතුකාසි" යනාදීන් පාළියෙහි ආඝේය සර්ඥඝන්වහන්සේගේ ශ්වෙතවර්ණවූ දන්තරසම්ප රාජහංස ධෙනුවක්මෙන් සිරොධාතුඩ ප්‍රදක්ෂිණාකරණාක්හිම සර්ඥඝන්වහන්සේ සිතාසුනේයයි දැනගන්නේයි දත්විදාත කොට සිතාසීම "හසිත" නම්වෙයි මිහිරිහඬින් සිනාසීම විහ සිතනම්වෙයි. දෙදසරුව සැලෙනසේ සිනාසීම. උපහසිතනම් වෙයි කඳුලුධාරා වහරුවා සිනාසීම අපහසිතනම්වෙයි. ශරීරය ඉදිරියට හෝ පසුභාගයට පෙරළ පෙරළා සිනාසීම අතිහසිත කම්වෙයි. මෙසේ සිනාව සැවැදැරුම්වන්නේයයි දතයුතුයි. මේ අහෙතුක ක්‍රියා චිත්තයන් තුන්දෙනා අතුරෙන් පාළි අට්ඨකථාදි යෙහි "උපෙක්ඛා සහගතං ක්‍රියාහෙතුක මනොධාතු චිත්තං" යන්නෙන් වදාළ චිත්තය පවවාරාවජ්ජනනම්ද, "උපෙක්ඛා සහගතං ක්‍රියාහෙතුක මනොවිඤ්ඤාණ ධාතු චිත්තං" යන්නෙන් වදාළ චිත්තය මනොද්වාරා වජ්ජනනම්ද, "සොමනස්ස සහගතං ක්‍රියාහෙතුක මනොවිඤ්ඤාණ ධාතුචිත්තං" යනුවෙන් වදාළ චිත්තය හසිතුපාදනම්ද, ආයුෂ්මත් අනුරුඬාචාරීන්

විසින් සංක්ෂේපකරණ්ඩ පිණ්ඩිත මේ අභිධම්මාවතාර සංග්‍රහයෙහි යොදනලද්දේයි. මේ ග්‍රන්ථකරණයවනාහි අර්ථදර්ශනයෙන් ගතුළුවා රචනාකළාක්මෙන්ම ග්‍රන්ථවිශදයෙන්ද ගතුළුවා රචනාකරණ්ඩ පිණ්ඩිත දෙශනා පාළියෙහි ආවාවූ මේ දීඝීවූ නම් තුණ්හීන් ගතු එවා මෙසේ රචනාකළපසු පශ්චිමාචාරීන් වීසිනුදු ඒ නම් තුණ පිළිගන්නාලද්දේයි.

අවලෝස් අහෙතුක චිත්තයන්ගේ සංක්ෂේප විසතර කථාව නිමියේයි.

පාපාහෙතුක මුත්තානි, අකුශල චිත්ත අහෙතුක චිත්ත යන්හෙන් මිදුනාවූ; ඒකුත්තසිති, එකුත්සැටක් හෝ; චිත්තානි, චිත්තයෝ; සොභනානීති, සොභනනාම් ඇත්තාවූ චිත්තයෝයයි; වුච්චරි, (වුච්චතේ) කියනුලැබේ. සොමනස්ස සහගතං, සොමනස් වේදනාව හා එකොත්පාදදී වශයෙන් මිශ්‍රවූ නොහොත් එකොත්පාදදීබවට ගියාවූ; ඤාණසම්පයුත්තං, ඥානය හා එකොත්පාදද් ප්‍රභෙදයෙන් යුක්තවූ; අසඞ්ඛාරිකං; මෙහෙයුම් රහිතවූ; චිත්තං, චිත්තයද; එකං, එකෙකි; සොම නස්ස සහගතං, සොම්නස් වේදනාව හා එකොත්පාදදීවශයෙන් මිශ්‍රවූ නොහොත් එකොත්පාදදීබවට ගියාවූ; සසඞ්ඛාරිකං, මෙහෙයුම් සහිතවූ නොහොත් මෙහෙයුම් සහිතව හටගත්තාවූ: චිත්තං, චිත්තය; එකං, එකෙකි; සොමනස්ස සහගතං, සොම නස් වේදනාව හා එකොත්පාදදීවශයෙන් මිශ්‍රවූ නොහොත් එකොත්පාදදීබවට ගියාවූ; ඤාණවිප්පයුත්තං, ඥානය හා යුක්තනොවූ; චිත්තං, චිත්තයද; එකං, එකෙකි, සොමනස්සසහ ගතං, සොම්නස් වේදනාව හා එකොත්පාදදීවශයෙන් මිශ්‍රවූ නොහොත් එකොත්පාදදීබවට ගියාවූ; ඤාණවිප්පයුත්තං, ඥානය හා යුක්ත නොවූ; සසඞ්ඛාරිකං, මෙහෙයුම් සහිතවූ නොහොත් මෙහෙයුම් සමග හටගත්තාවූ; චිත්තං, චිත්තය; එකං, එකෙකි; උපෙක්ඛාසහගතං, උපෙක්ෂා වේදනාව හා එකොත්පාදදීවශයෙන් මිශ්‍රවූ නොහොත් එකොත්පාදදීබවට ගියාවූ; ඤාණසම්පයුත්තං, ඥානය හා එකොත්පාදදීවශයෙන් යුක්තවූ; අසඞ්ඛාරිකං, මෙහෙයුම් රහිතවූ; චිත්තං, චිත්තයද; එකං, එකෙකි; උපෙක්ඛාසහගතං, උපෙක්ෂාවේදනාව හා එකොත්පාදදීවශයෙන් මිශ්‍රවූ නොහොත් එකොත්පාදදීබවට ගියාවූ; ඤාණසම්පයුත්තං, ඥානය හා එකොත්පාදදීවශයෙන් යුක්තවූ; සසඞ්ඛාරිකං, මෙහෙයුම් සහිතවූ; චිත්තං, චිත්තයද; එකං, එකෙකි; උපෙක්ඛාසහගතං, උපෙක්ෂාවේදනාව හා

එකොත්පාදදීවශයෙන් මිශ්‍රවූ නොහොත් එකොත්පාදදීබවට ගියාවූ; ඤාණවිප්පයුත්තං, ඥානයෙන් වියුක්තවූ; අසඞ්ඛාරිකං, මෙහෙයුම් රහිතවූ; චිත්තං, චිත්තයද; එකං, එකෙකි; උපෙක්ඛා සහගතං, උපෙක්ඛා වෙදනාව හා එකොත්පාදදීවශයෙන් මිශ්‍රවූ නොහොත් එකොත්පාදදීබවට ගියාවූ; ඤාණවිප්පයුත්තං, ඥානය හා යුක්තනොවූ; සසඞ්ඛාරිකං, මෙහෙයුම් සහිතවූ; චිත්තං, චිත්තයද; එකං, එකෙකි; මේ "ව" ශබ්දය සිංහාව ලොකත්‍යායෙන් මූලඝපතස්ථානයෙහිද යෙදේ. ඉති ඉමිනා පභෙදෙන, මේ කියනලද ක්‍රමයෙන්; අඨපි, අෂ්ටප්‍රකාරවූද; ඉමානි චිත්තානි, මේ චිත්තයෝ තුමූ; කාමාවචර කුසලචිත්තානි නාම, කාමාවචර කුශල චිත්තයෝය යන නම් ඇත්තාහු; හොනති, වෙත්. ඉති ඉමිනාපභෙදෙන, මේ ප්‍රභෙදයෙන්; අඨපි ඉමානි චිත්තානි. මේ චිත්තයෝ අටදෙන; සහෙතුකාමාවචර විපාක චිත්තානි නාම, සහෙතුකවූ කාමාවචර විපාක චිත්ත යෝය යන නම් ඇත්තාහු; හොනති, වෙත්. ඉති ඉමිනාප භෙදෙන, මේ ප්‍රභෙදයෙන්; අඨපි ඉමානි චිත්තානි, අෂ්ට ප්‍රකාර වූද මේ චිත්තයෝ තුමූ; සහෙතුකාමාවචර ක්‍රියා චිත්තානිනාම, සහෙතුකවූ කාමාවචර ක්‍රියා චිත්තයෝය යන නාම් ඇත්තාහු; හොනති, වෙත්. ඉදෙවවං, ඉති එවං යථාවුත්තනයෙන) මේසේ කියනලද ක්‍රමයෙන්; සබ්බථාපි, කුශලය, විපාකය, ක්‍රියාය, යන සම්ප්‍රකාරයෙහුදු; චතුවීසති, සුවිස්සක් ප්‍රභෙදවූ: සහෙතු කාමාවචර පුඤ්ඤපාකක්‍රියා චිත්තානි, කාමාවචර කුශල්ය, සහෙ තුක කාමාවචර විපාකය, සහෙතුක කාමාවචර ක්‍රියාචිත්තයෝය යන චිත්තයෝ තුමූ; සමත්තානි, සංක්ෂෙපයෙන් සංග්‍රහකොට අභිධන්නාලද්දහුය. නොහොත් චතුවීසති, සුවිස්සක් ප්‍රභෙදවූ; සහෙතුක කාමාවචර කුසල විපාක ක්‍රියා චිත්තානි, සහෙතුක කාමාවචර කුශල විපාක ක්‍රියා චිත්තයෝ; සමත්තානි, සංග්‍රහ කොට අභිධන්නාලද්දහුය; සහෙතුකාමාවචර පුඤ්ඤපාක ක්‍රියා, කාමාවචර කුශල්ය, සහෙතුකකාමාවචර විපාකය, සහෙ තුක කාමාවචර ක්‍රියාය යන චිත්තයෝ; වෙදනාඤාණ සඞ්ඛාර භෙදෙන, වෙදනා ඥානසංඛාරයන්ගේ ප්‍රභෙදයෙන්; පවෙව කං, වෙන වෙනම; විඛත්තාව, විප්‍රකාරවූභෙයින්ද; චතුබ්බි ධත්තාව, සතරාකාරවූභෙයින්ද; අඨවිධත්තාව, අෂ්ටප්‍රකාරවූ භෙයින්ද: සම්පිණ්ඩිත්වා සියල්ල පිඬුකොටගෙණ; ඡව, සදෙන කැයි කියාද; වාදසව, දෙලොස් දෙනෙකැයිකියාද; චතුවීසති, සුවිසිදෙනෙකැයි කියාද; පණ්ඩිතෙහි, විජම් ඇදුරන් විසින්;

කාමේ, එකොළොස් කාමභවයෙහි; අවචරානි, හෙතුඵල වශයෙන් හැසිරෙන්නාවූ; චිත්තානි, චිත්තයෝ තුමූ; තෙවීස පාකානිච, තෙවිසි විපාක සිත්කෙනෙක්ද; වීසති සුසඳසා පසඳසා ණිච, විංශති ප්‍රභෙදවූ කුශලා කුශල සිත්කෙනෙක්ද; එකාදස ක්‍රියාච්ඡනි, එකොළොස් ක්‍රියා සිත්කෙනෙක්දැයි; සබ්බථාපි, කුශලා කුශල විපාක ක්‍රියාවන්ගේ අභ්‍යන්තරයෙහි ඇතුලත්වූ සියලු ප්‍රභෙදයෙන්ද; චතුපඤ්ඤස එව, සුපණ්ස භෙදතෙක්ම; සියුං, වන්නාහුය; තතො, ඒ සුපණ්ස චිත්තයන් කෙරෙන්; ඵනාධිකානි, ඵනාධිකවූවාහු; නසියුං, නොවෙත්.

ඉමිහි භාවය.

කාමාවචර කුශල චිත්තයෙහි සංක්ෂෙප භාවය කෙසේ ඇත්? කාමාවචර කුශල චිත්තයෙහි "ඉමානි අඨපි සහෙතුක කාමාවචර කුසල චිත්තානි නාම" යනුවෙන් සහෙතුක යන විශෙෂණ පදය නොයොදා, විපාක ක්‍රියා නිගමනයෙහිම සහෙතුක විපාක ක්‍රියාචිත්තානි, සහෙතුක ක්‍රියා චිත්තානි" යනුවෙන් සහෙතුක ශබ්දය කුමක්හෙයින් විශෙෂණකලාහුද යත්? එසේම කුශල චිත්තයෙහිත් සහෙතුක ශබ්දය විශෙෂණය කෙළේ කවර දෙසක් වන්නේද යත්? කාමාවචර කුශලයෝ වනාහි එකාන්තෙන සහෙතුකමවෙති. ඉදින් අහෙතුකවූ කාමාවචර කුසල් සිත් කෙනෙකුන් විද්‍යමානවෙත්නම් එසේ ඇති කල්හි කාමාවචර කුශල චිත්තයන්ගේ ව්‍යභිචාරය ඇත්තේවෙයි. එකල්හි "සමභාසඵලඤාණවිප්පයුත්තානං විසෙසනත්ථං සාමඤ්ඤතිකා" යනුන්‍යායය බැවින් "සහෙතුක" ශබ්දය විශෙෂණ කටයුතුවෙයි. එබඳු අහෙතුක කාමාවචර කුසල් සිත් කෙනෙක් නැයි බැවින් "සහෙතුක" යන විශෙෂණය යෙදූයේනම් එකාන්තයෙන් නිෂ්ප්‍රයොජනවෙයි. එහෙයින් කාමාවචර කුසල චිත්තයන්හා සමග සහෙතුක යන විශෙෂණය නොයොදන ලද්දේයයි දතයුතු. එසේවීනම් කාමාවචර විපාක ක්‍රියාවන්හා සමග ඒ සහෙතුක යන විශෙෂණය කුමක්හෙයින් යෙදූයේද යත්? අහෙතුකාධිකාරයෙහි දක්වනලද්දාවූ කාමාවචර විපාකයෝ අවදෙනෙක් සහ ක්‍රියාවෝ තුන්දෙනෙක්ද කියනලද්දාහුය. එහෙයින් මේ කාමාවචර විපාක ක්‍රියාවන්ගේද අහෙතුකභෙදී සහෙතුකභෙදී හෝයි ව්‍යභිචාරය ඇත්තේයි. එහෙයින් ඒ ව්‍යභිචාරය වලක්වනු පිණිස විපාක ක්‍රියාවන් හා සමග සහෙතුක ශබ්දය විශෙෂණකලාහයි දතයුතු. මේ කාමාවචර කුශලයන්ටම ඉදිරියෙසේ වියයුතුනම් සියලු චිත්තයන්ගේ නිගමනයෙහි "චතුවී

සතිසම්පයුත්ත කාමාවචර කුසල විපාක ක්‍රියා චිත්තානි" යන වාක්‍යයෙහි ව්‍යභිචාරය නැතිවම කුශල ශබ්දයට පූර්වභාගයෙහි සහේතුක යන විශේෂණය කුමක්හෙයින් යෙදූයේක්ද යත්? එසේ යෙදුයේ නම්දු ඒ සහේතුක යන විශේෂණපදය යථාලාභ ව්‍යාප්තිවශයෙන් සහේතුක විපාකය සහේතුකක්‍රියාය යනුවෙන් විපාකක්‍රියාවන් හා යෙදෙන පමණමුත් කුශල ශබ්දය හා නොයෙදේමැයි කුමක්මෙන්ද යත්? සාමඤ්ඤඵල සූත්‍රපාළියෙහි "සක්කච්චකතඤ්ඤකම්පි මඤ්ඤුමඤ්ඤම්පි චරණම්පි තිට්ඨනම්පි" යන උදාහරණයෙහි වචනපරිපාටියවශයෙන් චරණ ක්‍රියාව සක්කච්චකතඤ්ඤා ශබ්දය හා සමගද, තිට්ඨනා ක්‍රියාව මඤ්ඤුමඤ්ඤ ශබ්දය හා සමගද යෙදියයුතුවෙයි. ඉදින් එසේ යෙදූයේනම් හැසිරෙන්නාවූ කෑටකාබිලිත්ය, සිටින්නාවූ මත්ස්‍යගුම්බය, නෙවත් මසුන් රංචුවය, යන විපරීතාර්ථයක් හැඟේ. එහෙයින් යථාලාභන්‍යායවශයෙන් වචන පරිපාටිය නොසලකා සක්කච්චකතඤ්ඤා ශබ්දය හා සමග තිට්ඨමාන ක්‍රියාවද, මඤ්ඤුමඤ්ඤ ශබ්දය හා චරණ ක්‍රියාවද යෙදුකල්හී ඉෂ්ටාර්ථයලැබේ. එපරිද්දෙන්ම මෙහි වචන පරිපාටිය නොසලකා "සහේතු" යන විශේෂණ පදය විපාක ක්‍රියා ශබ්දය හා සමග යොජනාකොට අර්ථගත යුතුයි. මහා යන විශේෂණයකොට කාමාවචර චිත්තයන් කෙරෙන් අතිශයින් පූජ්‍යවූ මහද්ගත ලෝකොත්තර චිත්තයන් සමග ඒ මහා යන විශේෂණය කුමක්හෙයින් නොයෙදූයේක්ද යත්? ඒ මහද්ගත කුශලයන් අතුරෙන් ප්‍රථමධ්‍යාන කුශල ප්‍රථම ධ්‍යාන භූමියෙහිද, ද්විතීය තෘතීය චතුර්ථධ්‍යානයෝ ඒ ඒ භූමියෙහිද, සතර අරූපාවචර ධ්‍යානයෝ සතර අරූපභූමියෙහිද, විපාකදෙත්මය. සොවාන් ශකෘදාගාමී අනාගාමී අර්හත් යන සතරමාර්ග කුශල චිත්තයෝ තමතමන්ගේ විපාක චිත්තයම උපදවත්. මෙසේ මහද්ගත ලෝකොත්තර චිත්තයන්ගේ විපාක දූනසඟහාව සංක්ෂේප බැවින් මහා යන විශේෂණය නොකරණ ලද්දේයි. කාමාවචර කුශලය එසේනොවෙයි. ප්‍රතිසන්ධි වශයෙන් කාමාවචර ප්‍රතිසන්ධිහු නවදෙනෙක්ද, කාමසුගති භූමිහු සත්දෙනෙකද දියහැකිවෙති. ප්‍රවෘත්ති විපාකයවනාහි අවීචිමහා නරකය පටන් භවාග්‍රය දක්වා එක්තිස් භූමියෙහිම සුදුසු පරිද්දෙන් දියහැකිවෙයි. එසේම මනුෂ්‍ය ලෝකයෙහි ප්‍රවෘත්ති කාලයෙහි චක්‍රවර්ති රාජ්‍ය සම්පත්තිය, මණ්ඩලිකරාජ්‍ය සම්පත්තිය ප්‍රදේශ රාජ්‍ය සම්පත්ත්‍ය, එසරාජ රාජ්‍ය සම්පත්තිය බ්‍රාහ්මණ මහාසාර, ගෘහපති මහාසාර, ක්ෂත්‍රිය මහාසාර සම්පත් ආදියද දී, මෙසේ කාමාවචර කුශලයන්ගේ විෂය මහත්ත්වය

හෙතුකොටගෙණ "මහා" යන විශෙෂණයකළ පමණමුත් පූජ්‍යාර්ථයෙන් මහායයි අර්ථොගතයුතුයි. කාමාවචර විපාකය කුමක්හෙයින් මහාවිපාකයයි ව්‍යවහාරකළේද යත්? මහද්ගත ලොකොත්තර විපාකයන්ට වඩා මහත්වූ විපාකදෝහෝයි සැකකටයුතුවේ. මහාකුශලයන්ගේ විපාකහෙයින් මහාවිපාක යයි ව්‍යවහාරකළ පමණමුත් මහද්ගත ලොකොත්තර විපාක යන්කෙරෙන් මහත්වූ අර්ථයෙන් මහාවිපාකයයි ව්‍යවහාර නොකෙරෙත්. එසේම කාමාවචර විපාකයන්ටද "මහා" යන විශෙෂණය මහාකුශලයන්ට බදු බැවින් මහාක්‍රියායයි ව්‍යව හාරකෙරෙත්. ඒ මහාක්‍රියාවෝ වනාහි ච්චිට්ඨපෙඡ්ජයකළාවූ බුදු පසේබුදු මහරහතුන්ට පමණක් උපදනාහුය. ඉදින් ඒමහා ක්‍රියා චිත්තයෝ පෘථග්ජන ශෛක්ෂ්‍ය සන්තානයෙහි උපදිත්නම් එකාන්තයෙන් විපාකදෙත්මැයි. එහෙයිනුදු මහාක්‍රියායයි ව්‍යව හාරකෙරෙත්.ඒමහාක්‍රියා චිත්තයෝඔක්කාහි පෘථග්ජන ශෛක්ෂ්‍ය යන්ගේ සන්තානයෙහි උපදිත්නම් විපාක ලැබෙත්යයි කීවාක් මෙන් පවචාරු ජින මනොචාරුවජින චිත්තයෝ තුමූ පෘථග් ජන ශෛක්ෂ්‍යයන්ගේ සන්තානයෙහි ඉපිද කුමක්හෙයින් විපාකනොදෙන්කාහුද යත්? පෘථග්ජන ශෛක්ෂ්‍යසන්තාන යෙහි උපදනාවූ ඒ අහෙතුක ක්‍රියාවෝ දෙදෙන ආසෙවන ප්‍රත්‍යය නොලබනහෙයින් විපාක නොදෙන්නේයයිද දතයුතු. ඒට උපමා කවරයත්? කිසිකලක මල්ඵල හටනොගත්තාවූ වෘක්ෂයක් වැසිනැත්තාවූ කාලයක්හි අකල් මල්ඵත්තේද එයින් ඵලය නුපදී. එපරිද්දෙන්ම පෘථග්ජන ශෛක්ෂ්‍යයන්ගේ සන්තා නයෙහි උපදනාවූ පවචාරුවජින මනොචාරුවජින දෙදෙන සමාන චිත්තයකින් ආසෙවන ප්‍රත්‍යය නොලබනහෙයින් අකල් මල්මෙන් විපාක නුපදවන්නාහුයයි දතයුතුයි. ඉදින් ආසෙ වන ප්‍රත්‍යය ලැබීමෙන් විපාකදියයුතුනම් රහතුන්ට උපදනා මහාක්‍රියා චිත්තයෝ සමාන ජාතික සිතින් ආසෙවන ප්‍රත්‍යය ලැබ කුමක්හෙයින් විපාක නුපදවන්නාහුද යත්? වෘතමූලය සඵල ඝාතනයකළාවූ බුදුන් රහතුන්ගේ සන්තානයෙහි නුප දනාහෙයින් ආසෙවන ප්‍රත්‍යය ලැබුවාවූද මහාක්‍රියා චිත්තයෝ විපාක නුපදවන්නාහුයයි. දතයුතු කුමක්මෙන්ද යත්? මූලින් උදුරාගන්නාලද වෘක්ෂයෙක්හි මල් පිපිධ්‍යේද ඒමල් වියලීම පමණමුත් එයින් ඵලය නුපදවන්. එහෙයින් වෘතමූලොපච්ඡි දනයකළාවූ බුදුන් රහතුන්ගේ සන්තානයෙහිම උපදනාහෙයින් ආසෙවන ප්‍රත්‍යය ලැබුවාවූද මහාක්‍රියා චිත්තයෝ විපාක නුපද වත්තයයිදතයුතු. මහාකුශලය සොම්නස්වීමට හෙතුහු නුවූ

දෙනෙක්වෙති. ඒ කවරහුදයත්? යොග්‍යවූ දානවස්තුවක් ලැබීමය, යොග්‍යවූ ප්‍රතිග්‍රාහකයෙක් ලැබීමය, යොග්‍යවූකාලසම්පත්තියක් ලැබීමය යොග්‍යවූ ප්‍රතිරූපදේශයක් ලැබීමය, යහපත් කල්‍යාණ මිත්‍රයන් ලැබීමය, පිරිසිදු සම්‍යක්දෘෂ්ටිය ඇතිබවය, ප්‍රතිග්‍රාහකයාගේ ගුණදැනීමය, දානයෙහි අනුසස්දැනීමය, සොම්නස් සහගත සතරපරිසක්ඛියෙන් යම් සිතකින් පරිත්‍යාගැණීමය යනමේ කාරණා නවයෙන් සම්පූර්ණවූකල්හි සෞමනස්වේදනාවෙන් උතුම්වූ මහාකුශල චිත්තය උපදී. මේකාරණා නවයෙන් එකක් හෝ බොහෝ ගණනක් හෝ අඩුවීනම් උපෙක්ඛාසහගත කුශල චිත්තය උපදී. මහාකුශල චිත්තය ඥානසම්ප්‍රයුක්තවීමට හෙතු පසෙක් ඇත්තේය. ඒ කවරහුදයත්? අතීතජාතියෙහි ප්‍රඥාව ලබම්වා යන ප්‍රාර්ථණාවෙන් ධර්මචිනය උගන්වා දීම හා නිරවද්‍ය ශිල්පශාස්ත්‍රාදිය උගන්වාදීමද එක්කාරණයකි, ප්‍රඥාසංවර්ධනීයවූ හෙවත් ප්‍රඥාව ලබම්වායන ප්‍රාර්ථණාවෙන් ධර්මදේශකාදීන්ට හෝ ධර්මය ඉගෙණගන්නාවුන්ට හෝ තෙල් පහන් දානවස්තු ආදියපිරීම එක්කාරණයකි, තමාද නිරවද්‍යවූ ශාස්ත්‍රශිල්පාදීන් උගන්නේවේද, ප්‍රඥාදශකයට පැමිණ ප්‍රඥෙන්ද්‍රියය මුහුකෙළේවේද, ඒදානවස්තුව දෙන්නාවූකල්හි ලොභ වෙෂ මොහයන්ගෙන් ඒදානමය කුශලචිත්තය පිරිවරකොට නොගන්නාලද්දේවේද යනමේ කාරණාපසින් සම්පූර්ණවිනම් උත්කෘෂ්ටවූ ඥාන සම්ප්‍රයුක්ත කුශලචිත්තය උපදී. මේ පසින් එකක් හෝ කීපයක් හෝ අඩුවිනම් ඥානවිප්‍රයුක්තවේ. මේ මහාකුශලය අසංඛාරිකවීමට හෙතුදෙකක් ඇත්තේවේ. ඒකවර දෙකක්ද යත්? දානවස්තුව මූර්ඛත්‍යාගතාවයෙන් යුක්තව ප්‍රතිග්‍රාහකයාගේ හස්තයෙහි පිහිටුවන්නේවේද එකාන්තයෙන් ඒ දානයාගේ කුශලානිශංසය ලබම්හයි යන දෘඪතර කල්පණාවක් ඇත්තේවේද යනමේ අඞ්ගවයෙන් සම්පූර්ණවිනම් මහාකුශලය අසංඛාරිකවෙයි. මේ අඞ්ගවයෙන් හෝ එකකින් හෝ අඩුවිනම් සසංඛාරික කුශලචිත්තයවෙයි. මේ කාමාවචර මහාකුශල චිත්තයෙහි සහගීදිවූ චෛතසික ධර්මයෝ අවකිස්දෙනෙක් යෙදෙන්නාහුද කුමක්හෙයින් වේදනා ඥානදෙකින්ම හෙදය දක්වූයේද යත්? සහගීදිවූ ධර්මයෝවනාහි සම්ප්‍රයුක්තසාධාරණයෝවෙති. එබඳු ධර්මයන්ගෙන් විශෙෂය නොපෙන්විය හැකි වෙයි. වේදනා ඥානයෝවනාහි සම්ප්‍රයුක්තසාධාරණ නොවන හෙයින් ඔවුන්ගෙන්ම විශෙෂය දක්වූහයි දතයුතුයි. වේදනා භෙදයවනාහි සෞමනස්‍ය උපෙක්ඛාවශයෙන් දෙආකාර බැවින්

වෙදනා භෙදය ලැබෙන්නේමැයි. ඥානභෙදය වන්නේ ඥාන සම්ප්‍රයුක්ත චිත්තයෙහි මුත් ඥානවිප්‍රයුක්ත චිත්තයෙහි කෙසේ ලැබෙන්නේද යත්? "සඞ්ඛාරතෝ සුඛිතකඛාදුක්ඛිතකඛා" යන උදාහරණයෙහි වර්ෂාව ඇතිකල්හී ලැබෙන්නාවූ සුඛිතභාවයද, වර්ෂාව නැතිකල්හී ලැබෙන්නාවූ දුර්භික්ෂභාවයද, යනදෙකම වර්ෂාව විසින් කරන්නාක්මෙන් ඥාණය ඇතිනැතිකල්හිවන්නාවූ භෙදයද ඥානය විසින්ම කරණලද්දේයයි දතයුතුයි. සඞ්ඛාරය වන්නේ ඒ චිත්තයෙහි යෙදෙන්නාවූ චෛතසික ධර්මයන්දෝ හෝයි සැක නොකටයුතුයි. මෙරමාගේ සන්තානයෙහි හෝ තමාගට පූජාභාගයෙහි උපදින්නාවූ චිත්තයකින් හෝ සංඝකාරය චිත්තයට ලැබෙන බැවින් චිත්තයාගේ සෑදීම නොහොත් සැරසීම සංඝකාරයයි දතයුතුයි. කුශල්කිරීමෙහි පුරුද්ද ඇත්තාවූ සත්පුරුෂයෝ තමාගේ සිතින් සිතා මතා දන්දීම කෙරෙති. එසතු තෘෂ්ණාව ආදී උපද්‍රව නිසා දන්දීමට මැලිවූවන්ට අනුන්ගේ අවවාද අනුශාසනාවෙන් දානඞ්ගාශය උපදවා දන්දෙති. එහෙයින් තියුණු මුවහත් ඇති ශස්ත්‍රයකින් කැපීමක්මෙන්ද, මොටවූ ශස්ත්‍රය මුවහත් තබා කැපීමක්මෙන්ද, මේ අසංඝකාර සසංඝකාර චිත්තවල උපදින සැටි දතයුතුයි. මේකාමාවචර කුශල චිත්තය චක්ඛුරාදී පවචාරයෙහිද, මනොචාරයෙහි අර්පණාප්‍රපත්තිය නොවිම්වශයෙන්ද, මනොචාරයෙහි අර්පණාප්‍රපත්තිය විම්වශයෙන්දයි ත්‍රිවිධාකාරයකින් උපදී. ඔවුන් අතුරෙන් පවචාරයෙහි උපදනා මේ මහාකුශල චිත්තවීථිය වෘක්ෂයෙක්හි හවගත්තාවූ වානප්‍රස්ථතාපසයන්මෙන්ද, මනොචාරයෙහි අර්පණාප්‍රපත්තිය නොවිම්වශයෙන් උපදනා කුශලය එම වෘක්ෂයෙහි ගැටකාලයෙහි වැටෙන්නාවූ ඵලමෙන්ද, අර්පණාප්‍රපත්තිවිම්වශයෙන් උපදනා කුශල චිත්තය සම්පූර්ණකල් ඉක්මවා වර්ණ ගන්ධ රසයෙන් සම්පූර්ණව විලිකුම්ව ගිය ඵලමෙන්ද දතයුතුයි. එපරිද්දෙන් පවචාරයෙහි උපදනා කාමාවචර කුශලයන්ගේ විපාකවශයෙන් අනුන්ගේ රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ, යන පඤ්චකාම සම්පත්තීන් දැකීම් මාත්‍රයකින් කුශල විපාක අහේතුක ප්‍රවෘත්තිඵල මාත්‍රයක් ලැබේ. මනොචාරයෙහි අර්පණාප්‍රපත්තිනොවිම්වශයෙන් උපන් කුශලයාගේ විපාකයෙන් අනුන්ට බැලමෙහෙකිරීම් ආදීයෙන් උපදවාගන්නාලද්දවූ දුක්ඛජීවිතා සඞ්ඛ්‍යාත ඵලයඋපදී. මනොචාරයෙහි අර්පණාප්‍රපත්තිවශයෙන් උපන් කාමාවචර මහාකුශලයාගේ අතිඋත්තමාර්ථ කුශලය සදේව්‍යලෝකයෙහි මහෙශාක්‍ය දෙවියන්ගේ හා මනුෂ්‍ය ලොකයෙහි සක්විති ආදී රජුන්ගේද සම්පත්ලාභ ජීවී සඞ්ඛ්‍යාතවූ නිරාශාසයෙන් සිතූ පැතූ සියලු සම්

පත් ලැබීමද, උත්තරාෂ්ට මඩ්‍යම්වශයෙන් රැස්කළාවූ කාමාවචර කුශලය උත්තාන ඵලවූ ජීවී සඞ්ඛ්‍යාතවූ ගොවිකම් වෙළඳුම් ආදිවූ තමාගේ ව්‍යාපාරයෙන් සම්පත් උපදවයි.

—————o—————

විතක්ක විචාර පීති සුඛෙකග්ගතා සහිතං, විතක්කය, විචාරය, පීතිය, සුඛය, චිත්තෛකාග්‍රතාය, යන ධ්‍යානාඞ්ග පඤ්චකයකින් යුක්තව හටගත්තාවූ: පඨමජ්ඣානකුසල චිත්තය, ප්‍රථමධ්‍යානය හා සම්ප්‍රයුක්තවූ කුශලචිත්තයෙක්ද; විචාර පීති සුඛෙකග්ගතා සහිතා, විචාර, පීති, සුඛ, එකග්ගතා, යන ධ්‍යානාඞ්ග චතුෂ්කයකින් යුක්තව හටගත්තාවූ; දුතියජ්ඣාන කුසල චිත්තං, ද්විතීයධ්‍යානය හා සම්ප්‍රයුක්තවූ කුශල චිත්තයෙක්ද; පීතිසුඛෙකග්ගතාසහිතං, ප්‍රීති, සුඛ, එකාග්‍රතා, යන ධ්‍යානාඞ්ගත්‍රයකින් යුක්තව හටගත්තාවූ; තතියජ්ඣාන කුසල චිත්තය, තෘතීය ධ්‍යානය හා සම්ප්‍රයුක්තවූ කුශල චිත්තයෙක්ද; සුඛෙකග්ගතා සහිතං, සුඛෛකාග්‍රතා සඞ්ඛ්‍යාත ධ්‍යානාඞ්ගවයකින් යුක්තව හටගත්තාවූ; චතුත්ථ ජ්ඣාන කුශල චිත්තය, චතුර්ථධ්‍යානය හා සම්ප්‍රයුක්තවූ කුශල චිත්තයෙක්ද; උපෙක්ඛකග්ගතා සහිතං, උපේක්ෂාඑකාග්‍රතා සඞ්ඛ්‍යාත අනික් ධ්‍යානාඞ්ගවයකින් යුක්තව හටගත්තාවූ; පඤ්චමජ්ඣානකුසල චිත්තය, පඤ්චමධ්‍යානයෙන් යුක්තවූ කුශලචිත්තයෙක්ද; මෙ "ච" ශබ්දය මූලසතර තන්හිද සිංහාවලෝකනන්‍යායෙන් යෙදෙයි; ඉති ඉමිනාපභෙදෙන, මෙසේ මේ ප්‍රභේදයෙන්; පඨමපි, පස්වැදෑරුම්වූද; ඉමානි චිත්තානි, මේ චිත්තයෝ තුමූ; රූපාවචර කුසල චිත්තානි නාමහොනති, රූපාවචර කුශල චිත්තයෝනම්වෙති. ඉච්චෙවං, (ඉති එවං යථා වුත්තනයෙන) මෙසේ මේකියනලද ක්‍රමයෙන්; සඞ්ඛථාපි, කුශල විපාක ක්‍රියා සඞ්ඛ්‍යාත සත්‍රිප්‍රකාරයෙන්ද; පණ්ණරස, පසළොස්වූ; රූපාවචර කුසල විපාක ක්‍රියා චිත්තානි, රූපාවචර කුශලය, රූපාවචර විපාකය, රූපාවචර ක්‍රියාය යන මේ චිත්තයෝ තුමූ; සමත්තානි, සම්පූර්ණීකරණලද්දාහුය; නොහොත් සංග්‍රහනොට සංක්ෂේප යෙන් අසීඝන්නාලද්දාහුයයි දතයුතුයි.

රූපාවචර මාතෘකය, රූපාවචර චිත්තය තෙමේ; ඛ්‍යාත හෙදෙන, ප්‍රථමධ්‍යානාදී ධ්‍යානාඞ්ගයන් හා සම්ප්‍රයුක්තවූ ප්‍රභේද වශයෙන්; පවඛ්‍ය, (පවච්ඡංහවේ) පස්ප්‍රකාරවන්නේයි. පුඤ්ඤ පාකක්‍රියා හෙළ, කුශල විපාක ක්‍රියාවන්ගේ ප්‍රභේදවශයෙන් නොහොත් කුශල භෙදය, විපාක භෙදය, ක්‍රියාභෙදය, යන භෙදත්‍රයෙන්; තං, ඒ රූපාවචර චිත්තය තෙම්; පවදසඛ්‍ය, පවදසවිධං හවෙ, පඤ්චලොස් ප්‍රකාරවන්නේයි.

ආකාසානඤ්චායතන කුසල චිත්තය, ආකාසානඤ්චායතන ධ්‍යානයෙන් සම්ප්‍රයුක්තවූ කුශල චිත්තයෙක්ද, නොහොත් අනන්තාකාශ ප්‍රඥප්තියම අරමුණුකොට ඇත්තාවූ ධ්‍යානය හා සම්ප්‍රයුක්තවූ කුශල චිත්තයෙක්ද; විඤ්ඤාණඤ්චායතන කුසල චිත්තය, විඤ්ඤාණඤ්චායතනය හා යුක්තවූ කුශල චිත්තයෙක්ද නොහොත් අනන්තාකාස ප්‍රඥප්තියෙහි හටගත් බැවින් අනන්තානම්වූ ප්‍රථම රූප්‍යවිඤ්ඤාණයම අරමුණුකොට ඇත්තාවූධ්‍යානය හා යෙදුනාවූ කුශල චිත්තයෙක්ද නොහොත් ත්‍රිතීයා රූප්‍ය විඤ්ඤාණය විසින් පැමිණිය යුතුවූ ප්‍රථම රූප්‍ය විඤ්ඤාණයම අරමුණුකොට ඇත්තාවූ ධ්‍යානය හා සම්ප්‍රයුක්තවූ කුශල චිත්තයෙක්ද, ආකිඤ්ඤායතන කුසල චිත්තය, ආකිඤ්ඤායතන ධ්‍යානය හා සම්ප්‍රයුක්තවූ කුශල චිත්තයෙක්ද, නොහොත් යටත් පිරිසෙයින් භඞ්ගමාත්‍රය කුදු අවශිෂ්ටව නැත්තාවූ ප්‍රථම රූප්‍ය විඥානයාගේ අභාව සඞ්ඛ්‍යාතවූ නාස්තිභාව ප්‍රඥප්තියම අරමුණුකොට ඇත්තාවූ ධ්‍යානය හා යෙදුනාවූ කුශලචිත්තයෙක්ද, නෙවසඤ්ඤානාසඤ්ඤායතන කුසල චිත්තය, නෙව සඤ්ඤානාසඤ්ඤායතන ධ්‍යානය හා යුක්තවූ කුශල චිත්තයෙක්ද නොහොත් ඕදාරිකවූ සංඥාදී නාම ධර්මයන් නැත්තාවූද, සියුම්වූ සංඥාදී නාම ධර්මයන් නැත්තේත් නොවන්නාවූ මනායතන ධර්ම යතනයෙහි අන්තර්ගතවූ ධ්‍යානය හා යුක්තවූ කුශල චිත්තයෙක්ද ඉති ඉමිනාපභෙදෙන, මේ ප්‍රභේදයෙන්; චත්තාරිපි, සතරක්කාරවූද; ඉමානි චිත්තානි, මේ චිත්තයෝ තුමූ; අරූපාවචර කුශල චිත්තානි නාමහොන්ති, අරූපාවචර කුශල චිත්තයෝ නම්වෙත්.

ඉවෙවං, (ඉති එවං යථාවුත්තනයෙන) කියනලද මේ ක්‍රමයෙන්; සඞ්ඛ්‍යාපි, කුසල විපාක ක්‍රියා සඞ්ඛ්‍යාන සියලු ආකාරයෙන්ද; වාදෙසු, දෙළසක් ප්‍රභේදවූ; අරූපාවචර කුසල විපාක ක්‍රියා චිත්තානි, අරූපාවචර කුශල විපාක ක්‍රියා චිත්තයෝ තුමූ; සමත්තානි, සම්පූර්ණාකාරණලද්දාහුය; නොහොත් සංග්‍රහකොට අර්ථගන්නාලද්දාහුය. "සමත්තානි," යන තන්හි "සං අත්තානි" යනු පදවෙජ්දයි. "සං" ශබ්දය සංක්ෂේපයෙන් සංග්‍රහකිරීම්ද "අත්තානි" යන්නෙන් ගැණීම්ද වාචකවෙති. "අත්ත" ශබ්දය "අර ගතියං" යන ධාතුවෙන් නිෂ්පන්නයි

ආරූපපමානසා, අරූපාවචර චිත්තය තෙමේ ආලම්බණප්‍රභෙදෙන, කසිණුග්ඝාටිමාකාසාදී ආලම්බණයන්ගේ ප්‍රභේදයෙන්: චතුධා, (චතූහිපකාරෙහි) සතරාකාරයකින්; සීතං සිවි යේසි. පුන, නැවත; පුඤ්ඤඵලාක ක්‍රියා භෙදා, කුශල විපාක

ක්‍රියාවන්ගේ ප්‍රභේදයෙන්; අනාගතයේ කුශල භේදය, විපාක භේදය, ක්‍රියාභේදය යන භේදත්‍රයෙන්; වාදසඞ්ඝ (වාදසඞ්ඝ පක්ෂාරෙහි) දෙළොස් ප්‍රකාරයකින්; සීතං, සිවිසේයි.

භාවය.

මේ රූපාවචර කුශල චිත්තයෝ පස්දෙන චතුෂ්කනයෙන් ගෙණ සතරක්ද, අරූපාවචර චිත්තයෝ සතරදෙනාදැයි යන අටදෙන අෂ්ටසමාපත්තීහුයයි කියති. ඒ රූපාවචර චිත්තයෝ පස්දෙනය, අරූපාවචර චිත්තයෝ සතරදෙනදැයි යන නවය එක්කොටගෙණ "නවානු පූර්වීහාර සමාපත්තිය"යි කියති. මේ ධ්‍යානයන්ගේ චතුෂ්කපඤ්චකනයය යනු සමාධියන්වහන්සේ විසින් සියලු අෂ්ටසමාපත්තීහු තීක්ෂ්ණප්‍රාඥයන්ගේ වැඩ පිණිස සියලු ධ්‍යානයෝ සතරින් සංග්‍රහකොට වදාරණලද්දේයි. මන්දප්‍රාඥයන්ගේ වැඩ පිණිස සියලු ධ්‍යානයෝ පඤ්චකනයින් පෙළැකැයි දෙශනාකරණලද්දේයි. ඒ චතුෂ්කපඤ්චකනය සංග්‍රහය යනු සුඛෛකාග්‍රතා සඞ්ඛ්‍යාත අඞ්ගවයකින් යුක්තවූ රූපාවචර පඨම ධ්‍යානය හා එම අඞ්ගවයෙන්ම යුක්තවූ අරූප ධ්‍යාන සතරද බහා සියලු ධ්‍යානයෝ සතරෙකැයි අඞ්ගසම්පන්නත්වය හෙතුකොටගෙණ චතුෂ්කනය වදාරණලද්දේයි. මේ චතුර්ථධ්‍යාන පඨමධ්‍යාන අරූපධ්‍යානයෝ සදෙන අඞ්ගයන්ගේ ගණන්වශයෙන් සමානවූවද, සුඛෛකාග්‍රතා දෙකින් යුක්තවූ ධ්‍යානය චතුර්ථධ්‍යානයයි කියාද රූපාවචර පඨමධ්‍යානය හා අරූපධ්‍යානයෝ සතරදෙන උපෙක්ෂා එකාග්‍රතා යන අඞ්ගයන්ගේ සමානත්වයෙන් හා ගණනින්ද සමාන බැවින් පඨම ධ්‍යානයයි දෙශනාකෙළේයි. මේ චතුෂ්කනය පඤ්චකනය එක්කොටගත්කල්හි සුද්ධික නවකයයි කියති. ඒ සුද්ධිකනවකය පරිත්තාලම්බනාදී ආලම්බණ චතුෂ්කයෙන් හා දුක්ඛාපටිපදාදී ප්‍රතිපත්ති චතුෂ්කයෙන්ද, නැවත ඒ ආලම්බණ ප්‍රතිපදාදෙක මිශ්‍රකිරීමෙන්වූ පස්විසිනවකයෙක් ධ්‍යාන විභඞ්ගයෙහි දෙශනා කරණලදී. මේ ධ්‍යානයන් උපදවන්නාවූ යොගාවචර තෙමේ විපාකාවරණ කර්මාවරණ, ක්ලේශාවරණ, සඞ්ඛ්‍යාත ආවරණත්‍රයෙන් මුවහත්නාවූ කල්‍යාණ පෘථග්ජනයෙක්ව "විශුද්ධිමාර්ග පෘථු විභාසිණ නිර්දේශයෙහි" ආක්‍රමයෙන් සියල්ල සම්පූර්ණකොට සංසාරයෙහිකළ පුරුද්ද ඇතිව ධ්‍යානලාභිවූ ආවාර්යවරයෙක් කරා එළඹ පළමුකොට සතරසංවර සීලයෙහි පරිපූරකාරිභාව ඇතුන් යුක්තව පළමුකොට ඒ ආචාර්යවහන්සේගෙන් උපනිශ්‍රය

ලැබ කාවේරිගඞ්ගා ඉවුරෙහි ගෝ වෙන යම්කිසි තැනක හෝ හටගත්තාවූ අරුණුවන් මැටියෙන් එක්වියක් යාඟුලක් ප්‍රමාණවූ පඨවීකසිණ පරිකම්ම නිමිත්ත ඉදිකොටගෙණ සුදුසුවූ සෙනාසනයෙක්හි "නිසිදති පලලඞ්කං ආභුජිත්වා උජුංකායං" යනාදින් ආවාවූ පද්මාසනයෙන් වැඩහිඳ තමාගේ ජීවිතය හා ආත්මයද බුදුන්ට පුදා තමාගේ සම්පයෙන් මියදණ්ඩක් පමණ දුරින් ඒ කසිණ පරිකම්ම නිමිත්ත තබා "පඨවිකසිණං පඨවිකසිණං" යනාදීන් භාවනාකටයුතු. ඒ භාවනාව පරිකම්ම භාවනා යයිද, ඒ නිමිත්ත පරිකම්ම නිමිත්තයයිද කියත්. ඒ භාවනා යෙහි අභිප්‍රායතම්:—නොයෙක් අරමුණෙහි විසිර පවත්නාවූ චිත්තය ඒ අරමුණෙන් වලක්වා මේ පෘථ්වීකසිණ පරිකම්ම නිමිත්තෙහි සිතනැවැත්වීමයි. එහි "කසිණ" ශබ්දය සකලාර්ථවාචි වෙයි. එහෙයින් ඒ යොගාවචරයාහට පරිකම්ම නිමිත්තෙහි සිත භාවිතාවීමෙන් යම්සේ පෘථ්විය කිම්දගත්තාවූ පුරුෂයෙකුට සියලු දිසාවෙන් පෘථ්වියයි වැටහෙන්නාක්මෙන් ඒ යොගාවචරයාහටද මාගේ සියලුදිසාවෙහි පෘථ්වියයි වැටහුනිනම් එකල්හි උග්ගහනිමිත්ත උපදී. ඒ උග්ගහනිමිත්තය යනු පෘථ්වීකසිණ පරිකම්ම නිමිත්තෙන් සියලු වණ්ණසණ්ඨානාදිය සම්ගගත්තාවූ ප්‍රතිබිම්බයක්මෙන් මනොද්වාරයට වැටහෙයි. ඒ උග්ගහනිමිත්තෙහි පරිකම්ම නිමිත්තෙහි තුබූ සියලු වණ්ණසවභාන් ආදිය සම්පූර්ණව වැටහෙයි. ඉක්බිති ඒ යොගාවචර තෙමේ යටකී පරිකම්ම නිමිත්ත හැරදමා විවෙකවූ ගල්ගුහා ඇතුල් ගබඩාදීවූ සෙනාසනයට වැද ඒ මනොද්වාරයට වැටහුනාවූ පරිකම්ම නිමිත්තාරම්මණ ධ්‍යානය සඞ්ඛ්‍යාතවූ උග්ගහ නිමිත්ත අරමුණුකොටගෙණ "පඨවිකසිණං පඨවිකසිණං" යනාදීන් පෙරසේම භාවනාකටයුතුයි. එසේ භාවනාකරණකල්හි ඒ භාවනාව පරිකම්ම භාවනානම්වෙයි. නිමිත්ත උග්ගහනිමිත්තනම්වෙයි. ඒ උග්ගහනිමිත්ත උපන්නාද නැද්ද යනු දැනගැණීම්ට ඇත්තාවූ උපායතම්:—ඇතුල්ගම් ආදියෙහි පීඩු පිණිස ගියකල්හිත් ඇස් වසා බැලූකල්හිත් ඒ පරිකම්ම නිමිත්තයාගේ ඡායාව සිහිනෙන් දකින්නාක්මෙන් මනොද්වාරයට වැටහෙයි. එසේ භාවනාකරණකල්හි යම්විටක ඒ උග්ගහ නිමිත්ත පිරිහිගියේවීනම් නැවතත් පරිකම්ම නිමිත්ත තුබූතැනට ගොස් පෙරසේම භාවනාකොට උග්ගහනිමිත්ත උපදවාගත යුතුයි. නැවත නැවතත් එසේ පිරිහිගියේනම් පෙරසේම භාවනාකොට උග්ගහනිමිත්ත උපදවාගතයුතුයි. ඒ උග්ගහනිමිත්ත අරමුණුකොට භාවනාකරණකල්හි පඤ්චනීවරණ ධම්මයන්ගේ මූවහුවීම් කුරුණුකොටගෙණ වලාහැබක් විවෘතකොටගෙණ

චන්ද්‍රමණ්ඩලය නික්මෙන්නාක්මෙන්ද, පසුඹියකින් කැඩපතක් නිකුත්කර ගන්නාක්මෙන්ද, ඒ උග්ගහනිමිත්ත විවෘතකොට ගෙණ පළමුවාරයෙහි කනමැදිරි ආලෝකයක් ප්‍රමාණවූ දෙසැත්තෑවක් වසතු ධර්මයන්ගෙන් මිදුනාවූ මේ ලොකයෙහි ඇත්තාවූ සියලු ආලෝකයන්ට වඩා අතිශයින් ප්‍රසන්නවූ කසිණ ප්‍රතිභාගනිමිත්තයයි කියනලද්දවූ කසිණාලෝකය උපදී. ඒ කසිණාලෝකය උපන් මාත්‍රයකින් ධ්‍යානය නූපදී. ඒ ආලෝකය මහත්වේවායි යන නිකාන්තිය උපදවාගෙණ ඒකසිණාලෝකය අරමුණුකොටගෙණ "පඨවිකසිණං පඨවිකසිණං" යනාදීන් භාවනාකරණකල්හී ඒ ආලෝකය අඟුලක් හෝ දැඟුලක් හෝ ප්‍රමාණවෙයි. ඒ අරමුණට පරිත්තාලම්බනයයි කියති. එපමණ වැඩුනකල්හි ධ්‍යානය ඉපදවිය හැකිවෙයි. ඉදින් එපමණින් තෘප්තියකට නොපැමිණ ඒකසිණා ලොකය මහත්කරණු කැමැත්තෙන් භාවනාකරන්නේවිනම් සරාවක් පමණ හෝ වට්ටියක් පමණ හෝ මහත්වෙයි. ඒ අරමුණ මධ්‍යාලම්බණනම් වෙයි. ඒ අරමුණෙහිදු ධ්‍යානය ඉපදවිය හැකිවෙයි. ඉදින් මෙපමණකින් තෘප්තියකට නොපැමිණ තමාගේ සෙනසුනය පමණට හෝ ආරාමය පමණට හෝ ග්‍රාමය නගරය විජය චක්‍රවාලය පමණට හෝ ඒ කසිණා ලොකය වැඩිය හැකිවේ. ඒ අරමුණ අප්පමාණාලම්බණනම්වේ මේ කසිණාලොකය උපන් යොගාවචර තෙමේ සක්විති කුමරෙකු මව්කුස පිළිසිඳගත් මෙවැ කුමෙන් ඒ කසිණාලොක සඞ්ඛ්‍යාතවූ අරමුණ මහත් ගෞරවයෙන් ආරක්ෂාකෙරෙයි. කුමන අර්ථයක් පිණිස ආරක්ෂාකරන්නේදයත්? ඒකසිණ ප්‍රතිභාග නිමිත්ත අරමුණුකොටගෙණ රූපාවචර පඨමධ්‍යානය දක්වා ධ්‍යාන පඤ්චක උපදවා නැවත ඒ පඨම ධ්‍යානයෙන්ම ඉර්ධිවිධඥානාදී පඤ්ඤාවන්ද ඒ යොගාවචරයාහට ඉපදවිය හැකිවේ. නැවත අරූපධ්‍යාන උපදවනු කැමතිනම් ඒ කසිණාලොකය ආකාසයෙහි එක් ප්‍රදේශයක පතුරුවා කසිණාලොකය උගුලුවා ලබාගන්නාවූ කසිණුග්ගත ඉගුළු ආකාශ ප්‍රඥප්තිය අරමුණුකොටගෙණ ආකාසානඤ්චායතන ධ්‍යානයද, ඒ ආකාසානඤ්චායතනධ්‍යානකුශලය අරමුණුකොටගෙණ විඤ්ඤාණඤ්චායතනධ්‍යානයද, ඒ ආකාසානඤ්චායතන ධ්‍යානයාගේ නත්ථිභාව ප්‍රඥප්තිය අරමුණුකොටමනණ ආකිඤ්චඤ්ඤායතන ධ්‍යානයද, ඒ ආකිඤ්චඤ්ඤායතන ධ්‍යානය අරමුණුකොටගෙණ නෙවසඤ්ඤානාසඤ්ඤායතන ධ්‍යානයද, මේ අෂ්ට සමාපත්තීන් අතුරෙන් කිසියම් සමාපත්තියකට සමවැද එයින් නැඟිට ඒ ධ්‍යානයෙහි අන්තර්ගතවූ ධර්මයන් අනිච්ච දුක්ඛ අනාත්ම

වශයෙන් විදර්ශනාකොට සෝවාන් ශකෘදාගාමී අනාගාමී අර්හත් යන සතර මඟ සතර ඵලයද, අනාගාමී අර්හත් පුද්ගලයන්ගේ ඉතාත්මයෙහි නිවන් සැප විඳීමයයි කියනලද්දවූ නිරෝධ සමාපත්තියට සමවැදීමද, යනමේ සියලු ලෞකික ලොකොත්තර ගුණධර්මයන්ගේ ලැබීමට ප්‍රතිභාගනිමිත්තම අරමුණුවනහෙයින් ඒ නිමිත්ත උපන්නාවූ යොගාවචර තෙමේ සක්විති රජකුම රෙකු මව්කුස පිළිසිඳගත් සක්විනි මවෙකු විසින් මහොත්සාහ යෙන් ඒ ගර්භය ආරක්ෂාකරන්නාක්මෙන් ප්‍රතිභාග නිමිත්තද, මහොත්සාහයෙන් ආරක්ෂාකටයුතුයි. ඒ ආරක්ෂාකිරීමය යනු පෙරිවි පියලි ආදියෙහි බහා ආරක්ෂාකිරීමක් නොව ප්‍රතිභාග නිමිත්ත පිළිබඳවූ චිත්තය ඒ ප්‍රතිභාග නිමිත්ත හැර රූපාදී යම් අරමුණක් කරාගියකෙණෙහිම ඒ ප්‍රතිභාග නිමිත්තභූමියේ නම්වෙයි. ප්‍රතිභාග නිමිත්ත උපන් තැන්පටන් ප්‍රථම ධ්‍යාන අර්ණ චිත්තය දක්වා උපදින්නාවූ සියලු භාවනාමය කාමාවචර කුශල චිත්තයෝ තුමූ දශපුණ්‍ය ක්‍රියාවස්තූන් අතුරෙහි ආවාවූ කාමාවචර භාවනාමය කුශල්නම්දවෙයි. උපචාරසමාධිය, උපචාරභාවනාවය යනුද ඊටමනම්වෙති. රූපාවචර අර්ණධ්‍යානය වනාහි කෙසේ උපදනේද යත්? ප්‍රථමධ්‍යානය, විතීයධ්‍යානය, තෘතීයධ්‍යානය, චතුර්ථධ්‍යානය, පඤ්චධ්‍යානයයි පස්වැදෑරුම්වෙත්. ඔවුන් අතුරෙන් ප්‍රථමධ්‍යානය කෙසේයත්? යවකී ප්‍රතිභාග නිමිත්ත අරමුණුකොටගෙණ ප්‍රථමධ්‍යානය ලබම්වාඝන නිකානතිය උපදවාගෙණ "පඨවිකසිණං පඨවිකසිණං" යනාදීන් භාවනාකරණකල්හි ඒ යොගාවචර තෙමේ මන්දප්‍රාඥයෙක්වීනම් මනොවාරාවජ්ජන සිත එක්වරක් ඉපිද ඥානසම්ප්‍රයුක්ත කාමාවචර මහාකුශල් සතරින් එක්තරාකුශල චිත්තයක් තෙමේ පරිකම් උපචාර අනුලොම ගොත්‍රභුයනනම්න් සතරවරක් හෝ තික්ඛප්‍රාඥයෙක්වීනම් උපචාර අනුලොම ගොත්‍රභු යනනම්න් තුන්වරක් හෝ උපචාර සමාධිභාවනා සිත් ඉපිද පස්වැනිව හෝ සතරවැනිව විතර්ක, විචාර, ප්‍රීති, සුඛ, එකාග්‍රතා, යන ධ්‍යානාඞ්ගපඤකයන්න් යුක්තවූ රූපාවචර ප්‍රථමධ්‍යාන අර්ණ සිත එක්වරක් ඉපිද ඊට අනාතුරුව සුදුසු පමණක් භවාඞ්ග සිත් උපදී. ඒ ප්‍රථමධ්‍යානලාභී පුද්ගලතෙමේ ඒ ධ්‍යානය ආවජ්ජනවසී, සමාපජ්ජනවසී, අධිට්ඨානවසී, උට්ඨාන වසී, පච්චවෙක්ඛනවසී, යන පස්ආකාරයෙන් පුරුදුකොට ඉක්බිති ඒ ප්‍රථම ධ්‍යානය පවනීවරණ සතුරන්ට ආසන්නය, විතර්ක නැමති ඔත්දරිකාඞ්ගයන්න් යුක්තය යනාදීන් ප්‍රථම ධ්‍යානයෙහි දෝස් දැක යම්කිසි මාගමක් සරණ පාවාගත් පුරුෂයෙක් තෙමේ

අනිත් මාගමක් කෙරෙහි පිළිබඳ සිත් ඇතිකල්හි පළමු මාගම ගෙන් වෙන්වෙනු කැමතිකල්හි ඒ මාගමගේ දෙස් කල්පණා කොට ඇ කෙරෙහි තුබූ පිළිබඳ සිත දුරුකටයුතුවෙයි. එපරිද්දෙන් ප්‍රථම ධ්‍යානයෙහි දෙස් දුටුයෝගාවචර තෙමේ ප්‍රථම ධ්‍යානනිකාන්තිය දුරුකොට ද්විතීයධ්‍යාන නිකාන්තිය උපදවා ගෙණ චතුරාඟයකින් යුක්තවූ ද්විතීයධ්‍යානය ලබම්වයි අභිනිහාරකොට නැවතත් "පඨවීකසිණං පඨවීකසිණං" යනාදීන් භාවනාවැඩියයුතුයි. එසේ භාවනාකරණකල්හි ප්‍රථමධ්‍යානයට කී සියලු අඟයන්ගෙන් යුක්තව ඖදාරිකවූ විතර්කාඩ්ගයෙන් තොරවූ විචාර, ප්‍රීති, සුඛ, එකාග්‍රතා, යන චතුරාඩ්ගයකින් යුක්තවූ ද්විතීය ධ්‍යාන අප්පනාසිත එක්වරක් ඉපිද සුදුසු පමණ භවාඩ්ගසිත් උපදී. නැවත ඒ ද්විතීය ධ්‍යානයද යටකී පවවසිතාවන්ගෙන් පුරුදුකොටගෙණ කල්පණාකරණකල්හි මාගේ මේ ද්විතීයධ්‍යානයට ආසන්නවූ විතර්ක නැමති සතුරෙක් ඇත්තේය. විචාර නැමති ඖදාරික ධ්‍යානයකින් යුක්තය, එහෙයින් යටකී මාගම් උපමාව පරිද්දෙන් ද්විතීය ධ්‍යාන නිකාන්තිය දුරුකොට තෘතීය ධ්‍යාන නිකාන්තිය උපදවාගෙණ අඩ්ගත්‍රයකින් යුක්තවූ තෘතීය ධ්‍යානය ලබම්වයි අභිනිහාරකොට යටකී නයින් "පඨවීකසිණං පඨවීකසිණං" යනාදීන් භාවනාකරණකල්හි ප්‍රීති, සුඛ, එකාග්‍රතා, යන අඩ්ගත්‍රයකින් යුක්තවූ රූපාවචර තෘතීය ධ්‍යාන අප්පණා සිත එක්වරක් ඉපිද සුදුසු පරිද්දෙන් භවාඩ්ගවශයෙන් උපදී. ඒ තෘතීය ධ්‍යානයද යටකී පවවශිතාවන් ගෙන් පුරුදුකොටගත්කල්හි මාගම් උපමාවෙහි කීපරිද්දෙන් මාගේ මේ තෘතීය ධ්‍යානයෙහි ප්‍රීති සඞ්ඛ්‍යාතවූ ඖදාරිකාඩ්ගයෙක් ඇත්තේය. එහෙයින් ඒ ධ්‍යානය හැර සුඛඒකාග්‍රතා යන අඩ්ගවයකින් යුක්තවූ චතුර්ථධ්‍යානය උපදවම්වයි අභිනිහාරකොට යටකී නයින් "පඨවීකසිණං පඨවීකසිණං" යනාදීන් භාවනා වඩනකල්හි සුඛඒකාග්‍රතා යන අඩ්ගවයකින් යුක්තවූ රූපාවචර චතුර්ථධ්‍යාන අප්පණා චිත්තය එක්වරක් ඉපිද සුදුසු පමණ භවාඩ්ග සිත් උපදී. ඒ ධ්‍යානයද පවවශිතාවන්ගෙන් පුරුදුකොටගෙණ කල්පණාකරණකල්හි මේ සුඛය වඩාපෙර ළෙඟ සුඛය ඖදාරිකයයි යනාදීන් චතුර්ථධ්‍යානයෙහි දෙස් දැක පඤ්චම ධ්‍යානය සාන්තවශයෙන් මෙනෙහිකොට යටකී නයින්ම භාවනාකරණකල්හි උපෙක්ඛා එකාග්‍රතා යන අනිත් අඩ්ගවය කීන් යුක්තවූ පඤ්චමධ්‍යාන අප්පණා සිත එක්වරක් ඉපිද ඒ පඤ්චම ධ්‍යානයද පවවශිතාවන්ගෙන් පුරුදුකොට රූපාවචර ධ්‍යාන යන්ගේ මුදුන්පත්වූහෙයින් ඉන් ඔබ්බට නොයාහැකිව ඒ රූපාවචර පඤ්චම ධ්‍යානයාගේ ආනිශංස විශෙෂයකැයි කියනලද්දාවූ

පඨමාභිඤ්ඤා චිත්තය උපදවයි. ඒ පඨමාභිඤ්ඤාවද උපදවන්නාවූ යොගාවචරයා විසින් යටකී නයින් ඒ කසිණපටිභාග නිමිත්ත අරමුණුකොටගෙණ සෘර්ධිවිධඥානය උපදවම්හයි යන නිකාන්තිය පෙරටුකොටගෙණ "සකං චිත්තං සමාදහිත්වා සමාහිතේ" යනාදීන් භාවනාකරණකල්හි ඒ පඨමඛ්‍යාන කුශල චිත්තය උපදී. ඊට අනතුරුව ප්‍රත්‍යවෙක්ෂාජවන චිත්තයන්ගේ කෙළවර නොමාරරූප සියයක් හෝ දහසක් හෝ යනාදී ක්‍රමයෙන් අභිමතවූ යම්කිසි රූපයක් හෝ පෘථුවිය කිම්දයි ණයක් හෝ අහසට නැගී යාමක් හෝ පොළොවෙහිමෙන් දියෙහි ගමන්කිරීමක් හෝ ඉර සඳ අතින් පිරිමැදීම් ආදියක් හෝ යනාදී ලෞකික පඨමාභිඤ්ඤාවන් උපදී. මේ විතකී, විචාර, ප්‍රීති, සුඛ, එකාග්‍රතා, යන ධර්මයෝ පස්දෙන ධ්‍යානාඞ්ගයෝ නම්වෙත්. එතකුදුවුවත් ඒ ධර්මයන් පස්දෙනාගේ එක්වීමක් ඇතිකල්හිම ධ්‍යානයයි කියනුලැබේ. යම්සේ නිම්වලලු රථ චක්‍ර ආදීවූ රථාවයවයෝ වෙන්වෙන්ව පවත්නාකල්හි රථාවයවයෝයයි කියත්ද, ඒ රථාවයවයෝ එක්කොට සුදුසු පරිද්දෙන් යෙදූකල්හිම රථයයි කියත්ද, එපරිද්දෙන්ම විතකීාදී ධ්‍යානාඞ්ගයන් එක්ව යෙදුනාවූ කල්හිම ධ්‍යානයයි කියති. ඒ ධ්‍යානාඞ්ගයන් පස්දෙනා එක්වූ කල්හි කුමක්හෙයින් ධ්‍යානයයි ව්‍යවහාර කෙරේද යත්? "ආරම්මණං උපනිජ්ඣායතීති ඣානං" පච්චනීක ධම්මේ ඣාපේතීති ඣානං" යන නිර්වචනවශයෙන් ධ්‍යානයයි ව්‍යවහාරකෙරෙත්. ඒ ආරම්මණූපනිජ්ඣාන ලක්ෂණය කුමක්ද යත්? ධ්‍යාන චිත්ත යෙහි යෙ නාවූ විතකී තෙමේ තමා හා සම්ප්‍රයුක්තවූ චිත්ත චෛතසික ධර්මයන් ප්‍රතිභාග නිමිත්ත සඞ්ඛ්‍යාත අරමුණට නන් වයි. විචාර තෙමේ ඒ ඒ ධර්මයන් අරමුණ හා ඔලපවයි. ප්‍රීති තොමෝ තමා හා සම්ප්‍රයුක්තවූ ධර්මයන් ඒ කසිණ ප්‍රතිභාග නිමිති සඞ්ඛ්‍යාතවූ අරමුණෙහි පිණවීමකරවයි. සුඛවේදනා තොමෝ තමා හා සම්ප්‍රයුක්ත ධර්මයන් උපබෘහණ සඞ්ඛ්‍යාතවූ මහත්වීම කරවයි. එකාග්‍රතා තොමෝ තමා හා සම්ප්‍රයුක්තවූ චිත්ත චෛතසික ධර්මයන් කසිණප්‍රතිභාග නිමිත්ත සඞ්ඛ්‍යාතවූ එකම අරමුණෙහි තවත්වයි. මෙසේ මේ ධ්‍යානයෝ පස්දෙන පස්ආකාරයකින් ආරම්මණූපනිජ්ඣානය හෙවත් අරමුණ ලං කොටබැලීම කරවත්. සතුරුවූ නීවරණධර්මයන් දවනාදීයෙන් කෙසේ ධ්‍යානනාම වේද යත්? විතකී සඞ්ඛ්‍යාත ධ්‍යානාඞ්ග තෙමේ පිනම්බ නීවරණයයි කියනලද්දාවූ චිත්ත චෛතසික ධර්මයන්ගේ අලසගතියදවයි. විචාර ධ්‍යානාඞ්ග තොමේ විචිකිච්ඡා නීවරණය දවයි. ප්‍රීතිධ්‍යානාඞ්ග තෙමේ ව්‍යාපාදනීවරණය දවයි.

සුඛධ්‍යානාඞ්ග තෙමේ උඛවඛුඤකුච්චනීවරණය දවයි. එකාග්‍ර තාධ්‍යානාඞ්ග තෙමේ කාමච්ඡන්ද නීවරණය දවයි. නැවත මේ ධ්‍යානාඞ්ගයෝ පස්දෙනම එක්වී අවිද්‍යානීවරණය දවයි. මෙසේ ආරම්මණූපනිජ්ඣාන ලක්ඛණයෙන් හා ප්‍රතිපක්ඛ ධර්මයන් දවනාඋයෙන්ද ධ්‍යානනම් වනන්‍යාය දතයුතුයි. කුශල ධර්මයන් විසින් අකුශල ධර්මයන්ගේ දැවීම හෙවත් ප්‍රහාණයකිරීම සතරාකාරවෙයි. ඒ කවරසතරාකාරයෙක්ද යත්? තදඞ්ගප්‍රහාණය, විෂ්කම්භනප්‍රහාණය, සමුච්ඡේදප්‍රහාණය, පටිපස්සඞ්ධිප්‍රහාණය යයි යන සතරාකාරයයි. ඔවුන් අතුරෙන් කාමාවචරකුශලයන්ගේ කෙලෙශප්‍රහාණය තදඞ්ගප්‍රහාණයනම්වෙයි. මේ මහද්‍යත කුශලයන් නවදෙනාගේ කෙලෙශප්‍රහාණය විෂ්කම්භන ප්‍රහාණ නම්වෙයි. සතරාමාගී කුශලයන්ගේ කෙලෙශප්‍රහාණය සමුච්ඡේද ප්‍රහාණනම්වෙයි. සතරඵලයන්ගේ කෙලෙශ විඛ්‍යාභන්ඞිඳවීම පටිපස්සඞ්ධිප්‍රහාණනම්වෙයි. ඔවුන් අතුරෙන් කාමාවචර කුශලයන් විසින් තමතමාට ප්‍රතිපක්ෂවූ අකුශලාඞ්ගයන් ප්‍රහාණය කිරීම තදඞ්ගප්‍රහාණයයි. ඒතදඞ්ග ප්‍රහාණයද කාමාවචර කුශලයන් පවත්නා ක්ෂණයෙහිම ප්‍රහාණයවී ඒ කුශලයන්ගේ නිරුඞ්ගවීමෙන් නැවතත් ඒ කෙලෙශයන් වැනිරුණයන්? ඊට උපමා කවරේ යත්? අන්ධකාරවූ ගබඩාවක්හි තෙල් පහනක් දැල්වූ ක්ෂණයෙහි ඒ අන්ධකාරය දුරුවී පහන නිවිගිය කල්හි නැවතත් අන්ධකාරය වැනිරුණේ ද එපරිද්දෙන්ම කාමාවචර කුශලයන් උපදනා ක්ෂණය තෙල් පහන් දැල්වූ සාලක්මෙන්ද, ඒකාමාවචර කුශලයාගේ උපාදඤ්ති භඞ්ග සඞ්ඛ්‍යාතක්ෂණත්‍රය ඇතුලෙහි පාප ධර්මයන්ගේ දුරුවීම අදුරු නැසීමක්මෙන්ද, පහන නිවිගියකල්හි අන්ධකාරය වැනිරුණාමක්මෙන් කාමාවචර කුශලයන්ගේ නිරුඞ්ගවීමට අනතුරුව පෙර තුබූ කෙලෙශයන් නැවතත් වැනිරුණාමද උපමා උපමෙය්‍ය සංසන්දනයකොට දතයුතුයි. මේ තදඞ්ග ප්‍රහාණයවනාහි නවමහග්ගත අප්පණිහිතින්ගේ පූජිභාගයෙහිද, ලොකොත්තර කුශල චිත්ත විසින්ගේ පූජිභාගයෙහිද, පරිකම්ම උපචාර අනුලොම ගොත්‍රභූ යනනමින් උපදනා කාමාවචර කුශල චිත්තයන් ථමලැබේ. විෂ්කම්භන ප්‍රහාණය යනු නවමහද්‍යත කුශල චිත්ත යන් විසින් කෙලෙසුන් ප්‍රහාණයකිරීමයි. ඒ කෙසේද යත්? ජලයෙන් පිරිපවත්නාවූ විල් පොකුණු වැව් ආදියෙහි දියවට හටගත්තාවූ දියසෙවෙල් දියපරඬලාදීන්ගෙන් වැසී තිබෙන්නාවූ ජලය කළාදියෙන්ගන්නාවූකල්හිද දඬු මුගුරු ආදියෙන් ඉරණාකල්හිද ඒ දියසෙවෙල් පරඬලාදිය යම්සේ ඉවත්ව

යෙත්ද, එපරිද්දෙන් රූපාවචර ධ්‍යානාදිය උපදනාකල්හි චිත්ත නැමති ජලය වහාගෙණ පවත්නාවූ කෙලශ නැමති දිය සෙවෙල් පරඬලාදිය ඇත්ව යන නුමුත් ඒ ධ්‍යානලාභි පුද්ග ලයාගේ සන්තානයෙහි යම්තාක්කල් ධ්‍යාන චිත්තය නොපිරිහී පවත්නේද? එතාක්කල් රාගාදී කෙලශයෝ දුරුව පවතිත්. එසේදවුවත් යම්කලෙක ධ්‍යානයෙන් පිරිහීගියේවිනම් නැවත වතුර නොගන්නාවූ ජලයෙහි දියසෙවෙල් පැතිරයාමක්මෙන් රාගාදී කෙලශයෝ නැවත මුවහකරගණිත්. මේ කෙලශප්‍රහා ණය විෂකම්භණ ප්‍රහාණයයි දතයුතුයි. සමුච්ඡේද ප්‍රහාණය යනු කෙසේද යත්? ලොකොත්තර කුශලයන්ගෙන් ඒ ඒ මාර්ගයෙන් වඩ්‍යවූ කෙලශයන් නැවත නූපදනා පරිද්දෙන් කෙලෙස්නැ සිම සමුච්ඡේද ප්‍රහාණ නම්වෙයි. ඒට උපමා කවරයත්? යම් වෘක්ෂයකට අසනිප්‍රහාරයක්වන්කල්හි ඒ වෘක්ෂයාගේ මුල් හා සමග විනාසවීමක්මෙන් ඒ ඒ මාර්ගයෙන් වඩ්‍යවූ අකුශලධර්මයෝ ඉතුරුනොකොට හාත්පසින්ම ප්‍රහාණයකෙරෙත්. ඒට අන තුරුව ඒ කෙලශයන්ගේ විඩාව සන්සිදුවීම්වශයෙන් ඵලසිත් දෙකක් හෝ තුණක් හෝ ඉපිද කෙලශ විඩාව සන්සිදවීම පටි පස්සද්ධිප්‍රහාණයයි දතයුතුයි. ඒ පටිපස්සද්ධිප්‍රහාණයට උදාහ රණනම්:—යම් ගෙයක් තුළ රැස්වූ කැලිකසලාදිය ගින්නෙන් දවා හළමකොට නැවත ඒ ගිනිකළ භූමියෙහි උළුණය සන්සිද වීම පිණිස පැන් බදුන් කීපයක් වත්කිරීමක්මෙනි. සතරමාර්ග කුශලයන්ගේ සමුච්ඡේද ප්‍රහාණය හා සතර ඵලයන්ගේ පටි පස්සද්ධිප්‍රහාණයද මාර්ගයට අනතුරුව ඵලය ලැබෙන බැවින් ඒ ඒ ක්ෂණයෙහිම ලැබෙක්, ඒකෙසේයත්? අනාදිමත් සංසාර යෙහි අනුසයවශයෙන් පැවිත ආවාවූ උඩවව සම්ප්‍රයුක්ත අකු ශල චිත්තය හැර අවශෙෂ එකොළොස් චිත්තයන්ගේ සතර අපාය ගමනීය ශක්තියෙන් යුක්තවූ එකොළොස් අකුශල් සිත් නැමති ආත්මාභිභ්‍යනතර නැමති ගෘහයෙහි කැලිකසලසොවාන් මාර්ග ඥාන නැමති ගින්නෙන් දවූකල්හි ඒ කෙලශයන්ගේ විඩාව සන්සිඳවීම පිණිස සොවාන් ඵල සිත්දෙකක් හෝ තුණක් හෝ උපදිත්. ඒට අනතුරුව කාමධාතුවෙහි උපදවා කටුක විපාක දියයුතුවූ දිට්ඨිප්‍රයුක්ත සිත් සතරය, දෙමිනස් සහගත දෙසි තය යන ආත්ම ගෘහයෙහි පවත්නාවූ කසල ගොඩවල් සය ශකෘදගාමි මාර්ග නැමති ගින්නෙන් දවූකල්හි එම ඵල සිත් දෙකක් හෝ තුණක් හෝ ඉපිද ඒදවූ කෙලෙසුන්ගේ විඩාව සන් සිඳුවයි. ඒට අනතුරුව කාමරාගයෙන් යුක්තවූ යථොක්ත අකු ශල් සිත් සය නැමති කසල ගොඩවල් සය අනාගාමි මාර්ග

නැමති ගින්නෙන් දැවුනාල්හි එම ඵල සිත් දෙකක් හෝ තුණක් හෝ ඉපිද ඒ කෙලෙස විඛාවන් සන්සිඳුවයි. ඊට අනතුරුව දිසි විප්‍රයුක්ත අකුශල් සහර හා උඛව සම්ප්‍රයුක්ත සිතද යන ආතමා ඛ්‍යානන්තරයෙහි පවත්නා කුසල ගොඩවල් පස අතීතම්ඛීනැමති ගින්නෙන් දැවුනාල්හි ඒ ඵල සිත් දෙකක් හෝ තුණක් හෝ ඉපිද කෙලෙස විඛාව සන්සිඳුවයි, මෙසේ සැමුවෙජ්ද ප්‍රහාණය හා පටි පස්සඛිප්‍රහාණයද සහර මාගී ඵලයන්ගේ වශයෙන් සතර සතර ආකාරවෙති. මේ ප්‍රථම ඛ්‍යානය ඉපදවීමට පස්විසි කමටහන් කෙනෙක්වෙති. ඒ කවරහුදැයි? දශකසිණය, දසඅසුභය, කාය ගතාසති කම්ස්ථානය, ආනාපාන සතියට අරමුණුවන්නාවූ ආශ්වාස ප්‍රාශ්වාස ප්‍රඥප්තිය. මෛත්‍රී බ්‍රහ්මවිහාරයට අරමුණුවූ සියලු සුඛිත දුඃඛිත සත්ව ප්‍රඥප්තිය, මුදිතා බ්‍රහ්මවිහාරයට අරමුණුවන්නාවූ සියලු සුඛිත සත්ව ප්‍රඥප්තිය, කරුණා බ්‍රහ්මවිහාරයට අරමුණුවන්නාවූ සියලු දුඃඛිත සත්ව ප්‍රඥප්තිය යනමේ පස්විසි කමටහන් අතුරෙන් තමාගේ චරිතානුකූලවූ කමටහනකින් ප්‍රථම ඛ්‍යානය ඉපදවිය හැකිවේ.

ඒතියඛ්‍යානය තෘතීයඛ්‍යානය චතුර්ථඛ්‍යානය යනමේ ඛ්‍යානයන් තුන්දෙන උපදවන්නාවූ කම්ස්ථානයෝනම්:—දස කසිණය ආනාපාන සතියට අරමුණුවන්නාවූ ආශ්වාස ප්‍රාශ්වාස ප්‍රඥප්තිය, මෙත්තා කරුණා මුදිතා යන අප්‍රමාණ්‍ය ධර්මයෝය, යනමේ තුදුස් කම්ස්ථානයන්ගෙන් චරිතානුකූලවූ කමටහනකින් ඒතිය තෘතීය චතුර්ථඛ්‍යානයෝ ලැබෙත්.

පඤ්චමඛ්‍යානය උපදවන්නාවූ කම්ස්ථානයෝනම්:—දස කසිණය ආනාපාන සතියට අරමුණුවන්නාවූ ආශ්වාස ප්‍රාශ්වාස ප්‍රඥප්තිය උපෙක්ඛා බ්‍රහ්මවිහාරයට අරමුණුවන්නාවූ දුඃඛිත සුඛිත සත්ව ප්‍රඥප්තිය, යනමේ දෙලොස් අරමුණු අතුරෙන් යම් කිසි කම්ස්ථානයක පඤ්චමද්ධ්‍යානය උපදී. ප්‍රථමද්ධ්‍යානයට අරමුණුවන්නාවූ පස්විසිකමටහන් අතුරෙන් තමාගේ චරිතානුකූලවූ යම්කිසි කමටහනක් භාවනාකිරීමෙන්ම ප්‍රථමද්ධ්‍යානය උපදවන පමණමුත් පස්විසිකමටහන් අතුරෙන් එක්තරා කමටහනක් අරමුණුකොටගෙණ යොගාවචරයෙක් විසින් භාවනා කටයුතුනොවේ. ඒ ප්‍රථමද්ධ්‍යානය ලබා පස්විසිකමටහන් කෙරෙන් අන්‍යවූ කමටහනක් ජීවිතාන්තය මුලුල්ලෙහි භාවනා කෙළේ නමුදු ප්‍රථම ධ්‍යානය නූපදී, ඒතිය තෘතීය චතුර්ථධ්‍යානයන්ට නියමවූ තුදුස්කම්ස්ථානයන් කෙරෙහි අන්‍යවූ කමටහනක් ජීවිතාන්තය මුලුල්ලෙහි

භාවනාකොටත් එකී ධ්‍යානයක් නොලැබිය හැකිවේ. පඤ්චම ධ්‍යානයට නියමවූ දෙලොස් කමටහන් හෙරෙන් අන්‍යවූ කමට හනක් ජීවිතාන්තය මුලුල්ලෙහි භාවනාකොටත් පඤ්චමධ්‍යා නය නොලැබිය හැකිවේ. ප්‍රථමද්ධ්‍යානයට නියමිතවූ පස්විසි කමටහන් අතුරෙන් යම්කිසි කමටහනක් භාවනාකරන්නාවූ ත්‍රිහෙතුක පුද්ගලයෙක්හටම ප්‍රථමධ්‍යානය උපදී. සුගතී අහෙතුක දුගතී අහෙතුක දුහෙතුක පුද්ගලයෙක් තෙමේ ශීල විශුද්ධිය මත්තකප්‍රාප්තකොට සිටියදීවත් සේම ආචාර්‍යයිකොට ගෙණ තමාගේ චරිතානුකූලවූ සුදුසු කමටහනක් රැගෙණ ජීවි තාන්තය මුලුල්ලෙහි භාවනාකෙළේ නමුදු ඒධ්‍යානය නොලැබේ. ඉදින් එබදු පුද්ගලයෙක් ධ්‍යානය උපදවම්සි වාර්තාල උපාසකා දීන්මෙන් අසථානයෙහි උත්සාහකොට උත්තරී මනුෂ්‍ය ධර්ම නොලැබුනුකල්හි උන්මාදබවට හෝ මෙහෙසට හෝ චිත්ත විපර්‍යාසයට හෝ පැමිණ මේ ශාසන බ්‍රහ්මචර්‍යාව ක්ෂයයි වරදවා දෘෂ්ටිගෙණ මරණින් මත්තෙහි සතර අපායොත්පත්ති යට පැමිණෙයි. සුගතී අහෙතුක දුහෙතුක පුද්ගලතෙමේ ඉහතම යෙහි ධ්‍යානය නොලැබෙන බැව් දැන දැන චිත්ත විපර්‍යාසාදි යට නොපැමිණ මතු භවයෙහි ධ්‍යාන ලබම්සි යන උත්සාහයෙන් භාවනාකරන්නේවිනම් ඔහුගේ භාවනාව මොඝනොවේ. ඉදින් ඒ පුද්ගල තෙමේ දෙවෙනි තුන්වෙනි අත්බැවිහි ත්‍රිහෙතුකව ඉපිද භාවනාවඩන්නේනම් වහාම ධ්‍යානය උපදී. සංසාරයෙහි භාවනාකළ පුරුදු සත්වයන්ට ගොයම්කමත් ආදියෙහි පවා කසි ණනිමිත්ත ලැබ ධ්‍යාන උපදී. එසේම සෙසු කසිණයෝත් සංසාර පුරුද්ද කාරණකොටගෙණ වහාම උපදිත්. ඒ කෙසේද යත්? තමාගේ ශරීරයෙහි නීලවර්ණවූ හිසකේ ආදියෙහි නීලකසිණයද රන්වන්වූ ශරීර වර්ණයෙහි පීත කසිණයද ඇස්නුවන් වලාදි යෙහි ලොහිත කසිණයද දතකාදියෙහි ඔදතකසිණයද උපදී. මේ ආකාරයෙන් සංසාරයෙහි ධ්‍යාන භාවනාකළ පුරුද්ද ඇත්ත වුන්ට ත්‍රිහෙතුක පටිසන්ධිය ලැබූ අත්බැවිහි වහාම ධ්‍යානයලැබී මට උපනිශ්‍රයවෙයි. ත්‍රිහෙතුක පුද්ගලයෝම ධ්‍යානය ලබත්යයි කීනමුදු ඉහත්මයෙහි පඤ්චානන්තරී කම්කළවුන්ට ත්‍රිහෙතුක වුවද ධ්‍යානය නොලැබේ. රජ යුවරජ ආදී මහත් ධන සම්පත් ඇත්තවුන්ට ඒ ධනයෙහි ඇත්තාවූ දළලෝභය කරණකොට ගෙණ ඒ ආත්මයෙහි ත්‍රිහෙතුකවුවත් ධ්‍යානය නොලැබේ. උප සපන් භික්ෂුහු දාරුජීකාපත්තියට පැමිණ ශ්‍රමණප්‍රතිඥවෙන් ශාස නයෙහි විසඋතාක්කල් ත්‍රිහෙතුකවුවද ධ්‍යානය නොලැබෙයි. ඉදින් ගිහිගෙට පැමිණ පඤ්චශීල දශශීලාදියෙහි සංවරනිඝා

කොට සීලවිසුද්ධිය ලැබ භාවනාකරන්නේවීනම් එබන්දන්ට ධ්‍යානයලැබේ. පස්මිසි කමටහනෙක ප්‍රථමධ්‍යානය උපදනේය. තුදුස් කමටහනෙක විතීය තෘතීය චතුර්ථධ්‍යානයෝ උපදනාහුය. දශලාස් කමටහනෙක පඤ්චමධ්‍යානය උපදනේයයි කුමක් හෙයින් මෙසේවෙන්කොට කියේද යත්? දශඅසුභය කායකොඨාශය යනමේ එකොළොස් කම්ස්ථානයෙහි විතීයධ්‍යානාදී ධ්‍යානයෝ සැදරදෙන නුපදනාහුය. ඒ එකොළොස් කම්ස්ථානයෙහි ප්‍රථම ධ්‍යාන මාත්‍රයක් උපදනේය. කුමක්හෙයින ය යත්? දස අසුභකාය කොඨාසයෝ තුමූ අතිශයින් ඔදරිකවූ කමටහන් වෙති. ඒ ඔදරිකවූ කමටහනෙහි විතකීධ්‍යානාඞ්ගය නැත්තාහු සෙසු ධ්‍යනය නොලැබේ. කුමක්මෙන්ද යත්? අතිශයින් බල වත්වූ සැඩ පහර ඇති ගඞ්ගානදිය රිවින් මිය ගබලින් ඔරුව නොනැවැත්වීය හැකිවෙයි. එපරිද්දෙන්ම දස අසුභ කාය කොඨාසයන් සැඩ පහර ඇති ගංගාවක්මෙන්ද විතකීය රිටක් මෙන්ද දතයුතුයි. එහෙයින් ඒ විතකී සහිතවූ ප්‍රථම ධ්‍යානයම දසඅසුභකාය කොඨාස ප්‍රඥප්තියෙහි අපිණාවශයෙන් පිහිටිය හැක්වෙයි. රිවිනැත්තාවූ හබල් මාත්‍රයක් ඇත්තාවූ ඔරුමෙන් විතීය තෘතීය චතුර්ථ පවමද්ධ්‍යානයෝ ඒ දසඅසුභකාය කොඨාස සඞ්ඛ්‍යාතවූ ඔදරික ප්‍රඥප්තියෙහි අපිණාවශයෙන් නොපිහිටිය හ කිවෙති.

තවද මේ දස අසුභකාය කොඨාසයෝ වනාහි සවභාව යෙන් අනිෂ්ටාලම්බණවෙති. අවශෙෂවූ කසිණාලම්බණයෝ සවභාවයෙන් ඉෂ්ටාලම්බණවෙති. සවභාවයෙන් අනිෂ්ටාලම්බ ණවූ දසඅසුභකාය කොඨාස ප්‍රඥප්තියෙහි දෙමනස් ජවන් උපදිති. ඒ දෙමනස් ජවන් උපදනාවූ දසඅසුභ කායකොඨාස යෙහි සොමනස් වේදනාවෙන් යුක්තවූ ප්‍රථමද්ධ්‍යානය කෙසේ උපදනේදැයි සැකකටයුතුවෙයි. එතකුදුවුවත් ඒ අරමුණ වඩා ලබන්නාවූ ධ්‍යානය සොමනස් සහගතවෙති. ඊට උපමා කවර යත්? වැයිකිළි ඉස්නා පුරුෂයෙක් නෙමේ ඒ වැයිකිළිය ඉස් නාවූකල්හි එකානතයෙන්ම සොමනස් සහගත නොවෙයි. එහා කුදුවුවත් එබල පුරුෂය තව මසුරන් දහසක් දෙමියිකීකල්හි මෙ මේ අමෙධ්‍යය ඉවත්කොට කැමති කැමතිදෙයක්හෙණ සැපසේ ජීවත්වෙමි ය ඇ උත්සාහය පෙරවූකොටහෙණ කිසි පිළිකුලක්නොවී ඒ අමෙධ්‍යරාශිය ඉවත්කොට මසුරන් දහසක් ලබාහෙණ කැමති කැමති දෙයක් රැහෙණ සැපසේ ජීවත්වෙයි. මේ උපමාවෙහි දසඅසුභකාය කොඨාස ප්‍රඥප්තිය අමෙධ්‍ය වළ කට උපමාවෙයි. ඒ අමෙධ්‍ය ඉවත්කරන්නාවූ පුරුෂයෙකුමෙන්

ප්‍රථමධ්‍යානය ලබනු පිණිස භාවනාවඩන්නාවූ යොගාවචර පුද්ගල තෙමේ සමාධිවෙයි. ඒ අමෙධ්‍ය රාශිය ඉවත් කිරීමෙන් ලබන්නාවූ මසුරන් දහයමෙන් දශඅකුසලකර්ම පථය ප්‍රඥප්තින් භාවනාකොට ලබන්නාවූ ප්‍රථමධ්‍යානය සමාධිවෙයි. ඒ මසුරන් දහස ලැබූ පුරුෂයා කැමති කැමති දෙයක් රැගෙණ සැපසේ ජීවත්වන්නාක්මෙන් ප්‍රථමධ්‍යානලාභී යොගාවචර තෙමේ ඒධ්‍යාන...ට සම්වැදී සේ ලබන්නාවූ ධ්‍යාන සැපය සමානවෙයි. එසේහෙයින් සොමනස්සවේදනා සහගතවූ රූපාවචර ප්‍රථමධ්‍යානය එකාන්තප්‍රතික්ඛේප සභාව ඇත්තාවූ දසඅකුසල කර්ම පථ ප්‍රඥප්තියෙහි රූපාවචර ප්‍රථමධ්‍යානය ලබන්නේයයි සැකහැර දතයුතුයි. මේ රූපාවචර ධ්‍යාන පවකයලැබූ යොගාවචර තෙමේ ඒ පඨමධ්‍යානය පවප්‍රහාරයෙන් වසීභූත කොටගෙණ අභිඥා උපදවන්නේයයි දතයුතු. එසේවුවත් පඨම ධ්‍යානය ලැබූ මාත්‍රයකින් අභිඥාව ලැබෙන්නේ නොවෙයි. ඒ උපදවන්නාවූ පඨමධ්‍යානයට සියක්වර දහස්වර ලක්ෂයක්වර සම්වැදී ඒ පඨමධ්‍යානයෙන් නැගිට එහි යෙදුනාවූ උපෙක්ඛා එකාග්‍රතාවන් ප්‍රත්‍යවෙක්ෂාකිරීමෙන්ම තමාගේ ප්‍රාණීන්ගේ පරිදී දෙන් ශතසහශ්‍රාදී නිර්මිත රූපාදිය ඉපදවීමෙහි දක්ෂවූ පඨම ධ්‍යාන කුශල චිත්තය හෝ ක්‍රියා චිත්තය හෝ එක්වරක් ඉපිද නිරුඩවේ. ඉක්බිති ඒ ධ්‍යානලාභී පුද්ගල තෙමේ අධිෂ්ඨානකළ පරිදීදෙන් ඒ රූපාලම්බණාදිය දක්නහැකිවෙයි. එහෙයින් පඨමාභිඥාවයයි කියනලද්දාවූ මේ අභිඥාශක්තිය රූපාවචර පඨම ධ්‍යානයාගේම ආනිශංස බලයකැයි දතයුතුයි. **"ඤාණවිප්පයුත්තං ජවනං අනුස්සරතී"** යනාදියෙහි මේ අභිඥාබලය ලබන්නාවූ පුද්ගලයෝ සදෙනෙක් ඇතැයි කියත්. ඒ සදෙනාතම් කවරහුද යත්? කර්මවාදී ක්‍රියාවාදී තීර්ථක තවිසාය, තීර්ථක තවිසා ආදීවූ පෘථග්ජනයාය, සාමාන්‍ය රහතුන්වහන්සේය, අසුම්හා ශ්‍රාවක යෝය, අග්‍රශ්‍රාවකයෝ දෙද�නාවහන්සේය, පසේබුදුන්ය, ලොව්තුරු බුදුන්ය, යන මේ සදෙනායි. කර්මවාදී ක්‍රියාවාදී තීර්ථකයා පටන් නොරහත්වූ සියලුදෙනාම පූර්වේනිවාසානුස්මෘතිඥානය උපදවනු කැමතිකල්හි රූපාවචර ප්‍රථමධ්‍යානය පටන් පඨමධ්‍යානය දක්වා උපදවා ඒ උපදවාගත්තාවූ රූපාවචර පඨමධ්‍යාන කුශල චිත්තය අභිඥාබවට පමුණුවා පූර්වේනිවාසය දැනගණී. ඔවුන්ගේ ඥානය කර්මප්‍රත්‍යයෙකුගේ ආලෝකයට බිඳුවේ. සාමාන්‍ය රහතුන්වහන්සේ ප්‍රථමධ්‍යාන ක්‍රියාචිත්තය පටන් පඨමධ්‍යාන ක්‍රියාචිත්තය දක්වා උපදවා අභිඥාබවට පමුණුවා පූර්වේනිවාසය දැනගණී. උන්වහන්සේගේ ඥානය තෙල

පහන් ආලෝකයට සමානවෙයි. අසුමහාශ්‍රාවකයෝද එසේම පඨමධ්‍යාන ක්‍රියාචිත්තය අභිඥාබවට පමුණුවා පූජේනිවාසය දැනගැණී. උන්වහන්සේගේ ඤාණය උල්කාලෝකයකටහෙවත් පන්දම් එලියකට සමානවෙයි. අනුශ්‍රාවක දෙදෙනාවහන්සේගේ ඒ පඨමධ්‍යාන ක්‍රියාචිත්තයෙන් උපදවාගන්නාවූ අභිඥාබලය ඔෂධිතාරකාවට නොහොත් පහන්තරුඑලියට සමානවෙයි. පසේබුදුවරයන්ගේ ඒ පඨමධ්‍යාන ක්‍රියාචිත්තයෙන් උපදවා ගන්නාවූ පූජේනිවාසඥානය සම්පූර්ණ චන්ද්‍රයාගේ චන්ද්‍රාලෝකයට බඳුවෙයි. සර්ව්ඥ බුදුවරයන්ගේ පඨමධ්‍යාන ක්‍රියාචිත්තයෙන් උපදවාගන්නාවූ පූජේනිවාසඥානය ඉර්මස අවපසලෝස්වක් දවස්හී පවොපකෙලශයන්ගෙන් විනිර්මුක්තවූ මධ්‍යාහ්න සූර්ය්‍යාගේ ආලෝකයට බඳුවෙයි. ඒ්මධ්‍යාහ්න සූර්ය්‍යාලෝකය රූපශරීරාදියෙහි පවා පැතිරයන්නාක්මෙන් සර්ව්ඥයන්වහන්සේගේ පූජේනිවාස ඥානයට හමුනොවන්නාවූ ධර්ම්යක්නම් නැත්තේසි. මෙසේ එකම රූපාවචර පඨමධ්‍යාන කුශලචිත්තය හා ක්‍රියාචිත්තයද ඒ ඒ පුද්ගලයන්ගේ සමාධිබලයේ බලවත් බැවින් විශෙෂවන්නේයයි දතයුතුයි. මේ රූපාවචර කුශලයන් පස්දෙනාගේ විපාක චිත්තයෝ පස්දෙන පාථග්ජන ශෛක්ෂ්‍ය පුද්ගලයන්ට සොළොස් රූපාවචර භූමියෙහි පටිසන්ධි ප්‍රවෘත්ති විපාකවශයෙන් උපදිති. රූපාවචර ක්‍රියාවෝ පස්දෙන ක්ෂීණාශ්‍රව රහතුන්වම උපදිති.

මේ පසළොස් රූපාවචර කුශල විපාක ක්‍රියාවන්ගේ

සංක්ෂෙප විභාගයයි.

අරූපාවචර චිත්තයන්ගේ සංක්ෂෙපවිභාගය කෙසේ යත්? කුශල විපාක ක්‍රියාවන්ගේවශයෙන් දෙළොස් වැදෑරුම්වූ මේ අරූපාවචර ක්‍රියාචිත්තය සොමනස්ස උපෙක්ෂාවෙදනා වශයෙන් උපෙක්ෂාවෙදනාවෙන්ම යුක්තවෙයි. සම්ප්‍රයුක්ත විප්‍රයුක්ත දෙදෙනාගේ වශයෙන් සම්ප්‍රයුක්තමවෙයි. ප්‍රථම ධ්‍යාන ද්විතීයධ්‍යාන තෘතීයධ්‍යාන චතුර්ථධ්‍යාන පඨමධ්‍යාන යන් අතුරෙන් පඨමධ්‍යානයම්වෙයි. එහෙයින් යටරූපධ්‍යාන පසළොස හා මේ අරූපධ්‍යාන දෙළසද එක්කොට මහද්ගත ධ්‍යානයෝ සත්විසිදෙනෙකැයි කියත්. මේ අරූපධ්‍යානයාගේ ඉපදීමට හෙතුවූ කම්සථාකයන් අතුරෙන් මේ දෙළොස් අරූපාවචර චිත්තයම ප්‍රඥප්තිය හා මහද්ගත ධර්ම්යම අරමුණුකොට

ඇත්තෙහුවෙත්. ඒ අරමුණුදෙක හැර අන්කිසි අරමුණෙක්හි මේ අරූපධ්‍යානයෝ නූපදිත්මැයි. එහෙයින් රූපාවචර පඨමධ්‍යානලාභීවූ යොගාවචර තෙමේ මේ ශරීරය ඇතිකල්හී දඬුමුගුරු අවි ආවුධාදියගෙණ කයින් සිඳවියයුතුවූ ප්‍රාණඝාතාදි දුශ්චරිතයන් හා මුඛය ඇතිකල්හී මුසාවා කීම් ආදී වචීදුශ්චරිත යන්ද කරන්නාවූ සත්ත්වතෙමේ මරණින් මතු සතර අපායාදියෙහි උපදී. එහෙයින් සත්වයාගේ සංසාර දුකට මූල්හෙතුව මේරූප යයි සලකා "ඛිරූපං ඛිරූපං"යනුවෙන් රූපයට නිදුකොට රූප ධ්‍යාන නිකාන්තිය හැර අරූපධ්‍යාන නිකාන්තිය උපදවා අරූපධ්‍යානය උපදවයි. ඒ කෙසේ උපදවන්නේද යත්? තමාගේ රූපාවචරධ්‍යානය ඉපදවීමට හෙතුවූ ආකාශකසිණවර්ජිත නව කසිණයන් අතුරෙන් යම්කිසි කසිණයක් භාවනාකොට උපදවා ගන්නාලද ප්‍රතිභාගනිමිත්ත සංඛ්‍යාත කසිණාලෝකය ආකාශ යෙහි කැමති පමණ ප්‍රදේශයක පතුරුවා ඒ කසිණාලෝකය උගුළුවා ලබාගන්නාවූ කසිණුග්ඝාටිමාකාශ ප්‍රඥප්තිය ආකාශාන ඤඤත්තනධ්‍යානයාගේ අරමුණවෙයි. විඤ්ඤාණඤඤත්තනධ්‍යාන යට ඒආකාශානඤඤත්ත කුශල චිත්තය අරමුණුවෙයි. විඤ්ඤා ණඤඤත්තනධ්‍යානය උපදනාකල්හී ආකාශානඤඤත්තධ්‍යානය නැති බැවින් ඒ ආකාශානඤඤත්තනධ්‍යානයාගේ නත්ථිභාව ප්‍රඥ ප්තිය ආකිඤඤඤඤත්තනධ්‍යානයට අරමුණුවෙයි. ඒ ආකිඤඤඤ ඤත්තනධ්‍යාන කුශල චිත්තය නෙවසඤඤ නාසඤඤඤඤත්තනධ්‍යාන කුශල චිත්තයට අරමුණුවෙයි. මෙසේ ආකාශානඤඤත්තා ආකි ඤඤඤඤත්ත දෙදෙන ප්‍රඥප්තාලම්බණවෙති. විඤ්ඤාණඤඤත්ත නෙවසඤඤ නාසඤඤඤඤත්ත දෙදෙන මහද්ගතාලම්බණවෙති. ඒ ආකාශානඤඤත්තාදිධ්‍යානය උපදවන්නාවූ යොගාවචර තෙමේ දණ්ඩාදාන ශස්ත්‍රාදානාදියමින්නේයයි කරජකාය රූප යෙහිම ආදීනවදැක "ඛිරූපං ඛිරූපං" යනුවෙන් රූපයට නිදු කොට කුමක්හෙයින් භාවනාවඩින්නේද යත්? මේ ලෝකවාසිවූ සත්වයෝ තුමූ මාතෘ පිතෘන්ගේ ශුක්ල ශ්‍රෝණිත දෙකින් හට ගත්තාවූ කරජකාය සංඛ්‍යාතවූ මේ රූපය පොෂ්‍යඝකරනු පිණිස අන් සත්වයන්ගේ ජීවිත විනාශකොට මේ කරජකාය රූපය පොෂ්‍යඝකටයුතුමැයි. එතකුදුවුවත් අටඅනුවක් රොගනවා නුවක් ව්‍යාධි දෙසියතුණක් අනතරාවන්ට මෙම කරජකාය රූප යම් භාජනවෙයි. එහෙයින් මේ කරජකාය රූපයට පිළිකුල් කිරීම් යුකකි යුකතවෙයි. කසිණ මණ්ඩලයෙහි පැතිර පවත් නාවූ කසිණාලෝක සංඛ්‍යාතවූ රූපය මව්පියන්ගේ ශුක්ල ශ්‍රෝණිතයෙන් හටගත්තේද නොවෙයි. භාවනාවෙන් හටගත්

තාවූ දෙසැත්තෑවක් වසතුධර්මියන්ගෙන් මිදුනාවූ කෙලෙශවිෂය මහතයට උපකාරවූ ප්‍රණීත රූපයක්වෙයි. එබඳු උතුම්වූ රූපය අරූපධ්‍යාන ලබන්නාවූ යොගාවචර තෙමේ කුමක්හෙයින් පිළිකුල්කොට උතුළුවන්නේද යත්? කරජකාය රූපයමෙන් කසිණාලෝක රූපය දුකට හෙතුනොවන්නේ නමුදු රූපවශයෙන් සමාන බැවින් මේ කසිණාලෝකරූපයද කරජකාය රූපයමෙන් භයඋපදවන්නේමෙහෝයි සිතා කසිණාලෝකයද දුරු කරන්නේයයි දතයුතුයි. ඊට උපමා කවර යත්? රාත්‍රි දවස තල්ගසක්මෙන් උස්වූ යක්ෂයෙක් දැක භයපත්වූ පුරුෂයෙක් තෙමේ ඊට මෑත භාගයෙහි නුපුරුදු මාර්ගයක යන්නාහු හිස සැත්තාවූ තල්කඳක් දැක එදවස රාත්‍රියෙහි භයකළාවූ යක්ෂයා මොහුමයයි සිතා පසුභාගය බලබලාදිවා ඒ භයින් ගැලවේද, එපරිද්දෙන්ම ආකාශානඤ්චායතනාදිධ්‍යානය ලබනු කැමතිව භාවනාවඩන්නාවූ යොගාවචර පුද්ගලයා හා ඒ යකුන්ට භයවූ පුද්ගලයාද උපමාකටයුතුවේ. කරජකාය රූපය හා නියම ජීවමාන යක්ෂයාද උපමාකටයුතුවෙයි. කසිණමණ්ඩලයෙහි කසිණාලෝකය හා නුපුරුදු මාර්ගයෙහි සමහවවූ හිසසැත්ති තල්ගසද උපමා උපමෙය සම්බන්ධකොට අර්ථදක්වයුතුයි. රූපාවචර පඨමධ්‍යානයෙහි දෝස් දැක අරූපාවචරධ්‍යානය උපදවනු කැමතිව ආකාශයෙහි කැමති ප්‍රදෙශයක ඒ කසිණාලෝකය පතුරුවා "පඨවී පඨවී ආපෝ ආපෝ" යනාදීන් භාවනාවැඩීමෙන්ම තමා විසින් නියමකරගන්නාලද්දාවූ ආකාශ ප්‍රදෙශය හාත් පසින් කසිණාලෝකයෙන්ම වැසීගෙයි. ඉක්බිති ඒ යොගාවචර තෙමේ මාගේ භාවනාවට පූජාවෙහි මේ ආකාශයෙහි චන්ද්‍රමණ්ඩල තාරකා රූපාදිය විද්‍යමානව තිබුනේය. දැන් වනාහි මාගේ කසිණාලෝකයෙන් ඒ තාරකා රූපාදිය වැසිගියේයයි සිතා ඒ කසිණාලෝකයෙහි නිමිත්තිකාය දුරුකොට පළමු තිබුනාවූ තාරකා රූපාදිය දක්නට කැමැත්ත උපන් බැවින් හා කසිණාලෝකයෙහි නිකාන්තිය හලබැවින්ද, ඒකසිණාලෝකය අතුරුදන්වියෙයි. මෙසේ කසිණ ඉගුළුවීම මුත් කබලකින් පුවක් උගුල්ලන්නාක්මෙන් හෝ කලාලයක් අකුලන්නාක්මෙන් ඉගුළුවීමක් නොවෙයි. තමා විසින් පතුරුවනලද්දාවූ කසිණාලෝකයෙහි නිකාන්තිය හැර ඊට යටවූ අවකාශ ප්‍රදෙශයෙහි තාරකා රූපාදිය දකිනු කැමතිකල්හී ඒ කසිණාලෝකය නැත්වී යෙයි. ඉක්බිති ඒ යොගාවචර තෙමේ ඒ කසිණාලෝකයෙන් වැසී තිබුනාවූ ප්‍රකෘති අවකාශය හා මිශ්‍රනොවූ ජනේල කවුළුව කට බඳුවූ ඒකිසුණු ඉගුළු අවකාශය අරමුණුකොටගෙණ

"අනන්තං ආකාසෝ අනන්තා ආකාසෝ" යනුවෙන් භාවනා වඩනකල්හි ඒ කසිණුග්ගු ඉගුළු අහස අරමුණුකොටගෙණ **මනෝ** වාරවජ්ජන විඤ්ඤාණයක් ඉපිද ඊට අනතුරුව ත්‍රිහෙතුක උපෙක්ඛා සහගත මහාකුසල විඤ්ඤාණයන් දෙදෙනා අතුරෙන් එක්තරා කුශල චිත්තයක් තෙමේ පරිකම්මාදී නමින් සතර වරක් හෝ උපචාරාදී නමින් තුන්වරක් හෝ උපචාර සමාධි ජවනකෘත්‍යය සිඛණ්ඩ කල්හි පස්වැනිව හෝ සතර වැනිව උපෙක්ඛාඒකග්ගතා සංඛ්‍යාත ධ්‍යානාඞ්ගමය ප්‍රධානකොට ඇති සමෙත්ත චෛතසිකයන්ගෙන් යුක්තවූ ආකාසානඤ්චායතන කුසලවිඤ්ඤාණය ආදිකර්මික වශයෙන් එක්වරක් ඉපිද නිරුඞ්ඛවේ. ඉක්බිති ඒ ආකාසානඤ්චායතන ධ්‍යාන ලාභීයොගාවචර තෙමේ ඒධ්‍යානය යටකී පස්ආකාරයෙන් පුරුදු කොට යම්කිසි පුරුෂයෙකු විසින් අච්ලාගන්නාලද්දාවූ රන්මිළ පොදියක් නැවත නැවත මුදුබලන්නාක්මෙන් මේ යොගාවචරයා විසින් උපදවාගන්නාලද්දාවූ ආකාසානඤ්චායතන කුශල චිත්තයෙහි පැවතුනාවූ උපෙක්ඛා එකග්ගතාවන් නැවත නැවත ප්‍රත්‍යවෙක්ඛණාකොට බලන්නාවූකල්හී මේ ආකාසානඤ්චායතන කුශල චිත්තයවනාහී රූපාවචර පඨමධ්‍යාන සංඛ්‍යාත සතුරෙකුට ආසන්නවෙයි. කසිණාලෝක නැමති රූපය පතුරුවනලද අවකාශයෙහි මේ ධ්‍යානය ලැබූ බැවින් මේ ධ්‍යානය ප්‍රණීත නොවෙයි, විඤ්ඤාණඤ්චායතනධ්‍යානය ප්‍රණීතයයි එහි නිකාන්තිය උපදවාගෙණ විඤ්ඤාණඤ්චායතනධ්‍යානයට භාවනාවඩයි. කෙසේ භාවනාවඩන්නේද යත්? පළමු උපදවාගන්නාලද ආකාසානඤ්චායතන කුශලචිත්තයම **"විඤ්ඤාණං අනන්තං විඤ්ඤාණං අනන්තං"** යනුවෙන් භාවනාවඩයි. මෙසේ භාවනාවඩන්නාවූ ඒයොගාවචරයාහට ආකාසානඤ්චායතනධ්‍යානය අරමුණුකොට ගෙණ මනොවාරවජ්ජන සිතක් ඉපිද පරිකම්ම උපචාර අනුලෝම ගොත්‍රභූ යන නාමින් සතරවරක් හෝ උපචාර අනුලෝම ගොත්‍රභූ යන නමින් තුන්වරක් හෝ ත්‍රිහෙතුක උපෙක්ඛා සහගත කාමාවචර කුශල චිත්තයන් දෙදෙනා අතුරෙන් එක්තරා කුශල චිත්තයක් තෙමේ උපචාර සමාධි ජවන කෘත්‍යවශයෙන් සතර වරක් හෝ තුන්වරක් ඉපිද නිරුඞ්ඛවූකල්හි පස්වෙනුව හෝ සතරවෙනුව උපෙක්ඛා එකග්ගතා සංඛ්‍යාත ධ්‍යානාඞ්ගමය ප්‍රධාන කොට ඇත්තාවූ සමෙත්ත චෛතසික ධර්මයන්ගෙන් සම්පූර්ණවූ විඤ්ඤාණඤ්චායතන අප්පිණා කුශලචිත්තය අප්පිණාවිපියට බස් නේයි. ඉක්බිති ඒ යොගාවචර තෙමේ ආකාසානඤ්චායතනයෙහි කීනයින්ම පස්ආකාරයෙන් පුරුදුකොට නැවත නැවත ඒ ධ්‍යානයට සම්මුඛීභාවකල්හී මැවිසි ඔනලද්දාවූ මේධ්‍යානයාගේ

අරමුණ ඕරාරිකයයි මා විසින් අත්හරනාලද්දාවූ ආකාසානඤ්චා
යතනධ්‍යාන කුශලචිත්තයමවෙයි. එහෙයින් මේ ධ්‍යානය අප්‍ර
ණීතවෙයි. මීට වඩා සියුම්වූ ප්‍රණීතවූ ආකිඤ්ඤායතනධ්‍යා
නය ලැබියේනම් මැනවැයි. මෙසේ ආකිඤ්ඤායතනධ්‍යාන
නිකාන්තිය උපදවාගෙණ යට ආකාසානඤ්චායතනධ්‍යානයාගේ
නැතිවීම් සංඛ්‍යාතවූ නත්ථිභාව ප්‍රඥප්තිය අරමුණුකොටගෙණ
"නත්ථිකිඤ්චි නත්ථිකිඤ්චි" යනුවෙන් භාවනාවඩනකල්හි ඒ නත්ථි
භාව ප්‍රඥප්තිය අරමුණුකොටගෙණ මනොමාරූ වජ්ජනචිත්තය
ඉපිද නැවත ඒ අරමුණම එල්බගෙණ උපෙක්ඛාසහගත ත්‍රිහෙතුක
කාමාවචර කුශලයන් දෙදෙනා අතුරෙන් එක්තරා කුශල
චිත්තයක් තෙමේ සතරවරක් හෝ තුන්වරක් හෝ උපචාර
සමාධි ජවනකෘත්‍යවශයෙන් ඉපිද නිරුඬවූකල්හි උපෙක්ඛාඒකා
ග්‍රතා සංඛ්‍යාත ධ්‍යානාඞ්ගවය ප්‍රධානකොට ඇත්තාවූ සමතිස්
චෛතසිකයකින්යුක්තවූ ආකිඤ්ඤායතන අපිණා කුශලචිත්තය
අපිණා වීථියට බස්නේයි. ඉක්බිති ඒ ලැබුවාවූ ධ්‍යානචිත්තය
රන්මිළ පොදියක් ඇතිදගත් පුරුෂයෙක් තෙමේ නැවත නැවත
උනාබලන්නාක්මෙන් ඒ ලැබූ ධ්‍යානයට නොයෙක්වර සමවදි
මින් නැවත ඒ ධ්‍යානය විඤ්ඤාණඤ්චායතනධ්‍යාන නැමති සතු
රෙකුට ආසන්නය. එහෙයින්ම අප්‍රණීතවෙයි. නෙවසඤ්ඤා
නාසඤ්ඤායතනධ්‍යානය වනාහී අතිශයින් ප්‍රණීතයයි ධ්‍යාන
නිකාන්තිය උපදවාගෙණ එම ආකිඤ්ඤායතනධ්‍යාන චිත්තය
අරමුණුකොටගෙණ "සන්තමේතං පණීතමේතං" යනුවෙන්
නැවත නැවත භාවනාකරන්නාවූ යොගාවචරයාහට යවකි
නයින් ඒ ආකිඤ්ඤායතනධ්‍යාන චිත්තය අරමුණුකොටගෙණ
මනොමාරූවජ්ජන සිතක් ඉපිද උපෙක්ඛා සහගත කාමාවචර ත්‍රි
හෙතුක කුශල චිත්තයන් දෙදෙනා අතුරෙන් එක්තරා චිත්ත
යක් තෙමේ සතරවරක් හෝ තුන්වරක් හෝ උපචාර සමාධි
ජවන කෘත්‍යය සිඳනෙරෙමින් ඉපිද නිරුඬවේ. තදනන්තරව
උපෙක්ඛා එකාග්‍රතා යන ධ්‍යානාඞ්ගවය ප්‍රධානකොට ඇත්තාවූ
සමතිස් චෛතසිකයකින් සම්පූර්ණවූ නෙවසඤ්ඤා නාසඤ්ඤා
යතන අපිණාධ්‍යාන චිත්තය පස්වැනිව හෝ සතරවැනිව එක්
වරක් ඉපිද නිරුඬවේ. ඒ ධ්‍යානචිත්තයද ඉවකීනයින් පඤ්චාං
ගයකින් පුරුදුකොට අභිඥා කාලයෙහි ධ්‍යාන සමාපත්ති සැප
යෙන් දවස්යවසි. මෙහි වනාහි විඤ්ඤාණඤ්චායතනධ්‍යානය ලබ
න්නාවූ යොගාවචර පුද්ගලතෙමේ මා විසින් ලබනලදාද්දාවූ
ආකාසානඤ්චායතනධ්‍යානය රූපාවචර පඤ්චමධ්‍යානලාභීති

සතුරෙකුටඅසන්නය, එසේම අඹයෝද දුවිල් වන්නාහුය,

විඤ්ඤාණඤ්චායතනධ්‍යානය වනාහි අතිශයින් සියුම්ය ප්‍රණීත යයි යනාදීන් විඤ්ඤාණඤ්චායතනධ්‍යානයෙහි ගුණදැක ආකාසානඤ්චායතනධ්‍යානය කෙළපිඬක් මෙන් පිළිකුල්කොට අත්හරියි. එසේකුදුවුවත් විඤ්ඤාණඤ්චායතනධ්‍යානය උපදවනු පිණිස ඒ පිළිකුල්කටයුතුවූ ආකාසානඤ්චායතනධ්‍යානයම නැවත **"විඤ්ඤාණං අනන්තං විඤ්ඤාණං අනන්තං"** යනුවෙන් ඒ පිළිකුල්වූ ධ්‍යානයම කුමක්හෙයින් අරමුණුකොට භාවනාවඩන්නේද යත්? විඤ්ඤාණඤ්චායතනධ්‍යානය ලබනු කැමති යොගාවචරයා විසින් ඒ ධ්‍යානය ඉපදවීම පිණිස ආකාසානඤ්චායතන කුශලචිත්තය හැර භවත්‍රයෙහිම වෙන අරමුණක් නැත්තේය. ඉදින් ඒ විඤ්ඤාණඤ්චායතනය උපදවන්නේවීනම් ඒධ්‍යානයෙන් විසංයෝගය කටයුතුවූ කෙලෙස්‍රුන් ප්‍රහාණයකිරීමට අනිකුත් ධ්‍යානයෙක්ද නැත්තේය. ඒධ්‍යානයෙහි ඇත්තාවූ උපෙක්ඛා එකාග්‍රතාවන් ප්‍රත්‍යවෙක්ඛා නොකොට හැක්කේය. මෙසේ විඤ්ඤාණඤ්චායතනයෙහි ඇත්තාවූ අනුශය දැන මුලපටන් පිළිකුල්කොට හරනලද්දවූ ආකාසානඤ්චායතනධ්‍යානයම අරමුණුකොට භාවනා වඩා ප්‍රණීතවූ විඤ්ඤාණඤ්චායතනධ්‍යානය උපදවයි. ඊට උපමාකවර යත්? තමාගේ රාජ්‍යයෙහි අනුශාසනාකරන්නාවූ රජ තෙමේ වනාහි ප්‍රාණඝාතාදී දුශ්චරිතයෙහි හැසිරෙන්නේය. දශරාජධර්මයෙන් හාත්පසින් දුරුව සතර සඟරුවනින්වෙන්ව රාජ්‍යය අනුශාසනාකරයි. ඒ රජහට අර්ථයෙන් ධර්මයෙන් අනුශාසනාකරන්නාවූ එක්තරා අමාත්‍යයෙක් තෙමේ හාත්පසින්ම ඒ රජහුගේ දුශ්චරිතයන්ට පිළිකුල්කරයි. එසේකුදුවුවත් ඒරජහට සෙවනොකොට තමාගේ අඹුදරුවන් පොෂ්‍යයනොකොට හැකිවෙයි. ඇත් අස් රන්රිදී ආදීවූ උපභොග පරිභොග වස්තුවද නොලැබිය හැකිවෙයි. මෙසේ ධාර්මිකවූ අමාත්‍ය තෙමේ ඒ දුශ්චරිතවූ පිළිකුල්වූ රජහු හමාගේ ඓහලෞකික අර්ථය සලකා ඒ රජහට සෙවාකොට සිත්වූ පරිද්දෙන් පස්කාමසම්පත්ති අනුභවකරයි. එපරිද්දෙන්ම ආකාසානඤ්චායතනධ්‍යානයට පිළිකුල්කරන්නාවූ විඤ්ඤාණඤ්චායතනධ්‍යානය ලබනු කැමැති යොගාවචර තෙමේ ඒ ධාර්මිකවූ රාජාමාත්‍යයා මෙන්ද, පිළිකුල්වූ රජහු ආකාසානඤ්චායතනධ්‍යානයමෙන්ද, ඒ රජහට සෙවාකිරීමක්මෙන් තමාගේ සිත නොකැමැතිවම අනික් අරමුණක්නැතිහෙයින් ආකාසානඤ්චායතනධ්‍යානයම අරමුණුකොට භාවනාකිරීමද, ඒරජහට සෙවාකිරීමෙන් ලබනලද්දවූ උපභොග පරිභොග සම්පත්තියක්මෙන් විඤ්ඤාණඤ්චායතනධ්‍යාන ලාභයද, ඒ අමාත්‍යතෙමේ රජහු කෙරෙන් ලබනලද්දවූ ධනයෙන් තමාගේ අඹුදරු දාසිදාසාදීන්

පොෂ්‍යයකිරීමක්මෙන් විඤ්ඤාණඤ්චායතනධ්‍යානයෙන් කෙලෙස විසකම්හනය හා ඒ සමාපත්ති සැපයෙන් දවස් යැවීමද උපමා උපමෙය සම්බන්ධයෙන් අවබෝධකළයුතුයි. මේ රාජෝපමාවවාදයේ අනිකුදු මෙබඳු තන්හි යොදා අවබෝධකළයුත්තේයි. නෙවසඤ්ඤා නාසඤ්ඤායතනධ්‍යානය ලබනු පිණිස භාවනාවඩන්නාවූ යෝගාවචර පුද්ගලතෙමේ මාවිසින් ලබනලද්දාවූ ආකිඤ්ඤඤ්ඤායතන ධ්‍යානය යට විඤ්ඤාණඤ්චායතනධ්‍යාන සංඛ්‍යාතවූ සතුරෙක් ලංව ඇත්තේය. නෙවසඤ්ඤානාසඤ්ඤායතනධ්‍යානය වනාහි අතිශයින් ප්‍රණීතවන්නේය. සියුම්වන්නේය. එහෙයින් ඒප්‍රණීත ධ්‍යානයලැබිය්‍යේනම් යෙහෙකැයි සිතා ආකිඤ්ඤඤ්ඤායතනධ්‍යානය වැසිකිළියක්මෙන් පිළිකුල්කොට හැරදමාගියාවූ යෝගාවචර පුද්ගලතෙමේ නෙවසඤ්ඤා නාසඤ්ඤායතනධ්‍යානය ලබනු පිණිස අප්‍රණීත ඖදාරිකයයි දෙස් දක්වා හැර ගියාවූ ආකිඤ්ඤඤ්ඤායතනධ්‍යානයම නැවතත් "සණතඤ්ඤේන පණීත ඤේන" යනුවෙන් පෙරළා කුමක්හෙයින් භාවනාවඩන්නේද යත්? නෙවසඤ්ඤා නාසඤ්ඤායතනධ්‍යානය ලබනු කැමති යෝගාවචරයා විසින් මේ ආකිඤ්ඤඤ්ඤායතනධ්‍යාන චිත්තය හැර අන්කිසි අරමුණක් ජීවිතාන්තය දක්වා භාවනාකෙළේ නමුදු නෙවසඤ්ඤා නාසඤ්ඤායතනධ්‍යානය නුපදවිය හැකිවෙයි. ඉදින් පිළිකුල්කොට හැරදැමූ ආකිඤ්ඤඤ්ඤායතනධ්‍යාන නැමති කම් සථානය නොවැඩුවේක්නම් නෙවසඤ්ඤානාසඤ්ඤායතනධ්‍යාන නැමති උතුම්වූ ගුණධර්මයෙන් පරිබාහිරවෙයි. ඒධ්‍යානලාභීන් විසකම්හණයකටයුතුවූ කෙලෙසයෝ අතික්ධ්‍යානයකින් විසකම්හනය නොකරවහැක්කේය. මේආදී අනුසස් සලකා පළමුවෙන් පිළිකුල්කරණලද්දාවූ ආකිඤ්ඤඤ්ඤායතනධ්‍යානයම නැවතත් "සණතඤ්ඤේන පණීත ඤේන" යනාදීවූ පෙරළා භාවනාකිරීමෙන් ඒඋතුම්වූ ධ්‍යානසමාපත්තිය ලබන්නේවෙයි. ඊට උපමාකවර යත්? මුලුරට අනුශාසනාකරන්නාවූ රජතෙමේ චතුරඟිනී සෙනාව හා රාජාමාත්‍යයන් විසින් පිරිවරණු ලැබ තමාගේ බිසව හා සමඟ සවණිාභරණයෙන් සරසනලද්දාවූ ඇතිවාහනාරූඪව නුවර පැදකුණුකරන්නාවූකල්හි එක්තරා ළිපියක ඇත්දත් ලියන්නාවූ ඇත්දත් වඩුවෙක් දැකා ඔහුගේ කම්මන්ත දකිණුකැමතිව ඇතියානාවෙන් බැස ඒ සියලඟ දූවිලි තවරාගෙණ කම්මන්ත කරන්නාවූ ඒ ඇත්දත් වඩුවා ලඟට පැමිණ ඔහු විසින් කරණ ලද්දාවූ ඇත්දළ කම්මන්තයක් අතින්ගෙණ ඒ ශිල්පයෙහි අතිශයින් පැහැදී සහය! තොපගේ මේ කම්මන්තය ඉතාම දක්ෂය. මා කිසිකලෙකත් තොප වැනි කම්මන්තකාරයෙක් නොදුටුවෙමි.

යනාදීන් ඒ ශිල්පීහට සතුතිකරණතල්හි එහි බලාසිටි එක්තරා අමාත්‍යයෙක් තෙමේ රජ්ජුරුවන්වහන්ස! එසේවීතම් තුබවහන්සේගේ රාජ්‍යය මේ ශිල්පීහට පාවාදී ඔහුගේ ශිල්පය භුබවහන්සේ විසින් කවයුතුදැයි විචාළේනම් එකාන්තයෙන්ම රාජ්‍යය ඒශිල්පයට භුවමාරුකරන්ට කැමතිනොවෙයි. මේ උපමාවෙහි ආකිංචඤ්ඤායතනයට හස්සිදන්න ශිල්පීහු සමානවෙයි. තෙව සඤ්ඤානාසඤ්ඤායතනධ්‍යානය ලබනු කැමති යොගාවචරයාහට මහරජහු උපමාවෙයි. ඒරාජ්‍ය සම්පත්තියට නෙවසඤ්ඤානාසඤ්ඤායතනධ්‍යානය උපමාවෙයි. මෙසේ උපමා උපමේය්‍ය සම්බන්ධය දතයුතුයි. ඒ සතර අරූපධ්‍යානයට සමානවූ උපමාවක් නම් කවරයත්? ගේ දොර ආදිය නැත්තාවූ මහන්කාන්තාර මාගීයෙක්හි එක්තරා මණ්ඩපයක් ඇතිවෙයි. ඒ මණ්ඩපය යට භූමියෙහි පාදය තැබීමට පවා සථානයක් නැතිව අසුවියෙන් පිරිතිබෙයි. ඉක්බිති එක්තරා පුරුෂයෙක් තෙමේ මහත්වූ සූයය්‍යීතාපයෙන් කලාන්තවූ ශරීර ඇතිව විඩාසන්සිඳවීමට සථානයක් සොයමින් යනුයේ මණ්ඩපය දැක වහාම මණ්ඩපයකරා ගොස් බැහැකල්හි යටභාගයෙහි පාදය පවා තැබීමට අවකාශනොමැතිව අසුවියෙන් පිරිතිබෙයි. එබැවින් විඩාසන්සිදුවීමට අතික් සථානයකුත් නැතිහෙයින්ද මණ්ඩපය යට අසුවියෙන් පිරිතිබෙනහෙයින්ද ඒපුරුෂතෙමේ මණ්ඩපයෙහි කොණක එල්ලිබිම පාදයන් සපයිනොකොට සිටිනේයි. ඉක්බිති දෙවෙනි පුරුෂයෙක්ද ඒ මාගීයෙහි අවුත් සූයය්‍යීතාපයෙන් මහත්කලාන්තවැට පැමිණ පළමු පුරුෂයාමෙන්ම මණ්ඩපයකරාගොස් යටභාගය අසුවියෙන් පිරිතිබෙනු දැක පළමුවෙන් එල්ලී සිටින්නාවූ පුරුෂයාගේ එක් පාදයක එල්ලිසිටියේයි. ඉක්බිති තුන්වැනි පුරුෂයෙක්ද ඒ කාන්තාරමාගීයෙහි යනුයේ පෙරසේම සූයය්‍යීතාපයෙන් කලාන්තවී මේ මණ්ඩපය දැක විඩාසන්සිදුවීම සඳහා මණ්ඩපය කරාගොස් බැහැකල්හි යටභාගය අසුවියෙන් පිරිතිබුනු බැවින් පයතබාසිටීමට අවකාශයක් නැත්තෙන් ඒමණ්ඩපයාගේ අතික් මුල්ලෙහි එල්ලිසිටගත. ඉක්බිති සතරවැනි පුරුෂයෙකුත් ඒකාන්තාර මාගීයෙහි ගමන්කොට සූයය්‍යීතාපයෙන් විඩාවට පැමිණ පෙර තුන්දෙනාමෙන්ම ඒ මණ්ඩපයකරාගොස් බැලූකල්හි යටභාගය අසුවියෙන් පිරිතිබෙනුබව දැක තුන්වැනි පුරුෂයාගේ පාදයක එල්ලිසිටගත්තේසේ. මේ උපමාවෙහි දීඝීවූ කාන්තාර මාගීයමෙන් සංසාරයද, යටභාගය අසුවියෙන් පිරිතිබෙන්නාවූ ප්‍රදෙශයමෙන් කාමලොකයද ඒඅසුවිගොඩ මත්තෙහි මණ්ඩපයමෙන් සතර අරූපභවයද, පළමුවැනි පුරුෂ

තෙමේ මණ්ඩපයෙහි එල්ලිසිටගත්තාක්මෙන් ආකාශානඤ්ච
තනධ්‍යානලාභී තෙමේද. පළමුවැනි පුරුෂයාගේ පාදයෙහි
එල්ලිසිටගත් පුරුෂයාගේ ආකාශානඤ්චායතනධ්‍යානය අර
මුණුකොට විඤ්ඤාණඤ්චායතනධ්‍යානය ලාභී යොගාවචර තෙමේ
ද ඒ මණ්ඩපයේ අනිත් පැත්තේ එල්ලිසිටගත් පුරුෂයාමෙන්
ආකිඤ්ඤායතනධ්‍යානලාභී යොගාවචර තෙමේද, තුන්වැනි
පුරුෂයාගේ පාදයෙහි එල්ලිසිටගත් පුරුෂයාමෙන් ආකිඤ්ඤා
යතනධ්‍යානචිත්තයෙහි එල්බගෙණ නෙවසඤ්ඤානාසඤ්ඤායත
නය උපදවාගත් යොගාවචර තෙමේද, උපමා උපමේය සම්බන්ධ
කටයුතුයි. තවද උස්වූ පර්වතයකට නගින්නාවූ පුරුෂයෙක්
තෙමේ තමාගේ දෙපය වලෙනකල්හි දෙඅත දෙදනෙහි තබා
නගින්නාක්මෙන්ද, දෙදණ වලෙනකල්හි දෙඅත කිමගසාද,
පර්වතයට නගින්නාක්මෙන් දෙදනෙහි දෙඅත තබා නැගීමක්
මෙන් විඤ්ඤාණඤ්චායතනධ්‍යානයද, දෙඅත කිමගසා නගින්
නාක්මෙන් ආකිඤ්ඤායතනධ්‍යානයද, දතයුත්තේයි. නෙව
සඤ්ඤානාසඤ්ඤායතනධ්‍යානයෙහි ඇත්තාවූ චිත්ත චෛතසික
ධර්මයෝ තුමූ මනායතන ධර්මායතන ධර්මයන්ට ඇතුළත්වන පමණ
මුත් අතිශයින් සියුම්වූ ඒ චිත්තය වනාහී මනායතන සභාව
යෙන් වෙන්නොවූ මාත්‍රයක් ඇත්තේයි. එහෙයින් මනායතන
යයි කියත් එහි යෙදෙන්නාවූ චෛතසික ධර්මයෝද ධර්මායතන
සභාවයෙන් වෙන්නොවීම් මාත්‍රයක් ඇත්තාහුය "නෙව
සඤ්ඤා නාසඤ්ඤා" යන පදයෙහි අර්ථයනම්:—ඔෂධාදිකවූ සංඥා
වක්ද නැත්තේය. සංඥා තොමෝ නැත්තේත් නොවෙයි. යන
අර්ථයි. "නෙවසඤ්ඤා නාසඤ්ඤා" යනුවෙන් සඤ්ඤාව ප්‍රධාන
කොට වදාළේ නමුදු 'නෙව චිත්තං නාචිත්තං" නෙව එසෝ
නාඵසෝ" යනාදීන් මෙහි විද්‍යමානවූ සමස්ත ධර්මයන්ගේ
විග්‍රහ අර්ථදතයුතුයි "නෙවසඤ්ඤූ නාසඤ්ඤායතනධ්‍යාන
චිත්තයෙහි විද්‍යමානවූ විඤ්ඤා චෛතසික ධර්මයෝවනාහි විද
ර්ශණාවඩන්නාවූ යොගාවචර සික්ෂූන්ගේ සීලාදිගුණ භාවනාවට
අරමුණුනොවේ. කුමක්හෙයින ඇත්? ඉතා සියුම් බැවිනැයි දත
යුතුයි. මේ චිත්තයෙහි විද්‍යමානවූ ධර්මයන්ගේ සභාව දැක්වී
මට මතු ප්‍රකාශවන්නාවූ උපමාවෝ දතයුත්තාහුය. ඒ කෙසේ
ඇත්? උපාඛ්‍යයන්හා සමඟ අන්තෙවාසිකයාද දීඝිමාඝීයෙහි
යන්නාවූකල්හි පෙරටුව ගියාවූ අන්තෙවාසිකයා ඉදිරි මාඝීයෙහි
සවල්ප දියත්තක් දැසා සවාමීනි! වගන් මුදුව ජලය ඇත්තේයයි
කීකල්හි උපාඛ්‍යාය තෙමේ ඇවැත්නි! එසේවීනම් ජලශෝකාව
ඉඤ්ඡවයි පැන් සනඟමහයි කීකල්හි සවාමීනි! ජලය නැතැයි

කියයි. මේ උපමාවෙහි වහන් තෙමෙන පමණ සුළුපට දියත්තක් ඇතිහෙයින් ජලයයි කියා. කැවතා නහන පමණ ජලයක් නැති හෙයින් ජලයනැතැයි කියා. එපරිද්දෙන් විදර්ශනාවට ගොචර වියයුතුවූ පඤ්ඤාවක් නැතිහෙයින් "නෙවඤ්ඤා" කියාද සංඥාව හාත්පසින් නැත්තේත් නොවන හෙයින් "නාඤ්ඤා" කියාද ව්‍යවහාර කෙරෙත්. තවද උදෑන්හි උපාධ්‍යයන්වහන්සේ හුළුකැන් වළඳනු පිණිස අනෙතාවාසිකයාහට බණවා ඇවැත්නි! පාත්‍රය ගෙණෙවයි කියාල්හි සවාමීනි! පාත්‍රයෙහි තෙලැයිකියේය. ඉක්බිති ඇවැත්නි! පාත්‍රයෙහි තෙල් ඇත්තේවිනම් පයමකන තෙල් කුලාව ගෙණෙව තෙල් පුරවාගණිම්හයි කියල්හි සවාමීනි! තෙල්නැතැයි කියයි. එපරිද්දෙන්ම නෙවසඤ්ඤා නාසඤ්ඤායතන පදයාගේ සඤ්ඤාව ඇත්තේත් නොවෙයි නැත්තේත් නොවෙයි යන අර්ථය තේරුම්ගතයුතුයි. මේහි පාත්‍රයෙහි තෙල් ඇතිබැවින් හුළුකැන් නොවැළඳියහැකියයි කීතන්හි ඒයේ දවස් පිළිගත්තාවූ තෙල අදයාවකාලිකවූ හුළුකැන හා සමග එක්කොට වැළඳීමෙන් සන්නිධිකාර පරිභොගය වියයුතුහෙයින් සවාමීනි! පාත්‍රයෙහි තෙලැයි කීයේයයි දතයුතුයි.

මේ අරූපද්ධ්‍යානයන්ගේ සංක්ෂේප විභාගයයි.

ධ්‍යාන විත්තයන් හා සම්බන්ධයි. අවෙඅභිභායතනයෝ නම් කවරහ යත්? අඨඛෝ ඉමානි ආනන්ද! අභිභායතනානි; කතමානි අඨ? අජ්ඣත්තං රූපසඤ්ඤී එකොබහිඩා රූපානි පස්සති පරිත්තානි සුවණ්ණ දුබ්බණ්ණානි තානි අභිභුය්‍ය ජානාමි පස්සාමීති එවං සඤ්ඤීහොති. ඉදං පඨමං අභිභායතනං. අජ්ඣත්තං රූපසඤ්ඤී එකොබහිඩා රූපානි පස්සති අප්පමාණානි සුවණ්ණ දුබ්බණ්ණානි තානි අභිභුය්‍ය ජානාමිපස්සාමීති එවං සඤ්ඤීහොති. ඉදං දුතියං අභිභායතනං. අජ්ඣත්තං අරූපසඤ්ඤී එකොබහිඩා රූපානි පස්සති පරිත්තානි සුවණ්ණ දුබ්බණ්ණානි තානි අභිභුය්‍ය ජානාමි පස්සාමීති එවං සඤ්ඤී හොති. ඉදං තතියං අභිභායතනං. අජ්ඣත්තං අරූපසඤ්ඤී එකොබහිඩා රූපානි පස්සති අප්පමාණානි සුවණ්ණ දුබ්බණ්ණානි තානි අභිභුය්‍ය ජානාමි පස්සාමීති එවං සඤ්ඤීහොති. ඉදංච චතුත්ථං අභිභායතනං. අජ්ඣත්තං අරූපසඤ්ඤී එකොබහිඩා රූපානි පස්සති නීලානි නීලවණ්ණානි නීලනිදස්සනානි නීලනිභාසානි සෙය්‍යථාපිනාම උමාපුප්ඵං නීලං නීලවණ්ණං නීලනිදස්ස

තං නීලනිභාසං සෙය්‍යථාපි වාපනතං වත්ථං බාරාණසෙය්‍යකං උභතෝ භාගවිමට්ඨං නීලං නීලවණ්ණං නීලනිදස්සනං නීලනිභාසං එවමෙව අජ්ඣත්තං අරූපසඤ්ඤී එකොබහිද්ධා රූපානි පස්සති නීලානි නීලවණ්ණානි නීලනිදස්සනානි නීලනිභාසානි තානි අභිභුය්‍ය ජානාමි පස්සාමීති එවං සඤ්ඤී හොති. ඉදං ෙච්මං අභිභායතනං අජ්ඣත්තං අරූප සඤ්ඤී එකොබහිද්ධා රූපානි පස්සති පීතානි පීතවණ්ණානි පීතනිදස්සනානි පීතනිභාසානි සෙය්‍යථාපීතාම කණිකාරපුප්ඵං පීතං පීතවණ්ණං පීතනිදස්සනං පීතනිභාසං සෙය්‍යථාපි වාපනතං වත්ථං බාරාණසෙය්‍යකං උභතෝ භාගවිමට්ඨං පීතං පීතවණ්ණං පීතනිදස්සනං පීතනිභාසං එවමෙව අජ්ඣත්තං අරූපසඤ්ඤී එකොබහිද්ධා රූපානි පස්සති පීතානි පීතවණ්ණානි පීතනිදස්සනානි පීතනිභාසානි තානි අභිභුය්‍ය ජානාමි පස්සාමීති එවං සඤ්ඤීහොති. ඉදං ඡට්ඨං අභිභායතනං අජ්ඣත්තං අරූපසඤ්ඤී එකොබහිද්ධා රූපානි පස්සති ලොහිතකානි ලොහිතකවණ්ණානි ලොහිතකනිදස්සනානි ලොහිතක නිභාසානි සෙය්‍යථාපිනාම බන්ධුජීවකපුප්ඵං ලොහිතකං ලොහිතකවණ්ණං ලොහිතකනිදස්සනං ලොහිතක නිභාසං, සෙය්‍යථාපිවාපන තං වත්ථං බාරාණසෙය්‍යකං උභතෝ භාගවිමට්ඨං ලොහිතකං ලොහිතකවණ්ණං ලොහිතකනිදස්සනං ලොහිතකනිභාසං එවමෙව අජ්ඣත්තං අරූපසඤ්ඤී එකොබහිද්ධා අරූපානිපස්සති ලොහිතකානි ලොහිතකවණ්ණානි ලොහිතකනිදස්සනානි ලොහිතකනිභාසානි තානි අභිභුය්‍ය ජානාමි පස්සාමීති එවං සඤ්ඤීහොති. ඉදං සත්තමං අභිභායතනං අජ්ඣත්තං අරූපසඤ්ඤී එකොබහිද්ධා රූපානිපස්සති ඔදාතානි ඔදාතවණ්ණානි ඔදාතනිදස්සනානි ඔදාතනිභාසානි සෙය්‍යථාපි නාම ඔසධිතාරකා ඔදාතා ඔදාතවණ්ණා ඔදාතනිදස්සනා ඔදාතනිභාසා සෙය්‍යථාපි වා පන තං වත්ථං බාරාණසෙය්‍යකං උභතොභාග විමට්ඨං ඔදාතං ඔදාතවණ්ණං ඔදාතනිදස්සනං ඔදාතනිභාසං, එවමෙව අජ්ඣත්තං අරූපසඤ්ඤී එකොබහිද්ධා රූපානි පස්සති, ඔදාතානි ඔදාතවණ්ණානි ඔදාතනිදස්සනානි ඔදාතනිභාසානි, තානි අභිභුය්‍ය ජානාමි පස්සාමීති එවංසඤ්ඤී හොති. "ඉදං අට්ඨං අභිභායතනං" ඉමානිඛො ආනන්ද! අට්ඨඅභිභායතනානි යතුවෙන් මහාපරිනිබ්බාණ සූත්‍රයෙහි ආවාවූ අභිභායතනයෝ අටදෙන දතයුත්තාහුය.

විමොක්ඛයෝ අටදෙනනම් කවරහයත්? අට්ඨඛො ඉමේ ආනන්ද! විමොක්ඛා, කතමේඅට්? රූපී රූපානි පස්සති, අයං පඨමෝ විමොක්ඛොඅජ්ඣත්තං අරූපසඤ්ඤීබහිද්ධාරූපානි පස්සති,

අයං දුතියෝ විමොක්ඛෝ සුභන්ත්වේව අධිමුත්තෝහොති අයං තතියෝ විමොක්ඛෝ සබ්බසෝ රූපසඤ්ඤානං සමතික්කමා පටිඝසඤ්ඤානං අප්පටිඝමා නානත්තසඤ්ඤානං අමනසිකාරා අනන්තෝ ආකාසෝති ආකාසානඤ්චායතනං උපසම්පජ්ජ විහරති. අයං චතුත්ථෝ විමොක්ඛෝ සබ්බසෝ ආකාසානඤ්චායතනං සමතික්කම්ම අනන්තං විඤ්ඤාණන්ති විඤ්ඤාණඤ්චායතනං උපසම්පජ්ජ විහරති. අයං පඤ්චමෝ විමොක්ඛෝ සබ්බසෝ විඤ්ඤාණඤ්චායතනං සමතික්කම්ම නත්ථිකිඤ්චීති ආකිඤ්චඤ්ඤායතනං උපසම්පජ්ජ විහරති. අයං ඡට්ඨෝ විමොක්ඛෝ සබ්බසෝ ආකිඤ්චඤ්ඤායතනං සමතික්කම්ම නෙවසඤ්ඤානාසඤ්ඤායතනං උපසම්පජ්ජ විහරති. අයං සත්තමෝ විමොක්ඛෝ සබ්බසෝ නෙවසඤ්ඤානාසඤ්ඤායතනං සමතික්කම්ම සඤ්ඤාවේදයිතනිරෝධං උපසම්පජ්ජ විහරති. අයං අට්ඨමෝ විමොක්ඛෝ "ඉමේමඛෝ ආනන්ද! අට්ඨවිමොක්ඛා" යනුදු මහා පරිනිබ්බාණ සූත්‍රයෙහි ආවාවූ විමොක්ෂයෝ අටදෙනායි.

භාවනය.

ආනන්දය! මේ අභිභායතනයෝ අටදෙනෙක්වෙත්. ඒ කවර අටදෙනෙක්ද යත්? "අභිභායතනය" යනු මැඩපවත්වන්නාවූ කාරණය යනාම්බිසි. කුමක් මැඩපවත්වන්නාහුද යත්? සතුරුවූ නීවරණ ධර්මයන් හා පරිකර්ම ප්‍රතිභාග ආලම්බණයෝත් මැඩපවත්වන්නාහුය යන අර්ථයි. අභිභායතනයෝ වනාහි ඉදුරා ප්‍රතිපක්ෂභාවයෙන් නීවරණ ධර්මයන් මැඩපවත්වන්නාහුය. පුද්ගලයාගේ සුඤ්ඤතතරිතර භාවයෙන් පරිකර්ම ප්‍රතිභාගාලම්බණයන් මැඩපවත්වන්නාහුය. පරිකර්ම නිමිත්ත හෝ ඥානය මැඩපවත්වන්නේනුයි අභිභූතන්ති වේ. මැඩ පැවැත්විය්‍යුතු අරමුණු සඛ්‍යා තඅභායතනයක් ඇත්තේනුයි අභිභායතන නම්. නොහොත් අරමුණ මැඩපවත්වනයෙයින් අභිභූතන්ති, යොගීන්ගේ සුඛ විහරණයට ආධාරවන බැවින් මනායතන ධර්මයන බැවින් හෝ සසම්ප්‍රයුක්ත ධ්‍යානචිත්තය අභිභායතන නම්වේ මේ සුඤ්ඤතතරිය භාවය ප්‍රතිපක්ෂ ධර්මයන් මැඩපැවැත්මෙහිද, අරමුණු මැඩපැවැත්වීමෙහිද, යන දෙතැනෙක් යෙදිය්‍යුතුයි හේ කෙසේයත්? පුද්ගලයාගේ සුඤ්ඤතතරිය භාවයෙන් සතුරුවූ නීවරණ ධර්මයන්ද මැඩපවත්වයි. ඒ සුඤ්ඤතතරිය භාවයෙන්ම අරමුණුද මැඩපවත්වයි. මේ අභිභායතන යන්නෙහි අර්ථයි. "අජ්ඣත්තං රූපසඤ්ඤී" යනාදියෙහි භාවය කෙසේයත්? අධ්‍යාත්මරූප ශබ්දයෙහි භගවත් තමාගේ ශරීරගතවූ රූපයෙහි පරිකර්මභාවනා

කසිණවශයෙන් උපදවාගන්නාලද්දාවූ චතුර්ථධ්‍යානඇත්තාවූ යොගාවචර තෙමේ අධ්‍යාත්ම රූපසඤ්ඤීනම්වන්නේයි. අධ්‍යාත්මයෙහි නීලඋපාදාරණය පිරියම්කරණ යොගීතෙමේ නිල්වන්වූ කෙසයෙහි හෝ පිතෙහි හෝ ඇස් මිහිරියෙහි හෝ නීලවර්ණය ගෙණ නීලකසිණයට පිරියම් භාවනාකරයි. පීතකසිණයට ශරීරයෙහි යටහාගයෙහි පිහිටි මේදතෙලෙහි හෝ රන්වන්වූ ජවියෙහි හෝ අත්පාපිටුවල හෝ අක්ෂීන්ගේ රන්වන් තැන හෝ පීතවර්ණයගෙණ පීතකසිණයට පිරියම්භාවනාකරයි. ලෝහිතකසිණයට මාංසයෙහි හෝ ලෙහෙයෙහි හෝ දිවෙහි හෝ අක්ෂීන්ගේ රක්තවර්ණ තැන හෝ රක්තවර්ණයගෙණ පිරියම්භාවනාකරයි. ඔදාතකසිණයට ඇටයෙහි හෝ දන්තයෙහි හෝ නිය පිට හෝ අක්ෂියෙහි සෙවත මණ්ඩලයෙහි හෝ ශ්වේතවර්ණය ගෙණ පිරියම්භාවනාකරයි. ඒ සතරාකාර පරිකර්මනිමිත්තම් පිරිසිදු නීලවර්ණය හෝ පිරිසිදු පීතවර්ණය හෝ පිරිසිදු රක්තවර්ණය හෝ පිරිසිදුවූ ශ්වේතවර්ණය හෝ නොවෙයි. අපිරිසිදු වර්ණයමවේ. මෙසේ පරිකර්මභාවනාවශයෙන් උපදවාගන්නාලද්දාවූ පරිකර්මනිමිත්ත ඇත්තාවූ යොගාවචර තෙමේ අධ්‍යාත්ම රූප සංඥ ඇත්තේනම්වේ. අර්පණාවශයෙන් නොවේ. ප්‍රතිභාග නිමිත්තාලම්බණවූ අර්පණා නොමෝ අධ්‍යාත්මයෙහිවූ අරමුණු ගොචරකොට නුපදනේමැයි. ඒ අධ්‍යාත්මයෙහි කෙසාදීන්ගේ නීලවර්ණාදිය නීලකසිණ පරිකර්මවශයෙන් භාවනාවඩා ලබන ලද්දාවූ කසිණනිමිත්තය අපිරිසිදුමවන්නේයි. බාහිරවූ නීලවර්ණ පුෂ්ප නීලවර්ණ කසි සළු නීලමාණික්‍යාදී කසිණනිමිත්ත භාවනා නොට උපදවාගන්නාලද නිමිත්තමෙන් පිරිසිදු නොවේමැයි. "එකෝඔභාසිඩා රූපානි පස්සති" යනු යමෙක්හට මේ පරිකර්ම නිමිත්ත අධ්‍යාත්මයෙහි උපන්නේවේද ඔහුට උපදනා ප්‍රතිභාග නිමිත්ත බාහිරවම උපදනේයි. ඒ යොගාවචර තෙමේ මෙසේ අධ්‍යාත්මයෙහි උපන් පරිකර්ම නිමිත්තගේ හා බාහිරව උපන් ප්‍රතිභාග නිමිත්ත අරහයා උපදවාගන්නාලද අර්පණාධ්‍යානයාගේවශයෙන් අධ්‍යාත්ම රූප සංඥඇත්තාවූ බහිඩාරූප සඤ්ඤාතවූ ප්‍රතිභාගනිමිත්ත සඤ්ඤාතවූ රූපයන් ධ්‍යාන නැමති චක්ෂුසින් දක්නාවූ එකෙකැයි කියනුලැබේ. හෙවත් අධ්‍යාත්ම රූපයෙහි පරිකර්මභාවනාවශයෙන් පහළවූ බාහිරවූ ප්‍රතිභාගනිමිති සඤ්ඤාත රූපය චතුර්ථධ්‍යාන නැමති ඇසින් බලන්නාවූ යොගාවචරයයිකියනුලැබේ. "පරිත්තානි" යනු යම් යම් පරිද්දෙකින් කුළු වට්ටි පමණවූ හෝ සරාව මාත්‍රවූ හෝ නොවඩනාලද පලමුකටගත් ප්‍රමාණවූ පිරිසිදු වර්ණඇත්තාවූ හෝ දුර්වර්ණවූ හෝ ආලෝ

ඔබණයෝයි. මේ අභිභායතනයවනාහි වණ්ණවශයෙන් මෙනෙහි කිරීම් ඇත්තේ නමුදු පරිත්තවශයෙන් හෙවත් සවලපවශයෙන්ම වදරණලද්දේයි. ඒ එසේමැයි. මේ ධ්‍යානාලම්බණයෙහි පරිත්තතාවය ඒ අරමුණ මැඩපැවැත්වීමට හෙතුවූයයි කියනු ලැබේ. වණ්ණවශයෙන් මෙනෙහිකිරීම ඇතිවූවත් නැතිවූවත් අභිභායතන භාවනාවනම් තික්ඛප්‍රාඥයාහටම නොහොත් බුබානුබුබ ශ්‍රාවකයන්ටම ලැබෙන්නේවෙයි. සෙස්සන්ට නොලැබෙන්නේය යන අර්ථය සූත්‍රානුසාරින ප්‍රඥාලයාය යන්නෙන් හැඟේ. "නානි අභිභුය්‍ය" යනු යම්සේ සම්පූර්ණ කුක්ෂියක් ඇත්තාවූ පුරුෂයෙක් තෙමේ සෑන්දක් පමණ බතක් ලැබ මෙහි වැළඳිය යුතු කුමක් ඇද්දැයි හකුළුවා එක් පිඬක්කොට ගිලිනේවේද, එපරිද්දෙන්ම සූත්‍රානුසාරින් උත්තරිතරවූ විශදප්‍රඥා ඇත්තාවූ බුබානුබුබාදී පුද්ගලතෙමේ මේ සවලපාලම්බණයෙහි සම්වැදිය යුතු කුමක් ඇත්තේදැයි මේමට බැරෑරුම්නොවෙයි සිතා ඒ කසිණ ප්‍රතිභාග නිමිත්තාලම්බණයෝ මැඩපවත්වා ධ්‍යානයට සමවදනේයි. හෙවත් ප්‍රතිභාග නිමිත්ත ඉපදීම හා සමගම මේ අරමුණෙහි අර්පණාවට පැමිණෙන්නේය යන අර්ථයි. මෙහි මැඩපැවැත්වීම හා සම්වැදීමය යනු උපචාරධ්‍යානාධිගමයට අනතුරුවම අර්පණාධ්‍යානයාගේ ඉපදීමයයි දතයුතුයි. එහෙයින් ප්‍රතිභාගනිමිත්තෝත්පාදය හා සමග මෙහි අර්පණාවට පැමිණෙන්නේ යයි කීහ. නිමිත්තෝත්පත්තිය හා සමග යන අටුවා වචනයෙන් අර්පණාවට මූලින් උපදනා පරිකම්දි චිත්තයන්ගේ අභාවය දක්වයි. යමෙක් ක්ෂිප්‍රාභිඥයයි කියනුලැබේද, ඔහුට වනාහි උපචාර අනුලෝම, ගොත්‍රභූ, යන උපචාර ධ්‍යානයෝ තුන්දෙනෙක්වෙති. ඔහුවත් වඩා සූත්‍රානුසාරිය පුද්ගලයාහටම අභිභායතන භාවනාව සමුඛීවියයුතුහෙයින් මේ ප්‍රතිභාගනිමිත්ත ඉපදීම හා සමගම උපචාරධ්‍යානයෝ නොසිපදම අර්පණාවට පමුණුවන්නේය යන අර්ථයි. මෙහි සමහර ආචාර්‍යවරයෝවනාහි උපචාරධ්‍යානය උපන්කල්හී ඒ ධ්‍යානය අරහයා ඝටත්පිරිසෙයින් දෙතුන්ජවන් නෙනෙක් උපදින්ද, ඒජවනයෝත් උපචාරධ්‍යාන පක්ෂයෙහිමවෙත්. ඊට අනතුරුව භවාඞ්ගපරිවාශයෙන් හෝ උපචාරසෙවනයෙන් හෝ නොරව අර්පණාධ්‍යානයාගේ ඉපදීම නිමිත්තෝත්පත්තිය හා සමග අර්පණාවට පැමිණීමයයි කියත්. ඒ ඔවුන්ගේ මතිමාත්‍රයකි. භවාඞ්ගපරිවාශයෙන් හෝ පරිකම්සෙවනයෙන් හෝ අර්පණාවරය නොකැමතිවිනලද්දෙය. මහද්ගත අප්‍රමාණධ්‍යානයෙහිමෙන් උපචාරධ්‍යානයෙහි එකාන්තයෙන් ප්‍රත්‍යවෙක්ෂාජවනයෝද නොදකැමතිවියයුත්තාහුය. එහෙයින්

උපචාරධ්‍යානයට පැමිණීමෙන් මතුභවාංග කිපයක්හුගේ කෙළවර අපිණාවට පැමිණෙන්නාහු නිමිත්තෝත්පත්තිය හා සමඟ අපිණාවට පැමිණවීමයයි කියනලද්දෙයි. "සඤ්ඤාමත්තුපපාදෙ නොච්" යන අට්ඨවා වචනය අභිප්‍රාය සහිත වචනයක්වෙයි. හෙවත් ඥෙයාර්ථ වචනයක්වෙයි. නීතාර්ථවචනයක් නොවේමැයි. එහි අභිප්‍රාය යටකියනලද ක්‍රමයෙන්දතයුතුයි. එකල්හි එබඳු ආහොගයක්නැති බැවින් සමවත් ඇතුළතනොවෙයි. සමවතින් නැංගාහුගේ ආහොගය පූර්වභාග භාවනාවශයෙන් ධ්‍යානඤ්ඤණයෙහි පැවති අභිභවනාකාරයගෙණ පැවැත්තේයයිදතයුතුයි. අභිධර්මී අට්ඨවාවෙහිවනාහි මෙයින් ඒධ්‍යානයාගේ පූර්වභාගය කියනලද්දේයයි දක්වනලදී. සමාපත්ති අබභ්‍යනතරයෙහි එබඳු ආහොගයක් නැතිකල්හී කුමක්හෙයින් ධ්‍යානසංඥාවෙන්ගය කියනලද්දේදැයි යන වොදාය සඳහා 'අභිභවනං-පෙ-අත්ථි" යනු අට්ඨවායෙහි කීහ. මෙසේ පරිත්තාලම්බණයන් හා ධ්‍යාන යෝත් මැඬපවත්වා ධ්‍යාන නැමත් තුවණින්දනිමිති ධ්‍යාන නැමති ඇසින් දක්නෙමියි යන සංඥා ඇත්තේවෙයි.

මේ පළමු වන අභිභායතනයයි.

දෙවෙනි අභිභායතනයෙහි "අපමාණානි" යනු උපන්නාවූ ප්‍රතිභාගනිමිත්ත වැඩීමෙන් අප්‍රමාණවූ මහත්වූ යනඅර්ථයි. එකඟුලවඟුලාදිවශයෙන් වැඩීමට නොපමුණුවනලද්දාවූ යන අර්ථයි. එබඳු වැඩීමෙක් මෙහි නොලැබෙනහෙයින් "මහත්තානි" යනු අට්ඨවායෙහි කියනලදී. "නාණ අභිභුය්‍ය" යන්නෙහි අර්ථ මෙසේයි:—යම්සේ බොහෝ කනු කැමත්තාවූ සම්පූර්ණ කුසිගයක් ඇත්තාවූ පුරුෂයෙක් තෙමේ එක් වේලකට කැපුතු ආහාර යෙන් කොටසක් බත් එස්නෙක බෙදා එළවූකල්හී අයත් අයත් බතකුත් ලැබුයේනම් හෙහෙයා, මේ සවලාපවූ බත මට කුමක් කරන්නේදැයි ඒබත් වස්න සවලාපවශයෙන් දක්නේද එපරිද්දෙන් උත්තරිතර ඤාණවත්ත පුද්ගල තෙමේ මෙහි සමවැදිය යුතු කුමක් ඇත්තේද, මේ ප්‍රතිභාග නිමිත්ත අප්‍රමාණනොවෙයි. මාගේ සිත එකඟකිරීම බැරුරුම් නොවන්නේගයි ඒ පරිකර්ම ප්‍රතිභාග නිමිති මැඬපවත්වා සමාපත්තියට සමවදනේය හෙවත් ප්‍රතිභාග නිමිත්ත ඉපදීම හා සමඟ අපිණාවට පැමිණෙන්නේය යන අර්ථයි. මෙසේ ධ්‍යාන නැමති තුවඟින් ප්‍රතිභාග නිමිත්තදන්නෙමියි ධ්‍යාන නැමති චක්ඛුයින් ප්‍රතිභාග නිමිත්ත සඞ්ඛ්‍යාත රූපාලම්බණය දක්නෙමියි යන මෙබඳු සංඥා ඇත්තේවේද, මේ දෙවෙන අභිභායතනයයි.

තුන්වෙනි අභිභායතනයෙහි "අජ්ඣත්තං අරූපසඤ්ඤී" යනු නොලැබුනු බැවින් හෝ නොකැමති බැවින් හෝ අධ්‍යාත්ම රූපයෙහි හෙවත් සවකීය ශරීරයෙහි කෙසාදියෙහි නීලවර්ණාදීය පරිකර්මනිමිත්තවශයෙන් නොඉත්හෙයින් අධ්‍යාත්මරූපයෙහි පරිකර්ම සංඥා විරහිතවූ යන අර්ථයි. එකොබහිඩා රූපානි පස්සති" යනු යම්මෙක්හට පරිකර්මනිමිත්ත හා ප්‍රතිභාගනිමිත්ත ත්බාහිරව උපන්නේවේද, ඒ යොගාවචර තෙමේ මෙසේ බාහිර පරිකර්මය හා බාහිරප්‍රතිභාග නිමිත්තෙහි උපදවනලද්දාවූ අප්පණාවශේදවශයෙන් අනාධ්‍යාත්ම රූපසංඥාඇත්තාවූ බාහිරවූ ප්‍රතිභාගරූපනිමිති සඞ්ඛ්‍යාත රූපයන් ධ්‍යානචක්ෂුසින් දක්නාවූ යොගාවචර එකෙනැයි කියනුලැබේ. ඒ යොගාවචර තෙමේ පරිත්තවූ නොහොත් සවලපවූ පිරිසිදුවණ්ණවත්වූ හෝ දුබ්බණ්ණවූ හෝ පරිකර්ම ප්‍රතිභාගරූපනිමිත්ත මැඩපවත්වා චතුර්ථධ්‍යානනැමති නුවණින් ප්‍රතිභාගරූපනිමිති සඞ්ඛ්‍යාත රූපයදැකීමියි කියාද චතුර්ථධ්‍යානනැමති ඇසින් ප්‍රතිභාගනිමිති සඞ්ඛ්‍යාත රූපයන් දකිමියි කියාද යන මෙබඳු සංඥා ඇත්තේවෙයි.

මේ තුන්වෙනි අභිභායතනයයි.

"අජ්ඣත්තං අරූපසඤ්ඤී" යනාදි සතරවන අභිභායතනයෙහි අර්ථකෙසේයත්? අනාධ්‍යාත්ම රූපසංඥාඇත්තාවූ සම්භර යොගාවචරයෙක් තෙමේ අප්‍රමාණවූ සවණ්ණවූ හෝ දුබ්බණ්ණවූ හෝ යම් කසිණපරිකර්ම නිමිත්තෙකෙනෙක් භාවනාකොට ප්‍රතිභාගනිමිති උපදවන්නාහුවෙත්ද, ඒකසිණ නිමිත්තිහු මැඩපවත්වා ප්‍රතිභාගනිමිත්තෙහා සමාපත්තිය හා සමග චතුර්ථධ්‍යානයට සම්මදනේවේද එ යොගාවචර තෙමේ චතුර්ථ ධ්‍යාන නැමති නුවණින් කසිණප්‍රතිභාග නිමිතිහු දන්නෙමියි කියාද, චතුර්ථධ්‍යාන නැමති ඇසින් කසිණ රූපයන් දක්නෙමියි කියාද යන මෙබඳු සංඥා ඇත්තේවෙයි.

මේ සතරවන අභිභායතනයයි.

මේ අභිභායතනයන් සතරදෙනා අතුරෙන් පළමුවන දෙවන අභිභායතන සඞ්ඛ්‍යාතවූ චතුර්ථධ්‍යානය තමාගේ ශරීරාභ්‍යන්තරයෙහිවූ නීල පීත ලෝහිත අවදාත වසතුහු පරිකර්මනිමිත්තවශයෙන් භාවනා කොට ඒ පරිකර්ම නිමිත්තභේවශයෙන් ආත්ම යෙහි විවිධාකාර උපදවාගන්නාලද්දාවූ ප්‍රතිභාගනිමිත්ත දරාසයා

උපදවාගන්නාලද්දාවූ චතුර්ථධ්‍යානය දක්වනලද්දේයි. තුන්වන සතරවන අභිභායතනවය අනුන්ගේ ශරීරයෙහි ඇතුලත්වූ නීල පීත ලෝහිතාවදාත වණ්වත්වූ වස්තූන් පරිකම්නිමිත්තවශයෙන්ගෙණ භාවනා වඩා උපදවාගන්නාලද්දාවූ ප්‍රතිභාග නිමිත්ත අරමුණුකොටගෙණ උපදවාගන්නාලද්දාවූ චතුර්ථධ්‍යානය දක්වනලදී. මේ සතරෙහි පරිකම්නිමිති සතරම දුර්වණ්වද ප්‍රතිභාග නිමිති සතර සවණ්වද ලැබෙන සැටි දතයුත්තේයි. තමාගේ ශරීරයෙහි උපදවනලද්දාවූ පරිකම් ප්‍රතිභාගනිමිත්ත පරිත්තවශයෙන් හා අප්‍රමාණවශයෙන්ද අනුන්ගේ ශරීරයෙහි උපදවනලද පරිකම් ප්‍රතිභාග නිමිත්ත පරිත්තවශයෙන් හා අප්‍රමාණවශයෙන්ද ලැබියයුතුහෙයින් සතර අභිභායතනයයි වදාරණලදී. මේඅභිභායතනයන් සතරදෙනා අතුරෙන් පරිත්තාලම්බණ අභිභායතනය චිතකී චෛතසිකයන්ගේවශයෙන්ද, අප්‍රමාණාලම්බණ අභිභායතනය මොහ චරිතයාගේවශයෙන්ද, යහපත් පිරිසිදුවණ්වත්වූ අභිභායතනය වෙෂ චරිතයාගේ වශයෙන්ද, දුර්වණ්වූ අභිභායතනාලම්බණය රාගචරිතයාගේවශයෙන්ද, වදාරණලද්දේයි. ඒ ඒ චරිතයන්ට සුදුසු පරිද්දෙන් සත්ප්‍රාය භෙදය විශුද්ධිමාර්ගයෙහි කසිණනිදේශය බලාදතයුතුයි. පස්වන අභායතනයෙහි විශෙෂ කවරෙක්ද? අනාඛ්‍යාතමරූප සංඥා ඇත්තාවූ නොහොත් ආත්මභාවයෙහි රූපයක් නොගෙණ බාහිරවූ රූපයන් පරිකම්වශයෙන් භාවනා වඩා බාහිරවූ ප්‍රතිභාග නිමිත්ත උපදවාගෙණ එහි චතුර්ථධ්‍යානය උපදවන්නාවූ ඇතැම් ධ්‍යානලාභියෙක් තෙමේ සවීනීලවූ නීලවණ්වූ අසමහින්න නීලවණ් ඇත්තාවූ නීල ප්‍රභාවෙන් යුක්තවූ බාහිරවූ නීල කසිණයන් ධ්‍යාන චක්ෂුසින් බලන්නේයි. යම්සේ සවීනීලවූ නීලවණ්වූ අසමහින්න නීලවණ්යෙන් යුක්තවූ නීලප්‍රභා ඇත්තාවූ දියබෙරලිය මල් හෝ යම්සේ කසිරට උපදනා දෙපිට මට සිලුවුවූ සවීනීලවූ නීලවණ් ඇත්තාවූ අසමහින්න නීලවණ්යෙන් යුක්තවූ නීලප්‍රභා ඇත්තාවූ වස්ත්‍රයක් හෝ නිර්දෝෂවූ ඉන්ද්‍රනීල මාණික්‍යරත්නයක් හෝවේද, එබඳුවූ බාහිරවූ රූපයන් පරිකම්වශයෙන් භාවනා වඩා බාහිරවූ ප්‍රතිභාග නිමිත්ත උපදවා ඒ අරමුණුකොට උපදවනලද්දාවූ චතුර්ථධ්‍යානඇත්තාවූ යොගාවචර තෙමේ ප්‍රතිභාග නිමිති හා ධ්‍යානයෝත් මැඩපවත්වා ධ්‍යානයට සමවදනේය. නොහොත් ප්‍රතිභාග නිමිත්තෙහා තපත්තිය හා සමග අපිණාවට පැමිණෙන්නේය. ඉක්බිති සමවතින් නැංගාවූ යොගාවචරයාහට ප්‍රත්‍යවෙක්ෂා ජවන් පවත්නා, හුය. අභිඤ්ඤාවන සංඥාව සමාපත්තියි ඇතුලෙහිද ආභොගසංඥාව

සමවතින් නැඟෙහවදවන්නේයි. මේ අභිභවන සංඥාවෙන් හා ආභොග සංඥාවෙන්ද ඒ යොගී තෙමේ මෙබඳු සංඥා ඇත්තේ යයි දතයුතුයි.

මේ පස්වෙනි අභිභායතනයයි.

සවෙනි අභිභායතනය කෙසේ යත්? අනාඛ්‍යාතමවූ ගෙවත් බාහිරවූ සපිපිතවූ පිතවණ්වූ අසමහින්න පිතවණී ඇත්තාවූ පිතවණී කාතනිඇත්තාවූ පිතකසිණාලම්බණයන් අරමුණුකොට ධ්‍යාන උපදවන්නාවූ ඇතැම් යොගාවචරයෙක් තෙමේ සපිපිතවූ පිතවණ්වූ අසමහින්න පිතවණීඇත්තාවූ පිතවණී කාතනිඇත්තාවූ කිණිහිරි මල් හෝ කසිරට උපදනා දෙපිටමට සිලුටුවූ සපිපිතවූ පිතවණීඇත්තාවූ අසමහින්න පිතවණීවූ පිතාව භාසවූ වසත්‍රයක් හෝ පුෂපරාග මාණිකය රතන යක් හෝ පරිකමීවශයෙන් භාවනා වඩා උපදවාගන්නාලද ප්‍රතිභාග නිමිත්ත අරමුණුකොටගෙණ ලබනලද චතුර්ධ්‍යාන ඇති යොගාවචර තෙමේ ඒ ප්‍රතිභාග නිමිති හා ධ්‍යානයෝත් මැඩපවත්වා ප්‍රතිභාගනිමිත්තෙහාත්පත්තිය හා සමග අපිණාවට පැමිණෙයි. සෙස්ස නීලකසිණයට කීනයින් යොදගතයුතුයි.

මේ සවෙනි අභිභායතනයයි.

සත්වන අභිභායතනයෙහි සවරූප කෙසේයත්? අනාඛ්‍යාත්මවූ ගෙවත් බාහිරවූ සලිලොහිතවූ ලොහිතවණීඇත්තාවූ අසමහින්න ලොහිතවණීගෙන් යුකතවූ ලොහිතාවභාසඇත්තාවූ ලොහිතකසිණාලම්බණයන් අරමුණුකොටගෙණ ධ්‍යානලබන්නාවූ යොගාවචර තෙමේ යම්සේ සලිලොහිතවූ ලොහිත වණී ලොහිත නිදශීන ලොහිත අවභාසඇත්තාවූ බඳුවද මලක් හෝ කසිරට උපදනා දෙපිට මට සිලුටුවූ ලොහිත වසත්‍රයක් හෝ ලොහිතඔක මාණිකාරතනයක් හෝ පරිකමීනීමිතවශයෙන් භාවනා වඩා එසින් උපදවනලද්දාවූ ප්‍රතිභාග නිමිත්ත අරමුණු කොටගෙණ රූපාවචර චතුර්ධ්‍යානය ලැබුවාවූ ඇතැම් ධ්‍යාන ලාභියෙක් තෙමේ ඒ ප්‍රතිභාග නිමිති හා ධ්‍යානයෝත් මැඩ පවත්වා ධ්‍යානයට සමවදනේයි. සෙස්ස නීලකසිණයට කී නුයින් දතයුතුයි.

මේ සත්වන අභිභායතනයයි.

අටවෙනි අභිභායතනයෙහි සඵරූප කෙසේයත්? අනා
ඛ්‍යාත්මවූ හෙවත් බාහිරවූ සුභශෙතවූ ශෙතවණ්ණවූ ශෙත
අසමභින්න ශෙත නිදර්ශන ඇත්තාවූ ශෙතාව භාෂඇත්තාවූ
ඔදාතඅසිණාලම්බණයන් අරමුණුකොට භාවනා වඩා ලබනලද
චතුර්ථධ්‍යානඇත්තාවූ ඇතැම් යොගාවචරයෙක් තෙමේයම් සුභ
සුභශෙතවූ ශෙතවණ්ණ ශෙතනිදර්ශන ශෙතාවභාසඇත්තාවූ
ඕදාතඩිතාරකාව හෝ කසිරට උපන් දෙපිට මට සිලුටුවූ වස්ත්‍ර
යක් හෝ එසේම සුභශෙතවූ ශෙතවණ්ණ ශෙතනිදර්ශන ශෙ
තාව භාෂඇත්තාවූ මුකතාඵලයක් හෝ වජ්‍රමාණික්‍යයක් හෝ
පරිකම්භාවනාවශයෙන් වඩා උපදවාගන්නාලද්දාවූ ප්‍රතිභාග
නිමිත්ත අරමුණුකොට ලබනලද චතුර්ථධ්‍යානඇත්තාවූ ඇතැම්
ධ්‍යානලාභියෙක් තෙමේ ඒ ඒ ප්‍රතිභාග නිමිති හා ධ්‍යානයෝත්
මැඩපවත්වා ධ්‍යානයට සමවදනේයි. නොහොත් ප්‍රතිභාග
නිමිත්තොත්පත්තිය හා සමග අප්‍රිණාවට පැමිණෙන්නේයි.
ඉක්බිති සමවතින් නැඟෙවූ යොගාවචරයාහට ප්‍රත්‍යවෙක්ෂා
ඥාන පවත්නාහුය. අභිභවන සංඥාව සඳිපත්ති ඇතුලෙහිද,
ආභොග සංඥාව සමවතින් නැඟෙනාතවන්නේයි. මේ අභි
භවන සංඥාවෙන් හා ආභොග සංඥාවෙන්ද ඒ යොගී තෙමේ
මෙබඳු සංඥා ඇත්තේයයි දතයුතුයි.

මේ අටවෙනි අභිභායතනයයි.

එම්බා ආනන්දය! මේ විමොක්ෂයෝ අටදෙනෙක්වෙති.
ඒ විමොක්ෂයෝ අටදෙනනම් කවරහුදයත්? රූපාරූපීයකින්
විමොක්ෂනම්වෙත්දයත්? අධිමුච්චනාර්ථයෙන් හෙවත් නිශ්චය
කරණාර්ථයෙන් විමොක්ෂනම්වෙති. අධිමුච්චනාර්ථය යනු කිමෙ
ක්දයත්? සතුරුනිවරණ ධම්මයන්ගෙන් මොනවට මිදෙන අර්ථ
යෙන් හා ධ්‍යානාලම්බණයෙහි විශෙෂයෙන් ඇලෙනාර්ථයෙන්ද
සුක්‍ෂ්මුච්චනාර්ථය දතයුත්තේයි. පියාගේ ඇතයෙහි දිගහරණ
ලද ඇත්පා ඇත්තාවූ ලදරුවාගේ සගනයකිරීමක්මෙන් අනිශ්ශ
භිතභාවයෙන් හා නිරාසඞ්කාවශයන් පැවැත්මයයි කියනලද්
දේවෙයි. මේ අර්ථය වනාහි පශ්චිමවූ අටවෙනි විමොක්ෂයෙහි
නොලැබෙන්නේයි. අවශෙෂවූ සප්තවිමොක්ෂයෙහිම ලැබෙන්
නේයයි දතයුතුයි. "රූපී රූපානි පශ්‍යතීති" යනු අධ්‍යාත්ම

යෙහිවූ හිසකේ ආදී නීලකසිණාදියෙහි හෙවත් යට පළමුවෙනි අභිභායතනයෙහි කීපරිදිදෙන් හිසකේ ආදිවූ නීලකසිණයෙහිද, මේද තෙල් ආදිවූ පීතකසිණයෙහිද, ලේ ආදිවූ ලොහිත කසිණයෙහිද ශෝතවණ්ණ චක්ඛු මණ්ඩලාදිවූ අවදාත කසිණයෙහි දැසි යන සත සතරවණ් කසිණයෙහි පිරියම් භාවනාකොට උපදවාගන්නාලද්දවූ බාහිරවූ ප්‍රතිභාගනිමිත්තයෙහි ලබන ලද්දවූ සතර රූපඣානලාභීවූ යොගාවචර තෙමේ ඣාන නාමති ඇසින් කසිණප්‍රතිභාග නිමිති සඞ්ඛ්‍යාත රූපයන්දක්නේ වේද මේ පළමුවන විමොක්ෂයයි දතයුතුයි. "රූපී රූපානි පස්සති" යනමෙහි උත්තරපද ලොපයෙන් රූපඣාන ශබ්දයාගේ ඣානයන්න ලොප්කොට අස්සජීවිතඞ්ගයෙහි ඊ ප්‍රත්‍යයකොට රූපී ශබ්දය නිපන්නේයයි දතයුතුයි. එහි අර්ථය රූපඣාන ලාභීවූ යොගාවචරය යනුයි. "රූපානි" යන්නෙහි කසිණ රූප ශබ්දයාගේ කසිණ යන පූර්වපදය ලොප්කොට රූපානි යනු නිපන්නේයයි දතයුතුයි. එහෙයින් ඔම් වාක්‍යයාගේ අර්ථය රූපඣානලාභීවූ යොගාවචර තෙමේ කසිණප්‍රතිභාග නිමිති සඞ්ඛ්‍යාත රූපයන් ඣාන නාමති ඇසින් දක්නේය යනුයි. "රූපූප පතිතියා ඔගහංභාවඞ්ගේ" යන තන්හි ඣාන ශබ්දය ලොප්නළාක්මෙන් අන්තයෙහිවූ ඣාන ශබ්දයකොට අස්සාස්ජීවියෙහි ඊ ප්‍රත්‍යයවශයෙන් රූපී ශබ්දයද, "දෙවදත්තෝ" යන උදාහරණයෙහි දෙව ශබ්දය ලොප්කොට දත්ත ශබ්දය නිපන්නාක්මෙන් කසිණ රූපානි යන්නෙහි මූලකසිණ ශබ්දය ලොප්කොට "රූපානි" යන්නද නිපන්නේයයි දතයුතුයි.

මේ පළමුවන විමොක්ෂයයි.

"අජ්ඣත්තං අරූපසඤ්ඤී බහිද්ධානි රූපානි පස්සති" යන මෙහි අනාඛ්‍යාත්මවූ හෙවත් තුන්වෙනි අභිභායතනයෙහි කී බැවින් තමාගේ ආත්මයෙන් පිටත අනුන්ගේ ආත්මය පිළිබඳවූ නිසකේ මේද තෙල් ලොහිත අක්ඛිමණ්ඩල සඞ්ඛ්‍යාතවූ සතරවණ් කසිණයන් පිරියම් භාවනාකොට උපදවාගන්නාලද්දවූ බාහිරප්‍රතිභාග නිමිත්තෙහි රූපාවචර චතුර්ථඣානලාභීවූ යොගාවචර තෙමේ බාහිරවූ ප්‍රතිභාග නිමිති සඞ්ඛ්‍යාත රූපයන් චතුර්ථඣාන නාමති ඇසින් දක්නේවේද, මේ දෙවෙනි විමොක්ෂයයි දතයුතුයි.

"සුඛෙනේව අභිඤ්ඤා හොති" යනු තුන්වෙනි විමොක්ෂයයි. එහි අර්ථ කවරයත්? යට පස්වෙනි අභිභායතනයෙහි පටන් අටවෙනි අභිභායතනය දක්වා කියනලද්දාවූ අතිශයින් පවිත්‍ර නීලවර්ණවූ දියබෙරලියමල් නිල් හාසි සළු නිල්මැණික් ආදීවූ නීලකසිණයෙහිද, කිණිහිරියමල් රන්වන්කසි සළු පුෂ්පරාග මාණික්‍යාදීවූ පීතකසිණයෙහිද බඳුවදමල් රක්තවර්ණකසි සළු ලොහිතඛක මාණික්‍යාදීවූ ලොහිත කසිණයෙහිද, ඔෂධිතාරකා සුදුවන් කසිසළු මුක්තාඵල වජ්‍රමාණික්‍යාදීවූ අවදාත කසිණයෙහිද යන සතරවර්ණ කසිණයෙහි පිරියම් භාවිනාකොට උපදවාගන්නාලද්දාවූ ප්‍රතිභාග නිමිති සඞ්ඛ්‍යාතවූ අතිශයින් පවිත්‍ර නීලවර්ණ ප්‍රතිභාගනිමිත්තද, එසේම අතිශයින් පවිත්‍රවූ පීතකසිණ ලොහිත කසිණ අවදාත කසිණ සඞ්ඛ්‍යාතවූ ප්‍රතිභාග නිමිතිහුද සුභයයි ව්‍යවහාරකෙරෙත්. ඒසතරාකාර සුභනිමිත් තෙහි අධිමුත්ති සඞ්ඛ්‍යාතවූ රූපාවචර චතුර්ථධ්‍යානලාභීවූ යොගාවචර තෙමේ සුභයයිකියාම අධිමුත්තිය ලැබූ යොගාවචරයයි කියනුලැබේ. ඒ යොගාවචරයා විසින් උපදවාගන්නාලද්දාවූ රූපාවචර චතුර්ථධ්‍යානය තුන්වෙනි විමොක්ෂනම්වන්නේයි. ප්‍රතිසම්භිදා මාර්ගයෙහි මෙත්තා කරුණා මුදිතා උපෙක්ඛා යන සතර බ්‍රහ්මවිහාර භාවනාවෙන් අප්‍රමාණ සත්ත්වයන් විෂයෙහි බ්‍රහ්මවිහාරය පතුරුවා වාසයකෙරේද ඒ යොගාවචරයාහට සියලු සතුන් අප්‍රතිකූලව වැටහෙන බැවින් ඒසතර බ්‍රහ්මවිහාරයෙන් උපදවාගන්නාලද්දාවූ ප්‍රතිභාගනිමිතිහුද සුභයයි ව්‍යවහාරකෙරෙත්. ඒ සුභඃඛ්‍යාතවූ අරමුණෙහි රූපාවචර චතුර්ථධ්‍යානයෙන් සතුරුවූ නීවරණ ධර්මයන්ගෙන් මිදීම වේද ප්‍රතිසම්භිදානයින් මේ තුන්වන විමොක්ෂයයි කියත්.

සූත්‍රාන්තයෙහි නීලාදී වර්ණකසිණයන්ගෙන් උපදවාගන්නාලද්දාවූ ප්‍රතිභාගනිමිතිහු සුභයයිකියාද, පටිසම්භිදාමාර්ගයින් මෛත්‍රී ආදී සතරබ්‍රහ්මවිහාරයෙන් උපදවාගන්නාලද්දාවූ ප්‍රතිභාගනිමිතිහු ශුභයයි කියාද, ඒ ඒ දෙශනා නයින් ධර්මස්වාමිවූ තථාගතයන්වහන්සේ විසින් විනය ඡනයන්ගේ අදහස් පරිද්දෙන්ද දෙශනා විලාසවශයෙන්ද, වදළ බැවින් අර්ථ විරෝධයක් නැතැයි දතයුතුයි. මේ ප්‍රකාරවූ ශුභසඞ්ඛ්‍යාතවූ අරමුණෙහි උපදවාගන්නාලද්දාවූ රූපාවචර චතුර්ථධ්‍යානයෝ ශුභ විමොක්ෂයයි ව්‍යවහාරකෙරෙත්. මේ ශුභ විමොක්ෂ සඞ්ඛ්‍යාතවූ රූපාවචර චතුර්ථධ්‍යානයෙන් ලබනලද්දාවූ බ්‍රහ්මලෝකත්‍රයෙහි පරිත්ත සුභ අප්පමාණසුභ සුභකිණ්හයයි ව්‍යවහාරකෙරෙත්, "සුභය" යනු එකඝනවූ නිශ්චලවූ ප්‍රභාමත්වූ ආලෝ

කයට නමකි. ඒබ්‍රහ්මලෝකත්‍රයෙහි උපන්නාවූ බ්‍රහ්මයන්ගේ ශරීර ප්‍රභා වද මිදුමක් ගලාඔවින්නාන්මෙන් සකලව එකඝනව පවත් නාහෙයින් පරිත්ත සුභ අපමාණ සුභ සුභ කිණ්ණය යන නම් ලබන්නාහුවෙත්.

මේ තුන්වන ධ්‍යාන විමොක්ෂයයි.

සමීප්‍රකාරයෙන් රූපසඤ්ඤා සඞ්ඛ්‍යාත රූපධ්‍යානයන් ඉක්මවීමෙන් හා ප්‍රතිඝසංඥාවන්ගේ විනාශයෙන්ද හෙවත් දෙමිනස් සඟත දෙසින විෂකම්මන ප්‍රභාණවශයෙන් නැසීමෙන්ද නානත්වසංඥාවන්ගේ මෙනෙහිනොකිරීමෙන්ද රූපාවචර පඤ්චධ්‍යානලාභී බොහොගාවචර තෙමේ ඒ ධ්‍යානයට අරමුණුවූ ප්‍රතිභාග නිමිත්ත ආකාශයෙහි කැමති ප්‍රදේශයක පතුරුවා ඒ කසිණ ප්‍රතිභාග නිමිත්ත මෙනෙහි නොකිරීමෙන් කිසුණු ඵල ඒවා ලබනලද්දාවූ කසිණුග්ඝාටිමාකාසය අරමුණුකොටගෙණ "අනන්තං ආකාසෝ" යනුවෙන් පිරියම් භාවනාකොට උපෙක්ඛා එකාග්‍රතා සඞ්ඛ්‍යාතවූ ධ්‍යානාඞ්ගවයකින් යුක්තවූ ආකාසානඤ්චායතන ධ්‍යානය උපදවා වාසයකෙරේද මේ සතරවන විමොක්ෂයයි දතයුතු.

සමීප්‍රකාරයෙන් ඒ ආකාසානඤ්චායතන ධ්‍යානය ඉක්මවා අහස්හි පැවති විඤ්ඤාණය හෙවත් ආකාසානඤ්චායතන ධ්‍යාන චිත්තය "අනන්තං විඤ්ඤාණං" යනුවෙන් පිරියම් භාවනා කොට උපෙක්ඛා එකාග්‍රතා යන අඞ්ගවයකින් යුක්තවූ විඤ්ඤාණඤ්චායතන ධ්‍යානය උපදවා වාසයකෙරේද මේ පස්වන විමොක්ෂයයි දතයුතු.

සමීප්‍රකාරයෙන් ඒ විඤ්ඤාණඤ්චායතන ධ්‍යානය ඉක්මවා හෙවත් ආකාසානඤ්චායතන ධ්‍යානයාගේ නාස්තිභාව ප්‍රඥප්තිය අරමුණුකොටගෙණ "නත්ථිකිඤ්චි කඤ්ඤීති" යනුවෙන් පිරියම් භාවනාකොට උපෙක්ඛා එකාග්‍රතා යන අඞ්ගවයකින් යුක්තවූ ආකිඤ්චඤ්ඤායතන ධ්‍යානය උපදවා වාසයකෙරේද, මේ සවෙනි විමොක්ෂයයි දතයුතුයි.

ඉක්බිති සමීප්‍රකාරයෙන් ආකිඤ්චඤ්ඤායතන ධ්‍යානය ඉක්මවා ඒ ධ්‍යාන චිත්තය අරමුණුකොට ගණ "නෙවසඤ්ඤානාසඤ්ඤං යතනමෙතං" යනුවෙන් පිරියම් භාවනාකොට උපෙක්ඛා එකාග්‍රතා යන ධ්‍යානාඞ්ගවයකින් යුක්තවූ නෙවසඤ්ඤානාසඤ්ඤායතන ධ්‍යානය උපදවා වාසයකෙරේද, මේ සත්වෙනි විමොක්ෂයයි දතයුතුයි.

ඉක්බිති සම්ප්‍රකාරයෙන් නෙවසඤ්ඤානාසඤ්ඤා යතනය ඉක්මවා හෙවත් අනාගාමි අර්හත් ආර්‍යයෝ තුමූ ප්‍රථමධ්‍යානාදී අෂ්ටසමාපත්තීන්ට ක්‍රමයෙන් සමවැද වැදගොස් නෙවසඤ්ඤා නාසඤ්ඤායතන ධ්‍යානයට දෙවරක් සමවැද සම්ප්‍රකාරයෙන් ඒ නෙවසඤ්ඤානාසඤ්ඤා යතන ධ්‍යානය ඉක්මවා සියලු නාමසකාය යන් නිරුඬකිරීමෙන් සඤ්ඤාවේදයිත නිරෝධයයි කියනලද්දාවූ නිරෝධ සමාපත්තියට සමවැද වාසයකෙරේද, මේ අටවෙනි විමොක්ෂයයි දතයුතුයි.

මේ විමොක්ෂයන් අටදෙනා අතුරෙන් ආකාශානඤ්චායතන ධ්‍යානය සියලු රූපධ්‍යානයන්ගෙන් මිදුනුහෙයින්ද, විඤ්ඤාණඤ්චායතන ධ්‍යානය ආකාශානඤ්චායතන ධ්‍යානයෙන් මිදුනුහෙයින්ද, ආකිඤ්ඤඤ්ඤායතන ධ්‍යානය විඤ්ඤාණඤ්චායතන ධ්‍යානයෙන් මිදුනුහෙයින්ද, නෙවසඤ්ඤා නාසඤ්ඤායතන ධ්‍යානය ආකිඤ්ඤඤ්ඤායතන ධ්‍යානයෙන් මිදුනුහෙයින්ද, සඤ්ඤාවේදයිත නිරෝධ සමාපත්තිය නෙවසඤ්ඤා නාසඤ්ඤායතන ධ්‍යානයෙන් හා සියලු නාමසකාය යන්ගෙන්ද විශෙෂයෙන් මිදුනු බැවින් විමොක්ෂයයි ව්‍යවහාරකෙරෙත්. මේ විමොක්ෂයන් අටදෙනා අතුරෙන් අටවෙනි විමොක්ෂය හැර අවශෙෂ සප්තවිමොක්ෂයෙහිම අරමුණු නැමති ලදරු තෙමේ ධ්‍යාන චිත්ත නැමති පියාගේ ඇකයෙහි කැමති පරිද්දෙන් අතපය දිගහැර නිරාසඞ්කභාවයෙන් සයනයකරයි. අටවෙනි විමොක්ෂයෙහි එබදු අරමුණක්නැති බැවින් ඒ අර්ථය නොලැබෙන්නේමැයි. සූත්‍රානතදෙශනාව පර්‍යායය කථාවයි. හෙවත් අප්‍රධාන කථාවෙයි. අභිධම්මදෙශනාව නිප්පර්‍යායය හෙවත් ප්‍රධාන කථාවවෙයි. එහෙයින් වණ්ණ භොගය නැත්තාවූ අභිභායතනයෝ වෙනම කියනලද්දාහුය. එසේම වණ්ණභොග සහිතවූ අභිභායතනයෝදවෙනම කියනලද්දාහුය. ඒ එසේමැයි. ඒ දෙයාකාර අභිභායතනයෙහිම අභිභවනාර්‍ථයක් ඇත්තේයි. එසේම මේ සූත්‍රයෙහිහෙවත් මේ මහාපරිනිබ්බාණ සූත්‍රයෙහි පර්‍යායය දෙශනා බැවින් විමොක්ෂයන්ගේද අභිභවනාර්‍ථයක් ඇත්තේනුයි "අජ්ඣත්තං රූප සඤ්ඤී" යනාදී ක්‍රමයෙන් පළමුවන දෙවන අභිභායතනයෙහි පළමුවන විමොක්ෂයද, තුන්වන සතරවන අභිභායතනයෙහි දෙවෙනි විමොක්ෂයද, වණ්ණඅභිභායතන සතරෙහි තුන්වන විමොක්ෂයද, අභිභවනාර්‍ථය ලැබෙනහෙයින් සංග්‍රහකරණ ලද්දේයි. අභිධම්ම ප්‍රධාන දෙශනාව බැවින් විමොක්ෂ අභිභායතනයන් අමිශ්‍රවශයෙන් දක්වනු පිණිස විමොක්ෂයන් හැර

අභිභායතනයෝ වදුරණුලද්දාහුය. සියලු විමොක්ෂ කෘත්‍යය ඇත්තාවූ ධ්‍යානයෝ විමොක්ෂදේශනාවෙහි වදුරණ ලද්දාහුයයි දතයුතුයි.

පදභාජනීය.

සොතාපත්ති මග්ගචිත්තය, සොවාන් මාගීය හා සම්ප්‍රයුක්තවූ චිත්තයෙක්ද; නොහොත් නිර්වාණ සංඛ්‍යාතවූ මහාසමුද්‍රයකරා වහනයවන්නාවූ ආර්‍යාෂ්ටාඞ්ගික මාර්ග සංඛ්‍යාතවූ ශ්‍රෝතයට පළමුවම පැමිණීමෙන් ලැබියයුතුවූ සෝතාපත්ති සම්ප්‍රයුක්තවූ චිත්තයෙක්ද, නොහොත් නිර්වාණ සංඛ්‍යාතවූ මහාසමුද්‍රය කරා බැසයන්නාවූ ආර්‍යාෂ්ටාඞ්ගික මාර්ගයාමති ශ්‍රෝතයට පළමුවෙනි පැමිණීමෙන් යුක්තවූ පුද්ගලයාගේ මාර්ගසම්ප්‍රයුක්තවූ චිත්තයෙක්ද, සකදාගාමි මග්ගචිත්තය, ශකෘදාගාමි මාර්ගය හා සම්ප්‍රයුක්තවූ චිත්තයෙක්ද; නොහොත් ප්‍රතිසන්ධිවශයෙන් මේ මනුෂ්‍ය ලෝකයට එක්වරක්ම එන්නාවූ පුද්ගලයාගේ මාර්ගසම්ප්‍රයුක්තවූ චිත්තයෙක්ද; අනාගාමි මග්ගචිත්තය, අනාගාමිමාර්ගය හා සම්ප්‍රයුක්තවූ චිත්තයෙක්ද; නොහොත් ප්‍රතිසන්ධිවශයෙන් මේ කාමධාතුවට නොඑන්නාවූ පුද්ගලයාගේ මාර්ගය හා සම්ප්‍රයුක්තවූ චිත්තයෙක්ද; අරහත්ත මග්ගචිත්තය, අර්හත් මාර්ගය හා සම්ප්‍රයුක්තවූ චිත්තයෙක්ද; නොහොත් පූජා විශේෂය ඉව සීමට සුදුසුවූ රහත් පුද්ගලයාගේ සභාවයයි කියනලද්දාවූ අර්හත්ඵලයට හෙතුභූතවූ මාර්ගය හා සම්ප්‍රයුක්තවූ චිත්තයෙක්ද; ඉති ඉමිනාපභෙදෙන, මේ කියනලද ප්‍රභෙදයෙන්; චත්තාරිපි ඉමානිචිත්තානි, සතර ආකාරවූද මේචිත්තයෝ තුමූ; ලෝකුත්තර කුශලචිත්තානි නාමහොත්තනි, ලෝකොත්තර කුශල චිත්තයෝනම් ඇත්තාහුවෙත්; සොතාපත්ති ඵලචිත්තය, සෝවාන් ඵලචිත්තයෙක්ද; නොහොත් නිර්වාණ සංඛ්‍යාතවූ මහාසමුද්‍රය කරා බැසයන්නාවූ ආර්‍යාෂ්ටාඞ්ගික මාර්ගයාමති ශ්‍රෝතයට පළමුකොට පැමිණීම්වශයෙන් ලබනලද්දාවූ විපාක චිත්තයෙක්ද නොහොත් අභිවෘද්ධි සඞ්ඛ්‍යාතවූ සම්මාදිට්ඨි ආදිවූ මාර්ගාඞ්ගයන් හා එක්වයෙදුනාවූ චිත්තයෙක්ද නොහොත් නිර්වාණ සංඛ්‍යාතවූ මහාසමුද්‍රය කරා බැසයන්නාවූ ආර්‍යමාර්ග ශ්‍රෝතයට පළමුවෙනි පැමිණීම ඇත්තාවූ පුද්ගලයාගේ විපාක භූත චිත්තයෙක්ද; සකදාගාමි ඵලචිත්තය, ශකෘදාගාමි ඵලචිත්තයෙක්ද නොහොත් ප්‍රතිසන්ධිවශයෙන් මේ මනුෂ්‍ය ලෝකයට එක්වරක්ම පැමිණිය යුතුවූ ආර්‍ය්‍ය පුද්ගලයාගේ විපාක භූතවූ චිත්තයෙක්ද; අනාගාමි ඵලචිත්තය, අනාගාමි ඵලචිත්තයෙක්ද; නොහොත් ප්‍රතිසන්ධිවශයෙන් මේ කාමධාතුවට නොඑන්නාවූ ආර්‍ය්‍ය පුද්ගලයාගේ විපාකභූතවූ චිත්තයෙක්ද; අරහත්තඵල චිත්තය, අර්හත් ඵල

චිත්තයෙක්ද; නොහොත් පූජාවිශෙෂය ඉවසිමට සුදුසුවූ රහතුන්ගේ සවභාවයි කියනලද විපාක භූතවූ චිත්තයෙක්ද; ඉති ඉම්නාපහෙදෙන, මෙ කියනලද ප්‍රභෙදයෙන්; චත්තාරිපි ඉමානි චිත්තානි, සතරවැදෑරුම්වූද මේ චිත්තයෝ තුමූ; ලොකුත්තර විපාක චිත්තානීනාම හොනති, ලොකුත්තර විපාක චිත්තයෝය යනනම් ඇත්තාහුවෙත්. ඉති එවං යථාවුත්තනයෙන, මේ කියනලද ක්‍රමයෙන්; සබ්බථාපි, කුසල විපාක සංඛ්‍යාතවූ සවී ප්‍රකාරයෙන්ද; අධ්‍යලොකුත්තර කුසල විපාක චිත්තානි, ලොකුත්තර කුශල චිත්තයෝ සතරදෙනය, ලොකොත්තර විපාක චිත්තයෝ සතරදෙනදැයි යන මේ ලොකොත්තර චිත්තයෝ අටදෙන; සමත්තානි, සම්පූර්ණීකරනලද්දාහුය; නොහොත් සංග්‍රහකොට අර්‍ථිගන්නාලද්දාහුය.

ගා ථා වෝ.

කුසලං, ලොකොත්තර කුශල චිත්තය; චතුම්ඝාපප හෙදෙන, සතරාකාර ප්‍රභෙද ඇත්තාවූ සොතාපත්ති මාඝීදී ආර්‍ය්‍ය අංගාඝික මාර්ගයෙන් යුක්තවූ ප්‍රභෙදවශයෙන්; චතුධා, චතුබ්බිධංහොති, සතරාකාරවන්නේයි; තථා, එපරිද්දෙන්; පාකං, ලොකොත්තර විපාක චිත්තය තෙමේ; තස්ස එව, ඒ ලොකොත්තර කුසල චිත්තයාගේම; ඵලත්තා, විපාකවූහෙයින් චතුධා, චතුබ්බිධංහොති, සතර ආකාරවන්නේයි; ඉති, මෙසේ; අනුත්තරං, ලොකොත්තර චිත්තය; අට්ඨවිධං ඉති, අටවැදෑරුම්යයි; මතං, දන්නාලදි; එවං. යථාවුත්තනයෙන, කියනලද යම් යම් පරිද්දකින්; අකුසලානි, අකුශලචිත්තයෝ තුමූ; වාදස එව සියුං, දෙළොස් දෙනෙක්මවෙත්; කුසලානි, කුසල චිත්තයෝ තුමූ; එකවීසති සියුං, එක්විස්සෙක්වෙති; පාකානි, විපාක චිත්තයෝ තුමූ; ඡත්තිංසසියුං, සත්තිසෙක්වෙති; ක්‍රියා චිත්තානි, ක්‍රියාචිත්තයෝ තුමූ; වීසතිඑව සියුං, විස්සෙක්මවෙති; කාමෙ, එකොළොස් කාමභූමියෙහි; අවචරානි, බොහෝසෙයින් හැසිරෙන්නාවූ; චිත්තානි, චිත්තයෝ; චතුපඤ්ඤාසධා, සුපණස් ප්‍රකාරවෙත්යයි: පරමත්තවිදූ; පරමාර්‍ථඥවූ භාග්‍යවත්තෙමේ: ඒරයෙ, දෙශනාකරයි. රූපෙ, අසංඥසත්ත්වවර්ජිතවූ පසළොස් රූපභූමියෙහි; අවචරානි, යෙහුයාවශයෙන් හැසිරෙන්නාවූ; චිත්තානි, චිත්තයන්; පරමත්ථවිදූපණ්ණරස ඒරසෙ, යනුසම්බන්ධ කරනු. අරූපෙ, සතර අරූප භූමියෙහි; අවචරානි, යෙහුයාවශයෙන් හැසිරෙන්නාවූ; චිත්තානි, චිත්තයන්; පරමත්ථවිදූ

මාදස ඊරයෙ, යනු සම්බන්ධකරනු. තථාපන, මුඛ්‍යවාරයෙන් අන්‍යවූ; උපචාරවාරය කියම්; අනුත්තරෙ, නවලෝකොත්තර ධම්මසමූහයෙහිවූ; චිත්තානි චිත්තයන්; පරමත්ථවිදූ අඛඩා ඊරයෙ යනු සම්බන්ධකරනු. නොහොත් කාමෙ කාමාවචරානි, එසොළොස් කාමභූමියෙහි යෙහුය්‍යවිශයෙන් හැසිරෙන්නාවූ; චිත්තානි, චතුපඤ්ඤාසඛෙපරමත්ථවිදූ ඊරයෙ" යනු සම්බන්ධකරණු. රූපෙ, රූපාවචරානි, අසංඥසත්තවර්ජිතවූ පසළොස් රූපභූමියෙහි යෙහුය්‍යවශයෙන් හැසිරෙන්නාවූ; චිත්තානි, "පරමත්ථවිදූ පණ්ණරස ඊරයෙ" යනු සම්බන්ධකරනු. අරූපෙ, අරූපාවචරානි, අරූපභූමිත්‍රයහි බොහෝසෙසයින් හැසිරෙන්නාවූ; චිත්තානි පරමත්ථවිදූ මාදස ඊරයෙ, යනු සම්බන්ධකරනු. අනුත්තරෙ අනුත්තරානි, නවවිධ ලොකොත්තර ධම්මසමූදයෙහි ලොකොත්තරවූ; චිත්තානි තථා, චිත්තානිපන, චිත්තයන් වනාහි; අඛඩා පරමත්ථවිදූ ඊරයෙ, යනු සම්බන්ධකරනු. පන, එකදෙශඅහැර සමුදයාර්ථය කියම්. මානසං, චිත්තය, ඉච්ච යථාවුත්තභෙදෙන, කියනලද්දාවූ ජාතිභෙද භූමිභෙදවශයෙන්; එකූනනවුතිප්පභෙදං කථා; එකුන් අනූවක් ප්‍රභෙද කොට; විවකඛණා ආභිධම්මික පණ්ඩිතයෝ තුමූ; විභජන්ති විභාගකෙරත්. අථවා, නොහොත් එකවීස සතංකත්වා, එක්සිය එක්විස්සක්කොට; විවකඛණා, විනෙඥාවිචක්ඛණයෙහි දක්ෂ පණ්ඩිතයෝ තුමූ විභජන්ති, විභාගකෙරෙත්. එකූනනවුතිවිධං, එකුන්අනූවක් ප්‍රභෙදවූ; චිත්තං, චිත්තයතෙමේ; එවම්සසතං හොති, එකසිය විසිඑකක්වන්නේ; කථං? කෙසේද යත්?

ලොකොත්තර චිත්තයෙහි විශෙෂ විභාග කෙසේ යත්?

ලොකොත්තර චිත්තයන් අවදෙනා අතුරෙන් සොතාපත්ති මාගීතොමෝ නිබ්බාණනැමති මහාසමුද්‍රය කරා අතරතුර නොනැවතී බස්නාහෙයින් සොතාපත්ති මාගීනම්වෙයි. නිබ්බාණයවනාහි මහාසමුද්‍රයාගේ එතරට බඳුවෙයි. සංසාරයවනාහි මහාසමුද්‍රයට බඳුවෙයි. සම්මාදිට්ඨි ආදී ආර්‍ය්‍ය අෂ්ටාංගිකමාගීය ඒ මුහුදු තරණයකරන්නාවූ නැවකට බඳු උපමා ඇතිවෙයි. විද්‍යාගුණාවඩන්නාවූ යොගාවචර පුද්ගලතෙමේ වනාහි ඒ නැවට නැගී යාත්‍රාකරන්නාවූ පුරුෂයෙකුට බඳුවෙයි. ශ්‍රොතාපත්ති මාගීය විසින් දිට්ඨගත සම්ප්‍රයුක්ත සිත්සතරය, විචිකිච්ඡා සඟගත චිත්තය යනමේ අකුශල පවකය ඉතුරු නොකොට නසනු ලැබෙයි. එහෙයින් අපාය ගමනීය ශක්තිඇත්තාවූ දිට්ඨගත විප්‍රයුක්ත සිත්සතරය, මෙම මූලික දෙසිතය යන අකුශල ත්‍රිවිධය

ඒ ශ්‍රෝතාපත්ති මාර්ගය විසින්ම තුනීකිරීමට වශයෙන් ප්‍රහාණය කරනු ලැබෙයි. සකෘදාගාමී මාර්ගය විසින් ඔළුදුරිස්සා කාමධාතුවෙහි උපදවා නවුන විපාක දියයුතුවූ දිට්ඨධම්ම විපච්චනීය කුසලතරය වෙන මුලින් දෙසිය යන අකුශල ශ්‍රේණිය තුනීකිරීමට වශයෙන් ප්‍රහාණයකරනු ලැබෙයි. සකෘදාගාමී මාර්ගය විසින් යම්කිසි අකුශල ධර්මයක් නිරවශේෂයෙන් ප්‍රහාණයකරනු නොලැබෙයි. අනාගාමී මාර්ගය විසින් ප්‍රවෘත්ති කාලයෙහි කියුම් විපාක දියහැකිවූ වෙන මුලික දෙසින නිරවශේෂයෙන් ප්‍රහාණයකරනු ලැබෙයි. දිට්ඨධම්ම විපච්චනීය සිත් සතර ඒ අනාගාමී මාර්ගය විසින්ම තුනීකිරීමට වශයෙන් ප්‍රහාණයකරනු ලැබෙයි. අර්හත්මාර්ග චිත්තය විසින් රූපාරූප භූමියෙහි විපාක දියයුතුවූ දිට්ඨධම්ම විපච්චනීය සිත් සතරය, උඩවව සඤ්ඤාවිඤ්ඤාණය යන මේ පවක්ය නිරවශේෂයෙන් ප්‍රහාණයකරනු ලැබේයි. මේ මාර්ගයෙන් ප්‍රහාණය කරන්නාවූ අකුශලයන් අතුරෙන් එකම මාර්ගයක්හු විසින් අකුශල ධර්මයෝ සදෙනෙක් ප්‍රහාණයකරනු ලැබෙත්. ඒ සදෙන නම්:-දිට්ඨධම්ම සම්ප්‍රයුක්ත අකුශල්සතරය, විචිකිච්ඡාසම්ප්‍රයුක්ත අකුශලය, උද්ධච්චසම්පයුත්ත අකුශලය යන සදෙනයි. මාර්ගයන් තුන්දෙනෙකු විසින් ප්‍රහාණයකටයුතුවූ අකුශලයෝ දෙදෙනෙක්වෙති. ඒ දෙදෙනානම්:-වෙන මුලික දෙදෙනයි. සතරමාර්ගය විසින්ම ප්‍රහාණය කටයුතුවූ අකුශලයෝ නම්:-සතරදෙනෙකි. ඒ සතරදෙනානම්-දිට්ඨධම්ම විපච්චනීය සතර දෙනයි. මෙසේ මාර්ගත්‍රිත්වශයෙන් අකුශල ප්‍රහාණය දත යුතුයි. ශ්‍රෝතාපත්ති මාර්ගය ලබන්නාවූ ක්ෂණයෙහි තෛහේතුක සංසකාර ධර්මයන්ගේ අනිත්‍ය දුඃඛ අනාත්ම යන ත්‍රිලක්ෂණයන් ගෙන් යම්කිසි ලක්ෂණයක් අරමුණුකොටගෙන මනොවාර වජ්ජන සිත එක්වරක් ඉපිද පරිකම්ම උපචාර අනුලෝම ගොත්‍රභු යන නමින් මනඳ්වාරයාගව සතරවරක් හෝ උපචාර අනුලෝම ගොත්‍රභු යනානමින් තික්ඛප්‍රාඥයාගට තුන්වරක් හෝ පූර්වභාගවිදර්ශණ සිත් ඉපිද පරිවර්තනය හෝ සතරවනු උපපාදසිතිහඬහයන්ගෙන් සම්පූර්ණවූ ශ්‍රෝතාපත්ති මාර්ගචිත්තය එක්වරක් උපදී. ඒ මාර්ගචිත්තයෙහි සපහේදවූ සතිස් බෝධිපාක්ෂික ධර්මයෙන් කෙනෙක් ලැබෙත්. ඔවුන්ගෙන් ඇතැම් ධර්මයන්ට සත්තිස් බොධිපාක්ෂික ධර්මයෝයයි කියති. ඒ ශ්‍රෝතාපත්ති මාර්ග චිත්තයෙහි යෙදුනාවූ අනඤ්ඤාතඤ්ඤස්සාමීතීන්ද්‍රිය යන නමින් ප්‍රසිද්ධවූ ප්‍රඥාවෛශාරද්‍ය තෙමේ දුඃඛසත්‍යය පිරිඳ දැනීමය සමුදය සත්‍යය නැතිකිරීමය, නිරෝධසත්‍යය ප්‍රත්‍යක්ෂව දැකීමය, මාර්ගසත්‍යය වැඩීමය, යන සතර කෘත්‍යය එකක්ෂණිකව සිඹ

තෙරේ. කුමක්මෙන්දයත්? තෙල් පහණක් දැල්වූකල්හී අඳුකාරය නැසීමය, ආලෝකය පැතිරයාමය, තෙල්ක්ෂයවීමය, පහන්වැටිය දැවීමය, යනමේ සතර කෘත්‍යය ඉදිරිපසුනොවී එකක්ෂණිකව කරන්නාක්මෙන් මේ ශ්‍රොතාපත්ති මාගීචිත්ත යෙහි යෙදුනාවූ ප්‍රඥාචෙතසික නැමැති ප්‍රදීපයද, එකක්ෂණිකව සතරකෘත්‍යයක් සිඹනෙරේ. ඊට චතුස්සත්‍යාවබොධයයි කියති. මෙසේ ශ්‍රොතාපත්ති මාගීචිත්තයට අනතුරුව ශ්‍රොතාපත්තිඵල සිත්දෙකක් හෝ තුණක් හෝ සුදුසු පරිද්දෙන් උපදිත්. ඒ ශ්‍රොතාපත්ති ඵලසිත්වූද්ශලයාහට නැවතත් චතුස්සත්‍යය නොපෙණීයයි. කුමක්මෙන්දයත්? දැල්වූ පහණ නිවී ගියකල්හී නැවතත් අඳුකාරය පැතිරයාමක්මෙනි. ඒ යොගාවචරතෙමේ පෙරසේම අනිත්‍ය දුඃඛ අනාත්ම යන ත්‍රිලක්ෂණ භාවනාවට පටන්ගත්කල්හි ශ්‍රොතාපත්ති මාගීයෙහි කීනසින්ම මනොවාරවජ්ජන චිත්තය එක්වරක් ඉපිද පරිකම් උපචාර අනුලොම වොදන යන නමින් සතරවරක් හෝ උපචාර අනුලොම වොදන යනනමින් තුන්වරක් හෝ මන්දප්‍රඥාත්‍රික්ෂප්‍රාඥයන්ගේ වශයෙන් පූර්වභාග විදර්ශණා සිත් උපන්කල්හි පස්වනුව හෝ සතරවනුව උපාදඤ්ඤි නම්බඨයන්ගෙන් සම්පූර්ණවූ ශකෘදාගාමි මාගීචිත්තය එක්වරක්ම උපදී. ඒ මාගීචිත්තක්ෂණයෙහි දුඃඛ සත්‍යය වෙන්වෙන්නොව දැනීමය, සමුදයසත්‍යය දුරුකිරීමය, නිරොධසත්‍යය ප්‍රත්‍යක්ෂකිරීමය, මාගීසත්‍යය වැඩීමය යන කෘත්‍යය සතර ඉදිරි පසුනොවී ඒ ශකෘදාගාමි මාගී චිත්තයෙහි යෙදුනාවූ අසඳ්දිඣිය සංඛ්‍යාතවූ ප්‍රඥාචෙතසිකය යටකී ප්‍රදීපන්‍යායමෙන් එක්වීට සිඹනෙරේ, ඊට අනතුරුව ශකෘදාගාමි ඵලසිත්දෙකක් හෝ තුණක් සුදුසු පරිද්දෙන් උපදිත්. දැල්වූ පහණ නිවීගියකල්හි නැවතත් අඳුකාරය පැතිරියාමක්මෙන් ශකෘදාගාමි ඵලචිත්තය පවත් අනාගාමි මාගීය දක්වා නැවතත් නොදැනීම සිඹවේ. ඒ ශකෘදාගාමි ඵලසඳ යොගාවචරතෙමේ නැවතත් අනිත්‍ය දුඃඛ අනාත්ම භාවනාවඩ්ඪනකල්හී යටකී පරිද්දෙන් මනොවාරවජ්ජන චිත්තය ඉපිද පරිකම් උපචාර අනුලොම වොදන යන නමින් සතරවරක් හෝ උපචාර අනුලොම වොදන යන නමින් තුන්වරක් හෝ පූර්වභාග විදර්ශණා කෘත්‍යවශයෙන් උපන්කල්හී පස්වෙනුව හෝ සතරවෙනුව උපාදඤ්ඤිනම්බඨයන්ගෙන් සම්පූර්ණවූ අනාගාමි මාගීචිත්තය එක්වරක් ඉපිද නිරුඬවේ. ඒමාගීචිත්තයෙහි යෙදුනාවූ අසඳ්දිඣිය සංඛ්‍යාතවූ ප්‍රඥාචෙතසික තෙමේ දුඃඛසත්‍යය හොත් පසින්දැනීමය, සමුදය සත්‍යය දුරුකිරීමය, නිරොධ සත්‍යය

ප්‍රත්‍යක්ෂකිරීමය, මාර්ගසත්‍යය වැඩීමය යන සතරකෘත්‍යය ඒමාර්ග චිත්තයෙහි යෙදුනාවූ අඤ්ඤින්ද්‍රිය සංඛ්‍යාතවූ ප්‍රඥාවෛතසිකය තෙමේ ඉදිරිපසුනොවී එකවිට සිඛකෙරේ. ඊට අනතුරුව අනාගාමී ඵලයින් දෙනෙක් හෝ තුණක් හෝ සුදුසු පරිද්දෙන් උපදින්. ඒ අනාගාමී ඵලචිත්තය පවත් අතීත්මාර්ග චිත්තක්ෂණය දක්වා දුල්වූ පහණ නිවීගියකලක්මෙන් නැවතත් දැකීමවළකී. ඊට අනතුරුව ඒ අනාගාමී යොගාවචර තෙමේ අනිත්‍ය දුඃඛ අනාත්ම යන තිලකුණු වඩනකල්හී ඝටකී නයින්ම මනොවාරවජ්ජන චිත්තයක් ඉපිද පරිකම් උපචාර අනුලොම වොදාන යන නමින් සතරවරක් හෝ, උපචාර අනුලොම වොදාන යනනමින් තුන්වරක් හෝ, පූර්වභාගවිදර්ශණා කෘත්‍යවශයෙන් උපන්කල්හී පස්වනුව හෝ සතරවනුව උපපාදක්ෂිති භඛයන්ගෙන් සම්පූර්ණවූ එකම අතීත්මාර්ග චිත්තක්ෂණය උපදී. ඒ මාර්ගචිත්තක්ෂණයෙහි යෙදුනාවූ අඤ්ඤින්ද්‍රිය සංඛ්‍යාතවූ ප්‍රඥාවෛතසිකය තෙමේ දුඃඛසත්‍යය වෙන්වෙන්කොටදැනීමය සමුදය සත්‍යයදුරුකිරීමය, නිරොධ සත්‍යය ප්‍රත්‍යක්ෂකිරීමය, මාර්ගසත්‍යය වැඩීමය යන, චතුසත්‍යාවබොධය ඉදිරිපසුනොවී එකක්ෂණිකව සිඛකෙරේ. ඊට අනතුරුව අතීත්ඵල සිත්දෙකක් හෝ තුණක් හෝ සුදුසු පරිද්දෙන් උපදින්. ඒ අතීත්ඵල චිත්තයෙහි යෙදුනාවූ අඤ්ඤාතාවින්ද්‍රිය සංඛ්‍යාතවූ ප්‍රඥාවෛතසිකය ඒ මහරහතන් වහන්සේගේ සකලක්ලේශපරිනිර්වාණය දක්වා හෙවත් පිරිනිවීමදක්වා ඒ දුඃඛසත්‍යය පිරිසිඳදැනීමය, සමුදයසත්‍යය දුරුකිරීමය, නිරොධසත්‍යය ප්‍රත්‍යක්ෂකිරීමය, මාර්ගසත්‍යය වැඩීමය, යන චතුසත්‍යයන්ගේ දැනීම නිරන්තරයෙන් පවත්නේයි. සොවාන් සකෘදාගාමී අනාගාමී යන ත්‍රිවිධ මාර්ගක්ෂණයෙහි චතුරාර්ය සත්‍යයධර්මයන්ගේදැකීම ඒ මාර්ගචිත්තක්ෂණයෙහිම සිඛකෙරේ. අවශෙෂ කාලයෙහි පහණ නිවීගියකලක්මෙන් චතුරාර්ය සත්‍යයන්ගේදැකීම සිඛනොකෙරෙයි. අතීත්මාර්ගක්ෂණයෙහිඑගන්නාවූ චතුසත්‍යයදැකීම ඒ රහතන්වහන්සේගේ පිරිනිවීම දක්වා නිරන්තරයෙන් දල්වාතිබෙන්නාවූ පහණක්මෙන් ඒ චතුරාර්ය සත්‍යයන්ගේදැකීම පවත්නේයි. මේ සතරමාර්ගක්ෂණයෙහි හටගන්නාවූ කෘත්‍යයෝ සොළොස්දෙන සොළොස් මාර්ගකෘත්‍යයයි දතයුතු.

තවද මේ සතර මාර්ගයන්ගෙන් දෙලොස් අකුශලයන්ගේ ප්‍රහාණිය හැඟවීමට උපමාවක් දක්වනුලැබේ. ඒකෙසේ යත්? එක්තරා රජකෙනෙක් තමාගේ සියලු අමාත්‍යාදීන් රැස්කොට ඒ අමාත්‍යයන් අතුරෙන් යුඛදක්ෂවූ එක්තරා නුවණැති අමාත්‍ය

යෙක් තෝරා තොපි මාගේ ආඥාව පවත්නාවූ දෙශයාගේ කෙළවර නොහොත් ප්‍රත්‍යන්තදෙශයෙහි අමාත්‍යධුරයෙහි තබමිසි ඒ පසළ්දනව්වාසීන්ට නිරන්තරයෙන්ම දුම්රිය සොරුන් ගෙන් පීඩාලැබෙන්නේය. තොපි ඒ දුම්රිය සොරුන් සමග යුඬකොට පසළ්දනව් වාසීන්ට අභයදේවියයි කියා ඒ පසළ්දනව්වෙහි අමාත්‍යධුරයට පත්කෙළේයි. ඒට නොබෝකලකට පසු නොයෙක් බලසෙනහින් පිරිවරණලද්දුවූ දුම්රිය සොරු දෙළොස්දෙනෙක් ඒ පසළ්දනව්වට ආවාහුය. ඉක්බිති අමාත්‍යධුරයට පත්කරණලද්දුවූ ඒ අමාත්‍යතෙමේ වහාම මහරජහුකරා අවුත් දෙවයෙනි! මහත් සෙනග විසින් පිරිවරණලද්දුවූ දුම්රිය සොරුන් දෙළොස්දෙනෙක් ආවාහුය. කුමක්කෙරෙම්දැයි විචාළේය. ඉක්බිති මහරජතෙමේ ඕහට නිහුකොට එම්බල අඥානය! නොපට මහසැපත්දී පසළ්දනව්වෙහි අමාත්‍ය ධුරයට පත්කෙළේ කා බී සැපසේ දවස් යවන්වද? ඔවුන් හා සමග යුඬ කරන්වදැයි ඔහුට අවවාදකොට බලවාහන සමග යුඬවුද පාවාදී වහාමගොස් යුඬකරවයි අණකෙළේයි. ඉක්බිති ඒඅමාත්‍ය තෙමේ මහරජහු විසින් දෙනලද්දුවූ යුඬාවුදදියගෙණගොස් ඒ මහසෙන් පිරිවරණලද්දුවූ දුම්රික සොරු දෙළොස්දෙන සමග යුඬකොට පළමුවෙනි යුඬයෙන්මි දුම්රික සොරදෙටුවන් පස්දෙනෙක් හා ඔවුන්ගේ බලසෙනඟද මරාදමා ඉතිරිවූ සත්දෙනාගේද සෙනඟ මැරීමෙන් දුබ්ලකෙළේය. නැවත ඒසත්දෙන ගල්ගුහාදියෙහි සැඟවීනත්තාහුය. අමාත්‍යතෙමේ දෙවෙනිවත් රජහුකරා අවුත් දෙවයෙන! අපගේ පළමුවෙනි යුඬයෙන්ම බලසෙන් සහිතවූ සොරදෙටුවන් පස්දෙනෙක් හාත්පසින් විනාශකරණලද්දුහුය. ඉතිරිවූ සත්දෙනාගේද සෙනඟ මරා දුබ්ලකරණලද්දේයයි සැළකලසල්හී මහරජතෙමේ ඒ අමාත්‍ය යාහට මඳක් සතුතිකොට නැවතත් යුඬාවුද සම්පත් ආදියදී වහාම ගොස් යුඬකරවයි අණකෙළේයි. ඉක්බිති ඒ අමාත්‍ය තෙමේ මහරජහුගේ අණපරිද්දෙන් දෙවෙනි වාරයෙහි ගොස් ඒ ඉතිරිවූ සත්දෙනා සමග යුඬකොට ඔවුන්ගේ සෙනඟ මරා බොහොසෙයින් දුබ්ලකෙළේය. එසේදවුවත් ඒදෙවෙනි යුඬයෙන් එක සොරදෙටුවෙකුදු විනාශනොකොට හැකිවිය. ඔබ්හු දුබ්ලව ගල්ගුහාදියෙහි සැඟවීනත්හ. ඉක්බිති අමාත්‍ය තෙමේ නැවතත් මහරජහුකරා අවුත් දෙවයෙනි! අපගේ දෙවෙනි යුඬයෙන් එකෙකුදු විනාශනොකොට හැකිවිය. එසේදවුවත් ඔබ්හු හාත්පසින් දුබ්ලව ගල්ගුහාදියෙහි සැඟවීගියාහයි සැළකෙළේයි. නැවතත් රජතෙමේ අමාත්‍යයාහට සෙනාවාහන සම්පත් ආදිය

දී තුන්වෙනි වරත් ගොස් යුඬකරවයි අණකෙළේසි. අමාත්‍ය තෙමේද රාජාඥාව පරිද්දෙන් තුන්වෙනිවර ගොස් යුඬකිරිමෙන් ඒ දුම්ලවූ සොරදෙටුවන් සත්දෙනා අතුරෙන් සෙනා සහිත දෙදෙනෙකුන් විනාශකෙළේය. ඉතිරිවූ පස්දෙනාද අතිශයින් දුම්ලව ගල්ගුහාදියෙහි සැඟවිගත්හ. ඉක්බිති අමාත්‍ය තෙමේ සතරවෙනි වාරයෙහිත් මහරජහුකරා අවුත් දෙවයෙනි! අපගේ තුන්වෙනි යුඬයෙන් සෙනා සහිතවූ සොරදෙටුවන් දෙදෙනෙක් විනාශවූහ. ඉතිරිවූ පස්දෙන අතිශයින් දුම්ලව සැඟවීගියාහයි සැළකෙළේසි. නැවතත් මහරජතෙමේ සෙනා වාහන සම්පත් ආදියදී නොබාගොස් යුඬකරවයි ආඥාකෙළේය. ඉක්බිති ඒ අමාත්‍යතෙමේ සතරවෙනි වාරයෙහි මහරජහුවිසින් දෙනලද සෙනා වාහන පිරිවරාගෙණගොස් ඒ දුම්ලවූ සොරදෙටුවන් පස්දෙනා හා සමග යුඬකොට හාත්පසින්ම සෙනා වාහන සහිතවූ ඔවුන් පස්දෙන විනාශකෙළේසි. ඉක්බිති ඒ පසල්දනව්වාසි මනුෂ්‍යයෝ අපගේ පසල්දනව්ව ක්ෂේමය නිර්භය යයි තමතමන්ගේ දරුවන් ලෙඟිනටවම්න් ප්‍රීතියෙන් දවස් යවන්ට පටන්ගත්හ. ඒ අමාත්‍යතෙමේද මහරජහුකරා අවුත් මේ සියලු ප්‍රවෘත්ති සැළකළකල්හි අමාත්‍ය මණ්ඩලයාගේ මධ්‍යයෙහි ඔහුට සතුතිකොට තොයෙක් උපහොග පරිභොගසම්පත් ත්‍යාගිවශයෙන් දුන්හ. ඒ අමාත්‍යතෙමේද මහරජහු හා සමග රාජප්‍රාසාදයෙහි ජයපානඝකරම්න් ප්‍රීතියෙන් දවස් යවන්ට පටන්ගත්තේසි. මේ උපමාවෙන් කවරාර්ථයක් ප්‍රකාශකළසේක්දයත්? එක් සමයෙක්හි භාග්‍යවතුන්වහන්සේ භික්ෂූන්ගේ මැද ධර්මදේසනාරූඪව වැඩහිඳ මහණෙනි! ග්‍රාමාන්ත සෙනාසනයට වඩා ආරණ්‍ය සෙනාසනය උතුම්යයි වදාළ වචනය අසා එක්තරා භික්ෂුකෙනෙක් සම්ඵදයන්වහන්සේ විසින් ආරණ්‍ය සෙනාසනය උතුමයයි වර්ණනාකෙළේ නොවිඳුසි සිතා වස්විසිමට ලංවූකාලයෙහි ආරණ්‍ය සෙනාසනයකට වැද ඒකකයන් විසින්දෙන්නාවූ ප්‍රණීත ආහාර වළඳමින් නිතර නිදාගැණීමෙන් තුන්මස පසුකොට කාමවිතර්කාදිය ඉපිද ග්‍රාමාන්තයෙහි සිවිකාලයටත් වඩා කෙලෙසුන් විසින් මැඩපවත්වනලද සිත් ඇතිව වස් පවරා බුදුන් කරා අවුත් සවාමිනි! නුඹවහන්සේ විසින් ආරණ්‍ය සෙනාසුන උතුමැයි වදාරණලද්දාවූ වචනය අසා මම අරණ්‍ය සෙනාසනයෙහි වස්තුන්මස පසුකෙළෙමි. එතකුදුවුවත් කිසි ගුණ ධර්මයක් නූපන්නේයයි සැලකෙළේසි. ඉක්බිති සම්ඵදයන්වහන්සේ එම්බල මෝඝපුරුෂය! ආරණ්‍යයට වැද යහපත් ආහාර පානවර්ණාදිය අනුභවකෙරෙම්න් දවස් යැවීමෙන් කවර ගුණ

ධර්මයක් උපදින්නේද? නොපි මේ පවසකණිය අනිත්‍යය දුඃඛය අනාත්මය යනාදීන් විදර්ශණාකරවයි මෙය වදුරා කමටහන් දුන්කල්හි ඒ භික්ෂුතෙමේ පළමු සිටි ආරණ්‍යයටම්වැද සප්තඥයන් වහන්සේ විසින් දෙනලද කමටහන් වඩා සොවාන් මාගීයට පැමිණීමෙන් බලසෙන් සහිතවූ සොරදෙටුවන් පස්දෙනෙකුට බදු උපමා ඇත්තාවූ දිසිසමපයුක්ත අකුශල් සතරය, විචිකිච්ඡා සම්ප්‍රයුක්ත අකුශලය, යනමේ පස්දෙන සමුළුවිද ප්‍රහාණ යෙන් නසා සෙසු අකුශලයන් සත්දෙනාගේ අපායගමනීය ශක්තිය තුනීකොට නැවතත් අවුත් භාග්‍යවත්හට සැළකෙළේය. ඉක්බිති භාග්‍යවතුන්වහන්සේ ශකෘදාගාමී මාගීයට කමට හන්දී නැවතත් ගොස් භාවනාකරවයි වදළේසි. ඉක්බිති ඒ සොවාන් ඵලසථ ආර්‍යතෙමේ නැවතත් ගොස් භාවනාවඩා ශකෘදාගාමී මාගීයට පැමිණ කාමධාතුවෙහි කටුක විපාකදීමට ශක්තිඇත්තාවූ ඒ අකුශලයන් සත්දෙනාගේ ශක්තියතුනී කොට නැවතත් අවුත් භාග්‍යවතුන්හට සැළකෙළේසි. ඉක්බිති භාග්‍යවත් තෙමේ තුන්වෙනිවර අනාගාමී මාගීයට කමටහන්දී භාවනාකරවයි පිටත්කෙළේසි. ඒ භික්ෂුතෙමේ තුන්වෙනි වරත්ගොස් භාවනාවඩා අනාගාමී මාගීයට පැමිණීමෙන් සොර දෙටුවන් දෙදෙනෙකුට බදුවූ දෙෂ මූලික ප්‍රතිඝසම්ප්‍රයුක්තවූ අකුශලයන් දෙදෙන සමුළුවිද ප්‍රහාණයෙන් නැසූයේසි. නැවතත් ඒ භික්ෂුතෙමේ බුදුන්සරා අවුත් මෙපවත් සැළකළකල්හි අර්හත්මාගීයට කමටහන්දී පිටත්කෙළේසි. ඒ භික්ෂුතෙමේ භාවනාවඩා අර්හත්මාගීයට පැමිණීමෙන් දුර්ලවූ සොරදෙටුවන් පස් දෙනෙකුට බදුවූ දිෂ්ටිවිප්‍රයුක්ත අකුශල් සතර හා උඩච්චසම්ප්‍රයුක්ත අකුශලයද යන අකුශල් පස සමුළුවිද ප්‍රහාණවශයෙන් නැසූයේසි. ඉක්බිති භාග්‍යවතුන්වහන්සේ සිව්දෙරිස් මඩ්‍යයෙහි ඒ භික්ෂුන්වහන්සේට සුප්‍රතිපන්නවූ ආර්‍ය ශ්‍රාවකයාය යනාදීන් සතුතිකොට වදුළේසි. ඒ මහරහතුන්වහන්සේ නිර්වාණ නැමති මහාප්‍රාශාදයෙහි ධර්මරාජන්වූ ශාස්තෘන්වහන්සේ හා සමග සදෘකාලික සැපවිඳිනේයසි දතයුතු. මෙසේ මේ උපමා උපමෙය යන්ගේ සම්බන්ධයෙන් සතරආර්‍යමාගීයන්ගෙන් දෙලොස් අකුශලයන්ගේ ප්‍රහාණිය ගලපාදතයුතුසි. සොළොස් වැදෑරුම් මාගීඤාත්‍යයන්ට සංධාරණවූ උපමාවක් දක්වන්නෙම්, ඒකෙසේ යත්? මහරජතෙමේ එක් දවසක් රාත්‍රී භාගයෙහි රජවාසල ආරක්ෂාකරන්නාවූ රාජපුරුෂයන්ට සතුටු පඬුරුදෙනු කැමතිව භාණ්ඩාගාරික අමාත්‍යයාට කථාකොට සඟයෙනි! රජවාසල රාත්‍රී දවස සැනපෙන්නාවූ රාජපුරුෂයන්ට සතුටු පඬුරුදෙනු

කැමැත්තෙම්, රාජභාණ්ඩාගාරයෙහි දෙර හැර හඳනා පිළි ගෙණෙවයි නියොග කෙළේයි. ඉක්බිති භාණ්ඩාගාරිකා තෙමේ රාජභාණ්ඩාගාරයට වැද පහණක් දල්වා රාජභාණ්ඩාගාරයෙහි තිබෙන්නාවූ රන්රුවන් මුතු මැණික් වස්ත්‍රාභරණාදී නොයෙක් සමපත් බලා වස්ත්‍ර පමණක් රැගෙණ භාණ්ඩාගාරයෙන් නික්ම ඉණිහිසට පැමිණෙනතාක් ඒ වස්තුවදක්නේය. ඉණිහිසින්බිමට බටකල්හි ඒ වස්තුව නොපෙනීයන්නේය. මෙසේ ඒ භාණ්ඩාගාරිකතෙමේ හඳනා පිළිගෙණගොස් රජහුට දක්වාළීය. නැවත රජතෙමේ භාණ්ඩාගාරිකයාට කථාකොට භාණ්ඩාගාරයට ගොස් හිස්වෙළුම් ගෙණෙවයි නියොග කෙළේය. භාණ්ඩාගාරිකතෙමේ දෙවෙනි වාරයෙහිත් භාණ්ඩාගාරයටවැද පහණක් දල්වා ඒ ප්‍රදීපාලොකයෙන් රාජභාණ්ඩාගාරයෙහි තුබූ රන්රුවන් ආදී වස්තුවබලා හිස්වෙළුම් පමණක්ගෙණ භාණ්ඩාගාරයෙන් නික්ම එනකල්හි ඉණිහිසට පැමිණෙනතාක් ඒවස්තුව දක්නේය. ඉණිහිසින් බිමට බස්නාකල්හි ඒවස්තුව නොපෙනීයයි. රාජපුරුෂතෙමේ හිස්වෙළුම් ගෙණගොස් රජ්ජුරුවන්ට දක්වාලයි. රජතෙමේ තුන්වෙනි වාරයෙහිත් රාජපුරුෂයන්ට සතුටුපඬුරු දෙනු පිණිස රාජභාණ්ඩාගාරයට වැද සැට්ටගෙණෙවයි නියොග කෙළේයි. භාණ්ඩාගාරිකතෙමේ තුන්වෙනි වාරයෙහිත් භාණ්ඩාගාරයටවැද පහණක් දල්වා භාණ්ඩාගාරයෙහි තිබෙන්නාවූ රන්රුවන් ආදිවූ නොයෙක් වස්තුව බලා සැට්ට පමණක්ගෙණ භාණ්ඩාගාරයෙන් නික්ම එනකල්හි ඉණිහිස දක්වා ඒභාණ්ඩාගාරයෙහි තුබූ වස්තුව දක්නේයි. ඉණිහිසින් බිමටබස්නාකල්හි නැවතත් ඒවස්තුව නොපෙණීයයි. රාජපුරුෂතෙමේ සැට්ට ගෙණවුත් රජහට දක්වාලයි. මහරජතෙමේ සතරවෙනි වාරයෙහි රාජපුරුෂයන්ට සතුටු පඬුරුදෙනු පිණිස උතුරු සළු ගෙණෙවයි නියොගකරයි. භාණ්ඩාගාරිකතෙමේ සතරවෙනි වාරයෙහි භාණ්ඩාගාරයට වැද පහණක්දල්වා එහි තිබෙන්නාවූ නොයෙක් වස්තුවබලා උතුරුසළු පමණක් රැගෙණ ඉණිහිසට පැමිණෙනකල සුශර්‍මයා උදෑවෙයි. එහෙයින් සුශෙර්‍මදය පවන් හසතඹගමනය දක්වා ඒ රාජභාණ්ඩාගාරයෙහි තිබෙන්නාවූ වස්තුවදක්නේයි. මේ උපමාවෙහි පළමුවෙනි වාරයෙහි පහණක් දල්වා රාජභාණ්ඩාගාරයෙහි තිබෙන්නාවූ අප්‍රමාණ වස්තුව බැලීමක්මෙන් ශ්‍රොතාපත්ති මාගීර්‍යක්ෂණයට පැමිණ ඒමාගීර්‍යක්ෂණයෙහි දුඃඛසත්‍යයාගේ පිරිසිඳදැනීමය. සමුදය සත්‍යයාගේ දුරුකිරීමය, නිරොධසත්‍යය ප්‍රත්‍යක්ෂකිරීමය, මාගීර්‍යසත්‍යය වැඩීමය යන චතුස්සත්‍යය ධර්‍මයන්ගේ කෘත්‍යයෝ රාජභාණ්ඩාගාරයෙහි පහ

ණක් දල්වා එහි තිබෙන්නාවූ රත්රුවන් ආදීවූ වසතුව දැකීමක් වැනිවූවාහුය. නැවත සොඬාපත්ති මාගීයට අනුතුරුව දෙතුන් සොතාපත්ති ඵලචිත්තක්ෂණ කෙනෙකුන්ගේ ඉපදීම භාණ්ඩාගාරයෙහි ඉණිහිසට පැමිණීමක් වැනිවෙයි. භාණ්ඩාගාරයෙහි පටන් ඉණිහිස දක්වා ඒවසතුව දකිමින් අවුත් ඉණිහිසින් බිමට බටසල්හී නැවත නොපෙනී යාමක්මෙන් දෙතුන් ඵලචිත්තක්ෂණය දක්වා චතුරාර්‍ය සත්‍යයන්ගේ කෘත්‍යය සිඛකොට නැවත නොපෙනීයාමක්මෙන් දතයුතු. දෙවෙනි වාරයෙහිත් තුන්වෙනි වාරයෙහිත් පළමුවෙනි වාරයට කීනයිනම් උපමා උපමෙය්‍ය සම්බන්ධකටයුතු. සතරවෙනි වාරයෙහි චතුර්‍ථ භාණ්ඩාගාරයට වැද පහණක් දැල්වීමෙන් එහි ඇත්තාවූ සියලු වසතුව එකඟිට දක්නාක්මෙන් අනීතමාගීක්ෂණයෙහි ඉදිරිපසුනොවී චතුස්සත්‍යයන්ගේ කෘත්‍යය සිඛගිරිමදතයුතු. සතරවෙනි වාරයෙහි ඉණිහිසට පැමිණිසල්හි සූර්‍යයාගේ උදුවීමෙන් රාජභාණ්ඩාගාරයෙහි සියලුවසතුව දවස මුලුල්ලෙහි දක්නාක්මෙන් අනීත්ඵල නැමති සූර්‍යයාගේ උදුවීමෙන් ඒ චතුස්සත්‍යයන්ගේ කෘත්‍යය නිරන්තරයෙන් සිඛවීමදතයුතු. මේ උපමාවෙහි රාජභාණ්ඩාගාරයෙහි සතරවරක් ප්‍රදීපසතරක් දැල්වීමඋමන් සතරමාගීයන්ගේ කෘත්‍යයදතයුතුයි. ඒ රාජභාණ්ඩාගාරයෙහි රත්රුවන් ආදී නොයෙක් වසතුවමෙන් චතුරාර්‍ය සත්‍යය ධර්මයෝ දතයුත්තාහුය. රාජභාණ්ඩාගාරය බලන්නාවූ භාණ්ඩාගාරික අමාත්‍යයාඋමන් මාගීඵලාඛිගමය කරනුකැමති ත්‍රෛභූමික සංඝස්කාර ධර්මයන් විදර්‍ශණාකරන්නාවූ යොගාවචර මහණතෙම දතයුතුය. සතරවෙනි වාරයෙහි සූර්‍යයාගේ පහළවීමමෙන් අනීත්ඵලයාගේ පහළවීම දතයුතුයි. සූර්‍යෝදය පටන් හස්තඛගමනය දක්වා ඒ රාජභාණ්ඩාගාරයෙහි වසතුව දැකීමක්මෙන් අනීත් ඵලාවබොධය පටන් පිරිනිවන් පෑම දක්වා නිරන්තරයෙන් චතුස්සත්‍යයාගේ කෘත්‍යය සිඛකරනබව දතයුතුයි. ඒ සූර්‍යයා හස්තඛගතවන්නාක්මෙන් ඒ රහතුන්වහන්සේගේ පිරිනිවීම දතයුතුයි. මේ සොළොස් මාගීකෘත්‍යයන්ට සාධාරණවූ උපමා වයි. යටදැක්වූ කාමරූප අරූප කුශලචිත්තයන්ටමෙන් මේලොකොත්තරචිත්තයන්ට ක්‍රියානැත්තේ කුමක්හිසාදයත්? ලොකොත්තරමාගී චිත්තයවනාහි එකාන්තණිඝාවෙයි. ඉදින් කාමරූප අරූප චිත්තයන්ටමෙන් නොයෙක්වර උපදනාඅඛීනම් පළමුව උපදනා චිත්තය කුශලයයිකියාද දෙවනුව උපදන්නාවූ චිත්තයෝ ක්‍රියායයිකියාද කියයුත්තාහුය. මාගීචිත්තයවනාහි නොයෙක්වර නූපදින්නේ කුමක්හිසාදයත්? සතරමාගීයෙන් නැසිය

යුතුවූ ඒ ඒ අකුශල ධර්මයෝවනාහි එකම මාර්ගක්ෂණයෙහිම විනාශවෙති. යම් වෘක්ෂයකට අසනිප්‍රහාරයක් වදිනාකල්හි ඒ වෘක්ෂයෙහි ඇතැම් කොඳාඇ විනාශවී ඇතැම් කොඳාඇ ජීවත්නොවෙති. අසනිප්‍රහාරයාගේ ප්‍රකෘතිස්වභාව යම් වෘක්ෂාග්‍රයකට අසනිප්‍රහාරය සපර්‍යවසානම් ඒවෘක්ෂයාගේ සියක් රියන් දිගඇත්තාවූ මූල්පවා පෘථිවී ගර්භයතුළම විනාශවීයෙති. අසනිප්‍රහාරය වන්නාවූ යම්වෘක්ෂයක මුලක් නැවත ජීවත්නොවෙයි. එපරිදි දෙන්ම මාර්ගයෙන් වධ්‍යවූ ක්ලේශයන් අසනිප්‍රහාරයක් වැනිවූ මාර්ගචිත්තය සපර්‍යවසානම් අනාදිමත් සංසාරයෙහි අනුසයවශයෙන් පැවැත්තාවූ සියලු කෙලෙසුන් නැවත නූපදනාපරිදි දෙන් විනාශවීයෙති. එහෙයින් මාර්ගචිත්තය එක් සත්ත්වයෙකුගේ සන්තානයෙහි එක්වරක්මුත් කිපවරක් නූපදනාහෙයින් ක්‍රියාසිද්ධනැත්තේයයි දතයුතුයි. තවද කාමරූප අරූප චිත්තයෝවනාහි පෘථග්ජන ශෛක්ෂ්‍යසන්තානයෙහි උපදනාකල්හි කුශල්නම්වෙති. බුදුන් රහතුන්ගේ සන්තානයෙහි උපදනාකල්හි කුශලය විපාක නොදියයුතුහෙයින් ක්‍රියාය‍යි ව්‍යවහාරකරති. මාර්ගචිත්තයවනාහි ශෛක්ෂ්‍යසන්තානය හැර අශෛක්ෂ්‍යයන්ගේ සන්තානයෙහි නොඋපදී. එහෙයින් මාර්ක්‍රියාසිද්ධ නැත්තේයයි දතයුතු. තවද කාමරූපා රූපකුශලයෝ වනාහි නැවත නැවත උපන්නාහු නම්වූ භාදඟප්‍රහාණ විෂඞම්භන ප්‍රහාණවශයෙන් කෙලෙස් නැසීම සිද්ධකරෙති. මාර්චිත්තයවනාහි එක්වරක්ම උපදනාහෙයින් කෙලඟධර්මයන් නිරවශෙෂයෙන් ප්‍රහාණීය කෙරේ, එහෙයින් ක්‍රියාසිද්ධ නැඟැසිදතයුතු. ඊට උපමාකවර යත්? යම් ප්‍රත්‍යය දැඟෙක් තෙමේ අපගේ විහාරයෙහි වසන භික්ෂූන්වහන්සේ එක්වේලු වළඳන්නේයයි කිකල්හි අනික් උපාසඟයෙක් තෙමේ කිමෙක්ද? පින්වත! නොපගේ භික්ෂූන්වහන්සේ එඞාඝනිඞාඟධාරිද පත්තපිඬිඞාඟධාරිදැයි විවාළකල්හි පින්වත! අපගේ භික්ෂූන්වහන්සේ අඞ්ගධාරිනොවෙයි. දන්නොලැබෙන්‍යහයින් නොවළඳන්නේයයි පිළිතුරුදෙයි. එපරිද්දෙන්ම මාර්චිත්තය තෙමේ නැවත ඉපදනැයිය යුතුකෙලෙස් නැතිහෙයින් නැවත නැවත මාර්ග චිත්තය නූපදනේයයි දතයුතු.

තදනන්තරවූ සංග්‍රහ ගාථාවන්ගේ භාවය දැක්වීම.

යවකියනලද්දවූ විඤ්ඤයෝවනාහි දෙලොස් අකුශලය, එක්විසිකුශලය, සත්තිස්විපාකය, විසිඋක්‍රියාය‍යි මෙසේ අකුශල් අකු

ශල් හා සමඟද කුශල් කුශල් හා සමඟද විපාක විපාක හා සමඟද ක්‍රියාවන් ක්‍රියාවන් හා සමඟද සම්බන්ධ ජාතිකවූ ඒ ඒ චිත්ත යන් ඒ ඒ ජාතියෙහි සංග්‍රහකොට ගත්කල්හි ඒ සියලු චිත්තයෝ එකුන් අනූවක්වෙත්. ඒ එකුන් අනූවක් චිත්තයෝ එකාසූවක් ලෞකික චිත්තය, ලොකොත්තර චිත්තයෝ අටදෙනෙක්දැයි යන දෙයාකාරයකින්ද, කාමාවචර චිත්තයෝ සූපණසෙක, මහග්ගත චිත්තයෝ සත්විස්සෙක, ලොකොත්තර චිත්තයෝ අටදෙනෙක්දැයි යනමේ සතරාකාර සංග්‍රහයෙන්ද; අශොභන චිත්තයෝ සමතිසෙක, නොහොත් දෙලොස් අකුසල් හා අකුසල විපාක සතදැයි යන එකුන්විසි අශොභන චිත්තයෝද, ශොභන චිත්තයෝ එකුන්සැටෙක, යනමේ දෙයාකාරයකින්ද; අකුශල චිත්තයෝ දෙලොස් දෙනෙක, අහෙතුක චිත්තයෝ අට ලොසෙක, කාමාවචර චිත්තයෝ සූවිස්සෙක, රූපාවචර චිත්ත යෝ පසළොසෙක, අරූපාවචර චිත්තයෝ දෙලොස්දෙනෙක, ලොකොත්තර චිත්තයෝ අටදෙනෙක, යනමේ සයාකාර ක්‍රම යෙන්ද; ලොභ මූලික චිත්තයෝ අටදෙනෙක, දෙෂ මූලික චිත්තයෝ දෙදෙනෙක, මොහ මූලික චිත්තයෝ දෙදෙනෙක, අහෙතුක අකුශල විපාකයෝ සත්දෙනෙක, අහෙතුක කුශල විපාකයෝ අටදෙනෙක. අහෙතුක ක්‍රියාවෝ තුන්දෙනෙක, කාමාවචර කුශල් අටෙක, කාමාවචර විපාක අටෙක, කාමාවචර ක්‍රියා අටෙක, රූපාවචර කුශල් පසෙක, රූපාවචර විපාක පසෙක, රූපාවචර ක්‍රියා පසෙක, අරූපාවචර කුශල් සතරෙක, අරූපාවචරවිපාක සතරෙක, අරූපාවචර ක්‍රියා සතරෙක, මාර්ගචිත්ත යෝ සතරෙක, ඵලචිත්තයෝ සතරදෙනෙකැයි යනමේ සංග්‍රහ යෙන්ද, නොයෙක් නාමයන්ගෙන් හා ලක්ෂණයන්ගෙන්ද, දක්වනලද්දුවූ චිත්තයෝ සම්ප්‍රකාරයෙන් එකුන්අනූවක්මවෙත්. "චාදසාකුසලානෙවං" යනාදී සංග්‍රහ ගාථාවෙහි අභිප්‍රායනම්:- ජාතිභෙදවශයෙන් සංග්‍රහකරනකල්හි අකුසලජාතිය, කුශල ජාතිය, විපාකජාතිය, ක්‍රියාජාතිය,යි යන සතරාකාරවන්නේය යනුයි. "චතුපඤ්ඤාසධා කාමේ" යනාදී ගාථාවෙහි අභිප්‍රාය නම්:- චිත්තය තෙමේ කාමාවචරචිත්තය, රූපාවචරචිත්තය, අරූපාවචරචිත්තය, ලොකොත්තරචිත්තයයි මෙසේ භූමිවශ යෙන් සතරාකාරවන්නේය යනුයි. භූමිතොමෝ සථානභූමිය අවසථාභූමියයි දෙවැදෑරුම්වේ. ඒ දෙවැදෑරුම් භූමින් අතු රෙන් සථානභූමිය යනු ඒ ඒ චිත්තයන් එක්තැනෙන් ලැබිය යුතුවූ භූමියයි. අවසථාභූමිය යනු ඒ ඒ චිත්තයන් උපදනාතාලය සඳහා කීහ. කාමභූමිය රූපභූමිය අරූපභූමිය යනමේ භූමිත්‍රය

ඒ ඒ චිත්තයන් බොහෝසෙයින් හැසිරෙන සථාන බැවින් සථාන භූමිනම්වේ. ඒ ඒ චිත්තයන් හටගන්නාවූ අවසථාව අවසථා භූමි නම්වෙයි ලොකොත්තර චිත්තය වනාහි කාමභූමීන්මෙන් හටගන්නාභූමියක් නැතිමෙයින් බුඩාදීන්ගේ පහළවීම ඇතිකල්හි අධිගම අනභිඤඤාය නොවනතාක්කල් ලොකොත්තර භූමියයි අවසථාවශයෙන්ගතයුත්තේයි. ලොකොත්තර චිත්තය හටගන්නාවූ භූමියක්නම් එකානතයෙන්ම නැත්තේයි. එතකුදුවුවත් අධිගම අනභිඤඤාය නොවනතාක්කල් ඒ ත්‍රිවිධභූමියම අවසථා භූමිවශයෙන් ගතයුත්තේයි. ජාතිභෙද භූමිභෙදවශයෙන් දෙවැදෑරුම්වූ චිත්තය ආභිධම්මික නුවණැති පඩිතයන් විසින් එකසියවිසිඑකෙකැයි කියාද බෙදනලද්දේයි.

අ ථ්ථ.

කථං? යොහි, කෙසේ එකසියවිසිඑකක්වන්නේද යත්? විතක්කවිචාරපීති සුඛෙකඟතා සහිතං, විතක්කී විචාර ප්‍රීතිසුඛ එකාග්‍රතා යන ධ්‍යානාඟ පසකින් යුකතවූ; පඨමජ්ඣාන සොතාපත්තිමඟ චිත්තඤ්ඤව, ප්‍රථමධ්‍යාන සෝවාන් මාගීචිත්තයෙක්ද; විචාර පීති සුඛෙකඟතා සහිතං, විචාර ප්‍රීති සුඛ එකාග්‍රතා යන ධ්‍යානාඞඟ සතරකින් යුකතවූ; දුතියජ්ඣාන සොතාපත්තිමඟ චිත්තඤ්ඤව, ද්විතීයධ්‍යාන සෝවාන් මාගීචිත්තයෙක්ද; පීතිසුඛ ඒකඟතා සහිතං, ප්‍රීතිය සැපය එකාග්‍රතාය යන ධ්‍යානාඞඟත්‍රය කින් යුකතවූ; තතියජ්ඣාන සොතාපත්ති මඟචිත්තව, තෘතීය ධ්‍යාන සෝවාන් මාගීචිත්තයෙක්ද; සුඛෙකඟතා සහිතං, සුඛ එකාග්‍රතා යන ධ්‍යානාඞඟවයකින් යුකතවූ; චතුත්ථජ්ඣාන සොතාපත්ති මඟචිත්තව, චතුර්ථධ්‍යාන සෝවාන් මාගීචිත්තයෙක්ද; උපෙකඛෙකඟතා සහිතං, උපෙක්ෂාඒකාග්‍රතා යන අනික් අඞඟ වැකින් සම්ප්‍රයුකතවූ; පඨමජ්ඣාන සොතාපත්ති මඟචිත්තව, පඨමධ්‍යාන සෝවාන් මාගීචිත්තයෙක්ද; ඉති, ඉමිනාපභෙදෙන, මේ කියනලද ප්‍රභෙදය කරණකොටගෙණ; පඤ්චපි ඉමානි ඣානානි, මේ ධ්‍යානයෝ පස්දෙනද; සොතාපත්ති මඟචිත්තානීතාදිහොනති, සොවාන් මාගීචිත්තයෝනම්වත්. සකදාගාමි මඟ අනාගාමිමඟ අරහත්තමඟචිත්තව, ශකෘදාගාමි මාගී චිත්තය, අනාගාමි මාගීචිත්තය අර්හත්මාගීචිත්තය යන මාගී චිත්තයෝද; තථා, එපරිද්දෙන්; පඨ, (පඨවිධංහොති,) පස් පස් ප්‍රකාරවන්නේයි. ඉති, මෙසේ; සමවීසතිමඟචිත්තානි, සමවිසි මාගීසිත්කොහොක්ද; තථා, එසේම විසිඅකාරවූ; ඵලචිත්තානිව,

ඵලචිත්තයෝද; ඉති, මේසේ; ලෝකුත්තර චිත්තානි, ලොකොත්තර චිත්තයෝ තුමූ; සම්මත්තාළිස භවන්ති; සමසාළිසෙක් වෙත්. ඉති, තසමා, එසේහෙයින් නොහොත් මාගීඵලචිත්තයන් සමසාළිසක් ප්‍රභෙදවනහෙයින්; එකූනනවුතිවිධං, එකුන් අනූවක් ප්‍රභෙදවූ; චිත්තං, චිත්තය තෙමේ; එකවීසසතංහොති, එකසිය විසිඑකක්වන්නේයි.

1. පාදකජ්ඣාන සම්මසිතජ්ඣාන පුඤ්ඤලජ්ඣාසයෙසු, පාදකධ්‍යානය සම්මසිතධ්‍යානය පුඤ්ඤලධ්‍යාශයධ්‍යානය යනමොවුන් අතුරෙන්; එකෙක සදිසත්තා, එකි එකී ධ්‍යානය හා සදෘශ බැවින්; එකෙකං, එකි එකී ලොකොත්තර චිත්තය; ඛ්‍යානඛ්‍යයොග හෙදෙන, ප්‍රථමධ්‍යානාදීවූ ධ්‍යානාඛ්‍යයන් හා යුක්තවන ප්‍රභෙද යෙන්; පවඛාකත්වා එව, පස් පස් ප්‍රකාරකොටම; අනුත්තරං චිත්තං, ලොකොත්තරවූ චිත්තය; චත්තාළිසවිධං ඉතිඛ, සතළිස් ප්‍රභෙද ඇත්තේයයිද; වුච්චති, කියනුලැබේ.

2. භාථාව-රූපාවචරංච, රූපාවචර චිත්තයද; අනුත්තරංච, ලොකොත්තර චිත්තයද; පඨමාදිඣාන හෙදෙන, ප්‍රථමධ්‍යානාදීවූ ධ්‍යානාඛ්‍යයන් හා සම්ප්‍රයුක්ත ප්‍රභෙදයෙන්; ගය්හතියථා, යම්සේගණුලැබේද; තථා, එපරිද්දෙන්; ආරුපපවාපි, දෙලොස් අරූපාවචර චිත්තයද; උපෙක්ඛකඛණතාදයොගෙන, උපෙක්ෂා එකාග්‍රතාවන් හා යුක්තහෙයින්; අඛසමතාය, අඛ්‍යයන්ගේ සම්මානත්වයෙන්; පවමෙ, පවමජ්ඣාන භාවෙන, පවමධ්‍යාන යාගේ සභාවයයි කියනලද ව්‍යවහාරයෙන්; යසමාගය්හති, යම්සේ ගන්නාලැබේද;

3. තසමා, එසේහෙයින්; පඨමාදිකං, ප්‍රථමධ්‍යානාදීවූ; එකෙකංඣානං, එකෙකී ධ්‍යානචිත්තය; එකාදසවිධං, එකොළොස් වැදෑරුම්යයි; ඨිතං, කියනලද්දේයි. අනෙනතු, අනන්තංපන, පවමධ්‍යාන චිත්තයවනාහි; තෙවීසති විධංහවෙ, තෙවිසි වැදෑරුම්වන්නේයි.

4. පුඤ්ඤං, කුශලචිත්තය තෙමේ; සත්තතිංස විධං හෙව, සත්තිස් වැදෑරුම්වෙයි. තථා, එපරිද්දෙන්; පාකං, විපාක චිත්තය තෙමේ; විපඤ්ඤසවිධං හවෙ, දෙපණස් වැදෑරුම්වේ. ඉති, තසමා, එසේ කුශලචිත්තය සත්තිස් වැදෑරුම් හා විපාක චිත්තය දෙපණස් වැදෑරුම් වනහෙයින්; චිත්තානි, චිත්තයෝ; එකවීසසතං, එකසිය විසිඑකක් ප්‍රභෙදඇත්තේයයි. බුධා, ආභිධම්මික පණ්ඩිතයෝ තුමූ; ආහු, කීවාහුය. අභිධම්මත්ථසඞ්ගහෙ, අභිධම්මසංඛ්‍යාප්‍රකරණයෙහි වදලාවූ අර්ථයන් සංක්ෂෙපයෙන් සං

ග්‍රහණීරීමක්වූහෙයින් අභිධම්මත්ථසඞ්ගහනාමවූ ප්‍රකරණයෙහි; චිත්තසඞ්ගහ වීහාගොනාම, චිත්තසංග්‍රහය බෙදීමට කාරණාවූ; පඨමෝ පරිවෙජ්දෙ, පළමුවන පරිවෙජ්දය; ඉති, මෙසේ සමාප්ත කරනලද්දේයි.

මෙහි භාවය මෙසේයි,

ලොකොත්තර සිත්තෙමේ ශ්‍රොතාපත්ති මාගීයෙහි ප්‍රථම ඛ්‍යානය, විතීයඛ්‍යානය, තෘතීයඛ්‍යානය, චතුර්ථඛ්‍යානය පඤ්ච ඛ්‍යානය යන මොවුන්ගේවශයෙන් පසෙක; එපරිද්දෙන් සකෘදාගාමි අනාගාමි මාගීයෙහිද අර්හත්මාගීයෙහිද පසක් පසක් වන හෙයින් ඒසතරමාගීයෙහි ලැබෙන්නාවූ චිත්තයෝ විසිදෙනෙක් වෙත්. එපරිද්දෙන්ම සොතාපත්තිඵලය සකෘදාගාමිඵලය අනාගාමිඵලය අර්හත්ඵලය යන සතර ඵලයෙහිද සිත් පසක් පසක්ම ලැබෙනහෙයින් ඵලචිත්තයෝද විසිදෙනෙක් වෙති. මෙසේ ලොකොත්තර චිත්තයෙහි ධ්‍යානාඞ්ගයන්ගෙන් වැඩිකොට සමසාළිස් සිත් කෙනෙක්වෙත්. එකාසූවක් ලෞකික චිත්තයන් අතුරෙහි මේ සමසාළිස් ලොකොත්තර චිත්තය එක්කොටගත්කල්හි එකාසිය විසිඑකක්වෙති. කුසල් හා විපාකයන්ද වැඩෙනහෙයින් සතළොස් ලෞකික කුසලයන් කෙරෙහි විසිමාගීකුසල චිත්තය ගෙදූකල්හි කුශල චිත්තයෝම සත්තිස් කෙනෙක්වෙති. ලෞකික දෙතිස්විපාක යන් කෙරෙහි ඵලවිපාකවිසිචිත්තය ගෙදූකල්හි දෙපණස් විපාක චිත්තයක්වෙති. ලෞකිකවූ ප්‍රථමඛ්‍යාන තුණෙක විතීයඛ්‍යාන තුණෙක තෘතීයඛ්‍යාන තුණෙක චතුර්ථඛ්‍යාන තුණෙක පඤ්ච ඛ්‍යාන තුණෙකැයි මෙසේ ලෞකිකඛ්‍යානයෝ පසළොසෙක් වෙති. ලොකොත්තර ඛ්‍යානයන්ගේවශයෙන් සොතාපත්ති මාගීය හා ඵලය සකෘදාගාමිමාගීය හා ඵලය අනාගාමිමාගීය හා ඵලය අර්හත්මාගීය හා ඵලය යනමේ ලොකොත්තර සිත් අටෙහි ප්‍රථමඛ්‍යානය විතීයඛ්‍යානය තෘතීයඛ්‍යානය චතුර්ථඛ්‍යානය පඤ්ච ඛ්‍යානය යන ධ්‍යානාඞ්ගයන්ගෙන් වැඩිකොටගත්කල්හි ලොකොත්තර ක්‍රමයෙහිම ප්‍රථමඛ්‍යානයෝ අටදෙනෙක, විතීය ධ්‍යානයෝ අටදෙනෙක, තෘතීයඛ්‍යානයෝ අටදෙනෙක, චතුර්ථධ්‍යානයෝ අටදෙනෙක, පඤ්චඛ්‍යානයෝ අටදෙනෙකැයි ප්‍රභෙදවන්නාහුය. මෙසේ ප්‍රභෙදවනහෙයින් ලෞකිකප්‍රථම ඛ්‍යානයෝ තුන්දෙනෙක, ලොකොත්තර ප්‍රථමඛ්‍යානයෝ අට දෙනෙකැයි මෙසේ ප්‍රථමඛ්‍යාන එකොළොසක්වෙති. එසේම ලෞකික විතීයඛ්‍යානයෝ තුන්දෙනෙක, ලොකොත්තර විතීය

ඛ්‍යානයෝ අටදෙනෙකැයි මේසේ තතියඛ්‍යාන එකොළොසෙක් වෙති. ලෞකික තෘතීයඛ්‍යාන තුණෙක, ලොකොත්තර තෘතීය ඛ්‍යානයෝ අටදෙනෙකැයි මේසේ තෘතීයඛ්‍යානයෝද එකොළොසෙක්වෙති. ලෞකික චතුර්ථඛ්‍යානයෝ තුන්දෙනෙක, ලොකොත්තර චතුර්ථඛ්‍යානයෝ අටදෙනෙකැයිද මේසේ චතුර්ථඛ්‍යානයෝද එකොළොසෙක්වෙති. ලෞකික රූපාවචර පඤ්චඛ්‍යානයෝ තුන්දෙනෙක, ලෞකික අරූපඛ්‍යානයෝ දෙලොස්දෙනෙක, පඤ්චඛ්‍යාන ලොකොත්තර අටදෙනෙකැයි මේසේ පඤ්චඛ්‍යානයෝ තෙවිස්සෙක්වෙති. ප්‍රථමඛ්‍යානය පටන්වතුර්ථඛ්‍යානය දක්වා සොමනස්සඛ්‍යානයයිද තෙවිසිපඤ්චඛ්‍යානයෝ උපෙක්ඛාඛ්‍යානයයිද කියත්. "ඛිඩාපඨමයොග හෙදෙකකතෙවෙතෙ කතතු" යනාදී ගාථාවෙහි අභිප්‍රාය මෙසේයි. ඛ්‍යානයවන්හි පාදකඛ්‍යානය සම්මසිතඛ්‍යානය පුථුජ්ජනඛ්‍යානය,යි තුන් වැදෑරුම්වේ. ඒ මේ තුන්වැදෑරුම් ඛ්‍යානයන් අතුරෙන් පාදකඛ්‍යානය යනු ලෞකික ඛ්‍යානයක්මවෙයි. ලොකොත්තරඛ්‍යාන යෙහිවන්හි ඛ්‍යානයෙන් ලැබියයුතුවූ ඵලය නොකැමැත්තවෙයි. පාදකඛ්‍යානයවන්හි පාදයව බඳු උපමා ඇතිවෙයි. සම්මසිත ඛ්‍යානය හස්තයට බඳු උපමා ඇතිවෙයි. පුථුජ්ජනඛ්‍යානය වන්හි පාදයෙන් පෘථිවියෙහි පිහිටා සිටගෙන හස්තයෙන් අහිමත සම්දෙයක්කිරීමක් වැනිවේ. ඛ්‍යානාලාභී පුථුජ්ජනතෙමේ මාරීය ලබනු කැමැත්තාහුල්ලි ඒ ඛ්‍යානයට සම්මැද ඒ සම්මසනයෙන් නැඟිට ඒ ඛ්‍යානයෙහි අනන්තගීතවූ නාමරූප ධර්මයන් අනිත්‍ය දුඃඛ අනාත්මවශයෙන් විදර්ශනා වඩා අභිමතවූ මාරීය උපදවයි. සම්මසිතඛ්‍යානයවන්හි සම්ඛ්‍යානයකට සම්මැදඅනික් ඛ්‍යානයක් සම්මර්ශනයකොට පෙරමෙන්ම මාරීය උපදවයි. පුග්ගලජ්ඣාසය ඛ්‍යානයවන්හි ඛ්‍යානලාභී යොගාවචර තෙමේ යම් ඛ්‍යානයකට බඳුවූ මාරීයක්ලබම්හයිඅදහස්කෙළේඛිනම් ඒ ඛ්‍යානයට බඳු මාරීයලබයි. පාදකඛ්‍යානයෙන් ලබන්නාවූ මාරීය පාදකඛ්‍යානයමෙන් පවඩ්ඪිකාදී අඞ්ගඇතිවෙයි. සම්මසිතඛ්‍යානලාභියාද ඒ සම්මර්ශනයකළාවූ ඛ්‍යානයට බඳුවූ අඞ්ගඇත්තාවූ මාරීයලබයි. පුග්ගලජ්ඣාසය ඛ්‍යානලාභී තෙමේද ඒ තමා අදහස්කළ ඛ්‍යානයට බඳුවූ අඞ්ගයන්හෙන් යුක්තවූ මාරීයලබයි. මේ ත්‍රිවිධාකාරයම ඛ්‍යානලාභීන්ට මුත් ශුෂ්ක විදර්ශකයන්ට නොලැබේ. එසේදවුවත් ශුෂ්කවිදර්ශකයා විසින් ලබන්නාවූ මාරීය එකාන්තයෙන් ප්‍රථම ඛ්‍යානයට සම්බන්ධවූ අඞ්ගපසකින් යුක්තවන්නේයි. එහෙයින් ශුෂ්ක විදර්ශකයාට හෝ සමථයානික යාට හෝ ලැබෙන්නාවූ මාරීය එකාන්තයෙන් ඛ්‍යානාඞ්ගයන්

ඉන් නොමිදෙන්නේමැයි, ශුෂ්ක විදර්ශනාවූ අනාගාමී පුද්ගලයෙක් තෙමේ දිවිහිමියෙන් ධ්‍යාන නූපදවා හිඳ කාලක්‍රියා කෙළේ වීනම් ඔහුගේ කාමරාගය කැතිබැවින් කාමධාතුවෙහිද පටිසන්ධිය නොගණී. ධ්‍යානයක් නොලැබූහෙයින් බ්‍රහ්මලෝකයෙහිද පටිසන්ධිය නොගන්නේයි. එසේවීනම් ඔහුගේ පටිසන්ධිය කෙසේ වන්නේද යත්? ශුෂ්ක විදර්ශක අනාගාමී තෙමේ සමසීසිව තුන්විඳ්‍යානලාභීව නොහොත් චුතියට පූර්භාගයෙහි චතුර්ථධ්‍යානය ලබා එයින් චුතව ශුද්ධාවාසයෙහි උපදින්නේයි. සත්‍රිහු තුමූ අනාගාමීවූවද සත්‍රී ආත්මය ඉතා හීනවූ බැවින් ඒ හීනවූ ආත්ම භාවයට අනාතුරුව ශ්‍රෙෂ්ඨවූ ශුද්ධාවාස භූමියෙහි පටිසන්ධිය නොගන්නේයි. එසේවීනම් අනාගාමී සත්‍රිහු ශුද්ධාවාස භූමියට කෙසේ යන්නාහුද යත්? ධ්‍යානලාභීවූ සියලු සත්‍රින්ට නියමවූ බ්‍රහ්මපාරිෂද්‍යයෙහි ප්‍රථමධ්‍යානය උපදවාගෙණ ඒ අනාගාමී සත්‍රිහු පළමුවෙන් ඉපිද එබ්‍රහ්මපාරිෂද්‍යයෙහි සිටගන චතුර්ථධ්‍යානය උපදවා බ්‍රහ්මපාරිෂද්‍යයෙන් චුතව ශුද්ධාවාස භූමියෙහි උපදින්නේයයි දතයුතුයි. අනාගාමීවූ ආර්‍යශ්‍රාවකයන්ට ඔවුන්ගේ අභිප්‍රායානුකූල පරිද්දෙන් පළමුවෙන් ප්‍රථමධ්‍යාන භූමියෙහි ඉපිද එතැන් පටන් සියලු බ්‍රහ්මලෝකයෙහි උඩංසොත අකනිඨගාම්වශයෙන් ඉපිද ඉපිදහොස් අකනිට්ඨා තලයෙහිදී රහත්ව පිරිනිවන් පාන්නාහුය. සොවාන් සකෘදාගාමී අනාගාමී යන ත්‍රිවිධ ආර්‍යශ්‍රාවකයන්ටම ප්‍රථමධ්‍යාන තලය පටන් මතු මතු බ්‍රහ්මලෝකයෙහි ඉපිද ඉපිද බ්‍රහ්ම සම්පත්විඳීමට බාධාවක්නැත්තේයි. ලෝකොත්තරසිත් අටය යනු විදර්ශණා නියමවශයෙන් ශුෂ්කවිදර්ශක පුද්ගලයන් දෙදෙනා සඳහා කියනලදී. ලෝකොත්තරසිත් සතළිසය යනු ධ්‍යානනියම්වශයෙන් සමථයානික පුද්ගලයන් දෙදෙනා සඳහා කියනලදී. ලෞකිකධ්‍යානය උපදවනු කැමතිකල්හි ප්‍රථමධ්‍යානය ලැබීමට හෙතුවූ පස්විසි කම්සථානයන් අතුරෙන් සම්කිසි කමටහනක් "පඨවී පඨවී" යනුවෙන් භාවනාකළ පමණකින් ප්‍රථමධ්‍යානයලැබේ. විතියඛ්‍යානාදියෙහිද එපරිද්දෙන්ම විදර්ශණාවට හොනහා විතියඛ්‍යානාදිය ලැබීමට හෙතුභූතවූ කම්සථානාදිය "පඨවී පඨවී" යනාදීන් භාවනාවඩා විතියඛ්‍යානාදිය පටන් නෙවසඤ්ඤා නාසඤ්ඤායතනඛ්‍යානය දක්වා සියලු මහද්ගත ධ්‍යානයෝ උපදවන්නාහුවෙත්. මාගීභාවනානුභාවන්නාවූකල්හි මෙසේ "පඨවී පඨවී" යනාදීන් භාවනාවඩා මාගීඵලානුලාභිය හැක්කේය; මාගීඵ ලබනු කැමති යොගාවචරයා විසින් ඒ තමන් විසින් උපදවනලද්දාවූ ධ්‍යානයෙහි නෙත්‍රොම්මක සංඛාර ධර්මයන් ආරෝපණය කොට

"පඨවී අනිච්චං පඨවී අනිච්චං" යනාදී වශයෙන් හෝ "රූපං අනිච්චං රූපං අනිච්චං" යනාදීවශයෙන් හෝ නාමරූප ධර්ම සමුදය අනිච්ච දුක්ඛ අනාත්මාදී වශයෙන් විවිධාකාරයෙන් බලා මාගීඵලය ඉපදවිය යුත්තේය. විදර්ශණා නියමවශයෙන් ශුෂ්කවිදර්ශක පුද්ගලයෝ දෙදෙනාය යනු නවවිධ ලෞකික ධ්‍යානයම ලැබුවාවූ යෝගාවචරයෙක්වූවද ඒධ්‍යානය පාදක වශයෙන් හෝ සම්මර්ශනයවශයෙන් හෝ ධ්‍යානය අපේක්ෂා නොකොට මාගීඵලලබනු කැමතිකල්හි හුදෙක් තෙහේතුකමක සංඝාරධර්ම මාත්‍රයක්ම විදර්ශනාකොට මාගීඵලලබන්නාවූ පුද්ගලයාය චක්ඛුපාල සථවිරාදීන්මෙන් හාත්පසින් ධ්‍යානයක් නොලැබ නාමරූප ධර්මමාත්‍රයම විදර්ශනාකොට මාගීඵලලබන්නාවූ පුද්ගලයාය යනදෙදෙන ශුෂ්කවිදර්ශක පුද්ගලයෝ දෙදෙනාතම්වෙත්. එක් ශුෂ්කවිදර්ශක පුද්ගලයෙකු විසින් ලබනලද්දාවූ සොවාන් ඡකෘදාගාමී අනාගාමී අර්හත් යන මාගීඵල ධර්මයෝ කවරධ්‍යානය කට බඳුව හටගන්නාහුද යත්? ඒශුෂ්කවිදර්ශකයා විසින් උපදවන්නාවූ සෝවාන් මාගීය සියලු ධ්‍යානයන්ට මුල්වන්නාවූ ප්‍රථම ධ්‍යානයෙහි විද්‍යමානවූ විතර්ක විචාර ප්‍රීති සුඛ එකාග්‍රතා යන ධ්‍යානාඞ්ගපවකයකින් යුක්තවම උපදී. ඒශුෂ්කවිදර්ශකයා විසින් උපදවනු ලබන්නාවූ ඡකෘදාගාමී අනාගාමී අර්හත් යන මාගීත්‍රයද ප්‍රථමධ්‍යානයෙහි ඇත්තාවූ පඤ්චඞ්ගයෙන් යුක්තවම උපදී. ඒ ඒ මාගීඵලයෙහි මන්දප්‍රාඥයන්ට උපදින්නාවූ ඵලසිත් දෙදෙනාද තික්ඛප්‍රාඥයන්ට උපදනා ඵලසිත් තුන්දෙනාද මුඛයෙහි ඇත්තාවූ අවයව කැඩපත්තලයෙහි පිළිබිඹුවන්නාවූ මුඛනිමිත්තෙහි පෙණෙන්නාක්මෙන් ඒ ඒ මාගී චිත්තයෙහි යෙදුනාවූ ධ්‍යානාඞ්ගපවකය ඒ ඒ ඵලචිත්තයෙහිත් ඇත්තේමැයි. මේ ශුෂ්ක විදර්ශක පුද්ගලයන් දෙදෙනාගේ විභාගයයි.

ධ්‍යාන නියමයෙන් ලැබෙන්නාවූ සමථයානික පුද්ගලයන් දෙදෙනාගේ විභාගකවර යත්? නවවිධ ලෞකික ධ්‍යානලාභීවූ යෝගාවචර පුද්ගල තෙමේ මාගීය ලබනු කැමතිව භාවනාවඩන කල්හි තමා විසින් ලබන ලද්දාවූ ප්‍රථම ධ්‍යානයට සම්මැද ඒ ධ්‍යානයෙන් නැගිට තෙහේතුකසංඝාර ධර්ම සමූහය ඒ ප්‍රථම ධ්‍යානයෙහි ආරොපණයකොට "පඨමජ්ඣානං අනිච්චං" පඨමජ්ඣානං දුක්ඛං පඨමජ්ඣානං අනත්තා" කියා හෝ සබ්බෙ සඞ්ඛාරා අනිච්චා සබ්බෙ සඞ්ඛාරා දුක්ඛා සබ්බෙ සඞ්ඛාරා අනත්තා" යනුවෙන් හෝ භාවනා වඩා සෝවාන් මාගීය ලබන කල්හි තමා විසින් සම්වද්ධලද පාදක ප්‍රථමධ්‍යානයෙහි යෙදූ

නාවූ ධ්‍යානාඞ්ගයන්ට සම්‍යානවූ ධ්‍යානාඞ්ගපසකින් යුකතවූ ශ්‍රොතාපත්ති මාගීචිත්තයද, ඒ මාගී චිත්තයට සුදුසු පරිද්දෙන් එම මාගී චිත්තයෙහි උපදින්නාවූ ඵලසිත් දෙක හෝ තුණ හෝ ධ්‍යානාඞ්ගපසකින් යුකතවම උපදින්. මේ පුදගල තෙමේවනාහි පාදකධ්‍යාන මාත්‍රයක් ඇතිව සම්මසිත අජඣාසය දෙක නැත්තාවූ පුද්ගලයා නම්වේ.

මේ එක් ක්‍රමයකි.

තවද නවවිධ ලෞකික ධ්‍යානලාභීවූ පුද්ගල තෙමේ ධ්‍යානයකට සමතොවැද ප්‍රථමධ්‍යානයෙහිත් තෙහුමික සංසකාර ධර්මයන් ආරොපණයකොට "පඨමජඣානං අනිච්චං" යනාදීවශයෙන් හෝ "සබ්බෙ සඞ්ඛාරා අනිච්චා" යනාදීවශයෙන් හෝ සම්මර්ශණයකොට මාගීය ලබන්නේවේද ඒ පුද්ගල තෙමේ මාගීය ලබන්නාවූකල්හී තමා විසින් සම්මර්ශණයකළාවූ ධ්‍යානයට බඳුවූ ධ්‍යානාඞ්ගපචකයකින් සම්පූර්ණවූ ශ්‍රොතාපත්ති මාගීයද ඒ මාගීයට සුදුසු පරිද්දෙන් ධ්‍යානාඞ්ගපචකයකින් යුකතවූ ශ්‍රොතාපත්ති ඵල චිත්තයද ලබන්නේයි. මේ පුද්ගල තෙමේ වනාහි සම්මසිත ධ්‍යාන මාත්‍රයක්ඇතිව පාදක අජඣාසයදෙක නැත්තාවූ පුද්ගලයා නම්වේ.

මේ දෙවෙනි ක්‍රමයයි.

නවවිධවූ ලෞකික ධ්‍යානය ලැබුවාවූ අනික් පුද්ගල තෙමේ ප්‍රථමධ්‍යානයට සමවැද ඒ ධ්‍යානයෙන් නැගිට ඒධ්‍යාන යෙහි තෙහුමික සංසකාර ධර්මයන් ආරොපණයකොට ත්‍රිලක්ෂණසම්මර්ශණයකරන්නේවේද, ඒ පුද්ගලතෙමේ මාගීය ලබන්නාවූ කල්හී තමා සමවැද සම්මර්ශණයකළාවූ පාදකසම්මසිත ධ්‍යාන යට සමානවූ ධ්‍යානාඞ්ගපසකින් සම්පූර්ණවූ ශ්‍රොතාපත්ති මාගී ඵද ඒ මාගීවීථියෙහි උපදනා ඵලචිත්තයෝ දෙදෙන හෝ තුන් දෙන මාගී චිත්තයෙහිමෙන් ධ්‍යානාඞ්ගපසකින් යුකතවම උප දින්. මේ පුද්ගල තෙමේවනාහි පාදකසම්මසිත දෙක ඇත්තාවූ අධ්‍යාශය නැත්තාවූ පුද්ගලයා නම්වේ.

මේ තුන්වෙනි ක්‍රමයයි.

එසේම ලෞකික නවවිධ ධ්‍යානලාභීවූ අනික් පුද්ගල තෙමේ ප්‍රථමධ්‍යානයට සමවැද ඒ ධ්‍යානයෙන් නැගිට ඒ ධ්‍යාන

යෙහිම තෙහුමක සංස්කාර ධර්මයන් ආරෝපණයකොට ත්‍රිලක්ෂණ භාවනා වඩා දැන් මා විසින් පාදකකරගන්නා ලද්දවූ ධ්‍යානාඞ්ගපවනයකින් යුක්තවූ ප්‍රථමධ්‍යානයට බඳුවූ ශ්‍රොතාපත්ති මාර්ගය ලැබියේනම්, මෑනවැයි යන අධ්‍යාශය නියමකර ගන්නේවේද ඒ පුද්ගල තෙමේ මාර්ගය ලබන්නාවූකල්හි පාදක අධ්‍යාශය දෙකට සමානවූ ධ්‍යානාඞ්ගපසකින් යුක්තවූ ශ්‍රොතාපත්ති මාර්ගය ලබන්නේවෙයි. ඒ මාර්ග විපියෙහි උපදනා ඵල සිත්දෙක හෝ තුන හෝ මාර්ගයෙහිමෙන් පවාඞ්ගයකින් යුක්තවම උපදිත්. මේ පුද්ගල තෙමේ වනාහි පාදකඅජ්ඣාශය දෙක ඇත්තාවූ සම්මසිත ධ්‍යානය නැත්තාවූ පුද්ගලයානම්වේ.

මේ සූත්‍රාරූඪ ක්‍රමයයි.

තවද නවවිධවූ ලෞකික ධ්‍යානලාභිවූ පුද්ගල තෙමේ ප්‍රථමධ්‍යානය "අනිච්ච දුක්ඛ අනාත්මය"යි ලක්ෂණත්‍රයට නංවා සම්මර්ශණයකෙරේද මා විසින් දැන් සම්මර්ශණයකළාවූ ධ්‍යානයට බඳුවූ පවාඞ්ගයකින් යුක්තවූ ශ්‍රොතාපත්ති මාර්ගය ලැබියේනම් මෑනවැයි අධ්‍යාශය නියමකරන්නේවේද ඒ පුද්ගල තෙමේ මාර්ගය ලබන්නාවූකල්හි සම්මසිත අධ්‍යාශය දෙකට සදෘශවූ ධ්‍යානාඞ්ගපසකින් සම්පන්නවූ ශ්‍රොතාපත්ති මාර්ගයද, ඒමාර්ගයට සුදුසු පරිද්දෙන් ඵලචිත්තයද උපදනේයි. මේ පුද්ගලතෙමේ සම්මසිත අජ්ඣාසය දෙනම ඇත්තාවූ පාදකය නැත්තාවූ පුද්ගලයා නම්වෙයි.

මේ පත්‍යෙක ක්‍රමයයි.

අජ්ඣාසය මාත්‍රයක් ඇත්තාවූ පාදක සම්මසිතදෙක නැත්තාවූ පුද්ගලයෙක් කොලැබිය යුත්තේනේයි. ප්‍රථමධ්‍යානය පාදක කොටගෙණ විතියඛ්‍යානය සම්මර්ශණයකෙරේද ඒ පවප්‍රකාර ධ්‍යානයන් අතුරෙන් යම්කිසි ධ්‍යානයක් අජ්ඣාසයවශයෙන් නියමකොට නොගන්නේවේද එසේ නියමකොට නොගත්තේ වීනම් හීන ප්‍රණීත දෙඅදනා අතුරෙන් ප්‍රථම ධ්‍යානයට වඩා විතියඛ්‍යානය ප්‍රණීතවෙයි. විතිය ධ්‍යානයට වඩා තෘතීය ධ්‍යානය ප්‍රණීතවෙයි. තෘතීය ධ්‍යානයට වඩා චතුර්ථධ්‍යානය ප්‍රණීතවෙයි. චතුර්ථධ්‍යානයට වඩා පඤ්චමධ්‍යානය ප්‍රණීතවෙයි. එහෙයින් සම්මර්ශණයකළාවූ ධ්‍යානයට බඳුවූ ධ්‍යානාඞ්ග සතරකින් යුක්තවූ මාර්ගය ලබන්නේවෙයි. ඊට අනතුරුව ඵලචිත්තයද ඒ මාර්ගචිත්තයමෙන් ධ්‍යානාඞ්ග සතරකින් යුක්තවම උපදී.

මේ ක්‍රමය වනාහි පාදක සම්මසිත ඛ්‍යානාඛගවය අඛ්‍යාශය නියම නොකොට භාවනාවඛතකල්හි පාදක සම්මසිතඛ්‍යාන දෙදෙනාගේ හීන ප්‍රණීතභාවයෙන් ලැබෙන්නේයි. මේ වනාහි හීන ප්‍රණීත ක්‍රමයයි.

පාදකඛ්‍යානය ප්‍රණීතවිනම් පාදකඛ්‍යානයට බඳුවූ මාගීයද සම්මසිත ඛ්‍යානය ප්‍රණීතවිනම් සම්මසිත ඛ්‍යානයට බඳුවූ මාගීයද කියයුත්තේයි. මේ ක්‍රමය පරිද්දෙන් පාදකඛ්‍යානය හා සම්මසිත ඛ්‍යානය යන ඛ්‍යානඛගවය පමණක් පෙරළ පෙරළා ගතයුතුයි. ප්‍රථමඛ්‍යානය පටන් නෙවසඤඤා නාසඤඤායතන ඛ්‍යානය දක්වා පාදක සම්මසිත ක්‍රමය ගතයුත්තේයි.

මේද එක් ක්‍රමයකි.

ප්‍රථමඛ්‍යානය පාදකකොට ද්විතීය ඛ්‍යානය සම්මර්ශණය කෙළේවිනම් ඒඛ්‍යාන දෙදෙනා අතුරෙන් ප්‍රථමඛ්‍යානය අදහස් කෙළේනම් පාදකඛ්‍යානයට බඳුවූ ධ්‍යානාඛග පචකයකින් සම්පූර්ණවූ මාගීය හා ඒට සුදුසුවූ ඵලචිත්තයද උපදනේයි. මේ ක්‍රමය වනාහි පාදකඛ්‍යානය හා සම්මසිත ඛ්‍යානය යන දෙදෙනා අතුරෙන් එක්තරා ධ්‍යානයක් අඛ්‍යාශය නියමකොට ඒනියම කළ පරිද්දෙන් පාදකඛ්‍යානය නියමකෙළේවිනම් පාදකඛ්‍යානයට බඳුවූ මාගීය කියයුක්තේය. සම්මසිත ඛ්‍යානය නියමකෙළේවිනම්ද සම්මසිත ඛ්‍යානයට බඳුවූ මාගීය කියයුත්තේයි. ප්‍රථම ඛ්‍යානය සමාපජ්ජනවසී අධිඨානවසී වුට්ඨානවසී යන ත්‍රිවිධාකාරයෙන් අරුණෝදගමන කාලයෙහි පටන් ඉරමුදුන් වනකාලය දක්වා හෝ අධිඨානකළ පරිද්දෙන් සමවදිනේයි. අරුණෝදයෙහි පටන් ඉරමුදුන්වන කාලය දක්වා මේ කාලය මුලුල්ලෙහි අනික් චිත්තයක් නොඉපද ධ්‍යාන ජවනයන්ගෙන් ඉක්මවන්නේයි. ඉරමුදුන්වූ කාලයෙහි අධිෂ්ඨානකළ පරිද්දෙන් ධ්‍යාන ජවනයන් සිඳ භවාඟයෙහි වැටුනුකල්හි සුදුසු පරිද්දෙන් අන්‍යවූ විපිචිත්තයෝ උපදනාහුය. කුමක්හෙයින් මාගීය ඉපදවීමට භාවනා නොකරණකල්හි ධ්‍යානයට සමවදිනේදයත්? මහද්ගතධ්‍යාන තෙමේ ක්ලේශ ධර්මයන් විෂ්කම්භන ප්‍රහාණවශයෙන් ප්‍රහාණය කටහැකි බැවින් නීවරණ ධර්මයන්ගේ සන්සිඳීමවීමෙන් සමාධියගේ බලවත්බවෙයි. සමාධිය බලවත්වූකල්හිම මාගීය ඉපදවීමට සුකරවෙයි. එහෙයින් ධ්‍යානලාභීවූ යොගාවචර තෙමේ

ඒ ධ්‍යානය ලැබූකල් තැන් පටන් බොහෝ කාලයක් මුලුල්ලෙහි අරුණෙදය පටන් මධ්‍යාහ්නය දක්වා ධ්‍යානයට සමවැද වැද සිටිරවූ බලවත්වූ සමාධිය ඇතිතෙරෙයි. සමාධිය වනාහි මාගීයට පාදයක්වැනිතෙයින් පාදකධ්‍යානයයි කියනලදී. ලොකොත්තර ධ්‍යානයයන ව්‍යවහාරය ලෞකික ධ්‍යානය සඳහාමකරනලදී. නව ලොකොත්තර ධර්මයෙන් අන්‍යවූ ලොකොත්තර ධ්‍යානයෙක්නම් මුඛ්‍යවශයෙන් නැත්තේමැයි. මේ කියනලද්දවූ නිශ්චයවනාහි ආචාර්‍ය්‍ය බුඛඝොෂ මහාසථවිරයන්වහන්සේ විසින් ඒ ඒ අටුවා යෙහි කියනලද්දවූ දීඝිවිසභාරයන්ගෙන් සංග්‍රහකොට ගන්නා ලදී. පුරාතන අභීසඨාචාර්‍ය්‍යවරයෝ වනාහි ලෞකිකධ්‍යාන යන් අතුරෙන් යම්කිසි ධ්‍යානයක්ම සම්පිණ්ඩිත අධ්‍යාශයවශ යෙන් නියමකරන්නාහු නම්වූ පාදකධ්‍යානයම ප්‍රධානහෙයින් පාදකධ්‍යානයට බඳුවූ මාගීයද ඒමාගීයට සුදුසු ඵලයද ලැබෙන්නේයයි කියත්. නොහොත් ලෞකික ධ්‍යානයන් අතුරෙන් අතිශයමිතවූ යම්කිසි ධ්‍යානයක් පාදක අජ්ඣාසය වශයෙන් නියමකරන්නාහු නම්වූ සම්මසිත ධ්‍යානයම ප්‍රධානහෙයින් සම්මසිත ධ්‍යානයට බඳුවූ මාගීය හා තත් සදෘශවූ ඵලයද ලැබෙන්නේයයි කියති නොහොත් ලෞකික ධ්‍යානයන් අතුරෙන් යම්කිසි ධ්‍යානයක් පාදක හෝ සම්මර්ශණය කෙළේ නම්වූ අජ්ඣාසයම ප්‍රධාන වනහෙයින් අජ්ඣාසය ධ්‍යානයට බඳුවූ මාගීය හා තත් සදෘශවූ ඵලයද ලැබෙන්නේයයි කියති. මේ වනාහි සමථයානිකයන් දෙදෙනාගේ විභාගය යි.

නවවිධ ලෞකික ධ්‍යානය ලැබුවාවූ පුද්ගලතෙමේද තමා විසින් ලබනලද්දවූ ඒ ධ්‍යානයන් පාදක හෝ සම්මර්ශනය හෝ නොකොට ත්‍රෛභූමක සංඝස්කාර ධර්මයන් අතුරෙන් යම්කිසි ධර්මයක් ලක්ඛණත්‍රයට නන්වා සම්මර්ශණය කෙරේද ඒ පුද්ගල තෙමේ මාගීය ලබන්නාවූවන්ගේ ලෞකික ප්‍රථමධ්‍යානය හා සදෘශවූ ධ්‍යානාඞ්ගපඤ්චකයෙන් සම්පන්නවූ මාගීය හා තත් සදෘශවූ ඵලයද ලබන්නේයි. මේ පුද්ගල තෙමේ විදර්ශණා නියම පුද්ගලයායි. "පාදක ධ්‍යානය" යනු කුමකට පාදකවන්නේද යත්? වුඩ්ඨානගාමිනී විදර්ශණාවට පාදකවන්නේයයි. ඒ පාදකවූද පාදකානුවූද ලෞකිකවූද ත්‍රෛභූමක සංඝස්කාර ධර්මයන් ලක්ඛණත්‍රය ආරොපණයකොට භාවනාකරන්ට පටන් ගත් තැන් පටන් මාගීයට පළමු උපදනාවූ ගොත්‍රභූ චිත්තය දක්වා හටගන්නාවූ සියලු ජවනයෝ ත්‍රිවිධ ලොකයෙන් නැඟිට යාමට හෙතුවන

හෙයින් උපචාර වශයෙන් වුථානගාමිනී විදර්ශණා ජවනයයි සම්මතකරණ ලද්දාහුය. මේ වනාහී ලොකොත්තර චිත්තය න්ගේ සංක්ෂෙප ප්‍රභාගයයි.

අභිධම්මාර්ථ සංග්‍රහ නම්වූ ප්‍රකරණයෙහි චිත්ත සංග්‍රහ විභාග නම්වූ පළමුවෙනි පරිච්ඡෙදය නිමි.

එකුපපාද නිරොධාව එකාලම්බණ වත්ථුකා,
වෙතො යුත්තා විපඤ්ඤුස්ස ධම්මා චෙතසිකා මතා.

කථං? එසෙසා, වෙදනා, සඤ්ඤා, චෙතනා, එකග්ගතා, ජීවිතින්ද්‍රියං, මනසිකාරොචෙති සත්තිමෙ චෙතසිකා සබ්බචිත්ත සාධාරණා නාම.

විතක්කො, විචාරො, අධිමොක්ඛො, විරියං, පීති, ඡන්දො චාතිජ ඉමෙ චෙතසිකා පකිණ්ණකා නාම. එවමෙතෙ තෙරස චෙතසිකා අඤ්ඤ සමානාති වෙදිතබ්බා.–

එකුපපාද නිරොධාව, සිත හා එක්ව ඉපදීම හා නිරුඬ වීම ඇත්තාවූද; එකාලම්බණවත්ථුකා, සිතට සමාන අරමුණු ඇත්තාවූද සිතට සමානවූ ආශ්‍රයස්ථාන ඇත්තාවූද; වෙතො යුත්තා, සිතෙහි යෙදුනාවූ; විපඤ්ඤුසධම්මා, දෙපණසක් සභාව ධර්මයෝ; චෙතසිකා, චෙතසිකනම ඇත්තාහුයයි; මතා, දන්නාලද්දාහුය; කථං? මතා; කෙසේ දන්නාලද්දාහුද යත්? එසෙසාව, අරමුණට වැදහැන්ම ලක්ෂණකොට ඇත්තාවූ එස්ස චෙතසිකයෙක්ද; වෙදනාව, අරමුණුරස විඳහැණීම ලක්ෂණ කොට ඇත්තාවූ වෙදනා චෙතසිකයෙක්ද; සඤ්ඤාව, අර මුණු සභාව නියමකරගැණීම ලක්ෂණකොට ඇත්තාවූ සඤ්ඤා චෙතසිකයෙක්ද; චෙතනාව, අරමුණෙහි සම්ප්‍රයුක්ත ධර්මයන මෙයෙයීම ලක්ෂණකොට ඇත්තාවූ චෙතනා චෙතසිකයෙක්ද; එකග්ගතාව, එක අරමුණක්ම ගන්නාහෙයින් ඒ අරමුණෙහි පිහිටුවම හා නාන් අරමුණෙහි නොදැම්ම ලක්ෂණකොට ඇත් තාවූ එකාග්‍රතා චෙතසිකයෙක්ද; ජීවිතින්ද්‍රියව, සහජාතවූ නාම රූපධර්මයන් ආරක්ෂාකරීමය, සහජාතවූ නාමරූප ධර්මය න්ට අධිපතිබවකිරීම ලක්ෂණකොට ඇත්තාවූ ජීවිතෙන්ද්‍රිය චෙතසිකයෙක්ද; මනසිකාරොව, අරමුණ මෙනෙහිකිරීම ලක්ෂණකොට ඇත්තාවූ මනස්කාර චෙතසිකයෙක්ද; ඉත ඉම්නාපහෙදෙන, මේ කියනලද ප්‍රභෙදයෙන්; ඉමෙ සත්තචෙත සිකා, මේ චෙතසික ධර්මයෝ සත්දෙනා යුක්ත; සබ්බචිත්ත සාධා

රණ නාම, සබ්බ චිත්ත සාධාරණ චෛතසිකනම් ඇත්තාහු නොහොත් සියලු චිත්තයන් හා සාධාරණ බැවින් සබ්බචිත්ත සාධාරණ චෛතසික නම් ඇත්තාහු: හොනති, වෙත්.

චිත්තක්කා, සම්ප්‍රයුක්ත ධම්මයන් අරමුණට අභිමුඛකොට නැන්වීම **ලක්ඛණ**කොට ඇත්තාවූ චිත්තකී **චෛතසික**යෙක්ද; විචාරොව, ඒධම්මයන් අරමුණෙහි හැසිරවීම ලක්ඛණකොට ඇත්තාවූ විචාර චෛතසිකයෙක්ද; අධිමොක්ඛොව, අරමුණුනිශ්චය කිරීම ලක්ඛණකොට ඇත්තාවූ අධිමොක්ඛ චෛතසිකයෙක්ද; විරියව, සම්ප්‍රයුක්ත ධම්මයන්ට රුකුල්දීම ලක්ඛණකොට ඇත්තාවූ විරිය චෛතසිකයෙක්ද; පීතිව, අරමුණෙහි පිණවීම ලක්ඛණකොට ඇත්තාවූ ප්‍රීති චෛතසිකයෙක්ද, ඡන්දොව, කරනු කැමති බැව් මාත්‍රයක් ලක්ඛණකොට ඇත්තාවූ ඡන්දචෛතසික යෙක්ද; ඉති ඉමිනාපභෙදෙන, මේ කියනලද ප්‍රභෙදයෙන්; ඡඉමෙ චෙතසිකා, මේ චෛතසික ධම්මයෝ සදෙන; පකිණ්ණකානාම, නොයෙක් චිත්තයෙහි නොයෙක් ප්‍රකාරයෙන් විසිර පවත්නාහෙයින් පකිණ්ණක චෛතසිකනම් ඇත්තාහු; හොනති වෙත්; එවං, මෙසේ; එතෙතෙරස චෙතසිකා, මේ **තෙළෙස්** චෛතසිකයෝ; අඤ්ඤසමානාති, අඤ්ඤසමාන චෛතසිකයෝ යයි නොහොත් ශොභන චිත්තයෙහි යෙදෙන කල්හි අශොභන චිත්තයෙන් අන්‍යවූ ශොභන චිත්තයන් හා සමානභෙයින් අශොභන චිත්තයෙහි යෙදෙනකල්හි ශොභන චිත්තයෙන් අන්‍යවූ අශොභන චිත්තයන් හා සමානවනභෙයින්ද අඤ්ඤසමාන චෛතසිකනම් ඇත්තාහුගයි; වෙදිතබ්බා, දතයුත්තාහුයි.

සතර පරමාර්ථයන් අතුරෙන් "චිත්තං" යන උද්දෙස පදයාගේ නිද්දේශය සැකෙවින් දක්වා දැන් වනාහි "චෙතසිකං" යන උද්දෙශපදයාගේ නිද්දේශය දක්වන්නාවූ අනුරුද්ධාචාරීන් වහන්සේ "එකුපපාද නිරොධාව" යනාදී ගාථාව කිහ. මෙහි අභිප්‍රාය:-සපගීදිවූ **දෙපණසක්** සවභාව ධම්මයෝ තුමූ සිත හා **එක්ව** හටගැණීමය, සිත හා එක්ව බිඳීමය, සිත හා එක්ව එක් අරමුණක **එල්ලීමය**, සිත හා සමානවූ නිශ්‍රය **ඇතිබවය** යන මේ සම්ප්‍රයොග ලක්ඛණ සතරින් යුක්තවූකල්හිම චෛතොයුත්ත නම්වෙයි. චිත්තයාගේ උපපාදඨිති භඞ්ග යන ක්ෂණත්‍රය අතුරෙන් චිත්තය හටගන්නා කල්හිම ඉදිරිපසුනොවී තමා හා සම්ප්‍රයුක්තවූ චෛතසික ධම්මයෝද හටගන්නාහුවෙති. මෙසේ **භූටගැණීම එකුපපාද ලක්ඛණ**නම්වෙයි. චිත්තය නිරුද්ධවන

කල්හි ඒ හා සමග යෙදුනාවූ චෛතසික ධර්මයෝද ඉදිරිපසු නොවී නිරුඛිවීමෙයි. මේ වනාහි එක නිරොධ ලක්ෂණයම වෙයි. චිත්තය වනාහි රූපාලම්බණය, සද්දාලම්බණය, ගන්ධාලම්බණය, රසාලම්බණය, ඵොට්ඨබ්බාලම්බණය, ධම්මාලම්බණය, ප්‍රත්‍යුත්පන්න අතීතානාගත ධර්මයෝය, කාලවිමුක්තවූ ප්‍රඥප්තිය චිත්ත චෛතසික සංඛ්‍යාත නාමධර්මය ආඛ්‍යාත්මික බාහිරධර්මය නිර්ඵාණය යන මේ ධර්මයන් අතුරෙන් යම්කිසි ධර්මයක් අරමුණු කොටගෙණ උපදනේයි. තමා හා සම්ප්‍රයුක්තවූ චෛතසිකයෝද රූපාලම්බණය පවත් නිර්ඵාණය අවසන්කොට ඇත්තාවූ චිත්ත යාගේ අරමුණක්ම අරමුණුකරත්. මේ වනාහි එකාලම්බණ ලක්ෂණයයි. චක්ඛුර්විඤ්ඤාණයෝ දෙදෙන වනාහි චක්ඛුප්පසාද සංඛ්‍යාතවූ වසතුව නිශ්‍රයකොටගෙණ උපදිත්. ඒ චක්ඛුර්විඤ්ඤාන චිත්තයෙහි යෙදුනාවූ සපඤ්ඤාදිවූ සත්තිත්තසාධාරණ චෛතසිකයෝ සත්දෙනද ඒ චක්ඛු වසතුවම නිසා පවත්නාහුමෙවෙති. සොතවිඤ්ඤත්ත ධාතුය, ඝාණවිඤ්ඤත්ත ධාතුය, ජිව්හා විඤ්ඤත්ත ධාතුය, කායවිඤ්ඤත්ත ධාතුය යන මේ විඤ්ඤත්තධාතු සතර දෙනද චක්ඛුවසතුවට කී නයින් දතයුතුයි. මනොධාතු මනොවිඤ්ඤත්තධාතු සංඛ්‍යාතවූ අවශෙෂවූ එකුන් අසුවක් චිත්තයෝ තුමූ හෘදය වසතුව නිසා පවත්නාහුවෙති. ඒ සිත් හා උපදනා චෛතසිකයෝද එසේම හෘදය වසතුව නිසා පවතිත්. මේ වනාහි එක වසතුක ලක්ෂණයයි. මේ සතර සම්ප්‍රයොග ලක්ෂණ සතරයයි දතයුතුයි. සම්මොහවිනොදනියෙහි විභඞ්ගපාළියෙහි "සුඛාය වෙදනාය සම්පයුත්තෙනා ධම්මා" යනාදී පාලියෙහි 'සං' ශබ්දයෙන් ඉදිරිපසුනොවී චිත්ත චෛතසිකයන්ගේ එකවිට ඉපදීමද, "ප" ශබ්දයෙන් මේ සතර ප්‍රකාරයද දක්වනලද්දේයි. කුමක්හෙයින් මේධර්මයන්ට චෛතසිකයයිව්‍යවහාරකෙරෙත්දයත්? "චිත්තෙන සහවත්තන්තීති චෙතසිකා, චෙතසිනියුත්තන්වා චෙතසිකං" යනාදී වචනාර්ථ පරිද්දෙන් සිත හා සමග හටගන්නාහෙයින්ද, සිතෙහි නියුක්තවූහෙයින්ද, චෛතසිකයයි ව්‍යවහාරකරන්නේනම් චිත්තජරූපයද සිත හා සමග හටගන්නාහෙයින් චෛතසිකයයිකුමක්හෙයින්ව්‍යවහාර නොකරන්නේදයත්? මෙසේ සිත හා සමග හටගත් පමණකින් චෛතසිකයයි නොකියයුත්තේයි. මේකී සම්ප්‍රයොග සතරින් සම්පුණ්ණකල්හිම චෛතසිකයයි කියයුතුවෙයි. සිත හා සමග හටගන්නා බැවින් චෛතසිකයයි කියන්නේනම් චිත්තජ රූප තෙමේ එකුපපාද මාත්‍රයකින් සමානව එකනිරොධ එකාලම්බණ ලක්ෂණවශෙන් අසමානවෙයි. කායවිඤ්ඤත්තී වචීවිඤ්ඤත්තී යන රූපයන් දෙදෙන වනාහි "චිත්තානුපරිවත්තිනො ධම්මා," විඤ්ඤත්තිහේතුකා ධම්මා"

යනාදී දුකයෙහි සිතට සමානව ඉපිද සිතට සමානව නිරුඬ වනහෙයින් ඒ රූපවල චෙතසිකයන්ට ඇතුළත් නොවන්නේ දැයි ප්‍රශ්නයක්වේ. ඒ රූපවල ලක්ෂණවලින් සමානවුවද එකාලම්බණ එකවසතුක යන වලයෙන් අසමානවෙයි. එහෙයින් ඒ රූපවලද නොඇතුළුකිවෙයි. චිත්තයවනාහි උපපාදඨිති භඞ්ග යන ලක්ෂණත්‍රයකින් යුක්තවෙයි. විඤ්ඤත්ති රූපවල හැර අවශෙෂවූ චිත්තජ රූපයෝ වනාහී එබඳු ලක්ෂණයන් එක් ක්ෂණසකට හෝ මහාචිත්තක්ෂණයන් සතළොසකට හෝ ආයුෂ ඇතිවෙයි. එපමණක් නොව චිත්තජරූපයෝ අනාරම්මණික වෙති. හෙවත් අරමුණු නොඇතුළුකිවෙති. චිත්තය වනාහි අරමුණුඇතුළුකිවෙති. තවද චිත්තයෝ වනාහි චක්ඛු වසතු ආදීවූ වසතු ආශ්‍රයකොටගෙණ පවතිත්. උපාදරූපවූ චිත්තජ රූපයෝ වනාහි තම තමාගේ කලාපයෙහි සතරමහා භූතයන් ආශ්‍රයකොටගෙණ පවතිත්. මෙසේ චිත්තජ රූප තෙමේ එකු පාද ලක්ෂණමාත්‍රයකින් යුක්තව එකනිරොධ එකාලම්බණ එකවසතුක යන ලක්ෂණත්‍රයෙන්ම විසදෘශවෙති. එහෙයින් චිත්ත ජරූපයෝ චෛතසික නොවෙත්. ඒ චෛතසිකයෝ තුමූ කෙතෙක් ප්‍රභෙද වන්නේදැයි යන වොද්‍යය සඳහා "විපඤ්ඤස විධං" යනු කිහ: එහි අභිප්‍රාය:—චෛතසිකයෝ දෙපණස් වැදෑ රුම්වෙත් යනුයි. ඒ "විපඤ්ඤස විධං" යන සංඛ්‍යාවගේ සංඛෙයය කවරේද යන වොද්‍යයට පරිහාරවශයෙන් "එසෙසා-පෙ-පවිසන්තිමෙ චෙතසිකා සොභනාති වෙදිතබ්බා" යන පාඨය කිහ. ඒ දෙපණස් චෛතසිකයන් අතුරෙන් තෙළෙස් චෛතසිකකෙනෙක් අන්‍ය සමාන රාශියයි කියාද, තුදුස් චෛතසිකා කෙනෙක් අකුශල රාශියයි කියාද පස්වසි චෛතසික කෙනෙක් ශොභන චෛතසික රාශියයි කියාද රාශිත්‍රයකට බෙදෙන් නේයි. ඒ රාශින් අතුරෙන් අකුශල රාශියට හා ශොභන රාශි යට හා පුළුමෙහි පළමුකොට අඤ්ඤසමාන රාශිය දක්වනලදි. ඒ අඤ්ඤසමාන රාශියෙහිද සප්ඵිත්ත සාධාරණ චෛතසිකයෝ සත්දෙනය, ප්‍රකීර්ණක චෛතසිකයෝ සදෙනයයි යන තෙළෙස අඤ්ඤසමාන රාශිනම්වේ. ඒ අඤ්ඤ සමාන රාශියෙහි සපශීය කුමක්හෙයින් දක්වනලද්දේද යත්? සිතෙහි හටගන්නාවූ සියලු චෛතසිකයෝ ඉඳිරිපසු නොවී එකවිට උපදින්නාහු නමුදු චිත්ත චෛතසික ධර්මයන් අරමුණෙහි වැදහැන්මහැමට පළමුව සිඳුවය යුතුහෙයින් සියලු චෛතසිකයන්ගේ ඒ ඒ කෘත්‍යවශයෙන් යථා ක්‍රමයෙන් සිඳුවියයුතුහෙයින් සපශීය පටන් ගියලු චෛතසික ධර්මයන්ගේ පෙළ්මෙළ්න් යොදවාලද්දී දැනුගයි දතයුතුයි. සප්ඵිත්ත සාධාරණවූ සත්දෙනා අතුරෙන්

කුමක්හෙයින් සපඝීයයි කියන්නේද යත්? අරමුණව වැදගන්නා සුවභාව ලක්‍ෂණකොට ඇතිහෙයින් සපඝීයයි කියනලද්දේයි. අරමුණට කෙසේ වැදගන්නේද යත්? ඇඟිල් ඵල කන්නහු දුටු වාවූ පුරුෂයාගේ මුඛයෙහි කෙල ඉනීමක්මෙන්ද යම්කිසි පුරුෂයෙක් උස්වූ ගසකට නැගී සියුම්වූ අතු පතර ආදියට නගින්නාවූ බව දක්නාවූ බිම සිටින පුරුෂයාගේ හෘදය වසතුව සැළී මහාරොමෝද්ගමනයදවී වැටෙන්නේයයි සිතා භයවන්නාවූ පුරුෂයෙකුමෙන්ද සණගලෙහි වැලිදමා ආවුධ මුවහත්කරන කල්හි ලඟ සිටියාවූ පුරුෂයාගේ හෝ හුනබට ආදිය ආවුධ යෙන් මදින්නාවූ පුරුෂයාගේ ලඟ සිටියාවූ හෝ පුරුෂයාගේ දත් හිරිවැටීමක්මෙන්ද, මේ සපඝීයාගේ වැදගැණීම දතයුතුයි. මේ උපමාවන්හි දක්වූ න්‍යායෙන් සපඝීය සඞ්ඛ්‍යාතවූ නාම ධර්මය හිකති ආදියෙහි හිරුරැස් වැදගැණීමක්මෙන් සසම්ප්‍රයුක්තවූ චිත්තය අරමුණෙහි හැපීම සපඝීයයි දතයුත්තේයි. මෙහි එකාන්තයෙන් වැදගන්නාවූ රූපධර්මයට බඳු වසතුවක් නැත්තේ නමුදු ඉතා සියුම්වූ නාමධර්ම සවභාවයක් අරමුණෙහි වැදගන්නා ආකාරයෙන් පවත්නේයි. මේ අර්ථයට කී උපමාවයි. සපඝීවේදනා දෙදෙන මිශ්‍රවහටගන්නාකල්හි ඒ දෙදෙනාගේ සවභාව දැක්වීමට මින්මතු උපමාවක් දක්වනු ලැබේ. වේදනා තොමෝ ආළඹණයාගේ රසය අනුභවකිරීම ලක්‍ෂණකොට ඇත්තිය. සපඝී තෙමේ අරමුණට වැදගැන්ම ලක්‍ෂණකොට ඇත්තේයි. එහෙයින් සපඝීය හා වේදනාවඑක්වූ කල්හි නිඝණ්ඨාවියෙකුට බඳු උපමා ඇත්තේයි කුමක්හෙයින්ද යත්? නිඝණ්ඨාවි තොමෝ වන ලැහැබ් ආදියෙහි ආහාර සොයමින් ගන්නාවූකල්හි වෘක්‍ෂයන්ගේ අතු පතර තමාගේ නිඝණ්ඨශරීරයේ වැදගැන්මද ඔහු ලේ බොන මැස්සන් වැදගැන්මද අතිශයින් භයවන්නේයි. ඉදින් අතුපතරාදියක් වැදගැණීමක් හෝ මැසි මදුරු ආදීන් ශරීරයෙහි වැසීමක් හෝ විනම් මහත්වූ දුක් වේදනාවක් අනුභවනොවෙයි. එහෙයින්සපඝී තෙමේ නිඝණ්ඨාවියෙකුට බඳු උපමා ඇතිවෙයි. වනාදියෙහි ඇවිදිනාකල්හි අතුපතර වැදීමක් හෝ මැසි මදුරු වැසීමක් හෝ සිඹවූකල්හි හටගන්නාවූ වේදනාව වේදනා චෛතසිකයට බඳුවෙයි. එහෙයින් නිඝණ්ඨාවී තොමෝ වනයෙහි ඇවිදිනාකල්හි අතුපතර හැපීමෙන් හා මැසි මදුරුවන් වැහීමෙන්දවන්නාවූ දුක් වේදනා තොමෝ මේසපඝීයට හා වේදනාවට බඳු උපමා ඇතිවෙයි. ආයුෂ්මත් අනුරුඬාවෝරින්වහන්ස! යුස්මත්හු මෙසින් වේදනාව රසානුභවනය කරන්නේයයි

කියේය. එහෙයින් සපශීර්ෂවූ සෙසු චෛතසිකයෝ ආලම්බණරසානුභවත්වය නොකරන්නාහුදැයි චෝදනාවක්වේ. ඊට පිළිතුරු මෙසේයි. සපශීර්ෂවූ සියලු චෛතසිකයෝම අරමුණුරස අනුභවකරන්නාහුයයි. එතකුදුවුවත් වෙදනාව මෙන් සවිප්‍රකාරයෙන් අනුභව නොකෙරෙති. වෙදනාව වනාහි ඒකාවර භාවයෙන් අරමුණුරස අනුභවකරයි. සපශීර්ෂවූ චෛතසිකයෝ වනාහි එකාදෙසයකින් අරමුණුරස අනුභවකෙරෙති. එහෙයින් වෙදනාවගේ හා සපශීර්ෂවූ අන්‍ය සියලු චෛතසිකයන්ගේත් අරමුණුරස අනුභවකිරීම "සුභොජන රසඤ්ඤාදකෝ රාජාවිය" යන උපමාවෙන් දතයුතුයි. එ එසේමැයි. මධුර ලවණ කටුක තික්තාදී නානාග්‍රරසයෙන් යුක්තවූ රසභොජනය එළවූකල්හි ඒ රසභොජනයෙහි විසඇත්තේදෝහොයි පරීක්ෂාකරනු පිණිස අරක්කැමි අමාත්‍යයා විසින් පළමුකොට ඒ රාජභොජනයෙහි සියලු ද්‍රව්‍යයන්ගෙන් මද මද අනුභවකොට විෂනැතිබව දැනගත්කල්හිම රජතෙමේ ඒ රාජභොජනය රිසිසේ අනුභවකෙරෙයි, එපරිද්දෙන්ම සපශීර්ෂවූ අවශෙෂ සියලු චෛතසික ධර්මයන්ගේ ආලම්බණ රසානුභවනය රාජභොජනය දිවඟා බලන්නාවූ අරක්කැමි අමාත්‍යයාගේ අනුභවයක්මෙන්ද වෙදනාවගේ ආලම්බණ රසානුභවනය රජතුගේ රිසියනතාක් රාජභොජනය අනුභවකිරීමක් වැනිවේ. එහෙයින් ආලම්බණරසානුභවනයෙහි වෙදනාව රජෙකුමෙන්ද සපශීර්ෂවූ අරක්කැමි අමාත්‍යයාමෙන්ද දතයුතුයි. සංඥාව වනාහි ආලම්බණ සඞ්ඛාත ඇඳිනීම ලක්ෂණකොට ඇත්තිය ඒ කෙසේදයත්? සංඥා තොමෝ වනාහි සුදුය රතුය නිල්ය කසාවන්ය යනාදී ඒ ඒ ආලම්බණයන්ගේ සලකුණුගැණීම් මාත්‍රයකින්ම අරමුණකදුනයි. එසේදවුවත් කුමක්හෙයින් සුදුවූයේද කුමක්හෙයින් රතුවූයේද යනාදීවශයෙන් ඒ ඒ ආලම්බණලක්ෂණයන්ගේ උපපත්තිනොදනී කුමක්මෙන්දයත්? ලදරුවෙක් පළමුකොට අං ඇත්තාවූ ගවයෙක් දැක මැනියෙනි! මූ කවර සතෙක්දැයි විචාළකල්හි පුත! මූ ගවයායයි මව උත්තරදෙයි. ඉක්බිති ඒ ලදරු තෙමේ මෙබඳු අං දෙකක් ඇත්තාවූ සත්වයා ගවයායයි ඇඳිනගනී. එතකුදුවුවත් ඒ ගවයා ගවදෙනගෙන් හටගන්නේද අස්වෙළඹෙකුගෙන් හටගන්නේද ඇතින්නියෙකුගෙන් හටගන්නේද මේ මහා පෘථිවියෙන් හැරගන්නේදැයි විශෙෂයක් නොදනී. එහෙයින් මේ සංඥා තොමෝ නැවත දුටුකල්හි ඇඳිනගන්නා පිණිස සලකුණක්ගෙණම ඇඳිනගන්නේවෙයි. නොහොත් සංඥාව වඩුවෙකුට බඳුවූ උපමා ඇත්තේවෙයි. වඩුවෙකුට කෙසේ සමානවන්නේද යත්?

පැතලි රූපාදිය කපන්නාවූ වඩුතෙමේ පළමුකොට දණ්ඩක් හෙණ රූපයක් කපනු කැමතිව දැලි නුල් ආදියෙන් මෙතැන්හී හිසවෙයි. මෙතැන්හී අත් පා ආදියවෙයි. යනාදීන් සලකුණු කිරීම් මාත්‍රයක් කෙරෙයි. එතකුදුවුවත් ඒ රූපය නොනිමියේ ඇවයි. එසේම සංඥාවද නීල පීතාදි සලකුණුගැණීම් මාත්‍රයක් කොට අරමුණු හැඳිනීම් මාත්‍රයක් කෙරෙයි. අං ඇති ගවයෙක් දුටු ලදරු තෙමේ ඒ ගවයා කවර හෙතුවකින් ගටගත්තේද යනබව හෝ රූපයක් ඉදිකරනු කැමති වඩුතෙමේ සලකුණු කිරීම් මාත්‍රයක් විනා ඒ රූපයාගේ සවහන්මෙන් නොකළහැකි වාක්මෙන්ද මේ සංඥාව සලකුණක්කොට අරමුණුහැඳිනීම් මාත්‍ර යක්කෙරෙයි. සංඥාවට විඤ්ඤණය එනතුවූකල්හි ගවයා ගව දෙනෙහෙ උපන්නේයයි. දූනගන්නාක්මෙන්ම මේ නාමරූප ධර්මයන්ගේ විශෙෂ හැඳිනගැණීම කෙරෙයි. ඒ සංඥා විඥාන දෙකට ප්‍රඥාව එක්වූකල්හි ඒ ගවයා අසවල් ජාතියෙහි ගම්යෙ ක්ය මෙබදු ජවඇත්තාවූ වර්ණයක යනාදී විශිෂ්ඨාකාර දූනගන් නාක්මෙන් සංඥා විඥානයන්ට ප්‍රඥාව එක්වූකල්හි මේ නාම රූපදෙක අනිත්‍යය දුඃඛය අනාත්මයයි යනාදී අනෙක ප්‍රකාර යෙන් දූන මාර්ගඵලාධිගමය පවා ඵලවිය හැකිවෙයි. ගවයෙක් නුදුටුවාවූ ලදරු තෙමේ පළමු ගවයා දුටු දවස්හි ඒ ගවයාගේ අං දෙක ගවයාබවම සලකුණයයි දූන හැඳිනගත්තාට පසු නැවත ගවයා දුටු දවසක ඒ අංදෙක සලකුණක්කොටගැණීම් වන්නේද නොවන්නේදැයි සැකයක් ඉපදිය යුතුවෙයි. ඉදින් පළමු දවස්හි ඒ අරමුණ දූක සංඥාව උපන්කල්හි නැවත නැවත ඒ අරමුණ දුටුකල්හී සංඥාවගේ ඉපදීම නිෂ්ප්‍රයොජනදෝ හෝයි සැකනවයුතුවෙයි. එසේ සැකනොසිතියයුත්තේයි. යම් වසතුවක් දවසකට දහස්වරක් දුටුයේ නමුදු පළමුවාරයෙහි ගන්නාවූ සලකුණෙන් දෙවෙනි වාරයෙහි හැඳිනීමසිඛ්ධකරෙයි. දෙවෙනි වාරයෙහි ගන්නාවූ සලකුණෙන් තුන්වෙනි වාරයෙහි හැඳිනීම සිඛ්ධකෙරෙයි මෙසේ පළමු පළමු ගන්නාලද සංඥෙ තයෝ නැවත නැවත දුටුකල්හි හැඳිනීමට ප්‍රත්‍යයවෙති. එහෙ යින් සංඥාවන්ගේ ඤිසි නොලැබීමක් නොවන්නේයි. චෙතනා තොමෝ අරමුණෙහි සම්ප්‍රයුක්ත ධර්මයන් තා සපරිකරව තා රස විඳුව තා හැඳිනගණුවසි යනාදීන් සියලු චෙතසික ධර්ම යන් ඒ ඒ කෘත්‍යයෙහි මෙහෙයන්නාවූ ධර්මය චෙතනානම් වෙයි. එහෙයින් චෙතනා නොමෝ යුඛයෙහි බලනායකයෙක් මෙන් දතයුතුයි. යම්සේ යුඛයෙහි බලනායක තෙමේ තමාගේ බලසෙනග මෙහෙයමින් තමාත් යුඛා යුඛභන්නබව යුඛකෙරේ

ද එපරිද්දෙන් චෙතනා තොමෝ තමා හා සම්ප්‍රයුක්තවූ ධම්
යන් ඒ ඒ කටයුත්තෙහි යොදවමින් තෙමේත් අරමුණෙහි
යෙදෙන්නේවෙයි. නොහොත් පාඨශාලාවෙක්හි ප්‍රධාන ශිෂ්‍ය
යෙක්මෙන්ද කම්මාන්තශාලාවෙක්හි ප්‍රධාන වඩුවෙක්මෙන්ද
චෙතනාව දතයුතුයි. පාඨශාලාවෙහි ප්‍රධාන ශිෂ්‍යතෙමේතමාත්
ඉගෙණීමෙහි නියුක්තවෙමින් අනබාල ශිෂ්‍යයන්ද ඉගෙණී
මෙහි යොදවයි. කම්මාන්තශාලාවෙහි ප්‍රධාන වඩු ශිෂ්‍යතෙමේ
තමාත් කම්මාන්තයෙහි යෙදෙමින් අඛිශෙෂ වඩුවන්ද ඒ ඒ
කම්මාන්තයෙහි යොදවයි. සංඝකාරසඤ්ඤායතෙම දෙසන්නාවූ
සම්බුදුයන්වහන්සේ විසින් විභඟප්‍රකරණයෙහි "චක්ඛුසම්ඵස්සජා
චෙතනා" යනාදීන් පළමුකොට මේ චෙතනාව වදාරා ඊට අන
තුරුව සහජාදීවූ එකුන්පණස් චෙතසිකයන් ක්‍රමයෙන් වදාළ
හෙයින් මේ චෙතනාව සංඝකාරසඤ්ඤයෙහි ප්‍රධාන ධම්මයවෙයි.
සහජාදීවූ ඒ ඒ චෙතසිකයන් ඒ ඒ ක්‍රියාවෙහි යොදවා සිඛකර
ගන්නාවූ ශක්තිය නොහොත් දන්දීම් ප්‍රාණඝාතකිරීම්වශයෙන්
සිඛකරගන්නාවූ අර්ථය මේ චෙතනාව පිළිබඳව පවත්නීය.
එහෙයින් කම්ම සංඝකාරය ආයූහනය චෙතනාය යනාදී නම්
මේ ධම්මයට පර්‍යායවෙයි. යම්කුශලා කුශල කම්මයක්කරන්නාවූ
කල්හී සහජාදීන්ගේ උපකාරයෙන් ලබාගන්නාවූ අර්ථය මේ
චෙතනාවෙහි පවත්නේයි. එතකුදුවුවත් චෙතනාවක්ෂණ නඛය
වෙයි. යම් ණයක්ගන්නාවූකල්හි ඒ ණයගැණීම ක්ෂණයකින්
සිඛවන්නාක්මෙන් මේ කම්මසංඛ්‍යාත චෙතනාවද චිත්තක්ෂණය
කට සමාන ආයුෂඇති බැවින් වහා බිඳී යන සුලුවෙයි. ඒ වහා
බිදීගිය චෙතනාවගේ ශක්තියෙන් කෙසේ විපාකය උපදවන්
නේද යත්? ණයගත්තාවූ පුරුෂයා ඒණයින් බඛවන්නාක්
මෙන්ම නොහොත් ඒ ණයගෙවනතුරුම ඔහු ණයගැතියායයි
ව්‍යවහාරකරන්නාක්මෙන්ද ඒ ණයින් නිදහස් නොවියහැකි
බැවින්ද, යම් කාලපරිච්ඡේදයක්කොට ණයගත්තේවීනම් ඒ
කාලයෙහි ගෙවියයුතුබවද කාලපරිච්ඡේදයක් නොකොට ණය
ගත්තේවීනම් කවර කාලයකවුවත් ඒ ණය ගෙවියයුතුවාක්
මෙන්ද කුශලා කුශල ජවනවීථීන්ගේ පළමුවන සත්වන
ජවනඝඞ්ගුවූ චෙතනාවෝ කාලපරිච්ඡේදයෙන්ගත්තාවූ ණය
මෙන් ඉහාත්මයෙහි හෝ අනතුරු අත්බැව්හි හෝ තම තම
න්ගේ විපාක උපදවත්. කාලපරිච්ඡේදය නැතුවගත්තාවූ ණය
මෙන් මධ්‍යයෙහිවූ ජවන් පස්දෙන පිළිබඳවූ චෙතනාවෝ පස්
දෙන සංසාරයෙහි අවකාශ ලැබුනු පරිද්දෙන් ඒකාන්තයෙන්
විපාක උපදවන්නාහුවෙත්. මේ ණයගැණීම සංඛ්‍යාතවූ ලොක

ව්‍යවහාරය ඒකාන්තයෙන් නිෂ්ප්‍රයෝජන නොවන්නාක් මෙන්ම කුශලාකුශල චෙතනාවන්ගේ කර්මශක්තියද කල්පකෝටි ශතසහස්‍රයකිනුත් බොල්නොවන්නේයයි දතයුතුයි. සඞ්ඛෙප චෙතනාදෙදෙනාගේ විශෙෂ කවරේද යත්? යම් පුරුෂයෙක් තෙමේ අනික් පුරුෂයෙක්හට ආභරණ වස්ත්‍රාදිය දෙනු කැමති වේද ආහාරපානාදියෙන් සංග්‍රහකරනු කැමතිවේද චෙතනාව එබඳු අදහස් ඇති පුරුෂයෙකුට බඳු උපමා ඇතිවෙයි. ශ්‍රද්ධාව වනාහි මේ ආත්මයෙහි දානමානාදී කුශල ක්‍රියාකිරීමෙන් මතු සංසාරයෙහි මහත් වස්තු සම්පත් ලබන්නේය යන විශ්වාසය ඇත්තාවූ පුරුෂයෙකුට සමානවෙයි. මේ වනාහි මේධම්දෙදෙනාගේ චෙතසයි. "එකාග්‍රතාව" යනු එකම අරමුණක් ඇණීම ලක්ෂණකොට ඇත්තාවූද එකම අරමුණෙක්හි සිත පිහිටුවීම ලක්ෂණකොට ඇත්තාවූද සිත කම්පානොවීම ලක්ෂණකොට ඇත්තාවූද සවභාව ධර්මයක්වේ. ඊට උපමා කවරයත්? පෘථිවියට කැන සිටවනලද්දාවූ ගල්ටැඹකට බඳු උපමා ඇත්තේවෙයි. ඒ ගල්ටැඹ වනාහි සතරදිගින් හමන්නාවූ පවනින් නොසැලෙන්නාක්මෙන් එකාග්‍රතා චෙතසිකය හෙතුකොටගෙණ සිත එකඅරමුණෙක්හි පිහිටන්නේවෙයි. අන්‍යවූ සපඤ්ඤාදිවූ චෙතසිකයන්ද නන් අරමුණෙහි විසිරයා නොදී එකඅරමුණෙක්හි සථිරවශයෙන් පැවතීම එකාග්‍රතාව හෙතුකොටගෙණවේ. එකාග්‍රතාව වනාහි නිවාතසථානයෙහි දැල්වූ පහන් සිළුවකට බඳු උපමා ඇතිවෙයි. නොගෙත් එකාග්‍රතා කොමෝ ජලයකට බඳු උපමා ඇතිවෙයි. සපඤ්ඤාදිවූ අවශෂ චෙතසිකයෝ තුමූ කොකුම් සුණු කසා සුණු ආදී චුණ්ණයකට බඳු උපමා ඇත්තේවෙයි. ඒ චූර්ණයට වනාහි ජලයවත්කොට හතාගුළිකළකල්හි විසිරයානොදී එකට හැනිපවත්නේයි. එහෙයින් කසාසුණු කොකුම්සුණු ආදින්ට බඳුවූ සපඤ්ඤාදිවූ චෙතසිකතෙමේ එකාග්‍රතා නැමති ජලයවත්කළකල්හි එකාබඳව නොවිසිර පවත්නේයි දතයුතුයි. ජීවිතෙන්ද්‍රිය තෙමේ නාමජීවිතෙන්ද්‍රිය රූපජීවිතෙන්ද්‍රියයයි දෙවැදෑරුම්වේ. ඒ දෙදෙන අන්‍යොන්‍ය විරුද්ධ ධර්මදෙකක්වූයේ නමුදු උපමා ලක්ෂණාදීන්ගේ වශයෙන් සාධාරණවේ. "නාමජීවිතෙන්ද්‍රියය" යනු එකුන් අනූවක් චිත්තක්ෂයෙහි සාධාරණවශයෙන් ලැබෙන්නාවූ ජීවිතයයි. "රූප ජීවිතය" යනු නවකම්ජ රූපකලාපයෙහි ඒ ඒ රූපකලාපයන් ජීවත්කරවන්නාවූ ජීවිතයයි. එක් රූප ජීවිතයක් තුළ නාම ජීවිත සතළොසක් ඉපිද නිරුඬ්ධවෙති. එහෙයින් නාම ජීවිතය අරූපවූ නාම ධර්මයක්වා පමණක් නොව උපාදාසීති සඞ්ඛ්‍යාතවූ කුඩා

ක්ෂණත්‍රයක් හෝ මහාචිත්තක්ෂණයක් හෝ ආයුෂ ඇත්තාවූ ධර්මයකි. රූපජීවිතය නමැති උපාදා රූපයක්වූ කුඩා ක්ෂණ එක් පණසකට හෝ මහා චිත්තක්ෂණ සතළොසකට හෝ ආයුෂ ඇත්තේය. මෙහි දක්වනු ලබන්නේ නාමජීවිතයයි. ඒ නාම ජීවිතය තමා හා එක්ව යෙදුනාවූ ධර්මයන් ජීවත්කරණයෙයින් ජීවිතකියාද තමා හා එක්ව යෙදුනාවූ ධර්මයන් තමාගේ වසන යෙහි පවත්වනයෙයින් ඉන්ද්‍රියකියාද ව්‍යවහාරකරත්. එහෙ යින් මේ ජීවිතෙන්ද්‍රියය සම්ප්‍රයුක්ත ධර්මයන් ආරක්ෂාකිරීම හා වසඟයෙහි පැවැත්වීම ලක්ෂණයකොට ඇත්තේයි. ඊට උපමා කවරයත්? පියුම් නැවි නෙලුඹු දැලියෙහි පවත්නාවූ ජලය ඒ පියුම්මල් ආරක්ෂාකරන්නාක්මෙන් ජීවිතෙන්ද්‍රියයද තමා හා එක්ව යෙදුනාවූ ධර්මයන් ජීවත්කරවන්නේයි. ඒ පියුම් නැවි නෙලුඹු දැලි අභ්‍යන්තරයෙහි පවත්නාවූ ජලය යම්තාක් කල් පවත්නේවේද එතාක්කල් පියුම්මල් නොවියලී පවත්නේයි. යම් දවසක ඒ ජලය සිඳිගියේවිනම් පියුම්මල් වියලියෙති. එප රිදෙන් සත්වයන්ගේ සකල පවත සඛ්‍යාතවූ මේ ශරීරය නොවියලී කුණුනොවී මේ ජීවිතෙන්ද්‍රිය හෙතුකොටගෙණ පවත්නේයි. ශරීරයෙහි යම්තැනක චමීය කැඩිගියේවිනම් චමීය වියලී කුණුවියෙයි. එසේවන්නේ කුමක්හෙයින්ද යත්? සිඳී බිඳී ගිය අවයවයෙහි ජීවිතෙන්ද්‍රිය නැත්තෙයිනී. මේසකලපවත සඛ්‍යාතවූ ශරීරය නොවියලී කුණුනොවී යහපත්වණ්ණයෙන් යුක්තව යාම් ඊම් ඉදුම් සිටුම් ආදීවූ ක්‍රියාවන්ගේ පැවැත්මට මේ ජීවිතෙන්ද්‍රිය හෙතුවන්නේයි. මනුෂ්‍යයාගේ ප්‍රතිසන්ධි විඤ්ඤාණය පටන් සතළොස් චිත්තක්ෂණය සම්පූර්ණවූකල්හි කම්ජ රූපකලාප නවය අතුරෙන් එක් එක් කලාපයක්හුගේ රූප ජීවිතෙන්ද්‍රියයෝ එක්පණසක් සම්පූර්ණවෙති. එහෙයින් ප්‍රතිසන්ධිය පටන් සතළොස් චිත්තක්ෂණයක් සම්පූර්ණවනකල්හි සත්ත්ව පුරුෂ දෙපක්ෂය අතුරෙන් එක්පක්ෂයකට ජීවිතෙන්ද්‍රියසාරසියඅටක් සම්පූර්ණවෙති. එතැන් සිටසඳහා ගේ චුතියපටන් ආපසු හිනුකල්හිසතළොස්වන චිත්තක්ෂණය දක්වා රූපජීවිතෙන්ද්‍රියයෝ සාරසිය අටදෙනෙක් දිවාරෑ දෙක්හි කිසි මොහොතක අඩු නොවිපවතිත්. ඒ ජීවිතෙන්ද්‍රියසාරසියඅටදෙන හෙතුකොට ගෙණ මේ සඳහා ශරීරය ජීවත්වෙයි. චුතිචිත්තයට සතළොස් වන චිත්තය පටන් කම්ජරූපයන්ගේ පහළවීම නොවන හෙයින් චුතිචිත්තයට සමකාලිකව නොහොත් චුතිචිත්තයාගේ භඞ්ගක්ෂණයෙහි සියලුම කම්ජරූප ඉපිළිබඳවූ රූපජීවිතෙන්ද්‍රිය හා නාමජීවිතෙන්ද්‍රියයද එකක්ෂණිකව නිරුඬවියෙති.

එහෙයින් සත්ත්වයාගේ මරණය ජීවිතෙන්ද්‍රියුපච්ඡේදයයි ව්‍යවහාර කෙරෙති. සමහර අභයාන සත්ත්වයෝ ජීවිතෙන්ද්‍රියය නොමැරෙන්නේයයි ව්‍යවහාර කෙරෙති. එතකුදුවුවත් ජීවිතෙන්ද්‍රියය එකාන්තයෙන් මැරෙන්නේමැයි. ඉදින් ජීවිතෙන්ද්‍රිය මේලේ නම් වූතිචිත්තයට අනතුරුව හටගන්නාවූ ප්‍රතිසන්ධි චිත්තයාගේ උපාදක්ෂණයෙහි නැවත ජීවිතෙන්ද්‍රියය හට නොගන්නේවේද යත්? සත්ත්වයන්ගේ පටිසන්ධිචිත්තය හා සමග කාමජීවිතෙන්ද්‍රිය එකක් හා ජලාබුජ සත්ත්වයන්ගේ රූපජීවිතෙන්ද්‍රිය තුණක්ද ඉදිරිපසුනොවී එකක්ෂණිකව පහළවෙති. ඉදින් ජීවිතෙන්ද්‍රිය මේලේනම් ප්‍රතිසන්ධි චිත්තය හා සමග නැවත ජීවිතෙන්ද්‍රියය කෙසේ උපදනේද යත්? චුතිචිත්තය හා සමග නිරුඬවන්නාවූ ජීවිතෙන්ද්‍රියය ප්‍රතිසන්ධි චිත්තයාගේ උත්පාදක්ෂණයෙහි නැවත උපදියි. එහෙයින් ජීවිතෙන්ද්‍රියය නෙලුම් දඬු ආදියෙහි පවත්නාවූ ජලය නෙලුම් මල් ආරක්ෂාකරන්නාක්මෙන් පවත් කඬිය ආරක්ෂාකරන්නේවෙයි. ජීවිතෙන්ද්‍රියය ජලයකට බදු උපමා ඇතිවෙයි. ඒ ජලය නෙලුම් දඬු ආදියෙහි නැතිකල්හි නෙලුම් මල් විඝලියන්නාක්මෙන් ජීවිතෙන්ද්‍රියය සංඛ්‍යාතවූ ආයුෂය නිරුඬව ගියකල්හි සකඨිපචක සංඛ්‍යාතවූපද්මය විඝලි දුවිලවියේ. එහෙයින් මේ ජීවිතෙන්ද්‍රියය නැව නිසා යන්නාවූ නැවියෙකුට බදු උපමා ඇතිවෙයි. නෞකා නොමෝ නැවියා විසින් ගෙණයනු ලැබෙයි. ඒ නැවියාද නෞකාව ආධාරකොට ගෙණයිවි, එපරිද්දෙන්ම ජීවිතෙන්ද්‍රියය හෙතුකොටගෙණ කම්ජ රූපකලාපහා නාම ධම්මෝද පවතියි. ඒ නාම ධම් හා රූපකලාප ආධාරකොටගෙණ ජීවිතෙන්ද්‍රියය පවත්නේයි. කම්විත්ත සෘතු ආහාර සංඛ්‍යාතවූ ප්‍රත්‍යය සතරකින් උපදින්නාවූ එක් විසිරූප කලාපයන් අතුරෙන් කම්ජ රූපකලාප නව යෙහි පමණක් ජීවිතෙන්ද්‍රියය පවතින්නට හා සෙසු ප්‍රත්‍යය තුණෙන් හටගන්නාවූ රූප කලාපයන්ගේ පැවතීමට ජීවිතෙන්ද්‍රියය නැත්තේ කුමක්නිසාද යත්? දරුවන් අටදෙනෙකු වදා යම් මවෙක් කලුරියකෙල්විනම් ඒ දරුවන් අටදෙනාවැඩී වඩිණයකරණු පිණිස කිරිමව්වරු අටදෙනෙක් ඇතිවියයුත්තා සුය. එපරිද්දෙන්ම පූර්ජාතියෙහි කම් නැමති මව් විසින් කම්ජ රූපකලාප අටක් සමග ප්‍රතිසන්ධිනාමසකඬ සතරද උපදවනවා සමගම් ඒ පටිසන්ධි කම්ෂකනිය නැතිවියෙයි. එබැවින් ඒ මව් මළ දරුවන් අටදෙනා පොෂ්‍යයකිරීම පිණිස කිරිමව්වරු අට දෙනෙක්මෙන් කම්ජ රූපකලාප පැවැත්වීම පිණිස ජීවිතෙන්ද්‍රියය අටක් ඇතිවියයුතුවෙත්. අවශෙෂ සෘතු චිත්ත ආහාර

යන රූප ජනක ප්‍රත්‍යයයෝ තුන්දෙන නිරන්තරයෙන් විද්‍යමාන බැවින් ඒ රූපකලාපයන් ආරක්ෂාකිරීමට ජීවිතෙන්ද්‍රියයෙන් ප්‍රයෝජන නැතැයි දතයුතුයි. මනසිකාරය වනාහි අරමුණ සිත්හිකිරීම ලක්ෂණකොට ඇත්තේයි. ඒට උපමා කවරයත්? ආජානීය ශෛක්ෂව අශ්වයන් දෙදෙනෙකු යොදනලද රථාවාහ්‍යීයාට බදු උපමා ඇතිවෙයි. ඒ ආජානීය අසුන් දෙදෙනෙකුන් යොදනලද රථයෙහි රථාවාහ්‍යී තෙමේ ඒ අසුන් දෙදෙනා එකසමව යාම නිතර සිත්හිකොට බලා හිඳින්නේවෙයි. එපරිද්දෙන්ම මානසිකාර නැමති රථාවාහ්‍යී තෙමේ ආජානීය අසුන් නැමති සපශීර්ෂවූ ඒ ඒ චෛතසික ධර්මයෝ අරමුණෙහි වැදහැණීම් ආදීවූ ඒ ඒ කෘත්‍යය ඉදිරිපසුනොවී එක විට සිඛඤ්ඤාඤ්ඤයි බලාහිඳින්නේවෙයි. තවද මනසිකාර තෙමේ වනයෙහි ඌරු මුව ගොනාදී සිව්පාවුන් තුවක්කු දුනු ආදියෙන් මරන්නාවූ දුණුවායෙකුට සමාන උපමා ඇතිවෙයි. වනයෙහි සිව්පාවුන්ට කුරුමානම් බලන්නාවූ වැදි තෙමේ යම් සිව්පාවෙක් මරණු කැමතිවීනම් ඒතලය නොවරදිනා පිණිස සිත්හිකරයි. එපරිද්දෙන්ම මනසිකාරය නැමති වැදි තෙමේ අරමුණු නැමති සිව්පාවුන් විදගන්නා පිණිස සපශීර්ෂ චෛතසික නැමති ඒතලයන් නොවරදනා පිණිස සිත්හිකරයි. එහෙයින් මනසිකාර තෙමේ අරමුණුමෙනෙහිකිරීම ලක්ෂණකොට ඇත්තේගයි කියනලදී. සපශීර්ෂ ආදිකොට මනසිකාරය අවසන් කොට ඇත්තාවූ මේ චෛතසික ධර්මයෝ සත්දෙන එකුන් අනුවක් චිත්තයෙහි එකාභිනයෙන් සාධාරණවශයෙන් යෙදෙන හෙයින් සර්වචිත්ත සාධාරණ චෛතසිකයෝයයි කියත්. ප්‍රකීර්ණක චෛතසිකයන් සදෙනාගේ ලක්ෂණාදියකෙසේ ඇත්ද? විතර්ක තෙමේ අරමුණට අභිමුඛව සපශීර්ෂවූ චෛතසික ධර්මයන් නැන්වීම ලක්ෂණකොට ඇත්තේයි. එහෙයින් මේ විතර්ක තෙමේ එක් පුරුෂයෙකු විසින් තමහට ඉසිලිය නොහැකි බරක් ඉසිපිටට හෝ කරපිටට හෝ ගැණීමට අල්වා දෙන්නාවූ පුරුෂයෙකුට බදු උපමා ඇතිවෙයි. විචාර තෙමේ විතර්කය විසින් අරමුණට නන්වනලද්දාවූ චෛතසිකයන් ඒ ඒ ක්‍රියායෙහි හැසිරවීම ලක්ෂණකොට ඇත්තේයි. විතර්කය වනාහි ඕදාරිකවූ සඵභාව ඇතිවෙයි. විචාර තෙමේ සියුම් සඵභාව ඇතිවෙයි. එහෙයින් විතර්කය ඝණ්ඨාර ලොහොබෙර ආදියද හැසිමෙන් හට ගන්නාවූ ඕදාරික ශබ්දයක්මෙන් විතර්කයද ඕදාරිකවූ පැතිරීම ඇතිවෙයි. විතර්ක විප්ඵාර ශබ්දය වනාහි අභිඥාලාභීන්ගේ දිව්‍ය ශ්‍රොත්‍රධාතුයට ඇසෙයි. ඉක්බිති ඒ විතර්ක විප්ඵාර ශබ්දය

අසා මෝහථ මෙනම් චිත්තයක් උපන්නේයසි දැනගණී. එහෙ සින් මේ විතකී විඤ්ඤාර ශබ්දයට ඝණ්ඨාර ලොහෝ බෙර ආදි යෙන් හටගන්නාවූ ඔඳුරිකවූ ශබ්දය සම්මඥන්වහන්සේ විසින් උපමාකොට දෙශනාකරණලද්දේසි. "විචාරය" යනු ඒ ඝණ්ඨාර ලොහෝ බෙර ආදියෙන් පසුව හටගන්නාවූ සියුම්වූ ශබ්දයට බදු උපමා ඇතිවෙයි. නොහොත් විතකී තෙමේ අහසට නගිනු කැමතිවූ රාජාලි උකුසු පක්ෂියෙක් අහසට නගිනකල්හි පියාපත් වෙහෙයෙන් පැහැර අහසට නැගීමක්මෙන්ද ඒ අහසට නැගුනාවූ රාජාලි උකුසු පක්ෂි තෙමේ පියාපත් නොපැහැර නිශ්චලව පියාහමන්නාක්මෙන් විචාරය සන්ඥුන් පැවතුම් ඇත්තේවෙයි. නොහොත් විතකී තෙමේ පියුම් විලකට අහසින් බස්නා භාඹග රාජයක්හුගේ වෙහවත්වූ පහළට බැසීමක් මෙන්ද ඒ පියුම් විලට බටුවාවූ භාඹගරාජතෙමේ පියුම්මල් හාත්පස සතුරන් නැත්තේදෝහෝයි සුවඳ ඇත්තේදෝහෝයි පරීක්ෂාකරමින් සෙමින් සෙමින් සිසැරීමක්මෙන් විචාරය සානතවූ පැවතුම් ඇත්තේවෙයි. නොහොත් ලොහෝතලියක් මදින්නාවූ පුරුෂයෙකු විසින් එක් අතකින් තරයේ අල්වා ගෙණ අනිත් අතින් ලොහෝතලිය සෙමින් සෙමින් මදින්නාවූකල්හි අල්වාගත් අතමෙන් විතකීයද මදින්නාවූ අතමෙන් විචාරයද දතයුත්තේසි. මේ විතකී තෙමේ අරමුණට අභිමුඛකොට සපඤ්ඤවූ චෛතසිකයන් නැන්වීම ලක්ෂණකොට ඇත්තේසි. විචාර තෙමේ ඒ විතකීය හා එක්ව යෙදුනාවූ කල්හි අරමුණු පිරිමැදීම ලක්ෂණකොට ඇත්තේසි. එසේහෙයින් දෙපස්විඥාන වර්ජිතකොට ඇත්නාවූ සුසාළිස් කාමාවචර චිත්තය, ප්‍රථමධ්‍යාන එකොළොසය, යන පස්පණස් චිත්තය සවිතකී සවිචාර සිත්නම්වෙත්. මේ පස්පණස් චිත්තයෙහි යෙදෙන්නාවූකල්හී අරමුණට නන්වාදෙන්නාවූ විතකීය ඇතිහෙයින් විචාරය හා යුකතව සවිතකී සවිචාර චිත්තයෝයයි කියත්. ඒ පස්පණස් චිත්තයන් අතුරෙහි විතීය ධ්‍යාන එකොළොස බහාලාබෙන්නාවූ අවිතකී සවිචාර සසැට චිත්තයෙහි අරමුණට නන්වාදෙන්නාවූ විතකීය නැතිහෙයින් කෙසේඅරමුණ ටනගින්නේදයත්? පූර්ව අරමුණට නන්වාදෙන්නාවූ විතකීය හා සමඟ පවත්නාවූ සවිතකී සවිචාර සිත් පස් පණස චිත්ත සන්තානයෙහි නිරන්තරයෙන් හටගත් බැවින් ඒ පුරුද්ද කරණ කොටගෙණ අරමුණට නන්වාදෙන්නාවූ විතකීයෙන් තොර වද, විචාර තෙමේ අවිතකී සවිචාර සසැට චිත්තයෙහි අරමුණු ගහගැනීවෙයි. ඊට උපමා කවර යත්? පිවිසුර ගම්වැසි පුරුෂ

යෙක් තෙමේ යම්කිසි කෙත්වත් ආදිවූ භූමියක් අරභයා අධිකරණයක් පැමිණිකල්හි ගම්මුදලියාට කියා ඒ අධිකරණය විනිශ්චය කරගණු කැමැත්ව ගම්මුදලියාට කීකල්හි ගම්මුදලිතෙමේද අධිකරණය නිසිසේ විනිශ්චය නොකෙළේසි. ඉක්බිති මහානගරයට පැමිණ යුවරජහට කියා මේ අධිකරණය විනිශ්චයකර ගණිමැයි සිතා මහානගරයට ආයේ නමුදු යුවරජුගේ රජ වාසල කවර තැනෙක්හිවේද යනාදිය නොදැන පළමුකොට යුවරජුගේ අමාත්‍යයෙක් කරා එළඹ ඔහු සහායකොටගෙණ ඔහුගේ පසුපස්සෙහි ගොස් යුවරජුගේ වාසලට පැමිණ තමාගේ අධිකරණය දැන්වූකල්හි යුවරජුද නිසිසේ අධිකරණය විනිශ්චයකොට දුන්නේසි. නැවත ඒ පිටිසරවැසි පුරුෂතෙමේ සවකීය ග්‍රාමයට පැමිණ වසනකල්හි නැවතත් එබඳු අධිකරණයක්වී මහානගරයෙහි යුවරජුකරා නැවතත් එන්ට සිදුවූකල්හි ඒ පිටිසර වැසි පුරුෂ තෙමේ පළමු වාරයෙහිමෙන් යුවරජුගේ අමාත්‍යයාකරා නොගොස් පළමුවෙනි වාරයෙහි පුරුද්ද හෙතුකොටගෙණ එසවරටම යුවරජුකරා පැමිණ අධිකරණය සෑලකෙළේසි. මේ උපමායෙහි අරමුණ හා යුවරජුද යුවරජුගේ අමාත්‍යයා හා විතකීයද පිටිසර වැසි පුරුෂයා හා සෙසු චෛතසිකයන්ද උපමා උපමේය සමඟකොට අර්ථදතයුත්තේසි. මෙහි විතකීය වනාහි තර්කය, විතර්කය, සංකල්පය, අපප්‍රණය, ව්‍යප්‍රපණය, උහයාශයි නොයෙක් නාමයෙන් නිර්දේශයේ ආයේසි. මේ විතර්කී තෙමේ ධ්‍යානාඞ්ගයන්ගෙන් පළමුවැනි ධ්‍යානාඞ්ගයවේසි. ධ්‍යාතෘ චිත්ත ජවීථියෙහි පරිකර්ම උපචාර අනුලෝමගොත්‍රභූ යන කාමාවචර සිත් සතර හා යෙදුනාවූ විතකීය විතකීයයි ව්‍යවහාරකෙරෙත්. පස්වෙනුව හවඟන්නාවූ ධ්‍යාන චිත්තයෙහි යෙදුනාවූ විතකීය අප්‍රපණාය ව්‍යප්‍රපණායයි ව්‍යවහාර කෙරෙති. මාගී චිත්තයෙහි උපදනා පරිකර්මාදී සිත් හා එක්ව යෙදුනාවූ විතකීය විතකීයයි ව්‍යවහාරකෙරෙති. මාගඵල චිත්තයෙහි යෙදුනාවූ එම විතකීය සම්මාසඞ්කප්පයයිකියාද අප්‍රපණා ව්‍යප්‍රපණායයි කියාද ව්‍යවහාරකෙරෙත්. සියලු උත්තරී මනුෂ්‍ය ධර්මයන්ගෙන් පළමුවන ධර්මය මේ ප්‍රථම ධ්‍යානයෙහි යෙදුනාවූ විතකීයයි. ඒ විතකීයාගේ අර්ථ නාමය සියලු අෂ්ටසමාපත්තීන්ට හා ඤාණසමාපත්තීන්ටද සියලු අභිඥාවන්ටද සියලු ලොකොත්තර චිත්තයන්ටද සියලු ඵලසමාපත්තීන්ටද මේ අර්ථ නාමය ව්‍යවහාර කෙරෙත් එතකුදුවුවත් කාමාවචර චිත්තයෙහි යෙදුනාවූ විතකීයට අර්ථනායයි නොකියති.

අධිමොක්ෂ චෛතසික තෙමේ අරමුණ නිශ්චයකිරීම ලක්ෂණ කොට ඇත්තේයි. ඊට උපමා කවරයත්? අධිකරණ නායකමහා මාත්‍යයෙකුට බඳු උපමා ඇතිවේ. අධිකරණ නායක මහාමාත්‍ය තෙමේ රාජනීති ලෝකනීති ධම්මනීතියෙහි පාරප්‍රාප්තවූ බැවින් අධිකරණ නායක විනිශ්චයකාර ධුරය ලැබෙයි. එබඳු අධිකරණ නායක තෙමේ යම් අධිකරණයක් ඇසූ කෙණෙහිම මෙබඳු අප රාධයක්කළ කැනැත්තේ මෙබඳු දඬුවමක් ලැබියයුත්තේයයි කියා හෝ දඬුවම් නොලැබියයුත්තේයයි කියා හෝ ඇසූ මාත්‍රය කින්ම විනිශ්චයකට හැකිවෙයි. එපරිද්දෙන්ම මේ අධිමොක්ෂ චෛතසිකය යම් සිතක යෙදුනුකල්හි මේ අරමුණ නිල්පැහැය ඇත්තේය. මෙය රතු පැහැය ඇත්තේය. මෙය සුදුපැහැය ඇත්තේය යනාදීවශයෙන් අරමුණෙහි ඇත්තාවූ තත්ත්වාකාරය තමා හා එක්ව යෙදුනාවූ චිත්ත චෛතසික ධම්මයන්ටද නියම කරදෙන්නේවෙයි. මේ අධිමොක්ෂ තෙමේ විචිකිච්ඡාවට ප්‍රති පක්ෂවෙයි. එහෙයින් අධිමොක්ෂය දෙරබාව සවිකරන්නාවූ ටැඹ කට බඳු උපමා ඇතිවෙයි. විචිකිච්ඡාව දෙරබාවට බඳු උපමා ඇතිවෙයි. එහෙයින් අධිමොක්ෂ තෙමේ නිශ්චලවූ දෙරබාව සවි කරන්නාවූ ටැඹක්මෙන් සිරව පිහිටයි. විචිකිච්ඡාව එහි සවි කරන්නාවූ දෙරබාවක්මෙන් නිතරම වචලඝතියෙන් පවත් නේය. තවද නගරවාරය නගවුරුවිම පිණිස ශොලොස්රියන් තැන් පොළොව කැන නගරවාර එලිපත සවිකරන පිණිස සිටුවන්නාවූ මහටැඹකට බඳු උපමා ඇතැයි යනු සමහර ආචාර්‍යවරයින්ගේ මතයි. එහෙයින් අධිමොක්ෂය ඉන්ද්‍රියලයක් මෙන්ද, සපතිවූ චෛතසිකයන්ගෙන් යුක්තවූ චිත්තය නගර වාරයෙහි එලිපතට බඳු උපමා ඇතිවෙයි. සම්මේ ඒ නගර වාරයෙහි එලිපත එසිඟාසටමහය හෙතුකොටගෙණ නොසැලී පවත්නේවේද, එපරිද්දෙන් සසම්ප්‍රයුක්තවූ චිත්තයද අධි මොක්ෂය හෙතුකොටගෙණ අරමුණෙහි අරමුණු විනිශ්චයකර ගැණීමවශයෙන් සිරව පවත්නේයයි දතයුතු.

වීර්‍ය්‍ය තෙමේ අරමුණෙහි සම්ප්‍රයුක්ත ධම් සහිතවූ චිත්ත යට අරමුණෙහි සිරව පිහිටාසිටීමට රුකුල්දීම ලක්ෂණකොට ඇත්තේයි. ඊට උපමා කවරයත්? පුරාණවූ විහාර ප්‍රාකාරශෛල මණ්ඩපාදියට පිටින්දෙන්නාවූ බලකරු නොහොත් උපස්ථ මිහිර යනාත්‍රයන්ගෙන් චිත්ත චෛතසික ධම්මයන්ගේ පහුබව නොවීම පිණිස මේ වීර්‍ය්‍ය චෛතසිකය රුකුල්දෙන්නේවෙයි. එහෙයින් වීර්‍ය්‍යය උපස්ථම්භක සඞ්ඛ්‍යාවූ බලකරුමෙන්ද සසම්ප්‍රයුක්තවූ චිත්තය ඒ බලකරු යන්තු රුකුල් ලැබීමෙන්

නොවැටිපවත්නා ප්‍රාසාද විහාර මණ්ඩපාදියකට බඳු උපමාඇති වෙයි. නොහොත් යුඛයෙහි යෙදුනාවූ බලසෙනඟට පසුබට නොවීම පිණිස යුඛායුධ ආහාර පානාදියෙන් අනුබලදෙන්නාවූ යුඛනායකයෙකුට බඳු උපමා ඇතිවෙයි. එහෙයින් සසම්ප්‍රයුක්තවූ චිත්තය බලසෙනඟ විසින් පිරිවැරූ ප්‍රමාණ යුඛභට යෙකුමෙන්ද, වීර්‍ය්‍ය චෛතසිකය ඔවුන්ගේ පසුබට නොවීම පිණිස යුඛොපකරණාදියෙන් අනුබලදෙන්නාවූ යුඛනායකයෙකුමේන්ද දතයුතුයි.

ප්‍රීති තොමෝ ආලම්බණ සවභාව ප්‍රියකිරීම ලක්ෂණයොට ඇත්තීය. මේ ප්‍රීතිය කරණයොටගෙණ විඤ්ඤාණක්ඛන්ධ සංඛ්‍යාතවූ චිත්තයද, වේදනා සඤ්ඤා සංඛාර සංඛ්‍යාතවූ නාමකාය පිණවීම නොහොත් සන්තර්පණයකිරීම මේ ප්‍රීතිහුගේ සවභාවයි. ඒට උපමා කවර යත්? කාන්තාර මාර්ගයෙහි යන්නාවූ පුරුෂයෙක් තෙමේ අතිශයින් පිපාසිතව වෙහෙසට පත්ව ජලය සොයමින් යන්නාවූකල්හී ඉදිරි මාර්ගයෙහි ආවාවූ යම් පුරුෂයෙක් දැක එම්බාසඟය! ජලය කොතැන්හි ඇත්තේදැයි විවාළකල්හී පින්වත! තොපි මේ යන්නාවූ මාර්ගයෙහි මදක් දුර යනකල්හි පස්පියුමෙන් සැදුම් ලත් සිහිල් ජලයෙන් පිරී ගියාවූ පොකුණක් සම්භවෙයි කිකල්හී වහ වහා යනුයේ ඒ මහී පුරුෂයා කී පරිද්දෙන් පස් පියුමෙන් සැදුම් ලත් සිහිල් ජලයෙන් පිරිගියාවූ ඒ පොකුණ දකින්ට ලැබුනේයි. පිපාසිතවූ ඒ පුරුෂයාහට පස්පියුමෙන් සැදුම් ලත් ඒ සිහිල් පැන් පොකුණ දුටු මාත්‍රයකින් ඔහුගේ සිත පිළිබඳවූ යම් සවභාවක් උපදනේද ඒ ප්‍රීතියයි දතයුතුයි. මේ ප්‍රීතිය චිත්තයෙහි සම්ප්‍රයුක්ත චිත්තයෙහි උපන්කල්හිසිහින්වූකපුපුළුන්පටලයක තලතෙල්වත් කලාක්මෙන්වෙයි. සසම්ප්‍රයුක්තවූ චිත්තය කපුපුළුන් පටලයක් මෙන්ද, ප්‍රීතිය තලතෙලක්මෙන්ද දතයුතුයි. මේ ප්‍රීතිතොමෝ ඛුද්දකා ප්‍රීතිය, ඛණිකා ප්‍රීතිය, ඔක්කන්තිකා ප්‍රීතිය, උබ්බෙගා ප්‍රීතිය, ඵරණා ප්‍රීතියයි පස් ආකාරවේ. ඔවුන් අතුරෙන් ලොමුදැහැගැණීම් මාත්‍රයක් උපදවන්නාවූ ප්‍රීති තොමෝ ඛුද්දකා ප්‍රීති නම්වේ, විදුලිය ගසන්නාක්මෙන් ක්ෂණ ක්ෂණයෙන් ශරීරයෙහි ලොමුදැහැගැණීම් උපදවන්නාවූ ප්‍රීති තොමෝ ඛණිකා ප්‍රීති නම්වෙයි. සමුද්‍රයෙහි රල පතර වෙලාන්නාසේ බිඳි බිඳියන් නාක්මෙන් සකල ශරීරයෙහි පැතිර යන්නාවූ ප්‍රීති තොමෝ ඔක්කන්තිකා ප්‍රීතිනම්වෙයි. වාතවෙගයෙන් අහසට නගන්නාවූ කපුපුළුන් පටලයක්මෙන් ප්‍රීතිවෙගය කරණයොටගෙණ චතුර්ථ ධ්‍යානයත් නොලැබම තමා අභිමත ස්ථානයට අහසින් ගෙණ

ගොස් සිටුවිමි කරන්නාවූ ප්‍රීති තොමෝ උවෙග ප්‍රීතිතම්වෙයි. මහත්වූ ගංවතුරක් අවුත් සවලපවූ මිල් පොකුණු පතුරුවාගෙණ යන්නාක්මෙන් සුළන් පිරූ හසත්‍රාවක් නොගොත් සම්පසුඹියක් මහත්වෙන්නාක්මෙන් සකල ශරීරගෙහි පැතිරයන්නාවූ ප්‍රීති තොමෝ එරණ ප්‍රීතිකම්වන්නේය. උවෙග ප්‍රීතියට උපමාවශයෙන් මහසෑ වදිනු පිණිස මව්පියන්ගේ පැමිණීමට මත්තෙන් ඔඩිහිණියකගේ පැමිණි කථාවදතයුතුයි.

"ඡන්ද චෛතසිකය" යනු අරමුණුගැණීමෙහි කැමති මාත්‍රයක්වෙයි. එහෙයින් ඡන්දය අරමුණුගැණීම ලක්ෂණකොට ඇත්තේවෙයි, ඊට උපමා කවරයත්? දුනුවායා විසින් විදින්නාවූ ඊතලය අසිහිකාරයාවූ එම දුන්න තමාගෙන් ඇතට දමා ගැසීම පිණිස ඒ දුණුදිය නැමී උපකාරවෙයි. මේ ලොභය හා ඡන්දයද තෘෂ්ණා පර්‍යායවූ ශබ්දයෝවෙති. එතකුදුවුවත් ඡන්ද චෛතස්කය අරමුණුගැණීම් මාත්‍රයක් කැමැත්තෙස්. ලොභය වනාහි විශෙෂයෙන් ඒ අරමුණෙහි ගිජුව ඇලෙයි. එහෙයින් මේ ඡන්ද චෛතසිකය කළාල පැදුරෙක්හි දම්නලද්දාවූ කැටකැබිලිතිමෙන්ද ලොභය ඒ කළාල පැදුරෙහි දම්නලද්දාවූ වදුරු ලඟටුවකට බඳු උපමා ඇතිවෙයි. නැවත ඒ කැබිලිති හා වදුරු ලඟටුවද කළාල පැදුරෙන්ගනු කැමතිකල්හි කැටකැබිලිති ආදිය පහසුවෙන් අවිලඟත ඇකිවෙයි. වදුරු ලඟටුව වනාහි නැවත ඒ කළාලයෙන් නොගතහැකි පරිද්දෙන් ඇලිගෙයි. එබැවින් මේ දෙදෙනාගේ විශෙෂය කැටකැබිලිති හා වදුරු ලඟටුවමෙන්ද අවබොධකටයුතුයි. තවද මේ ධර්ම්දෙදෙනාගේ විශෙෂය දැක්වීමට උදාහරණයක්නම්:-අනුන්ගේ ගෙගක් හිඳ අන්‍යතු වසතුවක් පැහැරගන්නාකල්හි ලොභ මූලික අකුශල චිත්තය උපදී. එසේම තමන් සතු වසතුවක් දන්දෙන්නාවූ කල්හි අලොභ ප්‍රධානවූ මහාකාමාවචර කුශල චිත්ත විථියක් උපදී. යම් කුශලාකුශල චිත්තවිථියෙක්හි ඒ ඡන්දචෛතසිකය සමානවශයෙන් යෙදේදැයි මේ උදාහරණයෙන් ලොභ ඡන්ද දෙදෙනාගේ විශෙෂය අවබොධකටයුතුයි. මේ චිත්තක්‍රීදී චෛතසිකයෝ සදෙන වනාහි නොයෙක් චිත්තයෙහි සයාකාරයකින් යෙදෙනහෙයින් ප්‍රකිණ්ණක චෛතසිකයෝයයි කියත්. පළමු කියනලද්දාවූ සප්ථචිත්ත සාධාරණ චෛතසිකයෝ සත්දෙන දෙවනු කියනලද්දාවූ ප්‍රකිණ්ණක චෛතසිකයෝ සදෙන යන මේ දෙකොටස එකකොටගත්කල්හි ඒ තෙළෙස් චෛතසිකයන් අන්‍ය සමාන රාශියයි කියත්. මොවුන් තෙළෙස්දෙනාගේ

කුමක්හෙයින් අන්‍ය සමාන රාශියයි කියන්නේද යත්? මේ තෙළෙස් ධර්මයෝ ශොභන සිත් හා එක්ව යෙදෙන්නාවූකල්හී අශොභනයන්හෙන් අන්‍යවූ ශොභනයන් හා සමාන බැවින්ද, අශොභන චිත්තයෙහි යෙදෙනකල්හී ශොභනයන්හෙන් අන්‍යවූ අශොභන සිත් හා සදෘශහෙයින්ද, අන්‍ය සමාන වේයයි යෝගයි ව්‍යවහාරකෙරෙත්. ඊට උපමා කවරයත්? මිත්‍රසන්ථව යෙහි දක්ෂවූ කෙරාටික මිත්‍රයෙක් තෙමේ ප්‍රාණඝාත අදත්තා දානාදීවූ දුශ්චරිත ක්‍රියාවෙහි හැසිරෙන්නාවූ පාපකාරී පුද්ගල යන් හා සමානවම ප්‍රාණඝාතාදියෙහි හැසිරෙයි. ඒ පුරුෂ තෙමේම දානාදි පුණ්‍ය ක්‍රියාදියෙහි හැසිරෙන්කාවූ යහපත් මනුෂ්‍යයන් හා මිත්‍රසන්ථවය පවත්වන්නාවූකල්හී ඔවුන් හා සමග විහාරාරාමාදියට එළඹ මල් පහන් පිදීම් බණ ඇසීම් ආදී කුශල ක්‍රියාවෙහි හැසිරෙය. එහෙයින් සපඝාදී අන්‍ය සමාන චෛතසිකයෝ තෙළෙස්දෙන දෙළොස් අකුශල් සිත් හා එක්ව යෙදුනාවූකල්හි ඒ ධර්මයෝද එකාන්තයෙන් අකුශල්නාම්වෙත්. කාම රූපාරූප ලොකොත්තර කුශල් සිත් හා එක්ව යෙදුනුකල්හී ඒ ධර්මයෝද එකාන්තයෙන් කුශල්නාම්වෙති. විපාක ක්‍රියාවන් හා එක්ව යෙදෙනකල්හී කුසලුත් නොවූ අකුශලුත් නොවූ අව්‍යාකෘත සභාව ඇත්තාවූ ධර්මයෝනාම්වෙති, එහෙයින් සපඝීය තෙමේ අකුශල් සිත් හා යෙදුනුකල්හී අකුශල සපඝීනම්දෙයි. කුශල් සිත් හා එක්ව යෙදුනුකල්හී කුශල සපඝීනම්වෙයි. විපාක ක්‍රියාවන් හා එක්ව යෙදුනුකල්හී අව්‍යාකෘත සපඝීනම්වෙයි. එහෙයින් පටිසම්භිදා මාර්ගයෙහි 'එකධම්මා කුසලං සියා අකුසලං, සියා අව්‍යාකතං" යනාදිය වදාරණලද්දේයි. වේදනාව ආදී අවශෙෂ දෙළොස් චෛතසිකයන්ගේද කුශලා කුශල අව්‍යාකෘත භාවය මෙසේ දතයුතුයි.

මොහොව ආලම්බණ සභාව මුවහකිරීම ලක්ෂණකොට ඇත්තාවූ මොහ චෛතසිකයෙක්ද; අහිරිකව, කායදුශ්චරිතාදී යෙන් ලජ්ජානොවීම ලක්ෂණකොට ඇත්තාවූ අහිරිකචෛතසිකයෙක්ද: අනොත්තප්පව, කායදුශ්චරිතාදියෙන් භයනොවීම ලක්ෂණකොට ඇත්තාවූ අනොත්තප්ප චෛතසිකයෙක්ද: උද්ධච්චව, නොසන්හුන්බව හා වික්ෂිප්තබව නොහොත් දමාගසන බව ලක්ෂණකොට ඇත්තාවූ උද්ධච්චචෛතසිකයෙක්ද; ලොභොව, අරමුණෙහි ඇලීම්වශයෙන් ගිජුවයබව ලක්ෂණකොට ඇත්තාවූ ලොභ චෛතසිකයෙක්ද; දිට්ඨව, පෙරළිම්වශයෙන් මෙකෙස් කිරීම ලක්ෂණකොට ඇත්තාවූ දිට්ඨිචෛතසිකයෙක්ද; මානොව, කම්මය උත්තමයෙකැයි සිතා ආත්මය ධවජයක්හා සමාන කරන්නාවූ මානචෛතසිකයෙක්ද; දෙසොව, කකීශභාවයෙන් වූ

දවා පැවැත්ම ලක්ෂණකොට ඇත්තාවූ වෙශ චෛතසිකයෙක්ද; ඉසාව, අඳුන්ගේ සම්පත්තියට රාබලීම ලක්ෂණකොට ඇත්තාවූ ඉසාචෛතසිකයෙක්ද; මච්ඡරියව, තමාගේ සම්පත් සහනා නැබීම ලක්ෂණකොට ඇත්තාවූ මච්ඡරිය චෛතසිකයෙක්ද; කුකුකුච්චව, පසුතිය කාලයෙහි කරණලද්දාවූ දුශ්චරිතයන් හා නොකරණලද සුචරිතයන් ගැන නැවත නැවත පසුතැවිලිවීම ලක්ෂණකොට ඇත්තාවූ කුකුකුච්ච චෛතසිකයෙක්ද; පීතව; චිත්තයාගේ අරමුණෙහි නොඉවසීම ලක්ෂණකොට ඇත්තාවූ පීතචෛතසිකයෙක්ද; මිඛව, වෙදනා සඤ්ඤා සංඛාර සංඛ්‍යා තසකඛන්ධයාගේ අරමුණු නොඉවසීම ලක්ෂණකොට ඇත්තාවූ මිඛචෛතසිකයෙක්ද; විචිකිච්ඡාව, අරමුණු නිශ්චයකිරීමෙහි අදක්ෂබව ලක්ෂණකොට ඇත්තාවූ විචිකිච්ඡා චෛතසිකයෙක්ද; ඉති, මෙසේ; චුද්දස ඉමේ චෙතසිකා, තුදුසක් ප්‍රභෙදවූ මේ චෛතසිකයෝ තුමූ; අකුසලානාම, අකුශල චෛතසිකනම් ඇත්තාහු නොහොත් අන්‍ය සමාන චෛතසිකයන්මෙන් කුශල අව්‍යාකෘත චිත්තයන්ගෙන් අන්‍යවූ අකුශල චිත්තයෙහිම යෙදෙනහෙයින් අකුසලනම් ඇත්තාහු; හොත්ති, වෙත්; සබ්බව, බුඩාදීවූ ඉෂ්ටාලම්බණයෙහි තමා හා එක්ව යෙදුනාවූ චිත්ත චෛතසිකයන් රාගාදී කෙලෙශ නැතිව ම්ඛ බොරයෙන්වෙන් කොට පැහැදවීම ලක්ෂණකොට ඇත්තාවූ ශ්‍රඩා චෛතසික යෙක්ද: සතිව, බුඩාදිවූ ඉෂ්ටාලම්බණය තමා හා සම්ප්‍රයුක්තවූ ධර්මයන්ට සිහිකරවීම ලක්ෂණකොට ඇත්තාවූ; සමාත චෛතසිකයෙක්ද; හිරිව, කායදුශ්චරිතාදියෙන් ලජ්ජාවීම ලක්ෂණකොට ඇත්තාවූ හිරිචෛතසිකයෙක්ද; ඔත්තප්පව; කායදුශ්චරිතාදියෙන් භයවීම ලක්ෂණකොට ඇත්තාවූ ඔත්තප්ප චෛතසිකයෙක්ද; අලොභොව, අරමුණෙහි නොඇලීම ලක්ෂණකොට ඇත්තාවූ අලෝභ චෛතසිකයෙක්ද; අදෙසොව, කර්කශභාවයෙන් වරදවා නොපැවැත්ම ලක්ෂණකොට ඇත්තාවූ අදෝස චෛතසිකයෙක්ද; තත්‍රමජ්ඣත්තතාව, ඒ ඒ අරමුණෙහි සම්ප්‍රයුක්ත ධර්මයන්ගේ මැදහත්ව නැංඹීම සිඩකිරීම ලක්ෂණකොට ඇත්තාවූ තත්‍රමජ්ඣත්තතා චෛතසිකයෙක්ද; කායපස්සඩ්ඪිව, වෙදනාදී සඤ්ඤාත්‍රයාගේ සන්සිඳීම ලක්ෂණකොට ඇත්තාවූ කායපස්සඩ්ඪි චෛතසිකයෙක්ද; චිත්තපස්සඩ්ඪිව, විඤ්ඤාණසඤ්ඤා යාගේ සන්සිඳීම ලක්ෂණකොට ඇත්තාවූ චිත්තපස්සඩ්ඪි චෛතසිකයෙක්ද; කායලහුතාව, වෙදනාදී සඤ්ඤාත්‍රයාගේ සැහැල්ලුබව ලක්ෂණකොට ඇත්තාවූ කායලහුතානම් චෛතසිකයෙක්ද; චිත්තලහුතාව, විඤ්ඤාණසඤ්ඤාගේ සැහැල්ලුබව ලක්ෂණ

කොට ඇත්තාවූ චිත්තඒලහුතා චෛතසිකයෙක්ද; කායමුදුතාව, වේදනාදී සඤ්ඤක්ඛන්ධයාගේ මොළොක්බව ලක්ඛණකොට ඇත්තාවූ කායමුදුතා චෛතසිකයෙක්ද; චිත්තමුදුතාව, විඤ්ඤාණ සඤ්ඤක්ඛන්ධයාගේ මොළොක්බව ලක්ඛණකොට ඇත්තාවූ චිත්ත මුදුතා චෛතසිකයෙක්ද; කායකම්මඤ්ඤතාව, වේදනාදීඑසඤ්ඤක්ඛන්ධ ත්‍රයාගේ අරමුණුගැණීමෙහි සාධුභාවය ලක්ඛණකොට ඇත්තාවූ කායකම්මඤ්ඤතා චෛතසිකයෙක්ද; චිත්තකම්මඤ්ඤතාව, විඤ්ඤාණසඤ්ඤක්ඛන්ධයාගේ අරමුණුගැණීමෙහි සාධුභාවය ලක්ඛණකොට ඇත්තාවූ චිත්තකම්මඤ්ඤතා චෛතසිකයෙක්ද; කායපාගුඤ්ඤතාව, වේදනාදීඑසඤ්ඤක්ඛන්ධත්‍රයාගේ අරමුණුගැණීමෙහි පුහුණු බැව් ලක්ඛණකොට ඇත්තාවූ කායපාගුඤ්ඤතා චෛතසිකයෙක්ද; චිත්තපාගුඤ්ඤතාව, විඤ්ඤාණසඤ්ඤක්ඛන්ධයාගේ අරමුණුගැණීම ලක්ඛණකොට ඇත්තාවූ චිත්ත පාගුඤ්ඤතා චෛතසිකයෙක්ද; කායුජුකතාව, වේදනාදිඑසඤ්ඤක්ඛන්ධත්‍රයාගේ අරමුණුගැණීමෙහි අවඬකබව ලක්ඛණකොට ඇත්තාවූ කායුජුකතා චෛතසික යෙක්ද; චිත්තුජුකතාව, විඤ්ඤාණස්කන්ධයාගේ අරමුණුගැණීමෙහි නොඇද බැව් ලක්ඛණකොට ඇත්තාවූ චිත්තුජුකතා චෛතසිකයෙක්ද; ඉති, මෙසේ; එකූනවිසති ඉමේ චෙතසිකා, එකුන්විස්සක් ප්‍රභෙදවූ මේ චෛතසිකයෝ තුමූ; සොභන සාධාරණානි, සියලු එකුන්සැටක් සොභන චිත්තයෙහි යෙදෙන බැවින් සොභන සාධාරණනම් ඇත්තාහු; භොන්ති, වෙත්; සම්මාවාචාව, ආජීවහෙතුව අපෙක්ෂානොකොට නොහොත් ජීවිකාවම කරණකොට නොගෙණ මුසාවාද පිසුනාවාච ඵරුසවාච සම්ඵප්‍රලාප යන සතරවාග් දුශ්චරිතයෙන් වෙන්වීම ලක්ඛණකොට ඇත්තාවූ චෛතසිකයෝද; සම්මාකම්මන්තා, ආජීවහෙතු අපෙක්ෂානොකොට නොහොත් ජීවිකාව කරණ කොට නොගෙණ පාණාතිපාත අදින්නාදාන කාමමිච්ඡාචාර සංඛ්‍යාතවූ ත්‍රිවිධකාය දුශ්චරිතයෙන් වැළක්ම ලක්ඛණකොට ඇත්තාවූ සම්මාකම්මන්ත චෛතසිකයෙක්ද; සම්මාආජීවොව, ආජීවහෙතු අපෙක්ෂානොකොට නොහොත් ජීවිකාව කාරණා කොටනොගෙණ යථොක්ත සප්තවිධ දුශ්චරිතයෙන් වැලකීම ලක්ඛණකොට ඇත්තාවූ සම්මාආජීව චෛතසිකයෙක්ද, ඉති, මෙසේ; තිසෙසා ඉමා චෙතසිකා, මේචෛතසිකයෝ තුන්දෙන; විරතියො නාම, විරතිනම් ඇත්තාහු; නොහොත් විරවිතව්‍ය වස්තූන්ගෙන් වැළකීමට හෙතුවනහෙයින් විරති චෙතසිකනම් ඇත්තාහු; භොන්ති, වෙත්; කරුණාව, අප්‍රමාණ දුඃඛිත සත්ව ප්‍රඥප්තිය අරමුණුකොටගෙණ අනුකම්පාකිරීම ලක්ඛණකොට

ඇත්තාවූ කරුණා චෛතසිකයෙක්ද; මුදිතාව අප්‍රමාණවූ සුඛිත සත්ව ප්‍රඥප්තිය අරමුණුකොට පැවැත්වීම ලක්ෂණකොට ඇත්තාවූ මුදිතා චෛතසිකයෙක්ද; ඉති ඉමේ චෛතසිකා, මෙසේ මේ චෛතසිකයෝ තුන්; අපපමඤ්ඤා යොනාම, අප්‍රමාණ සත්වයන් අරමුණුකොට පවත්නාහෙයින් අප්‍රමාණ්‍යනම් ඇත්තාහු; හොනති. වෙත්; ඉති, මෙසේ; සබ්බථාපි, සර්ව්‍රකාරයෙන්ද; පඤ්චින්ද්‍රියෙන සඬිං, අනිත්‍යාදිවශයෙන් ප්‍රතිවෙධකොට දූනඟැණීමෙහි ඒකෝරභාවය ලක්ෂණකොට ඇතිහෙයින් පඤ්චින්ද්‍රියකම්වූ අමෝහ චෛතසිකයා හා සමඟ; පවත්තති ඉමේ චෛතසිකා, පස්විසි මේ චෛතසිකයෝ; සොභන චෛතසිකා හොනති, ශොභන චෛතසිකනම් ඇත්තාහුයයි; වෙදිතබ්බා, දතයුත්තාහුය. ව, විසතරය හැර සංක්ෂපයෙන් දක්වම්: එත්තාවතා, එත්තාවතෙතන වචනකකමෙන, මෙපමණවූ ශබ්ද පන්තියකින්; මයාවුත්තා, මා විසින් කියනලද්දාවූ; චෛතසිකා, චෛතසිකයෝ; තෙරස අඤ්ඤසමානාව, තෙළෙස් අන්‍ය සමාන චෛතසික කෙනෙක්ද; චුද්දසා අකුසලා, තුදුස් අකුශල චෛතසිකයෙනෙක්ද; තථා, මොවුන් හැර; පවත්තති ශොභනා, පස්විසිශොභන චෛතසිකයෙනෙක්ද; ඉති, මෙසේ; විපඤ්ඤාය දෙපණසෙක්වෙත්යයි; පවුච්චරෙ, කියනුලැබෙත්.

අන්‍ය සමාන තෙළෙස් චෛතසිකයන්ගේ විභාග දක්වා දැන් තුදුස් අකුශල චෛතසිකයන්ගේ විභාග දක්වනුලැබේ. මොහ තෙවම් ආළම්බණ සවභාව මුවහකිරීම ලක්ෂණකොට ඇත්තේයි. ආළම්බණ සවභාව කොසේ මුවහකරන්නේදයත්? පූර්‍වාන්තය නොදැනීමය, අපරාන්තය නොදැනීමය, පූර්‍වාපරාන්තය නොදැනීමය, ඉදප්‍රත්‍යතා සඬ්ඛ්‍යාත පට්ච්චසමුප්පාදය නොදැනීමය, යනමේ සතර තැන මුවහකිරීම මොහයාගේ ලක්ෂණයයි. ඝම්සේ වනලැහැබය, අවපඤ්ඤාව දවසය, මඛ්‍යම රාත්‍රිය, මෙඝයෙන් වැසීමය, යන චතුරාඝයෙන් යුක්තවූ අඬ්කාරය නීල පීතාදිවූ රූපයන් මුවහකෙරේද එපරිද්දෙන් පූර්‍වාන්තාදී සතරතැන්හි නොදැනීම් සඬ්ඛ්‍යාතවූ මොහය අනිත්‍යාදී ලක්ෂණය මුවහකෙරෙයි. ලොකයෙහි ව්‍යාපි චතුරාඝයෙන් යුක්තවූ අඬ්කාරය හෙතුකොට ඝණ නොයායුතුවූ කුම්මාගීදියෙහි ගමන්කරවයි. එපරිද්දෙන් මේ චතුරාඝයෙන් යුක්තවූ මොහ සඬ්ඛ්‍යාතවූ සිත පිළිබඳවූ අඬ්කාරය කරණකොටගෙණ සත්වයා සතර අපායට හෙලයි.

අහිරික තෙමේ කායදුශ්චරිතාදියෙන් ලජ්ජානොවීම ලක්ෂණකොට ඇත්තේය. ඒ අහිරිකතෙමේ ගම්වාසින්ගේ හූරෙකුට බඳු උපමා ඇතිවේයි. ග්‍රාමාන්තයෙහි පහරන්නාවූ මළ මූත්‍රාදිය කරණකොටගෙණ ග්‍රාම්‍යවාසී මනුෂ්‍යයෝ ඒ දිග් භාගයට පවා ගමට බිළිකුල් වෙති. එනකුදුවුවත් හම් හූරූ තෙමේ අනිෂ්ටාලම්බිණයවූ ඒ අමේධ්‍යය මිනිසුන්ගේ අභිමුඛයෙහිම මිහිරක් අනුභවකරන්නාක්මෙන් රසාස්වාදයකරමින් අනුභවකෙරෙයි. එපරිද්දෙන්ම මනුෂ්‍ය තෙමේ මේ අහිරික චෛතසිකය කරණකොටගෙණ ආත්ම ගෞරවය අපේක්ෂා නොකොටම තමාගේ ආත්මය කෙලෙසේයයි ලජ්ජානොවී මහ ජනයා අභිමුඛයෙහිම ප්‍රාණඝාත සුරාපානාදී දුශ්චරිතයෙහි හැසිරෙයි.

අනොත්තප්ප චෛතසික තෙමේ කායාදී දුශ්චරිතයෙන් තැතිනොගැණීම ලක්ෂණකොට ඇත්තේයි. ඒ අනොත්තප්ප චෛතසිකය තෙමේ පළහැටියෙකුට බඳු උපමා ඇත්තේවෙයි. කෙසේ පළහැටියෙකුට සදිසවන්නේදයත්? අතල් පඟනක් දැල්වූකල්හි ඒ පඟන් සිළුව සපගී කිරීමට සමර්ථනොවෙයි. ඉදින් මේ පඟන් දළුව සපගී කෙළේනම් අතදවන්නේයයි භය පත්ව එහි ආදීනව දන්නාවූ මනුෂ්‍යයෝ දුරින්ම දුරුවෙති. එනකුදුවුවත් පළහැටි තෙමේ පඟනක් දැල්වූකල්හි ඒ පඟන් සිළු ආලෝකයට රැවටී රූපතෘෂ්ණාවෙන් මුළාවී ඒ පඟන් වැටියෙහි වැටී දිවිනසාගණී. එපරිද්දෙන්ම මනුෂ්‍ය තෙමේ ප්‍රාණඝාත කාමමිථ්‍යාචාර සුරාපානාදී තමාගේ දුශ්චරිතඵල් දුකට සැපවෙන්යයි රැවටී මේ අනොත්තප්පය හෙතුකොටගෙණ දුශ්චරිත නැමති ගින්නෙහිහෙලනුලැබේ. එහෙයින් අනොත්තප්පය පළහැටියෙකුට බඳු උපමා ඇතිවෙයි.

උඬ්ඩව්ච චෛතසිකය තෙමේ චිත්තයාගේ නොසන්හුන් බව හා වික්ෂිප්තබවකිරීම ලක්ෂණකොට ඇත්තේයි. ඒ උඬ්ඩව්චය තෙමේ අළු රැසකට කැටඹින්ගැසීමට බඳු උපමා ඇතිවෙයි. අළු රැසකට කැටඹින් පහර දුන්කල්හි ඒ අළු අහසට නැගීබඹමින් පවත්නේයි. එපරිද්දෙන්ම මේ උඬ්ඩව්චය නැමති කැටින් සම්ප්‍රයුක්ත චිත්ත නැමති අළු රැසට පහරදුන්කල්හි ඒ චිත්ත චෛතසික ධර්මයෝ නොසන්හුන් භාවයෙන් හා වික්ෂිප්තභාව යෙන් යුක්තව පවතිත්.

ලෝභ තෙමේ අරමුණෙහි ගිටුවහගෙන් ඇලීම ලක්ෂණකොට ඇත්තේයි. එහෙයින් මේ ලෝභ තෙමේ වඳුරු ලඟවූව

කට බදු උපමා ඇත්තේවේ. යම්සේ මිදුරන්යෂ්ඨාඹූ මංතල යෙහි පුවරුකඩක වදුරුලහටුව ගාතඹා වදුරන් ක්‍රීයකරන්නාවූ පුෂපඵලාදිය දැමූකල්හි යම්කිසි වදුරෙක් අවුත් ඒ ලහටුවෙහි අතතැබූකල්හි ඒ අත ඇලියයි. නැවත අනික් අත තැබූකල්හි ඒ අතත් ඇලියයි. ඉක්බිති පයත් තැබූකල්හි ඒපය ඇලියයි. අනිත් පයත් තැබූකල්හි ඒපයත් ඇලියයි. මෙසේ අත්පා ඇලි ගියකල්හි පස්වෙනුව මුඛය තබයි. ඒ මුඛයත් ඇලිගියකල්හි වදුරුවැදි තෙමේ දිවඅවුත් දඹුමුගුරු ආදියෙන් තලා මරා ගෙණගොස් මස් අනුභවකරයි. එපරිද්දෙන්මේ මනුෂ්‍ය තෙමේ රූපාදී පවකාම නැමති ලහටුවෙහි චක්ෂුරාදී පස්තැනින් ඇලිගියකල්හි වසවත්තිමාරතෙමේ අවුත් අපායට දමාගනියි. එහෙයින් ලොහතෙමේ වදුරු ලහටුවකට බදු උපමා ඇතිවෙයි.

දෘෂ්ටි තොමෝ වරදවා දැක්ම හා වරදවා මෙනෙහිකිරීම ලක්ෂණකොට ඇත්තීය. ඒ මිථ්‍යාදෘෂ්ටි තොමෝ ඉඳුජාලය කට බදු උපමා ඇත්තිවෙයි. නොහොත් ජීවිතාරක්ෂාව සඳහා පිශාච නගරයකට යායුතුවූ උන්වාගේයකට බදුවෙයි. යම්සේ ඉඳුජාලික තෙමේ කොටකැබිලිති ආදිය රහ්රූවන් මුතුමැණික් කොට පෙන්වාද එපරිද්දෙන්ම මිථ්‍යාදෘෂ්ටි සඞ්ඛ්‍යාත වරදවූ දැකීම හෙතුකොටගෙණ අනාත්මය ආත්මයක්කොට සිතා ගණියි. එකාන්තසාවද්‍යවූ සත්ත්වඝාතන සුරාපානාදිය එකාන්ත අනවද්‍යවූ කුශල ධර්මයයි සිතාගණියි. මේසින් මතු සදකාලික සවර්ගයෙහි හෝ බ්‍රහ්මලොකයෙහි හෝ උපදිමියි වරදවා මෙනෙහිකරයි. එසේම නොමැරෙනු කැමතිවූ සැප කැමතිවූ පුරුෂයෙක් බොහෝකල් සැපසේ ජීවත්වෙනු සඳහා පිශාච නගරගාමී මාර්ගයකට පැමිණෙයි. ඒ පුරුෂ තෙමේ පිශාච නගරයට පැමිණිකල්හි ඒ පිශාචයෝ මේ පුරුෂයා අල්වා ලේ බී මස් අනුභවකෙරෙති. එපරිද්දෙන්ම මිථ්‍යාදෘෂ්ටි මනුෂ්‍ය තෙමේ සදකාලික සැප ලබනු පිණිස මිථ්‍යාදෘෂ්ටි නැමති මාර්ගයෙහි ගොස් අපායට වැටුනුකල්හි නිරිසතුන් විසින් නොයෙක් දුක්කාරී කටුලුකරති.

මානතෙමේ මම උතුම්යි තමා ධවජයක්කරනු කැමැත්ත ලක්ෂණකොට ඇත්තේයි. ඒමානයකිරීමට හෙතුහුනම්:-තමාගේ ශරීර ලක්ෂණය හෙතුකොටගෙණද මානයකරයි. ධනසම්පත්තිය හෙතුකොටගෙණද මානයකරයි. වයසෙන් හා ගුණයෙන් වැඩිසිටීම හෙතුකොටගෙණද මානයකරයි. ජාතිගොත්‍රය හෙතුකොටගෙණද මානයකරයි. උතුම්වූහෙයින් මානයකරයි. කුශල

කම්උපනිස්සයකොටගෙණද මානයකරයි. මේ මාන තෙමේ ජාති මානය පුණ්‍යමානය ගුණමානයයි තුන්වැදෑරුම්වේ. මම වනාහි රජකුලයෙන් පැවත එන්නෙමියි සිතා මානයකරයි. මම වනාහි කුශලකම්හෙතුවෙන් ධනසම්පත් ලැබීමියි සිතාමානය කරයි. මම වනාහි ශීල සමාධි ගුණයෙන් යුක්තයයි සිතා මානය කරයි. නොහොත් හීනමානය, සදිසමානය, ප්‍රණීතමානයයි කියා තුන්වැදෑරුම්වේ. නිවම මනුෂ්‍යයෙක් තෙමේ උතුම් මනුෂ්‍ය යෙකුට මානකිරීම හීනමානයයි. මමද ඔහුද ධනකුලශීලාදී යෙන් සමානයයි සිතා මානකිරීම සදෘශමානයයි. රජ බමුණු වෙළඳ ආදීවූ උත්තම මනුෂ්‍යයන් පියාසින් හීන සම්මත මනුෂ්‍ය යන්ට මානයකිරීම පණීතමානයයි. සෙය්‍යමානය යනු මේවම නමකි.

වෙෂ තෙමේ කකීශවශයෙන් වැදවා පැවතීම ලක්ෂණ කොට ඇත්තේසි. ඒ වෙෂ තෙමේ ගස්බෙනයක සයනාසනකර න්නාවූ උහුවූ සොරවූ විෂඇත්තාවූ සතියෙකුට බඳුඋපමා ඇති වෙයි. යම්සේ ගස්බෙනයෙහි වැදහොත්තාවූ සතියාහට දඬු මුගුරු කැටකැබිලිති ආදියෙන් පහරදුන්නේවේද එකල්හි ඒ සතිතෙමේ ගස්බෙනයන් පිටතට අවුත් පහරදුන් පුරුෂයා දශවකොට ජීවිතක්ෂයට පමුණුවයි. එපරිද්දෙන්ම හෘදයාබභ්‍ය නතර නැමති ගස්බෙනයෙහි අනාගාමී මාර්ගයෙන් ප්‍රහාණය නොකිරීමෙන් අනුසයවිශයෙන් සයනයකළාවූ වෙෂ නැමති සතියාහට නවවිධ ආඝාත වස්තුවය, අසප්පායෝපය යන දශ ප්‍රකාරවූ කැටකැබිලිති දඬු මුගුරු ආදියෙන් පහර දුන්කල්හි ආත්මාබිභ්‍යනතරයෙන් මැනට අවුත් අනුන්ගේ ජීවිතය පවා විනාශකෙරෙයි. නොහොත් මේ වෙෂ තෙමේ යකඩයේ නැංගාවූ මලයක්සෙසිත් ඒ වෙෂ සහගත පුද්ගලයාම විනාශකෙරෙයි. නොහොත් හිනිගානා දඬෙන් හටගත්තාවූ ගින්නකට බඳු උපමා ඇත්තේවෙයි. එපරිද්දෙන්ම මේවෙෂ තෙමේද සත්ව යන්ගේ අඛ්‍යාතමසහධාතය නිසාසයකොටගෙණ ඉපිද වෙෂ යාගේ අනන්තර ඵලය සඩකිය ජීවිත විනාශය බැවින් මේ ජාති යෙහි තමාගේ ආත්මය විනාශකොටගෙණ මරණින් මතු සතර අපායෙහි ඉපිද මහත් අනයවසනයට භාජනවෙයි. එහෙයින් යකඩෙහි උපන්මලය යකඩය විනාශ කරන්නාක්මෙන්ද, ගස් බෙනයෙන් හටගත්තාවූ ගින්න එගස දවන්නාක්මෙන්ද, හිනි ගානාදණ්ඩෙන් හටගත්තාවූ ගින්න ඒහිනිගානා දඬුදවන්නාක් මෙන්ද සත්වයාගේ ආඛ්‍යාත්මික සන්තානයෙහි හටගත්තාවූ වෙෂ තෙමේ මේ ජාතියෙහිත් තමාගේ ආත්මය විනාශකොට මරණින් මතු අපාය දුකට භාජනවෙයි.

ඊර්ෂ්‍යා තොමෝ අනුන්ගේ සම්පත්තියට රවාබැලීම ලක්ෂණකොට ඇත්තීය. මාත්සර්‍යතොමේ තමාගේ සම්පත් සැඟවීම ලක්ෂණකොට ඇත්තේය. ඊර්ෂ්‍යාව වනාහි බාහිර ධර්මයන්ම අරමුණුකොට පවත්නීය. අධ්‍යාත්මය අරමුණුනොකරන්නීය. මාත්සර්‍යය අධ්‍යාත්මයම අරමුණුකරන්නේය. බාහිරය අරමුණුනොකරන්නේය. ඊර්ෂ්‍යා තොමෝ අනුන්ගේ වස්ත්‍රාභරණ ධනසම්පත් පිරිස්සම්පත් ආදිය සූරැස්නා සුළුව රවා බලන්නාවූ කල්හි බාහිරධර්මය අරමුණුකරන්නේනම්වෙයි. මාත්සර්‍යතොමේ තමාගේ ධනසම්පත් ඇත්තේ නමුදු අනුන්ටදීමට ප්‍රස්තාවක් පැමිණිකල්හි සියයක් ඇත්තේ නමුදු පණසක් ඇත්තේයයිද පණසක් ඇත්තේ නමුදු පස්විස්සක් ඇත්තේමයයිකියාද තමන්ගේ සැඟවීම මාත්සර්‍යයාගේ ලක්ෂණයවෙයි. මේ ධර්මයෝ දෙදෙනම වෙෂයාගේ යහළුවෝ දෙදෙනෙක්මවෙති. ඊර්ෂ්‍යාව උපදනාකල්හිද වෙෂය සමඟම උපදී. මාත්සර්‍යය උපදනා කල්හිද වෙෂය සමඟම උපදී. එහෙයින් මේ දෙදෙන වෙෂයාගේ යහලුවන්මෙන් දතයුතුයි.

කුකුකුච්චය තෙමේ පසුගිය කාලයෙහි රැස්කළාවූ කායාදී දුශ්චරිතයන්ද පසුගියකාලයෙහි රැස්නොකළාවූ දානාදී කුශල කර්මයන්ද කල්පණාකරමින් නැවත නැවත පසුතැවීම ලක්ෂණකොට ඇත්තේයි. ඒ කෙසේයත්? ලදරු කාලයෙහි වැදි කෙවුල් කර්මානතයෙන් හෝ සොරකම්කිරීම් බොරුසාක්ෂිකිම් ආදියෙන් හෝ ජීවත්වී වයස්ගතවූකල්හි සත්පුරුෂවූ ශ්‍රමණ බ්‍රහ්මණාදිවූ පණ්ඩිතයන් හා එක්ව ඒ පාපක්‍රියාවන් අත්හැර රතනත්‍රයෙහි සරණගොස් ධර්මය අසන්නාවූකල්හි ඒ දුශ්චරිතයෙහි යෙදුනාවූ පුරුෂ තෙමේ අහෝ! මාගේ මරණින් මත්තෙහි අසවල් අසවල් අපායෙහි ඉපිද මෙබඳු මෙබඳු දුක් අනුභවකරන්නටවේයැ’ පසුතැවෙන්නේයි. එසේම දානාදී පින්කම් කළාවූ සත්ත්වයෝ මරණින් මතු අසවල් අසවල් සුගතියෙහි ඉපිද මෙසේ මෙසේ දිව්‍යශ්‍රීසම්පත් වළඳන්නාහුයයි ධර්මදේශනාකාලයෙහි ඇසීමෙන් ඒ පාපකාරී වැදි කෙවුල් කර්මානතකළාවූ පුරුෂ තෙමේ මා විසින් මෙබඳු කුශලකර්මයක් නොකෙළෙමිසිතා පසුතැවෙන්නේවෙයි. මෙසේ අකුශල කර්මයන් සඳහාද කුශල කර්මයන් සඳහාද පසුතැවීම කුකුකුච්චනම්වෙයි. නොකරතලද්දාවූ සුචරිත කර්මයන් අරභයා පසුතැවෙන්නාවූ අනික් පුද්ගලයෙක්ද මහඩනසම්පත් ඇත්තාවූ කුලයෙහි ඉපිද තරුණවූ කාලයෙහි ඒ ධනය විසඳ කාමම්මත්‍යාවාර සුරාපානාදී

නොයෙක් පරිදිස්කොට විඤ්ඤාණයට පැමිණිකල්හි ඒ සම්පත් විනාශවීගියකල්හී දැකැදී පින්කම්කිරීමට සිත උපන්නේ නමුදු තමා සන්තකවූ ධනයනැති බැවින් පසුතැවීමට පැමිණේ. මේ කුසකුවව තෙමේ එකාන්තයෙන් අතීතකාලයම අරමුණු කෙරෙයි. ප්‍රත්‍යුත්පන්න අනාගත කාලයන් අරමුණුනොක රයි. නොහොත් කුසකුවව තෙමේ සවාමියා පිළිබඳව පවත්නාවූ දාසයෙකුට බදු උපමාවෙයි. ඒ දාස තෙමේ තමාගේ කැමැත්තක් නොසොට හැකිවෙයි. සවාමියා විසින් මේ දේකරව මේ දේ නොකරවයි ආඥා දුන්කල්හිම ඒ කෘත්‍යය කට හැකිවෙයි. එපරිද්දෙන්ම මේකුසකුවව චෛතසික තෙමේ අනිශයින් බලවත්වූ කල්හි ඒ කුසකුවව සහිත පුද්ගල තෙමේ තමාගේ කල්පණාවෙන්ම සුචරිත ධර්මයෙහි නොහැසිරිය හැකිවෙයි. බුඩප්‍රත්‍යෙක බුඩශ්‍රාවකාදී කල්‍යාණ මිත්‍රයන් ඇතිකල්හිම කුශලක්‍රියාවෙහි හැසිරියයුතුවෙයි. කුසකුවව තෙමේ සන්හුන් පැවතුම් ඇතිවේයි. එහෙයින් මේ කුසකුවව තෙමේ සවාමියා පිළිබඳවූ සන්සුන් දාසයෙකුට බදුවූ උපමා ඇතිවෙයි.

මේන තෙමේ තමා හා පවත්නාවූ චිත්තය හැකිලවීම සඳහා වකොට ඇත්තේවෙයි. ඕඩවෛතසික තෙමේ තමා හා එක්ව යෙදුනාවූ වේදනාස්කන්ධ සංඛාර ගත සකාඩිත්‍රය හකුලුවන සඳහාම් ලක්ෂණයකොට ඇත්තේවෙයි. එහෙයින් මේ පිනම්ඩදෙදෙන ගින්නට බදු උපමා ඇතිවෙත්. චිත්ත චෛතසිකයෝ තුමූ කුසකුවපක්ෂපත්‍රයකට බදු උපමා ඇතිවෙත්. යම්සේ ගින්නටපායනාලද කුසකුවපක්ෂපත්‍රය හැකිලියේද එපරිද්දෙන්ම පිනම්ඩදෙක හා සම්ග යෙදුනාවූ චිත්තචෛතසිකවය කුසකුවපක්ෂපත්‍රයකට බදුවෙයි. මේ පිනම්ඩයන ධර්මයෝ ඉදිදෙන එකාන්ත නිත්‍ය වන්දසම්සවයෙන් සියලු දෙශනාපාළියෙහි තුමක්ෂණයින් දක්නාලාබෙත්ද යත්? මේ ධර්මදෙදෙනාගේ කෘත්‍යය හා ප්‍රතිපක්ෂ ධර්මයෝ සමාන බැවින් නිරන්තරයෙන්ම වන්දසම්සවශයෙන් පවතිත්. මේ පිනම්ඩ දෙදෙනාගේ කෘත්‍යය චිත්තමෛත්‍රීකායන්ගේ සැහවෙනබවයි. මේ ධර්මදෙදෙනාට ප්‍රතිපක්ෂ ධර්ම වියයි චෛතසිකයයි. මෙසේ කෘත්‍යය හා ප්‍රතිපක්ෂධර්මයන්ද සමාන බැවින් පිනම්ඩ නීවරණ නාමයෙන් සියලු දෙශනාපාළියෙහි නිත්‍ය වන්දසම්සවශයෙන් වදාරණලද්දේය මේ ධර්මදෙදෙනා අතුරෙන් ඕඩයවනාභි නාමම්ඩය රූපම්ඩයයි දෙයාකාරවෙයි. ඔවුන් දෙදෙනා අතුරෙන් රූපම්ඩය අකුශල ධර්මයන්කෙරෙහි සංග්‍රහකොවෙයි. දුවල් දවස නොයෙක් කට සුතු කර්මාන්තකිරීමෙන් විඩාවට පත්වූ රූපස්කන්ධය දුවල් දවස

සුඛීතාපයෙන් තැවුනාවූ මහතෙල් උපුල් ආදීවූ පුෂ්පයන් රාත්‍රි දවස හැකිලී පවතින්නාක්මෙන් මනුෂ්‍යයාගේ රූපයක ඛයද රාත්‍රි දවස හැකිලීමට පැමිණෙයි. ඊට රූපම්ඛය නොගොත් නිද්‍රාවයයි ව්‍යවහාරකෙරේ. ඒ රූපම්ඛ වාචකවූ ම්ඛශබ්දය ජීනශබ්දය හා කිසිකාලෙකත් සමාසනොවී "සෙය්‍ය සුඛං ම්ඛසුඛං" යනාදියෙහිමෙන් ඒ ම්ඛශබ්දය හුදකලාව පවත්නේයි. එතකුදුවුවත් අකුශල ධර්මයන් කෙරෙහි ඇතුලත් ම්ඛය හෙතුකොටගෙණ රූපසඤ්ඤියෙහි හටගන්නාවූ නිද්‍රාවක්ද ඇත්තේයි. ඒකෙසේ හටගන්නේදත්? ජීනම්ඛනීවරණයෙන් යුක්තවූ සසංඛාරික අකුශල පවෘත්ය නිරන්තරයෙන් නැවත නැවත උපදනාකල්හී නාමම්ඛ සඤ්ඤාතවූ වෙදනාදිවූ සඤ්ඤාත්‍රය පිළිබඳවූ අලසභාවය නොගොත් සසංඛාරික අකුශල පවෘත්ය හා සමග උපදනා චිත්තජ රූපධර්මයන් ශරීරයෙහි පැතිරයාමෙන් රූපසඤ්ඤියද නිද්‍රාවට පැමිණෙයි. ඒ නිද්‍රාවට හෙතුවූ ජීනම්ඛ නීවරණය බැවින් "පවලායිකාරූපං පච්චුපඨානං" යනු අඨසාලිනී අට්ඨකථාවෙහි දක්වනලදී. එතකුදුවුවත් මේ රූපනිද්‍රාව අකුශල ධර්මයන්කෙරෙහි ඇතුලත්නොවේ. මේ දෙයාකාරවූ නිද්‍රාවම හෙවත් රූපධර්මයන්ගේ දෙගෙසව් හැකිලීමෙන් වන්නාවූ නිද්‍රාවය, සසංඛාරික අකුශල පවෘත්තියෙන්වන්නාවූ නිද්‍රාවය යනමේ නිද්‍රා දෙකම පෘථග්ජනයන්ට හා ශෛක්ෂ්‍යයන්ට ලැබෙත්. රහතුන්ටවන්නාවූ නිද්‍රාව දවල් දවස සුඛීතාපයෙන් මිරිකී රාත්‍රි දවස හැකිලෙන්නාවූ පද්මයක්මෙන් දවල් දවස පිඩු සිඟමාදියෙන් මිරිකුණාවූ රූපසඤ්ඤිය රාත්‍රි දවස හැකිලීම්වශයෙන් රහතුන්ට නිද්‍රාව පැමිණේ. විචිකිච්ඡා නොමෝ රූපාදී අරමුණු නිශ්චයකොට නොගතහැකිබව ලක්ෂණ කොට ඇත්තිය. ඊට උපමා කවරයත්? විචිකිච්ඡාව වනාහී දෙමංසඤ්ඤියකට බදු උපමා ඇතිවෙයි. කිසිකලෙක ඒ මාගී යෙහි නොගිය විරූ පුරුෂයෙක් තෙමේ දෙමංසඤ්ඤියට පැමිණි කල්හී මේමාගීයෙන් යෙම්දෝ අනික් මාගීයෙන් යෙම්දෝහෝයි යායුතුමාගීය නිශ්චයකොට නොගතහැකිවෙයි. තවද විචිකිච්ඡා නොමෝ සුඤ්ඤභූමියෙහි දෙදන නවාගෙණ උඩුබැලිව සය නයඤ්ඤරන්නාවූ පුරුෂයෙකුට බදු උපමා ඇතිවෙයි. ඒ පුරුෂ තෙමේ රාත්‍රිභාගයෙහි නින්දෙන් පිබිද බැලූකල්හී තමාගේ දෙදනම යකුන්දෙන්නෙකැයි සිතා භයපත්වන්නේයි. එපරිද්දෙන්ම විචිකිච්ඡා සම්ප්‍රයුක්තවූ චිත්තය නිරන්තරයෙන් පවත්නා පුඥල තෙමේ අකුශල් නොවන්නාවූ ක්‍රියාවෙහි අකුශල්යයි භය වෙයි. කුශල්නොවන්නාවූ ක්‍රියායෙහි කුශල්යයි වරදවා පිළි

පදියි. එබැවින් විචිකිච්ඡා චෛතසික තෙමේ ඖඩශවිධභාංශයෙහි යෙදී පවත්නාහෙයින් සොළොස් ප්‍රකාරඇත්තේයි. මේ විචිකිච්ඡාසම්ප්‍රයුක්තවූ චිත්තය මහාසාවද්‍ය බැවින් සොඬාන් මනින් ප්‍රහාතව්‍යවෙයි. එහෙයින් මිථ්‍යාදෘෂ්ටියට බදු මහාසාවද්‍ය අකුශල ධර්මයක්බව දතයුත්තේයි. තුදුස් අකුශල චෛතසික යන් අතුරෙන් උඩවව කුක්කුච්ච විචිකිච්ඡා යන අකුශල චෛතසිකයෝ තුන්දෙන බොහෝසෙයින් සමාන සභාව ඇත්තාහුවෙත්. මේතුදුස් අකුශල චෛතසිකයන්ගේ සංක්ෂේප විභාගයයි.

තුදුස් අකුශල චෛතසිකයන්ට අනතුරුව පස්විසි ශොභන චෛතසිකයන්ගේ ලක්ෂණ දක්වනුලැබේ ඔවුන් අතුරෙන් ශ්‍රද්ධාචෛතසිකතෙමේ බුද්ධාදී ගුණාලම්බණයෙහි තමා හා සම්ප්‍රයුක්තවූ ධර්මයන් පැහැදවීම ලක්ෂණකොට ඇත්තේයි. මේ ශ්‍රද්ධාව චක්‍රවර්ත්ති රජහුගේ සප්තරත්නයන් අතුරෙන් මාණික්‍ය රත්නයට බදු උපමා ඇතිවෙයි. සක්විතිවත්තා ප්‍රවර්ත්තාවූ රජුන්ට වෙපුල්ලපර්වතය යටහාගයෙහි දහසක් කුමහාණ්ඩයන් විසින් ආරක්ෂාකර ලද්දාවූ මාණික්‍ය රත්නය අහසින් අවුත් රජහුගේ අතෙහි පිහිටයි. ඒ රජුන් මරණයෙන් පසු නැවතත් ඒ මාණික්‍ය රත්නය වෙපුල්ලපර්වතය යටටම පැමිණෙයි. එහෙයින් මේ මාණික්‍ය රත්නය සක්විති රජුන් හැර අනිකෙකුට නොලැබෙන්නාවූ උතුම්වූ රත්නයකි. සක්විති රජතෙමේ සවහර කාලෙක්හි ජනපදචාරිකාව පිණිස සිව්රඟසෙන් පිරිවරාගන්නාවූකල්හි ඒ මාගීයෙහි සමහවූ කුඩා ගංගාවාට බැස සිව්රඟ සෙනඟ එතරවී සක්විතිරජහට පැන්පවස් ඇතිකල්හි ඒකුඩා ගංගාවෙහි බොරවූ ජලය සවණී හාජනයෙන් ගණුවුත් රජුට පිළිගන්වයි. ඉක්බිති සක්විති රජහුගේ අතපැළඳී ඒමාණික්‍යරත්නය බදනාලද පෙහෙරැස්මුදුව ගලවා ඒපැන් බදුනෙහි දමනවා හා සමඟම සියලු මඬබොරයට පත්ව ජලය ප්‍රසන්නවීයෙයි. එපරිදීදෙන්ම රාග මෙඝ මොහාදී මඬබොර හෙතුකොටගෙණ කැලැත්වූ ජලයක් මෙන් පවත්නාවූ චිත්තයෙහි ශ්‍රද්ධාචෛතසිකය නැමති මාණික්‍ය රත්නය දැමූකල්හි ඒකෙලෙශ නැමති මඬබොරයට පත්වී චිත්තය ප්‍රසන්නභාවයට පැමිණෙයි. එහෙයින් ශ්‍රද්ධාචෛතසිකය මාණික්‍ය රත්නයක්මෙන්ද, ලොභාදී පාපචෛතසිකයන් මඬබොරමෙන්ද, චිත්තයප්‍රලයමෙන්ද, උපමා උපමෙය සම්බන්ධකොට අවබෝධ දතයුතුයි.

සමෘති චෛතසිකතෙමේ යම් සිතක යෙදුනේද ඒසිත හා එක්ව යෙදුනාවූ ධර්මයන්ටද බුද්ධාදි රත්නත්‍රය ගුණසමූහය

හා නාමරූපධර්මයන්ගේ අනිත්‍යාදී සභාවයද සිහිකරවීම ලක්ෂණකොට ඇත්තේයි. ඒ සමෘති හොමෝ සක්විතිරජහුගේ පරිනායක රත්නය නොහොත් භාණ්ඩාගාරික අමාත්‍යයාට බදු වෙයි. සක්විතිරජහුගේ භාණ්ඩාගාරිකතෙමේ රාජභාණ්ඩාගාරයෙහි තිබෙන්නාවූ රත්රුවන් මුතු මැණික් ආදී වස්තූන්ගේ ලෙඛණය හා ඒ ඒ රාජාමාත්‍යාදීන්ට දියයුතු වැටුප් ආදිය ඒ අමාත්‍යයා ප්‍රවේසම්කරන්නේය. සක්විතිරජතෙමේ පවත්නා කාමයෙන් ප්‍රමාදවීමෙන් තමාගේ භාණ්ඩාගාරයෙහි ඇත්තාවූ ධනරාශියෙහිද අමාත්‍යාදීන්ට දියයුතු වැටුප් ආදියෙහිද මුළාවෙයි. ඉක්බිති ඒ භාණ්ඩාගාරික අමාත්‍යතෙමේ සක්විතිරජහුගේ විවෙකකාලයබලා ඒ ගණන් පොත් ආදිය ගෙණගොස් තුඹවහන්සේගේ භාණ්ඩාගාරයෙහි මෙතෙක් වස්තු ඇත්තේය. මේ මේ අමාත්‍යාදීන්ට වැටුප්දියයුතුය. මෙබඳු මෙබඳු කුශලකර්මයට යුතුය යනාදීන් ඒ ගණන් ලෙඛණය කියවූකල්හි සක්විතිරජතෙමේ මාගේ ධනය මෙපමණ ඇත්තේය. මාවිසින් මෙතෙක් කුශලකර්මකරණලද්දේය. අමාත්‍යාදීන්ට මෙතෙක් මෙතෙක් වැටුප්දියයුතුවන්නේයයි සිහිඵලවා සතුටුවන්නේයි. භාණ්ඩාගාරික අමාත්‍ය තෙමේ එතනින් නික්ම ගියකල්හී නැවතත් සක්විති රජහුගේ පවත්නා මානුභවය කාරණකොටගෙණ ඒ අමාත්‍යයා විසින් දක්වනලද සියල්ල මනාකොටැතිවෙයි. නැවත නැවතත් ඒ අමාත්‍ය තෙමේ අවවක්කියන්හී සිහිඵලවයි. එපරිදෙන්ම මේ සත්ත්වතෙමේ රූපාදී පවත්නාමයෙහි ඇලීම හෙතුකොටගෙණ ලොභ වෙෂ මොහයන්ගෙන් මුවහවනලද සිත්සතන්ඇත්තේ තමා විසින් රැස්කළ විරූ කුශලකර්මාදියෙහි මුළාවෙයි. නාමරූප ධර්මයෙහි ඇත්තාවූ අනිත්‍යාදිලක්ෂණය මුවහවෙයි. ඉක්බිති සමෘති චෛතසික නැමති භාණ්ඩාගාරික තෙමේ ඉදිරියට පැමිණිකල්හී ඒ ධර්මයන් සිහිපත්වෙයි. එහෙයින් මේ සත්ව සන්තානයෙහි ඇත්තාවූ ලොභ වෙෂ මොහයන්ගෙන් මුවහවීම චක්‍රවර්ත්‍යි රජහුගේ සම්පත්විදීම හෙතුකොටගෙණ තමාගේ ධනසම්පත් හා කටයුතු රාජකෘත්‍යය මුළාවීමද භාණ්ඩාගාරික අමාත්‍යයාගේ ගණන් පොත් කියවීමක්මෙන් සමෘති චෛතසික යාගේ එළඹසිටීමද ඒ අමාත්‍ය තෙමේ බැහැරගියකල්හී සක්විතිරජහුගේ මුළාවිඹක්මෙන් සමෘති චෛතසිකය පහවනිය කල්හි ලොභ වෙෂ මොහයන්ගේ පැතිරසාමද උපමා උපමෙය සංඛ්‍යාවෙන් දක්වනු ලැබේ. තවද සමෘති චෛතසිකතෙමේ ඒ ඒ අරමුණු මුළාකොටන පිණිස සතිරවශයෙන් පවත්වන හෙයින් මේ සමෘති චෛතසිකය ශීලාලෙඛණසඵහයකට බදු

උපමා ඇතිවෙයි. ශිලාලෙඛණියගේ ආරෝපණයකළාවූ යම් කාරණයක් නොනසින්නාක්මෙන්ම සමෘති චෛතසිකය සපිර වශයෙන් ප්‍රහාලයාහට ලදරු කාලයෙහි ඉගෙණගන්නාලද්දාවූ ශිල්පශාස්ත්‍රාදිහු මුළාතොවී පවතිත්. ඒ සමෘති චෛතසිකය පවම්ඛ්‍යානයෙහි ආරෝපණයකොට වැඩූකල්හී අතීතජාතියෙහි පැවති අරමුණු පවා සිහිකළහැකිවෙයි. බුඩප්‍රත්‍යෙක බුඩඅග්‍රශ්‍රාවකයන්ගේ පෙර විසූ කඳපිළිවෙළ සිහිකරන්නාවූ සිහියද අතීශයින් උත්කෘෂ්ටභාවයට පැමිණියාවූ සමෘති චෛතසිකයයි. තවද මේ සමෘති චෛතසිකය වනාහි දෙරටුසයක් ඇත්තාවූ ගෘහයක දෙරටු පාලයෙකුට බඳු උපමා ඇතිවෙයි. දෙරටු සයක් ඇත්තාවූ ගෘහය රක්නාවූ දෙරටු පාලතෙමේ ඒ දෙරටු සයෙන්ම සොර සතුරන්ට ඇතුල්වියනොදී ආරක්ෂාකරන්නාක්මෙන්ම චක්ෂුරාදී ෂඩිවාරයකින් යුකතවූ මේ ආත්මභාව නැමති ගෘහයට පාප ධර්ම නැමති සොරුන් වැද්දනොදී ආරක්ෂාකරන්නාවූ දෙරටු පාලඝානම් මේම සමෘතිචෛතසිකයයි.

හිරිචෛතසික තෙමේ කායදුශ්චරිතාදියෙන් ලජ්ජාවිම ලක්ෂණකොට ඇත්තිය. ඔත්තප්ප චෛතසික තෙමේ ඒ කාය දුශ්චරිතාදියට ත්‍රාසවිම ලක්ෂණකොට ඇත්තේයි. හිරි තොමෝ අඩ්‍යාත්මය අපෙක්ෂාකොට ලජ්ජාවිම්වශයෙන් අකුශලයෙන් වලක්නේයි. ඔත්තප්ප තෙමේ බාහිරය අපෙක්ෂාකොට සතර අපායකට භයවීම්වශයෙන් අකුශලයෙන් වලක්නේයි. හිරිය වනාහි ගෞරවය පෙරටුකොට ඇතිබව ලක්ෂණකොට ඇත්තිය ඔත්තප්පතෙමේ වරදට හා භයට ත්‍රාසවිම ලක්ෂණකොට ඇත්තේයි. හිරිතොමෝ ආත්මගෞරවය සඳහා පාපයෙන්වලක්නේයි. ඔත්තප්ප තෙමේ ලෝකගෞරවය සඳහා අකුශලයෙන් වලක්නේයි. හිරිතොමෝ අශුචියෙන් වැකුනාවූ සිහිල් අයසකඩියකට බඳුවූ උපමා ඇතිවෙයි. ඒ සිහිල් අයසකඩියවනාහි සිහිල්වූයේ නමුදු තමාගේ අත්පාදාදියෙහි අශුචිවැකේයයි යන භයින් නොඇල්ම හැකිවෙයි. ඔත්තප්ප තෙමේ ගිනිගෙණ දිලියෙන්නාවූ අයසකඩියකට බඳු උපමා ඇතිවෙයි ඒඅයසකඩිය වනාහි අතින් ඇල්මීමෙන් අශුචිනොවැකෙන්නේ නමුදු අතදවන්නේය යනභයින් අතින් නොඇල්ම හැකිවෙයි. තවද හිරි තොමෝ උත්තම කුලකාන්තාවකට බඳු උපමා ඇතිවෙයි. ඒකුල කාන්තාවකරා පරපුරුෂයෙක් පැමිණිනැල්හි මම උතුම් කුල කාන්තාවක්වමි. මොහු නීච වඤ්චයෙක. එබැවිණක්නොවිමාගේ මාතෘ පිතෘ ආදී සාම්මුඛ පරම්පරාවක්ම උතුමාම සම්මතව පැවතඑන්නේය. මාගේ පරම්පරාවෙහි කිසි ස්ත්‍රියෙක් පරපුරුෂ

සෙවනය නොකළවිරූය. මා විසින් දැන් එබඳු පාපයක්කෙළේවී නම් සියලු ලෝවැසි තෙමේ මට ගරහන්නේය. මාගේ උතුම්වූ කුලයද කෙලෙසෙන්නේයයි යනාදීන් තමාගේ කුලගොත්‍රාදිය සලකා පාපයෙන් වළකින්නාක්මෙන් හිරිවෙතසිකය කරණ කොටගෙණ ආත්මගෞරවය අපෙක්ෂාකොට පාපයෙන් වලක්නේසි. ඔත්තපපතෙමේ සිල්රක්ෂාකරන්නාවූ වෙසඟතකට බඳු උපමා ඇතිවෙයි. සිල් රක්ෂාකරන්නාවූ වෙසඟත කරා යම් පුරුෂයෙක් පැමිණිකල්හි තමාගේ ආත්මගෞරවය අපෙක්ෂාකොට රන්නේ නම්බුදු සිල් භෙදයට හසින් දුශ්චරිතයෙන් වලක්නේසි. තවද ඇතැම් වෛශ්‍යා සත්‍රීහු යම් පුරුෂයෙකුගේ පණයම්ගත් කල්හි ඒ පණයම්ගත් පුරුෂයා හැර අනික් පුරුෂයෙක් පිළි නොගණිත්. එපරිදිදෙන්ම ඔත්තපපතෙමේ කායදුශ්චරිතාදියට භයනොවන්නේද අපාය භය හෙතුකොටගෙණ පාප යෙන් වලක්නේසි. හිරි චෛතසිකය වනාහි සතරකාරණයක් කරණකොටගෙණ උපදනේසි. ඒ සතරකාරණයනම් ගොත්‍රය, වයසය, සූරභාවය, බහුශ්‍රැතභාවය, යනසතරයි. ඔත්තපපයද සතරකාරණයකින් උපදී. ඒකවර සතරෙක්ද යත්? ශීලය, දෙශය, ප්‍රඥාවය, භික්ෂුභාවය යන සතරවෙත්. හිරියෙහි සතර කාරණයන් අතුරෙන් උතුම්වූ කුලගොත්‍රයෙහි උපන් මනුෂ්‍ය තෙමේ වැදි කෙවුල් භාම්නන්නාදියකිරීම හෝ සුරාපානාදී දුශ්චරිතකිරීමක් හෝ කටයුතු තැනක් පැමිණිකල්හි මම වනාහි මෙබඳු උතුම් ගොත්‍රයෙහ උපන්නෙක්වෙමි. මෙවැනි කෙවුල් ආදී භාම්නන්න නීවූ මනුෂ්‍යයන්ට අයත් කම්නන්නවෙති. එහෙයින් මාගේ ගොත්‍රයට මෙබඳුවූ නීවූ පාපධර්ම නොකටයුතුයයි සිතා පාපයෙන් වලක්නේසි. එසේම සුදුසු වයසට පැමිණි පුරුෂ තෙමේ මේ සත්ත්වනාන සුරාපානාදිය මාගේ වයසට සුදුසුනොවෙයි සිතා දුශ්චරිතයෙන් වලක්නේසි. අනික් සත්ත්වයෙක් තමාගේ සූරවීරභාවයට මෙබඳු දුශ්චරිත නොකටයුතුය ගොවිකම් වෙළඳාම් ආදී යහපත් රක්ෂාවකින් ධනය උපයන්ට නොහැකි අලසයන්ගේ ක්‍රියාවකැයි සිතා දුශ්චරිතයෙන් වලකී. අනික් පුරුෂයෙක්ද දුශ්චරිතයක්කිරීමට ප්‍රත්‍යාව පැමිණිකල්හි මාගේ මාතෘ පිතෘන් විසින් මේ මේ ශිල්පශාස්ත්‍ර උගන්වා මා බහුශ්‍රැත භාවයට පමුණුවනලද්දේසි. මේබඳු අකුශල ධර්ම වනාහි කිසි ශිල්පශාස්ත්‍රයක් නුගත්තාවූ අඥාන මනුෂ්‍යයන්ට අසිති ක්‍රියා වෙයි. යනාදීන් සිතා දුශ්චරිතයෙන් වලක්නේසි. මෙසේ ගොත්‍ර වයස් සූරභාව බහුශ්‍රැතභාවය යන කාරණා සතර හෙතුකොට ගෙණ දුශ්චරිතයෙන් වලක්නේසි, ඔත්තපපයාගේ සතරකාර

ණයකම්:-යම්කිසිවෙක් දුශ්චරිතයක්කිරීමට ප්‍රස්තාව පැමිණි කල්හී ලොකයෙහි ශීලවන්තවූ ශ්‍රමණ බ්‍රාහ්මණදිව්‍යබ්‍රහ්මාදීහූඑකා න්තයෙන් මට නිහැකරන්නාහුයයි සිතා භයින්වලක්නේයි. "දෙශය" යනු රත්නත්‍රයට ගෞරවකරන්නාවූ මනුෂ්‍යයන් වාසය කරන්නාවූ ප්‍රතිරූපදෙශයෙහි මාවිසින් දුශ්චරිතය රැස්කෙළේ විනම් නුසුදුසුයයි සිතා දෙශයට භයින් දුශ්චරිතයෙන් වලකී. ප්‍රඥාව හෙතුකොටගෙණ කෙසේ දුශ්චරිතයෙක්වලක්නේද යත්? පණ්ඩිත ජනයන් වාසයකරන්නාවූ යම් ප්‍රදෙශයෙක්හි වසන්නාවූ පුද්ගලයෙමේ තමා විසින් රැස්කරනලද්දාවූ දුශ්චරිතයන් අසවල් අසවල් පණ්ඩිතයන් විසින් නිහැකරනුලැබේයයි සිතා ප්‍රඥාවනයෙන්ට භයින් දුශ්චරිතයෙන්වලකී. හිරිඔත්තප්පයට පැමිණියේ යම් දුශ්චරිතයක්කිරීමට ප්‍රස්තාව පැමිණිකල්හි මාගේ හිරිඔත්තප්පයට නුසුදුසුයයි සිතා අයුශලයෙන් වලක්නේයි මේ ඔත්තප්පයාගේ හෙතුඵලතරයි. මේ හිරිඔත්තප්ප දෙදෙන වනාහි දුශ්චරිතයන් රැස්කිරීමෙහි ලජ්ජාභය උපදවනහෙයින් මූලහූතවශයෙන් පවත්නේයි. එහෙයින් මේ හිරිඔත්තප්ප දෙදෙන දෙවධර්මයයි කියාද ලොකපාලක ධර්මයයි කියාද ව්‍යවහාරකෙරෙත්.

අලොභ චෛතසික තෙමේ රූපාදී අරමුණෙහි නොඇලීම ලක්ෂණකොට ඇත්තේයි. ඊට උපමා කවර යත්? ශෛවලද ආශ්‍රව ඇත්තාවූ මහරහත්තෙනෙකුට බඳු උපමා ඇත්තේවෙයි. ඒ අලොභය මහරහතුන්ව කෙසේ උපමාවන්නේදයත්? මහරහතුන්වහන්සේ වනාහි යම් උපාසකයෙකුගේ විහාරයෙහි වෙසෙමින් ඔහුගේ සිව්පසය අනුභවකොට ඒ විහාරයෙන් නික්මයන්නාවූකල්හි කුලයාකෙරෙහිද ගණයාකෙරෙහිද නොඇලිපවත්නාහෙයින් තමාගේ ප්‍රත්‍යදායකයාට පවා නොදන්වා විහාරයෙන් නික්මයෙයි. එබඳු නොඇලෙන්නාවූ සවභාව මේ අලොභයෙහි විද්‍යමානහෙයින් මහරහතුන්ට උපමා කෙරෙයි. නොහොත් පද්මපත්‍රයෙහි ජලය දැමූකල්හී එක්දිය බිඳුව කුදු පත්‍රයෙහි නොඇලී පෙරලීවැටෙයි. එපරිද්දෙන් අලොභචෛතසික ඝනමේ රූපාදී අරමුණෙහි නොඇලෙන්නේයි. නොහොත් අසුචිවළෙක්හි වැටුනාවූ පුරුෂයෙකුට බඳු උපමා ඇතිවෙයි. අසුචිවළෙහි වැටුනාවූ පුරුෂ තෙමේ තමාගේ ශරීරයෙහි වැකුනාවූ අශුචිය වහාම පිරිසිදුකරගැණීමට උත්සාහ කෙරෙයි. එපරිද්දෙන්ම කාමලොක නැමති අසුචි වළෙහි වැටුනාවූ පුරුෂයාගේ ශරීරයෙහි කැවරුනාවූ අශුචියක් වැනිවූ මේ

පඤ්චකාමසමපත්තිය වහාම දැනමුඛයෙහි විසඳීමට මේ අලෝභ චෛතසිකය උත්සාහකරෙයි.

අවෙෂ චෛතසිකය තෙමේ අරමුණෙහි රළු පරුෂ ආකාරයෙන් වරදවා නොපැවැත්ම ලක්ෂණකොට ඇත්තේයි. ඊට උපමා කවරයත්? වැලිකෙළියෙහි මිත්‍රවූ යම්කිසි මිත්‍රයෙක් අන් රටකට ගොස් බොහෝකලක් සිට නැවත ආකල්හි ඒ මිත්‍රයා පිළිගැණීමට වැලිකෙළියෙහි මිත්‍රවූ අනික් මිත්‍ර තෙමේ අතිශයින් සතුටුවෙයි. ආහාරපාන භොජනාදියෙන් සංග්‍රහකිරීමට අතිශයින් උත්සාහකෙරෙයි. එපරිද්දෙන් අවෙෂ චෛතසික තෙමේ අන්‍රවකට ගොස් බොහෝකලක් වැස නැවත ආ මිත්‍රයාට බඳු උපමා ඇතිවෙයි. ඒ චිත්තයෙහි යෙදුනාවූ අවශෙෂ පුරුදු චිත්ත චෛතසිකාදීහු පුරාණ වැලිකෙළියෙහි මිත්‍රවූ මිත්‍රයන්ට බඳුවෙත්. තවද ගොයිම් වඳනයකට බඳු උපමා ඇතිවෙයි. කකියන්නාවූ ජලයෙහි ගොයිම් වඳනය දැමූකල්හි ඒ කකියන්නාවූ ජලය වහාම සිහිල්වෙයි. එපරිද්දෙන්ම දෙම්නස් ප්‍රතිඝ නැමති ගින්නෙන් කකියන්නාවූ චිත්තයෙහි අවෙෂය යෙදුනු කල්හි වහාම සිතල භාවයට පැමිණෙයි. එහෙයින් අවෙෂචෛතසිකය ගොසිස වඳන ඛණ්ඩයකට බඳු උපමා ඇතිවෙයි. කෙලශයන්ගෙන් කකියන්නාවූ චිත්තය උණුජලයකට බඳු උපමා ඇතිවෙයි. මේ අවෙෂය සභාවවශයෙන් මෛත්‍රියට සමානවෙයි. එහෙයින් මෛත්‍රිය මේ චෛතසිකයන් කෙරෙහි නොගන්නාලදී.

තත්‍රමජ්ඣත්තතා චෛතසිකය තෙමේ මැදහත් ආකාරයෙන් අරමුණුනැරඹීම ලක්ෂණකොට ඇත්තීය. ඊට උපමා කවරයත්? ආජානීය ශෙක්ඛවයන් දෙදෙනෙකු යොදනලද්දාවූ රථයෙහි රථාචාර්‍යයාට බඳු උපමා ඇතිවෙයි. ආජානීය ශෙක්ඛව අසුන් දෙදෙන යොදනලද රථයෙහි රථාචාර්‍ය තෙමේ ඒ අසුන්දෙදෙනාගේ කටකලියා රැහැන් දැඩිනොකොට හෝ ලිහිල්නොකොට හෝ මැදහත් ආකාරයෙන් අල්වාගෙණ අසුන් දෙදෙනාගේ සමවූ ගමනබලාසිටින්නේවේද එපරිද්දෙන් අරමුණුකරායන්නාවූ චිත්ත චෛතසිකයන් අතුරෙන් යම්කිසි චෛතසිකයක් පසුබටවෙන්නට හෝ යම්කිසි චෛතසිකයක් ලිහිල්වෙන්නට හෝ නොදී මේ තත්‍රමජ්ඣත්තතා නැමති චෛතසික තෙමේ අරමුණ කරා සපගාදීන්ගේ සමවූ ගමන බලාසිටින්නේවෙයි.

කායපස්සද්ධි චෛතසික තෙමේ තමා හා සම්ප්‍රයුක්තවූ වේදනා සඤ්ඤාසංඛාර යන සකඤ්චත්‍රයාගේ කැළඹීම සන්සිඳුවන බව ලක්ෂණකොට ඇත්තේවෙයි.

චිත්තපස්සද්ධි චෛතසික තෙමේ **චිත්තයා**ගේ කැළඹීම සංසිඳුවතබව ලක්‍ෂණකොට ඇත්තේයි. ඊට උපමා කවරයත්? බලවත්වූ සූර්‍යතාපයෙන් මිරිකෙමින් එන්නාවූ පුරුෂයෙක් තෙමේ මහත්වූ ඡායාවකට ප්‍රවිෂ්ටවූකල්හි ඒ ශරීර ඕඝ සංසිඳීමකට බඳු උපමාඇතිවෙයි. එහෙයින් කායප්පස්සද්ධි චිත්ත පස්සද්ධි දෙදෙන මහත් ඡායාවකට පැමිණීමෙන් සිහිල්බව ලැබී මක්මෙන් චිත්ත චෛතසිකයන්ගේ සන්සිඳීම සිඩිකරයි. උඩචව චෛතසික තෙමේ සූර්‍යතාපයට බඳු උපමා ඇතිවෙයි. එහෙයින් මේ පස්සද්ධි චෛතසිකය උඩචවයට ඉඳුරා ප්‍රතිපක්‍ෂ වෙයි. මේ කායප්පස්සද්ධි චිත්ත පස්සද්ධි දෙදෙන එකාතුවිකාමාවචර චිත්තයෙහිම කැළඹීම සංඛ්‍යාතවූ උඩචවයට අවකාශ නොදෙන්නාහුය. එතකුදුවුවත් ලෞකොත්තර චිත්තයෙහි ප්‍රශ්‍රබ්ධි සම්බොඛ්‍යඞ්ගවශයෙන් එසක්මවන්නේයි. ඉදින් ප්‍රශ්‍රබ්ධිසම්බොඛ්‍යඞ්ගයෝ දෙදෙනකුවියයුතුනම් සත්තිස් බොධිපාක්‍ෂික ධර්මයන්ට එකක් අධිකවීමෙන් අවතිසක්වියයුත්තේය. කායලහුතා චෛතසික තෙමේ තමා හා එක්ව යෙදුනාවූ වෙදනාදී නාම සකඞ්ඛයන් තුන්දෙනාගේ බරබව සංසිඳුවනනේයි. **චිත්ත** ලහුතා චෛතසික තෙමේ තමා හා යෙදුනාවූ චිත්තයාගේ බරබව සංසිඳවන්නේයි. ඊට උපමා කවර යත්? යම්කිසි බරක් ඔසවාගෙණ බොහෝ දුරක සිට අවුත් ඒ බරවහාතැබීමකට බඳු උපමා ඇතිවෙයි. එපරිද්දෙන් කායලහුතා චිත්තලහුතා දෙදෙන එක්ව මහත්වූ බරක් දෙදෙනෙක් විසින් අල්ලා ඔහා තබන්නාක්මෙන් පිතම්බනීවරණ නැමති බර ඔහා තබන්නේවෙයි. එහෙයින් විප්‍රකාරවූ ලහුතා චෛතසිකයෝ දෙදෙන පිතම්බ දෙදෙනාගේ සතුරෝවෙත්. කායමුදුතා චෛතසික තෙමේ තමා හා එක්ව යෙදුනාවූ වෙදනා නාමඝකඞ්ඛයන් තුන්දෙනාගේ සියුම්බව මොළොක්බව ඇතිකරයි. චිත්ත මුදුතා චෛතසිකය තමා හා එක්ව යෙදුනාවූ චිත්තයාගේ තඨීශබව සංසිඳුවා මෘදු මොළොක්බවට පමුණුවන්නේයි. ඊට උපමා කවර යත්? යම්කිසි ගව එළු ආදීවූ ඒණියක් ඕඩිනා ඇම් ආදීවූ අභිමත වස්තුවක් ඉදිකාරගැණීමට නොඇකිවන්නේ අතිශයින් කඨීශව පවත්නාකල්හි සම්මඞ්ඝාතවූ පුරුෂයන් දෙදෙනකු කැඳවා වහුර තෙල් ආදීවූ ද්‍රව්‍ය බහමින් අතින් පයින් මැඩ ඒ චර්මය මොළොක්කෙරෙත්ද? එපරිද්දෙන් මේ කාය ලහුතා චිත්තලහුතා දෙදෙන එකතුව මිත්‍යාදෘෂ්ටි නැමති කඨීශභාවය පහකොට අරමුණුගැණීමෙහි මෘදු මොළොක්බවට පමුණුවන්. එහෙයින් කාය මුදුතා චිත්ත මුදුතා දෙදෙන මිත්‍යාදෘෂ්ටියට විරුඬවෙත්.

කායකම්මඤ්ඤතා චෛතසික තෙමේ තමා හා එක්ව යෙදුනාවූ වෙදනාදී නාමස්කන්ධයන්ගේ ගිලන්කම සිංසිදුවා අර මුණුගැණීමට සුදුසුබවකෙරෙයි.

චිත්තකම්මඤ්ඤතා චෛතසික තෙමේ තමා හා එක්ව යෙදුනාවූ චිත්තයාගේ ගිලන්කම සන්සිඳුවා අරමුණුගැණීමෙහි යොග්‍යබව සිඹකෙරෙයි. ඊට උපමා කවරයත්? යම්සේ තඹ පිත්තලාදී ලොහොයෙන් මිශ්‍රවූ සවණීය නැලීමට හෝ මැකීමට නුසුදුසුවේද එබැවින් ඒ රත්තරන මිශ්‍ර ලොහයන් දැසිවෙනතාක් නැවත තැවත පිඹගත්කල්හි ඒ සවණීය අභිමය කුණ්ඩලාභරණ අඩංගුල්‍යාදී කැමති කැමති ආභරණයක් ඉදිකළහැකිවේද තැලීම් මැකීම් ආදීවූ සියල්ල ඉවසන්නේවේද, එපරිද්දෙන්ම මේ චිත්තය යෙදුනාවූ නීවරණාදිවූ කෙලෙස නැමති තඹ ලොහො ආදිය මේ කායකම්මඤ්ඤතා චිත්තකම්මඤ්ඤතා දෙදෙනනැමති ගින්නෙන් දවාගත්කල්හි දුනාදී පුණ්‍යක්‍රියා නැමති ආභරණ විශෙෂයන් ශුඛකිරීමට චිත්තය නැමති සවණීය යොග්‍යවන්නේයි. එහෙයින් මේ කම්මඤ්ඤතා චෛතසික දෙදෙන නීවරණාදී සියලු කෙලෙසුන්ට සතුරුවන්නාහුය. කායපාගුඤ්ඤතා චෛතසික තෙමේ වෙදනාදී සකඛන්ධත්‍රයාගේ මහත්වූ අනතරායෙන් මිදවීම ලක්ෂණයොට ඇත්තේයි. චිත්ත පාගුඤ්ඤතා චෛතසික තෙමේ තමා හා එක්ව යෙදුනාවූ චිත්තයාගේ මහත් අනතරායකින් මිදවීම ලක්ෂණකොට ඇත්තේයි. යම්සේ රොගාදී අනෙක ප්‍රකාර අනතරායට පැමිණියාවූ පුරුෂයෙක් තෙමේ අනතරායෙන් මුළුක්වා නිරොගිභාවයට පමුණුවාද, එපරිද්දෙන්ම මේ පාගුඤ්ඤතා චෛතසිකයෝ දෙදෙන අශ්‍රද්ධාවය, මුළුසසතිය, නීවරණ ධර්මයෝය, යනාදී මහත් අනතරායන්නෙන් මුළුක්වා කුශල කර්මනාමති යහපත් ක්‍රියාකිරීමෙහි පුහුණුකරන්නාහුය.

කායුජුඤ්ඤතා චෛතසික තෙමේ වෙදනාදී සකඛන්ධත්‍රය සම්බන්ධවූ වඤ්කභාවය දුරුකිරීම ලක්ෂණකොට ඇත්තේයි. චිත්තුජුඤ්ඤතා චෛතසික තෙමේ චිත්තය සම්බන්ධවූ වඤ්කභාවය පහකිරීම ලක්ෂණකොට ඇත්තේය. ඒ වඤ්කභාවය යනු වංචවඤ්කය, නහල කොටිවඤ්කය, හොමුත්‍රිකාවඤ්කය, යන ත්‍රිවිධාකාරවූ වඤ්කයයි. මේ කායුජුඤ්ඤතා චිත්තුජුඤ්ඤතා දෙදෙනාහට උපමා කවරයත්? දුන්නෙන් විදිනා වැදිතෙමේ ඒ තමාවිදිනා ඊය ඇදවූකල්හී අභිමත ස්ථානයට නොවිදියහැකි බැවින් ඒ ඊය ඇදහැර අභිමත ස්ථානයට යම්සේ විදිනේද, එපරිද්දෙන්

දෙළොස් අකුශල් සිත්නැමති වඩකයන් මේ කායුජ්ජුකතා චිත් තුජ්ජුකතා නැමති වැදිහු විසින් සෘජුකළඇල්ලී කාමාවචර ශොභන සිත් නැමති ඊසැරය විදියහැකිවෙයි. එහෙයින් මේ කායුජ්ජුකතා චිත්තුජ්ජුකතා දෙදෙන ඔබලු දෙළොස් අකුශල ඝන්ට ප්‍රතිවිරුඬවෙත්. අකුශල පක්ෂයෙහි පිනම්ඬ නීවරණ යුග ලයමෙන්ම කුශල පක්ෂයෙහි මේ ධම්යුගලයෝ සදෙන තම තමාගේ සතුරු ධම්යන් සදෙන පහකරණහෙයින් විප්‍රකාරබව වදරණලද්දේයි. යම්සේ පිනම්ඬ නීවරණ සහිතවූ චිත්තයෙන් උපදවන්නාවූ චිත්තජරූපයන් පැතිරයෑමෙන් රූපසකඬිය නිත්දට යන්නාක්මෙන්ම මේ කායපස්සඬි ආදිවූ ධම්යුගලයෝ සදෙන සම්ප්‍රයුක්තවූ ශොභන චිත්තයන්ගෙන් හටගන්නාවූ චිත්තජ රූජයන් ශරීරයෙහි පැතිරයාම හෙතුකොටගෙණ රූප සකඬියාගේ සන්සිදීම මොළොක්වීම ආදිවූ සකඬියෝද හට ගණිති. ඒ අඵීය හැඟවීම පිණිසත් කායපස්සඬි යනාදින් දෙශ නාකරනලද්දේයයි දතයුතුයි. ශ්‍රඬාව ආදිකොට චිත්තුජ්ජුකතාව අවසන්කොට ඇත්තාවූ මේ ධම්යන් එකුන්විසිදෙන එකුන් සැටක් ශොභන චිත්තයෙහි අනූනව එකානතයෙන් යෙදෙන හෙයින් ශොභණ සාධාරණ ධම්යන්යයි කියත්.

ත්‍රිවිධ විරතීන් අතුරෙන් සම්මාවාචා විරති චෛතසික තෙමේ ආජීවහෙතු අපෙක්ෂානොකොට මුසාවාද පිසුනාවාච ඵරුසාවාච සම්ඵපපලාප සඬ්ඛ්‍යාතවූ සතරාකාර වාග්දුශ්චරිත යෙන් වැළකීම ලක්ෂණකොට ඇත්තේයි. සම්මාකම්මන්ත චේ තසික තෙමේ ආජීවහෙතුව අපෙක්ෂානොකොට පාණාතිපාත අදින්නාදාන කාමෙසුමිච්ඡාචාර සඬ්ඛ්‍යාතවූ ත්‍රිවිධකාය දුශ්චරිත යෙන් වැළකීම ලක්ෂණකොට ඇත්තේයි. සම්මාආජීව චෛත සික තෙමේ ආජීවහෙතුව අපෙක්ෂාකොට සම්මාවාචාවිරති යෙන් වලක්නාවූ සතරාකාර වවිදුශ්චරිතය සම්මාකම්මන්ත විරතියෙන් වලක්නාවූ ත්‍රිවිධාකාර කායදුශ්චරිතය යන සපත ප්‍රකාරවූ දුශ්චරිතයන්ගෙන් වැළකීම ලක්ෂණකොට ඇත්තේයි. සම්මාවාචාවිරතිය හා සම්මාකම්මන්ත විරතියද යන විරතීහු දෙදෙන ඔබ්බා සන්තානය අපෙක්ෂාකොට අකුශල ධම්යෙන් වලක්නාහුවෙති. සම්මාආජීව චෛතසික තෙමේ අඬ්ඝාත්ම සන්තානය අපෙක්ෂාකොට අකුශල ධම්යන් වලක්නේයි. මේ සම්මාවාචා සම්මාකම්මන්ත චෛතසික දෙදෙන වනාහි රාජ භයින් නොහොත් රජහු විසින් මේ මේ අපරාඬයන් කළකල්හී මෙබඳු මෙබඳු දඬුවම්කරන්නේයයි යන භයින් සොරකම්කිරි

මෙන් හා මිනිමැරීම් ආදිවූ අපරාධයෙන් වලක්නා සොරකුට බඳු උපමා ඇතිවෙයි. ඒ රාජභයින් භයපත්ව සොරකම් ආදියෙන් වලක්නාවූ සොරතෙමේ තමාගේ අඹුදරුවන් පොෂ්‍යය කරනු පිණිස අන් සතු රන් රුවන් මුතු මැණික් ආදී වස්තුව සොරකම්කිරීමෙහි සම්පූර්ණශක්තිය ඇත්තේ නමුදු මේ කාලයෙහි විනිශ්චයකාර තෙමේ පලාකොල මිටක් පවා සොරකම් කළාවූ සොරහු දිවස්හුල හිඳුවන්නේයයි මාගේ ආවුදය මූවහත් ඇත්තේ නමුදු මෙබඳු සුළුපටු සොරකම් හෙතුකොටගෙණ මාගේ ධාර්මිකවූ ජීවිතය විනාශවෙයි. මෙසේ ඒ සොරතෙමේ රාජදණ්ඩනයට භයින් ඒ රාජදණ්ඩනය සංඛ්‍යාතවූ බහිඛා සත්තානය අපෙක්ෂාකිරීම්වශයෙන් සොරකමින් වලක්නාක් මෙන් සම්මාවාචා සම්මාකම්මන්ත මෙවතසිකයෝ දෙදෙනාද අපායභය සඞ්ඛ්‍යාතවූ බහිඛාසත්තානය අපෙක්ෂාකොට මුසාවාදදී සතරාකාරවූ වාග්දුශ්චරිතය, පණිවා ආදී ත්‍රිවිධාකාර කායදුශ්චරිතය යන මේ සප්තප්‍රකාර දුශ්චරිතයන්ගෙන් වලකින්නේයි. මේසම්මාවාචා සම්මාකම්මන්ත දෙදෙනාහට සාධාරණ උපමායි. සම්මා ආජීව මෙවතසිකතෙමේ මිථ්‍යාජීව ඵල අනුභවකෙරෙමි නම් මාගේ ජීවිතය විනාශවෙයි යන භයින් අඛ්‍යාත්මය අපෙක්ෂාකොට විෂඵල නුබුදින්නාවූ පුරුෂයෙකුමෙන් තමාගේ ජීවිකාවෘත්ති සඞ්ඛ්‍යාතවූ අඛ්‍යාත්මය අපෙක්ෂාකොට සප්තප්‍රකාරවූ කායවචී දුශ්චරිතයන්හෙරෙන් එනම්:-එකාන්තයෙන් අනතුරු අත් බැවිහි සතර අපායෙහි මෙබඳු මෙබඳු දුක් ලැබෙයි. යනාදීන් සලකා සප්තප්‍රකාර දුශ්චරිතයන්ගෙන් වලක්නේයි. සම්මාආජීවයද එම සතරාකාරවූ වචීදුශ්චරිතයෙන් වලක්නේයි. සම්මාකම්මන්ත මෙවතසිකයද ත්‍රිවිධාකාර දුශ්චරිතයෙන් වලක්නේයි. ඒ විරතීහු තුමූ කෙසේ සමාදන්නාහුද යත්? ධර්මවශයෙන් විශෙෂ නොවන්නාහුද යත්? සම්මාවාචා විරතිතොමෝ සතරාකාර වචීදුශ්චරිතයෙන් වලක්නාවූකල්හි ජීවිකාවෘත්ති සංඛ්‍යාතවූ ආජීවහෙතුව අපෙක්ෂානොකොට අපායභය සඞ්ඛ්‍යාත බහිඛාසත්තානය අපෙක්ෂාකිරීම්වන්නේයි. අකුශලකර්මයෙන් වලක්නේයි. සම්මා ආජීව තෙමේද සතරාකාර වචීදුශ්චරිතයෙන් වලක්නාකල්හි ජීවිකාවෘත්ති සංඛ්‍යාතවූ ආජීවහෙතු අඛ්‍යාත්මය අපෙක්ෂානොකොට අකුශලකර්මයෙන් වලක්නේයි. සම්මාකම්මන්ත මෙවතසික තෙමේ ත්‍රිවිධාකාර කායදුශ්චරිතයෙන් වලක්නාකල්හි ජීවිකාවෘත්ති සංඛ්‍යාතවූ ආජීවහෙතුව අපෙක්ෂානොකොට අපායභය සඞ්ඛ්‍යාතවූ බහිඛාසත්තානයම අපෙක්ෂාකිරීම් වශයෙන් ත්‍රිවිධාකාර දුශ්චරිතයෙන් වලක්නේයි. සම්මාආජීව

චෛතසික තෙමේ ත්‍රිවිධ කායදුශ්චරිතයෙන් විලක්ෂණාකල්හි ජීවිකාවෘත්ති සංඛ්‍යාතවූ අඛ්‍යාත්ම සන්තානය අපෙක්ෂාකොට කායදුශ්චරිතයෙන් වියුක්තේයි. මේ අඛ්‍යාත්ම අපෙක්ෂාකිරීමය නොකිරීමය බහිඛාසන්තානය අපෙක්ෂාකිරීමය නොකිරීමය යනමේ සතරකාරණයය සමානමැයි. සම්මාආජීව චෛතසිකය කරණකොටගණ දුශ්චරිතයෙන් විලක්ෂණාකල්හි පළමුකොට අපායභය සඞ්ඛ්‍යාතවූ බහිඛාසන්තානයම අපෙක්ෂාකෙළේ නමුදු පසුභාගයෙහි අඛ්‍යාත්ම සන්තානයම අපෙක්ෂාකරමින්පවත්නේයි. සම්මාවාචා සම්මාකම්මන්ත සම්මාආජීව යන ත්‍රිවිධවිරතීන්ගේ අපෙක්ෂාකිරීම හා නොකිරීමද උපමාවෙන් දක්වනු ලැබේ. එක්තරා පුරුෂයෙක් තෙමේ අන්සතු කෙත් වතු ආදියක් අදලබාගන්නා පිණිස තාවකාලිකවශයෙන් ඉල්වාගෙණ බොහෝකලක් මුලුල්ලෙහි ශස්‍යාදියකොට මැතහාගයෙහි ඒ කෙත්වත් හිමියාගෙන් උදුරාගනු කැමතිව මේ කෙත්වත් ආදියෙහි අඳය තොපට නොදෙමියි මාගේ පියමුතුන් පරම්පරාවෙන් හිමිම මා විසින් බුත්තිවිඳහන එනලද්දෙයයි කීකල්හි ඒ කෙත්වත්හි නියම සවාමිතෙමේ අධිකරණ ශාලාවට පැමිණ අධිකරණයක්කෙළේයි. ඉක්බිති ඒ වචාවෙන් අසිනිකරගණු කැමති පුරුෂතෙමේ අභිමියන් හිමිකිරීමෙහි දක්ෂවූ නීතිඥයෙක් කරා එළඹ පින්වත්නි! මට මේබදු අධිකරණයක්ම තිබෙයි. ඒ කෙත්වත් ආදිය ඒ නානාකරණයෙන් මාසතුනොවෙයි. එසකුදුවුවිත් පින්වත්හු විසිවා අධිකරණශාලාවෙහි විත්ති බැණ ඒ කෙත්වත් ආදිය මට හිමිකරදෙන්නේනම් නොපට සතුටු පඬුරු පිණිස කහවණු පන්සියයක් දෙමියිකියාල්හි ඒනීතිඥතෙමේද එසානන්තයෙන් ඒ කෙත්වත් ආදිය තොපට හිමිනොවූවෝද මාගේ දක්ෂකමින් තොපට හිමිකරදෙමියි ප්‍රතිඥාදී ඒ කහවණුපන්සියය ඉල්වාගත්තේයි. මෙකඤගයෙහි ඒ නීතිඥයාහට මෙබඳු කල්පණාවක් පහළවිය. අන්සතු යම් වසතුවක් අහිමියෙකුට හිමිකරදීම මුසාවාද අකුශල කම්යක්යයි බුඬාදී උතුමන් විසින් පණවා වදාරණලද්දේය. ඒ අකුශල කම්යෙන් මරණින් මතු සතර අපායදුක්විඳ කම්වශෙෂයෙන් මිනිසත්බව ලැබුයේද මුසාවාද කම්යෙන් පිඬාකරණලද්දුවූ කාමාවචර කුශලකම්යෙන් උපදින්නාවූ මනුෂ්‍ය තොමෝ විරූපරූපයක් ඇත්තේවෙයි. වැදි කොවුල් චණ්ඩාලාදී නීචකුලයෙහි උපදින්නේවෙයි. තමාගේ වචනය ලොකයා පිළිනොගන්නේවෙයි. තමාගේ දුරුවන් පවා වචනයට කීකරුනොවෙයි. දුර්ගන්ධවූ මුඛයක් ඇත්තේවෙයි. දරුවන් ලබන්නේ තමුදු පිරිමිපුතුන් නොලැබ කාලකණ්ණිවූ දියනිවරුම්

ලබන්නේවෙයි. මෙසේ බුඩාදී උතුමන් විසින් කණ්ඨාවශෙෂ යාගේ විපාක ප්‍රණවා වදුරණුලද්දේය. එහෙයින් මා විසින් මේ මුසාවාදය කියමියි ප්‍රතිඥාදී ගන්නාලද කහවණු පන්සියය ආපසු පෙරළාදෙමියි සිතා ඒ කහවණු පන්සියය ඔහුට නැවතදී මුසාවාදයෙන් වලක්නේවේද, මේ විත්තයෙහි හටගන්නා විරති තොමෝ සම්මාවාචා විරතිනම්වෙයි. සම්මාආජීවය හෙතුකොට ගෙණ මුසාවාදයෙන් වැලකීම කෙසේවන්නේද යත්? ඒ නීතිඥතෙමේම අනික් පුරුෂයෙකුගෙන් බොරු කියා අනුන් සන්තක වස්තුවක් හිමිකරදෙමියි ප්‍රතිඥාදී හිඟුගෙන් කහවණු පන්සියයක් ලබාගෙණ නැවත මෙසේ කල්පණාකරන්නේවෙයි. මා විසින් බොරුකිම පිණිස ලබාගන්නාලද්දාවූ කහවණු පන්සියය බොහෝකලක් ජීවත්වීමටද කොපොහෝනේය. මේ කහවණු පන්සියයෙන් මම පමණක්නොව මාගේ අඹුදරු ආදී හුද ජීවත්වෙත්මය. එහෙයින් මුදුවුවත් මේ පාපයෙන් අපාය දුක් විඳින්නාවූකල්හී තනිවම ඒ දුකට භාජනවන්නෙමියි ඒ වස්තුව අනුභවකලාවූ සියලුදෙනම අපාය දුකට හිමිකොවෙති. එහෙයින් මම අනුන් නිසා බොරු කියා කුමිට විසතුව රැස්කෙරෙම් දැයි අනික් ධාර්මිකවූ රජතුමාවත්ම ජීවත්වෙමියි සිතා ඒ කහවණුපන්සියය වස්තු සාමියාට භාරදී බොරුකීමෙන් වලක්නේවේද, මෙසේ වලකින්නාවූ පුද්ගලයාහට ආජීවහතුව අපෙක්ෂා කොට සම්මාආජීවයෙන් හටගන්නාවූ සම්මාවාචාවිරතිය උපදනේයි. මුසාවාද සඛ්‍යාතවූ එකම විරවිතව්‍ය වස්තුවෙක්හී සම්මාවාචාවිරතිය හටගන්නා ක්‍රමයයි. පිසුනවාචා සංඛ්‍යාතවූ විරමිතව්‍ය වස්තුවෙහිද සම්මාවාචා විරතිය හා සම්මාආජීව විරතිය හටගන්නා ක්‍රමයද, සඵප්පලාප සඛ්‍යාතවූ විරවිතව්‍ය වස්තුවෙහිද සම්මාවාචා විරතිය හා සම්මාආජීව විරතිය හටගන්නා ක්‍රමයද මුසාවාද විරතියට කී උපමාවෙන් නිසියේ යොදා අර්ථදතයුත්තේයි. සම්මාකම්මන්ත විරතිය හා සම්මා ආජීව විරතියද අපෙක්ෂාකිරීමට හා නොකිරීමටද උපමාවක් දක්වනුලැබේ. ඒ කෙසේ යත්? යම්කිසි පුරුෂයෙක් තෙමේ හෙරිමස් බුදිනු කැමතිව අනික් පුරුෂයෙකුට කථාකොට පින්වත්නි! අසවල් ගවයා මරාදෙව තොපට දසදෙලොස් කහවණුවක්දෙමියි කී කල්හි ඒ පුරුෂතෙමේ ගහපතැයි ගිවිස්නේයි. ඉක්බිති ඒ දස දෙලොස් කහවණුව පිළිගෙණ ගවයා මරණු පිණිස ආයුධයක් රැගෙණ ගවයා ලඟට පැමිණිකල්හි මෙබඳු කල්පණාවක්හට ගන්නේයි. ඉදින් මම මේ කහවණු දසදෙලසකට ආසාවෙන් මේ ගවයා මැරුයේවීනම් එකාන්තයෙන් මහාසාව ද්‍යවූ ප්‍රාණ

ඝාත අකුශල කර්මයකින් බඳවෙමියි ඒ කර්මය හෙතුකොටගෙණ මරණින් මතු එකාන්තයෙන් අපා දුකට භාජනවන්නෙමියි ඒ අපායෙන් මිදී මිනිසත් බව ලබනකල්හි ඒ අකුශල කර්මයෙන් පිඬිතවූ කාමාවචර කුශල කර්මයෙන් උපදිනා බැවින් මනුෂ්‍යඝාතවෙයි. අනුන්ගේ ශස්ත්‍රයන් හෙතුකොටගෙණ මරණය පැමිණෙයි. සාපිපාසාදෙකින් පිඬිතවෙයි. මේ ආදි නොයෙක් දුක් විපාක ලබන්නේයයි ආදීනව සලකා ඒ ඝාතයා නොමැරා අවුත් ඔහුගේ කහවණු ආපසු භාරදී ඒ ප්‍රාණඝාත කර්මයෙන් වලක්නේවෙයි. එකල්හි ඔහුට සම්මාකම්මන්ත විරතිය ලැබෙන්නේයි. සම්මාආජීවයට උපමා කවරයත්? එක්තරා පුරුෂයෙකුට හුරු මස් කෑ කැමතිව අනික් පුරුෂයෙකු බණවා එම්බල! මේහුරා මරාදෙන්නේවිනම් තොපට දසදෙලොස් කහවණුවක්දෙන් නෙමියි කීකල්හි ඒ කහවණු ලබන ආසාවෙන් ආවුදයක් රැගෙණහුරා ලඟට ගියකල්හී මෙබඳු කල්පණාවක් පහළවෙයි. ඉදින් මා විසින් මේ හුරා මරණලද්දේවිනම් කහවණු දසදෙළසක් පමණ ලැබෙයි. ඒ සවල්පවූ මුදල මාගේ ජීවිකාවටද නොපොහොනේවෙයි. ඒ මුදලින් මා පමණක් නොව මාගේ අඹුදරුවෝද ජීවිකාවකෙරෙති. එතකුදුවුවත් මේ ප්‍රාණඝාත පාපය හෙතුකොටගෙණ අපාය දුක් විඳිනාකල්හී මා තනිවම ඒ දුකට භාජනවෙමියි මාගේ අඹුදරුවෝ හෝ අන්කිසි නෑයෙක් හෝ මා වෙනුවට ඒදුක් අනුභවකොකෙරෙත්. මේසේ සලකා ඒ හුරා නොමරා අවුත් කහවණු දසදෙළස ආපසුදෙයි. මෙසේ උපදනාකල්හී සම්මාආජීව විරතිය ලැබෙන්නේයි. මේ පාණාතිපාතා කර්මයට දුක්වූ ක්‍රමය උපනිශ්‍රයකොටගෙණ අදින්නාදානයෙන් වැලකීමෙන් ලැබෙන්නාවූ සම්මාකම්මන්ත විරතිය හා සම්මාආජීව විරතියද, කාමෙසුමිච්ඡාචාරයෙන් වැලකීමෙන් ලැබෙන්නාවූ සම්මාකම්මන්ත විරතිය හා සම්මාආජීව විරතියද උපමා උපමෙය සම්බන්ධකොට දතයුත්තේය. මුසාවාද පිසුණාවාච ඵරුසාවාච සම්පප්පලාප පාණාතිපාත අදින්නාදාන කාමෙසුමිච්ඡාචාරයන මේ සපත දුශ්චරිතයෝ තුමූ වැලකියයුතු ධර්මයන්ගෙන් විරතිකම්මපථසම්පත්තිවූ විරතිවෛතසිකයෝ තුන්දෙනා වශයෙන් ඒසපතප්‍රකාරවූ දුශ්චරිත සංඛ්‍යාතවූ විරමිතව්‍ය වස්තූන්ගෙන් වලක්නාහෙයින් විරතිනම්වෙත්. මෙසේ කීකල්හී ඒ ඒ දුශ්චරිතයන්ගේ අහසමුච්ඡේදවූකල්හී ඒ ඒ දුශ්චරිතයෙන් වැලකීම විරතිනම්වෙයි. විරමිතව්‍ය වස්තූන්ගෙන් වැළකීමෙන්ම එහානතයෙන් විරති ලැබෙයි. විරමිතව්‍ය වස්තූන්ගෙන් වැළකීමක් නැතිකල්හී විරතිනම් නොවෙත්. එහෙයින් යහපත් සුභාෂිත

වචනකිමද, බුඩාදී රතනත්‍රයට කවයුතුවූ අපවාඅන පුණ්‍ය ක්‍රියාවන්ද, යහපත් වචන යහපත් කම්මන්තවන්ගෙන් තමුදු විරවි තව්‍යවස්තූන්ගෙන් වැලකීමක් නැතිහෙයින් එකාන්ත විරතිකම් නොවෙත්. එහෙයින් මුසාවාදාදී සතරාකාර වාග්දුශ්චරිතයෙන් වැලකිම හැර අනික් සුභාෂිත වචන කීම් ආදියද බුඩාදී රතන ත්‍රය ගුණ කථනයද වොහාර සම්මාවාචා විරති නම්වෙයි. ප්‍රාණ ඝාතාදී ත්‍රිවිධ දුශ්චරිතයෙන් වැලකිම හැර අනික් යහපත් කම්මන්තකිරිම වොහාර සම්මාකම්මන්ත විරතිනම්වෙයි. ඒ විරතිහු තුන්දෙනද සමපත්ත විරති සමාදාන විරති සමුච්ඡේද විරතියයි එක් එක් විරතියක් තුන් තුන් ආකාරවන්නේයි. ඔවුන් අතු ගෙන් සමාදාන විරති තොමෝ අනාගතයම අපෙක්ෂාකරන්නේවෙයි. අවශෙෂ විරතිහු දෙදෙන ප්‍රත්‍යුත්පන්නයම අපෙක්ෂා කරන්නේවෙයි. ඔවුන් තුන්දෙනා අතුරෙන් සමපත්ත විරතිය කෙසේද යත්? යම්කිසි ප්‍රත්‍යයයක් හෝ වස්තුවක් හෝ ලැබුණත මත්තෙන් ආචාර්‍යයන් ලඟ පාණාතිපාතා වෙරමණී යනාදීවශයෙන් සමාදන්නොවීම බොරු කීම් ආදියට සුදුසු කාලයක් පැමිණිකල්හී ප්‍රත්‍යක්ෂයෙහිම ඒ බොරුකීම් ආදියෙන් වලක්නේයි. එකල්හී උපදනා කාමාවචර මහාකුශල චිත්ත වීථියෙහි එක එක සමපත්ත විරතිය ලැබෙන්නේයි. සමාදාන විරතිය කෙසේද යත්? වස්තු ප්‍රත්‍යාදිය නොදැක නොලැබ අද පටන් මුසාවාදාදී වචී දුශ්චරිතයෙන් වලකින්නෙමියි ප්‍රාණඝාතාදී කායදුශ්චරිතයෙන් වලකින්නෙමියි යනාදී අධිෂ්ඨානශක්තියෙන් ආචාර්‍යන් ලඟ ශික්ෂාපද සමාදන්වේද, එසමයෙහි උපදනා කුශල චිත්ත වීථියෙහි සමාදාන විරතිය ලැබෙන්නේයි. "සමුච්ඡේද විරතිය" යනු සැදැහැතිස්ස මහරජ්ජු විසින් සෝවාන්වූ තිස්සනම් අරක්කැමියාහට ජීවමාන කුකුළෙක් යවා ඉදින් තෝ මේ කුකුළා නොමරන්නේවීනම් මේ වධකයන් සමඟ ගොස් දන් ගෙඩියේ ඉසතබවිසි නියොගකළකල්හී යහපත දන්ගෙඩියේ හිසතබමියි කුකුළා නොමරමියි කියා වධකයන් සමඟ ගොස් ආඝාතනයෙහි තුබූ දන්ගෙඩියේ හිස තුබූ උදාහරණ කථාවෙහි මෙන් තමාගේ ජීවිත හානියවූ තමුදු ප්‍රාණඝාතාදී සපත්ත්‍රිඩ දුශ්චරිතයන් නොකරන්නාවූ ආර්‍යයී පුද්ගලයාගේ විරති තොමෝ සමුච්ඡේද විරතිනම්වෙයි. සමාදාන විරතියට උපමා වක් දක්වනුලැබේ. පුරාතන කාලයෙහි එක්තරා බමුණෙක් තමන්ගේ ආචාර්‍යන් ලඟ "පාණාතිපාතා වෙරමණී" යනාදී පඤ්ච ශික්ෂාපදය සමාදන්වී යම්කිසි කම්මන්තයක් පිණිස පෙරෝ වක් හා කෙවේරියක්ද රැගෙණ වනයට ගියේය. ඉක්බිති එක්

තරා පිඹුරෙක් අවුත් මේ බමුණාගේ දෙපතුල පටන් සකල ශරීරය වෙලාගත්තේයි. ඉක්බිති ඒ බමුණා තෙමේ මේසේ කල්පණා කෙරෙයි. මා අතිබෙන්නාවූ මේ පොරව කෙවේරි ගඟෙන් එතෙරවෙ මේ සපියාගේ ජීවිතය විනාශකටහැක්කේය එසේකළේඑහෙම් මා විසින් වන්යට එන්නාවූකල්හි සමාදන් වනලද්දාවූ පඨවිලය බිඳියන්නේය. එහෙයින් මාගේ ජීවිත හානිවූයේ නමුදු ශික්ෂාපදය නොබිඳිමියි සිතුවේය. මේසේ තුන් වරක්ම ඒ බමුණාහට සපියා මරා ජීවිතය ආරක්ෂාකරමියි සිතූ නුමුත් තුන්වාරයෙහිම තමාගේ ශීලශෝදයට භයින් ඒ සපියා නොමරා ඉදින් මේ පොරව කෙවේරිය ඔබ අත තුබුවේනම් සපියා මැරීමට සිත් උපදින්නේයයි සිතා අත තිබූ පොරව කෙවේරිය දමාගැසීය. ඉක්බිති ඒ පිඹුරු සපී තෙමේ වෙලීම හැර සෙමින් සෙමින් යන්වහිගියේයි. එකල්හි ඒ බමුණාහට උපන්නාවූ විරයි තොමෝ සමාදාන විරතිනම්වේ සම්පත්තවිරතියට උදාහරණ කෙසේ යත්? පුරාතනයෙහි එක්තරා සත්‍රියක්හට පුත්‍රයන් දෙමදනෙක් ඇතිවුහ. මෑත භාගයෙහි ඒ සත්‍රී මහලු භියසට පැමිණිකල්හී නොඉවසිය හැකිවූ මහත්වූ වාතරොගය සිහින් පෙළන්නට පටන්ගත්තීය. ඉක්බිති වෙදකු කැඳවා ගෙණවුත් ඒ රාගාතුරයා පෙන්වූකල්හී රොගය පරීක්ෂාකොට මේසේ කීයේයි. පින්වත්නි! තොපගේ මෑනියන්ගේ රොගය අන්කිසි ඖෂධයකින් පිළියම් නොකොටහැක්කේය. සාවකුගේ ලෙහෙසින් ඖෂධයක්කරණු කැමැත්තෙම්හයි කීහ. ඉක්බිති වැඩිමහලු සහෝදර තෙමේ බාල සොහොයුරාට කථාකොට මිනයව ගොස් සාවෙක් අල්ලා මරා ගෙණවයි නියොගකෙළේයි. ඉක්බිති බාලසොහොයුරු තෙමේ වනයට ගොස් සාවුන් මන්ත ලක දැලක් ඇද වනයට වැද එලවාගෙණ ගියකල්හි පැටවුන් සහිතවූ සාදනෙක් ඒ දැලෙහි අසුවිය. ඒ පැටව්ද මෑනියන් කෙරෙහි ඇත්තාවූ ආලය හෙතුකොටගෙණ ඒ සාදෙන ලහ හැසිරෙමින් සිටියෝය. ඉක්බිති ඒ පුරුෂ තෙමේ සාදෙනා මරණු පිණිස මිගුරක් රැගෙණ වහාම ගොස් ඒ සාදෙන මරන්නට සිතූකල්හී ලහ හැසිරෙන්නාවූ පැටවුන් දැක මෙසේ කල්පණා විය. ඉදින් අපගේ මෑනියෝ කාලක්‍රියාකෙළේනම් අපට හට නත්තාවූ දුකමෙන්ම මේ සාදෙන මැරුකල්හී ඇගේ පුත්‍රයන් වද මහත්වූ දුකහටගන්නේය. මෙවැද්‍යාචාරී තෙමේ සාලෙහෙයන් කෘත්තාවූ ඖෂධයෙන්ද අපගේ මෑනියන්ගේ රොගය එකා නාත්තෙහෙයන් ව්‍යපගමනයවිමින්ද නොසිටිය හැක්කේය. එහෙයින් මේ සාදෙන මැරීමෙන් මට ප්‍රයෝජනනැතැයි සිතා සාදෙන

දැලින් මුදා පැටවුන් සමඟ වනයට යන්නට ඇරියේසි. ඉක්බිති ඒ පුරුෂතෙමේ පෙරළා ගෙට අවුත් වැඩිමිල් සොහොයුරුට මෙපවත් කිකල්හි නොයෙක් වචනයෙන් නින්දාගහන්කෙළේසි. ඉක්බිති ඒ බාල මලනු තෙමේ මව් ලඟට ගොස් මෑනියෙනි! මව අද භූබවහන්සේගේ ජීවිතය වෙනුවෙන් මැරියයුතු පැටවුන් සහිතවූ සාදෙනාගේ ජීවිත දුනයදීම හෙතුකොටගෙණ එම සත්‍ය වචන බලයෙන් භූබගේ ශරීරාරෝග්‍යය සංසිදේවයි කියා මෑනියන්ගේ පිට පිරිමැද්ද ක්ෂණයෙහි ඒ රෝගය අලපත වැකි දිඇබිහුවක් සේවාම ව්‍යපගමනයව් ගියේසි. මේ පුරුෂයාට හවගත්තාවූ ප්‍රාණාතිපාත විරතිය සමාපන්න විරති නම්වෙයි දතයුතුයි.

සම්මෙහිද විරතියවනාහි ආර්‍ය්‍ය මාර්ගයෙහි ලැබෙන්නාවූ විරතියයි. සෝවාන් මාර්ගය ලැබූකල්හි දිට්ඨිගත සම්ප්‍රයුක්ත සිත් සතරය, විචිකිච්ඡා සහගත චිත්තය යන මේ අකුශල් පස සම්මෙහිදවශයෙන් නසන්නේසි. අනාගාමි මාර්ගයෙන් කාම රාගය හා පටිඝසම්ප්‍රයුක්ත දෙයිත සම්මෙහිදවශයෙන් නසන්නේසි. අර්හත් මාර්ගයෙන් රූපරාග අරූපරාග සම්ප්‍රයුක්තවූ දිට්ඨි ප්‍රයුක්ත සිත් සතරය, උඛ්ඛච්චසම්ප්‍රයුක්ත චිත්තය, යන සිත් පස සම්මෙහිද ප්‍රහාණවශයෙන් නසන්නේසි. මේ විරතිහු තුන්දෙනාවනාහි කවර ප්‍රඥාවෙක්හි කවර චිත්තයක ලැබෙන්නේද යත්? අඵ්ඵ මිච්ඡත්ත සංඛ්‍යාතවූ ප්‍රාණාතිපාත අදින්නාදාන කාමෙසුමිච්ඡාචාර මුසාවාද පිසුනාවාච ඵරුසාවාච සම්ඵප්පලාප මිච්ඡාජීව සංඛ්‍යාතවූ අෂ්ටප්‍රකාරවූ පාපධර්මයන්ගෙන් වැලකීම්වශයෙන් "පාණාතිපාතා වෙරමණී අදින්නාදානා වෙරමණී කාමෙසුමිච්ඡාචාරා වෙරමණී මුසාවාදා වෙරමණී පිසුනාවාචා වෙරමණී ඵරුසාවාචා වෙරමණී සම්ඵප්පලාපා වෙරමණී මිච්ඡාජීවා වෙරමණී සික්ඛාපදං සමාදියාමි "යනුවෙන් ආජීවාෂ්ටමක සීලය සමාදන්වන්නාවූකල්හී එකි එකී ශික්ෂාපදය පිළිබඳව උපදනා කාමාවචර කුශල චිත්ත විපි අටෙහි මේ විරත්හු අටදෙන ක්‍රමයෙන් ලැබෙත්. පවශීල අෂ්ටාඟශීල සම්බුදාදියෙහිදු සුදුසු පරිද්දෙන් එකොළොස්දෙනාගෙන් ලැබෙත්. සාමණේර උපසම්පදා ශීලදෙක්හි විඤ්ඤත්තිමාර්ගයෙහි ප්‍රකාශවූ සප්තප්‍රකාරවූ කුහනා වස්තූන්ගෙන් චෙන්විම්වශයෙන් සම්මාආජීව චෛතසිකයලැබේ. මේසේ දශ පුණ්‍ය ක්‍රියාවස්තූන්වශයෙන් පවත්නාවූ කාමාවචර කුශලචිත්ත යන් ශීලමය පුණ්‍යක්‍රියා වස්තුවශයෙන් පවත්නාවූ කාමාවචර කුශල චිත්තයෙහි මුත් දානාදිවශයන් පවත්නාවූ අවශෙෂ නව ප්‍රකාර පුණ්‍ය ක්‍රියා වස්තුවෙහිම නොලැබේ. කාමාවචර විපාක

චිත්තයෙහි වනාහි කායවාග් විඥප්ති ජනක චේතනා බැවින් විරතීහු නොලැබෙත්. කාමාවචර මහාක්‍රියා චිත්තයෝ වනාහි රහතුන්ට ආවෙණිකව උපදනා බැවින් එම විරතීන් නොලබත්. රූපාරූප මහග්ගත චිත්තයෙහි වනාහි ශීලවිශුද්ධිය නොලැබෙන බැවින් එකද විරතියක්වත් නොලැබෙන්නේමැයි. සෝවාන් ආදී සතරමාග් චිත්තයෙහි සියලු දුශ්චරිත දුරාජීවයන් ගෙන් වැලකීම ලැබියයුතුහෙයින් අපායගාමිනීවූ සියලු විරතීහු සෝවාන් මාගී චිත්තක්ෂණයෙහිද කාමරාග ප්‍රතිඝය හා එක්ව භවගන්නාවූ සියලු විරතීහු අනාගාමි මාගී චිත්තක්ෂණයෙහිද රූපරාග අරූපරාගයෙන් මුක්තවූ සියලු විරතීහු අර්හත් මාගී ක්ෂණයෙහිද ලැබිය යුතුවෙත්. තවද මේ විරතීහු තුන්දෙන ආජීවාෂ්ටමක ශීලයෙහි එක එකක් ලැබියයුතුවූවද ලොකොත්තර චිත්තයෙහි ලැබියයුතුවූ සම්මාවාචා සම්මාකම්මන්ත සම්මාආජීව යන මාගාඞ්ගයෝ තුන්දෙනෙක්ද ලැබියයුතුහෙයින් මේ ධර්මයන්ගේ නානත්වයක් නැත්තේයයි සැකත්වයුතුවෙයි. කාමාවචර චිත්තයෙහි ලැබෙන්නාවූ විරතීහු අවිතික්කප්‍රත්‍යයෙන් ලැබෙන්නාවූ කුශල සංස්කාරයන්ට උපකාරවෙති. එහෙයින් ඒධර්මයෝ පටිච්චසමුප්පාද චක්‍රයෙහි අඞ්ගයෝවෙති, හෙවත් මතු සංසාරයෙහි උපදිමට හෙතුහුවෙති. මාගී චිත්තයෙහි ලැබෙන්නාවූ මාගාඞ්ගයෝ වනාහි ඒ පටිච්චසමුප්පාද චක්‍රයෙන් බැහැරයාමට හෙතුවූ නීයාණිකාඞ්ගයෙන් යුක්තවූ මාගාඞ්ගයෝවෙති. මෙසේ මේ කාමාවචර විරතීහු ලොකොත්තර විරතීන්ට ඉදුරා ප්‍රතිපක්ෂවන්නාහු නමුදු පිදුරු විකිණීමෙන් ලැබියයුතුවූ රන්කහවණු මෙන් කාමාවචර විරතීහු ලොකොත්තර විරතීන්ගේ ප්‍රතිලාභයට එකාන්තයෙන් උපනිශ්‍රයවන්බව දතයුතුයි.

මේ ත්‍රිවිධ විරතීන්ගේ සංක්ෂේප විභාගයයි.

අප්‍රමාණ්‍ය ධර්මයන් දෙදෙනා අතුරෙන් කරුණා චෛතසිකතෙමේ අප්‍රමාණවූ දුඃඛිතවූ සත්ව ප්‍රඥප්තිය, අරමුණුකොට ගෙණ පවත්නාහෙයින් අනුන් කෙරෙහිද අනුකම්පාකිරීම ලක්ෂණකොට ඇත්තේයි. තමාගේ දූ දරුවන් කෙරෙහි බලවත් රොගාතුරකමක් පැමිණිකල්හි ඒ දූ දරුවන්ගේ මව් තොමෝ මාගේ දරුවන්ගේ රොගය කවර කලෙක්හි ව්‍යපගම්නයවන්නේද දැන් දැන් ව්‍යපගමනය වන්නේනම් යහපතැයි, යම්සේ අනුකම්පාකෙරේද, එපරිද්දෙන් සතුරු මිතුරු උදාසීන දුකට පත්වූ සකල සත්වයන් කෙරෙහි අනේ! මේ සත්වයෝ කවර

කලෙක්හි දුකින් මිදෙත්ද දැන් දැන් දුකින් මිදුනේනම් යහ පතැයි මෙසේ යටගන්නා කාරුණික සභාව කරුණා චෙත සිකානම්වේ, මුදිතා චෙතසිකා තෙමේ සුළුපත්වූ සකල සත්ව ප්‍රඥප්තිය අරමුණුකොටගෙණ සතුටුවීම සැලකිණකොට ඇත් තේයි. දූ දරුවන් ඇත්නාවූ මවෙක් නොමෝ ඒ දූ දරුවන්ගේ ධනසම්පත්තියද ඒ දූදරුවන්ගේ යහපත්වූ වණ්ණ සණ්ඨානාදියද දුටුවාල්හි යම්සේ සතුටුවන්නේද, එපරිද්දෙන් සතුරු මිතුරු උදාසීන සියලු සුවපත්වූ සත්වයන් කෙරෙහි එකාකාරය පවත් වන්නාවූ සතුටුවීම ලක්ඛණකොට ඇත්තාවූ මේ මුදිතා චෙත සිකය දරුවන් කෙරෙහි මැනියන්ගේ පවත්නාවූ මුදිතාවට උප මාඇතිවේ. මේ කරුණා මුදිතා චෙතසිකයෝ දෙදෙනා බාහි රවූ සත්ව ප්‍රඥප්තියම අරමුණුකොට පවත්නාහුවෙත්. තමන්ගේ දූ දරුවන් කෙරෙහි හෝ තමන්ගේ ඤාති මිත්‍රාදීන් හා සමග පවත්නා කරුණා චෙතසිකය හා මුදිතා චෙතසිකයද ගෙහ සිත ලොභයාගේ විශෙෂයක්මවෙත් එහෙයින් සතර දිගය. සතර අනුදිගය, උඩය, යටය, යන දසදිසාවෙහි වාසයකරන්නාවූ ශත්‍රු මිත්‍ර උදාසීනාදිවූ කිසි විභාගයක් නොකොට සමානවශ යෙන් පවත්වන්නාවූකල්හිම අප්‍රමාණ්‍ය ධම්නම්වෙත්. "විශුද්ධි මාගී විභාරභාවනාවෙහි" අප්‍රමාණ්‍ය ධම්යෝ සතරදෙනෙකැයි දක්වා නිබ්යදී මෙහි කුමක්හෙයින් දෙදෙනෙක්ම දක්වනලද් ද්‍හුද යත්? යට හොඳන චෙතසිකයන් අතුරෙන් අවෙශ චෙතසික තෙමේ මෙත්තා චෙතසිකය්මවෙයි. තත්‍රමජ්ඣත්ත තාවෙතසික තෙමේ උපෙක්ඛානම්වෙයි. එහෙයින් නැවත ඒ ධම්දෙදෙනා මෙහි නොගන්නාලද්දාහුයයි දනයුතුයි එහෙයින් අවෙශ සඞ්ඛ්‍යාත මෙත්තා චෙතසිකයද, කරුණාචෙතසිකා යද, මුදිතා චෙතසිකයද, තත්‍රමජ්ඣත්තතා සඞ්ඛ්‍යාත උපෙක්ඛා චෙතසිකයද, යන මේධම්යෝ සතරදෙන බ්‍රඹ්දීන්ගේ උත්තම විහාරයන් බැවින් බ්‍රහ්මවිහාරයයි ව්‍යවහාරකෙරෙත්. තමන්ගේ දූ දරුවන් ලදරු අවස්ථාවෙහි මව්පියන්ට පවත්නාවූ සභාව මෙත්තාකරුණාදෙකට සමානවෙයි. ඒ දූ දරුවන්ගේ අභි වෘද්ධියට පැමිණිකාල්හි මව්පියන් කෙරෙහි ඇත්තාවූ සභාව මුදිතා උපෙක්ඛා බ්‍රහ්මවිහාරයන්ට බඳුවෙයි. මෛත්‍රී බ්‍රහ්මවිහාර යට රාග තෙමේ ලාංවූ සතුරෙක් වැනිවෙයි. වෙෂ තෙමේ දුරවූ සතුරෙක් වැනිවෙයි. කරුණා බ්‍රහ්මවිහාරයට වෙෂතෙමේ ලංවූ සතුරෙක් වැනිවෙයි. අභිශෙෂ ත්‍රෛලොශ්‍යයෝ දුරවූ සතුරන් වැනි වෙත්, මුදිතා බ්‍රහ්මවිහාරයට සොම්නස ලංවූ සතුරන් වැනි වෙයි. අනභිඤ්ඤ සංඛ්‍යාතවූ ධ්‍යාන ඕදාසීනාදියෙහි නොඇලීම

දුරවූ සතුරෙකු වැනිවෙයි. උපෙක්ඛා බ්‍රහ්මවිහාරයට අසඳුණ උපෙක්ඛාව නොහොත් උපෙක්ඛා සහගත ඔවිප්‍රකාර අකුශල චිත්තයෙහි යෙදුනාවූ මොහය ලංවූ සතුරෙකු වැනිවෙයි. රාග ප්‍රතිඝයෝ දෙදෙන දුරවූ සතුරන් වැනිවෙත්. මෙසේ අප්‍රමාණ්‍ය චෛතසික දෙදෙනාගේ විභාග දතයුතුයි.

පඤ්චේන්ද්‍රිය චෛතසික තෙමේ සියලු ධර්මයන්ගේ අනිත්‍යාදි සභාව අවබෝධකිරීම් හා මාර්ගඵල චිත්තයෙහි යෙදුනාවූ අවශෙෂ ධර්මයන් තමාගේ වසඟයෙහි ලක්ෂණකොට ඇති හෙයින් ප්‍රඥෙන්ද්‍රියයයි ව්‍යවහාරකෙරෙත්. මේ ප්‍රඥෙන්ද්‍රිය විභාඞ්ගයහපත් පණ්ඩිත මාර්ගදෙශනායෙකුට බදු උපමා ඇතිවෙයි. නොහොත් ඝනවූ පුවරුකඩක් හෝ චක්ෂාදියක් හෝ විනිවිද යනලෙස විදීමෙහි දක්ෂවූ ඊතලයකට බදු උපමා ඇතිවෙයි. යම්සේ දක්ෂවූ දුහුවාගෙක් නොමේ මහත්වූ චක්ෂාදිය පවා විනිවිද යනලෙස විදින්නාක්මෙන් මේ ප්‍රඥෙන්ද්‍රිය තෙමේ සියලු ධර්මයන් විනිවිද පවත්නේයි. නොහොත් අඤ්ඤාණයෙහි විද්‍යමානවූ යම් යම් වස්තුව දල්වනලද්දාවූ ප්‍රදීපාලොකයකින් දක්නාක්මෙන් මොහ නැමති අඤ්ඤාණයෙන් වැසී පවත්නාවූ අනිත්‍ය දුඃඛ අනාත්මාදී ලක්ෂණයන් අවබෝධකරන්නේයි. දෘෂ්ටියද ප්‍රඥාවද යන මේ ධර්මයෝ දෙදෙන දැනීම් ලක්ෂණකොට ඇත්තාහු නම් ඒ ධර්මයන් දෙදෙනාගේ විශෙෂ කවරේද යත්? දෘෂ්ටි නොමෝ ඒ ඒ ධර්මයන්ගේ තත්ත්වාකාරය හැර අයථා සභාව යන්ද දැනීමකරයි. ප්‍රඥා නොමෝ ඒ ඒ ධර්මයන්ගේ සභාවයන් දැනීමකරයි. සංඥා විඥාන ප්‍රඥා යන මේ ධර්මයෝ තුන් දෙනාගේ අරමුණු දැනගැනීම් සාධාරණහෙයින් ඒ ධර්මයන් තුන්දෙනාගේ විශෙෂ කවර යත්? සංඥා නොමෝ නීල පීතාදී වර්ණමාත්‍රයක් හැඳිනගන්නීයි. කුමක්හෙයින් නිල්වූයේද? කුමක්හෙයින් රත්වන්වූයේද? යනාදී විභාගය නොදනී. එසේම සංඥා නොමෝ අනිත්‍ය සභාව දුඃඛ සභාව අනාත්ම සභාවනොදනී. මාර්ගඵලලැබීම් ඵලයාගේලැබීම මේ මේ හෙතුවෙන්වේයයිද නොදනී. විඤ්ඤාණ තෙමේ නීල පීතාදී රූපාලම්බණයදනී. කුමක් හෙයින් නීල පීතාදී වර්ණවූයේදැයිද දනී. අනිත්‍ය දුඃඛ අනාත්ම සභාවද දනී. එනකුදුවුවත් කවර කර්මඵලයක් හා විනාකිරීමෙන් මාර්ගඵලයන්ගේ ලැබීම්වන්නේදැයි නොදනී. ප්‍රඥා නොමෝ නීල පීතාදී අරමුණුද හඳුනයි. කුමක්හෙයින් නීල පීතාදිවර්ණවූයේදැයි යන හෙතුවද දැනගන්නී. අනිත්‍ය දුඃඛ අනාත්ම සභාවද දැනගන්නී. අසවල්කර්මඵලයන් භාවනාකොට අසවල් මාර්ගඵල

යද ලබන්නේයයි යන විභාගයද දනී. එහෙයින් ප්‍රඥාව හා යෙදුනාවූ සංඥා විඥාන දෙදෙන අප්‍රධානවෙත්. මේ සංඥා විඥාන ප්‍රඥාවන්ට උපමා කවර යත්? ලදරුවෙක, පිටිසර ගම් වැසියෙක, රන්කරුවෙක, යන මෙකී තුන්දෙනා ඉදිරියෙහි රන්කහවණු දැමූකල්හි කහාවණි මාත්‍රයක් ලදරු තෙමේ දන ගණී. සංඥාවගේ අරමුණු හැඳිනීමද ඊට උපමාවෙයි. පිටිසර වැසි පුරුෂ තෙමේ රන්කහවණු මනුෂ්‍යයන්ගේ උපභොග පරිභොග වසතුවක්බවද දුලීහවූ වටිනා වසතුවක් බවද දනගණී. විඤ්ඤාණයාගේ අරමුණු හැඳිනීම ඊට උපමාවේ. රන්කරු තෙමේ ඒ රන්කහවණුව අසවල් රට අසවල් ආකරයෙහි උපන්නේය. අසවල්දෙශයෙහි මෙතෙක් අගනේය අසවල් දෙශයෙහි මෙතෙක් අගනේය. යනාදී සියලුවිභාගයන් දනගණී. ශ්‍රද්ධාව ආදී කොට ඇත්තාවූ ප්‍රඥාව අවසන්කොට ඇත්තාවූ සම් පද්විසි චෛතසිකයෝ තුමූ ශොභන චිත්තයෙහිම යෙදියයුතු හෙයින් ශොභන චෛතසිකයෝයයි ව්‍යවහාරකෙරෙත්.

ආයුෂ්මත්වූ අනුරුඬාචාරීන්වහන්ස! නුඹවහන්සේගේ මේ "අභිධම්මාවතාරේ" නම් ප්‍රකරණය ව්‍යඤ්ජනවශයෙන් හා අර්ථවශයෙන්ද අනිශයින් සංක්ෂිප්තකොට සංග්‍රහකරම්හයි පළමුවෙන් ප්‍රතිඥාකොට සපශීය ආදිකොට ඇත්තාවූ ප්‍රඥාව අවසන්කොට ඇත්තාවූ මේ දෙපණසක් ධම්මයෝ "එසෝ වෙදනා-පෙ-පඤ්ඤින්ද්‍රියං" යනුවෙන් එකම පරිච්ඡේදයකින් සංග්‍රහකටහැකිවුවද එසේනොකොට සපශීාදීවූ සත්දෙන "සත්තිමෙ චෙතසිකා සබ්බචිත්ත සාධාරණානාම" යනුවෙන් එක් පරිච්ඡේදයක්වශයෙන්ද, ප්‍රකිණ්ණක ධම්මයෝ සදෙන" ඡ්ඉමෙ චෙතසිකා" යනුවෙන් එක් පරිච්ඡේදයක්වශයෙන්ද, නැවත ඒ පරිච්ඡේදවය ඕශ්‍රකොට "තෙරසචෙතසිකා අඤ්ඤ සමානාති වෙදිතබ්බා" යනුවෙන් එක් පරිච්ඡේදයක්වශයෙන්ද, මොහාදී චෛතසිකයෝ සතරදෙනෙක් "සබ්බා කුසල සාධාරණානාම" යනුවෙන් එක් පරිච්ඡේදයක්වශයෙන්ද, ලොභාදී චෛතසිකයෝ දසදෙනෙක් හා සමග ඒ පළමු චෛතසිකයෝ සතර දෙන "වුද්දසිමෙ චෙතසිකා අකුසලානාම" යනුවෙන් එක් පරිච්ඡේදයක්වශයෙන්ද, ශ්‍රද්ධාදී චෛතසිකයෝ එකුන් විසිදෙනෙක් "එකුනවීසතිමෙ චෙතසිකා සොභන සාධාරණා නාම" යනුවෙන් එක් පරිච්ඡේදයක්වශයෙන්ද, සම්මාවාචාදී චෛතසිකයෝ තුන්දෙනෙක් "තිස්සෝ විරතියෝ නාම" යනුවෙන් එක් පරිච්ඡේදයක්වශයෙන්ද, කරුණාදී චෛතසිකයෝ දෙදෙනෙක් "අප්පමඤ්ඤායෝ" යනුවෙන් එක් පරිච්ඡේදයක්වශයෙන්ද "පඤ්ඤින්ද්‍රියෙන සඞ්ගං" යනුවෙන් ප්‍රඥාව එක් පරිච්ඡේදයක්,

වශයෙන්දැයි මෙසේ නවපරිවෙජ්දයකින් පිරිසිඳ ග්‍රන්ථකාරවය ඇතිකොට කුමක්හෙයින් ප්‍රකාශකෙළේද යත්? මෙසේතා කොට සපශීර්දීවූ ප්‍රඥාව අවසන්කොට ඇත්තාවූ මේ දෙපණස් ධර්මයන්ගේ නාමව්‍යවස්ථානය එකම පරිවෙජ්දයකින් සංග්‍රහ නොකෙළේ කුමක්හිසාද යත්? ඊට පරිහාර මෙසේ දතයුතුයි. මේ දෙපණස් චෛතසිකයන් අතුරෙන් සපශීර්දී චෛතසිකයෝ සත්දෙන සියලුම චිත්තයෙහි එකාන්තයෙන් යෙදෙතබව හඟවනු පිණිස "සබ්බචිත්ත සාධාරණානාම" යනුවෙන් එක් පරිවෙජ්දයකින් පිරිසිදිනාලද්දේයි. චිත්තකීර්දී ධර්මයෝ සදෙන නානාප්‍රකාරයෙන් විසිර පවත්නා අර්ථය ප්‍රකාශකරනු පිණිස නොහොත් එක එකක් විරුඬව සයාකාරයකින් යෙදෙන අර්ථය හඟවන පිණිස "පකිණ්ණකා නාම" යනුවෙන් එක් පරිවෙජ්දයකින් පිරිසිදිනාලද්දේයි. ඒතෙළෙස් චෛතසික ධර්මයෝ තුමූ කුශලා කුශල අව්‍යාකෘත යන සියලු ධර්මයන්ට සමානව පවත්නා අර්ථය හඟවනු පිණිස "අඤ්ඤ සමාන ධම්" යෝයයි පිරිසිදිනාලද්දේයි. අකුශල චෛතසිකයන් අතුරෙන් මොහාදීවූ ධර්මයෝ සතරදෙනෙක් සර්ව අකුශල සාධාරණවශයෙන් යෙදෙන බව හඟවනු පිණිස "අකුසල සාධාරණා නාම" යනුවෙන් පිරිසිඳිනාලද්දේයි. ලෝහාදී අකුශල චෛතසිකයෝ දසදෙන සියලු අකුශල චිත්තයෙහි එකාකාරයෙන් නොයෙදී අනෙකාකාරයෙන් අකුශල චිත්තයෙහිම යෙදෙන බැව් හඟවනු පිණිස "අකුසලානාම" යනුවෙන් පිරිසිඳිනාලද්දේයි. ශ්‍රද්ධාදීවූ එකුන්විසි ධර්මයෝ තුමූ එකුන්සැටක් ශොභන චිත්තයෙහි නියත යොගීවශයෙන් එකාන්තයෙන් යෙදෙනබව හඟවනු පිණිස "සොභන සාධාරණානාම" යනුවෙන් පිරිසිඳිනාලද්දැක්වූය. සම්මා වාචාදීවූ විරතීහු තුන්දෙන ශීලමය පුණ්‍ය ක්‍රියා වස්තුවෙහි එසා එසා ශික්ෂාපදයක් අරමුණුකොටගෙණ පවත්නාබව හා ලෝකොත්තර විරතීහු ලෝකොත්තර චිත්තයෙහි එකාන්තයෙන් සියල්ල ලැබිය යුතුබව හඟවනු පිණිසද කරුණාදීවූ චෛතසිකයෝ දෙදෙන ප්‍රථම ත්‍රිතීය තෘතීය චතුර්ථධ්‍යාන චිත්තයෙහි බ්‍රහ්ම විහාර භාවනාවශයෙන් පවත්නාකල්හි ලැබිය යුතුබව හඟවණු පිණිස "අප්පමඤ්ඤායෝ නාම" යනුවෙන් පිරිසිඳිනාලද්දැක්වූය. ප්‍රඥාචෛතසිකය වනාහී සත්සාළිස් ත්‍රිහේතුක චිත්තයෙහිම අනියත යොගීවශයෙන් ලැබිය යුතුබව හඟවනු පිණිස "පඤ්ඤින්ද්‍රියෙන" යනුවෙන් වෙන්කොටදක්වනලද්දේයි. මෙසේ මේ දෙපණස් චෛතසික ධර්මයන්ගේ නවප්‍රකාර අර්ථය හඟවනු පිණිස නවපරිවෙජ්දයකින් වෙන්කොට දක්වනලද්දැක්වූයයි දත යුතුයි.

විත්තාවියුත්තානං, විත්තයෙහි එකාන්නයෙන් යෙදෙන්නාවූ; තෙසං, ඒ චෛතසිකයන්ගේ; චිත්තුප්පාදෙසු, විත්තයෙහි; පවෙඛකං, වෙනවෙනම්; සම්පයොගො, සම්ප්‍රයෝගක්‍රමය; ඉතෝ, මේ සංක්ෂේප ක්‍රමයෙන්; නොහොත් මේ උද්දෙසයෙන්; පරං, මත්තෙහි; යථායොගං, සුදුසු පරිද්දෙන්; පවුච්චති, ප්‍රභෙදවශයෙන් කියනුලැබේ.

සත්ත, සජීවිත්ත සාධාරණ චෛතසිකයෝ සත්දෙන තුමූ; සබ්බත්ථ, සියලු එකුන්අනූවක් විත්තයෙහි: යුජ්ජන්ති, යෙදෙන්නාහුවෙත්; පකිණ්ණකා. ප්‍රකීර්ණක චෛතසිකයෝ සදෙන තුමූ, යථායොගං, සුදුසු පරිද්දෙන්; යුජ්ජන්ති, යෙදෙන්නාහුවෙත්; වුද්දස, තුදුස් අකුශල චෛතසිකයෝ තුමූ; අකුසලෙසෙව, දෙලොස් අකුශලයෙහිම; යථායොගං, සුදුසු පරිද්දෙන්; යුජ්ජන්ති, යෙදෙන්නාහුවෙත්; සොභනා, පස්විසිශොභන චෛතසිකයෝ තුමූ; සොභනෙසෙව, එකුන්සැටක් ශොභන විත්තයෙහිම; යථායොගං, සුදුසු පරිද්දෙන්: යුජ්ජන්ති, යෙදෙන්නාහුවෙත්.

කථං යුජ්ජන්ති? කෙසේ යෙදෙන්නාහුද යත්? "යුජ්ජන්ති" යනු අඛ්‍යාහාරයි. සබ්බචිත්ත සාධාරණා, සජීවිත්ත සාධාරණ චෛතසිකයෝ සත්දෙන: තාව, පළමුකොට; "මයා වුච්චතෙත" යනු අඛ්‍යාහාරකරණ්ඩු. ඉමෙසත්තචෙතසිකා, මේ චෛතසිකයෝ සත්දෙන; සබ්බසුපි, සියලුම; එකූනනවුති චිත්තුප්පාදෙසු; එකුන් අනූවක් විත්තොත්පාදයෙහි; ලබ්භන්ති, ලැබියයුත්තාහුවෙත්.

පන, සජීවිත්ත සාධාරණ චෛතසිකයන්ගේ සම්ප්‍රයෝග ක්‍රමයෙන් අන්‍යවූ ප්‍රකීර්ණක චෛතසිකයන්ගේ සම්ප්‍රයෝගක්‍රමය කියම්. පකිණ්ණකෙසු, ප්‍රකීර්ණක චෛතසිකයන් සදෙනා අතුරෙන්; තාව, පළමුකොට; "මයාවුත්තෙතා" යනු අඛ්‍යාහාරයි. විතක්කෙකා, විතර්ක චෛතසික තෙමේ; විපවිඤ්ඤණ වජ්ජිත කාමාවචර චිත්තෙසුවෙව, දෙපස් විඤ්ඤණයන් හැර කොට ඇත්තාවූ සුභාළිස් කාමාවචර චිත්තයෙහිද; එකාදසසු, එකොළොස් ප්‍රකාරවූ; පඨමජ්ඣාන චිත්තෙසු, ප්‍රථමධ්‍යානය හා යුක්තවූ චිත්තයෙහිද; ඉති, මෙසේ; පවපඤ්ඤාස විත්තෙසු, පස්පණස් චිත්තයෙහි; උපපජ්ජති, උපදනේයි.

විචාරෙපන, විචාර චෛතසිකය වනාහි; "පන" යනු පක්ෂාන්තරයෙහි නිපාතපදයි. නෙසුවෙව, ඒ සවිතක්කවූ පස්පණස්

චිත්තයෙහිද; එකාදසසු, එකොළොස් ප්‍රකාරවූ; දුතියජ්ඣාන චිත්තෙනසුව ඉති, තතියඣාන චිත්තයෙහිදැයි යන; ඡසටයි චිත්තෙනසු, සසැටක් චිත්තයෙහි උපදනේයි.

අධිමොක්ඛ චෛතසික තෙමේ; පඤ්චවිඤ්ඤාණවිච්කිච්ඡා සහගත වජ්ජිත විත්තනසු, දෙපස් විඤ්ඤාණය විචිකිච්ඡා සහගත චිත්තය යන එකොළොස් චිත්තයන් හොරකොට ඇත්තාවූ අටසැත්තෑවක් චිත්තයෙහි, උපදනේයි.

විරියං, වීර්‍ය්‍ය චෛතසික තෙමේ; පඤ්චාරාවජ්ජන විපඤ්චවිඤ්ඤාණ සම්පටිච්ඡන සන්තීරණ වජ්ජිත චිත්තෙනසු, පඤ්චාරාවජ්ජන චිත්තය; දෙපස් විඤ්ඤාණදසය; සම්ප්‍රත්‍යේක්ෂණ ශුභාලය සන්තීරණත්‍රය යනමොවුන් හොරකොට ඇත්තාවූ තෙසැත්තෑවක් චිත්තයෙහි; උපජ්ජති, උපදනේයි.

පීති, ප්‍රීති චෛතසික තොමෝ; දෙඉනසසුපෙක්ඛා සහගත කායවිඤ්ඤාණ චතුත්ථජ්ඣානවජ්ජිත චිත්තෙනසු, චෙෂ මූලිකා දෙසිතය උපෙක්ඛා සහගත පස්පණස් චිත්තය කායවිඤ්ඤාණ යුගලය චතුජ්ඣාන එකොළොස් චිත්තය යනමොවුන් හොරකොට ඇත්තාවූ එක්පණස් චිත්තයෙහි; උපජ්ජති, උපදනේයි.

ඡන්දෝ, ඡන්ද චෛතසික තෙමේ; අහෙතුකමෝමූහවජ්ජිත චිත්තෙනසු, අටළොස් අහෙතුක චිත්තය මොහ මූලිකා දෙසිතය යන විංශති ප්‍රකාර චිත්තය වර්ජිතකොට ඇත්තාවූ එකුන් සැත්තෑවක් චිත්තයෙහි; උපජ්ජති, උපදනේයි.

ඉති, ඉමයේ; "නෙසං සත්තවිධෝ සම්පයොගෝ වෙදිතබ්බෝ" යනු අඛ්‍යාහාරයි. පන, පාරිශේෂන්‍යායෙන් එක් ප්‍රදේශයක් කියමි:-පකිණ්ණක විවජ්ජිතා, ප්‍රකීර්ණක සංඥන වර්ජිතකොට ඇත්තාවූ; තෙවිත්තුපපාදා, ඒ විඤ්ඤාණත්පාදයෝ; යථාක්කමං, පිළිවෙළින්; ඡසඨිම, සසැටක් ප්‍රභෙද ඇත්තාවූද; පඤ්චපඤ්ඤාසඤ්ච, පස්පණසක් ප්‍රභෙද ඇත්තාවූද; එකාදසච, එකොළොසක් ප්‍රභෙද ඇත්තාවූද; සොළසච, සොළසක්ප්‍රභෙද ඇත්තාවූද; සත්තතිච, සැත්තෑවක් ප්‍රභෙද ඇත්තාවූද; විසති චෙව, විස්සක් ප්‍රභෙද ඇත්තාවූදැයි ; වෙදිතබ්බා, දතයුත්තාහුය. සපකිණ්ණකා, ප්‍රකීර්ණක චෛතසික සංඥන හා එක්වහටගත්තාවූ; තෙවිත්තුපපාදා, ඒ විඤ්ඤාණත්පාදයෝ; යථාක්කමං, පිළිවෙළින්; පඤ්චපඤ්ඤාසඤ්ච, පස්පණසක් ප්‍රභෙද ඇත්තාවූද; ඡසට්ඨිච, සසැටක් ප්‍රභෙද ඇත්තාවූද; අට්ඨසත්තතිච, අටසැත්තෑවක් ප්‍රභෙද ඇත්තාවූද, තිසත්තතිච, තෙසැත්තෑවක් ප්‍රභෙද

ඇත්තාවූද; එකපසුසුසව, එක්පණසක් ප්‍රභෙද ඇත්තාවූද: එකූන සත්තතිව, එකුන් සැත්තෑවක් ප්‍රභෙද ඇත්තාවූදැයි; වෙදිතබ්බා, දහයුත්තාහුය.

දෙපණස් චෛතසිකයන්ගේ සවභාව ලක්‍ෂණයන් දක්වා ඒ ඒ චෛතසිකයෝ තුමූ යෙදෙන්නාවූද නොයෙදෙන්නාවූද ක්‍රමය සංක්‍ෂෙපයෙන් දක්වනුලැබේ. ඒ දෙපණස් චෛතසිකයන් අතුරෙන් සම්පයුත්තසාධාරණ චෛතස්කයෝ සත්දෙන කවර චිත්තයෙක්හි යෙදෙන්නේදැයි යමෙක් ප්‍රශ්නකෙළේවිනම් ඒ ධම්යෝ සත්දෙන නොයෙදෙන්නාවූ චිත්තයෙක්නම් නැත්තේය. එකාන්තයෙන් සියලු එකුන් අනූවක් චිත්තයෙහිම යෙදෙන්නේයයි කියයුතුයි. ප්‍රකීර්ණක චෛතසිකයෝ සදෙන සියලු එකුන් අනූවක් චිත්තයන් අතුරෙන් යථාහීයෙන් යෙදෙන්නාවූ චිත්තයෝද ඇත්තාහ. නොයෙදෙන්නාවූ චිත්තයෝද ඇත්තාහයි කියයුතුයි. තුදුස් අකුශල චෛතසිකයෝ තුමූ දෙලොස් අකුශල චිත්තයෙහිම යෙදෙන්නාහුය. එහෙත්දුවුවත් ඇතැම් චෛතසික ධම්යෝ ඇතැම් අකුශල චිත්තයෙක්හි යෙදෙන්නාහුය. ඇතැම් අකුශල චිත්තයෙක්හි නොයෙදෙන්නාහුය. පස්විසි ශොභන චෛතසිකයෝ තුමූ එකුන්සැටක් ශොභන චිත්තයෙහිම යෙදෙන්නාහුය. එහෙත්දුවුවත් ඇතැම් චෛතසිකයෝ ඇතැම් ශොභන චිත්තයෙක්හිම යෙදෙන්නාහුය. ඇතැම් ශොභන චිත්තයෙක්හි නොයෙදෙන්නාහුය. අට ලොස් අහෙතුක චිත්තයෙහි වනාහි තුදුස් අකුශල චෛතසිකයන්ගෙන් හා පස්විසි ශොභන චෛතසිකයන්ගෙන් යම් ධම්යක් යෙදී ඇත්තේදෝ හෝයි මනාසෙවිය යුත්තේයි. අටලොස් අහෙතුක චිත්තයෙහි යෙදෙන්නාවූ ධම්යන් සොයනු කැමැත්තාහුනම් අසූසු සමාන තෙළෙස් චෛතසිකයන් අතුරෙහි සෙවිය යුත්තේයි. දෙලොස් අකුශල චිත්තයෙහි යෙදෙන්නාවූ ධම්යන් සොයනු කැමැත්තාහුනම් අන්‍ය සමාන තෙළෙස් චෛතසිකයෝය. තුදුස් අකුශල චෛතසිකයෝය. යනමේ සත්විසි ධම්යන් අතුරෙහි සෙවිය යුත්තේයි. එකුන්සැටක් ශොභන චිත්තයෙහි යෙදෙන්නාවූ ධම්යන් සොයනු කැමැත්තාහුනම් අන්‍ය සමාන තෙළෙස් චෛතසිකයෝය පස්විසි ශොභන චෛතසිකයෝය යනමේ අවතිස් ධම්යන් අතුරෙහි සෙවිය යුත්තේයි. මෙසේ සංක්‍ෂෙපයෙන් චෛතසිකයන්ගේ සවභාව දැනගත් කල්හි අසවල් චෛතසිකයෝ අසවල් චිත්තයෙහි යෙදෙන්

නාහුය. අසවල් චිත්තයෙහි නොයෙදෙන්නාහුයයි වශාම අව බොධකටඇකිවන්නේසි. මේ අර්ථය සඳහාම දෙපණස් චෛත සිකයෝ අඤ්ඤ සමාන රාශිය, අකුශල රාශිය, කුශල රාශියයි තුන් රැසකට බෙදනලද්දාහුය. මේ චෛතසික ධර්මයෝ කෙසේ යෙදෙන්නාහුදැයි යමෙක් ප්‍රශ්නකෙළේවිනම් සප්තාදි සර්වචිත්ත සාධාරණ ධර්මයෝ සත්දෙන සියලු එකුන් අනූවක් චිත්තයෙහි අනූනාධිකවශයෙන් යෙදෙන්නාහුයයි මෙසේ ප්‍රකාශකොට ප්‍රකීර්ණක සදෙනා අතුරෙන් විතකී චෛතසික තෙමේ දෙපස් විඤ්ඤාණයන් දසදෙන හොරකොට ඇත්තාවූ සුසාළිස් කාමාවචර චිත්තය ලෞකික ලොකොත්තරවශයෙන් එකොළොස් වැදැරුම්වූ ප්‍රථමධ්‍යානචිත්තය යන පස්පණස් චිත්තයෙහිද විචාර චෛතසික තෙමේ සවිතකී පස්පණස් චිත්තයෙහි ලෞකික ලොකොත්තරවශයෙන් දෙවැදැරුම්වූ විතිය ධ්‍යාන එකොළොස බහා ලැබෙන්නාවූ සසැටක් චිත්තයෙහිද අධිමොක්ෂ චෛතසික තෙමේ දෙපස් විඤ්ඤාණ දසය විචිකිච්ඡා සහගත චිත්තය යන එකොළොස් චිත්තය හැර අටසැත්තැවක් චිත්තයෙහිද වීර්‍ය්‍ය චෛතසික තෙමේ පවවාරාවජ්ජන චිත්තය, දෙපස් විඤ්ඤාණ දසය, කුශලා කුශලවූ සම්ප්‍රතේ‍යෂණ යුගලය, සන්තීරණත්‍රය යන සොළොස් චිත්තය හැර තෙසැත්තැවක් චිත්තයෙහිද ප්‍රීතිචෛතසික තෙමේ දෙමිනස් සහගත දෙසිතය, උපෙක්ෂා සහගත පස්පණස් චිත්තය, කුශලා කුශල විපාකවූ කායවිඤ්ඤාණ දෙසිතය, ලෞකික ලොකොත්තරවූ චතුර්ථ ධ්‍යාන එකොළොසය යනමේ සැත්තැවක් චිත්තයන් හැර අවශෙෂවූ එක්පණස් චිත්තයෙහිද ඡන්ද චෛතසික තෙමේ අටලොස් අහෙතුක චිත්තය, මොහ මූලික දෙසිතය යනමේ විසිචිත්තයන් හැර අවශෙෂවූ එකුන්සැත්තැවක් චිත්තයෙහිද යෙදෙන්නේයයි කියාදතයුතුයි. අන්‍ය සමාන තෙළෙස් චෛතසිකයන්ගේ යෙදෙන්නාවූ ක්‍රම සතක් ඇත්තේවෙයි. ඒ සත කවරයන්? සර්වචිත්ත සාධාරණ සත්දෙන සමග ප්‍රකීර්ණක චෛතසිකයන් අතුරෙන් එක එක චෛතසිකය එක එක ආකාරයෙන් යෙදෙනයෙහින් සර්වචිත්ත සාධාරණ සත්දෙනාගේ යෙදීම හා එක්කොටගත්කල්හී සම්ප්‍රයොග ක්‍රම සතක්වන්නේයි. ඒ අන්‍ය සමාන චෛතසිකයන් අතුරෙන් විතකී විචාර ප්‍රීතිහු විසතාර පුඵුව හා යෙදෙන්නාහුයි. එයින් අන්‍යවූ ප්‍රීති ඡන්ද අධිමොක්ෂ යන චෛතසික තුන්දෙන සංඛ්‍යෙප පුඵුව හා යෙදෙන්නාහුයි. විසතාර පුඵුවය යනු එකසිය විසිඑක් චිත්තයන්ගේ සංඛ්‍යාවයි. මේ චෛතසිකයෝ සදෙන කුමක්හෙයින් එකාකාරව නොයෙදී

දෙනාකාරයකින් යෙදෙන්නාහුදැයි යමෙක් ප්‍රශ්නකෙළේනම් විතර්ක විචාර ප්‍රීති යන ධර්මයෝ තුන්දෙන ධ්‍යානාඞ්ග කෘත්‍යය සිඳහාර්ත්‍යාවූ චෛතසිකයන් බැවින් විසතාර පුඩුව හා යෙදෙත්මැයි. අවශෙෂ චෛතසිකයෝ තුන්දෙන ධ්‍යානාඞ්ගකෘත්‍යය සිඳසොකරන්නාවූ චෛතසික බැවින් සංක්ෂෙප පුඩුව හා යෙදෙත්මැයි. අටලොස් අහෙතුක චිත්තයන් හා යෙදෙන්නාවූ චෛතසිකයෝ සාවර්ජ්‍රදැයි දැනගණු කැමතිනම් අන්‍ය සමාන තෙලෙස් චෛතසිකයන් අතුරෙන් ඡන්ද චෛතසික මාත්‍රයක් හැර අවශෙෂ දෙලොස් චෛතසික ධර්මයෝ අටලොස් අහෙතුක චිත්තයෙහි යෙදෙනබව සැලකියයුත්තාහුය. විතර්ක විචාර අධිමොක්ෂ යන චෛතසිකයෝ තුන්දෙන දෙපස් විඤ්ඤාණයන් හා නොයෙදෙත්මැයි. ඒ දෙපස් විඤ්ඤාණයන් හැර අවශෙෂ චිත්තයන් අතුරෙන් අසවල් චිත්තයෙහි ඒ ධර්මයෝ තුන්දෙන නොයෙදෙන්නාහුයයි නැත්තේයි. "විරිය පීති" යන ධර්මයෝ දෙදෙනවනාහි ඇතැම් චිත්තයෙක්හි නොයෙදෙත්යයි දතයුතුයි. අටලොස් අහෙතුක චිත්තයන් අතුරෙන් ඡන්ද වජ්ජිත දෙලොස් චෛතසිකයෝ තුමූ හසිතුපපාද චිත්තයෙහිම යෙදෙත්මැයි. චෛතසික එකොලොසක් යෙදෙන්නාවූ චිත්තයෝනම්:-සොම්නස් සහගත සන්තීරණ චිත්තය මනොචාරාවජ්ජන චිත්තය යන දෙදෙනාමැයි. චෛතසික දශයක් යෙදෙන්නාවූ චිත්තයෝනම්:-සම්ප්‍රතෙච්ඡන යුගලය, අහෙතුක පටිසන්ධි යුගලය, පඤ්චාරාවජ්ජන චිත්තය යන සිත් පසයයි දතයුතුයි. චෛතසික නවයක් යෙදෙන්නාවූ චිත්තයෝනම්:-කුශලා කුශල පඤ්ඤයෙහි වක්ඛු විඤ්ඤාණවය, සොතවිඤ්ඤාණවය, ඝාණවිඤ්ඤාණවය, ජිව්හා විඤ්ඤාණවය, කායවිඤ්ඤාණවය, යන දෙපස් විඤ්ඤාණයෝයි. නොඑහෙත් අටලොස් අහෙතුක චිත්තයන් අතුරෙන් චෛතසික යන් සත් සත්දෙන යෙදෙන්නාවූ චිත්තයෝ දසදෙනෙක්ද, චෛතසිකයන් දස දසදෙනා යෙදෙන්නාවූ චිත්තයන් පස්දෙනෙක්ද, චෛතසිකයෝ එකොලොස එකොලොස යෙදෙන්නාවූ චිත්තයෝ දෙදෙනෙක්ද, දෙලොස් චෛතසිකයන් යෙදෙන්නාවූ චිත්තයෙක්දැයි මෙසේ අටලොස් අහෙතුක චිත්තයෙහි යෙදෙන්නාවූ චෛතසික සංඛ්‍යාව ක්‍රමයෙන් දතයුතුයි.

ඒ අටලොස් අහෙතුක චිත්තයන් අතුරෙන් දෙලොස් චෛතසිකයක් යෙදෙන්නාවූ චිත්තය එකමහසිතොත්පාද චිත්තයයිමැයි. එකොලොස් චෛතසිකයක් යෙදෙන්නාවූ චිත්ත

දෙයාකාරයකින් යෙදෙන්නාහුදැයි යමෙක් ප්‍රශ්නකෙළේනම් විතර්ක විචාර ප්‍රීති යන ධර්මයෝ තුන්දෙන ධ්‍යානාඞ්ග කෘත්‍යය සිද්ධකරන්නාවූ චෛතසිකයන් බැවින් විසාර පුඩුව හා යෙදෙත්මැයි. අවශෙෂ චෛතසික්යෝ තුන්දෙන ධ්‍යානාඞ්ගකෘත්‍යය සිද්ධනොකරන්නාවූ චෛතසික බැවින් සංක්ෂෙප පුඩුව හායෙදෙත්මැයි. අටළොස් අහෙතුක චිත්තයන් හා යෙදෙන්නාවූ චෛතසිකයෝ කවරහුදැයි දැනගණු කැමතිනම් අන්‍ය සමාන තෙළෙස් චෛතසිකයන් අතුරෙන් ඡන්ද චෛතසික මාත්‍රයක් හැර අවශෙෂ දෙළොස් චෛතසික ධර්මයෝ අටළොස් අහෙතුක චිත්තයෙහි යෙදෙනබව සැලකියයුත්තාහුය. විතර්ක විචාර අධිමොක්ෂ යන චෛතසිකයෝ තුන්දෙන දෙපස් විඤ්ඤාණයන් හා නොයෙදෙත්මැයි. ඒ දෙපස් විඤ්ඤාණයන් හැර අවශෙෂ චිත්තයන් අතුරෙන් අසවල් චිත්තයෙහි ඒ ධර්මයෝ තුන්දෙන නොයෙදෙන්නාහුයයි නැත්තේයි. "පීරිය පිති" යන ධර්මයෝ දෙදෙනවනාහි ඇතැම් චිත්තයෙක්හි නොයෙදෙත්යයි දතයුතුයි. අටළොස් අහෙතුක චිත්තයන් අතුරෙන් ඡන්ද වජ්ජිත දෙළොස් චෛතසිකයෝ තුමූ හසිතුපපාද චිත්තයෙහිම යෙදෙත්මැයි. චෛතසික එකොළොසක් යෙදෙන්නාවූ චිත්තයෝනම්:-සොම්නස් සහගත සන්තීරණ චිත්තය මනොචාරාවජ්ජන චිත්තය යන දෙදෙනාමැයි. චෛතසික දශයක් යෙදෙන්නාවූ චිත්තයෝනම්:-සම්ප්‍රත්‍යෙෂණ යුගලය, අහෙතුක පරිසන්ති යුගලය, පඤ්චාරාවජ්ජන චිත්තය යන සිත් පසයයි දතයුතුයි. චෛතසික නවයක් යෙදෙන්නාවූ චිත්තයෝනම්:-කුශලා කුශල පක්ෂයෙහි චක්ඛු විඤ්ඤාණාදිය, සොතවිඤ්ඤාණාදිය, ඝාණවිඤ්ඤාණාදිය, ජිව්හා විඤ්ඤාණාදිය, කායවිඤ්ඤාණාදිය, යන දෙපස් විඤ්ඤාණයෝයි. නොඑහෙත් අටළොස් අහෙතුක චිත්තයන් අතුරෙන් චෛතසික යන් සත් සත්දෙන යෙදෙන්නාවූ චිත්තයෝ දසදෙනෙක්ද, චෛතසිකයන් දස දසදෙනා යෙදෙන්නාවූ චිත්තයන් පස්දෙනෙක්ද, චෛතසිකයෝ එකොළොස එකොළොස යෙදෙන්නාවූ චිත්තයෝ දෙදෙනෙක්ද, දෙළොස් චෛතසිකයන් යෙදෙන්නාවූ චිත්තයෙක්දැයි මෙසේ අටළොස් අහෙතුක චිත්තයෙහි යෙදෙන්නාවූ චෛතසික සංඛ්‍යාව ගණාක්‍රමයෙන් දතයුතුයි.

ඒ අටළොස් අහෙතුක චිත්තයන් අතුරෙන් දෙළොස් චෛතසිකයක් යෙදෙන්නාවූ චිත්තය එකමහසිතොත්පාද චිත්තයමැයි. එකොළොස් චෛතසිකයක් යෙදෙන්නාවූ චිත්ත

යෝනම්:-සොම්නස් සන්තීරණය, මනොවාරාවජ්ජනය, යනදෙදෙනාසි. වෙතසික දශයක් යෙදෙන්නාවූ චිත්තයෝ නම්:-සම්ප්‍රතේ‍යෂණයුගලය, අහෙතුක පටිඝනියුගලය, පඤචාරාවජ්ජනය, යනමේ සිත් පසයි. වෙතසිකයෝ සත්දෙනෙක් යෙදෙන්නාවූ චිත්තයෝ නම්:-දෙපස්විඤඤාණ දශදෙනාසි නොහොත් අට ලොස් අහෙතුක චිත්තයන් අතුරෙන් වෙතසිකයෝ සත්සත් දෙන යෙදෙන්නාවූ චිත්තයෝ දසදෙනෙකි. වෙතසිකයෝ දස දසදෙන යෙදෙන්නාවූ චිත්තයෝ පස්දෙනෙකි. එකොළොස් එකොළොස් වෙතසික යෙදෙන්නාවූ චිත්තයෝ දෙදෙනෙකි. දෙලොස් වෙතසික නෙනෙක් යෙදෙන්නාවූ එක්චිත්තයෙකි. වෙතසිකයෝ සත් සත්දෙන යෙදෙන්නාවූ චිත්තයෙහිවනාහි අන්‍ය සමාන තෙළෙස් වෙතසිකයන් අතුරෙන් දෙපස්විඤඤාණදසයෙහි ප්‍රකීර්ණකයෝ සදෙනම නොයෙදෙන්නාහුවෙති එහෙයින් ප්‍රකීර්ණක සදෙන වර්ජිතකොට ඇත්තාවූ සවිචිත්ත සාධාරණ සත්දෙන යෙදෙන්නාහුවෙති එනම්:-දෙපස්විඤඤාණදසදෙනාසි. වෙතසික දශය දශය බැගින් යෙදෙන්නාවූ පඤචිත්තයෝ නම්:-සම්ප්‍රතේ‍යෂණ යුගලය, අහෙතුක පටිඝනියුගලය, මනොවාරාවජ්ජන චිත්තය යන පස්දෙනාසි. ඒ වෙතසික යන් දශදෙනාවකාහි ඡන්දවර්ජිතවූ අන්‍ය සමාන දෙලොස් වෙතසිකයන් අතුරෙන් සම්ප්‍රතේ‍යෂණ යුගලය, අහෙතුක පටිඝනි යුගලය, පඤචාරාවජ්ජනය යනමේ චිත්තයෝ පස්දෙනම උපෙක්ඛා සහගත බැවින් ප්‍රීතියද උඛරණය කටයුත්තේයි. එසේම වීරිය වෙතසිකයද උඛරණය කළකල්හී අවශෙෂවූ වෙතසිකයෝ දසදෙන ලැබෙන්නාහුයි. සොම්නස් සන්තීරණ මනොවාරාවජ්ජන චිත්තය යන දෙසිතෙහි එකොළොස් වෙතසිකයක් යෙදෙන්නේය යනු සොම්නස් සන්තීරණයවූයේනම් ඡන්දවීරිය දෙදෙනා උඛරණයකළකල්හී අවශෙෂවූ එකොළොස ලැබෙන්නේයි. මනොවාරාවජ්ජනයවීනම් ඡන්ද ප්‍රීති දෙදෙන උඛරණයකොට අවශෙෂවූ එකොළොස ලැබෙන්නේයි. ඒසොම්නස් සන්තීරණ මනොවාරාවජ්ජන යන දෙසිත එක්කොටගත් කල්හි කෙතෙක් වෙතසික ලැබෙන්නේදැයි යමෙක් ප්‍රශනයකළේවිනම් ප්‍රීති වෙතසිකය මනොවාරාවජ්ජනය හා නොයෙදෙන්නේ නමුදු සොම්නස් සන්තීරණයෙහි යෙදිය යුතුහෙයින් ඒ සොම්නස් සන්තීරණයෙහි යෙදෙන්නාවූ ප්‍රීතිය ලැබෙනසේද වීරිය වෙතසිකය සොම්නස් සන්තීරණයෙහි නොයෙදෙන්නේ නමුදු මනොවාරාවජ්ජන චිත්තයෙහි යෙදෙනහෙයින් මනොවාරාවජ්ජනයෙහි යෙදුනාවූ වීරිය වෙතසිකය ලැබෙනසේද ඒදෙසිත

එකට සම්බන්ධකොට එකම ඡන්දචෙතසිකය හැර අවශෙෂ දෙළ සලැබෙත්යයි කියයුත්තේයි. දෙළොස් චෙතසිකයක් ලැබෙන්නාවූ චිත්තය එකමහසිතොත්පාදයමැයි. ඒ දෙළස කෙසේ ලැබෙත්ද යත්? අන්‍ය සමාන තෙළෙස් චෙතසිකයන් අතුරෙන් එකම ඡන්ද චෙතසිකය හැර අවශෙෂ දෙළස ලැබෙත්යයි කියයුත්තේයි. පවවාරාවජ්ජන මනොවාරාවජ්ජන දෙසිතෙහි යෙදෙන්නාවූ චෙතසිකයෝ කෙතෙක්දැයි ප්‍රශ්නකෙළේවිනම් වීර්‍ය්‍ය චෙතසිකය පවවාරාවජ්ජන චිත්තයෙහි නොයෙදෙන්නේ නමුදු මනොවාරාවජ්ජන චිත්තයෙහි යෙදෙනහෙයින් අන්‍ය සමාන තෙළෙස් චෙතසිකයන් අතුරෙන් ඡන්ද ප්‍රීති දෙදෙන හැර අවශෙෂ එකොළොස් චෙතසිකය ලැබෙන්නේයයි විසඳියයුත්තේයි.

අටළොස් අහෙතුක චිත්තයෙහි සම්ප්‍රයොග ක්‍රමයයි.

දෙළොස් අකුශල චිත්තයෙහි චෙතසිකයන්ගේ බෙදීම කෙසේ යත්? අන්‍ය සමාන තෙළෙස් චෙතසිකයෝය, තුදුස් අකුශල චෙතසිකයයි යනමේ දෙකොටස එක්කලකල්හි ලැබෙන්නාවූ සත්විසි චෙතසිකය සාමාන්‍යයෙන් දෙළොස් අකුශල චිත්තයෙහි යෙදෙන්නේයයි විසඳියයුත්තේයි. එතකුදුවුවත් ලොභ මූලික චිත්තය, දොෂ මූලික චිත්තය, මොහ මූලික චිත්තය යනමොවුන් වෙන් වෙන්කොට ප්‍රකාශකෙළේවිනම් ඒ දෙළොස් අකුශල චිත්තයන් අතුරෙන් ඇතැම් චිත්තයක යෙදෙනහෙයින් ඒ දෙළොස් අකුශල චිත්තයෙහි වෙන්වෙන් වශයෙන් ලැබෙන්නාවූ චෙතසිකයෝ මේ මේයයි විස්තර කටයුත්තාහුය. සියලු දෙළොස් අකුශල චිත්තයෙහි සාමාන්‍ය යෙන් ලැබෙන්නාවූ සත්විසි චෙතසිකයන් අතුරෙන් සත්ත චිත්ත සාධාරණ චෙතසිකයෝ සත්දෙනය, ප්‍රීති අධිමොක්ෂ යන තුණ හැර චිතකී විචාර ප්‍රීති සංඛ්‍යාතවූ ප්‍රකීර්ණක චෙතසිකයන් තුන්දෙනාගේද වශයෙන් අන්‍ය සමාන චෙතසිකයෝ දසදෙනය, තුදුස් අකුශල චෙතසිකයන් අතුරෙන්ද මොහ අහිරික අනොත්තප්ප උඩචව සංඛ්‍යාතවූ සත්‍ය්‍ය අකුශල සාධාරණ චෙතසිකයෝ සතරදෙනය යනමේ තුදුස් චෙතසිකයන් අතුරෙන් අසවල් චෙතසිකය අසවල් චිත්තයෙහි යෙදෙන්නේදෝ හෝයි නොයෙදෙන්නේදෝහෝයි සැකනොකටයුත්තේයි.

නොහොත් සියලු අකුශල චිත්තයෙහි යෙදෙන්නාහුයයි දත යුතුයි. අන්‍ය සමාන වෛතසිකයන් අතුරෙන් ඡන්ද ප්‍රීති අධිමොක්ෂ යන තුන්දෙනය, සෝභාකුශල සාධාරණ වෛතසිකයෝ සතරදෙනය යන මේ සත්දෙනාගෙන් අන්‍යවූ ලොභදිට්ඨිමාන දෙස ඉස්සාමච්ඡරිය කුක්කුච්ච පින මිඹ විචිකිච්ඡා යන වෛතසිකයෝ දසදෙනය යන තෙළෙස් වෛතසිකයෝ අසවල්චිත්ත යෙහි යෙදෙන්නේද නොයෙදෙන්නේදැයි සෙවියයුත්තේයි. කුමක්හෙයින ද? ඒ වෛතසිකයෝ අනියත යෝගී බැවිනි. පළමුවෙන් දක්වනලද්දාවූ වෛතසිකයෝ නියත යොගීනම් වෙත්. ලොභ මූලික චිත්තයෙහි යෙදෙන්නාවූ වෛතසිකයෝ කවරහුදැයි විභාග්‍රහ කරම් සත්විසි වෛතසිකයන් අතුරෙන් "දෙස ඉස්සාමච්ඡරියකුක්කුච්ච විචිකිච්ඡා" යන වෛතසිකයෝ පස්දෙන උගුළුවා අවශෙෂ දෙවිසි වෛතසිකයෝ ලැබෙත්යයි කියයුතුයි. ඒ ලොභ මූලික චිත්තයන් අටදෙනාකෙරෙහි සොම්නස්ස උපෙක්ඛාසම්ප්‍රයුක්ත විප්‍රයුක්ත අසඞ්ඛාරික සසඞ්ඛාරික යන්වෙන්කොට විභාග්‍රහ කරම් ලොභ මූලික චිත්තයෙහි ලැබෙන්නාවූ දෙවිසි වෛතසිකය මුල්කොටගෙණ නොලැබියයුතු වෛතසිකය මේ මේයයි උඩරණයකොට විසඳියයුත්තේයි. සොම්නස් සහගත සතරවිත්තයෙහි යෙදෙන්නාවූ වෛතසික සඞ්ඛ්‍යාව විභාග්‍රහ කරම් යටකී දෙවිස්ස ලැබෙන්නේයයිකියාද, උපෙක්ඛා සහගත සතර චිත්තය විභාග්‍රහ කරම් යටකී දෙවිසි වෛතසිකයන් අතුරෙන් ප්‍රීතිය පමණක් උඩරණයකොට අවශෙෂ එක්විස්ස ලැබෙන්නේයයි කියයුතුයි. සම්ප්‍රයුක්ත සතර විභාග්‍රහ කරම් ඒ දෙවිසි වෛතසිකයන් අතුරෙන් මානවෛතසිකය උඩරණය කොට අවශෙෂ එක්විසි වෛතසිකයෝද, විප්‍රයුක්ත සතර විභාග්‍රහ කරම් දෙවිසි වෛතසිකයන් අතුරෙන් දෘෂ්ටිය පමණක් උඩරණයකොට අවශෙෂ එක්විස්ස ලැබෙන්නේයයි කියයුතුයි අසඞ්ඛාරික සතර විභාග්‍රහ කරම් දෙවිසි වෛතසිකයන් අතුරෙන් පින මිඹ දෙදෙන උඩරණයකොට අවශෙෂ විසිවෛතසිකය ලැබෙන්නේයයිද, සසඞ්ඛාරික සතර විභාග්‍රහ කරම් ඒ පින මිඹ දෙදෙන ප්‍රක්ෂෙප දෙවිස්සම ලැබෙන්නේයයිද කියයුත්තේයි. මේ ලොභ මූලික චිත්තයෙහි සොම්නස හා උපෙක්ඛාවවෙන්කොට ප්‍රශ්නකිරීම ප්‍රීතිය හෙතුකොටගෙණ කරන්නේවෙයි. සම්ප්‍රයුක්ත විප්‍රයුක්ත භෙදයවෙන්කොට ප්‍රශ්නකිරීම දිට්ඨිමාන දෙදෙන හෙතුකොටගෙණවන්නේයයි අසඞ්ඛාරික සසඞ්ඛාරික දෙක වෙන්කොට ප්‍රශ්නකිරීම පින මිඹ දෙදෙන හෙතුකොට ගෙණවන්නේයි. දිට්ඨිසම්ප්‍රයුක්ත චිත්තයෙහි මානය හා මාන

සම්ප්‍රයුක්ත චිත්තයෙහි දෘෂ්ටියද කුමක්හෙයින් නොයෙදෙන්නේද යත්? තරුණවූ කෙසර සිංහ රාජයෝ දෙදෙනෙක් ඔවුනොවුන්ට සටන්නොවනහෙයින්ද එසැසමාන බලසම්පන්නහෙයින්ද එකම ගල්ගුහාවෙහි කිසිකලක නොවසන්මැයි. එපරිදින් මේ දෘෂ්ටිමාන දෙදෙන එකසමාන බලතැතිහෙයින් එක චිත්තයෙක්හි නොයෙදෙත්ගි දනයුතුයි. වෙෂ මූලික දෙසි තෙහි යෙදෙන්නාවූ චෛතසිකයන් කෙතෙක්දැයි ප්‍රශ්නකෙළේ විනම් දෙලොස් අකුශලයන්ට සාධාරණවූ සත්විසි චෛතසික යන් අතුරෙන් "ප්‍රීති ලොභදිඨිමාන විචිකිච්ඡා" යන චෛතසිකයන් පස්දෙන උඩරණයකොට අවශෙෂ දෙවිසි චෛතසිකයෝ ලැබෙන්නාහුයයි විසඳියයුත්තේයි. ඒ දෙවිසිචෛතසික යෝද සාමාන්‍යයෙන් වෙෂ මූලික දෙසිතෙහිම යෙදෙන්නාහු යයි දනයුතුයි. වෙෂ මූලික අසඞ්ඛාරික චිත්තයෙහි කෙතෙක් චෛතසිකයෝ යෙදෙන්නාහුදැයි ප්‍රශ්නකෙළේවිනම් පින මිඹ දෙදෙන උඩරණයකොට අවශෙෂ විසිඑකචෛතසිකයෝ අසඞ්ඛා රික චිත්තයෙහිද, වෙෂ මූලික සසඞ්ඛාරික චිත්තයෙහිම පින මිඹදෙදෙන එක්කොට දෙවිස්සමයයි කියයුතුයි. මේ වෙෂ මූලික චිත්තයෙහි අසඞ්ඛාරිකදැයි යන ප්‍රශ්නය පින මිඹදෙදෙන හෙතුකොටගෙණමවන්නේයි. මොහ මූලික දෙසිතෙහි යෙදෙන් නාවූ චෛතසිකයෝ කෙතෙක්දැයි ප්‍රශ්නකෙළේවිනම් යවකි සත්විසි චෛතසිකයන් අතුරෙන් "ඡන්ද පිති ලොභ දිඨිමාන දෙස ඉස්සාමච්ඡරිය කුකුකුච්ච පින මිඹ" යන එකොළොස් චෛතසිකයන් උඩරණයකොට අවශෙෂවූ සොළොස් චෛත සිකයෝ ලැබෙන්නාහුයයි කියයුතුයි. ඒ දෙසිත අතුරෙන් විචි කිච්ඡා චිත්තය වෙන්කොට ප්‍රශ්නකෙළේවිනම් සොළොස් චෛතසිකයන් අතුරෙන් අධිමොක්ෂය උඩරණයකොට අව ශෙෂ පසළොස් චෛතසිකයෝ ලැබෙන්නාහුයයි කියයුතුයි. උඛවසහගත චිත්තය ප්‍රශ්නකෙළේවිනම් ඒ සොළොස් චෛත සිකයන් අතුරෙන් විචිකිච්ඡාව උඩරණයකොට අවශෙෂ පස ළොස් චෛතසිකයෝ යෙදෙන්නාහුයයි කියයුතුයි. විචිකිච්ඡාව හා උඛවයද යෙදීමෙන් පසළොස් සඛ්‍යාව සමානවේමැයි. සඛ්‍යය අසමානවේමැයි. විචිකිච්ඡා චෛතසික නෙමේ විචි කිච්ඡා සහගත චිත්තයෙහිම යෙදෙයි. අධිමොක්ෂය යෙදෙන් නාවූ චිත්තයෙහි විචිකිච්ඡාව නොයෙදෙන්නේමැයි. අධිමොක්ෂ චෛතසික නෙමේ උඛවව සහගත චිත්තයෙහි යෙදෙන්නේ වෙයි. විචිකිච්ඡා සහගත චිත්තයෙහි නොයෙදෙයි. එහෙයින් [illegible] සමානනොවන්නේයයි දනයුතුයි. මේ දෙසිත එක්

කොට විචාලේනම් විචිකිච්ඡා චිත්තයෙහි යෙදෙන්නාවූ විචිකිච්ඡාවද උඛවව සහගත චිත්තයෙහි යෙදෙන්නාවූ අධිමොක්ඛයද ලැබෙන නියාවෙන්සොළොස් චෛතසිකයයි විසඳියයුත්තේසි. ලොභ මූලික චිත්තය, ශුඛ දෙස මූල්ක චිත්තය, ශුඛ මොහ මූලික චිත්තය යන තුන් ප්‍රකාරවූ අකුශල චිත්තය මෙසේ දතයුතුයි. ලොභ මූලික චිත්තය හා දෙස මූලික චිත්තයද යන මේ දශප්‍රකාරවූ චිත්තයෙහි කෙතෙක් චෛතසිකයෝ යෙදෙන්නාහුදැයි ප්‍රශ්නකෙළේවිනම් සත්විසි චෛතසිකයන් අතුරෙන් විචිකිච්ඡා චෛතසික මාත්‍රයක් උඛරණයකොට අවශෙෂවූ සවිසි චෛතසිකය ලැබෙන්නේයයි විසඳියයුතු. ලොභ මූලික මොහමූලික දසචිත්තය එක්ෂණකොට කෙතෙක් චෛතසිකයෝ යෙදෙන්නාහුදැයි ප්‍රශ්නකෙළේවිනම් "දෙස ඉස්සා මච්ඡරිය කුකුච්ච" යන චෛතසිකයෝ සතරදෙන උඛරණය කොට අවශෙෂවූ තෙවිසි චෛතසිකය ලැබෙන්නේයයි විසඳියයුතුයි. චෙෂ මූලික මොහ මූලික සතර චිත්තය එක්කොටගත් කල්හී කෙතෙක් චෛතසිකයෝ ලැබෙන්නාහුදැයි ප්‍රශ්නකෙළේවිනම් "පිති ලොභ දිඨිමාන" යන සතර චෛතසිකය උඛරණයකොට සෙසු තෙවිසි චෛතසිකය ලැබෙන්නේයයි විසඳියයුතුයි. දෙළොස් අකුශල චිත්තයම පිඩුකොටගෙණ ඔවුන් අතුරෙහි සොම්නස් සතර චිත්තයෙහි කෙතෙක් චෛතසික යෙදෙන්නාහුදැයි ප්‍රශ්නකෙළේවිනම් "දෙස ඉස්සාමච්ඡරිය කුකුච්ච විචිකිච්ඡා" යන පස උඛරණයකොට අවශෙෂ දෙවිසි චෛතසිකය ලැබෙන්නේයයි විසඳියයුතුයි. ඒ දෙළොස් චිත්තයන් අතුරෙහි උපෙක්ඛා සහගත සඝාකාර චිත්තයෙහි කෙතෙක් චෛතසිකයෝ ලැබෙන්නාහුදැයි ප්‍රශ්නකෙළේවිනම් සත්විසි චෛතසිකයන් අතුරෙන් "පිති දෙස ඉස්සාමච්ඡරිය කුකුච්ච" යන පස උඛරණයහොට අවශෙෂ දෙවිස්ස ලැබෙන්නේයයි විසඳියයුත්තේසි. දෙළොස් චිත්තයන් අතුරෙන් දෘෂ්ටි සම්ප්‍රයුක්ත සතරෙහි කෙතෙක් චෛතසිකයෝලැබෙන්නාහුදැයි ප්‍රශ්න කෙළේවිනම් එකම මාන චෛතසිකය උඛරණයකොට අවශෙෂ සවිස්ස ලැබෙන්නේයයි විසඳියයුතුයි. දෙළොස් චිත්තයන් අතුරෙන් අසඞ්ඛාරික පවකයෙක් කෙතෙක් චෛතසිකයෝ ලැබෙන්නාහුදැයි ප්‍රශ්නකෙළේවිනම් සත්විසි චෛතසිකයන් අතුරෙන් පින මිඬ විචිකිච්ඡා තුන්දෙන උඛරණයකොට අවශෙෂ සුවිස්ස ලැබෙන්නේයයි විසඳියයුතුයි. සසඞ්ඛාරික පවකයෙහි කෙතෙක් චෛතසිකයෝ ලැබෙන්නාහුදැයි ප්‍රශ්නකෙළේවිනම් විචිකිච්ඡා චෛතසික මාත්‍රයක් උඛරණයකොට සෙසු සවිස්ස

ලැබෙන්නේයයි විසඳියයුතුයි. දෙලොස් අකුශල්ය, අටලොස් අහෙතුකය, යන සමතිස් චිත්තය එක්කොටගත්කල්හී ඒසමති සෙහි කෙතෙක් චෛතසිකයෝ ලැබෙන්නාහුදැයි ප්‍රශ්නකෙළේ චිතම් අහෙතුක චිත්තයෙහි ලැබෙන්නාවූ චෛතසිකයෝ අකුශල චිත්තයෙහිද ලැබියයුතුහෙයින් අකුශල චිත්තයට අනුව විසඳියයුතුයි. ලොභ මූලික චිත්තයන් අටදෙන හා අටලොස් අහෙතුක චිත්තය එක්කොටගත්කල්හී කෙතෙක් චෛතසිකයෝ ලැබෙන්නාහුදැයි ප්‍රශ්නකෙළේවිනම් ලොභ මූලික චිත්තයෙහිමෙන් දෙවිසි චෛතසිකයෙකැයි විසඳියයුතුයි. චෙෂ මූලික චිත්තය හා අටලොස් අහෙතුක චිත්තය එක්කොටගත්කල්හී කෙතෙක් චෛතසිකයෝ ලැබෙන්නාහුදැයි ප්‍රශ්නකෙළේවිනම් චෙෂ මූලික චිත්තයෙහි යෙදෙන්නාවූ දෙවිස්ස අතුරෙහි සුඛසන්තීරණ හසිතුපපාද චිත්තයෙහි යෙදියයුතුවූ ප්‍රීතිය උඩරණයකොට දෙවිසි චෛතසිකයෙකැයි විසඳියයුතුයි. මොහ මූලික දෙසිත හා අටලොස් අහෙතුක චිත්තයන් එක්කොටගත්කල්හී කෙතෙක් චෛතසික ධර්මයෝ ලැබෙන්නාහුදැයි ප්‍රශ්නකෙළේවිනම් මොහ මූලික චිත්තයෙහි යෙදෙන්නාවූ සොලොස් චෛතසිකයන් අතුරෙහි ප්‍රීතිය උඩරණයකොට පසලොසෙකැයි විසඳිය යුත්තේයි.

මේ අකුශල අහෙතුක චිත්තයෙහි සම්ප්‍රයොග ක්‍රමයයි.

දෙලොස් අකුශල චිත්තයන්ගේ උත්පත්තික්‍රමයකෙසේ යත්? "ඨදඟ නත්ථිකාමෙසු ආදී නවොත්‍යාදිනා" යනාදින් ටීකා යෙහි ආබැවින් යම්කලෙක්හි පස්කම්සැප විඳීමෙහි දෙසක් නැත්තේය යන මිච්ඡාදිඨියෙන් යුක්තව නොහොත් "නත්ථිසු කට දුක්කටානං කම්මානං ඵලං විපාකො" යන නියත මිත්‍යා දෘෂ්ටියෙන් පෙරලුනාවූ සිත් ඇතිව අනුන් විසින් නොමෙහෙ යන ලදුව පුථුජ්ජනත්ය විසින් පසුවහටගන්නාවූ චිත්තයට මෙහෙ යුමක් නොලැබ තමාගේ සවභාව නිස්සණවූ කල්පනාවෙන් යුක්තව කාමසමපත්තීන්ගේ සම්පූණීත්ය හෙතුකොටගෙණ සොම්නසින් යුක්තව රූප සද්ද ගන්ධ රස ඵොට්ඨබ්බ සඞ්ඛ්‍යා තවූ පස්කම් සැප අනුභවකිරීමක් හෝ මඞ්ගල සූත්‍රයෙහි වදු ළාවූ අටතිස් මඞ්ගලත්‍යයන්ගෙන් අන්‍යවූ උදැසන යහපත් රූපාලම්බනයක් දැකීම යහපත් මඞ්ගල්‍යයෙකැ, අයහපත්වූ

රූපාලම්බනයක් දැකීම අවර්ජනලක්ෂණයෙකැ, ගමන් කිමන් යාම් ආදි යෙහි කිරිදෙනුන් ආදී යහපත් අරමුණු ඉදිරියට සමහරිම මඛලක්ෂණයෙක, මළමිනි ආදී අයහපත් අරමුණු සමහරිම අව මඛලක්ෂණයෙකැයි, යනාදී දිසිමඛලක්ෂණයක් හෝ එසේම උදැ සන්හි යහපත් ශබ්ද ඇසිම මඛලක්ෂණයෙක, අයහපත් ශබ්ද ඇසිම අවර්ජනලක්ෂණයෙකැයි "යනාදී සුතමඛලක්ෂණයක් හෝ, උදැ සත යහපත් සුවඳ මලක් හෝ සුවඳ වගීයක් හෝ සිඹිමය, යහපත් අභිනව වස්ත්‍රයක් පැළඳීම කිරි හිතෙල් ආදිය අනුභව කිරිම, යහපත් මඛලක්ෂණයෙකැයි යනාදී ඝ්‍රාණ මඛලක්ෂණයක් හෝ අථර්ණවෙදයෙහි ආ නයින් අසවල් වාහනයෙන් යමිසි සිතා යාම් ආදිවූ විඤ්ඤාණ මඛලයක් හෝ එපරිද්දෙන් කම් විපාක යෙන් කොරව යහපත් නක්ෂත්‍ර මුහුතීාදිය යහපත් ශ්‍රාවණදාදිය හෙතුකොටගෙණ මේ මේ සුභ ඵලවෙයි යනාදීන් ගැණීමද, වෙදයෙහි ආ නයින් බලි බිලි ග්‍රහහෝම ග්‍රහශාන්ති ආදියෙන් මෙබඳු මෙබඳු යහපත් විපාක ලැබෙත් යනාදී දෘෂ්ටිගැණීමද, යනමේ ආදී කාලයෙහි සොමනස්ස සහගත දිසිගත සම්ප්‍රයුක්ත පළමුවන අසංඛාරික චිත්තය උපදනේයි. ඒ චිත්තය උපදනා කල්හිද ජවන් සතකින් ශ්‍රේෂ්ඨවූ ජවන් විපිහැක්ම උපදනේයි. ඒ ජවන විපි අතුරෙන්ද අර්හත්ඵලය නොවන්නාවූ ජවන විපිහු කම්වාසයෙන්ද, අර්හ ඵලයවූ ජවන විපිහු කම්පථවාසයෙන්ද, වෙන්වෙන්කොට සැළකියයුතුයි. අර්හ ඵලය නොවන්නාවූ ජවනයන් විසින් පිරිවරාගන්නාලද අර්හ ඵල ජවන විපි යෙහි ප්‍රථම ජවන චෙතනා සංඛ්‍යාතවූ කම්ය ඉහාතම්යෙහි ප්‍රවෘත්තී විපාක මාත්‍රයක්දෙන්නේයි. සත්වන ජවන සහගතවූ කම්ය අනතුරු අත්බැව්හි පටිසන්ධි ප්‍රවෘත්ති විපාක දෙකම දෙන්නේයි. මඛ්‍යයෙහි ජවන පවකය පිළිබඳවූ කම්යෝ පස් දෙන සංසාරයෙහි අවකාශ ලැබුනාවූ භවයෙක්හි පටිසන්ධි ප්‍රවෘත්ති විපාකවාසම හෝ ප්‍රවෘත්ති විපාක මාත්‍රයක් හෝදෙන් නේයයි දතයුතුයි. මේ පළමුවන අකුශල චිත්තයවකි ක්‍රමය උඩවව සම්ප්‍රයුක්ත චිත්තය හැර අවශෙෂවූ දශප්‍රකාර අකුශල චිත්තයන්ට හා කාමාවචර කුසල් අවවද යොදාගතයුතුයි. "යදා පන මනෙඤ්ඤ සම්භාරාභිතෙන චිතෙතන තදුභතියං" ඔනු ටීකා යෙහි ආ බැවින් පවකාම සම්පත් අනුභවකිරීමෙහි දෙසක් නැත්තේය යන විපරීත මිථ්‍යාදෘෂ්ටිය කරණකොටගෙණ අනුන් විසින් හෝ පූජා චිත්තයකින් හෝ මෙහෙයුමක් ඇතුවම පවකාම සම්පත්තීන්ගේ සම්පූර්ණත්වය හෙතුකොටගෙණ සොම් නසින් යුක්තව පස්කම් සැප විඳිත්නේනෝවේද ඔවැනි දිට්ඨ

මඩ්ඛලාදිය සාරවිහයෙන් හෝ ගණ්ඩ, එකල්හි දෙවෙනි සසඞ්ඛා රිකවූ අකුශල චිත්තය යටකී පරිද්දෙන් උපදනේහි. "යදපන මිච්ඡා දිඨිං අපුරක්ඛිත්වා" යනාදිය ටීකායෙහි ආ බැවින් යම් කලෙක්හි පවකාම සම්පත් අනුභවකිරීම් ආදිය සඳෙස්සයි දැන දැනම අනුන්ගෙන් හෝ පූජී චිත්තයකින් හෝ මෙහෙයුම් රහිතව තමාගේ සවභාව නිකෂණවූ කල්පනාවෙන්ම කාමසම්පත්තාදීන්ගේ සම්පූණීභය හෙතුකොටගෙණ මෙවුන සෙවනයකෙරේද, අනුන්ගේ සම්පත් ආදියට ලොභ උපදවාද, අනුන්ගේ සම්පත්තිය පැහැරගන්නේවේද, එකල්හී සොම්නස් සහගත දිඨිගත විප්‍රයුක්ත තුන්වෙනි අකුශල චිත්ත විථිය උපදනේහි. "යදපන මඤ්ඤන සම්මසාභිතෙන" යනාදියකි බැවින් යම්කලෙක්හී පස්කම් සැප අනුභවකිරීම් ආදිය සඳෙස්සයි දැන දැනම අනුන් විසින් හෝ පූජී චිත්තයකින් හෝ මෙහෙයුම් ඇතුව පවකාම සම්පත්තාදීන්ගේ සම්පූණීභය හෙතුකොට ගෙණ සොම්නසින් යුක්තව මෙවුම්දම්සෙවීමද, අන් සැපත් අභිඛ්‍යානෙරේද, අන් සැපත් පැහැරගණීද, එකල්හී සොම්නස් සහගත දිඨිවිප්‍රයුක්ත සතරවන අකුශල චිත්තය උපදනේහි. "යදපන කාමානං අසම්පත්තිං ආගමම" යනාදිය ආ බැවින් යම්කලෙක්හි පවකාම සම්පත් අනුභවකිරීම් ආදියෙහි දෙසක් නැතැයි යන මිථ්‍යාදෘෂ්ටිය කරණකොටගෙණ අනුන්ගෙන් හෝ පූජී චිත්තයකින් හෝ මෙහෙයුම් නොලැබ පවකාම සම්පත්තාදීන්ගේ අපරිපූණීභය හෙතුකොට ගෙණ මඛ්‍යසථකල්පනාවෙන් යුක්තව පස්කම් සැපවිඳින්නේහෝවේද, මූලචිත්තයෙහිකී දිඨමඛ්ඛලාදිය හෝ සාරවිහයෙන්ගණීද එකල්හී පස්වෙනි අකුශල චිත්තය උපදනේහි. එසේම මඛ්‍යසථකල්පනාවෙන් යුක්තව අනුන්ගේ හෝ පූජී චිත්තයකින් හෝ මෙහෙයුම් ලැබ යටකී නයින් මිථ්‍යාදෘෂ්ටියෙන් යුක්තව පස්කම් සැප හෝ විඳීද දිඨමඛ්ඛලාදිය හෝ සාරවිහයෙන්ගණීද, එකල්හි සවෙනි සසඞ්ඛාරික අකුශල චිත්තය උපදනේහි. යම්කලෙක්හි පවකාම සම්පත් අනුභවකිරීම සාවද්‍යයයි දැන දැනම අනුන්ගෙන් හෝ තමාගේ පූජී චිත්තයකින් හෝ මෙහෙයුම් නොලැබ පවකාමසම්පත්තාදීන්ගේ අසම්පූණීභය හෙතුකොටගෙණ මධ්‍යසථ කල්පනාවෙන් යුක්තව මෙවුනසෙවනය හෝ කෙරේද අනුන්ගේ සම්පත්තියට ලෝභ හෝ කෙරේද, අනුන් සන්තක වසතුව පැහැරගැණීම් හෝ කෙරේද, එකල්හි සත්වෙනි අකුශල චිත්තය උපදනේහි. යම් කලෙක්හි එම අකුශල කම්යෝ අනුන්ගේ මෙහෙයුමෙන් හෝ තමාගේ පූජීචිත්තයකින් ලැබූ මෙහෙයුම්

කින් හෝ කරන්නේවීනම් එකල්හි දිඝිහත විප්‍රයුක්ත අට වෙනි සසඞ්ඛාරිකවූ අකුශල චිත්තය උපදනේය. මේ ලොභ මූලික චිත්තය තෙමේ සෝමනස් සහගත සතරය, උපෙක්ෂාසහගත සතරයයි අවවැදෑරුම්වන්නේ නමුදු ගුණිත සඞ්ඛ්‍යාවෙන් වැඩිහළකල්හි අනෙක ප්‍රකාරවන්නේයි. ගුණිත සඞ්ඛ්‍යාවෝනම් අදින්නාදානය කාමේසුමිච්ඡාචාරය, මුසාවාදය පිසුනවචනය සඵප්පලාපය, අභිජ්ඣාය මිච්ඡාදිඨිය යනමේ අකුශල කර්මපථ සතින් ලොභ මූලික සිත් අට ගුණිතකළකල්හි සඵණස් සිත් තෙනෙක් වෙත්. ඒසඵණස් චිත්තය අතීතානාගත වර්තමාන යන කාලත්‍රයෙන් ගුණිතකළකල්හි එක්සියඅටසැට අකුශල චිත්තයක් ලැබෙන්නේයි. ඒ එක්සිය අටසැට චිත්තය රූප සද්ද ගන්ධ රස ඵොට්ඨබ්බ ධම්ම යන සාරමුණෙන් ගුණිතකළකල්හි එක්දහස් අටක්වෙයි. ඒ එක්දහස් අටක් චිත්තය අඛ්‍යාතමසන්තානය බහිද්ධාසන්තානය යනදෙකින් ගුණිතකළකල්හි සොළසක් අධිකවූ දෙදහසක් චිත්තයෝවෙති. ඒ දෙදහස් සොළසක් ප්‍රභෙදවූ ලොභ මූලික චිත්තය නගර ජනපදාදියෙහි වාසීන්ගේවශයෙන් ගුණිතකළකල්හි අනන්තාප්‍රමාණවන්නේයි.

ලොභ මූලික අකුශල චිත්තයන්ගේ විශෙෂ විභාගයයි,

"චිත්තං පනනෙසං චිත්තානං පාණාතිපාතාදිසු තිකඛමන්දපවත්තිභාවෙ උපපත්ති වෙදිතබ්බා" යනාදිය ටීකායෙහි ආ බැවින් අනිෂ්ට අරමුණක් දක්නාවූකල්හි අනුන්ගේ මෙහෙයීමක් හෝ පූර්වභාග චිත්තයකින් මෙහෙයුමක් හෝ නොලැබ තමාගේ තීක්ෂණ චිත්තයෙන්ම පාණාතිපාතාදීවූ දුශ්චරිතයන් කරන්නාවූකල්හි නොහොත් නපුරු වචන කියනකල්හි නපුරු අදහස් උපදවනකල්හි දෞර්මනස්ස සහගත පටිඝසම්පයුත්ත අසඞ්ඛාරික පළමුවන චිත්තය උපදී. එපරිදිදෙන්ම අනුන්ගේ මෙහෙයුමක් ඇතුව හෝ තමාගේ පූර්වභාග චිත්තයකින් රැකුල් ලැබීමෙන් හෝ දෞර්මනස්ස සහගත පටිඝසම්පයුත්ත අකුශල චිත්තය උපදී. "යංකිඤ්චි අනිට්ඨාරම්මණං නවවිධ ආඝාතවත්ථුනිව දෞර්මනස්සසහකාරණං පටිඝසහකාරණඤ්චානිදඤ්ඤබ්බං" යනු ටීකා වචන බැඳින් මේ දෞර්මනස් වෙදනා පටිඝසඞ්ඛ්‍යාතවූ දෙවැදෑරුම් ධර්මයන්ගේ ඉපදීමට හෙතුව නොකැමති අරමුණක්ලැබීම හා නවවිධ ආඝාත වස්තුවයි. මේ දෞර්මනස් පටිඝ දෙදෙනාගේ

ඉපදීම එකම හෙතුවකින් වන්නේනම් දෙම්නස හෝ පරිභව දුක්විමෙන් අභිමතාර්ථය ලැබෙන්නේ නොවේද, කුමක්හෙයින් දෙම්නස ලැබෙන්නේයයි කීසේක්ද යත්? සෙසු චිත්තයන්ගේ වේදනා භෙදය පළමුකොට දැක්වූහෙයින් මේ චිත්තයන් දෙදෙනාගේ වේදනා භෙදය දැක්වීමට එකාන්ත සහචාරිත්වය දැක්වීම පිණිසද දෙම්නසස පරිභවදෙකින්ම වෙසෙසා දක්වනලද්දේයයි දතයුත්තේයි. ඒ දෙස මූලික චිත්තය වනාහි විප්‍රකාරවන්නේ නමුදු ගුණිත සඛ්‍යාවෙන්ඟත්කල්හී අනෙක ප්‍රකාරවන්නේය. ඒ කෙසේ යත්? පාණාතිපාත ඵරුසාවාච ව්‍යාපාද යන කර්ම පථ තුන හා අදින්නාදාන මුසාවාද පිසුණාවාච සම්ඵප්පලාප යන සතර කර්ම පථයෙහිදැයි යන සප්තාකුශල කර්ම පථයෙහි පවත්නාහෙයින් මේ දෙසින තුදුස් ප්‍රකාරවන්නේයි. ඒ තුදුස් ප්‍රකාර වෙෂ මූලික චිත්තය කාලත්‍රයෙන් ගිණුකල්හී දෙසාළිස් චිත්තකෙනෙක්වෙත්. ඒ දෙසාළිස් චිත්තයෝ තුමූ සඳ්ඵලම්බණයෙන් ගුණිතකළකල්හී දෙසිය දෙපණසෙක්වෙත්. ඒ දෙසිය දෙපණස් චිත්තයෝ තුමූ අධ්‍යාත්මබහිඛා යන සන්තානවශයෙන් ගුණිතකළකල්හී පන්සිය සතරෙක්වෙති. ඒ පන්සිය සතරක් ප්‍රභෙද වෙෂ මූලික චිත්තයෝ නගර ජනපදදියෙහි වාසීන්ගේ වශයෙන් ගුණිතකළකල්හී අනන්තාපරිමාණවෙති. මේ වෙෂ මූලික චිත්තය වනාහි පාණාතිපාත ඵරුසාවාච ව්‍යාපාදයන කර්මපථත්‍රයෙහි අනිෂ්ටාලම්බණ ආඝාත වස්තු හෙතුකොට ගෙණ උපදනාහුවෙත්නම් කුකුළෙකු මරා මස් අනුභවකරණු කැමතිකල්හී ඒ කුකුලා අනිෂ්ටාලම්බණවන්නේ කෙසේද? නව විධ ආඝාත වස්තූන්ගෙන් කවර ආඝාත වස්තුවක් ඒ කුකුළා කෙරෙහි ලැබෙන්නේදැයි ප්‍රශ්නකටයුතුවෙයි. කුකුළාට මාංශ යෙහි ලොභ සහගත ප්‍රබල ප්‍රීතියක් උපන්කල්හී ඒ මාංශය ලබාගැණීම වලක්වන්නාවූ සතුරානම් ඔහුගේ ජීවිතෙන්ද්‍රියයයි. එහෙයින් ඔහුගේ ජීවිතෙන්ද්‍රියය අනිෂ්ටාලම්බණවෙයි. "අනත්ථං මෙ අවධි" යන ආඝාත වස්තුවෙහිත් දක්නාලැබෙයි. එහෙයින් මස් කන පිණිස සත්ව ඝාතනය කරන්නවුන්ට උපදනා ප්‍රතිසන්ධි ප්‍රත්‍යවේක්ෂා චිත්තය ලොභ පච්චය දෙස මූලික චිත්තයයි දතයුතුයි. අදින්නාදාන මුසාවාද පිසුනාවාච සම්ඵප්පලාප යන අකුශල කර්ම පථ සතර වෙෂ මූලික චිත්තයෙන් කෙසේ හටගන්නේද යත්? තමාගේ සතුරාගේ පිටු දක්වමිහයි සිතා ඔහුට අලාභ කරණ අදහසින් ඔහු සන්තක දේ පැහැරගැණීම වෙෂ මූලික චිත්තයෙන්වේ. එසේම සතුරාට විරුඬව අධිකරණ සභාවෙහි බොරු සාක්ෂිකීමද, සතුරා කෙරෙහි මිත්‍රයන් බිඳවන පිණිස

කේලාමිකම්ම‍ද, සතුරාට අලාභකරණ පිණිස හෝ නිහීනකරණ පිණිස සම්ඵප්‍රලාප බිණීම‍ද වෙම මූලික චිත්තයෙන් හටගන්නේය. මොහ මූලික දෙසිතෙහි වනාහි "ඡසු ආරම්මණේසු වේදනා වසෙන මජ්ඣත්තසභාවා පවත්තති කාලෙ උපපජ්ජති" යනාදිය අර්ථශාලිනී අර්ථකථාවෙහි ආ බැවින් යම්කලක මධ්‍යස්ථ කල්පනාවෙන් රූපාදී සාරමුණෙහි සැකය පවත්නේවේද එකල්හි උපෙක්ඛා සහගත විචිකිච්ඡා චිත්තය වන්නේයයි දතයුතුයි. "ඉදං චිත්තං ඡසු ආරම්මණේසු වේදනාදිවසෙන මජ්ඣත්තං භුත්වා උඛතං හොති" යනු අර්ථශාලිනී අටුවා බැවින් යම්කලෙක්හි මධ්‍යස්ථ කල්පනාවෙන් යුක්තව රූපාදී සාරමුණෙහි පිහිටියහැකිවූ වලලවූ සිත් ඇත්තේවේද එකල්හි උපෙක්ඛා සහගත උඛවව සම්ප්‍රයුක්ත චිත්තය උපදනේයයි දතයුතුයි. ඒ මොහ මූලික චිත්තය වනාහි විප්‍රකාරවූයේ තමුදු ගුණිත සංඛ්‍යාවන්ගේ වශයෙන් අනෙක ප්‍රකාරවන්නේයි. ඒ කෙසේ ගුණිත කරන්නේද යත්? දශඅකුශල කම් පථයන්ගේ වශයෙන් මොහ මූලික දෙසිත ගුණිතකල්හි විස්සෙක්වෙයි. ඒ විසිචිත්තය කාල ත්‍රයෙන් ගුණිතකළකල්හි සැටෙක්වෙයි. ඒ සැට ඡබ්භාගයෙන් ගුණිතකළකල්හි තුන්සිය සැටක්වෙයි. ඒතුන්සිය‍සැටක් චිත්තයෝ සන්තානවශයෙන් ගුණිතකළකල්හි සත්සිය විස්සෙක්වෙයි. ඒසත්සියවිසි චිත්තයෝ නගර ජනපදාදියෙහි වශ්‍යන්වුන්නේවශයෙන් අනන්තාප්‍රමාණවන්නේයි. මේ සත්සියවිසි චිත්තයන් අතුරෙන් තුන්සිය සැටක් චිත්තයෝ සතර අපායෙහි පටිසන්ධි ප්‍රවෘත්ති විපාක හා සුගතියෙහි ප්‍රවෘත්ති විපාක මාත්‍රයක්දන්නාහුවෙත්. අවශෙෂ තුන්සියසැට චිත්තයෝ තුළු පටිසන්ධි විපාකාදීමෙහි පොහොසත්වෙති. සුගති දුගති දෙකහිම අහෙතුක ප්‍රවෘත්ති විපාක මාත්‍රයක් දන්නාහුවෙත්. මේදෙලොස් අකුශල චිත්තයන් අතුරෙන් ලොභ මූලික සිත් අටවනාහි ලොභ මොහ සංඛ්‍යාතවූ හෙතුවයක් නොහොත් දෙමූලයක් ඇත්තේවෙයි. වෙම මූලික දෙසිතවනාහි දෙස මොහ සඛ්‍යාත හෙතුවයක් නොහොත් දෙමූලයක් ඇත්තේයි. මෝහ මූලික දෙසිත වනාහි මොහ සඛ්‍යාත එක මූලයක් නොහොත් හෙතුවක් ඇත්තේවේ. ලොභ මූලික සිත් උපදනාකල්හි ඒ පුද්ගලයාගේ මුඛාදී අවයවයෝ විලිකුන් නුග ඵලමෙන් රක්ත වණී ඇත්තේවෙයි. වෙම මූලික සිත් උපදනාහුගේ මුඛාදී අවයවයෝ විලිකුන් දඹ ඵලමෙන් අතිශයින් කාළවණී ඇත්තේයි. මොහ මූලික සිත් උපදිනාහුගේ මුඛාදී අවයවයෝ තලතෙලෙහි ඇත්තාවූ වණීයට බදු පැහැයක් ඇත්තේයි. මෙසේ ඒ ඒ සිත් උපදින අවස්ථාව මුඛ වණීදියාබලාදනයුත්තේයි.

මේ දෙලොස් අකුශලයන්ගේ සංක්ෂේප ලක්ෂණයයි.

අවලෝස් අහෙතුක චිත්තයන් අතුරෙන් අකුශල විපාකයෝ සත්දෙන එක එක අකුශලයෙහි විපාකවශයෙන් ලැබෙන්නේයි. ඒ කෙසේ ලැබෙන්නේද යත්? සොම්නස් සහගත දිසිසම්ප්‍රයුක්ත පළමුවන අකුශල චිත්තයෙන් යම් කෙනෙක් සිඳියක් වූයේනම් ඒ අකුශල චිත්තය සතර අපායෙහි පටිසන්ධි ප්‍රවෘත්ති විපාකවශයෙන්ද, සුගතියෙහි ප්‍රවෘත්ති විපාක වශයෙන්ද පවත්නේයි. ඒ කෙසේ පවත්නේද යත්? සපනාකුශල විපාකයන් අතුරෙන් උපෙක්ඛා සහගත අකුශල විපාක සන්තීරණ චිත්තය, යථොක්ත අකුශල චිත්තයාගේ නානාක්ඛණික කම්ප්‍රත්‍යය ලැබීමෙන් සතර අපායෙහි පටිසන්ධිවශයෙන් පවත්නේයි. ඉක්බිති ඒ අපායෙහි යම්පල්ලන් ගිනිදැල් ආදී අනිෂ්ටවූ රූපාලම්බණ දුටුකල්හි චක්ඛුවාරයෙහි චක්ඛු විඤ්ඤාණ විපාක වශයෙන් චක්ඛු විඤ්ඤාණ චිත්තයද ඊට අනතුරුව ඒ අරමුණු පිළිගැණීම්වශයෙන් අකුශල විපාක සම්පටිච්ඡන චිත්තයද, ඊට අනතුරුව ඒ අරමුණු තීරණයකරගැණීම් වශයෙන් පළමු පටිසන්ධිය දුන් සන්තීරණ චිත්තයම සන්තීරණ කෘත්‍යයවශයෙන්ද උපදී. එසේම යම්පල්ලන් විසින් කියන්නාවූ "තලව මරව" යනාදී නොයෙක් රළු පරුෂ වචන ඇසුකල්හි අකුශල විපාක සොත විඤ්ඤාණය හා අවශෙෂ චිත්තයෝද එසේම නිරිසතුන්ගේ හිස පැලී යනතරම් නපුරුවූ දුගීන්ධය ආඝ්‍රාණයකළකල්හි අකුශල විපාක ඝ්‍රාණ විඤ්ඤාණය හා සෙසු චිත්තයෝද, එසේම යම්පල්ලන් විසින් ඒ නරකයෙහි උපන් සත්වයා උඩුකුරුව හොඹා අයොමය අඩුවෙන් මුඛය විවෘතකොට ගිනිගෙණ දිලියෙන්නාවූ ලොකොදිය ලොහොගුලි ආදිය ගිල්වන්නාවූකල්හි අකුශල විපාකවූ ජිව්හා විඤ්ඤාණය හා සෙසු චිත්තයෝද, එසේම නරකයෙහි උපන් සත්වයා ගිනිගෙණ දැලියෙන්නාවූ අයොමය භූමියෙහි හොඹා සතරැස්කොට අටැස්කොට සොළසැස්කොට සසින්නාවූකල්හිද, ගිණිගෙණ දිලිහෙන්නාවූ අයොමය රථයෙහි හොඳ අඹාර පළිතයට කටුසැම්පියෙන් තලතලා නන්වන්නාවූකල්හි අකුශල විපාක දුක්ඛ සහගත කායවිඤ්ඤාණ චිත්තයහා අවශෙෂ චිත්තයෝද චක්ඛුවිඤ්ඤාණයට කියාගෙන් උපදනා හුය. මේ සපනාකුශල විපාක විඤ්ඤාණයන් අතුරෙන් චක්ඛුවිඤ්ඤාණය කුමක් නිශ්‍රයකොටගෙණ පවත්නේදයත්? ඇසඅහාරවූ චක්ඛු

ප්‍රසාදචක්ඛු යන මේ ප්‍රකාර චක්ඛූන් අතුරෙන් ප්‍රසාදචක්ඛුස නිශ්‍රයකොට්ඨාසෙණ පවත්නේයි. සසම්භාර චක්ඛුය යනු ලොකයා විසින් අක්ඛි ගොලයයි ව්‍යවහාරකරණු ලබන්නාවූ මාංස පිණ්ඩ යයි. ප්‍රසාදචක්ඛුය යනු යටගිය ජාතියෙහි රූප තණ්හාව කාරණාකොටගෙණ රැස්කළාවූ රූප දුන ඇඩ්ඛ්‍යාත කාමාවචර කුශල බලයෙන් මේ ශරීරයෙහි පහළවූ මහාභූතයන්ගේ ප්‍රසාද තෙලය ශ්වේත මණ්ඩලයෙන් වටකරණලද්දාවූ කාලමණ්ඩලය මධ්‍යයෙහි ඒ ඒ පිට පිහිටියාවූ ඇස් පටල සතෙහි කපුපුළුන් පටල සතක් තබා වත්කළාවූ තලතෙලක්මෙන් අක්ෂිපටල සතෙහි පැතිරපවත්නේයි. මනුෂ්‍යයාගේ චක්ඛුප්‍රසාද රූපය ගුලිකොටගත්කල්හි උකුණු හිසක් ප්‍රමාණවන්නේයි. ඒ චක්ඛු ප්‍රසාදයට අභිමුඛයෙහි යම් රූපාරම්මණක් වැටුනුකල්හි ඒප්‍රසාදය නිශ්‍රයකොටගෙණ හටගන්නාවූ චක්ඛුර්විඥාන චිත්තයෙන් ඒ රූපයදක්නේවෙයි. ඒචක්ඛු ප්‍රසාද රූපයෙහි සාමාන්‍යයෙන් ක්ෂුද්‍රාණුක රූපය හා චක්ඛුප්‍රසාද ජීවිතෙන්ද්‍රිය සඞ්ඛ්‍යාතවූ රූප දශයකින් යුක්තවූ මිටියක්ව පවත්නේයි. සොතවිඤ්ඤාණය කුමක් නිශ්‍රයකොටගෙණ පවත්නේද යත්? සසම්භාර ශ්‍රෝත බිලයාගේ අබ්භන්තරයෙහි තුනීවූ තඹවන් රොමයෙන් ගැවසී ගත්තාවූ ඇඟිලි මුදුවකට බදු සටහන් ඇත්තාවූ වසතුවෙහි පූර්ව ජාතියෙහි ශබ්ද තෘෂ්ණාව කාරණාකොටගෙණ දුන්නාවූ සද්ද දුනමය කුශලකර්මබලයෙන් මේ ශරීරයෙහි පහළවූ මහා භූත යන්ගේ ප්‍රසාද සංඛ්‍යාතවූ තෙල්ගතිය පැතිරපවත්නේයි. ඒ ප්‍රසාදය නිශ්‍රයකොටගෙණ හටගන්නාවූ ශ්‍රෝත විඥානයෙන් ශබ්දය දැනගණී. ඒ ශ්‍රෝත්‍රප්‍රසාදයෙහිද ක්ෂුද්‍රාණුක රූපය හා ශ්‍රෝත්‍රප්‍රසාදය ජීවිතෙන්ද්‍රියය යන රූප දශයකින් යුක්තවූ කලාපයක්ව පවත්නේයි. ඝ්‍රාණ විඥානය කුමක් ආශ්‍රයකොටගෙණ පවත්නේද යත්? සසම්භාර ඝ්‍රාණබිලය ඇතුලෙහි එළුකුරයකට බදු සටහන් ඇති ස්ථානයෙහි පූර්වජාතියෙහි ගන්ධතණ්හාව කාරණාකොටගෙණ දුන්නාවූ ගන්ධ දුනමය කුශල කර්මබලයෙන් මේ ශරීරයෙහි පහළවූ මහාභූතයන්ගේ ප්‍රසාද තෙල්ගතිය පැතිර පවත්නේයි. යම් සුගන්ධ දුර්ගන්ධයක් ඇටුණුකල්හි ඒ ඝ්‍රාණ ප්‍රසාදය නිශ්‍රයකොටගෙණ උපදනා ඝ්‍රාණවිඥාන චිත්තයෙන් ඒ අරමුණු දැනගනී. ක්ෂුද්‍රාණුක රූපය හා ඝ්‍රාණ ප්‍රසාදය ජීවිතෙන්ද්‍රිය යන රූප දශයකින් යුක්තවූ කලාපයක්ව පවත්නේයි. ජිව්හා විඥානයට කුමක් නිශ්‍රයස්ථානවන්නේද යත්? සසම්භාර ජිව්හා මධ්‍යයාගේ මුදුනෙහි උපුල්මල් පෙති අගක් බදුවූ සටහන් ඇති ස්ථානයෙහි යටගිය ජාතියෙහි රසතණ්හාව කාරණාකොට

ගෙණ දෙනලද්දවූ රසදූනයන්ගේ කුශල කම්බලයෙන් මේ ශරීරයෙහි පහළවූ මහාභූතයන්ගේ ප්‍රශාද සඞ්ඛ්‍යාතවූ තෙල් ගතිය පැතිරපවත්නේසි. යම් රසයක් එහි ගැටුනුකල්හි ඒ නිශ්‍රයකොටගෙණ උපදනා ජීවිතා විඤ්ඤාණයෙන් රසාරම්මණ හැඳින ගණී. ක්ෂුද්‍රාෂ්ටක රූපය හා ජීවිතෙන්ද්‍රියය යන දශයකින් යුක්තවූ කලාපයක්ව පවත්නේසි. කාය විඤ්ඤාණය කුමක් ආශ්‍රයකොටගෙණ පවත්නේද යත්? ව්‍යාම ප්‍රමාණවූ මේ සසම්භාර කාය සඞ්ඛ්‍යාතවූ ශරීරයෙහි කෙසාග්‍ර ලොමාග්‍ර නඛාග්‍ර ශුෂ්මා වශී ජරාග්නිය යන පස්තැන හැර අවශෙෂ සකල ශරීරයෙහි ඇතුළත්හිද පිටත්හිද යන සියලු තන්හි යට ගිය ජාතියෙහි පොළඹවා තණ්හාව කාරණාකොට ඇත්තාවූ සපරිදූනමය කුශල කම්බලයෙන් මේ ශරීරයෙහි පහළවූ මහාභූතයන්ගේ ප්‍රශාද සඞ්ඛ්‍යාතවූ තෙල්ගතිය පැතිර පවත්නේසි. යම් සපරිදූනයක් එහි ගැටුනුකල්හි ඒ සපරිදූන දූනගන්නා දුක්ඛ සහගත කායවිඤ්ඤාණ චිත්තය උපදී. ක්ෂුද්‍රාෂ්ටක රූපය කාය ප්‍රශාදය ජීවිතෙන්ද්‍රියය යන දශයකින් යුක්තවූ කලාපයක්ව පවත්නේසි. මේ පවප්‍රශාදයෙහි පවාළම්බණයන් ගැටුනුකල්හි පවවිඤ්ඤාණයන්ගේ ඉපදීමට උපමා කවර යත්? යම් බෙර යෙක්හි කඩිප්පුවෙන් පහර දුන්කල්හි එසින් නික්මෙන්නාවූ ශබ්දයමෙනි. ප්‍රශාද රූපය බෙර ඇසමෙන්ද, රූපාදී අරමුණු හැපීම කඩිප්පුවකින් පහරදීමක්මෙන්ද ඒ ප්‍රශාද ආළම්බණයන්ගේ ගැටීමෙන් හටගන්නාවූ පවවිඤ්ඤාණය බෙරයෙන් නික්මෙන්නාවූ ශබ්දයමෙන්ද දතයුතුයි නොඑහෙත් ගිනිගානා දඬු දෙකක් එකට ගැටීමෙන් හටගන්නාවූ ගින්නක්මෙනි. පව ප්‍රශාද පවාළම්බණයෝ උඩු යට ගිනිගානා දඬුදෙකක්මෙන්ද ප්‍රශාද ආළම්බණයන්ගේ නැවීම ගිනිගානා දඬුදෙක එකට ගැවීමක්මෙන්ද, ඒ ගැවීමෙන් හටගන්නාවූ ගින්නක්මෙන් පව විඤ්ඤාණයන්ගේ හටගැණීමද දතයුත්තේසි. තවද මේ පව ප්‍රශාද රූපයෝ පස්දෙන ශක්තිමත් ශරීරාවයව ඇත්තාවූ අඹ යන් පස්දෙනෙක්මෙන්ද, ඒ පවප්‍රශාදයන් නිසා පවත්නාවූ විඤ්ඤාණයෝ පස්දෙන ඇස් ඇත්තාවූ පිළුන් පස්දෙනෙකු මෙන්ද, දතයුත්තාහුය. ඇස් ඇත්තාවූ පිලු තෙමේ ශක්ති සම්පන්නවූ අඹයා පිටත්ගිකල්හි ඒ පිලිඳුගේ මාගීදෙශකත්වයෙන් අභිමත ස්ථානයට දෙදෙනාම පැමිණෙන්නාක්මෙන් අඹවූ පවප්‍රශාද රූපයන් ආශ්‍රයකොටගෙණ පවවිඤ්ඤාණයන්ගේ පැවැත්මවනහෙයින් අභිමත ස්ථානයට පැමිණීමක්මෙන් පවවිඤ්ඤාණයෝ අරමුණු හැඳිනගණිති.

මේ අන්ධ පංගුලන්‍යායයි.

පවවිඤ්ඤණයන් කරණකොටගෙණ ගන්නාලද්දාවූ රූප ශබ්ද ගන්ධ රස ඵොට්ඨබ්බ ඇත පවාළම්බණය පිළිගැණීම්වශයෙන් උපදනා විත්තය සම්පටිච්ඡන චිත්තනම්වෙයි. සම්පටිච්ඡන චිත්තය විසින් පිළිගන්නාලද අරමුණු තීරණයකරගැණීම් වශයෙන් උපදනා චිත්තය සන්තීරණ චිත්තනම්වෙයි. නොකැමැතිවූ රූපාදී අරමුණු පස හමුවූකල්හී අකුශල විපාකවූ චක්ඛුසොත ඝාණ ජිව්හා කාය විඤ්ඤණයෝද අකුසල විපාකවූ සම්පටිච්ඡන සන්තීරණ චිත්තයෝද උපදිත්. උඩවව සම්ප්‍රයුක්ත මොහ මූලික චිත්තය හැර අවශෙෂවූ එකොළොස් අකුශල චිත්තය විසින් සතර අපායෙහි පටිසන්ධිදෙන්නාවූකල්හී මේ අකුශල විපාක සන්තීරණ චිත්තය පටිසන්ධිවශයෙන්ද ඒ භවයෙහිවසන කාක්කල් භවාඞ්ගවශයෙන්ද ඒ භවයෙන් චුතවන්නාවූකල්හී චුතිවශයෙන්ද, එම සන්තීරණ චිත්තයම පවත්නේය. ප්‍රවෘත්ති කාලයෙහි දෙළොස් අකුශලයන්ගේම විපාකවශයෙන් සපනා කුශල විපාකයෝ සුදුසු පරිද්දෙන් උපදිත්. සපනකාම සවගී යෙහි ඒ අකුශල විපාකයෝ සත්දෙන අපරාපරීය වේදනීය අකුශල කම්බලයෙන් පවත්නේයි. අසංඥතලය හැර අවශෙෂවූ පසළොස් රූප භූමියෙහි අපරාපරිය වේදනීය අකුශල කර්මයන්ගේ වශයෙන් මිනිස්ලොව බලන්නාවූකල්හි හෝ මිනිස් ලොවට පැමිණීකල්හි හෝ අකුශල විපාක චක්ඛු විඤ්ඤණ සොතවිඤ්ඤණ සම්පටිච්ඡන සන්තීරණ විපාකයෝ සතරදෙන උපදිත්. යහපත්වූ ඉෂ්ටාළම්බණයන් වැටහුනුකල්හී කුශල විපාක චක්ඛුර් විඤ්ඤාදී විපාකයෝ අටදෙන උපදිත්. පවවාරාවජ්ජන චිත්තය යනු චක්ඛුරාදී පවවාරයෙහි ඉෂ්ටවූ හෝ අනිෂ්ටවූ හෝ රූපාදී අරමුණු ඇවුණුකල්හි ඒ අරමුණු ආවජ්ජනාකිරීම්වශයෙන් උපදනා චිත්තයයි. ක්‍රියා මනොධාතු චිත්තයයි. මනොවාරාවජ්ජනය යනු එකුන් විසිහවඞ්ග සඞ්ඛ්‍යාතවූ මනොවාරයෙහි දිඨසුත මුත විඤ්ඤාතවශයෙන් පවවාරයෙන්ගන්නාලද අරමුණු ආවජ්ජනාකරන්නාවූ මනොවිඤ්ඤාණ ධාතුචිත්තයයි. හසිතුපපාදචිත්තය යනු අනොළාරික අරමුණෙහි රහතුන්ට සිනා පහළකිරීම් වශයෙන් උපදනා චිත්තයයි.

අටළොස් අහෙතුක චිත්තයන්ගේ විභාගයනිම්.

එකුන් සැවක් ශොභන චිත්තයෙහි චෛතසිකයන්ගේ යෙදීම කෙසේ ඇත්? අන්‍ය සමාන තෙළෙස් චෛතසිකය ශොභන චෛතසිකයෝ පස්විසිදෙනය යනමේ අටතිස් චෛතසිකය ලැබෙන්නේයයි කියයුතුයි. ඒ ශොභන සිත් එක එකක් පාසා කෙතෙක් චෛතසිකයන් ලැබෙන්නේදැයි ප්‍රශ්නකෙළේවිනම් ඒ අටතිස් චෛතසිකය තබා එක එක චිත්තයෙහි නොයෙදෙන්නාවූ ධර්ම මේ මේයයි දැන සුදුසු පරිද්දෙන් විසඳියයුතුයි. මේ ශොභන චිත්තයෙහි යෙදියයුතුවූද නොයෙදියයුතුවූද චෛතසිකයන් සොයනු කැමතිකල්හි ප්‍රකීර්ණක චෛතසිකයන් අතුරෙන් විතර්ක විචාර ප්‍රීති යන තුන්දෙනය පස්විසි ශොභන චෛතසිකය යන අටවිසි චෛතසිකයන් අතුරෙන් විරති අප්‍රමාණ්‍ය ප්‍රඥෙන්ද්‍රිය යන සෝදනාය යනමේ චෛතසිකයන් අතුරෙන් කවර චෛතසිකයක් යෙදෙන්නේද නොයෙදෙන්නේදැයි සෙවියයුත්තේයි. අවශෙෂවූ ශොභන සාධාරණ චෛතසිකයන් විසිදෙනය අන්‍ය සමාන චෛතසිකවූ ඡන්දවිරිය අධිමොක්ෂය සබ්බචිත්ත සාධාරණ සත්දෙනය යනමේ එකුන්තිස් චෛතසිකයන් අතුරෙන් අසවල් චෛතසිකය යෙදෙන්නේද නොයෙදෙන්නේදැයි සැකයක් නැත්තේයි. කාමාවචර කුශල චිත්තයෙහි කෙතෙක් චෛතසික ධර්මයන් යෙදෙන්නේදැයි ප්‍රශ්නයක්වීනම් අටතිසයයි විසඳියයුතුයි. ඔහාවිපාක අටෙහි කෙතෙක් චෛතසික ධර්මයෝ යෙදෙන්නාහුදැයි ප්‍රශ්නයක්වීනම් කුශල චිත්තයෙහි යෙදෙන්නාවූ අටතිස අතුරෙන් විරතිත්‍රය අප්‍රමාණ්‍යවය යනමේ පස උඩරණයකොට අවශෙෂ චෛතසිකයෝ ලැබෙන්නාහුයයි කියයුතුයි. මහාක්‍රියා අටෙහි කෙතෙක් චෛතසිකයෝ ලැබෙන්නාහුදැයි ප්‍රශ්නකෙළේවිනම් ඒ අටතිස් චෛතසිකයන් අතුරෙන් විරතිත්‍රය පමණක් උඩරණකොට අවශෙෂ පන්තිසලැබෙන්නේයයි කියයුතුයි. මෙසේ කුශල විපාක ක්‍රියාවන් කෙරෙහි ලැබෙන්නාවූ චෛතස විරති අප්‍රමාණ්‍ය යන ධර්මයන් පස්දෙනාගෙන්ම වියයුතුබව සැලකියයුතුයි. සොම්නස් සහගත කාමාවචර කුශල චිත්තයෙහි කෙතෙක් චෛතසික ලැබෙන්නේදැයි ප්‍රශ්නකෙළේවිනම් අටතිසම නොඅඩුව ලැබෙන්නේයයි කියයුතුයි. උපෙකඛා සහගත සතර චිත්තයෙහි කෙතෙක් චෛතසිකයෝදැයි ප්‍රශ්නයක්වීනම් ඒ අටතිස අතුරෙන් ප්‍රීතිය පමණක් උඩරණයකොට අවශෙෂ සත්තිස ලැබෙන්නේයයි කියයුතුයි. ඤාණවිප්‍රයුක්ත සතරෙහි කෙතෙක් ලැබෙන්නේදැයි ප්‍රශ්නයක්වීනම් ප්‍රඥෙචෛතසිකය උඩරණයකොට අවශෙෂ සත්තිසයයි කියයුතුයි. සොම්නසයුත් ඝා උපෙක්ෂාවි

ප්‍රශ්නකිරීම ප්‍රීතිය හෙතුකොටගෙණවන්නේයි. සම්ප්‍රයුක්ත විප්‍රයුක්තවශයෙන් ප්‍රශ්නකිරීම ප්‍රඥාව හෙතුකොටගෙණවන්නේයි. මේ කුශලයෙහිද පඤ්ච ද්වාරයෙහි ක්‍රමයෙන් උඩරණයකොට නොලැබියයුතු චෛතසික තෙමේ මේයයි දැන විසතරකටයුතුයි. මහාවිපාක අටෙහි තෙතිස් චෛතසිකයන් ගෙන්ද, මහාක්‍රියා අටෙහි පන්තිස් චෛතසිකයන්ගෙන්ද පවන්ගෙණ නොලැබෙන්නාවූ චෛතසික මේ මේයයි නීය යුතුයි.

කාමාවචර ශොභනයන් අතුරෙහි පළමුවන මහාකුශල යෙහි ලක්ෂණ මෙසේයි. "යදු පන යො දෙය්‍ය ධම්ම පටිගාහාකාදි සම්පත්තිං" යනාදිය ටීකාවෙහි ආ බැවින් යම් කලෙක්හි දානවස්තු ප්‍රතිග්‍රාහකාදීන්ගේ සම්පත්තියක් දැක සතුටුවූ සිත් ඇතිව දන්දීම් පෙහෙවස් විසීම් ආදීවූ සුචරිත ක්‍රියාවන්කිරීමෙන් මෙතෙම මෙබඳු විපාක ඇත්තේයයි තමාගේ ප්‍රඥාව පෙරමුණෙහි යොදා පූර්ව චිත්තයකින් හෝ අනුන් විසින් හෝ මෙහෙයීමක් නොවී දන්දීම් සිල්රක්ෂාකිරීම් ආදිය තමාගේ සවභාව තීක්ෂණවූ සිතින්ම කරන්නේවේද එකල්හි සොමනස් සහගත ඤාණසම්ප්‍රයුක්ත පළමුවන අසංඛාරික චිත්තය උපදනේයි. යම් කලෙක්හි මූලචිත්තයෙහි කිසිසින් තුටු පහටුව දානාදී පින්කම්කිරීම මෙබඳු අනුසස් ඇතැයි යන සම්‍යක් දෘෂ්ටිය පෙරටුකොටගෙණ වස්තු හෘෂ්ණාදිය කාරණාකොට ගෙණ පසුබවවීමක් ඇතිකල්හි යම්කිසි කල්‍යාණ මිත්‍රාදීන් විසින් නොප වැන්නෙකු විසින් දන්නොදීම නොයෙදෙයි, යටගිය ජාතියෙහි දන්දීම හෙතුකොටගෙණ මේ ආත්මයෙහි තොපි ධනසම්පත් ලැබුවහුය. යම්හෙයකින් දන්දෙවයි යනාදීන් අනුන්ගේ මේහෙයුම්කින් හෝ අනුන් විසින් දෙන්නාවූ දන් දැක ඉබි විසිනුත් දන්දියයුතුයයි පූර්වභාගයෙහි උපදනා චිත්තයකින් මෙහෙයුම් ලැබ හෝ දානාදී පින්කම්කරන්නාහට දෙවෙනි සසඞ්ඛාරික කුශල චිත්තය උපදනේයි. යම්කලෙක්හි මාතාපිතෘන්ගේ දන්දීම් ආදිය දැක පුරුදුවූ ලදරුවෝ භික්ෂූන් දුටු මාත්‍රයකින් සතුටු සිත් ඇතිව අන තුබු යම්කිසි වස්තුවක් පුදන්නෝ හෝ වෙන්ද, මව්පියන් විසින් උගන්නා තුබූ පරිද්දෙන් දොහොත් මුදුන්දී වඳින්නෝ හෝවෙත්ද, එකල්හි සොමනස් සහගතඤාණසම්ප්‍රයුක්ත අසංඛාරික මහාකුශල චිත්තය උපදනේවෙයි. යම්කලෙක භික්ෂූන් දුටුකල්හි පුත! මේ දේ පුදව මෙසේ වඳුවයි යනාදී මව්පියන් විසින් මෙහෙයන ලදුව දන්දෙන්නේ හෝ වඳින්නේ හෝ වේද, එකල්හි දරුවන්ට සොමනස් සහගත ඤාණ

විප්‍රයුක්ත සසංස්කාරික චිත්තය උපදනේසි. යම් කලෙක දුනාදි වස්තූන්ගේ හෝ ද්‍රෂ්ටිග්‍රාහකාදීන්ගේ හෝ අසම්පූර්ණත්වය හෙතු කොටගෙණ උපෙක්ෂා වෙදනාවෙන් යුක්තව දුනාදිනිමිත්ත සංඛ්‍යාතවූ නුවණින් යුක්තව මෙරමිගෙන් හෝ පූර්වචිත්තය කින් හෝ මෙහෙයුම් නොලැබ බොහෝසෙයින් සංසාර පුරුද්ද හෙතුකොටගෙණ දුනාදී පින්කම් කෙරේද එකල්හී උපෙක්ෂා සහගත ඥානසම්ප්‍රයුක්ත අසංස්කාරික කුසල චිත්තය උපද නේසි. යම් කලෙක එම දන්දීම් ආදිය පූර්වචිත්තයකින් හෝ අනුන්ගෙන් හෝ මෙහෙයුම් ලැබකරන්නේවිනම් උපෙක්ෂා සහගත ඥාන සම්ප්‍රයුක්ත සසඛ්‍යාරික කුසල චිත්තය උපදනේසි. යම්කලෙක්හි දුන වස්තු ආදීන්ගේ අසම්පූර්ණත්වය හෙතුකොට ගෙණ මිවුපිය ආදීන්ගේ චරිතය දැස පුරුදුවූ ළදරුවෝ භික්ෂු සඞ්ඝයා දැක අත තුබූ යමක් දෙන්නෝ හෝ වෙත්ද බඹසැඟිලිව වදින්නෝ හෝ වෙත්ද එකල්හී සත්වෙනි මහාකුශලචිත්තය උප දනේසි. යම් කලෙක්හි එපරිද්දෙන්ම මිවුපිය ආදීන්ගේ මෙහෙ යුමකින් ඒදුන වස්තු ආදිය දෙන්නාවූකල්හී අටවෙනි මහා කුශල චිත්තය උපදනේසි. මේ කුශල චිත්තයන් අටදෙනා අතු රෙන් ඥාන විප්‍රයුක්ත සතර චිත්තයට බාලදරුණ උපමාව කුමක්හෙයින් දක්වනලද්දේද යත්? ඒ සතර චිත්තය බාල දරු වන්ට මුත් තරුණ මහලු අයට නූපදනේදැයි ප්‍රශ්නයක්තිබේ. ඥාන විප්‍රයුක්ත බව පෙන්වීමට උදාහරණ වශයෙන් දක්වූ පමණ මුත් තරුණ මහලු ආදී කවරෙක්වුවත් "අත්‍ථි දින්නං අත්‍ථි සිට්ඨං" යනාදීන් දශ වස්තුක සම්‍යක් දෘෂ්ටිය ඉපදවීමට සුදුසුවූ නුවණ නැත්තේ නම් එබදු සියල්ලෝම ළදරුවන්ට බඳු උපමා ඇතිවෙත්. එහෙයින් ළදරුවෝ හෝ තරුණයෝ හෝ මහල් ලෝහෝ දුනාදී කුශල ධර්මයන්ගේ අනුසස් නොදුන නොස ලකා කුසල්කරන්නෝවිනම් ඔවුන්ට ඥානවිප්‍රයුක්ත මහාකුශල චිත්තය උපදනේසි. මේ අටමහා කුශලයන් අතුරෙන් පළමු වන මහාකුශල චිත්තය ඉපදීමට උපමාවක් නම් යම්කිසි මනුෂ්‍ය යෙක් විසින් දනක් දෙමිසි සිතා දුන වස්තු සැපයීම් ප්‍රතිග්‍රාහක යන් සෙවීම් ආදී සියලු ක්‍රියාවෙහි ජවන් සතකින් යුක්තවූ අනන්තා පරිමාණවූ ජවන විථි උපදනාහුවෙත්. ඒ දුනය යම් දවසක සිතූ පරිද්දෙන් ප්‍රතිග්‍රාහකයාගේ හස්තයෙහි පිහිටුවංද ඒ දුන වස්තුව ඔසවාදීම සඞ්ඛ්‍යාතවූ කායවිඤ්ඤත්තිය ඉපදවීමට හෙතුභූතවූ අවි සාධක ජවන විථියම දුනමය කුශල කර්මපථයයි කියත්. ඒදුනය දුන්නායින් පසු මා විසින් මෙබඳු දුනයක් දෙන ලද්දේයයි සිහිකරන්නේවේද ඒ සිහිකිරීම්නාවූකල්හි උපදනා

කාමාවචර කුසලකම් වීථිහුද අනන්තාපරිමාණවෙත්. පූර්වභාග පශ්චාත්භාගයෙහි උපදනා අනන්තා පරිමාණවූ කාමාවචරකුශල කම් වීථිහු අර්ථ සාධක ජවන වීථියට පිරිවරව උපසම්පාදකවන් නාහුය, ඒ අනන්තාපරිමාණ පූර්වපශ්චාද්භාගයෙහි උපදනා කාමාවචර කුශල කර්මයන්ගෙන් උපසම්පාද ලබනලද්දාවූ අර්ථ සාධක ජවන වීථියගේ ප්‍රථම ජවන සහගතවූ චෙතනාවක්‍ෂේත්‍ර අධ්‍යාශය සම්පත්තීන්ගෙන් යුක්තවීනම් ධනජය මෙණ්ඩකාදී සිටුවරුන්ටමෙන් ඉහාත්මයෙහි සිටුයේසත් ආදී ප්‍රවෘත්ති විපාක දෙන්නේසි. සත්වන ජවන චෙතනා සඞ්ඛ්‍යාත අර්ථ සාධක කුශල චෙතනා තොමෝ අනාගතාත්ම භාවයෙහි අංකුරාදී දිව්‍ය පුත්‍රයන්ටමෙන් කාමසුගතියෙහි පටිසන්ධි ප්‍රවෘත්ති විපාක දෙන්නේසි. මධ්‍යයෙහි ජවන් පස පිළිබඳවූ චෙතනාවෝ පස් දෙන අපරාපරිය වේදනීය කර්ම වශයෙන් කල්පවිනාශාදී අවකාශ ලාභය ඇතිකල්හි අවීචිමහා නරකයෙන් පවා චුතව අවුත්සදිව්‍ය ලොකයෙහි උපදවා එහිදී වායෝ කසිණයෙන් ධ්‍යාන ලැබ බ්‍රහ්ම ලොකොත්පත්තියට පවා හෙතුවන්නේසි. මේ පළමුවන මහාකුශල චිත්තයන් අතුරෙන් පළමුවන කුශල චිත්තය මේ මනුෂ්‍ය ලොකයෙහි අසඞ්ඛ්‍යායුෂක ප්‍රතිසන්ධිය ලැබූ පශ්චිම භවික මහාබෝධි සත්ව චක්‍රවර්ති රාජාදීන්ට ලැබෙයි. එතකුදු වුවත් ගෞතම බෝධිසත්වයන්වහන්සේ වැනි ලොකයෙහි පහළවූ භාග්‍යවත් පක්‍ෂයෙහි උපදනා බෝධිසත්වවරයන්ගේ මරණය සෘතු විපරිතය හෙතුකොටගෙණ සියක්අවුරුදු දකින්වන්නේසි. මේ මහාකුශල චිත්තයට වඩා අතිශයින් මහානුභාව සම්පන්නවූ රූපා රූප ධ්‍යාන චිත්තයන්ට මහාලෞකොත්තර චිත්තයන්ටද මහා යන විශෙෂණය නොයෙදූ, මේ කාමාවචර චිත්තයන්ටම මහා යන විශෙෂණය කුමක්හෙයින් යොදනලද්දේද යත්? එහි මහා ශබ්දය පූජාර්ථයෙහි පවත්නා මහා ශබ්දයක් නොව මහා විෂයාර්ථයෙහිපවත්නා මහන්ත ශබ්දයෙකැයි දතයුත්තේසි. ප්‍රථම ධ්‍යාන කුශල චිත්තය එකම ප්‍රථම ධ්‍යාන භූමියෙහි විපාකදෙයි. අවශෙෂවූ මහග්ගත ලොකොත්තර චිත්තයෝද කම තමාගෙන් අන්‍යවූ භූමියෙක්හී විපාක නොදෙන්නාහුය. මේ කාමාවචර කුශල චිත්තයෝ වනාහී සප්තකාම භූමියෙහි ප්‍රතිසන්ධි ප්‍රවෘත්ති විපාක හා එකොළොස් කාම භූමියෙහි ප්‍රවෘත්ති විපාකද දෙන්නාහුවෙති. එහෙයින් මේ කාමාවචර කුශල චිත්තයන්ට වඩා විෂය මහන්තවය ඇත්තාවූ චිත්තයෙක්නම් නැත්තේසි. එහෙයින් මහාවිෂය ඇතිහෙයින් මහාකුශල චිත්තයෝයි ව්‍යවහාර කෙරෙත්. ඒ අටමහා කුසල චිත්තය වනාහී සොම්නස් සහගත

සතරස, උපෙක්ඛා සහගත සතරස්සයි යනමොවුන්ගේවශයෙන් අවවැදෑරුම්වන්නේ නමුදු ලැබියයුතුවූ පවසථානයන්ගේ වශයෙන් පසළොස් දහස්එකසිය විස්සෙක්වන්නේයි. ඒ ගණන කෙසේ ගිණිය යුත්තේද යත්?

"කමේන පුඤ්ඤවන්තූහි හොවරාධිපතීහිව
කම්මහීනාදිතොවෙව ගණෙය්‍ය නය කොවිදෙ."

යන ගාථාවෙහි ආ ක්‍රමයෙන් ගිණිය යුත්තේයි. ඒ කෙසේද යත්? දාන, ශීල, භාවනා, පත්තිදාන, පත්තානුමොදනා, ධම්මසවණ, ධම්මදෙසනා, වෙය්‍යාවච්ච, දිට්ඨිජුකම්ම, යන දශ පුණ්‍යක්‍රියා වසතුන්ගේවශයෙන් අටමහා කුසල චිත්තය දශ යෙන් ගුණිතකළකල්හි අසූවක්වෙයි. ඒ අසූ චිත්තය රූප, ශබ්ද, ගන්ධ, රස, ඵොට්ඨබ්බ, ධම්, යන අෂ්ඨධම්යෙහි ආවාවූ ධම්යන් සදෙනාගේ වශයෙන් ගිණුකල්හි සාරසිය අසූවක්වෙයි. ඒ සාර සිය අසූ චිත්තයන් අතුරෙන් ඤාන සම්ප්‍රයුක්තවූ දෙසිය සතළිස ගෙණ ඡන්ද, චිත්ත, විරිය, විමංස, යන අධිපති සතරින් ගිණුකල්හි නවසිය සැටෙක්වෙත්. ඤාණ විප්‍රයුක්තවූ දෙසියසත ළිස් චිත්තය ඡන්ද, චිත්ත, විරිය, යන අධිපතීන් තුන්දෙනාගෙන් ගුණිතකළකල්හි සත්සිය විස්සෙක්වෙත්. ඒ දෙකොටස එක් කරගත්කල්හි එක්දහස් සසිය අසූවක්වෙයි. ඒ එක්දහස් සසිය අසූ චිත්තය කායකම්, වචිකම්, මනොකම්, යන කම්ත්‍රයෙන් ගුණ තකළකල්හි පන්දහස් සතළිසෙක්වෙයි. ඒ පන්දහස් සතළිස හීන, මඣ්‍යම, ප්‍රණීත, යන තුණින් ගුණිතකළකල්හි පසළොස් දහස් එක්සිය විස්සෙක්වෙයි. මේ කාමාවචර චිත්තයන් අට දෙනාගේ ප්‍රභෙදය මෙසේ වියයුතුනම් බුඬදත්තාචාරීන් විසින් අභිධම්මාවතාරනම්වූ සංග්‍රහ අටුවාවෙහි:—

සත්තරස සහස්සානි වෙසත්තානි අසීතිව
කාමාවචර පුඤ්ඤානි භවන්තීති විනිද්දිසෙ.

යන ගාථාවෙන් සතළොස් දහස් දෙසිය අසූවෙකැයි කුමක්හෙයින් වැහිකොට කියනලද්දේද යත්? ඤානවිප්‍රයුක්ත දෙසිය සතළිස් චිත්තයෙහි නොලැබෙන්නාවූ විමංසාධිපතිධම්ම නුගුලුවාම ගණන් ශ්‍රොතසයෙහි වැටුනාවූ ක්‍රමයෙන් ගිණුහෙයි නැයි දතයුතුයි. එයින් අන්‍යවූ කාලදෙශාදී භෙදයෙන්වන්නාවූ ගණන අනන්තා පරිමාණවන්නේමැයි. මේ අටමහා කුශල චිත්තය ගිණුක්‍රමයෙන් මේ මහාක්‍රියා අටද ගිණියයුත්තේයි. මහාවිපාක සිත් අටෙහි වනාහි සොම්නස් උපෙක්ඛා සහගත වියයුතුබව "ඉමානිපි ඉධ ඉධමජ්ඣත්තසාරම්මණවසෙන යථාක්කමං

සොමනස්ස උපෙක්ඛාසහිතානි" ඉත්‍ය වීකා පාඨයට අනුව දත යුත්තේයි.

එහි භාවය:—සහජාත්වූ ඉෂ්ටාලම්බනයෙක්හි කුශල චිත්තය උපදනේවිනම් විපාකයත් සොම්නස් සහගතවෙයි. ඉඳ මජ්ඣත්තාලම්බනයෙක්හි කුසල චිත්තය උපන්නේවිනම් ඔහුගේ විපාකය උපෙක්ඛා සහගතවේමැයි. මහාවිපාකයෝ අට දෙන ඥාන සම්ප්‍රයුක්ත ඥාන විප්‍රයුක්තවීමට හෙතුකවර ඇත්? පටිසන්ධි, භවාඞ්ග, චුතීන්ගේ වශයෙන් පවත්නාකල්හී පටිසන්ධිය දෙන්නාවූ කම් තෙමේ බලවත්වූකල්හි විපාකවශයෙන් පහළ වන්නාවූ පටිසන්ධි චිත්තයද ඥාන සම්ප්‍රයුක්තවෙයි. දුර්ලවූ කම් යක් විසින් පටිසන්ධිදෙන්නාවූකල්හී ඒ විපාක චිත්තය ඥාන විප්‍ර යුක්තවෙයි. මහාවිපාක චිත්තය තදාරම්මණවශයෙන් පවත්නා කල්හි බොහෝසෙයින් ඥානසම්ප්‍රයුක්තබවද විප්‍රයුක්තබවිද ජවිනයන්ට අනුවවන්නේයි. හෙවත් ඥානසම්ප්‍රයුක්ත ජවන්දිවූ කල්හී තදාලම්බනවශයෙන් උපදනා විපාකයද ඥානසම්ප්‍ර යුක්තවෙයි. ඥාන විප්‍රයුක්තවූ ජවන්දිවූකල්හී තදාලම්බන විපාක ඇද ඥාන විප්‍රයුක්තවේමැයි. මේ ක්‍රමයද අනියතවෙයි. කුමක් හෙයින ඇත්? ඥාන සම්ප්‍රයුක්ත පටිසන්ධිගත් තැනැත්තාහට උපදනා භවාඞ්ගයෝද ඥානසම්ප්‍රයුක්තමැයි. එබන්දෙකුට ඥාන විප්‍රයුක්ත ජවන් උපන්නේ නමුදු මූලභවාඞ්ගයන්ගේ ශක්තිය කරණකොටගෙණ තදාලම්බන විපාක ඥානසම්ප්‍රයුක්තවිය හැක්කේයි. එපරිද්දෙන්මේ ඥානවිප්‍රයුක්ත පටිසන්ධිගත් තැනැත්තා හට ඥාන සම්ප්‍රයුක්ත ජවන්දිවූකල්හි ඥානවිප්‍රයුක්ත තදාලම්බ නද විය හැක්කේයි. කාමාවචර කුසල කම් අටදෙනාගේ ශක්ති යෙන් සුදුසු පරිද්දෙන් කාමාවචර සුගති පටිසන්ධි නවයෙන් යම් ක්සි පටිසන්ධියක් දිය හැක්කේයි. ඒ කුශලයන් අටදනා අතු රෙන් උත්කෘෂ්ටවූ කාමාවචර මහාකුශල චිත්තයෙන් සුගති පටිසන්ධියත් තැනැත්තාහට ප්‍රවෘත්ති කාලයෙහි සහෙතුක මහාවිපාක අටය, අහෙතුක විපාක අටයයි සොළොස් විපාකයක් උපදවන්නේයි. ඥානසම්ප්‍රයුක්ත මහාවිපාක සිතින් පටිසන්ධිගත් තැනැත්තාහට රන් රිදී මුතු මැණික් ගව මහිෂ කෙත් වත් ගම් කිම් ආදී ඉෂ්ටොභෝග පරිභෝග සම්පත් තැමති විපාක ආනිශංස ඇත්ද ලැබෙන්නාහුය. ඥාන විප්‍රයුක්ත දුහෙතුක පටිසන්ධිගත් තැනැත්තහුට උක්ත විෂයී ඵල සංඛ්‍යාතවූ කෘෂිවණිජ ආදී කෘත්‍යයන් හෙතුනොවගෙණ මධ්‍යම ප්‍රමාණවූ උපභොග පරි භෝග සම්පත් තැමති විපාක ආනිශංසයෝ ලැබෙන්නාහුවෙති. දුර්ලවූ දුහෙතුක කාමාවචර කුශල කම් බලයෙන් ජාත්‍යන්ධාදී අඞ්ගවිකලවූද, අනුන්ට බැලමෙහෙකරන්නාවූද, වැදි කෙවුල්

ආදී නීව ආත්මභාවයන්හිද, සුගති අහෙතුක පටිසන්ධිවසයෙන් උපදනේයි. ඔවුන්ගේ ප්‍රවෘත්ති කාලයෙහි අහෙතුක විපාක අට පමණක් ලැබෙන්නේයි. අහෙතුක විපාකයන්ට උපාකාතිශය නැති බැවින් එබඳු සත්වයෝ අනුන්ට බැලමෙහෙකොට අතිශයින් දුකකජීවිකාවෙන් ජීවත්වෙති. අසංඥ සත්වයන් හැර අව ශෙෂ පසළොස් රූප භූමියෙහි කුසල විපාක වකුඹු විඤ්ඤාණ සොතවිඤ්ඤාණ සම්පටිච්ඡන සන්තීරණ වශයෙන් අහෙතුක විපාක සතරක් ලැබන්නේයයි දතයුතුයි. තිපිටක චූලනාගථෙරවාදයෙහි: ත්‍රිහෙතුක උත්කෘෂ්ටවූ මහාකුශලයන් සතරදෙනා අතුරෙන් එක්තරා කුශලචිත්තයක් තෙමේ ත්‍රිහෙතුක මහා විපාකයන් සතරදෙනා අතුරෙන් එක්තරා විපාක චිත්තයක් පටිසන්ධිවසයෙන් උපදවයි. ප්‍රවෘත්ති කාලයෙහි සහෙතුක මහා විපාක අටය අහෙතුක කුශල විපාක අටය යන සොළොස් විපාක දෙන්නේයයිද, ත්‍රිහෙතුක ලාමක මහාකුශලයන් සතරදෙනා අතුරෙන් එක්තරා කුශල චිත්තයක්ද, දුහෙතුක උත්කෘෂ්ට මහා කුශලයන් සතරදෙනා අතුරෙන් එක්තරා කුශල චිත්තයක්ද යන දෙදෙන ශක්තිවශයෙන් සමානවෙත්. එහෙයින් ත්‍රිහෙතුක ලාමක කුශලයක් හෝ දුහෙතුක උත්කෘෂ්ට කුශලයක් මෘත්‍යු පටිසන්ධිගන්වන්නාවූ කල්හී ඥාන විප්‍රයුක්තවූ මහාවිපාකයන් සතරදෙනා අතුරෙන් එක්තරා විපාකයක් තෙමේ පටිසන්ධිවශයෙන් උපදවයි. ප්‍රවෘත්ති කාලයෙහි ඥාන විප්‍රයුක්තා මහාවිපාක සතරය, අහෙතුක විපාක අටය, යන දෙළොස් විපාකය උපදවයි කියාද, දුහෙතුක ලාමක කාමාවචර කුශලයන් සතරදෙනා අතුරෙන් එක්තරා කුශල චිත්තයක් තෙමේ පටිසන්ධිගන්වන්නාවූකල්හී කුසලවිපාක උපෙක්ඛා සන්තීරණ චිත්තය පටිසන්ධිවශයෙන් උපදවා ප්‍රවෘත්ති කාලයෙහි අහෙතුක විපාක අට උපදවන්නේයයි කියත්. මේතිපිටක චූලනාගවාදයයි. ඒමහා විපාක තෙමේ සංක්ෂේපයෙන් අටවැදෑරුම්වූයේ නමුදු ගුණිත සංඛ්‍යා වශයෙන් බොහෝ ප්‍රභෙද ඇත්තේය. හේ කෙසේ යත්? මහා විපාකයෝ අටදෙන දශප්‍රණ්‍ය ක්‍රියා වසතු වශයෙන් ගිණුකල්හී අසූවක්වන්නේයි. ඒ අසූවක්වූ විපාක චිත්තය රූපාදි සාරම්මණ වශයෙන් ගිණුකල්හි සාරසිය අසූවක්වෙත්. ඒ සාරසිය අසූවක් විපාක චිත්තය කායවාක් මනෝ යන කර්මත්‍රයෙන් ගිණුකල්හි එක්දහස් සාරසිය සතළිසෙක්වෙත්. ඒ එක්දහස්සාරසිය සතළිස ඝන මඛ්‍යම ප්‍රණීතවශයෙන් සාරදහස් තුන්සිය විස්සෙක්වෙත්. කාල දෙශාදීන්ගේ වශයෙන් ගිණුකල්හී අනෙක ප්‍රකාර ප්‍රභෙද වන්නාහුය. මෙසේ මහාකුසල චිත්තයන් අටදෙනාගේ මඛ්‍යම

පුඩුව පසළොස් දහස් දෙසිය අසූවෙක්ද මහාක්‍රියා අටදෙනාගේ මඬ්‍යම පුඩුව පසළොස් දහස්දෙසිය අසූවෙක්ද, මහාවිපාක අටදෙනාගේ මඬ්‍යම පුඩුව සාරදහස් තුන්සිය විස්සෙක්ද, චන්නාහුයයි කියාද, මේ චිත්තයන්ගේ විසතාර පුඩුව අනන්තාපරිමාණවන්නේයයි කියාද දතයුතුයි. කාමාවචර මහාක්‍රියාවන්ගේ හටගැණීම "තං තං කිච්චසාධන වසෙන පවත්තනාපනකරණ මත්ත මෙව හොති තසමා ක්‍රියාවුත්තා" යනු අත්ථසාලිනී අට්ඨවා වචන බැවින් ඒ ඒ කෘත්‍ය සිද්ධකිරීම්වශයෙන් මුත් විපාක ඉපදීම්වශයෙන් නොපවත්නාහෙයින් දන්දීම් ආදී ඒ ඒ ක්‍රියා කරණ මාත්‍රයක්හෙයින් ක්‍රියායයි කියනලද්දේයි. "ඉදං චිත්තං අඤ්ඤසං අසාධාරණං ඛීණා සවසෙව පාපිපුඤ්ඤලිතං ඡඩ්ඩු වාරෙසු ලබ්භති, යනු අත්ථසාලිනී අට්ඨවා වචන බැවින් මේ ක්‍රියා චිත්තයන්ගේ සමූහය වනාහි පෘථග්ජන ශෛක්ෂ්‍යයන්ට සාධාරණනොවෙයි. ක්ෂීණාශ්‍රව මහාරහතුන්ට හා පසේ බුදුවරයන් වද ආවේණිකවූ ප්‍රාතිපුද්ගලික චිත්තයයි දතයුතුයි. එතකුදුවුවත් කාමාවචර කුශලයමෙන්ම චක්ඛුරාදී ඡඩ්වාරයෙහි පැවති කාමාවචර ක්‍රියා චිත්තය රහතුන්ට ආවෙණිකවන්නාක්මෙන්ම කාමාවචර මහාකුශල චිත්තයද පෘථග්ජන ශෛක්ෂ්‍යයන්ට ආවෙණිකවන්නේයි. කාමාවචර මහාකුශල චිත්තයද චක්ඛුරාදී ඡඩ්වාරයෙහි අඤ්ඤ සාධකවශයෙන් පවත්නාකල්හි නොහොත් දන්දෙමැයි සිල්රක්ෂාකරම්හයි යනාදී සිතූ මාත්‍රයක්නම් ප්‍රවෘත්ති විපාක මාත්‍රයක් මුත් ප්‍රතිසන්ධි විපාක නොඉපදවියහැක්කේයි. දන්දෙමැයි සිතා දාන වස්තු ආදිය සම්පාදනයකොට හික්ෂූන් වඩාහිඳුවා සියලු පූජා කෘත්‍යකොට ඒ දාන වස්තු ප්‍රතිග්‍රාහකයන්ගේ අතෙහි නොපිහිටුවා ලූයේවීනම් ඒ ප්‍රස්තාවෙහි උපදනා කාමාවචර කුශල චිත්තයෝද පටිසන්ධි විපාක නොදීහැක්කාහුවෙති. ඒ වස්තු පරිද්දෙන් දාන වස්තු ප්‍රතිග්‍රාහකයාගේ අතෙහි පිහිටුවනකල්හී උපදනා අඤ්ඤ සාධක ජවන චිත්තයම ප්‍රතිසන්ධි ප්‍රවෘත්ති විපාක දියහැකිවෙති. දාන වස්තුව ඔසවා ප්‍රතිග්‍රාහකයාටද්ම කායවිඤ්ඤත්තති රූපයක්වෙයි. ඒ කායවිඤ්ඤත්තති රූපය කුමක්හෙයින් මේසා මහත් විපාක දෙන්නේද යත්? දන්දෙමැයි සිතන්නාවුකල්හි සප්තජවනයන්ගෙන් යුක්තවූ චිත්ත වීථියක් උපදී. ඒ සත්ජවන් හා සමග උපදනා චිත්තජ වායෝ ධාතුහු සත්දෙන අවශෙෂ තිජවාණයා ධාතූන්ට පැමිණීමෙන් සකල ශරීරයම ඒ චිත්තජ වායෝ ධාතුහුගේ වසඟයට පැමිණෙයි. ඉක්බිති ඒ චිත්තජ වායෝ ධාතුහු ගාත්‍රාදීන් කරා පැමිණ දාන වස්තුව ඔසවා ප්‍රතිග්‍රාහකයාගේ අතෙහි පිහිටුවීම් සඤ්ඤාවවූ

කාශවිකාරය උපදවයි. ඒ කාශවිකාරය ඉපදවීමට මූලභූතකාරණාවූ සත්ජවනයන් හා යෙදුනාවූ මේ වෙතනාවෝ සත්දෙන ඒ ක්‍රියාව නිපදවීමට කාරණවූහයින් ඒ වෙතනාවන්ට දුනමය කුශලකම්යයි කියති ඒජවන චිපිය වහාම නිරුඩවියන්නේ නමුදු ණයගන්නාවූ ණයඇතියාගේ ණයනැතිවීම් සඩ්ඛ්‍යාතවූ ක්‍රියාව වහා නිරුඩවියන්නේ නමුදු ඒව බොහෝ කාලයකට පසු ණයහිමියා ණයදෙවයි ඉල්ලුකල්හි එදවසගත් ණයක් මෙන්ම ණයගෙවා නිදහස්විය යුතුවාක්මෙන් ඒ දුනමය කුශල කම්ය ක්ෂණයකින් නිරුඩවිගියේ නමුදු ණයගැනීමේ ශකතිය නැතිනොවන්නාක්මෙන්ම කම්යෙන් බඳවූ ශකතිය කල්පකෝටි ශතසහශ්‍රයෙකිනුත් නිරුඩනොවී විපාකදීමට සුදුසු අවසරය ලැබුනුකල්හි මරණාසන්න ජවන චිපියට එසමයෙහි දන්දෙන කල්හි උපන්නාවූ දුනමය කුශල චිත්ත චිපිය හෝ ඒදුනොප කරණ ප්‍රතිග්‍රාහකාදීන් හෝ ඒ කම්යට නියතවූ සුගතියෙහි දිව්‍ය විමාන කප්රුක් ආදීන්ගේ සවරූපය හෝ සවප්නයක් දක්නෙකුවමෙන් මරණාසන්න ජවන චිපියට අරමුණුවෙයි. ඉක්බිති ඒ අරමුණ ධරමාන කල්හිම චුතිචිත්තය ඉපදී සුගති පටිසන්ධි චිත්තය පහළවන්නේයයි දතයුතු. මේ කාමාවචර කුශල්ය කාමාවචර ක්‍රියාය ගැනමොවුන්ට විලිකුම් අඹ ඇත්තාවූ අඹ ගසක් උපමා කටයුතුයි. ඒ ආම්බීවෘක්ෂයෙහි රොපණයකිරීමට සුදුසුවූ ආම්බීජයන්ගෙන් යුකතවූ විලිකුම් අඹ ඵලමෙන් අතීත සාධක කාමාවචර කුශල කම් පථ විපිහුද, රොපණය නොකටයුතුවූ ආම්බීජයන් නැත්තාවූ අඹ ඵලමෙන් ක්ෂීණාශ්‍රව යන්ට උපදනා ක්‍රියා චිත්තයෝද, යහපත් අඹ ඵලරොපණය කොට උපදවන්නාවූ අඹ වෘක්ෂමෙන් කාමාවචර විපාක චිත්තයෝද උපමා උපමෙය සම්බන්ධකොට දතයුතුයි.

කාමාවචර කුශල විපාක ක්‍රියාවන්ගේ විභාගය නිමි.

සත්විසි මහද්ගත චිත්තයෙහි පළමුකොට කාමාවචර මහා කුශලයටයි අටනිස් චෛතසිකය තබා විරතිත්‍රය උගුළුවා අවශෙෂවූ පන්තිස් චෛතසිකය ලැබෙන්නේයයි කියයුතුයි. ප්‍රථම ධ්‍යානත්‍රය සඳහා පන්තිස් චෛතසිකය කියනලද්දේයි. විතිය ධ්‍යාන තුණෙහි විතකී චෛතසිකය උගුලුවා අවශෙෂ සුතිස් චෛතසිකය ලැබෙන්නේයයි කියයුතුයි. තෘතීය ධ්‍යානතුණෙහි විතකී විචාර දෙක උගුලුවා අවශෙෂවූ තෙතිස් චෛතසිකය

ලැබෙන්නේයයි කියයුතුයි. චතුර්ථ ධ්‍යාන තුණෙහි විතර්ක විචාර ප්‍රීති තුණ උඩරණයකොට අවශෙෂ දෙකින ලැබෙන්නේයයි කියයුතුයි. පඤ්චම ධ්‍යාන පසලොසෙහි විතර්ක විචාර ප්‍රීති කරුණා මුදිතා යන පස උඩරණයකොට අවශෙෂවූ සමතිස් චෛතසිකය ලැබෙන්නේයයි කියයුතුයි. මේ මහග්ගත චිත්තයෙහි යෙදිය යුතු නොයෙදියයුතු චෛතසිකයෝ කවරහුදැයි සොයනු කැමති කල්හි විරතිත්‍රය හැත්පසින්ම උඩරණයකටයුතුයි. මහග්ගත චිත්තයෙහි විරතීහු කුමක්හෙයින් නොයෙදෙන්නාහුද යත්? විරතිත්‍රයෙහි ඇතුලත් අනභිජ්ඣාව ශීලවිශුද්ධියෙහි අන්තර්ගත වන බැවින් චිත්ත විසුද්ධි සඞ්ඛ්‍යාතවූ මේ මහග්ගත චිත්තයෙහි ඒ විරතීහු හැත්පසින් නොලැබෙන්නාහුමැයි. විතර්ක විචාර ප්‍රීති කරුණා මුදිතා යන මේ චෛතසිකයෝ පස්දෙන ඇතැම් ධ්‍යාන යෙක්හි නොලැබෙති. ඇතැම් ධ්‍යානයෙක්හි ලැබෙති. එහෙයින් මහග්ගත චිත්තයන්ගේ වෙනස සොයනු කැමතිකල්හී ඒ චෛතසික ධර්මයන්ම සෙවියයුත්තේයි. රූපාවචර කුශල චිත්තයෙහි යෙදෙන්නාවූ ධ්‍යාන ධර්මයෝ නම්:—"ඣානනති" විතක්කො, විචාරෝ, පීති, සුඛං, චිත්තස්සෙකග්ගතා"යි විභඞ්ගප්‍රකරණයෙහි ධ්‍යාන විභඞ්ගයෙහි වදුළහෙයින් විතර්ක විචාර ප්‍රීති සුඛ එකාග්‍රතා යන මේ ධර්මයෝ පස්දෙන ධ්‍යානාඞ්ග ධර්මයෝනම්වෙති. ඒ ධර්ම එක එකඟත්කල්හී ධ්‍යානාඞ්ගමුත් ධ්‍යානයයි නොකියති. යම්සේ නිමි වළලු දැව් ආදීවූ රථාවයවයන් වෙන්වෙන්කොට ගත්කල්හි රථයයි නොකියති. රථාවයවයයි කියාම ව්‍යවහාරකරති. ඒරථාවයවයන් එක්කොට රචනාකළකල්හිම රථයයි ව්‍යවහාරකරන්නාක්මෙන්ම මේ ධ්‍යානාඞ්ගපවත්තය එක් සිතෙක්හි යෙදුනුකල්හිම ධ්‍යානයයි ව්‍යවහාරකෙරෙත්. ඉදින් ධ්‍යානාඞ්ග පවත්තය යෙදුනුකල්හිම ධ්‍යානවෙත්නම් ධ්‍යානාඞ්ග සතරක් හෝ තුණක් හෝ දෙකක් හෝ යෙදුනාවූ චිත්තය කෙසේ ධ්‍යානනම්වන්නේදයත්? යටත් පිරිසෙසින් උපෙක්ඛා එකාග්‍රතා යන ධ්‍යානාඞ්ගවය යෙදුනාවූ චිත්තයෙහි අවශෙෂ ධ්‍යානාඞ්ගත්‍රයාගේ කෘත්‍යය ධ්‍යානාඞ්ගවය විසින්ම සමුඞ්ඝාතකරණු ලැබෙයි. එහෙයින් ධ්‍යානාඞ්ගවය යෙදුනාවූ චිත්තයද ධ්‍යානනාම්වෙයි. මේ විතර්කාදී පස්දෙන කුමක්හෙයින් ධ්‍යානාඞ්ගනම්වන්නේද යත්?

"උපනිජ්ඣාන කිච්චත්තා කාමාදි පටිපක්ඛතො
සන්තෙසු පිච අඤ්ඤෙසු පවෙච ඣාන සඤ්ඤිතා.

යනු සවව සංඛෙප වචන බැවින් පන්තිස් චෛතසිකයකින් සම්පුණීවූ රූපාවචර ප්‍රථම ධ්‍යාන චිත්තයෙහි මේ විතර්කාදී අඞ්ග

පඤ්චකය යෙදූනු බැවින් ධ්‍යාන චිත්තයයි ව්‍යවහාරයෙහි. ඉදින් ඒ අඞ්ගපඤ්චකය පමණක් ධ්‍යානවන්නේ නම් සෝතාපත්ති අවශෙෂ සමතිස් ධර්ම හා චිත්තයද යන එක්තිස් ධර්මයන්ගේ සමුදය කාමාවචරයයි කියයුතුද? රූපාවචරාදී අනික් නමක් කියයුතු දැයි ප්‍රශ්නයක්වේ. යම්සේ උණුදියෙහි බහා පිසනලද්දාවූ තෙලෙක් පුෂ්ප ඵලපත්‍රාදිය උණුදියෙහි ඇත්තාවූ තෙජොධාතු ශක්තියෙන් එකම සූපසම්භාවට පැමිණෙත්ද, එපරිද්දෙන්ම ධ්‍යාන චිත්තයෙහි යෙදුනාවූ ධ්‍යානාඞ්ග පඤ්චකයාගේ ශක්තිය කරණකොටගෙණ අවශෙෂවූ එක්තිස් ධර්මයෝද ධ්‍යානනම් වෙත්. විතර්කාදී ධර්මපඤ්චකය යටකී ගාථායෙහි ආ න්‍යායෙන් උපනිජ්ඣානකෘත්‍ය සම්පාදනවූ නැරඹීම් නොහොත් ලංකොට බැලීම් ඇතිහෙයින්ද කාමාදී පඤ්චනීවරණ ධර්මයන්ට ඉදුරා ප්‍රතිපක්ෂ බැවින්ද ධ්‍යානාඞ්ගයයි ව්‍යවහාර කෙරෙති. මේ "ඣාන" ශබ්ද ශවනාහි "ඣෙවිනත්‍ථායං" යන ධාතුවෙන් නිපන්නේ යයි කියත්. ලංකොට බැලීමය යනු කුමක් ලංකොට බලන්නේද යත්? කසිණ ප්‍රතිභාග නිමිති ආදීවූ අරමුණ ලංකොට බලන්නේ යයි දතයුතු. ඒ ලංකොට බැලීම කෙසේවන්නේද යත්? අඞ්කාරවූ රාත්‍රියෙක්හි පර්වතයක් මුදුනෙහි දල්වනලද්දාවූ මහත්වූ ගිනි කඳක් අඞ්ගයන් එක්තිස් දෙනෙකුට හා ඇස් ඇත්තාවූ පුරුෂයන් පස්දෙනෙකු ලවා බලත්වයි නියොගකළකල්හි ඇස් ඇත්තාවූ පුරුෂයන් පස්දෙනා විසින් සම්පයෙහි දැල්වූ ගින්නක් මෙන් ඒ පර්වතය මුදුනෙහි දිලිසෙන්නාවූ ගිනිකඳ දක්නාලැබෙයි. එතකුදුවුවත් අඞ්කාරයෙහි දක්නාබැවින් ඒ පර්වතයාගේ මෙබ ඇත්තාවූ වෘක්ෂලතාදිය නොදැක ගිනිකඳම දක්නාලැබෙයි. එපරිද්දෙන් ධ්‍යාන චිත්තයෙහි යෙදුනාවූ විතර්කාදී අඞ්ගපඤ්චකය විසින් රූපාදී අනිත් අරමුණක් නොදැක කසිණ ප්‍රතිභාග නිමිත්තම දක්නාලැබෙයි. අවශෙෂවූ අඞ්ගයන් එක්තිස් දෙනා ඒ පර්වතයෙහි දිලිසෙන්නාවූ ගිනිකඳ නොදක්නාක් මෙන් ධ්‍යාන චිත්තයෙහි යෙදුනාවූ අවශෙෂ සෝතාපත්ති සම්පත්තිවූ සම්තිස් ධර්ම හා ධ්‍යාන චිත්තයද යන එක්තිස් ධර්මයෝ කසිණ ප්‍රතිභාග නිමිත්ත සම්පාදනවූ ආලොකය නොදක්නාහුවෙති. මේ උපනිජ්ඣා යන කෘත්‍යයාගේ සවභාවයයි. විතර්ක චෙතසික තෙමේ ඒ කසිණ ප්‍රතිභාග නිමිති සම්පාදන අරමුණට සසම්ප්‍රයුක්තවූ ධ්‍යාන චිත්තය ආරොපණය කරවයි. විචාර තෙමේ සසම්ප්‍රයුක්තවූ ධ්‍යාන චිත්තය අරමුණෙහි හසුරුවයි. ගෙවත් ගලපවයි. ප්‍රීති තොමෝ කෘත්ස්න ප්‍රතිභාග නිමිති සම්පාදනවූ අරමුණෙහි සසම්ප්‍රයුක්ත ධ්‍යාන චිත්තය පිනවයි. සුඛ තෙමේ අරමුණ මහත්කොට

සසම්ප්‍රයුක්තවූ ධ්‍යාන චිත්තයට හඟවයි. ඒ විතර්ක විචාර ප්‍රීති සුඛ යන සතර ධර්මයන්ගෙන් උපකාර ලැබුනාවූ එකාග්‍රතා චෛතසික තෙමේ තමා හා සම්ප්‍රයුක්තවූ ධ්‍යානචිත්තය කසිණ ප්‍රතිභාග නිමිත්තාලම්බනයෙහි මොනවට පිහිටුවීය තමාගේ වසඟ යට පමුණුවාගන්නේයි. එහෙයින එකම කසිණ ප්‍රතිභාග නිමිත් තාලම්බණයෙහි සමකොට ලීනොඛ්චචයෙහි වැටීයතොදී මනා කොට සවිරවශයෙන් පිහිටුවන්නේවෙයි. මේ ධ්‍යානාඞ්ගයෝ පස්දෙනවනාහි තම තමන්ට සතුරුවූ පවනීවරණ ධර්මයන්වද සතුරුවන්නාහුවෙති. ඒකෙසේද යත්? විතර්ක නැමති සිංහරාජ තෙමේ පින මිඬ නිවරණනැමති හස්තියාට පිරුඬවන්නේයි. විචාර නැමති ගරුඬරාජ තෙමේ විචිකිච්ඡා නීවරණ නැමති නාග රාජයාහට ඉදුරා ප්‍රතිපක්ෂවෙයි. ප්‍රීති නැමති බිලාර තෙමේ ව්‍යාපාද නැමති මූෂිකයාහට ඉදුරා ප්‍රතිපක්ෂවෙයි. සුඛ නැමති නාගරාජ තෙමේ උඬච්ච කුක්කුච්ච නැමති මැඩියාහට ඉදුරා ප්‍රති පක්ෂවෙයි. එකාග්‍රතා නැමති ව්‍යාඝ්‍ර තෙමේ කාමච්ඡන්දනීවරණ නැමති මුවාහට ඉදුරා ප්‍රතිපක්ෂවෙයි. මෙසේ මේ ධ්‍යානාඞ්ගයෝ පස්දෙන පවනීවරණ ධර්මයන්ට ජාතියෙන් සතුරුවූ ප්‍රහායක ධර්මතම්වෙත්. සිංහාදීවූ පස්දෙන ඔවුන්ට ගොදුරුවූ නොගොත් ඔවුන්ට සතුරුවූ හස්ති ආදී පස්දෙන යම්සේ විනාශකෙරෙත්ද එපරිද්දෙන් මේධ්‍යානාඞ්ගයන් පස්දෙන කරණකොටගෙණ පින මිඬනීවරණාදී පඤ්චනීවරණ ධර්මයෝ විෂ්කම්භනප්‍රහාණවශයෙන් විනාශවන්නාහුයයි දතයුතුයි. මේපවවනීකඞ්ඛාපනඅර්ථයයි. මේසේ මේ ධ්‍යානාඞ්ග පවනයාගේ ආරම්මණූපනිජ්ඣාන කෘත්‍යය, ප්‍රත්‍ය නීක ධ්‍යාපන අර්ථ යන අර්ථවය මනාසේ අවබොධකටයුතුයි.

ඒ රූපාවචරඣන්ගේ විපාක දෙන්නාවූ ක්‍රමය කෙසේ යත්? සමථ කම්සථානවඩන්නාවූ යොගාවචර පුද්ගල තෙමේ හීනවූ රූපාවචර කුශල පවඞ්ඛ්‍යානය නොකොත් පවවසිතාවෙන් ගෙන පුරුදු නොකරණලද්දවූ ප්‍රථම ධ්‍යානය භාවිතාකොට කොටිරිහුන් ඛ්‍යානයෙන් කාලක්‍රියාකෙළේවිනම් බ්‍රහ්මපාරිඳ්‍ය භූමියෙහි ඒ ඒ ප්‍රථම ධ්‍යාන රූපාවචර කුශල ශක්තියෙන් එම විඳාක චිත්තය පටිසන්ධිවශයෙන් පහළවී එහි ආයු පමණින් වැස බඹලොවින් චුතව මතු බඹතලයක නූපදනේවිනම් ඉව කාමධාතුවෙහි සුළුජාතියෙහි ධ්‍යාන උපදවන්නාවූකල්හී ඒ ධ්‍යාන වීථියෙහි පරිකම්ම උපචාර අනුලෝම ගොත්‍රභූ නමින් උපන්නාවූ කාමාවචර භාවනාමය කුසල කම්බලයෙන් ත්‍රිහෙතුක වූ හෝ දුහෙතුකවූ හෝ කාමාවචර මහාවිපාක ප්‍රතිසන්ධියෙන් නේයි. ඒ රූපාවචර ප්‍රථම ධ්‍යානයම් "ආවජ්ජන, සමාපජ්ජන

අසීඤ්ඤ, වුඤ්ඤ, පච්චවෙක්ඛන්ත, යන පවවසිතාවන් අතුරෙන් දෙතුන් ආකාරයකින් පුරුදුකොට ඒ ධ්‍යානය නොපිරිහී කාල ක්‍රියාකෙළේවිනම් බ්‍රහ්මපුරෝහිතත්තම් බඹලොව ප්‍රතිසන්ධිවශයෙන් එම විපාක චිත්තය උපදී. එහි ආයු පමණින් සිට මතු බඹ සලයකට නොයන්නේවිනම් යටකී නයින්ම උපචාර සමාධි කාමාවචර භාවනාමය කුශල කම්බලයෙන් සපත්තකාම සුගතියෙහි ද්විහේතුකවූ හෝ ද්විහේතුකවූ හෝ ප්‍රතිසන්ධියනන්නේයි. ඒ ප්‍රථම ධ්‍යානයම පවවසිතාවන්ගෙන් මනාකොට පුරුදුකළාවූ රූපාවචර ප්‍රථම ධ්‍යාන කුසල තෙමේ මරණින් මතු මහාබ්‍රහ්ම භූමියෙහි ප්‍රතිසන්ධි විපාකය උපදවයි. ඒ බ්‍රහ්මතෙමේ එයින් චුතව මතු බ්‍රහ්මතලයෙහි නූපදනේවිනම් යටකී නයින් සපත්තකාම සුගතියෙහි ප්‍රතිසන්ධිය උපදවයි. මේ බ්‍රහ්ම භූමි තුණ සමාන තල නොහොත් එකම භූමියක්වශයෙන් පිහිටා තිබෙයි. මහාබ්‍රහ්මකායිකා රජ්ජුන්ගේ පිරිවරවූ බ්‍රහ්මයෝ බ්‍රහ්මපාරිසද්‍යයෙහිද, අමාත්‍යවූ බ්‍රහ්මයෝ බ්‍රහ්මපුරෝහිතයෙහිද උපදනාහුවෙත්. "ඉත්ථියෝ පන අරියා වා අනරියා වා අඤ්ඤමඤ්ඤපත්තිලාභිනියෝ බ්‍රහ්මපාරිසජ්ජසුයෙව නිබ්බත්තන්තී" යනු අට්ඨසාලිනී අට්ඨකථාවෙහි සෝවාන් සකෘදාගාමී අනාගාමී යන මාර්ගඵලලාභීවූ සත්ත්වයන් ධ්‍යාන නූපදවා ගිහි භූමියෙහි සිටියාහුනම් මරණාසන්න කාලයෙහි ප්‍රථමධ්‍යාන උපදවාද පෘථග්ජන ධ්‍යානලාභීවූ සත්ත්වයන් මරණින් මතු බ්‍රහ්මපාරිෂද්‍ය භූමියෙහි උපදිත්. එහි සිට මතුමත්තෙහි ධ්‍යාන වඩා අකනිට්ඨ බඹලොව දක්වා ක්‍රමයෙන් ගොස් නිවන් දක්නාසුලභයෙහි. රූපාවචර කුසල ද්විතීය ධ්‍යානය තෘතීයධ්‍යානය සහ ධ්‍යානයෝ දෙදෙන හීන මධ්‍යම ප්‍රණීත යන ත්‍රිවිධාකාර ශෙන් වඩා පරිත්තාභ, අප්පමාණාභ, ආභස්සර, යන බ්‍රහ්මභූමි ත්‍රයෙහි උපදනාසුලභයෙත්. එතකුදුවුවත් ද්විතීය ධ්‍යානයෙන් උපන්නාවූ බ්‍රහ්මයෝ සවල්පානුභාව ඇතුවද, තෘතීය ධ්‍යානයෙන් උපන්නාවූ බ්‍රහ්මයෝ මහානුභාව සම්පන්නවද ශරීර ප්‍රභාවිමානාදියෙන් මෙනස්වම උපදනාහුවෙත්. ඒ සවැදෑරුම් බ්‍රහ්ම රාජයෝ ඒ බඹලොවින් චුතව මතු බඹතලයෙක්හී නූපදනාහුවෙත්නම් උපචාර සමාධි කාමාවචර භාවනාබලයෙන් සපත්තකාම සුගතියෙහි ද්විහේතුකව හෝ ද්විහේතුකව හෝ උපදනාහුවෙත්. රූපාවචර කුසල චතුර්ධ්‍යානය හීන මධ්‍යම ප්‍රණීතවශයෙන් වඩා ඒ ධ්‍යානයෙන් නොපිරිහී කාලක්‍රියාකලාහුනම් පරිත්තසුභ, අප්පමාණසුභ, සුභකිණ්හක, යන බ්‍රහ්මභූමිත්‍රයෙහි උපදනාහුවෙත්. එහි ආයු පමණින් සිට කාලක්‍රියාකොට මතු බඹතලයට නොයන්නාවූවිනම් සපත්තකාම සුගතියෙහි යටකී නයින් ප්‍රතිසන්

ති ගණිත්. රූපාවචර කුසල පඨම ධ්‍යානයද හීන, මධ්‍යම, ප්‍රණීත, වශයෙන් වඩා වෙහප්ඵල බඹලොවෙහි උපදනාහුවෙත්. ඒ ත්‍රිවිධාකාර බ්‍රහ්මයෝම සමාධානුකූලවන්නාහු තමුන් ශරීර ප්‍රභාදියෙන් ධ්‍යානයෙහි කී වෙනස දක්නාලැබෙත්. ඒ පඨම්ධ්‍යාන ගම ශාසනයෙන් පිටත්හි අන්‍ය තීර්ථකයන් විසින් "සඤ්ඤු රොගො සඤ්ඤු ගණ්ඩො" යනාදීන් සතර නාමසඤ්ඤාවෙහි දෝෂ දැක වායෝ කසිණභාවනාවෙන් ධ්‍යාන වඩා මරණින් මතු අසංඥතලයෙහි මනුෂ්‍ය ලොකයෙහි යම් ඉරියව්වකින් කාලක්‍රියා කළාහුනම් එම ඉරියව්වෙම්ම පිළිමරු බැඳි ප්‍රතිමාලයක්මෙන් රූපසඤ්ඤා මාත්‍රයක් පහලව ඒ ධ්‍යානවෙගය නොසිඳී පවත්නා පන්සියයක් මහාකල්ප මුලුල්ලෙහි ඒ බ්‍රහ්මලොකයෙහි වැස එයින් චුතව කාමධාතුවට එන්නාවූකල්හී පළමු ධ්‍යාන ලැබූ භවයෙහි කරණලද්දාවූ යම්කිසි කර්මයක් අවකාශ ලැබ එයින් පටිසන්ධියකන්නේසි. උපචාර සමාධි කාමාවචර භාවනාබල යෙන් ඔවුන්ගේ පටිසන්ධිය නොගන්නාබව දතයුතුසි. අනාගාමී පුද්ගලයෝ තමූ මරණින් මත්තෙහි පවසුඛාවාස භූමියෙහි හෝ ඔවුන්ගේ භවනිකානතිවශයෙන් අනිකුදු බ්‍රහ්ම ලොකයෙක්හි හෝ උපදනාහුවෙත්. පවසුඛාවාසයෙහි උපදනා අනාගාමීහු තමූ ඔවුන් ලබන්නාවූ පඨම ධ්‍යානයෙහි ශ්‍රද්ධෙන්ද්‍රිය අධිකවිනම් අවිඝතලයෙහිද, සතීන්ද්‍රිය අධිකවිනම් අතප්පාලයෙහිද, චිත්තෙකග්ගතාඉන්ද්‍රිය අධිකවිනම් සුදස්සනලයෙහිද, සමාධින්ද්‍රිය අධිකවිනම් සුදස්සීනලයෙහිද, ප්‍රඥෙන්ද්‍රිය අධිකවිනම් අකනිට්ඨා තලයෙහිද ක්‍රමයෙන් උපදනාහුවෙත්. වෙහප්ඵලය, අකනිට්ඨා භූමිය, නෙවසඤ්ඤානාසඤ්ඤායතනභූමිය යනමේ තුන්තල යෙහි උපන්නාවූ ආර්‍යයෝ තමූ ඒ භූමීන්ගේ උතුම් බැවින් එයින් චුතව අනිත් භූමියෙක්හි නොඋපද මහාමෝගීයන්ට පැමිණ නිවන් දක්නාහුවෙති එහෙයින්:—

"වෙහප්ඵලෙ අකනිට්ඨෙ භවග්ගෙ ච පතිට්ඨිතා
න පුනාසඤ්ඤභූ ජායන්ති සබ්බෙ අරියපුග්ගලා
බ්‍රහ්මලොකගතා හෙතෙ අරියා නොප පජ්ජරෙ."

යනු නාම රූප පරිච්ඡේදයෙහි අනුරුද්ධාචාර්‍යන් විසින් කියනලදී. මේ රූපාවචර කුසල චිත්ත තෙමේ පඨමකාරයයි කීයේ තමුදු ගුණිතා සංඛ්‍යා විසින් ගත්කල්හී අනෙක ප්‍රකාර වන්නේසි. ඒ ගුණිතා සංඛ්‍යා ක්‍රමය මෙසේසි. රූපාවචර කුසල චිත්තයවනාහී ප්‍රථම ධ්‍යාන චිත්තය ද්විතීය ධ්‍යාන චිත්තය තෘතීය ධ්‍යාන චිත්තය චතුර්ථධ්‍යාන චිත්තයයි කිකබ ප්‍රාඥපුද්ගල

යන් සඳහා ලැබියලු රූපඛ්‍යානයෝ මේ ධ්‍යාන චතුෂ්කයෙහි සඞ්ගහ කොට චතුෂ්කධ්‍යාන වශයෙන් වදාරණලද්දේයි. ප්‍රථම ද්විතීය තෘතීය චතුර්‍ථ පඤ්ච ධ්‍යානයයි කියලු රූපා රූප ධ්‍යානයෝ ධ්‍යාන පඤ්චකයෙහි සංග්‍රහකොට මනෝද්වාර පුද්ගලයන් සඳහා පඤ්චධ්‍යාන වදාරණලද්දේයි. මේ චතුෂ්ක පඤ්ච දෙකට හෙතුභූ කවර යත්? රූපාවචර චතුර්‍ථ ධ්‍යානය පඤ්ච ධ්‍යානය අරූපධ්‍යාන චතුෂ්කය යන ධ්‍යාන සඅයෙහි යෙදුනාවූ ධ්‍යානාඞ්ගයන්ගේ ගණන්වශයෙන් සමාන බැවින් හෙවත් මේ ධ්‍යාන සඅය ධ්‍යානාඞ්ගවශයෙන් යුක්ත හෙයින් ධ්‍යානාඞ්ගවශයෙන් යුක්තවූ ධ්‍යානයෝ සඳහා චතුර්‍ථ ධ්‍යානයෙහිම සංග්‍රහකොට චතුෂ්කනය වදාරණලද්දේයි. ඒ අඩි ධ්‍යානයෙහි යෙදුනාවූ ධ්‍යානාඞ්ගයන් ගණන්වශයෙන් සමාන නමුදු සුඛෛකාග්‍රතා යන ධ්‍යානාඞ්ගවශය සමග යෙදුනාවූ ධ්‍යානය චතුර්‍ථ ධ්‍යානයයි කියාද, උපෙක්ෂා එකාග්‍රතා යන අඞ්ගවශයෙන් යුක්තවූ රූපාවචර පඤ්චධ්‍යානය හා එම අඞ්ගවශයෙන්ම යුක්තවූ අරූපධ්‍යානත්‍රයෝ සතරදෙනද අඞ්ග සමානත්වය සලකා උපෙක්ෂා එකාග්‍රතා යන අඞ්ගවශයෙන් යුක්තවූ ධ්‍යාන පඤ්චකයම පඤ්චධ්‍යානයයි වෙන්කොට වදාරණලද්දේයි. මේසේ දෙශනා කිරීමට හෙතු කවර යත්? සංක්ෂේප රුචිකවූ තීක්ෂ්ණප්‍රාඥ පුද්ගලයන්ගේ සත්‍යාවබෝධය පිණිස චතුෂ්කනයද විස්තාර රුචිකවූ මන්දප්‍රාඥ පුද්ගලයන්ගේ සත්‍යාවබෝධය පිණිස පඤ්චනයද ඒ ඒ සූත්‍රාන්තයෙහි ධර්මප්‍රතිග්‍රාහක පුද්ගලයන්ගේ අදහස්බලා වදාරණලද්දේයයි දතයුතුයි. මේ චතුෂ්කපඤ්චනය එක්කොටගත් කල්හි ඊට සුඛික නවකයයි කියත්. ඒ සුඛික නවකය "දුක්ඛාපටිපදා දන්ධාභිඤ්ඤාය, දුක්ඛාපටිපදා ඛිප්පාභිඤ්ඤාය, සුඛාපටිපදා දන්ධාභිඤ්ඤාය, සුඛාපටිපදා ඛිප්පාභිඤ්ඤාය 'යන සතර ප්‍රතිපදාවන් හා මිශ්‍රකොට වදාළහෙයින් එක එක ප්‍රතිපදාවෙහි නවකයක් නවකයක් බැගින් ප්‍රභේදවන්නේය. "දුක්ඛාපටිපදා දන්ධාභිඤ්ඤා පඨමජ්ඣාන කුසල විත්තය" යනාදීවශයෙන් සුඛික නවකයට සතර ප්‍රතිපදාව මිශ්‍රකිරීමෙන් ප්‍රතිපදා නවක නවකයක්වෙයි. ඒ කවයම පරිත්ත පරිත්තාරම්මණය පරිත්ත අප්පමාණාරම්මණය අප්පමාණ පරිත්තාරම්මණය, අප්පමාණ අප්පමාණාරම්මණයයි, මෙසේ අප්‍රමාණචතුෂ්කය හා මිශ්‍රකොට වදාළහෙයින්ද, එක එක අරමුණෙක්හි නවක සතරක් බැගින්වෙයි. ඊට අනතුරුව ආරම්මණ නවක සතර හා ප්‍රතිපදා නවක සතරද මිශ්‍රකොට දුක්ඛාපටිපදා දන්ධාභිඤ්ඤා පරිත්ත පරිත්තාරම්මණය, දුක්ඛාපටිපදා ඛිප්පාභිඤ්ඤා පරිත්ත අප්පමාණාරම්මණය, සුඛාපටිපදා දන්ධාභිඤ්ඤා අප්පමාණ පරිත්තාරම්මණය, සුඛාපටිපදා ඛිප්පා

කිසඤ්ච අපමාණං අපමාණාරම්මණයති, මේසේ ප්‍රතිපදාරම්මණ යන් මිශ්‍රකොට වදාළහෙයින්ද, ප්‍රතිපදාරම්මණ මිශ්‍රකෘතයෙහි නවක අවක්ඛේයි. ඒ අට හා යවකී සුඛිත නවකය ප්‍රතිපදානවකය ආරම්මණ නවකය යන ත්‍රිවිධකොටස එක්කොටසක්කල්හී රූපාවචර කුශල චිත්තයෙහි නවකයෝ පස්විස්සෙක්වෙත්. "දුක්ඛා පටිපදා දන්ධා නිසඤ්ඤං අපමාණං අපමාණාරම්මණං," යනාදීන් වත්තාවූ ක්‍රමයද, අෂ්ටප්‍රකාර අභිභායතනයෝය, අෂ්ටප්‍රකාර විමොක්ෂයෝය, සතර ඉරියාවිහාරය, දශඅනුභය යන මොවුන් භාවනාකොට ලබනලද්දවූ රූපාවචර කුශල ධ්‍යානයෝ ඒ ඒ ධර්මයන්හේවශයෙන් ගුණිතකොටසක්කල්හී ලැබෙන්නාවූ ප්‍රභෙදයෝද ඒ ධර්මයන්ට අනුව දතයුතුයි. විපාක ක්‍රියාවන් ගුණිත සංඛ්‍යාවශයෙන් ගණින්නාවූකල්හී කුශලයෙහිමෙන් විපාක ක්‍රියායෙහිද අනූනාධිකව ලැබෙත්යයි දතයුතුයි

රූපාවචර කුශල විභාගය නිමියේයි.

අරූපාවචර දෙළොස් චිත්තයන් අතුරෙන් ආකාසානඤ්චායතන කුශල චිත්තය, ආකාසානඤ්චායතන විපාක චිත්තය, ආකාසානඤ්චායතන ක්‍රියාචිත්තය, යනමේ තුන්දෙන ආකාසානසිඤ්ඤ වර්ජිතකොට ඇත්තාවූ නවකසිඤ්ඤයන් අතුරෙන් එක්තරා කසිඤ්ඤයකින් උපදවාගන්නාලද රූපාවචර පඤ්චම්‍යාන යට අරමුණු කසිඤ්ඤලෝක සඞ්ඛ්‍යාතවූ ප්‍රතිභාගනිමිත්ත කැමති පඤ්ඤ ආකාශ ප්‍රදේශයක පතුරුවා කැවක ඒ කසිඤ්ඤ ප්‍රතිභාග නිමිත්ත මෙනෙහිකොටකොට අත්හැරීමෙන් කසිඤ්ඤලෝකය අනන්තයැයි මෙනෙහිවෙයි. ඒ කසිඤ්ඤයෙන් වැසී තිබුනාවූ ආකාශ ප්‍රදේශය කසිඤ්ඤුග්ඝාටිමාකාසයයි කියත්. ඒ කසිඤ්ඤ ඉගුළු අහස අරමුණුකොටගෙණ "ආකාසෝ අනන්තෝ ආකාසෝ අනන්තෝ" යනුවෙන් භාවනාවඩ්ඪකල්හී උපෙක්ඛා එකාග්‍රතා සඞ්ඛ්‍යාත ධ්‍යානවය ආදිකොට ඇත්තාවූ සම්පිණ්ඩනාදී චෙතසිකයන්ගෙන් සම්පයුත්තවූ ආකාසානඤ්චායතන කුශල චිත්තය පෘථග්ජන සෝවාන් සකදාගාමී අනාගාමී යන සතරආකාර පුද්ගලයන්ට උපදනේයි. ඒ ධ්‍යානලාභී පුද්ගල තෙමේ ධ්‍යානයෙන් නොපිරිහී කාලක්‍රියාකෙළේවිනම් ආකාසානඤ්චායතන භූමියෙහි ප්‍රතිසන්ධිවශයෙන් විපාක චිත්තය පහළවෙයි. එම ධ්‍යානය රහතුන්ට හෝ බුදු පසේබුදුවරයන්ට හෝ උපදනාකල්හී ආකාසානඤ්චායතන ක්‍රියා ධ්‍යානයයි කියත්. ඒ ආකාසානඤ්චායතන ධ්‍යානලාභීවූ යොගාවචර තෙමේ [illegible]

ධ්‍යානය උපදවමින් කැමැතිකල්හි පළමු උපන් ආකාසානඤ්චායතන කුසල චිත්තය "විඤ්ඤාණං අනන්තං විඤ්ඤාණං අනන්තං" යනුවෙන් මෙනෙහි කිරීමෙහිලා ආකාසානඤ්චායතන කුසලචිත්තය අරමුණුකොටගෙන ධ්‍යානඵලය ආදිකොට ඇත්තාවූ සමකිස් වෙතසිකයෙකින් සම්පුණ්ණවූ විඤ්ඤාණඤ්චායතන කුසල චිත්තය පෘථග්ජනාදි සතරකාර පුද්ගලයන්ට උපදනේසි. ඒ ධ්‍යානයෙන් නොපිරිහී කාලක්‍රියා කළේවිනම් විඤ්ඤාණඤ්චායතන භූමියෙහි විඤ්ඤාණඤ්චායතන විපාක චිත්තය පටිසන්ධිවශයෙන් පහළවේ. එම ධ්‍යානය බුදු පසේබුදු මහරහතුන් විසින් උපදවන්නාවූ කල්හි ක්‍රියා ධ්‍යානයයි කියත්. ඒ විඤ්ඤාණඤ්චායතන ධ්‍යානය ලැබුවාවූ යොගාවචරයාගේ ඒ ධ්‍යානය ලබනවා හා සමග පෙර තුබූ ආකාසානඤ්චායතන කුසල චිත්තය නැත්පසින් නිරුද්ධවී යෙයි. ඒ නිරුද්ධවීම නත්ථිභාව ප්‍රඥප්තියයි කියත්. ඒ නත්ථිභාව ප්‍රඥප්තිය අරමුණුකොටගෙන විඤ්ඤාණඤ්චායතන ධ්‍යානලාභී යොගාවචර තෙමේ "නත්ථි කිඤ්චි නත්ථි කිඤ්චි" යනුවෙන් භාවනා වඩනකල්හි තොහොත් තමා විසින් පළමුවෙන් උපදවාගන්නා ලද්දාවූ ආකාසානඤ්චායතන කුසල චිත්තයාගේ උපපාද, ඨිති, භඞ්ග, සඞ්ඛ්‍යාත ක්ෂණත්‍රය අතුරෙන් යවත් පිරිසෙසින් භඞ්ග ක්ෂණය තුදු අවශිෂ්ටවෙනැතැයි, භාවනා වඩනකල්හි යටකී ක්‍රම යෙන් ධ්‍යානඤ්චය ආදිකොට ඇත්තාවූ සමකිස් ධර්මයෙකින් සම්පුණ්ණවූ ආකිඤ්චඤ්ඤායතන කුසල චිත්තය උපදනේසි. ඒ ධ්‍යානයෙන් නොපිරිහී කාලක්‍රියා කළේවිනම් ආකිඤ්චඤ්ඤායතන විපාක චිත්තය ප්‍රතිසන්ධිවශයෙන් පහළවේ. ඒ ධ්‍යානය බුදු පසේබුදු මහරහතුන් විසින් උපදවනකල්හි ක්‍රියා ධ්‍යානයයි ව්‍යවහාර කෙරෙත්. ඒ ආකිඤ්චඤ්ඤායතන ධ්‍යානලාභීවූ යොගාවචර තෙමේ තමා විසින් උපදවාගත්තාවූ ආකිඤ්චඤ්ඤායතන කුසල චිත්තය භාවනාවශයෙන් මෙනෙහි කොට "සන්තමේතං පණීතමේතං" යනුවෙන් භාවනාවඩනකල්හි පෘථග්ජනාදි සතරකාර පුද්ගලයන්ට ධ්‍යානඤ්චය ආදිකොට ඇත්තාවූ සමකිස් වෙතසිකයෙකින් සම්පුණ්ණවූ නෙවසඤ්ඤානාසඤ්ඤායතන කුසල චිත්තය උපදනේසි. ඒ ධ්‍යානයෙන් නොපිරිහී කාලක්‍රියා කෙළේවිනම් පෘථග්ජනාදි සතරකාර පුද්ගලයන්ට නෙව සඤ්ඤානාසඤ්ඤායතන භූමියෙහි නෙවසඤ්ඤානාසඤ්ඤායතන විපාක චිත්තය ප්‍රතිසන්ධිවශයෙන් පහළවන්නේසි. බුදු පසේබුදු මහරහතුන් විසින් නිරෝධ සමාපත්තියට සම්වදනා කල්හි චිත්ත චෛතසිකයන්ගේ නිරෝධයට පූර්වභාගයෙහි නෙවසඤ්ඤානාසඤ්ඤායතන ක්‍රියා චිත්තය උපදනේසි. මේ

නෙවසඤ්ඤානාසඤ්ඤායතනචිත්තය සංඥායිමීවශ්ගෙන් හෙවත් සංඥාව ප්‍රධානකොට නෙවසඤ්ඤානාසඤ්ඤායයි කියේ නම්වූදු ඒ චිත්තයෙහි යෙදුනාවූ අවශෙෂ එකුන්තිස් ධම්හා චිත්තයද "නෙවඵසෙසා නාඵසෙසා නෙවවෙදනා නාවෙදනා නනවිත්තං නාචිත්තං" යනාදීන් සියලු ධම්යන්ගේ පදභාදතයුතුයි. මේ සතර අරූපාවචර විපාක ධම්යෝ සතර අරූතලයෙහි මුත් අන්කිසි භූමියෙක්හි නුපදිත්. රූපාවචර ධ්‍යානයන්ගේ විතර්කාදී අඞ්ගයන් ඉක්මවා මතු මතු ධ්‍යාන උපදවන්නාක්මෙන් මේ අරූපධ්‍යානයෝ සතරදෙන නුපදනාහුය. මේ අරූප ධ්‍යානයන්වනාහි කිසුණු ඉගුළු අඟසඟ, එහි පැවති විඤ්ඤාණ, එහි විඤ්ඤාණයාගේ නත්ථිභාව ප්‍රඥප්තිය ඒ නත්ථිභාව ප්‍රඥප්තියෙහි උපදවන්නාවූ ආකිඤ්ඤායතන කුශල චිත්තය යන සතරදෙන යථාක්‍රමයෙන් අරමුණුවෙති.

එහෙයින්:—

"ආරම්මණානිකඤ්ඤමතෝ චතසෙසාපි භවන්ති වා,
අඞ්ගානිකඤ්ඤමමෙතාසං න ඉච්ඡන්ති ථෙරාවිනො."

යනු පුරාතන අර්ථකථාචාරීන්ගේ මතය බැවින් එක එක අරමුණ ඉක්මවා යාම මේ අරූප ධ්‍යානයන්ගේ ලක්ෂණයි.

එහෙයින් ඡපපටාචාරීන් විසින්:—

"අසුවිමහි ඉණඩපෙ ලඝෙහා
එකො තනනිස්සිතො පරො;
සිතසෙසඤ්ඤා ඔහිනිසසාය,
තන්නිසසායවා පරො."

යන්නෙන් ඒ සතර අරූපාවචරයන්ගේ ආලම්බන විභාගය දක්වනලදී. විඤ්ඤානඤ්චායතන කුශල චිත්තය උපදවන්නාවූ යොගාවචරයා විසින් උපපාදඛ්ණි භඞ්ගසඞ්ඛ්‍යාත ක්ෂණත්‍රයකින් යුක්තවූ ආකාසානඤ්චායතන කුශලචිත්තය "විඤ්ඤාණං අනන්තං විඤ්ඤාණං අනන්තං" යනුවෙන් උපපාදනඞ්ග සඞ්ඛ්‍යාතවූ කෙළවරක් නැත්තාවූ විඤ්ඤාණයයි කුමක්හෙයින් භාවනා වඩන්නේදයත්? විඤ්ඤාණය උපපාදඛ්ණි භඞ්ගසඞ්ඛ්‍යාත ක්ෂණත්‍රයකින් යුක්තවුවද ඝානඝන නාමය ඝානීහූ කෙරෙහි ආරොපණය කොට ඝානූ පවාරවශයෙන් විඤ්ඤාණං අනන්තං විඤ්ඤාණං අනන්තං සි කියනලදී." මවා උකකුඨිං කරොනති" යන උදාහරණයෙහිමෙන් මෙහිහු ඉල්වීරඛ්ඩ ගසත්. එහෙයින් "මිච" ශබ්ද

යෙන් මවයෙහි හොත්තාවූ පුරුෂයෝ ශබ්දකරන්නාහයි අසීඝන්තාක්මෙනි. ඒ අරූපාවචර දෙලොස් චිත්තය සොළස කඛත්තුකත්තය, සුඛිත එකකනය, පවිපද එකකනය, වතු ආරම්මණ එකකනය, ඝන මොවුන්ගේවශයෙන් ගුණිත කළකල්හි අනෙක ප්‍රකාරවෙත්. සොළසකඛත්තුකත්තය යනු දුකඛාපවිපද දන්ධාභිඤ්ඤුවෙහි ආරම්මණ එකෙක, සත රෙක, දුකඛාපවිපද ඛිපපාභිඤ්ඤුවෙහිද ආරම්මණ එකෙක සතරෙක, සුඛාපවිපද දන්ධාභිඤ්ඤුවෙහිද ආරම්මණ එකෙක සතරෙක, සුඛාපවිපද ඛිපපාභිඤ්ඤුවෙහිද ආරම්මණඑකෙක සතරෙකැයි, මෙසේ සොළසකඛත්තුකනය ආදිකොට ඇත්තාවූ අභිභායතන විමොක්ෂයන්ගේවශයෙන් ලැබෙන පරිද්දෙන් දතයුත්තේයි. රූපාවචරයෙහි කීහයින් මේ අරූපාවචර චිත්තයෙහිද කුශලයන් කෙරෙහි ලැබෙන්නාවූ ප්‍රභෙදය අනුනාධිකවශයෙන් විපාක ක්‍රියායෙහිද ලැබෙන්නේයයි දතයුතුයි.

අරූපාවචර විභාගය නිමියේයි.

ලොකොත්තර චිත්තයෙහි කෙතෙක් චෛතසිකයන් ලැබෙන්නේදැයි ප්‍රශ්නකළේවිනම් කාමාවචර මහාකුශලචිත්තයට කී අටතිස් ධර්මයගෙණ ඔවුන් අතුරෙන් අප්‍රමාණ්‍යදෙදෙන උඩරණයකොට අවශෙෂ සතිස ලැබෙන්නේයයි කියයුතුයි. ප්‍රථම ඛ්‍යානය විතීය ඛ්‍යානය තෘතීය ඛ්‍යානය චතුර්ථඛ්‍යානය පඤ්චම ඛ්‍යානය ඝන ධ්‍යාන පසින් යෙදුනාවූ ලොකොත්තර චිත්තයෝ අවදෙනද, සොම්නස් උපෙක්ෂාවන්හි පළමුකී මහග්ගත චිත්තය ආශ්‍රයකොටගෙණ නොලැබෙන්නාවූ චෛතසිකයන් උඩරණය කටයුත්තේයි. සත්විසි මහග්ගත චිත්තයන් හා ලොකොත්තර චිත්තයෝද මිශ්‍රකොට ප්‍රශ්නකළේවිනම් එකොළොස් ප්‍රථම ඛ්‍යාන චිත්තයෙහි අටතිස් චෛතසික කෙතෙක්ද, විතීය ඛ්‍යාන එකොළොසෙහි ඒ අටතිස් චෛතසිකයන් අතුරෙන් විතක්කය උඩරණයකොට අවශෙෂ සත්තිසද, තෘතීය ඛ්‍යාන එකොළොසෙහි විතක්ක විචාර දෙදෙන උඩරණයකොට අවශෙෂ සතිස් චෛතසිකයෝද, චතුර්ථ ඛ්‍යාන එකොළොසෙහි විතක්ක, විචාර, ප්‍රීති, තුණ උඩරණයකොට අවශෙෂ පන්තිසද, පඤ්චම ඛ්‍යාන චිත්තයෙහි විතක්ක විචාර ප්‍රීති අප්‍රමාණ්‍ය දෙදෙනය ඝන පස උඩරණයකොට අවශෙෂ තෙතිස් චෛතසිකයද ලැබෙන්නේයයි විසඳිය යුත්තේයි. ලොකොත්තර චිත්තයෙහි ත්‍රිවිධ විරතීහු එකාකාර

යෙන් ලැබෙන්නේයි. සියලු ශොභන චිත්තයන් එක්කොට නොලැබෙන්නාවූ චෛතසික මේයයි දැන සුදුසු පරිද්දෙන් උඩරණයකොට කියයුත්තේයි. ශොභන සිත් හා අශොභන සිත් එක්කොට කෙතෙක් චෛතසික ලැබෙන්නේදැයි ප්‍රශ්න කෙළේවිනම් දෙපණස් චෛතසිකයම්ම බහා නොලැබෙන්නාවූ ධම්මේ මේයයි විසඳියයුත්තේයි. නොලැබෙන්නාවූ ධම්මේ උඩරණය කරණ ක්‍රමය මෙසේයි. දෙසැටක් සොම්නස් සහගත චිත්තයෙහි දෙපණස් චෛතසිකයන් අතුරෙන් දෙස, ඉස්සා, මච්ඡරිය, කුක්කුච්ච, විචිකිච්ඡා, යන පස උඩරණයකොට අවශෙෂවූ සත්සාළිස් ධම්මය ලැබෙන්නේයයි විසඳියයුතුයි. උපෙක්ඛාසහගත පස්පණස් චිත්තයෙහි කෙතෙක් චෛතසිකයෝ ලැබෙන්නාහුදැයි ප්‍රශ්නකෙළේවිනම් පිති, දෙස, ඉස්සා, මච්ඡරිය, කුක්කුච්ච, යන පස උඩරණයකොට අවශෙෂවූ සත්සාළිස ලැබෙන්නේයයි විසඳියයුතුයි. උපෙක්ඛා සහගත පස් පණස් චිත්තයෙහි කෙතෙක් චෛතසිකයෝ ලැබෙන්නාහුදැයි ප්‍රශ්න කෙළේවිනම් පිති, දෙස, ඉස්සා, මච්ඡරිය, කුක්කුච්ච, යන පස උඩරණයකොට අවශෙෂවූ සත්සාළිස ලැබෙන්නේයයි විසඳියයුතුයි. මොහ මූලික දෙසිතය, අහිරික දෙසිතය, යන සතර චිත්තය එකතුකොට කෙතෙක් චෛතසික ලැබෙන්නේදැයි ප්‍රශ්නකෙළේවිනම් විතක්ක, විචාර, විචිකිච්ඡා, අකුශල සාධාරණ සතරදෙනය, යන මෙතෙක් ධම්මෝ නොලැබෙන්නේයයි විසඳියයුතුයි. මේ එකුන් අනූවක් චිත්තයන් අතුරෙන් දෙපණස් චෛතසිකයම ලැබෙන්නාවූ සිත් පස කවරහුදැයි ප්‍රශ්නයක් කෙළේවිනම් පළමුවෙනි මහාකුශල් දෙසිතය, පළමුවෙනි අකුශල චිත්තය, පළමුවෙනි දෙස මූලික චිත්තය, විචිකිච්ඡා සහගත චිත්තය, යනමේ පවසඅෙහි දෙපණස් චෛතසිකය ලැබෙන්නේයයි කියයුතුයි. නියත අනියතවශයෙන් චෛතසිකයන්ගේ ලැබීම කෙසේදැයි ප්‍රශ්නයක්කෙළේවිනම් "ඉස්සාමච්ඡරකුක්කුච්ච" යනාදී ගාථාව මෙතෙහිකොට සියලුකල්හි නොයෙදෙන්නාවූ අනියත චෛතසිකමේයයි කියයුතුයි. ඊෂ්‍යාවය, මාත්සර්‍යය, කෞක්‍රත්‍යය, සම්මාවාචා, සම්මාකම්මන්ත, සම්මා ආජීව කරුණා, මුදිතා, මාන, දිට්ඨ, මිද්ධ, යන එකොළොස් දෙන අතුරෙන් ඉස්සා, මච්ඡරිය, කුක්කුච්ච, යන තුන්දෙන මෙෂ මූලික චිත්තය උපදින සියලුකල්හි නූපදින්නාහුමය. අනුන්ගේ සම්පත්තියට රවා බලන්නාවූකල්හි මෙෂය හා ඊෂ්‍යාවද, තමාගේ සම්පත්තිය සඟවනු කැමතිකල්හි මෙෂය හා මාත්සර්‍යයිද, කළාවූ දුශ්චරිත හා නොකළාවූ සුචරිතයන් අතු

රෙන් යම්කිසිවක් මෙනෙහිකොට පසුතැවෙනකල්හි වෙෂය හා කෙෂක්‍රත්‍යයද වෙන් වෙන්ව උපදනාහෙයින් මේ ධර්මයෝ අනියතනම්වෙත්. විරති චෛතසිකයෝ තුන්දෙනාද සියලු කාමාවචර කුශල චිත්තයෙහි එකාන්තයෙන් නොලැබෙන්නේ මැයි. ආජීවඨමක සීලසමාදානයෙහි හෝ පව, අඹ, දස, සීල සමාදානයක හෝ එක එක විරතිය එක එක ශික්ෂාපදය පිළි බඳව උපදනා කාමාවචර කුශලචිත්තයෙහි උපදනේයි. ලොකොත්තර චිත්තයෙහි පමණක් ඒ ඒ මාර්ගයෙන් වර්ජ්‍යවූ ක්ලෙශයන්ට ඇතුලත්වූ විරතීහු ඒ ඒ මාර්ග චිත්තක්ෂණයෙහි ලැබෙත් මැයි. එහෙයින් විරතීහු අනියතයයි කියත්. කරුණා මුදිතා යන අප්‍රමාණ්‍යයෝ දෙදෙනාද සප්‍රීතික ධ්‍යානචිත්තයක හෝ කාමාවචර කුශලචිත්තයක හෝ කාමාවචර ක්‍රියා චිත්තයක හෝ දුකසිත සුඛිත සත්වයන් අරමුණුකිරීම්වශයෙන් පවත්නා කල්හිම ලැබෙත්. සෙසු කාමාවචරාදී චිත්තයෙහි නොලැබෙත් මැයි. එහෙයින් අප්‍රමාණ්‍යයෝද අනියතනම්වෙත්. මානචෙතසිකයද ලොභ මූලික දෘෂ්ටි විප්‍රයුක්ත චිත්තයක්පාසා සියලුකල්හි නොලැබේමැයි. ඒ ලොභ මූලික දෘෂ්ටි විප්‍රයුක්ත චිත්තය හිත මානය සදිසමානය ප්‍රණීතමානය යන යම්කිසි මානයක්හුගේ වශයෙන් පවත්නාකල්හී ඒ චිත්තයෙහි සමහර කලෙක්හිම මානය ලැබෙන්නේමැයි. ඉස්සා, මච්ඡේර, කුක්කුච්ච, විරති, කරුණා, යන ශබ්ද හා සමග "නා නා" ශබ්දය මුත් කදාචි ශබ්දය නොයෙදෙයි. මාන ශබ්දය හා කදාචි ශබ්දය මුත් නා නා ශබ්දය නොයෙදෙයි. පින චෛතසිකය හා මිඩ චෛතසිකයද සියලුම් සසංඛාරික චිත්තයක් පාසා නොලැබෙන්නේමැයි. යම්කලෙක්හි චිත්ත චෛතසිකයන්ගේ හැකිලීමක් ඇතිකල්හිම පින මිඩය ලැබෙන්නේමැයි. එහෙයින් සහ ශබ්දය සමග කදාචි ශබ්දයද පින මිඩ දෙදෙනා සමග මුත් මානය හා නොයෙදෙයි. නොහොත් ඉස්සා, මච්ඡේර, කුක්කුච්ච, විරති, කරුණා යන ධර්මයන් හා කදාචි ශබ්දය හා නා නා ශබ්දයද සුදුසු පරිද්දෙන් යෙදෙන්නාහුමැයි. මානචෛතසිකය හා කදාචි ශබ්දයම යෙදෙයි. පින මිඩ ශබ්දදෙදෙනා හා සමග සහ ශබ්දය හා කදාචි ශබ්දයත් යෙදෙන්නේමැයි. ඉස්සා, මච්ඡරිය, කුක්කුච්ච, විරති, කරුණා චෛතසිකයෝ තුමූ වෙන වෙනම කදාචි ශබ්දය සමගද නා නා ශබ්දය සමගද යෙදෙන්නාහුවෙත්. මාන චෛතසික තෙමේ කදාචි ශබ්දය හා සමගම යෙදෙන්නේයි. පින මිඩ ශබ්දයෝ තුමූ කදාචි ශබ්දය හා සමගද සහ ශබ්දය හා සමගද යෙදෙන්නාහුවෙත්. නා නා ශබ්දය සමග නොයෙදෙන්නාහුවෙත්, නොහොත්

පීන මිඩ දෙදෙනා සසඞ්ඛාරික පවත්තියෙහි යෙදෙන්නේයසි කියේ නම්‍මුදු දෝස මූලික සසංඛාරික චිත්තය උපදනාකල්හි චිත්ත චෛතසික ධර්මයන්ගේ හැකිලීම හා අනුන්ගේ සම්පත්තියට ඊර්ෂ්‍යාකිරීමද යනමේ කාරණා තුණ එක්වූකල්හි පරිඝසම්ප්‍රයුක්තවීමට හෙතුවක්ද චිත්ත චෛතසික ධර්මයන්ගේ හැකිලීම ක්ද අනුන්ගේ සම්පත් ආදියට ඊර්ෂ්‍යාකිරීමක්ද එකවිට ඇති කල්හි දෝස මූල සසඞ්ඛාරික චිත්තයෙහි පීන මිඩ දෙදෙනා හා ඊර්ෂ්‍යාවද යෙදෙන්නේයි. මෙසේ යෙදෙනකල්හි පීන මිඩ ශබ්දය සම්ගද ඉස්සා ශබ්දය සම්ගද සහ ශබ්දය සම්ගද යෙදෙන්නේයි. "ඉස්සා, පීන, මිඩ" යන වෛතසිකයෝ තුන්දෙන මෙම මූලික සසඞ්ඛාරික චිත්තයෙහි සම්හර කලෙක යෙදෙන්නාහුවෙත්. සම්හර කලෙක තුන්දෙනම නොයෙදෙන්නාහුවෙත්. සම්හර කලෙක පීන මිඩ දෙදෙන පමණක් යෙදෙන්නාහුවෙත්. සම්හර කලෙක ඊර්ෂ්‍යාව පමණක් යෙදෙන්නේය. සම්හර කලෙක මේ ධර්මයෝ තුන්දෙනම යෙදෙන්නාහුවෙති. සම්හර කලෙක තුන් දෙනම් නොයෙදෙන්නාහුවෙති. එහෙයින් මේඛාථාවෙහි ආවාවූ "කදාචි, නා නා, සහ" යන නිපාත ශබ්දයෝ තුන්දෙන සුදුසු පරිද්දෙන් යොදාගතයුත්තාහුය. "ඉස්සා, පීන, මිඩ" තුන්දෙන හට යම් ක්‍රමයක් දක්වනලද්දේනම් "පීන, මිඩ, මච්ඡරිය" තුන් දෙනහටද "පීන, මිඩ, කුක්කුච්ච, යන තුන්දෙනහටද යෙදිය යුත්තේයි. ලෝභ මූලික දිට්ඨි විප්‍රයුක්ත සසඞ්ඛාරික චිත්තවයෙහි "පීන මිඩය" හා "මානය"ද සම්ග "සහ" ශබ්දය හා "නා නා" ශබ්දය "කදාචි" ශබ්දයද තුන් ආකාරයකින් ලැබෙන ක්‍රමය දෝස මූලික සසඞ්ඛාරික චිත්තයටකී නයින් යොදාගතයුතුයි. "ඉස්සා, මච්ඡරිය, කුක්කුච්ච," මාන" යනමේ චෛතසික සතර දෙන හා සම්ග පීන මිඩය යෙදෙන්නාවූකල්හි ඒ සතර චෛත සිකයන් හා සම්ග නානා ශබ්දයද ඒ ඒ චිත්තය හා සම්ග කදාචි ශබ්දයද යෙදෙන්නාවූ ක්‍රමය සුදුසු පරිද්දෙන් යොදාගතයුතුයි. ලොකොත්තර චිත්තයෙහි අප්‍රමාණයෝ දෙදෙන කුමක්හෙයින් නොයෙදෙන්නාහුද යත්? ලොකොත්තර චිත්තයෝ අවදෙන වනාහි නිබ්බාණය අරමුණුකෙරෙත්. අප්‍රමාණය ධර්මයෝවනාහි සත්ත්වප්‍රඥප්තිය අරමුණුකෙරෙත්. මෙසේ ආලම්බණනානත්වය හෙතුකොටගෙණ ලොකුත්තර චිත්තයෙහි අප්‍රමාණයෝ නොයෙදෙන්නාහුයයි දතයුතුයි. සත්ත්වයි මහග්ගත චිත්තයන් අතුරෙහි විරතීහු කුමක්හෙයින් නොයෙදෙන්නාහුදයත්? මහග්ගත චිත්තයෝවනාහි කසිණාදී ප්‍රඥප්තිය අරමුණුකෙරෙති. ලොකුත්තර චිත්තයෙහි යෙදෙන්නාවූ විරතීහු නිබ්බාණය අරමුණු

කෙරෙහි. ලෞකික චිත්තයන් අතුරෙන් විරති චෛතසිකයන් ලැබෙන්නාවූ ලෞකික චිත්තයෝ ඒ ඒ ව්‍යතික්‍රම වස්තූන් අරමුණුකොට පවත්නාහුවෙති. එහෙයින් ඇතැම් කාමාවචර චිත්තයෙක්හිම ලෞකික විරතීහු ලැබෙන්නාහුයයි දතයුතුයි. නොහොත් මහග්ගත කුසල චිත්තයෝ තුමූ කාමාවචර කුශලයන්මෙන් කායකම්ම වචීකම්මයෝ තදඞ්ගප්‍රහාණවශයෙන් නොනැසියහැකිවෙති. ලොකොත්තර චිත්තයන්මෙන් දුශ්චරිත දුරාජීවයන් සමුච්ඡේද ප්‍රහාණවශයෙන් නොනැසිය හැකිවෙයි. එහෙයින් මහග්ගත චිත්තයෙහි විරතීහු නොලැබෙන්නාහුමැයි. අප්‍රමාණ්‍යයෝ දෙදෙන වනාහි ප්‍රථම ධ්‍යාන ද්විතීය ධ්‍යාන තෘතීය ධ්‍යාන චතුර්ථ ධ්‍යානයන් අතුරෙන් එකී එකී ධ්‍යාන චිත්තයෙහි අප්‍රමාණ්‍යයෝ දෙදෙන එකවිට නොලැබ එක එක චිත්තයෙහි එක එක අප්‍රමාණ්‍ය ධර්මය කුමක්හෙයින් ලැබෙන්නේද යත්? සතළිස් කර්මස්ථානයන් අතුරෙන් මෛත්‍රාකරුණා භාවනාදෙක හැර අවශෙෂවූ අටතිස් කර්මස්ථානයන්ගෙන් උපදවන්නාවූ ප්‍රථම ධ්‍යානාදියෙහි කිසිකලෙකත් අප්‍රමාණ්‍යයෝ නොලැබෙත්මැයි. දුක්ඛිත සත්වයන් කෙරෙහි අප්‍රමාණ්‍යවශයෙන් වඩන්නාවූ කරුණා භාවනාව හෙතුකොටගෙණ උපදනා ධ්‍යාන චිත්තයෙහි කරුණා චෛතසිකය මුත් මුදිතා චෛතසිකය නූපදනේයි. අප්‍රමාණවූ සුඛිත සත්වයන් කෙරෙහි මුදිතාභාවනා වඩන්නාවූ යොගාවචරයාහට උපදනා ප්‍රථම ධ්‍යාන චිත්තයෙහි මුදිතා චෛතසිකය මුත් කරුණා චෛතසිකය නූපදනේයි. මේ අප්‍රමාණ්‍යයෝ දෙදෙන වනාහි ලෞකික උපෙක්ඛා සහගත චිත්තයෙහි ලැබෙන්නාක්මෙන් පඤ්ච ධ්‍යාන මහග්ගත චිත්තයෙහි කුමක්හෙයින් නොලැබෙන්නේද යත්? අප්‍රමාණවූ අප්‍රමාණ්‍ය තෙමේ සොම්නසින් වෙන්ව කිසිකලෙක නොලැබෙනහෙයින් පඤ්ච ධ්‍යාන චිත්තයෙහි අප්‍රමාණ්‍ය නොලැබෙත්මැයි. ද්විතීය ධ්‍යාන චිත්තයෙහි කුමක්හෙයින් විතර්කය නූපදනේදයත්? "භාවනාබලෙන නූපපජ්ජති" යනු අටුවා බැවින් භාවනාවෙහි පුරුදුකිරීම්වශයෙන් විතර්කය නූපදනේයයි දතයුතුයි. භාවනාවෙහි පුරුදුකිරීම කෙසේවන්නේදයත්? රූපාවචර ප්‍රථම ධ්‍යානලාභීවූ කාමාවචර රූපාවචර ත්‍රිහෙතුක පුද්ගලයෙක් තෙමේ මාවිසින් අතිශයින් නොලබනලද්දාවූ උතුම් ගුණධර්මයක් ලබන ලද්දේයයි ඒ ධ්‍යානයට නැවත නැවත සම්මැදී ඒ ධ්‍යානයෙහි ඇත්තාවූ සංස්කාර ධර්මයන් සම්මර්ශනය කොට එහි යෙදුනාවූ විතර්කාදි ධ්‍යානාඞ්ග පඤ්චකය අතුරෙන් පළමුකොට විතර්කය ප්‍රත්‍යවෙක්ෂාකරන්නාවූ විජියක, විචාරය ප්‍රත්‍ය

වෙක්ඛාකරන්නාවූ පීතියත, ප්‍රීතිය ප්‍රත්‍යවෙක්ඛාකරන්නාවූ පීතියත, සුඛය ප්‍රත්‍යවෙක්ඛාකරන්නාවූ පීතියත, එකාග්‍රතාව ප්‍රත්‍යවෙක්ඛාකරන්නාවූ පීතියත, තැවත ඒ ධ්‍යානාඞ්ග පඤ්චකය ප්‍රත්‍යවෙක්ඛාකරන්නාවූ පීතියකැයි මෙසේ චිත්ත පීති උපදවමින් ප්‍රත්‍යවෙක්ඛාකොට තදනන්තරව තෘතීය ධ්‍යානය උපදවනු කැමති කල්හි ප්‍රථම ධ්‍යානයෙහි ආදීනව දැක නොහොත් කාමච්ඡන්ද නීවරණ නැමති සතුරෙක් ආක්‍රමණයෙහි ඇත්තේය, චිත්තකීර්ති නැමති ඖදාරික අඞ්ගයකින් යුක්තවන්නේය. එහෙයින් මේ ඖදාරිකවූ ධ්‍යානාඞ්ගය හැර ධ්‍යානාඞ්ග චතුෂ්කයකින් සම්පූර්ණවූ තෘතීය ධ්‍යානය ලැබූයේනම් යෙහෙකැයි සිතා තෘතීය ධ්‍යානයට කාරණාවූ පෘථිවි තුදුස් කසිණස්ථානයන් අතුරෙන් තමහට අභිමතවූ යම්කිසි කමටහනක් භාවනා වඩා අඞ්ගචතුෂ්කයකින් යුක්තවූ තෘතීය ධ්‍යානය ලබන්නේයි. එහෙයින් "භාවනාබලෙන නුපපජ්ජති" යනු කිහ. ලෝකොත්තර චිත්තයෙහි වනාහි "සොතාපත්ති මග්ගෙන හි දිට්ඨත සමුප්පන්න විචිකිච්ඡා සහගතානි පවත්තකුසල චිත්තානි අනවසෙසෙන පහීයන්ති" යනු සංඛෙපවණ්ණනාවෙහි බැවින් සොතාපත්තිමාර්ගය කරණකොටගෙණ දිට්ඨත සම්ප්‍රයුක්ත සිත්සතරය, විචිකිච්ඡා සහගත චිත්තයයන චිත්තයන් පස්දෙන නිරවශෙෂවසයෙන් නසත්. අවශෙෂ අකුශල චිත්තයන් සත්දෙනාගේ අපායගමනීය ශක්තියෙන්යුක්තවූ අනාදිමත් සංසාරයෙහි රැස්කරණලද්දවූ ගණන පථානික්‍රමනවූ අපරාපරිය අකුශල කර්මරාශිය නසන්නේයි. "සකදාගාමිමග්ගෙන දිට්ඨත විපයුත්තානි වෙදෙමනස්ස සහගත චිත්තානිවෙති" යනු සංඛෙපවෘත්තිකා වචන බැවින් දිට්ඨත විප්‍රයුක්ත සිත්සතරය, වෙෂ මූලික දෙසිතය යන මේ අකුශලයන් සත්දෙනාගේ කාම ධාතුවෙහි උපදවා යාවජ්ජ භවඞ්ග ඖදාරික විපාක දියහැකිවූ කර්මශක්තිය තුනීකරන්නේයි. "අනාගාමිමග්ගෙන කාමරාග ව්‍යාපාදථිනමිද්ධ උද්ධච්චකුක්කුච්චා අනවසෙස වසෙන පහීයන්ති" යනු එම පිකා බැවින් දිට්ඨවිප්‍රයුක්ත සතරය, දෙමනස්ස සහගත දෙසිතය යනසදෙන අනවශෙෂ ප්‍රහාණයෙන්ද දිට්ඨගත විප්‍රයුක්ත සතරදෙනාගේ කාමරාගයෙන් යුක්තවූ කොටස්ද නිරවශෙෂයෙන් ප්‍රහාණයකෙරේ. "අරහත්ත මග්ගෙන චත්තාරි දිට්ඨත විපයුත්තානි උද්ධච්ච සහගත චිත්තඤ්ච අනවසෙසවසෙන පහීයන්ති" යනු පිකා බැවින් රූපරාග, අරූපරාග, මාන, උද්ධච්ච, අවිජ්ජා, යන උඩමහාගිය සංයොජන පඤ්චයෙහිවූ යටමාගීත්‍රයෙන් තුනීකරණලද්දවූ දිට්ඨගත විප්‍රයුක්ත සතරය, උද්ධච්ච සහගත චිත්තය යන මේ චිත්තයන් පස්දෙන නිරවශෙෂවසයෙන් නසන්නේයි. මේ සතර

මාර්ග චිත්තයන්ට අනන්තරව ඒ ඒ මාර්ග චිත්ත වීථියෙහි උපදනා ඵලචිත්තයෝ සතරදෙනෙක්ම ඒ ඒ මාර්ගයෙන් නසන ලද්දාවූ අකුශලයන් නිරවශේෂවසයෙන් ප්‍රහාණයකොට ඒ මාර්ගයන්ගේ හා ඵලයන්ගේද අතරතුර ඇසිපිය හෙලන කාලයක් පමණ කුදු අතරක් නොදී නික්ම ප්‍රාප්තයන්ට ඵල සිත් තුණක්ද මැද ප්‍රාප්තයන්ට ඵල සිත් දෙකක්ද උපදනාහුය. ඒ උපදනා ඵල චිත්තයන්ට ආනන්තරික සමාධියයි ව්‍යවහාර කෙරෙත්. මේ මනුෂ්‍ය ශරීරයෙන්ම නිවන් සැප විඳිනාහෙයින් ඒ ඵල චිත්ත යට වඩා උතුම්වූ සැපයක් භවත්‍රයෙහිම නැත්තේයයි දත යුතුයි. මේ ලොකොත්තරයෙහි ක්‍රියා සිත් නැත්තේ කුමක්හෙයි නයත්? "මග්ගස්ස එකචිත්තක්ඛණිකත්තා" යනු අට්ඨා බැවින් නැසියයුතු ගම්කිලි වෘක්ෂයකට එකම අසනිප්‍රහාරයක් වැදී මෙන් ඒ වෘක්ෂයාගේ යට මූලාග්‍රය දක්වා එකක්ෂණිකවම විනා ශවනාහෙයින් නැවත ඒ වෘක්ෂයට අසනි ප්‍රහාරයවැදීමෙන් නැසියයුත්තක් නැත්තේයි. එපරිද්දෙන්ම මාර්ගචිත්තයෙන් නැසුවාවූ ක්ලේශයන්ගේ නැවත නැවතත් නැසියයුත්තක් ඇත් තාහුවෙත්නම් නැවත නැවත උපදනා ලොකොත්තර මාර්ග චිත්තයෝ ක්‍රියා සිත්බවට පැමිණිය යුත්තාහුය. එබඳු නැසීමක් නොවනහෙයින් ගම්කිලි උතුම් වෘක්ෂයක් ලැබුවාවූ පුරුෂයෙකු විසින් ඒවෘක්ෂය බලමින් ප්‍රීති සැප විඳින්නාක්මෙන් මාර්ග ඵලලාභීවූ ආර්‍යයන්වහන්සේ දිට්ඨධම්ම සුඛවිහාරය පිණිස ඵල සමාපත්තියට සමවැදීමමුත් ක්‍රියාචිත්තයන්ගේ ඉපදීමෙක් නැතැයිදතයුතුයි. ලොකොත්තර මාර්ග චිත්තයවනාහි සතරමාර්ගය හා සම්ප්‍රයුක්තවිමිශ්‍රයෙන් සතරාකාරවන්නේ නමුදු සුඤ්ඤත අප්පණිහිත ප්‍රතිපදාදීන්ගේවශයෙන් ගුණිතකළකල්හි අනෙක ප්‍රකාරවන්නේයි. හේ කෙසේ යත්? සුඤ්ඤත සෝතාපත්තිමාර්ගය අප්පණිහිත සෝතාපත්ති මාර්ගය යන දෙකින් ගුණිතකරණලද්දාවූ සෝතාපත්ති මාර්ගය, දුක්ඛාපටිපදා ඛිප්පාභිඤ්ඤා, දුක්ඛා පටිපදා දන්ධාභිඤ්ඤා, සුඛාපටිපදා ඛිප්පාභිඤ්ඤා, සුඛාපටිපදා දන්ධා භිඤ්ඤා, යන සතර ප්‍රතිපදාවන්ගෙන් සුඤ්ඤත අප්පණිහිත සෝතාපත්ති මාර්ගවය, වෙන වෙනම ගුණිතකළකල්හි සෝතා පත්ති මාර්ගචිත්තයෝ අටදෙනෙක්වෙත්. ඒ මාර්ග චිත්තයෝ අට දෙන පළමු කී සුඤ්ඤත අප්පණිහිත සෝතාපත්ති මාර්ගචිත්තවය එක්කරගත්කල්හි සෝතාපත්ති මාර්ග චිත්තයෝ දසදෙනෙක් වෙත්. ඒ දසදෙන සම්පධානය, සම්‍යක් ප්‍රධානය, ඍර්ද්ධි පාදය, ඉන්ද්‍රිය, බලය, බොජ්ඣඞ්ගය, සච්චය, සමථය, විදර්ශනාය, ලොකුත්තර ධර්මය, සකන්ධය, ආයතනය, ධාතුය, ආහාරය,

එසඝය, වෙදනාඝය, සඤ්ඤාඝය, චෙතනාඝය, චිත්තඝය යනමේ එකුන් විසි අතිනිවෙසයන් කරණකොටගෙණ ගුණිතකළකල්හි එක් සිය අනූවක් සොතාපත්ති මාගී චිත්තයෝවෙති. ඒ එක්සිය අනූ වෙහි පළමුකී සොතාපත්ති මාගීදඝය යෙදූකල්හි දෙසියයෙක් වෙත්. ඒ සොතාපත්ති මාගී දෙසියය ඡන්ද, චිත්ත, විරිය, වීමංස, යන අධිපති ධර්ම සතරින් ගුණිතකළකල්හි අටසියයෙක් වෙත්. ඒ අටසියයක් ශ්‍රොතාපත්ති මාගී චිත්තයන්ට අධිපතීන් හා මිශ්‍රනොවූ පළමුකී දෙසියය එක්කළකල්හි සොතාපත්ති මාගීචිත්තයෝ දහසෙක්වෙති. මේ මාගී දහස්දෙන තානාධිමුක්තිකවූ දහසක් ආඝ්‍යීයන්ටමුත් එක් ආඝ්‍යීයෙක්හට දෙසි තක් නොලැබිය හැකිවෙයි. එතකුදුවුවත් සොතාපත්ති මාගී චිත්තයෙහි ප්‍රභෙද බැවින් දහසක් නසින් ප්‍රතිමණ්ඩිතවූ සොතා පත්තිමාගීඝයි කියත්. ඝකෘදගාමි අනාගාමි අර්හත් යන මාගීත්‍ර යෙහිද මෙසේම නය දහස බැගින් ලැබිය යුතුහෙයින් සතර මාගීයෙහි නය සාරදහසක් ලැබෙන්නාහුය. ඒ සාරදහසක් නය ක්‍රමය සම්මාදිට්ඨි සම්මාසඞ්කප්ප සම්මාවාචා සම්මාකම්මන්ත සම්මා ආජීව සම්මාවායාම සම්මාසති සම්මාසමාධි යන **ආඝ්‍යී** අෂ්ටාඞ්ගික මාර්ගීයන්ගේ ලෝභයෙන් අවශිෂ්ටවූ කෙලෙශයන්ගෙන් නිර්මුක්ත යාමය. ලෝභයෙන් අවශිෂ්ටවූ අකුශල චිත්තයන්ගෙන් නිර්මුක්ත යාමය. අකුශල මූලත්‍රයෙන් නිර්මුක්තයාමය. සම්ප්‍රයුක්ත ධර්ම සහිතවූ කාමාදී චතුරාශ්‍රවයන්ගෙන් නිර්මුක්තයාමය යනමේ පස ප්‍රකාරවූ නිර්‍යාණිකාර්ථයෙන් ගුණිතකළකල්හි ඒ සතරමාගී යෙහි විසිදහසක් නය ලැබෙන්නාහුය. තැවත ඒ සාරදහසක් මාගී චිත්තය ප්‍රථම ධ්‍යානයෙහි යෙදුනාවූ විතර්ක, විචාර, ප්‍රීති සුඛ එකාග්‍රතා ඵස්පර්ශ යන ධ්‍යානාඞ්ග පඤ්චකයෙන් ගුණිතකළ කල්හි නය විසිදහසෙක්වෙත්. තැවත ඒ මාගීචිත්තයන් සාර දහසම සඒසංග්‍රාහිකවූ ධ්‍යානාඞ්ග පඤ්චකයෙන් ගුණිතකළකල්හි විසිදහසක් නය ක්‍රමයෝ ලැබෙන්නාහුවෙත්. මේ ත්‍රිවිධ ක්‍රම යන් අතුරෙන් ප්‍රථම ධ්‍යානයෙහි යෙදුනාවූ ධ්‍යානාඞ්ග පඤ්ච යාගේ වශයෙන් යෙදීම ශුෂ්ක විදර්ශීකයන්ගේවශයෙන්ද, සඒ සංග්‍රාහික ධ්‍යානාඞ්ග පඤ්චයාගේවශයෙන් යෙදීම සමථයානික යන්ගේ වශයෙන්ද ගතයුත්තේයි. මෙසේ ආඝ්‍යී අෂ්ටාඞ්ගික මාර්ගීයන්ගේ පඤ්චප්‍රකාර නිර්‍යාණිකාර්ථයන්ගේවශයෙන් විසිදහ සෙක, ශුෂ්කවිදර්ශීකයන්ගේ ප්‍රථම ධ්‍යානයෙහි යෙදුනාවූ අඞ්ග පඤ්චකයන්ගේවශයෙන් විසිදහසෙක, සමථයානිකයන්ට ලැබිය යුතුවූ සඒසංග්‍රාහික ධ්‍යානාඞ්ගයන්ගේවශයෙන් විසිදහසෙකැයි යනමේ නෙවිසි දහස එක්කොටගත්කල්හි සතර මාගීයෙහි

ලැබියයුතුවූ නාම සැටදහස සවව විහඬහයෙහි ආ ක්‍රමයෙන් ලැබෙන්නාහුයයි දතයුතුයි. කැඩපතින් මුඛ නිමිත්ත බලන්නාවූකල්හි මුඛයෙහි ඇත්තාවූ සියලු අවයව පෙණෙන්නාක්මෙන් සතරමාඟී චිත්තයන්ගේ ප්‍රතිබිම්බවූ සතරඵල චිත්තයෙහිද සැටදහසක් නාය ලැබියයුතුහෙයින් මාඟඵල චිත්තයන් අට දෙනාගේ එක්ලක්ෂ විසිදහසක් නයක්‍රමයෝ සුදුසු පරිද්දෙන් යොදාගතයුත්තාහුය. ඒ එක්ලක්ෂ විසිදහසක් නය ක්‍රමයෝ තුමූ සත්විසි මහගහන චිත්තයෙහි ලැබියයුතු සතිස්තවකහන්ගේවශයෙන් හා කාලදෙශ සන්තානාදීන්ගේවශයෙන්ද, ගුණිතකලකල්හි මාඟඵල චිත්තයන්ගේ සංඛ්‍යාම අනන්තාපරිමාණවෙයි. එවද මේ මාඟඵල චිත්තයෝ අටදෙන විතකාදි ධ්‍යානාඞග පචකයෙන් ගුණිතකලකල්හි මාඟී චිත්තයෝ විසිදෙනෙක්ද, ඵලචිත්තයෝ විසිදෙනෙක්දැයි සමසාළිස් මාඟඵලසිත් කෙනෙක්වෙත්. පළමුවෙන් දක්වනලද්දවූ සංක්ෂෙප පුඩුවෙහි එකුන් අනුවක් චිත්තය මඛ්‍යම පුඩුවයයි කියනලද්දවූ එකසිය විසිඑකක්විමට හෙතුව මේ මාඟඵල චිත්තයන්ගේ වැඩිමයි. ඒකෙසේවන්නේද යත්? පාදකඛ්‍යානය සම්මසිත ධ්‍යානය පුඵඵලඛ්‍යානාභඛ්‍යානය යනමේ තුන්දෙනා අතුරෙන් එකතරා ධ්‍යානයක් හා සදෘශවන බැවින් ලොකොත්තර චිත්තයන් අට දෙනා අතුරෙන් එකී එකී චිත්තයෙහි ධ්‍යානාඞග පස පස බැගින් යෙදෙනහෙයින් ලොකොත්තර චිත්තයෝ සදෘසාළිස් දෙනෙක්වත්. පාදකඛ්‍යානය යනු කවර යත්? "පඨමජ්ඣානාදීසු යං යං ඣානං සමාපජ්ජිත්වා තතෝ තතෝ වුට්ඨාය සංඛාරෙ සම්මසනතාය වුඨාන ගාමිනී විපස්සනා පවත්තා තං පාදකජ්ඣානං නාම" යනු ටීකා බැවින් කම්ඨාන භාවනාවඩන්නාවූ සොඟාවචර පුඵඵල තෙමේ ප්‍රථම ධ්‍යානාදි පවම ධ්‍යානයන් අතුරෙන් යම්කිසි ධ්‍යානයකට සමවැද ඒ ධ්‍යානයෙන් නැගිට භෙත්‍ර භූමික සංඛාර ධර්මයන් අරමුණුකොටගෙණ "සබ්බෙ සඞඛාරා අනිච්චා සබ්බෙ සඞඛාරා දුක්ඛා සබ්බෙ සඞඛාරා අනත්තා" යනුවෙන් නැවත නැවත භාවනාවඩන්නාවූ ඒ යොගාවචරයාහට සෝවාන් ආදී මාඟඵලක් ලබනු කැමතිකල්හි ඒ සංඛාර ධර්මයන් අරමුණුකොටගෙණ මනොචාර වර්ජන චිත්තයක් ඉපිද මඳ ප්‍රාඥයාහට පරිකර්ම උපචාර අනුලොම ගොත්‍රභූ යන නමින් පුඵඵාභාග විදර්ශනා චිත්තයෝ සතරදෙනෙක් හෝ තික්ඛ ප්‍රාඥයාහට උපචාර අනුලොම ගොත්‍රභූ යන නමින් පුඵඵාභාග විදර්ශනා චිත්තයෝ තුන්දෙනෙක් හෝ ඉපිද පස්වෙනි හෝ සතරවෙනි හෝ චිත්තය සොතාපත්ති මාඟී චිත්තයවැ සවෙනි සත්වෙනි

චිත්තවය හෝ පස්වෙනි සවෙනි සත්වෙනි සිත් තුණ හෝ සෝතාපත්තිඵල සිත්වෙත්. මේ සෝතාපත්ති මාර්ග විථියෙහි සතර වරක් හෝ තුන් වරක් හෝ උපදනා පූර්වභාග විදර්ශනා චිත්තයන් අතුරෙන් අනුලෝම චිත්තයෙහි යෙදුනාවූ ප්‍රඥා චෛතසිකය වුත්ථානගාමිනී විදර්ශනාය, සංඛාරෝපෙක්ඛාඥානය, සච්චානුලෝමිකඥානය, ගෝත්‍රභූ ඥානය, යන නම් සතර කින් ව්‍යවහාරවෙයි. වුත්ථානගාමිනී විදර්ශනා සඛ්‍යාත පූර්වභාග විදර්ශනා චිත්තයට පළමු සමවන් ධ්‍යානය පාදකවෙයි. ඒ ලබන් නාවූ මාර්ගඵල චිත්තයෝද ඒ සමවන් ධ්‍යානයට බදු අඛ්‍යයන් ගෙන් යුක්තවම උපදනාහුය. එහෙයින් පාදක ධ්‍යානය යි ව්‍යවහාර කෙරෙත්. මාර්ගඵල ලබන්නාවූ සියලු ආර්ය්‍යයෝ තෙරුහු මිත සංඝස්කාර ධර්මයන් අනිත්‍ය දුඃඛ අනාත්ම යන ත්‍රිලක්ෂණයට ආරෝපණයකොට භාවනාවඩනකල්හි එක් ආර්ය්‍යයෙක්හට එක් ලක්ෂණයක්ම වැටහී මාර්ගඵලයන්ගේ ලැබීම සභාව ධර්මයක්වෙයි. බුදුවරයන්ට වනාහි සූක්ෂ්මතරය පුදුමල බැවින් අනිත්‍ය දුඃඛ අනාත්ම යන ලක්ෂණත්‍රයම එකවිට වැටහී සෝවාන් ආදී මාර්ගයන්ගේ පිළිවෙළින් අවීත් මාර්ගඵලාවබෝධය කෙරෙත්. ඒ අතීත්මාර්ග ඵලයෙහි දශබල චතුවෛශාරද්‍යඥානාදි සියලු සර්වඥගුණයෝ අන්තර්ගතවෙත්. අන්‍යවූ යම්කිසි ශ්‍රාවකයෙක් තෙමේ "අනිච්චං, දුක්ඛං, අනත්තං" යන ත්‍රිලක්ෂණ භාවනාව වඩා අනාත්මවශයෙන් දැක ආත්ම ග්‍රහණය මුදන්නී වේද, ඔහුට උපදනා මාර්ග විථියෙහි අනුලෝමසිත හා යෙදුනාවූ ප්‍රඥා චෛතසිකය සුඤ්ඤතානුපස්සනානම් විමොක්ෂමුඛය වෙයි. තදනන්තරව උපදනා මාර්ගඵල සුඤ්ඤත මාර්ගඵලම්වෙයි. ඊට අනතුරුව උපදනා ඵලයද සුඤ්ඤත ඵලය නම්වෙයි. ඒ මාර්ග ඵලයන්ට අරමුණුවන්නාවූ නිර්වාණ ධර්මයද, සුඤ්ඤත නිර්වාණයයි කියත්. තවත් ශ්‍රාවකයෙක් තෙමේ ත්‍රිලකුණු භාවනා වඩා සියලු ධර්මයන් අනිත්‍යවශයෙන් දැක විපල්ලාස නිමිත්ත මුදන්නීවේද, ඔහුට උපදනා මාර්ග විථියෙහි අනුලෝම සිත හා එක්ව යෙදුනාවූ ප්‍රඥා චෛතසික තෙමේ අනිමිත්තානුපස්සනා විමොක්ෂ මුඛය නම්වෙයි. ඊට අනතුරුව උපදනා මාර්ගඵල නිර්වාණ ධර්මයෝ තුමූ අනිමිත්ත මාර්ගය අනිමිත්ත ඵලය අනිමිත්ත නිර්වාණයයි ව්‍යවහාරයට යෙත්. තවත් ශ්‍රාවකයෙක්තෙමේ ත්‍රිලකුණු භාවනා වඩා සියලු සංඝස්කාර ධර්මයන් දුක්වශයෙන් දැක තෘෂ්ණාප්‍රණිධිය මුදන්නීවේද ඔහුට උපදනා මාර්ග විථියෙහි අනුලෝම සිත හා එක්ව යෙදුනාවූ ප්‍රඥා චෛතසික තෙමේ අප්පණිහිතානුපස්සනා විමොක්ෂ මුඛයනම්වෙයි. ඊට

අනතුරුව උපදනා මාර්ගඵල නිර්වාණ ධර්මයෝද අප්පණිහිත මාර්ග අප්පණිහිත ඵල අප්පණිහිත නිර්වාණයයි ව්‍යවහාරයටයෙත්. මෙසේ මාර්ග චිත්ත ච්ඡියෙහි යෙදෙන්නාවූ අනුලෝම සිත හා යෙදුනාවූ ප්‍රඥාවෛතසික තෙමේ වුට්ඨානගාමිනී විදර්ශනාව, සංඛාරෝපෙක්ෂා ඥානය, සච්චානුලෝමිකඥානය, අනුලෝමඥානය, යන නම් ලබන්නාක්මෙන්ම සුඤ්ඤතානුපස්සනා විමොක්ෂ මුඛය, අනිමිත්තානුපස්සනා විමොක්ෂමුඛය, අප්පණිහිතානුපස්සනා විමොක්ෂමුඛය, යන නම් ලබා ඒ හෙතුවෙන් මාර්ගඵල නිර්වාණ ධර්මයෝද ඒ ඒ නම් ලබන්නාහුයයි දතයුතුයි. යම් නගරයකට ඇතුල්වන්නාවූ මාර්ගයක් විවෘතවූකල්හී ඒ මාර්ගය කරණකොටගෙණ නිර්භයවූ ක්ෂේමවූ නගරාභ්‍යන්තරයට ඇතුල් වන්නාවූ පුරුෂයෙකුමෙන් මේ විදර්ශනා ඥානයෝ තුන්දෙන දෙරටු තුණක් බඳුහෙයින් විමොක්ෂ මුඛයෝයයි කියත්. සම්ම සිත ඛ්‍යානය යනු "යං යං ඛ්‍යානං සම්මසන්තස්ස සා පවත්තතා තං සම්මසිතඛ්‍යානං" යනු ටීකා වචන බැවින් ඛ්‍යානලාභිවූ යොගාවචර පුද්ගලයෙක් තෙමේ ප්‍රථම ඛ්‍යානාදීන් අතුරෙන් යම්කිසි ඛ්‍යානයක් අනිත්‍ය දුඃඛ අනාත්මවශයෙන් භාවනා වඩනකල්හී ඒ වුට්ඨාන ගාමිනී විදර්ශනාව පවත්නීද නොහොත් අනිත්‍යාදිවශයෙන් භාවනා වැඩීම හෙතුකොටගෙණ ඒඛ්‍යානය අනිත්‍යවශයෙන් හෝ දුක්වශයෙන් හෝ අනාත්මවශයෙන් හෝ වැටහී පරිකර්ම උපචාර අනුලෝම නොත්‍රභූ සංඛ්‍යාතවූ පූර්වභාග විදර්ශනා චිත්තයන් පවත්නාකල්හී අනුලෝම සිත හා සමඟ යෙදුනාවූ ප්‍රඥා වෛතසික තෙමේ වුට්ඨානගාමිනී විදර්ශනා නම්වෙයි. ඒ විදර්ශනාවගේ ඉපදීමට අනිත්‍යාදිවශයෙන් සම්මර්ශී නයකළ ඛ්‍යානය ඒ මාර්ගඵලයන්ට උපකාරවන බැවින් සම්ම සිත ඛ්‍යාන ආර්‍ය්‍ය පුද්ගලනම්වෙයි. "පුද්ගලඛ්‍යානශය ඛ්‍යානඤ" යනු "අහෝ! වත මෙ පඨමජ්ඣාන සදිසෝ මග්ගෝ පඤ්චඞ්ගිකෝ දුතියජ්ඣානාදීසු වා අඤ්ඤතර සදිසෝ චතුරඞ්ගිකාදි හෙදෝ මස්සෝ භවෙය්‍යාති" එවං යොගාවචරස්ස උපජ්ඣාසයෝ පුග්ගලජ්ඣාසයෝ නාම" යනු ටීකා බැවින් අෂ්ටසමාපත්තිලාභිවූ යම් යොගාවචරයෙක් තෙමේ ප්‍රතිණීක ධර්මයන් අනිත්‍යාදිවශ යෙන් සම්මර්ශනයකරනකල්හී අහෝ! මට ප්‍රථම ධ්‍යානයට බඳු පඤ්චාඞ්ගයකින් යුක්තවූ මාර්ගයක් ලැබුයේනම් යෙහෙක, විතීය ධ්‍යානය තෘතීය ධ්‍යානය චතුර්ථ ධ්‍යානය පඤ්ච ධ්‍යානයන්ට බඳුවූ අඞ්ගයන්ගෙන් යුක්තවූ මාර්ගයක් ලැබුයේනම් යෙහෙකැයි මෙසේ යොගාවචරයාට උපන් අදහස් පරිද්දෙන් ඒ ඒ ධ්‍යාන ශත්ව බඳුවූ අඞ්ගයන්ගෙන් යුක්තවූ මාර්ගය උපදී. මේ පුග්ග

ලජ්ඣාසය නම්වේයි. කම්සප්‍රානවඩ්ඪාවූ ධ්‍යානලාභීවූ යොගාවචර පුද්ගලයෙක් තෙමේ ප්‍රථම ධ්‍යානාදීවූ ධ්‍යානයන් පස් දෙනා අතුරෙන් යම් යම් ධ්‍යානයකට සමවදනේවේද ඒ ධ්‍යානයෙන් නැගිට තෙත්‍රිහුමක මිශ්‍ර සංසකාරයන් අනිත්‍යාදී වශයෙන් විදර්ශනාකොට ශ්‍රොතාපත්ති මාර්ගාදිය ලබන්නේවේද ඒ ලබනලද්දුවූ මාර්ග තෙමේ සමවන් ධ්‍යානයට බදු අධිෂ්ඨයන් ගෙන් යුක්තවන්නේයි. ඒ යොගී පුද්ගලයාහට විදර්ශනාවට පාදකවූ යම්කිසි ධ්‍යානයක් නැතිවම ප්‍රථම ධ්‍යානාදීන් අතුරෙන් යම්කිසි ධ්‍යානයක් අනිත්‍යාදිවශයෙන් විදර්ශනාකොට ශ්‍රොතාපත්ති මාර්ගාදිය ලබන්නේවේද ඒ ලබන්නාවූ මාර්ගය වශයෙන් අනිච්චාදිවශයෙන් විදර්ශනාකලාවූ ධ්‍යානයට බදුවූ අධිෂ්ඨානයෙන් යුක්තවූ මාර්ගයලබන්නේයි. ඒ යොගාවචර පුද්ගල තෙමේ ප්‍රථම ධ්‍යානාදීන් අතුරෙන් යම් ධ්‍යානයකට සමවැද ඒ සමවන් ධ්‍යානයෙන් නැගිට අභිමතවූ ධ්‍යානයක් අනිත්‍යාදී වශයෙන් විදර්ශනාකොට ලබන්නාවූ මාර්ග තෙමේ යොගී පුද්ගලයාගේ අදහස් පරිද්දෙන් ඒ පාදක ධ්‍යානයට හෝ සම්මර්ශනය කළ ධ්‍යානයට හෝ සමානවූ ධ්‍යානාධිෂ්ඨානයන්ගෙන් යුක්තවූ මාර්ගයලබන්නේයි. එබදු අදහසක් නැත්තාවූ යොගාවචර පුද්ගලයාහටවනාහි යට යට ධ්‍යානයට සමවැද ඒ ඒ ධ්‍යානයෙන් නැගිට මතු මතු ධ්‍යානයන් විදර්ශනාකෙරේද ඒ යොගාවචරයාහට ලැබෙන්නාවූ මාර්ගයවනාහි පාදක ධ්‍යානය අපෙක්ෂා නොකොට සම්මර්ශනයකළ ධ්‍යානයට බදුවූ මාර්ගය ලැබෙන්නේයි. මතු මතු ධ්‍යානයන්ට සමවැද ඒ ඒ ධ්‍යානයෙන් නැගිට යට යට ධ්‍යාන ධර්මයන් විදර්ශනාකෙරේද ඒ යොගාවචර පුද්ගලයාහට සම්මර්ශනයකළ ධ්‍යානය අපෙක්ෂා නොකොට සමවන් ධ්‍යානයට බදු අධිෂ්ඨානයන්ගෙන් යුක්තවූ මාර්ගය ලැබෙන්නේයි. ධ්‍යානලාභීවූ යොගාවචරයෙක් හෝ ධ්‍යාන නොලැබූ යොගාවචරයෙක් හෝ මාර්ගඵල ලබනු කැමතිකල්හි ඒධ්‍යානය නොසලකා තෙත්‍රිහුමක සංසකාර ධර්මයන් අනිත්‍යාදිවශයෙන් මෙනෙහිකරන්නාවූකල්හි ඔහුට ලැබෙන්නාවූ මාර්ගය ප්‍රථම ධ්‍යානයට බදු අධිෂ්ඨාන පසකින් යුක්තවම ලැබන්නේයි. තවද එකම යොගාවචර පුද්ගලයෙක්හට පාදකධ්‍යානවශයෙන් සෝවාන් මාර්ගය ද, සම්මර්ශිත ධ්‍යානවශයෙන් සකෘදාගාම් මාර්ගයද, පුද්ගලජ්ඣාශය ධ්‍යානවශයෙන් අනාගාම් මාර්ගයද, ශුෂ්කවිදර්ශකවශයෙන් රහත් මාර්ගයද, ඔහුගේ කැමති පරිද්දෙන් ලැබියහැකිවේ. සුඤ්ඤත අනිමිත්ත අප්පණිහිතවශයෙන් විමොක්ෂමුඛත්‍රයද, එසේම එකම ආර්ය්‍යපුද්ගලයාහට මාර්ගත්‍රයෙක්හි ලැබියහැකිවේයි.

එසේ ඒ සියලු මාගීඵලලාභීවූ ආර්‍යයෝ ඵලසමාපත්ති උපද වන්නාවූකල්හිද ඒ විමොක්ෂ මුඛත්‍රය ලබන්නාහුයි. එක්ආර්‍ය පුද්ගලයෙක්ගට එක් දවසක් ලැබෙන්නාවූ ඵලසමාපත්තිය සුඤ්ඤත විමොක්ෂ මුඛවශයෙන් ලැබ දෙවෙනි දවස්හි අනිමිත්ත විමොක්ෂ මුඛවශයෙන්ද, තුන්වෙනි දවස්හි අප්පණිහිත විමොක්ෂ මුඛ වශයෙන්ද නොහොත් එකම දවස්හි තුන්වරක් ඵලසමාපත්ති න්ට සමවදින්නාවූ ආර්‍යයන්වහන්සේ ඉදින් කැමතිවිනම් තුන්වරක් විමොක්ෂ මුඛත්‍රය ලැබියහැකිවෙයි.

මේ ලොකොත්තර චිත්තයන්ගේ විභාගයයි.

පදභාජනීය.

පන, අකුශල චෛතසිකයන්ගේ සම්ප්‍රයෝගයෙන් අන්‍යවූ ශොභන චෛතසිකයන්ගේ සම්ප්‍රයෝග ක්‍රමය දක්වම්:- සොභනෙසු, පස්විසි සොභන චෛතසිකයන් අතුරෙන්; සොභන සාධාරණා, සොභන සාධාරණවූ චෛතසිකයෝ; තාව, පළමු කොට; මයාවුච්චනෙන, යනු අඛ්‍යාහාරයි. එකූනවීසති ඉමේ චෛතසිකා, ශ්‍රද්ධාව ආදිකොට ඇත්තාවූ චිත්තොජ්ජුකතාව අව සන්කොට ඇත්තාවූ මේ එකුන්විසි චෛතසිකයෝ තුමූ; සබ්බෙ සුපි, සියලුම; එකූනසට්ඨිසොභන චිත්තෙසු, එකුන්සැටක් ශොභන චිත්තයෙහි; සංවිජ්ජන්ති, විද්‍යමානවෙත්; පන, ශොභන සාධාරණයන්ගෙන් අන්‍යවූ විරතීන් කියම්:—තිස්සොපි විරතියො, තුන්විරති චෛතසිකයෝ නොහොත් විරති චෛතසිකයෝ තුමූ; ලොකුත්තර චිත්තෙසු, ලොකොත්තර සිත් අටෙහි; සබ්බථාපි, ඒ ඒ දුශ්චරිත දුරාජීවයන් ප්‍රහාණයකිරීම්වශයෙන් පැවැත්තාවූ සියලු ආකාරවශයෙන්ද; නියතා, එකාන්තයෙන් හෙවත් සැමකල්හී; එකන්තොව, එකක්ෂණවශයෙන්ම; ලබ්භන්ති, ලැබියයුත්තාහුවෙති. පන, නියතයෙන් අන්‍යවූ අනියතය කියම්:—ලොකියෙසු, ලෞකිකවූ ශොභන සිත් සතළොස්දෙනා අතුරෙන්; කාමාවචර කුසලෙසෙව, කාමාවචර කුශල් සිත් අටෙහිම; කදාචි, කලින්කල; සන්දිස්සන්ති, ප්‍රකටව දක්නාලැබෙත්. විසුං විසුං, වෙන වෙනම; "ජායන්ති," යනු අඛ්‍යාහාරයි. පන, විරති චෛතසිකයන්ගෙන් අන්‍යවූ අප්‍රමාණ්‍ය චෛතසිකයන් කියම්. අපමඤ්ඤයො, අප්‍රමාණ්‍ය චෛතසිකයෝ තුමූ; වාදසසු, දෙළොස් වැදෑරුම්වූ; පඨමජ්ඣානවජ්ජිත මහග්ගත චිත්තෙසුවෙව, පඨමධ්‍යාන යන තම් ඇත්තාවූ චිත්තයන් තොර

කොට ඇත්තාවූ මහද්ගත චිත්තයෙහිද, කාමාවචර කුසලෙ සුඹ, කාමාවචර කුශල් අටෙහිද; සහෙතුක කාමාවචර ක්‍රියා චිත්තසුව, සහෙතුකවූ කාමාවචර ක්‍රියා චිත්තයෙහිද, ඉති, මෙසේ; අඤ්ඤති චිත්තසෙවම, අටවිසි චිත්තයෙහිම: කදාචි, කලින්කල; නානාඝුත්තා, වෙන් වෙන්ව; ජායන්ති, උපදිත්; (අහෙතුක කාමාවචර ක්‍රියා සිත් තුණක් ඇති බැවින් ඔවුන් නොගන්නා පිණිස සහෙතුක ශබ්දය යොදනලදී.) පන, විභජ්ජ වාදයෙන් අන්‍යවූ කෙව්වාදය දක්වම්:—එත්, මේ සොළොස් කාමාවචර ශොභන චිත්තයන් අතුරෙන්; උපෙක්ඛා සහගතෙසු, උපෙක්ඛා සහගත සිත් අටෙහි; කරුණාමුදිතා, කරුණාමුදිතා චෙතසිකයෝ තුමූ; නසන්තීති, නැත්තාහයි; කෙව්වදන්ති; ඇතැම් ආචාර්‍යවරයෝ කියත්. (අනුරුද්ධාචාරීන් විසින් පිළි නොගත් බැවින් කෙව්වාදයක්කෙළේසි. ඒවාදය මූලටීකාචාරීන්ගේ වාදයකි.) පන, අප්‍රමාණ්‍යයන්ගෙන් අන්‍යවූ පඤ්චේන්ද්‍රිය චෙතසිකය දක්වම්:-පඤ්ඤා, ප්‍රඥෙන්ද්‍රිය චෙතසිකය තෙමේ; වාදයසු සද්ධාණසම්පයුත්ත කාමාවචර චිත්තසුවෙව, ඥාන සම්ප්‍රයුක්තකුශල් සතරය, විපාක සතරය, ක්‍රියාසතරය යන දෙළොස් කාමාවචර ශොභන චිත්තයෙහිද; සබ්බසුපි, සියලුම; පවත්තිංස මහග්ගත ලොකුත්තර චිත්තසුවෙව, පන්තිස් මහග්ගත ලෝකුත්තර චිත්තයෙහිද; ඉති, මෙසේ; සත්තවත්තාළිස චිත්තසු, සත්සාළිස් චිත්තයෙහි; සම්පයොගං ගච්ඡන්ති, සම්ප්‍රයෝගයට යෙත්. ඉති, මෙසේ; තෙසං, ඒ ශොභන පස්විසි චෙතසිකයන්ගේ; චතුබ්බිධො, සතරවැදෑරුවූ; සම්පයොගො, සම්ප්‍රයෝග ක්‍රමය, වෙදිතබ්බො, දතයුත්තේසි.

එකූනවීසති ධම්මා, එකුන්විසි චෛතසිකයෝ තුමූ; එකූන සඞ්ඛ්‍යා, එකුන්සැටක් චිත්තයෙහි; ජායන්ති, උපදිත්; තයො ධම්මා, විරති චෛතසිකයෝ තුන්දෙන තුමූ; සොළස චිත්තසු, සොළොස් චිත්තයෙහි; ජායන්ති, උපදිත්; වයං, අප්‍රමාණ්‍ය චෛතසික දෙක; අඤ්ඤසතියං, අටවිසි චිත්තයෙහි; ජායති, උපදී; පඤ්ඤා, පඤ්ඤේන්ද්‍රිය චෛතසිකය; සත්තවත්තාළිස විධෙසුපි, සත්සාළිස් චිත්තයෙහිද; පකාසිතා, ප්‍රකාශකරණලද්දී; එවං, (ඨපිතාවුත්තනයෙන,) මේකියකලද ක්‍රමයෙන්; සොභනා, පස්විසි ශොභන චෛතසිකයෝ තුමූ; සොභනෙසෙව, ශොභන සිත් එකුන්සැවෙක්හිම; චතුධා, සතරාකාරයකින්; සම්පයුත්තා හොන්ති, සතරසම්ප්‍රයෝග ලක්ඛණයෙන් යෙදුනාහු වෙත්. ඉස්සාමච්ඡේර කුක්කුච්චවිරති කරුණාදයො, ඊර්ෂ්‍යාවය

මාතසය්‍යය, කෞකෘත්‍යය, විරතීහු තුන්දෙනය, කරුණා මුදිතා දෙදෙනය යනමේ චෛතසිකයෝ තුමූ; කදාචි, කලින්කල; නා නාජායනති, වෙන් වෙන්ව උපදිත්; මානොව, මානචෛතසික තෙමේද; කදාචි ජායති, කලින්කල උපදි. තථා, එපරිද්දෙන්; පීන මිඛං, පීන මිඛ චෛතසිකවය තෙමේ; සහ, එක්ව; කදාචි ජායති, කලින්කල උපදි. නොහොත් තථා, එපරිද්දෙන්; පීන මිඛං, පීන මිඛවය තොමේ; ඉස්සා මච්ඡර කුක්කුච්චෙකිව; ඊෂ්‍යා වය, මාතසය්‍යය, කෞකෘත්‍යය, යන චෛතසිකයන් සමඟද; මානෙනව, මානචෛතසිකය හා සමඟද; සහ, එක්ව; කදාචි ජායති; කලින්කල උපදි; යථාවුත්තානුභාවෙන, යම් යම් කියතලද ක්‍රමය අනුව යාමෙන්; එකාදස, එකොළොස් චෛතසිකයෝ තුමූ; අනියත යොගිනො, අනියතයොගී චෛතසිකයෝ නම්වෙත්; ගෙවත් එකානතයෙන් නොයෙදෙන්නාවූ චෛතසිකයෝ නම්වෙත්; සෙසා, අනියතයොගී එකොළොස් චෛතසිකයන්ගෙන් අන්‍යවූ එක්සාළිස් චෛතසිකයෝ තුමූ; නියත යොගිනො, නියතයොගී චෛතසිකයෝනම්වෙත්. ගෙවත් එකානතයෙන් යෙදෙන්නාවූ චෛතසිකයෝ නම්වෙත්. තෙසං, ඒ නියත යොගී අනියත යොගී චෛතසිකයන්ගේ; යථාරහං, සුදුසු පරිද්දෙන්; සඞ්ගහව, එක්කොට හකුළුවාගැනීම්ද නොහොත් ගණන්කිරීමද, ඉදානි, දැන්වනාඟි; අහං, මම; පවක්ඛාමි; ප්‍රභෙදවශයෙන් කියම්; අනුත්තරෙ, ලොකුත්තර චිත්තයෙහි; ඡත්තිංසාපි, සතිසක්වූද; ධම්මා, චෛතසික ධර්මයෝ; ලබ්භන්ති; ලැබිය යුත්තාහුවෙත්; මහග්ගතෙ, මහද්ගත චිත්තයෙහි; පඤ්ච සාපිධම්මා, පන්නිසක්වූද චෛතසික ධර්මයෝ; ලබ්භන්ති, ලැබිය යුත්තාහුවෙත්. කාමාවචර සොභනෙ, කාමාවචර ශොභන චිත්තයෙහි; අට්ඨතිංසාපිධම්මා, අටතිස් ප්‍රභෙදවූද චෛතසික ධර්මයෝ; ලබ්භන්ති, ලැබිය යුත්තාහුවෙත්; අපුඤ්ඤමහි, අකුශල චිත්තයෙහි; සත්තවීසතිපි ධම්මා, සත්විසක් ප්‍රභෙදවූද චෛතසික ධර්මයෝ. ලබ්භන්ති, ලැබිය යුත්තාහුවෙත්; අහෙතුකෙ, අහෙතුක චිත්තයෙහි; චාදසපිධම්මා, දෙළොස් ප්‍රභෙදවූද චෛතසික ධර්මයෝ; ලබ්භන්ති, ලැබිය යුත්තාහුවෙත්; ඉතිව, මෙසේම; යථාසම්භව යොගතා, සම්භවවූ පරිද්දෙන් යෙදීමෙන්; තත්‍ථ, ඒ ගණන; සමොධානා, සංග්‍රහක්‍රමයෙහි; පවඩා, පැස්ප්‍රකාරයකින්; සඞ්ගහො, සංග්‍රහකිරීම නොහොත් හකුලුවා පිඬුකිරීම; හොති, වෙයි.

සඞ්ගහො කථං? හොති, සංග්‍රහක්‍රමය කෙසේ වන්නේද යත්? ලොකුත්තරෙසු, ලොකුත්තර චිත්තයෙහි; තාව, පළමු

කොට; ''සඞ්ඛහෝ මයාවුච්චතෙ,'' යනු අඛ්‍යාහාරයි. අඤ්ඤ පඨ මජ්ඣානික චිත්තෙසු, අෂ්ට ප්‍රකාරවූ ප්‍රථම ඛ්‍යානය හා සම්ප්‍ර යුක්තවූ ලොකොත්තර චිත්තයෙහි; අඤ්ඤසමානා, අඤ්ඤසමාන නම් ඇත්තාවූ; තෙරස චෙතසිකා, තෙළෙස් චෛතසිකයෝද; අපපමඤ්ඤාවජ්ජිතා, අප්‍රමාණ්‍ය දෙදෙනවර්ජිතකොට ඇත්තාවූ; තෙවීසති සොභන චෙතසිකා, තෙවිස්සක් ශොභන චෛතසික යෝද; ඉති, මෙසේ; ඡත්තිංස ධම්මා, සතිස් චෛතසික ධම් කෙනෙක් තුමූ; සඞ්ඛහං, සංග්‍රහයට; ගච්ඡන්ති, යෙත්; තථා, එපරිදිදෙන්; දුතියජ්ඣානික චිත්තෙසු, ද්විතීය ඛ්‍යානය හා යුක්තවූ ලොකොත්තර සිත් අටෙහි; විතක්කවජ්ජා, විතකීය තොරකරණලද්දවූ; පවත්තිංස ධම්මා, පන්තිස් චෛතසික ධම් කෙනෙක් තුමූ; සඞ්ඛහං, සංග්‍රහකටයුතුබවට, හෙවත් සංග්‍රහ යට; ගච්ඡන්ති, යෙති. තතියජ්ඣානික චිත්තෙසු, තෘතීය ඛ්‍යානය හා යුක්තවූ ලොකොත්තර සිත් අටෙහි; විතක්ක විචාරවජ්ජා, විතකී විචාරයන් විසින් තොරකරණලද්දවූ; චතුත්තිංසධම්මා, සතිස් චෛතසික ධම්කෙනෙක් තුමූ; සඞ්ඛහං ගච්ඡන්ති, සංග්‍රහ බවටයෙත්. චතුත්ථජ්ඣානික චිත්තෙසු, චතුර්ථ ඛ්‍යානය හා යුක්තවූ ලොකොත්තර සිත් අටෙහි; පීතක්ක විචාර පිතිවජ්ජා, විතකී විචාර ප්‍රීතීන් විසින් තොරකරණලද්දවූ; තෙත්තිංස ධම්මා, තෙතිස් චෛතසික ධම් කෙනෙක් තුමූ; සඞ්ඛහං ගච්ඡන්ති, සංග්‍රහබවට යෙත්. පඤ්චමජ්ඣානික චිත්තෙසු, පඤ්චම ඛ්‍යානය හා යුක්තවූ ලොකොත්තර සිත් අටෙහිද; උපෙක්ඛා සහගතා, උපෙක්ඛාවෙදනාව හා එක්ව හටගත්තාවූ; තෙයෙව ධම්මා, ඒ චතුර්ථ ඛ්‍යානයෙහි යෙදෙන්නාවූ තෙතිස් ප්‍රභෙදවූ අන්‍ය සමාන සොභන චෛතසිකයෝම; සඞ්ඛයන්ති, සංග්‍රහවනුලැබෙත්. ඉති, මෙසේ; සබ්බථාපි, සම්ප්‍රකාරයෙනුදු, අඤ්ඤ ලොකුත්තර චිත්තෙසු, ලොකුත්තර සිත් අටෙහි; පඨමජ්ඣානවසෙන, පඨම ඛ්‍යානඅන්හේවශයෙන්; පඨමාව, පස්ප්‍රකාරයකින්ම; සඞ්ඛහෝ හොති, සංග්‍රහයවෙයි. ඉති, මෙසේ; තෙසු, ඒලොකුත්තර සිත් අටෙහි; පඨවිධෝ සඞ්ඛහෝ, පඨප්‍රකාරවූ සංග්‍රහක්‍රමය; වෙදිතබ්බෝ, දතයුත්තේදැ; "සඞ්ඛත" යන සිඟලු යන්හි "සඞ්ඛතෝ ගතා පවත්තා උපපන්නා" යනු අර්‍ථයි.

අනුත්තරෙ, ලොකොත්තර චිත්තයෙහි; සඞ්ඛහෝ, සංග්‍ර හක්‍රමය තෙමේ; යථාක්කමං, පිළිවෙළින්; ඡත්තිංසව, සතිසක් චෛතසිකයෝද, පඨමාව, පන්තිසක් චෛතසිකයෝද, චතුත්තිංසව, සූතිසක් චෛතසිකයෝද; තෙත්තිංසවචං, තෙතිස් චෛතසික යුගලයෙක්ද; ඉවෙවං, (ඉති එවං) මෙසේම; පවඩ්ඪිතා, පස්ප්‍රකාරයක්න් සිටියාහුය.

පන, ලොකොත්තර චිත්තයෙන් අන්‍යවූ මහද්ගත චිත්ත යෙහි සංග්‍රහනය දක්වම්:—මහග්ගතෙසු, සත්විසි මහද්ගත චිත්තයන් අතුරෙන්; තීසුපඨමජ්ඣානික චිත්තෙසු, තුන්ප්‍රකාර යෙන් ප්‍රථම ධ්‍යානයෙහි යෙදුනාවූ මහද්ගත චිත්තයෙහි; තාව, පළමුකොට "සඞ්ගහොමඅවුචචතෙ" යනු අධ්‍යාහාරයි. අඤ්ඤ සමානා, අන්‍ය සමාන නම් ඇත්තාවූ; තෙරසචෙතසිකා, තෙළෙස්චෙතසිකයෝද; විරතිත්තය වජ්ජිතා, විරති චෛතසිකත්‍රය විස්න් තොරකරණලද්දාවූ; වීසතී සොභන චෙතසිකාව, දෙවිසි ශොභන චෛතසිකයෝද; ඉති, මෙසේ; පඨමජ්ඣානවසෙන, ධ්‍යානාඞ්ගයන් පස්දෙනාගේවශයෙන්, පඨමාව, පස්පරිද්දක්ම්; සඞ්ගහෙ හොති, සංග්‍රහයවෙයි. ඉති, මේ උක්තප්‍රකාර යෙන්: තෙසු, ඒ සත්විසි මහග්ගත චිත්තයෙහි; පඨමාව, පස්වැදෑරුම්වූ; සඞ්ගහෙ, සංග්‍රහයඃවෙදිතබ්බා, දතයුත්තේයි.

පන, ලොකොත්තර චිත්තයෙන් අන්‍යවූ මහද්ගත චිත්ත යෙහි සංග්‍රහනය දක්වම්:—මහග්ගතෙසු, සත්විසි මහද්ගත චිත්තයන් අතුරෙන්; තීසුපඨමජ්ඣානික චිත්තෙසු, තුන්ප්‍රකාර යෙන් ප්‍රථම ධ්‍යානයෙහි යෙදුනාවූ මහද්ගත චිත්තයෙහි; තාව, පළමුකොට "සඞ්ගහොමඅවුචචතෙ" යනු අධ්‍යාහාරයි. අඤ්ඤ සමානා, අන්‍ය සමාන නම් ඇත්තාවූ; තෙරසචෙතසිකා, තෙළෙස්චෙතසිකයෝද; විරතිත්තය වජ්ජිතා, විරති චෛතසිකත්‍රය විස්න් තොරකරණලද්දාවූ; වීසතී සොභන චෙතසිකාව, දෙවිසි ශොභන චෛතසිකයෝද; ඉති, මෙසේ; පඨමජ්ඣානවසෙන, පන්තිස් චෛතසික ධර්මයෝ තුමූ; සඞ්ගහං ගචඡන්ති, සංග්‍රහ බවට යෙත්. පන, ඒ ප්‍රථම ධ්‍යානයෙහිම විශෙෂාර්ථයක් දක්වම්:—එසේ, මේ ප්‍රථම ධ්‍යාන මහද්ගත සිත් තුණෙහි තොහොත් මේ පන්තිස් චෛතසික ධර්මයන් අතුරෙන්; කරුණා මුදිතා, කරුණා මුදිතාවෝ දෙදෙන; පඨෙවකමෙව, වෙන වෙනම; යොජෙතබ්බා, යෙදියයුත්තාහුය, තථා, එපරිද්දෙන්; දුතියජ්ඣානික චිත්තෙසු, විතිය ධ්‍යානයෙන් යුක්තවූ මහද්ගත සිත් තුණෙහි; විතක්කවජ්ජා, විතකී චෛතසිකය විසින් වර්ජිත කරණලද්දාවූ; චතුත්තිංස ධම්මා, සූතිස් චෛතසික ධර්මයෝ තුමූ; සඞ්ගහං ගචඡන්ති, සංග්‍රහබවටයෙත්. තතියජ්ඣානික චිත්තෙසු, තෘතීය ධ්‍යානයෙන් යුක්තවූ මහද්ගත සිත් තුණෙහි, විතක්ක විචාර වජ්ජා, විතකී විචාරයන් විසින් වර්ජිතකරණ ලද්දාවූ; තෙත්තිංස ධම්මා, තෙතිස් චෛතසික ධර්මයෝ තුමූ; සඞ්ගහං ගචඡන්ති, සංග්‍රහයට යෙත්. චතුත්ථජ්ඣානික චිත්තෙසු, චතුර්ථධ්‍යානයෙන් යුක්තවූ මහග්ගත සිත් තුණෙහි; විතක්ක විචාර පීති වජ්ජා, විතකී විචාර ප්‍රීතීන් විසින් තොරකරණලද්දාවූ; ඔත්තිංස ධම්මා, දෙතිස් චෛතසික ධර්මයෝ තුමූ; සඞ්ගහං ගචඡන්ති, සංග්‍රහයටයෙත්. පන, විශෙෂාර්ථයක් දක්වම්:—නොහොත් සුඛික ක්‍රමයෙන් අන්‍යවූ මිශ්‍රිත ක්‍රමයක් දක්වම්:—පණ්ණරසසු, පසළොස් ප්‍රභෙදවූ; පඨමජ්ඣානික චිත්තෙසු, පඨම ධ්‍යානයෙන් යුක්තවූ චිත්තයෙහි; අපමඤ්ඤායො, අප්‍රමාණ ධර්මයෝ දෙදෙන, නලබිහන්ති, නොලැබිය යුත්තාහුවෙත්. ඉති, මෙසේ; සඞ්ඛ්‍යාපි, සංඛ්‍යාවෙන්ද, සත්තවීසති මහග්ගත චිත්තෙසු, සත්විසි මහග්ගත චිත්තයෙහි; පඨමජ්ඣානවසෙන, ධ්‍යානාඞ්ගයන් පස්දෙනාගේවශයෙන්, පඨමාව, පස්පරිද්දක්ම්; සඞ්ගහෙ හොති, සංග්‍රහයවෙයි. ඉති, මේ උක්තප්‍රකාර යෙන්: තෙසු, ඒ සත්විසි මහග්ගත චිත්තයෙහි; පඨමාව, පස්වැදෑරුම්වූ; සඞ්ගහෙ, සංග්‍රහයඃවෙදිතබ්බා, දතයුත්තේයි.

මහග්ගතෙ, මහද්ගත චිත්තයෙහි, සඞ්ඛෙහා, සංග්‍රහක්‍රමය තෙමේ; ඡථාකකමං, පිළිවෙළින්; පවතිංසව, පන්තිස් චෙතසිකකෙනෙක්ද, චතුත්තිංසව, සුතිස් චෙතසිකකෙනෙක්ද, තෙත්තිංසව, තෙතිස් චෙතසිකකෙනෙක්ද, ඛත්තිංසවෙව, දෙතිස් චෙතසිකකෙනෙක්ද, තිංසව, සමිතිස් චෙතසික කෙනෙක්ද, ඉති, මෙසේ; පවඛාව, පස් පරිද්දකින්ම; සීතා, සිවියාහුය.

පන, මහග්ගත චිත්තයෙහි සංග්‍රහක්‍රමයෙන් අන්‍යවූ කාමාවචර ශොභන චිත්තයෙහි සංග්‍රහ ක්‍රමය දක්වම්: කාමාවචර ශොභනයෙහු, සුවිසි කාමාවචර ශොභන චිත්තයන් අතුරෙන්; කුසලයෙහු, අටමහා කුශල චිත්තයෙහි; තාව; පළමුකොට "සඞ්ඛහෙ මියා වුච්චතෙ" යනු අඛ්‍යාහාරයි. පඨමවයෙ, පළමුවන මහා කුසල චිත්තවයෙහි; අඤ්ඤසමානා තෙරස චෙතසිකාව, අන්‍ය සමානතාවූ තෙළෙස් චෙතසිකකෙනෙක්ද, පවත්තිසති සොභන චෙතසිකාව, පස්විසි ශොභන චෙතසිකකෙනෙක්ද, ඉති, මෙසේ; අඤ්ඤා ධම්මා, අවතිස් චෙතසික ධර්මකෙනෙක් තුමූ; සඞ්ඛහං ගච්ඡන්ති, සංග්‍රහඛවට යෙත්. පන, ඒ කුශල චිත්තව යෙහිම විශෙෂාර්ථයක් දක්වම්. එත්ථ, මේ පළමුවෙනි මහාකුශල වයෙහි; නොභොන්ති අවතිස් චෙතසික ධර්මයන් අතුරෙන්; පවත්ති, පඛ්‍රකාරවූද; අපපමඤ්ඤාවිරතියා, අප්‍රමාණ විරතීහු; පවෙඛතමෙව, එක එකක්ම; යොජෙතඛ්බා, යෙදියයුත්තාහුය; තථා, එපරිද්දෙන්; දුතියවයෙ, දෙවෙනි මහාකුශලවයෙහි; ඤාණ වජ්ජිතා, ඤාණය විසින් තොරකරණලද්දාවූ; සත්තතිංස ධම්මා, සත්තිස් චෙතසික ධර්මකෙනෙක් තුමූ; සඞ්ඛහං ගච්ඡන්ති, සංග්‍රහඛවට යෙත්. තතියවයෙ, තුන්වන මහාකුශලවයෙහි; ඤාණසම්පයුත්තා, ඥානය හා සම්ප්‍රයුක්තවූ; පීතිවජ්ජිතා, ප්‍රීතිය විසින් තොරකරණලද්දාවූ; සත්තතිංස ධම්මා, සත්තිස් චෙතසික ධර්මකෙනෙක් තුමූ; සඞ්ඛහං ගච්ඡන්ති, සංග්‍රහඛවට යෙත්. චතුත්ථවයෙ, සතරවන මහා කුශලවයෙහි; ඤාණ පීති වජ්ජිතා, ඥාන ප්‍රීති දෙදෙන විසින් තොරතරණලද්දාවූ; තෙළෙව, ඒ සත්තිසක් ප්‍රභෙදවූ චෙතසිකයෝම; සඞ්ඛයාහන්ති, සංග්‍රහවනුලැබෙත්; ක්‍රියාවිත්තසුපි, මහාක්‍රියා සිත්අටෙහිද, විරතිවජ්ජිතා, විරති චෙතසිකයන් විසින් තොරකරණලද්දාවූ; තෙතෙව, ඒ පන්තිස් ප්‍රභෙදවූ චෙතසිකයෝම; තථෙව, ඒමහා කුශලචිත්තයට සදෘශවම; චතුසුපිදු කෙසු, සතර දුකයෙහිම; චතුඛාව, සතර පරිද්දකින්ම; සඞ්ඛයාහන්ති, සංග්‍රහවනුලැබෙත්; තථා, ඒක්‍රියාවිත්තයෙහි කීනයින්;

විපාකෙසුව, අටමහා විපාක චිත්තයෙහිද; අපපමඤ්ඤ විරති වජ්ජිතා, දෙවැදෑරුම් අප්‍රමාණය තුන් වැදෑරුම් විරතින් විසින් තොරකරණලද්දාවූ; තෙයෙව, ඒ තෙතිසක් ප්‍රභෙදවූ අන්‍ය සමාන ශොභන චෛතසිකයෝම; චතුසුපිදුනෙසු, සතර දුක යෙහිම; චතුධාව, සතරපරිද්දකින්ම; සඞ්ඛාරයනති, සංග්‍රහවනු ලබෙත්; ඉති, මෙසේ; සබ්බථාපි, සම්ප්‍රකාරයෙනුදු; චතුවිසති කාමාවචර සොභන චිත්තෙසු, සූවිසි කාමාවචර ශොභන චිත්ත යෙහි; දුකවසෙන, දුකයන්ගේවශයෙන්; වාදසධාව, දෙළොස් පරිදිදකින්ම; සඞ්ගහෙතා හොති, සංග්‍රහයවේයි. ඉති, මෙසේ තෙසු, ඒකාමාවචර ශොභන චිත්තයෙහි; වාදසවිධෝ, දෙළොස් වැදෑරුම්වූ; සඞ්ගහෙතා වෙදිතබ්බා, සංග්‍රහය දතයුත්තේයි.

සහෙතු කාමාවචර පුඤ්ඤපාක ක්‍රියාමහෙත, කාමාවචර කුසල්ය, සඅහතුක කාමාවචර විපාකය, සහෙතුක කාමාවචර ක්‍රියාය යනමේ චිත්තයෙහි නොහොත් චිත්තයන් අතුරෙන්; සුභෙ, අටමහාකුසල චිත්තයෙහි; අඨනිංසව, අටතිස් චෛතසික කෙනෙක්ද, සත්තනිංසවයච, සත්තිස් චෛතසික යුගලයෙක්ද, ඡත්තිංසකං, සතිස් චෛතසිකකෙනෙක්ද; භවෙ, වන්නේයි. ක්‍රියෙ, අටමහා ක්‍රියාචිත්තයෙහි; පචනිංස, පන්තිස් චෛතසිකකෙනෙක්ද; චතුත්තිංසවයං, සුත්තිස් චෛතසික යුගල යෙක්ද; තෙත්තිංසකං, තෙතිස් චෛතසිකකෙනෙක්ද; බත්තිංසවයං, දෙතිස්චෛතසික යුගලයෙක්ද, එකතිංසකං, එක්තිස් චෛතසිකකෙනෙක්ද; භවෙ, වන්නේයි. පාකෙ, අටමහා විපාක චිත්තයෙහි; තෙත්තිංස, තෙතිස් චෛතසිකකෙනෙක්ද; චත්තිංසවයං දෙතිස්චෛතසික යුගලයෙක්ද; එකතිංසකං, එක්තිස් චෛතසිකකෙනෙක්ද; භවෙ, වන්නේයි. එත්ථ, මේ ශොභන චිත්තයන් අතුරෙන්; ක්‍රියාසුව, අටමහා ක්‍රියාචිත්තයෙහිද; මහග්ගතව, සත්විසි මහද්ගත චිත්තයෙහිද; විරති, විරතිහු තුන්දෙන තුමූ; නවිජ්ජනති, විද්‍යමානනොවෙත්. අනුත්තරෙ, ලොකොත්තර සිත් අටෙහි; අපපමඤ්ඤ, අප්‍රමාණයෝ දෙදෙන තුමූ; නවිජ්ජනති, විද්‍යමාන නොවෙත්. තථා, එපරිද්දෙන්; කාමපාකෙ, අටමහා විපාක චිත්තයෙහි; චයං, අප්‍රමාණ විරති දෙදෙනාගේ සමූහ තෙමේ; නවිජ්ජති, විද්‍යමානනොවේ. අනුත්තරෙ, ලොකොත්තර චිත්තයෙහි, ඣාන ධම්මා, චිතකීර්‍ය ධ්‍යානාඞ්ග ධර්මයෝ තුමූ; විසෙසකා, ප්‍රභෙදකරන්නාහුය මජ්ඣිමේ, මහද්ගත සත්විස්සෙහි; ඣාන ධම්මාව, චිතකීර්‍ය ධ්‍යානාඞ්ග ධර්මයෝද, අපපමඤ්ඤව, අප්‍රමාණය ධර්මයෝද, විසෙසකා, ප්‍රභෙදකරන්නාහුවෙති. "අපපමඤ්ඤව" යන්තෙහි "ව" ශබ්ද

යෙන් ධ්‍යාන ධම්මෝද මෙතනට ඇදගන්නාහුවෙත්. පරිතෙනසු, සුම්සිකාමාවචර ශොභන චිත්තයෙහි; අපපමඤ්ඤාව, අප්‍රමාණ්‍ය චෛතසිකයෝද; විරති ඤාණ පීතිව, ත්‍රිවිධ විරතී හුය, ප්‍රඥෙන්ද්‍රියය, ප්‍රීතිය, යන මොහුදෝ විසෙසකා, ප්‍රභෙදකරන්නාහුවෙත්.

පන, කාමාවචර ශොභන චිත්තයෙහි සංග්‍රහ නයින් අන්‍යවූ අකුශල චිත්තයෙහි සංග්‍රහනය කියමි. අකුසලෙසු, අකුශල චිත්තයන් දෙලොස්දෙනා අතුරෙන්; ලොභමූලෙසු, ලොභ මූලික සිත් අටෙහි; තාව, පළමුකොට, සඛහෙතා මයාවුවවතෙ" යනු අඛ්‍යාහාරයි. පඨමේ අසඛ්ඛාරිකෙ, පළමුවන ලොභ මූලික අසඛ්ඛාරික චිත්තයෙහි; අඤ්ඤසමාන්‍යා, අන්‍ය සමාන නම් ඇත්තාවූ; තෙරස චෙතසිකාව, තෙළෙස් චෛතසිකයෝද; චිත්තාරොඅකුසල සාධාරණාව, අකුසල සාධාරණවූ චෛතසිකයෝ සතරදෙනද; ඉති. මෙසේ; සත්තාරස, සතළොස; ලොභ දිට්ඨි සඞ්ඛ්‍ය, ලොභ දෘෂ්ටීන් හා සමඟ; එකූනවීසති ධම්මා, එකුන් විසිවෙතසික ධම්මයෝ තුමූ; සඛහඞ්ගවජ්ජනති, සංග්‍රහයට යෙත්. තථෙව, ඒ පළමුවන අසඛ්ඛාරික චිත්තයමෙන්ම; දුතියෙඅසඛ්ඛාරිකෙ, දෙවෙනි ලොභ මූලික අසඛ්ඛාරික චිත්තයෙහි; ලොභ මානෙනසඞ්ඛ්‍ය, ලොභ මානයන් හා සමඟ; එකූනවීසති ධම්මා, එකුන්විසි චෛතසික ධම්මෝ තුමූ; සඛහඞ්ගවජ්ජනති, සංග්‍රහයට යෙත්. තථෙව, ඒ දෙවන අසඛ්ඛාරික චිත්තයමෙන්ම; තතියෙ, තුන්වන අසඛ්ඛාරික ලොභ මූලික චිත්තයෙහි; පිතිවජ්ජිතා, ප්‍රීතිය විරහිත් තොරකරණලද්දාවූ; ලොභ දිට්ඨි සහ, ලොභදෘෂ්ටීන් හා සමඟ: අඨාරස ධම්මා, අටලොස් චෛතසික ධම්මෝ තුමූ; සඛහඞ්ගවජ්ජනති, සංග්‍රහයට යෙත්. තථෙව, ඒ තුන්වන අසඛ්ඛාරික චිත්තයමෙන්ම; චතුත්ථෙ, සතරවැනිවූ; අසඛ්ඛාරිකෙ, අසඛ්ඛාරික ලොභ මූලික චිත්තයෙහි; ලොභමානෙන සහ, ලොභ මාන දෙදෙන සමඟ; අඨාරස ධම්මා, අටලොස් චෛතසික ධම්මෝ තුමූ; සඛහඞ්ගවජ්ජනති, සංග්‍රහයට යෙත්. පන, ලොභ මූලික අසඛ්ඛාරික චිත්තයන්ගෙන් අන්‍යවූ වෙන මූලික අසඛ්ඛාරික චිත්තය කියමි:—පටිඝසම්පයුත්තෙන, ප්‍රතිඝය හා සම්ප්‍රයුක්තවූ; පඨමේ අසඛ්ඛාරිකෙ, පස්වන අසඛ්ඛාරික චිත්තයෙහි; දොසාව, වෙන චෛතසිකයද, ඉස්සාව, ඊර්ෂ්‍යා චෛතසිකයද, මච්ඡරියව, මච්ඡරිය චෛතසිකයද; ඉති, මෙසේ; චතුඛිසඞ්ඛ්‍ය, සතර චෛතසිකයන් හා සමඟ; පිතිවජ්ජිතා, ප්‍රීතිය විසින් තොරකරණලද්දාවූ: තෙළෙවීසති ධම්මා, අන්‍ය සමාන අකුශල චෛතසිකා සඞ්ඛ්‍යාතවූ ඒ විසිධම්මෝම; සඛහඞ්ගහනති,

සංග්‍රහවනු ලැබේත්. පන, එහිම විශෙෂාර්ථයක්කියම්:—එසේ, මේ පස්වෙනි අසඞ්ඛාරික චිත්තයෙහි නොහොත් තත් සම්ප්‍රයුක්තවූ විසිධර්මයන් අතුරෙන්; ඉස්සාමච්ඡර කුක්කුච්චානි, ඉස්සාමච්ඡර කුක්කුච්ච චෛතසිකයෝ; පතිඑකමේව, එක එකක්ම; යොජෙතබ්බානි, යෙදියයුත්තාහුය; තථෙව, ඒ පස්වෙනි අසඞ්ඛාරික චිත්තයමෙන්ම; සසඞ්ඛාරික පවත්තෙ, සසඞ්ඛාරික සිත් පවෙසිද; පන මිඩ්ධෙන විසෙසෙත්වා, පින මිඩ්ධයෙන් වෙනස්කොට නොහොත් අසඞ්ඛාරික චිත්තයන්ට කී ධර්මයෙහි පින මිඩ්ධය බහා; යොජෙතබ්බා, යෙදියයුත්තාහුය: පන, ලොභ මූලික දෙස මූලික චිත්තයෙන් අන්‍යවූ මොහ මූලික චිත්තය දක්වම්; ඡන්ද පීති වජ්ජිතා, ඡන්ද ප්‍රීතින් විසින් තොරකරණලද්දුවූ; එකාදස අසාධාරණාව, එකොළොස් ප්‍රකාරවූ අන්‍ය සමාන නම් චෛතසිකයෝද, චිත්තාරෝ අකුසල සාධාරණාව, අකුශල සාධාරණතම්වූ අකුශල චෛතසිකයෝ සතරදෙනද, ඉති පණ්ණරස ධම්මා, මෙසේ පසළොස් චෛතසික ධර්මයෝ තුමූ; උඩ්ඩව සහගතෙ, උඩ්ඩව සහගත චිත්තයෙහි; සම්පයුජ්ජන්ති, සම්ප්‍රයෝගවනු ලැබෙත්. විච්ඡිච්ඡා සහගත චිත්තෙව, විචිකිච්ඡා සහගත චිත්තයෙහිද, තථෙව, ඒ උඩ්ඩව සහගත චිත්තයමෙන්ම; අධිමොක්ඛ විරහිතා, අධිමොක්ෂ චෛතසිකය විසින් තොර කරණලද්දුවූ; විචිකිච්ඡා සහගතා, විචිකිච්ඡාව හා එක්වගියාවූ: පණ්ණරස ධම්මා, පසළොස් චෛතසික ධර්මයෝ තුමූ, සමුපලබ්භන්ති, මොනවටලැබෙත්. ඉති, මෙසේ; සබ්බථාපි, වෙදනා භෙද සඞ්ඛාර භෙදයේ සම්ප්‍රකාරවූද; වාදසා කුසල චිත්තුප්පාදෙසු, දෙළොස් අකුශල චිත්තයෙහි; පචෙකං, වෙනවෙනම්; යොජියමානාපි, යෙදෙනලද්දාහුද; ගණන වසෙන, ගණන් වශයෙන්; සත්තධාව, සත්පරිද්දකින්ම, සඞ්ගහිතා භවන්ති, සංග්‍රහවන ලද්දාහුවෙත්. ඉති, මෙසේ; තෙසු, ඒ දෙළොස් අකුශල චිත්තයෙහි; සත්තවිධෙ, සත්වැදෑරුම්වූ; සඞ්ගහෙ වෙදිතබ්බා, සංග්‍රහයට දතයුතුයි. අකුසලෙසු, දෙළොස් අකුශල චිත්තයෙහි; සඞ්ගහා, සංග්‍රහ ක්‍රමයෝ තුමූ;

එකූනවීස, එකුන්විසි චෛතසික නොහොක්ද; අථාරස, අටළොස් චෛතසිකයෙනෙක්ද, වීස, විසිචෛතසිකයෙනෙක්ද, එකවීස, එක්විසිචෛතසිකයෙනෙක්ද, වීසති, නැවතත් විසිචෛතසිකයෙනෙක්ද, බාවීස, දෙවිසිචෛතසිකයෙනෙක්ද, පණ්ණරස, පසළොස් චෛතසිකයෙනෙක්ද, ඉති, මෙසේ; සත්තධා, සත්ප්‍රකාරයකින්; සීතා, සිටියාහුය; නොඋත් යෙදුනාහුය,

චත්තාරෝ සාධාරණාව, අකුශල සාධාරණ චෛතසික යෝ සතරදෙනෙක්ද, අපරෙ, ඡන්ද පීති අධිමොක්ෂ චෛතසිකයන්ගෙන් අන්‍යවූ; දසසමානාව, අන්‍ය සමාන චෛතසික යෝ දසදෙනෙක්ද, ඉති, මෙසේ; චුද්දස එතෙචෙතසිකා, ඒතුදුස් චෛතසිකයෝ; සබ්බාකුසලයොගිනො, සියලු අකුශල චිත්ත යන් හා යෙදීම් ඇත්තාහුයයි; පවුච්චන්ති, ප්‍රභෙදවශයෙන් කියනුලැබෙත්.

පන, අකුශල චිත්තයෙහි සංග්‍රහක්‍රමයෙන් අන්‍යවූ අහෙතුක චිත්තයෙහි සංග්‍රහ ක්‍රමය දක්වමි:—අහෙතුකෙසු, අටලොස් අහෙතුක චිත්තයන් අතුරෙන්; හසනචිත්තෙ, හසිතොත්පාද චිත්තයෙහි; තාව, පළමුකොට "සඞ්ඛහො මයා වුච්චතෙ" යනු අඞ්ගාහාරයි. හසන චිත්තෙ, හසිතොත්පාද චිත්තයෙහි; ඡන්දවජ්ජිතා, ඡන්දය විසින් වර්ජිතකරණලද්දාවූ; අඤ්ඤසමානා, අන්‍ය සමාන නම් ඇත්තාවූ, වාදසධම්මා, දෙලොස් ධර්මයෝ තුමූ; සඞ්ඛහං ගච්ඡන්ති, සංග්‍රහයටයෙත්. තථා, ඒ හසනචිත්තය මෙන්ම; වොට්ඨපනෙ, ව්‍යවස්ථාපන චිත්තයෙහි; ඡන්ද පීති වජ්ජිතා, ඡන්ද ප්‍රීතින් විසින් වර්ජිතකරණලද්දාවූ; අඤ්ඤ සමානා එකාදස ධම්මා; අන්‍ය සමාන නම් ඇත්තාවූ එකොළොස් චෛතසික ධර්මයෝ තුමූ; සඞ්ඛහං ගච්ඡන්ති, සංග්‍රහයට යෙත්. සුඛ සන්තීරණෙ, සොම්නස් සහගත සන්තීරණ චිත්තයෙහි; ඡන්ද විරියවජ්ජිතා, ඡන්දවීර්‍යයන් විසින් වර්ජිතකරණලද්දාවූ; අඤ්ඤ සමානාඑකාදස ධම්මා, අන්‍ය සමාන නම් ඇත්තාවූ එකොළොස් චෛතසික ධර්මයෝ තුමූ; සඞ්ඛහං ගච්ඡන්ති, සංග්‍රහයටයෙත් මනොධාතුතතිකා හෙතුක පටිසන්ධියුගලෙ, උපෙක්ඛාවජ්ජන සම්පටිච්ඡන යුගල සංඛ්‍යාත මනොධාතු ත්‍රිකය හා උපෙක්ඛාසන්තීරණවය සංඛ්‍යාතවූ අහෙතුක ප්‍රතිසන්ධි යුගලයෙහි, ඡන්ද පීති විරිය වජ්ජිතා, ඡන්ද පීති වීර්‍යයන් විසින් අනාරකරණලද්දාවූ; අඤ්ඤසමානා, අන්‍ය සමානවූ; දසධම්මා, දශචෛතසික ධර්මයෝ තුමූ; සඞ්ඛහං ගච්ඡන්ති, සංග්‍රහයට යෙත්. ඵපඨවිඤ්ඤාණ සංඛ්‍යාතවූ කුශලා කුශල චක්ෂුර්විඥානාදීවූ දසදෙනාකෙරෙහි; පකිණ්ණක චජ්ජිතා, ප්‍රකීර්ණක සැදෙන වර්ජිතකොට ඇත්තාවූ; තෙයෙව, ඒ සත්වැදෑරුම්වූ සජීවිත්ත සාධාරණ චෛතසිකයෝම; සඞ්ඛය්හන්ති, සංග්‍රහවනුලැබෙත් ඉති, මෙසේ; සබ්බථාපි, සර්ව්‍රප්‍රකාරයෙනුදු; අථාරසසු අහෙතුකෙසු, අටලොස් අහෙතුක චිත්තයෙහි; ගණනවසෙන, ගණන්වශයෙන්; චතුධාව, සතරපරිද්දෙකින්ම; සඞ්ඛහො හොති, සංග්‍රහයවෙයි.

ඉති, මෙසේ; තෙසු, ඒ අහෙතුක චිත්තයෙහි; චතුබ්බිධෝ, සතරාකාරවූ; සඞ්ගහෝ, සංග්‍රහය; වෙදිතබ්බෝ, දතයුත්තේයි.

අඨාරස අහෙතුකෙසු චිත්තුපපාදෙසු, අට්ලොස් අහෙතුක චිත්තයෙහි; වාදසව, දෙළොස් චෙතසිකකෙනෙක්ද; එකාදසව, එකොළොස් චෙතසිකයෙනක්ද; දසව දසචෙතසිකකෙනෙක්ද; සත්තව, සත්චෙතසිකකෙනෙක්ද; ඉති, මෙසේ; චතුබ්බිධෝ, සතරවැදෑරුම්වූ; සඞ්ගහෝ, සංග්‍රහය; වෙදිතබ්බෝ, දතයුත්තේයි. බලවත් අහෙතුකෙසු, සියලුම අට්ලොස් අහෙතුක චිත්තයෙහි; සත්ත, සප්ත චිත්ත සාධාරණ චෙතසිකයෝ සත්දෙන තුමූ; යුජ්ජන්ති, යෙදෙන්නාහුවෙත්. සෙසා, ඡඳ යෙන් අවශිෂ්ටවූ ප්‍රකීර්ණක චෙතසිකයෝ පස්දෙන තුමූ; යථාරහංයුජ්ජන්ති, යථාර්හයෙන් යෙදෙන්නාහුවෙත්. ඉති, මෙසේ; විත්තාරම්මණා, විස්තරවශයෙන්; තෙත්තිංසවිධ සඞ්ගහෝ, තෙතිස් ප්‍රභෙදවූ; සංග්‍රහක්‍රමය; මයා වුත්තෝ, මා විසින් කියනලද්දේයි. ඉත්ථං, (යථාවුත්ත හෙදෙන) ඍම් ඍම් කියනලද ප්‍රභෙදයකින්; චිත්තාසම්පයුත්තානං, චිත්තයෙහි නිරන්තරයෙන් යෙදෙන්නාවූ චෛතසිකයන්ගේ; චිත්ත පරිවෙජ්දවසෙන, සිත පිරිසිදීම්වශයෙන් හෙවත් වෙන්කිරීම්වශයෙන්; වුත්තං, කියනලද්දුවූ; සොළසවිධං, සොළොස් වැදෑරුම්වූ; සම්පයොගඤ්ච, සම්ප්‍රයොගය ද, චෛතසික රාසි පරිවෙජ්දවසෙන, චෛතසිකයන්ගේ රාශින් පිරිසිදීම්වශයෙන්, වුත්තං, කියනලද්දුවූ; තෙත්තිංස විධං, තෙතිස් වැදෑරුම්වූ; සඞ්ගහඤ්ච, සංග්‍රහය ද; ඤත්වා, දැන; යථායෝගං, යෙදෙන යෙදෙන පරිද්දෙන්; චිත්තෙනසමං, සිත හා සමවූ; නෙදං, ප්‍රභෙදය; උත්තියෙ, ප්‍රකාශකරන්නේයි.

අභිධම්මත්ථ සඞ්ගහෙ, අභිධර්ම සප්තප්‍රකරණයෙහි වදාළාවූ අර්ථයෝ සංක්ෂෙපයෙන් හැකිලුවාගත්හෙයින් අභිධම්මත්ථ සංග්‍රහ නම්වූ ප්‍රකරණයෙහි; චෙතසික සඞ්ගහ විභාගොනාම, චෛතසික සංග්‍රහ විභාග නම්වූ; දුතියෝ පරිවෙජ්දෝ, දෙවන පිරිසිදීම; ඉති සමත්තෝ, මෙසේ සම්පූර්ණවූ කරණලද්දේයි.

භාවය.

"විරතියොපන තිස්සොපි ලොකුත්තර චිත්තසු" යනාදී පාඨයෙහි අභිප්‍රායවෙදේයි:-සම්මාවාචා, සම්මාකම්මන්ත, සම්මාආජීව යන ත්‍රිවිධ විරතීහු සතරලොකොත්තර මාර්ග චිත්තයෙහි එකාන්තයෙන්සම්ප්‍රකාරයෙන් ලැබෙන්නාහුයයි කියාල්හි ඉදින් සෝවාන්

මාගීයෙන් සියලු දුශ්චරිත දුරුජීවයන් එකවිට නසන්නාහුතම් ඒ විරතීහු තුන්දෙන සෝවාන් මාගීයෙහි ලැබියයුත්තාහුය; තැවත සකෘදාගාමි ආදී මාගීත්‍රයෙහි කොසේලැබිය යුත්තාහුදැයි සංසයකටයුතුවෙයි. එහි සවභාවධර්ම මේසේයි:—සතර අපායෙහි ඉපදියයුතුවූ අනිශයින් ඔහුදුරකැවූ පණිවා ආදී සපත දුශ්චරිත යන් සෝවාන් මාගීයෙන් නැසියයුතුහෙයින් ඒ සොතාපත්ති මාගීචිත්තයෙහි යෙදෙන්නාවූ සත්තිස් බොධිපාක්ෂික ධර්මයන් අතුරෙන් සම්මාවාචා, සම්මාකම්මන්ත, සම්මාආජීව, යන මාර්ගඛන්ධත්‍රය විසින් නිරවශෙෂවශයෙන් අපායගමනීයවූ දුශ්චරිත දුරුජීවයන් එකක්ෂණයෙහි නසන බැවින් සප්ප්‍රකාරයෙන් සියලු විරතීහුම සෝවාන් මාගීයෙහි ලැබියයුත්තාහුය. තදනන්තරව සකෘදාගාමි මාගීක්ෂණයෙහිද කාමධාතුවෙහි උපදවා අඛණ්ඩවිසලවීම් දුක්ඛපත් භාවයට පැමිණීම් මනුෂ්‍යඝණවීම් ආදීවූ කාටුඝාවිඝාතදිය යුතුවූ අනොලාරිකවූ පණිවා ආදී සියලු දුශ්චරිත දුරුජීවයන් සකෘදාගාමි මාගීයෙහි යෙදුනාවූ සම්මාවාචාදී මාගීඛන්ධත්‍රයකරණකොට්ගෙණ සියලු දුශ්චරිත දුරුජීවයන් තුනීකිරීම්වශයෙන් ප්‍රහාණයකරත්. එහෙයින් සකෘදාගාමී මාගීයෙහිද සියලු විරතීහු එකක්ෂණයෙහි එකාන්තයෙන් ලැබියයුත්තාහුය. තදනන්තරව අනාගාමි මාගී චිත්තක්ෂණයෙහි උඩම්භාගිය සංයොජනයන්ට අයත්වූ දිඨිවිප්‍රයුක්ත සිත් සතර තුනීකිරීම්වශයෙන්ද, දෙම්නස් සහගත දෙසින නිරවශෙෂ ප්‍රහාණයකිරීම්වශයෙන්ද, අධොභාගිය සංයොජනයන්ට අයත්වූ අනොලාරිකවූ පණිවා ආදී සියලු දුශ්චරිත දුරුජීවයන් අනාගාමි මාගීයෙහි යෙදුනාවූ සම්මාවාචා ආදී මාගීඛන්ධත්‍රය කරණකොට්ගෙණ ප්‍රහාණයකරණ හෙයින් අනාගාමි මාගීයෙහිද සියලු විරතීහු ලැබෙත්මැයි. අර්හත්මාගී චිත්තක්ෂණයෙහි උඩම්භාගිය සංයොජනයන්ට අයත්වූ දිඨිවිප්‍රයුක්ත සිත් සතරය, උඩ්ඩච්චසහගත චිත්තය යන මේ සිත් පසට අයත්වූ අනිශයින් දුර්ලවූ පණිවා ආදී සියලු දුශ්චරිත දුරුජීවයන් අර්හත්මාගීයෙහි යෙදුනාවූ සම්මාවාචා ආදී මාගීඛන්ධත්‍රය කරණකොටගෙණ අර්හත්මාගීක්ෂණයෙහිද සියලු විරතීහු ලැබෙත්මැයි. "මෙසේ ලොකුත්තර චිත්තෙසු සබ්බථාපි නියතා එකතොව ලබ්භන්ති," යන පාඨයෙහි සම්පූර්ණ භාවාර්ථය දතයුතුයි. ලෞකික චිත්තයන් අතුරෙන් වසාගි කාමාවචර කුශලයෙහිම ඇතැම් කාලෙක්හි වෙන් වෙන්ව දක්නාලැබෙත් යයි යන පාඨයෙහි භාවය කෙසේ යත්? කාමාවචර කුශලයවනාහි දානාදී දශපුණ්‍ය ක්‍රියා වසතුවශයෙන් පවත්නාහු නමුදු දාන භාවනා ආදීවූ නවවිධ පුණ්‍ය ක්‍රියා වසතුවෙහි උපදනා

කාමාවචර කුශල චිත්තයෙහි එකද විරති ධර්මයක් නොලැබේ මැයි. ශීලමය පුණ්‍ය ක්‍රියාවස්තුවෙහිවනාහි "පාණාතිපාතාවෙර මණී" යන ශික්ෂාපදය සමාදන්වන්නාවූකල්හි උපදනා කාමාවචර මහාකුශල චිත්තවීථියෙහි සම්මාකම්මන්ත විරතීන් අතුරෙන් පාණාතිපාතා විරතිය ලැබේමැයි. "අදින්නාදානාවෙර මණී" යන ශික්ෂාපදය සමාදන්වන්නාවූකල්හි උපදනා කාමාවචර කුශල චිත්තවීථියෙහි එකම අදින්නාදානාවිරතිය ලැබේමැයි. කාමෙසුමිච්ඡාචාරා වෙරමණී සික්ඛාපදය සමාදන්වන්නාවූකල්හි උපදනා කාමාවචර කුශල චිත්ත වීථියෙහි කාමෙසු මිච්ඡාචාර විරතිය ලැබේමැයි. එසේම මුසාවාදාවෙරමණී, පිසුනාවාචාවෙර මණී, ඵරුසාවාචාවෙරමණී, සම්ඵප්පලාපාවෙරමණී, යන ශික්ෂා පද පස සමාදන්වන්නාවූකල්හි එක එක ශික්ෂාපදය අරභයා උපදනා කාමාවචර කුශල චිත්ත වීථි පවකයෙහි සතරාකාරවූ සම්මාවාචාවිරතිය හා සම්මාආජීව විරතියද, යථා ක්‍රමයෙන් ලැබෙත්. එහෙයින් "කාමාවචර කුසලෙසෙව කදාචි සන්දිස්සනති විසුං විසුං" යනු කිහ. මේ විරති ධර්මයෝ වනාහි මහාවිපාක මහාක්‍රියා මහග්ගත කුසල විපාක ක්‍රියා යන පවප්‍රකාර චිත්තයෙහි කුමක්හෙයින් නූපදනාහුද යත්? කාමාවචර විපාකයවනාහි විඤ්ඤත්ති සමුට්ඨාපක නොවන බැවින් හෙවත් කායික වාචසික ක්‍රියා නූපදවන බැවින් මහාවිපාක චිත්තයෙහි නොලැබෙත්මැයි. මහාක්‍රියා චිත්තයවනාහි අතීතමාගීයෙන් සියලු දුඃඛවිත දුරුජීව යන් සමූලෙඡද ප්‍රහාණයෙන් නැසුවාවූ බුදු පසේබුදු මහරහතුන්ට පමණක් ආවේණිකවූ සිත් බැවින් මහාක්‍රියා චිත්තයෙහි නොලැබෙත්මැයි. මේ විරතීහුවනාහි ශීලවිශුද්ධියෙහි ඇතුලත්වූ ධර්මයන් බැවින්ද, ශීලවිශුද්ධිය සම්පූර්ණකොට ඉක්බිති චිත්තවිශුද්ධි සඞ්ඛ්‍යාතවූ මහග්ගත චිත්තයන් උපදනා බැවින් සියලු මහග්ගත චිත්තයෝ තුමූ විරතීන්ගේ ඉපදීමට සර්වාත්මනාවෙස්මැයි. තවද කාමාවචර කුශල චිත්තයෙහි ලැබෙන්නාවූ විරතීහු මතු සප්ත කාම සඛගීයෙහි ඉපදවීමට හෙතුවන බැවින් කාමාවචර චිත්තයෙහි යෙදෙන්නාවූ විරතීහු අවිද්‍යා ප්‍රත්‍යයෙන් හටගන්නාවූ සංස්කාරයන්ට ඇතුළත්ව වාදසාඞ්ග ප්‍රතීත්‍ය සමුත්පාදයාගේ දෙවෙනි අඞ්ගයෙහි ඇතුළත්වෙති. සෝවාන් ආදී සතරමාගී යෙහි යෙදෙන්නාවූ සම්මාවාචාදි මාගීඞ්ගයෝ කුන්දෙන නියම්‍ය ණිකාඡී සඞ්ඛ්‍යාතවූ සසර කතර එතර කිරීමෙහි උපකාරවූ ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගික මාගී සත්‍යයෙහි ඇතුළත්වෙයි, එතකුදුවුවත් ලෞකික චිත්තයෙහි යෙදෙන්නාවූ ඒ විරතීහු අවශෙෂ දානාදී කුශල ධර්මයෝ ඒ මාගීසත්‍යයට හෙතුවන්නාක්මෙන් මේ විරතී

හුදු ඒ මාගීඵලත්‍රයට දුරහෙතුවෙත්. විදර්ශනා භාවනාකිරීම අවි දුර හෙතුවෙත්. මේ වනාහි ලෞකික ලොකොත්තර විරතීන්ගේ වෙනසයි. "අපපමඤ්ඤායෝ" යනාදී පාඨයාගේ භාවය මෙසේයි:- කරුණා මුදිතා සඞ්ඛ්‍යාත අප්‍රමාණ්‍ය ධර්මයෝදෙදෙන ශත්‍රු මිත්‍ර උදාසීන සකල සත්වයන් කෙරෙහි ප්‍රමාණයක්නොගෙණ භාවනාවඩනහෙයින් අප්‍රමාණ්‍යයෝයයි කියත්. ඒ අප්‍රමාණ්‍යයෝ දෙදෙන ප්‍රීති චෛතසිකය හා එක්ව ඉපදිය යුතුහෙයින් උපෙක්ෂා එකාග්‍රතා යන ධ්‍යානාඞ්ගවයකින් යුක්තවූ පඨමජ්ඣාන චිත්තයෙහි කිසිකලෙකත් නොලැබෙන්නාහුමැයි. සම්සතළිස් කමටහන් අතුරෙන් කරුණා සඞ්ඛ්‍යාතවූ අප්‍රමාණ්‍ය ධර්මය භාවනා වඩා ප්‍රථමධ්‍යානය උපදවන්නාවූ යොගාවචරයාහට උපදනා ප්‍රථම ධ්‍යානාදී චිත්තයෙහි කරුණා චෛතසිකය මුත් මුදිතා චෛතසිකය නූපදනේසි. එපරිද්දෙන්ම අප්‍රමාණවූ සුවපත් සත්වයන් අරමුණුකොටගෙණ මුදිතා බ්‍රහ්මවිහාරභාවනා වඩා ප්‍රථමධ්‍යානාදී ධ්‍යාන චතුෂ්කය අතුරෙන් යම්කිසි ධ්‍යානයක් උපදවන්නාවූ යොගාවචරයාහට මුදිතා චෛතසිකය මුත් කරුණා චෛතසිකය නූපදනේසි. එපරිද්දෙන්ම පෘථිවීකසිණාදීවූ අවශෙෂ අටතිස් කර්මස්ථාන භාවනාවඩන්නාවූ යොගාවචරයන්ට උපදනා ධ්‍යාන චිත්තයෙහිද මේ කරුණා මුදිතාවෝ නොලැබෙත්මැයි. කාමාවචර කුශල චිත්තයෙහි මේ අප්‍රමාණ්‍ය ධර්මයෝ කෙසේ ලැබෙන්නාහුද යත්? කරුණා මුදිතා භාවනා වන් වඩා ධ්‍යාන උපදවන්නාවූ යොගාවචරයාහට උපදනා අපිණා ප්‍රතිපදාගමනයෙහි පරිකර්ම උපචාර අනුලෝමගොත්‍රභූ නම්වූ උපදනා පුඵිඤාභාග චිත්තයෝ කාමාවචර කුශල් බැවින් ඒ ඒ ධ්‍යාන ප්‍රතිපදාගමනයෙහි පුඵිඤාභාග කාමාවචර කුශල චිත්තයෙහිත් ඒ ඒ අප්‍රමාණ්‍ය ධර්මලැබෙමැයි. සහෙතුක කාමාවචර ක්‍රියා චිත්තයෙහි අප්‍රමාණ්‍ය ධර්මයෝ කෙසේ ලැබෙන්නාහුද යත්? බුදු පසේ බුදු මහරහතුන්වහන්සේලා විසින් යථොක්ත බ්‍රහ්මවිහාර භාවනා වඩනකල්හි ඒ ඒ ක්‍රියා ධ්‍යාන ප්‍රතිපදාගමනයෙහි උපදනා කාමාවචර ක්‍රියා චිත්තයෙහිද සාමාන්‍යයෙන් දුඃඛිත සුඛිත සත්වයන් අරමුණුකොටගෙණ උපදනා කාමාවචර මහා ක්‍රියාචිත්තයෙහිද මේ අප්‍රමාණ්‍ය ධර්මයෝ ලැබෙත්මැයි. ප්‍රථමාදී ධ්‍යාන චතුෂ්කයෙහි නෝ කාමාවචර කුශලයෙහි නෝ මහා ක්‍රියා චිත්තයෙහි නෝ උපදනා අප්‍රමාණ්‍ය ධර්මයෝ වනාහි දුඃඛිත සත්වයන් අරමුණුකොට නෝ සුඛිත සත්වයන් අරමුණුකොට නෝ භාවනාවඩන්නාවූකල්හි එකී එකී ධර්මයක්ම ලැබියයුතු හෙයින් "සබ්බෙ නා නා හුත්වා ජායන්ති" යනු කීහ. උපෙක්ඛා සුඛ

ගතෙසු පනෙස්ථ කරුණා මුදිතා නසන්තීති කෙවිවදන්ති" යන්නෙහි භාවය කෙසේ යත්? යම්කිසි යොගාවචරයෙකු විසින් දුඃඛිත සුඛිත සත්ත්වයන් අරමුණුකොටගෙණ බ්‍රහ්මවිහාර භාවනාවඩනකල්හි ප්‍රගුණ ග්‍රන්ථයක් සජ්ඣායනාකරන්නෙක්හට අන්‍ය විහිතවත් ඒ ග්‍රන්ථය සජ්ඣායනාකළ හැකිවාක්මෙන්ම අප්‍රමාණ්‍ය භාවනාවඩන්නාවූ යොගාවචරයාහට අපි ඤාවට පූර්භාග යෙහි උපදනා කාමාවචර කුශල ක්‍රියා චිත්තයන් පුරුද්ද කරණ කොටගෙණ උපෙක්ෂා සහගතවද ලැබියහැකි බැවින් උපෙක්ෂා සහගත චිත්තයෙහි අප්‍රමාණ්‍ය ධර්මයන්ගේ නොයෙදීම මූලටීකා චාරීන් විසින් දක්වනලද්දේ නමුදු අනුරුඛාචාරීන්වහන්සේ විසින් ඒ මතය පිළිනොගන්නාලද බව අගාරවාභීයෙහි වැටෙන්නාවූ "කෙවිවදන්ති" යන ශබ්දයන්ගෙන් දක්වනුලැබෙයි. ප්‍රඥාවවත්‍යාඛ්‍ය ඥාන සම්ප්‍රයුක්ත ත්‍රිහෙතුක කාමාවචර කුශල විපාක ක්‍රියාවෝ දෙළොස්දෙනද, පන්තිස් මහද්ගතලොකොත්තර චිත්තයෝය යන සත්සාළිස් චිත්තයෙහි සම්ප්‍රයොගයට යෙත්යසිදනයුතු. එහෙයින් ශොභන සාධාරණවූ එකුන්විසි ධර්මයෝ එකුන්සැටක් ශොභන චිත්තයෙහිද, ත්‍රිවිධ විරතිහු සොළොස් චිත්තයෙහිද, අප්‍රමාණ්‍ය දෙදෙන විසිවිත්තයෙක්හිද, ප්‍රඥා තොමෝ සත්සාළිස් චිත්තයෙක්හිදැයි මෙසේ ශොභන පස්විසි යෙතසිකයෝ තුමූ ශොභන චිත්තයෙහිම සතරාකාරයකින් යෙදෙන්නාහුයයි දනයුතු. "ඉස්සාමච්ඡේර කුකකුච්ච" යනාදී ගාථාවෙහි ආවාවූ එකොළොස් යෙතසිකයෝ තුමූ ආරම්මණ ප්‍රතිලාභයෙහිම යම්කිසි කලෙක වෙන් වෙන්ව හට ගන්නාහුයයි දනයුතු. සපඤ්ඤාදිවූ යෙතසිකයන් නූපදනාසිතක් නැත්තේය. ශ්‍රද්ධාදී ශොභන යෙතසිකයන් නූපදනා ශොභන චිත්තයක්ද නැත්තේය. මොහාදී යෙතසිකයන් නූපදනා අකුශල චිත්තයක්ද නැත්තේය. ඒ ගාථාවෙහි කී යෙතසික එකොළොස්දෙන නොලැබ සෙසුප්‍රකාරයෙන්ම ඒ ඒ සිත් උපදනාහු වෙති. අනුන්ගේ සම්පත්තියක් දැසා ඊර්ෂ්‍යාකරන්නාවූකල්හි උපදනා ප්‍රතිඝචිත්තයෙහිම ඉස්සායෙතසිකය ලැබෙයි. එතකුදුවුවත් සත්ඝාතනයකරන්නාවූකල්හි උපදනා ප්‍රතිඝයෙතසික යෙහි ඉස්සායෙතසිකය නොලැබෙයි. මේ ඊර්ෂ්‍යාවට කීනයින්ම අවශෙෂ යෙතසිකයන් දසදෙනාවද සුදුසු අරමුණු ලැබුනාහු නම් එකාන්තයෙන් උපදනාහුමැයි. එහෙයින් සපඤ්ඤාදිවූද, ශ්‍රද්ධාදිවූද, මොහාදිවූද, නියතයොගී යෙතසික ධර්ම හා ඊර්ෂ්‍යාදී අනියත යොගී යෙතසික ධර්මයෝද යෙදෙන්නාවූ ක්‍රමය මනායේ අවබොධකටයුතුයි. ඡත්තිං සාකුත්තරෙ ධම්මා" යනාදියෙ

භාවය මෙසේයි. ලොකුත්තර චිත්තයෙහි උත්කෘෂ්ට පරිච්ඡේදයෙන් සතිස් චෛතසිකයෙක්ද, මහග්ගත චිත්තයෙහි උත්කෘෂ්ට පරිච්ඡේදවශයෙන් චෛතසිකයෝ පන්තිස්දෙනෙක්ද, කාමාවචර ශොභන චිත්තයෙහි උත්කෘෂ්ට පරිච්ඡේදයෙන් අටතිස් චෛතසිකයෙක්ද අකුශල චිත්තයෙහි උත්කෘෂ්ට පරිච්ඡේදයෙන් සත්විසි චෛතසිකයෙක්ද, අහෙතුක චිත්තයෙහි උත්කෘෂ්ට පරිච්ඡේදවශයෙන් දෙළොස් චෛතසිකයෙක්දැයි මේසේ මේ ලොකොත්තර, මහද්ගත, කාමාවචර, ශොභන, අකුශලය, යන පස්වැදෑරුම් සහෙතුක අහෙතුක චිත්ත කොට්ඨාසයෙහි පස්ප්‍රකාරයකින් චෛතසිකයන්ගේ යෙදීම් දත යුතුයි. හේ කෙසේ යත්? ලොකොත්තර ප්‍රථම ධ්‍යාන සිත්අවය, ද්විතීය ධ්‍යාන සිත් අටය, තෘතීය ධ්‍යාන සිත් අටය, චතුර්ථ ධ්‍යාන සිත් අටය, පඤ්ච ධ්‍යාන සිත් අටය, යන සමසාළිස් ලොකොත්තර චිත්තයෙහි චෛතසිකයෝ සතිසෙක, පන්තිසෙක, සුතිසෙක, තෙතිසෙක, නැවතත් තෙතිසෙකැයි මේසේ පඤ්චප්‍රකාරයකින් යෙදෙන්නාහුයයි දතයුතුයි. මේසේ එකි එකී චෛතසිකය ඌනව යෙදීමට හෙතු කවර යත්? ප්‍රථම ධ්‍යානය ලැබූ යොගාවචර තෙමේ ප්‍රථම ධ්‍යානයෙහි ආදීනව දැක ද්විතීය ධ්‍යානනිඝානතිය උපදවා භාවනා මඩනකල්හි ඔහුදුරුබවු විතර්කාඛ්‍යය හැර ද්විතීය ධ්‍යානය උපදනේසි. මේසේ සියලු ධ්‍යානයන්ගේ ඉපදීම භාවනා බලයෙන් වන සැටි දතයුතුයි. මහද්ගත චිත්තයන් අතුරෙන් ප්‍රථම ධ්‍යාන සිත් තුණෙහි පන්තිසෙක්ද, ද්විතීය ධ්‍යාන සිත් තුණෙහි සුතිසෙක්ද, තෘතීය ධ්‍යාන සිත් තුණෙහි තෙතිසෙක්ද, චතුර්ථ ධ්‍යාන සිත් තුණෙහි දෙතිසෙක්ද, පඤ්චම ධ්‍යාන පසළොස් චිත්තයෙහි තිසෙක්දැයි මෙසේ සත්විසි මහද්ගත චිත්තයෙහි පස් ආකාරයකින් චෛතසිකයන්ගේ යෙදීම දතයුතුයි.

කාමාවචර ශොභන චිත්තයන් අතුරෙන් වතාහි පළමු කොට පළමුවන කුසල චිත්තයෙහි අන්‍ය සමාන තෙළෙස් චෛතසිකයෝය, පසුවිසි ශොභන චෛතසිකයෝදැයි යන අටතිස් ධම්සෙනෙක් සම්සඩ්ගාභිනවශයෙන් සඩ්ගහකට යෙත්. විශෙෂවශයෙන්වනාහි අප්‍රමාණය ඵරතීහු පස්දෙන නානාලම්බණික ධම් බැවින් එක් චිත්තක්ෂණයෙක්හි නොයෙදෙන්නුයි එක එක චිත්තයෙහි එක එක ධම්යක් යෙදේමැයි. ඊට උදාහරණ කවර යත්? දානාදී දශපුණ්‍ය ක්‍රියාවස්තුන් අතුරෙන් දානමය කුශල ක්‍රියාවෙහි මෙවිරති අප්‍රමාණය ධම්යෝ නොලැබෙත්මැයි.

ශීලමය පුණ්‍ය ක්‍රියාවෙහි "පාණාතිපාතාවෙරමණී" යනාදී ශික්ෂා පද සමාදන්වන්නාවූකල්හි එක එක විරතිය ලැබෙයි. එහෙයින් ඒ ඒ කුශල චිත්තයන්ගේ අරමුණු පරිද්දෙන් චෛතසික ධර්ම යන්ගේ යෙදීම දතයුතුයි. දෙවෙනි කාමාවචර කුශලචෛතසික ඥානවර්ජිතවූ සත්තිස් ධර්මකෙනෙක්ද, තුන්වෙනි මහාකුශල චෛතසික ඥානසම්ප්‍රයුක්තවූ ප්‍රීතිවර්ජිතවූ සත්තිස් ධර්මකෙනෙක්ද, සතරවන දුකෂයෙහි ඥාන ප්‍රීති දෙදෙන වර්ජිතකොට ඇත්තාවූ සතිස්චෛතසික ධර්මකෙනෙක්ද, සඛ්‍රහයටගෙන්යයි දතයුතු. කාමාවචර ක්‍රියාසිත් අටදෙනා අතුරෙන් පළමුවන දුකයෙහි විරතිත්‍රයවර්ජිතකොට ඇත්තාවූ පන්තිස් චෛතසිකකෙනෙක්ද, දෙවෙනි දුකයෙහි සූතිස් චෛතසිකකෙනෙක්ද, තුන්වන දුකයෙහිත් එසේම සූතිස් චෛතසිකකෙනෙක්ද, සතරවන දුකයෙහි තෙතිස් චෛතසිකකෙනෙක්ද ක්‍රමයෙන් ගෙදෙන්නාහුයයි දතයුතුයි. කාමාවචර විපාකයන් අටදෙනා අතුරෙන් පළමුවන දුකයෙහි තෙතිස් චෛතසිකකෙනෙක්ද, දෙවන දුකයෙහි දෙතිස් චෛතසිකකෙනෙක්ද, තුන්වන දුකයෙහිත් එසේම දෙතිස් චෛතසිකකෙනෙක්ද, සතරවන දුකයෙහි එක්තිස් චෛතසිකකෙනෙක්ද, මෙසේ සුවිසි කාමාවචර කුශල විපාක ක්‍රියාචිත්තයෙහි දෙලොස් ආකාරයකින් චෛතසිකයන්ගේ යෙදීම දතයුතුයි, "සහෙතුකාමාවචර පුඤ්ඤපාක ක්‍රියාමනෝ" යන වාක්‍යයෙහිද, "සබ්බථාපි චතුවීසති සහෙතුක කාමාවචර කුසල විපාක ක්‍රියා" යන වාක්‍යයෙහිද, යථාලාභ න්‍යායවශයෙන් සහෙතුක ශබ්දය, පුඤ්ඤ ශබ්දය, අපෙක්ෂා නොකොට විපාක ක්‍රියා ශබ්දවය අපෙක්ෂාකරන්නේයයි දතයුතුයි. කුමක්හෙයින යත්? කාමාවචර කුශල්වනාහි එකානත සහෙතුක මුත් අහෙතුක කාමාවචර කුශලයෙක්නම් නැත්තේයි. එහෙයින් කාමාවචර කුශලය සහෙතුකදෝ අහෙතුකදෝහෝයි ව්‍යභිචාරයෙක් නැත්තේයි. කාමාවචර විපාක ක්‍රියාවෝවනාහි සහෙතුක විපාකය, අහෙතුක විපාකය, සහෙතුක ක්‍රියාය, අහෙතුක ක්‍රියායයි යන ව්‍යභිචාරය ඇත්තාහුවෙත්. "සතිහි සමහවෙ ව්‍යභිචාරෙව විසෙසනං සාධූකාංසියා" යනු න්‍යාය බැවින් ව්‍යභිචාරය ඇත්තාවූ විපාක ක්‍රියා ශබ්ද හා සමග මුත් ව්‍යභිචාරය නැත්තාවූ කාමාවචර කුශල ශබ්දය හා නොයෙදෙන්නේයයි දතයුතු. සාමඤ්ඤ ඵල සූත්‍රයෙහි හා අඩ්ඨකනාගර එකක නිපාතයෙහි "සක්කරතඵලිතාම්පි මච්ඡගුම්බම්පි චරන්තම්පි තිඨන්තම්පි" යන වාක්‍යයෙහි සක්කරතඵලිත ශබ්දය හා චරණ ක්‍රියාවද, මච්ඡගුම්බ ශබ්දය හා ඨාතක්‍රියාවද යෙදියයුතුවෝක් මෙන් පෙනෙන නමුත් එබඳු අවීඥක් ලොකයෙහි නොලැබෙන හෙයින් දුරින් පිහිටි චරණ ක්‍රියාව මච්ඡගුම්බ ශබ්දය හා සමඟද,

ඛාන ක්‍රියාව සකර්මකඛලිත ශබ්දය හා සම්ඛද අර්ථ ලැබෙන ක්‍රමයෙන්යෙදිය යුතුවාක්මෙන්ම "සහෙතු කාමාවචර පුඤ්ඤ පාක ක්‍රියා" යන වාක්‍යයෙහිද ලඟ පිහිටි සහෙතු ශබ්දය පුඤ්ඤ ශබ්දය හා සම්ඛ නොයොදා, පාක ශබ්ද ක්‍රියා ශබ්දයන් සම්ඛම් යෙදියයුතුයි. මේ යථා ලාභන්‍යාය අනිකුදු මෙබඳු තන්හි යෙදිය යුතුයි. ක්‍රියා සිත්හිද, මහද්ඛත සිත්හිද, විරතීහු නොලැබෙත් මැයි. කුමක්හෙයින යත්? ක්‍රියා චිත්තයෝ තුමූ ආවෙණිකවශ යෙන් රහතුන්ගේ සන්තානයෙහිම උපදනාහෙයින්ද, මහද්ඛත සඛ්‍යාතවූ රූපා රූප සම්පත්තීන් උපදවන්නාවූ යොගාවචර තෙමේ පළමුකොටම ශීල නැමති පෘථිවියෙහි පිහිටා ශීලවිශුඛිය මසතකප්‍රාප්තකොටගෙණ ඛ්‍යාන උපදවනහෙයිනි. ලොකොත්තර චිත්තයෙහි අප්‍රමාණ්‍ය ධම්මයෝ නොයෙදෙත්මැයි. කුමක්හෙයින යත්? ලොකොත්තර චිත්තයන්ගේ කෘත්‍යය කෙලෙශ යන්ගේ නිරවශෙෂ ප්‍රහාණයයි. අප්‍රමාණ්‍ය ධම්මෝ තුමූ දුඃඛිත සුඛිත සත්ත්වප්‍රඥප්තිය අරමුණුකරන්නාහුවෙති. එහෙයින් මේ ධම්මයන්ගේ අන්‍යෝන්‍ය විසදෘශ භාවයෙන් ලොකොත්තර චිත්ත යෙහි නූපදනාහුවෙත්. කාමාවචර විපාක චිත්තයෙහිද ඒ අප්‍ර මාණ්‍ය ධම්මෝ විද්‍යමාන නොවෙත්. විතර්කාදී ඛ්‍යානාඞ්ග ධම්මෝ තුමූ ලොකොත්තර චිත්තයන්ගේ සම්මසනලිස් ප්‍රභෙදයට කාරණා වනහෙයින් ඛ්‍යාන ධම්මෝ ලොකොත්තර ධම්මයන් වෙනස්කර න්නාවූ ධම්මෝනම්වෙත්. කරුණා මුදිතා බ්‍රහ්මවිහාර දෙදෙන ප්‍රථම චිතිය තෘතීය චතුර්ථ ඛ්‍යානයන් නිපදවීම්වද උපෙක්ෂා බ්‍රහ්මවිහාරය පඤ්චඛ්‍යානය ඉපදවීම්වද හෙතුවන බැවින් අප්‍ර මාණ්‍ය ධම්මෝ තුමූ මහද්ඛත ධම්මයන් වෙනස්කරන්නාවූ ධම්මෝ නම්වෙත්. විරතීහු තුන්දෙනාය ඤාන ප්‍රීතිය යන මේ ධම්මෝ පස්දෙන කාමාවචර සිත්වෙනස්කරන්නාවූ ධම්මෝනම්වෙත්.

දෙළොස් අකුශලයන් අනුසරන් ලොභ මූලිකවූ පළමුවන අසඛ්ඛාරික චිත්තයෙහි අන්‍ය සමාන තෙළෙස් චෛතසිකයෝය. අකුශල සාධාරණ සතරදෙනාද සි යන සතලොස්දෙන ලොභ දෘෂ්ටීන් හා සමග එකුන්විසි ධම්මෙනෙක්ව සඛ්ග්‍රහයටයෙති. එසේම දෙවෙනි අසඛ්ඛාරික චිත්තයෙහි දෘෂ්ටිසථානයෙහි ප්‍රවි ෂවූ මානය හා සමග එකුන්විසි ධම්මෙනෙක් සඛ්ග්‍රහයටයෙත්. තුන්වෙනි අසඛ්ඛාරික චිත්තයෙහි ප්‍රීති වර්ජිතවූ ලොභ දෘෂ්ටීන් හා සමග අටළොස් ධම්මෙනෙක් සඛ්ග්‍රහයටයෙත්. සතරවෙනි අසඛ්ඛාරික චිත්තයෙහි දෘෂ්ටිසථානයෙහි ප්‍රවිෂටවූ මානය හා සමග එසේම අටළොස් ධම්මෙනෙක් සඛ්ග්‍රහයටයෙත්. පටිස සම්ප්‍රයුක්තවූ පස්වෙනි අසඛ්ඛාරික චිත්තයෙහිවනාහි දෙස, ඉස්සා, මච්ඡරිය, කුක්කුච්ච, යන ඇකර චෛතසිකයන් හා

සමඟ ප්‍රීති වර්ජිතවූ ඒ විසිධර්මයෝ සඞ්ග්‍රහයට යෙත්. මේ චිත්ත යෙහි යෙදියයුතුවූ දෙස, ඉසසා, මච්ඡරිය, කුක්කුච්ච, යන සතර ධර්මයන් අතුරෙන් වෙෂය නියතයොගීචෂයෙන්ද, ඉසසා, මච්ඡර, කුක්කුච්ච, යන තුන්දෙන අනියත යොගී ධර්මවන හෙයින් වෙෂය හා ඊර්ෂ්‍යාව හෝ වෙෂය හා මච්ඡරිය හෝ වෙෂය හා කුක්කුච්චය හෝ මේසේ වෙන වෙනම යථා ලබ්ධ වශයෙන් උපදනාහුයසිදතයුතු. ඊර්ෂ්‍යාවට මෙර මාගේ සම්පත්ති යද, මච්ඡරියට තමාගේ සම්පත්තියද, කුකකුච්චයට කළාවූ දුශ්චරිතය හා නොකළාවූ සුචරිතයන්ද අරමුණුවියයුතුහෙයින් කිසි කෘලක මේ ධර්මයෝ තුන්දෙන එක් සිතක්හි නොලැබෙන්නා හුයයි දතයුතු. යථොක්ත සඤ්ඣාරික පඤකයෙහිද ඒ ඒ චිත්ත යට නියමවූ ධර්මයන් හා සමඟ පින ඕඝයද එක්කොට යෙදිය යුතුයි. ඡන්ද ප්‍රීති වර්ජිතකොට ඇත්තාවූ අන්‍ය සමාන ලොභ ලොස් චෛතසිකයෝය, අකුසල සාධාරණ සතරදෙනදැයි යන පසළොස් චෛතසික ධර්මයෝ උඛවව සහගත චිත්තයෙහි යෙදෙන්නාහුවෙත්. විචිකිච්ඡා සහගත චිත්තයෙහිද අධිමොක්ෂස්ථාන යට ප්‍රවිෂවූ විචිකිච්ඡාව හා සමඟ පසළොස් ධර්මයෙනෙක් සඞ්ග්‍රහයටයෙති. එහෙයින් මේ දෙළොස් අකුශල චිත්තයෙහි චෛතසිකයෝ එකුන්විසිදෙනෙක, අටළොස්දෙනෙක, විසිදෙනෙක, එක්විසිදෙනෙක, නැවතත් විසිදෙනෙක, දෙවිසිදෙනෙක, පසළොස්දෙනෙකැයි මේසේ සත්ප්‍රකාරයකින් සිටියා හුය. අකුශල සාධාරණයෝ සතරදෙනය, ඡන්ද, ප්‍රීති, ඊර්ෂ්‍ය, වර්ජිතවූ අන්‍ය සමාන දසදෙනය යනමේ තුදුස් චෛතසික ධර්මයෝ සියලු දෙළොස් අකුශල චිත්තයෙහිම නියතයොගී ධර්මයෝ නම්වෙත්.

අටළොස් අහෙතුක චිත්තයන් අතුරෙන් හසිතොත්පාද චිත්තයෙහි ඡන්ද වර්ජිතවූ අන්‍ය සමාන දෙළොස් ධර්මයෝ සඞ්ග්‍රහයටයෙත්. ව්‍යවස්ථාපනය පරනාමඩෙයකින් ප්‍රකෘතවූ මනොවාරවජ්ජන චිත්තයෙහි ඡන්ද ප්‍රීති වර්ජිතකොට ඇත්තාවූ එකොළොස් ධර්මයෝද සොමනස් සන්තීරණ චිත්තයෙහි ඡන්ද ඊර්ෂ්‍ය වර්ජිතවූ එකොළොස් චෛතසික ධර්මයෝද, පඤවාරවජ්ජන සම්ප්‍රත්‍යෙෂණ යුගල සඞ්ඛ්‍යාතවූ මනොධාතු ත්‍රිකයෙහි හා උපෙක්ෂා සන්තීරණවය සඞ්ඛ්‍යාතවූ අහෙතුක පටිසන්ධි යුගලය යන පඤඉයෙහි ඡන්ද ප්‍රීති ඊර්ෂ්‍ය වර්ජිතකොට ඇත්තාවූ අන්‍ය සමාන දශධර්මයෝද, කුශලාකුශල විපාකවූ දෙපස් විඥාන දසයෙහි ප්‍රකීර්ණක සඳෙන වර්ජිතකොට ඇත්තාවූ සප්ත

චිත්ත සාධාරණ චෛතසිකයෝ සත්දෙනද යනමේ ක්‍රමයෙන් අටලොස් අකුසලතුක චිත්තයෙහි චෛතසිකයෝ දෙලොස්දෙනෙක, එකොළොස්දෙනෙක, දසදෙනෙක, සත්දෙනෙකැයි යනමේ සතරාකාරයෙන් චෛතසිකයන්ගේ යෙදීම දතයුත්තා සුය. ඉස්සා මච්ඡේර කුක්කුච්ච යනාදී ගාථාවෙහි භාවය කෙසේ යත්? මේ ගාථාවෙන් දක්වන්නාවූ අනියතයොගී එකොළොස් චෛතසිකයන් අතුරෙන් ඉස්සාමච්ඡරිය කුක්කුච්ච යන ධර්මයෝ තුන්දෙන චෙෂ මූලික චිත්තය උපදින උපදින සියලුකල්හිම නොලැබෙන්නාහුමැයි. අනුන්ගේ සම්පත්තියන් නුරුස්නාකල්හිද තමාගේ සම්පත් සඟවන්නාවූකල්හිද කෘතාකෘත දුශ්චරිත සුචරිතයන් සඳහා පසුතැවෙන්නාවූකල්හිද එක එක චිත්ත යෙහි එක එක ධර්මයක් උපදනාසෙයින් කදාචි ශබ්දය යොදන ලද්දේසි. ඒ ඇතැම්කලෙක්හි ඉපදීමද, අනුන්ගේ සම්පත් නුරුස්නාකල්හී උපදනා දෙස මූලික චිත්තයෙහි ඊර්ෂ්‍යාවම මුත් මච්ඡරිය කුක්කුච්ච දෙදෙන නූපදනාහුවෙත්. තම සැපත් සඟවන්නාවූකල්හී උපදනා දෙස මූලික චිත්තයෙහි මච්ඡරිය චෛතසිකය මුත් ඉස්සා කුක්කුච්ච දෙදෙන නූපදනාහුවෙත්. කෘතාකෘත දුශ්චරිත සුචරිතයන් ගැන පසුතැවීම්වශයෙන් දෙස මූලික චිත්තය උපදනාකල්හි කුක්කුච්චයමුත් ඉස්සාමච්ඡරිය දෙදෙන නූපදනාහුවත්. එහෙයින් දෙස මූලික චිත්තය හා සමග කදාචි ශබ්දයද, ඉස්සා, මච්ඡේර, කුක්කුච්ච, ශබ්දයන් හා නා නා ශබ්දයද යෙදෙන්නේසි. ඒ ඉස්සා, මච්ඡරිය, කුක්කුච්ච, යන චෛතසිකයෝ තුන්දෙන තුමූ එකක්ෂණයෙහි නූපදනාබව නා නා ශබ්දයෙන් දක්වසි. විරති චෛතසිකයෝ තුන්දෙන තුමූ ලොකොත්තර චිත්තයෙහි ඒ ඒ දුශ්චරිත දුරාජීවයන් එකවිට නැසීම්වශයෙන් විරතීහු ලොකොත්තර චිත්තයෙහි නියතයොගී නම්වෙත්. එතකුදුවූවත් මහාකුශල චිත්තයෙහි සියලුකල්හි නූපදනා බැවින්ද දුශ්චරිත දුරාජීවයන්ගෙන් වැළකීම්වශයෙන් සම්පත්ත සමාදානවශයෙන් සලාතුරකින් ලැබෙන්නාහුවෙති. එහෙයින් මහාකුශල චිත්තයන් හා සමග කදාචි ශබ්දයද විරතීන් හා නා නා ශබ්දයද යෙදෙන්නාහුයයි දතයුතු. සම්මාවාචා විරතිය යෙදෙන්නාවූ කල්හි සම්මාකම්මන්ත විරතිය හෝ සම්මා ආජීව විරතිය හෝ නොයෙදෙන්නාහුවෙති. සම්මාකම්මන්ත විරතිය යෙදෙන්නාවූකල්හි සම්මාවාචාවිරතිය හෝ සම්මාආජීව විරතිය හෝ නොයෙදෙන්නාහුවෙති. සම්මාආජීව විරතිය යෙදෙන්නාවූකල්හි සම්මාවාචා සම්මාකම්මන්තවිරතීහු නොයෙදෙන්නාහුවෙති. එහෙයින් නා නා ශබ්දය විරතීන් හා වෙන

වේනම් යෙදියයුතුයි. අප්‍රමාණයෝ දෙදෙන තුමූ යෙදෙන්නාවූ චිත්තයෙහි කදුවි ශබ්දයද, අප්‍රමාණ ධර්ම හා නා නා ශබ්දයද මෙන් වෙන්ව යෙදෙන්නේයයිදතයුතු. මානවෛතසික තෙමේ ද ලොභ මූලික දෘෂ්ටි විප්‍රයුක්ත සතර චිත්තඝ උපදිනා සියලු කල්හිම නොලැබෙයි. හීනමානය, සදිසමානය, පණීතමානයයි කියනලද තුන් වැදෑරුම් මානයන් අතුරෙන් එක එක මාන යක් යෙදෙන්නාවූකල්හී මානවෛතසිකය ලැබියයුතු බැවින් කදුවි ශබ්දය හා යෙදියයුත්තේයි. මානවචකාහි එතම ධර්මයක් බැවින් නා නා ශබ්දය හා නොයෙදෙන්නේයි. පින වෛතසිකය හා ම්ඛ වෛතසිකයද යන දෙදෙන සසඛ්කාරික සිත් පවකය උපදනා සියලුකල්හිම නොලැබෙන්නාහුමැයි. චිත්තවේතසිකයන්ගේ හැකිලීමක් ඇතිකල්හිම කලාතුරකින් ලැබියයුතුහෙයින් කදුවි ශබ්දය හා යෙදෙන්නේයි. ඒ පින ම්ඛවේතසිකයෝ දෙදෙන වනාහි කලාතුරකින් ලැබෙන්නාහු නමුදු එකාන්තයෙන් වෙන් වෙන්ව නොලැබෙකහෙයින් සහ ශබ්දයද පින ම්ඛ ශබ්දය හා යෙදෙන්නේයි. එනකුදුවුවත් පින ම්ඛ ශබ්දය හා සමග නා නා ශබ්දය කිසි කලෙකත් නොයෙදෙන්නේයයි දතයුතු. එහෙයින් ඉස්සාමච්ඡරිය කුකුච්ච විරති කරුණා මුදිතා වෛතසිකයෝ තුමූ එක එක ධර්මයක් පාසා "කදුවි ඉස්සා නා නා කදුවි මච්ඡරියං නා නා" යනාදීන් සියලු ධර්මයන් හා මේ නිපාත ශබ්දයෝ දෙදෙක වෙන වෙනම යෙදෙන්නාහුයයි දතයුතු. මාන ශබ්දය හා කදුවි ශබ්දය පමණක් යෙදෙන්නේයි. පින ම්ඛ ශබ්දයන් හා කදුවි ශබ්දය හා සහ ශබ්දය යෙදෙන්නාහුයයි දතයුතු. එනකුදුවුවත් නා නා ශබ්දය හා කිසිකලෙකත් නොයෙදෙන්නේයයි දතයුතු. නොහොත් පින ම්ඛ දෙදෙන වනාහි සසඛ්කාරික අකුසල පවනයෙහි යෙදෙන්නාහු නමුදු දෙඝ මූල සසඛ්කාර චිත්තය උපදනාකල්හී චිත්ත වෛතසිකයන්ගේ හැකිලීම හා අනුන්ගේ සම්පත්තියට ඊර්ෂ්‍යා කිරිමද යනඅඛවය තින් සම්මූර්ඡිවූයේනම් ඒදෙස මූලය සඛ්කාර චිත්තයෙහි පින ම්ඛ දෙදෙන හා සමග ඊර්ෂ්‍යාවද යෙදෙන්නේයි. එසේ යෙදෙන්නාවූකල්හි ඊර්ෂ්‍යාව හා සමග පින ම්ඛ දෙදෙනද එක්ව උපදනාහුවෙත්. මේසේ උපදනාකල්හි සහ ශබ්දය හා සමග ඊර්ෂ්‍යාවද, පින ම්ඛ දෙදෙනද යෙදෙන්නේයයි දතයුතු. ඉස්සා පින ම්ඛ යන වෛතසිකයෝ තුන්දෙන දෙස මූල සසඛ්කාර චිත්තය උපදනාකල්හි ඇතැම්විටක යෙදෙන්නාහුවෙත්. ඇතැම්විටක තුන්දෙනම නොයෙදෙන්නාහුවෙත්. එහෙයින් කදුවි ශබ්දයද පින ම්ඛ ශබ්දය හා සමග ඉස්සා ශබ්

දස හා සමඟද යෙදෙන්නාහුයයිදතයුතු. ඇතැම් තලෙක්හී ලෝභ මූල සසඞ්ඛාර චිත්තයෙහි පිහ මිඹ දෙදෙන පමණක් යෙදෙන්නේවෙයි. එකල්හි ඊර්ෂ්‍යාව නොයෙදෙන්නේදවෙයි. ඇතැම් කලෙක්හි ඊර්ෂ්‍යා මාත්‍රයක් යෙදෙන්නේවෙයි. පිහ මිඹ දෙදෙන නොයෙදෙන්නේවෙයි. මෙසේ පිහ මිඹ දෙදෙන හා සමග ඊර්ෂ්‍යාව යෙදෙන සැටිද, ඊර්ෂ්‍යාවෙන් තොරව පිහ මිඹ දෙදෙන යෙදෙන සැටිද වෙන් වෙන්වශයෙන් දතයුතු. පිහ මිඹ දෙදෙන හා සමග මච්ඡරිය චෛතසිකයාගේ යෙදීම හා කුක්කුච්ච චෛතසිකයාගේ යෙදීමද ඊර්ෂ්‍යාවට නිනසින්ම යොදුහතයුතුයි. ලොභ මූලික දෘෂ්ටි විප්‍රයුක්ත සසඞ්ඛාරික චිත්ත වයෙහි පිහ මිඹ දෙදෙනා හා සමග මාන චෛතසිකයාගේ යෙදීමද සහ ශබ්දය හා නා නා ශබ්දයද කඳුවී ශබ්දයද ලැබෙන් නාවූ ක්‍රමයෙන් තුන්වරක් අසිඳිහයුතුයි. ඉසියා, මච්ඡරිය, කුක්කුච්ච, මාන යනමේ සතරවෛතසිකයන් හා සමග පිහ මිඹය යෙදෙනකල්හි චෛතසිකයන් හා සහ ශබ්දයද නා නා ශබ්දයද, චිත්තය හා කඳුවී ශබ්දයද තුන්වරක්ම ලැබෙන්නේ යයි දතයුතු. ලොකුත්තර චිත්තයෙහි අප්‍රමාණ්‍යයෝ දෙදෙන තුවූ කුක්කුච්චයින් නොයෙදෙන්නාහුද යත්? ලොකොත්තර චිත්තයෝවනාහි නිවීණය අරමුණුකරන්නාහුවෙති. අප්‍රමාණ්‍ය යෝවනාහි සත්ත්වප්‍රඥප්තිය අරමුණුකරන්නාහුවෙති. මෙසේ නා නාලම්බණික භාවය හේතුකොටගෙණ ලොකොත්තර චිත්ත යෙහි අප්‍රමාණ්‍යයෝ නොලැබෙත්මැයි. සත්ත්වයි මහද්ගත චිත්ත යෙහි කුක්කුච්චයින් විරතිහු නොලැබෙන්නාහුද යත්? මහද්ගත චිත්තයෝ වනාහි ප්‍රඥප්තිය අරමුණුකරන්නාහුවෙති. ලොකොත්තර චිත්තයෙහි යෙදෙන්නාවූ විරතිහු නිවීණය අරමුණුකරන්නාහුවෙති. කාමාවචර කුසල චිත්තයෙහි යෙදෙන්නාවූ විරතිහු ඒ ඒ දුශ්චරිත දුරුජීවයන් අරමුණුකරන්නාහුවෙති. නොහොත් මහද්ගත කුශල චිත්තයෙහි වනාහි කාමාවචර කුශල චිත්තයෙහිමෙන් කුක්කුච්චයන් විරතිහු නොලැබෙන්නාහුද යත්? මහද්ගත කුශලය වනාහි කාමාවචර කුශලයමෙන් සාය සම්ප්‍රයුක්තධර්මයන් තදඟ ප්‍රහාණවශයෙන් නසන්නාහුදනොවෙත්. ලොකොත්තර කුශලයන්මෙන් සමුච්ඡේද ප්‍රහාණවශයෙන් නස න්නාහුද නොවෙත්. විෂ්කම්භන ප්‍රහාණවශයෙන්ම කෙලෙස් මුවහකරණ බැවින් මහද්ගත චිත්තයෙහි විරතිහු නොලැබෙත්. අප්‍රමාණ්‍ය දෙදෙන වනාහි එක චිත්තයක එකක්ෂණිකව නොලැබ වෙන් වෙන්ව ලැබෙන්නේ කුමක් නිසාද යත්? නිත්‍යාලම්බණික බැවිනැයි දතයුතුයි. දුස්සීල සත්ත්ව ප්‍රඥප්තිය අරමුණුකරන්

නාවූහාල්ගි සුඛිත සඤ්ඤාපතිය හෝ සුඛිත සති ප්‍රඥප්තිය අරමුණුකරන්නාවූහාල්ගි දුක්ඛිත සඤ්ඤාපතිය හෝ අරමුණුනොකොට හැකිවෙති. එහෙයින් එකක්ෂණිකව එකම චිත්තයෙහි මේ ධර්මයෝ දෙදෙන නොලැබෙන්නාහුයයි දත යුතුයි මේ අප්‍රමාණ්‍ය ධර්මයෝ දෙදෙන එකාභි ලෞකික උපෙක්ෂා සහගත චිත්තයෙහි යෙදෙන්නාහුද උපෙක්ෂා සහගත පඤ්චමධ්‍යාන චිත්තයෙහි කුමක්හෙයින් නොයෙදෙන්නාහුදයත්? අභිඥාවට පැමිණියාවූ අප්‍රමාණ්‍යයෝ දෙදෙනවානාභි කිසි කලෙකත් සෞමනස්‍ය වේදනාවෙන් තොරව නූපදනාහුවය. පඤ්චමධ්‍යානයද කිසිකලෙකත් උපෙක්ෂාවෙන් තොරව නූපදනේකි. එහෙයින් මේ අප්‍රමාණ්‍ය දෙදෙනාගේ හා පඤ්චමධ්‍යානයාගේද වේදනා විසභාගත්වය හෙතුකොටගෙණ අප්‍රමාණ්‍ය ධර්මයන්හෙන් යුක්තවූ පඤ්චමධ්‍යානයෙක්නම් නැත්තේකි. ප්‍රථම ද්විතීය තෘතීය චතුර්ථ ධ්‍යානයෙහි සෞමනස්‍ය වේදනා යුක්තබැවින් එක එක අප්‍රමාණ්‍ය ධර්මය අනියතවශයෙන් යෙදෙන්නේයයි දතයුතු. ද්විතීය ධ්‍යානයෙහි විතර්ක ධ්‍යානාඞ්ගය කුමක් හෙයින් නොයෙදෙන්නේද යත්? "භාවනා බලෙන නූපජ්ජති" යනු කිහෙයින් භාවනාශක්තියෙන් විතර්කය නූපදනේය: දත යුතු. එහි විස්තර මෙසේකි. ප්‍රථම ධ්‍යානලාභීවූ ත්‍රිහෙතුක කාමාවචර රූපාවචර පුද්ගල තෙමේ මා විසින් ලබනලද්දාවූ මේ ප්‍රථම ධ්‍යානය අතිශයින් දුර්ලභවූ උතුම් ධර්මයකැයි නැවත නැවත සෞමනසින් යුක්තව ප්‍රථමධ්‍යානයට සම්වැද ඒ ධ්‍යානයෙහි ඇත්තාවූ සංස්කාර ධර්මයන් ප්‍රත්‍යවෙක්ෂාකොට හෙවත් පළමු කොට එක එක ධ්‍යානාඞ්ගය ප්‍රත්‍යවෙක්ෂාකොට නැවත ධ්‍යානාඞ්ගපවනය එක්කොට ප්‍රත්‍යවෙක්ෂාකිරීමෙන් පුරුදු පුහුණු කොට ද්විතීය ධ්‍යාන නිකාන්තිය උපදවන්නේකි. කෙසේ උපදවන්නේද යත්? යම්කිසි පුරුෂයෙක් තෙමේ භාග්‍යවත් සරණ පාවාගෙණ බොහෝකල් එකට විසීමෙන් ඇතෙරෙහි ඇත්තාවූ දුර්ගුණයන් ප්‍රත්‍යක්ෂවීමෙන් ඇතෙරෙහි ඇත්තාවූ ප්‍රේමය සිද අනික් භාග්‍යවත් කෙරෙහි ද්‍රෝම උපදවාගත් පුරුෂයෙකුවෙන් ප්‍රථම ධ්‍යානලාභීවූ යොගාවචර තෙමේ මා විසින් ලබන ලද්දාවූ ප්‍රථම ධ්‍යාන තෙමේ මේ කාමච්ඡන්දනීවරණ සඞ්ඛ්‍යාතවූ ලාවූ සතුරෙකුගෙන් යුක්තය. ඒ ධ්‍යානයෙහි ඇත්තාවූ ධ්‍යානාඞ්ග පවනය අතුරෙන විතර්ක ධ්‍යානාඞ්ගය ඖදාරිකවන්නේය. එහෙයින් ඒ ධ්‍යානාඞ්ගය හැර ද්විතීය චතුරඞ්ගයකින්යුක්තවූ ද්විතීය ධ්‍යානය ලාභියේනම් මෙනවැයි සිතා ද්විතීයධ්‍යානයට ගොවර වන්නාවූ භූදුස ආකාරයන් අතුරෙන් තමාගේ චරිතයට අනුකූලවූ කරුණහනක් "පඨවි පඨවි" ආදීන් මෙඳුනහිකරණ

කල්හී විචාර ප්‍රීති සුඛ එකාග්‍රතා යන ධ්‍යානාඞ්ග සහරක්ෂිත් යුක්තවූ තෘතීය ධ්‍යානය ලබන්නේයි. විතකී සහිතවූ ධ්‍යානාඞ්ගය වනාහි භාවනාශක්තියෙන් දුරුකරන්නේයි. මේ තෘතීය ධ්‍යානයටකී ක්‍රමය පඤ්ච ධ්‍යානය දක්වා යොදා අවීගතයුත්තේයි.

මහද්ගත චිත්තයෙහි සංග්‍රහනය නිමියේයි.

මහද්ගත සඞ්ග්‍රහනයට අනතුරුව කාමාවචර චිත්තයන්හේ සඞ්ග්‍රහනය දක්වනු කැමතිවූ අනුරුඛාචාරීන්වහන්සේ "කාමාවචර සොභනෙසු පන" යනාදීන් කීහ. සුවිසි කාමාවචර සොභන චිත්තයන් අතුරෙන් මහාවිපාක මහාක්‍රියාවන්ට පූර්වභාගයෙහි මහාකුශල චිත්තය දක්වනලදි. ඔවුන් අතුරෙන් පළවූවන මහාකුශලයෙහි යටකීනයින් විරතිත්‍රය හා අප්‍රමාණ්‍ය දෙදෙනද සඞ්ග්‍රහකලදෙයින් අදහස් ධර්මකෙනෙක් ලැබෙන්නාහුවත්. එතකුදුවුවත් විරතිත්‍රය අප්‍රමාණ්‍යවය යන පස්දෙනා අතුරෙන් එක එක වෛතසිකයම ලැබෙන්නේයි. එතකුදුවුවත් විරතිත්‍රය අතුරෙන් එකක් හා අප්‍රමාණ්‍ය දෙදෙනා අතුරෙන් එකාක්ද එකාන්තයෙන් එකක්ෂණයෙහි නොලැබෙන්නේයි විරතියක් ලැබෙන්නාවූ චිත්තයෙහි අප්‍රමාණ්‍යයක් හෝ අප්‍රමාණ්‍යයක් යෙදෙන චිත්තයෙහි විරතියක් හෝ නොලැබෙන්නේයි. කුමක් හෙයින යත්? අප්‍රමාණ්‍යයෝවනාහි ප්‍රමාණ රහිතවූ සත්ත්වප්‍රඥප්තියක්ම අරමුණුකෙරෙත්. ලෞකික චිත්තයෙහි යෙදෙන්නාවූ විරතිහු විරවිතව්‍ය වස්තුවූ දුශ්චරිත දුරාජීවයන්ම අරමුණුකෙරෙති. මෙසේ අප්‍රමාණ්‍ය විරතින්ගේ ආලම්බනයාන්තර්භූත හෙතු නොවගෙණ අප්‍රමාණ්‍ය විරතිහු එක චිත්තයෙහි එකවිට නොලැබෙත්මැයි. මේ විරතිහුවනාහි කාමාවචර කුශල චිත්තයෙහි අනියත යොගීවශයෙන් ඇතැම් කලෙක්හී එක එක විරතිය ලැබෙන්නේ නමුදු ලොකොත්තර චිත්තයෙහි සියලු විරතිහුම එකක්ෂණයෙහි නියතයොගීවශයෙන් යෙදෙන්නාහුමැයි. මේ විරතිහුවනාහි කාමාවචර කුශල චිත්තයෙහි අනියත යොගීවශයෙන් එක එක ඇමියත් ලොකොත්තර චිත්තයෙහි නියත යොගීවශයෙන් සියලු විරතිහුත් කෙසේ ලැබෙන්නාහුද යත්? කාමාවචර කුශලයෙහි ලැබෙන්නාවූ විරතිහු විරවිතව්‍ය දුශ්චරිතයන්ම අරමුණුකෙරෙති. ලොකොත්තර චිත්තයෙහි යෙදෙන්නාවූ විරතිහු එකාන්තයෙන් නිර්වාණය අරමුණුකරන්නාහුවෙති. එහෙයින් ලොකොත්තර චිත්තයෙහි සියලු විරතිහු එකක්ෂණිකව ලැබෙන්

නාහුමැයි. කාමාවචර කුශලය වනාහි දුශ්චරිතාදය අරමුණුකරයි. සුදුසු පරිද්දෙන් නිර්වාණයද අරමුණුකරයි, ප්‍රඥප්තියද අරමුණු කරයි. මෙසේ නිර්වාණ ප්‍රඥප්ති ආදිය අරමුණුකරන්නාවූකල්හී සුදුසු පරිද්දෙන් විරතින්ගේ යෙදීම දතයුතුයි.

මහාකුශල සංග්‍රහනය නිමියේයි.

සහෙතුක කාමාවචර ක්‍රියා චිත්තයෙහි විරතිහු කුමක්හෙයින් නොයෙදෙන්නාහුද යත්? ලෞකික කුසලානං එකන්ත කුසල සභාවත්තා නත්ථි අබ්‍යාකතෙසු සම්භවොති වුත්තං විරති වජ්ජිතා" යි. ඒකා වචන බැවින් ලෞකික විරතිහු එකාන්ත කුශල සභාව ඇති බැවින් අව්‍යාකෘතවූ ක්‍රියා චිත්තයෙහි නොලැබිය යුතුහෙයින් විරතීහු ක්‍රියා චිත්තයෙහි නොලැබෙන්නාහු යයි කියයුතුයි. "පඤ්චඞ්ගිකඛාපදානි කුසලානි" යනු ප්‍රතිසම්භිදා මාර්ගයෙහි වදාල බැවින් කාමාවචර කුශලයෙහි මුත් අව්‍යාකෘතවූ විපාක ක්‍රියා චිත්තයෙහි නොලැබෙන්නේයයි දතයුතුයි. මේ මහාක්‍රියා චිත්තයෙහි අවසිස් චෛතසිකයන් අතුරෙන් විරති ත්‍රය උඛරණයකොට අවශෙෂවූ පන්සිස් චෛතසිකයෝ ප්‍රථම දුකාදියෙහි සුදුසු පරිද්දෙන් යෙදියයුත්තාහුයි.

කාමාවචර ක්‍රියා සංග්‍රහනය නිමියේයි.

සහෙතුක කාමාවචර විපාක චිත්තයෙහි අප්‍රමාණ විරති දෙදෙනා කුමක්හෙයින් නොලැබෙන්නාහුද යත්? "කාමාවචර විපාකානම්පි එකන්ත පරිත්තාරම්මණත්තා අපමඤ්ඤානවිඤ්ඤාණාරම්මණත්තා විරතීනම්පි එකන්ත කුසලත්තාවුත්තං අප මඤ්ඤාවිරති වජ්ජිතාති" යනු ඒකා බැවින් අරමුණු විශෙෂ බැවින්ද, ජාති විශෙෂ බැවින්ද, අප්‍රමාණ විරතිහු විපාකචිත්ත යෙහි නොලැබෙන්නාහුයයි දතයුතුයි. මේ මහාවිපාක චිත්ත යෙහි අවසිස් චෛතසිකයන් අතුරෙන් අප්‍රමාණ විරතිහු පස් දෙන උඛරණයකොට අවශෙෂවූ තෙතිස් චෛතසික ධර්මයෝ ප්‍රථම දුකාදියෙහි සුදුසු පරිද්දෙන් යොදුගතයුත්තාහුයි.

කාමාවචර මහාවිපාක සංග්‍රහනය නිමියේයි.

සුවිසි කාමාවචර සොභන චිත්තයන්ගේ සඞ්ග්‍රහනය දක්වා දෙළොස් අකුශල චිත්තයන්ගේ සඞ්ග්‍රහනය දක්වනුලැබේ. පළමු

වන අසඞ්ඛාරික චිත්තය හා දෙවෙනි අසඞ්ඛාරික චිත්තය ද, දිට්ඨි මාන, දෙදෙන සමඟ විසිවෙතසිකය බැගින් ලැබෙන්නේයයි කියාද, තුන්වෙනි අසඞ්ඛාරික චිත්තය හා සතරවෙනි අසඞ්ඛාරික චිත්තයෙහිද, ප්‍රීතිය උඩරණයකොට දිට්ඨිමාන දෙදෙන වෙන වෙනම බහා අටළොස් වෙතසික කෙනෙක්ද, පස්වෙනි අසඞ්ඛාරික චිත්තයෙහි දෙවියි වෙතසිකයන් අතුරෙන් පින මිඩ දෙදෙන උඩරණයකොට විසි විසි වෙතසිකය ලැබෙන් නේයයි දතයුතුයි. පළමුවන සසඞ්ඛාරික චිත්තය, දෙවෙනි සස ඞ්ඛාරික චිත්තය යන දෙසිතෙහි අසඞ්ඛාරික චිත්තයෙහි කී එකුන් විසිවෙතසිකයන් හෙරෙහි පින මිඩ දෙදෙන බහා එක් විසිවෙතසිකකෙනෙක්ද, තුන්වන සසඞ්ඛාරික චිත්තයෙහි හා සතරවන සසඞ්ඛාරික චිත්තයෙහිද අසඞ්ඛාරික චිත්තවයට කී අටළොස් වෙතසිකයන් හෙරෙහි පින මිඩ දෙක බහා විසි වෙ තසිකයක් ලැබෙන්නේයයි දතයුතුයි, දෙස මූල සසංඛාර චිත්ත යෙහි පින මිඩ දෙදෙන බහා විසිවෙතසිකකෙනෙක්ද, උඛවව සහගත චිත්තයෙහි ජාඳ ප්‍රීති වර්ජිතකොට ඇත්තාවූ අන්‍ය සමාන එකොළොස් වෙතසිකයන් හෙරෙහි අකුශල සාධාරණ සතරවෙතසිකය බහා පසළොස් වෙතසිකයක් ලැබෙන්නේ යයිද, විචිකිච්ඡා සහගත චිත්තයෙහි එම පසළොස් වෙතසික යන් හෙරෙහි ඇතුළත්වූ අධිමොක්ඛය උදුරා විචිකිච්ඡාව බහා පසළොස් වෙතසිකයෙ ැයි දතයුතුයි. ඒ දෙළොස් අකුශල යෙහි සත්වැදෑරුම් සඞ්ග්‍රහනය ගාථාවෙහි කීහයින් දනයුතුයි.

අකුශල සංග්‍රහනය නිමි යේයි.

අහෙතුක සඞ්ග්‍රහයෙහි දෙළොස් අකුශල චිත්තයෙහිමෙන් කීයයුත්තේයි. සම්ප්‍රයෝග ක්‍රමයෙහිවනාහි අකුශල සංග්‍රහය පළමුකොට දක්වූවාක්මෙන් මේ අහෙතුක සංග්‍රහයෙහිද, අකු ශල විපාකය දක්විය යුතුනොවේද යත්? ලොකොත්තරචිත්තය කුමක්හෙයින් දක්වූයේදැයි චොදනාකටයුතුවෙයි. වෛතසික ධර්මයන් අතිශයින් ව ඩිවූ චිත්තය පළමුකොට දක්වා ඊට අන තුරුව ක්‍රමයෙන් වෛතසිකයන් වැඩිචිත්තයන් දක්වනු පිණිස ලොකොත්තර චිත්තය පළමුකොට දැක්වූයේයයි දතයුතුයි. වෛ තසිකයන්ගේ යෙදීමෙහි මහාකුශලචිත්තයෙහි සියල්ලන්ට අධි කවූ වෛතසිකයන් යෙදෙනහෙයින් කාමාවචර මහාකුශල චිත්තාදිය පළමුකොට දැක්විය යුතු නොවේදැයි ප්‍රශ්නයක්ති බේ. ඊට පරිහාර වචනනම්:-අධිකාවී සවලපාවී දෙකින් යුක්තවූ

කුසල චිත්තයන් අතුරෙන් යම් චිත්තයක් උතුම්වීනම් ඒ චිත්තය පළමුකොට දක්වීම් යුතුයි බැවින් ලොභසහගත චිත්තයෙහි චෛතසික ධර්මයන්ගේ ඵනසඛය ඇති නුමුත් ශ්‍රේෂ්ඨත්වය සළකා පළමුකොට තඛනලද්දේයයි දතයුතු. මහාක්‍රියා චිත්තය හා සමග මහාවිපාක චිත්තයද උත්තමත්වයෙන් ක්‍රියාචිත්තයම පළමුකොට දක්වනලද්දේයි.

මේ ක්‍රියා විපාක චිත්තයෙහි සංග්‍රහනයයි.

"ඉමේ චිත්තාදියුත්තකානං" යනාදී නිගමන ගාථාවෙහි අභිප්‍රායාර්ථය "මෙසේයි:-චිත්තෙන සම්මුද්දිසෙ" යන ගාථාපදයෙහි අභිප්‍රායාර්ථය චිත්ත පරිච්ඡේදයට අනුව යෙදියයුත්තේයි. ඒ මෙසේයි:-සඵශාදිවූ චෛතසිකයෝ සත්දෙන සදිචිත්තසාධාරණ භාවයෙන් සියලු චිත්තයෙහිම යෙදෙනහෙයින් එකුන් අනූවක් සඵශය, එකුන් අනූවක් වෙදනාය, එකුන් අනූවක් සංඥාය එකුන් අනූවක් චෙතනාය, එකුන් අනූවක් එකාග්‍රතාවෝය, එකුන් අනූවක් ජීවිතෙන්ද්‍රියයෝයයි මෙසේ චෛතසික සංඛ්‍යාව මොනවට අවබොධකටයුත්තේයි. පකිණණක චෛතසිකයන් සදෙන අතුරෙන් වනාහි විතකීය සැටෙක්ද; විචාරය පස් පණසෙක්ද, අධිමොක්ෂය එකොළොසක්ද, වීර්‍යය සොළසෙක්ද, ප්‍රීතිය සැත්තෑවෙක්ද, ඡන්දය විස්සෙක්දුයි, මෙසේ පකිණණකයන්ගේ ගණනදතයුතුයි ශ්‍රද්ධාව ආදිකොට ඇත්තාවූ කායප්පස්සද්ධිය තෙක් අවසන්කොට ඇත්තාවූ එකුන්විසි චෛතසිකයන් අතුරෙන් එක් චෛතසිකයක් එකුන් සැටක් ප්‍රභෙදවනහෙයින් ඒ එකුන්විසි ශොභන සාධාරණයන්ගේ එකුන් සැටක් ප්‍රභෙදය වෙන වෙනම දතයුතුයි. අප්‍රමාණයයන් අතුරෙන් එක්කරු ධර්මයක් සොළසක් සොළසක් වනහෙයින් තුන්දෙනාගේ සොළසාකාර භෙදය එන එනක්හුගේ සොළසාකාරවූ භෙදයයි දතයුතුයි. අප්‍රමාණය දෙදෙන අටවිසි චිත්තයෙහි යෙදෙනහෙයින් එන එන ධර්මයක් අටවිසි අවවිසි ප්‍රභෙදවේ. ප්‍රඥා තොමෝ චතාහි පන්සාළිසක් ප්‍රභෙදවෙයි. මෝහ, අහිරිකා, අනොත්තාප්ප, උඛච්ච, යන ධර්මයෝ සතරදෙනවනාහි එනක් එකක් දෙළොස් ආකාරවෙත්. ඉර්ෂ්‍යාදෘෂ්ටියවනාහි සතරාකාර වෙයි. මාත්‍සර්‍යද එසේම සතරාකාරවෙයි. විචිකිච්ඡාවවනාහි විචිකිච්ඡාසහගත චිත්තයෙහි යෙදෙනහෙයින් එකාකාරවන්නේයි. "ඉසියා, මච්ඡේර, කුක්කුච්ච" ධර්මයෝ තුන්දෙනවනාහි යම්කිසි

කෙලෙහ යෙදෙන හෙයින් අනියතයෝයයි කියනලද්දැ, හුය. වෙශය වනාහි දෙයාකාරවන්නේයි. මේසේ මේ චිත්තයෙහි යෙදෙන්නාවූ චෛතසික ධර්මයන් වනාහි තම තමා හා යෙදෙන්නාවූ චිත්තයන්ගෙන් ගණන් බලා චෛතසිකයන්ගේ සංඛ්‍යාව පිවුකොට කියයුතුයි.

මේසේ අභිධම්මාත්ථ සඞ්ග්‍රහයෙහි චෛතසික සඞ්ග්‍රහ විභාගනාම්වූ

විතීය පරිච්ඡේදය නිමියේයි.

තුන්වෙනි පරිච්ඡේදයෙහි පදභාජනීයයි.

යථායොගං, සුදූසු පරිද්දෙන්; සම්පයුත්තා, සහරසම්පයොගලක්ඛණයෙන් යුක්තවූ; චිත්තචෙතසිකා, චිත්ත චෛතසික නම්වූ; ධම්මා, පරමාත්ථ ධර්මයෝ තුමූ; සභාවතෝ, ආරම්මණ විජානන ඵුසනාදි තම තමාගේ කාර්ය්‍ය ලක්ඛණ ප්‍රභේදවශයෙන්; තෙපඤ්ඤා, තෙපණසක් ප්‍රභෙදවූවාහු; හොන්ති, වෙත්; ඉති (ඉදානි) දැන් වනාහි; තෙසං, ඒ තෙපණසක් ප්‍රභෙදවූ සභාව ධර්මයන්ගේ: යථාරහං, සුදූසු පරිද්දෙන්; චිත්තුප්පාදවසෙනෙවා චිත්තචෛතසිකයන්ගේ වශයෙන්ම; වෙදනාහෙතුතෝ, වෙදන, හෙ ය හෙතු භෙදය වශයෙන්ද; කිච්චවාරාලම්බණවත්ථුතෝ, කෘත්‍යය භෙදය, ද්වාර භෙදය, ආලම්බණ භෙදය, වස්තු භෙදය, යනාමොවුන්ගේවශයෙන්ද, සඞ්ගහොනාම්, වෙදනාදී සංග්‍රහ නම් ඇත්තාවූ ප්‍රකීර්ණක සංග්‍රහයන්; ඒයා, මා විසින්; නීය්‍යතෙ, ඵලවත්ලැබේ.

තත්ථ, (තෙසුජ්ජ පකිණ්ණක සඞ්ගහෙසු) ඒ සවැදෑරුම්වූ ප්‍රකීර්ණක සංග්‍රහයන් අතුරෙන්; වෙදනා සඞ්ගහෙ, වෙදනා සංග්‍රහයෙහි, තාව, පළමුකොට; (විභාවෙතා, විභාවය; මයාවුච්චති, මා විසින කියනුලැබේ;) වෙදනා, වෙදනා තොමෝ; සුඛාව, සුඛ වෙදනාවෙක්ද; දුක්ඛාව, දුඃඛවෙදනාවෙක්ද; අදුක්ඛමසුඛාව, දුකුත් නොවූ සැපත් නොවූ උපෙක්ඛාවෙදනාවෙක්ද; ඉති, ශ්‍රීමානාපහෙදෙන) මෙසේ අනුභවන ලක්ෂණ ප්‍රභෙදවශයෙන්; තිවිධා, (හොති) තුන් ප්‍රකාරවන්නේයි. පන, අනුභවන ලක්ෂණ යෙන් අන්‍යවූ ඉන්ද්‍රිය භෙදය දක්වම්:-වෙදනා, වෙදනා තොමෝ; සුඛාව, සුඛවෙදනාවෙක්ද; දුක්ඛාව, දුක්ඛවෙදනාවෙක්ද; සොමනස්සාව, සොම්නස්වෙදනාවෙක්ද; දෙමනස්සාව, දෙම්නස් වෙදනාවෙක්ද; උපෙක්ඛාව, උපෙක්ෂාවෙදනාවෙක්ද; ඉති, (ඉම්නාව

දෙන) මෙසේ ඉන්ද්‍රිය ධර්මයන්ගේ ප්‍රභෙදවශයෙන්; පඤ්චධා වෙයි, පස්ප්‍රකාර වන්නේයි. නමුත්, ඒ වේදනා සංග්‍රහයෙහි නොගෙන්නාවූ අනුරෙන් නොගොස්, ඒ පඤ්චප්‍රකාර වේදනාවන් හා සමඟ හටගන්නාවූ චිත්තයන් අනුරෙන්; සුඛසහගතං, සුඛවේදනාව හා එක්ව හටගන්නාවූ සිත් තෙමේ; කුසල විපාකං, කුසලයාගේ විපාකවූ; කායවිඤ්ඤාණමෙ කමෙව ගොසි, කායවිඤ්ඤාන එකම සිතක් වෙයි; නථා එපරිද්දෙන්; දුක්ඛසහගතං, දුක් වේදනාව හා එක්ව හටගත්තාවූ සිත් තෙමේ; අකුසලවිපාකං, අකුසලයාගේ විපාකවූ; කායවිඤ්ඤාණ මෙකමෙව ගොසි, එක් කායවිඥානයක්ම වෙයි. පන, දුක්ඛවේද නාවෙන් අන්‍යවූ සොම්නස් වේදනාව කියමි; සොමනස්ස සහ ගත චිත්තානි, සොම්නස් වේදනාව හා එක්ව හටගත්තාවූ චිත්ත යෝ තුනී; චත්තාරි ලෝභ මූලානිච, ලොභමූලික චිත්තයෝ සතර දෙනෙක්ද; වාදසකාමාවචර සොභනානිච, කාමාවචර සොභන චිත්තයෝ දෙළොස්දෙනෙක්ද; වෙසුඛඤතිරණසහජානිච, සොම්නස් සහගත සන්තීරණ චිත්තය, සොම්නස් සහගත හසි තොත්පාද චිත්තය යන දෙදෙනාද; ඉති, මෙසේ; අට්ඨාරස කාමා වචර සොමනස්ස සහගත චිත්තානිවෙව, අටළොස් කාමාවචර සොම්නස් සහගත චිත්තයෝද: පඨම, දුතිය, තතිය, චතුත්ථඣා න, සංඛාතානි, ප්‍රථමධ්‍යාන චිත්තයෝ එකොළොස්දෙනය; විතීය ධ්‍යාන චිත්තයෝ එකොළොස්දෙනය: තතියඣාන චිත්තයෝ එකොළොස් දෙනය චතුත්‍රීධ්‍යාන චිත්තයෝ එකොළොස්දෙනය යන; චකුවිඤ්ඤාණාදීස, සුඤාදීසක් ප්‍රභෙදවූ; මහග්ගතලෝකුත්තර චිත්තානි, මහද්ගත ලොකොත්තර චිත්තයෝය; ඉති, (ඉමිනාප හෙදෙන) මෙසේ මේ ප්‍රභෙදයෙන්; වාසට්ඨිවිධානභවන්ති, දෙසැටවැදෑරුම් වෙත්. පන, සොමනස්සසහගත චිත්තයන් ගෙන් අන්‍යවූ දෞම්නස හා එක්ව හටගන්නාවූ චිත්තයෝ තුනී; වෙපටික සම්පයුත්ත චිත්තානෙවඅහානති, ප්‍රතිඝසම්ප්‍රයුක්ත චිත්තයෝ දෙදෙනාම වෙති. සෙසානි, සුඛ දුක්ඛ සෝම නස්ස දෞම්නස්ස වේදනා සහගත චිත්තයන්ගෙන් අව ශිෂ්ටවූ; සඛඛානි, සියලුම; පවපඤ්ඤස, පස්පණස් චිත්තයෝ තුළ; උපෙක්ඛා සහගත චිත්තානි භවන්ති, උපෙක්ඛාසහගතය චිත්තයෝ නම් වෙති. ඉති, මෙසේ මේ උක්තප්‍රකාරයෙන්; (වෙදිතබ්බං) දතයුත්තේයි.

නමුත්, ඒ වේදනා සංග්‍රහයෙහි; වේදනා, වේදනා තොමෝ; සුඛව, සුඛවේදනාවද; දුක්ඛව, දුක්ඛවේදනාවද; උපෙක්ඛාව, උපෙක්ඛා වේදනාවද; ඉති, (ඉමිනාපහෙදෙන) මෙසේ මේ අනු

භවන ලක්ෂණ ප්‍රභෙදයෙන්; නිවිධාහොති, තුන් වැදෑරුම් වෙයි. වෙදනා, වෙදනාතොමෝ; සුඛව, සුඛවෙදනාවද; දුක්ඛව, දුක් වෙදනාවද; සොමනස්සව, සොමනස්ස වෙදනාවද; දෞමනස්සව, දෞමනස්ස වෙදනාවද; උපෙක්ඛාව, උපෙක්ඛාවෙදනාවද; (ඉති ඉමිනාපභෙදෙන) මේසේ මේ ඉන්ද්‍රිය භෙදයෙන් පවඩාහොති, පස්වැදෑරුම්වෙයි. සුඛව, සුඛවෙදනා තොමෝද; දුක්ඛව, දුක් වෙදනා තොමෝද; එකන්තිකං, එකම චිත්තයෙක්හි පිහිටියේයි. දෞමනස්සං, දෞමනස්ස වෙදනා තොමෝ; වයෙකන්තිකං, දෙතැනෙක්හි පිහිටියේයි; සොමනස්සං, සොමනස්ස වෙදනා තොමෝ; වාඝටයි සුඛිතං, දෙඇටවිත්තයෙක්හි පිහිටියේයි. ඉතරා, මොවුන් ගෙන් අන්‍යවූ; උපෙක්ඛාවෙදනා තොමෝ; පවත්තසුඛසුඛකෙ, පස් පණස් චිත්තයෙක්හි; ඝිතා, සිටියාවෙයි; මෙහි වෙදයිත ශබ්දය අපෙක්ෂාකොට "සුඛං දුක්ඛං" යන නපුංසක ලිඛිත නිර්දේශයද, වෙදනා ශබ්දය අපෙක්ෂාකොට "උපෙක්ඛා යන ඉත්‍රි ලිඛිත නිර්දේශයද, සුදුසු පරිද්දෙන් ගොදගත යුතුයි.

භාවාදී.

චෛතසික පරිවෙජ්දය දක්වා තදනන්තරව පකිණ්ණක පරිවෙජ්දය දක්වනුලැබේ:—හේ කෙසේයත්? එකුපපාද, එක නිරොධ, එකාලම්බණ, එකවත්ථුක, සංඛ්‍යාතවූ සතරසම්ප්‍රයොග ලක්ෂණයෙන් යුක්තවූ චිත්ත චෛතසික ධර්මයෝ තුමූ ආරම්මණ විජානනලක්ෂණය, ඵුසන ලක්ෂණය, යනාදිවූ අන්‍යොන්‍ය වීරුඬ ලක්ෂණ වශයෙන් තෙපණස් වැදෑරුම් වෙයි. ඒ සියලු චිත්ත චෛතසිකයෝ වනාහි සවරූපාකාරයකින් තෙපණසක්වන්නාහුද යත්? එකුන් අනුවක් චිත්තයෝ තුමූ අරමුණු දැනගැණීම් සංඛ්‍යාතවූ එකම අර්ථයෙන් ඒ එකුන් අනුවක් චිත්තයම සාධාරණ වූ එකම ලක්ෂණයෙන් යුක්ත හෙයින් එකක්කොට ගත්තේයි. දෙපණස් චෛතසිකයෝ වනාහි ඵුසනවේදිතනාදිවූ තම තමා ගේ ලක්ෂණවශයෙන් දෙපණස් වැදෑරුම් වන හෙයින් දෙපණ සෙක්ම වන්නේයි. ඒ දෙපණසට ඇවකි එක් වැදෑරුම් චිත්තය එක්කොට ගත්කල්හි ඒ තෙපණස තෙපණස් නාම ධර්මයයි ගත යුතුයි. ඒ තෙපණස් නාම ධර්මයෝ තුමූ සුදුසු පරිද්දෙන් චිත්ත චෛතසිකයන්ගේ මිශ්‍රකිරීම් වශයෙන්ම වෙදනා භෙදය, හෙතු භෙදය, කෘත්‍ය භෙදය, වාර භෙදය, ආලම්බණ භෙදය, වත්ථු භෙදය, යන මොවුන්ගේ වශයෙන් වෙදනා සංග්‍රහාදී නම් ඇත් තාවූ ප්‍රකීර්ණක සංග්‍රහයක් ඵලවනු ලැබයි. ඒ තෙපණස් නාම

ධම්මයෝ තුමූ සුදුසු පරිද්දෙන් ඵලවිමය යනු වෙදනා භෙදය, හෙතුභෙදය, කෘත්‍ය භෙදය, වාරභෙදය, ආලම්බණ භෙදය, වත්‍ථු භෙදය, යන මොවුන්ගේ වශයෙන් බෙදීමම සුදුසු පරිද්දෙන් බෙදීම නම් වෙයි දතයුතුයි. ඒ සඝාකාර භෙදයන් අතුරෙන් වෙදනා සංග්‍රහයෙන් බෙදූකල්හි වෙදනාවිරහිත චිත්තයක් නැති බැවින් සියලු එකුන් අනූවක් චිත්තයෝම ලැබෙත්. හෙතුසංග්‍රහයෙන් බෙදූකල්හි අටලොස් අහෙතුක චිත්තයන් හැර එක් සැත් කැවක් සහෙතුක චිත්තයෝ ලැබෙත්. කෘත්‍ය සංග්‍රහයෙන් බෙදූකල්හි කෘත්‍යාදිය රහිතවූ චිත්තයක් නැති බැවින් සියලු එකුන් අනූවක් චිත්තයෝම ලැබෙත්. වාරසංග්‍රහයෙන් බෙදූකල්හි වාර විමුක්තවූ හෙවත් ෂට්වාරශයන් පිටත්හි පවත්නාවූ එකුන්විසි චිත්තයන් හැර අවශෙෂ චිත්තයෝම ලැබෙත් ආලම්බණ සංග්‍රහයෙන් බෙදූකල්හි නිරාලම්බණිකවූ සිතක් නැති බැවින් සියලු එකුන් අනූවක් චිත්තයෝම ලැබෙත්. වත්‍ථුසංග්‍රහයෙන් බෙදූකල්හි සතර අරූප විපාක හා සමග අරූපභූමියෙහි හවඟන් නාවූ දෙසාදිසික් චිත්තයෝ විකල්ප වශයෙන් ලැබෙත්. අනුභවනය යනු අරමුණු රසවිඳහැණීම කියනාලදී. ඒ වෙදනාවම ඊශ්වර භාවිය කරණ හෙයින් ඉන්‍ද්‍රිය ධම්මයෝයයි කියනු ලැබෙත්. අනුභවන ලක්ෂණවශයෙන් ත්‍රිවිධාකාරවූ වෙදනාවන් අතුරෙන් සුඛවෙදනා තොමෝ වනාහි සුඛයහගතවූ තෙසැට චිත්තයෙහි පවත්නාවූ වෙදනාවයයි කියනුලැබෙයි. සුඛවෙදනා සම්‍පයුත්ත තෙසැටෙක්වෙයි. ඒ සුඛවෙදනා හා පවත්නාවූ චෙතසිකයෝ වනාහි අගණිත ග්‍රහණක්‍රියාවෙන් සසාළිසෙක් වෙත්. දුක්ඛ වෙදනා තොමෝ දුක් සහගත තුන්සිතෙහි පවත්නේයි. ඒ තුන් සිතෙහි පවත්නාවූ වෙදනාව දුක්ඛවෙදනායයි කියනු ලැබේ. දුක්ඛවෙදනාවන්ගේ සම්‍මුදය තුන්දෙනෙකි. ඒ දුක්ඛ වෙදනාව හා සමග පවත්නාවූ චෙතසිකයෝ තුමූ අගණිත ග්‍රහණක්‍රියාවෙන් එක්විස්සෙකි. උපෙක්ෂාවෙදනායය යනු උපෙක්ෂා සහගත පස්පණස් චිත්තයෙහි පවත්නා වෙදනාවයි. ඒ උපෙක්ෂාවෙදනාවන්ගේ සම්‍මුදය පස්පණසෙකි. උපෙක්ෂාවෙදනාව හා සමග පවත්නාවූ චෙතසිකයන්ගේ සංඛ්‍යාව අගණිත ග්‍රහණක්‍රියාවෙන් සසාළිසෙක්ම වෙයි. ඉන්‍ද්‍රිය භෙදයද මේ ක්‍රමයෙන්ම විසතර කටයුත්තේයි. ඉන්‍ද්‍රිය භෙදයෙන් බෙදූකල්හි දුක්ඛෙන්‍ද්‍රිය සමග පවත්නාවූ එක් සිතෙක්ද, සුඛෙන්‍ද්‍රිය සමග පවත්නාවූ එක් සිතෙක්ද, සොමනස්සෙන්‍ද්‍රිය සමග පවත්නාවූ දෙසැට චිත්තයෙක්ද, දොමනස්සෙන්‍ද්‍රිය සමග පවත්නා දෙසිතෙක්ද, උපෙක්ඛින්‍ද්‍රිය සමග පවත්නා පස්පණස් චිත්තයෙක්ද වන්නාහුයයි දතයුතුයි.

දුක්ඛවේදනාවෙන් හා සැප වේදනාවෙන්ද අන්‍යවූ වේදනා තොමෝ අදුක්ඛමසුඛානම් වන්නීය. අදුක්ඛම සුඛා යැ කියන්නි යම්මදනාදී සූත්‍රයෙන් මෙහාරාගම්වූ නැනි. අකාරය තෙමේ ප්‍රතිෂේධාර්ථය, විරහාර්ථය, අභාවාර්ථය, මුක්ඛ්‍යාර්ථය, තබහාවාර්ථය, යන මෙතෙක් අර්ථයෙහි පවත්නේයි. ඒ අර්ථයන් අතුරෙන් මේතැන්හි අන්‍යාර්ථයෙහි පවත්නේය යනු බව හඟවන පිණිස අදුක්ඛ අසුඛ ශබ්දයෙහි අකාරය අසඳහ ශබ්දයෙන් විභාවෙහි වණ්ණාකරණ ලද්දේයි. එහෙයින් "දුක්ඛතා අසඳහ අදුක්ඛා සුඛතා අසඳහා අසුඛා," යි පඤ්චවිතත්පුරිස සමාසයයුතුයි. "මෙම භික්ඛවෙ වේදනා සුඛදුක්ඛා" යනුවෙන් සූත්‍රාන්තයෙහි වදළයෙහින වේදනාවෝ දෙදෙනෙක් නොවේදයි යම්කිසි වොදායෙකු විසින් වොදනාකෙළේවිනම් ඒට මෙසේ ප්‍රත්‍යුත්තර දියයුතුයි. ඒ 'මෙම භික්ඛවේ" යනාදී වචනය වනාහි නිරවද්‍ය පක්ෂයෙහිවූ අදුක්ඛමසුඛ උපෙක්ඛා වේදනාව සුඛවේදනාවෙහිද, සාද්‍ය පක්ෂයෙහිවූ අදුක්ඛමසුඛවේදනාව දුක්ඛ වේදනාවෙහිද සඞ්ග්‍රහකොට වේදනාවෝ දෙදෙනෙකැයි වදාරණලද්දාහුය අනවද්‍ය පක්ෂයෙහිවූ වේදනාව නම් කුශලාව්‍යාකතයෙහි පවත්නාවූ උපෙක්ඛා වේදනාවයි. සාවද්‍යපක්ෂයෙහි පවත්නාවූ වේදනාව නම් අකුශල විපාකයෙහිවූ වේදනාවයි. තවද ඇතැම් සූත්‍රාන්තයෙකහි "යං භික්ඛවේ වේදයිතම්ද තං දුක්ඛස්ස, යත්‍රුවෙන් විදීම අර්ථකොට ඇත්තාවූ සියලු වේදනාවෝම දුක්ඛ වේදනාවම දක්නේයැයි යන මේ වචනයද හාශ්‍යවශ්හු විසින් වදාරණලද්දේයි. අභිධම්මයෙහි තුන් ප්‍රකාරයක් හා පස් ප්‍රකාරයක් ඇතැයි වදාරණලද්දවූ මේ වේදනාව ඇතැම් සූත්‍රයෙක්හි දෙවාකාරයයි වදාරා තවත් එකම වේදනාවයයි තවත් සූත්‍රයෙක්හි දේශනාකිරීම කෙසේ ගැලපෙන්නේදැයි යම්කිසි වොදායෙකු විසින් වොදනාකෙළේවිනම් ඒට ප්‍රත්‍යුත්තර මෙසේයි. ත්‍රෛභූමිකවූ සියලු වේදනාවෝ ප්‍රත්‍යයෙන් හටගන්නා බැවින් සියලු වේදනාව දුක් වේදනාවයයි වදාරණලද්දේයැයි දත යුතුයි. තවද සංඛාර දුක්ඛ විපරිනාමදුක්ඛ දුක්ඛ දුක්ඛයයි දුක් වේදනාවම ත්‍රිවිධාකාරවෙයි. ඔවුන අතුරෙන් ජාති ජරා මරණාදී සංඛාර දුක් හා සංඛාර අපා දුකද දුක්මවූ දුක් බැවින් දුක්ඛ දුක්ඛයයි කියාද, අවශෙෂ භවත්‍රයෙහි ඇතුළත්වූ සුඛවේදනා සම්පත්වූ සියලු වේදනාවෝ ප්‍රත්‍යයෙන් හටගන්නා බැවින් සංඛාර දුක්ඛයයි කියාද, සුවාසූදහසක් මහා කල්පයන්ට ආයුෂ ඇත්තාවූ නෙවසඤ්ඤා නාසඤ්ඤායතනයෙන් චුතවී එන්නාවූ දවස්හි සුවාසූදහසක් කල්පය මුලුල්ලෙහි පිහිටුවූ විරාගී සැපය විපරි

නාම දුකඛයෙහි ඇතුලත්වෙයි. එහෙයින් බ්‍රහ්මලෝක දිව්‍ය ලෝක මනුෂ්‍ය ලෝකයෙහි ඇත්තාවූ සුඛ සාමිසතවූ වේදනාවෝ විපරිනාම දුකින් හා සංඛාර දුකින්ද පහනුවූ බැවින් තෙවැනි වෘත්තයම දුඃඛ සත්‍යයයි වදාරණලදීදේයි. එහෙයින් "සංකිලිට්ඨවෙදයිත මිදමෙව දුකඛස්ස" යන දේශනාවම නිප්පර්‍යායවූ (ප්‍රධාන) දෙශනාවම්මවෙයි. සූත්‍රාන්තයෙහි හා අභිධම්පිටකයෙහි වේදනාවෝ ත්‍රිප්‍රකාරය, තිප්‍රකාරය, පඤ්චප්‍රකාරයයි වදාළාවූ දෙශනාවෝ පර්‍යායත (අප්‍රධාන) දෙශනාවෝනම්වෙත්. සම්මාසම්බුදුරජාණන්ගේ දෙශනාවිලාසයෙන් හා විනෙයජනයන්ගේ අදහස් පරිදී දෙන්ද එකම ධර්මය අනෙක ප්‍රකාරයෙන් බෙදා වදාළේයයි දත යුතුයි.

පදභාජනීය.

හෙතු සඞ්ඛාතෙ, හෙතු සඞ්ඛාතයෙහි; (එවං, මෙසේ; විභාගොමයාවුච්චතෙ,) යනු අධ්‍යාහාරයි. හෙතු නාම, හෙතුහු නම් වනාහි; ලොභොච, ලොභ හෙතුවෙක්ද; දොසොච, දෙෂහෙතු වෙක්ද; මොහොච, මෝහහෙතුවෙක්ද; අලොභොච, අලෝභ හෙතුවෙක්ද, අදොසොච, අදෙෂ හෙතුවෙක්ද, අමොහොච ඉති, අමෝහ හෙතුවෙක්දැයි (ඉමිනා.පහෙදනා, මේ ප්‍රභෙදයෙන්,) ජබ්බිධා භවන්ති, සවෙදාරම්මණචිත්. තත්‍ර. ඒ හෙතු සඞ්ඛ්‍රාතයෙහි කොතැනක්ද් ඒ සවෙදාරම්මණ හෙතූන් අතුරෙන් නොනොත් සවෙදාරම්මණ හෙතූන් ඇත්තාවූද නැත්තාවූද හෙතූන් අතුරෙන්; පඤ්චවාරාවජ්ජන විපඤ්චවිඤ්ඤාණ සම්පටිච්ඡන සන්තීරණවොට්ඨපන භවඞ්ගචෙතසා, පඤ්චවාරාවජ්ජන චිත්තඤ දෙපඤ්චවිඤ්ඤාණයෝඤ සම්පටිච්ඡනසඞ්ඛාතඤ සන්තීරණත්‍රඤ ව්‍යවස්ථාපන චිත්තඤ හසිතුප්පාදචිත්තඤ යනමොවුන්ගේවශයෙන්; අඤ්ඤාසු, අට ලොස් චිත්තයෝ තුමූ; අහෙතුක චිත්තානිනාම, සම්ප්‍රයුක්තහෙතු විරහිත බැවින් අහෙතුක චිත්තනම්වූවාහු; නොනත්ථි, වෙත්; සෙසානි අවලොස් අහෙතුක චිත්තයන්හෙන් අවශිෂ්ටවූ; සඞ්ඛාතිපි එක සත්තති චිත්තානි, සියලුම එත් සැත්තෑවක් චිත්තයෝ තුමූ; සහෙතුක චිත්තානි, (නාවුනොනත්ථි) සම්ප්‍රයුක්තහෙතු සහිත බැවින් සහෙතුක චිත්තයෝනම්වෙත්. තත්‍ර අපි, ඒ සහෙතුක චිත්තයන්අතුරෙනුදු; වෙමොමුහ චිත්තානි, මෝහ මූලික චිත්තයෝ දෙදෙන තුමූ; එකහෙතුකානි, එකම හෙතුවක් ඇති බැවින් එක හෙතුක චිත්තයෝනම්වූවාහු; නොනත්ථි, නොවත්. සෙසානි, මොහ මූලික දෙසිතෙන් අන්‍යවූ; දසඅකුසල චිත්තානිවව, දසඅකුසල

චිත්තයෝද; සඞ්ඛාරවිපයුත්තානි, සඞ්ඛාරවිරහිතවූ; වාදසකාමාවචරසොභනානිච: දෙළොස් වැදෑරුම්වූ කාමාවචර සොභන චිත්තයෝද; ඉති, මෙසේ; වාවීසති, දෙවිසි චිත්තයෝ තුමූ; දුහෙතුක චිත්තානි හොනති, හෙතූන්දෙදෙනෙකුගෙන් යුක්ත වෙයින් දුහෙතුක චිත්තනම්වූවාහුවෙත්. වාදසඞ්ඛාරසම්පයුත්ත කාමාවචර සොභනානිවෙව, දෙළොස් වැදෑරුම් ඤාණසම්ප්‍රයුක්ත කාමාවචර සොභන චිත්තයෝද. පංචත්තිංසමහග්ගත ලොකුත්තර චිත්තානිවෙති, පන්තිස් මහද්ගත ලෝකොත්තර චිත්තයෝදැයි යන; සත්තචත්තාළීස, සත්සාළිස් චිත්තයෝ තුමූ; තිහෙතුක චිත්තානි (හොනති) සම්ප්‍රයුක්තවූහේතූන් තුන්දෙනෙකුන්ගෙන් යුක්තවෙයින් ත්‍රිහෙතුක චිත්තනම්වූවාහුවෙත්. ඉති, මෙසේ; වෙදිතබ්බං, දනයුත්තේයි.

අකුසලාහෙතු, අකුශලවූ හෙතුහු තුමූ; ලොභොව, ලෝභ හෙතුවද; දෙසොව, ද්වේෂ හෙතුවද; මොහොව, මෝහහෙතුව දැයි, තයොහොනති, ප්‍රභෙදයෝ තුන්දෙනෙක්වෙත්. කුසලාබ්‍යාකතා, කුශලවූ; අව්‍යාකෘතවූද; හෙතු: හෙතුහු තුමූ; අලොභොව, අලෝභහෙතුවද; අදෙසොව, අද්වේෂ හෙතුවද, අමොහොව ඉති, අමෝහ හෙතුවදැයි; තථා, ඒ අකුශලයෙහිකි පරිදී දෙන්; තයොහොනති, ප්‍රභෙදයෝ තුන්දෙනෙක්වෙත්. අහෙතුකා, අහෙතුක චිත්තයෝ; අට්ඨරස, අවලොස් ප්‍රභෙදය කැයි; මතා, දන්නාලද්දාහුය; එකහෙතුකා, එකහෙතුක චිත්තයෝ; වෙ, ප්‍රභෙද දෙකෙකැයි; මතා, දන්නාලද්දාහුය; දුහෙතුකා, දුහෙතුක චිත්තයෝ; වාවීස, දෙවිසි ප්‍රභෙදයක් ඇත්තාහුයයි; මතා, දන්නාලද්දාහුය, තිහෙතුකා, ත්‍රිහෙතුක චිත්තයෝ; සත්ත චත්තාළීස, සත්සාළිසක් ප්‍රභෙද ඇත්තාහුයයි; මතා, දන්නා ලද්දාහුය.

හා වා තී.

හෙතු තෙමේ ලක්ෂණවශයෙන් සඞ්ඛාරයෙක්ද, කුශලා කුශල අව්‍යාකෘත ජාතිවශයෙන් නවාකාරයෙක්ද, වෙත්. නොහොත් කුශලා කුශල විපාක ක්‍රියාවශයෙන් දෙළොස් ආකාර යෙක්ද, කාමරූප අරූපභූමිවශයෙන් සතිස් ආකාරයෙක්ද වෙත්. නොහොත් ලක්ෂණවශයෙන් සඞ්ඛාරයෙක්ද, මානෘකා වශයෙන් නවාකාරයෙක්ද, නිද්දේශවශයෙන් දෙළොස් ආකාර යෙක්ද, කාමභූමියෙහි සඞ්ඛාරයෙක්ද, රූපාරූප ලොකොත්තර භූමියෙහි තුන් තුන් ආකාරය ලැබෙනහෙයින් නවආකාරයෙ

ක්ද, සිඟලු හෙතූන්ගේ පිඩුකිරීම්වශයෙන් දෙසාළිස් හෙතු කෙතෙක්ද, වෙත්. මේ හෙතූන්ගේ ප්‍රභෙද ක්‍රමයයි. මොහ මූලික දෙසිතෙහි යෙදුනාවූ මොහ තෙමේ අහෙතුක චෛතසිකනම්වෙයි. මොහ මූලික දෙසිත වනාහි එක හෙතු කචිත්තකම්වෙයි. ඒ දෙසිතෙහි යෙදුනාවූ අවශෙෂවූ චෛතසිකයෝද එක හෙතුක චෛතසිකනම්වෙත්. දුහෙතුක චිත්ත සෙහි යෙදුනාවූ චෛතසික සමූහ තෙමේ දුහෙතුක චෛතසික නම්වෙත්, ඒ දුහෙතුක චිත්තයෙහි යෙදුනාවූ අවශෙෂ චෛතසිකයන් හා චිත්තයෝද දුහෙතුක චිත්ත චෛතසිකයෝනම් වෙත්. ත්‍රිහෙතුක චිත්තයෙහි යෙදුනාවූ චෛතසික සමූහ තෙමේ ත්‍රිහෙතුක චෛතසිකනාමවෙත්. (අවශෙෂ චෛතසික යන් හා චිත්තයෝද ත්‍රිහෙතුක චිත්ත ත්‍රිහෙතුක චෛතසිකනාම වෙත්) ලොභ හෙතුව හා දෙස හෙතුවද සිඟලුකල්හිම සහ තුකමවෙත්, මොහ හෙතු තෙමේ අහෙතුක සහ එකහෙතුක වෙයි. අලොභ හෙතුව හා අදෙස හෙතුවද එක හෙතුක සහ දුහෙතුකදවෙයි. අමොහ හෙතු තෙමේ විනාහි ත්‍රිහෙතුකම්වෙයි. ත්‍රිහෙතුකවූ හෙතුධම්මඝන්තම් ඇත්තේමැයි. තදනන්ත රව අහෙතුක දුහෙතුක ත්‍රිහෙතුක චිත්ත විභාගය අභි ධම්මපී සංග්‍රහ පාඨයෙහි ආගතින් අවබොධකටයුතුයි. එහෙයින් හෙතුවී ධම් මාත්‍රයක් විස්තරකොට දක්වනුලැබෙයි. ඒ සංක්ෂෙ පයෙන් සඝාතර්වූ හෙතූන්ගේ හෙතු භාවඝවනාහි ඒ හෙතු සම්ප්‍රයුක්තවූ චිත්තයන් මොහවට පිහිටා සිටීනබවයයි කියන ලද්දවූ මූල භාවඝනම්වෙයි. හෙවත් මූලඝන්ට සදෘශවූ අර්ථයයි. කුමක්හෙයින් මොහවට පිහිටාසිටිනබව මූල සඝභාවඝයි නෙවත් හෙතුබවඝයි කියතලද්දේද ඝන බොදනාවට පරිහාර මෙසේ දතයුතුයි. ලබනලද හෙතුප්‍රතාඝ ඇත්තාවූ ධම්මෝ තුමූ තට ගත් මුල් ඇත්තාවූ වෘක්ෂඝෝ ඒ වෘක්ෂඝන්ගේ මුල් හෙතුකොට ගෙණ ප්‍රකෘති පෘථිවියෙහි ඝම්සේ පිහිටා සිටිද්ද එපරිද්දෙන් සහෙතුකවූ චිත්ත සංඛ්‍යාතවූ වෘක්ෂඝෝද වැටිඝ නොදී දරන් නාහුවෙයි. තවද හවඝත් මුල් ඇත්තාවූ වෘක්ෂඝන්ගේ ඒ මුල් නැමති ඝස්තඝන් ඉසින් පෘථිවී ඔජාව උඩට නඟා ශාඛාග්‍රඝෙහි පුෂ්ප ඵලඝන් උපදවද්ද එපරිද්දෙන්ම සහෙතුක කුසලා කුසල චිත්තඝයන්ගේ ඵලදානඝ ඉහවත් ප්‍රතිසන්ධි ප්‍රවෘත්ති විපාකදීම මේ හෙතු ධම්ඝන්ගේ ශක්තිඝෙන්ම සිඩකෙරෙයි. අහෙතුක චිත්තඝෝ තුමූ හෙතූන්ගේ විරහඝ හෙතුකොටගෙණ දියවිව හවඝත් ශෛවාලඝන්ට සමානවෙත්. එහෙයින් සුවිසිවි බැව් සිඩකිරීම සංඛ්‍යාතවූ මූලනාවඝම් ඝෙතු බවඝම්වෙයි. එහෙ

සින්ම සූත්‍රාන්තයෙහි "ලොභෝ අකුසල මූලං අලොභෝ කුසල මූලං" යනාදීන් අභිධම්මයෙහි වදළාවූ හෙතු ධම්මෝම මූල ධම්මෝයයි වදාරණලද්දාහුය. එතකුදුවුවත් මේ අභිධම්මාවතාරය කොදන්නා අභයගිරිවාසීනු කුශලත්‍රන්ගේ කුසල භාවයද අකුසලයන්ගේ අකුසල භාවයද අව්‍යාකෘත ධම්මත්‍රන්ගේ අව්‍යාකෘත භාවයද සිඛකරන්නාවූ මූල ධම් තෙමේ හෙතු භාවයයි කියත්. අභය ගිරිවාසින්ගේ විනය පරිදීපනිරාකරණය පිණිස මහවිහාරවාසීන්ගේ විභජ්ජවාදයෙන් දුන්නාවූ ප්‍රත්‍යුත්තරය මෙසේයි. ඉදින් අභය ගිරිවාසීන්ගේ මතය පරිදීපනේ කුසලාදීන්ගේ කුශලාදිභාවය සිඛකරන්නාවූ මූල ධම් තෙමේ හෙතුවේනම් ඒ හෙතූන්ගේ කුශලාදි භාවය සිඛකරන්නාවූ අනික් හෙතුවක් සෙවියයුත්තේය. එබඳු ආචාරියනි! හෙතූන්ගේ කුශලාදි භාවය සිඛකරන්නාවූ අනික් හෙතුවක් සෙවිය යුත්තේනම් කියන්නේවීනම් දුහෙතුකවූ කුසලා කුසලත්‍රන්ගේ හා ත්‍රිහෙතුකවූ කුසලා කුසලයන්ගේද එක් හෙතුවක් නොමේ අනික් හෙතූනගේ කුසලා කුසල භාවය සිඛකරන්නේයයි කියයුතුනිසා දුහෙතුක ත්‍රිහෙතුක කුසලා කුසලයන්ගේ කුසලා කුසලයෙහි යෙදුනාවූ හෙතූන්ගේ කුසලා කුසලාදි භාවය සම්ප්‍රයුක්තවූ සෙසු හෙතූන් ප්‍රතිබඛයයි. කිවහැකිවෙයි. එසේ කීකල්හිද මොහ මූලික විත්ත වසෙහි යෙදුනාවූ මොහ හෙතූන්ගේ අකුසල භාවය සිඛකරන්නාවූ අනිත් හෙතුවෙක් නැසිහෙයින් ඒ මොහ මූලික දෙසිතෙහි යෙදුනාවූ මොහයාගේ අකුසල භාවය අහේතුප්‍රතිබඛ නොවෙයි. ඒ මොහය සභාවවසයෙන්ම අකුසල්වන්නේයයි කියයුතු වෙයි. ඉදින් මොහ මූලික දෙසිතෙහි යෙදුනාවූ හෙතූන්ගේ පවණක් අකුසලභාවය හෙතුප්‍රතිබඛතොවෙයි. අවසෙස කුශලා කුසලයන්ගේ කුසලා කුසලාදි භාවය හෙතු ප්‍රතිබඛයයි කියන් නේවීනම් ඒ දෙයාකාර අභිධම්මනයෙන් නොයෙදෙන් නේමැයි. එහෙයින් මොහ මූලික දෙසිතෙහි යෙදුනාවූ මොහ යෝ ඳදෙන තමාගේ සභාවවසයෙන්ම අකුසල්වෙති. සෙසු විහෙතුක දෙ අකුශල චිත්තයෙහි යෙදුනාවූ ලොභ මොහ දෝස මොහයන්ගේ අකුශලභාවය සම්ප්‍රයුක්තවූ අන්‍ය හෙතු ප්‍රතිබඛ වෙයි. නොහොත් ලොභයාගේ අකුශලභාවය තත්සම්ප්‍රයුක්තවූ මොහය ප්‍රතිබඛවෙයි ඒ මොහයාගේ අකුසල භාවයද ලොභ ප්‍රතිබඛවියයි. ප්‍රකාශකරණ විත්තම් එකාන්තයෙන් තොපගේ ඒ වාදය පිහිටුවීමට යුක්තියක් නෝ ආගමක් නොවේ. මෙසේ මහාවිහාරවාසීන් විසින් විමර්දුරු දුන් කල්හි අභයගිරි වාසිනු තුෂ්ණීම්භූතයවුලාහුය. එහෙයින් මොහ මූලික දෙසිතෙහි

යෙදුනාවූ මොහයෝ දෙදෙන තමන්ගේ සභාවයෙන්ම අකුසල්වූවාහුනම් සෙසු සියලු සහෙතුක චිත්තයෙහි යෙදුනාවූ එකුන්සැත්තෑ ප්‍රභෙදවූ (සමාන්‍රිස් ප්‍රභෙදවූ) සහෙතුන්ගේද කුසල අකුසල අව්‍යාකෘත භාවය සඩයං සිඩ්ධ්වේයයි දත යුතුයි. තවද අටලොස් අහෙතුක චිත්තයන්ගේ අව්‍යාකෘත භාවය සිඩ්කරන්නාවූ එකම හෙතුව කුදු නැතිව අව්‍යාකෘත භාවය සඩයං සිඩ්වේනම් සෙසු කුසලා කුසල අව්‍යාකෘතයන්ගේද කුසලා කුසල අව්‍යාකෘත භාවය සඩයං සිඩ්නොවීම්ට හෙතුවක් අභයගිරිවාසීන්ට නොදක්විය හැක්කේයි. එහෙයින් කුසලභාවය යොනිසොමනසිකාර හෙතුවෙන්ද අකුසල භාවය අයොනිසොමසිකාර හෙතුවෙන්ද ක්‍රියාවන්ගේ අව්‍යාකෘතභාවය රහතුන්ගේ සන්තානයෙහි පැවතීමෙන්ද විපාකයන්ගේ අව්‍යාකෘතභාවය කම්ප්‍රතිඩ්ඩ භාවයෙන් හා අවිපාක භාව ප්‍රතිඩ්ඩ භාවයෙන්දවන්කානුයයි දතයුතුයි. මේ හෙතූන්ගේ භූමිවශයෙන් විභාගය කෙසේ යත්? ලොභ වෙෂ මොහ යන ත්‍රිවිධාකාර අකුසල හෙතුහු තුවූ එකොළොස් කාමභූමියෙහි හටගන්නාහෙයින් තුන්දෙනෙක්මවෙති. අලොභ අවෙෂ අමොහ සඩඛ්‍යාත කුසල හෙතුහු තුන්දෙන තුවූ එකොළොස් කාමභූමිය, පසළොස් රූපභූමිය, සතරාකාර අරූපභූමිය, ලොකොත්තර භූමිය යනමේ සතර භූමියෙහි හෙතුහු තුන් තුන්දෙන ලැබෙන හෙයින් දෙළොස් හෙතු කෙනෙක්වෙත්. ඒ දෙළොස් දෙනාගෙන් අකුසල හෙතු තුන්දෙන හා මිශ්‍රවූකල්හි සියලු හෙතුහු භූමිවශයෙන් පසළොස් වැදෑරුම්වෙත්. ජාතිවශයෙන්වනාහි ලොභ වෙෂ මොහ යන හෙතුහු තුන්දෙන අකුසල ජාතියෙහිවූහෙයින් ත්‍රිවිධ අකුසල් හෙතුහුනම්වෙත්. අලොභ අවෙෂ අමොහ සඩඛ්‍යාත හෙතුහු තුන්දෙනවනාහි මාතෘකාක්‍රමයවූ කුසල අව්‍යාකෘත ජාතිවශයෙන් සදෙනෙක්වෙත්. ඒ සදෙනාගෙන් යටකී හෙතුහු තුන්දෙන එක්කොටගත්කල්හි හෙතුහු නවදෙනෙක්වෙත්. එහෙයින් ජාතිවශයෙන් හෙතුහු නවදෙනෙකැයි දතයුතුයි. නිර්දෙශ ක්‍රමයෙන් වනාහි කුසලය, අකුසලය, විපාකය, ක්‍රියාය, යන ඍතර තත්හි කුසල හෙතුහු නවදෙනෙක, අකුසල හෙතු තුන්දෙනෙක, යනමේ දෙපසය එක්කොටගත්කල්හි හෙතුහු දෙළොස් දෙනෙක්වෙත්. මෙසේ සභාවවශයෙන් සදෙනෙක, භූමිවශයෙන් පසළොසෙක, ජාතිවශයෙන් නවදෙනෙක, නිර්දෙශකවශයෙන් දෙළොස් දෙනෙකැයි යන මේ සතරවාරය එක්කොටගත්කල්හි හෙතුහු දෙසාස්‍රිත් දෙනෙකැයි දතයුතුයි. එකුන් අනුවක් විත්තයන් අතුරෙන් අටලොස්

අහෙතුක චිත්තය තබා අවශෙෂවූ එක් සැත්තෑවක් චිත්තයෝ තුමූ ඔව් වැදෑරුම් හෙතූන් හා සම්ප්‍රයුක්තවනහෙයින් සහෙතුක චිත්තයෝනම්වෙත්. ඒ සහෙතුකවූ එක්සැත්තෑවක් චිත්තයන් අතුරෙ නුදු මොහ මූලික දෙසිත එකම මොහ හෙතුවකින් යුක්ත බැවින් එක හෙතුක චිත්තයෝනම්වෙත්. ලොභ මූලික සිත් අටෙහි ලොභ මොහ සංඛ්‍යාත හෙතුහු දෙදෙනෙක්ද වෙෂ මූලික දෙසිතෙහි දොස මොහ සංඛ්‍යාත හෙතුහු දෙදෙනෙක්ද සසුණ්හප්‍රයුක්ත දෙලොස් කාමාවචර ශොභන චිත්තයෙහි අලොභ අවෙෂ සංඛ්‍යාත හෙතුහු දෙදෙනෙක් බැගින්ද සම්ප්‍රයුක්ත වනහෙයින් මේ දෙවිසි චිත්තයෝ තුමූ දුහෙතුක චිත්තයෝනම් වෙත්. ඥානසම්ප්‍රයුක්ත කාමාවචර ශොභන සිත් දෙළසය, පන්සිස් මහද්ගත ලොකොත්තර චිත්තයෝය යන මේ සත්සාළිස් චිත්තයෝ තුමූ අලොභ අවෙෂ අමොහ සංඛ්‍යාතහෙතූන් තුන්දෙනෙකු හා සම්ප්‍රයුක්තවනහෙයින් ත්‍රිහෙතුක චිත්තයෝ නම්වෙතියි දතයුතුයි.

කිච්චසඞ්ගහ පදෙඵ්ඵ.

කිච්ච සඞ්ගහෙන, කෘත්‍ය සඞ්ග්‍රහයෙහි; (එවං විභාගොමයා වුච්චතෙ) ඉතු අඞ්‍යාහාරයි. කිච්චානිනාම, කෘත්‍යයෝවනාහි; පටිසන්ධි භවඞ්ගාවජ්ජනදස්සන සවනඝායන සායන ඵුසන සම්පටිච්ඡන සන්තීරණ වොත්ථප්පන ජවන තදාරම්මණ චුතිව සෙන, පටිසන්ධි කෘත්‍යය, භවාඞ්ග කෘත්‍යය, ආවජ්ජන කෘත්‍යය, දර්ශන කෘත්‍යය, සවන කෘත්‍යය, ඝායන කෘත්‍යය, සායන කෘත්‍යය, ඵුසන කෘත්‍යය, සම්පටිච්ඡන කෘත්‍යය, සන්තීරණ කෘත්‍යය, ව්‍යවස්ථාපන කෘත්‍යය, ජවන කෘත්‍යය, තදාලම්බණ කෘත්‍යය, චුති කෘත්‍යය, යන මොවුන්ගේවශයෙන්; චුද්දස විධානි ගවනති, තුදුස් වැදෑරුම්වෙත්. පන, කෘත්‍යයන්හෙන් අන්‍ය ස්ථානයකියම්:-නෙසං, ඒකෘත්‍යවත්වූ ධර්මයන්ගේ; ඨාන හෙදෙ, ස්ථාන භෙදය; පටිසන්ධි භවඞ්ගාවජ්ජන, පඤ්චවිඤ්ඤණ ඨානාදිවසෙන, ප්‍රතිසන්ධිස්ථානය, භවාඞ්ගස්ථානය, ආවජ්ජනස්ථානය, පඤ්චවිඤ්ඤණස්ථානාදීන්ගේවශයෙන් නොභොත් ප්‍රතිසන්ධි ස්ථානය, භවාඞ්ගස්ථානය, ආවජ්ජනස්ථානය, පඤ්චවිඤ්ඤණස්ථාන ය, සම්පටිච්ඡනස්ථානය සන්තීරණස්ථානය, ව්‍යවපස්ථාපන ස්ථා නය, ජවන්ස්ථානය, තදාලම්බණස්ථානය, චුතිස්ථානය යන මොවුන්ගේවශයෙන් දසධා, දශප්‍රකාර ඇත්තේයයි; වෙදි

තබෙබා, දතයුත්තේසි. ඒ කෘත්‍ය සඞ්ග්‍රහයෙහි නොහොත් ඒ කෘත්‍යසථාන දසදෙනා අතුරෙන් නොහොත් ඒ කෘත්‍ය සථානවත්වූ චිත්තයන් අතුරෙන්; වේ උපෙකඛා සහගත සන්තීරණානි වෙමි, උපෙක්ඛා සහගිය සන්තීරණ චිත්තයෝ දෙදෙනාද; අඞ්ගමහා විපාකානිව, මහාවිපාක චිත්තයෝ අටදෙනද; නවරූපාරූප විපාකානිව, නවවැදෑරුම්වූ රූපාරූප විපාක චිත්තයෝ නවදෙනද; ඉති (ඉමිනාපහෙදෙන,) මෙසේ මේ ප්‍රභෙදයෙන්; එකූනවීසති චිත්තානි, එකුන්විසි චිත්තයෝ තුමූ; පටිසන්ධි භවඞ්ගචුති කිච්චානි නාම, ප්‍රතිසන්ධි කෘත්‍යය, භවාඞ්ග කෘත්‍යය චුති කෘත්‍යයවත්වූ චිත්තයෝනම්වෙත්. පන, ඒ ත්‍රිවිධ කෘත්‍යයෙන් අන්‍යවූ එක කෘත්‍යය ඇත්තාවූ චිත්තයෝ දක්වම්;- ආවජ්ජන කිච්චානි, ආවජ්ජන කෘත්‍යය ඇත්තාවූ චිත්තයෝ තුමූ; වේ, දෙදෙනෙකි; දසසන ඝවන ඝායන සායන ඵුසන සම්පටිච්ඡන කිච්චානිච, රූපයන් දක්නා කෘත්‍යය ශබ්දයන් අසන කෘත්‍යය ගඞ්ධයන් ආඝ්‍රාණයකරණ කෘත්‍යය රසයන් විඳ ගන්නා කෘත්‍යය ඵසීයන් වැදගන්නා කෘත්‍යය ඒ පවාලම්බණයන් පිළිගන්නා කෘත්‍යය යන මොහුද යන මේකී කෘත්‍යවත්වූ චිත්තයෝද; වේ, දෙදෙනෙක් දෙදෙනෙක්වෙති. සන්තීරණ කිච්චානි, සන්තීරණ කෘත්‍යය ඇත්තාවූ චිත්තයෝ තුමූ; තිණි, තුන්දෙනෙක්වෙති. මනොවාරවිජ්ජනමේව, මනොවාරවර්ජන චිත්තයම්; පවවාරෙ, පවවාරයෙහි; වොට්ඨපනකිච්චං සාධෙති, අරමුණුනියමිකරණ කෘත්‍යය සිඹකෙරෙයි. ආවජ්ජනවය වජ්ජිතානි, පවවාරාවර්ජන මනොවාරවර්ජන දෙසිත තොරකොට ඇත්තාවූ; පවජවුසුස, පස්පණසක් පමණවූ කුසලාකුසල ඵලක්‍රියා චිත්තානි, කුශලාකුශල ඵල ක්‍රියා චිත්තයෝ තුමූ; ජවනක්ච්චානි නාම, දිවන කෘත්‍යය සිඹකරන්නාවූ චිත්තයෝනම්වෙත්; අඨ්ඨමහා විපාකානිවෙව, මහාවිපාක චිත්තයෝ අටදෙනද; සන්තීරණත්තයව, සන්තීරණ සිත් තුණද; ඉති, (ඉමිනාප හෙදෙන) මේ ප්‍රභෙදයෙන්; එකාදස, එකොළොස් චිත්තයෝ තුමූ; තදුලම්බණ කිච්චානිනාම, ජවනයන්ගේ අරමුණමගන්නාහෙයින් තදුලම්බණ කෘත්‍ය සාධකවූ චිත්තයෝනම්වෙත්. පන, සප්‍රභෙදයෙන් අන්‍යවූ නිස්ප්‍රභෙදය දක්වම්:- තෙසු, ඒ කෘත්‍ය සථානවත්වූ චිත්තයන් අතුරෙන්; වේ උපෙකඛා සහගත සන්තීරණ චිත්තානි, උපෙක්ඛා සහගියාවූ සන්තීරණ චිත්තයෝ දෙදෙන තුමූ; පටිසන්ධි භවඞ්ග චුති තදාරම්මණ සන්තීරණවසෙන, පටිසන්ධි කෘත්‍යය, භවාඞ්ග කෘත්‍යය

චුති කෘත්‍යය තදාරම්මණ කෘත්‍යය සන්තීරණ කෘත්‍යය යන මොවුන්ගේවශයෙන්; පවකිච්චානි නාම, කෘත්‍ය පසක් ඇත්තාවූ චිත්තයෝනම්වෙත්. අඤ්ඤසමානවිපාකානිච, මහාවිපාක චිත්තයෝ අටදෙන තුමූ; පටිසන්ධි භවඞ්ග චුතිතදාරම්මණවසෙන, පටිසන්ධි කෘත්‍යය භවාඞ්ග කෘත්‍යය චුති කෘත්‍යය තදාරම්මණකෘත්‍යය යන මොවුන්ගේවශයෙන් චතුකිච්චානි නාම, සතර කෘත්‍ය ඇත්තාවූ චිත්තයෝනම්වෙත්; නවමහග්ගත විපාකානි, රූපාරූප විපාක චිත්තයෝ නවදෙන තුමූ; පටිසන්ධි භවඞ්ග චුතිවසෙන, පටිසන්ධි කෘත්‍යය භවාඞ්ග කෘත්‍යය චුති කෘත්‍යය යනමොවුන්ගේ වශයෙන්; තිකිච්චානි නාම, කෘත්‍යත්‍රයක් ඇත්තාවූ චිත්තයෝ නම්වෙත්. සොමනස්ස සන්තීරණං, සොමනස්ස සහගිය සන්තීරණ සිත් තෙමේ; සන්තීරණ තදාරම්මණවසෙන, සන්තීරණ කෘත්‍යය තදාරම්මණ කෘත්‍යයවශයෙන්; දුකිච්චං, කෘත්‍යවයක් ඇත්තාවූ චිත්තයනම්වේ. වොට්ඨපනං, ව්‍යවස්ථාපන චිත්තය තෙමේ; වොට්ඨපනාවජ්ජනවසෙන, පඤ්චාරවිථියෙහි අරමුණුනිශ්චය කිරීමය මනොද්වාරවිථියෙහි අරම්මණ ආවර්ජනාකිරීමය යනමොවුන්ගේවශයෙන්; තථා, එපරිදිදෙන්; දුකිච්චං, කෘත්‍යවයක් ඇත්තාවූ චිත්තයනම්වේ. පන, අනෙක කෘත්‍යයෙන් අන්‍යවූ එක කෘත්‍යය දක්වමි:-සෙසානි, කියනලද්දවුන්හෙන් අවශිෂ්ටවූ; සබ්බානිපි, ජවන මනොධාතුතතිය විඤ්ඤාණඤඤානි, සියලු පස්පණස් ජවන් ගා මනොධාතුත්‍රිකය දෙපස් විඥානයෝ දස දෙනය යන චිත්තයෝ තුමූ; යථාඤමහවං සමභව වශා පරිදිදෙන් එකකිච්චානිහි, එක කෘත්‍යය ඇත්තාවූ චිත්තයෝයයි; වෙදිතබ්බා, දතයුත්තාහුය.

ගා ථා.

පටිසන්ධාදයෝ, ප්‍රතිසන්ධ්‍යාදීවූ නම් ඇත්තාවූ; චිත්තුපාදා, චිත්තමෙවසිසාදයෝ; කිච්චභෙදෙන, කෘත්‍යයන්ගේ ප්‍රභෙදයෙන්; චුද්දස, තුදුස් ප්‍රකාර ඇත්තාහයි; පකාසිතා, ප්‍රකාශකරණලද්දාහුය. ඨානභෙදෙන, ස්ථානයන්ගේ ප්‍රභෙදයෙන්; දසධා, දසප්‍රකාර ඇත්තාහයි. පකාසිතා, ප්‍රකාශකරණලද්දාහුය. එක විසිචතුපඤ්චවිඤ්ඤානානි, එක කෘත්‍යය එකස්ථාන ද්විකෘත්‍යය විසථාන ත්‍රිකෘත්‍යය ත්‍රිස්ථාන චතුකෘත්‍යය චතුස්ථාන පඤ්චකෘත්‍යය පඤ්චස්ථාන ඇත්තාවූ චිත්තයෝ; යථාක්‍රමං, පිළිවෙලින්; අෂ්ට සත්තිව, අටසැටක් ප්‍රභෙද ඇත්තාහුයයිද; තථා, එපරිදිදෙන්; වෙව, විප්‍රකාරයයි කියාද; නවව, නවප්‍රකාරයයි කියාද; අෂ්ටව

අඤ්ඤප්‍රකාරයකි කියාද, වේව, විපාකාරයකි කියාද; නිද්දිසෙ විසතරකරන්නේකි. නොහොත් විසතරතරව.

කෘත්‍ය සංග්‍රහයෙහි සංක්ෂෙප විභාගය මෙසේකි:–පටිසන්ධිය යනු කුමක්හෙයින් පටිසන්ධිනම්වන්නේද යත්? අතීත භවය හා වර්තමාන භවය හෝ වර්තමාන භවය හා අනාගත භවය හෝ ගළපනහෙයින් පටිසන්ධිනම්වෙකි. කෙසේ ගළපන්නේද යත්? චුතියවූයේනම් තදනන්තරව පටිසන්ධියවන්නේමය. එහෙයින් චුතිය හා පටිසන්ධියගේද අතරතුර නොදක්වා ගැළපීම පටිසන්ධිනම්වෙකි. යම්සේ ජීවත්ව ඉන්නාවූ සත්වයෙකුගේ ප්‍රවෘත්ති කාලයෙහි නිරුඬවන්නාවූ චිත්තයක් තෙම හටගන්නාවූ චිත්ත යකට අනන්තරාදී ප්‍රත්‍යයෙන් උපකාරවේද, එපරිද්දෙන් චුති චිත්තයතෙම අනතුරු භවයෙහි පටිසන්ධි චිත්තයට අනන්තරාදී ප්‍රත්‍යයෙන් උපකාරවෙකි. භවාඞ්ගය යනු කුමක්ද යත්? සැඩ පහර ඇත්තාවූ ගඞ්ගාවෙක්හි බස්නා ජලශ්‍රෝත්‍රයමෙන්ද, දල් වන්නාවූ පහණක පහන් සිළුමෙන්ද නොහොත් ගඞ්ගාශ්‍රෝත්‍රය පළමු ජලයට පසුව බස්නාවූ ජලයද, පළමු හටගත්තාවූ පහන් සිළුවට පසුවහටගත්තාවූ පහන්සිළුද අතරතුර නොදක්වා බස් නාක්මෙන්ද, දැල්වෙන්නාක්මෙන්ද, උපප්‍රාප්ති භවයට කාරණ වශයෙන් හටගන්නාවූ චිත්ත පරම්පරා තොමෝ භවාඞ්ගයයි කියත්. සත්වයාගේ සයන කාලයෙහි පවෘත්තියන් විසින්ම රූපාදි අරමුණු නොගත හැකි බැවින් චිත්ත පරම්පරාව පැවතීමට හෙතුවක් නැතිවෙකි. එහෙයින් සුවල්ප කාලයෙහි හෝ උප ප්‍රාප්ති භවයෙහි අරමුණු නොගන්නා කාලයෙහි හෝ යටගිය ජාතියෙහි මේ භවයෙහි ඉපදීමට හෙතුවූ යම්කිසි කර්මයක් හෝ කර්ම නිමිත්තක් හෝ ගති නිමිත්තක් හෝ වැටහී ප්‍රත්‍ය සන්නියවූයේනම් වර්තමාන භවයෙහි අරමුණු නොගන්නාකල් හිද සැපත කාලයෙහිද එම අරමුණ ඵල්බහෙණ භූමි ජාති සම්ප්‍රයුක්ත ධර්ම සංස්කාර ආරම්මණයන්ගේවශයෙන් සවිප්‍රකාර යෙන් ප්‍රතිසන්ධි චිත්තයට සමානවූ සිතක් නිරතුරුව පවත් නේය. ඒ සිත උපප්‍රාප්ති භවය නොසිදිමට කාරණාවන හෙයින් "භවස්ස අඞ්ගං කාරණං භවඞ්ගං" යන නිර්වචන බැවින් භවාඞ්ගයමවෙකි. විපාක චිත්තයන්ගේ පැවැත්ම තමහට නොවැටහෙනහෙයින් සවපනයෙහි සිඳුවූ දෙය මූලාවට පැමිණෙකි. පවෘත්තියෙහි හටගන්නාහෙයින් පවෘත්තිවර්ජිතතම් වූද, මනොවාරයෙහි හටන්නාහෙයින් මනොවාරවර්ජිතතම් වූද චිත්තයෝ දෙදෙනා ආවර්ජන කෘත්‍යයතුමවෙත්. දර්ශන

කෘත්‍යය සිඛකරන්නාවූ චක්ෂුර්විඥානයෝ දෙදෙන දර්ශන කෘත්‍යනම්වෙත්. එසේ එපරිද්දෙන්ම ඉෂ්ටානිෂ්ටවූ ශබ්දයන් ශ්‍රවණයකරන්නාවූ දෙසිත ශ්‍රවණ කෘත්‍යනම්වෙසි. ඉෂ්ටානිෂ්ටවූ ගන්ධයන් ආඝ්‍රාණයකරන්නාවූ දෙසිත ඝ්‍රාණකෘත්‍යනම්වෙසි. ඉෂ්ටානිෂ්ටවූ රස විඳගන්නාවූ දෙසිත ඝායන කෘත්‍යයනම්වෙසි. ඉෂ්ටානිෂ්ටවූ පහස් විඳගන්නාවූ දෙසිත ඵුසන කෘත්‍යනම්වෙසි. චක්ෂුරාදි පඤ්චද්වාරයෙහි හැවෙන්නාලද පඤ්චාලම්බණයන් පිළිගන්නා හෙයින් සම්පටිච්ඡන කෘත්‍යනම්වෙසි. සම්ප්‍රතිච්ඡන චිත්තයෙන් විසින් පිළිගන්නාලද අරමුණු මොනවට ලකුණුකරණහෙයින් හෙවත් සලකන අර්ථයෙන් සන්තීරණ කෘත්‍යනම්වෙසි. පඤ්චද්වාරයෙහි රූපාදී අරමුණු පස නියමකරණහෙයින් ව්‍යවස්ථාපනනම්වෙසි. අරමුණු රස භාත්පසින් විඳගැණීම්වශයෙන් යුහු සුළුව නොහොත් නැවත නැවත හවහැණීම ජවන කෘත්‍යනම්වෙසි. ඒ ජවනයන්ගේ අරමුණම ඵල්බගෙණ අරමුණු රසවිඳගැණීම තදාලම්බණ කෘත්‍යනම්වෙසි. චතීමාන භවයෙන්ගිලිහීම චුති කෘත්‍යනම්වෙසි. මේ චුති කෘත්‍යය මානෘකාවශයෙන් අවසානයෙහි යොදා පදභාජනය කරන්නාවූ කාලයෙහි කුමක් හෙයින් ආදිභයෙහි තබනලද්දේද ඝත්? පටිසන්ධි භවාඞ්ග චුති යන චිත්තයෝ තුන්දෙනම සම්ප්‍රකාරයෙන් සම්ප්‍රයුක්ත සහජාදි වශයෙන් සමානවෙසි. එහෙයින් මේ චිත්තයෝ තුන්දෙන එක් රැස්කොට දක්වනලදහ. සඨානවශයෙන් ප්‍රතිසන්ධිසඨාන එකෙනෙක, භවාඞ්ගසඨානයෝ සදෙනෙක, ආවර්ජනසඨානයෝ දෙදෙනෙක, පඤ්චවිඥානසඨාන, එකෙක, සම්ප්‍රතිච්ඡන සඨාන එකෙක, සන්තීරණ සඨාන එකෙක, ව්‍යවස්ථාපන සඨාන දෙකෙක, ජවනසඨාන සදෙනෙක, තදාලම්බන සඨාන දෙනෙක, චුතිසඨාන තුනෙක, යනමේ සිඟල්ල පිඬුකළකල්හී සඨානයෝ පස්විසිදෙනෙක්වෙති. ප්‍රතිසන්ධි සඨානය වනාහි මරණාසන්න වීථියෙන් උපදියුත්තේය. භවාඞ්ග සඨානයෝ සදෙන වනාහි මරණාසන්න වීථිදෙකෙක, ප්‍රතිසන්ධිසඨාන එකෙක, ප්‍රවෘත්තිකාලයෙහි අතිමහන්තාලම්බණ වීථි එකෙක, පරිත්තාලම්බණ වීථි එකෙක, අතිපරිත්තාලම්බණ වීථි එකෙක යනමේ චිත්ත වීථීන් එක්කොට භවාඞ්ගසඨාන සදෙන දතයුත්තාහුය. ආවර්ජනසඨානයෝ දෙදෙනානම්:-පඤ්චාර වීථියෙහි එක් තැනෙක, මනොද්වාර වීථියෙහි එක් තැනෙකැයි දතයුතුයි. පඤ්චවිඥාන සම්පටිච්ඡන සන්තීරණ සඨානයෝ වනාහි පඤ්චාර වීථියෙහි ගතයුත්තේයි. ව්‍යවස්ථාපන සඨානයෝ දෙදෙනා වනාහි අතිමහන්තාලම්බණවීථිය මහන්තාලම්බණ වීථිය යන විථි දෙක්හි එක්

තැනෙක, පරිත්තාලම්බණ විපියෙහි එක් තැනෙකැයි ගතයුත් තේයි. ජවන සථානයෝ සදෙතා නම්,-අතිමහන්තාලම්බණ විපිය, මහන්තාලම්බණවිපිය, විභූතාලම්බණවිපිය, අවිභූතාල ම්බණවිපිය, ජවනයන්ට අනතුරුව චුතිය හටගන්නාවූ මරණා සන්න මනොවාර විපිය, ජවනයන්ට අනතුරුව චුතිය හටගන් නාවූ චක්ඛුවාර මරණාසන්න විපියද යනමේ සදෙන දතයුත් තාහුය. තදුලම්බණ තුණ්හනම්:-ප්‍රවෘත්තිකාලයෙහි දෙතැ නෙක, මරණාසන්න කාලයෙහි එක් තැනෙකැයි, තුන්දෙනයි. චුති සථානයෝ තුන්දෙනනම්:-මරණාසන්න චිත්ත විපි තුණෙ හිම දතයුත්තාහුයි, මෙසේ පස්විසි සථානය වෙන්වෙන්කොට බෙදා දතයුත්තේයි. ඒ පස්විසි සථානයන් අතුරෙන් චුති භවඞග චිත්තයන්ගේ අතර එකම පටිසන්ධි සථානනම්වෙයි. පටිසන්ධි ආවර්ජනයන්ගේද, ජවන ආවර්ජනයන්ගේද, තදුලම්බණආවර්ජ නයන්ගේද, ව්‍යවසථාපන ආවර්ජනයන්ගේද, ජවනචුතීන්ගේද, තදුලම්බණචුතීන්ගේද, අතරතුර භවිභවාඞග සථානයෝනම්වෙත්. භවාඞග පවවිඤ්ඤාතයන්ගේද, භවාඞගජවනයන්ගේද, අතරතුර ආවර්ජන සථානවය නම්වෙයි පවවාරවර්ජන සම්ප්‍රතෙෂණ යන්ගේ අතරතුර එකම පවවිඤ්ඤානසථානනම්වෙයි. පවවිඤ්ඤාන සන්තීරණයන්ගේ අතරතුර එකම සම්පටිච්ඡන සථානනම් වෙයි. සම්පටිච්ඡන ව්‍යවසථාපනයන්ගේ අතරතුර එකම සන්තී රණ සථානනම්වෙයි. සන්තීරණ ජවනයන්ගේද, සන්තීරණ භවාඞගයන්ගේද, අතරතුර ව්‍යවසථාපනවයනම්වෙයි. ව්‍යවසථා පන තදුලම්බණයන්ගේද ව්‍යවසථාපන භවාඞගයන්ගේද, ව්‍යව සථාපන චුතීන්ගේද, මනොවාරවර්ජන තදුලම්බණයන්ගේද, මනොවාරවර්ජන භවාඞගයන්ගේද, මනොවාරවර්ජන චුතීන් ගේද, අතරතුර ජවන සථානයෝ සදෙතනම්වෙත්. ජවනභවා ඞගයන්ගේද, ජවනචුතීන්ගේද, අතරතුර තදුලම්බණ සථාන වයනම්වෙයි. ජවනපටිසන්ධීන්ගේද, තදුලම්බණ පටිසන්ධි චිත්තයන්ගේද, භවාඞග පටිසන්ධි චිත්තයන්ගේද, අතරතුර චුති සථානත්‍රයනම්වෙයි. මෙසේ සූළී චිත්ත පඤ්චම චිත්තයන්ගෙන් හටගන්නාවූ පස්විසි සථානය දතයුත්තේයි. මේ සථානයන්ගේ ආකාරය දැනගැනීම පිණිස චිත්ත විපි විත්‍යාසය කොට අවබෝධ කටයුතුයි. ඒ ඒ කෘත්‍ය සිඞ්කරන්නාවූ චිත්ත යෝ මෙසේ දතයුත්තාහුය. උපෙක්ඛා සහගත සන්තීරණ චිත්තයෝ දෙදෙනාය, ඔහාවිපාක යෝ අටදෙනය, රූපා රූප විපාකයෝ නවදෙනය, යනමේ එකුන්විසි චිත්තයෝ තුමූ පටි සන්ධි කෘත්‍යය, භවාඞග කෘත්‍යය, චුති කෘත්‍යය සිඞ්කරන්නාවූ

චිත්තයෝ නම්වෙත්. පටිසන්ධි චිත්තය, භවාඞ්ග චිත්තය චුති චිත්තයයි කියාද ව්‍යවහාරකෙරෙත්. පඤ්චද්වාරාවර්ජන මනොද්වාරාවර්ජන චිත්තයෝ දෙදෙන ආවර්ජනා කෘත්‍යය සිඞ්කරන්නාවූ චිත්තයෝනම්වෙත්. චක්ෂුර්විඥාන දෙසිත දර්ශන කෘත්‍යය සිඞ්කරයි. ශ්‍රොත විඥාන දෙසිත ශ්‍රවන කෘත්‍යය සිඞ්කරයි. ඝ්‍රාණ විඥාණ දෙසිත ඝායන කෘත්‍යය සිඞ්කරයි. ජිහ්වා විඥානදෙසිත ආඝායන කෘත්‍යය සිඞ්කරයි. කාය විඥාන දෙසිත ස්පර්ශන කෘත්‍යය සිඞ්කරයි. සම්ප්‍රතිච්ඡන යුගලය අරමුණු පිළිගන්නා කෘත්‍යය සිඞ්කරයි. සන්තීරණත්‍රය අරමුණු සලකන කෘත්‍යය සිඞ්කරයි. මනොද්වාරාවර්ජනය ව්‍යවස්ථාපනකෘත්‍යය සිඞ්කරයි. දෙලොස් අකුශල් සහ හසිතොත්පාද චිත්තය, මහා කුශල් අටය, මහාක්‍රියා අටය, මහද්ගත කුශල් නවය, මහද්ගත ක්‍රියානවය, ලොකොත්තර අටය, යනමේ පස්පණස් චිත්තයෝ තුමූ ජවන කෘත්‍ය සිඞ්කෙරෙති. සන්තීරණත්‍රය, මහාවිපාක අටය, යන එකොළොස් චිත්තයෝ තුමූ තදාලම්බණ කෘත්‍ය සිඞ්කෙරෙත්. ඒ ඒ කෘත්‍යය සිඞ්කරන්නාවූ චිත්තයන් වෙන වෙන පිඬුකොට දක්වත්හොත් උපෙක්ඛා සන්තීරණ යුගලය, පටිසන්ධි, භවාඞ්ග, චුති, තදාලම්බණ සන්තීරණ යන පවත්‍රකෘත්‍යයක් හා පස්තැනක් ඇත්තාවූ චිත්තයෝනම්වෙත්. මහාවිපාකයෝ අටදෙන වනාහි පටිසන්ධි භවාඞ්ග චුති තදාලම්බණ යන සතර කෘත්‍යයක් හා සතර ස්ථානයක් ඇත්තාවූ චිත්තයෝනම්වෙත්. මහද්ගත විපාකයෝ නවදෙන වනාහි පටිසන්ධි භවාඞ්ග චුති යන කෘත්‍යත්‍රයක් හා ස්ථානත්‍රයක් ඇත්තාවූ චිත්තයෝනම්වෙත්. සොම්කස් සන්තීරණය වනාහි තදාලම්බණ සන්තීරණ කෘත්‍යවයක් හා ස්ථානවයක් ඇත්තාවූ චිත්තයනම්වේ. මනොද්වාරාවර්ජන චිත්තයවනාහි එසේම කෘත්‍යවයක් හා ස්ථානවයක් ඇත්තාවූ චිත්තයනම්වේ, පස්පණස් ජවන්ත්‍රය, මනොධාතුත්‍රිකය, දෙපස් විඥානයෝ දසදෙනය, යන මෙතෙක් චිත්තයෝ වනාහි එකම කෘත්‍යයක් හා එකම ස්ථානයක් ඇත්තාවූ චිත්තයෝ නම්වෙත්.

වාරාදීහි,

වාරසඞ්ගහෙ, වාරසඞ්ග්‍රහයෙහි; (එවං, මෙසේ; විභාගෙ; විභාගයෙ; වෙදිතබ්බෙ, දතයුත්තේහි) වාරුත්තිකාම්, වාරයෝ වනාහි; චක්ඛුවාරව, චක්ඛුවාරයද; සොතවාරව, ශ්‍රොත්‍රවාරයද; ඝාණවාරව, ඝ්‍රාණවාරයද, ජිවහාවාරව, ජිහ්වාවාරයද;

කායවාරව, කායවාරයද; මනොවාරව, මනොවාරයද; ඉති, (ඉමිනාපභෙදෙන) මේ ප්‍රභෙදයෙන්; ඡබ්බිධානි භවන්ති, සවැදෑරුම්වූවාහුවෙත්. තත්‍ර, ඒ සවැදෑරුම් වාරයන් අතුරෙන්; චක්ඛුමෙව, ප්‍රඥාදර්ශනසම; චක්ඛුවාරං, චක්ඛුවාරනම්වේ. තථා, ඒ චක්ඛුවාරයමෙන්ම; සොතාදයොං, ප්‍රඥාද ශ්‍රොත්‍රය, ප්‍රඥාද ඝ්‍රාණය, ප්‍රඥාද ජිව්හාවය, ප්‍රඥාදකායය යන මෙවිහු; සොත වාරාදීනි, ශ්‍රොත්‍රවාර ඝ්‍රාණවාර ජිව්හාවාර කායවාරයෝත්මවෙති. පන, පවවාරුයෙන් අන්‍යවූ මනොවාරය කියම්:-නොහොත් රූපවාරයෙන් අන්‍යවූ නාම වාරය කියම්:-නොහොත් සුඛයෙන් අන්‍යවූ මිශ්‍රකනය කියම්. භවඞ්ගං, එකුන්විසි වැදෑරුම්වූ භවඟුපවෙදය; මනොවාරනති, මනොවාරයයි නොහොත් ආවර්ජනාදිවූ චිත්ත චිත්තයන්ගේ ඉපදීමට කාරණයයි. නොහොත් එකුන්විසි භවාංගු පවෙදයම මනොවාරාවර්ජනාදී චිත්ත චිත්තයන්ගේ ඉපදීමට කාරණයයි; පවුච්චති, කියනුලැබේ. නෙවත් අනෙක ප්‍රකාරයෙන් කියනුලැබේ. තත්‍ර, ඒ වාරසංග්‍රහයෙහි නොහොත් සවැදෑරුම්වූ වාරයන් අතුරෙන් නොහොත් සවැදෑරුම් වාරයෙහි භවඞ්ගන්නාවූ චිත්තයන් අතුරෙන්; චක්ඛුවාරෙ, චක්ඛුවාරයෙහි; පවවාරාවජ්ජන චක්ඛු විඤ්ඤාණ සම්පටිච්ඡන සන්තීරණ වොට්ඨපන කාමාවචර ජවන තදාලම්බණවසෙන, පවවාරාවර්ජනය චක්ඛුර්විඤ්ඤාන දෙසිතය, සම්ප්‍රත්‍යෙෂණ යුගලය සන්තීරණත්‍රය, ව්‍යවස්ථාපන චිත්තය, එකුන්තීස් කාමාවචර ජවන්හුය, එකොළොස් තදාලම්බණයෝය, යනමොවුන්ගේවශයෙන්; ඡචිත්තානීස චිත්තානි, සසාළීස් චිත්තයෝ තුළු; ඡථාරහං, සුදුසු පරිද්දෙන්; උපපජ්ජන්ති, උපදනාහුවෙත්. තථා, ඒ චක්ඛුවාරයට කීතයින්; සොතවාරාදිසුපි, ශ්‍රොත්‍ර ඝ්‍රාණ ජිව්හාකාය යන වාරයෙහි; පවවාරාවජ්ජන සොතවිඤ්ඤාණාදි වසෙන, පවවාරාවජ්ජන ශ්‍රොත්‍රවිඤ්ඤානාදීන්ගේවශයෙන් නොහොත් පවවාරාවජ්ජන, ශ්‍රොත්‍රවිඤ්ඤානය, පවවාරාවජ්ජන ඝ්‍රාණවිඤ්ඤානය, පවවාරාවජ්ජන ජිව්හාවිඤ්ඤානය, පවවාරාවජ්ජන කායවිඤ්ඤානය, සම්පටිච්ඡන සන්තීරණ ව්‍යවස්ථාපන කාමාවචර ජවන තදාලම්බණ යන මොවුන්ගේවශයෙන්; ඡචිත්තානීසෙව චිත්තානි, සසාළීස් චිත්තයෝම; භවන්ති, භවඟණිත්, ඉති, මෙසේ; සබ්බථාපි, සම්ප්‍රකාරයෙ නුදු; පවවාරෙ, පවවාරයෙහි; චතුපඤ්ඤාසචිත්තානි, අඟණිත ග්‍රහණන්‍යායෙන් සුපණස් සිත් කොපෙක් තුළු; කාමාවචරානෙව, කාමාවචරවූවාහුම; භවන්ති, භවඟණිත්. පන, පවවාරයෙන් අන්‍යවූ මනොවාරය කියම්. මනොවාරෙ, මනොවාරයෙහි; මනොවාරාවජ්ජන පවපඤ්ඤාස

ජවන සදෘලම්බණවසෙන, මනොවාරවජ්ජනය, පඤ්චණ්ණ ජවන්හුය, එකොළොස් තදෘලම්බණය, යන මොවුන්ගේවශයෙන්; **සත්තසඞ්ඛි චිත්තානි**, සත්සැට යි කෙනෙක් තුමූ; භවන්ති, උපදනාහුවෙත්. එකූනසත්තති, එකුන්හැත්තෑ යි කෙනෙක් තුමූ; පටිසන්ධි භවඞ්ග චුතිවසෙන, **ප්‍රතිසන්ධි** භවාඞ්ග චුතින්ගේවශයෙන්; වාරවිමුත්තානි, **ෂට්වාරයෙන්** මිදුනාවූ **චිත්තයෝනම්වෙත්**; පන, **ප්‍රදෙශයෙන් අන්‍යවූ** සමුදය දක්වම්. තෙසු, ඒ **ෂට්වාරික චිත්තයන්** අතුරෙන්; පඤ්චද්වාරාණාවෙව, දෙපස් විඤ්ඤාණයෝ **දසදෙනද**, මහග්ගත ලොකුත්තර ජවනානිව, මහද්ගත ලොකොත්තර ජවනයෝ සත්විසිදෙනද; ඉති (ඉම්නාපභෙදෙන) මෙසේ **මේ ප්‍රභෙදයෙන්**; ඡත්තිංස, **ඡත්තිසක් ප්‍රභෙදවූ චිත්තයෝ** තුමූ; ඨාරහං, සුදුසු පරිදෙන්; **එකවාරික චිත්තානි නාම**, එකවාරික චිත්තයෝ නම්වෙත්. පන, එකවාරික චිත්තයන් ගෙන් අන්‍යවූ පවවාරික චිත්තයන් දක්වම්. මනොධාතුත්තිකං, පඤ්චවාරාවජ්ජන සම්ප්‍රත්‍යෙෂණ යුගල සංඛ්‍යාතවූ **මනොධාතු ත්‍රික** නමේ; පඤ්චවාරිකං, පඤ්චද්වාරයෙහි උපදනේයි. සුඛසන්තීරණ වොත්ථපන කාමාවචර ජවනානි, සොම්නස් සහගිත සන්තීරණ චිත්තය, ව්‍යවස්ථාපන චිත්තය, එකුන්තිස් කම්වැදරි ජවන්හුය, යනමේ චිත්තයෝ තුමූ; ඡවාරික චිත්තානිනාම, **ෂට්වාරයෙහි** උපදනා **චිත්තයෝ නම්වෙත්**. උපෙක්ඛා සහගත සන්තීරණ මහාවිපාකානි, උපෙක්ඛා සහගිත සන්තීරණයෝ දෙදෙනද, මහාවිපාකයෝ අටදෙනද, යනමේ චිත්තයෝ තුමූ; ඡවාරිකානිවෙව, ෂට්වාරයෙහිද උපදනාහුවෙති. වාරවිමුත්තා නිව, ඇතැම් කලෙක්හි ෂට්වාරයෙන් මිදුනාහුවෙති. මහග්ගත විපාකානිනව, මහද්ගත විපාකයෝ නවදෙන තුමූ; **වාරවිමුත්තා** නෙව, සියලුකල්හිම **ෂට්වාරයෙන්** මිදුනාහුමවෙත්. ඉති, මෙසේ වෙදිතබ්බං, දහසුතුසි.

එකවාරික චිත්තානිව, එක්වාරයෙක්හි උපදනා **චිත්ත යෝද**; පවවාරිකානිව, පවවාරයෙහි උපදනා චිත්තයෝද, ඡවාරිකානිව, **ෂට්වාරයෙහි** උපදනා චිත්තයෝද, ඡවාරිකවී මුත්තානිව චිත්තානි, ෂට්වාරයෙහි ඉපිද ඇතැම් **කලෙක්හි ෂට් වාරයෙන්** මිදුනාවූ චිත්තයෝද, සඞ්ඛ්‍යා, සංඛ්‍යා ප්‍රකාරයෙන්; විමුත්තානිව, **ෂට්වාරයෙන්** මිදුනාවූ චිත්තයෝද; යථාක්කමං, පිළිවෙළින්; ඡත්තිංසතිව, සත්සැක් ප්‍රකාර ඇත්තාහුයයිද; තථා, එපරිද්දෙන්; තීණිව, තුන්ප්‍රකාර ඇත්තාහුයයිද; **එකතිංසව**, **එක්තිසෙක්ද**, දසඛ්ව, දසප්‍රකාර ඇත්තාවූද, නවව, නව

ප්‍රකාර ඇත්තාහුද; ඉති, ආවජ්ජනා: පවඩා, පස්ප්‍රකාරයකින්; පරිදීපයෙ, හාත්පසින් ප්‍රකාශකරන්නේයි.

"චාරය" යනු මනුෂ්‍යයන්ගේ ඇතුල්වීමට හා නික්මීමට කාරණාවූ චාරයයි කියත්. මේ ස්ථානයෙහි චක්ඛුච්චාරයෙහි රූපාලම්බණය එල්බගෙණ සසාස්‍රිස් සිත් කෙනෙක් තුමූ ඇතුල්වීම හා නික්මීමද කෙරෙත්. චිත්තයාගේ ඉපදීම ඇතුල්වීමට බඳුවෙයි. චිත්තයාගේ නිරුඩ්ඨීම නික්මීමට බඳුවෙයි. එහෙයින් චක්ඛුච්චාරයයි කියතුලැබේ. සොතඝාණ ජිව්හාකාය යන චාරසතරෙහිද, ඝබ්දලම්බණ ගන්ධාලම්බණ රසාලම්බණ ස්පෂ්ඨාලම්බණයන් එල්බගෙණ සසාස්‍රිස් සසාස්‍රිස් සිත් කෙනෙක්ම ඇතුල්වීම් සංඛ්‍යාතවූ ඉපදීමට හා නික්මීම් සංඛ්‍යාතවූ නිරුඩ්ඨයට පැමිණෙනහෙයින් සොතච්චාරය, ඝාණච්චාරය, ජිව්හාච්චාරය, කායච්චාරයයි කියත්. "චක්ඛුමෙව" යන්නෙහි එව ශබ්ද නෙමේ විභාවනී ටීකායෙහි ආක්‍රමයට මාංශ චක්ඛුවම කියන්නේයයිද "මණිසාරමංජුසා" ටීකායෙහි ආක්‍රමයෙන් චක්ඛූර්දශක කලාපයෙහි චක්ඛුප්පසාදයෙන් අවශිෂ්ටවූ නවරූපය කියන්නේයයිද කියත්. මනොච්චාරය යනු කුමක්ද යත්? භවඞ්ග පවෙජ්ද චිත්තය මනොච්චාරයයි කියත්. එසේවිනම් පටිසන්ධි චිත්තයට අනතුරු නැන්හි හටගන්නාවූ ප්‍රථම භවාඞ්ගාදිය පවත් සියලු භවාඞ්ගයෝම සිදි සිදී යන්නාහුවෙති. ඒ සිදි සිදී යන්නාවූ සියලු භවාඞ්ගයෝම මනොච්චාරයයි ගතයුතුද යනු ප්‍රශ්නයක්වෙයි. ප්‍රථම භවාඞ්ගාදී සියලු භවාඞ්ගයෝම අනතුරුව උපදනා භවාඞ්ග චිත්තයාගේ ඉපදීමට හෙතුභාවයෙන් සිදියන්නාහවෙති. ඒ භවාඞ්ගයෝ මනොච්චාරයයි නොගතයුතුයි. යම් භවාඞ්ගයක් වනාහි විපි චිත්තයන්ගේ ඉපදීමට කාරණා බැවින් සිදියන්නේවිනම් ඒ භවඞ්ග පවෙජ්දයම් මනොච්චාරයයිගතයුතුයි. ඉදින් එසේවිනම් චක්ඛුරාදී පඤ්චාරයෙහි අරමුණුගැටුනුකල්හී පඤ්චාරාවජ්ජන චිත්තයට මූලින් උපදනා භවඞ්ග පවෙජ්ද චිත්තයද. විපි චිත්තයන්ගේ ඉපදීමට උපකාරවෙමින් භවාඞ්ග ශ්‍රෝතය සය සිදිනේවෙයි. ඒ භවඞ්ග පවෙජ්දයත් මනොච්චාරයයිගතයුතුද යත්? එසේ නොගතයුත්තේයි. පඤ්චාරාවජ්ජන චිත්තයට පළමුව උපදනා භවඞ්ග පවෙජ්ද චිත්තයද චක්ඛුරාදී පඤ්චාරයටම සාධාරණහෙයින් සාමඤ්ඤච්චාරයයි කියතුලැබේ. මනොච්චාරාවජ්ජන චිත්තයටම පූර්වභාගයෙහි උපදනා භවඞ්ග පවෙජ්ද චිත්තයම ඒ නියම මනොච්චාරයයි ගතයුත්තේයි. මේ පඤ්චාර

යව් හෘ මනෝවාරයවද පළමුව හවඟන්නා භවංග පවේජ්ද චිත්තයන්ට උපමා කවරෙස්ද? වැසි පවලයෙන් සූර්යාලෝකය මුවහවූ දවසෙක යම් වෘක්ෂශාඛාග්‍රයෙක්හී සැඟවෙන්නාවූ හෙවත් හිදගන්නාවූ පක්ෂියෙකුගේ ඡායාව භූමියෙහි නොපැතිරෙයි. පවවාරයෙහි පවවාරාවජ්ජන චිත්තයට පූර්වභාගයෙහි උපදනා භවඟ පවේජ්ද චිත්තයද ඒ භූමියෙහි නොපැතිරෙන්නාවූ ඡායාව ඇති පක්ෂියාට බදු උපමා ඇතිවෙයි. පවොපකෙලේශයන් ගෙන් විනිර්මුක්තවූ සූර්යාලෝකය ඇති දවසෙක යම්වෘක්ෂ ශාඛාග්‍රයෙක්හී පක්ෂියාගේ වැඩීම හා ඒ වෘක්ෂ ඡායාවේහි පක්ෂි ඡායාව සසඟිවීමද ඉදිරිපසුනොවී එකක්ෂණයෙහි සිඹවන්නේසි. එපරිද්දෙන් මනෝවාරාවජ්ජන චිත්තයට අරමුණුහමුවීමද, ඊට පළමුව උපදනා භවංග පවේජ්ද චිත්තයද, උපමා උපමෙය සම්බන්ධකොට අර්ථතයුත්තේසි. ඒපඤ්චවාරයෙහි හටගන්නාවූ චිත්තයෝවනාහි පවවාරාවජ්ජනය, චක්ෂුර්විඥාන යුගලය, සම්ප්‍රතෙච්ඡණයුගලය, සන්තීරණත්‍රය, ව්‍යවස්ථාපන චිත්තය, එකුන් තිස් කාමාවචර ජවන්හුය, තදාලම්බණ මහාවිපාකයෝ අටදෙනය යනමේ සසාස්‍රික් චිත්තයෝ තුමූ චක්ෂුවාරයෙහි උපදින්. සොතවාරයෙහිද එම සසාස්‍රික් චිත්තයන් අතුරෙන් චක්ෂුර්විඥානයුගලය උඩරණයෙකොට සොතවිඤ්ඤාණ යුගලය බහා ලැබෙන්නාවූ සසාස්‍රික් චිත්තයෝ උපදනාහුවෙත්. ඝානවාරයෙහි එම සසාස්‍රික් චිත්තයන් අතුරෙන් සොතවිඤ්ඤාණ යුගලය උදුරා ඝාණවිඤ්ඤාණ යුගලය බහා ලැබෙන්නාවූ සසාස්‍රික් චිත්තයෝ උපදනාහුවෙත්. ජිව්හාවාරයෙහි වනාහි එම සසාස්‍රික් චිත්තයන් අතුරෙන් ඝාණවිඤ්ඤාණ යුගලය උදුරා ජිව්හාවිඤ්ඤාණ යුගලය බහා ලැබෙන්නාවූ සසාස්‍රික් චිත්තයෝ උපදනාහුවෙත්. කායවාරයෙහි එම සසාස්‍රික් චිත්තයන් අතුරෙන් ජිව්හාවිඤ්ඤාණයුගලය උදුරා කාය විඤ්ඤාණ යුගලය බහා ලැබෙන්නාවූ සසාස්‍රික් චිත්තයෝ උපදනාහුවෙත්. මනෝවාරයෙහි මනෝවාරාවජ්ජනය, පස්පණස් ජවන්හුය, එකොළොස් තදාලම්බණය යන සැටසතක් චිත්තයෝ උපදනාහුවෙත්. පටිසන්ධි භවාඞ්ග චුතිකෘත්‍යය සිඹකරන්නාවූ එකුන්විසි චිත්තයෝවනාහි ෂට්වාරයෙහිම නොපවත්නාහෙයින් වාරවිමුක්තනම්වෙත්. ෂට්වාර යෙහිහටගන්නාවූ චිත්තයෝ වෙන් වෙන්කොට දක්වන්නාවූ කල්හි දෙපස් විඥානදසය, මහද්ගත ලොකොත්තර ජවනයෝ සවිසිදෙනය, යනමේ සතිස් චිත්තයෝ තුමූ සුදුසු පරිද්දෙන් එක එක වාරයෙහි පවත්නාවූ චිත්තයෝනම්වෙත්. පවවාරාවජ්ජනය, සම්ප්‍රතෙච්ඡණයුගලය, යන මනොධාතුත්‍රිකයවනාහි

පවත්තරයෙහිම උපදනේවෙයි. සොමනස්ස සහගත සන්තීරණ චිත්තය ව්‍යවස්ථාපන චිත්තය, එකුන්තිස් කාමාවචර ජවන්හුය, යන මොහු සත්තරයෙහිම උපදනාහුවෙත්. උපෙක්ඛා සහගත සන්තීරණයෝ දෙදෙනය, මහාවිපාකයෝ අටදෙනය යන කාමාවචර විපාක චිත්තයෝ දසදෙනවනාහි සත්තරයෙහිද උපදනාහුවෙත්. සත්තරයෙන් විනිර්මුක්තවද උපදනාහුවෙත්. මහද්ගත විපාකයෝ නවදෙනවනාහි සත්ප්‍රකාරයෙන්ම වාරවිමුක්තමවෙත්.

වාරසංග්‍රහ විභාගයයි.

ආලම්බණ සඞ්ගහෙ, ආලම්බණ සංග්‍රහයෙහි; (එවං විභාගො වෙදිතබ්බො,) යනු අඞ්ගාහාරයි. නොහොත් ආලම්බණ සඞ්ගහෙ, අලම්බණ වසතුවෙහි; (එවං ඉමිනාවුත්තවිධානතයෙන විභාගො මඤ්ඤිත්ථ,) යනු අඞ්ගාහාරයි. ආලම්බණානිනාම, ආලම්බණයෝ වනාහි; රූපාරම්මණඤ්ච, රූපාලම්බණයඳ; සද්දාරම්මණඤ්ච, සද්දාලම්බණයඳ; ගන්ධාරම්මණඤ්ච, ගන්ධාලම්බණයඳ; රසාරම්මණඤ්ච, රසාලම්බණයඳ; ඵොට්ඨබ්බාරම්මණඤ්ච, ඵොට්ඨබ්බාලම්බණයඳ; ධම්මාරම්මණඤ්ච, ධම්මාලම්බණයඳ; ඉති ඉමිනාපභෙදෙන, මේ ප්‍රභෙදයෙන්; ඡබ්බිධානි හවන්ති, සවැදෑරුම්වෙත්. තත්ථ, ඒ සවැදෑරුම් ආලම්බණයන් අතුරෙන්; රූපමෙව, වණ්ණායතන මෙමේම; රූපාරම්මණං, රූපාලම්බණනාම්වෙයි; තථා, ඒ රූපාලම්බණයමෙන්; සද්දාදයො, ශබ්දායතනාදීහු තුමූ; නොහොත් ශබ්දායතන ගන්ධායතන රසායතන ඵොට්ඨබ්බායතනයෝ තුමූ; සද්දාරම්මණාදීනි, ශබ්දාලම්බණාදීහුනම්වෙත්. නොහොත් ශබ්දාලම්බණය; ගන්ධාලම්බණඤ, රසාලම්බණය; සප්පඨාලම්බණයයි නම් ඇත්තාහුවෙති. පන, කෙවල නයින් අන්‍යවූ මිශ්‍රකනය දක්වම්. ධම්මාරම්මණං, ධර්මාලම්බණය; පසාද සුඛුමරූප චිත්තචෙතසික නිබ්බාන පඤ්ඤත්තිවසෙන, පවත්තාද රූපඤ, සොළොස් සූක්ෂමරූපය, එකුන් අනූවක් චිත්තය දෙපණස් චෛතසිකය, නිර්වාණය, ප්‍රඥප්තිය, යන මොවුත්ගේවශයෙන්; ඡධා, සයාකාරයකින්; සඞ්ගය්හන්ති, හකුළුවාගන්නාලද්දාහුවෙත්. තත්ථ, ඒආලම්බණ සංග්‍රහයෙහි නොහොත් සවැදෑරුම්වූ ආලම්බණයන් අතුරෙන්; නොහොත් සවැදෑරුම්වූ ආලම්බණයෙහි හටගන්නාවූ චිත්තයන් අතුරෙන් සබ්බසමපි චක්ඛුවාරික චිත්තානං, සියලුම චක්ෂුවාරයෙහි හටගන්නාවූ චිත්තයන්ගේ; ආරම්මණං, ආලම්බණ මෙමේ; රූපමෙව, රූපාලම්බණයමැයි. තව, ඒ

රූපාලම්බණඤ, පච්චුප්පන්නං, ප්‍රත්‍යුත්පන්නවෙයි. තථා, එපරිද්දෙන්; සොතවාරික චිත්තාදීනං. ශ්‍රොතවාරයෙහි හවඟන් නාව චිත්තාදීන්ගේ නොහොත් සොතව්‍රයෙහි හවඟන්නාවූ චිත්තඤ, ඝාණවාරයෙහි හවඟන්නාව චිත්තඤ, ජිව්හාවාරයෙහි හවඟන්නාව චිත්තඤ, කායවාරයෙහි හවඟන්නාව චිත්තඤ, යන මොවුන්ගේ; ආරම්මණානිපි. ආලම්බණයෝ තමුද; සඳෘදීහි වෙත්. නොහොත් ශබ්දාලම්බණ ගන්ධාලම්බණ රසාරම්මණ සපර්‍ශාලම්බණඤ යනමොහුයි. තාතිව, ඒශබ්දාලම්බණාදීහුතමුද, නොහොත් ඒ ශබ්දාලම්බණඤ, ගන්ධාලම්බණඤ, රසාලම්බණඤ; සපර්‍ශාලම්බණඤ යන මොවිහුද, පච්චුප්පන්නානි එව, ප්‍රත්‍යුත්පන්නමවෙත්. පන, කෙවලයාගින් අන්‍යවූ විශෂනයඳක්වමි. නොහොත් ප්‍රත්‍යුත්පන්නාලම්බණයෙන් අන්‍යවූ ප්‍රත්‍යුත්පන්න අතීත අනාගතකාල විෂය ආලම්බණයන් දක්වමි:- මනොවාරික චිත්තානං, මනොවාරික චිත්තයන්ගේ; ආලම්බණං, අරම්මණ තෙමේ; සබ්බාරහං, සුදුසු පරිද්දෙන්; පච්චුප්පන්නව, ප්‍රත්‍යුත්පන්නකාලිකවද; අතීතව, අතීතකාලිකවද; අනාගතං ව, අනාගතකාලිකවද; කාලවිමුත්තව, කාලවිමුක්තවූද; ඡබ්බිධම්පි, සවැදෑරුම්වූ ආලම්බණ තෙමේද; හොති, වෙයි. පටිසන්ධි භවඞ්ග චුති සඞ්ඛාතානං, ප්‍රතිසන්ධි භවාඞ්ගචුතියයි කියනලද්දවූ; වාරවිමුත්තානං, වාරයෙන් විමුක්තවූ එකුන්විසි චිත්තයන්ගේ; ආලම්බණව. අරම්මණම; යෙහුයෙන, බොහෝසෙයින්; භවන්තරෙ, අතීතානන්තර භවයෙහි: ඡවාරහිතං, සදෙරින්ගන්නා ලදුව: නොහොත් ඡවිචාරික මරණාසන්න ජවනයන් විසින් ගන්නාලදුව; පච්චුප්පන්නංවා, ප්‍රත්‍යුත්පන්නකාලිකව හෝ, අතීතංවා, අතීතකාලිකව හෝ පඤ්ඤත්තිනිහතංවා, ප්‍රඥප්තිව හෝ; නාමඤ කම්මනිමිත්ත ගතිනිමිත්ත සම්මතං, කම්ම කම්ම නිමිත්තඤ ගතිනිමිත්තයයි සම්මතකරණ ලදුව; ඡබ්බිධම්පි, සවැදෑරුම්වූ අරම්මණම; යථාසම්භවං, ලැබෙන ලැබෙන පරිද්දෙන්; හොති, අරම්මණවෙයි. තෙසු, ඒ ආරම්මණාදීන චිත්තසමුහයා අතුරෙන්; චක්ඛු විඤ්ඤාණාදීනි, චක්ඛුර්විඥාන, ශ්‍රොත විඥාන, ඝ්‍රාණවිඥාන, ජිව්හාවිඥාන, කායවිඥාන චිත්තයෝ තුම; යථාක්‍රමං පිළිවෙළින්; රූපාදි එකෙකාරම්මණානෙව, රූපාදී ආලම්බණයන් අතුරෙන් එකෙකී අරම්මණක් ඇත්තාහුවෙත්. මනොධාතුත්තිකං පන; මනොධාතුත්‍රිකයවනාහි; රූපාදී පඤ්චාලම්බණං, රූපාදී අරම්මණ පඤ්ච ඇත්තේවෙයි. සෙසානි, දෙපස් විඥානදඃඝ, සම්ප්‍රත්‍යෙඝණයුගලඃඝ, යනමොවුන්ගෙන් අවශිෂ්ටවූ; කාමාවචර විපාකානිච, කාමාවචර විපාකයෝ වනාහි: රූපාදී පඤ්චාලම්බණං,

රූපාදී අරමුණු පසක් ඇත්තේවෙයි. සෙසානි, දෙපස්විඥාන දසය, සම්ප්‍රතෙච්ඡන යුගලය යනමොවුන්ගෙන් අවශිෂ්ටවූ; කාමාවචර විපාකානිව, එකොළොස් කාමාවචර විපාක චිත්ත යෝද, හසනචිත්තඤ, හසිතොත්පාද චිත්තයද, ඉති ඉමානිවා දස චිත්තානි, මේ දෙළොස් චිත්තයෝ තුමූ; සබ්බථාපි, සම්ප්‍රකාර යෙනුදු; කාමාවචරාලම්බණානෙව, කාමාවචර ධම්මෙයෝම අර මුණුකොට ඇත්තාහුවෙත්. අකුසලානිවෙව, දෙළොස් අකුශල චිත්තයෝද; සඳුණවිපයුත්ත කාමාවචර ජවනානිව, ඥානවිප්‍ර යුක්තවූ කාමාවචර කුශල ක්‍රියා ජවන යෝ අටදෙනද, ඉතිඉමානි විසති චිත්තානි, මේ විසිචිත්තයෝ තුමූ; ලොකුත්තරවජ්ජිත සබ්බාලම්බණානි, නවලොකොත්තර ධම්මවර්ජිතකොට ඇති සියලු අරමුණු ඇත්තාහුවෙත්. සඳුණසම්පයුත්ත කාමාව චර කුසලානිවෙව, ඥාන සම්ප්‍රයුක්ත කාමාවචර කුශල චිත්ත යෝද; පඨමජ්ඣාන සඞ්ඛාත මහග්ගතකුසලංව, පඨමඣ්‍යානයයි කියනලද අභිඥා කුශල චිත්තයද, ඉති ඉමානි පඤ්චිත්තානි, මේ පඤ්චප්‍රකාරවූ චිත්තයෝ තුමූ; අරහත්තමග්ගඵලවජ්ජිත සබ්බාල ම්බනානි, අනාගාමී ඵලයන් වර්ජිතකොට ඇති සියලු අර මුණු ඇත්තාහුවෙත්. සඳුණසම්පයුත්ත කාමාවචර ක්‍රියානිවෙව, ඥානසම්ප්‍රයුක්ත කාමාවචර ක්‍රියා චිත්තයෝ සතරදෙනද; ක්‍රියාඅභිඥාවව, අභිඥාක්‍රියාචිත්තයද; වොට්ඨපනඤ, ඵල සඨාපන චිත්තයද, ඉතිඉමානි ඡචිත්තානි, මේ සවැ දෑරුම් චිත්තයෝ තුමූ; සබ්බථාපි, සම්ප්‍රකාරයෙ තුදු; සබ්බාලම්බණානි, සියලු අරමුණුඇත්තාහුවෙත්. ආරූ පෙසු, දෙළොස් අරූපාවචර චිත්තයන් අතුරෙන්: දුතියචතු ත්ථානි, විඤඤාණඤඤායතන සිත් තුණය, නෙවසඤඤානාසඤඤා යතන සිත් තුණය, යනමේ සවැදෑරුම් චිත්තයෝතුමූ; මහග්ගතා ලම්බණානි, ප්‍රථමාරූප්‍ය විඤඤාණය, තෘතීයාරූප්‍ය විඥානය යන මහද්ගත ධම්මෙයෝම අරමුණුකොට ඇත්තාහුවෙත්. සෙසා නි, විඤඤාණඤඤායතන සිත් තුණය, නෙවසඤඤානාසඤඤා යතන සිත් තුණය, අභිඥා දෙසිතය යනමොවුන් වර්ජිතකොට ඇත්තාවූ; සබ්බානිපි, සියලුම; මහග්ගත චිත්තානි, එක්විසි මහග්ගත චිත්තයෝ තුමූ; පඤඤත්තාලම්බණානි, ප්‍රඥප්ති ධම් යන්ම අරමුණුකොට ඇත්තාහුවෙත්. ලොකුත්තර චිත්තානි, ලොකොත්තර චිත්තයෝ තුමූ; නිබ්බානාලම්බනානි, නිවන් අරමුණුකොට ඇත්තාහුවෙත්. නොහොත් නිබ්බාන ධම්ම අරමුණු කරන්නාහුය. ඉති, මෙසේ; වෙදිතබ්බං, දතයුතුයි. පවිසිය, පස්විසි සිත් කෙනෙක් තුමූ; පරිත්තමහි එව, කාමාවචර අරමුණෙහිම;

හොනති, භවඟන්තානුභූවෙත්. ජීවිත්තානි, සයංකාර සිත්කෙ
නෙක් තුමූ; මහග්ගතෙ එව, මහද්ගතාලම්බණයෙහිම; හොනති,
වෙත්. එකවීසති, එක්විසි සිත් කෙනෙක් තුමූ; වොහාරෙ එව,
ප්‍රඥප්තාලම්බනයෙහිම; හොනති, වෙත්. අඤ, විත්තායෝ අට
දෙනෙක් තුමූ; නිබ්බානඤාවරෙ එව, නිවන් අරමුණෙහිම;
හොනති, වෙත්. වීස, විසිසිත් කෙනෙක් තුමූ;අනුත්තරමුත්තම්හි
නවලෝකොත්තර ධම්මන්ගෙන් මිදුනාවූ අරමුණෙහිම: හොනති
වෙත්. පඤ, පඤප්‍රකාරවූ සිත්කෙනෙක් තුමූ; අඤමඤ එලු
ජාතිතෙ, අතීතමාගීඵලයන් වර්ජිතකොට ඇත්තාවූ අරමුණෙහි;
හොනති, වෙත් ඡව, විත්තයෝ සදෙනෙක්වනාහි: සබ්බපි,
සියලු අරමුණෙහි, හොනති, වෙත්. ඉති, මෙසේ; තත්‍ර, ඒආලම්
බණ සංග්‍රහයෙහි; සත්තඛා, සත්පරිද්දෙකින්; සඞ්ඛහොහොති,
සංග්‍රහයවෙයි. අරමුණුවශයෙන් කෙසේ දතයුත්තාහුදැයි යනු
අරමුණු තෙමේ රූපාලම්බණය, ශබ්දාලම්බණය, ගන්ධාලම්බණය,
රසාලම්බණය; සපඨාලම්බණය, ධම්මාලම්බණයයි සවැදෑරුම්වේ.
ඒ සදෙනා අතුරෙන් නීල පීතාදිවූද, දිඝීග්‍රහස්වහතරැස් අටැස්
ආදීවූ සටහණද, ඇසින් දැක්කයුතුහෙයින් රූපාලම්බණතම්
වෙයි. මනුෂ්‍යයන්ගේ කථිත හසිතාදිවූද, භෙරිමාදඞ්ගාදිවූද
සියලු ශබ්දතෙමේ ශබ්දාලම්බණතම්වෙයි. කපුරු කසතුරි ආදීවූ
සියලු ගන්ධතෙමේ ගන්ධාලම්බණතම්වෙයි. මධුරාම්ලකටුකත්‍රික්තා
ආදිවූ සියලු රසතෙමේ රසාලම්බණතම්වෙයි. උපාදිණ්ණ අනුපා
දිණ්ණ සියලු සපඨයෝ සපඨාලම්බණතම්වෙත්. පඤප්‍රසාදරූපය;
සූක්ෂමරූපසොළසය, එකුන් අනූවක් විත්තය,දෙපණස් චෙත
සිකය, නිබ්බාණය,ප්‍රඥප්තිය යන සව.දෑරුම් ධම්මතෙමේ ධම්මාලම්
බණතම්වෙයි. චක්ඛුවාරයෙහි උපදනා සඟාළිස් විත්තයෝ තුමූ
ප්‍රත්‍යෙකාත්පන්නවූ රූපාලම්බණයම අරමුණුකෙරෙති. මෙහි
ප්‍රත්‍යෙකාත්පන්නය යනු ඛණපච්චුපන්නය, සන්තතිපච්චුපන්න
ය අඛාපච්චුපන්නයයි ප්‍රත්‍යෙකාත්පන්නය ත්‍රිවිධාකාරවෙයි. ඔවුන්
අතුරෙන් ඛණපච්චුපන්නයයනු රූපාලම්බණයාගේ ආයුෂවූසත
ළොස් විත්තක්ෂණකාලය රූපයාගේ ඛණපච්චුපන්නතම්වෙයි.
සන්තතිපච්චුපන්නය යනු යම්රූපයක් ඇසින් දුටුකල්හී චක්ඛුවා
රිකළුක් විත්ත වීථියෙක්ද, තදනුවර්තික මනොවාර වීථිහු තුන්දෙ
නෙක්ද, ඉපදීමෙන්ම, ඒ රූපය භඳුනයි. මේවිත්තවීථි සතරදෙන
පවත්නා කාලයයි සන්තති පච්චුපන්නය අඛාපච්චුපන්නය යනු
යම්සත්වයෙකුගේ පටිසන්ධිවිත්තය පටන් චුතිවිත්තයදක්වා හිඳක්
අවිරුද්දක්හෝඉන් අඩුවැඩිකාලයක් හෝ ඔහුගේ ජීවත්වීම පිළිබ
ඳුවූකාලයඅඛාපච්චුපන්නයයි. මේත්‍රිවිධාකාරප්‍රත්‍යෙකාත්පන්නයන්

අතුරෙන් මෙහි කී ප්‍රත්‍යෝත්පන්න රූපාලම්බණය යනු ඒ රූපා
ලම්බණයාගේ උත්පත්තිය පටන් නිරුඬ්ධීම දක්වා මේ අතර
තුර පැවති සතලොස් චිත්තක්ෂණයයි කියන්නාලද්දාවූ රූපයාගේ
ආයුෂ ඛණ පවිවුපන්නයයි දතයුතුයි. ශබ්ද ගන්ධ රස ඵෂ්ඨ
ලම්බණයන්ගේ ප්‍රත්‍යෝත්පන්නයද මෙසේම ඛණපවිවුපන්න
යයි සැලකියයුතුයි. සොතද්වාරයෙහි හවඟන්නාවූ සහජාත
චිත්තයෝ තුමූ ඛණ ප්‍රත්‍යෝත්පන්නවූ ශබ්දාලම්බණය අරමුණු
කෙරෙත්. ඝාණද්වාරයෙහි උපදනා සහජාත චිත්තයෝ තුමූ ඛණ
ප්‍රත්‍යෝත්පන්නවූ ගන්ධාලම්බණය අරමුණුකෙරෙත්. ජිව්හාද්වාර
යෙහි උපදනා සහජාත චිත්ත යෝ තුමූ ඛණපවිවුපන්නවූ රසා
ලම්බණය අරමුණුකෙරෙත්. කායද්වාරයෙහි උපදනා සහජාත
චිත්තයෝ තුමූ ඛණපවිවුපන්නවූ ඵෂ්ඨාලම්බණය අරමුණු
කෙරෙත්. මනොද්වාරයෙහි උපදනා සත්සැට චිත්තයෝ තුමූ
ප්‍රත්‍යෝත්පන්න අරමුණය අතීතවූ අරමුණය, අනාගතවූ අරමු
ණය, නිප්ඵන්නාලම්බණය, ප්‍රඥප්තාලම්බණය යන මොහු කාමා
වචර ජවන අභිඥාමහදගත ජවනයන්ට සුදුසු පරිද්දෙන් අර
මුණුකරන්නාහුවෙත්. වාරවිමුක්තවූ චිත්තයෝ එකුන්විසිදෙන
වනාහි අනාගතරූ භවයෙහි මරණාසන්න කාලයෙහි ජවිවාර
යෙන් ගන්නාලද්දාවූ ප්‍රත්‍යෝත්පන්න අරමුණුය, අතීත අරමු
ණුය, ප්‍රඥප්තිඅරමුණුය, කම්අරමුණුය, කම්නිමිති අරමුණුය,
ගතිනිමිති අරමුණුය, යන මෙතෙක් ආලම්බණයෝ බොහෝ
සෙයින් සුදුසු සුදුසු පරිද්දෙන් අරමුණුකෙරෙත්. ඒ අරමුණුකර
න්නාවූ චිත්තයෝවෙන් වෙන්කොට මෙසේ දැක්විය යුත්තාහුය.
චක්ඛුර්විඥානයෝ දෙදෙන රූපාලම්බණයද, ශ්‍රොත්‍රවිඥා
නයෝ දෙදෙන ශබ්දාලම්බණයද, ඝ්‍රාණවිඥාන දෙදෙන ගන්ධා
ලම්බණයද, ජිව්හාවිඤ්ඤාණයෝ දෙදෙන රසාලම්බණයද, කාය
විඥානයෝ දෙදෙන ඵෂ්ඨාලම්බණයද, කායවිඥානයෝදෙදෙන
සඵෂ්ඨාලම්බණයද, වෙන් වෙන්වශයෙන් අරමුණුකරන්නාහු
වෙත්. මනොධාතු ත්‍රිකයතෙමේ රූපාලම්බණාදී පඤ්චාලම්බණ
යම් අරමුණුකරයි. ඔවුන් කෙරෙත් අවශිෂ්ටවූ කාමාවචර
විපාක චිත්තයෝය, හසිතොත්පාද සඛ්‍යාතවූ අහෙතු ක්‍රියා
චිත්තයද, යන මෙතෙක් චිත්තයෝ තුමූ කාමාවචර ධර්මයන්ම
අරමුණුකෙරෙත්. දෙලොස් අකුශල චිත්තයෝය, ඥානවිප්ර
යුක්ත කාමාවචර ජවන් අටදෙනය යන මෙතෙක් චිත්තයෝ
තුමූ ලොකොත්තර ධර්මයන්ගෙන් අවශිෂ්ටවූ සියලු ධර්මයන්ම
අරමුණුකරන්නාහුවෙත්. ඥානසම්ප්‍රයුක්ත කාමාවචර කුශල
ක්‍රියා චිත්තයෝ සතරදෙනය, රූපාවචර පඨමධ්‍යාන සඛ්‍යාත

අභිඥාකුශලය යනමේ චිත්තයෝ පස්දෙන තුමූ අතීත්මාගී ඵලවර්ජිතකොට ඇත්තාවූ සත්අසුවක් ප්‍රභෙදවූ චිත්තයන් අරමුණුකරන්නාහුවෙත්. කාමාවචර ක්‍රියා ඥානසම්ප්‍රයුක්ත සතරදෙනය, ක්‍රියාඅභිඥාචිත්තය, ව්‍යවස්ථාපන චිත්තය, යන මෙතෙක් චිත්තයෝ තුමූ සියලු කාමාවචර ධම්මයෝය, සියලු මහද්ගත ධම්මයෝය, සියලු ලොකොත්තර ධම්මයෝය, සියලු ප්‍රඥප්ති ධම්මයෝය, යනමෙතෙක් ධම්මයන් අරමුණුකරන්නාහුවෙත්. සර්ව්ඥ බුදුවරයන් විසින් ලොකධාතුව බලාවදුරන්නාවූ කල්හිද ධම්දෙශනාකාරණකල්හිද, යනාදී සියලු ප්‍රස්තාවෙහි බුදුවරයන්ව උපදනා චිත්තය මේ ඥානසම්ප්‍රයුක්ත මහාක්‍රියා චිත්තයවේ. එපරිද්දෙන්ම අතීතානාගත කාලයන් බලාවදුරන්නාවූකල්හි උපදනා අභිඥාක්‍රියා චිත්තය මෙහිකී අභිඥා ක්‍රියා චිත්තයයිදතයුතුයි. අරූපාවචර දෙලොස් චිත්තයන් අතුරෙන් විඤ්ඤාණඤ්චායතනචිත්තයෝ තුන්දෙනය, නෙවසඤ්ඤා නාසඤ්ඤායතනචිත්තයෝ තුන්දෙනය, යනමේ චිත්තයෝ සදෙන තුමූ ආකාශානඤ්චායතනචිත්තය ආකිඤ්චඤ්ඤායතන චිත්තය, යනදෙසිත අරමුණුකොට පවත්නාහෙයින් මහග්ගතා ලම්බණිකවෙත්. ආකාශානඤ්චායතන චිත්තයෝ තුන්දෙනය, ආකිඤ්චඤ්ඤායතන චිත්තයෝ තුන්දෙනය, රූපාවචරචිත්තයෝ පසළොස්දෙනය, යනමේ එක්විසි චිත්තයෝ තුමූ කසිණොදකාට ආකාශප්‍රඥප්ති නිමිත්තය, නජිහාවප්‍රඥප්ති නිමිත්තය, සෙසු කසිණප්‍රතිභාග නිමිත්තිහුය, යන ප්‍රඥප්තිහුම අරමුණුකරන්නාහුවෙත්. ලොකොත්තර චිත්තයෝ අටදෙනවානාහි නිබ්බාණ ධම්මය අරමුණුකරන්නාහුවෙත්. මේආලම්බණයන් අතුරෙන්වනාහි රූපාදි අරමුණු සතර අම්ශ්‍රවූ අරමුණුවෙති. සප්තාලම්බණය මිශ්‍රවූ අරමුණුවෙයි. ධම්මාලම්බණයද නාමරූප ප්‍රඥප්ති නිබ්බාණ ධම්මයන්හෙන් මිශ්‍රවූ අරමුණුක්වෙයි. වක්ඛුවාරයෙහි උපදනා සඝාත්‍රිස් චිත්තයෝ තුමූ ප්‍රත්‍යොත්පන්න රූපාලම්බණයම අරමුණුකෙරෙති. ශ්‍රොත්‍රවාරාදියෙහිද වෙන් වෙන් වශයෙන් උපදනා සඝාත්‍රිස් චිත්තයෝ තුමූ ප්‍රත්‍යොත්පන්නවූ ශබ්දාලම්බණාදීන් අරමුණුකෙරෙති. මනොවාරයෙහි හටගන්නාවූ සැවසත් චිත්තයෝ තුමූ ආලම්බණයෝ සඳෙනය කාලවිමුක්ත ආලම්බණය, යනමොවුන් අරමුණුකෙරෙති. ප්‍රත්‍යොත්පන්න අතීතානාගතවූ සියලු කාලිකවූ ධර්මුණුම අරමුණුකෙරෙති. සියලු අරමුණු දිඨ සුත මුත වශයෙන් තුන් වැදෑරුම්වෙති. "දිඨ" යනු ඇසින් දක්නාලද රූපාරමුණයි. "සුත" යනු කණින් අසන ලද්දාවූ ශබ්දාලම්බණයයි. "මුත" යනු ඝාණජිව්හාකාය යන

වාරත්‍රයෙන් වැදගන්නාලද ගන්ධ රස ස්ප්‍රෂ්ටව්‍ය ආලම්බණයෝයි, රූපාලම්බණයන් ඇසින් දක්නාලදකල්හී සතලොස් චිත්තක්ෂණය ඉක්ම ගියාට පසු දිළුයයි ව්‍යවහාරකෙරෙති. ශබ්ද ගන්ධ රස ස්ප්‍රෂ්ටව්‍යාලම්බණයෝද ඒ ඒ වාරයෙන් ගන්නාලද කල්හී සතලොස් චිත්තක්ෂණය ඉක්ම ගියාට පසු සුතමුතයයි ව්‍යවහාරකෙරෙත්. ඒ දිළු, සුත, මුත, යන ත්‍රිවිධාකාර ආලම්බණයෝම මනොවාරයට අතීතකාලිකවශයෙන් හමුවෙත්. ශ්‍රැත යන්නට අනුශ්‍රැතයද ඇතුලත්වෙයි. මනොවාරයෙහි හවඟන්නාවූ චිත්තයෝ තුමූ කාලත්‍රයම අරමුණුකරන්නාවූ තන්හී රූපාලම්බණයාගේ ප්‍රත්‍යෙවෙක්ෂණවූ සතලොස් චිත්තක්ෂණය පවත්නාවූකල්හී මනොවාරයට හමුනොවෙත්. යම්කින් මූවහකරණලද්දවූ අරමුණුම ප්‍රත්‍යෙවෙක්ෂණවශයෙන් මනොවාරයට හමුවෙති. ඒකෙසේ අරමුණුකරන්නාහුද යත්? ඊයේ දවස්හී යම් කිසි බුඩාදීවූ රූපාලම්බණයක් දැක අද දවස්හී එම අරමුණ නැවත අරමුණුකරණු කැමතිවිනම් තමාගේද උත්පාදක්ෂණය බුඩසඩ්ඛ්‍යාතවූ ආලම්බණයාගේ උත්පාදක්ෂණයද එකක්ෂණිකවූකල්හී ප්‍රත්‍යෙවෙක්ෂණවූ ඒරූපාලම්බණය අරමුණුකෙරෙති. ඊයේ දවස ශ්‍රවණයකරණලද්දවූ ශබ්දාදියෙහිද මේක්‍රමය යොදා ගතයුතුයි. තමාගේ උත්පාදක්ෂණය යනු මනොවාරයයිදත යුතුයි. "යථා සමහවං" යන්නෙහි අභිප්‍රාය කෙසේයත්? කාමාවචර ප්‍රතිසන්ධිහු දසදෙනවනාහි අරමුණුවශයෙන් රූපාදී සාරමුණුම ගන්නාහුවෙති. වාරවශයෙන්ද ෂට්වාරයෙහිම පවත්නාහුය, කාලවශයෙන් ප්‍රත්‍යෙවෙක්ෂණ අතීත ඝනකාලවයම ලැබෙන්නේවෙයි. නිමිත්තවශයෙන් කම්ම කම්මනිමිත්ති ගතිනිමිති සඩ්ඛ්‍යාතවූ නිමිත්ති තුන්දෙනම ලැබෙන්නාහුවෙති. රූපාවචර ප්‍රතිසන්ධිහු පස්දෙනය, ආකාසානඤ්චායතන ආකිඤ්ඤායතන සඩ්ඛ්‍යාතවූ අරූපිප්‍රතිසන්ධිහු දෙදෙනදැයි යන මහදකත ප්‍රතිසන්ධිහු සත්දෙන තුමූ අරමුණුවශයෙන් ධම්මාලම්බණයෙහි ඇතුලත්වූ ප්‍රඥප්ති ධම්මාලම්බණයද, වාරවශයෙන් එකම මනොවාරයද, කාලවශයෙන් කාලවිමුක්ත අරමුණුද. නිමිත්තවශයෙන් කම්මනිමිති සඩ්ඛ්‍යාත නිමිත්තද, ඒ කම්මනිමිති සදෙන අතුරෙන් ධම්මාලම්බණ කම්මනිමිත්තද ඇත්තාහුවෙත්. ධම්මාලම්බණ කම්මනිමිති අතුරෙනුදු ප්‍රඥප්ති ධම්මාලම්බණ කම්මනිමිත්ත ලබන්නාහුවෙත්. විඤ්ඤාණඤ්චායතන නෙවසඤ්ඤා නාසඤ්ඤායතන ප්‍රතිසන්ධිහු දෙදෙනා තුමූ අරමුණුවශයෙන් ධම්මාලම්බණය අරමුණුකරන්නාහුවෙති. ධම්මාලම්බණ සදෙන අතුරෙනුදු චිත්ත සඩ්ඛ්‍යාත කම්මඔමය අරමුණුකරන්නාහුවෙති. ඒ එකුන් අනුවක් චිත්ත

යන් අතුරෙහුදු ආකාසානඤ්චායතන ආකිඤ්ඤායතන සඞ්ඛ්‍යා තකුසලක්‍රියා දෙදෙන අරමුණුකරන්නාහුවෙති. වාරවශයෙන් මනොවාරයෙහිම පවත්නාහුය. කාලත්‍රය අතුරෙන් අතීතකාල යම අරමුණුකරන්නාහුවෙති. ත්‍රිවිධාකාර නිමිත්තයන් අතු රෙන් කම්මනිමිත්තම අරමුණුකරන්නාහුවෙති. සයංකාර කම් නිමිති අතුරෙහුදු ධම්මාලම්බණ කම්මනිමිත්ත අරමුණුකෙරෙති. ධම්මාලම්බණ කම්මනිමිති සදෙන අතුරෙහුදු චිත්ත සඞ්ඛ්‍යාත ධම්මා ලම්බණ කම්මනිමිත්ත අරමුණුකරන්නාහුවෙති. එකුන් අනූවක් චිත්තයන් අතුරෙහුදු ආකාසානඤ්චායතන ආකිඤ්ඤායතන කුසලක්‍රියා චිත්තයෝ දෙදෙන අරමුණුකරන්නාහුවෙති. කම්මනිමිති තෙමේ අරමුණුවශයෙන් ධම්මාලම්බණවෙයි. ධම්මාලම්බණ යන් සදෙනා අතුරෙන් චෛතසික ධම්මාලම්බණයවෙයි. දෙප ණස් චෛතසිකයන් අතුරෙහුදු එකම චෙත්තා සඞ්ඛ්‍යාත ධම්මා ලම්බණයවෙයි. වාරවශයෙන් මනොවාරයද, කාලවශයෙන් අතීතකාලයද, නිමිත්තවශයෙන් කම්මනිමිත්තද, අරමුණුවශයෙන් ඛාලම්බණයද, වාරවශයෙන් ඛඩ්වාරයද, කාලවශයෙන් ප්‍රත්‍යුත්පන්න අතීතකාලවශයවෙයි. ගතිනිමිත්තෙමේ අර මුණුවශයෙන් රූපාලම්බණයද, වාරවශයෙන් මනොවාරයද කාලවශයෙන් ප්‍රත්‍යුත්පන්නකාලයද වන්නේයි. ඡවිවාරයෙන් ගන්නාලද්දාවූ කම්නිමිති ගතිනිමිතිහු අතීතභවයෙහි මරණා සන්න ජවනයන් විසින්ද කමිය අරමුණුකරන්නේවිනම් ප්‍රත්‍යුත්පන්නභවයෙහි ප්‍රතිසන්ධි චිත්ත තෙමේ ඒ කමිය අර මුණුකරයි. කම්නිමිත්ත අරමුණුකරන්නේවිනම් එම ප්‍රතිසන්ධි සිත්තෙමේද කම්නිමිත්ත අරමුණුකෙරෙයි. "යෙභුය්‍යෙන" යන්නෙහි අභිප්‍රාය මෙසේයි:-මරණාසන්න ජවනයන් හා පටි සන්ධි ආලම්බණයන්ගේ සදෘශභාවය යෙභුය්‍යතායෙන්ම වන්නේයයි කී නියාසි. යෙභුය්‍යතායෙන් වනකල්හි අපකතායා යවශයෙහුදු එසේ නොවන්නාවූ තැන් ඇතිවියයුතුයි. හේ කවරේද යත්? මේ මනුෂ්‍ය ලොකයෙහි වාඝොකාසිණයෙහි චතුත්‍රීඛ්‍යාන උපදවා අසංඥා තලයෙහි උපදනා කම්වාදී ක්‍රියා වාදී තීර්ථකයන්ගේ ප්‍රතිසන්ධිය හා අසංඥාතලයෙහි පන්සිය යක් මහාකල්පගතකොට නැවත සපතකාම භූමියට එන්නාවූ අසංඥ බ්‍රහ්මයන්ගේද කාමප්‍රගතියෙහි පටිසන්ධියද රඟතුන්ගේ මරණාසන්නවීථියෙහි උපදනා චුති චිත්තයද මෙහි අපකතායා යෙන් නොලැබෙන්නාවූ සථානයෝයයි දතයුතුයි. දෙපස් විඤ්ඤාණයෝ දසදෙන තුමූ එකානන කාමාවචරද එකානන රූපාලම්බණාදිය ඇත්තාමුද එකානන ඛණපච්චුපපන්න ඇත්

නාවූද චිත්තයෝයයි දතයුතුයි. අවශෙෂවූ චිත්තයෝවනාහි අනෙකානන්ත චිත්තයෝයයිදතයුතු. මහග්ගත චිත්තයෝවනාහි අරමුණුකරණකල්හි එකානන්ත ඔහග්ගතමවෙති. එකානන්ත ධම්මාලම්බණඇත්තාහුදවෙති. හේ කෙසේයත්? එක්මහග්ගත චිත්තයක් තෙමේ එකානන්තයෙන් සිතක්ම අරමුණුකරයි. ඒ චිත්තයද එකානන්තයෙන් අතීතකාලිකවෙයි. එකානන්තයෙන් නාම ධම්මයක්මවෙයි. අවශෙෂවූ මහද්ගත චිත්තයෝ වනාහි එකානන්තයෙන් ප්‍රඥප්තාලම්බණිකවෙති. එකානන්තයෙන් කාලවිමුක්තවෙති. එකානන්තයෙන් ධම්මාලම්බණ ඇත්තාහුවෙති. ලොකොත්තර චිත්තයෝ අටදෙනවනාහි එකානන්තයෙන් නිබ්බානයම අරමුණුකෙරෙති. එකානන්තයෙන් නාමධම්මයක්ම අරමුණුකෙරෙති. එකානන්තයෙන් ධම්මාලම්බණයක්ම අරමුණුකෙරෙති. එකානන්තයෙන් කාලවිමුක්ත අරමුණුඇත්තාහුමවෙති. චිත්තයෝ තුන්දෙනෙක්වනාහි එකානන්තයෙන් රූපයම අරමුණුකෙරෙති. එකානන්තයෙන් ප්‍රත්‍යෙවත්පන්නවූම අරමුණුගණිති. එකානන්තයෙන් කාමාවචර අරමුණුමගණිති. ඒ චිත්තයෝ තුන්දෙනනම් මනොධාතු ත්‍රිකයයි. අටමහා කුශලයෝවනාහි අතීතමාගීඵල වර්ජිතවූ සියලු අරමුණුගන්නාහුනම් ඒ කුශලයන්ගේ විපාකයෝ අටදෙනවනාහි කුශලයන්ගේ සියලු අරමුණු කුමක්හෙයින් නොගන්නාහුද යත්? කාමාවචර කුශලයෝ තුමූ තෘෂ්ණාව පෙරටුකොට ඇති බැවින් අතීතමාගී ඵලයන් අරමුණු කළනොහැකිවෙති. අකුශල චිත්තයෝවනාහි ලොකොත්තර ධම්මයන් කුමක්හෙයින් අරමුණු නොකරන්නාහුදයත්? තමාගේ ලාමකභාවය ඇතිහෙයින් ලොකොත්තර ධම්මයන් අරමුණුනොකොට හැකිවෙති. යම්සේ අතිශයින් රත්වූ අයසකැබැල්ලෙහි මැසි මදුරු ආදීහු නොවසත්ද එහෙයින් මැසි මදුරු ආදීන්ට බදුවූ දෙළොස් අකුශල චිත්තයෝවනාහි රත්වූ අයසකැබැල්ලක බදුම්බි ලොකොත්තර චිත්තය අරමුණුනොකරන්නාහුවෙති. ඥානවිප්‍රයුක්ත කාමාවචර කුශල ක්‍රියාවෝ තුමූ ඥානයෙන් විප්‍රයුක්තහෙයින් ලොකොත්තර ධම්මයන් අරමුණුකිරීමෙහි පොහොසත් නොවෙති. ඥානසම්ප්‍රයුක්ත කාමාවචර කුශලයෝ සතර දෙනය, අභිඥා කුශලය යන පස්දෙන අතීතමාගී අතීත්ඵලයන් වර්ජිතකොට ඇති සියලු ධම්මයන් අරමුණුකෙරෙති. ඒ චිත්තයෝ පස්දෙන වනාහි පෘථග්ජන ශෛක්ෂ්‍යසන්තානයෙහිම හට ගණිති. රහතුන්ගේ සන්තානයෙහි හටනොගණිති. මනොවාරවර්ජිත සිත්තෙමේ ඥානයෙන් විරහිතවූයේද සවිඥකඥන ගතිඇත්තේයයි කුමක්හෙයින් කියේද යත්? ඥානසම්ප්‍රයුක්ත

මහාක්‍රියාචිත්තයෙහි යෙදුනාවූ ප්‍රඥාව සම්ප්‍රයුක්තඥානනම්වෙයි. ඒ මහාක්‍රියා චිත්තයන්ට පූර්වභාගයෙහි උපදනා මනෝවාරවජ්ජන චිත්තයද සම්ප්‍රයුක්තඥානගති ඇත්තේයයි ව්‍යවහාරකරන්. කාමාවචර කුශලතෙමේ පාථමජ්ඣාන සන්තානයෙහිද උපදනේයි. එසේ භවගන්නේ නම්දු ඥානසම්ප්‍රයුක්ත මහාකුශලයෝ සතර දෙන තුමූ නිර්වාණය අරමුණුකොට හැකිවෙති. එහකුදුවුවත් සෝවාන් සකෘදාගාමි අනාගාමි යන ආර්‍ය්‍ය පුද්ගලයන් තුන් දෙනාකෙරෙහි පවත්නාවූ ඥානසම්ප්‍රයුක්ත මහාකුශලයෝ තුමූ නිර්වාණය අරමුණුකරන්නාහුවෙති. පාථමජ්ඣාන සන්තානයෙහි පවත්නා ඥානසම්ප්‍රයුක්ත කුශලයවනාහි සෝවාන් මාර්ගඥානයට පළමු උපදනා චිත්තමාත්‍රයක්ම නීවන් අරමුණුකරයි. නොත්‍රිතු චිත්තය උපදනා ක්ෂණයෙහි එතෙමේ පාථමජ්ඣානමවෙයි. ඒට අනතුරුව උපදනා සෝවාන් මාර්ග චිත්තයෙන් පසු සෝවාන් ඵලක්ෂණයෙහි සොතාපන්න පුද්ගලනම්වෙයි. මනෝවාරවජ්ජන අභිඥාවෝද එපරිද්දෙන් විසතරකටයුත්තාහුයි.

වත්‍ථු සඞ්ගහෙ, වසතු සංග්‍රහයෙහි (එවං විභාගෝ වෙදිතබ්බෝ) යනු අධ්‍යාහාරයි. නොහොත් වත්‍ථු සඞ්ගහෙ, වසතු සංග්‍රහයෙහි (එවං ඉමිනා වුච්චමානනයෙන මයාවුච්චතෙ) යනු අධ්‍යාහාරනොට අර්‍ථකියයුතුයි. වත්‍ථූතිනාම, වස්තූහුනම්වනාහි; චක්ඛිවත්‍ථුව, චක්ඛුපීසතුවද. සොතවත්‍ථුව, ශ්‍රොත්‍රවස්තුවද, ඝාණවත්‍ථුව, ඝ්‍රාණවස්තුවද; ජිව්හාවත්‍ථුව, ජිව්හාවස්තුවද; කායවත්‍ථුව, කායවස්තුවද; හදයවත්‍ථුව, හෘදයවස්තුවද; ඉති (ඉම්නාපහෙදෙන,) මේ ප්‍රභෙදයෙන්; ඡබ්බිධානි හවනති, සවැදෑරුම්වූවාහුදවෙත්. කාමලොකෙ, කාමභූම්යෙහි; සබ්බානි පි තානි, ඒ සියලු ඡවි වස්තුරූපයෝම;ලබ්භනති, ලැබියයුත්තාහුවෙත්. පන, සියල්ලෙන් අන්‍යවූ එකදෙශය දක්වම්:-රූප ලොකෙ, රූපභූම්යෙහි;ඝාණාදිත්‍තයං, ඝාණාදිවූවස්තුහු තුන්දෙන; නත්‍ථි,නැත්තේයි. පන,එකදෙශයෙන් අන්‍යවූ සකලාර්‍ථයදක්වම්:-අරූපලොකෙ, අරූපභූම්යෙහි;සබ්බානිපි, සියලු වස්තු රූපයෝද; න සංවිජ්ජනති, විද්‍යමානනොවෙත්. තත්‍ථ, ඒවස්තුරූප සංග්‍රහයෙහි නොහොත් සවැදෑරුම් වස්තු රූපයන් අතුරෙන් නොහොත් සවැදෑරුම් වස්තු රූපයන් නිශ්‍රයකොටගෙණ හට ගන්නාවූ විඤ්ඤාණ ධාතූන් අතුරෙන්; පවත්තිඤ්ඤාණ ධාතුයො, පවත්තිඤ්ඤාණධාතුහු තුමූ; යථාකකමං, පිළිවෙළින්; එකනෙත්තන, එකාන්තයෙන්; පඨමජ්ඣානවත්‍ථූනි, පඨමප්‍රකාරවූ ප්‍රඥාද වස්තු

රූපයන්; නිස්සාඝෙව, නිශ්‍රයකොටගෙණම; **පවත්තනති**, හට ගන්නාහුවෙත්. පන, පවවිඤ්ඤ ධාතූන්ගෙන් අන්‍යවූ මනො ධාතුව කියම්:-පවවාරාවජ්ජන සම්පටිච්ඡන සඛ්ඛාතා, පවවාරා වජ්ජන චිත්තය, සම්ප්‍රතේ‍යෂණ යුගලයයි කියනලද්දාවූ; මනො ධාතුව, මනොධාතු තොමෝද; හදයං නිස්සිතාඝෙව, හෘදය වස්තුව නිශ්‍රිතවූවාම; පවත්තනති, පවත්තී; පන, පවවිඤ්ඤ ධාතු මනොධාතූන්ගෙන් අන්‍යවූ මනොවිඤ්ඤණ ධාතු වකියම්:-අවසෙසා, පවවිඤ්ඤ ධාතු මනොධාතූන්ගෙන් අව ශිෂ්ටවූ සන්තීරණ මහාවිපාක පටිඝවය; පඤ්චද්වාරාහරණ රූපා වචරවසෙන, සන්තීරණත්‍රය, මහාවිපාක අටය. වෙඝ මුලික දෙසිතය, සොවාන් මාගී්ඵචිත්තය, හසිතොත්පාද චිත්තය, රූපා වචර පඨමජ්ඣාන් චිත්තය, යන මෙකී චිත්තයන්ගේවශයෙන්; තීංඝ, තිස්ප්‍රකාරවූ; මනොවිඤ්ඤණ ධාතු සඛ්ඛාතා, මනො විඤ්ඤණධාතුයයි කියනලද්දාවූ, විඤ්ඤණධාතුයෙව, විඤ්ඤ ධාතුහුද, හදයං නිස්සාඝෙව; හෘදය වස්තු රූපය නිස්සාම; පවත්තනති, හටගන්නාහුවෙත්. පන, එකාන්තනිශ්‍රයවූ චිත්ත යන්ගෙන් අන්‍යවූ අනෙකාන්තනිශ්‍රය චිත්තයන් දක්වම්:-සෙසා, සන්තීරණාදී සමතිස් චිත්තයන්ගෙන් අවශිෂ්ටවූ; කුසලාකුසල ක්‍රියාත්‍රිතත්තරවසෙන, ලෞකික කුශල් දෙළසය, අකුශල් දස දෙනය, ක්‍රියාසිත් තෙළෙස්දෙනය, ලෝකොත්තර සිත් සත් දෙනය යන මොවුන්ගේවශයෙන් වෙවත්තාළිස මනොවිඤ්ඤාණ ධාතුයෝ, දෙසාළිස් වැදෑරුම්වූ මනොවිඤ්ඤාණධාතුහු තුමූ; හදයං නිස්සාඝවා, හෘදය වස්තු රූපය නිස්සාහෝ; අනිස්සාඝවා, හෘදයවස්තුරූපය නොනිසා හෝ; පවත්තනති, හටගන්නාහු වෙත්. ආරූපපවිපාකඛ්ඤන්ධ, අරූපාවචර විපාකයන්ගේවශ යෙන්; චතසෙසාමනොවිඤ්ඤාණධාතුයෝ, මනොවිඤ්ඤාණධාතු හු සතරදෙන තුමූ; හදයං අනිස්සාඝෙව, හෘදය වස්තුව නොනි සාම; පවත්තනති, හටගණිත්යයි; වෙදිතබ්බං, දතයුතුයි.

කාමෙ, එකොළොස් කාමභූම්යෙහි; ඡවත්ථුං, ෂට්ප්‍රකාර වස්තුරූපය; නිස්සිතා, නිශ්‍රයකොටගෙණ හටගත්තාවූ; විඤ්ඤාණධාතුයෝ, විඤ්ඤාණධාතුහු; සත්ත, සත්දෙනෙකැයි, මතා, දන්නා ලද්දාහුය; රූපෙ, අසංඥ සත්ව වර්ජිතවූ පඤලොස් රූපභූම්යෙහි; චවත්ථුං, චක්ෂුර්වස්තු ශ්‍රොත්‍රවස්තු හෘදයවස්තුත්‍රය, නිස්සිතා, නිශ්‍රය කොටගෙණහටගත්තාවූ; විඤ්ඤාණ ධාතුයෝ, විඤ්ඤ ධාතුහු;චතු ඛ්ඛිධා,සතරවැදෑරුම්යයි; මතා, දන්නාලද්දාහුය; අරූපෙ, අරූප භූම්යෙහි; චත්ථු, වස්තුරූපය, අනස්සිතාඝෙව, නිශ්‍රයකොට

නොගෙණම ඝටගත්තාවූ; එකාඛාතු, එකම මනොවිඤ්ඤාණ ධාතුව; මතා, දන්නාලදී. නෙවත්තානාසීස, නෙසාසීස් චිත්තයෝ තුමූ, වත්‍ථූ, වසතුරූපය; නිස්සාය එව, නිශ්‍රයකොටගෙණම; ජායන්ති, උපදින්නාහුවෙත් එවත්තානාසීස, දෙසාසීස් චිත්තයෝ තුමූ; වත්‍ථුං, වසතුරූපය; නිස්සායව, නිශ්‍රයකොටගෙණද, අනිස්සාය ව, නිශ්‍රයකොට නොගෙණද, ජායරෙ, උපදනාහුවෙත්. පාකා රූපඤ, අරූපාවචරවිපාකයෝ සතරදෙන තුමූ; වත්‍ථුං, වසතු රූපය; අනිස්සිතායෙව, නිශ්‍රයකොට නොගෙණම; ජායරෙ, උපදනාහුවෙත්.

අභිධම්මත්ථ සඞ්ගහෙ, අභිධම්මාවතාර සංඛ්‍යාප්‍රකරණයෙහි වදුරණලද්දාවූ අර්‍ථයන්ගේ සංක්‍ෂෙප සඞ්ග්‍රහයවූහෙයින් අභිධම්මාවතාර සඞ්ග්‍රහනම්වූ ප්‍රකරණයෙහි; පකිණ්ණක සඞ්ගහ විභාගොනාම, ප්‍රකීර්‍ණක සඞ්ග්‍රහය බෙදීමට කාරණාවූහෙයින් පකිණ්ණක සඞ්ග්‍රහනම්වූ; තතියො පරිච්ඡෙදෝ, තුන්වන පරි ච්ඡෙදය; ඉති, මෙසේ සම්පාතකරණලද්දේයි.

චක්ඛු, සොත, ඝාණ, ජිව්හා, කාය, ඉන ප්‍රසාද රූපයෝ පස්දෙනම චක්ෂුර්විඤ්ඤාණ යුගලාදිවූ දෙපස් විඤ්ඤාණයන්ගේ ඉප දීමට කාරණාවනහෙයින් වසතු රූපනම්වෙත්. ඒ වසතු රූප යන්ගේ සවරූප විභාගය මතු රූප නිර්දෙශයෙහි පහළවන්නේයි. මනොධාතු මනොවිඤ්ඤාණධාතූන්ගේ නිශ්‍රය ස්ථානවූ හෘදය රූපය හෘදය වසතුනම්වන්නේයි. ඒ හෘදය වසතු රූපය වනාහි දෙතන මැද ඝටිකුරුව එල්වනලද්දාවූ පියුම් කැකුලක් මෙන් පිහිටා ඇත්තේයි. ඒ වසතුහූගේ අභ්‍යන්තරය වැටකොළු වහල්ලක්මෙන් නොසමව ඇත්තේයි. ඊතුළ අඩකුලුදුලක් පමණ ලෙහෙයක්ඇත්තේයි. ඒ ලෙහෙය ආශ්‍රයකොටගෙණ හෘදය වසතුරූපය පවත්නේ නුවනැත්තහුගේ ඒ හෘදයවසතු රූපය කුඩාවෙයි. නුවණැත්තවුන්ගේ හෘදය වසතුරූපය මහත් වෙයි. එතකුදුවුවත් නුවණ ඇත්තවුන්ගේ හෘදය වසතුවෙහි සිදුර මහත්වෙයි. අඥානයන්ගේ සිදුර කුඩාවෙයි. නුවණැත්ත වුන්ගේ හෘදය වසතු රූපයෙහි අඹපත්‍ර දෙකක් වැනිවූ කුඩා අවයව දෙකක් ඇත්තේවෙයි. අඥානයන්ගේ හෘදය වසතුවෙහි අඹපත්‍රයක් වැනිවූ මහත්වූ එකම අවයවයක් ඇත්තේවෙයි. ඒ හෘදය වසතුශෝණිතයවනාහි මොහාධිකකල්හි ඉදිගිය දංඇට මෙන් කාළවණ්ණඇත්තේවෙයි. ලොභාධිකකල්හි මස් සේදූ ජලයට බදු වණ්ණඇතිවෙයි. මොහාධිකකල්හි සහල් දෙව් දියට බදු වණ්ණඇතිවෙයි. ඉතකී චරිතයාගේ ඒ ලොහිතය

කොල්ලුතැම්බි ජලයට බදු පැහැ ඇතිවෙයි, ශුඛාවරිතයාගේ හෘදය වස්තු ලොහිතය ප්‍රභාත්‍ය මුතු ඵල බදු වණී ඇතිවෙයි, එසේ නොවිනම් කිණිහිරියමල් පෙත්තට බදු වණී ඇතිවෙයි, ප්‍රඥා චරිතයාගේ හෘදයවස්තු ලොහිතය ලොහිතඛ මාණික්‍ය යට බදු පැහැය ඇතිවෙයි. මේ ෂට්වස්තුහුම පරිපූර්ණයෙන්ම ඇත්තාවූ සත්ත්වයන් කාමලෝකයෙහිම ලැබියයුතු හෙයින් ෂට් වස්තුහුම කාමලෝකයෙහි ලැබෙන්නාහුවෙත්. රූපලෝකයෙහි වනාහි අසංඥතලයහැර අවශෙෂ පඤ්චස්කන්ධ රූපභූමිවලින් ඝාණ ජිවහාකායයන වස්තුහු තුන්දෙන අවිද්‍යමාන වෙත්. චක්ෂුශ්‍රොත්‍ර දෙදෙනාවන්නාහු නම් ඝ්‍රාණාදිත්‍රය කුමක්හෙයින් නොවන්නා හුදයත්? චක්ෂුශ්‍රොත්‍ර වස්තුදෙදෙන හෙතුකොටගෙණ බුඩ දර්ශනධර්මශ්‍රවණාදී කුශල ධර්මයෝද රැස්කොට හැකිවෙති. ඝාණ ජිවහාකාය වස්තුත්‍රය හෙතුකොටගෙණ ගන්ධ රස සප්ත සඛ්‍යාත ත්‍රිවිධකාම ගුණ විදගැණීම්මත්තක් අන්කිසි කුසල් ධර්මයක් නොලැබියහැකිවේ. එහෙයින් ඝාණජිවහාකායයන් බ්‍රහ්මලොකයෙහි නැත්තේයි. එසේම කාමවිරාග භාවනාබලයෙන් පවකාම ගුණික තාෂණාව ප්‍රහීණකළ හෙයින් පවකාමගුණයන්ම විදගැණීම අපිකොට ඇත්තාවූ ඝාණජිවහාකායයන වස්තුත්‍රයෙහිද විරකත භාවය ඇතිහෙයින් බ්‍රහ්මලොකයෙහි ඝ්‍රාණාදිත්‍රය නැත්තේයි. අසංඥතලයෙහි භාත්පසින්ම වස්තුරූපනැත්තේයි. අරූපභූමියෙහි වස්තුරූපාදීවූ සියලුම රූපස්කන්ධය නොපවත්නේයි. ලොකයෙහි වනාහි සිතකැලැත්වන්නේයයි යන ව්‍යවහාරයෙහි හෙතුහුගේ නාමය ඵලයෙහි ආරොපණයකොට හෘදයවස්තු ලොහිතයා ශේකැලැත් බව චිත්තයාගේ කැලැත් බවයයි ව්‍යවහාර කෙරෙති. හෘදය වස්තුව කැලැත්වයයි ව්‍යවහාර කරණ කල්හි ඝානිහුගේ නාමය ඝානයෙහි ආරොපණයකොට ඝාන්‍යුපචාර වශයෙන් ව්‍යවහාර කරණලදී. හෘදය වස්තුව ආශ්‍රයකොට පවත්නාවූ මනොවිඤ්ඤාණ ධාතුතොමෝ තුන්ප්‍රකාරයක් වන්නිය. ඒ කවරයත්? හෘදය වස්තුව එකාන්නතයෙන් ආශ්‍රයකොට පවත්නා එක්කොළොසයක, හෘදය වස්තුව අනෙකාන්නත වශයෙන් ආශ්‍රයකොට පවත්නා එකෙකොළොසයක, සම්ප්‍රකාරයෙන්ම හෘදය වස්තුව ආශ්‍රය නොකොට පවත්නා එක් කොළොසයකැයි මෙසේ ත්‍රිවිධාකාර වන්නේයි. ඔවුන් අතුරෙන් තෙතිස් සිත්කෙනෙක් එකාන්නත යෙන් හෘදය වස්තුව ආශ්‍රය කෙරෙති. දෙසැලිස් සිත්කෙනෙක් අනෙකාන්නත වශයෙන් හෘදය වස්තුව ආශ්‍රය කෙරෙති. සතර සිත්කෙනෙක් සම්ප්‍රකාරයෙන්ම හෘදය වස්තුව ආශ්‍රය නොකෙරෙති.

අභිධම්මත්ථසංගහ භාවසන්නයෙහි ප්‍රකීර්ණක සංග්‍රහ විභාගනම්වූ තෘතීය පරිච්ඡේදයයි.

අහං, මම; ඉච්චෙවං (ඉතිඑවං යථා වුත්තනයෙන) යම් පරිද්දෙකින් කියනලද ක්‍රමයෙන්; චිත්තුපාදඤං, චිත්ත චෛතසික සඞ්ඛ්‍යාතවූ සතරනාමස්කන්ධයන්ගේ; උත්තරං, වෙදනා සංග්‍රහාදිය බෙදීම් වශයෙන් උතුම්වූ; සඞ්ගහංකත්වා, සඞ්ගහය ක්කොට; පුන, නැවත; භූමිපුග්ගලභෙදෙන, භූමිපුද්ගලයන්ගේ ප්‍රභෙදයෙන්; ලක්ඛිතං, ලක්ෂිතවූ; හෙවත් සලකුණු කරණ ලද්දාවූ නොහොත් දතයුතුවූ; පුබ්බාපරනියාමිතං, පූර්වචිත්ත අපරචිත්තයන්ගෙන් නියම කරණලද්දාවූ; පටිසන්ධිපවත්තියං, ප්‍රතිසන්ධිකාලයෙහි හා ප්‍රවෘත්ති කාලයෙහිද; වා, නොහොත් ප්‍රතිසන්ධි ප්‍රවෘත්ති කාලයන් අතුරෙන්; පවත්ති සඞ්ගහංනාම, ප්‍රවෘත්ති සඞ්ග්‍රහ නම්වූ විපිසඞ්ග්‍රහයක්; සමාසෙන, සංක්ෂේපයෙන් යථාසම්භවතෝ, සම්භවවන පරිද්දෙන් හෙවත් ලැබෙන පරිද්දෙන්; පවක්ඛාමි, ප්‍රභේද වශයෙන් කියම්; කථං, (පවක්ඛාමි) කෙසේ ප්‍රකාශ කරන්නෙම්දයත් ? ඡවඩ්ඪනිව, ඡවිප්‍රකාරවූ වස්තු කෙතෙක්ද; ඡවාරාතිව, ඡවිප්‍රකාරවූ වාරකෙතෙක්ද; ඡආලම්බණානිව, ඡවිප්‍රකාරවූ ආලම්බණ කෙතෙක්ද; ඡවිඤ්ඤාණානිව, ඡවිප්‍රකාරවූ විඤ්ඤාණ කෙතෙක්ද; ඡවිපිගො, ඡවිවිධතෙනෙක්ද; ඡධාවිසයපවත්තිව, ආලම්බණයන්ගේ වාරයන්ගේ හවඟැණීම්ද; වා, නොහොත් ආලම්බණයෙහි චිත්තයන්ගේ හවඟැණීම්ද; ඉති, මෙසේ; විපිසඞ්ගහෙ, විපිසංග්‍රහයෙහි; ඡඡක්කානි, ඡවිකසඳෙතෙක්; වෙදිතබ්බානි, දතයුත්තාහුය; පන, විශෙෂාර්ථයක් කියම්:—විපිමුත්තාරම්මණං, විපිමුක්තවූ එකුන්විසි චිත්තයන්ගේ; විසයපවත්තිං, ආලම්බණයෙහි චිත්තයන්ගේ හටගැණීම තොමෝ; කම්ම කම්මනිමිත්තඤ ගතිනිමිත්තවසෙන, කර්ම කර්ම නිමිත්තය ගතිනිමිත්තය යන මොවුන්ගේ වශයෙන්; නිච්චං හොති, තුන්වැදෑරුම් වන්නීය. තත්‍ථ, ඒ ඡවි ඡවිකයන් අතුරෙන්; වත්ථුවාරා ලම්බණානි, වස්තුඡවිකා වාරඡවිකා ආලම්බණ ඡවිකයෝතුමූ; පුබ්බ, පූර්වවූ ප්‍රකීර්ණක සංග්‍රහයෙහි වුත්තනයා නෙව, කියනලද ක්‍රමඇත්තාහුමැයි චක්ඛුවිඤ්ඤාණඤ්ච, චක්ෂුර්විඥානයද; සොත විඤ්ඤාණඤ්ච, ශ්‍රොත්‍ර විඥානයද, ඝාණවිඤ්ඤාණඤ්ච, ඝ්‍රාණවිඥානයද, ජිව්හාවිඤ්ඤාණඤ්ච, ජිහ්වාවිඥානයද; කාය විඤ්ඤාණඤ්ච, කායවිඥානයද; මනොවිඤ්ඤාණඤ්ච ඉති, මනෝවිඥානය දැයි යන; ඡවිඤ්ඤාණානි හොන්ති, ඡවිවිඥාන කෙතෙක් වෙත්. පන, විශෙෂාර්ථයක් දක්වම්:—නොහොත් ක්‍රමයෙන්

අන්‍යවූ මිශ්‍රක කුමය දක්වමි:—නොහොත් අභෙදයෙන් අන්‍යවූ භෙදයක් දක්වමි:—චාරපවත්තා, චාරයෙහි හටගන්නාවූ; විත්තපවත්තියෝ, විත්තයන්ගේ හටගැනීම් සඞ්ඛ්‍යාතවූ: විපියෝ. විපිහු; චක්ඛුචාර විපිව, චක්ඛුචාර විපියද; සොතචාර විපිව, සොතචාර විපියද: ඝානචාරවිපිව, ඝ්‍රාණචාරවිපියද; ජිව්හාචාර විපිව, ජිව්හාචාර විපියද; කායචාරවිපිව, කායචාරවිපියද; මනොචාර විපිව, මනොචාර විපියදැයි කියා; චාරවසෙනවා චාරවශයෙන් හෝ; චක්ඛුවිඤ්ඤණවි පිව, චක්ඛුවිඤ්ඤාන විපියද; සොතවිඤ්ඤණ විපිව, ශ්‍රොත්‍ර විඥාන විපියද; ඝාණවිඤ්ඤාන විපිව, ඝ්‍රාණ විඥාන විපියද; ජිහ්වා විඤ්ඤාණවිපිව, ජිව්හාවිඥානවිපියද; කාය විඤ්ඤාණ විපිව, කායවිඥානවිපියද; මනොවිඤ්ඤාණ විපිව, ඉති, මනොවිඥාන විපියදැයි කියා; විඤ්ඤාණවසෙනවා, විඥානයන්ගේ වශයෙන් හෝ; ඡ, සඅංකාර ඇත්තාහුයයි; යොජෙතබ්බා, යෙදිය යුත්තාහුය. නොහොත් චාරපවත්තා, චාරයෙහි හටගන්නාවූ; විපියෝ, විපිහු; චක්ඛුචාර විපිව, චක්ඛුචාර විපියද;-පෙ-මනොචාර විපිව ඉති, මනොචාර විපියදැයි කියා; චාරවසෙනවා, චාරයන්ගේ වශයෙන් හෝ; ඡ, සඅංකාර ඇත්තාහුයයි; යොජෙතබ්බා, යෙදිය යුත්තාහුය. විත්තපවත්තියෝ, විත්තයන්ගේ හටගැනීම් සඞ්ඛ්‍යාතවූ; විපියෝ, විපිහු; චක්ඛුවිඤ්ඤණ විපිව, චක්ඛුවිඥාන විපියද;-පෙ-මනොවිඤ්ඤාණ විපිව ඉති, මනොවිඥාන විපිය දැයි කියා; විඤ්ඤාණවසෙනවා, විඤ්ඤාණයන්ගේ වශයෙන් හෝ; ඡ, සඅංකාර ඇත්තාහුයයි; යොජෙතබ්බා, යෙදිය යුත්තාහුය; නොහොත් චාරවසෙනවා, චාරයන්ගේ වශයෙන්ද, චාරපපවත්තා, චාරයෙහි හටගන්නාවූ; විපියෝ, විපිහු; චක්ඛුචාර විපිව, චක්ඛුචාර විපියද;-පෙ-මනොචාර විපිව ඉති, මනොචාර විපිය දැයි කියා; ඡ, සඅංකාර ඇත්තාහුයයි; යොජෙතබ්බා, යෙදිය යුත්තාහුය; විඤ්ඤාණවසෙනවා, විඤ්ඤාණයන්ගේ වශයෙන්ද විත්තපවත්තියෝ, විත්තයන්ගේ හටගැනීම් සඞ්ඛ්‍යාතවූ විපියෝ, විපිහු; චක්ඛුවිඤ්ඤාණ විපිව, චක්ඛුවිඥාන විපියද;-පෙ-මනොවිඤ්ඤාණ විපිව ඉති, මනොවිඥාන විපිය දැයි කියා; ඡ, විපිහු සඅංකාර ඇත්තාහුයයි; යොජෙතබ්බා, යෙදිය යුත්තාහුය. නොහොත් ඡ විපියෝ, ඡවිපිහු; චක්ඛුචාර විපිව, චක්ඛුචාර විපියද; සොතචාර විපිව, ශ්‍රොත්‍රචාර විපියද; ඝාණචාර විපිව, ඝ්‍රාණචාර විපියද; ජිව්හාචාර විපිව; ජිව්හාචාර විපියද; කායචාර විපිව, කායචාර විපියද; මනොචාර විපිව, මනොචාර විපියද; ඉති, මෙසේ චාරවසෙනවා, චාරයන්ගේ වශයෙන්ද; චාරපපවත්තා, චාරයෙහි හටගන්නාහුයයි; යොජෙතබ්බා,

යෙදිය යුත්තානුභය; ඡ ද්විපියෝ, චක්ඛුවිඤ්ඤාණ ද්විපිව චක්ඛුවිඤාන ද්විපියද; සොතවිඤ්ඤාණ ද්විපිව, ශ්‍රෝත්‍ර විඥාන ද්විපියද; ඝාණවිඤ්ඤාණ ද්විපිව, ඝ්‍රාණවිඤාන ද්විපියද; ජිව්හා විඤ්ඤාණ ද්විපිව, ජිව්හාවිඤාන ද්විපියද; කායවිඤ්ඤාණ ද්විපිව, කායවිඤාන ද්විපියද; මනොවිඤ්ඤාණ ද්විපිව, මනොවිඤාන ද්විපියද; ඉති මෙසේ; විඤ්ඤාණඩ්ඨෙසාවා, විඥානයන්ගේ වශ යෙන්ද; චිත්තපවත්තියෝ, චිත්තයන්ගේ හටගැණීම වන්නා හුයයි; යොජෙතබ්බා, යෙදිය යුත්තානුභය; අතිමහන්තං, ඉතා මහත්වූ ද්විපිච්චිත්තෝතපාදඤ ඇත්තාවූ අරමුණෙක්ද; මහන්තං මහත්වූ ද්විපිච්චිත්තෝතපාදඤ ඇත්තාවූ අරමුණෙක්ද; පරිත්තංව, සඵලාවූ ද්විපිච්චිත්තෝතපාදඤ ඇත්තාවූ අරමුණෙක්ද; අතිපරිත්තව, ඉතා සඵලාවූ ද්විපිච්චිත්තෝතපාදඤ ඇත්තාවූ අරමුණෙක්ද; ඉති, මෙසේ; පවත්තරෙ, පවත්තරෙහි; විඤඤපපවත්තති, ආලම්බණ යන්ගේ වාරයෙහි හටගැණීම නොහොත් ආලම්බණයෙහි වාරය න්ගේ හටගැණීම; චතුඛා, සතරාකාර ඇත්තේවෙයි. මනොවාරෙ, මනොවාරයෙහි; විභූතව, වැටහෙන්නාවූ අරමුණෙක්ද; අවිභූත ව, නොවැටහෙන්නාවූ අරමුණෙක්ද; ඉති මෙසේ; විඤඤපපවත්තති, ආලම්බණයන්ගේ හටගැණීම නොහොත් ආලම්බණයෙහි චිත්ත යන්ගේ හටගැණීම; විධා, දෙවැදෑරුම්වෙයි. ඉති (ඉමිනාප හෙදෙන) මේ ද්‍රව්‍යභේදයෙන්; ඡධා ඝඨනාකාරයක් ඇත්තාවූ; විඤඤ පපවත්තති, ආලම්බණයන්ගේ වාරයෙහි හටගැනීම නොහොත් ආලම්බණයෙහි චිත්තයන්ගේ හටගැණීම; වෙදිතබ්බා, දතයුත්තිය. නොහොත් විඤඤපපවත්තති, ආලම්බණයන්ගේ වාරයෙහි හටගැණීම; ඡධා ඝඨනාකාරයක් ඇත්තීයයි; වෙදිතබ්බා, දතයුත්තීය. කථං (වෙදිතබ්බා,) කෙසේ දතයුත්තීදයත්? උපපාදඨිති භඞ්ගවසෙන, උත්පාදක්ෂණය, ඨිතික්ෂණය, භඞ්ග ක්ෂණය යන මොවුන්ගේ වශයෙන්; ඛණත්තයං, කුඩාක්ෂණයන් තුන්දෙනාගේ සමූදය පොදෙමි; එකචිත්තක්ඛණං නාම, එක් චිත්තක්ෂණයක් නම්වෙයි. පන, චිත්තයාගේ ආයුෂයෙන් අඨ්‍යවූ රූපයාගේ ආයුෂය දක්වමි:—තානි, තාදිසානි, එබඳු සවභාව ඇත්තාවූ හෙවත් තුන් තුන් ක්ෂණයකින් පරපූණිවූ; සත්තරස චිත්තක්ඛණානි, සතළොස් චිත්තක්ෂණයකට බඳු ක්ෂණයෝ තුමූ; රූපධම්මානං, විඤඤත්ති රූපවර්ය ලක්ෂණ රූපසතරය යන මොවුන් හැර සෙසු දෙවිසිරූපයන්ගේ; ආයු, ආයුෂවෙයි. එකචිත්තක්ඛණාතීතානිවා, එක් චිත්තයක්හුගේ ක්ෂණයන්ට බඳු ක්ෂණයන් ඉක්මගියාවූ හෝ; බහුචිත්තක්ඛණාතීතානිවා, බොහෝ චිත්තයන්ගේ ක්ෂණයන්ට බඳු ක්ෂණයන් ඉක්මගියාවූ

හෝ තොහොත් චිත්තක්ෂණයක් හෝ තුන්චිත්තක්ෂණයක් හෝ සතර චිත්තක්ෂණයක් හෝ පස්චිත්තක්ෂණයක් හෝ සවිත්තක්ෂණයක් හෝ සත්චිත්තක්ෂණයක් හෝ අවචිත්තක්ෂණයක් හෝ -පෙ-පසළොස් චිත්තක්ෂණයක් හෝ ඉක්මගියාවූ; ඨිතිපත්තානි එව, ඨිතිකාලයට පැමිණියාවූම; පවාලම්බණානි; පවාලම්බන යෝතුමූ; පවවාරෙ, පවවාරණෙහි; ආපාථං, හමුබවට හෙවත් වැටහීමට; යදාමාආගච්ඡන්ති, යම් හෙයකින් එත්ද, තදාමා එසේ හෙයින්; එකචිත්තක්ඛණාතීතත්තං, එක්චිත්තක්ෂණයක් හුගේ ක්ෂණයන්ට බදු ක්ෂණයන් ඉක්මගියාවූ; රූපාරම්මණං, රූපාලම්බණ තෙමේ; චක්ඛුස්ස, චක්ෂුස්ස ඉඳුරණට; ආපාථං, හමුබවට; හෙවත් වැටහීමට; යදි ආගච්ඡති, ඉදින් පැමිණෙන්නේවී නම්; එවංසති, මෙසේ පැමිණීමක් ඇතිකල්හී; තතෝ, එසේ වැටහීමට; පැමිණිහෙයින් තොහොත් එසේ වැටහීමට පැමිණීමෙන්; පරං, මත්තෙහි; චික්ඛත්තුං, දෙවිටක්; භවාඞ්ගචලිතෙ, භවාඞ්ගය සැලුනුකල්හී; භවඞ්ගසොතං, භවාඞ්ගප්‍රවාහය; වොච්ඡින්දිත්වා, විශෙෂයෙන් සිඳ හැරී; තමේව රූපාරම්මණං, ඒ රූපාලම්බණය; ආවජ්ජන්තං, ආවර්ජනා කරන්නාවූ; පවවාරාවජ්ජන චිත්තං, පවවාරාවජ්ජන සිත්තෙම; උපපජ්ජිත්වා, ඉපිද, නිරුජ්ඣති, නිරුඬවෙයි, තතොපරං, ඒ පඤ්චවාරාවජ්ජන චිත්තය නිරුඬවීමෙන් මත්තෙහි; තස්ස, ඒ පවවාරාවජ්ජන චිත්තයට අනතුරුතන්හි; තමේවරූපං, ඒ රූපයම; පස්සන්තං, දක්නාවූ; චක්ඛුවිඤ්ඤාණං, චක්ෂුර්විඥාන චිත්තයද, සම්පටිච්ඡන්තං, පිළිගන්නාක්වැනිවූ; සම්පටිච්ඡන චිත්තං, සම්පටිච්ඡන චිත්තයද; සන්තීරයමානං, මොනවට සලකුණු ලබන්නාවූ; සන්තීරණ චිත්තං, සන්තීරණ චිත්තයද; වවත්ථපෙන්තං, මොනවට නියමකරන්නාක් වැනිවූ; වොත්ථපන චිත්තංව, ව්‍යවස්ථාපන චිත්තයද, ඉති ඉමානි චිත්තානි, මේ චිත්තයෝතුමූ; යථාක්කමං, පිළිවෙළින්; උපපජ්ජිත්වා, ඉපිද; නිරුජ්ඣන්ති, නිරුඬවෙත්; තතොං, ඒ ව්‍යවස්ථාපන චිත්තය, නිරුඬවීමෙන් මත්තෙහි, එකූනතිංස කාමාවචර ජවනෙසු, එකුනතිස්සාවිදරි ජවන් අතුරෙන්; යංකිඤ්චි, යම්කිසි ජවනයක් තෙමේ; ලඞ්ඝනවාරාදී වශයෙන් ලබාලද උපකාර ඇතිව; යෙහුයෙන, බොහෝ සෙයින්; සත්තක්ඛත්තුං, සත්විටක්; ජවති, දිවේ; ජවනානුබන්ධානි, ජවන් ලුහුබැන්දාවූ තොහොත් ජවනයන්ට අනුවගියාවූ; වෙතදාලම්බණපාකානිච, තදාලම්බණ විපාක චිත්තයෝ දෙදෙනෙක්ද; යථාරහං, සුදුසු පරිදෙන්; පවත්තන්ති, උපදිත්; තතොපරං, ඒ තදාලම්බණයාගේ නිරුඬවීමෙන් මත්තෙහි; භවඞ

පෘතෝ, භවාඞ්ගයෙහි වැටීමවෙයි. එත්තාවතා, මෙපමණකින්; වුද්ධඅවීපි චිත්තුපාදෝ, තුදුස්විපි චිත්තෝත්පාදෝ කෙනෙක්ද, වෙභවඞ්ගවලනානි, භවාඞ්ගවලන චිත්තයෝ දෙදෙනෙක්ද, පුබ්බව, පූර්වයෙහිම; අතීතකං, ඉක්මගියාවූ; එකවිත්තක්ඛණං, එක් භවාඞ්ග චිත්තක්ෂණයෙක්ද; ඉතිකත්වා, මෙසේ මේ ප්‍රභේදයෙන්; සත්තරස චිත්තක්ඛණානි, සත්තරෝස් චිත්තක්ෂණ කෙනෙක්තුමූ; පරිපූරෙන්ති, සම්පූර්ණවේත්. තතොපරං, ඒ දෙවන තදාලම්බණයාගේ සිතික්ෂණයෙන් මතු භවාඞ්ගකාලයෙහි; රූපාලම්බණං, රූපාලම්බණ නමේ; නිරුජ්ඣති, නිරුද්ධවෙයි. එතං ආරම්මණං, ඒ අරමුණුතෙම; අතිමහන්තං නාම, අතිමහන්තාලම්බණ නම් ඇත්තාවූ; ගොචරං, අරමුණයි. පන, අතිමහන්තාලම්බණ විපිත්තෙන් අන්‍යවූ මහන්තාලම්බණ විපිය දක්වමි:— නොහොත් තදාලම්බණ වාරයෙන් අන්‍යවූ ජවනවාරය දක්වමි:— යාවතදාලම්බණුප්පාදා, තදාලම්බණෝත්පත්තියා දක්වා; අපපහොන්තාතීතකං, නොපොහොනා බැවින් ඉක්මිම ඇත්තාවූ; නොභොත් ශක්තිනැති බැවින් ඉක්මිම් ඇත්තාවූ; ආපාථං ආගතං, වැටහීමට පැමිණියාවූ; ආලම්බණං, අරමුණු තෙමේ; මහන්තං නාම, මහන්තාලම්බණ නම් වෙයි. තත්ථ, ඒ මහන්තාලම්බණයෙහි; ජවනාවසානෙ, ජවන්හුගේ කෙළවර; භවඞ්ග පාතොවහොති, භවාඞ්ගයෙහි හිමම්වෙයි. තදාලම්බණුප්පාදෙ, තදාලම්බණයන්ගේ හටගැණීමෙක්; නත්ථි, නැත්තේයි. යාවජවනුප්පාදාපි, ජවනයන්ගේ හටගැණීම දක්වාද; අපපහොන්තාතීතකං, නොපොනා බැවින් නික්මිම් ඇත්තාවූ; ආපාථං ආගතං, හමුබවට ගියාවූ; ආලම්බණං, අරමුණු තෙමේ; පරිත්තං නාම, පරිත්තාලම්බණ නම් වෙයි. තත්ථ, ඒ පරිත්තාලම්බණයෙහි; ජවනම්පි, ජවනසෘ අපි, ජවනයාගේද, අනුප්පජ්ජිත්වා, අනුපපජ්ජනතොං, හටගැණීම නොවන හෙයින්; වත්තික්කත්තුං, දෙතුන් විටක්; වොට්ඨපන මෙව, ව්‍යවස්ථාපන චිත්තයම; පවත්තති, භවඟන්නේයි. තතොපරං, ඒ දෙතුන් ව්‍යවස්ථාපන චිත්තයකින් මත්තෙහි, භවඞ්ගපාතොව හොති, භවාඞ්ගයෙහි හිමම වෙයි. පන, ව්‍යවස්ථාපන වාරයෙන් අන්‍යවූ මෙඅවාරය දක්වමි:— යාව වොට්ඨපනුප්පාදා, ව්‍යවස්ථාපනෝත්පත්තියා දක්වාද; අපප හොන්තාතීතකං, නොපොහොනා බැවින් ඉක්මිම ඇත්තාවූ; ආපාථං ආගතං, හමුබවට ගියාවූ නිරොධාසන්නං, නිරුද්ධීමට ලංවූ; ආලම්බණං, අරමුණු තෙමේ; අතිපරිත්තං නාම, අතිපරිත්තාලම්බණ නම් වෙයි. තත්ථ, ඒ අතිපරිත්තාලම්බණයෙහි; භවඞ්ගචලනමෙවනත්ථි, භවාඞ්ගයාගේ සැලීම් මාත්‍රයක්මවෙයි.

විපිත්තුපපාදෙ, විපිවිත්තයන්ගේ හටගැණීමෙක්; නත්ථි, නැත් තේයි. ඉතිඑවං යථා වුත්තනයෙන, මෙසේ මේ කියනලද ක්‍රම යෙන්; චක්ඛුවාරෙ, චක්ෂුවාරයෙහි; විසයපපවත්ති, ආලම්බණ යන්ගේ වාරයෙහි හවගැණීම නොහොත් ආලම්බණයෙහි හට ගැණීම; වත්තබ්බොහොති, සතරාකාරවෙයි. තථා; එපරිද්දෙන්; සොතවාරාදී සුව, ශ්‍රෝත්‍රවාරාදියෙහිද, නොහොත් සොතඝාණ ජිව්හාකායෙ යන ඝතරවාරයෙහිද; විසයපපත්ති, ආලම්බයන්ගේ වාරයෙහි හටගැණීම; වත්තබ්බොහොති, සතරාකාරවෙයි. ඉති මෙසේ; සබ්බථාපි, සම්ප්‍රකාරයෙනුදු; පවත්තාරෙ, පවත්වාරයෙහි; තදුලම්බන ජවන වොත්ථපන මොඝවාර සඛ්‍යාතානං, තදුලම්බන වාරය, ජවනවාරය, වොත්ථපනවාරය, මොඝවාරයයි කියනලද තුදු; වත්තබ්බානං වාරානං, සතරවාරයන්ගේ; යථාසකමං, පිළි වෙළින්; ආලම්බකභූතා, අරමුණුවූ හෙවත් කාරණාවූ; විසයපප වත්ති, ආලම්බණයන්ගේ වාරයෙහි හටගැණීම නොහොත් ආලම්බණයෙහි විත්තයන්ගේ හටගැණීම; වත්තබ්බා, සතරපරිද් දෙන්; වෙදිතබ්බා, දතයුත්තීය. පවත්තාරෙ, පවත්වාරයෙහි; යථාර හං, සුදුසු පරිද්දෙන්; උපපජ්ජමානානි, උපදිනු ලබන්නාවූ; විපි විත්තානි, විපිවිත්තයෝතුමූ; අවසෙසතො, සාමාන්‍ය වශයෙන්; සත්තතව, සත්දෙනෙක්ම; සියුං, වත්තාහුය; විසෙසතො, විශෙෂ වශ යෙන් විත්තුපපාද, විත්තුපපාදවසෙන, විත්තයන්ගේ වෙන වෙනම හටගැණීම වශයෙන්; වත්තබ්බ සියුං, තුදුස් ප්‍රභෙදයක් වෙති. විත්ථාරා, විස්තර වශයෙන්; වත්තබ්බා සියුං, සූපණෙක්ම වෙත්. එත්, මේ විපිසංග්‍රහයෙහි; අයං, මේ කියනලද්දේ වනාහි, පවත්තාරෙ, පවත්වාරයෙහි; විපිවිත්තපපත්තිනයො, විපිවිත්ත යන්ගේ හටගන්නා ක්‍රමයයි.

ආලම්බණයන්ගේ වාරයෙහි හටගැණීමය යන අවිශෙෂතාව වනාහි රූපාලම්බණාදිහු චක්ෂුවාරාදියෙහි හටගැණීම සඳහා කියනලදී. ආලම්බණයෙහි විත්තයන්ගේ හටගැණීමය යන අවිශෙෂතාව වනාහි මිස්සුවාරාදියෙහි හටගන්නාවූ විත්තයෝ තුමූ රූපාලම්බණාදිය අරමුණු කොටගෙණ හටගැණීම සඳහා කියනලදී. මනොවාරයෙහි හටගන්නා විත්තයෝතුමූ කම්ම නිමිත්තය යන දෙදෙන අරමුණු කිරීම නතයුත්තේයි. පව වාරවීථියෙහි අතිමහත්තාලම්බණය, මහත්තාලම්බණය, පරිත්තා ලම්බණය, අතිපරිත්තාලම්බණයයි කොවර ප්‍රවෘත්ති සතරාකාර මේයි. මනොවාරයෙහි වනාහි විභූතාලම්බණය, අවිභූතාලම්බණ

යයි විසය ප්‍රවෘත්තියය දෙයාකාරවෙයි. මෙසේ පවත්වාරම්මණෝවාර යෙහි විසයප්‍රවෘත්තිය යාකාරයක් වෙයි. චිත්තයාගේ ඉපදීම උත්පාදක්ඛණ නම්වෙයි. චිත්තයාගේ පිතිය ජරතානම්වෙයි. චිත්තයාගේ බිඳීම මරණ නෙවත් භඞ්ගනම් වෙයි. මෙසේ එකම චිත්තයක් හුගේ උපපාදඨිති භඞ්ගඛ්‍යාතවූ ක්ඛණත්‍රය එක්වූ කල්හී එක් චිත්ත ක්ඛණයක් නම්වේ. ඉහවත් චිත්තයාගේ ආයුෂ නම් වෙයි. එබඳු චිත්තක්ඛණ සතළොසෙක් හෝ උපපාදක්ඛණාදී කුඩාක්ඛණයෝ එක් පණසෙක් හෝ එකම රූපධම්මයක්හුගේ ආයුෂ නම් වෙයි. රූපයාගේ ඉපදීම හා රූපයාගේ බිඳීමද ඒ කුඩා එක් පණසින් එක එකක්ම වන හෙයින් රූපයාගේ උපපාදඛඞ්ගවය හා චිත්තයාගේ උපපාදඛඞ්ගවයද සමානායුක වන්නේයි. එබඳු කුඩාක්ඛණයෝ එකුන් පණසක් රූපයාගේ පිතිකාලය හෙවත් ජරතා රූපය නම් වෙයි චිත්තයාගේ පිතිය වනාහි එකම කුඩාක්ඛණයක් වන හෙයින් රූපයාගේ උපපාදය හා සමානවන්නේයි. රූපයාගේ උපපාදය, රූපයාගේ උපචය, රූපයාගේ සන්තතිය, යන මේ නාමයෝ තුන්දෙනාම සමානාර්ථයි. රූපයාගේ පිතිකාලය, ජරතාරූපය යන මේ නාම මයද, සමානාර්ථයි. රූපයාගේ භඞ්ගය, රූපයාගේ මරණය, අනිච්චතා රූපය, යන මේ නාමත්‍රය සමානාර්ථයි. කායවිඤ්ඤත්ති රූපය, වචීවිඤ්ඤත්ති රූපය හෙවත් කයින් අභිප්‍රාය ඇඟවීමය, වචනයෙන් අභිප්‍රාය ඇඟවීමය යන මේ රූපවයද, එක එක චිත්තයකට බඳු ආයුෂ ඇතිවෙයි. හෙවත් උපපාදඨිති භඞ්ගඛ්‍යාත ක්ඛණත්‍රයකින් එක් චිත්තක්ඛණයක් කෙළවරවන්නාක් මෙන්ම කායවිඤ්ඤත්ති වචීවිඤ්ඤත්ති සඞ්ඛ්‍යාතවූ චිත්තජරූපවයද, ඒ ඒ සිත හා සමඟම නිරුඬවන්නේයි. එහෙයින් අභිධම්ම මාතෘකාවෙහි "චිත්තානුපරිවත්තිනෝ ධම්මා චිත්තසහභුනෝ ධම්මා," යන පදයන්ගෙන් මේ කායවිඤ්ඤත්ති වචීවිඤ්ඤත්ති රූපවය වදාළ බැවින් ඒ රූපවය සත්තරසායුක නොවියයුත්තේයි. එහෙයින් අවවිසිරූපධම්මයන් අතුරෙන් උපචය රූපය අනිත්‍යතා රූපය, යන රූපවය කුඩාක්ඛණ එක් පණසින් එක එක ක්ඛණයකට බඳු ආයුෂ ඇත්තේයයි කියාද, විඤ්ඤත්ති රූපවය ඒ කුඩාක්ඛණ තුණතුණට බඳු ආයුෂ ඇත්තේයයි කියාද, ජරතා රූපය ඒ කුඩාක්ඛණ එකුන්පණසකට බඳු ආයුෂ ඇත්තේයයි කියාද, අවශේෂවූ සියලු රූපයෝ සත්තරසායුක නොහොත් කුඩාක්ඛණ එක් පණසකට බඳු ආයුෂ ඇත්තේයයි කියාද, සන්තතිරූපය උපචය රූපයට බඳු ආයුෂ ඇත්තේයයි කියාද, අර්ථගතවයුත්තේයි. පටිසන්ධි චිත්තයාගේ උත්පාදක්ඛණයෙහි පහළවන්නාවූ කායභාව වත්ථුකලාපත්‍රයාගේ

භවඟඋණ්ම උපචය රූපයයිද, ඒ පටිසන්ධි චිත්තයාගේ සීඝ්‍රක්ෂණය පටන් චුතිචිත්තයට ආපසු ගිණූ කල්හි සතළොස් වන චිත්තයාගේ උත්පාදක්ෂණය දක්වා නිරන්තරයෙන් ඒ රූපයන්ගේ භවඟඋණ්ම සන්තතිරූපනම් වෙයි. ඒ ඒ භවයෙහි යම් රූපකලාපයක්හුගේ පළමුවන භවඟඋණ්ම උපචය රූපයයිද, නැවත නැවත භවඟඋණ්ම සන්තතිරූපයයිද වන බැවින් උපචය සන්තති දෙදෙනාගේ වෙනසක් නැතැයි දත යුතුයි. අවශෙෂවූ දෙවිසි රූපයම සන්තරසාධාරණ වියයුත්තේයි. ඒ සන්තරසාධාරණ වන්නාවූ දෙවිසි රූපයන් අතුරෙන් 'වණ්ණාගන්ධාදී යම්කිසි රූපයක් තෙමේ ඉපිද යටත් පිරිසෙයින් එක් චිත්තක්ෂණයක් ඉක්මවා හෝ උඩත් පිරිසෙයින් සොළොස් චිත්තක්ෂණයක් ඉක්මවා හෝ චක්ඛුරාදී වාරයට හමුවන්නේයයි දත යුතුයි. ඒ හමුවීමද අභිමුඛීභූත ඝටනය හමුවීමයයි කියනලදී. ඒ හමුවීමද භවාඞ්ගචලනයාගේ උත්පාදක්ෂණයකට පැමිණීමෙන් හමුවන්නේයයි කියාද ඇතැම් ආචාර්‍යවරයන්ගේ මතපරිද්දෙන් පළමුවන අතීත භවාඞ්ගයාගේ උත්පාදක්ෂණයෙහි ඇත්තාවූ චක්ඛු ප්‍රසාදය හා බාහිර රූපාලම්බණ තෙමේ අතීත භවාඞ්ගය හා සමානව උපන්නාවූ චක්ඛුප්‍රසාදයට ගැවෙන්නේයයි ඇතැම් ආචාර්‍යවරයෝ කියත්. භවාඞ්ගචලනය යනු වෘත්තානුසාරයෙන් සැලෙන්නාවූ වෘක්ෂ ශාඛාවක්මෙන් සැලෙන්නේ නොවෙයි. පූර්‍වභවාඞ්ගයට විසදෘශව උපදනා භවාඞ්ගයම භවාඞ්ගචලනයයි ව්‍යවහාර කෙරෙති. ඒ භවාඞ්ගශ්‍රොතස සිදගෙණ උපදනා භවාඞ්ග චිත්තයම භවඞ්ගුපච්ඡෙදයයි ව්‍යවහාර කෙරෙත්. චක්ඛු ප්‍රසාදය වනාහී සසම්භාර චක්ඛුව ආශ්‍රය කොටගෙණ පවත්නේයි. ඒ උපාදරූපවූ චක්ඛුප්‍රසාදය හා සමග ශරීරයෙන් පිටත් හී පවත්නාවූ රූපාලම්බණය ගැටුනු කල්හි කුමක්හෙයින් හෘදය වස්තුව නිසා පවත්නාවූ මනොවිඤ්ඤාණධාතු සඞ්ඛ්‍යාතවූ භවාඞ්ග චිත්තය සැලෙන්නේද, ඝට්ටණයවූ සථානය අනික්කෙක, සැලෙන්නාවූ ධර්ම අනික්කා, මේ සිඞ්ගීම කෙසේ වන්නේදැයි ප්‍රශ්නයක් නැඟේ. ඊට පරිහාර මෙසේයි. සුණඛ කුණපයක් අනුභව කරමින් ඉන්නාවූ ගිජුලිහිණියෙකුට යන්ත්‍ර මුක්ත ආයුධ සඞ්ඛ්‍යාතවූ තුවක්කුවකින් වෙඩිතැබූකල්හී ඒ ලඟහුන් කඩුවූතෙම අතිශයින් භයට පැමිණ ඉගිලියන්නාක්මෙන් සුනඛ කුණපයට බඳුවූ රූපාලම්බණය අනුභව කරන්නාවූ ගිජුලිහිණියෙකුට බඳුවූ චක්ඛුප්‍රසාදය ගැටුනු කල්හි ඊලඟහුන් කවුඩුවෙකුට බඳුවූ භවාඞ්ග චිත්තය සැලෙන්නේයයි දත යුතුයි. අතීත භවාඞ්ග චිත්තයාගේ

උත්පාදක්ෂණයෙහි "ඛණෙ ඛණෙ සමුඨාපෙති" යනු කියෙයින් උත්පාදක්ෂණයෙහි චක්ඛුදසක වසතු දශකයෝද, ඨිතික්ෂණයෙහි චක්ඛුදසක වසතු දසකයෝද, භඞ්ගක්ෂණයෙහි චක්ඛුදසක වස්තු දසකයෝද, නිරන්තරයෙන් උපදනානුවෙත්. සියලු චිත්තයන්ගේ තුන් තුන් ක්ෂණයෙහි සත්ත්වයන්ට සත්ත්ව භාවරූපය සමගද පුරුෂයන්ට පුරුෂභාව රූපය සමගද, මෙසේම රූපකලාපයෝ අට අටදෙනෙක් උපදනාහුවෙත්. එහෙයින් නිරන්තරයෙන් එක් සත්වයෙක්හට චක්ඛුදශක කලාපයෝ එක් පණසක්දා ශ්‍රොත්‍රාදී අවශෙෂ සප්තකලාපයන්ගේ එක් පණස බැගින් ඇත්තාහුවෙත්. ඔවුන් අතුරෙන් චක්ඛුදශකයෙහි ඇතුලත්වූ සතර මහාභූතයන්ගෙන් අවශිෂ්ටවූ වණ්ණ ගන්ධ රස ඔජාජීවිතෙන්ද්‍රිය චක්ඛුප්පසාද සඞ්ඛ්‍යාතවූ සාසාකාර උපාදාය රූපයෝතුමූ චක්ඛුදශක කලාපයෙහි ඇත්තාවූ උතුවතුෂ්කය නිශ්‍රයකොට පවත්නාහුවෙත්. ඒ සතර මහා භූතයෝ වනාහි එක් භූතයෙක් අවශෙෂ භූතත්‍රයටද ඒ භූතත්‍රය ඒක් භූතයෙක්හටද භූතමයෙක් අනික් භූතත්‍රයද නිශ්‍රයවීමෙන් තමාගේ සතළොස් චිත්තක්ෂණයතුල පවත්නාහුය. වසතුදසක කලාපයෙහිද චක්ඛුදශක කලාපයට කිනයින්ම සතර මහා භූතයන්ගෙන් අවශිෂ්ටවූ උපාදා රූපයෝ සදෙන භූතචතුෂ්කය නිශ්‍රයකොට පවත්නාහුවෙත්. ඒ සතර මහා භූතයෝ වනාහි චක්ඛුකලාපයෙහි කිනයින් ඔවුහොවුන්ට ඔවුනොවුන් උපකාරවෙත්. මනොවිඤ්ඤාණධාතු තෙමේ හෘදය වස්තුව නිශ්‍රයකොට පවත්නේයි. එසේ පවත්නා හෙයින් බාහිරවූ රූපාලම්බණය හා අතීත භවාඞ්ගයාගේ උත්පාදක්ෂණයෙහි අධ්‍යාත්ම සන්තානයෙහි ඇත්තාවූ චක්ඛුප්පසාදය හා ගැටීමෙක් වීනම් ඒ චක්ඛුප්පසාදය වවලවන්නේයි ඒ චක්ඛුප්පසාදය වවලවූ කල්හි චක්ඛුප්පසාද කලාපයෙහි ඇත්තාවූ භූතචතුෂ්කය වවලවන්නේයි. ඒ භූතචතුෂ්කය වවලවූ හෙයින් වසතුදශක කලාපයෙහි ඇත්තාවූ භූතචතුෂ්කයද අන්‍යොන්‍ය සම්බන්ධය ඇති හෙයින් වවලවන්නෙයි. ඒ වසතුදශක කලාපයෙහි ඇත්තාවූ භූතචතුෂ්කය වවලවූ හෙයින් තත්නිශ්‍රිතවූ හෘදය වස්තුව වවලවන්නේයි. ඒ හෘදය වස්තු වවලවීම හෙතුකොට ගෙණ මනොවිඤ්ඤාණධාතු සඞ්ඛ්‍යාතවූ භවාඞ්ගය වවලවන්නේයි. ඊට උපමාකවිරයන? දෙදුහුණු බෙරයක එක් මුහුන තෙක්හි ඇලීගියාවූ සකුරු කැටයෙහි මැස්සෙක් අවුත් හුන් කල්හි අනිත් බෙර මුහුනතට ගැසීමෙන් ඒ බෙර මුහුණත වවලවෙයි. ඊටපසු වරපට වවලවෙයි. ඉක්බිති ඒ වරපට හා සම්බන්ධ බැවින් අනිත් බෙර මුහුණත වවලවෙයි. ඉක්බිති ඒ බෙර මුහුණතහි ඇලීතුබූ සකුරු කැටය වවලවෙයි. ඒ වවලවීම හෙතුකොට ගෙණ සකුරු කැටයෙහි හුන් මැස්සා ඉගිලෙයි. මේ උපමාවෙහි අනිත් බෙර මුහුනතට ගැසෙන්නාවූ කඹිපුව

මෙන් බාහිරවූ රූපාලම්බනයද, ඒ බෙර මුහුනතමෙන් චක්ඛු ප්‍රශාද රූපයද, වරපටමෙන් චක්ඛුදශක කලාපයෙහි භූතවතුෂ්කය ද, සකුරු කැවය ඇලිතිබෙන්නාවූ බෙර මුහුනතමෙහි හෘදය වස්තු කලාපයෙහි ඇත්තාවූ භූවතුෂ්කයද, සකුරු කැවයෙමෙන් හෘදය වස්තු රූපයද, ඒ සකුරු කැවයෙහි හුන්මැස්සාමෙන් මනොවිඤ්ඤාණධාතු සඞ්ඛ්‍යාත භවාඞ්ගචලන චිත්තයද උපමා උප මෙය සම්බන්ධකොට අර්ථ දක්වයුතුයි. ආලම්බණ සටවණයවූ කල් හිම විපිසිත් කොඉපද කුමක්හෙයින් අතීත භවාඞ්ග සිත් එකක් හෝ ඉන්වැඩි ගණනක් හෝ උපදනාහුදයන්? මහාජව වෙග යෙන් දුවන්නාවූ අසෙකු අතිමත ස්ථානයෙහි සිටුවනු කැමැත්තේ විනම් ඒ ස්ථානයෙන් එක් බඹයක් හෝ දෙතුන් බඹයක් හෝ පොලාපැන ගොස් නැවැත්විය යුතුවෙයි. එපරිද්දෙන්ම මහත්වූ සැඞවතුරෙක් මෙන් බස්නාවූ භවාඞ්ග ප්‍රවාහය සිදගෙණ චිත්ත විපියක් උපදවනු කැමති විනම් යවත් පිරිසෙයින් එක් අතීත භවාඞ්ගයක් හෝ උඩත් පිරිසෙයින් අතීත භවාඞ්ග (සොළසක්) හෝ ඉපිද ඊට අනතුරුව විපිසිත් ඉපදිය යුතුවෙත්. චක්ඛුප්‍රශාදය හා බාහිර රූපාලම්බණයාගේ ගැටීම ගිනිගලක් හා ගිනිකටුවක්ද එකට ගැටීමක් වැනිවෙයි. ගිනිගල හා ගිනිකටුව ගවන්නාවූ කල්හී ගිනිමල් වැටෙන්නාක්මෙන් විපිවිත්තයන්ගේ භවඟඋණීම දතයුතුයි. ගිනිගලමෙන් චක්ඛු ප්‍රශාද රූපයද, ගිනිකටුවමෙන් රූපාලම්බණයද, උපමා උපමෙය සම්බන්ධ කොට අර්ථ ගතයුතුයි. විපිවිත්තයන්ගේ තදුලම්බණ වාරාදිය විපියෙහි අනන්තිම චිත්තය සඳහා ව්‍යවහාර කරණු ලැබෙයි. තදුලම්බණයන්ගෙන් අවසාන වන විපිය තදුලම්බණ වාරයයි කියාද, ජවනයන්ගෙන් අවසාන වන විපිය ජවන වාරයයි කියාද, ව්‍යවස්ථාපන චිත්තයෙන් අවසන් වන්නාවූ විපිය වොත්ථපනවාරයයි කියාද, භවාඞ්ගචලන මාත්‍රයකින් කෙළවරවන්නාවූ විපිය විපිවිත්තයන්ගෙන් සිස්වූ බැවින් මොඝ වාරයයි කියාද ව්‍යවහාර කෙරෙත්. අතිමහන්තාලම්බණ විපි යෙහි විපිවිත්තයෝ තුදුස්දෙනෙක් වෙත්. ඔවුන්ගේ අරමුණ වනාහි එක් අතීත භවාඞ්ගයක් ඉක්මිගියාවූ නොහෙත් අතීත භවාඞ්ගයාගේ උත්පාදක්ෂණය හා සමග එකොතපාදවූ ප්‍රත්‍යුත්පන්න රූපාලම්බණයයි. ඒ "ප්‍රත්‍යුත්පන්නය"යනු පච්චුප්පන්න සඞ්ඛ්‍යාතවූ ඒ රූපාලම්බණයාගේ ධරමාණ කාල යයි. හෙවත් සතළොස් චිත්තක්ෂණයක් ඇතුලත්හිවූ කාලයයි. තදුලම්බණ නියමයෙහි "ජවනානුබන්ධාදී"යන වචනයෙහි අභිප්‍රාය මෙසේයි. සෞමනස් සහගත ඤාණසම්ප්‍රයුක්ත අසංඛාරික චිත්තයෙන් පරිභුක්ත වූ පුද්ගලයාහට තදුලම්බණ වන්නාවූ කල්හී ඒ සෞමනස් සහගත ඤාණසම්ප්‍රයුක්ත අසංඛාරික මහා විපාක චිත්තයක්ම තදුලම්බණ වශයෙන් පැවතුනේ

නම් තදනන්තරව පවත්නාවූ භවාඞ්ගයද, සොමනස් සහගත ඤාණසම්ප්‍රයුක්ත අසංඛාරික භවාඞ්ගයක්ම වෙයි. ඤාණවිප්‍රයුක්ත සිතින් පටිසන්ධි ගත්තාවූ පුද්ගලයාහට භවාඞ්ගසිත් හා සමග තදුලම්බණයද, ඊට සමානවම වන්නේයි. භවාඞ්ගය විසින් අරමුණු කරණලද්දවූ කම්ම කම්මනිමිත්තය ගතිනිමිත්තය යන තුණින් එකක් අරමුණු කරන්නේයයි කියෙසින් භවාඞ්ගයාගේ අරමුණ නොගෙණ ජවනයාගේ අරමුණට අනුවයන්නේයයි දක්වනු පිණිස "ජවනානුබන්ධානි"යනු කියනලදී. රූපාලම්බණ තෙමේ අනිශයින් අඩිකවූ ආයුෂ ඇත්තාවූ චිත්තවීථි තෙමේ අනිමහන්තාලම්බණ වීථිතම් වෙයි. මහන්තාලම්බණ වීථිය යනාදියෙහිද මේ ක්‍රමයෙක් දතයුතුයි. මහන්තාලම්බණ වීථියෙහි වනාහි කුමක්හෙයින් තදුලම්බණ නොවන්නේදයත්? තදුලම්බණ දෙසිතක් ඉපදීම පිණිස රූපාලම්බණයාගේ ආයුෂ නොපොහොනා බැවින් තදුලම්බණ නොවන්නේයයි දතයුතුයි. එසේ වීතම් එක් තදුලම්බණයක් ඉපදීමට රූපාලම්බණයාගේ ආයුෂ ඇති බැවින් එක් තදුලම්බණයක් නුපදින්නේ කුමක් නිසාදයත්? තදුලම්බණය වනාහි යුගල යුගල වශයෙන්ම ඉපදීම චිත්තනියාමය බැවින් එක් තදුලම්බණයෙක් නුපදනේයි. ඉදින් ඒ රූපාලම්බණයාගේ ආයුෂ නොපොහොනේ වීතම් ප්‍රත්‍යුත්පන්න රූපාලම්බණයෙහි එක් තදුලම්බණයක් හා අතීතවූ රූපාලම්බණයෙහි එක් තදුලම්බණයෙක්ද ඉපදියයුතු නොවේදැයි යමෙක් ප්‍රශ්නකෙළේ වීතම් එකම චිත්තවීථියෙහි ඇතැම් චිත්තයන් ප්‍රත්‍යුත්පන්නාලම්බනයන් හා ඇතැම් චිත්තයන්ට අතීතාලම්බණයද අරමුණු නොවියයුතු බැවින් හා පවත්වාරයෙහි හටගන්නාවූ චිත්තයන්ට අතීතාලම්බණයන් අරමුණු නොවිය යුතුහෙයිනැයි දතයුතුයි. එහෙයින් එක් තදුලම්බණයකට ආයුෂ ඇත්තේ නමුදු අනිත් තදුලම්බණයට ආයුෂ නොපොහොනා බැවින් ජවනයන්ගේ කෙළවර භවාඞ්ගවන්නේයයි දතයුතුයි. පරිත්තාලම්බණ වීථියෙහි ජවන්නුපදින්නේ කුමක්හෙයින්දයත්? ජවනයන්ගේ සභාව වනාහි ප්‍රකෘති ප්‍රවෘත්ති කාලයෙහි කාමාවචර ජවන්හු සත්දෙනෙක්ම දිවිමද, සිහිමුර්ඡාවූ කල්හි ජවන් සදනෙක් දිවිමද, මරණාසන්න කාලයෙහි ජවන් දසක දිවිමද, සෘද්ධිප්‍රාතිහාර්‍යාදිය පෑනෑකල්හි කාමාවචර ප්‍රත්‍යවෙක්ෂා ජවනයෝ සතරදෙනෙක් හෝ පස්දෙනෙක් හෝ දිවිමද, කාමාවචර ජවනයන්ගේ ප්‍රකෘති සභාව මේ මේ ප්‍රකාර වනාහි සඅවරක් හෝ සතරවරක් හෝ පස්වරක් හෝ දිවන්නාවූ කාලය නොවෙයි සත්වරක්ම දිවිමි

සඞ්ඛාව වෙයි. මේ චිත්ත යෙහි රූපාලම්බණයාගේ ආයුෂ චිත්තක්ෂණසතකට අඩුවූ හෙයින් චිත්තනියාමය පරිදි සත්ජවන් කෙතෙක් ඉපදීමට ආයුෂ නොපොහොනා බැවින් එක් ජවන යෙකු නොඉපද භවාඞ්ගවන්නේයයි දතයුතුයි. අතිපරිත්තාලම්බණ චිත්තයෙහි පඤ්චද්වාරවජ්ජනය, සම්පටිච්ඡනය, සන්තීරණය, ව්‍යවස්ථාපන චිත්තය යන චිත්තක්ෂණ සතරක් ඉපදීමට ආයුෂ ඇතිවූවද එසේ නොඉපිද භවාඞ්ගචලන මාත්‍රයක්ම භවාඞ්ග ශ්‍රෝතඃසයට ඔස්නේ කුමක්හෙයිනයත්? ව්‍යවස්ථාපන චිත්තය වනාහි අතිමහත්තාලම්බණ මහත්තාලම්බණ යන දෙවිපිරිසෙහිම එක්වරක්ම උපදනේයි. මේ චිත්ත වීථිවයෙන් අන්‍යවූ වීථියෙක්හි ව්‍යවස්ථාපන චිත්තය එක්වරක්ම උපදනේය යන නියමය නැති බව "චතුක්ඛත්තුං වොත්ථපනමේව පවත්තති" යන්නෙන් ප්‍රකට වේ. ව්‍යවස්ථාපන චිත්තය වනාහි අතිමහත්තාලම්බණ මහත්තාලම්බණ වීථිවයෙන් අන්‍යවූ යම් වීථියක උපදනේ චිතම් දෙතුන්විටක්ම උපදනේයි. දෙතුන්විටක් ඉපදීමට ආයුෂ නොපොහොනේ චිතම් සවීප්‍රකාරයෙන් ව්‍යවස්ථාපන චිත්තය නූපදනේයි. ව්‍යවස්ථාපන චිත්තය නූපදනා හෙයින් සන්තීරණ චිත්තයත් නූපදනේයි, සන්තීරණ චිත්තය නූපදනා හෙයින් සම්පටිච්ඡන චිත්තයත් නූපදනේයි. සම්පටිච්ඡන චිත්තය නූපදනා හෙයින් පඤ්චද්වාරාවජ්ජනය නූපදනේයි. පඤ්චද්වාරාවජ්ජනය නූපදනා හෙයින් පඤ්චාරාවජ්ජනය නූපදනේයි එහෙයින් භවාඞ්ගචලන මාත්‍රයක්ම වන්නේයයි දතයුතුයි. ඒට උපමාකවරයත්? තුඞ්ගෙහි වසන්නාවූ සපියාගේ ඔස තුඞ්ස් කටින් එක් තරා පුරුෂයෙක් දූක එහි සපියෙක් වසන්නේයයි තමාගේ ඥාතීන්වා හා සමග සාකච්ඡාකරණ කල්හී සපියාගේ ඔස නැවත ඇතුලටගෙණ නොපෙණියාමත් මෙන්ද, බලවත්සේ නිදිමතින් සයනය කරන්නාවූ යම් පුරුෂයෙකු පුබුදුවා එකල්හි මදක් ඇසහැර නැවතා නිද්‍රොපගතවන්නාක් මෙන්ද, මේ අතිපරිත්තාලම්බණ වීථිහුගේ භවාඞ්ගචලන මාත්‍රයක් වන්නේයයි දතයුතුයි. මේ චිත්ත වීථියෙහි පඤ්චද්වාරාවජ්ජනයට අනතුරුව පඤ්චද්වාරය ද, ඒට අනතුරුව සම්පටිච්ඡනයද, ඒට අනතුරුව සන්තීරණය ද, ඒට අනතුරුව ව්‍යවස්ථාපනයද, ඒට අනතුරුව ජවන් සතෙක්ද, ඒට අනතුරුව තදුලම්බණ යුගලයෙක්ද යන මේ පිළිවෙළින් හටගැණීම ඊශ්වරාදී ආත්මාදිකාරයෙක් හුගේ නියම යෙක් නොව චිත්ත නියමයයි දතයුතුයි. ඒ එසේමැයි-මේ ලොකයෙහි ලොකසවහා ධම්සවහා වශයෙන් නියමයෝ පස්දෙනෙක් වෙති. ඒ කවරහුයත්? උතුනියාමය, බීජනියාමය, ධම්මනියාමය,

කම්මනියාමය, චිත්තනියාමය යන මේ නියාමයෝ පස්දෙනායි. එහි උතුනියාමය නම්:-මේ සමයෙහි තොපි සිත කරව්, තොපි උෂ්ණ කරව්, වර්ෂා කරව් යනාදීන් නියමකරන්නාවූ ඊශ්වරාදී කාරකයෙක් නැත්තේයි. මේ ලෝකයෙහි හවගන්නා සියලු සත්ත්වයෝ උතුනියම නම්වෙත්. "බීජනියමය"යනු සියලු ලතා ජාතිහු ආසන්නයෙහි ඇති වෘක්ෂයක (දක්ෂිණ වෘතවම) පැවලී යන්නාහුවෙති. නාලිකෙරඵලයෙහි සිදුරුතුණක් ඇතිවෙයි. වෙණු ආදී වෘක්ෂයන් ඇතුලත්හී සිදුරු ඇතිවෙති. මේ සියල්ල බීජනියාමය නම්වෙයි. "ධම්මනියාමය"යනු මහාබොධිසත්ත්වාදීන් ගේ පහළවීමාදියෙහි පෘථිවිකම්පාවීමය, දෙතිස් පුබ්බනිමිති පහළවීමය, යනාදී සියලු සිඩවීම් ධම්මනියාමයතම් වෙයි. "කම්ම නියාමය"යනු කුශල කර්මයට කුශල කර්මවිපාකය හා අකුශල කර්මයට අකුශල විපාකදීමාදිය කර්මනියම නම්වෙයි. "චිත්තනියම මය"යනු මේ චිත්තවීථීන්ගේ චිත්තයන් හවගන්නා පිළිවෙල නම්වෙයි. තෝ පඨවාරාවජ්ජන නම්වෙව, තෝපඨවිඤ්ඤාණ නම් වෙවයි කියා හෝ තෝපඨවාරාවජ්ජනයට අනතුරුව උපදුවයි කියා හෝ නියමකරන්නාවූ කාරකයෙක් නැතිහෙයින් චිත්ත නියාම නම්වෙයි.

පඨවාරාවජ්ජන චිත්තවීථියෙහි උපමාව මෙසේයි. විලිකුම් අඹ ඇත්තාවූ අඹඝසක්යට හිසවසා පොරවාගෙණ සැත පෙන්නාවූ පුරුෂයෙක් තෙමේ ඒ අඹඝසින් විලිකුන් අඹ ඵලයක් හුණු ශබ්දයට පිබිද ඇස ඇර බලා ඒ අඹඵලය දැක අතින්ගෙණ විලිකුන් නොවිලිකුන් බව දැනගන්නා පිණිස අතින්මැඩ පරීක්ෂාකොට නැවතත් නියම වශයෙන් විලිකුන් බව දැනගන්නා පිණිස නාසයට අල්වා සිඹ විලිකුන් බව දැන සතුවින් යුක්තව අඹඵලය අනුභවකොට තලුඅදියෙහි වැකි තිබුනාවූ අඹ රසය මුඛගත ශ්ලේෂ්මය හා සමග ගිල නැවතත් එහිම සයනයකරන්නේය. මේ උපමාවෙහි විලිකුම් අඹ ඇති ගෘහමෙන් කාමලෝකයද, එහි හිසවසා පොරවාගෙණ සැතපී හුන් පුරුෂයාමෙන් භවාඞ්ගචිත්තද, අඹඝසින් අඹගෙඩියක් වැටී මක් මෙන් රූපාදී පඤ්චාලම්බණයන් අතුරෙන් යම්කිසි අරමුණක් වැටීමද, ඒ අඹඵලය හුණු ශබ්දයෙන් නින්දෙන් පිබිද ඇස දැල්වීමක්මෙන් පඨවාරාවජ්ජන චිත්තයද, අඹඵලය දැකීමක්මෙන් චක්ෂුර්විඥාන චිත්තයද, අඹඵලය අවිලා ගැණීමක්මෙන් සම්ප්‍ර ත්‍යෙෂණ චිත්තයද, අඹඵලය අතින්මැඩ පරීක්ෂා කිරීමක්මෙන් සන්තීරණ චිත්තයද, ඉදුනු බව නියමකරගැණීම පිණිස නාස යට ඇල්වීමක්මෙන් ව්‍යවස්ථාපන චිත්තයද, ඉදුනු බව නිශ්චය කොටගෙණ සතුටට පැමිණ අනුභව කිරීමක්මෙන් ජවනස්

සහගත දිට්ඨිගතසම්ප්‍රයුක්ත ලොභමූලික චිත්තය බොහෝසෙයින් ජවන් වශයෙන් සත්වරක් දිවීමද, කැවත තලුආදියෙහි වැකුණාවූ අඹ රසය මුඛගතඥෙළුමය හා සමග ගිලීමක්මෙන් තදලම්බණ විපාක චිත්තයන් දෙදෙනාගේ ඉපදීමද, නැවතත් හිස වසා පෙරවාගෙණ එහිම සැතපීමක්මෙන් මේ අතීමහන්නාලම්බණ චිත්තවීථියට අරමුණුවූ සපරසායුක්තවූ රූපාලම්බණය නිරුඬවීමෙන් පසු නැවත භවාඞ්ගභේදද උපමා උප මෙය්‍ය සම්බන්ධකොට අර්ථදතයුතුයි. මේ අමෙඩාපමා මාත්‍රයකි.

දෙවාරිකොපමාව කෙසේයත්? එක්තරා රජෙක් තෙමේ සවස්භාගයෙහිම ශ්‍රියඝන් නඛඞ්ගවට පැමිණ සැතපෙන්නට පටන් ගන්නේයි. ඉක්බිති ඒ රජහුගේ පරිචාරක පුරුෂ තෙමේ රජහුගේ පාදයන් මඬිමින් ශ්‍රියඝනලඝ හිඳින්නේවෙයි. රජ ඉෙයි දෙරටුවෙහි බිහිරිවූ දෙරටුපාලයෙක් මූරකරයි. ඒ දෙරටුව හා ශ්‍රියඝනට අතරතුර පාටිහාරික රාජපුරුෂයෝ තුන් දෙනෙක් පිළිවෙළින් සිටිඝානුඝ. ඉක්බිති පසල්දනව්වැසි එක්තරා මනුෂ්‍යයෙක් තෙමේ පඬුරු රැගෙණ අවුත් රජඉෙයි වාසල් දෙරට ආකොටණය කෙරෙයි. එතකුදුවුවත් බිහිරි දෙරටුපාල තෙමේ ඒ ශබ්දය නොඅසයි. රජහුගේ පය පිරිමඩිමින් හුන්නාවූ රාජපුරුෂ තෙමේ ඒ ද්වාරාකොටණ ශබ්දය අසා බිහිරි දෙරටුපාලයාහට දෙර විවෘතකරවයි සංඥාවක්දෙයි. ඒ සංඥාවෙන් බිහිරි දෙරටුපාලයා දොරහැර දුන්කල්හි පාටිහාරිකයන් තුන්දෙනා අතුරෙන් පළමුවන පාටිහාරික පුරුෂ තෙමේ පසල් දනව්වැසි මනුෂ්‍යයා විසින් ඉෙණඑතලද්දවූ පඬුරුපාත්කුඩම අතටගෙණ දෙවෙනි පාටිහාරික පුරුෂයා අතටදෙයි. දෙවෙනි පාටිහාරික පුරුෂ තෙමේ තුන්වෙනි පාටිහාරිකයා අතටදෙයි. තුන්වෙනි පාටිහාරික පුරුෂ තෙමේ රජහු අතට පිළිගන්වයි. රජතෙමේ මහත් සොම්නසින් යුකතව අනුභවකරයි. මේ උපමා ඉෙයි රජහුමෙන් සත්ජවනයන්ගේ පැවැත්ම දතයුතුයි. රජහුගේ පාදසම්බාහනය කළ පුරුෂයාමෙන් පවත්වාරූඪීන චිත්තය දතයුතුයි. බිහිරි දෙරටුපාලයාමෙන් වක්ඛුර්විඤ්ඤන චිත්තය දතයුතුයි. පාටිහාරික පුරුෂයන් තුන්දෙනාමෙන් ක්‍රම ඉෙයන් සම්පටිච්ඡන සන්තීරණ ව්‍යවස්ථාපන චිත්තයන් තුන්දෙන දතයුත්තාහුඝ. පසල්දනව්වැසි මනුෂ්‍යයෙක් පඬුරක් ඉෙණවුත් රජවාසල් දෙරට ආකොටණය කිරීමක්මෙන් රූපාදී පවත්වාලම්බණය පවත්‍රඝාදයෙහි ගැටීම දතයුතුයි. පඤ්චපරිමඳ්දිමින්හුන් රාජපුරුෂයා විසින් සලකුණක් දුන්කාලයෙමෙන් ක්‍රියා මනොධාතු සඞ්ඛ්‍යාතවූ පවත්වාරූඪීන චිත්තය කරණකොටගෙණ භවාඞ්ග

යාගේ ආවර්ජනචිත්තකාලය දතයුතුයි. ඔහු විසින් දෙනලද සංඥාවෙන් බිහිරි දෙරටුපාලයාගේ දෙර විවෘත කළ කාලයමෙන් චක්ඛුර්විඤ්ඤාණයාගේ ආරම්මණ දර්ශනකෘත්‍යය සිද්ධකළාවූ කාලය දතයුතුයි. පළමුවන පාටිහාරික පුරුෂයා විසින් පසල්දනව්වැසි මනුෂ්‍යයා අතින් පඬුර පිළිගත් කාලයමෙන් විපාක මනෝධාතු සඞ්ඛ්‍යාතවූ සම්පටිච්ඡන චිත්තයාගේ අරමුණු පිළිගන්නාකාලය දතයුතුයි. පළමුවන පාටිහාරික පුරුෂයා විසින් දෙවෙනි පාටිහාරික පුරුෂයා අතට දුන්කාලයමෙන් විපාක මනෝවිඤ්ඤාණධාතු සඞ්ඛ්‍යාතවූ සන්තීරණ චිත්තයාගේ අරමුණු තීරණය කරගන්නාකාලය දතයුතුයි. දෙවෙනි පාටිහාරිකයා විසින් තුන්වෙනි පාටිහාරික පුරුෂයා අතට දුන්කාලයමෙන් ක්‍රියා මනෝවිඤ්ඤාණධාතු සඞ්ඛ්‍යාතවූ ව්‍යවස්ථාපන චිත්තයාගේ අරමුණු නියමකරගන්නාකාලය දතයුතුයි. තුන්වෙනි පාටිහාරික පුරුෂයා විසින් රජහු අතට දුන්කාලයමෙන් ව්‍යවස්ථාපන චිත්තයෙන් ජවනයට නියමිතකාලය දතයුතුයි. රජහුගේ පරිභෝගකාලයමෙන් ජවනයාගේ ආලම්බණ රසානුභවනකාලය දතයුතුයි.–මේ දෙවාරික උපමාවෙන් මහතාලම්බණ විථිය සැලකියයුතුයි.

ගාමදූර කොපමාව නෙසේයත්? බොහෝවූ ගම්දරුවෝ එක්රැස්ව ඇතුල්විථියෙහි වැලිකෙළිමින් සිටියාහුය, ඔවුන් අතුරෙන් එක්තරා ගම්දරුවෙකුගේ ඝනතලයෙහි වැලි පෙරලන්නාවූ කල්හි රිදීමය කඟවණුවක් ඇවෙයි, ඉක්බිති ඒ ලදරුතෙමේ මාගේ අතෙහි කුමක් පැටුණේදැයි විමැරයි. අනිත් ගම්දරුවෙක් ශ්වේතවර්ණවූ එක්තරා වස්තුවෙකැයි කියේයි. ඉක්බිති අනිත් ගම්දරුවෙක් තෙමේ ඒ ශ්වේතවර්ණවූ වස්තුව වැලි හා සමග මිටමොලවාගත්තේයි. ඉක්බිති අනිත් ගම්දරුවෙක් පළල්වූ ඝතරැස් වස්තුවෙකැයි කියේයි. ඉක්බිති අනිත් ගම්දරුවෙක් ඒ වස්තුව එක් කඟවණුවක්යයි කියේයි. ඉක්බිති ඒ කඟවත්‍රුව මිටමොලවාගත් ගම්දරු තෙමේ වහාම ගෙටදුව අවුත් මව අතට දුන්නේයි. ඉක්බිති මව් තොමෝ ඒ කඟවණුව අභිමත කටයුත්තෙක්හි යෙදූයේයි. බොහෝවූ ගම්දරුවෝ ඇතුල් විථියෙහි වැලිකෙළිමින් හුන්කාවූ කාලයමෙන් චිත්ත විථිහුගේ පැවැත්ම දතයුත්තීය. එක් ගම්දරුවෙකුගේ අතෙහි කඟවණුව හැපුනුකලක් මෙන් ආලම්බණය ප්‍රහාදයෙහි ඇටුනු කාලය දතයුතුයි මේ කිමෙක්දැයි කියනලද කාලයමෙන් ඒ අරමුණ එල්බගෙණ මනොවාරාවජ්ජන චිත්තයාගේ භවාඞ්ගාවතීතකාලය දතයුතුයි.ඒ සුදෙකැයි කියනලදකාලයමෙන් චක්ඛුර්විඤ්ඤාණ විසින් දර්ශනකෘත්‍යය සිද්ධකරණකාලය දතයුතුයි. වැලි හා සමග දැඩිකොට මිටමොලවාගත් කාලයමෙන් සම්පටිච්ඡන

ඔණ විත්තයාගේ අරමුණු පිළිගන්නාකාලය දනයුතුයි. ඒ පලල්වූ සතරැස් වසතුවෙකැයි කියනලද කාලයමෙන් සන්තීරණ විත්තයාගේ අරමුණු තීරණය කරගන්නාකාලය දනයුතුයි. ඒ ඉදිකඩවණුවකැයි නියමකොට කියනලද කාලයමෙන් ව්‍යවස්ථාපන විත්තයාගේ අරමුණ නියමකරගන්නාකාලය දනයුතුයි. ඉක්බිති මව මියින් අභිමතකමියෙහි ගොදනා කාලය මෙන් ජවන් සත්දෙනාගේ ආලම්බණරසානුභවනකාලය දනයුතුයි. මේ ගාමදාරකොපමාවෙන් අතීමහන්තාලම්බණ මහන්තාලම්බණ විපිදෙදෙනාගේ පැවැත්ම අවබෝධ කටයුතුයි. මේ උපමා තුය අතුරෙන් අමෙඛාපමාව අභිධම් අනුටිකාවෙන්ද දෙවාරිකොපමාව හා ගාමදාරකොපමාවද අභිධම්මත්ථවිකාසිනි නම්වූ අභිධම්මාවතාරටිකාමෙන්ද විසතර කැමැත්තහු විසින් බලා අවිඳිමිබෙඛකටයුතුයි.

මනොවාරයහටගැණීමෙහි හෙතුව ගට ප්‍රකිණ්ණක කිදීසයෙහි කිනසින් දනයුතුයි. මනොවාරයෙහි අතීතභවාඞ්ගයන්ගේ ඉෂ්ටිම්මවනාහි විඤ්ඤත්තිරූපවත, ලක්ඛණරූපසකරත, එකුන් අනුවක්විත්තය ගත මෙතෙක් ධම්යෝ වනාහී අතීතාකාගත වර්තමාන ගත කාලයන් අතුරෙන් කෙබදු කාලයක අරමුණු කරන්නානුනමුදු අතීතභවාඞ්ගනොවෙයි, විඤ්ඤත්තිරූපවත, ලක්ඛණරූපසතරත ගතමේ සඳෙන වර්ජිතකොට ඇත්තාවූ දෙවිසිරූපයද, අතීත අනාගතකාලිකවූම අරමුණ් අරමුණු කරන්නේවීනම් අතීතභවාඞ්ග නොවියයුත්තේයි. ඒ දෙවිසි රූපය ප්‍රත්‍යුත්පන්නකාලික වශයෙන්ම අරමුණුකරන්නේ වීනම් අතීතභවාඞ්ගවියයුත්තේයි. මනොවාර විපිදෙහි විසය ප්‍රවෘත්ති සඞ්ඛ්‍යාතවූ විප්‍රකාරවූ අරමුණු අතුරෙන් විභූතාලම්බණය ගනු අයිසයින් ප්‍රකටවූ අරමුණ සඳකාමී කියයි. අවිභූතාලම්බණය ගනු විභූතාලම්බණය ඇති බැවින්ම අවිභූතාලම්බණ යයි ව්‍යවහාර කෙරෙයි. ඉදින් අරමුණ හෘත්පසින්ම නොවැව හෙන්නේවීනම් විපිචිත්තයන්ගේ ඉපදීමෙක් නැත්තේය. යම් වණ්ණායතනසඞ්ඛ්‍යාතවූ රූපාලම්බණයන් තෙමේ සවිප්‍රකාරයෙන් හෘත්පසින්ම චක්ඛුවාරයෙහි වැටහුනේවීනම් එම අරමුණ මනොවාරයෙහි විභූතාලම්බණ නම්වෙයි හෙවත් ප්‍රකට අරමුණ නම් වෙයි. යම් රූපාලම්බණයක් තෙමේ එක දිශායකින් චක්ඛුවාර ගව අරමුණුවූයේවීනම් එම අරමුණ මනොවාරයෙහි අවිභූතාලම්බණ නම්වෙයි. මනොවාරික විභූතාලම්බණ විපිදෙහි මනොවාරවජ්ජනචිත්තයන් ඉපිද නිරුද්ධවූ අනන්තරව ජවන් සතක්ද, තදනන්තරව තදාලම්බණ ද්‍රඟලඝක්ද ඉපිද විඤ්ඤාණය අවයව්‍යමයි.

අවිභූතාලම්බණ විපියෙහි මනොවාරවජ්ජන චිත්තයක්ඉපිද තදනන්තරව ජවන්සතක් ඉපිද ඊට අනතුරුව භවාඞ්ගපාතය වන්නේයි. මේ විභූතා විභූත අරමුණුදෙක ප්‍රකට වශයෙන් දැන ගැනීම පිණිස උපමාවක් දක්වනුලැබේ. ඉල්මස පුරපසළොස්වක් දවස්හි රාත්‍රි භාගයෙහි අහසදෙස බලන්නාහට චන්ද්‍රමණ්ඩලය හා අවශෙෂ තාරකා රූපයන්ද පලමුකොට චක්ඛුවාරයෙහි ප්‍රත්‍යාපත්තාකාලික වශයෙන් අතිමහන්තාලම්බණ හෝ මහන්තාලම්බණ හෝ යම් චිත්තවීථියක් ඉපිද මනොවාරයට වැටහෙන්නාවූ කල්හි චන්ද්‍රබිම්බය විභූතාලම්බණනම්වෙයි. තාරකාරූපයෝ අවිභූතාලම්බණනම්වෙත්. රහතුන් විසින් පිරිවරණලද්දාවූ තථාගතයන්වහන්සේ විපියෙහි පිඬුසිඟාවඩිනා කල්හි ඝනීඳ්‍රූපය විභූතාලම්බණනම්වෙයි, අවශෙෂ රහතුන්ගේ රූපයෝ අවිභූතාලම්බණනම්වෙයි, මේ ක්‍රමයෙන් සියලු විභූත අවිභූත ආලම්බණයන්ගේ ක්‍රමය සැලකියයුතුයි.

පදශතාවලී.

පන, පවවාරයෙන් අන්‍යවූ මනොවාරගණියම්:—මනොවාරෙ, අනන්තරාදී ප්‍රත්‍යයෙන් උපකාරලබන්නාවූ එකූන්විසිභවඞ්ගපවෙණිද සඞ්ඛ්‍යාතවූ මනොවාරයෙහි; විභූතං, ප්‍රකටව වැටහෙන්නාවූ; ආලම්බණං, අරමුණුතෙමේ; අපාථං, හඹුබවට; යදි ආගච්ඡති, ඉදින් පැමිණේද; එවංසති, මෙසේ ඇතිකල්හී, තතො, ඒ වැටහීම හෙතුකොටගෙණ; තොහොත් තතොපරං, ඒ වැටහීමෙන් මත්තෙහි; භවඞ්ගචලන මනොවාරාවජ්ජන ජවනාවසානෙ, භවාඞ්ගචලනය මනොවාරාවජ්ජනය, ජවන්ය යන මොවුන්ගේ කෙළවර; තදාලම්බණපාකානි තදාලම්බණවිපාක චිත්තයෝතුම්බු; පවත්තන්ති, හටගණිත්; තතොපරං, ඒ දෙවෙනි තදාලම්බණයාගේ නිරුඞ්ඛයෙන් මත්තෙහි; භවඞ්ගපාතොහොති, භවාඞ්ගපාතයවෙයි; පන, විභූතාලම්බණවිපියෙන් අන්‍යවූ අවිභූතාලම්බණවිපිය කියමි:—අවිභූතෙ ආලම්බණෙ, අප්‍රකට අරමුණෙහි; ජවනාවසානෙ, ජවන් කෙළවර; භවඞ්ගපාතොවහොති, භවාඞ්ගයෙහි හිඳීමවේ. තදාලම්බණුප්පාදෙ, තදාලම්බණෙතපත්තියෙන්; තත්ථ්ති, නැත්තේයයි; (වෙදිතබ්බං) දැනගුත්තේයි.

එත්ථ, මේ මනොවාරයෙහි; (උප්පන්නානි, හටගත්තාවූ) විවිධ චිත්තානි, විවිධචිත්තයෝ; (අච්ඡෙජ්ජෙන, සාධාරණ වශයෙන්;) තිණ්ණෙව, තුන්දෙනෙක්මවෙත්යයි ඊරිතං, (ඊරිතානි) කියන ලද්දාහුය; විසෙසතොං, විශෙෂ වශයෙන්; චිත්තුප්පාදෙ, (චිත්තුප්පාදවසෙන, චිත්තොත්පාදයන්ගේ වශයෙන් හෙවත් මෙන්

වෙන්වූ විඤ්ඤාණයන්ගේ වශයෙන්;) දසඉරියා, (ඉරියානි) දස දෙනෙකැයි කියනලද්දාහුය. පන, විඤ්ඤාණයන් දක්වමිඃ- නොහොත් වුඤ්ඤනකම්මයෙන් අන්‍යවූ අනුඤ්ඤාතුකම්මය දක්වමිඃ- නොහොත් අනුඤ්ඤාතීන්වෙන් අන්‍යවූ උඤ්ඤාතීන්ව දක්වමිඃ- පඨිතෝ එකවත්තාලීස විභාවයෙ යන තන්හි එකවත්තාලීස යනු අනුඤ්ඤාත කම්මයි. පඨිතෝ යනු වුඤ්ඤාත ඤාතීන්ගි මිස්සාරෙන යනුඅනුඤ්ඤාත ඤාතීන්ගි. විස්සාරෙන, විස්තර වශයෙන්; එකවත්තාලීස, එක්සාළිසෙ කැයි; විභාවයෙ, ප්‍රකට කොට දක්වයි. එහෙ, මේ විඤ්ඤාණඤ්ඤාතෙහි; අයං, මේ කියලන්නද්දේ ඒනාහි; පරිත්ත ජවනවාරෙ, කාමාවචර ජවනයන්ගේ වාරයයි.

භාවාර්ථ.

පණු පලඟැටි ආදී සතුන් හැසිරෙන්නාවූ ඖෂධයෙහි අස් දිසාවන්ට දැල්පසක් ඇද ඊමැදහුන් මකුළුතෙමේ වැදහෝනේය. මේ පස්දිසාවන් අතුරෙන් පළමුවන දිසාවෙහි අදිනාලද නූලෙහි පණුවෙක් හෝ මැස්සෙකු හෝ ගැටුනු කල්හි එහි හුන් මකුළුතෙමේ හුන්තැනින් මිදක් සෙලවී සූත්‍රානුසාරයෙන් ගොස් ඒ පණුවාගේ ශිසවිද ලේඋරා බොයි. නැවත අවුත් පළමුවැදහොත් දැලමැදම පහසු පරිදෙන් වැදහෝනේය. දෙවෙනි තුන්වෙනි සතරවෙනි පස්වෙනි දිසාවන්හිත් මෙසේම ඒ සූත්‍රයෙහි පණුවන් ආදී සතුන් හැටුනුකල්හි පීළුවූ පරිදෙන් හොස් ලේ උරා බොයි. මේ උපමාවෙහි පස්දිගව අදිනාලද නූල්මෙන් චක්ඛු සොත, ඝාණ, ජිවහා, කාය යන පඤ්චප්‍රසාදයෝ දතයුත්තානුයා මැදහොත් හුණ මකුළුවාමෙන් හෘදයවත්‍යුව නිසා පවත්තා භවාඞ්ගචිත්තය දතයුතුයි. පණුවන් ආදී සතුන් ඒ ඒ නූලෙහි හැපීමක් මෙන් චක්ඛුරාදී පඤ්චප්‍රසාදයෙහි රූපාදී පඤ්චාලම්බණයන්ගේ හැපීම දතයුතුයි. ඒ මැදහුන් හුණ මකුළුවාගේ සැලීමක් මෙන් ප්‍රසාදවත්ථු කියද, එහි අරමුණුගෙණ ක්‍රියා මනොධාතු සඞ්ඛ්‍යාතවූ පඤ්චද්වාරාවජ්ජන චිත්තය හා භවාඞ්ගයන්ගේ පෙරළීමද ඒ සූත්‍රානුසාරයෙන් හුණ මකුළුවාගේ ගමන මෙන් සම්පටිච්ඡනාදි විඤ්ඤාණයන්ගේ ඉපදීම්ද දතයුතුයි. ඒ පණුවන් ආදීන්ගේ ශිස්පලා ලේඋරාපීමන්මෙන් ආලම්බණරසානුභවන වශයෙන් ජවනයන්ගේ ඉපදීම දතයුතුයි. නැවත නූලදිගේ ආපසු අවුත් දැලමැද හෙවීමක් මෙන් හෘදය වත්‍යුව නිසාම භවාඞ්ගයාගේ ඛාත්පසින් පැවැත්ම ද දතයුතුයි. මේ උපමාව වනාහි චිත්ත චෛතසිකයන්ගේ පවත්නා ආකාරය පහළ කරයි. පළමු ශොට අරමුණෙන් ප්‍රසාද ඝට්ටනය වූකල්හි චක්ඛුරාදී ප්‍රසාදයන්හෙන් හා හෘදය වත්‍යුවෙන්ද චිත්තයන්ගේ ඉපදීම දතයුතුයි. ඒ චිත්තයන් අතුරෙනුදු හෘදයවත්‍යුව නිසා පවත්නාවූ සඞ්ඛාරාවජ්ජනචිත්තය පළමුකොටම උපදනේයි, එක එක අරමුණ විනාඩි වාර දෙනෙක

සියලු චක්ඛුරුදිදී චාරණෙහි අරමුණුබවට පැමිණෙන්නේය යනමේ අදහස මෙසේම පහළකරයි. ඒ හමුබවට පැමිණීම මෙසේයි. රූපාලම්බණය චක්ඛුප්‍රසාදයෙහි ඇටීම හා සමගම මනොචාර යෙහිත් ඇටීම වන්නේයි. ඊට උපමාකවරයත්? සූදැස්සිලොකය පමිත්තාකල්හී වෘක්ෂ ශාඛාවෙක්හී සැඟවෙන්නාවූ පක්ෂි තෙමේ ශාඛාභූයෙහි විහතවා සමගම ඒ පක්ෂියාගේ ඡායාව බිම පැතිර තිබෙන්නාවූ වෘක්ෂ ශාඛා ඡායාවෙහිත් ඉදිරිපසුතොව් එකවිට සපශීවිම තොඑහොත් ඇටීම වන්නේයි. ඒ ශාඛාවේ ඇටීම හා ඡායාහි පැතිරයාමත් ඉදිරිපසුතොව් එකවිට සිඛවෙයි. එසේම රූපයහා ද්‍රශ්‍යදඤවිඤ්ඤණත් හෘදයවස්තුව නිසා පවත්නා භවාඞ්ග චිත්තයාගේ සැළීමත් අතීතයෙන් හා ප්‍රත්‍යයෙකුත් සමානමැයි. එසේම මනොචාරයෙහි හමුවීමද ඉදිරිපසුතොව් එකක්ෂණයෙහි සිඛවන්නේයි. ඊටපසු භවාඞ්ගවෙගය සිඳී; චක්ඛුචාරයෙහි ක්‍රම යෙන් පවචාරාවජ්ජනචිත්තය උපන්කල්හී චක්ඛුර්විඤ්ඤාණචිත්තය හා සම්පටිච්ඡනචිත්තයද සන්තීරණචිත්තය හා ව්‍යවස්ථාපන චිත්තයද ක්‍රමයෙන් ඉපිද චතුත්වක්ක සම්පත්තීන්ගේ හේතුවෙන් සොභනසඞ්කාරය ලැබ කුසල් ජවින යන්ද ඉතුත්වක්ක සම්පත්තීන්ගේ විපත්තියෙන් අසොභනි සොමනසඞ්කාර හෙතුවෙන් අකුසල් ජවින්ද නිදුසය සන්තීරණ හෙතුවෙන් හෙවිත් රහතුන්ගේ සන්තානයෙහි ඉපදී මෙන් හිනැ ජවන්ද උපදනාහුවේකි. මෙසේ චක්ඛුමාරික චිත්ත වීථියට අනතුරුව එම අරමුණ අතීත කාලික වශයෙන් ගහණ මනොචාරයෙහි මනොචාරාවජ්ජනය, ජවන්සතය තදුලම්බණ දෙසිතය ඇත තුදුස් චිත්තයකින් යුක්තවූ මනොචාරික චිත්ත වීථියක් උපදනේයි. පවචාරිකචිත්තවීථි හෝ අවීසාඛක තොවින්නාවූ මනොචාරික වීථියෙහි හෝ උපදනා ජවනයන්ගේ ප්‍රවෘත්ති විපාක මානුයක්මුත් ප්‍රතිසන්ධි විපාක තොදියහැක්කේයි හෙවත් දන්දෙමියි සිතුපමණකින් හෝ සතෙක් මරමියි සිතු පමණකින් හෝ උපදනා ජවන පිළිබඳවූ කර්මයන්ට ප්‍රතිසන්ධි විපාක තොදියහැක්කේයි. ඒ සිතු නියාවෙන් දන්දෙන්නාවූ ප්‍රසාදයෙහි හෝ සත්ත්වඝාතනය කරන්නාවූ ප්‍රසාදයෙහි හෝ උපදනා අවීසාඛක ජවන වීථියෙහි පළමුවන ජවන චිත්ත සම්ප්‍රයුක්තවූ කර්මය ආසෙවන ප්‍රත්‍යයෙන් ශක්තිමත්තොවූ හෙයින් ප්‍රතිසන්ධිවිපාක තොදියහැකිබැවින් ඒ කර්මය සිඛකලාවූ පවත්නාඞ්ගයම අහෙතුකප්‍රවෘත්තිවිපාක මාත්‍රයක් දෙයි. ඒ කර්මය දිට්ඨධම්මවේදනීය කර්මනම්වේ. සත්වන ජවන් තෙමේ මුල ජවන් සයයින් ආසෙවන ප්‍රත්‍යය ලැබූ බැවින් අතිශයින් ශක්තිමත්වූ

මිට අනතුරු අත්බැවෙහි පටිසන්ධිවිපාක හා ප්‍රවෘත්ති විපාකත් දෙන්නේවෙයි. ඒ උපපද්‍ය වේදනීයයි. මෑද ජවන්පස සම්බන්ධවූ කම් පස නවත්නා කම්තම් වෙයි. හෙවත් කළ පමණකින් කම් සඞ්ඛ්‍යාවට පැමිණි බැවින් තුන්වෙනි අත්බැව පටන් සකලාපරිනිර්වාණය දක්වා කල්ප කොටි ලක්ෂ ගණන් ඇවෑමෙනුදු අව්‍යාහතවූ කල්හිම පටිසන්ධි ප්‍රවෘත්ති උභය විපාකයම දෙන්නාහු වෙති. මේ චක්ඛුවාරයට සියනින් ශ්‍රෝත්‍රවාර මනොවාර දෙක්හිද ඝාණවාර මනොවාර දෙක්හිද, ජිව්හාවාර මනොවාර දෙක්හිද, කායවාර මනොවාර දෙක්හිද, කම්විපි කම්පථ විපින්ගේ පැවැත්ම යථා ක්‍රමයෙන් දතයුත්තාහුය. අවීසංඛතනොවී කම් කම් විපි වශයෙන්ද, අවීසංඛත විතම් කම්පථවිපි වශයෙන්ද අවිදතයුතුයි. පවවාරයෙහි කියිකලෙනත් අවීසංඛත විපි නුපදනා බව මනොවාරයෙහි අවී සාඛත අසාඛත වශයෙන් දෙයාකාර විපිහුම පවත්නා බවද දතයුතුයි.

මේ පරිත්ත ජවනවාරයයි.

පදඝනාවර්ත.

පත, කාමාවචර ජවන වාරයෙන් අන්‍යවූ අප්පණා ජවන වාරය කියම්:- අපණා ජවනවාරෙ, අප්පණා ජවනයාගේ වාර යෙහි; විභූතා විභූතභෙදෙ, නත්ථි, ප්‍රකට අරමුණය, අප්‍රකට අරමුණය යන විශෙෂයක් නැත්තේයි. තථා, එපරිද්දෙන්; තදාලම්බණූපපාදෙව, තදාලම්බණයාගේ හවගැණීමෙක්ද; නත්ථි, නැත්තේයි. හි, ඒ අර්ථය විස්තර කෙරෙම්:- අපණා ජවන වාරෙ, අප්පණා ජවනයාගේ වාරයෙහි අඤ්ඤාණ සම්පයුත්තකාමාවචර ජවනානං, ඥානසම්ප්‍රයුක්තවූ කාමාවචර ජවනයන් අට දෙනා අතුරෙන්; අඤ්ඤතරස්මිං, එක්තරා ජවනයක්තෙමේ; පරිකම්මෝපචාර අනුලෝම ගොත්‍රභූනාමෙන, පරිකර්මය උපචාරය අනුලෝමය ගොත්‍රභූය යන නමින්; චතුක්ඛත්තුංවා, සතර වරක් හෝ; තික්ඛත්තුමෙවවා, තුන්වරක්ම හෝ; යථාක්කමං, පිළිවෙළින්; උපජ්ජිත්වා නිරුද්ධෙ, ඉපිද නිරුද්ධවූකල්හී; නිරුද්ධානන්තරමෙව, ඒ නිරුද්ධවීමට අනතුරුවම හෙවත් ඒ නිරුද්ධවූ චිත්තයාගේ අනන්තර ප්‍රත්‍යය ඇතිවම; යථාරහං, කිප්‍රාභිඥ දන්ධාභිඥ පුද්ගලයන් කෙරෙහි සුදුසු පරිදිදෙන්; චතුත්ථංවා, සතරවැනිව හෝ; පංචමංවා, පස් වැනිව හෝ; ඡබ්බිසති මහග්ගත ලොකුත්තර ජවෙසු, සත්තිසමහද්ගත ලොකොත්තර ජවනයන් අතුරෙන්; යථාභිනීහාරවසෙන, ප්‍රාර්ථනාකළ පරිදි දෙන් රූපාරූප ලොකොත්තර මාර්ගඵලයන්ට සුදුසුවූ සමථ විදර්ශනා භාවනාවන්ගේ වශයෙන්; යංකිඤ්චිජවනං, යම් කිසි

ජවනයන් තෙමේ; අපණ්ණකීං, අවිරද්ධවිපාකයට; ඔතරති, බැස්සේයි. තතොපරං, ඒ අවිරද්ධවිපාකයට බැසීමෙන් මත්තෙහි; අපණ්ණවසෙන, අපුනර්භවයන් කෙළවර, භවඞ්ගපාතොවහොති; භවාඞ්ගයෙහි නිමිවෙයි. තත්ථ, ඒ අපුනර්භවයන් විරයෙහි තුන් ඟොත් ඥානසම්ප්‍රයුක්ත කාමාවචර ජවනුන් අටදෙනා අතුරෙන්, සොමනස්ස සහගත ජවනානන්තරං, සොමනස්ස සහගතය ඥාන සම්ප්‍රයුක්ත සතරකාමාවචර ජවනුන්ට අනන්තරව; අපණ්ණපි, අවිරද්ධවද; සොමනස්ස සහගතාව, සොමනස්ස සහගතය අවිරද්ධ වෙක්ම; පාටිකඞ්ඛිතබ්බා, පැතැස්සයුත්තීය. උපෙක්ඛා සහගත ජවනානන්තරං, උපෙක්ඛා සහගත ඥානසම්ප්‍රයුක්ත සතරකාමාවචර ජවනුන්ට අනන්තරව; අපණ්ණපි, අවිරද්ධවද; උපෙක්ඛා සහගතාව, උපෙක්ඛා සහගතය අවිරද්ධ වෙක්ම; පාටිකඞ්ඛිතබ්බා, පැතැස්සයුත්තීය. තථාපි, යනු "තස්මිං එකච්චෙදනා ජවනවීථියෙ අපි" යනාදීයි. ඒ සඳහා වේදනා ඇත්තාවූ ජවනයාගේ වීථියෙහිද; කුසල ජවනානන්තරං, ඥානසම්ප්‍රයුක්ත මහා කුශලයන් සතරදෙනාට අනන්තරව; කුසල ජවනවෙව, මහද්ගතවූ හෝ ලෞකොත්තරවූ කුශල ජවනයෙක්ද; හෙතීමං, යටහගයෙහිවූ; ඵලතනයව, ඵලජවනයන් තුන්දෙනාගේ සමූදයෙක්ද; අපෙති, "අපණ්ණවසෙන උපපජ්ජති," යනාදීයි. අවිරද්ධවශයෙන් උපදී. ක්‍රියා ජවනානන්තරං, ඥානසම්ප්‍රයුක්ත මහා ක්‍රියා ජවනයන් සතරදෙනාට අනන්තරව; ක්‍රියාජවනව, මහද්ගත ක්‍රියා ජවනයෙක් හෝ අරහත්ත ඵලව, අග්‍රඵල ජවනයෙක් හෝ; අපෙති, අවිරද්ධ වශයෙන් උපදී. ඉති (වෙදිතබ්බා) මේසේ දතයුත්තේයි.

සුඛපුඤ්ඤඋපෙක්ඛාසහරතං, සොමනස්ස සහගත ඥාන සම්ප්‍රයුක්ත කාමාවචර කුශල ජවනයන් දෙදෙනාගෙන් මත්තෙහි; චත්තාරෝ අපණ්ණ, දෙනිස් අවිරද්ධ ජවනකෙනෙක් තුන්; සම්භවන්ති, පහළවෙත්. උපෙක්ඛා කාමපරං, උපෙක්ඛා සහගත ඥාන සම්ප්‍රයුක්ත මහා කුශලයන් දෙදෙනාගෙන් මත්තෙහි; වාදස අපණ්ණ, දෙළොස් අවිරද්ධජවන් කෙනෙක්තුන්; සම්භවන්ති, ඔටගණිත්. සුඛිතක්‍රියතොපරං, සොමනස්ස සහගත ඥාන සම්ප්‍රයුක්ත මහා ක්‍රියා ජවනයන් දෙදෙනාගෙන් මත්තෙහි; අට්ඨ අපණ්ණ, අවිරද්ධ ජවනයෝ අටදෙනෙක්තුන්; සම්භවන්ති, ඔටගණිත්. උපෙක්ඛා කාමපරං, උපෙක්ඛා සහගත ඥාන සම්ප්‍රයුක්ත මහා ක්‍රියා දෙදෙනාගෙන් මත්තෙහි; ඡ අපණ්ණ, අවිරද්ධ ජවනයෝ සදෙනෙක් තුන්; සම්භවන්ති, ඔටගණිත්. පුථුජ්ජනානංච, ත්‍රිහෙතුක

පරිකර්මය පුථුජ්ජන පුථුලභාවය, පෙරකොටස්වල අභ්‍යාසපුථුලභාවය නිසා තුන්දෙනාගේවද, කාමපුථුජ්ජනභාවහේතුවෙනුදු පරං, ත්‍රිභූමක කාමාවචර කුශලයන් සතරදෙනාගෙන් ඔත්තෙහි; එතු වත්තාරීසඅපපණ්ණා, සුභාසීස් අපිණ්ඩපාතිකයන් කෙනෙක්තුමූ; සබ්බේ එකතී, හටගණිත්. වීතරාගානං, රාගය තුන් ගේ; තිහෙතුකාමෝ ත්‍රිහේතුකයෙනුදු, ත්‍රිහෙතුක කාමාවචරක්‍රියා සතරින් මත්තෙහි; චුද්දස අපපණ්ණා, තුදුස් අපිණ්ඩපාතිකයන්කෙනෙක්තුමූ; සම්භවන්ති, හට ගණිත්. එත්ථ, මේ විපිසංග්‍රහයෙහි; අයං, මේ කියනලද්දේ වක්‍යාර්ථයි; මනොවාරෙ, මනොවාරයෙහි; විපි චිත්තපවත්තිනයෝ, විපි චිත්තනයන්ගේ හටගන්නා ක්‍රමයයි.

හා වා ජී.

අපිණ්ඩපාතිකාංගයෙහි විභූත අවිභූත භේදයකුමක් නොයෙන් නැත්තේද යත්? අපිණ්ඩපාතිකාංග වක්‍යාර්ථයෙන් ප්‍රකට වූ අරමුණෙහි ඉපදිය යුතුහෙයින් අප්‍රකට අරමුණ කියිසේත් අපිණ්ඩපාතිකාංගයෙහිම නොයෙදෙයි. "අපිණ්ඩපාතිකාංග" යනු "ආරම්මණං අපෙපති පාපෙතීති අපපණ්ණා" යනු නිරුක්ති බැවින් සසම්ප්‍රයුක්තවූ චිත්තචෛතසිකරූපාරූපාවචර ධර්මයන් අපිණ්ඩපාතිකාංගයයි ව්‍යවහාරකෙරෙත්. අපිණ්ඩපාතිකාංග යනු චේතනාගේ පර්‍යායය විශේෂයයි. සියලු උත්තරී මනුෂ්‍ය ධර්මයන්ගේ පුබ්බභාගයෙහි පළමුකොට ප්‍රථමධ්‍යානය ඉපදවිය සුදුවෙයි, ඒ ප්‍රථම ධ්‍යානය පවත්වන්නාවූ පුද්ගලයාගේම උපකාරයෙන් අවසාන පත්තියුම ඉපදවිය යුත්තාහුවෙත්. එපරිද්දෙන්ම ප්‍රථම ධ්‍යානය පවත් වූ ධ්‍යානලාභී දක්ඛිණ රූපාවචර සියලු ධ්‍යානයන් උපදවා පවත්වන්නාවූ පුද්ගලයාටයෙන් නැවත වතුර්ථ ධ්‍යානයෙන්ම පවාතිඤ්ඤාවෝද ඉපදවිය යුත්තාහුය. ඒ ප්‍රථම ධ්‍යානාදී ධ්‍යානයට සමවැද එයින් නැගිට ධ්‍යාන පාදකකොට හෝ සම්මර්ශනයකොට හෝ පුද්ගල ධ්‍යාශයවශයෙන් හෝ ත්‍රෛභූමක සංස්කාර ධර්මයන් සම්මර්ශනයකොට නෝවාන් ආදී මාර්ග ඵල තෙමේ ඉපදවියහුවේ. නැවත ඒ ප්‍රථම ධ්‍යානය පවත් අවසාන පත්තියුම්ව ක්‍රමයෙන් සමවැද නෛවසංඥානාසංඥා ධ්‍යානය ඇතුළු ධ්‍යානයට දෙවරක් සමවැද චිත්ත ප්‍රවෘත්තිය නිරුද්ධකිරීමෙන් සඤ්ඤා වෙදයිත නිරෝධ සමාපත්තියට සමවදී. මෙසේ ප්‍රථම ධ්‍යානය ආදිකොට නිරෝධ සමාපත්තිය අවසන්කොට ඇත්තාවූ සියලු උත්තරී මනුෂ්‍ය ධර්මයන්ට චිතකී සංඛ්‍යාතවූ අපිණ්ඩපාතිකාංගය ප්‍රධාන ධර්මයවෙයි. එහෙයින් සියලු උත්තරී මනුෂ්‍ය ධර්මයන්ට ප්‍රධානත්‍යාංගවශයෙන් අපිණ්ඩපාතිකාංගයයි ව්‍යවහාරකෙරෙත්.

ඒ අපිණා ජවන තෙමේ ඤාණසම්ප්‍රයුක්ත ච්ප්‍රයුක්ත දෙදෙනා අතුරෙන් ඤාන සම්ප්‍රයුක්ත ජවනයක්ම වියප්‍රතුයි අසඛ්ඛාරික සසඛ්ඛාරික දෙදෙනා අතුරෙන් අභිශෙෂවශයෙන් අසඛ්ඛාරික කත්වෙයි. සසඛ්ඛාරිකත්වෙයි. ඤාන සම්ප්‍රයුකත කාමාවචර ජවන් අටදෙනාගේ නුවූ ඤානසම්ප්‍රයුකත මහාකුසල් සතරගේ, ඤානසම්ප්‍රයුක්ත මහාක්‍රියා සතරගේ යන අටදෙනා අතුරෙන් යම්කිසි ජවනයක් අපිණා විථියෙහි උපදනේයි. ඔවුන් අතුරෙ නුදූ ත්‍රිහෙතුක පෘථග්ජනයන්ගේ සෝවාන් සකෘදාගාමි අනා ගාමි යන ශෛක්ෂ්‍යයන්ටද අපිණාවනකල්හි ත්‍රිහෙතුක කුශල යන් සතරදෙනා අතුරෙන් එකක් හෝ රහතුන්ට අපිණා උපදනාකල්හි ත්‍රිහෙතුක ක්‍රියා ජවන් සතරදෙනා අතුරෙන් එකක් හෝ සුදුසු පරිද්දෙන් උපදනේයි. පරිකර්ම උපචාර අනුලෝම ගොත්‍රභූ යන සතර නාමයෙන් ව්‍යවහාරකරන්නේ නම්දු සභාවයෙන් කාමාවචර කුශල් හෝ ක්‍රියා හෝ වෙත්. පළමුවන සිත පරිකර්මයයි කුමක්හෙයින් ව්‍යවහාරකරන්නේද යත්? ධ්‍යාන මාගඵල සඛ්‍යාතවූ අපිණාව සාක්ෂාත්කරණ හෙයින් පළමුවන සිත පරිකර්මයයි ව්‍යවහාරකරත්. උපචාරය යනු අපිණාවට සමීපයෙහි හැසිරෙන හෙයින් උපචාරයයි ව්‍යවහාර කෙරෙත්. අපිණාව සමීපවූ චිත්තය ගොත්‍රභූචිත්තය නොවේද, ඒ සිතට උපචාරයයි ව්‍යවහාර නොකොට අනුලෝම ගොත්‍රභූ යන දෙසිතකට පුළුයෙහිවූ චිත්තයට උපචාරයයි කුමක්හෙයින් ව්‍යවහාර කරන්නේදයත්? ඉතා නුදුරුවූද ඉතා නොලංවූද චිත්තයන් උපචාරයයි ව්‍යවහාර කවයුතු හෙයින් උපචාර චිත්ත යයි, මෙහි ව්‍යවහාර කරත්. අනුලෝම චිත්තය යනු අනුරූපවූ හෙවත් යොග්‍යවූ චිත්තය යන අර්ථයි. කෙසේ අනුරූපවන් නේදයත්? ඉදින් අනුලෝම චිත්තය සෞමනස් සහගතචිතම් පෙර පසුව උපදනා පරිකර්ම අපිණාවෝද සෞමනස් සහගතම වෙති. ඉදින් අනුලෝම චිත්තය උපෙක්ෂා සහගතචිතම් පෙර පසු උපදනා පරිකර්ම අපිණා චිත්තයෝද උපෙක්ෂා සහගතම වෙති. මෙසේනිම සුදුසුවූ අනුරූපභාවය නම් වෙයි. "ගොත්‍රභූ චිත්තය" යනු ගොත්‍රය මැඩපවත්වන හෙයින් නොහොත් දිවුණු කරණ හෙයින් ගොත්‍රභූ නම් වෙයි. ධ්‍යානයට පුළුභාගයෙහි උපදනා ගොත්‍රභූ චිත්තය කාමාවචර ගොත්‍රය මැඩපවත්වන හෙයින්ද මහගතත ගොත්‍රය දිවුණුකරණ හෙයින්ද ගොත්‍රභූ නම් වෙයි. මාගඵයට පුළුභාගයෙහි උපදනා ගොත්‍රභූචිත්තය පෘථග්ජන ගොත්‍රය මැඩපවත්වන හෙයින්ද අශෛක්ෂ ගොත්‍රය දිවුණුකරණ හෙයින්ද සෝවාන් මාගඵයට පෙර වූව උපදනා චිත්තය ගොත්‍රභූයයි ව්‍යවහාර කෙරෙත්. ඒ සොතාපත්තිමාගඵ සාධණයෙහි දීඝගත සම්ප්‍රයුකතාදීවූ සතර

අපායෙහි උපදවන්නාවූ අකුශල චිත්තයන් නිරවශෙෂප්‍රහාණ යෙන් නසා පවිත්‍රවූ හෙයින් ශකෘදාගාමි අනාගාමි අර්හත් යන මාගීත්‍රයට පුර්‍වභාගයෙහි උපදින චිත්තයන් තුන්දෙන වොදුන චිත්තයන්යැයි ව්‍යවහාර කෙරෙත්. සතරමාගී ඊර්‍ධියෙහි උපදනා අනුලොම චිත්ත සම්ප්‍රයුක්තවූ ප්‍රඥා චෛතසිකය අනුලොම ඥානය සවොතුලොමික ඥානය මග්ගඤ ප්‍රඥා විදර්‍ශනා ඥානය වුත්ථාන ගාමිනී විදර්‍ශනා ඥානය සඞ්ඛාරොපෙක්‍ෂා ඥානය යනාදී නොයෙක් නමින් ව්‍යවහාර කෙරෙත්. ධ්‍යාන ඊර්‍ධියෙහි උපදනා එම අනුලොම චිත්ත සහගතප්‍රඥා චෛතසිකය දක්‍ඛාභිඤ්ඤය ඛිප්පාභිඤ්ඤය යනාදී නමින් ව්‍යවහාර කෙරෙත්. මේධ්‍යාන මාගී ඊර්‍ධියෙහි උපදනා අනුලොම ගොත්‍රභූ චිත්තයන්ගේ විශෙෂයි.

—(ㄑ)—

පදභාජනීය.

පන, ජවනවාරයෙන් අන්‍යවූ තදාලම්බණ වාරය දක්වමි:- එසේ, මේ පවෘත්ති මනොවාරයෙහි; සබ්බථාපි, අති මහන්තාදි සියලු විෂය ප්‍රවෘත්තියි ආකාරයෙන්ද නොහොත්; එසේ, මේ ඊර්‍ධි සංග්‍රහයෙහි; සබ්බථාපි, සියලු පවෘත්ති මනොවාර යෙහිද; අනිදෙ ආලම්බණෙ, නොකැමතිවන්නාලද අමෙධ්‍යස්‍රතඛ කුණ පාදී අරමුණෙහි; අකුසල විපාකානෙව; අකුශල විපාකාවුම; පවවිඤ්ඤාණ සම්පටිච්ඡන සන්තීරණ තදාලම්බණානි, පවවිඤ්ඤාණ සම්පටිච්ඡනඤ සන්තීරණඤ තදාලම්බණඤ යන මොහු; භවන්ති, වෙත්. ඉදෙ, කැමතිවන්නාලද්දාවූ; ආලම්බණෙ, ආහාර පාන සයනාසන වස්ත්‍රාභරණාදිවූ අරමුණෙහි; කුසල විපාකානි, කුශල විපාකාවූ; පවවිඤ්ඤාණ සම්පටිච්ඡන සන්තීරණ තදාලම්බ ණානි, පවවිඤ්ඤාණඤ සම්පටිච්ඡනඤ සන්තීරණඤ තදාලම්බණඤ යන මොහු; භවන්ති, වෙත්. පන, අඤ්ඤතර පක්‍ෂයක් දක්වමි- අති ඉදෙ, අතිශයින් කැමතිවන්නාලද්දාවූ; ආලම්බණෙ, බුඛප්‍රතිමා චෛත්‍ය භික්‍ෂු ආදී අරමුණෙහි; සොමනස්ස සහගතානෙව, සොමනස්ස සහගතාවුම; සන්තීරණ තදාලම්බණානි, සන්තීරණ තදාලම්බණඤ තුමූ; භවන්ති, වෙත්. තත්‍රාපි, ඒ එකොළොස් තදාලම්බණයන් අතුරෙ බුදු සොමනස්ස සහගත ක්‍රියා ජවනා වසානෙ, සොමනස් සහගතවූ ක්‍රියා ජවනුන්ගේ කෙළවර; සොමනස්ස සහගතානෙව, සොමනස් සහගතාවුම; තදාලම්බණානි භවන්ති, තදාලම්බණඤ වෙත්. උපෙක්‍ඛා සහගත ක්‍රියාජවනාව සානෙව, උපෙක්‍ෂා සහගත ක්‍රියා ජවනුන්ගේ කෙළවරද; උපෙ ක්‍ඛා සහගතානි භවන්ති, උපෙක්‍ෂා සහගතවූ තදාලම්බණඤ වෙත්. පන, ජවනයෙන් තදාලම්බණයම නියමකිරීමෙන්

අන්‍යවූ ජවනයෙන් තදුලම්බණ භවාඞ්ගයදෙක නියමකරන්නාවූ පක්ෂය දක්වම්:-දෙමනස්ස සහගත ජවනාවසානයෙව, දෙමනස් සහගිය ජවනුන්ගේ කෙළවරද; උපෙක්ඛා සහගතයෙව, උපෙක්ඛා සහගියාවූම; තදුලම්බණානිවෙව, තදුලම්බණයෝද; භවඞ්ගානිව, භවාඞ්ගයෝද, යසමා භවන්ති, යම්හෙයකින් වෙත්ද, තසමා, එසේහෙයින්; සොමනස්ස පටිසන්ධිකස්ස, සොම්නස් සහගිය විපාක සිතින් පිළිසිඳගත් පුද්ගලයාගට; දෙමනස්ස ජවනාවසානෙ, දෙමනස් සහගිය ජවනුන්ගේ කෙළවර; තදුලම්බණ සමහවෙ, තදුලම්බණයන්ගේ හටගැනීමෙක්; යදි නත්ථි, ඉදීන් නැත්තේවේද; එවංසති, මෙසේ ඇතිකල්හි, තදා, එකල්හි; පරිත්ත පුබ්බං, පුරුදුකරණලද වීරූ; යංකිඤ්චි පරිත්තාලම්බණං, යම්කිසි කාමාවචර අරමුණක්; ආරබ්භ, අරබයා; උපෙක්ඛා සහගත සන්තීරණං, උපෙක්ඛා සහගිය සන්තීරණසිත් තෙමේ; උපජ්ජති; උපදනේයි. තං, ඒ උපෙක්ඛා සහගත ආගන්තුක භවාඞ්ග චිත්තය; අනන්තරිත්වා, අනතුර කොට, භවඞ්ගපාතොවහොති, සොමනස් භවාඞ්ගපාතයවෙයි. ඉති, මෙසේ; ආචරියා, අභයගිරිවාසී ආචාර්‍යවරයෝ තුමූ; වදන්ති, කියත්. තථා, එපරිද්දෙන්; කාමාවචර ජවනාවසානෙ, කාමාවචර ජවනුන්ගේ කෙළවර; කාමාවචර සත්තානං, කාමාවචර සත්ත්වයන්ට; ආලම්බණභූතෙසු, අරමුණුවූ; කාමාවචර ධම්මෙසුවෙව, කාමාවචර ධර්මයෙහිම; තදුලම්බණං ඉච්ඡන්ති, තදුලම්බණය පසසිත්. ඉති වෙදිතබ්බං, මෙසේ දතයුත්තේයි.

කාමෙ, එකොළොස් කාමභූමියෙහි; (පවත්තානං) හට ගත්තාවූ; ජවන සත්තාලම්බණානං, ජවනය සත්‍යය ආලම්බණය යනමොවුන්ගේ; තීහි අඛෙහි, තුන් අඞ්ගයන් කරණකොට ගෙණ; නියමෙ සති, නියමය ඇතිකල්හි; විභූතෙව, ප්‍රභූකාලම්බණයෙහිද; අතිමහතෙතව, අතිමහත්තාලම්බණයෙහිද; තදුලම්බණං, තදුරම්මණය, ථිරිතං, කිඤ්චනලද්දේයි. එත්ථ, මේ විෂි සඞ්ග්‍රහයෙහි; අථං, මේ කියන්නලද්දේවනාහි; තදුලම්බණනියමො, තදුලම්බණයන්ගේ නියම ක්‍රමයයි.

භාවාර්ථ.

තදුලම්බණ නියමයෙහි දක්වනලද්දුවූ ඉෂ්ටාලම්බණ අනිෂ්ටාලම්බණ විශෙෂය යට ප්‍රථම පරිච්ඡේදයෙහි අහෙතුකාධිකාරයෙන්ද දතයුතුයි. අනිෂ්ටවූ ගෙවත් නොකැමතිවූ අරමුණක් වූයේනම් චක්ඛුරාදී ද්වාරයෙහි උපදනා චකඛු විඤ්ඤාණ සම්පටිච්ඡන සන්තීරණ චිත්තයෝ තුමූ අකුශල විපාකම වෙති.

හෙවත් සංසාරයෙහි රැස්කරණලද්දවූ අකුසල කර්මයන්ගේ විපාකවශයෙන් ඒ චිත්තයෝ පහළවෙති. ඉදින් චක්ඛුරාදී පඤ්චද්වාරයෙහි ගැටෙන්නාවූ රූපාදී අරමුණු ඉෂ්ටාලම්බණවූවාහු නම් චක්ඛුරාදී පඤ්චවිඤ්ඤාණ හා සම්පටිච්ඡන සන්තීරණ චිත්තයෝද කුසල විපාකමවෙති. හෙවත් සංසාරයෙහි රැස්කරණලද්දවූ සුගතිවර කුසල කර්මයන්ගේ විපාකමවෙති. ඒ චිත්ත වීථි අවසානයෙහි උපදනා තදාලම්බණ චිත්තයෝද අනිෂ්ටාලම්බණ වීථියක්විනම් අකුසල විපාකවූ උපෙක්ඛාසන්තීරණ චිත්තය තදාලම්බණවශයෙන් උපදී. ඉදින් ඒ අරමුණ ඉෂ්ට මධ්‍යස්ථාලම්බණයක්වීනම් ඒ චිත්ත වීථි අවසානයෙහි උපදනා තදාලම්බණ චිත්තයෝ කුසල විපාක උපෙක්ඛාසන්තීරණ චිත්තය හෝ උපෙක්ඛා සහගත මහා විපාක සතර හෝ යන මේ විපාක පසින් යම් විපාකයෙක් තදාලම්බණවශයෙන් උපදී. ඉදින් බුඩාදී අති ඉෂ්ටාලම්බණයක් ගැටුනේවිනම් චිත්ත වීථියෙහි මූල උපදනා සන්තීරණ චිත්තයද සොමනස් සහගත සන්තීරණයමවෙයි. ඒ වීථි අවසානයෙහි තදාලම්බණවියයුතු නම් එම සොමනස් සහගත සන්තීරණ චිත්තය හෝ සොමනස් සහගත මහාවිපාක සතර හෝ යන මේ පසින් එක්තරා චිත්තයක් තදාලම්බණවශයෙන් උපදී. එතකුදුවුවත් ලෝභ මූලික ජවන් අවස්ථා, මෝහ මූලික ජවන් දෙදෙනාය මහාකුසල් ජවන් අටය යන අටළොස් ජවනයන් අතුරෙන් යම්කිසි ජවනයක් ජවන්වශයෙන් දිවූකල්හී අසවල් විපාක චිත්තයම තදාලම්බණ වශයෙන් උපදනේය යන නියමයක් නැත්තේයි. කුමක්හෙයින ද? ඒ ජවනයෝ තුමූ පෘථග්ජන සෛක්ෂ්‍ය සන්තානයෙහිම උපදනාහෙයිනැයි දතයුතුයි. පෘථග්ජනවූ තීක්ෂ්ණකෂායන්ට බුඩාදී අති ඉෂ්ටාලම්බණයෙහි පවා සොමනස් සහගත ජවන් උපදී. සුගඛාදීන්ට වනාහි ගෙරිකුණු අශුචි ආදිවූ අනිෂ්ටාලම්බණයෙහි පවා සොමනස් සහගත ජවන් උපදී. කුමක්හෙයින ද? සඤ්ඤාවිපල්ලාස චිත්ත විපල්ලාස දිට්ඨිවිපල්ලාස යන්නාදී විපල්ලාසයන් ඇතිහෙයින් පෘථග්ජනයන්වද සංඥාදී විපර්‍යාසනැතිහෙයින් ශෛක්ෂ්‍ය පුද්ගලයන්ටද ජවනයෙන්ම තදාලම්බණ නියමය නොකවහැක්කේයි. එහෙයින් සොමනස්සහගත හසිතෝත්පාද චිත්තය හෝ සොමනස්සහගත මහාක්‍රියා ජවන් හෝ දිවූ කල්හී සොමනස් සහගත තදාලම්බණයක්ම එකාන්තයෙන් උපදනේයයි නියම කළහැක්කේයි. එසේම උපෙක්ඛාසහගත ක්‍රියා ජවනයන් දිවූ කල්හී උපෙක්ඛාසහගත තදාලම්බණ සඳහා අතුරෙන් එක්තරා තදාලම්බණයක්ම නියම වශයෙන් උපදනේයි. ඤාතසම්ප්‍රයුක්ත

මහාක්‍රියා ජවනයන්ට අනතුරුවැ ඥානසම්ප්‍රයුක්ත මහා විපාක යක්ම තදාලම්බණ වශයෙන් උපදී. ඥානවිප්‍රයුක්ත මහාක්‍රියා ජවනයන්ට අනතුරුව ඥානවිප්‍රයුක්තවූ තදාලම්බණයක්ම උපදී. එසේම සසඞ්ඛාරික අසඞ්ඛාරික ක්‍රියා ජවනයන්ට අනතුරුව සසඞ්ඛාරික අසඞ්ඛාරික තදාලම්බණයෝම උපදනාහුය. මේ හසිතුප්පාද මහාක්‍රියාවන්ට අනතුරුවම ඒ ජවනයන්ට සුදුසුවූ තදාලම්බණයන්ම ඉපදීම කුමක්හෙයින් වන්නේදයත්? හසිතුප්පාද මහාක්‍රියා ජවනයෝ වනාහි බුදුන් රහතුන්ටම උපදනා හෙයිනි. ඒ බුදුන් රහතුන්ට වනාහි සංඥා විපල්ලාසාදී පවවිප ල්ලාසයන් නැතිහෙයින් කිසිකලෙකත් ඉෂ්ටාලම්බණය අනිෂ්ට වශයෙන් හෝ අනිෂ්ටාලම්බණය ඉෂ්ටයකියා හෝ ඉෂ්ටාලම්බණ අනිෂ්ටාලම්බණ දෙක්හිම සංඥාවිපල්ලාසාදිය නොවනහෙයින් කිසිකලෙකත් ජවනයට විරුඬවූ තදාලම්බණොත්පත්තියක් බුදුන් රහතුන්ට නැත්තේයයි දතයුතුයි. උපෙක්ඛාසහගත ප්‍රතිසන්ධි චිත්තයෙන් පිළිසිඳගත්තාවූ පුද්ගලයෙක්හට ඉෂ්ටමඬ්‍යස්ථවූ අරමුණක් ඵල්බහෙණ වෙඡමූලික ජවනයෙක්විනම් තදාලම්බණ යන්ගේ හවඟැණීමට සුදුසුවූ ආයුෂ ඇත්තේවිනම් උපෙක්ඛා සහගත තදාලම්බණයක්වෙයි. තදාලම්බණයන්ගේ හවඟැණීමට ආයුෂ නොපොහොනේවිනම්. උපෙක්ඛාසහගත භවාඞ්ගමවෙයි. මෙසේ ඇතිකල්හී අරමුණහා පවිසන්ධිචිත්තයද ජවනයද ඔවු නොවුන්ට ඉඟලපෙන්නේයි. ඒ උපෙක්ඛාසහගත පවිසන්ධි ඇත් තාවූ පුද්ගලයෙක්හටම අති ඉෂ්ටාලම්බණයක් හමුවී වෙඡමූලික ජවන්වූවාහුනම් තදාලම්බණවීමට අවකාශ ඇත්තේනමුදු තදා ලම්බණනොවී කාමාවචර උපෙක්ඛාසහගත භවාඞ්ගයක්මවෙයි. ඉදින් තදාලම්බණය විඳයුතුකල්හී අරමුණටඅනුව සොම්නස් සහගත තදාලම්බණයක්ම විඳයුත්තේයි. එසේවනකල්හිද ජව නයන් හා නොඉවැලපෙන හෙයින් තදාලම්බණ නොවී භවාඞ්ගම වන්නේයි. වෙදනාවන්ගේ විරුඬයක් ඇතිකල්හී අනන්තර ප්‍රත්‍යය නොවියයුත්තේයි. සොම්නස් පවිසන්ධික පුද්ගලයාහට ඉෂ්ටමඬ්‍යස්ථාලම්බණයක් අරමුණුකොටගෙණවෙඡ මූලික ජවන් දිවූ කල්හි තදාලම්බණ නොවියයුත්තේයි. ඉදින් තදාලම්බණ වන්නේනම් උපෙක්ඛාසහගත තදාලම්බණයක්ම විඳයුත්තේයි. එසේ නොවනහෙයින් සොම්නස්සහගත ජවනයාට අනතුරුවි උපෙක්ඛාසහගත භවාඞ්ගයක්මවෙයි. ඒ සොම්නස්සහගත පවි සන්ධිගත් පුද්ගලයාහට අති ඉෂ්ටාලම්බණයක් අරමුණුකොට ගෙණ වෙඡමූලික ජවන් දිවූ කල්හි තදාලම්බණවිඳයුතු විපියක් විනම් අරමුණට අනුරූප පරිද්දෙන් සොම්නස්සහගත තදාලම්

බණයක් වියයුත්තේයි. එසේ ඇති කල්හී ජවනයන් හා නොගැලපෙන හෙයින් ඒ ජවනයන්ට සුදුසු පරිදෙන් උපෙක්ෂා තදුලම්බණයක් වියයුත්තේයි. එසේ ඇතිකල්හී ඉෂ්ටාලම්බණය හා නොගැලපෙන හෙයින් උපෙක්ෂා සන්තීරණ චිත්තය උපද නේයි. උපෙක්ෂා සන්තීරණචිත්තය වනාහි පඤ්චද්වාරයෙහි හා පඤ්චද්වාරයක් ඇති හෙයින් මේ දෙසමූලික ජවන් කෙළවර උපන්නාවූ සන්තීරණය පටිසන්ධිකෘත්‍යය සිඹකරන්නේවේදැයි යමෙක් ප්‍රශ්නකෙළේවිනම් එසේ නොවේයයි පිළිවදන් දියයුත්තේයි. කුමක්හෙයින්ද යත්? වර්තමාන භවය හා අනාගත භවයද ගලපන්නාවූ තන්හිම පටිසන්ධිකෘත්‍යය සිඹකෙරෙයි. මේ වෙන මූලික ජවනයන්ට හා භවාඞ්ගයන්ටද අතරතුර භවයන්ගේ ගැලපීමක් නැති හෙයින් මේ සන්තීරණ චිත්තය ප්‍රතිසන්ධි කෘත්‍යය සිඹකරන්නේ නොවෙයි පිළිවදන් දියයුතුයි. ඉදින් ප්‍රතිසන්ධි කෘත්‍යය සිඹනොකරන්නේවී නම් චුති කෘත්‍යය සිඹ කරන්නේදැයි නැවතත් ඒ වොදක තෙමේ විමසයි. චුති කෘත්‍යයද සිඹකරන්නාවූ සථානයෙක්ද නොවෙයි. කුමක්හෙයින ගත්? ප්‍රත්‍යාසන්නභවයෙන් ගිලිහෙන්නාවූ අවසාන චිත්තය චුති කෘත්‍යය නම්වෙයි.

මේ වෙන මූලික ජවනයන්ගේ හා භවාඞ්ගයන්ගේද අතර කවර චුති කෘත්‍යයෙක් දැයි පිළිවදන්දිය යුත්තේයි. නැවතත් ඒ වොදක තෙමේ ඉදින් චුති කෘත්‍යය නොවේනම් සන්තීරණ කෘත්‍යය දැයි ප්‍රශ්න කටයුතු වෙයි. සන්තීරණ කෘත්‍යයද නොවන්නේයයි පිළිතුරු දියයුතුයි. කුමක් හෙයිනයත්? සන්තීරණ කෘත්‍යය වනාහි පඤ්චද්වාරයෙහි සම්පටිච්ඡන කෘත්‍යය ව්‍යවස්ථාපන කෘත්‍යය දෙදෙනාගේ අතරතුරෙහි අරමුණු තීරණය කිරීම සන්තීරණ කෘත්‍යය නම් වෙයි. මේ වෙන මූලික ජවනයන්ට හා භවාඞ්ගයන්ට ද අතරතුර කවර සන්තීරණ කෘත්‍යයෙක් දැයි පිළිතුරු දියයුතුයි. නැවතත් ඒ වොදක තෙමේ ඉදින් සන්තීරණ කෘත්‍යය සිද්ධ නොකරන්නේවී නම් තදුලම්බණ කෘත්‍යය සිද්ධ කරන්නේදැයි ප්‍රශ්න කටයුතු වෙයි. එසේ කල්හී තදුලම්බණ කෘත්‍යයද නොවන්නේය යි පිළිවදන් දියයුතුයි. කුමක් හෙයිනයත්? තදුලම්බණය යනු ජවනයට අනුව ජවන යාගේ අරමුණම ගෙණ උපදනා විපාක චිත්තය තදුලම්බණය යි ව්‍යවහාර කෙරෙති. මෙතන්හි ජවනයන්ට හා භවාඞ්ගයන්ට අනතුරුව උපදනාසන්තීරණ චිත්තය වන හෙයින් තදුලම්බණ කෘත්‍යය නැති හෙයිනැ යි කියයුතුයි.

ඉක්බිති ඉමිදක තෙමේ එසේ විනම් වීථිචිත්තභාවයෙන් උපදනේ දෑ ප්‍රභේද කවයුතුයි. එසේද නොවන්නේය යි පිළිදන් දියයුතුයි. කුමක් හෙයිනයත්? වීථිචිත්තය යනු ආවර්ජනා චිත්තය විසින් ගන්නා ලද අරමුණ ම අරමුණුකොට ඉපදිය යුතු වෙයි. මෙහි චනාහි ආවර්ජනය විසින් ගන්නා ලද අරමුණ නොවෙණ ඒහවයෙහි හෙතුඝ්‍ය වශයෙන් ගන්නාලද විරූ කාමාවචර අරමුණක් එල්බගෙණ මේ ජවනයන්ට හා භවාඞ්ගයන්ටද අතරතුර පදනා ඝනතීරණ චිත්තය වීථිචිත්ත වශයෙන්ද නොගතයුත්තේය යි පිළිතුරු දියයුතුයි. මෙසේ සන්තීරණ චිත්ත යට අයත්වූ වූතී කෘත්‍යය ප්‍රතිසන්ධි කෘත්‍යය භවාඞ්ග කෘත්‍යය තදාලම්බණ කෘත්‍යය වීථිචිත්තභාවය යන පසවම අයිති නොවන්නාවූ මේ සන්තීරණ චිත්තය වනාහි පාරිශේෂ න්‍යාය ක්‍රමයෙන් අවශිෂ්ටව ඇතතාවූ ආගනතුක භවාඞ්ගකෘත්‍ය වශයෙන් පවත්නේයයි පිළිතුරු දියයුතුයි. මෙසේ ප්‍රත්‍යුත්තර දුන් කල්හී මොදකවාදී තෙමේ නිශ්ශබ්දවෙයි. ඉක්බිති ඒ සන්තීරණ චිත්තයෙන් අනනතර ප්‍රත්‍යය ලැබ තමාගේ පටිසන්ධි චිත්තය හා භූමි ජාත්‍යාදී වශයෙන් සදෘශවූ සොමනස් සහගත භවාඞ්ග තෙමේ භවාඞ්ග කෘත්‍යය වශයෙන් පවත්නේය යි දතයුතුයි.

තදාලම්බණ ඉපදීමට ආයුෂ නොපොහොනවූ සොමනස් සහගත පටිසන්ධිචිත්තයෙන් පිළිසිඳ ගත් තැනැත්තාහට උපදනා දෙමනස් ජවනයාගෙන් සොමනස් භවාඞ්ගචිත්තයට අනනතරප්‍රත්‍යය ලැබෙනා ක්‍රමය මෙසේ දතයුතුයි තථාගත යන්වහන්සේ විසින් වනාහි "අහෙතුකං භවඞ්ගං සහෙතුකස්ස භවඞ්ගස්ස අනනතරපච්චයෙන පච්චයෝ" යනුවෙන් පට්ඨාන ප්‍රකරණයෙහි සාමාන්‍යයෙන් වදාළ වචනය සලකා අට්ඨකථාචාරීන්වහන්සේ විසින් මේ චිත්තවීථි ක්‍රමය නියමකරණලද් දේයි. මේ වීථි නොමෝ වනාහි පඤ්චද්වාරයෙහි මුත් මනොද්වාරයෙහි නොලැබේ. මනොද්වාරයෙහි වනාහ අවශ්‍යමා පත්තිලාභිවූ පුද්ගලයෙකුගේ ධ්‍යානය යම්කිසි නුසුදුසු කාරණාවක් හෙතුකොටගෙණ ඒ ධ්‍යානයෙන් පිරිහුනුකල්හී උපදනා වෙහ මූලික ජවනයද අනිෂ්ටාලම්බණයෙහි මේ ක්‍රමයෙන් යෙදියයුතතේයි. කාමාවචරජවනය කාමාවචර සත්ත්වය කාමාවචර අරමුණය යන අඞ්ගයන්ගේ යෙදීමක් ඇතිකල්හිම තදාලම්බණවත්නේයයි දතයුතුයි. එතකුදුවුවත් මනොද්වාරයෙහි විභූතාලම්බණවීථිය පඤ්චද්වාරයෙහි අතිමහනතාලම්බණවීථිය

යන දෙතැන්හිම තදුලම්බණයයි දතයුතුයි. රූපී අරූපී බ්‍රහ්ම යන්ට වනාහි කුමක්හෙයින් තදුලම්බණ නොවන්නේද යත්? කාමාවචරකම් තමැති බිජුවටින් ප්‍රතිසන්ධි කොගත්හෙයිනැයි දතයුතුයි. මහද්ගතලොකොත්තර ජවනයන්ට අනතුරුව කුමක්හෙයින් තදුලම්බණ නොවන්නේද යත්? මහද්ගත ලොකොත්තර නිප්‍රීණ ප්‍රඥප්තීන් අරමුණුකරන්නාවූ තන්හි තදුලම්බණ නොවන්නේහි. කුමක්හෙයින ගත්? තදුලම්බණ යන්ගේ හෙතුහුතවූ කාමතෘෂ්ණාවට ප්‍රතිපක්ෂ හෙයිනැයි දත යුතුයි.

අවිහුතාලම්බණය පරිත්තාලම්බණය අතීපරිත්තාලම්බ ණය මහත්තාලම්බණය යන මේ සතර විධියෙහි තදුලම්බණ යන්ගේ නොවීම තදුලම්බණවීමට සුදුසු පමණ ආයුෂ නැති හෙයිනැයි දතයුතුයි. එහෙයින් තදුලම්බණ තෙමේ මනෝ වාරයෙහි විහුතාලම්බණ විධියෙහිත් පඤ්චවාරයෙහි අති මහත්තාලම්බණවිධියෙහිත් තදුලම්බණ වියයුතුනම් තදුලම්බ ණවන්නේයි. ඒ විහුතාලම්බණ අතිමහත්තාලම්බණ තෙමේ තදුලම්බණයෙහි වන්නේයි. විහුතාලම්බණ අතිමහත්තා ලම්බණ සියලු විධියෙහිම තදුලම්බණ වියයුතුය යන නියම යෙක්ද ඇත්තේයි. එහෙයින් යෙහුය්‍යත්‍යාය වශයෙන් අති මහත්තාලම්බණ විහුතාලම්බණවිධියෙහි තදුලම්බණවන් නේයයි දතයුතුයි.

තදුලම්ලණ තෙමේ ළදරුවෙකුට බදු උපමා ඇතිවෙයි. ළදරු තෙමේ මව්පියන්ගේ පසුපස්සෙහි යන්නේවෙයි. මව්පිය න්ට බදුවූ නැදිමසිලන් සුළුපියන් පස්සෙහිද යන්නේවෙයි. එතකුදුවුවත් රාජපුරුෂයින්ගේ පසුපස්සෙහි නො යන්නේ වෙයි. මව්පියාදීන්ගේ පසුපස්සෙහි යන්නේ නමුදු ළදරුවන්ට පුරුදු ගේ මිදුල් ආදියෙහිම යන්නේ වෙයි. මව් පියාදීන් හෙයින් පිටත්ව දුරබැහැර යන්නාවූ කල්හි පුරුදුවූ ගේ මිදුල් ආදියෙහිම පසුපස්සෙහි හොස් නොපුරුදුවූ [illegible] කල්හි ආපසු සැකියා හෙදරවම පෙරළා [illegible] වෙයි. දෙලොස් අකුසල් හා කාමාවචර [illegible] මව් පියන්ට බදුවෙත්. කාමාවචර මහාක්‍රියාවන් හා හසිතෝත්පාද ක්‍රියාචිත්තයද සුළුපිය නැදිමසිලන්ට බදුවෙත්. මහද්ගත ලොකොත්තර ජවනයෝ වනාහි රාජපුරුෂාදීන්ට බදුවෙත්. තදුලම්බණ තෙමේ ළදරුවෙකුට බදු උපමා ඇති මෙහි, එහෙ යින් රාජපුරුෂාදීන්ට බදු මහද්ගත ලොකොත්තර ජවන යන්ගේ පසුපස්සෙහි තදුලම්බණයෝ නුදුවත්.

මේ තදුලම්බණ නියමයයි.

ප්‍රවෘත්ති කාලයෙහි අධිකවශයෙන් කාමාවචර ජවන්දි වන්නාවූ කල්හි සත්වරක්ද මූර්ඡාකාලයෙහි සයවරක්ද මරණාසන්න කාලයෙහි පස්වරක්ද කුමක්හෙයින් දිවන්නාහුද යත්? සිතට නිශ්‍රයසථානවූ හෘදයවස්තුව මරණාසන්න කාලයෙහි අතිශයින් දුර්වල හෙයිනැයි දතයුතුයි. එහෙයින් "වුති චිත්තපවත්තා සමකාලමෙව නිරුජ්ඣනති" යනු කීහ. මරණාසන්නජවන් එතමේ මහද්ගත හෝ ලෝකොත්තර හෝ නොවන්නේයි. එහෙයින් කාමභූමියෙහි හෝ රූපාවචර අරූපාවචර භූමියෙහි හෝ මැරෙන්නාවූ සත්වයන්ට කාමාවචර ජවන් දිවීම ම සවභාව ධර්මයක්වෙයි. ඒ සියලු සත්වයන්ට ඛටඟන්නාවූ කාමාවචර ජවනයෝ තුමූ කාමභූමියෙහි අනාගතවූ ලෝභජවනය දෙසජවනය මෝහජවනය කාමාවචරමහාකුසල ජවනය යන මොවුන් අතුරෙන් යම්කිසි ජවනයක් ම දිවන්නේයි. එහි කෙසේද යත්? සපතකාමභූමියෙහි ලෝභමූලික අකුසල් රැස්කොට අනතුරු ආතමභාවයෙහි අපාඟප්‍රතිසන්ධිය ඟන්නේවීනම් ලෝභමූලික ජවන් ම දිවන්නේ යි. යම් සත්වයෙක් දෙස මූලික අකුසල් රැස්කොට අනතුරු ආත්මභාවයෙහි අපායොත්පත්තිය ඟන්නේවීනම් මරණාසන්න ජවන්වශයෙන් මෙය මූලික ජවන්දිවෙත්. මෝහ මූලික අකුශල් රැස්කොට අනතුරු ආත්මභාවයෙහි අපායප්‍රතිසන්ධිය ඟන්නේවීනම් මෝහ මූලික ජවනයෝම මරණාසන්න කාලයෙහි වෙත්. සපත කාමභූමියෙහි දානාදී පින්කම්කොට හෝ රූපාරූපධ්‍යාන උපදවා හෝ අනතුරු ආත්මභාවයෙහි සුගතියෙහි හෝ රූපාරූප භවයෙහි හෝ ප්‍රතිසන්ධිගන්නේවී නම් කාමාවචර මහාකුශල් ජවන්වශයෙන් දිවෙත්: රූපාරූපභවයෙහි උපන්නාවූ සත්වයන් ඒ භවයෙන් චුතවන්නාවූකල්හී මහාකුශල් ජවනයෝම එකාන්තයෙන් දිවන්නාහුවෙත්. රූපාරූපභවයෙන් චුතවන්න වුන්ට යටකී පරිද්දෙන් අකුශල් ජවන් කුමක්හෙයින් නූපදනාහුද යත්? ශ්‍රේෂ්ඨ භවයෙන් චුතව අනතුරු ආත්මභාවයෙහි දුගතියෙහි නූපදනා හෙයිනි; එසේද වුවත් සතර අරූප තලයෙන් චුතව කාමසුගතියෙහි උපදින්නාවූ සත්වයෝ ත්‍රිහෙතුකව මුත් දුහෙතුකව නූපදනාහු මැයි. අහෙතුක පටිසන්ධිය කියනුම කිම? සොළොස් රූපභවයෙන් චුතව කාමසුගතියෙහි උපදින්නවුන්ට ත්‍රිහෙතුකව හෝ ද්විහෙතුකව හෝ ප්‍රතිසන්ධිය මුත් අහෙතුක ප්‍රතිසන්ධිය කිසිකලෙකත් නොලැබෙන්නේයි. පුදුගල වශයෙන් වනාහි සපතකාමභූමියෙන් චුතවන්නාවූ පෘථග්ජනයන්ට ලෝභජවනය හෝ මෙය ජවනය

හෝ මෝඝජච්ඡාය හෝ මෙ සුගති ජවනය හෝ සුඛානුරූප පරිද්දෙන් දිවින්නාහු වෙත්. රූපාරූපභූමියෙහි උපන්නාවූ ත්‍රිහෙතුක පෘථග්ජනයන්ට හා සෝවාන් සකෘදාගාමී අනාගාමී යන ඵලසඳ තුන්දෙනාහට ද මරණාසන්න කාලයෙහි මහාකුශල් ජවන්ම දිවෙත්.

මරණාසන්න කාලයෙහි බොහෝසෙයින් ලෝභජවන් දිවූ සත්‍යතෙමේ අනාතුරු ආත්මභාවයෙහි ප්‍රේත ලෝකයෙහිම උපදනාහු වෙත්. ඒ ප්‍රේතයන් අතුරෙහුදු නිජ්ඣාමතණ්හි කාදිවූ ප්‍රේතවිෂයෙහි උපදනාවුන්ගේ පටිසන්ධිචිත්තය උපෙක්ඛා සහගත අකුසල විපාක සන්තීරණයෙන් අපායට ඇතුලත්ව හටගන්නේසි. ඉතිි ප්‍රේතව උපදනා ප්‍රේතයන්ගේ ප්‍රතිසන්ධිචිත්තය කුසලවිපාක උපෙක්ඛාසහගත සන්තීරණ චිත්තයෙන් සිව්මහරජයට ඇතුළත්ව හටගන්නේසි. මරණාසන්න කාලයෙහි වෙෂ මූලිකජවන් දිවූ සත්‍යතෙමේ බොහෝ සෙයින් අනාතුරු ආත්මභාවයෙහි අපාය ප්‍රතිසන්ධිය ගන්නේසි. මරණාසන්න කාලයෙහි මෝහමූලිකජවන් දිවූ සත්‍ය තෙමේ බොහෝසෙයින් අනාතුරු ආත්මභාවයෙහි තිරිසන් අපායෙහි ප්‍රතිසන්ධි ගන්නේ සි. සප්තකාම භූමියෙන් චුතව නැවත එම භූමියෙහිම හෝ රූපාරූප භූමියෙහි හෝ පටිසන්ධි ගන්නාවූ සත්වයන්ටද රූපභූමියෙන් චුතව එම රූප භූමියෙහිම හෝ කාමසුගතියෙහි හෝ අරූපභූමියෙහි හෝ උපදනා සත්වයන්ටද, අරූපභූමියෙන්චුතව එමභූමියෙහිමහෝ කාමසුගති භූමියෙහි හෝ උපදනා සත්වයන්ට මරණාසන්න කාලයෙහි කාමාවචර මහා කුශල්ජවන්ම දිවෙත්. "මරණාසන්නකාලාදීසු" යන්නෙහි ආදි ශබ්දයෙන් විභාවනීටීකායෙහි මූර්ඡාකාලාදියෙහි හවගන්නාවූ ජවන් සඳෙහ ගන්නේසි. සංඛිපවණ්ණනා ටීකායෙහි එම ආදි ශබ්දයාගේ අර්ථ වශයෙන් බුඩාදීන්ට ලහුක ප්‍රවෘත්තියෙහි උපදනාවූ ප්‍රත්‍යවෙක්ෂා ජවන් සතර හෝ පස හෝ ගන්නේසි. ඒ එසේමැයි. යමක ප්‍රාතිහාර්‍යාදී කාලයෙහි බුදුවරයනට උපදනා ප්‍රත්‍යවෙක්ෂා ජවන සතරද ප්‍රත්‍යෙක බුඩ මහාශ්‍රාවකාදීන්ට එබඳු ප්‍රාතිහාර්‍යාදිය දැක්වීමෙහි උපදනා ප්‍රත්‍යවෙක්ෂා ජවන් පසයයි ගන්නේසි. එසේදවුවත් ආචාර්‍ය ධම්මපාල සථවිරයන් විසින් තික්ඛිඳ්‍රිය පුදුගලයන්ට ජවන් සතරක්ද මුදිඳ්‍රිය පුදුගලයන්ට ජවන් පසක්ද ගතයුතුහෙයින් භාග්‍යවත්හු තික්ඛිඳ්‍රිය බැවින් ප්‍රත්‍යවෙක්ෂා ජවන සතරක්ද ප්‍රත්‍යෙක බුඩමහාශ්‍රාවකාදීන් මුදිඳ්‍රිය බැවින් ප්‍රත්‍යවෙක්ෂා ජවන්

පසෙකැයි විසඳා කොට දක්වන ලද්දේයි. මහග්ගතජ්ඣානයන් ගේ ආදිකම්මික පිරිමසෙහි එක් වරක්ද, ඒ ඒ ධ්‍යානයට සම වදනා සමාපත්ති පිරියෙහි අහෝරාත්‍රයක් හෝ කැමති කාල යක් හෝ මුලුල්ලෙහි අප්පමණා ජවනයන්ගේ සඛ්‍යා පථාති ක්‍රාන්තව කටඹන්නා බවද අධිට්ඨාන කළ පරිද්දෙන් සමා පත්තියට සමවැදීම අධිට්ඨාන වශිතා නම් වන බවද, අධිට්ඨාන කළ පරිද්දෙන් ධ්‍යානයෙන් නැඟිට අන්‍යවූ අභිමත චිත්ත පිරියක් ඉපදවීමයයි කියන ලද්දාවූ ධ්‍යානයෙන් නැඟිටීම වුට්ඨාන වසිතාම් වන බවද, සියලු මාඝීජවනය එක් වරක්ම වන බවද, මාඝීජවනයන්ගේ සමාපත්ති වශයෙන් නැවැත්ම නැති බවද, අභිඥා ජවනය වනාහි පළමුවෙන් ලබන්නාවූ කල්හිද එක් වරක්ම උපදනා බවද. අභිඥාජවනයට සමවදනා කල් හිද එක් වරක්ම සමවදනා බවද, දත යුත්තේයි. අභිඥා ජවනය වනාහි සෙසු සමාපත්ති පිරියෙහි මෙන් බොහෝවර කුමක් හෙයින් නුපදනේදයත්? අභිඥාජවනයෙහි සමාපත්ති යක් නැති හෙයිනැයි දත යුතු. "අභිඥාවය" යනු පවමබ්‍යානයා ගේම එක්තරා ශක්ති විශෙෂයෙක් වෙයි අභිඥාජවනය වනාහි එක් වරක් ඉපිද නිරුඬවූ කල්හි" සතං හොමි සහසසං හොමි" යනාදීන් සියදහස් කෙළමාර රූපාදිය උපද වන්නාවූ කල්හි ඒ අභිඥාජවනය නැත්තේ මැයි. අභිඥාජවනය නැත් තේවිනමුදු පළමු උපන් ඒ අභිඥාජවනචිත්තක්ෂණයාගේ ධම් ශක්තිය හෙතුකොටගෙණ ශතසහශ්‍රාදී රූපයන්ගේ හට ගැණීම වෙයි. මේ ඍර්ඩිවිධියට කී නයින්ම දිව්‍යශ්‍රොත්‍ර පර චිත්ත විජානන ඥානාදී සෙසු අභිඥාවන් උපදවන කල්හිද පවමබ්‍යාන සඛ්‍යාතවූ අභිඥාජවන විථිය එක් වරක්ම ඉපිද නිරුඬවූ කල්හි පෘථග්ජන ශෛක්ෂ්‍යයන්ට කාමාවචර කුශල චිත්තයෙන්ද, බුදුපසේබුදු මහරහතුන්ට කාමාවචර ක්‍රියා චිත්තයෙන්ද ඒ දිව්‍ය ශ්‍රොත්‍රාදිය කටඹන්නේයයි දත යුතුයි. කුමක් මෙන්දයත්? මෘගමදය බහාතුබ්බූ භාජනයෙහි ඒ මෘග මදය ඉවත් කළේ නමුදු මනොඥවූ සුගන්ධය ඒ භාජනයෙහි පවත්නාක් මෙන් අභිඥා චිත්තය නිරුඬවී ගියේ නමුදු ඒ අභිඥාභාවය කරණකොටගෙණ කාමාවචර කුශල ක්‍රියා චිත්තයන්ගෙන් ඍර්ඩිවිධිය දිව්‍යශ්‍රොත්‍රය පරසිත් දැනීමය, පෙර විසූ කඳපිළිවෙළ දැකීමය, දිව්‍යංචක්ෂුරභිඥාවය යන පඤ්චාභිඥාව හා දිව්‍යංචක්ෂුරභිඥානයාගේ විශෙෂවූ ඉන්ද්‍රිය පරොපරියත්ත ඤාණය, අනිතංසඥානය, අනාගතංසඥානය යන අභිඥාවෝද පවත්නාහු වෙති. එලජවනතෙමේ මාඝී පිරියෙහි මන්දප්‍රාඥයාහට දෙවරක්ද, තික්ඛ ප්‍රාඥයාහට තුන්

වරක්ද උපදනේය යන මේ වාදය සමාන වාදය නම් වෙයි. සමහර ආචාර්යවරයෝ වනාහි ඵලජවනයන්ගේ දෙතුන් වරක් ඉපදීමට තීක්ෂ්ණප්‍රාඥබව හෝ මන්දප්‍රාඥබව හෝ කාරණා නොවෙති. ඒ මාර්ග ඵලී පුද්ගලයෙහි පරිකර්ම උපචාර අනුලෝම ගොත්‍රභූ යන කාමාවචර සමාධිහු සතර වරක් උපන්නෝ විසම් පස්වන සිත මාර්ගසිත්ව සවන සත්වන දෙසිත ඵලසිත් වෙයි. එම ඵලීයෙහිම පරිකර්ම සිත නොඉපද උපචාර අනුලෝම ගොත්‍රභූ යන නමින් කාමාවචර ජවනයෝ තුන් දෙනෙක් වූහුනම් සතරවන සිත මාර්ගසිත්වැ පස්වෙනි සවෙනි සත්වෙනි තුන්දෙන ඵලසිත් වන්නේයයි කියති. අනාගාමීන්ව හා රහතුන්ට පරිකර්ම නිරෝධයට සමවැදිය හැකි වේනි. ශුෂ්කවිදර්ශක කාමරාගය ඇතිතෙයින් නිරෝධ සමාපත්තියට සමවදිනු නොහැකි වෙත්. අනාගාමී රහත්හුද ශුෂ්ක විදර්ශකයෝ වූවාහුනම් හෝ මෘදු කාගයෙහිවත් අල්පසමාපත්තිය නොලැබුවාහු නම් හෝ අනාගාමී රහත්වූ පමණින්ම නිරෝධයට සමවැදිය නොහැකි වෙති. නිරෝධයට සමවැදීමෙහි අඩංගුවක් ඇතිවිය යුතුයි. එනම්:-අල්පසමාපත්තියෙහි අග තැන්පත් වීමය. කාමරාගය නිරවශේෂ ප්‍රහාණයෙන් හැසිමය, යන මේ අඩංගුවය ඇතිකල්හිම නිරෝධයට සමවැදිය හැකි වෙති. එනකුදුවුවත් කාමාවචර භූමියෙහි වසන්නාවූ අනාගාමීන්ට හා රහතුන්ව මුත් රූපභූමියෙහි වත් අරූප භූමියෙහි වත් වසන්නාවූ ඒ ආර්යයන්ට නිරෝධසමාපත්තිය නොලැබෙත්යයි සමහරු කියති. කුමක් හෙයිනයත්? නිරෝධයට සමවදින්නාවූ ආර්යයන් වහන්සේ විසින් රූපාවචර ප්‍රථම ධ්‍යානය පටන් චතුර්ථක නයින් අෂ්ට සමාපත්තියට සම වැද වැද ක්‍රමයෙන් ගොස් කාමධර්මයන්ගේ නිරෝධය කළ යුතු වෙයි. එනකුදුවුවත් රූපභූමියෙහි උපන්නාවූ ආර්යයන්ට අරූපධ්‍යානය හෝ අරූපභූමියෙහි උපන්නාවූ ආර්යයන්ට රූපධ්‍යානය හෝ නොලැබිය හැකි බැවින් රූපාරූප භූමිවයෙහිම උපන්නාවූ අනාගාමී රහතුන්ට නිරෝධ සමාපත්තිය එකාලැබෙයි. එනකුදුවුවත් නිර්ඉණ සැපයට උදහරණ දක්වන්නාහු විඳුනි මාර්ග ඵලයෙහි නිරෝධයට සමවන් අරූපිබ්‍රහ්මයෝ ඒ ඛන්ධලෝකයින් චුතවූවාහු නොවෙති. එහෙයින් අරූපී බ්‍රහ්මයන්ට නිරෝධ සමාපත්ති කාලයෙහි ලැබෙන්නාවූ සැපත නිර්ඉණ සැපතට සමානයයි විස්තර කර තිබේ. ඉදින් අෂ්ටසමාපත්තීන්ට සමවැදීම නොහොත් රූප ධ්‍යානයන්ට සමවැදීම නිරෝධයාගේ පූර්ව කෘත්‍යයක් නොවන්

නේ චිතම් අරූප ලෝකයෙහි නිරෝධ සමාපත්තිය එකානස්ස යෙන් ලැබිය හැක්කේයි, එහෙයින් රූපාවචර බ්‍රහ්මලෝකය හැර සතර අරූප භවයෙහිද කාමසුගතියෙහිද විසන්නාවූ ආර්‍යයන්ට නිරෝධසමාපත්තිය ලැබෙන්නේය යන වාදය සමීන වාදයයි සැලකිය යුතුයි, සමහර ආචාර්‍යවරයෝ වනාහි අරූපී භවයෙහි රූපය නැතිහෙයින් නිරෝධ සමාපත්තියට සමවැදෙන්නේයයි කියති. එහෙයින් අෂ්ට සමාපත්ති ලාභීවූ අනාගාමී අර්හත් පුද්ගලයෝ තුමූ පළමුකොට ප්‍රථම ධ්‍යානයට සමවැද ඒ ධ්‍යානයෙහි ඇත්තාවූ විතර්කවිචාර ප්‍රීති සුඛ එකාග්‍රතා යන ධ්‍යානාඞ්ග පංචකය අනිත්‍ය දුක්ඛ අනාත්ම යන ලක්ෂණත්‍රයට ආරෝපණය කොට ප්‍රත්‍යවේක්ෂා කරත්. තදනන්තරව විතීය ධ්‍යානයට සමවැද ඒ ධ්‍යානයෙහි ඇත්තාවූ ධ්‍යානාඞ්ග චතුෂ්කයද විදර්ශනා කොට තදනන්තරව තෘතීය ධ්‍යානයට සමවැද ඒ ධ්‍යානයෙහි ඇත්තාවූ ධ්‍යානාඞ්ගත්‍රිකය විදර්ශනා කොට තදනන්තරව සුඛෙකාග්‍රතා උපෙක්ෂා එකාග්‍රතා යන චතුර්ථධ්‍යානයට සමවැද ඒ ධ්‍යානයෙහි ඇත්තාවූ ධ්‍යානාඞ්ග යුග්මය විදර්ශනා කොට තදනන්තරව ආකාසානඤ්චායතන විඤ්ඤාණඤ්චායතන ආකිඤ්චඤ්ඤායතන යන අරූප ධ්‍යානත්‍රයටද පිළිවෙළින් සමවැද ඒ ඒ ධ්‍යානයෙහි ඇත්තාවූ උපෙක්ෂා එකාග්‍රතා සඞ්ඛ්‍යාතවූ ධ්‍යානාඞ්ගයෝ දෙදෙන අනිත්‍යාදි වශයෙන් විදර්ශනා කොට තදනන්තරව තමාගේ විවරාදි පරිෂ්කාරයන් සොරුන් විසින් පැහැර නොගණිවයි කියාද, තමාගේ විහාරය ගින්නෙන් විනාශ නොවේවයි කියාද, යන මේ නානා භාණ්ඩ අවිකොපණය කොට තදනන්තරව සරීරයන් වහන්සේ විසින් අඩහා වදාළේ චිතම් ඤානඤ්ඤම්මා යන සත්‍යුපකෙකා සකයද, සඞ්ඝයාට යම් කෘත්‍යයක් ඇතිවිට ඉඟිය ගැසුයේ නම් ඒ ඤානඤ්ඤම්මා යන සඞ්ඝ පරිණාන කයද, අධිෂ්ඨාණ කොට තදනන්තරව සත්දවස ගිය තත්හි නැගිටිම්මා යන අඩව පරිවෙජ්දය අධිෂ්ඨාන කිරීමය. යන මේ පූජා කෘත්‍ය සතර අධිෂ්ඨාන කොට ගෙණ තදනන්තරව නෙවසඤ්ඤා නාසඤ්ඤායතනයට සමවදිනුයුය. ඒ ධ්‍යානයට දෙවරක් සමවැදුනාවූ කල්හි චිත්ත චෛතසික චිත්තජ රූපයන්ගේ නිරෝධය වෙයි. කම්ම උතුජ ආහාරජ යන තිජරූපයන්ගේ හටගැණීම නිරෝධ සමාපත්තියට සම වැදීමයයි කියනු ලැබේ. ඒ නිරෝධයෙන් නැගිටිනා කල්හි අනාගාමීන්ට අනාගාම්ඵල චිත්තයද රහතුන්ට අර්හත්ඵල චිත්තයද, එක් වරක් ඉපිද ඒ ඵල චිත්තයෙන් අනන්තර ප්‍රත්‍යය ලැබ භවාඞ්ග

විමට පවන් සන්නේය. අරූපභූමියෙහි නිරෝධයට සම වදනාවූ අභාග්‍යයන්ට කෘ කෘ භණ්ඩ අවිඝ්කාපණාදි සතර අධිෂ්ඨාන මාත්‍රයක් නැත්තේය. කුමක් හෙයින් නැත්තේද යත්? රූපසඤ්ඤිය නැතිහෙයිනැයි දතයුතුයි. අනාගාමීන් නිරෝධගට සමවදිනා කල්හි ප්‍රථමධ්‍යාන කුශල චිත්තාදීන්ද රහතුන් සමවදිනා කල්හි ප්‍රථම ධ්‍යාන ක්‍රියා චිත්තාදීන්ද උපදනාබැවි මාත්‍රයක් මෙහි විශෙෂයි. "අභිඤ්ඤ ජවනය" යනු පවම ධ්‍යාන කුශල ක්‍රියා චිත්තයෝ මැයි. එහෙයින් අභිඤ්ඤා චිත්තයයි අනික් සිතක් නැත්තේයයි දතයුතුයි. දුහෙතුක පුඤ්ඤකුශලයන්ට ක්‍රියා ජවන් කුමක් හෙයින් නූපදනාහුදයත් ක්‍රියාජවන් වනාහි ත්‍රිහෙතුක පුද්ගලයන්ට අභිඤ්ඤලය ලැබී මේන්ම උපදනා ජවනයෝය. එහෙයින් බුඩ ප්‍රත්‍යෙක බුඩ ආර්‍ය්‍ය ශ්‍රාවිකයන්ගේ සන්තානයෙහිම මහග්ගත ක්‍රියා නවඤ්ඤ කාමාවචර ක්‍රියා අටද යන සතළොස් දෙනා හා හසිතුප්පාද ක්‍රියා චිත්තයද යන අටළොස් ක්‍රියා චිත්තය උපදනේයයි දතයුතුයි. දුහෙතුක සන්ධියන්ට අභිඤ්ඤා ජවන් කුමක් හෙයින් නූපදනාහුද යත්? විපාකානන්තරය ඇති හෙයිනැයි දතයුතු. ඥාන විප්‍රයුක්ත මහා විපාකයෝ සතරදෙන දුහෙතුක පුද්ගලයන්ගේ පටිසන්ධි චිත්තයෝ වෙති. ඒ පටිසන්ධි විපාකයෙන් අභිඤ්ඤාව මුවහ කරණහෙයින් සුගතියෙහි දුහෙතුක සන්ධියන්ට කිසිකලෙකත් අභිඤ්ඤාව නොලැබෙන්නේයි. එහෙයින් වෙප චිත්ති අසුරභවනයෙහි වාසඤ්ඤකරන්නාවූ අසුරයන්ටද, ගන්ධබ්බ ලොකයෙහි වාසඤ්ඤකරන්නාවූ දුහෙතුක දෙවියන්ටද, මනුෂ්‍ය ලොකයෙහි දුහෙතුක මනුෂ්‍යයන්ටද එම ආත්ම භාවයෙහි ධ්‍යානාභිඥා මාර්ගඵල සඞ්ඛ්‍යාතවූ අභිඤ්ඤාව එකාන්තයෙන් නොලැබෙන්නේය, එනකුදුවුවත් ඒ දුහෙතුක සන්ධියන්ට දුගති අහෙතුක පටිසන්ධි ඇත්තාවූ කම්මලාසසතර නාග භවනාදියෙහි වසන්නාවූ දිව්‍ය නාගයන්ට හා ගුරුළු භවන යෙහි වසන්නාවූ දිවගුරුලන්ටද, ප්‍රවෘත්තිකාලයෙහි තදාලම්බණ වශයෙන් ත්‍රිහෙතුක මහාවිපාකද; ඒ ත්‍රිහෙතුක මහා විපාකයන්ගේ අනුභාවවූ සත්රුවන්මය විමාන උද්‍යානාදිය හා සිතූ පැතූ දේ ලබන්නාවූ කප්රුක්ද, දිව්‍ය වස්ත්‍ර දිව්‍ය සුගන්ධ දිව්‍යප්‍රාරාවන් ආදිවූ දිව්‍යමාවූ පඤ්චකාම සම්පත්තියද ලැබෙන්නේයි.

පදඝනාර්ථය.

පන, ජවන නියමයෙන් අනාවූ පුද්ගල භෙදයකියම්:- එසේ, මේ පුද්ගල භෙදයෙහි කොහොත් මේ දෙළොස් පුද්

ගලයන්අතුරෙන්; දුම්හෙතුකානංච, දුහෙතුකපුද්ගලයන්ටද; අහෙතුකානංච, සුගතිඅහෙතුකදුගතිඅහෙතුක පුද්ගලන්යටද; ක්‍රියාජවනානිවෙව, ක්‍රියාජවනයෝද; අපඤ්ඤජවනානිව්,අපිඤ්ඤජවනයෝද; නලබ්භනති, නොලැබියයුත්තාහු වෙත්. තථා, එපරිදිදෙන්; සුගතියං, සුගතිභූමියෙහි; දුහෙතුකඅහෙතුකානං, දුහෙතුක පුද්ගලයන්ට හා සුගතිඅහෙතුක පුද්ගලයන්ටද; ඤාණසම්පයුත්ත විපාකානිව්, ඤාණසම්ප්‍රයුක්ත මහාවිපාකයෝද; නලබ්භනති, නොලැබියයුත්තාහු වෙත්. දුග්ගතියං, දුගතිභූමියෙහි; අහෙතුකානං පන, දුගතිඅහෙතුක පුද්ගලයන්ට වනාහි; ඤාණවිප්පයුත්තානි, ඤාණවිප්‍රයුක්තවූ; මහාවිපාකානිව, මහාවිපාකයෝද; නලබ්භනති, නොලැබියයුත්තාහු වෙත්. තිහෙතුකෙසුව, ත්‍රිහෙතුක පුද්ගලයන් අතරෙහුදු; ඛීණාසවානං, රහතුන්ට; කුසලාකුසල ජවනානිව්, කුශලාකුශල ජවනයෝද; නලබ්භනති, නොලැබියයුත්තාහු වෙත්. තථා, එපරිද්දෙන්; සෙක්ඛපුථුජ්ජනානං, සෝවාන්ඵලස්ථයන් තුන්දෙනාගේ, ත්‍රිහෙතුක පෘථග්ජනයාගේ, යහමොවුන්ට; ක්‍රියාජවනානි නලබ්භනති, ක්‍රියාජවනයෝ නොලැබියයුත්තාහුය. සෙක්ඛානං, සෝවාන්ඵලස්ථයන් තුන්දෙනාහට; දිට්ඨධම්මසුඛවිහාරඣානජවනානිව්, දෘෂ්ටධර්මසුඛවිහාරඣානසම්ප්‍රයුක්ත ජවන් හා විචිකිච්ඡාජවනයෝද; නලබ්භනති, නොලැබියයුත්තාහු වෙත්. පන, එහිම විශෙෂාර්ථයක් දක්වමි:- අනාගාමිපුග්ගලානං, අනාගාමිපුද්ගලයන්ට; පටිඝජවනානිව, ප්‍රතිඝජවනයෝද; නලබ්භනතීති, නොලැබියයුත්තාහු වෙත්. ලොකුත්තරජවනානිව, ලෝකෝත්තරජවනයෝ අවදෙන වනාහි; ඛීණාසවස්ස, සුදුසු පරිද්දෙන් අරියඵලය එව, අත්ථාධිඤ්ඤ පුද්ගලයන්වමි; සම්පජ්ජන්ති, මොහොවට වෙන ඵලක්ෂණ උපදනාහු වෙත්. ඉති වේදිතබ්බා මෙසේ දතයුත්තේයි. මේ පෘථග්ජනාදි "දුහෙතුකානංච" යන ෂෂ්ඨීවිභක්ති පටන් "අනාගාමිපුග්ගලානං" යන ෂෂ්ඨී විභක්තියෙහි දක්වන විභක්ති විපරිණාමවශයෙන් සලකා දුහෙතුක පුද්ගලයන් විසින් යහපතින් අනුභව කිරීම සඳහා සිදුවූ පදයන් වූහුය කර්ම්ම වශයෙන් දෙවෙනි වාරයෙහි අර්ථ කිරීම යුතුයි. අසෙක්ඛානං රහතුන්ට; චතුවත්තාළීස, සුසාළිස් විධි සිත් කෙනෙක්; සමඛවා, (ඵලසමඛවං) සමඵලවන පරිද්දෙන්; උදපාසෙ, ප්‍රකාශකරන්නේයි. සෙක්ඛානං, ශෛක්ෂ්‍ය පුද්ගලයන් සත්දෙනාහට; ඡපඤ්ඤාස, ඡපණස් විධිසිත් කෙනෙක්; ඵලසමඛවං උදපාසෙ, 'ලැබෙන පරිද්දෙන් ප්‍රකාශකරන්නේයි. අවසෙසානං, සෙක්ඛ අසෙක්ඛ පුද්ගලයන් කෙරෙන් අවශිෂ්ටවූ පෘථග්ජනයන් සතරදෙනාහට; චතුපඤ්ඤාස, සතළිස්විධිසිත් කෙනෙක්; ඵලසමඛවං, සුදුසු

පරිද්දෙන්; උද්දිසෙ, ප්‍රකාශ කරන්නේයි, අයං, මේ කියන ලද්දේ වනාහි; එත්, මේ විපිසංග්‍රහයෙහි; පුග්ගලභෙදෙ, පුද්ගල භෙදයයි. නොහොත් පුද්ගලයන්ගේ වශයෙන් හටගන්නාවූ චිත්ත විපිත්‍රමයයි.

පදශතාර්ථය.

කාමාවචර භූමියං පන, කාමාවචර භූමියෙහිම; "පන" ශබ්දය අවධාරණාර්ථයි. සබ්බානිපි එතානි විපිචිත්තානි, ඒ සියලුම විපි චිත්තයෝ; යථාරහං, සුදුසු පරිද්දෙන්; උපලබ්භන්ති, ලැබිය යුත්තාහු වෙත්. රූපාවචර භූමියං, රූපාවචර භූමියෙහි; පටිසන්ධාදි තදුලබ්භණ වජ්ජිතානි, වෙන මුලින් දෙසිනය, තදුලබ්භණ එකොළොසය යන තෙළෙස් චිත්තයන් විසින් තොරකරණ ලද්දාවූ; එතානි විපිචිත්තානි, ඒ විපි චිත්තයෝ; යථාරහං, සුදුසු පරිද්දෙන්; උපලබ්භන්ති ලැබිය යුත්තාහු වෙත්. ච, විශෙෂාර්ථයක් කියමි:- අරූපාවචර භූමියං, අරූපාවචරභූමියෙහි; පඨමමග්ග රූපාවචරඣාන සන්න මෙකීමාරූපප වජ්ජිතානි, සෝවාන් මාර්ගචිත්තය; පඨ ලොස් රූපාවචර චිත්තය, සකිදාගාමිඵල චිත්තය, යට යට අරූපචිත්තය යන මොවුන් විසින් වර්ජිත කරණ ලද්දාවූ; එතානි විපිචිත්තානි, ඒ විපිචිත්තයෝ; යථාරහං, සුදුසු පරිද්දෙන්; ලබ්භන්ති, ලැබිය යුත්තාහු වෙත්. සබ්බථාපිච, සියලු ආකාරයෙනුදු; තංතං පඨාදරහිතානං, ඒ ඒ ප්‍රඨාද රූපයෙන් වෙන්වූ භූමීන්ගේද, තං තං වාරික විපිචිත්තානි, ඒ ඒ වාර යෙහි, උපදනා විපිචිත්තයෝ; නලබ්භන්ති නොලැබිය යුත්තාහු වෙත්. නොහොත් තං තං පඨාදරහිතානං, ඒ ඒ ප්‍රඨාද රහිත භූමියන් විසින්; තංතංවාරික විපිචිත්තානි, ඒ ඒ වාරයෙහි ඉපදිය යුතු විපිචිත්තයෝ; නලබ්භන්තෙව, නොලැබිය යුත්තාහුමැයි. අසඤ්ඤසත්තානං පන, අසංඥසත්ත යන්ට වනාහි; සබ්බථාපි, සපීප්‍රකාරයෙනුදු; චිත්තපවත්ති, චිත්තයන්ගේ හටගැනීමෙක්; නත්ථෙව, නැත්තේ මැයි. ඉති වෙදිතබ්බං, මෙසේ අර්ථ දතයුතුයි.

කාමෙ, එකොළොස් කාමභූමියෙහි; අසිති විපිචිත්තානි, අසූවක් විපිචිත්තයෝ; යථාරහං, සුදුසු පරිද්දෙන්; ලබ්භරේ, ලැබිය යුත්තාහු වෙත්. රූපෙ, අසංඥ සත්ත වර්ජිතවූ පඨ

ලෙස් රූපභූමියෙහි ; චතුසසී විපිවිත්තානි, සුසැව පිපිසිත් කෙනෙක් ; යථාරහං ලබිහරේ, සුදුසු පරිද්දෙන් ලැබිය යුත්තාහු වෙත්. තථා, එපරිද්දෙන් ; අරූපෙ, සතර අරූප භූමියෙහි ; වෙවත්තාළිස විපිවිත්තානි, දෙසාළිස් විපිසින් කෙනෙක් ; යථාරහං ලබිහරේ, යහු සමබන්ධ කටයුතුයි. අයං, මේ කියන ලද්දේ වනාහී ; එසේ, මේ විපිසංග්‍රහයෙහි; භූමිවිභාගෝ, භූමි විභාගයයි. නොහොත් භූමින්ගේ වශයෙන් ප්‍රවෘත්තිතවිපි විත්තයන්ගේ විභාගයයි. ඉවෙවවං, (යථා වුත්තන යෙන) යථොක්ත ක්‍රමයෙන් හෙවත් කියනලද ක්‍රමයෙන් ; ජවං රික විත්තපපවත්තී, ජවිවාරයෙහි හටගන්නා විත්තයන්ගේ පැවැත්ම; යථාසම්භවං, ලැබෙන ලැබෙන පරිද්දෙන් විභාගයන් අතුරුකොට ඇතිව ; යාවතායුකං, දිවි ඇතිතාක් මුළුල්ලෙහි ; අඛ්ඛාචරිත්තා නොසිදෙන ලද්දී ; පවත්තති, පවත්නේයි. අභිධම්මත්ථසඛ්ඛහෙ, අභිධම්මිකයන් සංග්‍රහ නම් ප්‍රකරණයෙහි ; විපිසඛ්ඛහවිභාගෝනාම, විපිසංග්‍රහ විභාග නම්වූ ; චතුත්ථෝ පරි වෙජ්දෝ, සතරවන පරිවෙජ්දය, ඉති, මෙසේ සම්පූර්ණ කරණ ලද්දේයි.

භාවාර්ථය.

කාමාවචර භූමියෙහි වනාහි ඒ සියලු විපිවිත්තයෝම යථාර්හයෙන් කුමක්හෙයින් ලැබෙන්නාහුද යත් ? කාමාවචර භූමියෙහි වනාහි එකොළොස් භූමියෙනෙක්ද, ප්‍රතිසන්ධිහු ද සදෙනෙක්ද, අවවිසිරූපයෙනෙක්ද, ජවිවාරයෙනෙක්ද, සම් පූර්ණයෙන් ලැබෙන්නාහු වෙති. මේ කාමාවචර භූමියෙහි ලැබෙන්නාවූ දශප්‍රකාර ප්‍රතිසන්ධිහු නම් සතර අපායවාසින් ගේ අපායප්‍රතිසන්ධි විත්තයඛ්‍යාතවූ අකුශලවිපාක උපෙක්ඛා සන්තීරණ විත්තයද, මනුෂ්‍යලොකයෙහි ජාත්‍යන්ධාදි ලාමක සත්වයාගේ හා භූමිනිශ්‍රිත විනිපාතික අසුරයන්ගේද ප්‍රති සන්ධිය ගෙණදෙන්නාවූ කුශලවිපාක උපෙක්ඛා සන්තීරණ විත්තයද සප්තකාම සුගතියෙහිම ප්‍රතිසන්ධි දෙන්නාවූ මහා විපාකයෝ අවදෙනද යන මේ දශප්‍රකාරවූ ප්‍රතිසන්ධියකින් විසුකතවූ නිකාය වශයෙන් ගණන පථාතික්‍රාන්තවූ අනෙක සත්වගතියාගෙන් සම්පූර්ණවූ භූමිය කාමභූමියයි. භූමිනිශ්‍රිත විනිපාතික අසුරයන් හෝ වෘක්ෂ නිශ්‍රිත කොට වාසය කරන්නාවූ රුක්දෙවියෝද පේත ගඛ්ඛා සමුද්‍රාදිය ආශ්‍රය කොට වසන්නාවූ දෙවියෝද චාතුම්මහාරාජිකයෙහිම ඇතුලත්

වෙයි. ඒ භූමි නිශ්‍රිත විනිපාතික අසුරයෝ වනාහි ඝනු ප්‍රේත සඞ්ඛ්‍යාවෙන් නැගෙන් බලාපොරොත්තු වන නමුත් මනුෂ්‍ය භූමියට හෝ අපාය භූමියට හෝ ඇතුලත් නොවනහෙයින් චාතුම්මහා රාජිකාදියහිම ඇතුලත් වන්නාහුයයි දතයුතුයි, මෙසේ කාම භූමිය සියල්ලෙන්ම සම්පූර්ණ වන බැවින් පරිපූර්ණ යනත ඇත් තාවූ සත්ත්වයන්ට සුදුසු පරිද්දෙන් සියලු විඳි විත්තයෝම උපද නාහු වෙත්. රූපාවචර භූමියෙහි වනාහි ප්‍රතිසන්ධි ජවන තදාලම්බණයෝ නූපදනාහු වෙත්. තදාලම්බණයන්ගේ නොඉපදීමේ හෙතුව යව තදාලම්බණ නියමයෙහි දක්වනලදී. එසේම රූපා වචර භූමියෙහි ඝාණජිව්හා කාය යන චාරත්‍රය නොලැබෙන හෙයින් ඒ චාරත්‍රයෙහි ආවෙණික වශයෙන් උපදනාවූ ඝාණ විඤ්ඤත්තිය ජිව්හාවිඤ්ඤත්තිය කායවිඤ්ඤත්තිය යන විත්ත යෝසදෙන නූපදනාහු වෙත්. රූපාවචර බ්‍රහ්මයන්ට වනාහි ඝ්‍රාණාදිප්‍රසාදත්‍රය නැත්තේ නමුදු සසම්භාරඝ්‍රාණ සසම්භාරජිව්හා සසම්භාරකාය යන මහාභූතරූපයෝ ඇත්තාහු මැයි. ඝ්‍රාණාදී ප්‍රසාදත්‍රය කුමක් හෙයින් නැත්තේද යත්? කාමයෙහි විරකත භාවනා බලයෙන් බ්‍රහ්මලොකොත්පත්තිය වන හෙයින් ඝ්‍රාණාදී ප්‍රසාදත්‍රය නැත්තේයි. එසේවී නම් චකඛු සොත ප්‍රසාදවය කුමක් හෙයින් ලැබෙන්නේද යත්? බුඩ දර්ශන ධම්ශ්‍රවණාදිය සඳහා මුත් රූප ශබ්ද කාම කොඨාසයන් අරමුණු වශයෙන් නන්නා පිණිස නොවෙත්යයි දතයුතුයි. "ඝාණජිව්හා" කායප්‍රසාද ත්‍රය ගන්ධ රස ස්ප්‍රෂ්ටව්‍ය කාමගුණයන් අනුභව කිරීම මුත් අනිත් කෘත්‍යයක් නැති හෙයින් රූපී බ්‍රහ්මයන්ට ඝ්‍රාණාදී ප්‍රසාදත්‍රය නැත්තේයයි දතයුතුයි. එහෙයින් අරූපාවචර භූමියෙහි සෝවාන් මාර්ගඵල සඳලොස් රූපාවචර විත්තය හසිතොත්පාද විත්තය යව යව අරූපාවචර විත්තය යන මොවුන් තොර කොට ඇත්තාවූ අවශෙෂ සියලු විත්තයෝ සුදුසු පරිද්දෙන් උපදනා නුයයි දතයුතුයි. අසංඥතල සත්වයන්ට වනාහි විත්තයන්ගේ ඉපදීමට හෙතුභූතවූ ජවිවාරයම නැති හෙයින් විත්ත ප්‍රවෘත්තිය කෘත්පසින්ම නැත්තේයි. ඉදින් අසංඥතල වාසී සත්වයන්ට විත්ත ප්‍රවෘත්තිය කෘත්පසින්ම නැත්තේ වී නම් අසංඥ භවයෙන් චුතව කාමාවචර භූමියෙහි උපදනා කල්හී කවර වාරයකින් ගන්නාලද අරමුණෙක පටිසන්ධිය වන්නේද යත්? අසංඥතල යෙහි ඉපදීමට හෙතුභූතවූ වායොකසිණ චතුර්ථධ්‍යානය ඉපදෙවී භවයෙහි රැස්කරණ ලද්දාවූ යම්කිසි කාමාවචර කුශල කර්මයක් අවසරලැබ අපරාපරිය වෙදනා වශයෙන් එලඹුනාවූ කර්මානුභාවය කින් හෙණ හැර දක්වන්නාවූ කර්ම නිමිත්තක් හෝ ගති නිමිත්

තක් හෝ එල්ල ගෙණ කාමාවචර භූමියෙහි පටිසන්ධිගන්නේයයි දතයුතුයි. එහෙයින් කිහ :- සච්චසඞ්ඛේපයෙහි-

"භවන්තර කතං කම්මං යමෝකාසං ලහේ තතෝ
හොති සා සන්ධි තෙනෙව උපඨපිත ගොවරෙ"යනාදියයි.

අභිධම්මත්ථ සඞ්ග්‍රහයෙහි විපි සංග්‍රහ විභාග නම්වූ ඍව්වෙනි පරිච්ඡේදය මෙතෙකින් සමාප්තයි.

චතුත්ථෝ පරිච්ඡෙදෝ නිට්ඨිතෝ.

පදගතාර්ථ.

විපි චිත්ත වසෙනෙව පවත්තියා භූදිරිතෝ
පවත්තී සඞ්ගහෝ නාම සඞ්ගීයං දුති වුච්චති.

එවං (යථාවුත්තනයෙන) යථොක්ත ක්‍රමයෙන් ; විපිචිත්ත වසෙන, විපි චිත්තයන්ගේ වශයෙන් ; පවත්තියං, ප්‍රවෘත්ති කාල යෙහි හෙවත් ප්‍රතිසන්ධි චිත්තයට අනතුරු ප්‍රථම භවාඞ්ගය පටන් චුති චිත්තයව අනන්තර ප්‍රත්‍යය වන්නාවූ ජවනයෝ තදාලම්බණ හෝ භවාඞ්ගය දක්වා මේ අතර කාලයෙහි ; පවත්තී සඞ්ගහෝ නාම, ප්‍රවෘත්තීති සංග්‍රහ නම්වූ විපි සංග්‍රහය ; මයා, මාවිසින් උද්දිසිතා, කියන ලද්දේයි. දුති, (ඉදුති) දැන් වක්‍යාභිඥ සඤ්ඤං, ප්‍රතිසන්ධි කාලයෙහි හා චුතිකාලයෙහි; පවත්තී සඞ්ගහෝ නාම, ප්‍රවෘත්තී සඞ්ග්‍රහ නම්වූ විපිමූකත සඞ්ග්‍රහයක්; මයා, මාවිසින්, පවුච්චති, කියනු ලැබේ. චතාසෙසා භූමියෝව, සතර භූමි කෙනෙක්ද ; චතුබ්බිධා පටිසන්ධිව, සතරාකාරවූ ප්‍රතිසන්ධියෙක්ද ; චත්තාරිකම්මානිව, සතර කර්මයෙනක්ද, චතුධාමරණුපපත්තිව, සතරාකාරවූ මරණෝත්පත්ති සංඛ්‍යානවූ චුතියෙක්ද; ඉති, මෙසේ; විපිමූකත සඞ්ගහෙ, විපිමූකත සංග්‍රහයෙහි; චත්තාරිවතුකකානි, සතර චතුෂ්ක කෙනෙක්ද; වෙදිතබ්බානි, දතයුත්තාහුය. තත්‍ථ, ඒ සතර චතුෂ්කයන් අතුරෙන් ; අපායභූමිව, අපායභූමියද ; කාමසුගති භූමිව, කාමසුගති භූමියද ; රූපාවචර භූමිව, රූපාවචර භූමියද ; අරූපාවචර භූමිව, අරූපාවචර භූමියද : ඉති, මෙසේ ; චතසෙසාභූමියොනාම, සතරභූමිහු නම් ; වෙදිතබ්බා, දතයුත්තාහුය. තාසු, ඒ සතරාකාර භූමින් අතුරෙන් ; නිරයොව, නරක භූමියද ; තිරච්ඡානයොනිව, තිරිසන් භූමියද ; පෙතනිවිසයොව, ප්‍රෙත භූමියද ; අසුරකායොව, අසුරකාය භූමියද ; ඉති, මෙසේ ; අපායභූමි, අපාය භූමිතොමෝ ; චතුබ්බිධා හොති, සතරාකාවන්නීය. මනුස්සාව, මනුෂ්‍ය භූමියද ; චතුමහා

රාජිකාව, චාතුම්මහාරාජික භූමියද ; තාවතිංසාව, තාවතිංස භූමියද, යාමාව, යාමභූමියද ; තුසිතාව, තුසිත භූමියද ; නිම්මාණරතීව, නිම්මාණරතී භූමියද ; පරනිම්මිතවසවත්තීව, පරනිම්මිතවශවත්තී භූමියද ; ඉති, මෙසේ ; කාමසුගතිභූමි, කාමසුගති භූමි නොමේ ; සත්තවිධාහොති, සත් වැදෑරුම් වන්නීය. පන, අවයවයෙන් අන්‍යවූ සමුදය කියම්හ :- එකා දසවිධා අපි, එසෝ ලොස් වැදෑරුම්වූද ; සා අයංභූමි, ඒ භූමිනොමේ ; කාමාවචර භූමියේව, කාමාවචර භූමියයි කියාම ; සඞ්ඛංගච්ඡති, ගණනට යෙයි. නොහොත් කාමාවචර භූමියෙහි සංග්‍රහයට යෙයි. හෙවත් කාමාවචර භූමිය යන ව්‍යවහාරයට යෙයි. බ්‍රහ්ම පාරිසජ්ජාව, බ්‍රහ්මපාරිසද්‍ය භූමියද ; බ්‍රහ්මපුරොහිතාව, බ්‍රහ්මපුරොහිත භූමියද ; මහාබ්‍රහ්මාව ඉති, මහාබ්‍රහ්ම භූමියදැයි ; පඨමජ්ඣාන භූමි, ප්‍රථමධ්‍යාන භූමිනොමේ ; තිවිධාහොති, තුන්වැදෑරුම් වන්නීය ; පරිත්තාභාව, පරිත්තාභා නම් භූමියද ; අප්පමාණාභාව, අප්පමාණාභා නම් භූමියද ; ආභස්සරාව ඉති, ආභස්සර භූමියදැයි යන ; දුතියජ්ඣාන භූමි, විතීයධ්‍යානභූමි නොමේ ; තිවිධාහොති, තුන්වැදෑරුම් වන්නීය. පරිත්තසුභාව, පරිත්තසුභ නම් භූමියද ; අප්පමාණසුභාව, අප්පමාණසුභ නම් භූමියද ; සුභකිණ්හාව ඉති, සුභකිණ්හ නම් භූමියදැයි ; තතියජ්ඣාන භූමි, තෘතීය ධ්‍යාන භූමිනොමේ ; තිවිධාහොති, තුන්වැදෑරුම් වන්නීය. වෙහප්ඵලාව, වෙහප්ඵල නම් භූමියද ; අසඤ්ඤසත්තාව, අසංඥසත්ව නම් භූමියද ; සුඛාවාසාව ඉති, පවසුඛාවාස භූමිහු දැයි ; චතුත්ථජ්ඣානභූමි, චතුර්ථධ්‍යාන භූමිනොමේ ; සත්තවිධා හොති, සත්වැදෑරුම් වන්නීය. ඉති, මෙසේ ; රූපාවචරභූමි, රූපාවචර භූමිනොමේ ; සොළසවිධා හොති, සොළොස් වැදෑරුම් වන්නීය. අවිහාව, අවිහනම් භූමියද ; අතප්පාව, අතප්ප නම් භූමියද, සුදස්සාව, සුදස්ස නම් භූමියද ; සුදස්සීව, සුදස්සී නම් භූමියද ; අකනිට්ඨාව ඉති, අකනිට්ඨ නම් භූමිය දැයි, සුඛාවාස භූමිනොමේ ; පවවිධා හොති, පස්වැදෑරුම් වන්නීය. ආකාසානඤ්චායතන භූමිව, ආකාශානඤ්චායතන භූමියද ; විඤ්ඤාණඤ්චායතන භූමිව, විඥානඤ්චායතන භූමියද ; ආකිඤ්ඤඤ්ඤායතන භූමිව, ආකිඤ්ඤඤ්ඤායතන භූමියද ; නෙවසඤ්ඤානාසඤ්ඤායතන භූමිව ඉති, නෙවසඤ්ඤානාසඤ්ඤායතන භූමිය දැයි ; අරූපභූමි, අරූප භූමිනොමේ ; චතුබ්බිධා හොති, සතර වැදෑරුම් වන්නීය.

සුඛාවාසෙසු, සුඛාවාසභූමියෙහි නොහොත් සුඛාවාස භූමිහු තුළ ; සබ්බථා, සම්ප්‍රකාරයෙන් ; පුථුජ්ජනාපුග්ගලාඅපි, පෘථග්ජන පුද්ගලයෝද ; සොතාපන්නාපුග්ගලාවාහි, සෝවාන් පුද්ගලයෝද ; සකදාගාමිනෝ පුග්ගලාවාපි, ශකෘදාගාමි පුද්ගලයෝද ;

නලබභනති, නොලැබිය යුත්තාහු මෙත්. අසඤ්ඤාපායභූමිසු, අසංඥසත්ව භූමිය අපායභූමිය යනා මෙහි නොහොත් භූමීන් විසින් අරිය, අනරියෝ පුද්ගලයෝ ; නූපලබ්භන්ති, නොලැබිය යුත්තාහු වෙත්. සෙසඤ්ඤාසු, පඤ්චවොකාරභව සතර අපාය අසංඥසත්ව භූමිය යන දස භූමීන්ගෙන් අන්‍යවූ එක්විසි භූමියෙහි නොහොත් භූමීන් විසින් ; අරියෝව, අනරියෝ පුද්ගලයෝද ; අනරියාවිච, පෘථග්ජන පුද්ගලයෝ තුන්දෙනද ; ලබ්භන්ති, ලැබිය යුත්තාහු වෙත්. ඉදං, මේ කියන ලද්දේ එකාහි, එහි, මේ වීථිමුඛන සංග්‍රහයෙහි ; භූම්වතුක්කං, භූමි චතුෂ්කයයි

භාවනාවිධි.

මෙසේ දක්වන ලද්දාවූ නාමරූප සඞ්ඛ්‍යාත පරමාර්ථ ධර්මයාගේ හටගැණීමට සථානවූ භූමිතොමෝ වනාහි එකොළොස් කාමභූමිය සොළොස් රූපාවචර භූමිය සතර අරූපාවචර භූමියයි සඞ්ඛ්‍යා වශයෙන් ත්‍රිවිධාකාර වන්නේයි. සඞ්ඛ්‍යා වශයෙන් එක්තිස් ආකාර වන්නේයි. එකොළොස් කාමභූමිය' යනු නරක භූමිය තිරච්ඡාන භූමිය, ප්‍රෙතභූමිය, අසුරකාය භූමියයි අපායභූමි සතරෙක. මනුෂ්‍යභූමිය, චාතුම්මහාරාජිකභූමිය, තාවතිංසභූමිය, යාමභූමිය, තුසිතභූමිය, නිම්මාණරතිභූමිය, පරනිම්මිත වශවත්තීභූමිය'යි යන කාමභූමි සතෙක. මේ දුගතිසුගතිදෙක එක්කොට ගත් කල්හි එකොළොස් කාමභූමියයි කියත්. මේ එකොළොස් කාමභූමීන්ගේ සභාව ලක්ෂණය වෙන් වෙන් කොට දක්වන්නාවූ තන්හි "අයතෝ දුක්ඛතෝ නිරයතොති නිරයෝ" යනුවෙන් අප සඞ්ඛ්‍යාතවූ සැපයෙන් පහව ගියාවූ සථානය නිරය නමැයි කියන ලදී. එක් ඇසිපිය ක් හෙලන කාලයක් පමණකුදු සැපයක් නැත්තාව අත්‍යන්ත දුඃඛයට පැමිණෙන හෙයින් නිරය භූමියයි කී නියාය. ඒ නිරයභූමිය වනාහි කුශලාකුශල කර්මයන්ගේ දැනීමක් නැත්තාවූ ලොභයෙන් මුළාව සත්ව ඝාතනාදි අකුශල්රැස් කළාවූ සත්වයන්ගේ ඉපදීමට සථානවූ නරකයෙහි ආයු පමණින් පන්සියයක් අවිරුදු ආයුෂ ඇත්තාවූ සංජීව නම් නරකයෙක්ද, ඒ සංජීව නරකයෙහි එක් දවසක් මනුෂ්‍යයන්ගේ ආයුපමණින් හවිරුදු කවලක්ෂයයැයි කියනලදී. සෙසු නරකයෙහිද සතර සතරින් ගුණ කොට ආයු ගතයුතුයි. මාතෘ පිතෘ ආචාර්‍ය උපාධ්‍යායාදීන් කෙරෙහි වරදවා පිළිපදින්නා සත්වයෝය. මිථ්‍යාදෘෂ්ටි ගත්තාවූ සත්වයෝය, යන මොවුන්ගේ ඉපදීමට භූමිවූ නරක ආයු පමණින් දහසක් අවිරුද්දට ආයු

ඇත්තාවූ කාල සූත්‍ර නම් එක් නරකයෙක, ගවයන් එළුවන් තිරෙළුවන් ආදීවූ සත්ව ඝාතනය කරන්නාවූ වැදි කෙවුල් ආදීවූ සත්වයන්ගේ ඉපදීමට භූමිවූ නරකායුගණනින් දෙදහසක් අවිරුද්දව ආයුෂ ඇත්තාවූ සඞ්ඝාත නම් එක් නරකයෙක, සත්වයන්ට හිංසා පිඩා කරන්නාවූ සත්වයෝය, ඉඳුජාල මායාකාර සත්වයෝය යන මොවුන්ගේ ඉපදීමට භූමිවූ නරකායුෂ පමණින් සාරදහසක් අවිරුද්දව ආයුෂ ඇත්තාවූ රෞරව නම් නරකයෙක, තුණුරුවන්ට අයත්වූ වසතුය අම්බලම් මඩම් ආදිය මේ ආදීවූ වසතුව විනාශ කරන්නාවූ පැහැරගන්නාවූ මනුෂ්‍යයන්ගේ ඉපදීමට භූමිවූ නරක ආයුපමණින් අවදහසක් අවිරුද්දව ආයු ඇත්තාවූ මහාරෞරව නම් නරකයෙක, ප්‍රාණඝාතාදිවූ දුශ්චරිතයන්ට අනිෂ්ට විපාකයෙක් නැත්තේය සුගතිය හා දුගතියත් මේ මනුෂ්‍ය භූමියෙහිමය යනාදීවූ මිථ්‍යාදෘෂ්ටි ගත්තාවුන්ට භූමිවූ නරකායුපමණින් සොළොස් දහසක් අවුරුද්දට ආයු ඇත්තාවූ තාප නම් මහා නරකයෙක, බුදුන් දහම් සඞ්ඝයා නැතැයි යන මිථ්‍යාදෘෂ්ටි ගත්තාවූ සත්වයන්ගේ ඉපදීමට භූමිවූ අනන්තරකල්පාඞ්ගකට ආයුෂ ඇත්තාවූ මහා තාප නම් එක් නරකයෙක, මව්පියන් රහතුන් මැරීමක් හෝ දෙදෙනාදින් මෙන් බුදුන්ගේ ශරීරයෙන් ලේ සොල්වන්නාවූ නැනැත්තන්ද, සඞ්ඝයාට අයිතිවූ සඞ්ඝාරාම දගැබ් මහබෝ ප්‍රතිමාරූපාදිය විනාශ කරන්නාවූ නැනැත්තන්ගේද උතුපතනියට සුදුසුවූ අනන්තරකල්පයකට ආයුෂ ඇත්තාවූ දුකෙන් අතුරක් නැතිහෙයින් අවීචි නම්වූ මහානරකයෙක, මේ මහා නරක අට හා එක් මහා නරකයෙක්හි එකි එකි පාර්ශ්වයෙහි උස්සද නරක සතර සතර බැගින් ඇතිහෙයින් සියලු පිරිවර කුඩා නරක හා මහා නරකයෝද එක්සියසතිරක්වෙත්. තවද චක්‍රවාටයන් තුන්දෙනෙක් රැස්වූ තන්හි හටගන්නාවූ ලෝකාන්තරික නම් නරකයෙක්ද, ලෝහකුම්භි නම් කුඩා නරකයෙක්ද, වෛතරණී නම් ගඩොලා නරකයෙක්ද, කෝටිසිම්බලී නම් වෘක්ෂාකාර නරකයෙක්ද, යන මේ සියලු නරකයෝ නිරය නම් වත්. ඒ අවමහා නරකයෝ තුමූ ජම්බුද්වීපයෙහි පාංශුපෘථිවියෙහි පිහිටා ඇත්තාහුයයි දතයුතුයි. අවීචිමහානරකය, ජම්බුද්වීපය, තව්තිසා භවනය, අසුරභවනය, ගුරුළුභවනය යන මේ සියලු භූමිහුම දසදහසක් යොදුන් ප්‍රමාණ ඇත්තාහුයයි දතයුතුයි "තිරොඅඤ්ඡිතාති තිරච්ඡානා" යනු විග්‍රහ බැවින් සරසට යන්නාවූ සත්වයෝ තුමූ නොහොත් මාගීඵලයන්ගෙන් මිදුනාවූ යට භාගයට යන්නාවූ අර්හත්ගන් තිරච්ඡාන නම් වෙත්. "පකඤ්ඤෙන සුඛතෝ ඉතාගතාති පෙතා" යනු විග්‍රහ බැවින්

ප්‍රකාශයෙන් හෙවත් සම්ප්‍රකාරයෙන් සැපයෙන් පහවගියාවූ අර්ථයෙන් ප්‍රේත නම් වෙත්. නසුරනති ඉස්සරිය කිලංදිඝි නදිබබනතීති අසුරා" යනු නිරුක්තිය බැවින් ඓශ්වර්‍ය්‍ය ක්‍රීඩාදි යෙන් ක්‍රීඩා නොකරණ අර්ථයෙන් හෙවත් නොබබලන අර්ථයෙන් අසුර නම් වෙත්. මේ විග්‍රහයෙන් වනාහි ප්‍රේතාසුරයෝ මුත් වෙපච්චතති අසුරයෝ නොගැණෙත්. කුමක් හෙයිනයත්? වෙපච්චතති නම් අසුරරාජයා විසින් තමා වශයෙහි පවත්වන්නාවූ දිව්‍ය අසුරයෝ වනාහි දුහෙතුක කාමාවචර විපාක සිතින් පටිසන්ධි ගෙණ ප්‍රවෘත්ති කාලයෙහි ත්‍රිහෙතුක මහා විපාක යන්ගේ වශයෙන් දෙවියන්ට බදුවූ පස්කම්සැප අනුභව කරණ හෙයින් තව්තිසාවැසි දෙවියන් කෙරෙහි ඇතුලත් වෙත් මැයි. ඔවුන්ට වනාහි ත්‍රිහෙතුක දෙවියන්ට මෙන් ධ්‍යාන මාර්ගඵල නොලැබෙත් මැයි. එහෙයින් කිහ:- පරමාර්ථ විනිශ්චයෙහි :-

"තාවතිංසෙසු දෙවේසු වෙපච්චිතාසුරාගතා" යනාදියයි. ඒ තිරවශේෂ ප්‍රේත අසුර යන ත්‍රිවිධාකාර නරකවාසි සත්ත්වයන්ට අයත්වූ ආවේණික භූමියෙක් නම් නැත්තේයි. "තිරවශේෂ පෙතනිවිසය අසුරකායානඤ්ච විසුං භූමිට්ඨානඤ්ච නෙසං ඛණ්ඩ පවත්තති විසයෝ යෙව භූමිනාම" යනු කිහ. එසේම යථවා අරඤ්ඤ පබ්බත පාදදිනෙ නිබ්බත්තසං වසන්ති සෝයෙව ඔකාසෝ භූමිම් ඉති ගහෙතබ්බා" යනුද සංඛෙපවණ්ණනා පිහා යෙහි කී බැවින් තිරවශේෂ ප්‍රේත අසුර නිකායයන්ට අන්‍ය භූමියෙක්නම් නැත්තේමැයි. ඔවුන්ගේ සකඤ්ඣයෝම භූමිතම්වෙයි. ඒ එසේමැයි. රජමාලිඝාදියෙහි වඩිණයකරන්නාවූ ගිරා සැළලිහිණි මොනර ආදිවූ පක්ෂීන් හා රාජාලිවූ ඇත් අස් මඛාලය වෘෂභාදී සත්ත්වයෝද වාසයකරන්නාවූ ඒ රාජ මන්දිරය කාමසුගති භූමියෙහි ඇතුලත්වෙයි. එසේකුදුවුවත් ඔවුන්ගේ පවසකඤ්ඣයෝම නිරවශේෂ භූමිනම්වෙත්යයි අර්ථගතයුතුයි. තවද ගිජ්ඣකූට පර්වතපාදයෙහි අනෙක ප්‍රකාර තිරශ්චාමතණ්ඩිකාදී ප්‍රේතයෝද, සියලු ජලයෙහි මත්ස්‍යාදිවූ අනෙක ප්‍රකාර සත්ත්වයෝද, සියලු ආරණ්‍යාදියෙහි සිංහ ව්‍යාඝ්‍රාදී අනෙක ප්‍රකාර සත්ත්වයෝද නිබඳ වාසයකරණහෙයින් ඒ ඒ ස්ථාන ඒ ඒ සත්ත්වයන්ගේ අපාය භූමියයි එකාකාරයකින් ගතහැකිවෙති. නරකය තිරවශේෂයොනිය ප්‍රේත විෂය අසුරකාය යන භූමිත්‍රය සතරදෙන වනාහි "පුඤ්ඤසම්මතා අයා යෙහුය්‍යෙන අපගතාති අපායෝ" යනු විග්‍රහ බැවින් පුණ්‍ය සම්මතවූ අයයෙන් බොහෝසෙයින් පහව ගිය ස්ථානය අපායනම්වෙයි. එහි "අප"

ශබ්දය අපෙතාළීවංචකවෙයි. "අය" ශබ්දය අතිවංචීකුශල කම්විපාක වංචකවෙයි. ඒ එසේමැයි. සතරඅපායෙහිම සැප වීඳීමට හෝ කුශල් රැස්කිරීමට හෝ සුදුසුවූ යොග්‍යවූ ඇසි පියහෙලන කාලය කුදු නැත්තේයි. එහෙයින් අපායයි ව්‍යවහාරයි.

පුද්ගලයෝ වනාහි දුඃඛති අහෙතුක පුද්ගලය, සුඛතිඅහෙතුක පුද්ගලය, දුහෙතුක පුද්ගලය ත්‍රිහෙතුක පුද්ගලයයි,යන පෘථග් ජනයෝ සතරඅදනෙක්ද; සෞතාපත්තිමාර්ගීසටය, ඵලසටය,සකෘ දාගාම් මාර්ගීසටය, ඵලසටය, අනාගාම් මාර්ගීසටය. ඵලසටය, අර්හත් මාර්ගීසටය, ඵලසටයයි, ආර්‍යපුද්ගලයෝ අටදෙනෙක යන මේ දෙවැදෑරුම් පුද්ගලයන්ගේ සඛ්‍යාව දෙළෙසෙක්වෙයි. ඒ දෙළොස් පුද්ගලයන් අතුරෙන් සතර අපායභූමියෙහි වාසය කරන්නාවූ සත්ව ජාතීන්ගේ සංඛ්‍යාව යම් උපමාවකින් හෝ ගණන් ක්‍රමයකින් හෝ නොදතහැක්කේය. නොකිය හැක්කේය. ඒවි උදාහරණයක් නම්:—අප ඉදිරියෙහි වසන්නාවූ දිස කොඩ සත්වයන්ගේ හෙවත් තිරිසන් අපායගත සත්වයන්ගේ ජාති සංඛ්‍යාව ගණන් නොතැබිය හැක්කේය. එසේම අපගේ ඇසට විසය නොවන්නාවූ ත්‍රිවිධාපායවාසී සත්වයන්ගේ ජාති සංඛ්‍යාව උපමාවක් නැත්තේයි. එක එක ජාතියෙහි උපදනාවූ එක එක සත්වයාවයෙන් ගණන් ගතහැත් අනන්තාප්‍රමේය්‍ය වෙයි. එහෙයින්"සත්තවිසයොඅවින්තියෝ"යනු වදාළේයි. ඒසතර අපායවාසී සත්වයන්ගේ පවිසන්ධිය උඩවව සඟගත අකුශලය හැර අවශෙෂවූ එකොළොස් අකුශල කම්ඔන්ගේ ශක්තියෙන් අකුශල විපාක උපෙක්ෂා සන්තීරණ චිත්තයෙන්මඟන්නේයි. එඟයින් සතර අපායවාසී සත්වයන්ට එකත්ත සඤ්ඤීඅසිකඅති. නානත්තකායාඅසි ව්‍යවහාරකෙරෙති. එකත්තසඤ්ඤී යනු එකම උපෙක්ඛා සඟගත සන්තීරණය යන අර්ථයි. නානත්තකායා යනු අනෙක ප්‍රකාර ශරීර සවඟන් ඇත්තාවූ සත්ව සමූහයෝය යන අර්ථයි. මේ අකුශල විපාක උපෙක්ඛා සන්තීරණ චිත්ත යෙන් සත්සිඅයක් ඔදුන් දිඟ ඇත්තාවූ ආනන්ද මත්ස්‍යාදී මහත් ආත්මභාව ඇත්තාවූ සත්වයෝද, මෙත්ත සූත්‍රාදියෙහි "අණුක ථූලා" යනාදී තන්හි මෙඅසට නොපෙණෙන්නාවූ කුඩා සත්වයෝද කෙසේ උපදින්නාහුදැයි විමතිය ඉපදිය යුතුවෙයි. සියලුම සත්වයන්ගේ උත්පත්තිය සියලු භව යොනි ගති සීති සත්වාවසයන්ට සුදුසු පරිදිදෙන් උපදනාහුයයි දතයුතුයි. එහෙයින් එකම උපෙක්ඛා සන්තීරණ චිත්තයෙන් ඔදුන් සිය

ගණන් ආත්මභාව ඇත්තාවූ සත්වයෝද, ඇසට නොපෙණෙන් නාවූ සියුම් සත්වයෝද, අපාද දිපාද චතුප්පාද බහුප්පාද සත්වයෝද, ඒ ඒ යොනියට සුදුසු පරිද්දෙන් උපදනාහුයයි දත යුතුයි. ඒ සත්වයන්ගේ නාමකාය උපෙක්ඛා සන්තීරණ චිත්තයෙන්ද, රූපකාය යොනියෙන්ද, හටගන්නා බැවින් ඒ ඒ යොනියෙහි ඇත්තාවූ සභාවයෙන් ඒ සත්වයන්ගේ ශරීර සතහන් ආදිය හටගන්නාබව දතයුතුයි. උපෙක්ඛා සන්තීරණ චිත්තයෙන් පටිසන්ධියගන්නාවූ සියලු අපායයිහ සත්වයන්ගේ භවාඞ්ග චුතියහුද එම චිත්තයෙන්ම වන්නේයයි දතයුතුයි. ඒ දුගති අහෙතුක පුද්ගලයන් කෙරෙහි ප්‍රවෘත්ති කාලයෙහි උපදනා චිත්තයෝ නම්:—දෙලොස් අකුශල චිත්තයෝය, හසිතොත්පාද චිත්තය හැර අවශෙෂ අහෙතුක සිත් සතළොසය, මහා කුශල අටය, යනමේ දෙතිස් චිත්තයෝ තුමූ සුදුසු පරිද්දෙන් උපදනාහුවෙත්. ඒ සතර අපායවාසී සත්වයන්ගේ ආයුෂවකාහි නියමයෙක් නැත්තේයි "අපායිකානං සත්තානං ආයු පරිච්ඡෙදෙ නත්ථි. යාව අකුසලකම්මං නඛීයති තාවච්චනාභාවතො"යි සුචිත්තාලඞ්කාරයෙහි ආහෙයින්ද,

"අපායික මනුස්සාශ්‍ය—පරිච්ඡෙදෙ නවිජ්ජති;
තථාහිකාලො මඤ්ඤාය—යකඛාකෙච් විරූයුතො."

යන සච්චඞ්ඛප ගාථාවෙන් තිරිසන් අපායෙහි උපන්නාවූ මහාකාලඤාගරාජ ආදෙමේ කල්පායුෂක බව පෙණෙන හෙයින්ද, වැසිකිළි ආදයෙහි කුණුමස් ආදියෙහි උපදනාවූ සියලු පණුවගීයෝ ඉපද සත් දවසකින් වයොවෘඞ්ව මරණයට යනබව පෙණෙන හෙයින්ද, යම්තාක් අකුශලකර්ම නොඉවේ නම් ඒතාක් අපායෙන් චුත නොවේයයි දතයුතුයි.

අපාය පරිච්ඡේදය නිමි.

"සතිසූර බ්‍රහ්මචරිය යොගාභ්‍යතාහි ගුණෙහි උත්තරිතරඤ්ඤතාය මනොඋස්සන්නතං එතෙසනති මනුස්සා" යනු නිදීවක බැවින් මනුෂ්‍යයන්ට ඇත්තාවූ පවකාම සම්පත්තියට වඩා විශිෂ්ටවූ ප්‍රණීතවූ පවකාම සම්පත්තියක් දෙවියන්ට ඇත්තේ නමුදු මනුෂ්‍යයෝ තුමූ උපසම්පදාදී ශ්‍රෙෂ්ඨ ශීලයන් රක්ෂාකිරීම පිණිසද නොයෙක් ගුණයෙන් උතුම්වූ සිත් ඇතිහෙයින් අතිශයින් උතුම්වූ සමාධි ප්‍රඥාගුණයට පැමිණියාවූ සම්‍යක් සම්බුද්ධ ප්‍රත්‍යෙක බුද්ධ අශ්‍රශ්‍රාවක මහාශ්‍රාවකා තුමූදිහු මනුෂ්‍ය යොනියෙහිම උපදනා

හෙයින් උත්සන්නවූ සිතක් ඇත්තේය යන අර්ථයෙන් "මනුස්ස" නම්වෙයි. නොහොත් ලෝක ශබ්දයාගේ අර්ථයදන්නාවූ පුරුතන ආචාර්‍යවරයෝ තුමූ මේ ලෝකයෙහි පළමුවෙන් පහළවූ මනු නම් ඇත්තාවූ රජුගේ පුත්‍රවූ බැවින්ද, මනුෂ්‍යයයි කීවාහුය. ඒ මනුෂ්‍යයන්ගේ වාසස්ථානවූ පන්සියයක් කුඩා දිවයින් පිරිවරකොට ඇත්තාවූ සතරමහා ද්වීපය මනුෂ්‍ය භූමිනම්වෙයි. "මාතුම්මහාරාජික භූමි" යනු "මනුස්ස භූමිතෝ චතාළීස සහස්ස යොජනෙ ගුහඤ්චරපබ්බමාණෙ ඨානෙනිඨිති" යනු සුචිත්තාලඞ්කාරයෙහි දා බැවින් මනුෂ්‍ය භූමියෙන් දෙසාළිස් දහසක් යොදුන් උස්වූ ගුහඤ්චර පර්වතය හා සමානවූ මහාමේරු පර්වතයාගේ පස්වෙනි ඇලිඳයෙහි මාතුම්මහාරාජික භූමිය පිහිටියේයි. ඒ මාතුම්මහාරාජික භූමිය වනාහි නොයෙක් ආකාරයෙන් නොයෙක් තන්හි පිහිටියාවූ නොයෙක් විමානයෝද මාතුම්මහාරාජික යයි ව්‍යවහාරකෙරෙති. නොයෙක් පර්වත ඝඩිකා සමුද්‍රවෘක්ෂාදිය ආශ්‍රයකොටකොණ වසන්නාවූ සියලුභූම්‍යට්ඨ දෙවියෝද, මාතුම්මහාරාජික භූමියෙහි ඇතුලත්වෙති. දුහෙතුක ලෞකික කාමාවචර කුශල කර්මබලයෙන් අහෙතුක කුශල විපාක උපෙක්ඛාසන්තීරණ සිතින් පටිසන්ධිගන්නාවූ භූමිනිශ්‍රිත විනිපාතික අසුරයයි කියන ලද්දාවූ ඥති ප්‍රේත සමූහයාද කුශල කර්මානුභාවයකින්ම උපන් හෙයින් අපායෙහිද ඇතුලත් නොකොටහැකි වෙති. මනුෂ්‍ය යෝනියෙහි නුපන් හෙයින් මනුෂ්‍ය භූමියෙහිද ඇතුලත්නොකට හැකිවෙති. එහෙයින් ඔවුන් මාතුම්මහාරාජිකයෙහිම ඇතුලත්කටයුත්තාහුය. එබැවින් පෘථිවිතලය ඒවුන් යුගන්ධර පර්වතය දක්වා සියලු භූම්‍යට්ඨ ආකාශස්ථ දෙවියන්ගේ වාසස්ථානයෝ තුමූ මාතුම්මහාරාජික භූමියෙහි ඇතුලත්වෙති. එනැන් පටන් දෙසාළිස් දහසක් යොදුන් ඔබ තන්හි තවතිසා භවනයද එනැන් පටන් මතු දිව්‍ය ලෝකයන්ගේද අතරතුර දෙසාළිස් දහසක් යොදුන්ම ඇති වන්නාහුය. "චතූ මහාරාජේසු හවති යෙසං චතුන්නං මහාරාජානං නිවාසට්ඨානතුතෙ චතුමහාරාජේ හවන්ති–චාතුම්මහාරාජිකා" යනු නිර්වචන බැවින් සිව්වරම් රජදරුවන්ව යෙදෙරවකට යුතු බැවින්ද, සිව්වරම් රජුන්ගේ නිවාසස්ථානවූයෙහින්ද, මාතුම්මහාරාජිකනම්වේ. තාවතිංසා යනු "මඝෙන මානවෙන සඞ්ගං තෙතතිංස සහපුඤ්ඤකාරිනෝ එත්ථනිබ්බත්තාති තං සහචරිත ඨානං තෙතතිංසෝ"යි නිර්වචන බැවින් මඝමානවකයා ප්‍රධාන කොට ඇත්තාවූ එක්ව පින්කම්කළාවූ තෙතිස්දෙනාගේ උත්පත්තිස්ථානවූහෙයින් "තෙතතිංස"යයි කියයුතුනන්හි මහා

ප්‍රදේශ සූත්‍රයෙන් තාවතිංසා යනු ආදේශකොට උපචාරවශයෙන් "තාවතිංසාභූමි" යයි කියනලදී "දුක්ඛස්සා යාතා අපයා තාති යාමා යනු නිර්වචන බැවින් දුකින් පහවූ හෙයින් ඒ දෙව් යෝයාමනම් වෙත් "අත්තනෝ සිරි සම්පත්තියා තුසංපිතං ඉතා ගතාති තුසිතා" යනු නිර්වචන බැවින් තමන්ගේ ශ්‍රී සම්පත්තිය කරණකොටගෙණ ප්‍රීතියට පැමිණියාවූ හෙයින් තුසිතයැයි වෙයි. "නිම්මාණෙරති එතෙසනති නිම්මානරතිනෝ" යනු නිර්වචන බැවින් තමන් විසින් නිර්මිත කරගන්නා ලද්දාවූ ශ්‍රී සම්පත්තියෙහි ඇලෙන හෙයින් ඒ දෙවියෝ නිම්මානරති නම් වෙත් ඒ දෙවියන්ට වාසස්ථානවූ භූමිතොමෝ නිම්මානරති භූමියැයි වේ. 'පරනිම්මිතෙසු හොගෙසු අත්තනෝ දිසං වත්තනතීති පර නිම්මිත වසවත්තිනෝ"යනු නිර්වචන බැවින් අනුන් විසින් නිර්මිත කරණ ලද්දාවූ ශ්‍රී සම්පත්තිය තමාගේ වසඟයට පමුණුවන හෙයින් ඒ දෙවියෝ පරනිම්මිත වසවත්ති නම් වෙත්. ඒ දෙවියන්ට වාසස්ථානවූ භූමිතොමෝ "පරනිම්මිත වසවත්තී" නම් වේ. මෙසේ දක්වන ලද්දාවූ මනුෂ්‍ය භූමිය හැර විවිධ කාම සවණීය යන භූමිහු සත්දෙන "අනෙකවිධ සම්පත්ති අධිට්ඨානතාය සොභනා ගනානබ්බතෝ උපගනන්තබ්බතෝ ගතීති සුගතී" යනු නිර්වචන බැවින් අනෙකප්‍රකාරවූ සම්පත්තියට ආධාරස්ථානවූ හෙයින්ද ශොභන සඞ්ඛ්‍යාතවූ කාමාවචර මහා කුසල කර්ම හෙතුවෙන් පැමිණිය යුතුහෙයින් පවිසන්ති ලැබියයුතු හෙයින් කාම සුගති යයි ව්‍යවහාර කරණ ලැබේ. ඒ සප්තප්‍රකාරවූ කාමසුගති භූමීන් අතුරෙන් මනුෂ්‍යභූමිය චාතුමහාරාජිකභූමිය යන භූමිවලයි යම් කියන ලද්දාවූ දෙලොස් වැදෑරුම්වූ පුද්ගලයන් අතුරෙන් දුගති අහෙතුක එකම පුද්ගලයෙකු හැර අවශෙෂ එකොලොස් පුද්ගලයෝම ලැබිය යුත්තාහුය. තාවතිංස භවනය පටන් වශවර්ත්ති දිව්‍යලොකය දක්වා මේ පවභූමියෙහි දුගති අහෙතුක සුගති අහෙතුක දෙදෙන හැර අවශෙෂවූ දසවැදෑරුම් පුද්ගලයෝම ලැබිය යුත්තාහුය ඒ කාමසුගති පුද්ගලයන් අතුරෙන් පවිසන්ති චිත්ත බිඳුවෙහි හවඟන්නාවූ අණ්ඩජ සත්වය, කලල සඞ්ඛ්‍යාතවූ මඩෙහි දලබුව් නිශ්‍රයසෝට හවඟන්නාවූ ජලාබුජසත්වය, යන මේ ත්‍රිත්වයන් දෙදෙනාගට චක්ඛුරෙන්ද්‍රියාදිවූ ඉන්ද්‍රිය රූපයන්ගේ හටගැණීමට සුදුසුකාල යෙහි ඒ චක්ඛාදි ඉන්ද්‍රියයන් වලක්වන්නාවූ අකුසලකර්මය විසින් තමාගේ විපාකය පවිසන්තිකාලයෙහි දෙන හෙයින්ද ඒ කර්මයෙන් අන්‍යවූ ප්‍රවෘත්ති කාලයෙහි අතීත විපාක දියහැකිවූ අකුසලකර්ම හෙතුවෙන්ද චක්ඛුරාදි ඉන්ද්‍රියයෝ ජාත්‍යන්ධාදී සත්වයන්ටද, පවිසන්ති වශයෙන් බිහිවිවන්නාවූද, පවිසන්ති

විශයෙන් පණ්ඩකවශ්‍යාවූද, උභතෝබ්‍යඤ්ජනකවශ්‍යාවූද, කථාකිරීමෙහි අදක්ෂවූ සත්ත්වයන්වද, භූමිනිශ්‍රිතවූ දෙවියන්වද, විනිපාතික අසුරයන්වද කුශල විපාක උපෙක්ඛා සහගත සන්තීරණ චිත්තයෙන් අහෙතුක ලෞකික කාමාවචර කුශල කර්ම හෙතුවෙන් පටිසන්ධිගෙණ ඒ භවයෙහි වසනතාක්කල් මුලුල් ලෙහි එම චිත්තයම භවාඞ්ගවශයෙන් ඉපිද මරණ කාලයෙහි එම චිත්තයම චුතිවශයෙන් උපදී. කාමාවචර මහාවිපාකයෝ අටදෙනාවනාහි සප්තකාම භූමියෙහිම උපදනා සත්ත්වයන්ට පටිසන්ධි භවාඞ්ග චුතිවශයෙන් උපදනාහුවෙත් මේ මහාවිපාකයෝ අටදෙන හා යවකී ජාත්‍යන්ධාදී මනුෂ්‍යයන්ගේ හා විනිපාතික අසුරයන්ගේද පටිසන්ධි ශන්නාවූ උපෙක්ඛා සන්තීරණ චිත්තයද, යන මේ නව චිත්තයම කාමසුගති පටිසන්ධි නවයයි ව්‍යවහාර කෙරෙත්. කාමසුගති ඒකොළොස් පුද්ගලයන් අතුරෙන් සුගති අහෙතුක පුද්ගලයා කෙරෙහි උපදනා චිත්තයෝ නම්:- දෙළොස් අකුශල චිත්තය, හසිතෝත්පාද වර්ජිත අහෙතුක සත්තළොස් චිත්තය, මහා කුශල් අටය, ඥාන සම්ප්‍රයුක්ත මහා විපාක වර්ජිත කොට ඥානවිප්‍රයුක්ත සතර මහා විපාක චිත්තයෝද, යන මේ එක් සාළිස් චිත්තයෝම ගතගන්නාහු වෙති. දුහෙතුක පුද්ගලයා කෙරෙහිද යථොක්ත එක්සාළිස් චිත්තයම් ලැබෙත්. ධ්‍යානලාභී නොවූ ත්‍රිහෙතුක පුද්ගලයාහට යථොක්ත එක්සාළිස් චිත්තයෙහි ඥානසම්ප්‍රයුක්ත මහා විපාක සතර මහා පන්සාළිස් චිත්තයෙක්ම උපදනාහුයයි දතයුතුයි. ධ්‍යානලාභීවූ ත්‍රිහෙතුක පුද්ගලයාහට යථොක්ත පන්සාළිස් චිත්තයෙහි මහග්ගත කුශල් නවය මහා සුපණ්ණ සිත්කෙනෙක් උපදනාහුයයි දතයුතුයි. ශ්‍රෝතාපත්ති මාර්ගඨ පුද්ගලයා කෙරෙහි ශ්‍රෝතාපත්ති මාර්ග චිත්තයක්ම අධික වශයෙන් යෙදිය යුතුයි. ධ්‍යානලාභී නොවූ ශ්‍රෝතාපත්ති ඵලස්ථ පුද්ගලයා කෙරෙහි දිළිඟත විප්‍රයුක්ත සිත් සතරය, වෙළ මූලික දෙසිතය, උඛවව සම්ප්‍රයුක්ත චිත්තය හසිතෝත්පාද වර්ජිතවූ සතළොස් අහෙතුක චිත්තය, මහාකුශල් අටය, මහාවිපාක අටය සෝතාපත්තිඵල චිත්තයයන මේ එක්සාළිස් චිත්තයෝ උපදනාහු වෙත්. ධ්‍යානලාභීවූ සෝතාපත්තිඵලස්ථ පුද්ගලයා කෙරෙහි යථොක්ත එක්සාළිස් චිත්තයෙහි මහග්ගතකුසල් නවයඛහා සම්පණ්ණ සිත්කෙනෙක්උපදනාහුයයිදත යුතුයි. සකෘදාගාමී මාර්ගස්ථ පුද්ගලයා කෙරෙහි සකෘදාගාමී මාර්ග චිත්තයම ලැබෙයි. ධ්‍යානලාභී නොවූ සකෘදාගාමී ඵලස්ථ පුද්ගලයා කෙරෙහි දිළිඟත විප්‍රයුක්ත සිත් සතර, වෙළ මූලික දෙසිතය, උඛවව සම්ප්‍රයුක්ත සිතය; හසිතෝත්පාද වර්ජිත සත

ලොස් අහෙතුක චිත්තය, මහාකුශල් අවය, මහා විපාක අවය ශකෘදගාම් ඵල චිත්තය යන එක්සාළිස් සිත්කෙතෙක් උපදනාහු වෙත්. ධ්‍යානලාභීවූ ශකෘදගාමි පුද්ගලයා කෙරෙහි එක්සාළිස් චිත්තයෙහි මහාගත කුශල් නවය බහා සමපණස් සිත්කෙතෙක් උපදනාහුයයි දතයුතුයි. අනාගාමී මාගීඨ පුද්ගලයා කෙරෙහි අනාගාමී ඵලචිත්තය උපදනේ වෙයි. ධ්‍යානලාභී නොවූ අනාගාමී ඵලසථ පුද්ගලයා කෙරෙහි දිෂ්ඨගත විප්‍රයුක්ත සහරග උඛ්ඛවසගගත චිත්තය, හසිතොත්පාද වර්ජිත අහෙතුක සතලොසයමහාකුශල්අවය, මහාවිපාක අවය, අනාගාමී ඵල චිත්තය යන එකුන්සාළිස් සිත්කෙතෙක් උපදනා හු වෙත්. ධ්‍යානලාභීවූ අනාගාමී පුද්ගලයා කෙරෙහි ඒ එකුන්සාළිස් චිත්තයෝ උපදනාහුයයි දතයුතුයි. අර්හත්මාගීඨ පුද්ගලයා කෙරෙහි අර්හත් මාගී චිත්තය උපදනේයි. ධ්‍යානලාභී නොවූ අර්හත්ඵලසථ පුද්ගලයා කෙරෙහි අවලොස් අහෙතුක චිත්තය, මහා විපාකඅවය, මහා ක්‍රියා අවය, අර්හත්ඵල චිත්තය, යන පන්සිස් චිත්තයෝ උපදනාහු වෙත්. ධ්‍යානලාභීවූ අර්හත්ඵල පුද්ගලයා කෙරෙහි යථොක්ත පන්නිස් චිත්තයන්ගෙහි මහද්ගත ක්‍රියා නවය බහා සුසාළිස් සිත්කෙතෙක් උපදනාහුයයි දතයුතුයි. දෙලොස් පුද්ගලයන් අතුරෙන් මාගීඨ ඵලසථ අවබෙදනා කෙරෙහි මාගීඨ පුද්ගලයන් සතරදෙන වනාහි තම තමන්ගේ එකම මාගී චිත්තක්ෂණයෙහිම මාගීඨඵයයි ව්‍යවහාර කෙරෙති. මාගීඨ හා ඵල චිත්තයාගේද අතර කාලය ඇසිපිය හෙලීමය, අසුර ගැසීමය, විදුලිය යන කිසිවෙකින් උපමා කතෘකව හැකි වේ. උපපාදථිනි භඞ්ග සඞ්ඛ්‍යාත ක්ෂණත්‍රයකින් යුකතවූ මාගී චිත්තයෙන් අනන්තර ප්‍රත්‍යය ලැබ ඵල චිත්තය උපදනා හෙයින් ඵලසථයන් මුත් මාගීඨ පුද්ගලයෙක් නොලැබෙමැයි. යම්කිසිවෙක් විසින් ආඥාමාගීඨ පුද්ගලයෙකු මරමිසි සිතා ආයුධයක් හෙණ ක්‍රීවයෙහි තබා මාගීක්ෂණයෙහි ජීවිතක්ෂයට පමුණුවම්හයි උත්සාහ කෙළේ නමුදු ඒ මාගීක්ෂණයෙහි මරණය සිඳ නොකට හැකිවෙයි. එසේමමාගීඨ පුද්ගලයෙක් හට දන්දෙම්හි සිතා උත්සාහ කෙළේ නමුදු මාගීචිත්තක්ෂණයෙහි දන් දිය නොහැකි වෙයි. යමෙක් මාගීක්ෂණයෙහි දන් දෙනු කැමැත්තේවිනම් මසකප්‍රාප්ත විදර්ශනා ඇති යොගාවචර තෙමහට නිරනතරයෙන් දන්දෙන්නේවි නම් ඔහුගේ දානය බලද භාවනා කරන්නාවූ කල්හී මාගීඨ ප්‍රත්‍යක්ෂ කෙළේවිනම් ඒ මාගීඨඵඨාහට දන් දුන්නේ නම් වෙයි. ඒ ඵලසථ පුද්ගලයන් සතරදෙනා අතුරෙන් සොතාපන්න ඵලසථ පුද්ගල තෙමේ ධ්‍යාන ලාභී සොතාපත්තිඵඨයාය, ධ්‍යානලාභී නොවූ සොතාපත්තිඵඨයායයි

මිස්සකාර වනයෙහිත් ධ්‍යානලාභී සෝවාන් පුද්ගල තෙමේ මේ මනුෂ්‍ය භූමියෙහි කියනලද කාම භූමියෙහි එක්වරකුදු පටිසන්ධි නොගෙණ මේ භවයෙහිම මතු මාගිත්‍රය ප්‍රත්‍යක්ෂ කොට අර්හත් ඵල නිර්වාණ ධර්මයට පැමිණෙයි. රූපභූමි අරූපභූමියෙහි හෝ ඉපිද එහිදී රහත්ව නිවණට හෝ පැමිණෙයි. එහෙයින් ධ්‍යාන ලාභී සෝවාන් පුද්ගලයාගේ ප්‍රභේදයක් නැත්තේයි. ඛ්‍යාන ලාභී නොවූ ශුෂ්ක විදර්ශක සෝවාන් පුද්ගලයා වනාහි එකබීජී සොතාපන්නයා, කොලංකොල සොතාපන්නයා, සත්තක්ඛත්තු පරමයයි ත්‍රිවිධාකාර සෝවාන් පුද්ගල කෙනෙක් වෙත්, ඔවුන් අතුරෙන් සෝවාන් වීමට අනතුරුව මේ මනුෂ්‍ය ලොකයෙහි හෝ දිව්‍යලොකයෙහි හෝ එක්වරක්ම පටිසන්ධි ගෙණ ඒ ආත්ම යෙහි රහත්ව නිවන් දක්නා සෝවාන් පුද්ගල තෙමේ එකම ප්‍රතිසන්ධි බීජයක් ඇතිහෙයින් එකබීජී සොතාපන්න නම් වෙයි. සෝවාන්වීමට අනතුරුව මේ මනුෂ්‍ය භූමියෙහි හෝ දිව්‍යලොක යෙහි හෝ ඒ දිව්‍ය මනුෂ්‍ය භව දෙතැන්හිම හෝ දෙවරක් හෝ තුන්වරක් හෝ සතර වරක් හෝ පස්වරක් හෝ සයවරක් හෝ පටිසන්ධිගෙණ ඒ සමෙහි ආත්මභාවයෙහි අර්හත් ඵලය සාක්ෂාත් කරන්නාවූ සොතාපන්න තෙමේ කොලඞ්කොල නම් වෙයි. සෝවාන් ඵලයට පැමිණීමට අනතුරුව මනුෂ්‍ය භූමි හෝ දිව්‍යභූමිහෝ ඒ දෙක්හිම හෝ මිශ්‍රව සත්වරක් පටිසන්ධි ගෙණ සත්වෙනි අත්බැව්හි රහත්ව නිවන් දක්නා සොතාපන්න තෙමේ සත්තක්ඛත්තු පරමසොතා පන්නනම් වේයි. මේසොතාප න්න අංශී පුද්ගලයා සඳහා "නතෙහවං අට්ඨමං ආදියනති" යන දෙශනා ක්‍රමයෙන් අටවෙනි භවයෙහි නූපදනේය යන නියමය කාම භවය සඳහාම ගතයුත්තේයි. මනුෂ්‍ය ලොකයෙහි සෝවාන් ඵලයට පැමිණ ප්‍රථම ධ්‍යානය උපදවා ගෙණ බ්‍රහ්ම පාරිෂද්‍ය භූමි යෙහි උපන්නාවූ සෝවාන් පුද්ගල තෙමේ ඉදින් කැමති වී නම් පසළොස් රූපාවචර භූමියෙහි පසළොස් වරක්ද, පවත්තුඩාවාස යෙහි අනාගාම්ව. පස්වරක්ද මෙසේ විසි අත්බැවිහි ඉපිද අක නිට්ඨ බ්‍රහ්මලෝකයේදී රහත්ව පිරිනිවන් පාණට හැකිවෙයි.

ශුෂ්කවිදර්ශී සෝවාන් පුද්ගල තෙමේද ධ්‍යානලාභී ශුෂ්ක කාමියාසේ, ශුෂ්කවිදර්ශීසෝවාන් ශුෂ්ක කාමියාසේ දෙවැදෑරුම් වෙයි. ඔවුන් අතුරෙන් ධ්‍යානලාභී ශුෂ්කකාමී තෙමේ මනුෂ්‍යලොක යෙහි හෝ දිව්‍යලොකයෙහි හෝ එක්වරකුදු පටිසන්ධි නොගෙණ ඉදින් කැමති වී නම් මේ භවයෙහිම රහත්ව නිවන් දක්නට පොහොසත් වෙයි. රූපභූමි අරූපභූමියෙහි හෝ ඉපිද එහිදී රහත්ව නිවන් දක්නටද පොහොසත් වෙයි. එහෙයින් ධ්‍යාන්

ලාභී ශකෘදගාමිහුගේ ප්‍රභෙදයක් නැත්තේය. *ඛ්‍යානලාභී නොවූ ශකෘදගාමී පුද්ගලයන් අතුරෙහි මේ මනුෂ්‍යභූමියෙහිම ශකෘදගාමි ඵලයට පැමිණ මෙහිදී අර්හත්ඵලය සාක්ෂාත්කරන්නාවූ ශකෘදගාමී පුද්ගලයෙක්ද ඇත්තේය, දිව්‍යලෝකයෙහිදී ශකෘදගාමි ඵලයට පැමිණ දිව්‍යලෝකයෙහි රහත්වන්නාවූ ශකෘදගාමී පුද්ගලයෙක්ද ඇත්තේය. මනුෂ්‍යලෝකයෙහි ශකෘදගාමිවූ පුද්ගලතෙම එක්වරක් දිව්‍යලෝකයෙහි පටිසන්ධිගෙණ එහිදී රහත්වන ශකෘදගාමී පුද්ගලයෙක්ද ඇත්තේය, දිව්‍ය ලෝකයෙහිදී ශකෘදගාමීව මනුෂ්‍ය ලෝකයෙහි ඉපිද රහත්වන ශකෘදගාමී පුද්ගලයෙක්ද ඇත්තේය. නැවත මනුෂ්‍යලෝක යෙහි ශකෘදගාමීව දිව්‍යලෝකයෙහි එක්වරක් පටිසන්ධිගෙණ එයින් චුතව මනුෂ්‍යලෝකයෙහි ඉපිද මෙහිදී රහත්වන ශකෘදගාමී පුද්ගලයෙක්ද ඇත්තේය. මෙසේ ඛ්‍යානලාභී නොවූ ශකෘදගාමී පුද්ගලයාගේ ප්‍රභෙදපසෙක් ඇත්තේ වෙයි.

ශකෘදගාමී විභාගය යි.

අනාගාමී ඵලස්ථ පුද්ගල තෙමේ ඛ්‍යානලාභී සමථයානික අනාගාමී පුද්ගලයාය, ඛ්‍යානලාභී නොවූ ශුෂ්ක විදර්ශක අනාගාමී පුද්ගලයායයි දෙවැදෑරුම් වේ. ඔවුන් අතුරෙන් ඛ්‍යානලාභී නොවූ අනාගාමී තෙමේ මනුෂ්‍යලෝකයෙහි හෝ දිව්‍යලෝක යෙහි හෝ එක්වරකුදු පටිසන්ධි නොගෙණ ඉදින් කැමති වී නම් මේ භවයෙහිදීම රහත්ව නිවන් දක්නේය. රූපාරූප භූමියට හෝ පැමිණ එහිදී රහත්ව නිවන් දක්නා අනාගාමී පුද්ගලයෙක් ඇත්තේය. එහෙයින් ඛ්‍යානලාභී අනාගාමී පුද්ගලයාගේ ප්‍රභෙදයෙක් නැත්තේය. ඛ්‍යානලාභී නොවූ ශුෂ්ක විදර්ශක අනාගාමී පුද්ගලයා එකාහි අන්තරාපරිනිබ්බායී අනාගාමීය. උපහච්චපරිනිබ්බායී අනාගාමීය, අසඞ්ඛාර පරිනිබ්බායී අනාගාමීය, සසඞ්ඛාර පරිනිබ්බායී අනාගාමීය, උඩ්ඪංසෝත අකනිට්ඨගාමී අනාගාමීයයි පවප්‍රකාර වන්නේය. ඔවුන් අතුරෙන් යම් අනාගාමී පුද්ගලයෙක් තෙමේ පව සුඛාවසයන් අතුරෙන් යම්කිසි භූමියක පටිසන්ධිගෙණ එහි නියමිත ආයුෂයාගේ මධ්‍යයට නොපැමිණ පූර්වභාගයෙහි රහත්ව නිවන් දක්නේවිනම් ඒ අනාගාමී තෙමේ අන්තරාපරිනිබ්බායී

* සකිං එකවාරං පටිසන්ධිවසෙන ඉමං මනුස්ස ලෝකං ආගච්ඡතීති සකදගාමී, ඉධපත්වා ඉධ පරිනිබ්බායි, තත්ථ පතවාතත්ථ පරිනිබ්බායි, ඉධ පත්වා තත්ථ පරිනිබ්බායි, තත්ථපත්වා ඉධ පරිනිබ්බායි, ඉධපත්වා තත්ථ නිබ්බත්තිවා ඉධ පරිනිබ්බායීති පංචසු සකදගාමීසු.

නම් වේ. යම් අනාගාමියෙක් තෙමේ සුඛාවාසභූමීන් අතුරෙන් යම් භූමියක ඉපිද එහි නියම ආයුෂයාගේ කෙළවරට පැමිණ රහත්ව නිවන් දක්නේ වීනම් ඒ අනාගාමී තෙමේ උපහච්ච පරිනිබ්බායි නම් වේ යම් අනාගාමී පුද්ගලයෙක් එතෙමේ මේ පවසුඛාවාසයන් අතුරෙන් යම්කිසි භූමියක ඉපිද විදර්ශනා භාවනා කිරීම් සඛ්‍යාත උත්සාහය කොට රහත්ව නිවන් දක්නේවීනම් ඒ අනාගාමී තෙමේ අසඛ්කාර පරිනිබ්බායි නම් වේ. යම් අනාගාමී පුද්ගලයෙක් තෙමේ සුඛාවාස භූමියක ඉපිද විදර්ශනා භාවනා කිරීම් සඛ්‍යාත උත්සාහ කොට රහත්ව නිවන් දක්නේ වී නම් ඒ අනාගාමී තෙමේ සසඛ්කාර පරිනිබ්බායි නම් වේ. යම් අනාගාමී පුද්ගලයෙක් තෙමේ කාමධාතුවෙන් එතරව අවිහ බඹලොව ඉපිද එහි කැමතිතාක් වැස අතපප, සුදස්ස, සුදස්සි, අකනිඨ යන සතර සුඛාවාස භූමියෙහි ඉපිද ආයු ඇතිතාක් එහි වැස රහත්ව නිවන් දක්නේ වී නම් ඒ අනාගාමී තෙමේ උඛංසොත අකනිඨගාමී නම් වේ.

මේ අනාගාමී පුද්ගල විභාගයයි.

අතීත්ඵලසට පුද්ගල තෙමේද ධ්‍යානලාභී රහත්හුය, ධ්‍යාන ලාභී නොවූ රහත්හුයයි දෙවැදෑරුම් වේ. ඒ ධ්‍යානලාභී රහත් තෙමේ සමථයානිකය හෙවත් ධ්‍යානිකයයි කියති. ධ්‍යානලාභී නොවූ රහත්තෙමේ ශුෂ්ක විදර්ශකයයි කියති. එතකුදු වුවත් රහතන්වහන්සේ සියලු ක්ලේශ නැසූ හෙයින් පිරිනිවීමෙන් මතු සෙසු ආර්‍යයන්ගේ මෙන් විශෙෂයක් නැතැයි දතයුතුයි. මේ සතර ආර්‍ය පුද්ගලයන් විසින් ඒ ඒ භාගීයෙන් නසන්නාවූ ක්ලේශයන්ගේ විභාගය යට චිත්තපරිච්ඡේදයෙහි උපමා උපමෙය සමග දක්වන ලද්දේය.

ඒසපනකාම භූමියෙහි උපන්නාවූ සත්වයන්ගේ ආයුපරිච්ඡේදය මෙසේයි. "මනුස්සානම්පි ආයුපරිච්ඡෙදෙ නත්ථි. කදාචි උකකට්ඨවසෙන අසඞ්ඛ්‍යෙය්‍යායුකත්තාව කදාචි ඔමකවසෙන දස වස්සායුකත්තාව" යනු සුචිත්තාලඞ්කාරයෙහි ආ බැවින් මනුෂ්‍යයන්ට ඇතැම් කලෙක්හී උත්කර්ෂ වශයෙන් අසඞ්ඛ්‍යායුෂද යවත්පිරිසෙසින් දසවස්සායුකද වන හෙයින් මනුෂ්‍යයන්ට නියමවූ ආයුපරිච්ඡේදයෙක් නැත්තේයි. "භුම්මදෙවානම්පි ආයුපරිච්ඡෙදොත්ථි" යනු කී හෙයින් භූමාට්ඨදෙවියන්ටද කුශල කර්ම නොගෙවා තාක් ඒ දිව්‍යාත්මයෙන් චුතවීමක් නැත්තේයි. එහෙයින් ඇතැම් භූමාට්ඨදෙවියෝ සත්දවසක් පමණද,

ඇතැම් භූමිවල දෙවියෝ කල්පයක් පමණද ජීවත්වන හෙයින් භූමිවල දෙවියන්වද ආයුෂ්පරිච්ඡේදයක් නැත්තේමි. චාතුම්මහාරාජිකය, තාවතිංසය, යාමය, තුෂිතය, නිම්මාණරතිය, පරනිම්මිතවශවර්තිය යන ෂඩ්කාම සවර්ගයෙහි දෙවියන්ට වෙන වෙනම ආයුෂ ඇත්තෙමි. මිනිස් ගණනින් පණස් අවුරුද්දක් චාතුම්මහාරාජික දිව්‍යලෝකයෙහි එක් දවාලක් හා එක් රැයක්ද වෙමි. ඒ ගණනින් තිස්දවසෙක් මාසයෙක්ද, දෙළොස් මාසයෙක් හවුරුද්දෙක්ද ඒ ප්‍රමාණයෙන් පන්සියයක් හවුරුදු චාතුම්මාරාජික දිව්‍යලෝකයෙහි ආයුෂ ප්‍රමාණ වෙමි. ඒ පන්සියය මිනිස්ගණනින් අනූලක්ෂයක් හවුරුදු වෙත්. මිනිස් ගණනින් හවුරුදු සියයක් තව්තිසා භවනයෙහි එක් දවාලක් හා එක් රැයක් වෙමි. ඒ ගණනින් දහසක් හවුරුදු තව්තිසා භවනයෙහි ආයුෂ වෙමි. මිනිස් ගණනින් තුන්කෝළ සැටලක්ෂයක් හවුරුදු වෙමි. මනුෂ්‍ය ලොකයෙහි හවුරුදු දෙසියයෙක් යාම දෙවිලොවට එක් දිවාරැයෙක්වෙමි. ඒගණනින් දෙදහසක්හවුරුදු යාමදෙව්ලොව ආයුෂ ප්‍රමාණ වෙමි. මිනිස් ගණනින් තුදුස් කොටි සතලිස් ලක්ෂයක් හවුරුදු වෙමි. මනුෂ්‍යයන්ගේ සාරසියයක් හවුරුදු තුසිතපුරයෙහි එක් දිවාරැයෙක් වෙමි. ඒ ගණනින සාරදහසක් හවුරුදු තුසිපුරයෙහි ආයුෂ ප්‍රමාණ වෙමි. මිනිස් ගණනින් සත්පණස් කොටි සැටලක්ෂයක් හවුරුදු වෙමි. මනුෂ්‍යලෝකයෙහි අටසිය යක්හවිරදු නිම්මාණරති දිව්‍යලෝකයෙහි එක් දිවාරැයෙක් වෙමි. ඒ ගණනින් අටදහසක් හවුරුදු නිම්මාණරති දිව්‍යලෝකයෙහි ආයුෂ ප්‍රමාණ වෙමි. මිනිස් ගණනින් දෙසිය තිස්කොටි සත ලක්ෂ ලක්ෂයක් හවුරුදු වෙමි. මනුෂ්‍යලොකයෙහි හවුරුදු එක් දහස් සියයෙක් පරනිම්මිත වශවර්ති දිව්‍යලෝකයෙහි එක දිවාරැයෙක් වෙමි. ඒ ගණනින් සොළොස් දහසක් හවුරුදු පරනිම්මිත වශවර්ති දිව්‍යලෝකයෙහි ආයුෂ ප්‍රමාණ වෙමි. මිනිස් ගණනින් නවසිය එක්විසිකෝළ සැට ලක්ෂයක් හවුරුදු වෙමි. මෙසේ ෂඩ්කාමභූමියෙහි ආයුෂ ප්‍රමාණය දත යුතුමි.

සොළොස් රූපාවචරභූමිය යනු බ්‍රහ්මපාරිසද්‍යය බ්‍රහ්ම පුරෝහිතය මහා බ්‍රහ්මය යන භූමිත්‍රය ප්‍රථම ධ්‍යාන භූමි නම් වේ. පරිත්තාභා අප්පමාණාභා ආභස්සරා යන භූමිත්‍රය විතීය ධ්‍යාන භූමි නම් වේ. පරිත්තසුභා අප්පමාණසුභා සුභකිණ්හා යන භූමිත්‍රය තෘතීය ධ්‍යාන භූමි නම් වේ. මෙහිපථුල අසංඥ සත්ව යන භූමිය හා සමග අවිහඅතප්පසුදස්ස සුදස්සි අකනිට්ඨ යන පවසුඛාවූ, සභූමි හා සමග යන භූමි සතරවතුර්ථධ්‍යාන භූමි නම් මෙමි. මෙසේ

රූපාවචර භූමිය සොළොස් ප්‍රකාර වේයි. "පඨමජ්ඣානභූමිඤ්ච පරනිම්මිත වසවත්තී භූමිඤ්ච උපරි පඤ්චසතුබ්බේධ සතසහස්සඨ සහස්ස යොජනෙ සමතලෙ ආකාසෙ තිඨති" යනු සුවිපුලා ලඞ්කාරයෙහි ආ බැවින් ප්‍රථම ධ්‍යානභූමියද පරනිම්මිත වශවර්ත්තී දිව්‍යලෝකයෙන් මත්තෙහි පණස්පස් ලක්ෂ අටදහසක් යොදුන් ගිය තන්හි ආකාශයෙහි සමතලයෙහි පිහිටා සිටිනේ වෙයි. ද්විතීය ධ්‍යාන භූමිත්‍රයද ප්‍රථම ධ්‍යාන භූමිය මත්තෙහි පණස්පස් ලක්ෂ අටදහසක් යොදුන් ගිය තන්හි සමතලවූ ආකාශයෙහි පිහිටා සිටිනේ වෙයි. තෘතීයධ්‍යාන භූමිත්‍රයද ද්විතීයධ්‍යාන භූමියෙන් මත්තෙහි පණස්පස් ලක්ෂ අටදහසක් යොදුන් ගිය තන්හි සමතලවූ ආකාශයෙහි පිහිටා සිටිනේ වෙයි. චතුර්ථ ධ්‍යාන භූමියෙන් මත්තෙහි පණස්පස්ලක්ෂඅටදහසක් යොදුන් ගියතන්හි වෙහප්ඵල අසඤ්ඤසත්ත ඇත භූමිවය සමතල ආකාශයෙහි පිහිටා සිටිනේ වෙයි. වෙහප්ඵලය මත්තෙහි පණස්පස්ලක්ෂ අටදහසක් යොදුන් ගිය තන්හි අවිහභූමියද, අවිහභූමියෙන් එපමණ මත්තෙහි අතප්පභූමියද, අතප්ප භූමියෙන් එපමණමත්තෙහි සුදස්ස භූමියද, සුදස්ස භූමියෙන් එපමණ මත්තෙහි සුදස්සිභූමියද, සුදස්සි භූමියෙන් එපමණ මත්තෙහි අකනිට්ඨ භූමියද, පිහිටාසිටිනේ වෙයි. මේ සොළොස් රූපාවචර භූමියෙහි වාසය කරන්නාවූ සත්වයන්ගේ ලක්ෂණ මෙසේයි. "මහාබ්‍රහ්මානං පරිවාරිකත්තා තෙසං පරිසනිං භවති බ්‍රහ්මපාරිසජ්ජා" යනු විග්‍රහ බැවින් මහා බ්‍රහ්මයන්ගේ උපස්ථායක පිරිසෙහි හටගත් බැවින් බ්‍රහ්මපාරිසජ්ජ නම් වේ. ඒ බ්‍රහ්මයන්ගේ වාසස්ථාන භූමියද උපචාර වශයෙන් බ්‍රහ්මපාරිෂද්‍ය නම් වේ. "තෙසං පුරොහිතඨානෙ ඨිතත්තා බ්‍රහ්ම පුරොහිතා" යනු නිර්වචන බැවින් ඒ මහා බ්‍රහ්මයන්ගේ අමාත්‍ය ස්ථානයෙහි සිටි හෙයින් බ්‍රහ්මපුරෝහිත නම් වේ. "තෙහි තෙහි කිඤ්ඤාදීහි ගුණ විසෙසෙහි බ්‍රූහිතා පරිවුඩ්ඪා බ්‍රහ්මානො. වණ්ණ වන්තතායවෙව දීඝායුකතාදීහිච බ්‍රහ්මපාරිසජ්ජාදීහි මහන්තා බ්‍රහ්මානොති මහාබ්‍රහ්මානො" යනු නිර්වචන බැවින් ඒ ඒ ධ්‍යානාදී ගුණ විශෙෂයන් කරණකොටගෙණ හාත්පසින් අභිවර්ධියට පැමිණි හෙයින්ද, වණ්ණවත් බැවින් හා දීඝායුෂ්ක බැවි ආදියෙන් බ්‍රහ්මපාරිෂද්‍යාදීන් කෙරෙන් මහත්වූ බැවින්ද මහා බ්‍රහ්ම නම් වෙත්. ඒ ප්‍රථම ධ්‍යාන භූමිත්‍රය වනාහි විශෙෂ වශ යෙන් උතුම්වූ ආලොකයෙන් බබලන්නාවූ ඛම්භතල වාසිහු වෙත්. ඔවුන් අතුරෙන් බ්‍රහ්මපාරිෂද්‍යයෙහි උපදනා බ්‍රහ්මයෝ තුමූ මේ මනුෂ්‍ය ලෝකයෙහි ප්‍රථම ධ්‍යාන ලැබූ මාත්‍රයකින් නො

පිරිහුන් ධ්‍යානයෙන් හොස් බ්‍රහ්මපාරිෂද්‍ය භූමියෙහි උපදනාහු වෙත්. ඒ ප්‍රථම ධ්‍යානයම ආවර්ජනා ආදී කිපාකාරයකින් වශීභූතකොට්ඨාසත් ධ්‍යානලාභීහු බ්‍රහ්මපුරෝහිත තලයෙහි උපදිත්. ඒ ප්‍රථම ධ්‍යානය පවත්‍රකාරයකින් වශීභූත කරගත්තාවූ ධ්‍යාන ලාභීහු මහාබ්‍රහ්මතලයෙහි උපදනාහු වෙත්. මේ තුන්තල යෙහිම උපදනා බ්‍රහ්මරාජයන්ගේ පටිසන්ධි විපාක චිත්තය එකම ප්‍රථම ධ්‍යානයාගේ විපාක චිත්තය මැයි. ඒ භවයෙහි වසනතාක් කල් මුළුල්ලෙහි එම විපාක චිත්තයම භවාඞ්ග වශයෙන් ඉපිද චුතිය ලයෙහිද එම විපාක චිත්තයම චුති වශයෙන් පවත්නේයි. "පරිත්තාභා" යනු "උපරිමෙහි පරිත්තාආභා එතෙසන්ති පරිත්තාභා" යනු නිර්වචන බැවින් මතුබ්‍රහ්ම ලොකයෙහි බ්‍රහ්මරාජයන්ට වඩා සවල්පවූ ආලෝක ඇති හෙයින් පරිත්තාභා නම් වෙත්. "අපමාණා ආභා එතෙසන්ති අපමාණාභා" යනු නිර්වචන බැවින් ප්‍රමාණ රහිතවූ ආලෝක ඇති හෙයින් අපමාණාභා නම් වෙත්. වලාහකත්තා විජ්ජුවිය ඉතොචිතොව ආභාසරති නිස්සරති එතෙසං සපීතිකඣානා නිබ්බත්තකඞ්ඛා සත්තානත්තානි ආභස්සරා" යනු නිර්වචන බැවින් වලාපටලයකින් නික්මෙන්නාවූ විදුලියක් මෙන් සප්‍රීතික ධ්‍යානයෙන් හටගන්නාවූ සඤ්ඤියක් ඇති හෙයින් මේ බ්‍රහ්මයන්ගේ ශරීරප්‍රභාවද ඔබ මොබ නික්මෙන හෙයින් ආභාශ්වර නම් වෙත්. ඒ තිතීය ධ්‍යාන භූමිතල වාසීවූ බ්‍රහ්මයන්ගේද වාසය කරන්නාවූ සමාන තල ත්‍රය අයිශයින් උපදින්නාවූ ආලෝකයෙන් බබලන්නේයි. තිතීය ධ්‍යානය හා තෘතීය ධ්‍යානයද පරිත්ත වශයෙන් හා මධ්‍යම වශයෙන්ද උතකෘෂ්ට වශයෙන්ද උපදවා ගත්තාවූ ධ්‍යාන ලාභීහු ඒ බ්‍රහ්මලොකත්‍රයෙහි සඤ්ඤාරාශයකින් තිතීය ධ්‍යාන තෘතීය ධ්‍යාන විපාක චිත්තය කරණකොටගෙණ පටිසන්ධි භවාඞ්ග චුති චිත්තයන්ගේ හටගැණීම වේ. "පරිත්ත සුභ" යනු "සුභාති එකඤ්ඤා අවලා සරිරා ආභාවුච්චති සා උපරිබ්‍රහ්මෙහි පරිත්තාසුභා එතෙසන්ති පරිත්තසුභා" යනු විග්‍රහ බැවින් සුභ සඞ්ඛ්‍යාතවූ එකඤ්ඤවූ ශරීරප්‍රභාව මතු බ්‍රහ්මලොකයන් කෙරෙන් මතු බ්‍රහ්මයන් කෙරෙන් පරිත්ත හෙයින් පරිත්තසුභ නම් වේ. "අපමාණසුභ" යනු අපමාණා සුභා එතෙසන්ති අපමාණසුභා" යනු නිර්වචන බැවින් ඒ සුභසඞ්ඛ්‍යාත නිශ්චල ශරීර සවභාව අප්‍රමාණ වශයෙන් ඇතිහෙයින් අපමාණසුභ නම් වේ. "සුභකිණ්හා" යනු "පභාසමුදය සඞ්ඛාතෙහි සුභෙහි කිණ්හා ආකිණ්හාති" යනු නිර්වචන බැවින් ප්‍රභාසමූහ සඞ්ඛ්‍යා තවූ ශොභාවෙන් ගැවසී ගත්හෙයින් සුභකිණ්හ නම් වේ. සුභා

කිණ්ණෝයෙයි කියයුත තන්හි හකාරයට හ්‍රස්ව කොට අනන්ම ණකාරයට හකාරාදෙශවීමෙන් සුහකිණ්ණා යන ව්‍යවහාර කරණු ලැබේ. ඒ තෘතීය ධ්‍යාන භූමිත්‍රයෙහි වාසයකරන්නාවූ බ්‍රහ්මයෝ වනාහි විශෙෂ වශයෙන් උතුම්වූ එකඝණ ශරීර ප්‍රභාවෙන් බබලන හෙයින් ඒ බ්‍රහ්මයන්ගේ වාසස්ථාන භූමිත්‍රය සමානතල වශයෙන් පිහිටියේයි. ඒ තෘතීය ධ්‍යාන තුන්තලයෙහි එකම චතුර්ථ ධ්‍යානය හීන වශයෙන්ද මධ්‍යම වශයෙන්ද ප්‍රණීත වශයෙන්ද වැඩුවාවූ බ්‍රහ්මයන්ම ඒ බඹතලයෙහි උපදනා හෙයින් එකම චතුර්ධ්‍යාන විපාක චිත්තය ප්‍රතිසන්ධි භවාඞ්ග චුති වශයෙන් පවතී. "වෙහප්ඵලභූමි' යනු "ඣානපසභාය නිබ්බත්තං විපුලං ඵල මෙතෙසන්ති වෙහප්ඵලා" යන නිර්වචන බැවින් ධ්‍යානානුභාවයෙන් හවඟන්නාව අනෙක ප්‍රකාරවූ විපාක ඵල ඇති හෙයින් වෙහප්ඵල නම් වේ. අසංඥ සත්ව භූමිය යනු "සඤඤා විරාගභාවනා නිබ්බත්ත රූපසන්තති මත්තත්තා නත්ථි සඤඤා මූඛෙන වත්තනා අවසෙසා රූපක්ඛන්ධාව එතෙසන්ති අසඤඤී" යනු නිර්වචන බැවින් "සඤඤා රොගොසඤඤා ගණ්ඩා" යනාදීන් සංඥාවගේ නොඇලුනාවූ භාවනා වශයෙන් හවඟත්තාවූ රූපකලාප මාත්‍රයන් ඇති බැවින්ද සංඥ ශීඝ්‍රයෙන් නියත ලද්දාවූ සතර අරූපඋත්පත්තියන් මෙවුන්ට නැති හෙයින් අසංඥ නම් වෙත්. ඒ වෙහප්ඵල අසංඥ සත්ව භූමිවයෙහි වාසයකරන්නාවූ බ්‍රහ්මයන්ගේ විශෙෂය නම්:- ව්‍යානලාභීවූද ධ්‍යානලාභී නොවූද පඨමධ්‍යානලාභීවූ අශ්‍රී අනාගාමී දෙනොබොසත උපදනා භූමිය වෙහප්ඵලයයි කීයාද ක්‍රම්මවාදී ක්‍රියාවාදී තීර්ථකයන් විසින් සංඥාවෙහි හෝ ඇළුනාවූ විඤ්ඤාණඤ්චායාගේ වශයෙන් උපදවන ලද පඨම ධ්‍යානයාගේ විපාකයෙන් රූප මාත්‍රයක් හඳිනන්නා භූමිය අසංඥ සත්ව භූමි නම් වේ. මේ වෙහප්ඵල අසංඥ සත්ව භූමිවයද සමානතල වශයෙන් පිහිටා තිබේ. ඔවුන් අතරෙන් වෙහප්ඵල භූමියෙහි පඨමධ්‍යාන විපාක චිත්තය පටිසන්ධි භවාඞ්ග චුති වශයෙන් පවතී. අසංඥ තල යෙහි එම පඨම ධ්‍යාන විපාක ශක්තියෙන් උපදවන ලද්දාවූ ජීවිත නවක රූපකලාප සමූහය මහා කල්ප දහ්ම්යයක් ඉක්ම්ලේ ලෙහි සත්තති විවෙජදය නොවී පැවත නිරුඬවන්නේයි. අවිහභූමි යනු "අපපෙන කාලෙන අත්තනොභාවං න විජ හන්තීති අවිහා" යනු නිර්වචන බැවින් තමාගේ ඒ අවිහ භූමි සඞ්ඛ්‍යාත සථානය මදකලකින් අත්නොහරින හෙයින් අවිහ නම් වෙත්. දුතිය තලය වනාහි න ඛෙනව තපපන්තීති අතපපා" යනු නිර්වචන බැවින් යම් කිසිවකින් තොතැවෙන හෙයින් අත පප නම්වෙත්, තුන්වනතල වාසිහු මෙතෘහි "පරමසුන්දර රූප

තනා සුඛෙන දිස්සනතීති සුදස්සා" යනු නිරුක්තින් අතිශයින් සිත්කළ රූප ඇති බැවින් සුඛයේ දක්නයතු බැවින් සුදස්සනම්වෙත්, සතරවෙනිකල වාසිහු වනාහි "සුපරිසුඛ දස්සනතනා සුඛෙන පස්සනතීති සුදස්සිනෝ"යනු නිරුක්තින් සතරවෙනිතල වාසිහු වනාහි අතිශයින් පවිත්‍ර චක්ඛුර්විඥානය ඇතිහෙයින් රූපාලම්බණය සුවසේ දක්නා සුළුහෙයින් සුදස්සී නම් වෙත්. එවමිතලවාසිහු වනාහි "උභයකාර්‍යසම්පත්තිභාතනානත්ථි එතෙසං න නිට්ඨාභාවොති අකනිට්ඨා" යනු නිරුක්තින් අතිශයින් උත්කෘෂ්ට සම්පත්ති ඇතිහෙයින් කිසිම බ්‍රහ්මයෙකුට බාලබවෙක් නැති හෙයින් අකනිට්ඨ නම් වේ. මේ භූමීහු පස්දෙන වනාහි "සුඛානං අනාගාමී අරහත්තානඤ්චව ආවාසොති සුඛාවාසා" යනු නිරුක්තින් කෙලෙසුන්ගෙන් පවිත්‍ර අනාගාමී රහතුන්ගේ වාසස්ථාන හෙයින් සුඛාවාස නම් වේ. නොහොත් "අනූනකය පටිඝභාවතෝ දිඝ සන්තතිං ආවාසෝ එතෙසනති සුඛාවාසෝ" යනු නිරුක්තින් දිගිහැසම්ප්‍රයුක්ත විත්තය උඩවව සම්ප්‍රයුක්ත විත්තය වෙපමුලින දෙයිනය යන මොවුන්ගෙන් වෙන්වූ අනාගාමී රහතුන්ගේ වාසස්ථානවූ හෙයින්ද සුඛාවාස නම්වේ. මේ සුඛාවාස පවකයෙහි වනාහි අනාගාමී ආර්‍යයෝම පඤ්චවිධ්‍යාත්ත විපාකචිත්තයෙන් පටිසන්ධිගෙන එම විත්තයම භවාඞ්ග චුතිවශයෙන පැවත් එම භූමියෙහිම රහත්ව පිරිනිවන් පානාහු වෙති, නොලොස් රූපාවචර භූමීන් අතුරෙන් අසංඥසත්ව සුඛාවාස භූමිවය හැර අවශෙෂවූ දසභූමියෙහි භවඟන්නාවූ පුද්ගලයෝ නම්:— යටකී දෙලොස් පුද්ගලයන් අතුරෙන් සුගති අහෙතුකය, දුගති අහෙතුකය, දුහෙතුකය යන තුන්දෙනා හැර අවශෙෂ ත්‍රිහෙතුක පුද්ගලය, සතර මාර්ගසථයෝය, සතර ඵලසථයෝය යන නවවැදෑරුම් පුද්ගලයෝයි. ඒ නවවැදෑරුම් පුද්ගලයන් අතුරෙන් බඹලොව උපන් ත්‍රිහෙතුක පුද්ගලයා කෙරෙහි චෙෂමූලික දෙසිතද හැර දස අකුශල විත්තය ස්‍රාණවිඥානවය, ජිව්හා විඥානවය, කාය විඥානවය, හසිතොත්පාද විත්තය යන සතලොසද හැර එකොලොස් අහෙතුක විත්තය මහාකුශල් අටය, මහදගත කුශල් නවය, රූපාවචරවිපාක පසය යන මේ තෙතිස් විත්තයෝ සුදුසු පරිදිදෙන් උපදනාහුවත්. ශ්‍රොතාපත්තිමාර්ගසථ පුද්ගලයා කෙරෙහි ඒ තෙතිස යා සමඟ ශ්‍රොතාපත්ති මාර්ගවිත්තය උපදී. ශ්‍රොතාපත්තිඵලසථ පුද්ගලයා කෙරෙහි දිගිහත විප්‍රයුක්ත ඕත් සතරය, උඩවව සඟහත විත්තය, චක්ඛු විඥානවය, ශ්‍රොත්‍ර විඥානවය, සම්පටිච්ඡනවය, සන්තීරණත්‍රය, ආවජ්ජනවය යන මොවුන්ගේ වශයෙන් එකොළොස් අහෙතුක විත්තය, මහා

කුසල් අටය, මහද්ගත කුශල් නවය, රූපාවචර විපාක පසය, සෝතාපත්තිඵල චිත්තය යන මොවුන්ගේ වශයෙන් එකුන් සාළිස් සිත් කෙනෙක් සුදුසු පරිද්දෙන් උපදින්. ශකෘදාගාමී මාගීසථය කෙරෙහි ශකෘදාගාමී මාගී චිත්තය සමග ඒ එකුන් සාළිසම ලැබේ. ශකෘදාගාමී ඵලසථය කෙරෙහි යථොක්ත එකුන්සාළිස් චිත්තයන අතුරෙන් සෝතාපත්තිඵලචිත්තය උඩර ණයකොට ශකෘදාගාමී ඵලචිත්තය බහා එකුන්සාළිස් සිත් කෙනෙක්ම සුදුසු පරිද්දෙන් උපදින්. අනාගාමී මාගීසථය කෙරෙහි අනාගාමී මාගී චිත්තය සමග යථොක්ත එකුන්සාළිසම ලැබේ. අනාගාමී ඵලසථය කෙරෙහි යථොක්ත එකුන්සාළිස් චිත්තයන් කෙරෙන් ශකෘදාගාමී ඵලචිත්තය උදුරා අනාගාමී ඵලචිත්තය බහා එකුන්සාළිසෙක්ම සුදුසු පරිද්දෙන් ලැබෙන්. අර්හත්මාගීසථය කෙරෙහි අර්හත්මාගී චිත්තය සමග යථොක්ත එකුන්සාළිස් චිත්තයම ලැබේ. අර්හත්ඵලසථය කෙරෙහි චක්ඛුර් විඤ්ඤාණය, සෝත්‍රවිඤ්ඤාණය, සම්පටිච්ඡනය, සන්තීරණත්‍රය, ආවජ්ජනය, හසිතොත්පාදචිත්තය යන මොවුන්ගේ වශයෙන් දසලොස් අහෙතුක චිත්තය, මහාක්‍රියා අටය, රූපාවචරවිපාක පසය, මහද්ගත ක්‍රියාත්‍රය, අර්හත්ඵලචිත්තය යන මොවුන්ගේ වශයෙන් පන්තිස් සිත්කෙනෙක් සුදුසු පරිද්දෙන් ලැබෙන්. අසංඥාතලයෙහි වනාහි "අසඤ්ඤසත්තා බ්‍රහ්මලෝකෙ එකෝ සුඛී අහෙතුක පුග්ගලෝ තසම්ං තයෝ කලාපාහොන්ති" යනු සුවිත්තාලඞ්කාර වචනබැවින් අසංඥාතලභූමියෙහි එකම සුඛී අහෙතුක පුද්ගලයෙක් වේ. ඔහුකෙරෙහි ජීවිතනවකකලාපය, ශුද්ධාෂ්ටක කලාපය, ලහුතාදී එකාදශක කලාපය යන රූපකලාපයෝ තුන්දෙනෙක්ම වෙති, මනුෂ්‍යලෝකයෙහි චාඅයොකසිණයෙන් සඤ්ඤ විරාගභාවනාව වඩා පඨමධ්‍යානලාභීව යම් ඉරියව්වකින් කාලක්‍රියා කළේ නම් ඒ ඉරියව්වෙන්ම ඒ බ්‍රහ්ම ලොකයෙහි ප්‍රතිමාරූපයක්මෙන් පහළව ඒ ඉරියව්වෙන්ම මහා කල්ප පන්සියයක්හුගේ අවිඝාතයෙහි ධ්‍යානවෙගය සිඳී අපර පරිත්ත වේදනීය කුශලකර්ම බලයෙන් කාමධාතුවෙහිම උපදනේසි. සුඛාවාස පඨභූමියෙහි වනාහි අනාගාමී ඵලසථයාය, අර්හත් මාගී සථයාය, අර්හත්ඵලසථයාය යන පුද්ගලයෝ තිදෙනෙක්ම ලැබෙන්. ඒ තිදෙනා අතුරෙන් අනාගාමී ඵලසථයා කෙරෙහි දිට්ඨගත විප්‍රයුක්ත සිත් සතරය, උඩවත්තහසහගත චිත්තය, චක්ඛුවිඤ්ඤාණ සෝතවිඤ්ඤාණ සම්පටිච්ඡන ආවර්ජන, සන්තීරණත්‍රය, ආවජ්ජනය යන සොළොස් අහෙතුක අහෙතුක චිත්තය, මහා කුශල් අටය, මහද්ගත කුසල් නවය, පඤ්චමධ්‍යාන විපාකචිත්තය අනාගාමී ඵලචිත්තය යන පන්තිස් චිත්තයෝ සුදුසුපරිද්දෙන් උප

දීත්. අතීත්මංගීසඨයා කෙරෙහි අතීත්මංගී චිත්තය සමඟ යථොක්ත පන්තිස් චිත්තයෝම ලැබෙත්. අතීත්ඵලසඨයා කෙරෙහි චක්ඛුවිඤ්ඤණ සොතවිඤ්ඤණ සම්පටිච්ඡන ෂට්කය, සන්තීරණත්‍රය, ආවජ්ජණවය, හසිතොත්පාදය යන දෙලොස් අහෙතුක චිත්තය, මහාක්‍රියා අටය, මහද්ගත ක්‍රියාත්‍රය, පඤ්ච ඛ්‍යාන විපාක චිත්තය, අතීත්ඵලචිත්තය යන එක්තිස් චිත්තයෝ සුදුසු පරිද්දෙන් උපදිත්. මෙසේ කීයකලද්දවූ රූපාවචර සෝ ලොස් භූමියෙහි ආයුපරිවෙජ්දය මෙසේයි. "අසඞ්ඛ්‍යය කපපාය තියොහංගො බ්‍රහ්මපාරිසජ්ජානං දෙවානං ආයු හොති" යනු සුචිත්තාලඞ්කාරපාඨයෙහි ආනසින් අසඞ්ඛ්‍යය කල්පයක්හුගේ තුන්වෙනි භාගය බ්‍රහ්මපාරිෂද්‍යයාගේ ආයුෂ වෙයි "උපඩ්ඪං සඞ්ඛ්‍යය කපපාය බ්‍රහ්මපුරොහිතානං ආයු" යන බැවින් අසඞ්ඛ්‍යය කල්පයක්හුගේ අඩිය බ්‍රහ්මපුරොහිතයාට ආයුෂ වෙයි. 'අසඞ්ඛ්‍යානං කපපාය මහාබ්‍රහ්මාය" යනු බැවින් මහාබ්‍රහ්ම තල වාසීන්ට අසඞ්ඛ්‍යය කල්පයක් ආයුෂවෙයි. මෙසේ ප්‍රථම ධ්‍යාන තුන්තලවාසීන්ගේ ආයු ප්‍රමාණය අසඞ්ඛ්‍යය කල්ප යෙන්ම නියම කථයුත්තේයි. විතීයඛ්‍යාන තලය පවත් මතු බ්‍රහ්මතලයන්ගේ ආයුෂවන්‍නෙහි මහාකල්පයෙන්ම නියම කථයුත් තේය. ඒ අසඞ්ඛ්‍යකල්ප මහා කල්පයන්ගේ වේනස මෙසේයි. දිගින් යොදුනක්ද පුලුලින් යොදුනක්ද ඝනයෙන් යොදුනක්ද ඇත්තාවූ සුදු අබ අටුවකින් අවිරුද්ධ සියයක් ඇවෑමෙන් එක එක් අබ බිඳ්ව නිකුත්කිරීමෙන් අබ අටුව හෙළියන්නේ නම්වූ අවුරුද්දගණන නොහෙවෙන්නාවූ කල්පය එකම අසඞ්ඛ්‍ය කල්ප යක් නම් වෙයි. ඒ අසංඛ්‍ය කල්ප සතරෙක් එක් මහාකල්ප යකි. මිනිස්ලොව ආයුගණනින් දක්වන මේ නම් සත්ථන්තර කල්පය, දුබ්භික්ඛන්තර කල්පය, රොගන්තර කල්පය යන ත්‍රිවිධ අන්තරකල්ප විනාශයන් අතුරෙන් යම්කිසි විනාශයකින් බොහෝ සත්වයන් විනාශවී ගොස් ගල්ගුහාදියෙහි සැඟවී සිටි යාවූ බොහෝ දෙනෙකුගෙන් හටගන්නා සත්වයෝ තුමූ අපගේ අකුශල කම්ඵලානුභාවයෙන් දශවර්ෂායුෂ්කව නැවත විනාශවී ගියේ යයි පවටහගව පාපයෙන් වැලකීම් හේතුවෙන් ක්‍රමයෙන් වැඩී අසංඛ්‍යායුෂ්ක බවට පැමිණ නැවත නැවතත් සත්වයන්ට ජරා මරණ නැතැයි සලකා අධර්ම සමාදානයෙහි හැසිරීම් හෙතුකොට ක්‍රමයෙන් ආයුෂ පිරිහී ගොස් දශවර්ෂායුෂ්කවූ කල්හි පළමු කී නයින්ම එක්තරා අන්තරකල්ප විනාශයකින් සත්ව විනාශය වෙයි. මේ දශවර්ෂායුෂ්ක සත්වයන්ගේ විනාශදෙකකින් පිරිසිඳින ලද කාලය එක් අන්තරකල්පයක් නම් වෙයි. එබඳු අන්තර කල්ප සූසැටවක් හෝ සම්බුරුන්ගේ මතවශයෙන් තිස්සෙක්

හෝ එකම අසංඛ්‍ය කල්පයකි. ඒ අසංඛ්‍ය කල්පය විනාශී සංවර්තකල්පය, සංවර්තස්ථායී කල්පය, විවර්තකල්පය, විවර්තස්ථායී කල්පයයි සතරකට බෙදෙයි. ඔවුන් අතුරෙන් කල්පවිනාශක මහා මේඝය පටන් කල්පවිනාශක මහාවහ්නියගේ නිවීම දක්වා සංවර්ත අසංඛ්‍ය කල්ප නම්වෙයි. ඒ ගිණි නිවීමපටන් කෙල ලඝුයක් සක්වල සම්පත්තිකර මහාමේඝය දක්වා මේ අතර කල්පය සංවර්තස්ථායී කල්ප නම්වේ. සම්පත්තිකර මහා මේඝය පටන් මිනිස් සූර්‍යයින්ගේ උදාවීම දක්වා විවර්ත අසංඛ්‍ය කල්පනම්. එතු සූර්‍යයින්ගේ පහළවීම පටන් නැවතත් කල්ප විනාශක මහා මේඝය දක්වා මේ අතර කාලය විවර්තස්ථායී අසංඛ්‍ය කල්ප නම් වේ. මේ අසංඛ්‍යකල්ප සතරෙක් එක් මහාකල්පයක් නම් වේ. ප්‍රථමධ්‍යාන තලවාසී බ්‍රහ්මයන්ගේ ආයුෂ විනාශී මේ මහා කල්පයක් සම්පූර්ණවීමට මත්තෙන් ඒ බඹලොවින් චුතවන සෙයින් අසංඛ්‍යෙය්‍ය කල්පයෙන්ම ආයුෂ නියමකරණ ලද්දේයි.

මහාකල්පය විනාශවන සැටි මෙසේයි:—

ඔකාසලෝක සංඛ්‍යාත කෙළුලඝුයක් සක්වල විනාශවන කාලී කල්හි පිළිවෙළින් සත්වරක් ගින්නෙන් විනාශව අවවෙනී වාරයෙහි දියෙන් විනාශවේ. ඒ ජලය යනු ප්‍රකෘති ජලය නොව නරකයෙහි හටගන්නා ක්ෂාරෝදකයයි. මෙසේ අටවාර අවක් විනාශවූ කල්හි නොවත් සැටසතර වාරය සම්පූර්ණවූකල්හි සැටපස්වෙනි වාරය සුලඟින් විනාශ වේ. මෙසේ ලෝක විනාශයවන කල්හි ප්‍රථමධ්‍යාන තුන්තලයපටන් ගින්නෙන්ද ද්විතීයධ්‍යානතලය පටන් ජලයෙන්ද චතුර්ථධ්‍යාන තලය පටන් සුලඟින්ද මෙසේ වෙනපවුලක් හැර අවශෙෂවූ සියලු බ්‍රහ්මභූමිකු විනාශවන්නාහුය. එහෙයින් ප්‍රථමධ්‍යාන තුන්තලවාසීන්ගේ ආයුෂ මහාකල්පයෙන් නොව අසංඛ්‍ය කල්පයෙන්ම නියම කට යුතතේය. පරිත්තාභ බ්‍රහ්මලෝකවාසීන්ගේ ආයුෂ මහාකල්ප දෙකක් ප්‍රමාණ වෙයි. අප්පමාණාභ බ්‍රහ්මයන්ගේ ආයුෂ මහා කල්ප සතරක් ප්‍රමාණවෙයි. ආභස්සර බ්‍රහ්මයන්ගේ ආයුෂ එක් අසංඛ්‍ය කල්පයක් හා මහාකල්ප සතැක් ප්‍රමාණ වේ. පරිත්තසුභ බ්‍රහ්මයන්ගේ ආයුෂ විනාශී මහාකල්ප සොළසක් පමණ වේ. අප්පමාණසුභ බ්‍රහ්මයන්ගේ ආයුෂ දෙතිස් මහා කල්පයක් ප්‍රමාණවේ. සුභකිණ්හබ්‍රහ්මයන්ගේ ආයුෂ විනාශී එක් අසඞ්ඛ්‍යකල්පයක් හා මහාකල්ප සතසැටක් පමණ වේ. වෙහප්ඵල අසංඥ සත්ත්ව බ්‍රහ්මයනගේ ආයුෂ විනාශී මහා කල්ප පන්සියයක් ප්‍රමාණවේ. අවිහයන්ගේ ආයුෂ විනාශ මහාකල්ප දහසක් ප්‍රමාණ වේ. අතප්ප බ්‍රහ්මයන්ගේ ආයුෂ මහාකල්ප

දෙදහසක් ප්‍රමාණවේ. සුදස්ස බ්‍රහ්මයන් ගේ ආයුෂ මහාකල්ප සාරදහසක් ප්‍රමාණ වේ. සුදස්සී බ්‍රහ්මයන්ගේ ආයුෂ මහා කල්ප අටදහසක් ප්‍රමාණ වේ. අකනිට්ඨ බ්‍රහ්මයන්ගේ ආයුෂ මහාකල්ප සොළොස් දහසක් ප්‍රමාණ වේ.

රූපාවචර පරිච්ඡේදය නිමි.

අරූපාවචර සතර භූමිය යනු ආකාසානඤ්චායතනභූමිය, විඤ්ඤාණඤ්චායතනභූමිය, ආකිඤ්චඤ්ඤායතනභූමිය, නෙව සඤ්ඤානාසඤ්ඤායතනභූමිය යන මොවුන්ගේ වශයෙන් අරූප භූමිය සතරාකාර වේ. ඒ සතරභූමිහුද අනනිට්ඨභූමියෙන් මත්තෙහි යොදුන් පණස්පස්ලක්ෂ අසූදහසයකින් මත්තෙහි ආකාසානඤ්චායතන භූමිය පිහිටා තිබේ, සෙසු භූමිහු තිදෙනද එප මණ දුරින් පිහිටා තිබෙන්නාහුයයි සමහරු කියත්. සමහර ආචාර්යවරයෝ වනාහි සතර භූමිය සමානව පිහිටා තිබේයයි කියත්. ආකාසානඤ්චායතන භූමිය යනු ආකාශ කසිණය හැර නව කසිණයන්ගෙන් යම් කිසි කසිණයකින් උපදවාගන්නාලද ප්‍රතිභාග නිමිත්ත නොහොත් කසිණාලොකය පතුරුවා උගුළුවා ගන්නාලද කසිණුග්ඝාටිමාකාශයෙහි උපදවන ලද්දාවූ ප්‍රථම රූප්‍ය කුශල චිත්තයාගේ විපාකවශයෙන් අකනිට්ඨ බ්‍රහ්මලොක යෙන් මත්තෙහි යට කියනලද්දාවූ දුර ප්‍රමාණ ආකාශයෙහි පහලවී පවත්නා සතරනාමස්කන්ධයයි, නොහොත් ප්‍රථමාරූප්‍ය සඞ්ඛ්‍යාත සතර නාමස්කන්ධයන් විසින් පිරිසිඳගන්නා ලද්දාවූ ආකාශය ආකාසානඤ්චායතන භූමිනමුත් සෙසු භූමිතය එපරිද්දෙන්ම ඒ ධ්‍යාන විපාක චිත්තයන්ගේ වශයෙන් පිරිසිඳ ගන්නා ලද්දාවූ ආකාශ ප්‍රදේශයෝ මැයි. ඔවුන් අතුරෙන් ආකාසා නඤ්චායතන බ්‍රහ්මයෝ තුමූ ආකාසානඤ්චායතන විපාක චිත්ත යෙන් පළමුවිසිඳගෙණ ආයු පමණින් හෝ ඛය වශයෙන් පැවත එම චිත්තයම චුතිවශයෙන් නිරුඬ වන්නේය, සෙසු භූමිත්‍රය, එසේම දතයුතුයි. මේ සතර අරූප බ්‍රහ්මයෝ වනාහි යට කියනලද දෙළොස් ප්‍රකාර පුද්ගලයන් අතුරෙන් දුගති අහෙතුක සුගති අහෙතුක දුහෙතුක සොතාපත්තිමාගීඵට යන සතර දෙන හැර ත්‍රිහෙතුක පුද්ගලය සොතාපත්ති ඵලස්ථය ආදි කොට ඇත්තාවූ සප්ත ආර්ය පුද්ගලයෝය යන අටදෙනෙක් ම වෙති. ඒ අටදෙනා අතුරෙන් ආකාසානඤ්චායතනයෙහි උප දනා ත්‍රිහෙතුකයා කෙරෙහි ලැබෙන්නාවූ චිත්තයෝ නම්:- වෙශ මූලික දෙසිත හැර අවශෙෂ දස අකුශල චිත්තය, මනොද්වාරා වජ්ජනය, මහා කුශල් අටය, අරූපාවචර කුශල් සතරය, ආකාසා

නාසඤ්ඤායතන විපාක චිත්තය යන මේ සුවිසිචිත්තයෝ ලැබෙත්. විඤ්ඤාණඤ්චායතනයෙහි හටගන්නා ත්‍රිහෙතුක පෘථග්ජනයා හට යටකී සුවිසි චිත්තයන් අතුරෙන් ආකාශානඤ්චායතන විපාක චිත්තය, කුශලචිත්තය, යන දෙසිත උඩරණ්ඩ කොට විඤ්ඤාණඤ්චායතන විපාකචිත්තය බහා තෙවිසිසිත් කෙනෙක්ම ලැබෙත්, ආකිඤ්ඤායතනයෙහි උපදනා ත්‍රිහෙතුකයාහට එතැනැහි යටකී තෙවිසිචිත්තයන් අතුරෙන් විඤ්ඤාණඤ්චායතන කුශල විපාක දෙසිත උඩරණ්ඩ කොට ආකිඤ්ඤායතන විපාකය බහා දෙවිසි සිත්කෙනෙක් ලැබෙත්. නෙවසඤ්ඤානාසඤ්ඤායතනයෙහි උපන් ත්‍රිහෙතුක පෘථග්ජනයාහට යටකී දෙවිසි චිත්තයන් අතුරෙන් ආකිඤ්ඤායතන කුශලවිපාක දය උඩරණ්ඩ කොට නෙවසඤ්ඤානාසඤ්ඤායතන විපාකය බහා එක්විසිසිත්කෙනෙක් ලැබෙත්. ආකාශානඤ්චායතනයෙහි උපන් සෝතාපත්ති ඵලසථයාහටදිඹිගත මිශ්‍රඝ්‍රහක සතරය, උඩ වසඟගත චිත්තය, මනෝද්වාරාවජ්ජනය, මහාකුශල් අටය, අරූපකුශල් සතරය, ආකාශානඤ්චායතන විපාකය, සෝතාපත්ති ඵලචිත්තය යන විසි චිත්තයෝ ලැබෙත්. විඤ්ඤාණඤ්චායතනයෙහි උපන් සෝතාපත්තිඵලසථයාහට යටකී විසිචිත්තයන් අතුරෙන් ආකාශානඤ්චායතන කුශලවිපාකය උඩරණ්ඩකොට විඤ්ඤාණඤ්චායතන විපාකය බහා එකුන්විසි සිත්කෙනෙක් ලැබෙත්. ආකිඤ්ඤායතනයෙහි උපන් සෝතාපත්තිඵලසථයා හට යටකී එකුන්විසි චිත්තයන් අතුරෙන් විඤ්ඤාණඤ්චායතන කුශල විපාකය උඩරණ්ඩකොට ආකිඤ්ඤායතන විපාකය බහා අටලොස් සිත්කෙනෙක් ලැබෙත්. නෙවසඤ්ඤානාසඤ්ඤායතනයෙහි උපන් සෝතාපත්තිඵලසථයාහට යටකී අටලොස් චිත්තයන් අතුරෙන් ආකිඤ්ඤායතන කුශලවිපාකය උඩරණ්ඩකොට නෙවසඤ්ඤානාසඤ්ඤායතන විපාකය බහා සත්‍රලොස් සිත් කෙනෙක් ලැබෙත්. ශකෘදාගාමී මාර්ගසථයාහට වතැහි ශකෘදාගාමී මාර්ගචිත්තය අධික කොට ලැබේ. ආකිඤ්ඤායතනයෙහි උපන් ශකෘදාගාමී ඵලසථයාහට යටකී සෝතාපත්ති ඵලසථයා කෙරෙහි ලැබෙන විසි චිත්තයන් අතුරෙන් සෝතාපත්තිඵලචිත්තය උඩරණ්ඩකොට ශකෘදාගාමී ඵලචිත්තය බහා විසි සිත්කෙනෙක් ලැබෙත්. ආකිඤ්ඤායතනයෙහි ශකෘදාගාමී ඵලසථයාහට අටලොස් සිත්කෙනෙක්ද, නෙවසඤ්ඤානාසඤ්ඤායතන ශකෘදාගාමියාහට සත්‍රලොස් සිත් කෙනෙක්ද, ඒ ක්‍රමය පිළිවෙළින් සෝතාපත්තිඵලචිත්තය උඩරණ්ඩකොට ශකෘදාගාමී ඵලචිත්තය බහා යොදාගත්කල සංඛ්‍යාක්‍රමය සම්පූර්ණ

යෙන් ලැබේ. අනාගාමී මාර්ගඨ පුද්ගලයාහට අනාගාමී මාර්ග චිත්තයම අධික වශයෙන් ලැබේ. ආකාසානඤ්චායතන අනාගාමී පුද්ගලයාහට විඤ්ඤාණඤ්චායතන අනාගාමී ඵලසට පුද්ගලයාහට එකුන්විසි චිත්තයෙක්ද, ආකිඤ්ඤායතන අනාගාමී ඵලසටයාහට අටළොස් සිත් කෙනෙක්ද, නෙවසඤ්ඤානාසඤ්ඤායතන ඵලසටයාහට සතළොස් සිත් කෙනෙක්ද ලැබෙත්. ඒ ක්‍රමයෙන්ම සකෘදාගාමී ඵලචිත්තය උඩරණයකොට අනාගාමී ඵලචිත්තය බහාලීමෙන් යට කියනලද සංඛ්‍යාවෝ වෙති. අර්හත්මාර්ගඨ පුද්ගලයාහට අර්හත් මාර්ග චිත්තය පමණක් අධිකවශයෙන් ලැබේ. ආකාසානඤ්චායතන අර්හත්ඵලසටයාහට මනොද්වාරාවජ්ජන චිත්තය, මහාක්‍රියා අටය, අරූපාවචර ක්‍රියා සිත් සතරය, ආකාසානඤ්චායතන විපාක චිත්තය, අර්හත්ඵල චිත්තය යන පසළොස් චිත්තයෝ ලැබෙත්. විඤ්ඤාණඤ්චායතන අර්හත්ඵලසටයාහට යටකියනලද පසළොස් චිත්තයන් අතුරෙන් ආකාසානඤ්චායතන විපාක ක්‍රියා දෙක උඩරණය කොට විඤ්ඤානඤ්චායතන විපාක චිත්තය බහා තුදුස් සිත් කෙනෙක්ම ලැබත්. ආකිඤ්ඤායතන අර්හත්ඵලසටයාහට යටකී තුදුස් චිත්තයන් අතුරෙන් විඤ්ඤාණඤ්චායතන විපාක ක්‍රියා දෙක උඩරණයකොට ආකිඤ්ඤායතන විපාකචිත්තය බහා තෙළෙස් සිත්කෙනෙක් ලැබෙත්. නෙවසඤ්ඤානාසඤ්ඤායතන අර්හත්ඵලසටයාහට යටකී තෙළෙස් චිත්තයන් අතුරෙන් ආකිඤ්ඤායතන විපාක ක්‍රියා දෙක උඩරණයකොට නෙවසඤ්ඤානාසඤ්ඤායතන විපාකය බහා දෙළොස් සිත්කෙනෙක්ම ලැබෙත්. ආකාසානඤ්චායතන බ්‍රහ්මයන්ගේ ආයුෂවනාහි විසි දහසක් මහාකල්ප ප්‍රමාණවෙයි. විඤ්ඤාණඤ්චායතන බ්‍රහ්මයන්ට වනාහි මහාකල්ප සතළිස්දහසක්ද, ආකිඤ්ඤායතන බ්‍රහ්මයන්ට මහාකල්ප සැටදහසක්ද, නෙවසඤ්ඤානාසඤ්ඤායතන බ්‍රහ්මයන්ට මහාකල්ප අසූඅට දහසක්ද ආයුෂ ප්‍රමාණ වන්නේයි.

මෙසේ දක්වනලද්දාවූ එකොළොස් කාමභූමිය, සොළොස් රූපාවචර භූමිය, සහර අරූපාවචරභූමිය යන එක්තිස් භූමියෙහි හවගන්නාවූ පුද්ගලයෝ සංක්ෂේපවශයෙන් දෙළොස්දෙනෙක්ද විස්තරවශයෙන් දෙසිය තුදුස් දෙනෙක්ද වෙත්. ඒ දෙසිය තුදුස් දෙන කවුද:— සතරඅපායභූමියෙහි ලැබෙන්නාවූ එකම දුගති අහෙතුක පුද්ගලයා නරක තිරිසන් ප්‍රේත අසුරසංඛ්‍යාතවූ සතර භූමියෙහි හවගන්නාවූ සතරදෙනාගේ වශයෙන් දුගති

අහෙතුකයෝ සතරදෙනෙක් වෙත්. මනුෂ්‍යභූමිය චාතුම්මහාරාජික භූමිය යන භූමිවලයෙහි ලැබෙන්නාවූ දෙලොස්දෙනා අතුරෙන් දුගති අහෙතුක පුද්ගලයා දුරුකළහෙයින් අවශෙෂවූ එකොළොස් පුද්ගලයන්ගේ වශයෙන් මනුෂ්‍යභූමියෙහි එකොළොස් දෙනෙක, චාතුම්මහාරාජික භූමියෙහි එකොළොස් දෙනෙකැයි දෙවිසි දෙනෙක් වෙත්. අවශෙෂ පඤ්චසුගති භූමියෙහි වනාහි සුගති අහෙතුකයාද නොලැබෙන හෙයින් දසදෙනෙක්ම ලැබෙත්. ඒ දසදෙන පවසුගතිභූමියෙන් මෙහෙන්වැනිකළකල්හි තව්තිසාභූමියෙහි දසදෙනෙක, යාමයෙහි දසදෙනෙක, තුසිතයෙහි දසදෙනෙක, නිම්මාණරතියෙහි දසදෙනෙක, පරනිර්මිතවශවර්තීති භූමියෙහි දසදෙනෙකැයි මෙසේ පණස් පුද්ගලකෙනෙක් වෙත්. ප්‍රථමධ්‍යානභූමිත්‍රය, විතීයධ්‍යානභූමිත්‍රය, තෘතීයධ්‍යාන භූමිත්‍රය, චෙතපථලය යන දසභූමියෙහි දෙලොස් පුද්ගලයන් අතුරෙන් සුගති අහෙතුක දුගති අහෙතුක දුහෙතුක යන තුන්දෙනෙක් නොලැබෙන හෙයින් දස බ්‍රහ්මලොකයෙහි පුද්ගලයන් නවදෙන බැගින් අනූදෙනෙක් ලැබෙත්. අසංඥසත්ත්වභූමියෙහි එකම සුගති අහෙතුක පුද්ගලයෙක් ලබේ. පඤ්චසුද්ධාවාසභූමියෙහි අනාගාම් ඵලස්ථයාය, අර්හත්මාර්ගස්ථයාය, අර්හත්ඵලස්ථයාය යන තුන්දෙන ලැබෙන හෙයින් පවසුද්ධාවාසයෙහි පස ලොස් දෙනෙක් ලැබෙත්. සතර අරූපභූමියෙහි වනාහි දුගති අහෙතුක සුගති අහෙතුක දුහෙතුක සොතාපත්තිමාර්ගස්ථය යන් සතරදෙන හැර අවදෙන බැගින් ලැබෙන හෙයින් සතර අරූපභූමියෙහි දෙනිස් පුද්ගලකෙනෙක් ලැබෙත්. මේ සියලු පුද්ගලයන්ගේ සංඛ්‍යාව පිඩුකළකල්හි දෙසිය තුදුස් පුද්ගල කෙනෙක් එක්හිස් තලයෙහිම ලැබෙත්.

ඒ එක්හිස් තලයෙහි උපදනා සත්ත්වයන්ව තමතමාගේ භූමියව සුදුසු පරිද්දෙන් ලැබියයුතු නොලැබිය යුතු ශෝභනීයත්‍රිහේතුක වනාහි "නිරයෙ එකං ඔපපාතිකයොනි හොති" යනු සූත්‍රයෙහි ලබ්ධාරබැවින් අවීමහා නරකය ආදිවූ නරකයෙහි වාසී සත්ත්වයන්ව ඔපපාතික ප්‍රතිසන්ධියම වන්නේයි. ඔවුන්ගේ ප්‍රතිසන්ධිචිත්තයාගේ උත්පාදක්ෂණය හා සමග එකවූ, සොත, ඝාණ, ජිව්හා, කාය, භාව, වසතු දශක සංඛ්‍යාතවූ සපත දශකකෙනෙක් පහළ වෙති. එකවූ සොත භාව දශකයන් ඇතැම් කලෙක්හි ඇතැම් සත්ත්වයන්ව පහළ නොවෙති. "අඝාණකෝ ඔපපාතිකෝ නත්ථි" යනු යමක අටුවා බැවින් ඝ්‍රාණප්‍රසාද නැත්තාවූ නරකවාසි සත්ත්වයෙක් නැත්තේයි. "තිරච්ඡානෙ අඝාණයොනි ජලාබුජයොනි

සංසෙදජයොනි ඔපපාතිකයොනි වෙති වතසෙසා යොනියො හොනති" යනු එම සුවිත්තාලඞ්කාරයෙහි පාඨබැවින් තිරවශෙස යොනියෙහි උපදනා සත්වයන් කෙරෙහි මේ සතරයොනියෙහි සත්වයෝම ඇත්තාහු වෙති. "නිජ්ඣාමතණ්හික පෙතවිජ්ජිත පෙතලොකෙ අණ්ඩජයොනි ජලාබුජයොනි සංසෙදජයොනි ඔපපාතිකයොනි වෙති වතසෙසා යොනියො හවනති" යනුබැවින් නිජ්ඣාමතණ්හික ප්‍රෙතයන් හැර අවශෙෂ ප්‍රෙතයන් කෙරෙහිද සතරයොනිහුම ලැබෙත්. නිජ්ඣාමතණ්හික ප්‍රෙතයන්ට වනාහි එකම ඔපපාතික යොනි ප්‍රතිසන්ධියම් ලැබෙන්නේයි. මනුෂ්‍යයන්ට හා භූමිවූ දෙවියන්වද ඒ සතර ප්‍රතිසන්ධිහුම ලැබෙත් මැයි. ඡඩ්ඩන්තවරදිව්‍යලොකයෙහි වනාහි එකම ඔපපාතික ප්‍රතිසන්ධියම් ලැබෙන්නේයි. රූපා රූප බ්‍රහ්මලොකයෙහිද එකම ඔපපාතික ප්‍රතිසන්ධියම් ලැබෙන්නේමැයි. මේ ප්‍රතිසන්ධීන් අතුරෙන් ඔසුපත් නරක හා අටමහා නරකයෙහිද, නිජ්ඣාමතණ්හික ප්‍රෙතයන් හැරෙහිද, දෙවියන්ට මෙන් ඔපපාතික ප්‍රතිසන්ධියලැබෙන්නේයයි කුමක් හෙයින් කියේදයත්? ඒතරකයෙහි උපදනා සත්වයන්ගේ කම්ජ තෙජොධාතුව අධික හෙයින් කල් පැනතවහි්යෙහි අණ්ඩජ ජලාබුජ සංසෙදජ සත්වයන් නූපද නාක්මෙන් නිජ්ඣාමතණ්හික ප්‍රෙතයන් සහිතවූ අටමහානරක වාසී සත්වයන්ට ඉඛභසෙය්‍යකාදී යොනිත්‍රය නොලැබෙන්නේමැයි.

භූමි විභාග චතුෂ්කය නිමි.

අපාය පටිසන්ධිච්, අපාය ප්‍රතිසන්ධියද; කාමසුගති පටිසන්ධිච, කාමසුගති ප්‍රතිසන්ධියද; රූපාවචරපටිසන්ධිච, රූපාවචර ප්‍රතිසන්ධියද; අරූපාවචරපටිසන්ධිච, අරූපාවචර ප්‍රතිසන්ධියද; ඉති, මෙසේ; චතුබ්බිධා, සතරාකාර ඇත්තාවූ; පටිසන්ධි නාම, ප්‍රතිසන්ධිය වනාහි; වෙදිතබ්බා, දතයුත්තියි; තත්‍ථ, (තෙසු පටිසන්ධිසු.) ඒ සතරාකාර ප්‍රතිසන්ධීන් අතුරෙන්; අකුසල විපාකොපෙක්ඛා සහගත සන්තීරණං, අකුසල විපාක උපෙක්ඛාසහගත සන්තීරණසිත් තෙමේ; අපායභූමිඤ්, අපාය භූමියෙහි; ඔකකන්තිකඛණෙ, බැසගන්නාක්ෂණයෙහි; පටිසන්ධි හුත්වා, ප්‍රතිසන්ධිව; තතොපරං, ඒ ප්‍රතිසන්ධියෙන් මත්තෙහි; භවඞ්ගහුත්වා, භවාඞ්ගව; පරියොසානෙ, භවයාගේ කෙළවර; චවනහුත්වා, චුතිසිත්ව; වොච්ඡිජ්ජති, විශෙෂයෙන් සිඳේ. එකා, හුදකලාවූ; අයංපටිසන්ධි, මේ ප්‍රතියන්ධි තොමෝ

අපායපටිසන්ධිනාමේ, අපායපටිසන්ධි නම් වේ. පන, දුගති ප්‍රතිසන්ධියෙන් අන්‍යවූ සුගති අහෙතුක ප්‍රතිසන්ධිය දක්වම් :-කුසල විපාකොපෙක්ඛාසහගත සන්තීරණං, කුශල විපාක උපෙක්ෂා සහගත සන්තීරණ සිත්තෙමේ ; කාමසුගතියංනාම, කාමසුගති භූමියෙහි ; ජවවසේනාදිනං, ප්‍රතිසන්ධි වශයෙන් අඞ්ගවිකාර ආදී විකාර ඇත්තාවූ ; මනුස්සානංවෙව, මිනිසුන්ගේද ; නොහෙත් මිනිසුන්වද ; භූමිනිස්සිතානං, භූමිවූ දෙවියන්ගේ සභාව ඇති හෙයින් භූමිනිශ්‍රිතයයි කියන ලද්දාවූ ; විනිපාතිකාසුරානංව, විනිපාතික අසුරයන්ගේද ; පටිසන්ධි භවඞ්ගචුතිවසෙන, ප්‍රතිසන්ධිභවාඞ්ගචුති වශයෙන් ; පවත්තති, හටගන්නේයි. පන, අහෙතුක ප්‍රතිසන්ධියෙන් අන්‍යවූ සහෙතුක ප්‍රතිසන්ධිය දක්වම් :- අඩ්ඪමහාවිපාකානි, මහාවිපාකයෝ අටදෙන තුමූ ; සබ්බඵාපි, සෑම ප්‍රකාරයෙහුදු ; කාමසුගතියං එව, සපතාකාම සුගතියෙහිම ; පටිසන්ධිභවඞ්ගචුතිවසෙන පවත්තන්ති, ප්‍රතිසන්ධි භවාඞ්ගචුතීන්ගේ වශයෙන් හටගන්නාහු වෙත්. තවද්‍යම්, නව ප්‍රකාරවූ මේ ප්‍රතිසන්ධිහු තුමූ ; කාමසුගතිපටිසන්ධියොනාම, කාම සුගති ප්‍රතිසන්ධිහු නම් වෙත්. පන, අවයවයෙන් අන්‍යවූ සමුදායාදීය දක්වම් :- දස විධාපි, දශප්‍රකාරවූද ; සා අයංපටිසන්ධි, ඒ ප්‍රතිසන්ධිතෘෂ්ණාමෝ ; කාමාවචර පටිසන්ධිවෙව, කාමාවචර ප්‍රතිසන්ධියයි කියාම ; සඞ්ඛ්‍යංගච්ඡති, සඞ්ඛ්‍යාවට හෙවත් ගණනට යෙයි. තෙසු, දශප්‍රකාරවූ ඒ ප්‍රතිසන්ධීන් යුක්තවූ ඒ පුද්ගලයන් අතුරෙන් ; චතුන්නං අපායානංච, සතර ආපායික පුද්ගලයන්වද ; මනුස්සානව, මිනිසුන්වද ; විනිපාතිකාසුරානව, විනිපාතික අසුරයන්වද ; ආයුප්පමාණගණනාය, ආයුප්‍රමාණ ගිණීමෙහි ; නියමොනත්ථි, එකාන්තබවෙක් නැත්තේයි. පන, අනියතයෙන් අන්‍යවූ නියතය දක්වම් :- චාතුම්මහාරාජිකානං දෙවතානං; සිව්මහරජයෙහි දෙවියන්ගේ ; ආයුප්පමාණං, ආයුෂ ප්‍රමාණය ; දිබ්බානි, දෙවියන් කෙරෙහිවූ ; පඤ්චවස්සසතානි හොන්ති, පන්සියයක් හවුරුදු වෙත් මනුස්සගණනාය, මිනිස් ගණනින් ; නවුතිවස්ස සතසහස්සප්පමාණං හොති, අනූලක්ෂ යක් හවුරුදු වෙයි. තතෝ, ඒ සිව්මහ රජයෙහි දෙවියන්ගේ ආයුගණනින් ; චතුගුණං, සතරගුණයක් තෙමේ ; තාවතිංසා නං දෙවානං, තව්තිසාවැසි දෙවියන්ගේ ; ආයුප්පමාණංහොති, ආයුෂ ප්‍රමාණය වෙයි ; තතෝ, ඒ තව්තිසාවැසි දෙවියන්ගේ ආයුගණනින් ; චතුගුණං. සතර ගුණයක් තෙමේ ; යාමානං දෙවානං, යාමදෙවියන්ගේ ; ආයුප්පමාණං හොති, ආයුෂ ප්‍රමාණය වෙයි. තතෝ, ඒ යාමදෙවියන්ගේ ආයුගණනින් ;

චතුගහුණං, සතර ගුණයක් තෙමේ; තුසිතානං දෙවානං, තුසිත දෙවියන්ගේ; ආයුපපමාණං හොති, ආයුෂ ප්‍රමාණය වෙයි. තතෝ, තුසිත දෙවියන්ගේ ආයුගණනින්; චතුගහුණං, සතර ගුණයක් තෙමේ; නිම්මානරතීනං දෙවානං. නිම්මාණරතී දෙවියන්ගේ; ආයුපපමාණං හොති, ආයුෂ ප්‍රමාණය වෙයි. තතෝ, ඒ නිම්මානරති දෙවියන්ගේ ආයුගණනින්; චතුගහුණං, සතර ගුණයක් තෙමේ; පරනිම්මිත වසවත්තීනං දෙවානං, පරනිම්මිත වශවර්ත්ති දෙවියන්ගේ; ආයුපපමාණං හොති, ආයුෂ ප්‍රමාණය වෙයි. වසවත්තිසු, වශවර්ත්ති භූමියෙහි හව ගත්තාවූ; දෙවානං, දෙවියන්ගේ; ආයුපපමාණං, ආයුෂ ප්‍රමාණය; මනුස්සගණනාය, මිනිස්ගණනින්; වස්සානං, වර්ෂයන් සංඛ්‍යාවූ; නවසතකෝටියෝ, කෝටිනවසියයෙක්ද; එකවීස කෝටියෝව, එක්විසිකෝටියෙක්ද; තථා, එපරිද්දෙන්; සත්තව වස්සසතසහස්සානි, හත්රිදුසැටලක්ෂයෙක්ද; හොති, වෙයි.

පඨමජ්ඣාන විපාකං, ප්‍රථමධ්‍යාන විපාකය; පඨමජ්ඣාන භූමියං, ප්‍රථමධ්‍යාන භූමියෙහි; පටිසන්ධි භවඞ්ගචුතිවසෙන, ප්‍රතිසන්ධිය භවාඞ්ගය චුතිය යන මෙවුන්ගේ වශයෙන්; පවත්තති, හටගන්නේයි. තථා, එපරිද්දෙන්; දුතියජ්ඣාන විපාකම්ව, තෙවැනි ධ්‍යානය හා යුක්තවූ විපාකචිත්තයද; තතිය ජ්ඣාන විපාකම්ව, තෘතීයධ්‍යානය හා යුක්තවූ විපාක චිත්තයද; දුතියජ්ඣාන භූමියං, තෙවැනි ධ්‍යාන භූමියෙහි; පටිසන්ධි භවාඞ්ග චුතිවසෙන, පටිසන්ධි භවඞ්ග චුතීන්ගේ වශයෙන්; පවත්තති, හටගන්නේයි. චතුත්ථජ්ඣාන විපාකං, චතුර්ථධ්‍යානය හා යුක්තවූ විපාක චිත්තය; තතියජ්ඣාන භූමියං, තෘතීයජ්ඣාන භූමියෙහි; පටිසන්ධිභවඞ්ග චුතිවසෙන ප්‍රතිසන්ධිභවාඞ්ගචුති වශ යෙන්; පවත්තති, හටගන්නේයි. පඨමජ්ඣාන විපාකං, පඨම ධ්‍යානය හා යුක්තවූ විපාකචිත්තය; චතුත්ථජ්ඣාන භූමියං, චතුර්ථ ධ්‍යාන භූමියෙහි; පටිසන්ධිභවඞ්ග චුති වසෙන, ප්‍රතිසන්ධි භවාඞ්ග චුතිවශයෙන්; පවත්තති, හටගන්නේයි. පන, විශෙෂාර්ථයක් දක්වමි:- අසඤ්ඤසත්තානං, අසංඥ භූමියෙහි සත්ත්ව යන්ට: රූපමෙව, ජීවිත නවක රූපකලාප මාත්‍රයක්ම; පටිසන්ධි හොති, ප්‍රතිසන්ධිය වෙයි; තථා එපරිද්දෙන්; තතොපරං, ඒ ප්‍රතිසන්ධියෙන් මත්තෙහි; පවත්තියම්ව, ප්‍රවෘත්තිකාලයෙහිද; චවනකාලෙව, චුතවන්නාවූ කාලයෙහිද; රූපමෙව ජීවිත නවක රූපකලාප මාත්‍රයක්ම; භවඞ්ග චුතිවසෙන, භවාඞ්ගචුති වශයෙන්; පවත්තතිම්ව, පැවත;

නිරුජ්ඣති, නිරුඣවන්නේයි. ඡිඤ්ඤා, මේ ප්‍රතිසන්ධිහු සදෙන තුමූ; රූපභවගර පටිසන්ධියොනාම, රූපභවගර ප්‍රතිසන්ධිහු නම් වෙත්.

තෙහු, ඒ සවිප්‍රකාර ප්‍රතිසන්ධීන් හා යුක්තවූ පුද්ගලයන් අතුරෙන්; බ්‍රහ්මපාරිසජ්ජානං දෙවානං, බ්‍රහ්මපාරිසජ්ජයෙහි දේවියන්ගේ; ආයුප්පමාණං, ආයුෂ ප්‍රමාණය; කප්පඤ්ඤ, අසඞ්ඛ්‍ය කල්පයාගේ; තතියෝ භාගොහොති, තුන්වන භාගය වෙයි. හෙවත් තුනින් බෙදූ කොටසක් වෙයි. බ්‍රහ්ම පුරෝහිතානං දෙවානං, බ්‍රහ්ම පුරෝහිත තුම්යෙහිවූ දෙවියන්ගේ: ආයුප්පමාණං, ආයුෂ ප්‍රමාණය; උපඩ්ඩකප්පෝ හොති, අසඞ්ඛ්‍ය කල්පයාගේ අඩියක් වෙයි. මහාබ්‍රහ්මානං, දෙවානං, මහාබ්‍රහ්ම තුම්යෙහිදෙවියන්ගේ; ආයුප්පමාණං, ආයුෂ ප්‍රමාණය; එකොකප්පොහොති, එක් අසඞ්ඛ්‍ය කල්පයෙක් වෙයි. පරිත්තාභානං දෙවානං, පරිත්තාභා නම් දෙවියන්ගේ; ආයුප්පමාණං, ආයුෂ ප්‍රමාණය; චතුකප්පානීහොන්ති, මහාකල්පයෝ දෙදෙනෙක්වෙත්; අප්පමාණාභානං, දෙවානං, අප්පමාණාභ දෙවියන්ගේ; ආයුප්පමාණං, ආයුෂ ප්‍රමාණය; චත්තාරිකප්පානි හොන්ති, මහාකල්පයෝ සතරදෙනෙක් වෙත්. ආභස්සරානං දෙවානං, ආභස්සර දෙවියන්ගේ; ආයුප්පමාණං, ආයුෂ්ප්‍රමාණය; අට්ඨකප්පානි හොන්ති, මහාකල්පයෝ අටදෙනෙක් වෙත්. පරිත්තසුභානං දෙවානං, පරිත්තසුභ දෙවියන්ගේ; ආයුප්පමාණං, ආයුෂ ප්‍රමාණය; සොළසකප්පානි හොන්ති, සොළොස් මහාකල්පයක් වෙත්. අප්පමාණසුභානං දෙවානං. අප්පමාණ සුභ දෙවියන්ගේ; ආයුප්පමාණං, ආයුෂ ප්‍රමාණය; වත්තිංසකප්පානි හොන්ති, දෙතිස් මහාකල්පයෙක් වෙත්; සුභකිණ්හකානං දෙවානං, සුභකිණ්හක දෙවියන්ගේ; ආයුප්පමාණං, ආයුෂ ප්‍රමාණය; චතුසට්ඨිකප්පානි, හොන්ති, සැට මහාකල්පයෙක් වෙත්. වෙහප්ඵලානං දෙවානම්ව, වෙහප්ඵල දෙවියන්ගේද; අසඤ්ඤසත්තානං දෙවානම්ව, අසංඥතලවාසී දෙවියන්ගේද; ආයුප්පමාණං, ආයුෂ ප්‍රමාණය; පඤ්චකප්පසතානි හොන්ත, මහාකල්ප පන්සියයෙක් වෙත්. අවිහානං දෙවානං, අවිහතල වාසී දෙවියන්ගේ; ආයුප්පමාණං, ආයුෂ ප්‍රමාණය; කප්ප සහස්සානි හොන්ති, මහාකල්ප දහසෙක් වෙත්. අතප්පානං දෙවානං, අතප්පතලවාසී දෙවියන්ගේ; ආයුප්පමාණං, ආයුෂ ප්‍රමාණය; වෙකප්ප සහස්සානිහොන්ති, මහාකල්ප දෙදහසෙක් වෙත්. සුදස්සානං දෙවානං, සුදස්සතලවාසී දෙවියන්ගේ ආයුප්ප

මාණං, ආයුෂ ප්‍රමාණය චතුසාරිකපපසහස්සානි හෙවත්, මහා කල්පයක් වෙත්. සුදස්සිනං දෙවානං, සුදස්සිතලවාසී දෙවියන්ගේ ; ආයුප්පමාණං, ආයුෂ ප්‍රමාණය ; අට්ඨකප්පසහස්සානි හෙවත්, මහා කල්ප අටදහසක් වෙත්. අකනිට්ඨානං දෙවානං, අකනිට්ඨතලවාසී දෙවියන්ගේ ; ආයුප්පමාණං, ආයුෂ ප්‍රමාණය, සොළසකප්පසහස්සානි හෙවත්, මහා කල්ප සොළොස් දහසක් වෙති.

පඨමාරූපාදිවිපාකානි, ප්‍රථමාරූපයන් ආ යුක්තවූ විපාකයෝ තුමූ; පඨමාරූපාදිභූමිසු, ප්‍රථමාරූප්‍යාදිභූමියෙහි; යථාක්කමං, පිළිවෙළින්; පටිසන්ධිභවඞ්ගචුතිනිවසෙන, ප්‍රතිසන්ධිභවාඞ්ගචුතීන්ගේ වශයෙන්; පවත්තන්ති, පවතිත්; තත්‍රායං භූමං, මේ සතර ප්‍රතිසන්ධිභූමිය; ආරූපප්පවිසන්ධියෝ නාම, ආරූප්‍ය ප්‍රතිසන්ධි නම් වෙත්. පන, ප්‍රතිසන්ධියෙන් අන්‍යවූ ආයුෂ ප්‍රමාණය දක්වමි:—තෙසු චතුසු, ඒ සතර ප්‍රතිසන්ධියෙන් යුක්ත පුද්ගලයන් අතුරෙන්; ආකාසානඤ්චායතනූපගානං දෙවානං, ප්‍රථමාරූප්‍ය භූමියට පැමිණි දෙවියන්ගේ; ආයුප්පමාණං, ආයුෂ ප්‍රමාණය; වීසතිකප්පසහස්සානි හෙවත්, මහා කල්ප විසිදහසක් වෙත්. විඤ්ඤාණඤ්චායතනූපගානං දෙවානං, විතීයාරූප්‍යතලයට පැමිණි දෙවියන්ගේ; ආයුප්පමාණං, ආයුෂ ප්‍රමාණය; චත්තාලීසකප්පසහස්සානි, සතළිස් දහසක් මහා කල්පයෝ වෙත්. ආකිඤ්චඤ්ඤායතනූපගානං දෙවානං, තුන්වෙනි ආරූපතලයට පැමිණි දෙවියන්ගේ; ආයුප්පමාණං, ආයුෂ ප්‍රමාණය; සට්ඨිකප්පසහස්සානි හෙවත්, මහා කල්ප සැටදහක් වෙත්; නෙවසඤ්ඤානාසඤ්ඤායතනූපගානං දෙවානං, සතරවන ආරූප්‍යයට පැමිණි දෙවියන්ගේ; ආයුප්පමාණං, ආයුෂ ප්‍රමාණය; චතුරාසීති කප්පසහස්සානි හෙවත්, සුවාසූදහසක් මහා කල්පයට ආයුෂ වෙත්.

පටිසන්ධි භවඞ්ගඤ්ච තථා වචන මානසං,
එකමේව තථේවේ ක විසයංවෙක ජාතියං.

එක ජාතියං, එක් භවයෙක්හි; පටිසන්ධිච, ප්‍රතිසන්ධිචිත්තයද; භවඞ්ගච, භවාඞ්ග චිත්තයද; තථා, එසේම; වචනමානසංච, චුතිචිත්තයද; එකමෙව හොති, භූමිජාති සම්ප්‍රයුක්ත ධම්මසංඝාරවශයෙන්; සදෘශමවෙයි. තථේව, එපරිද්දෙන්ම; එකවිසයච, සදෘශවූ අරමුණුද ඇත්තේ වෙයි. ඉදං, මේ කියනලද්දේ වනාහි; එත්ථ, මේ විපිමුක්තඝඩ්ගහයෙහි; පටිසන්ධි චතුකඤ්ච, ප්‍රතිසන්ධි චතුෂ්කයයි.

ප්‍රතිසන්ධි වතුස්සතයෙහි විභාග කෙසේයත්? අපාය ප්‍රතිසන්ධිය කාමසුගති ප්‍රතිසන්ධිය, රූපාවචරප්‍රතිසන්ධිය, අරූපාවචර ප්‍රතිසන්ධි යයි ප්‍රතිසන්ධිතොමෝ සතරාකාරවන්නීයි. "භවතො භවසස පටිසන්ධානං පටිසන්ධි" යනු නිර්වචන බැවින් අතීතභවයෙහි චුති චිත්තය හා එතීමාන භවයෙහි ප්‍රතිසන්ධි චිත්තයද එතීමාන භව යෙහි චුති චිත්තය හා අනාගත භවයෙහි ප්‍රතිසන්ධි චිත්තයද යන භවයෙන් භවය අතුරක් නැතිසේ ගලපන්නාවූ චිත්තය ප්‍රතිසන්ධි නම් වේ. ඔවුන් අතුරෙන් දෙලොස් අකුශලයන්ගේ විපාකවූ උපෙක්ඛාසහගත සන්තීරණ සිත් තෙමේ සතර අපාය භූමියෙහි බැසගන්නාවූ ක්ෂණයෙහි පළමුකොට ප්‍රතිසන්ධි වශයෙන් ඉපිද ඒ අපාය භූමියෙහි වසනතාක්කල් මුලුල්ලෙහි භවාඞ්ගවද, ඒ අපාය භූමියෙන් චුතවන්නාවූ කාලයෙහි චුති චිත්තවශයෙන්ද ඉපිද නිරුඹවන්නේයි. මේ සතර අපායට අයත්වූ සත්ත්වයින්ගේ සඞ්ඛ්‍යාවට උපමා කළහැකි වසතුවක් ලොකයෙහි නැත්තේයි. එහෙයින් නානත්තකායා එකත්තසඤ්ඤිනියි ව්‍යවහාර කෙරෙති. කාම්බලාස්සතර නාග භවනයෙහි හා ගුරුළු භවනයෙහිද උපදනා සත්ත්වයන්ගේ ප්‍රතිසන්ධිචිත්තය මෙම උපෙක්ෂා සහගත සන්තීරණ චිත්තයම වන හුමුත් ඔවුන්ගේ ප්‍රවෘත්තිකාලයෙහි දෙවියන්ට බඳුවූ ක්ෂුධාභොජනය අනුභවකොට දිව්‍ය විමාන දිව්‍ය කල්ප වෘක්ෂාදියෙන් අභිමත වසතු ලැබ දෙවියන්මෙන් සැපවිඳිනාහු වෙති. ඔවුන් අභිමතවූ රූපාදිය මවා පෑමෙහිද පොහොසත් වෙති. ඔවුන්ගේ ප්‍රතිසන්ධිවිඤ්ඤාණය අකුශලකර්ම හෙතුවෙන් හට ගත්තේ නමුදු සියලු ප්‍රවෘත්ති විපාක පරම්පරාව කාමාවචර උපෙක්ෂාසහගත කුශල බලයෙන්ම ලැබෙත්. අකුශල විපාක සන්තීරණ බලයෙන් හටගත්තාවූ විපාකවිඤ්ඤාණය බැවින් ඒ ආත්මයෙහි ධ්‍යාන මාර්ගඵලාදිය එහිනතයෙන් නො ලැබෙත් නේමැයි. කුශලවිපාක උපෙක්ෂා සහගත සන්තීරණ චිත්තය වසඟ කාමසුගතියෙහි ජාත්‍යන්ධ ජාතිබධිර ජාතිනපුංසකාදිවූ අඛ්‍යවකාල සත්ත්වයන්ගේ හා මඛ්‍යොසෙයින් අනුන්ට බැල මෙහෙ කරන්නාවූ විමංසණ බුද්ධිමත්වූ අඛ්‍ය සම්පූණීවූද සත්ත්ව යන්ගේ ප්‍රතිසන්ධිය හා භූමිනිශ්‍රිතවූ විනිපාතික අසුර සඞ්ඛ්‍යාතවූ ඥති ප්‍රේතාදීන්ගේද, ප්‍රතිසන්ධියත් නේයි. ඔවුන්ගේ ප්‍රතිසන්ධිය ඤාණවිප්‍රයුක්තවූ දුහෙතුක කාමාවචර කම්බලයෙන් හට ගත්තේයයි දතයුතුයි. ඔවුන් අතුරෙන් ලාමක මනුෂ්‍යයෝ මනුෂ්‍ය භූමියෙහිද, විනිපාතික අසුරයෝ චාතුම්මහාරාජික භූමියෙහිද, ඇතුලත්වන බැවින් චාතුම්මහාරාජිකයෙහිද අහෙතුක ප්‍රතිසන්ධිකයෝ ඇතැයි කියති. මහාවිපාකයෝ අටි

දෙන වනාහි සාමාන්‍යයෙන් සපත්කාම්භවගීයෙහි ප්‍රතිසන්ධි විශයෙන් පවත්නානුයයි කියනත් මනුෂ්‍යභූමියෙහි ඛත්තිය මහාසාර බ්‍රාහ්මණ මහාසාර ගහපති මහාසාර යන සාමි කුලත්‍රයෙහි ඥානසම්ප්‍රයුක්ත සතරවිපාකයද, ඒ සාමි කුලත්‍රයෙහි මහාසාර කොවන්නාවුන්ගේ හා ශූද්‍රයන්ගේද ප්‍රතිසන්ධිය දුහෙතුක විපාක සතරෙන්ම ගන්නේයි. සවිකාම සුගීයෙහි මහෙශාක්‍ය මහානුභාවසම්පන්න දෙවියන්ගේ ප්‍රතිසන්ධිය ත්‍රිහෙතුක විපාක සතරෙන් හා ගන්ධර්ලෝක අසුරභවන යන දෙතන්හිද අල්පෙශාක්‍ය දෙවියන්ගේද ප්‍රතිසන්ධිය දුහෙතුක විපාක සතරෙන් ගන්නේයි. එහෙයින් අසුර ගන්ධර්වාදීන්ට එම ආත්මයෙහි ධ්‍යාන මාර්ගඵලාදිය කොලැබිය හැකි වේ. මේ සදිව්‍ය ලොකවාසීන්ගේ ආයු ප්‍රමාණය යට භූමිවතුෂ්කයෙහි කී නයින් දතයුතුයි.

ප්‍රථමධ්‍යාන විපාකය ප්‍රථමධ්‍යාන භූමියෙහි ප්‍රතිසන්ධි භවාඞ්ග චුතිවශයෙන් පවත්නේයයි සාමාන්‍යයෙන් කියේ නමුදු විතර්කාදී පවාඞ්ගයෙන් යුක්තවූ ප්‍රථම ධ්‍යානය උපදවාගත් පමණින් කාලක්‍රියා කෙළේවී නම් බ්‍රහ්ම පාරිෂද්‍යභූමියෙහි උපදනේ වෙයි. එසේම සත්ත්‍වී ආත්මභාවයෙහි උපන්නාවූ අඤ්ඤසමාපත්තිලාභීවූ අනාගාමීහුද බ්‍රහ්ම පාරිෂද්‍යභූමියෙහි ඉපිද ඒතු මතු බඹලොවට අනුක්‍රමයෙන් ගොස් සුඛාවාස භූමියෙහි පිරිනිවන් පානානුයයි දතයුතුයි. ඒ ප්‍රථමධ්‍යානය මධ්‍යම වශයෙන් වැඩූ පවවශිතා වේන් පුරුදු නොකළාවූ ධ්‍යානලාභී තෙමේ බ්‍රහ්ම පුරෝහිතතල යෙහි උපදී. ඒ ප්‍රථමධ්‍යානය පස් ආකාරයකින් වශීභූතකර ගත්නාවූ ධ්‍යානලාභියට මහ බ්‍රහ්මභූමියෙහි ප්‍රථමධ්‍යානවිපාක චිත්තය ප්‍රතිසන්ධි භවාඞ්ග චුතිවශයෙන් පවත්නේයි. සෙසු ධ්‍යාන යන්ගේද ඇටකිනයින් විස්තර දතයුත්තේයි.

ප්‍රතිසන්ධි චතුයෂ්ඨක නිමි.

(පදනතාවී.)

ජනකව, විපාකනාමසඤ්ඤිකචෙතනාරූපයන් උපදවන්නාවූ ජනකකම්මයද; උපත්ථම්භකව, ඒ ජනක කම්මයට ලංව රුකුල් දෙන්නාවූ උපසථම්භක කම්මයද; උපපීළකව, ඒ ජනක කම්මයට ලංව පීඩාකරන්නාවූ උපපීඩක කම්මයද; උපඝාතකව, ජනක කම්මයට ලංව විපාකඝාතය සිදින්නාවූ උපඝාතක කම්මයද; ඉති, මේසේ; කිච්චවසෙන, කෘත්‍යයන්ගේ වශයෙන්; චතුධාරිකම්මානි නාම, සතරකම්මෙකනෙක්; වෙදිතබ්බානි, දතයුත්තාහුය.

ගරුකව, කුශලපක්‍ෂයෙහි නොහොත් අකුශලයෙහි සියල්ලට වඩා බරවූ කර්මයද; ආසන්නව, මරණාසන්නකාලයෙහි සිහි කරණ ලද්දවූ හෝ රැස්කරණ ලද්දවූ කර්මයද; ආචිණ්ණව, බොහෝකලක් නිරන්තරයෙන් පුරුදුකරණ ලද්දවූ කර්මයද; කටත්තාකම්මව, ගරුකාදී භාවයට නොපැමිණියාවූ විපාකදීම මාත්‍රයක් ඇත්තාවූ කර්මයද; ඉති, මෙසේ; විපාකදානපරියායෙන, විපාක දෙන්නාවූ ක්‍රමයෙන්; චත්තාරිකම්මානි නාම, සතර කර්ම කෙනෙක්; වෙදිතබ්බානි, දතයුත්තානුග.

දිට්ඨධම්මවේදනීයව, ප්‍රත්‍යක්‍ෂවූ ශරීර භාවයෙහි විඳදයුතු විපාක ඇත්තාවූ කර්මයද; නොහොත් කර්ම රැස්කළාවූ සකල පවත්තයටම විපාකදීම ලක්‍ෂණකොට ඇත්තාවූ කර්මයද; උපපජ්ජවේදනීයව, දෙවෙනි ආත්මභාවයෙහි විඳදයුතුවූ කර්මයද; අපරාපරියවේදනීයව, ප්‍රත්‍යක්‍ෂ ආත්ම භාවයෙන්ද දෙවෙනි ආත්මභාවයෙන්ද අන්‍යවූ යම්කිසි ආත්මභාවයක විඳදයුතු විපාකදීම ඇත්තාවූ කර්මයෙක්ද නොහොත් තුන්වෙනි භවය පටන් සකල්පරිනිර්වාණය දක්වා මේ අතරෙහි යම්කිසි තැනකදී විපාකදීම ලක්‍ෂණකොට ඇත්තාවූ කර්මයෙක්ද; අහොසිකම්මව, (විපාකදී කෙළවරවූද) අනාගතයෙහි විපාක නොදියයුතුවූද කළිඑත්‍රයකින් කර්මනමුදු අහොසිතම් කර්මයෙක්ද; ඉති, මෙසේ; පාකකාලවසෙන, විපාක දෙන්නාවූ කාලයන්ගේ වශයෙන්; කම්මානිනාම, කර්මයෝ වෙත්ගි; චත්තාරිඉති, සතරදෙනෙකැයි; වෙදිතබ්බානි, දතයුත්තානුග.

තථා, එපරිද්දෙන්; අකුසලව, දුෂ්ප්‍රෝස් අකුශල කර්මයද; කාමාවචරකුසලව, කාමාවචර කුසලකර්ම අටද; රූපාවචරකුසලව, රූපාවචර කුසලකර්ම පසද, අරූපාවචරකුසලව, අරූපාවචර කුශලකර්ම සතරක්ද; ඉති, මෙසේ; පාකඨානවසෙන, විපාක දෙන්නාවූ ස්ථානයන්ගේ වශයෙන්; චත්තාරිකම්මානි නාම, සතර කර්මයෙනෙක්; වෙදිතබ්බානි, දතයුත්තානුග.

තත්‍ර, ඒ සතරාකාර කර්මයන් අතුරෙන්; අකුසලං, අකුශල කර්ම තෙමේ; කායකම්මව, කායකර්මයද; වචීකම්මව, වාක් කර්මයද; මනොකම්මව. මනෝ කර්මයද; ඉති, මෙසේ; කම්මවාරවසෙන, කර්මද්වාරයන්ගේ වශයෙන්; තිවිධං හොති, තුන්වැදෑරුම් වෙයි. කථං හොති? කෙසේ වන්නේද යත්? පාණාතිපාතොව, අනුන්ගේ ජීවිතෙන්ද්‍රියය ඉක්මුත්තුළුව හෙළීමද; අදින්නාදානව, හිමියාවසින් කායවාක්දෙකින් නොදෙන ලද්දවූ අන්‍යතු වස්තුව හොරකම් කිරීමද; කාමෙසුමිච්ඡාචාරොව, සත්පුරුෂයන්වූ අඛ්‍රහ්මචාරීන්ගේ

හැසිරීම සෙවනය කිරීම වශයෙන්ද; කායද්වාරයෙහි හටගන්නාවූ නොයෝයුතු මානුරක්ඛිතාදී සථානයන් ඉක්මවන්නාවූ චෙතනා සඞ්ඛ්‍යාතවූ කාමගුණයෙහි වරදවා හැසිරීමද; ඉති, මෙසේ; තීව්‍රඛංකම්මං, තුන්වැදෑරුම්වූ කර්මතෙමේ; කායවිඤ්ඤත්තිසඞ්ඛාතෙ, කායවිඥප්තියයි කියනලද්දුවූ නොහොත් ශරීරයෙන් හැඟවීම් සංඛ්‍යාතවූ නොහොත් ශරීරය හේතුකොටගෙණ දැන්වීම යයි කියනලද්දුවූ; කායද්වාරෙ, කායද්වාරයෙහි; බාහුල්ලවුත්තිතො, බොහෝ සෙයින් හටගන්නා බැවින්; කායකම්මං නාම, කායකර්ම නම් වේ.

මුසාවාදෙ, අසත්‍යය සත්‍යය වශයෙන් කීමට හේතුවූ වචනයද; පිසුණාවාචා, දෙදෙනෙකුගේ ප්‍රේමය සුණුවිසුණුකරන්නාවූ වචනයද; ඵරුසාවාචා, කියනකල්මෙන් රෞද්‍ර සපථී ඇත්තාවූ වචනයද; සම්ඵප්පලාපො ච, හිතාහිතවිධිය විනාශකරන්නාවූ ශීතාහරණාදි නිෂ්ප්‍රයෝජන කථාවන්ද; ඉති, මෙසේ; චතුබ්බිධං කම්මං, සතර වැදෑරුම් කර්මතෙමේ; වචීවිඤ්ඤත්තිසඞ්ඛාතෙ, වචීවිඥප්තියයි කියනලද්දුවූ නොහොත් වචනයෙන් හැඟවීමයයි කියනලද්දුවූ නොහොත් වචනය හේතුකොටගෙණ; දැන්විය යුත්තේයයි කියනලද්දුවූ; වචීද්වාරෙ, වාග්ද්වාරයෙහි; බාහුල්ලවුත්තිතො, බහුලවශයෙන් හටගත් සෙයින්; වචීකම්මං නාම, වාක් කර්ම නම් වේයි,

අභිජ්ඣාච, මෙරමාගේ සම්පත්තිය අභිවුඛකොට කල්පණා කිරීම් වශයෙන් පවත්නාවූ දැඩි තෘෂ්ණාවද; ව්‍යාපාදෙ ච, මෙරමාගේ සම්පත් විනාශකිරීමට හේතුවූ වෙෂචෙතසිකයද; මිච්ඡාදිට්ඨිච, විපරීතවූ දැකීමද; ඉති, මෙසේ; තිවිධං කම්මං, තුන්වැදෑරුම් කර්මතෙමේ; විඤ්ඤත්තියා අඤ්ඤත්තුාහි, කයින් හැඟවීමෙන් හෝ වචනයෙන් හැඟවීමෙන් තොරවද; මනසම්භවෙව, චිත්තයෙහිම; බාහුල්ලවුත්තිතො, බහුල වශයෙන් හටගන්නා හෙයින් නොහොත්; මනසම්භවං, මනොද්වාරයෙහි; බාහුල්ලවුත්තිතොයෙව, බහුල වශයෙන් හටගන්නාහෙයින්ම; මනොකම්මං නාම, මනඃ කර්ම නම් වෙයි.

තෙසු, ඒදශාකුශලකර්මපථයන් අතුරෙන්; පාණාතිපාතොච, පාණාතිපාතයද; ඵරුසාවාචාච, පරුෂ වචනයද; ව්‍යාපාදෙව, ව්‍යාපාදයද; දෙඝමූලෙන, වෙඝසංඛ්‍යාතවූ මූලය හේතුකොටගෙණ; ජනයන්ති, උපදනාහු වෙත්. කාමෙසුමිච්ඡාචාරොච, කාමමිථ්‍යාචාරයද; අභිජ්ඣාච, අභිධ්‍යාවද; මිච්ඡාදිට්ඨිච, මිථ්‍යාදෘෂ්ටි

ඝද;ලෝභමූලෙන, ලෝභසංඛ්‍යාත මූලය හෙතුකොටගෙණ; ජනඝනති, උපදනාහු වෙත්. සෙසානි කිඤ්චාපි කම්මපථයන්ගෙන් අවශිෂ්ටවූ; චත්තාරිහි, සතරාකාරවූ; අදින්නාදාන මුසාවාද පිසුණාඵරුස සම්ඵප්පලාපයෝ වත්තාහි; ඒහිමූලෙහි, ලෝභ වෙෂ සංඛ්‍යාතවූ මූලය හෙතුකොටගෙණ; සම්භවන්ති, හටගන්නාහු මෙත්. පන, අවයවයෙන් අන්‍යවූ; සමුදයාර්ථය දක්වම්:- චිත්තුප්පාද වසෙන, චිත්තෝත්පාදයන්ගේ වශයෙන්; එතං අකුසලං, ඒ අකුශල කම්තෙමේ; සඞ්ඛ්‍යාපි, සංඛ්‍යාප්‍රකාරයෙනුදු; වාදසවිධං හොති දෙළොස්වැදෑරුම් වේයි.

කාමාවචර කුසලම්පි, කාමාවචර කුශලයද; කායද්වාරෙ පවත්තං, කායද්වාරයෙහි හටගත්තාවූ කම්තෙමේ; කායකම්මව, කායකම්මයයි කියාද; වචීද්වාරෙපවත්තං, වචීද්වාරයෙහි හටගත්තාවූ කම්තෙමේ; වචීකම්මව, වචීකම්මයයි කියාද; මනොද්වාරෙ පවත්තං, මනොද්වාරයෙහි හටගත්තාවූ කම්තෙමේ; මනොකම්මව, මනොකම්මයයි කියාද; ඉති, මෙසේ; කම්මද්වාරවසෙන, කම්නිප්පත්තියට හෙතුවූ ද්වාරයන්ගේ වශයෙන්; තිවිධං හොති, තුන්වැදෑරුම් වේ. තථා, එපරිදිදෙන්; ඤාණසම්පයුත්තාසඞ්ඛාරික සඞ්ඛාරික භාවනාවසෙන, ඤාණ සම්පයුත්ත භාවනාවන්ගේ වශයෙන්; තිවිධං හොති, තුන්වැදෑරුම් වෙයි. පන, එකදෙශයෙන් අන්‍යවූ සමුදයාර්ථය දක්වම්:- චිත්තුප්පාදවසෙන, චිත්තෝත්පාදයන්ගේ වශයෙන්; එතං කුසලං, ඒකාමාවචර කුශලකම් තෙමේ;අෂ්ටවිධං හොති, අටවැදෑරුම් වෙයි. ඤාණ සම්පයුත්ත භාවනා වෙය්‍යාවච්චව පත්තිඤාණ පත්තානුමෝදනා ධම්මස්සවන ධම්මදෙසනා දිට්ඨිජ්ජුකම්මවසෙන, දන්දීමය, සිල්රැකීමය, කම්වහන්භාවනා වැඩීමය, තුණුරුවන් මව්පියන් ආදීන්ව ගරුබුහුමන් කිරීමය, ඔවුන්ටම කුදුමහත් කටයුතු වත්පිළිවත් කිරීමය. තමා විසින් රැස්කළාවූ කුශලභාගය අනුන්ට දීමය, අනුන් විසින් කරණලද්දවූ කුශලකම්යට සතුටුවීමය, බණ ඇසීමය, බණ දෙසීමය, දෘෂ්ටිය සෘජුකිරීමය, යන මොවුන්ගේ වශයෙන්; දසවිධං හොති, දසවැදෑරුම් වේ. පන, අවයවයන්ගෙන් අන්‍යවූ; සමුදයාර්ථය දක්වම්:—විසතිවිධම්පි, විසිවැදෑරුම්වූද; තං එතං කම්මං, ඒ කුශලාකුශලකම්තෙමේ; කාමාවචරකම්මම්පෙවව, කාමාවචර කම්යයි කියාම; හෙවත් කාමාවචරයන්ගේ ගණනටම; ගච්ඡති, යෙයි.

පන, කාමාවචරකම්යෙන් අන්‍යවූ රූපාවචර කම්ය දක්වම්:-රූපාවචරකුසලං, රූපාවචර කුශලකම් තෙමේ; මනොකම්මමෙව, මනඃකම්යමැයි. තුන්ව, ඒරූපාවචරකුශල සංඛ්‍යාතවූ

මනෝකම්මඤ්ඤමේද; භාවනාමයං, භාවනාවෙන් නිපන්නේයි. අපපණාපත්තං, අපිණාවවපැමිණියේයි. ඛිනාඛභඤ්ඤෙදන, ඛ්‍යානාඛභඤ්ඤයන් හා යුක්තවූ ප්‍රභෙදය කරණකොටගෙණ; පංචවිධං හොති, පස්වැදෑරුම් වෙයි. තථා, එපරිද්දෙන්; අරූපාවචර කුසලංච, අරූපාවචර කුශලකම්මඤ්ඤමේද; මනෝකම්මං. මනෝ කම්මඤ්ඤම්පි, ඒ අරූපාවචර කුශල සඞ්ඛ්‍යාත මනෝකම්මඤ්ඤමේද; භාවනාමයං, භාවනාවෙන් නිපන්නේයි. අපපණාපත්තං, අපිණාබවට පැමිණියේයි. ආලම්බණභෙදෙන, කිසුණු ඉගුළු අහසය ආකාශානඤ්චායතන කුශලචිත්තය එම චිත්තයාගේ නැසීභාව ප්‍රඥප්තිය ආකිඤ්ඤඤ්ඤායතන කුශල චිත්තය යන ඝතරාලම්බණයන්ගේ ප්‍රභෙදයෙන්; චතුබ්බිධං හොති, ඝතරවැදෑරුම් වේ. එසේ, මේ ඝතරකම්මඤ්ඤයන් අතුරෙන්; උඩ්ඩවරභීතං, උඩ්ඩවඤ්ච ප්‍රයුක්ත චිත්තයෙහි යෙදුනාවූ චෙතනාව විසින් තොරකරණ ලද්දාවූ; අකුසලකම්මං, එකොළොස් අකුශලකම්මඤ්ඤමේ; අපායභූමිඤං, ඝතර අපාය භූමියෙහි; පටිසන්ධිං ජනෙති, පිළිසිඳගන්වයි. පවත්තිඤං පන, ප්‍රථමභවාඞ්ගය පවත් චුතිය දක්වා මේ අතර ප්‍රවෘත්තිකාලයෙහි වනාහි; ච්‍යාදසධ්ධා, දෙළොස් වැදෑරුම්වූ; සබ්බම්පි, සියලු අකුශලකම්මඤ්ඤමේද; සත්තානකසලවිපාකානි, සත්වැදෑරුම් අකුශල විපාකයෝ; සබ්බථාපි, සම්ප්‍රකාරයෙනුදු; කාමලොකෙච, කාමභූමියෙහිද; රූපලොකෙච, රූපභූමියෙහිද; යථාරහංවිපච්චන්ති, සුදුසු පරිද්දෙන්; විපාක උපදවයි.

කාමාවචර කුසලම්පි, කාමාවචර කුශලකම්මඤ්ඤමේද; කාම සුගතිඤයමේව, සත්තකාම සුගතිභූමියෙහිම; පටිසන්ධිං ජනෙති, පිළිසිඳගන්වයි. භථා, එපරිද්දෙන්; පවත්තියඤ්ච, ප්‍රවෘත්තිකාල යෙහිද; මහාවිපාකානි, මහාවිපාකයෝ අටදෙන; ජනෙති, දන්වයි. අඨපි අහෙතුක විපාකානි පන, අෂ්ටප්‍රකාරවූද අහෙතුක විපාකයෝ වනාහි; සබ්බථාපි, සම්ප්‍රකාරයෙනුදු; කාමලොකෙව, කාමභූමියෙහිද; රූපලොකෙච, රූපභූමියෙහිද; යථාරහංවිපච්චන්ති, සුදුසු පරිද්දෙන් විපාක උපදවයි.

කතම, ඒ කාමාවචර කුශලකම්මඤ්ඤයන් අතුරෙනුදු; තිහෙතුක මූකඤං, ත්‍රිහෙතුක උත්තමවූ; චතුබ්බිධං කුසලං, සතර වැදෑරුම්වූ කුශලකම්මඤ්ඤමේ; තිහෙතුකා ත්‍රිහෙතුකවූ; චතුබ්බිධං පටිසන්ධිං දත්වා, සතර වැදෑරුම් ප්‍රතිසන්ධිය දී; සවත්තෙන, ප්‍රවෘත්තිකාලයෙහි; සොළස විපාකානි, සහෙතුක අටය, අහෙතුක අටය යන සොළොස් විපාක විඤ්ඤාණ; විපච්චන්ති, උපදවයි. තිහෙතුක ඔමකං, ත්‍රිහෙතුක ලාමකවූ; චතුබ්බිධං කුසලඤ්ච,

සතරවැදෑරුම්වූ කුශලකර්මයද; දුහෙතුක මූකකර්මය, දුහෙතුක උත්කෘෂ්ටවූ, චතුර්විධ, සතර වැදෑරුම්වූ; කුසලවූ, කුශල කර්ම තෙමේද; දුහෙතුකතා, දුහෙතුකවූ; චතුර්විධ පරිසන්ධිං දත්වා, සතරවැදෑරුම් පිළිසිඳදී; පවත්නා, ප්‍රවෘත්තිකාලයෙහි; ත්‍රිහෙතුක රහිතානි, ත්‍රිහෙතුක විපාක සත්ත්ව තොරකොට ඇත්තාවූ; චාදසවිපාකානි, දෙලොස් වැදෑරුම් විපාක චිත්තයන්; විපච්චති, උපදවයි. ත්‍රිහෙතුකමෝමකං, ත්‍රිහෙතුකලාමකවූ; (චතුර්විධ) කුසලං පන, සතරවැදෑරුම් කුසලකර්මය වනාහි; අහෙතුකමෙව පටිසන්ධිං, අහෙතුකවූ ප්‍රතිසන්ධියක්ම; දෙති, දෙයි. පවත්තෙන්ව, ප්‍රවෘත්තිකාලයෙහිද; අහෙතුකවිපාකානෙව, අහෙතුක කුශලවිපාකයන් අටදෙනම; විපච්චති, උපදවයි.

අසංඛාරං, අසංඛාරික කුශලකර්ම තෙමේ; සසංඛාරවිපාකානි, සසංඛාරිකවිපාකයන්; න විපච්චති, නූපදවයි. සසංඛාරං, සසංඛාරික කුශලකර්මතෙමේ; අසංඛාරවිපාකානි, අසංඛාරික විපාක චිත්තයන්; න විපච්චතීති, නූපදවන්නේයයි. කෙවිපත, ඇතැම් ආචාර්‍යවරයෝ තුමූ නොහොත් මහාවිහාරවාසී මහා ධම්මරක්ඛිත ස්ථවිරාදීවූ සබකිය පරම්පරාවෙහි ආචාර්‍යවරයෝ තුමූ; "වදන්ති" යනු අධ්‍යාහාරයි. තෙසං තෙසං, ඒ ඒ ආචාර්‍යන්ගේ වාදයෙහි; යථාවුත්තානුක්‍රමෙන, යථොක්ත ක්‍රමානුසාරයෙන්; යථාකකමං, පිළිවෙළින්; වාදසපාකානි, දෙලොස් විපාක සිත් කෙතෙකුන්ද; දසපාකානිව, දශවිපාක සිත් කෙතෙකුන්ද; අට්ඨපාකානිව, අටවිපාකසිත් කෙතෙකුන්ද; යථාසම්භවං, සම්භව වන පරිද්දෙන්; උදාහරේ, ප්‍රකාශකරන්නේයි.

පන, කාමාවචර කුශලයෙන් අන්‍යවූ රූපාවචර කුශලය කියම්:— නොහොත් ධම්මානුඤ්ඤානයෙන් අන්‍යවූ පුද්ගලාධිට්ඨාන කථ කියම්:— "යොගාවචරෝ" යන කර්තෘකාරකය අධ්‍යාහාරයි. රූපාවචරකුසලං, රූපාවචර කුශල කර්මයවූ; පරිත්තං, සවල්පානුභාව ඇත්තාවූ; පඨමජ්ඣානංභාවෙත්වා, ප්‍රථමධ්‍යානය වඩා; නොහොත් පඨමජ්ඣානං, ප්‍රථමධ්‍යානය; පරිත්තං, සවල්පානුභාව ඇති කොට; භාවෙත්වා, වඩා; බ්‍රහ්මපාරිසජ්ජේසු, බ්‍රහ්මපාරිෂද්‍ය භූමියෙහි; උපපජ්ජති, උපදනේයි මජ්ඣිමං, මධ්‍යමානුභාව ඇත්තාවූ; තථෙව, ඒ ප්‍රථමධ්‍යානයම; භාවෙත්වා, වඩා; විකල්පාර්‍හය යටකී නයයි. බ්‍රහ්මපුරෝහිතේසු, බ්‍රහ්මපුරෝහිත භූමියෙහි; උපපජ්ජති, උපදනේයි, පණීතං, උතුම් ආනුභාව ඇත්තාවූ; තථෙව, ඒ ප්‍රථමධ්‍යානයම; භාවෙත්වා, වඩා; මහා බ්‍රහ්මසු, මහාබ්‍රහ්ම භූමියෙහි; උපපජ්ජති, උපදනේයි.

තථා, එපරිද්දෙන්; පරිත්තං, අල්පානුභාවේ ඇත්තාවූ; දුති යජ්ඣානඤ්ච, විතියඣ්‍යානයද; තතියජ්ඣානඤ්ච, තෘතීයඣ්‍යානයද; භාවෙත්වා, වඩා; විකල්පාභිඤ්ඤ සියලු තන්හි යවකී නසින් දත යුතුයි. පරිත්තාභෙසු, පරිත්තාභ භූමියෙහි; උපපජ්ජති, උපද නේයි. මජ්ඣිමං, මධ්‍යමානුභාවේ ඇත්තාවූ; විතියඣ්‍යානඤ්ච භා තෘතීයඣ්‍යානයද; භාවෙත්වා, වඩා; අප්පමාණාභෙසු, අප්පමාණාභ භූමියෙහි; උපපජ්ජති, උපදනේයි. පණීතං, උත්තමානුභාවේ ඇත් තාවූ විතියඣ්‍යානඤ්ච භා තෘතීයඣ්‍යානයද; භාවෙත්වා, වඩා; ආභස්ස රෙසු, ආභාස්වරභූමියෙහි; උපපජ්ජති, උපදනේයි.

පරිත්තං, අල්පානුභාවේ ඇත්තාවූ; චතුත්ථජ්ඣානං, චතුර්ථ ඣ්‍යානය; භාවෙත්වා, වඩා; පරිත්තසුභෙසු, පරිත්තශුභ භූමියෙහි; උපපජ්ජති, උපදනේයි. මජ්ඣිමං, මධ්‍යමානුභාවේ ඇත්තාවූ; චතුර්ථඣ්‍යානය; භාවෙත්වා, වඩා; අප්පමාණසුභෙසු, අප්පමාණශුභ භූමියෙහි; උපපජ්ජති, උපදනේයි. පණීතං, උත්තමානුභාවේ ඇත්තාවූ චතුර්ථඣ්‍යානය; භාවෙත්වා, වඩා; සුභකිණ්හෙසු, සුභ කිණ්හ භූමියෙහි; උපපජ්ජති, උපදනේයි.

පඨමජ්ඣානං, පඤ්චමඣ්‍යානය; භාවෙත්වා, ත්‍රිවිධාකාරයෙන් වඩා; වෙහප්ඵලෙසු, වෙහප්ඵල භූමියෙහි; උපපජ්ජති, උපදනේයි. සඤ්ඤාවිරාගං, පහවූ සංඥා ඇත්තාවූ; තථෙව, ඒ පඤ්චමඣ්‍යාන යම; භාවෙත්වා, වඩා; නොහොත් තථෙව, ඒ පඨමඣ්‍යානයම; සඤ්ඤාවිරාගං, සංඥාවහි නො ඇලීම් වශයෙන්; භාවෙත්වා, වඩා; අසඤ්ඤසත්තෙසු, අසංඥසත්වභූමියෙහි; උපපජ්ජති, උපදනේයි. අනාභාම්හෙ පන, අනාභාවී පුද්ගලයෝම; මෙහි "පන" ශබ්දය එවකාරාර්ථයි. සුඛාවාසෙසු, පවසුඛාවාස භූමි යෙහි; උපපජ්ජන්ති, උපදනාහු වෙත් අරූපාවචර කුසලව, අරූ පාවචර කුශලකර්මයද; යථාක්කමං භාවෙත්වා, පිළිවෙළින් වඩා; අරූපෙසු, අරූප භූමියෙහි; උපපජ්ජති, උපදනේයි.

ඉච්චං මහග්ගතං පුඤ්ඤං, යථාභූම්වවත්ථිතං,
ජනෙතිසදිසංපාකං, පටිසන්ධිපවත්තියං.

ඉච්චං, (යථාවුත්තභෙදෙන) මේ යථොක්ත ප්‍රභෙදයෙන්; මහග්ගතං පුඤ්ඤං, මහද්ගත කුශලකර්ම තෙමේ; පටිසන්ධිපවත්ති යං, ප්‍රතිසන්ධි ප්‍රවෘත්ති කාලයෙහි; යථාභූම්වවත්ථිතං, භූමි පරිද් දෙන් නියමකරණලද්දාවූ; සදිසංපාකං, කුශලයට සදෘශ විපාක විත්තයෝ; ජනෙති, උපදවයි. ඉදං, මේ කියනලද්දේ වන්හි; එත්ථ, මෙහි; කම්මවාතුක්කං, කර්මවාතුෂ්කයයි.

(භාවය.)

කම් චතුෂ්කයෙහි විභාග කෙසේයත්? ප්‍රතිසන්ධි සඞ්ඛ්‍යාතවූ විපාක නාමස්කන්ධයෝය, ප්‍රතිසන්ධිය හා එකට පහළවන්නාවූ කම්ජරූප සඞ්ඛ්‍යාතවූ කටත්තාරූපයද යන මේ නාමරූපමය උපදවන්නාවූ කම්තෙමේ ජනක කම් නම් වේ. ඒ ජනක කම්ය විපාකි සුළප විපාක දෙන්නාවූ කල්හි ඒ ජනකකම්යාගේ විපාක මහත් බව පිණිස රූකුල් දෙන්නාවූ කම්තෙමේ උපත්ථම්භක කම් නම් වේ. ඒ ජනකකම්යාගේ පරම්පරාවත් නොසිඳ ජනකකම්යත් නොසිඳ ජනකකම්යට හිංසා කරන්නාවූ කම්තෙමේ උපපීළකකම් නම් වේ. ඒ ජනක කම් විපාකය සිදීම් වශයෙන් තමාගේ විපාකදීමට අවකාශ ගන්නාවූ කම්තෙමේ උපඝාතක කම් නම් වේ.

මේ කම්චතුෂ්කයට උපමානම්:-යම් ගොවියකු විසින් ක්ෂේත්‍රයෙහි ධාන්‍යබීජරොපණය කිරීමක්මෙන් ජනකකම්යද, ඒ ශස්‍යයට උපකාර පිණිස දිය බැඳීම් පොහොර දැමීම් රුකවල්ලීම් නෙලීම් ආදියමෙන් උපත්ථම්භක කම්යද මෙසේ ශස්‍ය වර්ධනය වන කල්හි කුළුඝාතයක් හටගෙණ ශස්‍යයන්ගේ මලානිකවීමක් මෙන් උපපීළක කම්යද, ඊට අනතුරුව ලැව්ගින්නක් හටගෙණ ඒ ශස්‍යයන්ගේ විනාශය මෙන් උපඝෙදක කම්යද; සැලකිය යුත්තේයි.

සවිඤ්ඤාණක වසතු උපමාවක් නම්:- දෙවිදත් තෙරණුවන්ගේ රජකුලයෙහි ත්‍රිහෙතුක ප්‍රතිසන්ධි ගැණීම ජනක කුශලකම් නම් වේ. මෑතභාගයෙහි සස්නෙහි පැවිදිව අෂ්ටසමාපත්ති උපදවාගැන්ම කුශල උපත්ථම්භක නම් වේ. ඊට පසුභාගයෙහි බුද්ධරාජ්‍යය ගණිමැයි සිතා දුතුවාගම් යැවීම් ගල්පෙරළීම් ආදි අකුශල ක්‍රියාවන්ගේ රැස්කිරීම උපපීළක කම් නම් වේ. අනතිම කාලයෙහි සඞ්ඝ භෙදකොට ඒ කම්යෙන් ජනක කුශලකම්ය සිඳ එම ආත්මයෙන්ම අවීචිමහානරකයට යෑම උපඝෙදක නම් වේ. මෙසේ අවිඤ්ඤාණක සවිඤ්ඤාණක උපමාවන්ගේ වශයෙන් කම්චතුෂ්කය අවබෝධකටයුතුයි.

ජනක කම්තෙමේ කුශල ජනකකම්ය අකුශල ජනක කම්ය යන දෙදෙනාගේ වශයෙන් ව්‍යාපාරවේ. ඔවුන් අතුරෙන් කුශලජනක කම්තෙමේ කුශල විපාකනාමස්කන්ධයන් හා කටත්තාරූප උපදවයි. අකුශලජනක කම්තෙමේ අකුශල විපාකනාමස්කන්ධයන් හා කටත්තාරූප උපදවයි.

ඒ විපාකාරවූ ජනක කම්තෙමේ පටිසන්ධිවිපාක ප්‍රවෘත්තිවිපාක යන උභය විපාකඝන්ම දෙන්නේසි. ඔවුන් අතුරෙන් ප්‍රතිසන්ධි විපාක දීමට අනතුරුව යට කී පරිදි දෙන්ම ප්‍රවෘත්ති විපාක දෙන්නාවූ කල්හි ඝඟපත් පස්කම්සැප අනුභව කිරීම් ආදිය නොහොත් සිතූ පැතූ සියලු භවභොග සම්පත් ලැබීම කුශල ජනක කම්යාගේ විපාකාදිමයයි දතයුතුයි. දුක්සහිතවූ සථානයෙහි ප්‍රතිසන්ධිගෙණ ප්‍රවෘත්තිකාලයෙහි සා පිපාසාදි නොයෙක් දුකින් පීඩිතවීම අකුශලජනක කම්යාගේ සවභාවයයි දතයුතුයි.

උපසථම්භක කම්යද කුශල උපසථම්භකය අකුශල උපසථම්භකය යන දෙදෙනාගේ වශයෙන් විප්‍රකාර වෙයි. ඒ උපසථම්භක කම්තෙමේ ප්‍රතිසන්ධියට අනතුරුවූ පළමුවෙනි භවාඞ්ගය පටන් චුති චිත්තය දක්වා මේ අතර කාලයෙහිමුත් ප්‍රතිසන්ධි කාලයෙහි විපාක නොදෙන්නේසි. එතකුදුවුවත් කුසල උපසථම්භක කම්තෙමේ කුශලජනක කම්යකට රුකුල් දෙන්නේසි. ඒ කෙසේ දෙන්නේදයත්? කුශල ජනක කම් යක්හු විසින් නාමසකන්ධ විපාක කවතතා රූපයන් උපදවන ලදුව ඒ ජනක කම්යාගේ ශකතියෙන් උපදවන ලද්දාවූ නාමසකන්ධ කවතතා රූපයන් වඩාගය කිරීමට නුපුළුවන් කල්හි අනිත් උපසථම්භක කුශල කම්යක් සරිලා ඒ විපාක නාමසකන්ධයන් වඩා යකිරීම පිණිසද මහත්වූ භවභොග සම්පත් දීම පිණිසද උපසථම්භක කම්ය රුකුල් දෙන්නේසි. මෙසේ ජනක කුශල කම්යට ජනක උපසථම්භක කම්ය රුකුල්දෙන සැටි දතයුතුයි. ජනක අකුශල කම්යට ජනක උපසථම්භක අකුශලකම්ය රුකුල් දෙන සැටි කෙසේද යත්? අකුශල කම් ඝහතුවෙන් ගවයෙක්ව ඉපිද ඒ ගවයා වැඩිවිය පැමිණි කල්හි බරගැල් ආදියෙහි යොදා කටුසෑමිටි ආදියෙන් තලමින් විෂම මාර්ගයෙහි මහත්වූ සූඝ්‍රීතාපයෙහි ගමන් කරවීමට සුදුසුවූ උපසථම්භක අකුශල කම්යක් ලඟට පැමිණ විපාක දෙන්නේසි. එසේම අකුශල කම්යෙන් පිරිව ගන්නාලද්දාවූ දුර්ල දුඝෙතුක කාමාවචර කුශලකම් බලයෙන් මිනිසතබව ලැබ නැවත සා පිපාසා දෙකින් නොමිම්මට හෙතුවූ අකුශල කම්යන් ලඟට පැමිණ විපාක දෙන්නේ වෙයි

උපපීළක කම්යද කුසල උපපීළක කම්ය අකුශල උපපීළක කම්යයි දෙවැදෑරුම් වේ. ඒ කම්යෝ වනාහි ප්‍රවෘත්ති කාලයෙහි මුත් ප්‍රතිසන්ධිකාලයෙහි විපාක නොදෙති. එසේ නොදෙන්නේ

නමුදු උපපීළක කුශල කර්මතෙමේ ජනක අකුශලකර්මයට හිංසා කෙරෙයි. උපපීළක අකුශල කර්මතෙමේද ජනක කුශල කර්මයට හිංසා කෙරෙයි. අකුශල කර්මතෙමේ කුශල කර්මයට හිංසා කිරීම මෙසේයි. කුශලජනක කර්මය විපාක දෙන්නාවූ කල්හී නොහොත් මහත්වූ සම්පත්තීන් ආස්වූ කුලයෙහි ඉපිද ඒ සම්පත් අනුභව කොළඹ හැකිවන පිණිස රොහාතරයෙක් හෝ උමත අනුෂ්‍යයෙක් හෝ වෙයි. එසේවූ කල්හී ඒ සම්පත් අනුභව කිරීමට අවකාශ නොලැබෙන්නේයි. කුශල උපපීළක කර්මතෙමේ අකුශලයට හිංසා කිරීම කෙසේයත්? අකුශල ජනකකර්මයක් කරණකොට ඝෝණ හස්තියොනියෙහි අශ්වයොනියෙහි ගවයොනියෙහි උපන් කල්හී ඒ හස්ති අශ්ව ගවයන් රාජවාහනයට යෙදූ කල්හී අවශෙෂ මනුෂ්‍යයන්ට අධිකවූ මහත්වූ සැප ඔවුන්ට ලැබෙන්නේයි. එසේම දුඃඛිතවූ කුලයෙහිද ඉපිද සෘ පිපාසා දෙකින් පෙළෙන්නාවූ කල්හී එකවිටම ඔවුන්ගේ දුක් නසන්නාවූ කුශලකර්මයන් ලඟට පැමිණ අකුශල කර්මයන්ට හිංසාකිරීම මෙසේ දතයුතුයි. එක් කලෙක ආයුෂ්මත් මුගලන් මහ තෙරුන් වහන්සේ ලෝක විචරණ නම් ප්‍රාතිහාර්‍යයක් දක්වා අවීචිමහානරකයෙහි වහ්නිය නිවා මොහොතක් සැල ධර්මදෙශනා කෙළේයි. එකල්හී ඒ නරකයෙහි උපන්නාවූ සත්වයන්ගේ අකුශලකර්මයට හිංසා කොට කුශල කර්මය විපාක දිමි වශයෙන් ගතපත්වූ ආර්‍ය්‍ය රූපය දැකීමද ධර්ම ශබ්දය ඇසීමද කුශලෝ විපාක වශයෙන් සිඛවූ බව දතයුතුයි. උපඝාතක කර්මතෙමේද කුශල උපඝාතක කර්මය අකුශල උපඝාතක කර්මයයි දෙවැදෑරුම්මේ. ඒ දෙවැදෑරුම් උපඝාතක කර්මතෙමේ පටිසන්ධි විපාකය හා ප්‍රවෘත්තීහි විපාකයන් දෙන්නේයි. එනකුදුවුවත් කුශල උපඝාතක කර්මතෙමේ අකුශල ජනක කර්මයද කුශල ජනක කර්මයද යන විප්‍රකාරවූ කර්මයම නසා තමාගේ විපාකය දෙවන්නේයි. අකුශල උපඝාතක කර්මතෙමේද කුශලජනක කර්මය අකුශලජනක කර්මය යන විප්‍රකාරවූ කර්මයම නසා තමාගේ විපාකය දෙවන්නේයි. කුශල කර්මය කුශලකර්මයෙන් නැසීම වනාහි මෙසේයි. දන් දුන්නාවූ කුශලකර්මයකින් ප්‍රතිසන්ධිය දෙමැයි ඉදිරියට පැමිණි කල්හී වස්තූදනමයවූ කුශලකර්මතෙමේ උපඝාතක කර්ම ආහාරදනමය සඛ්‍යාතවූ ජනක කුශල කර්මය නසා තමාගේ ප්‍රතිසන්ධි විපාක දෙවන්නේයි. කුශල කර්මයෙන් අකුශල කර්මය නැසීම නම්—ප්‍රාණඝාත අකුශල ජනක කර්මය ප්‍රතිසන්ධි දෙමැයි ඉදිරියට පැමිණි කල්හී

විභාරදාන සඞ්ඛ්‍යාතවූ කුශල උපඝාතක කර්මයක් ඉදිරියට පැමිණ ප්‍රාණඝාත අකුශලජනක කර්මය නසා තමාගේ ප්‍රතිසන්ධි විපාකය දෙවන්නේසේ. අකුශලයෙන් අකුශලය නැසීම නම්:— ගොඝාතක අකුශල ජනක කර්මයක් ප්‍රතිසන්ධිය දෙමැයි ඉදිරියට පැමිණි කල්හි සුණඛඝාතන අකුශල උපඝාතක කර්මයක් අනිත් කර්මය සිඳ තමාගේ ප්‍රතිසන්ධි විපාකය දෙවන්නේසේ. අකුශල කර්මයෙන් කුශලකර්මය නසන්නාවූ තන්හි උදක පූජා සඞ්ඛ්‍යාතවූ කුශල ජනක කර්මයක් ප්‍රතිසන්ධි විපාක දෙමැයි ඉදිරියට පැමිණි කල්හි කුක්කුටඝාතන අකුශල උපඝාතක කර්මයක් ඉදිරියට පැමිණ පුළුල් ජනක කර්මය සිඳ තමාගේ ප්‍රතිසන්ධි විපාකය දෙවන්නේසේ. ප්‍රවෘත්තිකාලයෙහිද මේ ක්‍රමයෙන්ම දතයුතුයි. උපඝාතක කර්මයෙන් ජනක කර්මය නසන්නේයයි කියේ නම්වූදු දුර්වලවූ ජනක කර්මයක්ම බලවත්වූ උපඝාතක කර්මයක් විසින් නැසියයුතුවේ. බලවත්වූ ජනක කර්මයක් දුර්වලවූ උපඝාතක කර්මයක් විසින් නොනැසිය හැක්කේසේ. ඒ සතර කර්මයන් අතුරෙන් ජනක කර්මය හා උපඝාතක කර්මයෙහේද කුශල විපාක ඇතිබව හා ප්‍රතිසන්ධි ප්‍රවෘත්ති විපාක දීමද, සදෘශ හෙයින් ජනක කර්මය කියේවීනම් උපඝාතක කර්මය නොකියයුත්තේසේ. උපඝාතක කර්මය කියේවීනම් ජනක කර්මය නොකියයුත්තේසේ.

මෙසේ දැක්වීමවූ හෙතුව නම්:= කාරණයන්ගේ විරුද්ධබවයයි දතයුතුයි. උපඝාතක කර්මයෙහේ ජනක කර්මයකුගේ සිඳ තමාගේ විපාකය දීමට පොහොසත් වෙයි. ඊට උපමාවක්නම්:= සෙනෙවිරත් තෙමේ සෙනෙවිරත් ධුරය දරන්නාවූ කල්හි කිසි මනුෂ්‍යයෙක් ඝාතනය නොකරයි. එනකුදුවූවත් ඝාත්නය කිරීමට ආඥාව දෙයි. අනිත් මනුෂ්‍යයෙක් රාජ්‍යයට පැමිණි කල්හි ඒ සෙනෙවියා ඝාතනය කෙරෙයි. එසේ ඝාතනය කෙරෙට රාජ්‍යය ලබාගැණීමෙහිදී සෙනාපතියා මෙන් ජනක කර්මයද, ඒ සෙනෙවිරජහු ඝාතනය කරන්නාවූ ශූරභටයා මෙන් උපඝාතක කර්මයද. රජහු මරා රාජ්‍යය ගැණීමක් මෙන් පටිසන්ධි කටතෘරූපයන් ඉපදවීමද, මෙසේ උපමා උපමෙය්‍ය සංසන්දනය කොට අර්ථ දතයුත්තේසේ. මේ වතාහි අට්ඨාවෙහි අා සමාන වාදයයි. ඇතැම් ආචාර්‍යයෝ වතාහි උපඝාතක කර්මයෙහේ විපාක නොදීය හැක්කේය. ප්‍රතිසන්ධි කර්මය සිදීම් මාත්‍රයක් කරන්නේය යන මේ අර්ථය සට කි උපමාවෙන් සසුට කරති. උපරිපණ්ණාස අට්ඨාවෙහි

වනාහි ජනක කර්මතෙමේ කුසල විපාක ඇත්තේ ප්‍රතිසන්ධි ප්‍රවෘත්තීහි දෙක්ෂිම විපාක දෙන්නේකි. උපත්‍යුපබ්‍රහක කර්මතෙමේ කුසල්ම වෙයි. අකුශල උපත්‍යුපබ්‍රහක කර්මයෙක් නම් නැත්තේය. ප්‍රවෘත්තීහි විපාක මාත්‍රයක්ම දෙන්නේය, උපපීළක උපඝාතක කර්මතෙමේ කුසල් නම් නොවන්නේය. අකුශල්ම වන්නේය. උපපීළක කර්මය වනාහි ප්‍රවෘත්තී වශයෙන්ම විපාක දෙයි. උපඝාතක කර්මය වනාහි ප්‍රතිසන්ධි ප්‍රවෘත්තී යන විපාක වශ දෙන්නේයි, ඒ කර්මයෝ තුන්දෙන වනාහි කෘත්‍යය වශයෙන් භවඟන්නාවූ විශෙෂ ඇත්තාහුයයි කියති. බරවූ කර්මතෙමේ ගරුකම් නම් වෙයි. මරණාසන්න කාලයෙහි කරණ ලද්දාවූ හෝ රැස්කරණ ලද්දාවූ කර්මතෙමේ ආසන්න කර්මය නම් වෙයි. විපාක දීම් මාත්‍රයක් ඇත්තාවූ ගරුක ආසන්න ආචිණ්ණ යන ත්‍රිවිධාකාරයව පෙරැම්බිසියාවූ කර්මතෙමේ කවත්තා කම් නම් වෙයි. ඒ සතරාකාර කර්මයන් අතුරෙන් ගරුකම් තෙමේ කුශල ගරුකර්මය අකුශල ගරුකර්මයයි දෙආකාරවෙයි. ඔවුන් අතුරෙන් අකුශල ගරුකර්මය වනාහි මාතෘඝාතක පිතෘඝාතක අරහන්ත ඝාතක ලොහිතුප්පාදක සංඝභේද කර්මඝයෙන් පස් වැදෑරුම්වෙයි. මේ කම් පව කය මනුෂ්‍යයෙකුවමුත් අමනුෂ්‍යයෙකුව නොකට හැක්කේයි. ඒ කම් පවඝාය ගම් මනුෂ්‍යයෙක් විසින් රැස් කෙළේ නම් කවර කර්මයක් විපාක දෙන්නේදැයි ප්‍රශ්න කෙළේවිනම් සඞ්ඝභෙද කර්මයම විපාකදෙන්නේයි. අවශෙෂ කම් චතුෂ්කය අහොසිකම් වේයයි පිළිතුරු දියයුතුයි. සඞ්ඝ භෙදකර්මය නබා අවශෙෂ කර්මචතුෂ්කය කෙළේවිනම් ලොහිතුප්පාදක කර්මය විපාක දෙයි. අවශෙෂ කර්මත්‍රය අහොසිකම් වෙයි. ලොහිතුප්පාදක කර්මය නබා අවශෙෂ කර්මත්‍රය රැස් කෙළේවි නම් අරහන්තඝාතක කර්මය විපාක දෙයි. අවශෙෂ කර්මය අහොසි කම් නම් වෙයි. අරහන්ත ඝාතකය නබා අවශෙෂ කර්මය රැස්කෙළේවිනම් පියා සුසිද්ධවනාහෙක්විනම් ඔවි දුශ්ශීලවිනම් පිතෘඝාතක කර්මය විපාක දෙයි, මාතෘ ඝාතක කර්මය අහොසි කර්මවෙයි. ඔව්පියා දෙදෙනම දුශ්ශීල වෙත් නම් මාතෘඝාතක කර්මය විපාකදෙයි. පිතෘඝාතක කර්මය අහොසි කම් වෙයි මාතෘ පිතෘ දෙදෙනම සිල්වත් වී නම් එකල්හිද මාතෘඝාතක කර්මය විපාක දෙයි. පිතෘඝාතක කර්මය අහොසි කර්මවෙයි. මව ශීලවතියෙක්ව පියා දුශ්ශීලයෙක්වී නම් මාතෘඝාතක කර්මයම විපාකදෙන්නේ කුමක් හෙයින්ද යත්? මාතෘ පිතෘ දෙදෙනා අතුරෙන් මව ගුණ මහත්තරය

ඇතිවෙයිනැයි දතයුතුයි. අහොසිකම්ය යනු විතීයාදීආත්ම භාවයන්හි විපාක නොදෙන කම්යවේ. ඒ පවත්තනන්තරිය කම්යම රැස්කළාවූ පුදුගල තෙමේ ඒ කම්ය කළාවූ ආත්මභාවයට අනතුරු අත්බැව්හි එකාන්තයෙන් අපායොපපත්තිය ලබයි. ඒහෙයින් ආනන්තරිය කම්යයි ව්‍යවහාර කෙරෙති. ඒ ආනන්තරිය කම්ය කළාවූ සත්තෙම් ඔසුප්‍රක් සහිතවූ අවමභාතරක යන් අතුරෙන් යම්කිසි නරකයක ඉපදීම නියතනුමුත් අවීචි මහා නරකයෙහිම උපදින්නේයයි කියා හෝ එක්කල්පයක් දුක්විඳින්නේයයි කියා හෝ නියත බවෙක් නොවදාළේසි. කල්පයක්හුගේ මධ්‍යයෙහි ආනන්තරිය කම්යක් කෙළේවිනම් අඛ්කල්පයක්ම දුක්විඳ කම්ය ගෙවියන්නේසි. කල්පවිනාශ යට දසදවසක් මත්තෙන් ආනන්තරිය කම්යක් කෙළේවිනම් දස දවසක්ම අපාය දුක්විඳ කම්ය ගෙවියන්නේසි. කල්ප විනාශයට දෙතුන්දිනක් තබා ආනන්තරිය කම්යක් කෙළේවිනම් ඒ පුද්ගලතෙමේ නොමළහොත් අපාය දුකින් මිදෙන්නේ මැයි. කුමක්හෙයිදයත්? අපායෙහි දවසක් හෝ දෙකක් හෝ දුක් විඳිමෙක් නැත්තේසි. එසේම ඒ ආත්මයෙන් වුතවූ දෙවෙනි ආත්මයෙහි ආනන්තරිය කම්ී සඛ්‍යානවූ සත්වෙනි ජවන චෙතනා කම්ය අහොසි කම්ය වන බැවින්ද නැවත අපාය දුක්විඳිමෙක් නැත්තේසි. ආනන්තරිය කම්යන් රැස්කරන්නාවූ සමයෙහි උපදනා සත්වෙනි ජවන චෙතනා කම්ය මෙසේ අහොසි කම්ී වන නමුත් ඒ අතීසාධක ජවන විපියෙහි දෙවන තුන්වන සතරවන පස්වන සවන ජවන චෙතනාවන් අප රාපරිය වෙද්‍ය වශයෙන් විපාක දියහැකි බැවින් මුගලන් මහ තෙරුන් වහන්සේ සංසාරයෙහි කලාවූ මාතෘඝාතක පිතෘ ඝාතක, කුම්යන්ගේ දෙවෙනි චෙතකාව ආදීවූ අපරාපරිය වෙද්‍ය අකුශල කම්යක් හෙතුකොට ගෙණ රහත්වූ අත්බැව්හි පල්හොරු පන්සියයක් විසින් තලා මරා දැම්මෙන් පිරිනිවන් පෑයේසි. ඒ පවත්තනන්තරිය කළාවූ යම්කිසි පුද්ගලයෙක් තෙමේ ඒ කම්ය වලක්වන අදහසින් මහාමෙරු පවිතය ප්‍රමාණවූ චෛත්‍යයක් කොට මේ චක්‍රවාළ ගහීය ප්‍රමාණවූ මණ්ඩපයක් තනා ඒ චෛත්‍යය නවරතනයෙන් සරසා චක්‍රවාළ ප්‍රමාණවූ මහා මණ්ඩපයෙහි බුඩප්‍රමුඛවූ මහරහතුන් වහන්සේලා උරයෙන් උරය ගැටෙනසේ වඩා හිඳුවා අෂ්ටපරිෂ්කාරකල්ප වෘක්ෂ සහිතවූ අනෙකප්‍රකාර පුද පූජා සහිතවූ කොසොල් මහ රජ්ජුරුවන් විසින් දෙන ලද්දාවූ අසදෘශ මහා දන් වැනි වූදක් දුන්නේ නමුදු අනතුරු අත්බැව්හි අපායොපපත්තිය

එකාන්තයෙන් නොවැලැක්විය හැකිවිමැසි. ඒව උදහරණ න්ම :- අජාසත් මහ රජතෙමේ පිතෘඝාතක කම්ය කොව ලෝහිතුප්පාදක සඞ්ඝභෙදක කම්යන්ට දැයකව ඒව මෑත භාගයෙහි සාමඤ්ඤඵල සූත්‍රාදෙන ධම්දෙශනාව අසා සෝ කලාවු පව්ශෑණ පශ්චාත්තාපවී බුදුන් ක්ෂමාකරවාගෙණ ම්ම ශාසනයේහි අවලශ්‍රද්ධාවත්ත උපාසකයන් කෙරෙන් අග්‍රයයි ත්තදග්‍රස්ථානයෙහි තබනු ලැබ මෑතභාගයෙහි බුදුන්ගේ පිරි නිවිමෙන් පසු ප්‍රථම මහා සඞ්ගායනාව පිණිස සපත පණිවිති ගුහාවාරයෙහි කෙළලක්ෂගණන් වසතු විසද සඞ්ගායනා ධම් මණ්ඩපය කරවා තුන්මසක් මුළුල්ලෙහි මහා කාශ්‍යපාදී පන් සියයක් මහරහතුන්ට මහදන් දී පන්දහසක් හව්රුදු ම් ශාසනය නිම්ලසේ පවත්නා පිණිස උපස්ථම්භකවුයේ නමුදු සෝවදහසක් අව්රුද්දව ආයු ඇත්තාවූ ලොභොතුඹු නරක යේහි ඉපිද අද දක්වා දුක් විඳින්නේයයි දතයුතුයි. එහෙ සින් ආනන්තරිය කම්ය කළාවු සව්වතෙමේ නෙතෙක් පින් රැස්කෙළේ නමුදු අපායොත්පත්තියෙන් නොවැලැක්විය හැක්කේ යයි දතයුතුයි. එසේම නාස්තික දෘෂ්ටිය අහෙතුක අක්‍රිය දෘෂ්ටිය යන නියත මිත්‍යාදෘෂ්ටින් තුන්දෙන ගත්තාවූ පුද්ගල තෙමේ මරණයට අනතුරු අත්බැව්හි එකාන්තයෙන් අව්චි මහා නරකයෙහි උපදනේයි. කල්පවිනාශ කාලයෙහි ආකාශ යෙහි ගින්නක් මැව් ඒ මිත්‍යාදෘෂ්ටික සත්වයා ඒ ගින්නෙහි පැසෙන්නේයයි සමගර ආචාර්ය්‍යවරයෝ කියති. ඇතැම් ආචාර්ය්‍යවරයෝ වනාහි එකාවිට නස්නා ස්වභාවලක්ෂණයක් ලෝක ධාතූන්ගෙන් පිටත්හි අනික් අව්චිනිරයෙක්හි පැසෙන්නේයයි කියති. පශ්චානන්තරිය කම්යන් හා ත්‍රිවිධ නියත මිත්‍යාදෘෂ්ටින් ගේද චෙතස නම්— : පශ්චානන්තරිය කම්ය ළාවූ පුද්ගලතෙමේ අනතුරු අත්බැව්හි අනියතවූ ගම්කිසි නරකයේක්හි ඉපිද කල්ප විනාශ සීමාවෙන් මිදෙන්නේය. ත්‍රිවිධ නියත මිත්‍යා දෘෂ්ටිගත් පුද්ගලතෙමේ මරණින් මතු එකාන්තයෙන් අව්චි මහා නරකයෙහිම ඉපිද කල්පවිනාශ කාලයෙහි නොනස්නා අපායකව පැමිණ මෙසේ ගණන පර්යන්ක්‍රාන්ත කාලයක් මුලුල්ලෙහි දුක් විඳිනේයයි දතයුතුයි. එහෙයින් සිඟලු අකු ශල කම්යන් අතුරෙන් ගරුකම්ය නියත මිත්‍යාදෘෂ්ටි කම්ය බවද, දෙවෙනි ගරුක කම්ය පශ්චානන්තරි කම්ය බවද දත යුත්තේයි. මොවුන් අතුරෙන් නියත මිත්‍යාදෘෂ්ටි කම්ය යනු සෞමනස්සසහගතවූ හෝ උපෙක්ෂාසහගතවූ හෝ දිට්ඨිගත සම්ප යුක්තවූ චිත්ත වීථියක් ඉපිද කුශලාකුශල කම්යෙහි විපාක

කෑත ඝනාදිවූ දශවස්තුව හෝ දැඩිවශයෙන් ගණිද මේලොකය හා සත්වයෝ අහෙතුකව හටගන්නේයයි දැඩිවශයෙන් ගණිද කුශල කර්මයෙහි ඉෂ්ටවිපාකය හෝ අකුශල කර්මයෙහි අනිෂ්ට විපාකය හෝ නැතැයි දැඩිවශයෙන් ගණිද එකල්හි උපදනා අකුශල චිත්ත විපියෙහි සත්වන ජවනචෙතනා තෝමෝ තික මිතෘකෘයෙහි මිථ්‍යාදෘෂ්ටි කර්මයයි දතයුතුයි. පච්චානන්තරිය කර්මය නම් දෙමිනස්සහගත ප්‍රතිඝ සම්ප්‍රයුක්ත අකුශල චිත්තවිපියෙහි ඉපිද මව් මැරීම්ආදී අනිෂ්ට සිඩිය කෙළේවිනම් ඒ චිත්තවිපියෙහි සත්වන ජවනචෙතනාව ආනන්තරිය කර්මයයි දතයුතුයි. මේ විප්‍රකාරවූ ගරුකර්මයම රැස්කළාවූ සත්තෙමේ අනතුරු අත්බැවිහි එකාන්තයෙන් අපායෝතපත්තිය ලබයි. කුශලපක්ෂයෙහි ගරුකර්මය නම්:—නව මහග්ගත කුශලයෝයි. අකුශලපක්ෂයෙහි ගරුකර්ම හෝ නම්:—ඝාතන මිථ්‍යාදෘෂ්ටිතුණ හා පච්චානන්තරිය කර්මයද යන අෂ්ටවිධත්තයයිදනයුතුයි ලෝකෝත්තර කුශලත්තෙමේ කුම ක්‍රමයින්ගරුකම් වශයෙන් නොගත්තේදයත්? මෙහිකී කුශලා කුශල කර්මයෝතුමූ එකාන්තයෙන් ප්‍රතිසන්ධි විපාකදෙන්නාවූ කුශලාකුශලයෝම වෙති. ලෝකෝත්තර කුශලය එසේහි ප්‍රතිසන්ධි විපාක නොදියහැකි බැවින් ගරුකර්මස්ථානයෙහි නොගන්නා ලද්දේයි. ප්‍රථමධ්‍යානලාභීවූ යෝගාවචරත්තෙමේ ඒ දෙකැනින් නොපිරිහී කාලක්‍රියා කෙළේවිනම් එකාන්තයෙන් ප්‍රථමධ්‍යාන භූමියෙහි උපදනේයි. එහෙයින් ගරුකර්මයයි කියති. ප්‍රථම ධ්‍යානය පටන් නෙවසඤ්ඤානාසඤ්ඤායතන ධ්‍යානය දක්වා ඕහාන උපදවාගත් යෝගාවචරයෙක්තෙමේ මරණින් මතු අසවල් තැන උපදිම්වායි භූමි නියමයක් නොකොට කළුරිය කෙළේවිනම් • නෙවසඤ්ඤානාසඤ්ඤායතනතලයෙහි උපදනේයි. අනිත් ධ්‍යානලාභියෙක්තෙමේ තවවිධවූ මහද්ගත ධ්‍යානයම උපදවා මරණාසන්නකාලයෙහි යම් භූමියක නිකාන්තිය පිහිටුවා කාලක්‍රියා කෙළේවිනම් ඒ භූමියෙහිම උපදනේයි. අනිත් ධ්‍යානලාභී යෝගාවචරයෙක් තෙමේ තවමහද්ගත ධ්‍යාන යම උපදවා ඉදින් බ්‍රහ්මලෝකයෙහි ඉපදීමෙන් කම්නැත කාමාවචරයෙහි උපදිම්වායි නිකාන්තිය පිහිටුවා කාලක්‍රියා කෙළේවිනම් ඒ ධ්‍යානවිපින්ගේ පරිකර්මාදි කාමාවචර කුශල කර්ම බලයෙන් සපතකාමාවචරයෙහි මහෙශාක්‍ය දිව්‍යරාජයෙක්ව උපදනේයි.

මේ ගරුකර්ම විභාගයයි.

ආසන්න කම්මයාගේ විභාගය මෙතැන් පටන් දක්වනු ලැබේ:— ආසන්නකම්ම වනාහි කුශලාසන්නකම්ම අකුශලාසන්නකම්මයයි දෙවැදෑරුම් වේ. කුශලාසන්නකම්ම වනාහි පසු පසුව කළාවූ කුශලකම්මද, මිරණාසන්න කාලයෙහි කළාවූ කුශල කම්මද, පූර්වයෙහි කරණලදුව මරණාසන්නකාලයෙහි සිහිපත්කලාවූ කම්මද, ආසන්න කුශලකම්මයම්වේ. ඒ කුශල කම්ම ප්‍රතිසන්ධි විපාකයදෙන්නේයි. ඒට සාධකයම්:—දුටුඇමැති කුමහරජතෙමේ චුල්ලඛණ්ඩිය යුධයෙන් පැරද චුල්ලුපඨාකයම් තිස්සඇමතියා සමඟ වලටවැද අතිශය බඩසයින් පෙළෙනකල්හි එම්බා චුල්ලුපඨාකය! කෑ යුත්තක් ඇත්තේදැයි විමාළේය. සවාමිනි! මට ආහාර පිණිස ගෙණ එනලද්දාවූ එකම බත්තලියක් ඇත එය අනුභවකාරකසේක්වාසි කියා ඉදිරියෙහි තැබුයේයි. එකල්හි රජතෙමේ එසේවිනම් ඒ බත්තලිය සතරකොටසකට බෙදවයිනියොගකෙළේයි. චුල්ලුපඨාක තෙමේ සවාමිනි! නුඹවහන්සේහා මිමද අස්වෙළඹද ඇත තුන්දෙනෙක් පමණක් ඇත්තේය. සතරවෙනි කොටස කවරක්හු පිණිසදැයි විමාළේයි. එම්බල චුල්ලුපඨාකය! මාගේ ආත්මය සිහිකරන්නට දැනගත් තැන් පටන් අද දවස දක්වා කිසිකලෙකත් දන්නොදී නොකෑවිරුම්හ. එහෙයින් ආර්‍යයන් උදෙසා සතරවැනි කොටසයයි කීයේය. එක්කිති චුල්ලුපඨාක තෙමේ සවාමිනි! ඉතාකල් ආසන්නවිය. මේ වනමඛ්‍යයෙහි කොයින් ආර්‍යයන් ලබමුදැයි විමාළේයි. එම්බල! මට ශ්‍රද්ධාව තිබෙනම් ආර්‍යයන් දුර්ලභ නොවෙයි. වහා බෙදවයි නියොගකෙළේයි. චුල්ලුපඨාක තෙමේද එසේම කෙළේයි. * රජතෙමේ හුනස්නෙන් නැගිට අහසදෙස බලා සවාමිනි ආර්‍යයෝ ඇත්නම් දැන් මේ අනතුරුයට පැමිණියාවූ ඇත්ත හුගේ දැනය පිළිගැණීමට එඛනාසේක්වයි කාලඤ්ඤාකෙළේයි. එකල්හි පුවතු ද්වයින්ට දෙලොස් දහසක් භික්ෂූන් හා සමඟ දන් වැළඳීමට වැඩහුන්නාවූ පිණ්ඩපාතික තිස්ස සථවිරයන්වහන්සේ කාලඤ්ඤා ශබ්දය අසා අන්තඉගයෙහි බුදුසසුන් වඩන්නාවූ රජහුගේ ශ්‍රද්ධාව පිරිහී කියේවිනම් නපුරුය සිතා ඒ භික්ෂූන්ට එසේම වැඩහිඳුවයි කියා පාසිවිරුගෙණ ඇසිල්ලකින්

---

* රාජා කාලං ඤාසෙහීති ආහ. ඡඩ්ඩිතාභරඤ්ඤෙ කුතෝ අය්‍යෙ ලභිස්සාම දෙවාති, තාහං තව භාරෙ‍ාං, සචෙ මම සඩ්ඩා අත්ථි අය්‍යෙ ලභිස්සාම, විස්සජ්ජෙථ කාලං ඤාසෙඝීති ආහ. සෙ කාලො භන්තෙති නික්ඛන්තු. ඤාසෙසි. අථස්ස බොධිමණ්ඩෙ මහාතිස්සත්ථෙරො තං සද්දං දිබ්බාය සොත ධාතුයා සුත්වා-පෙ-අජ්ජ මයා රඤ්ඤෙ සංගහං කාතුං වට්ටතීති මනසා ඔකාසං ආහන්ත්වා රඤ්ඤෙ පුරතො අට්ඨාසි, අංගුත්තරනිකායඨ්ඨකථා.

අහසින් අවුත් රජහුගේ ඉදිරියේ වැඩසිටිකල්හි එම්බා චුල්ලුපඨාකයා! මාගේ ශ්‍රද්ධාමහිමය බලවසි කියා ශ්‍රද්ධාව දිගුණව රජහුගේ කොටසත් සමග පිණ්ඩපාතයට තිබූ කොටස පිදූයේසි. චුල්ලුපඨාකයාද තමාගේ කොටසත් පිදූයේසි. අස්වෙළඹගේ කොටසද පුදුනු කැමැත්ත හැඟවූයේසි. ඉක්බිති ඒ කොටසත් පිදූයේසි. තෙරුන්වහන්සේ වහාම අහසින් ගොස් රජහුගේ කුශලය ඕහත්වේවයි සිතා දෙලොස් දහසක් භික්ෂූන්ට බත් සරලු ගණනින් දන්දී වළඳ අනතුරෙහි දුටුගැමුණු මහරජ තෙමේ ක්ෂුධාවෙන් පීඩිත බැව් දැනගෙණ තෙරුන්වහන්සේගේ පාත්‍රය සොඬා ප්‍රණීතාහාරයෙන් පුරවා අහසට දැමූයේසි. පාත්‍රය අවුත් රජහුගේ අතැ පිහිටියේසි. ඉක්බිති රජහුද චුල්ලුපඨාකයාද අස්වෙළඹිද යන තුන්දෙන බඩපුරා බත් කා තෙරුන්වහන්සේගේ පාත්‍රය දෙවා හිස් පාත්‍රය යැවීම් නුසුදුසුයයි සිතා රජහුගේ ශරීරයෙහි තුබූ ලක්ෂණයක් අහසා කසිසළුව පාත්‍රයෙහි බහා අහසට දැමූකල්හි තෙරුන්වහන්සේගේ අතැ පිහිටියේසි. ඉක්බිති රජතෙමේ යුද්ධයෙන් ජයගෙණ අනුරාධපුරයට පැමිණ ථූපාරාමපටිඝඩිරණය ලොහප්‍රාසාදය රුවන්වැලිසෑය යනාදීවූ මහජින්කම්කොට මරණමඤ්චකයට පැමිණිකල්හි තමාගේ පුණ්‍යකර්මයන් සඟහන්කරණලද්දවූ පින් පොත කියවන්නට පටන් ගෙණ රුවන්වැලිසෑය ආදීවූ මහාපුණ්‍යකර්මයන් කියවන්නාවූ කල්හිද විශෙෂ ප්‍රීතියක් නූපන්නේය. චුල්ලඛඟණීය යුද්ධයෙන් පැරද වනයෙහි සැඟවීසිටගෙණ දුන් බත් පාත්‍රය ගැන කියවන කල්හි අහෝ! මා විසින් මෙබඳු සඤ්ඣාන සථානයෙහි සිටගෙණ දෙනලද්දවූ පිණ්ඩපාතදානය අතිශයින් ආශ්චර්‍යයි මහත් ප්‍රීති සොම්නස් උපන්කල්හිම එදවස් දන්පිළිගන්නාලද පිණ්ඩපාතික තිස්ස සථවිරයන්වහන්සේ පාත්‍රය අතින්ගෙණ වැඩසිටියාක්මෙන් සවප්නයක් දකින්නාක්මෙන් කම්මනිමිති වැටහිණ. ඉක්බිති ඒ කම්මනිමිතත අරහයා මරණාසන්න ජවන චිත්ත වීථිය ඉපිද ඒ චිත්ත වීථි අවසානයෙහි නිදා පිබිදී එකෙකුමෙන් කළුරිය කොට තුසිපුරයෙන් දිගණා දිව්‍ය රථයෙහි හොලොස් හැවිරිදි වයස් ප්‍රමාණවූ රාජකුමාර වෙශයකින් ඔපපාතිකව ඉපිද ගැල් සැටක් පුරාලන්නාවූ දිව්‍යා භරණයෙන් සැරසී දිව්‍යපස්රුවන් පිරිවරාගෙණ දිව්‍ය රථයෙන් බැස රුවන්වැලිසෑය පැදකුණු කොට නැවතත් රථයට නැගී තුසිපුරය බලාගියේසි මෙසේ පූජියෙහි කරණලද්දවූ කුශල කර්මයද මරණයට ආසන්නවූ කල්හී සෙසු බලවත් කුශල කර්මවතුරා තමාගේ විපාකයට අවකාශගන්නේසි. මනොරථපූරණියෙහි සබ්බත්‍රුලකම්මයයි කියන

ලදී. තවද රජගහනුවරවැසි තමබදුකිකතම් වෝරඝාතක තෙමේ දිවිසිමියෙන් මනුෂ්‍ය ඝාතකයකොට මරණයට ආසන්න කාල යෙහි ආයුෂමත් සැරියුත් මහතෙරුන්වහන්සේ මහදී සරිලා ගෙට වැඩම්මාගෙණවුත් වඩා හිඳුවා තමා පිණිස පිසූ කිරිබත දන්දී උන්වහන්සේගෙන් ධර්මකථාව අසා නොබෝ කලකින්ම කාලක්‍රියාකොට ඒ මනුෂ්‍ය ඝාතක අකුශල කර්මය මුවහකොට දන්දී බණ ඇසූ කුශල කර්මය ආසන්නයට පැමිණ සුගති පටිසන්ධිය දුන්නේසි. ආසන්න අකුශල කර්මයට උදාහරණ නම්:- වාචනාල උපාසක වස්තුව දතයුතුයි.

ආසන්න කර්ම විභාගයයි.

"ආචිණ්ණ කර්මය" යනු නිරන්තරයෙන් කරණලද්දුවූ වැදි කෙවුල් ආදී කර්මාන්තය හෝ එක් වරක්මකරණලද්දුවූ යම්කිසි කුශල කර්මයක් හෝ අකුශල කර්මයක් හෝ නිරන්තර යෙන් සිහිපත්කරන්නේවිනම් ඒ කර්මයද ආචිණ්ණ කර්මනම්වේ. ඊට උදාහරණවශයෙන් දෙවරම්වෙනෙර පිටිපස සිටියාවූ වුන්ද සූකරයාගේ කථාවස්තුව දතයුතුයි.

මේ ආචිණ්ණ කර්ම විභාගයයි.

"කටත්තා කර්මය" යනු එක්වරක්කොට සිහියෙන් තුරන්වූ කර්මයයි. එබදු කර්මයද ගරුකාදී කර්ම නැත්තේවිනම් ආසෙවන ප්‍රත්‍යය ලැබ පටිසන්ධි විපාකදෙන්නේසි. එක් වරක් කොට සිහියෙන් තුරන්වූ යම්කිසි කර්මයක් ආසෙවන ප්‍රත්‍යය නොලැබුයේනම් ප්‍රතිසන්ධි විපාක නොදෙන්නේසි. සබලාවූ කුශලකර්මයකුදුකොට නැවත නැවත සිහිපත්කරන්නේවිනම් ඒ සිහිපත්කිරීම ආසෙවන ප්‍රත්‍යය නම්වේ. එසේ බලලැබීමෙන් පටිසන්ධි විපාකදීමේහි පොහොසත්වෙයි. විපාකදෙන කල්හි පළමුකොට ගරුකර්මයක් නැතිකල්හි ආසන්නකර්මය පටිසන්ධි විපාකදෙයි. ගරුකර්මය ආසන්නකර්මය යන දෙක නැති කල්හි ආචිණ්ණක කර්මයද ප්‍රතිසන්ධි විපාකදෙයි. ගරුකර්ම ආසන්න කර්ම ආචිණ්ණකර්ම තුන නැතිකල්හි කටත්තාකර්මය ආසෙවන ප්‍රත්‍යය ලාභයෙන් පටිසන්ධි විපාකදෙයි. මේ වාක්‍යයේ අනුරුද්ධ මහරින්ගේ අභිප්‍රායයයි. අභිධර්මාවතාර ටීකායෙහි විභාගේ ආචිණ්ණ කර්මය බලවත්වෙයි. ආසන්න කර්මය දුර්වලවෙයි. ඊට උපමා නම්:—

ගව් ගාලෙක්හි සයනයකරන්නාවූ ගවයන් අතුරෙන් ජරාපත්වූ ගවයෙක් තමුදු ගාල් දොරටුවෙහි සයනයකෙළේවිනම් පසු ගාලයෙහි සයනයකරන්නාවූ බලවත් ගවයන්ට පළමුකොට ගාල් දොර සයනයකළාවූ දුර්වල ගව තෙමේ නික්මෙන්නාක් මෙන් බලවත්වූ ආවර්ජන කර්මයක් ඇත්තේ නමුදු දුර්වලවූ ආසන්න කර්මය මරණයට ලංවිනම් පළමුකොට විපාකදෙන්නේ යයි දක්වයි. මේ උපමාවෙහි බලවත්වූ ගවයන්ට ආවර්ජනකර්මය ද ජරාපත්වූ ගවයන්ට ආසන්න කර්මයද උපමා උපමේය වශයෙන් සම්බන්ධකරයුතුයි. ඉහාතම්හි කර්මයන්ලාවූ සකර්මයන්ගේ විපාකදෙන කල් තෙමේ දිට්ඨධම්මවේදනීය කර්මනම්වේ. අනතුරු අත් බැවිහි ප්‍රතිසන්ධිවිපාකදෙන කර්මතෙමේ උපපජ්ජවේදනීය කර්මනම්වේ. තුන්වන අත් බැව පවත් අපරාපරිශෙෂනිර්වාණ ධාතුවෙන්පිරිනිවන් පෑම දක්වා මේ අතරෙහි අවකාශ ලත්විටක විපාකදෙන කර්ම තෙමේ අපරාපරිය වේදනීය කර්මනම් වේ. විපාක නොදෙනලද්දාවූද මතුවිපාක නොදන්නාවූද කර්මතෙමේ අහොසි කර්මනම්වේ. ඒ සතරාකාරකර්මයන් අතුරෙන් ප්‍රවර්තිකාලයෙහි සත්වරක්ජවන්වශයෙන් පවත්නාවූ කුශලා කුශල ජවන චිත්තයන්ගේ හෙවත් කුශලා කුශල ජවනචිත්ත යෙහි යෙදුනාවූ චෛතසිකයන් අතුරෙන් වෙඛනා චේතසිකය කර්මයයි ව්‍යවහාරකෙරෙයි. ප්‍රථම ජවනයෙහි යෙදුනාවූ චෙතනා කර්ම තෙමේ ඉහාතම්හාවයෙහි නිර්ක්‍රමයි රන්පළඟිනා දිය පහළවීම් වශයෙන් විපාක දිය හැකිව කර්ම තෙමේ දිට්ඨධම්ම වේදනීය කර්මනම්වෙයි. ඒ කර්මය කුශලා කුශල කර්මවශයෙන් දෙවැදෑරුම්වෙයි. ඒ ප්‍රකාරවූ කර්මයන් අතුරෙන් දිට්ඨධම්ම වේදනීය කුශලකර්මය අතිශයින් මහත්වූ විපාකාදීමෙහි ශක්තිඇත්තාවූ කර්මයක්විමට සතර කාරණයකින් සම්පූර්ණවියයුතුයි. ඒ සතර කාරණයෝ නම්:—

ධ්‍යානාභිඥාබලයෙන් සම්පූර්ණවූ බුදු පසේබුදු මහරහත් කෙනෙකුන්ගේ ලැබීමය, ධාර්මිකවූ දානවස්තුවක් ලැබීමය, ප්‍රතිග්‍රාහක තෙමේ එදවස්හි නිරෝධයෙන් නැගිටිනබවය, දායක තෙමේද පූර්වචේතනා මුවනචෙතනා අපරචෙතනාවන් ගෙන් සම්පූර්ණවූ ශ්‍රද්ධාවත්ගෙන් යුක්තවනබවය යන මේ සතරාඞ්ගයෙන් යුක්තවනකල්හි දානය ධර්ම වේදනීය කර්මය එදවස්හිම සිටුව සේසත්ලැබීම් ආදියට උපකාරවන්නේයි. දිට්ඨධම්මවේදනීය කර්මය ආසෙවන ප්‍රත්‍යය නොලැබීමෙන් දුර්වලවූහෙයින් ප්‍රතිසන්ධි විපාක නොදීය හැක්කේය එසේ හෙයින් එම කර්මයකළාවූ සහේතුක කුශලා

කුශලවිපාක මාත්‍රයක් දියහැකිවෙයි. ඉහාතම්යෙහි සිටු සේසත් ආදිය ලැබීම වනාහි ත්‍රිහෙතුක කුශලයන්ගේ සහෙතුක මහා විපාකයමවෙයි. සිටු සේසත් ආදිය ලැබීමෙහි අපරාපරිය වේදනීය කර්මය මහත් යසෙශ්වර්‍යයී සංඛ්‍යාතවූ විපාක ආනිශංස කෙසේදෙන්නේද යත්? එබඳු දිළුධම්මවේදනීය කර්මය වීසින් බලවත්වූ අපරාපරිය වේදනීය කර්මයකට රුකුල්දීමෙන් සසර තුන්වැනි අත්බැව් ආදියෙහි මහත්වූ ඓශ්වර්‍යය ලැබෙන්නේමි. එතකුදුවුවත් දිළුධම්මවේදනීය කර්මයෙන් තොරව ඒ මහානුභාව සම්පන්නවූ අපරාපරිය වේදනීය කර්මයන්ට විපාක කොදියහැක්කේමි. ඒට උපමානම්:— දර, තෘණ, පරඛලා ආදී වස්තුවය, ගිනිපුපුරුය, යන මේ ද්‍රව්‍යයන් සොඟා බහාලන්නාවූ පුරුෂයාය, ගිනි පිඹින්නාවූ පුරුෂයාය, යන මේ දෙදෙනා හට සමානවෙත්. ගිනි පුපුරු දර ආදිය සොයා පරීක්ෂාකොට බහාලන්නාවූ පුරුෂයාමෙන් දිළුධම්මවේදනීයකර්මය, ගිනි පිඹින්නාවූ පුරුෂයාමෙන් වාක් අදිය භෙදකොට විපාකාදිය කැමතිව ප්‍රාර්ථණාකරන්නාවූ පුරුෂයාද ගිනිපුපුරක්මෙන් අපරාපරිය වේදනීයකර්මය, උපමාඋපමෙය්‍ය සම්බන්ධකොට අර්ථදත යුතුමි. එහෙයින් දිළුධම්ම වේදනීය කර්මයන්ගෙන් මුක්තවූ අපරාපරියවේදනීය කර්මයන් විසින් තුන්වෙනි අත්බැව් ආදියෙහි සිටු සේසත් ආදී මහත් විපාක දියහැක්කේමි. අපරාපරිය වේදනීය කර්මය බලවත්කල්හිද දිළුධම්මවේදනීය කර්මය දුර්වලවූයේ නමුදු මහත්වූ ප්‍රකටවූ විපාකදෙන්නේමි. ඒට උපමානම්:— දැඩිවූ ගිනි අඟුරු රැසක් මත්තෙහි අමු දර රාශියක් දැමූයේ නමුදු ඒ දර දවන්නේයයි දනයුතුමි, අපරාපරිය වේදනීය කර්මය දුර්වලවූකල්හි දිළුධම්මවේදනීය කර්මය බලවත්වූයේ නමුදු මහත්වූ විපාකදෙන්නේමි. ඒට උපමා නම්:—දුර්වලවූ ගින්නට යහපත්වූ දර දමූකල්හිඅතිශයින් දැඩිවූ ගින්න හටගන්නාක්මෙනි; අපරාපරිය කුශලකර්මය දුර්වලවූකල්හි බලවත්වූ අපරාපරිය අකුශල කර්මය විසින් පෙළෙන ලදුව විපාක නොදෙන්නේමි. ඒට උපමා නම්:—දුර්වලවූ ගින්නට වතුර ජලය ලැබුනුකල්හි ඒගින්න නිවී යන්නාක් මෙනි

අපරාපරිය වේදනීය කර්මයන්ගේ සභාව නම්:—ඒ කර්මයන්ගේ ශක්තියෙන්මි විපාකදෙනුදිය හැකිබවයි. බිය සුළු පුරුෂයෙක්හට රාත්‍රි කාලයෙහි සුදකලාව සොහොන් භූමියකට නොයාහැකිවෙයි. එහෙයින් දෙවෙනි පුරුෂයෙක් හා සමගම සොහොන් භූමියට යාහැකිවන්නාක්මෙන අපරාපරිය වේදනීය කර්මතෙමේ දිළුධම්මවේදනීය කර්ම කැමති යහපලුවාගේ උපකාර

ලැබ විපාකදෙන්නේයයි දතයුතුයි. දිට්ඨධම්මවේදනීය කම්යන් ගේ විපාකදීමය කතුඃ—යම්සේ ආහාර පානාදියෙන් දුක් විඳින් නාවූ පුරුෂයෙක්හට උපභොග පරිභොග සම්පත්තියෙන් ආඪ්‍ය වූවන් විසින්දෙනලදුව යහපත් වස්ත්‍රාභරණ හැඳ පැළඳ යහ පත් ආහාරපාන අනුභව කරන්නාවූ කල්හි අපගේ සවාමියා විසින් දෙනලදුව මේබදු වස්ත්‍රාභරණාදිය හැඳ පැළඳ යහපත් ආහාර අනුභවකරමිදැ කියයි නමුදු ඒ දුඃඛිතවූ සත්වයන් කෙරෙහි ලැබියයුතුවූ කුශල කම්යන්ගේ විපාකවශයෙන් ඒ වස්ත්‍රාභරණ ආහාරපානාදිය ලබන්නේයයි දතයුතුයි.

මේ වනාහී කුශල කම්යන්ගේ විපාකදීමයි.

අකුශල කම්යන්ගේ විපාකදීම වනාහි පුථුල වශයෙන් නන්දනම් මානවක තෙමේ උත්පලවණ්ණී රහත් මෙහෙණින්න කෙරෙහි වරදවා පිළිපැදීමද, නන්ද නම් ගොඝාතක තෙමේ පස ළොස්වක් පොහෝ දවස්හි තමාගේ මඛලවෘෂභයාගේ දිවකපා බැද ගෙණෙවයි නියොඝකොට ඒ මාංසය තමාගේ දිවෙහි තුබූ කෙණෙහිම දිවවුලින් ඉගිලී ඛත්වස්තෙහි හුණුබවද, සැරියුත් මුගලන් දෙදෙනාවහන්සේට කොකාලික තෙමේ "පාපිච්ඡා භන්තෙ සාරිපුත්තමොග්ගල්ලානා" යනාදීන් අග්‍රශ්‍රාවකයන්හට බුදුන්ගේ අභිමුඛයෙන් මදක්තැන් යනකල්හි බෙලිඵල පමණ මහත්වූ පිළිකා හටගෙණ එයින් කාලක්‍රියාකොට පදුම නරක යෙහි උපන් වස්තුවද, අකුශල පක්ෂයෙහි උදාහරණ වශයෙන් දැක්වීය යුතුයි. මේ දිට්ඨධම්මවේදනීය කම්ය වනාහි සමාන ජාතික ජවනයන්ගෙන් ආසෙවන ප්‍රත්‍යය නොලැබූ හෙයින් ප්‍රතිසන්ධි විපාක නොදෙන්නේයි. ඉදින් ඉහාතම්යෙහි අහෙතුක විපාක මාත්‍රයක් නුදුන්නේවීනම් අහොසිකම් වෙයි. සත්වෙනි ජවනයෙහි යෙදුනාවූ චෙතනාව උපපජ්ජවේදනීය කම්යයි කියත්. ඒ කම්ය වනාහි දෙවෙනි අත්බැව්හි පටිසන්ධිවිපාක හා ප්‍රවෘත්ති විපාකත් දෙන්නේයි. එය ජනක කම්ය සමානයි. ඒ කම්ය දෙවෙනි අත්බැව්හි පටිසන්ධි විපාකදෙන්නේ කුමක් හෙයින්ද යත්? ආසෙවන ප්‍රත්‍යයාගේ බලවත් බැවිනැයි දතයුතුයි.

ඊට උපමා නම්:—

හොන්ගුඟසතක් යෙදූ ගැල පසු පසුව යෙදුවාවූ හොන්ගුඟ සය විසින් රැකුල්දෙන ලදුව සත්වන ගව ගුඟය විසින් සම්පූර්ණ යෙන් ගැලඇදිනු ලැබෙයි. එපරිද්දෙන්ම ප්‍රථම ජවනාදී ජවන් සය විසින් රැකුල් දෙන ලදුව සත්වන ජවනය විසින් ප්‍රතිසන්ධි

ප්‍රවෘත්ති විපාකය උපදවනු ලැබෙයි. ඒ කර්මයද කුශලෘ කුශල වශයෙන් දෙවැදෑරුම් වෙයි. ඔවුන් අතුරෙන් කුශල උපපජ්ජවේදනීය කර්මයෝ තුමූ එක් සත්වයෙක් කෙරෙහි අනන්තෘප්‍රමාණ වෙත්. ඒ අප්‍රමාණ උපපජ්ජවේදනීය කර්මයන් අතුරෙන් අතීශයින් බලවත්වූ උපපජ්ජවේදනීය කර්මයකින් හෙවත් පිණ්ඩපාත දානමය ආදී කුශල කර්මයකින් ප්‍රතිසන්ධිය දුන්කල්හී අවශෙෂවූ සත්වන ජවනචෙතනා කුශලකර්මයෝ තුමූ අහොසි කර්ම නම්වෙත්. නොහොත් නියම කාලය ඉක්මීම හෙතුකොට ගෙණ පැලනොවෙන්නාවූ ධාන්‍යබීජමෙන් අහොසිකර්ම බවට යෙත්. එපරිද්දෙන්ම ඛෙහෝ අකුශල් රැස්කළාවූ පුද්ගලයෙක් තෙමේ එක්තරා ගොඤාතක අකුශලකර්ම සත්වන ජවනයකින් අපායප්‍රතිසන්ධිය ගත්කල්හී අවශෙෂවූ අනන්තෘප්‍රමාණවූ සත්වන ජවන චෙතනා අකුශලකර්මයෝ තුමූ අහොසිකර්ම නම් වෙත්.

"අපරාපරියවෙදනීයකර්මය" යනු මධ්‍යයෙහි ජවන චෙතනා පසසම්ඵස්සාවූ කර්මයෝයි. එක් සත්වයෙක්හට ඇත්තාවූ අපරාපරිය වෙදනීය කර්මයන්ගේ සඞ්ඛ්‍යාව ගන්නා පිණිස මේ මහාපෘථිවියෙහි සියලු පස අබ බිඳු පමණ ගුලියකළේ තමුදු සතර මහාසාගරයෙහි ජලය අබ පියල්ලකින් මනින්නාහු තමුදු එකම සත්වයෙකුගේ අපරාපරිය වෙදනීය කර්මයන්ට නොපොහොනේ යයි දතයුතුයි. ඒ අපරාපරිය වෙදනීයකර්මය විසින් විපාකදීමට අවකාශයක් ලැබුනු කල්හිම විපාක දෙන්නේයි. ඊට උදාහරණ යක් නම්:—මිනිසුන් දහසක් කැඟි ගියාවූ තැවක් සමුද්‍රමධ්‍යයෙහි විනාශවිනම් ඒ දහසක් මිනිසුන්ට අපරාපරිය කර්ම දහසක් අභිමුඛයට අවුත් විපාකදෙයි. ඒ දහසක් මිනිසුන්ගේම මරණය වන්නේයි. අපරාපරිය වෙදනීයකර්ම සඞ්ඛ්‍යාතවූ මධ්‍යයෙහි ජවනයෝ පස්දෙන නිවීණය දක්වාම ප්‍රතිසන්ධි ප්‍රවෘත්තිවිපාක දිය හැකිවෙත්. එක් කර්මයක්හි එක් භවයෙහ ප්‍රතිසන්ධිය දී ජාති සතසඟ්‍රහයකත් ප්‍රවෘත්ති විපාක දියහැක්කෝයි. ප්‍රතිසන්ධිවිපාක නොදී ප්‍රවෘත්තිවිපාක දෙන්නාවූ අපරාපරියවෙදනීයකර්මයෙක් නම් නැත්තේයි. අහොසිකර්මයද කුශලාකුශල වශයෙන් දෙවැදෑරුම් වෙයි. දෙවිදත් තෙරණුවෝ මේ ශාසනයෙහි පැවිදිව සතර සංවර ශීලය රක්ෂාකොට පඤ්චාභිඥා අෂ්ටසමාපත්ති උපදවා මෑතභාගයෙහි සඞ්ඝභෙදකර්මයකොට අවීචිමහ නරකයෙහි උපන්නේය. ඔහු විසින් රැස්කළාවූ කාමාවචර රූපාවචර කුශල යන්ගේ දිට්ඨධම්මවෙදනීය උපපජ්ජවේදනීය කර්මයෝ අහොසි කර්ම බවට පැමිණුවූහ. කොවිගණන් මනුෂ්‍යභාවතය කොට මෑතභාගයෙහි මහණව රහත්වූ අතුල්මල් තෙරණුවෝ ඒ අප

මෙණවු අකුශල කර්මයන්ගේ උපපජ්ජවේදනීය අපරාපරියවේදනීය අකුශලකර්මයන් අහොසිකර්ම බවට පැමිණෙන්නාහ. එතකුදුවුවත් ඒ අඞ්ගුලිමාල තෙරුන්වහන්සේ වැඩවසන බවට පැමිණි ග්‍රාම තඟරුදිගෙහි බලු කපුටු ආදීන්ට දම්සඟන්නාවූ කැටමුඹුරු ආදිය තෙරුන්වහන්සේගේ හිසේ පැහැර හිඳෙන් ගලන්නාවූ ලෙහෙසෙන් සිරුරු තෙමී වෙහෙරට පෙරළා එන්නේ වෙයි. මේ වනාහි මනුෂ්‍යඝාතන අකුශල කර්මයන්ගේ දිට්ඨධම්මවේදනීය විපාකඝයයි දතයුතුයි.

මෙහිදී බුදුන් රහතුන්ගේ තණ්හක්ඛයකරඥාන සඞ්ඛ්‍යාතවූ අඟ්ග මඟ්ගඥානයෙන් කර්මක්ඛය කරන්නාහු නොවෙත්ද? එහෙයින් මේ අඞ්ගුලිමාල වසතුවෙහි දිට්ඨධම්මවේදනීය කර්මය කෙසේ විපාක දුන්නේදැයි ප්‍රශ්නයක් උපදනේය. ඊට පරිහාර නම්:— සියලු රහතුන් වහන්සේලාගේ අතීත්මාගීඥාන සඞ්ඛ්‍යාතවූ කර්මක්ඛයකරඥානයෙන් ආයතිභවයෙහි පටිසන්ධිගහණ දෙන්නාවූ උපපජ්ජවේදනීය කර්මයෝත් බුදුවරයන්ගේ කර්මක්ඛයකරඥානයෙන් උපපජ්ජවේදනීය කර්මය, දිට්ඨධම්මවේදනීය කර්මය, (අපරාපරියවේදනීය කර්මය) යන මේ සියලු කර්මයතුත් නසන්නාහුයයි දතයුතුයි. මුහලන් මහතෙරුන් වහන්සේට අපරාපරියවේදනීය කර්මයද, අඟුල්මල් තෙරුන්ට දිට්ඨධම්මවේදනීය කර්මයද විපාක දුන් සැටි දතයුතුයි. දිට්ඨධම්මවේදනීයකර්මය ඉහාතභවයෙහිත් උපපජ්ජවේදනීයකර්මය දෙවෙනි ආතභවයෙහිත් අපරාපරියවේදනීයකර්මය සකඞ්ඛපරිනිබ්බාණයෙහිත් අහොසිකර්ම වන බැවින් දිට්ඨධම්මවේදනීයාදිවූ කර්මයන්ගේඒ ඒ නියමකාලය ඉක්මවෙන්ම අහොසිකර්මයයි ව්‍යවහාර කෙරෙත්. ඊට කාරණ කර්මවිපාකයයි කියත්.

මේ කර්මයෝ සතරඳන විපාකදෙන්නාවූ කාලයාගේ වශයෙන් හඳහන්නාවූ කර්මවෙත්. ඒ කර්මතෙමේ අකුශලකර්මය කාමාවචර කුශලකර්මය රූපාවචරකුශලකර්මය අරූපාවචරකුශලකර්මයයි සතරවැදෑරුම් වේ. ඔවුන් අතුරෙන් අකුශලකර්මය වනාහි සතරඅපායෙන් අන්‍යවූ කාමාවචර රූපාවචර අරූපාවචර යන තුන්වැදෑරුම්වූ භූමියෙහි විපාකදෙන්නාහු නම්වූ රූපාවචර අකුශල අරූපාවචර අකුශලයයි ව්‍යවහාර නොකෙරෙත්. යම්සේ මනුෂ්‍ය ස්ත්‍රීන්ගේ කුස උපදනා තිරශ්චීනයන් මනුෂ්‍ය යොනියෙහි සඞ්ග්‍රහනොකොට තිරශ්චීනයොනියෙහිම සඞ්ග්‍රහ කෙරෙත්ද, එපරිද්දෙන්ම රූපාරූපභූමියෙහි විපාක දෙන්නාවූ අකුශලකර්මයන් අපායභූමියෙහිම සඞ්ග්‍රහ කෙරෙත්. ඒ කර්ම වනාහි විපාක දෙන සථාන ලකෂයෙන් සතර වැදෑරුම් වේ.

ඔවුන් අතුරෙන් අකුශල කම්තෙමේ කායකම්ය, වචිකම්ය, මනොකම්යයි වාර වශයෙන් තුන්වැදෑරුම් වේ.

මෙතැන්හි වාරය යන ව්‍යවහාරය මතු රූපපරිච්ඡේදයෙහි ප්‍රකාශ රූපයන්ට වාරරූපයයි කරන්නාවූ ව්‍යවහාරයමෙන් නොවේ. කායවිඥප්ති වචීවිඥප්ති වශයෙන් කායවාර වචීවාරයයි කියති. ඒ ත්‍රිවිධාකාරකම්යන් අතුරෙන් පාණාතිපාත, අදින්නාදාන, කාමමිථ්‍යාචාර යන කම් තුන්දෙන වනාහි කායකම් නම් වෙත්. ඒ කම් තුන්දෙන කායකම්ය යන නාමය කියා කලෙකත් අත් නොහරිති. කායවිඥප්තිය වනාහි කායවාරයයි කුමක් හෙයින් ව්‍යවහාර කරන්නේදයත්? කායකම්යන්ගේ නිකුත්වීමට දොරටුවක් වැනි හෙයින් කායවාර නම් වේ. ඒ කායකම්යන්ගේ හටගැණීමට සථානවූ කායවිඥප්ති සඞ්ඛ්‍යාත වාරයෙහි වචිකම්ය හටනොගන්නේදැයි ප්‍රශ්න කෙළේවිනම් කායවාරයෙහි වචිකම්යද සවලාපවශයෙන් හටගන්නේයයි විසඳා රකටයුතුයි. එහෙයින් කායවාරයෙහි කායකම්ය බොහෝ සෙයින්ද වචිකම් සවලාපවශයෙන්ද හටගන්නේයයි කියයුතුයි. එසකුදුවුවත් ඒ කායවාරයෙහි හටගන්නාවූ සවලාපවූ වචිකම්යන්ව කායකම්යයි ව්‍යවහාර නොකෙරෙත්. කුමක්මෙන්ද යත්? "බ්‍රාහමණගාමෙ" යනාදී උදාහරණයෙහිමෙන් බොහෝ සෙයින් වසන්නාවූ බ්‍රාහමණයන්ගේ වශයෙන් බ්‍රාහමණග්‍රාමයයි කියන නමුත් සවලාපවශයෙන් වසන්නාවූ වණ්ඩාලාදීන් හෙතු කොටගෙණ වණ්ඩාලග්‍රාමයයි යනාදීන් ව්‍යවහාර නොකෙරෙති. මේ උපමාගෙහි බ්‍රාහමණයන්මෙන් කායකම්යද සවලාපවූ වණ්ඩාලාදීන්මෙන් වචිකම්යද, ග්‍රාමයමෙන් කායවිඤ්ඤත්තියද, උපමා උපමෙය්‍ය සමබන්ධ කවයුතුයි. කායවාරයෙහි සවලාපවශයෙන් වචිකම්හටගන්නේ කෙසේදයත්? වචනයෙන් කියයුතුවූ මුසාවාද පිසුණාවාච ඵරුසාවාච සම්ඵප්‍රලාප යන යම්කිසි අකුශල කම්යක් පත්‍රාදියෙහි ලියා දෙන්නේවිනම් හසතමුද්‍රායෙන් හඟවන්නේවිනම් කායවාරයෙහි පැවති වචිකම්යයි දතයුතුයි. මේ වනාහි කායකම්යෙන් වාරය නියමකිරීමයි. කායවාරය එකාහයෙන් ගතයුත්තේයි. ඒ කම්ය කායවාරයෙහි උපදනා හෙයින් කායකම්යයි ව්‍යවහාර කෙරෙත්. අභිධ්‍යා, ව්‍යාපාද, මිථ්‍යාදෘෂ්ටි යන කම්යෝතුමූ මනොවාරයෙහි පවත්නා හෙයින් මනොකම් නම් වෙත්. කායකම් වචිකම්යෝ තුමූ කායවිඤ්ඤත්තියි වචීවිඤ්ඤත්තියින්ගෙන් තොරව හටනොගන්නාක්මෙන් මනොකම්යද මනොවාරයෙන් තොරව හටගන්නේදැයි යන වෝදනාය සඳහා "අඤ්ඤත්‍රාපි විඤ්ඤත්තියා" යන්නෙහි "පි" ශබ්දය දක්වන

ලද්දේයි. ඒ "ද්‍ර" ශබ්දයාගේ ප්‍රයෝජනය කම්:— මනොකම්මසඞ්ඛ්‍යාතවූ ත්‍රිවිධකම්මයෝ තුමූ කායවිඤ්ඤත්තියත් හා සමඟද ඇතැම් කලෙක්හී හවඟනිත්ත යන අර්ථය "ද්‍ර" ශබ්දයාගේ ප්‍රයෝජනයයි. එහේ හවඟන්නේ නමුදු කායවිඤ්ඤත්තිය වචීවිඤ්ඤත්තියන් හා සමඟ සවලාවශයෙනුත් මනොද්වාරයෙහි බහුල වශයෙනුත් පවත්නා බව හඟවනු පිණිස "මනසම්ං යෙව බහුලං වුත්තිතොා" යනු කීහ. එහි අභිප්‍රාය කම්:—

කායවිඤ්ඤත්තිය වචීවිඤ්ඤත්තියෙහි බහුලවශයෙන් නූපදනා හුය. මනොද්වාරයෙහිම උපදනාහුය යන අර්ථය හඟවනු පිණිස එවකාරය දක්වනලදී. එනකුදු වූවත් කායද්වාර චිත්තවීථියෙහි හවඟන්නාවූ ලොභසහගතයෝ දුර්ලභවෙති. මනොද්වාරයෙහි හවඟන්නා ලොභ සහගතයෝම බලවත්වෙති. යම් කර්මයක් කරන්නාවූ කල්හී චේතනාව පෙරමුණෙහි හමන්කිරීමය අවිඝිඩයම්මය යන මේ ලක්ෂණයෙන් සමන්විතවූ කර්මයම ප්‍රතිසන්ධි විපාකයදෙයි තියුණුවූ චේතනාව නැතිවිනම් ප්‍රවෘත්ති විපාකම්ත්‍රයක් දෙන්නේයි. එහෙයින් මව්පිය ගුරුවරුදීන් විසින් දූදරු ශිෂ්‍යාදීන්ගේ යම්කිසි දුශ්චරිතාදියක් දුටුකල්හී රළුපරුෂ වචනාදිය ව්‍යවහාර කරත් නමුදු චිත්තයාගේ සණ්හසමුදුභාවය හෙතුකොට ගෙණ එරුස වචන කර්මපථය නොවන්නේයි. මනොකම්මයෙහි දෘෂ්ටිය යනු මේ ලොකය හා සත්ත්වයෝත් අහෙතුකව හවඟණිත්ත යන අහෙතුකදෘෂ්ටියද කුශලකම්මයෙහි කුශල විපාකයකුත්නැත. අකුශල කර්මයෙහි අකුශල විපාකයකුත් නැතැයි යනාදී දශ වස්තුවක් කැතැයි හත්තාවූ නාස්තික දෘෂ්ටියද, බුද්ධාදී උතුමන් කෙරෙහි පැවැත්විය යුතුවූ සිරිත් විරිත් ආදීවූ ක්‍රියාවක් (සත්ත්වයාගේ මරණින් මත්තෙහි ඉපදීමෙක්)නැතැයි හත්තාවූ අක්‍රිය දෘෂ්ටියද, යන මේ ත්‍රිවිධ මිථ්‍යාදෘෂ්ටිහුම දශ අකුශල කර්මපථයෙහි ඇතුළත්වූ කර්මපථයෝ නම් වෙති, අවශෙෂවූ සියලු අනියත මිථ්‍යාදෘෂ්ටිහු අකුශල කර්මයෙහි ඇතුළත්වෙති. එනකුදු

එත්ථකානෙතසෙන් අපායෙහි උපදනෝයයිනියමනෙනාකාව හැක්කේයි. මේ දශාකුශලකර්මපථයන් අතුරෙන් පාණාතිපාත එරුස වචන ව්‍යාපාද යන මේ ත්‍රිවිධ කර්මපථයෝතුමූ මොහමූලික සිතින් උපදනාහුය. විකල්පභයෙන් චිතාති මොහසම්පයුත්තවූ මොහ මූලික සිතින්ද උපදනාහුය. ඒ කෙසේයත්? මේහු මව අනාථ කෙළේයයි යනාදීන් නොවිධ අකාරක වස්තූන් හෙතුකොට ගෙණ ප්‍රාණඝාත එරුස වචන ව්‍යාපාද යන අකුශල කර්මයක් කරන්නේවිනම් ඒ අකුශලකර්මය මොහ මූලික සිතින් හටගත්

හේයි. මෙහිය හෙතුකොටහෙණ ආදිකම් නොදන ප්‍රාණඝා තාදී අකුශලකම්යක් කරන්නේ විනම් ඒ කම්ය මෙහයමුවඩාන වෙශ මූලිකයයි දතයුතුයි. කාමම්මිත්‍යාචාර අභිධ්‍යා මිත්‍යාදෙෂ් යන මේ අකුශලකම්යෝ තුන්දෙන ලොභමූලික සිතින් හෝ මෝහපවවය ලොභ මූලික සිතින් හෝ සවගන්නා ක්‍රමය යවකි නයින් දතයුතුයි.

මාතුරක්කීතාදී දෙලොස් ප්‍රකාර සත්‍රීන්කරා වරදවා යන්නාවූ පුරුෂයාහව කාමම්මිත්‍යාචාර කම්ය වෙයි. සත්‍රීන්ව වනාහි තමාගේ සපගී කාමගුණය අයිතිවූ පුරුෂයෙකු නැත්තේවිනම් කාමම්මිත්‍යාචාරය නොවෙයි. කුමක් හෙයින ගත්? ඇගේ මව පියාදීන්ට කාමගුණය අයිති නොවන හෙයිනි. පුරුෂයන්ව වනාහි කෙබඳු සත්‍රියෙක් වුවත් ඉක්මවා ගිහිය් නම් කම් පථය වන්නේයි. සුරාමේරකම්ය වනාහි කායකම්මාදී ත්‍රිවිධ කම්යන් අතුරෙන් කායකම්යෙහිද සපගී කාමගුණයෙහිද වරදවා පිළි පදනා හෙයින් කාමම්මිත්‍යාචාරයෙහිද ඇතුළත් වන්නේයි. අවශෙෂවූ අදින්නාදාන මූසාවාදය පිසුණාවාව සම්ඵප්පලාප යන සතර වැදෑරුම් කම්යෝ තුමූ ලොභමූලික දොසමූලික සිතින් උපදනාහුය. විකල්පයෙන් වනාහි යවකි නයින් මෙහ පවවය ලොභමූලික සිතින්ද මොහපවවය වෙශමූලික සිතින්දයි මෙසේ සතරාකාරයකින් සවගන්නා ක්‍රමය යවකි නයින් යොදා ගත යුත්තේයි. ඒ දශප්‍රකාරවූ අකුශලකම්යෝ විත්තනානප්පාද වශයෙන් දෙලොස් වැදෑරුම් වෙයි. කාමාවචර කුශලයද කායකම් වචීකම් මානසකම් වශයෙන් ත්‍රිවිධාකාර වන්නේයි. විරවනක්‍රමය අකුශල කම්යව කී නයින් යොදාගත යුතුයි. හෙවත් සවහත්‍යාගෙන් දන්දෙන කල්හී දානමය කුශලය කායවාරයෙහිද මෙසේ දන්දෙවයි විධානකල කල්හී දානමය කුශල කම්ය වචීවාරයෙහිද පවත්නා සැටි දතයුතුයි. වාර වශ යෙන් ත්‍රිවිධාකාරවන්නාක් මෙන්ම දාන සීල භාවනා වශයෙනුදු ත්‍රිවිධාකාර වෙයි. චිත්තනානප්පාද වශයෙන් අවෙප්‍රකාර වෙයි. යමෙකු විසින් මම දන්දෙමයයි සිතිවිලි මාත්‍රයක් උපදවන ලද් දේවිනම් ඒ උපදවන ලද්දවූ කාමාවචර කුශලචිත්තචිතය දාන මයකුශලකම් නම්වෙයි ඒ සිතු පරිද්දෙන් දානයදෙන්නාවූ කල් හී සවගන්නා අවීසාඛක ජවන චිතය කුශලකම්පථ නම් වෙයි. සියලු තන්හිම අවීසාඛක ජවනචිතහු ප්‍රතිසන්ධි ප්‍රවෘත්ති විපාකවශද අවීසාඛක නොවූ ජවනචිතහු අහෙතුක ප්‍රවෘත්ති විපාක මාත්‍රයන්ම දෙන්නාහුයයි දතයුතුයි. මේ දානාදීවූ දශ කුශල කම්පථයන් අතුරෙන් අපවයන වෙය්‍යාවච්ච යන

පුණ්‍ය ක්‍රියා දෙදෙන ශීලමය පුණ්‍යක්‍රියාව හා සදෘශ බැවින් ශීලයෙහි ද පත්තිදාන පත්තානුමොදනා දෙදෙන දානයට සදෘශ බැවින් දානමය පුණ්‍යක්‍රියාවෙහි ද ධම්ශ්‍රවණ ධම්දෙශනා දිට්ඨජුකම් තුන්දෙන භාවනාව හා සදෘශ බැවින් භාවනාවෙහි ඇතුලත් වන්නේයයි සමහර ආචාර්‍යවරයෝ කියති. එතකුදුවුවත් දිට්ඨජුකම්ය වනාහි සියලු පුණ්‍යක්‍රියාවන් නියම කිරීම ලක්‍ෂණ කොට ඇත්තේයයි දික්ඝයි අට්ඨකථාවෙහි කියන ලද්දේයි. කුමක් හෙයිනයත්? දෘෂ්ටිය ඇද නැති කල්හිම දාන ශීලාදී සියලු කුශල කර්මයන් රැස්කළ හැක්කේ වෙයි එහෙයින් දානාදී තව පුණ්‍ය ක්‍රියාවෙහිම දිට්ඨජුකම් පුණ්‍යක්‍රියාව පූර්‍ණ්‍ඛම කොට ඇත්තේයයි දතයුතුයි. රූපාවචර කුශල කර්මයද මනොවාරයෙහිම ඝටගන්නේයි. භාවනාවෙන් නිපන්නේ වෙයි. අර්‍පණාවට පැමිණියේ වෙයි. ධ්‍යානාඞ්ග වශයෙන් පවප්‍රකාර වන්නේයි. එසේම අරූපාවචර කුශල කර්මයද මනොවාරයෙහිම ඝටගන්නේ වෙයි. භාවනාවෙන් නිපන්නේ වෙයි අර්‍පණාඛවව පැමිණියේ වෙයි. රූපාවචර කුශලකර්මය ධ්‍යානාඞ්ග වශයෙන් පසක් වන්නාක්මෙන් අරූපාවචර කුශලකර්මය ආලම්බණ වශයෙන් සතරක් වෙයි පරිකර්ම නිමිත්ත වැටහුණු තැන් පවත් උග්ගහ නිමිත්ත උපදින තැන් දක්වා "පඨවී පඨවී" යනාදීන් කරන්නාවූ භාවනා තොමෝ පරිකර්ම භාවනා නම් වෙයි. පරිකර්ම නිමිත්ත වැටහීමය. උග්ගහනිමිත්ත වැව හීමය යනු අරුණුවන් මැවියෙන් ඉදිකරන්නාවූ කසිණ මණ්ඩලය අභිමුඛයෙහි තබා භාවනා කරණ කල්හී දියෙහි හිඳුනු පුරුෂයෙකුට හාත්පසින් ජලයයි වැටහෙන්නාක්මෙන් තමන්ගේ හාත්පස පෘථිවියයි වැටහුනේවීනම් පෘථිවිකසිණ පරිකර්ම නිමිත්ත වැවහුනේ වෙයි. ඒ නිමිත්ත බලා භාවනා කරණ කල්හි ඒ නිමිත්ත හා සර්‍වප්‍රකාරයෙන් සමානවූ ප්‍රතිබිම්බයක් වැනිවූ නිමිත්ත උපන් කල්හි යම් යම් දිශාවට ඇස් ඔලන්නාවූ කල්හිත් සවපානයෙන් දකින්නාක් මෙන් ඒ පෘථිවිකසිණ නිමිත්ත දකින්නාහු වී නම් උග්ගහනිමිත්ත උපන්නේ නම් වෙයි. ඒ පරිකර්ම නිමිත්ත උපන් තැන් පවත් උග්ගහ නිමිත්ත උපදිනතැන් දක්වා කරන්නාවූ භාවනා පරිකර්ම භාවනාව නම් වෙයි. උග්ගහනිමිත්ත උපන් තැන් පවත් හොත්තු චිත්තය දක්වා "පඨවීකසිණං" යනාදීන් කරන්නාවූ භාවනාව උපචාර භාවනා නම් වෙයි. ඊට අනතුරුව උපදනා ධ්‍යාන ජවනතෙමේ අර්‍පණා භාවනානම් වෙයි. පරිකර්ම භාවනා උපචාර භාවනාවෝ තුමූ කාමාවචර මහා කුශල් නම් වෙත්. අර්‍පණාජවනය රූපාවචර කුශල් නම් වෙයි.

විපාකදානසථාන වශයෙන් වනාහී අකුශලය කාමාවචර කුශලය රූපාවචර කුශලය අරූපාවචර කුශලය යන සතර කම්යන් අතුරෙන් උඛවවෙතනා සහිත චිත්තය වර්ජිත කොට ඇත්තාවූ එකොළොස් වැදෑරුම් අකුශල කම්යෙහි ඇත්තාවූ චෙතනා සංඛ්‍යාතවූ කම්තෙමේ අපායභූම්යෙහි පටිසන්ධිය උපදවයි. ප්‍රවෘත්තිකාලයෙහි වනාහි කාමරූප භූම්යෙහි දොළොස් වැදෑරුම් අකුශල කම්තෙමේ සත් වැදෑරුම් අහෙතුක අකුශල විපාකය දෙන්නේයි. එසේ දෙන්නේනමුදු චක්ෂු ශ්‍රොත ඝ්‍රාණප්‍රභාදයෝ නොලැබුවාහු නම් කාමභූම්යෙහි ඒ ඒ විපාක චිත්තය, නො ලැබෙන්නේයි. ප්‍රතිසන්ධි කාලයෙහි වනාහි උඛවවසහගත කම් වර්ජිත අකොට ඇත්තාවූ එකොළොස්කම්ය අපායභූම්යෙහි ප්‍රතිසන්ධිය දෙන්නේයයි කුමක්හෙයින් කියේ දයත්? උඛවව සහගත කම්ය වනාහි ප්‍රතිසන්ධි දානශක්තිය නැති හෙයින්. ප්‍රතිසන්ධිය නොදෙන්නේයි. ඒ බව කවර කාරණයකින් දතයුත්තේද යත්? මානෘකාවෙහි දර්ශන ත්‍රිකය බලන කල්හි උඛවව සහගත කම්ය ප්‍රතිසන්ධි නොදෙනබව හැඟෙයි. ඉදින් ඒ උඛවව සහගත කම්ය ප්‍රතිසන්ධිය දෙන්නේවිනම් දර්ශනත්‍රිකයෙහි "දස්සනෙන පහාතබ්බා ධම්මා" යන මානෘකාපදයාගේ පදභාජනයෙහි වදාළ යුතුමැයි. එසේ නොවදාළ හෙයින් ඒචිත්තය පටිසන්ධිය නොදෙන බව දතයුත්තේයි. "ඝථාරහං" යන පදයාගේ අභිප්‍රාය නම්:—කාමභූම්යෙහි ඉන්ද්‍රිය විකලනුවූයේ කම් සපත්‍රාකුශල විපාකයම ලැබෙන්නේයි. චක්ඛු සොත ඝාණ කලාපයන්ගේ අඩුබවක් විනම් ඒ ඒ විඥානය නොලැබිය යුත්තේයි. රූපභූම්යෙහි වනාහි ඉන්ද්‍රිය විකලයක් නැත්තේමැයි. එසේවූයේනමුදු චක්ඛුවිඤ්ඤාණ සොතවිඤ්ඤාණ සම්පටිච්ඡන සන්තීරණ යන විපාක සතරම ලැබෙන්නේයි. අවශෙෂ විපාකයෝ තුන්දෙන නොලැබෙත්. චතුම්මහාරාජයෙන් මත්තෙහි අනිෂ්ටවූ රූපාලම්බණයක් නැත්තේයි. ඉෂ්ටවූම් රූපාලම්බණාදිය ඇත්තේයි. එසේවිනම් කුමක්හෙයින් අකුශල විපාකවූ චක්ඛුවිඤ්ඤාණ සොතවිඤ්ඤාණ සම්පටිච්ඡන සන්තීරණයෝ කෙසේ ලැබෙන්නාහුද යත්? ඒ ඒ බ්‍රහ්මභූම්යෙහි සිට හෝ චාතුම්මහාරාජිකයෙන් මත්තෙහි පස් දිව්‍යලොකයෙහි සිට හෝ කාමධාතුව බලන්නාවූ කල්හි හෝ බුඬදර්ශන ධම්ශ්‍රවණාදිය සඳහා කාමධාතුවට පැමිණි කලහෝ අනිෂ්ටවූ රූපශබ්දාලම්බණයන් දැකීමෙන් හෝ ඇසීමෙන් ඒ ඒ දිව්‍යබ්‍රහ්මයන්ට අකුශල විපාක චක්ඛුවිඤ්ඤාණාදිය උපදනාහුයයි දතයුතුයි. කාමාවචර මහා

කුශලයෝ අවදෙන වනාහි සපනකාමභූමියෙහිම ප්‍රතිසන්ධිවිපාක උපදවත්. ප්‍රවෘත්තිකාලයෙහිවනාහි කාම භූමිරූප භූමි යන දෙන තැනිම ඒ කාමාවචර කුශලයෝ තුමූ අහෙතුක කුශලවිපාක අවය සහෙතුක විපාක අටය යන සෝළොස් විපාකයන්ම උපදවත්. "යථාරහං" යන පදයාගේ අභිප්‍රාය නම්:—කාමභූමියෙහි ඉන්ද්‍රිය විකලයක් නොවූයේනම් සෝළොස් විපාකයම උපදවති. ඉන්ද්‍රිය විකලයක්වීනම් ඒ ඒ විපාක උගුළුවා දැමිය යුතුයි. රූපභූමියෙහි වනාහි කුශල විපාකවූ චක්ඛුවිඤ්ඤාණ සෝතවිඤ්ඤාණ සම්පටිච්ඡන සන්තීරණ විපාකයෝ සතරදෙන පමණක් උපදවති අවශෙෂවූ පසළොස් කාමාවචර විපාකයෝ බඹලොවිහි නැතැයි දතයුතුයි. ඒ මහාකුශලයන් අවදෙනා අතුරෙන් ඤාන සම්ප්‍රයුක්ත කුශලය තෙමේ උත්කෘෂ්ටවූ ඤානසම්ප්‍රයුක්ත කුශලය ලාමකවූ ඤාන සම්ප්‍රයුක්ත කුශලයයි දෙවැදෑරුම් වේ. ඔවුන් අතුරෙන් උත්කෘෂ්ට ඤානසම්ප්‍රයුක්ත කුශලචිත්තයන් සතරදෙනා හා සමඟ යෙදුනාවූ චෙතනාවෝ සතරදෙන ත්‍රිහෙතුක උත්කෘෂ්ට කුශල චෙතනාකම් නම් වෙත්. ලාමකවූ ඤාන සම්ප්‍රයුක්ත කුශලචිත්තයන් සතරදෙනා හා සමඟ යෙදුනාවූ චෙතනාවෝ සතරදෙනතුමූ ත්‍රිහෙතුක ඔමක කුශලකම් නම් වෙත්. ඔවුන් අතුරෙන් ත්‍රිහෙතුක උත්කෘෂ්ට කුශලචෙතනා කම්තෙමේ සපනකාම සුගතියෙහි මහෙශාක්‍ය මහානුභාව සම්පන්නවූ ත්‍රිහෙතුක උත්කෘෂ්ට ප්‍රතිසන්ධිය උපදවයි. ප්‍රවෘත්තිකාලයෙහි මහාවිපාක අටය අහෙතුකවිපාක අටයයි සෝළොස් විපාක තෙනෙකුන් උපදවයි. ඤානවිප්‍රයුක්ත කාමාවචර කුශලතෙමේද උත්කෘෂ්ටවූ ඤානවිප්‍රයුක්ත කුශලය ලාමකවූ ඤාන විප්‍රයුක්ත කුශලයයි දෙවැදෑරුම් වේ. ඔවුන් අතුරෙන් උත්කෘෂ්ට ඤානවිප්‍රයුක්ත දුහෙතුක කුශල් සතරෙහි යෙදුනාවූ චෙතනාවෝ සතරදෙනතුමූ දුහෙතුක උත්කෘෂ්ට කුශලකම් නම්වේ. ලාමකවූ ඤාන විප්‍රයුක්ත කුශල් සතරෙහි යෙදුනාවූ චෙතනාවෝ සතරදෙනතුමූ දුහෙතුක ඔමකකුශලකම් නම් වේ. ඒ දෙවැදෑරුම් කම්යන් අතුරෙන් දුහෙතුක උත්කෘෂ්ට කුශලකම්ය හා ත්‍රිහෙතුක ඔමක කුශලකම්හද විපාකදීම වශයෙන් සමාන ශක්ති ඇත්තාහුවෙත්. ඒ දෙවැදෑරුම් කුශලකම්යම සපනකාම භූමියෙහි දුහෙතුක ප්‍රතිසන්ධිය උපදවයි. ප්‍රවෘත්තිකාලයෙහි වනාහි ඤානවිප්‍රයුක්ත මහා විපාක සතරය, අහෙතුක කුශලවිපාක අටයයි දෙලොස් විපාක තෙනොකුන් උපදවයි. දුහෙතුක ඔමක කුශලකම් තෙමේ මනුෂ්‍යභූමියෙහි ජාත්‍යන්ධාදී හීනසත්වයන්ගේද චාතුම්මහාරාජික භූමියෙහිද පෙතිපෙත සඤ්ඤාතවූ වීනිපාතික අසුරයන්ගේද අහෙ

තුක සුගතී ප්‍රතිසන්ධිය, උපදවයි. පේතිප්‍රේත සඞ්ඛ්‍යාතවූ විනිපාතික අසුරයෝ වනාහි මනුෂ්‍යයන් සමානවූ භූමියෙහිම උපදනාහු නමුදු මනුෂ්‍යභූමියෙහි නොව චාතුම්හාරාජිකභූමියෙහිම ඇතුළත් වෙති. එහෙයින් චාතුම්හාරාජිකයෙහි අහෙතුක ප්‍රතිසන්ධිකයෝ ඇතැයි කියති. අනාගරිකය චාතුම්හාරාජිකභූමියෙහි වනාහි කිසිසේත් අහෙතුක ප්‍රතිසන්ධි නැත්තේයි. ත්‍රිහෙතුක උත්කෘෂ්ට කුශලකර්මය යනු යම් කුශලකර්මයක් කිරීමට මත්තෙන් හෝ කුශලකර්මය කරන්නාවූ කල්හි හෝ අකුශලකර්මයකින් පිරිවරා නොගෙණ කුශලකර්මයන් විසින්ම පිරිවරා ගන්නේ වේද කුශලකර්මය කළාවූ ඉක්බිතිද අනෝ! මාගේ වසනුභාවය වූයේ යයි පශ්චාත්තාපයෝ සිහිවූවූවිට සතුට උපදවන්නේ වේද මේ සියලුතන්හිම දානානිශංස සැලකීමෙහි පොහොසත්වේද ඒකර්මය ත්‍රිහෙතුක උත්කෘෂ්ට කුශල නම් වෙයි. ත්‍රිහෙතුක ලෞකික කුශලකර්මය යනු දානානිශංස සැලකීමෙහි පොහොසත්වූවද අධර්මයෙන් ලබනලද ධනයෙන් දුශ්ශීලයාදීන් විෂයෙහි දන්දේද මේසේ අකුශලකර්මයන්හෙන් පිරිවරාගන්නා ලද්දවූ කුශලකර්මය ත්‍රිහෙතුක ඔමක කුශලකර්ම නම් වෙයි. ද්විහෙතුක උත්කෘෂ්ට කුශලකර්මය යනු දැහැමෙන් ලබනලද වසනුවෙන් ශීලවන්තයන් විෂයෙහිම දානානිසංශ නොදැන දෙන්නාවූ දානය ද්විහෙතුක උත්කෘෂ්ට කුශලකර්ම නම් වේ. ද්විහෙතුක ලෞකික කුශලකර්මය යනු දානානිශංසත් නොදැන අධර්ම වෙළඳාම් පසින් හෝ වැදි කෙවුල් ආදී නීචජාතීන්හයෙන් හෝ නොඅකස්ව දෙන්නාවූ දානය ද්විහෙතුක ලෞකික කුශලකර්ම නම් වෙයි. ත්‍රිහෙතුක උත්කෘෂ්ට කුශල කර්මය යනු පූර්ව අපරභාග දෙක්හි කුශලකර්මයන් හෙන් පිරිවරනු ලැබ දානවසනුව දෙන්නාවූ කල්හිද මේ දානය මෙබඳු මෙබඳු ආනිශංස ඇත්තේයයි යන කර්මඵලඥානය හෙන් යුක්තව ආදී මධ්‍ය පර්යවසානය යන තුන් තන්හිම ඥාන සම්ප්‍රයුක්තව දානාදී පින්කම් කරන්නේවිනම් ඒ කාමාවචර ත්‍රිහෙතුක උත්කෘෂ්ට කුශලකර්ම නම් වෙයි. ඒ කර්මයෙන් ගන්නාවූ ප්‍රතිසන්ධිය හෙතු අටකින් යුක්ත වෙයි. එනම්:—ආයුෂ්‍යත්ව ක්ෂණයෙහි හෙතූන් තුන්දෙනෙක, ප්‍රතිසන්ධික්ෂණයෙහි හෙතූන් තුන් දෙනෙක, නිෂ්ඨානනිරුද්ධක්ෂණයෙහි එකතූන් (තුන්දෙනක) දෙදෙනෙ කැයි මේසේ හෙතු අටකින් යුක්ත වන්නේයයි ප්‍රතිසම්භිදාමාර්ගයෙහි දක්වයි. ආයුෂ්‍යත්ව ක්ෂණය යනු දානාදී පින්කම්කරන්නාවූ කාලයයි. නිෂ්ඨානනිරුද්ධක්ෂණය යනු මරණාසන්න කාලයෙහි මරණාසන්න ජවන් වශයෙන් උපදනා කාමාවචර ඥානසම්ප්‍රයුක්ත (ඤාණසම්ප්‍රයුක්ත) කුශලචේතනා විපිරයයි. එහෙතුනු අටදෙනය යනු ආයු

භණ්ඩඤ්ඤයෙහි උපදනා කාමාවචර කුශලචිත්ත විපියෙහි යෙ දෙන්නාවූ අලොභ අවෙෂ අමොහ යන තුන්දෙනය, නිකාන්ති ක්ෂණයෙහි උපදනාඥානවිප්‍රයුක්ත කුශලචිත්තවිපියෙහි යෙදුනා වූ අලොභ අවෙෂ යන දෙදෙනාය, ප්‍රතිසන්ධි චිත්තයෙහි ලැබෙන්නාවූ අලොභ, අවෙෂ, අමොහ යන හෙතුහු තුන්දෙනාය යන මේ හෙතුහු අටදෙනාගයි දතයුතුයි. ආයූහණ ක්ෂණයෙහි හා නිකාන්තික්ෂණයෙහි ලැබෙන්නාවූ හෙතුහු පස්දෙන කුශල්ම වෙති. ප්‍රතිසන්ධික්ෂණයෙහි ලැබෙන්නාවූ හෙතුහු තුන්දෙන අව්‍යාකෘත නම් වෙති. ත්‍රිහෙතුක ඔමක්කමීය යනු වෙතනා පූර්ව අපර වෙතනාවන් අකුශලකමීයන්ගෙන් පිරිවරණු ලැබ මුඤ්චන වෙතනා මාත්‍රයක් ඥානසම්ප්‍රයුක්තවූ කමීයයි. දුහෙතුක උත්කෘෂ්ට කමීය යනු පුබ්බවෙතනා අපරවෙතනා දෙදෙන කුශලකමීයන්ගෙන් පිරිවරණු ලැබ මුඤ්චන වෙතනාවද ඥානයෙන් වියුක්තවූ කමීය දුහෙතුක උත්කෘෂ්ට කමීයයි. දුහෙතුක ලාමක කමීය යනු පූර්වෙතනා අපර වෙතනාවන් අකුශලකමීයන්ගෙන් පිරිවරණු ලැබ මුඤ්චන වෙතනාවද ඥානයෙන් වියුක්තවූ කමීයයි. ත්‍රිහෙතුක උත්කෘෂ්ට කාමීය හා ත්‍රිහෙතුක ලාමක කමීයද මධ්‍යයෙහි ඥානසම්ප්‍රයුක්තවීම සමානයි. පූර්වෙතනා අපරවෙතනාවෝ අසමාන වෙත්. දුහෙතුක උත්කෘෂ්ට කමීය හා දුහෙතුක ලාමක කමීයද මධ්‍යයෙහි සමානව පෙරපසු අසමාන වෙත් ත්‍රිහෙතුක උත්කෘෂ්ට කමීය හා දුහෙතුක උත්කෘෂ්ට කමීයද පෙරපසු සමානවම මධ්‍යයෙහි අසමානවෙයි. ත්‍රිහෙතුක ලාමක කමීය හා දුහෙතුක ලාමක කමීයද පෙරපසු සමානව මධ්‍යය අසමාන වෙයි. කාමාවචර කුශලකම් බලයෙන් ගන්නාවූ ප්‍රතිසන්ධියට "නිණ්ණං භික්ඛවෙ! සත්තානං පාතා ගබ්භසසාවක්කන්ති හොති" යන දෙශනා ක්‍රමයෙන් මවගේ ඍතුකාලය පැමිණීමය, මාතා පිතෘන්ගේ සඛමය, ගන්ධර්වයා පැමිණියයුත්තෙක් එළඹසිටීමය, යන කාරණයන් තුන්දෙනාගේ රැස්වීම හෙතුකොටගෙණ මව් කුස ප්‍රතිසන්ධිගැබෙන්නේයි රූපාවචර කුශලකම් තෙමේ ප්‍රථමධ්‍යානාදී වශයෙන් දෙයාකාර වන්නේයි. ඔවුන් අතුරෙන් ප්‍රථමධ්‍යාන මාත්‍රයක්ලැබූ පුද්ගලතෙමේ ඒ ධ්‍යානයෙන් නොපිරිහී කාලක්‍රියා කෙළේවිනම් බ්‍රහ්ම පාරිෂද්‍යනම්වූ බ්‍රහ්ම භූමියෙහි ප්‍රතිසන්ධිය ගන්නේයි. ඒ බ්‍රහ්මයෝ වනාහි අසඛ්‍යකල්පයක්හුගේ තුනෙන් භාගයක් ආයුෂ ඇත්තාහු වෙති ඒ ප්‍රථමධ්‍යානය වනාහි සවාසවික වශයෙන් වැඩූ යොගාවචරයෝ තමු මරණින් මත්තෙහි බ්‍රහ්මපුරොහිත භූමියෙහි ඉපිද අසඛ්‍ය කල්පයක්හුගේ අර්ධයක්ම එහි සැප විඳිනාහුය. ප්‍රථමධ්‍යානයම පඤ්චප්‍රකාරයෙන් භාවිත

කළාවූ යොගාවචරයෝ තුමූ මරණින් මත්තෙහි මහා බ්‍රහ්මලෝකයෙහි උපදනාහුය. ඒ බ්‍රහ්මයෝ වනාහි එහි අසඞ්ඛ්‍යකල්පයක්ම සැපවිඳිනාහුය. මෙසේ ප්‍රථම ධ්‍යානයම ත්‍රිවිධාකාරයකින් වඩා බ්‍රහ්මලෝකයෙහි උපදනාබව දතයුතුයි. විතීයධ්‍යාන තෘතීය ධ්‍යාන චතුර්ථධ්‍යානයෝද මෙසේම ත්‍රිවිධාකාරයකින් වඩා ඒ ඒ ධ්‍යානයට අයිතිවූ තලයෙහි උපදනාබව දතයුතුයි. පඤ්චමධ්‍යානය ලැබුවාවූ යොගාවචරයෝ තුමූ මරණින් මත්තෙහි වෙහප්ඵලය අසඤ්ඤසත්තය ශුද්ධාවාසභූමිය යන සත්තැනක උපදනාහුයයි දතයුතුයි. ඒ කෙසේ උපදනාහුදයත්? කම්වාදී ක්‍රියාවාදී තීර්ථකයෝ වනාහි නාම ධම්මයෙහි ආදීනව දැක "සඤ්ඤූ රොගා සඤ්ඤූගණ්ඩා" යනාදීන් භාවනා වඩා වායෝ කසිණයෙන් පවමධ්‍යානය උපදවා ඒ ධ්‍යානයෙන් නොපිරිහී කාලක්‍රියා කෙළේ විනම් අසංඥාතලයෙහි උපදනාහුය. ඒ උත්පත්ති ක්‍රමයද මනුෂ්‍යලෝකයෙහි ඉදිම් සිවිම් ආදී යම් ඉරියව්වකින් කාලක්‍රියා කෙළේවිනම් එම ඉරියව්වෙන්ම අසංඥා තලයෙහි හඬාපු ප්‍රතිමාරූප පරිද්දෙන් රූපසකාය මාත්‍රයක් පහළව මහාකල්ප පන්සියයක් මුලුල්ලෙහි ඒ අසංඥතලයෙහි රූපමාත්‍රයකින් පවත්නාහුය. එම පඤ්චමධ්‍යානයම රූප ධම්මයෙහි ආදීනව දැක හෙවත් රූපය ඇතිකල්හි දණ්ඩාදාන ශස්ත්‍රාදානාදිය පවත්නේයයි යනාදීන් රූපයෙහි දෙස්දැක පඤ්චමධ්‍යානය උපදවා ගත්තාවූ යොගාවචරයෝ තුමූ කම්වාදී ක්‍රියාවාදී තීර්ථකයෝ හෝ සම්‍යග්දෘෂ්ටිකයෝ හෝ මරණින් මත්තෙහි සතර අරූපතලයෙහි ඉපිද සුවාසූ දහසක් මහාකල්පයන් මුලුල්ලෙහිත් ඒ නෙවසඤ්ඤූ නාසඤ්ඤූයතනභූමියෙහි පවත්නාහුය. එම පඤ්චමධ්‍යානය ත්‍රිහෙතුක පෘථග්ජන පුද්ගලයන් විසින් උපදවනලද්දේවිනම් මරණින් මත්තෙහි වෙහප්ඵලභූමියෙහි උපදනාහුය. එපරිද්දෙන්ම සෝවාන් සකෘදාගාමී යන ආර්‍යයෝද පඤ්චමධ්‍යානය උපදවා රූපධම්මයෙහි ආදීනව නොදැක්කාහුනම් මරණින් මත්තෙහි වෙහප්ඵලභූමියෙහි උපදනාහුය. එම සෝවාන් සකෘදාගාමී යන ආර්‍යයෝ වනාහි පඤ්චමධ්‍යානය ලැබ රූප ධම්මයෙහි ආදීනව දුටුවාහුවීනම් මරණින් මත්තෙහි සතර අරූතලයෙහි උපදනාහුය. අනාගාමී පුද්ගලයෝ තුමූ එම පඤ්චමධ්‍යානය ලැබ ශ්‍රද්ධාදී පඤ්චේන්ද්‍රියයන්ගේ සම්‍යත්වය ඇතිකල්හි වෙහප්ඵල බඹලොවිහිම උපදනාහුය. ඒ අනාගාමී පුද්ගලයෝ තුමූ පඤ්චමධ්‍යානය ලැබ ශ්‍රද්ධේන්ද්‍රිය අධිකවීනම් අවිහතලයෙහිද වීර්‍යේන්ද්‍රිය අධිකවීනම් අතප්පතලයෙහිද සතිඉන්ද්‍රිය අධිකවීනම් සුදස්ස තලයෙහිද සමාධීන්ද්‍රිය අධිකවීනම්

සුදසසි තලයෙහිද ප්‍රඥේන්ද්‍රිය අධිකවීනම් අකනිට්ඨ තලයෙහිද ක්‍රමයෙන් උපදනාහුයයි දතයුතුයි. මෙසේ චතුර්ථික නයින් චතුර්ධ්‍යානවූද පඤ්චකනයින් පඨමධ්‍යානවූද උපෙක්ඛා එකාග්‍රතා යන අඞ්ගවයෙන් යුක්තවූ එකම ධ්‍යානය උපදවා නාමයෙහි කලකිරුණාවූ යොගාවචරයෝ අසංඥ තලයෙහිද රූපයෙහි කලකිරුණාවූ යොගාවචරයෝ සතර අරූප තලයෙහිද නාම රූප දෙක්හිම කලකිරුණාවූ සෝවාන් සකෘදාගාමී යන ආර්‍යයෝ දෙදෙනාද ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයාද ශ්‍රද්ධාදී පඤ්චේන්ද්‍රියයන්ගේ සමානත්වය ඇත්තාවූ අනාගාමීහුද යන මේ සතරාකාරවූ පුද්ගලයෝ වෙහප්ඵලභූමියෙහිද ශ්‍රද්ධාදී පඤ්චේන්ද්‍රිය යන්ගේ වෙමත්තතාව ඇත්තාවූ අනාගාමීහු පස්දෙන ක්‍රමයෙන් පඤ්චශුද්ධාවාස භූමියෙහිද උපදනාබව දතයුතුයි. අනාගාමීහු වනාහි කාමභූමියෙහි ප්‍රතිසන්ධිවශයෙන් නූපදනාහුයයි දතයුතුයි. කුමක් හෙයිනයත්? කාමරාගය ප්‍රහාණයකළ හෙයිනැයි දතයුතුයි. එපරිද්දෙන්ම ධ්‍යානය නොලැබ කාලක්‍රියා කරන්නාවූ අනාගාමී පුද්ගලයෙක්ද නැත්තේයි. යටත් පිරිසෙසින් මරණාසන්න චිත්තවීථියට සමීපකාලයෙහිද පඨමධ්‍යානයලැබ ඉන්ද්‍රිය වෙමත්තතාව නැත්තේවීනම් වෙහප්ඵලභූමියෙහිද ඉන්ද්‍රිය වෙමත්තතාව ඇත්තේ වී නම් ඒ ශුද්ධාවාස භූමියෙහිද උපදනාහුයයි දතයුතුයි. "අනාගාමිඋපපන්න" යන්නෙහි පත ශබ්දයතෙමේ ඒවකාරාර්ථයෙහි වැටෙයි. ඒ අවධාරණාර්ථය හෙතුකොටගෙණ අනාගාමීන්ගෙන් අන්‍යවූ පුද්ගලයෙක් ශුද්ධාවාස භූමියෙහි නූපදනාබව දතයුතුයි.

කම්මචතුෂ්කය නිමියේයි.

(පා)

යථාරහං, සුදූසු පරිද්දෙන්; අභිමුඛීභූතං, ඉදිරියට පැමිණියාවූ; භවන්තරෙ, අනතුරු භවයෙහි; පටිසන්ධිජනකං, ප්‍රතිසන්ධිය උපද වන්නාවූ; කම්මංවා, කුශලාකුශල කර්මය හෝ; තං කම්මකරණ කාලෙ, ඒ කර්මය කරන්නාවූ කාලයෙහි; උපලබ්භනීයබ්බංවා, ලබන ලද විරූද; උපකරණ භූතංවා, උපකරණ වූද; රූපාදිකං, රූපාලම්බණාදිවූ නොයෙක් රූප (සප්තවිධ සඞ්ඛ්‍යාත) දර්ශන ධර්ම ශ්‍රවණාදිවූ; කම්මනිමිත්තංවා, කවුදු දුනු අඞ්ගවැටි නොමරාදීවූද බුද්ධප්‍රතිමා චෛත්‍ය හොජන චීවර ධජ

පතාක සුවඳ මල් ආදීවූ කම්නිමිත්තක් හෝ; අනන්තර වූපජ්ජමානභවේ, අනතුරුව උපදිනු ලබන්නාවූ භවයෙහි; උපලභිතබ්බව, ලැබිය යුතුවූද; උපභොගභූතව, විඳියුතුවූද, ගතිනිමිත්තංවා, මාතෘකුක්ෂි නරකගිනි ස්වර්ගෝද්‍යාන දිව්‍යපසරා දිව්‍යවිමාන කල්පවෘක්ෂ ආදීවූද ගතිනිමිත්තක් හෝ; කම්මබලෙන, කර්මානුභාව ශක්තියන්; ඡන්නං වාරානං, ඡට්වාරයන් අතුරෙන්; අඤ්ඤතරස්මිං, එක්තරා වාරයෙක්හි; පවත්තූපඛ්‍යාති, නැවත නැවත එළඹ සිටිනේ වෙයි. තතොපරං, ඒ කම් කම්නිමිති ගතිනිමිතින්ගේ එළඹ සිටීමෙන් මත්තෙහි; තථොපඨිතං, ඒ ආකාරයෙන් නැවත නැවත එළඹ සිටියාවූ; තමෙව ආලම්බණං, ඒ කම් කම්නිමිති ගතිනිමිති සඞ්ඛ්‍යාත අරමුණක්ම; ආරබ්භ, අරමුණුකොටගෙණ විපච්චමානක කම්මානුරූපං, ප්‍රතිසන්ධිය ඉපදවියහැකිවූ කම් යම සුදුසුවූ; පරිසුද්ධංවා, කුශලකම් වශයෙන් පවිත්‍රවූ හෝ උපක්කිලිට්ඨංවා, අකුශලකම් වශයෙන් කිළිටුවූ හෝ; උපලභිතබ්බභවානුරූපං, ලැබියයුතුවූ අනුභවකටයුතු භවයට සුදුසු පරිද්දෙන්; තස්ස, ඒ ලැබිය යුතුවූ අනුභවකටයුතුවූ භවයෙහි; ඔතතං ඉව, නැමුනාක්මෙන්; ඔනඞ්ං, නැමුනේම; චිත්තඤ්ඤතති, චිත්ත පරම්පරාතොමෝ; අභිණ්හං, නිරන්තරයෙන්; බාහුල්ලෙන; බොහෝසෙයින්; පවත්තති, භවගන්නේය; පන, අර්ථාන්තර යක්ංදක්වම්:— පටිසන්ධිජනකභූතං, ප්‍රතිසන්ධිය උපදවන්නාවූ; තමෙව කම්මංවා, ඒ කර්මයම හෝ; අභිනවකරණවසෙන, නැවත අළුතින් කිරීම් වශයෙන්; වාරපත්තං හොති, මාරයට පැමිණීයේ වෙයි. පච්චාසන්නමරණස්ස, ඉතා ලංවූ මරණඇත්තාවූ; තස්ස, ඒ සත්ත්වයාට; චිත්තාවත්ථානෙවා, තදාලම්බණය අවසන්කොට ඇත්තාවූ හෝ චිත්තයන්ගේ අවස්ථානයෙහි හෝ; භවඞ්ගක්ඛණෙවා, ඒ ජවන තදාලම්බණයන්ට අනතුරුවූ භවාඞ්ගයාගේ කෙළවර හෝ නොහොත් භවාඞ්ගචිත්තයාගේ භඞ්ගක්ෂණාවස්ථානයෙහි හෝ; චවනවසෙන, පුරුණ භවයෙන් ගිලිහීම් වශයෙන්; පවත්තූපපන්නභවපරියොසාන භූතං, ඒ ප්‍රත්‍යෙකත්පත්තභවයාගේ අවසානයවූ; චුතිචිත්තං, චුතිසිත්තෙමේ; උපජ්ජිත්වා නිරුජ්ඣති, ඉපිද නිරුඬවන්නේය. තස්මිං, ඒ චුතිචිත්තය; නිරුද්ධෙ, නිරුඬවූ කල්හි; නිරුද්ධාවත්‍ථානෙ, නිරුඬයාගේ කෙළවර; තස්ස, ඒ චුතිචිත්තයාගේ; අනන්තරමෙව, අනතුරුවත්හිම; තථාගහිතං, ඒ ආකාරයෙන් නොහොත් ඡඩ්වාරික මරණාසන්න ජවනයන් විසින් ගන්නා ලද්දාවූ; ආලම්බණං; කම්ය කම්නිමිත්තය ගතිනිමිත්තයයි

කියන ලද්දුවු අරමුණ ; ආරබහ, එල්බගෙණ ; සවත්‍ථුකංවා, පවත්තෝකාරහවයෙහි හෘදයවස්තුව සහිතව හෝ ; අවත්‍ථුකමේවවා, වත්තුවෝකාරහව වශයෙන් හෘදයවස්තුව නැතිව හෝ ; ඝථාරහං, සුදුසු පරිද්දෙන් ; අභිජ්ජානුසය පරිකිලේතෙන, අභිජ්ජානුසය විසින් පිරිවරණ ලද්දුවූ ; තණ්හානුසය මූලකෙන, තෘෂ්ණානුශයම මූලකාරණකොට ඇත්තාවූ ; සඞ්ඛාරෙන, මරණාසන්න ජවන සහගතවූ කුශලාකුශල සංස්කාරය විසින් ; ජනීයමානං, උපදවනු ලබන්නාවූ ; සම්පයුත්තෙනඝි, සහගත වෙදනාදීවූ සම්ප්‍රයුක්ත ධර්මයන් විසින් ; පරිනයහමානං, අප ගේ ඵලයයි මකාගෙනාට පිළිගන්නා ලද්දුවූ ; සහජානානං, එක්ව උපන්නාවූ සහජාතවෙදනාදීවූ ධර්මයන්ගේ ; අධිට්ඨාන භාවෙන, ආධාරස්වභාවයෙන ; පුබ්බඞ්ගමභූතං, පෙරටුව ගන්නාවූ ; භවන්තරපටිසන්ධිභවසෙන, පුනර්පශ්චිම භවයන් එක්කොට ගැලපීම වශයෙන් ; පටිසන්ධිඞ්ගතං, ප්‍රතිසන්ධියයි කියන ලද්දුවූ : මානසං, සිත්තෙමේ ; උපපජ්ජමානමෙව, උපදිනු ලබම්ම ; භවන්තරෙ, අළුත් භවයෙහි ; පතිඨානි, පිහිටයි. පන, අතීතන්තරයක් දක්වම් :- එහෙ, මේ මරණාසන්න විපියෙහි ; මන්දපවත්තානි, ලස්ව හටගත්තාවූ ; පවෙවජවනානි, මරණාසන්නජවනයෝ පස්දෙනෙක් ; ඝසමා, යම්හෙයකින් ; පාටිකංඛි තඛ්බානි, පැසැස්ස යුත්තාහුද ; තසමා, එසේහෙයින් ; ආපාථගතෙසු, හමුබවට පැමිණියාවූ ; පවවු පත්තාලම්බණෙසු, යටකී කඩු දුනු චෛත්‍ය විහාරාදී කම් නිමිත්තක් හෝ මානෘකුක්ෂි දිව්‍යාප්සරාදීවූ ගතිනිමිත්තක් හෝ ; ඔරත්තසෙසෙව, උවත්නාකල්හිම ; මරණංගෙනි, මරණයවේද ; තදා, එකල්හි ; පටිසන්ධිඝවඞ්ගභවනාදිපි, ප්‍රතිසන්ධිභවාඞ්ග විඥාන යන්ගේද ; පවවුපත්තාලම්බණතා, ප්‍රත්‍යෝත්පන්න අරමුණුබව ; ලබ්භති, ලැබිය යුත්තේයි. ඉති, (ඇසමා) මෙසේ වන හෙයින් ; කාමාවචරපරිසන්ධියා, කාමාවචර ප්‍රතිසන්ධියගේ ; ආලම්බණං, අරමුණ ; පවවාරඝහිතං, ඡඩ්වාරයෙන් ගන්නා ලද්දුවූ නොඉහත් ඡඩ්වාරික මරණාසන්නජවනයන් විසින් ; ගන්නාලද්දුවූ ; පවවුපත්තං, ප්‍රත්‍යෝත්පන්නවූද ; අතීතං, අතීතවූද ; කම්මනිමිත්තව, කර්මනිමිත්තක්ද ; මනොවාරඝහිතං මනොවාරයෙන් ගන්නාලද්දුවූ ; පවවුපත්තමෙව, ප්‍රත්‍යෝත්පන්නමවූ ; ගතිනිමිත්තව, ගතිනිමිත්තක්ද ; උපලබ්භති, ලැබිය යුත්තේය. කම්මංපන, කුශලාකුශල කර්මය වනාහි ; අතීතමෙව, අතීතකාලිකමැයි ; තව, ඒ කුශලාකුශල කර්මයද ;

මනොවාරගහිතං, මනොවාරයෙන් ගන්නා ලද්දේවෙයි. පන, අවයවාදීයෙන් අන්‍යවූ සමූදයාදී දක්වම් :— සබ්බානිපි තානි, ඒ සියලු කම්මං කම්මනිමිත්ති භනිනිමිත්තිහු තුමූ ; පරිත්ත ධම්මහුතානෙව, කාමාවචරසභාව ඇත්තාවූ ආලම්බණානි, හොනති, ආලම්බණයෝ වෙත්. පන, කාමාවචර ප්‍රතිසන්ති හුගේ අරමුණක් අන්‍යවූ මහද්ගත ප්‍රතිසන්හුගේ අරමුණක් දක්වම් :— රූපාවචර පටිසන්ධියා, රූපාවචර ප්‍රතිසන්හුගේ ; ආලම්බණං, අරමුණ නෙමේ ; පඤ්ඤත්තිහුතං, ප්‍රඥප්තිවූ ; කම්මනිමිත්තතමෙව හොති, පෘථ්වීකසිණාදී කම් නිමිත්තක්ම වෙයි. තථා, එපරිද්දෙන් ; ආරුප්පපටිසන්ධියා අරූපාවචර ප්‍රතිසන්හුගේ ; ආලම්බණංච, අරමුණක්ද ; අතිරහං, සුදුසුපරිද්දෙන් ; මහග්ගතහුතංච, මහද්ගතවූද ; පඤ්ඤත්තිහුතංච, කිසුණු ඉඟුළු අහසය ; නත්ථිභාවය ඝන ප්‍රඥප්තිහුද ; කම්ම නිමිත්තමෙව හොති, කම් නිමිත්තම වෙයි. පන, නාම ප්‍රතිසන්ධියෙන් අන්‍යවූ රූපප්‍රතිසන්ධිය කියම් :- අසඤ්ඤසත්තානං, අසංඥසත්වයන්ට ; ජීවිතනවකමෙව, ජීවිත නවක රූපකලාප මාත්‍රයක්ම ; පටිසන්ධිභාවෙන, ප්‍රතිසන්ධිභාවයෙන් ; සමාපජ්ජති, සමවැදෙයි ; සම්මෙයකින් පිහිටාද ; සඤ්ඤා, එසේහෙයින් ; තෙ, ඒ අසංඥසත්ව පුද්ගලයෝ තුමූ ; රූපපටිසන්ධිකානාම, රූප ප්‍රතිසන්ධික පුද්ගලයෝ නම් වෙත්. අරූපා, අරූපාවචර පුද්ගලයෝ තුමූ ; අරූපපටිසන්ධිකානාම, අරූපප්‍රතිසන්ධිකයෝ නම් වෙත්. සෙසා, අවශෙෂවූ පවත්තිකාරභව ප්‍රතිසන්ධික පුද්ගලයෝතුමූ ; රූපාරූපපටිසන්ධිකානාම, නාමරූප ප්‍රතිසන්ධික පුද්ගලයෝ නම් වෙත්.

ආරුප්පචුතියා පරං, අරූපාවචර චුතියෙන් මත් තෙහි ; හෙට්ඨිමාරුප්පවජ්ජිතා, යට යට අරූපාවචර ප්‍රතිසන්ධිය වර්ජිත කොට ඇත්තාවූ ; ආරුප්පසන්ධිච, අරූපාවචර ප්‍රති සන්ධියද ; තථා, එපරිද්දෙන්ම ; කාමතිහෙතුකා, කාමාවචර ත්‍රි හෙතුක ප්‍රතිසන්ධිහු සතරදෙනද ; හොනති, වෙත්. රූපාවචර චුතියා පරං, රූපාවචර චුතියෙන් මත්තෙහි ; අහෙතුක ප්‍රති සන්ධිය වර්ජිතකොට ඇත්තාවූ දෙළොස් සහෙතුක ප්‍රතිසන්ධිහු තුමූ ; සියුං, වන්නාහුය ; කාම තිහෙතුමහාපරං, කාමාවචර ත්‍රිහෙතුක ප්‍රතිසන්ධි චතුෂ්කයෙන් මත්තෙහි ; සබ්බා, සියලු එකුන්විසක් ප්‍රතිසන්ධිහුතුමූ නොහොත් සියලු විසි ප්‍රතිසන්ධිහු තුමූ ; සියුං, වන්නාහුය. පන, අඤ්ඤාතරයක් දක්වම් :—ඉතෙ, පරං, කාමාවචර ත්‍රිහෙතුක දුහෙතුක චුතියෙන් මත්තෙහි ; කාමෙසෙවච, එකොළොස් කාමභූමියෙහිම ; (පටිසන්ධියෝ, දස

ප්‍රකාරවූ ප්‍රතිසන්ධිහු තුමූ;) සියුං, වත්තබ්බය, නොහොත්, කාමෙසුඑව, කාමාවචර ප්‍රතිසන්ධි දශදෙනම, සියුං, වත්තබ්බය.

අයං, මේ වනාහි; එසේ, මේ පරිවෙජදයෙහි; චුතිපටි සන්ධිකකමෝ, ව්‍යුතිප්‍රතිසන්ධීන්ගේ: ක්‍රමයයි.

පන, ව්‍යුතිප්‍රතිසන්ධි පරම්පරාවෙන් අන්‍යවූ භවාඞ්ගපරම් පරාව දක්වම්;— පුබ්බව යථාවුත්තනයෙන, යම් යම් පරිදි දෙකින් කියනලද්දාවූ ක්‍රමයෙන්; ගහිතපටිසන්ධිකානං, ගන්නා ලද ප්‍රතිසන්ධි ඇති පුද්ගලයන්ට; පටිසන්ධි නිරොධානන්තරතෝ, ප්‍රතිසන්ධිචිත්තයාගේ නිරොධයවූ තැන්පටන්; තමෙව ආලම්බණං, ඒ ප්‍රතිසන්ධි චිත්තයාගේ අරමුණම; ආරබහ, අරමුණුකොට ගෙණ; තදෙව චිත්තං, ඒ පටිසන්ධි චිත්තයම; යාවචුති චිත්තුපාදා, චුතිවිඤ්ඤාත්පත්තිය දක්වා; ඒපිචිත්තුපාදෙ අසති, ඒපිචිත්තයාගේ ඉපදීමෙක් නැති කල්හි හෙවත් පව වාරාවජ්ජනය. චක්ඛුර් විඤ්ඤනය පවවාරාවජ්ජනය, ශ්‍රොත්‍රවිඤ්ඤනය. පවවාරා වජ්ජනය—ඝ්‍රාණ විඤ්ඤනය—පඤ්චවාරා වජ්ජනය—ජිව්හා විඤ්ඤනය—පවවාරා වජ්ජනය—කායවිඤ්ඤනය—මනොවාරා වර්ජ්ජනය—ජවන්හුය, යනාදී ඒපිචිත්තයන්ගේ ඉපදීමෙක් නැති කල්හි; භවස්ස, ප්‍රත්‍යෙත්පන්න උපප්‍රාප්තභවයාගේ; අඞ්ග භාවෙන, නොසිදීමට අඞ්ගබැවින්; භවඞ්ගසන්තතිසඞ්ඛාතං, භවාඞ්ග ප්‍රවාහයයි කියනලද්දාවූ; මානසං, සිත්තෙමේ; අබ්බොච්ඡින්නං, නොසිඳෙන ලද්දේ; නදිසොතොවිය, ගඞ්ගා ප්‍රවාහයක් මෙන්; පවත්තති, හටගණිමින් පවත්නේයි. පරියොසානෙව, ආයුෂයාගේ කෙළවරද; වඛනවසෙන, ප්‍රත්‍යෙත්පන්න භවයෙන් ඉවීම වශයෙන්; චුතිචිත්තංහුත්වා, චුතිසිතක්ව; නිරුජ්ඣති, නිරුඞ්ධවන්නේයි, තතොපරව, ඒ චුතිචිත්තයාගේ නිරොධයෙන් මත්තෙහිද; පටිසන්ධාදයො, ප්‍රතිසන්ධිආදීවූ චිත්තයෝතුමූ; යථාකකමං, දැන් මෙහි කියනලද ක්‍රමයෙන්ම; රථචක්කං ඉව, රථචක්‍රයක් මෙන්; පරිවත්තනති එව, පෙරලෙන්නාහුම හෙවත් පෙරළෙමින්ම; වත්තනති, භව ඞ්ගයි.

ගාථාර්ථ.

ඉහ, මේ ප්‍රත්‍යෙත්පන්න භවයෙහි; පටිසන්ධිභවඞ්ග චිත්තයෝ, ප්‍රතිසන්ධිභවාඞ්ග චිත්තයෝද; චුතිච, චුතිචිත්තයද; පරි වත්තනතියථා, යම්සේ පෙරලෙන්නාහුද; තථා, එපරිදිදෙන්; පුන, නැවත; භවන්තරෙ, අනාගතභවයෙහි; පටිසන්ධි භවඞ්ග

ඉති, ප්‍රතිසන්ධිභවාඞ්ගය ආදිකොට ඇත්තාවූ; අයං චිත්ත සන්තති, මේ චිත්තපරම්පරාතොමෝ; පරිවත්තති, පෙරළෙන් නේයි. පන, සංසාර චක්‍රයාගේ භ්‍රමණයෙන් අන්‍යවූ සංසාර චක්‍රයාගේ විභාගය දක්වම්:- බුධ්, ප්‍රාඥයෝතුමූ; අඛුවා; අනෙකානන්තසඛභාව ඇත්තාවූ නොඛෝත් සදාකාලික නොවන්තාවූ; එතං, මේ වෘත්ත ධර්මය; පටිසඞ්ඛාය, විදර්ශනානුවනින් පරීක්ෂාකොට දැන; විරාය, බොහෝකලක් මුලුල්ලෙහි හෙවත් උත්තරාඛට පරිච්ඡේදයෙන් සොළසාසඞ්ඛ්‍ය කල්ප ලක්ෂයක් හා නිකෘෂ්ටපරිච්ඡේදයෙන් කප්ලක්ෂයක් මුලුල්ලෙහිද; සුඛිතා, දැන ශීල භාවනා සඞ්ඛ්‍යාතවූ යහපත් වෘත්ත ඇත්තාහුයයි; සුසමූචිත්තාසිනෙහබන්ධිතෙන, මෝහතමට මර්දනකරණ කොටගෙණ අනුත්පාදනිරෝධයෙන් සිඳිනාලද තෘෂ්ණා බන්ධන ඇත්තාහුයයි; අවචූතං, ගිලිහීමක් නැත්තාවූ හෙවත් පහවීමක් නැත්තාවූ; පදං; නිර්‍වාණපදය; අධිගතත්තා, මර්දනඥාන ඵලඥානයන්ගෙන් දැක; සම්ං, සියලු වෘත්ත දුඃඛය සංසිඳුවන්නාවූ නිරුපධිශෙෂ නිර්‍වාණධාතු සඞ්ඛ්‍යාත සන්සිඳීමට; එසනති, පැමිණෙත්.

(අභිධම්මත්ථ සඞ්ගහෙ) අභිධර්මාර්ථ සඞ්ග්‍රහ නම්වූ ප්‍රකරණයෙහි; විපිවූත්තසඞ්ඛතවිභාගොනාම, විපිඹුකතසඞ්ග්‍රහ විභාග නම්වූ; පඨමෝ පරිච්ඡේදෝ, පළමුවන පරිච්ඡේදය; ඉති, මෙසේ; සමාප්ත කරණ ලද්දේයි.

භාවය.

භවයෙහි උපන්නාවූ සත්ත්වයෝතුමූ ආයුෂයෙවීමෙන්ද කාලක්‍රියා කෙරෙති. කර්මයෙවීමෙන්ද කාලක්‍රියා කෙරෙති. ආයුකර්ම දෙදෙනාගේ ගෙවීමෙන්ද කාලක්‍රියා කෙරෙති යුහුසුළුව උත්තැන් පහකරන්නාවූ උපච්ඡේදක කර්මයෙන්ද කාලක්‍රියා කෙරෙති. මෙසේ සතරාකාර මරණයන් අතුරෙන් දහසක් හවිරුද්දට ආයුෂ ඇති සත්ත්වයන්ගේ උපන් සත්තෙමේ දහසක් හවිරුද්ද ගෙවීමෙන් වන්නාවූ මරණය ආයුක්ඛය මරණ නම් වේ. දහසක් හවිරුද්දට ආයුෂ ඇති කාලයෙක්හි පන්සිය්‍යයක් හවිරුදු විපාකදිය යුතුවූ කර්මයකින් ඉපිද ඒ කර්මවශයෙන් සිදියෑමෙන් පන්සියයක් හවිරුද්දෙන් වන්නාවූ මරණය කර්මක්ඛය මරණය නම් වේ. අසූහවිරුද්දකට ආයුෂ ඇති කාලයෙහි අසූහවිරුද්දම විපාක දියහැකි කර්මයකින්

ඉපිද අසුභවිරූද්දෙන් මියගොස් ආයුකමී දෙදෙනාගෙන් වන්නාවූ මරණයයි. අසුභවිරූද්දක් ආයුෂ ඇති කාලයෙක්හි අසුභවිරූද්දක් විපාක දියහැකි කර්මයකින් උපන් සත්වතෙමේ සතළිස් හවිරූදු කාලයෙහි යුඩ්ගකට හසුවීමෙන් හෝ වෘක්ෂයකින් වැටීමෙන් හෝ දියෙහි වැටීමෙන් හෝ විෂ භක්ෂණයෙකින් හෝ වන්නාවූ මරණය උපච්ඡේදක මරණය නම්වේ. මේ සතරාකාර මරණයන් අතුරෙන් උපච්ඡේදක මරණය ප්‍රේත ලෝකය අසුරනිකාය තිරිසන් අපාය මනුෂ්‍යලෝකය චිනි පාතික අසුරාදී භූමාටුදෙවියෝය යන මොවුන් කෙරෙහිම ලැබෙන්නේයි. ඛෝනිප්‍රෙතාදී චිනිපාතික අසුරයෝ තුමූ වාතුමහාරාජික භූමියෙහි ඇතුලත්වන හෙයින් චාතුමහාරාජිකභූමියෙහිද උපච්ඡේදක මරණය ඇත්තේයයි කියයුතුයි. මනුෂ්‍ය භූමියක හා චාතුමහාරාජික භූමියකද අතරතුර අනික්ඛුමියක් නැතිහෙයින් භූමිනිශ්‍රිතව උපදනා චිනිපාතික අසුර සඞ්ඛ්‍යාතවූ මලයක්ෂාදී සිඟලු භූමාටු දෙවියෝද චාතුමහාරාජිකයෙහිම ඇතුලත් වෙති. කාවතිංස භවනය පවත් නෙවසඤ්ඤා නාසඤ්ඤා භවනය දක්වා ඇත්තාවූ සිඟලු සුගතිභූමිය අවමහාතරකය උතුරුකුරුදිවයිනය යන මෙහි තන්හි උපච්ඡේදක මරණය ලබාලැබේන්නේයි, උපච්ඡේදක මරණය නොලැබෙන්නාවූ සියලු තන්හිම අවිශේෂවූ ත්‍රිවිධාකාර මරණයම ලැබෙන්නේයි. මේ සතරාකාර මරණයම එකම තෙලපහන් උපමාවෙන් දැක්විය යුතුයි. තෙලපහන වනාහි තෙල්හෙළීමෙන්ද, පහන් වැටිය හෙළීමෙන්ද, තෙල් පහන්වැටි දෙදෙනාගේම හෙළීමෙන්ද, තෙල් පහන්වැටි විද්‍යමානව තිබියදීත් බලවත් පවන් වැදී නිවීමද, මේ සතරාකාර මරණයට උපමාවෙයි. තෙල් හෙළීමෙන් වෙන්නාවූ මරණය කර්මක්ෂය මරණයටද, තෙල් තිබියදී පහන්වැටිය හෙළීමෙන් වන්නාවූ මරණය ආයුක්ෂය මරණයටද, තෙල් පහන්වැටි දෙකම හෙළීමෙන් වන්නාවූ මරණය උභයක්ෂය මරණයටද, තෙල් පහන්වැටි තිබියදී බලවත් පවනින් වන්නාවූ නිවීම උපච්ඡේදක මරණයටද, උපමා කටයුතුයි. මරණාසන්න කාලයෙහි කර්ම කර්මනිමිත්තය ගති නිමිත්තය යන තුන්දෙනා අතුරෙන් යම්කිසි අරමුණක් සවස් කාලයෙහි පවිත්‍රවර්ණාදිය වූවිදිසාවට වැටෙන්නාක් මෙන් මරණාසන්නකාලයට එළඹෙන්නේයි. ඒ එළඹෙන්නාවූ කර්ම කර්මනිමිති ගතිනිමිති යන තුණ මාතා පිතෘ ඥාති මිත්‍රාදීන් විසින් එළවන්නේද ආචාර්ය උපාධ්‍යායාදීන් විසින් එලවන්නේද මහෙශාක්‍ය මහාබ්‍රහ්මාවූ සමවත්තාවූ දිව්‍ය බ්‍රහ්මාදීන් විසින් එලවනු ලබන්නේද යනාදී මිහත් සැකයක් උපදනේයි. ඒ කර්මාදිය

වනාහි කම්මානුභාවයෙන්ම වැටහෙන්නේයි. එක් සත්වයෙකුට ඇත්තාවූ කම්මයන්ගේ සඛ්‍යාව ගණනපථාතික්‍රාන්ත බැවින් ඒ මහත්වූ කම්මසමූහයන් අතුරෙන් කවර කම්මයක්හු විසින් එලවනු ලබන්නේද යත්? අනතුරු භවයෙහි ප්‍රතිසන්ධිය ඉපදවීමට නියතවූ ප්‍රතිසන්ධි ජනක කම්මය විසින් එලවනු ලබන හෙයින් සත්වයා උපදවන්නාවූ ඊශ්වරයා නම් කම්මයයි. විශුද්ධි මාර්ග ඉන්ද්‍රියනිද්දේශයෙහි ආයේයි. "උපලද්ධපුබ්බකත්ව" යන පදයෙහි අත්ථයනම්:— දඬුමුගුරු ආයුධ ආදියයි. "උපකරණභූතත්ව" යන්නෙහි අභිප්‍රායනම්:- මල්පහන් ආදිවූ පූජාවස්තූහි. දඬුමුගුරු අවීආයුධාදිය වනාහි අකුශලකම්ම නිමිත්තයි. විහාරය ප්‍රතිමාලය චෛත්‍යය චීවරාදිය යන මේ පූජාවස්තු වනාහි කුශල කම්මනිමිත්තයි. නරකාග්නි නිරයපාල කාළසුනඛාදීහු වනාහි අකුශල ගතිනිමිත්තයි. දිව්‍යප්සරා කල්පවෘක්ෂ උද්‍යානාදීහු වනාහි කුශල ගතිනිමිත්තයි. කම්මනිමිත්ත වැටහීම වනාහි යම් කිසි ආයුධයකින් ඇන ගවයෙක් මරා අනතුරු අත්බැව්හි ඒ කම්ම-විපාක දියයුතු නම් මරණාසන්න ජවනයන්ට සවිඤ්ඤකයකින් පෙනෙන්නාක් මෙන් ඒ ගවයා වැටහෙයි. කුශල කම්මයෙහි මේ ක්‍රමය අනුව අවබෝධ කළයුතුයි. මෙම ලක්ඛිවිහි සොණ නම් පණ්ඩිතයා සම්පයෙහි වැඩවසූ සොණ සථවිරයන්ගේ පිතෘ වන මහාසාමණේරයන්ගේ මරණාසන්නයෙහි පළමුවෙන් අකුශල කම්ම ගතිනිමිති වැටහී ඊට අනතුරුව දිව්‍යාප්සරාවන් වැටහුනු බැවින් කුශලාකුශල කම්මයටම සොණ සථවිර වසඟව උදාහරණ කරයුතුයි. මරණින් මතු ප්‍රේතලෝකයෙහි උපදින සත්වයාට මහත්වූ ආරණ්‍ය පර්වතාදියම ගතිනිමිති වශයෙන් වැටහෙයි. මේ කම්ම කම්මනිමිති ගතිනිමිති වැටහීම කවරෙකු විසින් එලවනු ලැබේදැයි යත්හොත්? කුශලාකුශල කම්මානුභාවයෙන්ම වැටහෙයි. කවරවාරයෙක්හි වැටහෙන්නාහුදයත්? කම්මය වනාහි මනොවාරයෙහිම වැටහෙයි. ඒ වනාහි එකාන්ත නාමධම්මයකි. කම්මනිමිත්ත වනාහි ෂඩ්වාර පෙහිම රූප ශබ්ද ගන්ධ රස ස්පර්ශ ධම්ම විශයෙන් වැටහෙයි. ගතිනිමිත්ත වනාහි එකාන්ත රූපාලම්බණයම බැවින් සවඤ්ඤකයක් දකින්නාවූ කලක් මෙන් මනොවාරයටම වැටහෙයි. "පරිසුද්ධං උපක්කිලිට්ඨංවා" යන්නෙහි "පරිසුද්ධං" යනු කුශල කම්මනිමිති ගතිනිමිති වෙත්. "උපක්කිලිට්ඨං" යනු අකුශල කම්මනිමිති ගතිනිමිති වෙත්. අනතුරු භවයෙහි ලැබියයුතුවූ සවඤ්ඤකයක් මෙන් චිත්තපරම්පරා තොමෝ නිරන්තරයෙන් පවත්නේවෙයි. අතීත ජාතියෙහි සොම්නස් සහගත ඥාන සම්ප්‍රයුක්ත

සිතින් යුක්තව දුන වසතු ආදිය බෙදීමක් හෝ ශීලභාවනාදී පුණ්‍යක්‍රියාවක් හෝ රැස්කෙළේ වී නම් අනතුරු අත්බැව්හි විපාකදිය යුතුවූ ඒ කුශලකර්මය මරණාසන්නයෙහි වැටහී ඒ කර්මය රැස්කළාවූ සමයෙහි මෙන් මහත්වූ සොම්නස් උපද නේයි. "අභිනව කරණ වසෙන" යන්නෙහි අභිප්‍රාය නම් :— යම් කුශලකර්මයක් හෝ අකුශලකර්මයක් හෝ අනතුරු භව යට යායුතු නම් ඒ කර්මය රැස්කරන්නාවූ කාලයෙහි කළාක් මෙන් මරණාසන්නයෙහිද අළුතින් කරණ ලද්දේවෙයි, "ඉච්ඡුකං අවච්ඡුක මෙව වා" යන්නෙහි අභිප්‍රාය නම් :—එකොළොස් කාමභූමිය පසළොස් රූපභූමිය; යන පවවොකාර භව යෙහි හෙවත් පවසකඬියකින් යුක්තවූ භවයෙහි හෘදය වසතුව ආශ්‍රයකොටගෙණ හෙවත් හෘදය වසතුව උපද වමින්ම පවත්නා විඤ්ඤාණය පිහිටයි, චතුවොකාර භව සඞ්ඛ්‍යාතවූ සතරඅරූපභූමියෙහි රූපයනැති බැවින් ප්‍රතිසන්ධි විඥානය අවසතුකව පිහිටයි. "අවිජ්ජානුසය පරිකිලෙසන" යන්නෙහි අභිප්‍රාය නම් :— සතර අපායෙහි උපදනා සත්වයන්ට උපදනා ලොභසහගත මරණාසන්න ජවන චිත්තයෙහි අවිද්‍යාව සම්ප්‍ර යුක්තවම ලැබෙයි. සුගතියෙහි උපදනා සත්වයන්ට මරණා සන්නයෙහි කාමාවචර කුශලචිත්තවීථිය උපදනේ නමුදු මෘදු යෙන් අවිද්‍යාව ප්‍රහාණය නොකළ බැවින් අනුසයවශයෙන් පැවති අවිද්‍යාව විසින් වටකරණු ලැබෙයි. තෘෂ්ණාසඞ්ඛ්‍යාතවූ මූලය හෙතුකොටගෙණ ප්‍රතිසන්ධිය උපදවන බැවින් රහතුන් ගේ චුතියෙන් අනතුරුව ප්‍රතිසන්ධියක් නැත්තේයි. "සම්ප යුත්තෙහි පරිගහයමානං යන්නෙහි අභිප්‍රාය නම් :— ප්‍රතිසන්ධි චිත්තය හා එක්ව හටගන්නාවූ සපඤ්ඤවූ චෛතසික ධර්මයන් විසින් පිරිවරාගණු ලබන බැවින් "මනොපුබ්බඞ්ගමාධම්මා" යනාදී ගාථාවෙහි ආනයින් ප්‍රතිසන්ධිචිත්තය පෙරටුකොට ගෙන් ගත් කල්හි අවිඝෙෂසපඤ්ඤවූ චෛතසික ධර්මයෝද මේ අපගේ ඵලයයි වැළඳගන්නාක් මෙන් ප්‍රතිසන්ධිචිත්තය ආශ්‍රය කොට ගෙණ පවත්නාහු වෙති. වර්තමාන භවය හා අනාගත භවය ඵලජනක අවීචියෙන් ප්‍රතිසන්ධියයි ව්‍යවහාර කෙරෙති. ඛණ පච්චුපන්නය, සන්තති පච්චුපන්නය, අඞ්ගපච්චුපන්නයයි පච්චුපන්නය ත්‍රිවිධාකාර වෙයි. ඔවුන් අතුරෙන් එකම රූප ධර්මයක්හුගේ ආයුෂවූ සතළොස් චිත්තක්ෂණ කාලය ඛණ පච්චුපන්නයනම්වෙයි. එක අරමුණක් පිළිබඳව උපදනා සම් තාක් චිත්ත වීථිවන්නාහුනම් ඒ සියලු චිත්ත වීථින්ගේ කාලය සන්තතිපච්චුපන්නයනම්වෙයි. ප්‍රතිසන්ධි චිත්තාදිය පටන් චුති

විත්තය දක්වා මේ අතර කාලය අඛාපවත්තිපච්චුපන්නානම්වෙයි. එක් භවයෙකින් චුතවම අනිත් භවයට යන්නාවූ සත්ත්වයා සම්බන්ධවූ පවත්තිකාලයෙන් යම් සන්ධියක් අනිත් භවයෙහි යන්නේයයි කියා හෝ හාත්පසින් කිසිවක් නොයන්නේයයි කියා හෝ නොගතයුත්තේයි. පහනකින් පහනක් දල්වන්නාවූ කලක්මෙන්ද, හස්ත මුද්‍රාවක් බබාගන්නා කලක්මෙන්ද, පරිඝෝෂකයාගේ වචනය විනිශ්චයකාරයාගේ සිතෙහි හටගන්නාක්මෙන්ද සැපි. විෂ දූතයාගට මන්ත්‍රාදිකය පෙවීමෙන් විෂ ආතුරයාගේ විෂ ව්‍යාපත්තිය සංසිඳුවීමක්මෙන්ද චුතවන්නාහුගේ පවත්තිකාලය මෙහිම නිරුඬවන්නේ නමුදු කම්වේගය කරණකොටගෙණ මරණාසන්න ජවන විඤ්ඤාණයෙහි උපදනා මරණාසන්නජවනයන් පස්දෙනා හා සම්ප්‍රයුක්තවූ චේතනා සඞ්ඛ්‍යාත බිඳුවෙන් නානාක්ඛණිකා කම්ඵකතිය ප්‍රධානකොට ගෙණ අනන්තරූ භවයෙහි ප්‍රතිසන්ධිය උපදන්නේයි. මරණාසන්න කාලයෙහි ජවන් පවත්නේ කුමක්හෙයින් උපදනාහුද යත්? අවිද්‍යාවෙහි දමනලද තාලපත්‍රයාගේ නීලවර්ණය ක්‍රමයෙන් නැතිවී අවුත් එක් තැනෙක රැස්වන්නාක්මෙන් චක්ෂු ශ්‍රෝත්‍රාදී කම්ජ රූප සියල්ල නිරුඬවීගොස් අවිශේෂවම ඇත්තාවූ හෘදයවස්තුව නිසා පවත්නාවූ විත්තය අතිශයින් දුර්වලවෙයි. එහෙයින් පස්වරෙක්ම උපදනාහුගයි දතයුතුයි. වුනි විත්තයද තදුලම්බණයට අනන්තරූ වුත්තය. තදුලම්බණයට අනන්තරූ භවාඞ්ගයද, ඒ භවාඞ්ගයට අනන්තරූ චුතියද, ජවනයන්ට අනන්තරූ චුතියද, ජවනයන්ට අනන්තරූව භවාඞ්ගයී ඒ භවාඞ්ගයට අනන්තරූව වන්නාවූ චුතියද සතරාකාරවන්නේයි. ඒ තදුලම්බණයට අනන්තරූ චුතියවන්නාවූ විඤ්ඤාණයෙහි මනොවාරූ වර්ජනය පටන් මරණාසන්න ජවනයන් අවසන්කොට ඇත්තාවූ විඤ්ඤාණෝතුමූ රූපාලම්බණ කම් නිමිත්තක්ම අරමුණුකොට ගන්නාවූකල්හි රූපාලම්බණ තෙමේ ප්‍රතිසන්ධි විත්තයට අනන්තරූව උපදනා සතරවෙනි භවාඞ්ග විත්තයාගේ හඞ්ගය හා එකක්ෂණිකව නිරුඬවේ.එකල්හී ප්‍රත්‍යාතපන්නවූ රූපාලම්බණ කම්නිමිත්තය ප්‍රතිසන්ධි භවාඞ්ගයන්ට අරමුණුවන්නේහි. මේ ක්‍රමය එල්බ ගෙණ මතු මතු විපිහුද දතයුත්තාහුය. කම් නිමිත්ත වනාහි ප්‍රත්‍යාතපන්නයයි කීයේ නමුදු එකාන්ත ප්‍රත්‍යාතපන්නය නොවෙයි. යමෙක් සිව්රක් පුදා ඒ කුශලයෙන් සුගතියෙහි උපදනාකල්හී ඒ චීවර සඞ්ඛ්‍යාතවූ කම් නිමිත්ත එකාන්ත ප්‍රත්‍යාතපන්නවශයෙන් නොවැටහෙන්නේමැයි. තත්සාදෘශ්‍යවූ කම්නිමිත්තක් මරණාසන්න කාලයෙහි හටගන්නා බැවින් ප්‍රත්‍යාතපන්නයයි ව්‍යවහාරකෙරෙත්. කම් කම්නිමිති ගතිනිමි

තිහු කාල ආරම්මණ වාරයන්ගේවශයෙන් නියමකිරීම යට ආලම්බණ සංග්‍රහයෙහි ආගතින් දතයුත්තාහුය. අසඤ්ඤ සත්ත භූමියෙහි වනාහි රූපයෙන්ම ප්‍රතිසන්ධිග්‍රහණය කෙරෙයි. සතර අරූප භූමියෙහි නාමයෙන්ම ප්‍රතිසන්ධිග්‍රහණයකෙරෙයි. ඔවුන් කෙරෙන් අවශිෂ්ට පඨවොකාර භූමියෙහි නාම රූපමයෙන්ම ප්‍රතිසන්ධිග්‍රහණය කෙරෙයි. අරූපාවචර චුතියෙන් මත්තෙහි අරූපාවචර ප්‍රතිසන්ධි සතරඅ ත්‍රිහෙතුක කාමාවචර ප්‍රතිසන්ධිසතරඅ, යන මොවුන්ගේ වශයෙන් ප්‍රතිසන්ධි අටෙක් යථාහීයෙන් වෙත්. වෙන් වෙන්ව භූමිවශයෙන් වනාහි ආකාසානඤ්චායතන චුතියට අනතුරුව එම ප්‍රතිසන්ධි අටමවෙත්. විඤ්ඤාණඤ්චායතන චුතියට අනතුරුව ආකාසානඤ්චායතන ප්‍රතිසන්ධි වර්ජිතකොට ඇත්තාවූ අරූපාවචර ප්‍රතිසන්ධිත්‍රය, ත්‍රිහෙතුක කාමාවචර ප්‍රතිසන්ධි චතුෂ්කය, යන ප්‍රතිසන්ධි සතෙක්වෙත්. (ආකිඤ්චඤ්ඤායතන චුතියට අනතුරුව කාමාවචර ත්‍රිහෙතුක ප්‍රතිසන්ධිචතුෂ්කය, ආකිඤ්ඤායතන නෙවසඤ්ඤානාසඤ්ඤායතන ප්‍රතිසන්ධිචය යන මොවුන්ගේ වශයෙන් සදෙනෙක්වෙත්. නෙවසඤ්ඤානාසඤ්ඤායතන චුතියට අනතුරුව කාමාවචර ත්‍රිහෙතුක සතරඅ, ආකිඤ්ඤායතන නෙවසඤ්ඤානාසඤ්ඤායතන ප්‍රතිසන්ධිචය යන පසෙක්වෙත්.) ඉමේපාඨයවිඹසනු

පුථුජ්ජනවශයෙන්වනාහි ආකාසානඤ්චායතන භූමියෙහි ත්‍රිහෙතුක චුතියට අනතුරුව සතර අරූප ප්‍රතිසන්ධිහුය. ත්‍රිහෙතුක කාමාවචර ප්‍රතිසන්ධි සතරය, යනමොවුන්ගේවශයෙන් අටදෙනෙක් වෙත් එම භූමියෙහි සෝවාන් සකදාගාමී අනාගාමීහුවෙත්නම් සතර අරූපාවචර ප්‍රතිසන්ධිහුමවෙත්. රහත් පුථුජ්ජනයෙක්වීනම් එක්ප්‍රතිසන්ධියකුත් නොවේ. විඤ්ඤාණඤ්චායතන භූමියෙහි ත්‍රිහෙතුක ප්‍රතිසන්ධියට අනතුරුව කාමාවචර ත්‍රිහෙතුක ප්‍රතිසන්ධි චතුෂ්කය. ආකාසානඤ්චායතන වර්ජිතකොට ඇත්තාවූ අරූපාවචර ප්‍රතිසන්ධිත්‍රය, යනමොවුන්ගේවශයෙන් සත්දෙනෙක් වෙත් සෝවාන් සකදාගාමී අනාගාමීහුවෙත්නම් අරූපාවචර ප්‍රතිසන්ධිත්‍රය ලැබෙයි. රහත් පුථුජ්ජනයෙක්වීනම් එකකුදු නොලැබේ. ආකිඤ්ඤායතන භූමියෙහි ත්‍රිහෙතුක චුතියට අනතුරුව ත්‍රිහෙතුක කාමාවචර ප්‍රතිසන්ධි චතුෂ්කය, ආකිඤ්ඤායතන නෙවසඤ්ඤානාසඤ්ඤායතන ප්‍රතිසන්ධියුගල යන මොවුන්ගේ වශයෙන් සදෙනෙක්වෙත් සෝවාන් සකදාගාමී අනාගාමීහුවෙත්නම් ආකිඤ්ඤායතන නෙවසඤ්ඤානාසඤ්ඤායතන ප්‍රතිසන්ධියුගල මාත්‍රයක්වෙයි. රහත් පුථුජ්ජනයෙලක්වීනම් එකකුදු නොලැබෙයි. නෙවසඤ්ඤානාසඤ්ඤායතන භූමියෙහි ත්‍රිහෙතුක චුතියට අනතුරුව කාමාවචර ත්‍රිහෙතුක ප්‍රතිසන්ධි සතරය, නෙවසඤ්ඤා

නාසඤ්ඤායතන ප්‍රතිසන්ධිය, යම පසෙක්ම් ලැබෙයි. සොතා පත්ත සකදාගාමි අනාගාමිහුවෙත්නම් ඒනෙවසඤ්ඤානාසඤ්ඤා යතන ප්‍රතිසන්ධි මාත්‍රයක්වෙයි. රහත්පුදුගලයෙක්විනම් එදෙනා ලැබෙයි. අරූපභූමියෙන් චුතවී කාමභූමියට එන්නාවූකල්හී අහෙතුක දුහෙතුක ප්‍රතිසන්ධි කුමක්හෙයින් නොගන්නාහුද යත්? අරූපාවචර ධ්‍යාන චිත්තයට පුථුභාගයෙහි උපදනා පරිකම්ම උපචාර අනුලෝම ගොත්‍රභූ යන උපචාර ධ්‍යානයන්ගේ බලවත් බැවින් ත්‍රිහෙතුක ප්‍රතිසන්ධිය මුත් දුහෙතුක අහෙතුක ප්‍රතිසන්ධිහු නොගන්නාහුයයි දතයුතුයි. මතු මතු අරූපාවචර භූමියෙන් චුතවන්නාවූ බ්‍රහ්මයෝ තුමූ යට යට භූමියෙහි කුමක් හෙයින් නූපදනාහුද යත්? මතු මතු අරූපධ්‍යානයන්ට භාවනා වඩන්නාවූ යොගාවචරයෝ තුමූ යට යට අරූපධ්‍යානයන්ට පිළිකුල්ව මතු මතු ධ්‍යානයන් උපදවන්නාක්මෙන්ම මතු භූමියෙන් චුතවී යට භූමියෙහි නූපදනාහුයයි දතයුතුයි. නොහොත් යට යට කුශලධ්‍යාන නෙමේ මතු මතු භූමියෙහි උපන්නාවූ බ්‍රහ්මයන්ට නොලැබෙනහෙයින් යට භූමියෙහි ඉපදීමට ධ්‍යාන යක් නැත්තේයයි දතයුතුයි. "බ්‍රහ්මලොකගතා හෙට්ඨා" යනාදී ගාථාවෙහි ආක්‍රමියෙන් බ්‍රහ්මලොකයෙහි උපන්නාවූ ආර්‍ය්‍ය නෙමේ උඩංගොන බැවින් මතු බ්‍රහ්මලොකයෙක්හි රහත්ව පිරිනිවන් පානා පමණමුත් යට බ්‍රහ්මලොකයකට හෝ කාම ධාතුවට හෝ එකාන්තයෙන් නොඑන්නේයයි දතයුතුයි. රූපාවචර චුතියට අනතුරුව කාමාවචර ත්‍රිහෙතුක දුහෙතුක ප්‍රතිසන්ධි අටය, මහද්ගත ප්‍රතිසන්ධි නවය යනමොවුන්ගේ වශයෙන් සත ලොස් ප්‍රතිසන්ධි කෙනෙක්වෙත්. භූමිවශයෙන් විභාගකරන්නාවූකල්හී ප්‍රථම ධ්‍යාන භූමියෙහි සතලොසෙක, විතියධ්‍යාන භූමියෙහි සතලොසෙක, තතිය ධ්‍යාන භූමියෙහි සතලොසෙක චතුත්‍ථධ්‍යාන භූමි සඞ්ඛ්‍යාත වෙහප්ඵල තලයෙහි සතලොසෙකැයි මෙසේ ප්‍රතිසන්ධිගණිත්. අසංඥසත්ව භූමියෙහි ප්‍රතිසන්ධි අටක්වෙත්. යට සුඛාවාස සතරෙහිවනාහි පඤ්චමධ්‍යාන ප්‍රතිසන්ධි සඞ්ඛ්‍යාත එකම ප්‍රතිසන්ධියෙක්වෙයි. අකනිට්ඨ භූමියෙහිවනාහි එකම ප්‍රතිසන්ධිය කුදු නොවෙයි. පුද්ගලවශයෙන් වනාහි ප්‍රථම ධ්‍යාන භූමියෙහි ත්‍රිහෙතුක චුතියට අනතුරුව අහෙතුක ප්‍රතිසන්ධි වර්ජිතකොටැති සතලොස් ප්‍රතිසන්ධිකෙනෙක්වෙත්. සෝවාන් සකදාගාමි අනාගාමිහුද වෙත්. රහත්පුදුගලයෙක්විනම් එකකුදු නොවෙයි. විතිය ධ්‍යාන භූමියෙහි ත්‍රිහෙතුක චුතියට අනතුරුව සතලොස් ප්‍රතිසන්ධි කෙනෙක්වෙත්. සොතාපන්න සකදාගාමි අනාගාමිහුවෙත්නම් මහද්ගත ප්‍රතිසන්ධි නවයවෙයි. අහිත්පුදුගලයෙක්

විනම් එකකුදු නොවෙයි තෘතීය ධ්‍යාන භූමියෙහි ත්‍රිහේතුක චුතියට අනතුරුව සතළොස් ප්‍රතිසන්ධිකෙණෙක්වෙත්. සෝවාන් ආදී ආර්‍යයෝ තුන්දෙනවීන්ම මහද්ගත ප්‍රතිසන්ධිනවයක්වෙත්. රහත් පුද්ගලයෙක්වීනම් එකකුදු නොවෙයි. වෙහප්ඵල භූමියෙහි ත්‍රිහේතුක චුතියට අනතුරුව අහේතුක ප්‍රතිසන්ධිවර්ජිතකොට ඇත්තාවූ සතළොස් ප්‍රතිසන්ධිහුවෙත්. සොතාපන්නාදී ආර්‍යයෙණෙක්වීනම්:—"වෙහප්ඵල අකනිට්ඨෙ භවග්ගෙව පතිට්ඨිතා" යනාදී ක්‍රමයෙන් ඉදින් ඒ ආර්‍යයන්වහන්සේගේ අභිප්‍රායානුකූල පරිදීදෙන් එම භූමියෙහිම පඨමධ්‍යාන ප්‍රතිසන්ධි එකෙක් වෙයි. රහත්පුද්ගලයෙක්වීනම් එකකුත්නොවෙයි. ඔට සතර ශුද්ධාවාස භූමියෙහි අනාගාමීහු ඉදින් කැමැත්තාහුවීනම් පඨම ධ්‍යාන ප්‍රතිසන්ධි මාත්‍රයක් ගතහැකිවෙයි. රහත්පුද්ගලයෙක්වීනම් ඒද නොගන්නේයි ඔටශුද්ධාවාසයෙහි රහත්වූ ආර්‍යයතෙමේ අකනිට්ඨභූමියෙහිද කැවත නූපදනේයි. අනාගාමී ආර්‍යයතෙමේ ශුද්ධාවාස භූමියෙහි නොරහත්ව පිරිනිවන් නොපානේමැයි. හෙවත් එනානත්තයෙන් රහත්ව පිරිනිවන් පානේයයි දතයුතුයි. අසංඥසත්ව භූමියෙහි එකම්සුගති පුද්ගලයෙන්ම ලැබෙයි. අසංඥසත්වභූමියෙන් චුතව ඒ පුද්ගල තෙමේ එනානත්තයෙන් කාම භූමියෙහි ත්‍රිහේතුක දුහේතුක ප්‍රතිසන්ධි අවින් එකක්ම ගන්නේයි. කාමාවචර චුතියට අනතුරුව එකුන්විසි ප්‍රතිසන්ධි තෙනෙක් හෝ අසංඥ සත්ව ප්‍රතිසන්ධිය සමග විස්සෙක් හෝ ලැබෙන් නේයි. භූමිවශයෙන් කල්පණාකරණකල්හි සපතකාම සුගතියෙන් චුතවූයේනම් එකුන්විසි ප්‍රතිසන්ධිය හෝ විස්සම හෝ ලැබෙන්නේයි. සතර අපාය භූමියෙන් චුතවූ සත්ව තෙමේ දශ ප්‍රකාර කාමාවචර ප්‍රතිසන්ධින්ගෙන් එක්තරා ප්‍රතිසන්ධියක්ම ගන්නේයි. පුද්ගලවශයෙන් කල්පණාකරන්නාවූ කල්හි සපත කාම භූමියෙහි සුගති අහේතුක දුගති අහේතුක පුද්ගලයෙක් චුතවීනම් කාමාවචර ප්‍රතිසන්ධි දශදෙනා අතුරෙන් එක්තරා ප්‍රතිසන්ධියෙක්මගන්නේයි. කාමාවචර ත්‍රිහේතුක චුතියට අනතුරුව එකුන්විසි ප්‍රතිසන්ධිය හෝ අසංඥසත්ව ප්‍රතිසන්ධිය හා සමග විස්සම හෝ ලැබෙන්නේයි. කාමභූමියෙන් චුතවන්නාවූ සෝවාන් සකෘදාගාමී පුද්ගලයෝ තුමූ කාමාවචර ත්‍රිහේතුක ප්‍රතිසන්ධි සතරක මහද්ගත ප්‍රතිසන්ධි නවය යනමේ දහතුනෙන් එකක් ගන්නාහුමැයි, කාමභූමියෙහි අනාගාමී පුද්ගල තෙමේ මහද්ගත ප්‍රතිසන්ධි නවයෙන් එකක් ගණියි. අනීත පුද්ගලයෙක්වීනම් එකකුදුනැත්තේයි. සතර අපායෙහි එකම දුගතිඅහේතුක පුද්ගලයෙක්වෙයි, එයින් චුතව එනකල්හි අහේතුක

ප්‍රතිසන්ධි යුගලය, සහෙතුක ප්‍රතිසන්ධි අවය යන දශයෙන් එකක්ගන්නේයි. අසංඥ සත්ව භූමියෙහි නාමයෙන් තොරව මහාකල්ප පන්සියයක් වැස කාමභූමියට එන්නාවූකල්හි නාම රූපවයෙන් යුක්තවූ ප්‍රතිසන්ධිය කුමක්හෙයින් ගන්නේදැයි? අසංඥසත්වය ලැබීමට හෙතුවූ සතරවෙනි ධ්‍යානය උපදවන කල්හී ඒ ධ්‍යාන සිතට පූර්වභාගයෙහිවූ උපචාර ජවනබලයෙන් යයි දතයුතුයි. බ්‍රහ්මලෝකයෙන් චුතව කාම ධාතුයෙහි කුමක් හෙයින් අහෙතුක ප්‍රතිසන්ධියෙන් නුපදනේද යත්? ඒ ඒධ්‍යාන විපිරියෙහි උපචාර ජවන චෙතනා බලයෙනැයි දතයුතුයි. යම් භවයෙක්හි ප්‍රතිසන්ධි වන පුද්ගලයෙක් තෙමේ ප්‍රතිසන්ධියට අනතුරුව සම්තාක් විපි සිත් නුපදනාහුද ඒතාක්කල් මුලුල්ලෙහි ජලප්‍රදිඝයක්මෙන් භවාඞ්ග ප්‍රවාහය නොකඩව බස්නේයයි දතයුතුයි. මිනිස් ලොව මව්කුස උපදනාවුන්ට ප්‍රතිසන්ධියට අනතුරුව භවාඞ්ග දශයක් ඉපිද දෙවනුව මනොද්වාරාවර්ජනයක් හා භවනිකාන්ති ලොභ ජවන පසක්ම යුක්ත ජවන විපියක් ඉපිද තදනන්තරව භවාඞ්ග සිත් උපදින්නට පටන්ගණිත්. එතැන් පටන් නවමසක් ගෝමුලුල්ලෙහි ගර්භාශ්‍රාත්‍රයක්මෙන් භවාඞ්ග සිත්ම පැවත මව් කුසින් නික්මෙනවා හා සමග පළමුකොට සුඛසීතා ලොකාදිය දැකීමෙන් චක්ෂුර්විඥානාදී විපිසින් ඉපදීමට පටන්ගණිත්. එතැන් පටන් ක්‍රමයෙන් සත්වයාගේ වැඩීමකෙතුකොටගෙණ භවාඞ්ග පරම්පරාව අඩුවී රූපාදී අරමුණු ඵල්බගෙණ විපි සිත් උපදින්නාහුවෙත්. ඒ ඉපදීමද රූපයක් දැක නැවත ශබ්දයක් අසන්නාවූකාලයෙහි අතර භවාඞ්ග බොහෝසෙයින් උපදිත්. නින්දට ගියකල්හි භාත්පසිනම භවාඞ්ග පරම්පරාව පවතිත්. මෙසේ අසූ අනූ වයස්ගතවන කල්හී නැවතත් භවාඞ්ග පරම්පරාව වැඩෙයි. ඊට අනතුරුව ඇතිවන චුති සිතද භවාඞ්ගයාගේ අරමුණම ඵල්බගෙණ පවතියි. එක් භවයෙක්හි එක් සත්වයෙකුගේ භවාඞ්ගය චුතිය ප්‍රතිසන්ධිය යනමේ සිත් තුණ කර්මනිමිත්තය ගතිනිමිත්තය යන තුණෙන් එකක්ම අරමුණුකොට පවත්නේයි. මීට අනතුරු භවයෙහිද ඒ චිත්තයන්ගේ පැවතීම මේ භවයට කියාසින් දතයුතුයි. මෙසේ භ්‍රමනාගවන්ධාවූ සංසාර වක්‍රයාගේ දුඃඛස්කන්ධ කුශලා කුශලකර්ම සමූහය ගිල භූමියෙහ පිහිටා සිටගෙණ ශ්‍රද්ධානැමති හස්තයෙන් අතීත්මාගීඥාන නමැති කඩුව ගෙණ සිඳ බිඳ විනාශකෙළේවිනම් සංසාර වක්‍රය විනාශවූයේ යයි දතයුතුයි.

භූමි විභාගය නිමි.

ව්‍යුති ප්‍රතිසන්ධි ක්‍රමයයි.

අභිධර්මාර්ථ සංග්‍රහයෙහි විපි මුඛත සංග්‍රහ විභාග කර්මවූ පස්වෙනි පරිච්ඡේදය නිමි.

සචෙනි පරිචෙඡ්දය

(ප)

එත්තාවතා, (එත්තා වත්තාහි පවත්ති පරිවෙඡ්දෙහි) මෙපම ණවූ පවපරිවෙඡ්දයකින්: සපභෙදපවත්තිකා, ත්‍රිවිධ පරිවෙඡ දයකින් කියනලද්දවූ හටගැණීම්ද ඇත්තාවූ; නොහොත් උද්දෙස නිද්දෙස පටිනිද්දෙසයන්ගේවශයෙන් කියනලද්දවූ ප්‍රභෙද හා ප්‍රවෘත්ත ප්‍රතිසන්ධින්ගේවශයෙන් කියනලද්දවූ හට ගැණීම්ද ඇත්තාවූ; චිත්ත චෙතසිකා ධම්මා, චිත්ත චෛත සික සංඛ්‍යාතවූ සවභාව ධර්මයෝත්; ඒ, (යසමා) යම්හයකින්; මයා, මා විසින්; විභත්තා, බෙදනලද්දාහුවෙත්ද; තසමා, එසේ බෙදනලදහෙයින්; දානි, (ඉදානි) දැන් වනාහි; රූපං, රූපය; පවුච්චති, ප්‍රභෙදවශයෙන් කියනුලැබේ.

සමුද්දෙසාව, සංක්ෂෙපයෙන් රූපය ප්‍රකාශකිරීම් වශ යෙන්ද; විභාගාව, රූපයබෙදීම්වශයෙන්ද; සමුඩානාව, චක්ෂු ර්දශකාදි රූපයන්ගේ හටගැණීම්වශයෙන්ද; කලාපතොව, චක්ෂුර්දශකාදී රූපයන්ගේ කලාපවශයෙන්ද; පවත්තිකකම තොව, භවිකාල සම්බ ප්‍රභෙදයෙන් රූපයන්ගේ හටගැණීම් වශයෙන්ද; ඉති, මෙසේ; තත්ථ, ඒ රූප සංග්‍රහයෙහි; පඨමා, පස්ප්‍රකාරයකින්; සඞ්ගහඤ්ච ඉති, සංග්‍රහයවෙයි.

චත්තාරි මහාභූතානිච, සතරමහා භූතරූපකෙනෙක්ද චතුන්නව මහාභූතානං, සතරමහාභූතයන්; උපාදාරූපඤ්ච, නාම්‍රයකොටගෙණ හටනන්නා රූපයද; ඉති, මෙසේ; දුවිධම්පි, ඔප්‍රකාරවූද; එතං රූපං, ඒ රූප තෙමේ; එකාදසවිධෙන, එකොළොස් ප්‍රකාරයකින්; සඞ්ගහං ගච්ඡති, සංග්‍රහයට හෙවත් ව්‍යවහාරයට පැමිණේ. කථං? කෙසේ සංග්‍රහයට යන්නේද යත්? පඨවී ධාතු, පෘථිවි ධාතුවය; ආපොධාතු, ආපොධාතු වය, තෙජොධාතු, තෙජොධාතුවය, වායොධාතු, වායොධාතු වය; භූතරූපන්නාම, භූතරූපනම්වේ. චක්ඛුං, චක්ෂුප්‍රසාදයද; සොතං, ශ්‍රොත්‍රප්‍රසාදයද; ඝාණං, ඝ්‍රාණප්‍රසාදයද; ජිව්හා, ජිව්හාප්‍රසාදයද; කායෝ කායප්‍රසාදයද; පසාදරූපන්නාම, ප්‍රසා දරූපනම්වේ. රූපං, රූපාලම්බණයද; සද්දෝ, ශබ්දාලම්බණයද; ගන්ධෝ, ගන්ධාලම්බණයද; රසෝ, රසාලම්බනයද; ආපොධාතු විවජ්ජිතං, ආපොධාතුවර්ජිතකොට ඇත්තාවූ; භූතත්තය සං ඛාතං, භූත රූප තුන්දෙනාගේ සමූදායයි කියනලද්දවූ;

ඵොඨබ්බං, සපගීාලම්බණයද; ගොචරරූපංනාම්, ගොචර රූප නම්වේ; ඉත්ථත්තං, සත්‍රීභාවරූපයද, පුරිසත්තං, පුරුෂභාවයද, භාවරූපංනාම, භාවරූපනම්වේ. හදයවත්ථු, හෘදයවස්තුතෙමේ; හදයරූපංනාම්, හෘදය රූපනම්වේ. ජීවිතින්ද්‍රියං, ජීවිතෙන්ද්‍රියය තෙමේ; ජීවිත රූපංනාම, ජීවිත රූපනම්වේ. කබළීකාරෝ, කබළුකොට අනුභවකරන්නාවූ; ආහාරෝ ආහාර තෙමේ; ආහාර රූපංනාම, ආහාර රූපනම්වේ. ඉති (ඉමිනාපභෙදෙන) මේ ප්‍රභෙදයෙන්; අට්ඨාරසවිධංපි, අටළොස් වැදෑරුම්වූද; එතං රූපං, මේ රූප තෙමේ; සභාවරූපනතිව, කැකුළු බැව් ආදී තම තමාගේ සවභාවවශයෙන් ලැබියයුතු බැවින් සභාව රූපයයි කියාද; සලක්ඛණ රූපනතිව, අනිත්‍යාදී ලක්ෂණයන් හා සමග භටගන්නාහෙයින් සලක්ඛණ රූපයයි කියාද; නිපඵන්න රූප නතිව, පරිවෙජ්දාදී සවභාව හැර තම තමාගේ සවභාවවශයෙන්ම; කම්මාදී සතර ප්‍රත්‍යයන් විසින් නිපදවනලෙයින් නිෂ්පන්න රූපයයි කියාද; රූපරූපංව, ශීතොෂ්ණාදි විරුඬ ප්‍රත්‍යයක් ඇතිකල්හි විකාර සවභාවය ඒ ශීතොෂ්ණාදි විරුඬ ප්‍රත්‍යයන් විසින් විකාරකරවිය යුතු සවභාව ඇතිලෙයින් රූපරූපයයි කියාද; සම්මසන රූපනතිව, පරිවෙජ්දාදි සවභාවය ඉක්මවා සවභාවවශයෙන්ම ලැබියයුතු හෙයින් අනිත්‍ය දුඃඛ අනාත්ම යයි කියනලද්දාවූ ලක්ෂණත්‍රයාරොපණයකිරීමෙන් සම්මර්ශනය කිරීමට සුදුසු බැවින් සම්මසන රූපයයිකියාද; සඞ්ඝහං ගච්ඡති, සංග්‍රහයට හෙවත් ව්‍යවහාරයට පැමිණේ. ආකාසධාතු, ආකාශ ධාතු තෙමේ; පරිවෙජ්ද රූපංනාම්. පරිවෙජ්ද රූපනම් වේ. කායවිඤ්ඤත්තිං, කායවිඥප්තියද; වචීවිඤ්ඤත්තිං, වාග්විඥප්තියද, විඤ්ඤත්තිං රූපංනාම, විඥප්ති රූපනම්වේ. රූපස්ස, අට ළොඹ් නිෂ්පන්න රූපයාගේ; ලහුතා, සැහැල්ලුබවද, මුදුතා, මෘදුබවද, කම්මඤ්ඤතා, කර්මණ්‍යභාවද; විඤ්ඤත්තිද්වයං, විඥප්තිරූපවයද; විකාර රූපානාම, විකාර රූපනම්වේ. රූපස්ස, චක්ෂුරාදී රූපයන්ගේ, උපචියෝ, ප්‍රථමොත්පත්තියද; සන්තති, නැවත නැවත භටගැණීමද; ජරතා, දිරීමද; අනිච්ච තා, හාත්පසින් රූපයාගේ බිඳුමද; ලක්ඛණරූපංනාම, ලක්ෂණරූපනම්වේ. පන, අධීනන්තරයක් දක්වම්:—එහි, මේ ලක්ෂණ රූපයන් සතරදෙනා අතුරෙන්; ජාතිරූපමෙව, එක්ම ජාති රූපයම; උපචය සන්තතිනාමෙන, උපචය නමින් හා සන්තති නමින්ද; පවුච්චති, ප්‍රභෙදකොට කියනුලැබේ; ඉති, මෙසේ; එකාදසවිධම්පි, එකොළොස් වැදෑරුම්වූද; එතංරූපං, මේ රූප තෙමේ; සරූපවශෙන, තම තමාගේ සවකීය සවරූපවශයෙන්

නොහොත් තම තමාගේ සභාවවශයෙන්; අඤ්ඤසහි විධං හොති, අවවියිවැදුරුම් වෙයි. කථං?, කෙසේද යත්?

භූතපසාදඤ්ඤථා, භූතරූප සතරය; පුඤ්ඤාද රූපපඤ්ඤ, ගොචරරූප සතරය, ඝනමොවුන්ද; භාවෝ, භාවරූපවයද; හදයම්චඤ්ඤි, භාදයරූපයද, ජීවිතාහාර රූපෙහි, ජීවිත රූපආහාර රූපයන් හා සමඟ; අඤ්ඤසවිධං, අවලෝස් වැදැරුම්වූ; (නිපඵන්නානංව) නිඵන්න රූපයද; තථා, එසින් අන්‍යවූ; පරිවේඡදෙව, පරිවේඡද රූපයද; විඤ්ඤත්තිව්, විඥප්ති රූපවයද; විකාරොව්, විකාරරූපත්‍රයද; ලක්ඛණන්නිව්, ලක්ෂණ රූපඒකාදශ; ඉති, මෙසේ; දසඅනිපඵන්නාව්, අනිඵන්න රූපයෝ දසදෙනද; ඉති, (ඉමිනා හෙදෙන) මේ ප්‍රභෙදයෙන්; අඤ්ඤසවිධංහවෙව, අවවියි වැදැරුම් වේ.

අයං, මේ කියනලද්දේ වනාහි; එසේ, මේ රූප සංග්‍රහයෙහි නොහොත් රූපසමුදෙඤාදි පවසමුදෙඤයන් අතුරෙන්. රූපසමුදෙඤා, රූපඤසංඛෙපයෙන් ප්‍රකාශකරන්නාවූක්‍රමයයි.

රූප සමුදෙදසය නිමි.

—o—

පන, රූප සමුදෙඤයෙන් අන්‍යවූ රූප විභාගය කියමි:- සබ්බව, සියලුම්; මෙහි "ච" ශබ්දය එවකාරාර්ථයි; එතං රූපං, ඒ රූප තෙමේ; අහෙතුකං, අලොභාදි සම්ප්‍රයුක්ත හෙතුනැති හෙයින් අහෙතුකතම්වෙයි. ඔපපච්චයං, කම්විත්තසතු ආහාර සංඛ්‍යාත සතර ප්‍රත්‍යය ධර්මයන් හා හවඟත්හෙයින් ඔපපච්චය නමුදුවෙයි. ඝාඝවං, චතුරාශ්‍රව ධර්මයන්ට අරමුණුවනහෙයින් ඝාඝවනමුදුවෙයි. සංඛතං, කම්විත්ත සතු ආහාර යන සතර ප්‍රත්‍යයන් විසින් සකස්කළහෙයින් සංඛත නමුදුවෙයි. ලොකියං, සතර උපාදානයන්ට අරමුණුවූ සංස්කාර ලොකයෙහි ඇතුලත්වනහෙයින් ලොකිය නමුදුවෙයි. කාමාවචරං, කාමතෘෂ්ණාවගේ හැසිරීමට ගොචර ස්ථානවනහෙයින් කාමාවචර නමුදුවෙයි. අනාරම්මණං, චිත්ත චෛතසිකයන්මෙන් අරමුණුකොටගන්නාහෙයින් අනාරම්මණ නමුදුවෙයි. අපපහාතබ්බං, තදඞ්ග ප්‍රහාණවිෂකම්භනප්‍රහාණ සමුච්ඡේද ප්‍රහාණයන්ගේ වශයෙන් නොපැහිය යුතුහෙයින් අපපහාතබ්බ නමුදුවෙයි. ඉති, මෙසේ; එකවිධම්පි, එක්වැදැරුම්වුද; රූපං, රූප තෙමේ; අජ්ඣත්තික බාහිරාදිවසෙන, අධ්‍යාත්මික බාහිරාදීන්ගේවශයෙන්; බහුධා, අනෙකප්‍රකාරයෙන්; භෙදං ගච්ඡති, ප්‍රභෙදයට යේ. කථං?, කෙසේ ප්‍රභෙදයට යන්නේද යත්? පසාද සංඛාතං, පවප්‍රසාද යයි කියනලද්දාවූ; පවවිධම්පි රූපං, පස් වැදැරුම්වූද රූපය;

අජ්ඣත්තික රූපංනාම, අඛ්‍යාත්මික රූපනම්වේ. ඉතරං, මෙයින් අන්‍යවූ තෙවිසිවැදෑරුම් රූප තෙමේ; බාහිර රූපං, බාහිර රූපනම්වේ. පසාදඝදය සංඛාතං, ප්‍රසාද රූප පසඝ, ඝෘදඝ රූපඝයි කියනලද්දුවූ; ඡබ්බිධම්පි රූපං, සවැදෑරුම්වූද රූපතෙමේ; චක්ඛුරූපංනාම, චිත්ත චෛතසිකඝන්ගේ ඉපදීමට කාරණාවනහෙයින් චක්ඛුරූපනම්වේ. ඉතරං, මෙයින් අන්‍යවූ දෙවිසි රූපඝ; අවක්ඛුරූපංනාම, අවක්ඛුරූපනම්වේ පසාද විඤ්ඤත්ති සංඛාතං; පවප්‍රශාදඝ විඤ්ඤත්තිවඝයි කියනලද්දුවූ; සත්තවිධම්පි රූපං, සත්වැදෑරුම්වූද රූපඝ; වාරරූපංනාම; චිත්ත චෛතසික කාඝවාක් කම්ඝන්ගේ නික්මීමට වාරවන හෙයින් වාරරූපනම්වේ. ඉතරං, මෙයින් අන්‍යවූ එක්විසි රූපඝ; අවාරරූපංනාම, අවාරරූපනම්වේ. පසාදභාව ජීවිත සංඛාතා, පවප්‍රශාදඝ භාවරූපවඝ ජීවිතෙන්ද්‍රියඝයි කියනලද්දුවූ; අඤ්ඤිධම්පි රූපං, අටවැදෑරුම්වූද රූපඝ; ඉන්ද්‍රියරූපංනාම, ඒශ්වරාදීකරණවහෙයින් ඉන්ද්‍රිඝ රූපනම්වේ. ඉතරං, මෙයින් අන්‍යවූ විසිවැදෑරුම්රූපඝ; අනින්ද්‍රිඝ රූපංනාම, අනින්ද්‍රිඝරූපනම්වේ. පසාදවිඤඤ සංඛාතං, පවප්‍රශාදඝ විඤඤරූප සතරඝයි කියනලද්දුවූ; චාදස විධම්පි රූපං, දෙලොස් වැදෑරුම්වූද රූපඝ; ඔළාරිකරූපං නාම, ඔළාරික රූපනම්වූදුවේ. නොහොත් රළු පරිඤ රූපනම්වේ. සනතිකෙරූපව, සනතිකෙ රූපනම්වූදුවේ; හෙවත් ලංවූ රූප නම්වූදුවේ. සප්පටිඝ රූපව; සප්පටිඝ රූපනම්වූදුවේ. හෙවත් හැපීම් ඇත්තාවූ රූපනම්වේ. ඉතරං, මෙයින් අන්‍යවූ සොළොස් රූප තෙමේ; සුඛුමරූපව; සියුම් රූප නම්වූදුවේ. දූරෙරූපව, දූරෙරූප නම්වූදුවේ. හෙවත් දුර පිහිටි රූපනම්වූදුවේ. අප්පටිඝරූපව, අප්පටිඝ රූපනම්වූදුවේ. හෙවත් හැපීම් නැත්තාවූ රූපනම්වූදුවේ. කම්මජං, අටළොස් කම්ජරූප තෙමේ; උපාදිණ්ණරූපංනාම, උපාදිණ්ණ රූපනම්වේ. නොහොත් අරමුණුකිරීම් වශයෙන් තෘෂ්ණාදෘෂ්ටීන් විසින් ලංකොටගන්නාලද්දුවූ කර්ම විසින් තමාගේ ඵලවශයෙන් ගන්නාලදහෙයින් උපාදිණ්ණ රූපනම්වේ. ඉතරං, මෙයින් අන්‍යවූ තිස් රූප තෙමේ; අනුපාදිණ්ණ රූපංනාම, අනුපාදිණ්ණ රූපනම්වේ. හෙවත් ඍතුකී අග්නියෙන් නොගන්නාලද හෙයින් අනුපාදිණ්ණ රූපනම්වේ. රූපායතනං, රූපායතන තෙමේ; සනිදස්සන රූපංනාම, සනිදස්සන රූපනම්වේ. හෙවත් දැකීම් සහිතව හටගත්තාවූ රූපනම්වේ. ඉතරං, මෙයින් අන්‍යවූ සත්විසි රූපතෙමේ; අනිදස්සන රූපංනාම, අනිදස්සන රූපනම්වේ. චක්ඛාදිචඝං, චක්ඛුඝාත දෙදෙන; අඝම්පතතව

සෙන, නොපැමිණිම්වශයෙන්ද; ඝාණාදිත්තායං, ඝ්‍රාණජීවිතා කාය තුන්දෙන; සම්පත්තවසෙන, පැමිණිම්වශයෙන්ද; නොහොත් අසම්පත්තවසෙන, නොපැමිණිම්වශයෙන්; (පවත්තා) චක්ඛාදිවත්ථං හවඟත්තාවූ චක්ඛුසොත දෙදෙනද; සම්පත්ත වසෙන, පැමිණිම්වශයෙන්, (පවත්තං) ඝාණාදිත්තයං, භව ඟත්තාවූ ඝාණජීවිතාකාය යන තුන්දෙනද, ඉති, මෙසේ; පච විඤ්ඤපි, පස්වැදෑරුම්වූද රූපතෙමේ; ගොචරග්ගාහික රූපං නාම, ගොචර ග්‍රාහික රූපතමේවි. ඉතරං, මෙයින් අන්‍යවූ තෙවිසි රූපය; අගොචරග්ගාහික රූපංනාම, අගොචරග්‍රාහික රූපතමේවි. වණ්ණගන්ධ, රූපාලම්බණයද; ගන්ධොව, ගන්ධා ලම්බ ණයද; රසොව, රසාලම්බණයද; ඔජාව, ආහාර රූපයද; භූත චතුක්කංව, භූතචතුෂ්කයද, ඉති, මෙසේ; අට්ඨවිධම්පි, අටවැදෑ රුම්වූද රූපතෙමේ; අභිනිඛ්භාගරූපං, වෙන් වෙන්කිරීමට නො හැකි රූපතමේවි. ඉතරං, මෙයින් අන්‍යවූ විසිරූපතෙමේ; විභාගරූපං, වෙන් වෙන්කොටහැකි රූපතමේවි.

ඉච්චවං, ඉති එවං (යථාවුත්තනයෙන) මේ යථොක්ත ක්‍රමයෙන්; අට්ඨසතිවිධම්පි, අටසියවැදෑරුම්වූද; රූපං, රූපය; මෙහි "ච" ශබ්දය එවකාරාර්ථයි. යථාරහං, සුදුසු පරිදි දෙන්; අජ්ඣත්තිකාදි භෙදෙන, අජ්ඣත්තික රූපාදීන්ගේ ප්‍රභේදයෙන්; විභජකෙණ, අර්ථ දැක්වීමට ඉගැන්වීමෙහි දක්ෂ පණ්ඩිතයෝ තුමූ; විභජන්ති, විභාග කෙරත්.

අථං, මේ කියනලද්දේවතාහි; එත්ථ, මේ රූපසංග්‍රහයෙහි, හෙවත් රූපසමුදෙදෝදී පඤ්චසමුදයන් අතුරෙන්; රූපවිභා ගො, රූපයන්ගේ බෙදීමය.

—o—

කම්මච, කර්මාවචර කුශලය; අකුශලය යන විසිවැදෑරු ම්වූ කර්මයද; විපාකත්ථ, සතර අරූපාවචර විපාකය දෙපස්විසූදු ණය රහතුන්ගේ චුති චිත්තය යනමොවුන් විසින් සොරකරණ ලද්දාවූ පන්සැත්තෑවක් චිත්තයද; උතුව, ශික්ෂාකාම සංඛ්‍යාත සෘතුවද; ආහාරොව ඉති, ආහාරයද යන, චත්තාරි, සතරකාර ණයෝ තුමූ; රූපසමුට්ඨානානි නාම, රූපයන් උපදවන්නාවූ හෙතුහුතම්මෙත්. තත්ථ, ඒ සතරාකාර හෙතූන් අතුරෙන්; කාමාවචරච, කාමාවචර කුශලා කුශල විස්දෙනද; රූපාවචරච; රූපාවචර කුශල කර්මයෝ පස්දෙනද; ඉති, මෙසේ; පචවිඤ්ඤති විධම්පි, පස්විසි වැදෑරුම්වූද; කුසලා කුසල කම්මං, කුශලා කුශල කර්මයමේ; අජ්ඣත්තිකා සන්තානෙ, අධ්‍යාත්මික සන්තා නයෙහි; අභිසඞ්ඛතං, සකස්කරණලද්දාවූ; කම්මසමුට්ඨාන රූපං, කර්මය උත්පත්තිහාරණාකාට ඇත්තාවූ රූපය හොඳහාත්

කම්මයෙන් ඔටගත්තා රූපය; පටිසන්ධිමූලපාදය, ප්‍රතිසන්ධි චිත්තය පටන්; ඛණෙ ඛණෙ, ක්ෂණයක් ක්ෂණයක් පාසා; නොහොත් එකෙකි චිත්තයාගේ තුන් තුන් ක්ෂණයෙහි; සමුඛාපෙති, උපදවයි; අරූප විපාක විපච්චිඤ්ඤාණවජ්ජිතං, අරූප විපාක සතරය දෙපස් විඤ්ඤාණය රහතුන්ගේ චුති චිත්තය යන මොවුන් විසින් නොරකරණලද්දාවූ; පවත්තනිච්ඡමපි, පන්සැත්තැ වක් ප්‍රභෙදවූද; චිත්තං, සිත්තෙමේ; චිත්ත සමුඛාතරූපං, සිතම කාරණකොට ඇති රූපය නොහොත් සිතින් ඔටගන්නාවූ රූපය; පඨමභවඞ්ගමූපාදය, ප්‍රතිසන්ධි චිත්තයට අනතුරුව ඔට ගත්තාවූ පළමුවෙනි භවාඞ්ගයාගේ උත්පාදක්ෂණයෙහි පටන්; ජායනත්ං එව, උපදිනු ලබම්න්ම; හෙවත් උත්පාදක්ෂණය හිමි; අජ්ඣත්තික සන්තානෙ, අධ්‍යාත්ම සන්තානයෙහි; සමුඛා පෙති, චිත්තජ රූපය උපදවයි. තත්ථ, එක් සැත්තැවක් ප්‍රභෙදවූ චිත්තයන් අතුරෙන්; අපපණාජවනං, සවිසි අපිණා ජවන් තෙමේ; ඉරියාපථම්පි, ඊර්‍ය්‍යාපථයද; නොහොත් යාමි ඉදිමි සිටිමි සයනයකිරීමි සංඛ්‍යාත ඊර්‍ය්‍යාපථයද, සන්තානෙති, මොහ වටනමයි, හෙවත් ඛිඩාකාරවයි. මොත්තපන කාමාවචර ජව නාභිඤ්ඤුපන, ව්‍යවස්ථාපන චිත්තය කාමාවචර ජවන් එකුන් තිසය, අභිඥාකුසල ක්‍රියාවෝ දෙදෙනාය යනමොහුවනාහි; විඤ්ඤත්තිම්පි, කායවාක් විඤ්ඤත්ති සංඛ්‍යාත විකාරයද; සඞ්ඛා පෙන්ති, උපදවත්. පන, විශෙෂාර්‍ථයක් දක්වම්:—එහි, මේ විඤ්ඤත්තිය උපදවන්නාවූ ව්‍යවස්ථාපන චිත්තය කාමාවචර ජවන් එකුන්තිසය අභිඥාදෙසිතය යනමොවුන් අතුරෙන්; තෙරස්සොමනස්ස ජවනානි, තෙළෙස් ප්‍රකාරවූ සොම්නස් සහ ගත ජවනයෝ තුමූ; හසනම්පිජනෙන්ති, සිනාවද උපදවත්. සිතුණෙහාතු ඔමඤ්ඤත්තා,සිත උතු උණහ උතුයයි කියනලද්දාවූ; තෙජෝධාතු, තෙජෝධාතු නොමෝ; සීතිපපත්තාව, තමාගේ ඕතිකාලයයි කියනලද්දාවූ එකුන්පණස් කුඩා ක්ෂණයන්ට පැමි ණියේම; උතුසමුඛාන රූපං, සෘතුව කාරණකොට ඇත්තාවූ රූපය; නොහොත් සෘතුවෙන් ඔටගන්නාවූ රූපය; අජ්ඣත්තඤ්ච, අධ්‍යාත්ම සන්තානයෙහිද; බහිඛා ච, බහිර්ධා සන්තානයෙහිද; යථාරහං සමුඛාපෙති, සුදුසු පරිද්දෙන් උපදවයි. ඔජාඤ්ඛතා, ඔජාගය කියනලද්දාවූ; ආහාරෝ, ආහාරයතෙමේ;ආහාරසමුඛාන රූපං, ආහාරයම කාරණකොට ඇත්තාවූ රූපය නොහොත් ආහාරයෙන් ඔටගන්නාවූ රූපය; අජ්ඣොහරණකාලෙ, ගිලින් නාවූකාලයෙහි; ඨානපපත්තොව, තමාගේ ඕතිකාල සංඛ්‍යාතවූ එකුන්පණස් කුඩා ක්ෂණයන්ට පැමිණියේම නොහොත් ආමාශ

සංඛ්‍යාතවූ සථානයෙහි තැන්පත්වූයේම; අජඞ්ඝනතඝනතානෙ, අඞ්ඝාතම් ඝනතාතඝයහි; සමුඞ්ඝාපෙති, ආහාරජරූප උපදවයි. තව්, ඒ රූප සමූහයා අතුරෙන්; හදය ඉන්ද්‍රිය රූපානි, හෘදය රූපය ඉන්ද්‍රියරූපය යාමොහු; කම්මජානෙව, කර්‍මයෙන්ගටගන් නාහුම වෙත්. විඤඤත්තිවයං, විඥප්තිරූපවය; චිත්තජමේව, සිතින්ම ගටගන්නේයි ඇදෙ, ශබදය හෙළුම්; චිතතොතුජෝ, චිත්ත් හා සෘතුවෙන් ගටගන්නේයි, ලහුතාදිත්තයං,රූපසස ලහුතා රූපසස මුදුතා රූපසස කම්මඤඤතා යන රූපත්‍රය;උතුචිත්තා හාරෙහි, සෘතු චිත්ත ආහාර යන තුන්දෙන හෙතුකොටගණ හෙවත් සෘතුවෙන් හෝ චිත්තයෙන් හෝ ආහාරයෙන් හෝ; සමොහානි, ගටගණි. අවිනිබෙහාග රූපාකිවෙව, සුඛඨවිකරූප සංඛ්‍යාතවූ ඔජඨවිකරූපයෝද; ආකාසධාතුව්, පරිවෙජදූසණ ධාතුවිද; චතුහි, සතර රූපසමුඨානයන් හෙතුකොටගෙණ වෙන වෙනම්; සම්භූතානි, ගටගන්නාහුවෙත්. ලකඛණ රූපානි,ලක්ෂණරූපයෝ සතරදෙන තුමූ; කුතොව්, කිනි රූප ජනක ප්‍රත්‍යයකින්; නජානනති, නූපදනාහුවෙත්.

කම්ම-පෙ-ජානි, කර්‍මජ චිත්තජ උතුජ ආහාරජ රූපයෝ තුමූ; යථාකකමං, පිළිවෙළින්; අඨාරසාතිව, අටළොස් ප්‍රභෙද ඇත්තාහුද; හොනති, වෙත්; පණණරසාතිව, පසළොස් ප්‍රභෙද ඇත්තාහුද වෙත්; තෙරසාතිව, තෙළෙස් ප්‍රභෙද ඇත්තාහුද වෙත්; වාදසාතිව, දොළොස් ප්‍රභෙද ඇත්තාහුද වෙත්.

කෙවලං, හුදෙක්; ජාඨමාතාදිරූපානං, උපදිනුලැබීම් ආදීවූ නිඵපන්නරූපයන්ගේ; සහාවතතාහි, (සහාවතො යේව) සවභාවක් වන හෙයින්ම; ලකඛණානි, ලක්ෂණරූපයෝ සතරදෙනතුමූ; කෙහිචි, යම්කිසි රූපජනක ප්‍රත්‍යයකින්; නජානනතීති, නොහටගණිත්යයි; පකාසිතං, ප්‍රකාශකරණ ලදදේයි.

අයං, මේ කියනලදදේ වතාහි; එහි, මේ රූප සඞ්ඛ්‍යාය යෙහි නොහොත් රූපසමුදෙසාදී පව පරිවෙජදයන් අතුරෙන්; රූපසමුඨානතයො, රූපසමුඨාන ක්‍රමයයි,

එකුපපාද, එක්ව හටගැණීම් ඇත්තාවූ; නොහොත් සමාන හටගැණීම් ඇත්තාවූ; එකනිරොධා, එක්ව නිරුඛවීම් ඇත්තාවූ; නොහොත් සමානනිරුඛවීම් ඇත්තාවූ; සහවුතතිතො,එක්ව හට ගැණීම් ඇත්තාවූ; නොහොත් වෙන් වෙන්වූ කලාපයෙහි පිහිටියාවූ රූපයන්ගේ විශයෙන් එක්ව හටගැණීම් ඇත්තාවූ; එක විසති, එක්විසි රූපසමූහයෝතුමූ; රූපකලාපානාම, රූපකලාපයෝ නම්වෙත්. තව්, ඒ එක්විසි රූපකලාපයන් අතුරෙන්; ජීවි

තඤ්ච, ජීවිතරූපයද; අවිනිබෙහොගරූපඤ්ච, අවිනිර්භොග ශුද්ධාෂ්ටක රූපයද; චක්ඛුනාසහ, චක්ඛුප්පසාදඤ භා සමග; චක්ඛුදස කනති, චක්ඛුදීශකයයි; පවුච්චති, කියනුලැබේ හෙවත් චක්ඛුප්පසාද යෙන් නියමකටයුතුවූ රූපයන් දසදෙනාගේ සමූහයයි; පවුච්චති, ප්‍රභෙදවශයෙන් කියනු ලැබේ. තථා, එපරිද්දෙන්; සොතාදීහි සඞ්ගං, ශ්‍රොත්‍රාදශකාදීන් භා සමග; නොහොත් ශ්‍රොත්‍රප්‍රසාද ඝ්‍රාණ ප්‍රසාද ජිව්හාප්‍රසාද කායප්‍රසාද ඉත්ථිභාවදසකඤ පුම්භාවදසකඤ භාදශවස්තු දශකඤ යන මොවුන් භා සමග; සොතදසකනතිව, ශ්‍රොත්‍රදසකඤයි කියාද නොහොත් ශ්‍රොත්‍රප්‍රසාදයෙන් නියම කටයුතුවූ රූපයන් දසදෙනාගේ සමූහයද; ඝාණදසකඤ්ච, ඝ්‍රාණ දශඤයයි කියාද නොහොත් ඝ්‍රාණප්‍රසාදයෙන් නියමකටයුතුවූ රූපයන් දශදෙනාගේ සමූහයද; ජිවහාදසකඤ්ච, ජිවහාදශකඤයයි කියාද නොහොත් ජිවහාප්‍රසාදයෙන් නියමකටයුතුවූ රූපයන් දසදෙනාගේ සමූහයද; කායදසකඤ්ච, කායදසකඤයයි කියාද; නොහොත් කායප්‍රසාදයෙන් නියමකටයුතුවූ රූපයන් දශදෙනා ගේ සමූහයද; ඉත්ථිභාවදශඤ්ච, සත්‍රිභාව දශකයයි කියාද නොහොත් සත්‍රිභාවයෙන් නියමකටයුතුවූ රූපයන් දසදෙනා ගේ සමූහයද; පුමභාවදසකඤ්ච, පුම්භාවදශකයයි කියාද; නොහොත් පුම්භාවයෙන් නියමකටයුතුවූ රූපයන් දසදෙනාගේ සමූ හයද; වත්ථුදසකඤ්ච, වස්තුදශකයයි කියාද නොහොත් භෘදය වස්තුවෙන් නියමකටයුතුවූ රූපයන් දසදෙනාගේ සමූහයයි කියාද; පවුච්චති, ප්‍රභෙදවශයෙන් කියනු ලැබේ. ඉති, මෙයේ; යථාක්කමං, පිළිවෙළින්; යොජෙතබ්බං, යෙදිය යුතුයි. අවි නිබෙහොගරූපමෙව, අවිනිබෙහොගසුඛාෂ්ටක රූපයම; ජීවිතෙන සහ ජීවිතෙන්ද්‍රිය භා සමග; ජීවිතනවකනති, ජීවිත නවක කලාපයයි කියාද නොහොත් ජීවිතෙන්ද්‍රියයෙන් සලකුණු කටයුතුවූ නවක කලාපඤයි කියාද; පවුච්චති, ප්‍රභෙදවශයෙන් කියනු ලැබේ ඉති, මෙසේ; ඉමෙනව, මේ රූපකලාපයෝ නවදෙන; කම්මසමුට්ඨාන කලාපානංච, කර්මයෙන් හටගන්නා රූපකලාප යෝ නම් වෙත්.

පන, කර්මජකලාපයෙහි අනාවූ චිත්තජකලාපයන් දක්වමි:- අවිනිබෙහොගරූපං, අවිනිබෙහොගරූපයන් අටදෙන; සුඛට්ඨකං හොති, අමිශ්‍රවූ අෂ්ටකය නම් වෙයි. තදෙව, ඒ ශුද්ධාෂ්ටක කලාප යම්; කායවිඤ්ඤත්තියා සහ, කායවිඤ්ඤත්තියද භා සමග; කාය විඤ්ඤත්තිනවකඤ්ච හොති, කායවිඤ්ඤත්ති නවක කලාපයක්ද වෙයි; වචීවිඤ්ඤත්තියාදෙඞ්ග සහ, වාක්විඥප්ති ශබ්දයන් භා සමග; වචීවිඤ්ඤත්තිදසකඤ්චහොති, වචීවිඤ්ඤත්ති දශකකලාප

යෙක්ද වෙයි. ලහුතාදීහි සඬිං, ලහුතා මුදූතා කම්මඤ්ඤතා යන රූපත්‍රය සමඟ; ලහුතාදෙකාදසකං, ලහුතාදී එකාදශක කලාප යෙක්ද වෙයි; කායවිඤ්ඤත්ති ලහුතාදීවාදසකං, කාය විඤ්ඤත්ති ලහුතාදී වාදශක කලාපයෙක්ද වෙයි; වචීවිඤ්ඤත්තිසද්දලහුතාදි තෙරසකඤ්චති, වාග්විඤ්ඤත්ති ශබ්ද ලහුතාදී තෙරසක කලාප යෙක්ද වෙයි; ඉති, මෙසේ; ඡ, (ඉමේරූපකලාපා) මේ සවිඤ්ඤාණ රූපකලාපයෝ තුමූ; චිත්තසමුට්ඨානකලාපා (නාම) සිතින් හට ගන්නා රූපකලාපයෝ නම් වෙත් නොකොත් චිත්තය උත් පත්තිකාරණයකට ඇති රූපකලාපයෝ නම් වෙත්.

සුඛට්ඨකං, ශුද්ධාෂ්ටක කලාපයෙක්ද; සද්දනවකඤ්ච, ශබ්ද නවක කලාපයෙක්ද; ලහුතාදෙකාදසකඤ්ච, ලහුතාදී එකාදසක කලාපයෙක්ද; සද්දලහුතාදිවාදසකඤ්ච, ශබ්ද ලහුතාදී වාදශක කලාපයෙක්ද, ඉති, මෙසේ; චත්තාරෝ (ඉමේ රූපකලාපා) මේ රූපකලාපයෝ සතරදෙන තුමූ; උතුසමුට්ඨාන කලාපා (නාම) ඍතුවෙන් හටගන්නා රූපකලාපයෝ නම්වෙත්; හෙවත් ඍතු ය උපත්ති කාරණයකට ඇති රූපකලාපයෝ නම් වෙත්.

සුඛට්ඨකඤ්ච, ශුද්ධාෂ්ටක කලාපයෙක්ද; ලහුතාදෙකාදස කඤ්ච, ලහුතාදී එකාදශක කලාපයෙක්ද; ඉති,මෙසේ; වේ(ඉමේ රූපකලාපා) මේ රූපකලාපයෝ දෙදෙන තුමූ; ආහාරසමුට්ඨාන කලාපා (නාම) ආහාරයෙන් හටගන්නා රූපකලාපයෝ නම් වෙත්.

තත්‍ර, ඒ එක්විසි රූපකලාපයන් අතුරෙන්; සුඛට්ඨකඤ්ච, ශුද්ධාෂ්ටක කලාපයද; සද්දනවකඤ්ච, ශබ්දනවක කලාපයද; ඉති, මෙසේ; වේ උතුසමුට්ඨානකලාපා, ඍතුනවත් හටගන්නා රූප කලාපයෝ දෙදෙන; බහිද්ධාපි, (ඇතැම් තැනෙන්) පිටත්හිද; හෙවත් පෘථිවි පර්වත ගඟා සමුද්‍ර මෙඝ ගර්ජිතාදියෙහිද; ලබ්භති, ලැබිය යුත්තාහු වෙත්; පන, සාධාරණයෙන් අන්‍යවූ අසාධාර ණය කියමි:—අවසෙසා උතුසමුට්ඨානරූපකලාපයන් දෙදෙනා තෙරෙන් අවශිෂ්ටවූ සබ්බපි, සියලුම; (එකූනවීසතිරූපකලාපා) එකුන්විසි රූපකලාපයෝ; අජ්ඣත්තිකතොවෙව, අධ්‍යාත්ම සන්තානයෙහිම; ලබ්භන්ති, ලැබිය යුත්තාහු වෙත්.

කම්මවිඤ්ඤත්තාහාරසමුට්ඨානා, කර්මය චිත්තය ඍතුය ආහාරය යන මේ සතර ප්‍රත්‍යයෙන් හටගන්නාවූ රූපකලාපයෝ තුමූ; යථාක්කමං, පිළිවෙළින් හෙවත් අනුරූප දක්වන සඞ්ඛ්‍යා ක්‍රමයෙන්; තවව (හොත්), කම්මජකලාපයෝ නවදෙනෙක්ද වෙත්; ඡව (හොත්), චිත්තජකලාපයෝ නවදෙනෙක්ද වෙත්; ඡව (හොත්), චිත්තජකලාපයෝ

සදෙනෙක්ද වෙත්; චතුරෙව (හොතති,) සෘතුවෙන් හටගන්නා රූපකලාපයෝ සතරදෙනෙක්ද වෙත්; මෙව (හොතති,) ආහාරයෙන් හටගන්නා රූපකලාපයෝ දෙදෙනෙක්ද වෙත්; ඉති, මෙසේ; කලාපා, රූපකලාපයෝ තුමූ; එකවීසති (සියුං,) එක්විසි දෙනෙක් වෙත්.

ඉතා ඤංච, පරිවෙජදුකාඝධාතුවද; ලක්ඛණානිච; ලක්ෂණ රූපයෝ සතරදෙනද; ඉතා ඝලක්ඛණානං, ඉතා ඝධාතූ ලක්ෂණ රූප. සතරදෙනාගේ; කලාපානං, කලාපයෝ හෙවත් කලාපයන්ගේ; පරිවෙජදලක්ඛණතා, වෙන්කිරීම් සලකුණු බැවින්; කලාපඛඤං ඉති, රූපකලාපයන්ගේ අඛණයයි; විවක්ඛණා, අවිවක්ෂණයෙහි දක්ෂවූ පණ්ඩිතයෝ තුමූ; තඉහු, තොකිවාහුය.

අඤං, මේ කියනලද්දේ වනාහි; එත්ථ, මේ රූපසඛ්‍රහයෙහි; කලාපයොජනා, රූපකලාපයන්ගේ යෙදීමයි.

—— ० ——

පන, රූපකලාපක්‍රමයෙන් අන්‍යවූ රූපප්‍රවෘත්තිය දක්වම්:— ඨඛ්බානිපිතානිරූපානි, ඒ සියලුරූපයෝම; කාමලොකෙ, කාම ධාතුයෙහි; ඨථාරහං, සුදුසුපරිද්දෙන්; පවත්තියං, ප්‍රවෘත්තිය සංඛ්‍යාතවූ; ප්‍රතිසන්ධිචුතිදෙදෙනා අතර කාලයෙහි; අනූනානි, නොඅඩුවූවාහු; උපලබහන්ති, ලබන්නාහුය.

පන, ප්‍රවෘත්තිකාලයෙන් අන්‍යවූ ප්‍රතිසන්ධි කාලය දක්වම්:— පටිසන්ධිඤං, ප්‍රතිසන්ධිකාලයෙහි; සංසෙදජාතසත්ත්වව, පණුවන් ආදී සංශේදජසත්ත්වයන්ටද; ඔපපාතිකානඤ්ච, විශිෂ්ටවූ උපපාතිකය ඇති සත්ත්වයන්ටද; නොඉතාත් ඕවිම්මහරජ්ජ පවත් සියලු සුගති සත්ත්වයන්ටද; උකකට්ඨවසෙන, උත්කෘෂ්ටවශයෙන්; චක්ඛු-පෙ-වත්ථුදසකඤ්ඣතානි, චක්ෂුදශකය ශ්‍රොත්‍රදශකය ඝ්‍රාණදශකය ජිහ්වාදශකය කායදශකය භාවදශකය වස්තුදශකයයි කියනලද්දුවූ; සත්තදසකානි, දශකයෝ සත්දෙනෙක් තුමූ; පාතුභවන්ති, ප්‍රතිසන්ධිකාලයෙහි එකක්ෂණිකව පහළවෙත්; ඔමකවසෙනපන, අඩුවූකලාපයන්ගේ වශයෙන් වනාහි; චක්ඛු-පෙ-භාවදශකානි, චක්ෂුදශක ශ්‍රොත්‍රදශක ඝ්‍රාණදශක භාවදශක යන මොහු; කදාචි චි, ප්‍රථමකල්පාදී ඇතැම් කලෙක්හි; නලබහන්ති, නොලැබිය යුත්තාහු වෙත්; තසමා, එසේහෙයින්; තෙසංවසෙන, ඒ නොලැබෙන්නාවූ කලාපයන්ගේ වශයෙන්; කලාපඤානි වෙදිතබ්බා, කලාපයන්ගේ අඩුවීම තොමෝ දතයුත්තියි.

පන, සංසෙදජඔපපාතික සත්ථන්ගේ අන්‍යවූ ගබ්භසෙය්‍යක ප්‍රතිසන්ධිය දක්වමි:— ගබ්භසෙය්‍යක සත්තානං, මව්කුස හට ගන්නා සත්ථන්ට; කාය-පෙ-සඞ්ඛාතානි, කායදශකය පුරුෂ යන්ට පුරුෂභාව දශකය සත්‍රීන්ට සත්‍රීභාවදශකය .වසතුදශක යයි කියනලද්දුවූ; තීණි, දශකයෝ තුන්දෙනෙක් තුමූ; පාතු භවන්ති, පහළවෙත්. තඤ්ඤේව, ඒ තුන්කලාපයන් අතුරෙහුදු භාවදසකං, භාවිදශකය; කදාචි, ඇතැම් කලෙක්හි; නලබ්භති, නොලැබිය යුත්තේයි. තතෝ පරං, ඒ ප්‍රතිසන්ධිකාලයෙන් මත් තෙහි; පවත්තිකාලෙ, චුතිය දක්වා ඇත්තාවූ ප්‍රවෘත්තිකාලයෙහි; චක්ඛුදසකාදීනිව, චක්ෂුර්දශකාදීහුද; නොහොත් චක්ඛු සොත ඝාණ ජීවිතාදසකයෝද: කමෙන, පිළිවෙළින්; පාතුභවන්ති, පහළවෙත්.

ඉවෙවවං, යථොක්ත ක්‍රමයෙන්; පටිසන්ධිමූපාදාය, ප්‍රතිසන්ධි චිත්තයාගේ උත්පාදක්ෂණයපටන්; කම්මසමුට්ඨානා, කර්‍මයෙන් හටගන්නා රූපකලාපයෝ තුමූ; පවත්තන්ති, පහළවෙත්. දුතිය චිත්තමුපාදාය, ප්‍රතිසන්ධිචිත්තයට දෙවෙනිව පහළවන්නාවූ පළමු වෙනි භවාඞ්ගයාගේ උත්පාදක්ෂණය පටන්; චිත්තසමුට්ඨානා, සිතින් හටගන්නාවූ රූපකලාපයෝ තුමූ; පවත්තන්ති, හට ගණිත්. සීතිකාලමුපාදාය, ප්‍රතිසන්ධි චිත්තයාගේ සීතිකාලය පටන්; උතුසමුට්ඨානා, සෘතුවෙන් හටගන්නාවූ රූපකලාපයෝ තුමූ, පවත්තන්ති, හටගණිත්. ඔජාඵරණමුපාදාය, ගර්භයෙහි උපන් තැනැත්තහුගේ ගර්භාවස්ථ පිහිටා ජීවිතනවක කලාපයාගේ තෙජෝධාතුව දීපතිමත්වූ තැන් පටන් මවගේ ආහාර ඔජාව පැතිරීම හෙතුකොටගෙණ; ආහාරසමුට්ඨානා, ආහාරයෙන් හට ගන්නා රූපකලාපයෝ තුමූ; පවත්තන්ති, හටගණිත්. ඉති, මෙසේ; චතුඋසමුට්ඨානරූපකලාප සන්තති, සතර සමුට්ඨානයන් ගෙන් හටගන්නා රූපකලාපයන්ගේ පරම්පරාතොමෝ; කාම ලොකෙ, එකොළොස් කාමභූමියෙහි; දීපජාලාවියව, පහන් සිළුවෙන් හටගන්නා පහන් දැලක්මෙන්ද; නදිසොතොවියව, ගඞ්ගා ප්‍රවාහයක්මෙන්ද; යාවතායුකං, දිවිඇතිතාක් කල් මුළුල් ලෙහි; අඛ්ඛාවච්ඡින්නා, නොසිඳහලද්දී; පවත්තති, හටගණිමින් බිඳෙමින් පවත්නේයි.

පන, රූපයන්ගේ හටගැණීමෙන් අන්‍යවූ භඞ්ගය දක්වමි:— මරණකාලෙ, මරණයට ආසන්නවූ කාලයෙහි; චුතිචිත්තොපරි, චුතිචිත්තයෙන් මත්තෙහි, සත්තරසමචිත්තසඤ්ඤ, ප්‍රතිලාභයෙන් නිමූ තැල්හි සත්තලාස්වන චිත්තයාගේ; සීතිකාලමුපාදාය, සීති

කාලය පවත්; කම්මජරූපානි, කර්මයෙන් හටගන්නාවූ රූප කලාප අවදෙන වකාහි; න උපපජ්ජනති, නූපදිත්; පුරෙතරං, චුතිචිත්තයට මත්තෙහි සතලොස්වන චිත්තක්ෂණයේ උත්පාද ක්ෂණයෙහි නොහොත් චුතිචිත්තය පවත් ප්‍රතිලෝමයෙන් ගිණූ කල්හි සත්තලොස්වන චිත්තයාගේ උත්පාදක්ෂණයෙහි; උපපන්නානි, උපන්නාවූ; කම්මජරූපානිච, කර්මජරූපයෝද; චුතිචිත්තසමකාලමෙව, චුතිචිත්තයට සමානවූ කාලය මූලුල්ලෙහිම; පවත්තිත්වා, පැවත; නිරුජ්ඣන්ති, නිරුද්ධවෙත්. තතොපරං, ඒ කර්මජ රූපයන්ගේ නිරුද්ධවීමෙන් මත්තෙහි; චිත්තජාහාරජ රූපඤ්ච, චිත්තජ ආහාරජ රූපයද; වොච්ඡිජ්ජති, විශෙෂයෙන් සිදෙන්නේය. තතොපරං, ඒ චිත්තජ ආහාරජ රූපයන්ගේ නිරුද්ධවීමෙන් මත්තෙහි; උතුසමුට්ඨානරූපපරම්පරා, ඍතුවම කාරණා කොට ඇත්තාවූ රූපකලාපයන්ගේ පරම්පරාවෝ; යාව මතකලෙබරඤ්ඣාතා, මැරීමෙන් මතෙතෙහි මෘතශරීරයයි කියන ලද්දවූ ධර්මපුඤ්ජය දක්වා; පවත්තන්ති, හටගණිමින් පවත්නා හුය.

ඉච්චෙවං, ඉතිඑවං, (යථාවුත්තනයෙන) මෙසේ කියනලද ක්‍රමයෙන්; "ඉහහවේ" යනු පාඨශෙෂයි. මේ ප්‍රත්‍යුත්පන්න භවයෙහි; පටිසන්ධිමූපාදාය, ප්‍රතිසන්ධිචිත්තයාගේ; උත්පාදක්ෂණය පවත්; රූපං, චතුසමුට්ඨානික රූපතෙමේ; යථාපවත්තති, යම් සේ හටගණිද; තථා, එපරිද්දෙන්; මතඤ්ඤානං, මළාවූ සත්ත්වයන්ට; පුනදෙව, කැවතද; භවන්තරෙ, අනාගතභවයෙහි; පටිසන්ධිමූපාදාය, ප්‍රතිසන්ධිචිත්තයාගේ උත්පාදක්ෂණය පවත්; රූපං චතුසමුට්ඨානික රූපතෙමේ; පවත්තති, හටගණිමින් පවත්නේය.

——o——

පන, කාම්භූමියෙහි හටගන්නා රූපයෙන් අන්‍යවූ රූප භූමියෙහි හටගන්නා රූපයන් දක්වම්:—රූපලොකෙ, රූපභූමියෙහි කාණ-පෙ-භාවදසකානිච, ශ්‍රාණදශකය ජිව්හාදශකය කායදශකය භාවදශකය යන මේ කර්මජ රූප කලාපයෝද; ආහාරජ කලාපානිච, ආහාරජ කලාපයෝද; නලබ්භන්ති, නොලැබියයුත්තාහුවෙත්; තස්මා, එසේ නොලැබෙනයෙයින්; තෙසං, ඒ රූපී බ්‍රහ්මයන්ට; පටිසන්ධිකාලෙ, ප්‍රතිසන්ධිකාලයෙහි; චක්ඛුදසකඤ්චවත්ථුවසෙන, චක්ෂුදශකය ශ්‍රොත්‍රදශකය වස්තු දශකය යනමොවුන්ගේවශයෙන්; තීණිදසකානිච, තුන් දශකයෝද; ජීවිතනවකඤ්ච, ජීවිතනවකය කලාපයද; ඉති, මෙසේ;

චත්තාරෝ කම්මසමුට්ඨානකලාපා, කම්මෙන් හටගන්නා රූප කලාපයෝ සතරදෙනා; ලබ්භන්ති, ලැබියයුත්තාහුවෙත්. පවත්තියං, ප්‍රවෘත්තිකාලයෙහි; චිත්තෙනාතු සමුට්ඨානාව, චිත්තයෙන් හා සෘතුවෙන් හටගන්නා රූපකලාපයෝද; ලබ්භන්ති, ලැබියයුත්තාහුවෙත්.

පන, විශෙෂාර්ථයක් කියමි:--අසඤ්ඤසත්තානං, අසංඥ සත්වයන්ට; චක්ඛුසොතවත්ථුඝානිපි, චක්ෂුශ්‍රොත්‍ර වස්තු ඝ්‍රාණ ශබ්ද යෝද, නලබ්භන්ති, නොලැබියයුත්තාහුවෙත්. තථා, එපරිද්දෙන්; සබ්බානිපි චිත්තජ රූපානි, සියලු චිත්තජ රූපයෝද; නලබ්භන්ති, නොලැබියයුත්තාහුය. තසමා, එසේ නොලැබිය යුතුහෙයින්; තෙසං, ඒ අසංඥතලවාසීන්ට; පටිසන්ධිකාලෙ, ප්‍රතිසන්ධි කාලයෙහි; ජීවිතනවකමෙව, ජීවිතනවක රූපකලාප මාත්‍රයක්ම; (හොති) වන්නේයි. පවත්තියංව, ප්‍රවෘත්තිකාලයෙහිද; සද්දවජ්ජිතං, ශබ්දය හැරකොට ඇත්තාවූ; උතුසමුට්ඨාන රූපං, සෘතුවමුත්ථාපන කොට ඇත්තාවූ රූපතෙමේ; අනිරිවත්තති, අවශිෂ්ටවන්නේයි. ඉවෙවං, ඉතිඑවං යථාවුත්තනයෙනෙව, මේ යථොක්තක්‍රමයෙන්; කාමරූපාසඤ්ඤීසඛ්‍යාතෙසු, කාමභූමිය රූපභූමිය අසංඥ සත්ව භූමියයි කියනලද්දාවූ, තීසුඨානෙසු, තුන්ස්ථානයෙහි; පටිසන්ධි පවත්තිවසෙන, ප්‍රතිසන්ධි ප්‍රවෘත්තීන්හේවශයෙන්; දුවිධා, විප්‍රකාරවූ; රූපප්පවත්තී, රූපයන්ගේ හටගැන්ම; වෙදිතබ්බා, දතයුත්තීය.

කාමෙසු, එකොළොස් කාමභූමියෙහි; අට්ඨවිසති, අවවිසි රූපතෙනෙක්වෙත්. රූපීසු, අසංඥ සත්වවර්ජිත පසළොස් රූප භූමියෙහි; තෙවීස හොනති, තෙවිසි රූපතෙනෙක්වෙත්; අසඤ්ඤීනං, අසංඥ සත්වයන්ට; සත්තරසෙව, සතළොස් රූපතෙනෙක්මවෙත්; අරූපෙ, සතර අරූප භූමියෙහි; කිඤ්චි, කිසි රූපයෙක් නොමේ; නත්ථි, නැත්තේයි.

උපපත්තියං, ප්‍රතිසන්ධි කාලයෙහි; සද්දෙව, ශබ්දයද; විකාරොව, විකාර රූපයද; ජරතාව, ජරතා රූපයද; මරණංව; අනිච්චතා රූපයද; නලබ්භන්ති, නොලැබිය යුත්තාහුවෙත්. තු, නොලැබෙන්නාවූ රූපයන්හෙන් අන්‍යවූ ලැබියයුතුවූ රූපයන් දක්වමි:—පවත්තෙ, ප්‍රවෘත්ති කාලයෙහි; කිඤ්චි, කිසිද රූපයක්; නබ්භලති, නොලැබිය යුත්තේය යනු; න, නොවේ. (ලබ්භති එව) ලැබියයුත්තේමැයි.

අයං, මේ කියනලද්දේවතාහි; එසේ, මේ රූපසංග්‍රහයෙහි, රූප පවත්තිඤ්ඤමෝ, රූපඋත්ගේ ප්‍රවෘත්තික්‍රමයයි.

—— ० ——

පන, රූපයෙන් අන්‍යවූ නිර්‍වාණය කියමි:—නොහොත් චිත්ත චෛතසික රූපඋත්ගෙන් අන්‍යවූ නිර්‍වාණය කියමි:—මඟඵලානං, සතරමාගීඵලඋත්ට; ආලම්බණභූතං, අරමුණුවූ; චතුමඟඤාණේන, සතරමාගීඥානයෙන්; සච්ඡිකාතබ්බං, ප්‍රත්‍යක්ෂ කටයුතුවූ හෙවත් ප්‍රඥානැමති ඇසට හමුකටයුතුවූ; ලොකුත්තරසඞ්ඛාතං, ලොකොත්තරයයි කියනලද්දවූ; නිබ්බානං, නිර්‍වාණය; ධාන සඞ්ඛාතංඇ, සත්වයන් සංසාරවෘත්තයෙහි මසතාදීයෙන් සංසාර වෘත්තයයි කියනලද්දවූ හෙවත් කුඛාභවයෙන් මඟත් භවයද මහත්භවයෙන් කුඛාභවයද එකටමසන්කාවූ බානක් වැනිවූ; තණ්හාඇ, තෘෂ්ණාවෙන්; නිකඛන්තතතා, නික්මගිය හෙයින්; නිබ්බානන්ති, නිර්‍වාණයයි; පවුච්චති, ප්‍රභෙදවශයෙන් කියනු ලැබේ. සභාවතා, තමාගේ සන්සුන් සභාව වශයෙන් නොහොත් තමාගේ කෘත්‍යලක්ෂණ වශයෙන්; එකවිධම්පි, එක් වැදෑරුම් වූයේ නමුදු; තං එතං, (නිබ්බානං), ඒ නිර්‍වාණධාතු නොමේ; සඋපාදිසෙසනිබ්බාන ධාතුව, කෙලෙසුන්ගෙන් අවශිෂ්ටවූ සඤ්ඤාපඤ්චක මාත්‍රයක් සමඟ හවගත්තාවූ; සඋපාදිශෙෂ නිර්‍වාණධාතුවෙක්ද; අනුපාදිසෙසනිබ්බානධාතුව, කෙලෙසුන් ගෙන් අවශිෂ්ටවූද සඤ්ඤාමාත්‍රයක් නැත්තාවූ අනුපාදිශෙෂ නිර්‍වාණධාතුවෙක්ද; ඉති, මෙසේ; කාරණපරියායෙන, හඟවන්නාවූ හෙතූන්ගේ ලෙසමාත්‍රයක් කරණකොටගෙණ; දුවිධං හොති, විප්‍රකාර වේයි. තථා, එයින් අන්‍යවූ; සුඤ්ඤතව, රාග වෙෂ මොහයන්ගෙන් සිස්වූ හෙයින් සුඤ්ඤත නම්වූ නිර්‍වාණ යෙක්ද; අනිමිත්තව, රාග වෙෂ මොහ සඞ්ඛ්‍යාත කාරණයෙන් පහවූ හෙයින් අනිමිත්ත නම් ඇත්තාවූ නිර්‍වාණයෙක්ද; අපප ණිහිතව, රාග වෙෂ මොහ සඞ්ඛ්‍යාත ප්‍රාර්‍ථනාවන් පහවූ හෙයින් අපපණිහිත නම් ඇත්තාවූ නිර්‍වාණයෙක් ද, ඉති; මෙසේ; ආකාරභෙදෙන, විදශීකාවගේ ආකාරභෙදයෙන්; තිවිධංහොති, තුන්වැදෑරුම් වෙයි.

අවවුතං, චුතවීම් සංඛ්‍යාත ගිලිහීමක් නැත්තාවූ; අවච නතං, චුති සංඛ්‍යාත අන්තය ඉක්ම සිටියාවූ නොහොත් ලොක ධාතුවගේ අතිශයින් අනන්තයවූ; අසඞ්ඛතං, කර්‍මචිත්ත ඍතු ආහාර සංඛ්‍යාතවූ හෙතු ධර්‍මයන් විසින් නොසකස්කරණලද්දවූ;

තෙහොත් සංසකාරයන් විසින් උපදවනලද්දාවූ සෙසු සත්වයන් මෙන් නොසකස්කරණලද්දාවූ; අනුත්තරං, තමහට අධික ධර්මයක් නැත්තාවූ; පදං, මෘගීඵලයන්ට ආලම්බණ ප්‍රත්‍යයවූ ධර්මය; නිබ්බානං ඉති, නිර්වාණයයි වානමුත්තා, වාණයයි කියන ලද තෘෂ්ණාවෙන් මිදුනාවූ; මහෙසයෝ, මහාඍෂිවරයෝ තුමූ; භාසන්ති, දෙශනාකෙරෙත්.

ඉති, (එවං යථාවුත්තනයෙන) යථොක්ත ක්‍රමයෙන්; චිත්තං, චිත්තය; චෙතසිකං, චෛතසිකය; රූපං, රූපය; නිබ්බානං ඉති අපි, නිර්වාණයයි කියාද; චතුධා, සතරාකාරයකින් හෙවත් සතර ප්‍රභෙදයකින්ම; පරමත්ථං, පරමාර්ථ ධර්මය; තථාගතා, තථාගතවූ බුදුවරයෝ තුමූ; පකාසෙන්ති, ප්‍රකාශ කෙරෙත්.

අභිධම්මත්ථ සඞ්ගහෙ, අභිධර්මාර්ථ සංග්‍රහයෙහි; රූප සඞ්ගහ විභාගොනාම, රූපසංග්‍රහ විභාගයනම්වූ; ඡට්ඨෝ පරිච්ඡෙදෝ, සවෙනි පරිච්ඡේදය; ඉති, මෙසේ සම්පූර්ණ කරණලද්දේයි.

—o—

(භා.)

උද්දෙශ නිද්දේශ ප්‍රතිනිද්දේශ වශයෙන් පවපරිච්ඡේදයකින් චිත්ත චෛතසිකයන්ගේ විභාගයකොට දැන් වනාහි රූපයාගේ ප්‍රභෙදය දක්වනුලැබේ "පවපරිච්ඡේදය" යනු චිත්ත පරිච්ඡේදය, චෛතසික පරිච්ඡේදය, පකිණ්ණක පරිච්ඡේදය, වීථි පරිච්ඡේදය, භූමි පරිච්ඡේදය, යන පසයි. උද්දෙශ නිද්දෙශ පටිනිද්දෙසයෝ නම්:- චිත්ත පරිච්ඡේදය උද්දෙශනම්. චෛතසික පරිච්ඡේදය නිද්දේශ නම්. පකිණ්ණක පරිච්ඡේදය ප්‍රතිනිද්දේශ නම්. වීථි පරිච්ඡේදය ප්‍රවෘත්ති නම්. භූමි පරිච්ඡේදය ප්‍රතිසන්ධිය දක්වීමනම්වෙයි. මේසේ පව පරිච්ඡේදයකින් චිත්ත චෛතසිකයම විභාගකොට, දැන් වනාහි රූපය විභාග කරණුලැබේ. ඒ කෙසේද යත්? රූපයාගේ නාම මාත්‍රයක් ප්‍රකාශකිරීමනම්වූ උද්දෙශය, සිතින් හටගන්නාවූ රූපය, කර්මයෙන් හටගන්නාවූ රූපය, ශීතොෂ්ණ සංඛ්‍යාතවූ ඍතුවෙන් හටගන්නාවූ රූපය, ආහාරයෙන් හටගන්නාවූ රූපයයි මෙසේ සමුච්චානවශයෙන්ද, මේ මේ රූපයෝ එක්ව හටගන්නාහුයයි කලාපවශයෙන්ද, මේ රූපය මේතැන් පටන් හටගත්තේය. මෙතැන් පටන් නිරුඬවන්නේයයි හටගන්නා ක්‍රමය ප්‍රකාශ

කිරීම්වශයෙන්ද, යනමේ පස් ආකාරයෙන් රූපසංග්‍රහය දක්වනුලැබේ. ඒ පස් ආකාරයන් අතුරෙන් රූපනිද්දේශයාගේ අභිප්‍රාය මෙසේයි. ඒ කෙසේද? සියලුම රූප තෙමේ භූතරූපය උපාදා රූපයයි විප්‍රකාරවෙයි. ඔවුන් අතුරෙන් මහාභූත රූප ශෝවනාකි එක් භූතයෙක් තෙමේ භූතත්‍රයක්ද, භූතයෝ තුන් දෙනෙක් තුමූ එක් භූතයක්ද, භූතයෝ දෙදෙනෙක් තුමූ භූතයෝ දෙදෙනෙක්ද නිශ්‍රයකොට ගන්නාහුවෙත්. උපාදාය රූපයෝ වනාහි සතර මහාභූතයෝම නිශ්‍රයකොටගෙණ හට ගන්නාහුවෙති. ඉදින් භූත රූපයෝද එක් භූතයෙක් හෝ භූතයන් දෙදෙනෙක් හෝ භූතයන් තුන්දෙනෙක් හෝ නිශ්‍රය කොටගෙණ හටගන්නාහුනම් ඔවුන්වද උපාදාය රූපයයි නොකියන්නේද යත්? නොකියත්මැයි. සතර මහාභූතයන්ම නිශ්‍රයකොටගෙණ හටගන්නා රූපයන්ට උපාදාය රූපය යන නාමය ප්‍රකාශකරණ පමණ මුත් එක් භූතයක් හෝ දෙනක් හෝ තුණක් හෝ නිසා පවත්නා රූපයන්ට භූතයයි කියා මිස උපාදාරූපයයි ව්‍යවහාර නොකෙරෙත්මැයි. ඒට නිදර්ශන නම්:--පඨවී ආපෝ තෙජෝ වායෝ වණ්ණ ගන්ධ රස ඔජා ජීවිතෙන්ද්‍රිය චක්ඛුප්පසාදය යන චක්ඛුර්දශක කලාපයෙහි අන්තර්ගතවූ චක්ඛුප්පසාදාදී සඳෙන සතර මහාභූතයන් නිසාම පවත්නේයි. චක්ඛු ප්‍රසාදාදී යම් උපාදාය රූපයකට අනික් රූපයක් පැවැත්වීමට ශක්තියක් නොමැත්තේහි. එහෙයින් එක්විසි රූපකලාප යෙහිම විද්‍යමානවන්තාවූ සතරමහා භූතයන් නිසා චක්ඛුරාදි උපාදාය රූපයෝ පවත්නාහුවෙති. තවද අනුන් නිසාම පවත්නා රූපයෙක්ම උපාදාය රූපනම්වෙයි. සතරමහා භූතයෝ කිසිකලෙකත් උපාදාය රූපනම් නොවන්නාහුය. මේ උපාදාය රූපයෝ වනාහි එකොළොස් දෙනෙක්වෙත්. ඔවුන්ගේ විභාගය මතු පහළවන්නේයි. පෘථිවී ධාතුව කර්කශ සවභාව ලක්ෂණකොට ඇත්තේයි. මේ ප්‍රකෘති පොළොව මනුෂ්‍ය තිරශ්චීන වෘක්ෂලතාදී සියල්ලගේ පිහිටා සිටීමට ආධාරවන්නාක්මෙන් එක එක රූප කලාපයෙක්හි අන්තර්ගතවූ සියලු රූපයන්ගේ පිහිටීමටද උපකාරවන්නේයි. ආපොධාතු කොමෝ වැගිරීම හා බැඳීමද මහත්කිරීමද ලක්ෂණකොට ඇත්තේයි. මේ මහා පොළොව වනාහි අනන්තා ප්‍රමාණ රූප කලාපයන් ආපොධාතුවෙන් බැඳීම කරණකොටගෙණ නොවිසිර පවත්නේයි. රූපකලාපයන්ගේ එකට බැඳි පැවතීම ආපොධාතුහුගේ ලක්ෂණයම්වෙයි. වායොධාතු තෙමේ පිරවීමය, සිටීමය, සැලීමය, යන මොවුන් ලක්ෂණකොට ඇත්තේයි. ඒට නිදර්ශන නම්:—

මේ පොළොවෙහි පිහිටා සිටින සියලු වෘක්ෂලතාදීන්ගේසිටීම වායෝ ධාතු ශක්තියෙන්යයි දතයුතුයි. තෙජෝ ධාතුය යනු මිහිකිරීමය පැසීමය උණුසුම්කිරීමය යන මොවුන් ලක්ෂණ කොට ඇත්තේයි. යම්සේ ලුණු මිශ්‍රකළ මාංශය කුනුනොවී පවත්නේද එසේම තෙජෝ ධාතුව කරණකොටගෙණ සවිඤ්ඤාණක අවිඤ්ඤාණක සියලු වස්තූන්ගේ බොහෝකලක් පැවැත්වීම කෙරෙයි. මේ සතර කුමක්හෙයින් මහාභූතයයි ව්‍යවහාරකරන්නේද යත්? යොදුන් ගණන් දිග පුළුල ඇති ආත්මභාවදී මත්ස්‍යයෝද, රාහු අසුරාදී අසුරයෝද, මහාකාල නාගෝපනාගාදී නාගයෝදයනාදී සවිඤ්ඤානකවූද මහමෙරුමහාසමුද්‍ර මහාපෘථිවී ආදිඅවිඤ්ඤානකවූද භූතයන් පහළකරවනහෙයින් මහාභූතයයි ව්‍යවහාර කෙරෙත්. තවද ඉඤ්ජාලිකයන්ටද මහාභූතයයි කියති. ඉඤ්ජාලිකයෝ වනාහි රන් රිදී නොවන්නාවූ වසතු රන් රිදී ආදිය මෙන් කොට පෙන්වති. එසේම මේ මහාභූතයෝ එක එක ආකාරයට මිශ්‍රවූවාහු රන්ය රිදීය මුතුය මැණික්ය යනාදී නොයෙක් වණ්ණයට පැමිණ මනුෂ්‍යාදීන්ගේ ඉඤ්ජියයන් මුලා කරති. එහෙයින් මහාභූතයයි කියනී. තවත් හිමාලය වනාදියෙහි වාසයකරන්නාවූ විචක යක්ෂණියන්ටද භූතයයි කියති. ඒ යක්ෂණිහුවනාහි පුරුෂයන් දුටුකළ හාව භාව විලාසය සම්පූර්ණ සොළොස් ස්ත්‍රීරූපී වියස්වූ සත්‍රී රූප මවා ඒ පුරුෂයන් පොළඹවා අභිමත සථානයට හෙණහගාස් මස් ලේ අනුභවකරති. එසේම මේ සතරමහා භූතයෝ තුමූ සත්‍රීන්ගේ සිතගන්නා පුරුෂරූපය පුරුෂයන්ගේ සිත්ගන්නා සත්‍රී රූපය යනාදී රූප මවා මහත්වූ අනය ව්‍යසනයට පමුණුවන්නාහුවෙති. එහෙයින්ද මහා භූත යයි ව්‍යවහාර කෙරෙති. ඒ සතරමහා භූතයන් අතුරෙන් සපශීකරන්නාවූ සවභාව පඨවී නම්. විසිරයාගොදී එකාබද්ධකොට පවත්වන්නාවූ සවභාව ආපොනම්. හිඳගෝ පැසීම් දන්වැටීම් ආදී මිහිකිරීම තෙජෝ ධාතු ලක්ෂණයයි. මේ භූතත්‍රය සෙලවීම් ආදී ක්‍රියා පැවැත්වීම වායෝ ධාතු ලක්ෂණයයි. තෙජෝ ධාතු තෙමේ ශීතලවූයේනම් ශීත නොජෝ ධාතුයයි කියාද, උණුසුම්වූයේනම් උණුසුම් තෙජෝ ධාතුයයි කියාද ව්‍යවහාරකරයි. එහෙයින් ශීතොෂ්ණ යන ගුණදෙක තෙජෝ ධාතුහුගේ ලක්ෂණයයි හෙවත් විශෙෂයකැයි දතයුතුයි. ඉදින් ආපොධාතුහුගේ ගුණය ශීතයයි කියාද තෙජෝ ධාතුහුගේ ගුණය උෂ්ණයයිකියා හෝ ගතයුතුවිනම් ශීතොෂ්ණ යන ගුණවය එකමරූපකලාප යෙක්හි ලැබියයුතුවෙයි. මේ ශීතොෂ්ණ යන ගුණවය කිසි කලෙකත් එකම රූප කලාප්යෙක්හි නොලැබෙන බැවින්

තෙජෝධාතුහුගේ එතර මෙතර දෙක ශීතෝෂ්ණ ගුණ දෙක යයි දතයුතුයි. ඔවුන් අතුරෙන් පෘථවී ධාතු තෙමේ කම්ජ පෘථවී ධාතුය, චිත්තජ පෘථවී ධාතුයයි යනාදී නොයෙක් ප්‍රකාර වෙයි. එපරිද්දෙන්ම සෙසු භූතත්‍රයද කම්ජ චිත්තජාදිවශ යෙන් අනේක ප්‍රකාරයි. මේ සතර මහාභූතයන් අවිද්‍යමාන වස්තූවක්හම් නැත්තේයි. එහෙයින් දුවුවත් එක එක වස්තු වෙහි එකෙකී භූතය අධිකව බලවත්වූකල්හී සෙසු භූතත්‍රය අප්‍රකටවෙයි. සමුද්‍රඝඩාවාපි තඩාගාදියෙහි ජලය. පත්තෙල්, කිරි, ආදි ද්‍රව ද්‍රව්‍යාදියෙහි ආපෝධාතුව අධිකව සෙසු භූතත්‍රය අප්‍රකටවෙයි. සරජාවාතය, අරජාවාතය, යනාදී වාතනා සුළු ද්‍රව්‍යයෙහි වායෝධාතුව අධිකව සෙසු භූතත්‍රය අප්‍රකටයි. කලාපාතතවග්ගනිය, සුශ්‍රීතාපඤ්ඤ, කරකාග්නිය, ප්‍රකාශී ගින්නය, ඔතාදියෙහි තෙජෝධාතුව අධිකව සෙසු භූතත්‍රය අප්‍රකටවෙයි. එහෙයින් බුදුරජාණන්වහන්සේ විසින් ධාතු විභඞ්ග හත්‍රිපදෝපම සූත්‍රාදියෙහි ඒ ඒ භූතය අධික වස්තුව ඒ ඒ ධාතු හඳුන්වනු පිණිස වදාරණලද්දේයි. ඉදින් පෘථවී ආදි ධාතූන්ගේ සභාව මාත්‍රයක් වදාළේවිනම් ඒ අවබෝධ කිරීම අතිශයින් දුෂ්කරවෙයි. අඹඟසක හටගත් ඵල තෙජෝ ධාතු අධිකවීම හෙතුකොටගෙණ විලිකුම්බවට පැමිණෙයි. අනතුරුව නටුවෙන් වැඟිරෙයි. එසේම මනුෂ්‍ය තිරශ්චීනදින්හේද වෘක්ෂලතාදින්හේද ජරාව තෙජෝ ධාතුව කරණ කොටගෙණවෙයි. මරණයද ඒ කරණකොටගෙණමවෙයි. යනු අවිබෝධකවයුතුයි. චක්ඛුරාදී පසට කුමක්හෙයින් ප්‍රශාද රූප යයි ව්‍යවහාරකරන්නේද යත්? තමා හා එක්ව යෙදුනාවූ කලාපයම ප්‍රසන්නකරවනහෙයින් ප්‍රශාද රූපයයි කියත්. ඇසින් දක්කයුතුවූ යම්පත්වූ හෝ නපුරුවූ හෝ සියලු අරමුණම රූපාලම්බණතම්. එසේම කණින් ඇසියයුතුවූද, නාසයෙන් විඳයුතුවූද, දිවෙන් දතයුතුවූද, කයින් දතයුතුවූද, සියලු ශබ්ද ගන්ධ රස පහස ධර්‍මාදී අරමුණු ආලම්බණනම්වෙයි. සපඤ්ඤාලම්බණය ආපොධාතුව හැර අවසෙස භූතත්‍රය පමණකි. මේ සතිදැරුම් රූප තෙමේ දෙපස් විඤ්ඤාණයන්ට ගොචර වනහෙයින් දෙපස් විඤ්ඤාණ නැමති මහල්ලන්ගේ නැගිටීමට සැරයටි වැනි බැවින් ගොචර රූපයයි කියත්. චක්ඛුර්විඤ්ඤාණයාගේ ගොචරසථානය රූපාලම්බණයයි. සොත ඝාණ ජිව්හා කායවිඤ්ඤාණාදීන්ගේද එසේමැයි. සත්‍රී ලිඞ්ග සත්‍රී නිමිත්ත සත්‍රී ආකල්පයයි කියනලද සත්‍රී භාව රූපයද, පුරුෂ ලිඞ්ග පුරුෂ නිමිත්ත පුරුෂ කුත්තක පුරුෂ ආකල්පයයි කියනලද, පුරුෂ භාව රූපයද, ඔතමේ

ලිඞ්ගාදිය මෝ සත්‍රිය මේ **පුරුෂභාසි** දැනගැණීමට **කාරණාවන** හෙයින් **භාව** රූපයක්වෙයි. සත්‍රීන්ගේ අඞ්ගජාතය සත්‍රී ලිඞ්ග නම්. සත්‍රීන්ගේ අදහස් ආදිය සත්‍රී නිමිත්ත නම්. **සත්‍රීන්ගේ** ස්ත්‍රීවාභරණ කණීාභරණ වස්ත්‍රාභරණාදිය සත්‍රීකුත්තනම්. සත්‍රීන්ගේ අඩෘ ශරීරයෙහි විශදභාවය ඌර්ඛව ශරීරයාගේ අවිශද භාවය සත්‍රීඅකල්පනම්. අටුවාවෙහි ආකාරය මෙසේයි. සත්‍රීන්ගේ සිහින්වූ කඤ්චනපාදුදිය කුඩාවූ මුහුනද පයොධරාදි ය සත්‍රී ලිඞ්ගනම්, සත්‍රීන්ගේ හිසකේ ගැවසීම හෘදයෙහි ලෝම් නැහිබව රැවුල් නැතිබව සත්‍රීනිමිත්තනම්. සත්‍රීන්ට අයත්වූ මෘදුම් පිසුම් හෙතුම් ආදී ක්‍රියාවෝ සත්‍රී කුත්තනම්. **සත්‍රීන්ගේ** ලැජ්ජාමන් ඇතිබවය. සිහින්වූ කටහඬ **ඇතිබවය**, ඔතාදී ක්‍රියා වෝ සත්‍රීඅකල්පනම්. පුරුෂයන්ගේ අභිප්‍රාය පුරුෂ නිමිත්ත නම්. පුරුෂයන්ට අයත්වූ වස්ත්‍රාභරණාදිය **පුරුෂකුත්තනම** පුරුෂයන්ගේ අඩෘ ශරීරය **අවිශද** භාවය ඌර්ඛව ශරීරය විශද භාවය **පුරුෂකල්ප** නම නොහොත් අටුවාවෙහි ආ ක්‍රම යෙන් පුරුෂයන් කෙරෙහි සත්‍රීන්ට **වෙනස්ව** පිහිටන්නාවූ මූත්‍ර ආදිය හෘදයෙහි හටගන්නා රොමාදිය **පුරුෂ** ලිඞ්ග නම්. පුරුෂයන්ගේ වස්ත්‍රාභරණාදිය පලදිනා ආකාරය පුරුෂ නිමිත්ත නම්. පුරුෂයනට අයත්වූ කම්මන්තාදිය පුරුෂ ආකල්ප නම්. සත්‍රීභාව පුරුෂභාවය **වෙන් වෙන්ව** සත්‍රී පුරුෂයන් කෙරෙහි ඇතිබව කෙසේ **දනයුත්තේද** යත්? සත්‍රීහු තුමූ **ලදරු** අවස්ථායෙහිම ක්‍රීඩා පිණිස **දරුවන්** නැලවීම් පිසීම් ආදි ක්‍රියාවෝ සත්‍රීභාව රූපයන්ගේ හෙතුවෙත්. **පුරුෂභාව** රූපය ඇති ලදරුවෝ කුඩා කාලයෙහි සී සැම් වැපිරීම් ආදි යෙහි පුරුදුවෙති. එය පුරිස භාවනාම්වෙයි. මෙසේ සත්‍රී පුරු ෂයන්ගේ උපපත්ති **කාලයෙහිම** ඔවුනොවුන්ට වෙනස්වූ ක්‍රියා **ඇතිවීම** සත්‍රීභාව පුම්භාව රූපයන්ගෙන් ඇතිවන්නේයයි දත යුතුයි. "**භාවදශ රූපය**" යනු හෘදය මාංශඛ්‍යනන්තරයෙහි ඝටි කොට එල්වනලද්දාවූ පිසුම් කැකුලක් බදුවූ සථානයෙහි ඇතු ලත විසමවූ මස් ගඩුවක්වෙයි. එහි අඩපනක් පමණවූ නොහොත් දෙඹ ගෙඩියක් තුල වත්කලහැකි පමණවූ **ප්‍රසන්න** ලෙහෙය ආශ්‍රයකොටගෙණ හෘදය වසනු රූපය පවත්නේයි. ඒ රූපය ධම්මසඞ්ගණී ප්‍රකරණයෙහි දෙසනාහෙදයවනහෙයින් කොව දුළේන්මුදු පඨාන්යෙහි නිශ්‍රය ප්‍රත්‍යය නිදේශයෙහි:-**සංසිට්ඨා ණ මහාභූතා මහාභූතපච්චයතාය ධාතුව**" යන පාඨයෙන් වදුරණ ලද්දේයි. "**ජීවිත රූපය**" යනු තමා හා එක්ව හවගන්නාවූ කම්ජ රූපයන් ආරක්ෂාකරමින් ඒ ඒ කලාපයෙහි රූපයන්ට

ඊඛ්වර භාවඛෙන් පවත්නාඛෙයින් ජීවිතෙන්ද්‍රිඛ රූපඛයි ව්‍යවහාර කෙරෙත්. චක්ඛුර්දශක කලාපයෙහි විද්‍යමානවූ ජීවිතෙන්ද්‍රිඛ තෙමේ තමාඛෙන් අන්‍යවූ රූපඛන් නවඛ ආරක්ඛාකරමින් ඊඛ්වරභාවඛ පවත්වයි. සෙත ඝාණ ජිහ්වා කාඛ හදඛවත්තු ඝාව ඛන දශක කලාපයෙහිද එපරිද්දෙන්ම ඊඛ්වර භාවඛ කෙරෙත්. ජීවිත නවකකලාපයෙහි විද්‍යමානවූ ජීවිතනවකකලාප තෙමේ තමාඛෙන් අන්‍යවූ රූප අටදෙන ඊඛ්වර භාවඛෙන් ආරක්ඛාකෙරෙයි. ඊට උපමානම්:--පියුම් දණ්ඩහි ඇත්තාවූ ජලඛ ඒ පියුම් මලානික නොව ආරක්ඛාකරගන්නාක්මෙන් ජීවිතෙන්ද්‍රිඛ තෙමේ තමා හා එක්ව ඔටගත්තාවූ කම්ජ රූපඛන් ආරක්ඛාකෙරෙති. ඛම්සේ නැවේ ඔන්නාවූ නාවිකඛාඛෝහිටීම නැවනිසාඳ නැව ආරක්ඛාවී පැවතීම තමා නිසාඳ වන්නාක්මෙන් ජීවිතෙන්ද්‍රිඛ නැමති නාවුක තෙමේ කම්ජ රූප කලාප නැමැති නැව නිසාඳ, ඒ නැවිඛා නිසා නැව පවත්නාක්මෙන් ජීවිතෙන්ද්‍රිඛ හෙතුකොටගෙණ කම්ජ රූප කලාප පවත්නාහුවෙති. කම්ජ චිත්තජ ඍතුජ ආහාරජ ඔන රූප කලාප සම්භවඛන ඔතරිත් ඔට ඔන්නාවූ එක්විසි රූප කලාපඛන් අතුරෙන් කම්ජ රූප කලාප නවඳෙන පමණක් තම තමාට ඊඛ්වරවූ ජීවිතෙන්ද්‍රිඛඛ නිසා පවත්නාක්මෙන් චිත්ත ඍතු ආහාර ඔන ත්‍රිඍම්භවඛික රූප කලාපඛන් පවත්වන්නාවූ ජීවිතෙන්ද්‍රිඛඛෝ තුමූ කුමක්හෙයින් නැත්තාහුද ඔත්? කම්ජ රූප කලාපඛෝ වඛාගි ඵුසීජාති කම්ප්‍රත්‍යඛෙන් කම්ජ රූප කලාපඛන් උපදවා නිරුඬ්ඛිඛන්නේඛ. මව්මලවිට දරුවන් පොෂ්‍යඛකිරීම පිණිස කිරිමව්වරු ඇතිවිඛ යුතුවාක්මෙන් කම්ජ රූපඔන්ගේ ජනක ප්‍රත්‍යඛ නැතිවූහෙයින් ජීවිතෙන්ද්‍රිඛ ශකතියෙන් පවත්නාහුවෙති. චිත්ත ඍතු ආහාර ඔන තිඍම්භවඛික රූප කලාපඛන්ගේ ජනක ප්‍රත්‍යඛවූ චිත්ත ඍතු ආහාරඔන් විද්‍යමාන බැවින් ජීවිතෙන්ද්‍රිඛඛාගෙන් ප්‍රඛොජන නැත්තේයි.

"ඔජා රූපඛ" ඛනු කටුකඛික්කලවණාදීවූ ඡවි රසඛන්ගේ හා බාද්‍ඛ-භොජ්‍ඛ-ලේහ්‍ඛ-පෙය්‍ඛ ඔන රසඛන්ගේ ඔජ්ඣඛ ඔක් නඛර අනුව ඔන්නාවූ තෙල ඝඛ්ඛනාතවූ ආහාරඛ ඔජා රූපනම්වෙයි. කම්ජ රූප කලාප තුළඉති ඇත්තාවූ ඔජාරූප ඔන් නවළඳනාඛට ඔඵොක්ත බාහිර ආහාරඛෙන් රූකුල් ලැබීමෙන්ම බාහිර ආහාරඛෝ ආහාරජ රූපඛන් උපදවන්නාහුවෙති. ඉදින් බාහිර ආහාර ඔජාව නොලැබුනේනම් අධ්‍යාත්මිකවූ ඔජාරූපඛන් සම්ප්‍රකාරඛෙන්ම ඉපදවිඛනොහැක්කේයි. මේ අඛ්‍යනතර ඔජාව හා බාහිර ඔජාව ඔන දෙදෙන

දිට්ඨම්මවෙදනීය අපරාපරියවෙදනීය යන කම්ඵලයට සමාන වෙත්. (ඉදින් දිට්ඨම්මවෙදනීය කම්යක්විපාක අපරාපරිය වෙදනීය කම්යකින් රූකුල්ලැබීමෙන්ම විපාකදෙයි. අපරාපරිය වෙදනීය කම්යකින් රූකුල් නොලැබුණේනම් දිට්ඨම්මවෙදනීය කම්ය අහොසි කම්ය නම් වෙයි.) එපරිද්දෙන්ම කම්ජ අබ්භඤ්ඤ රවූ ඔජාරූපයට ඛාද්‍ය-භොද්‍ය-ලෙය්‍ය-පෙය්‍යාදී ආහාරයෙන් රූකුල් නොලැබුනේ වීනම් සන්තතිය ම්වි කුස්ස්ම විනාශවෙයි. මෙසේ මේ දක්වනලද්දාවූ රූපයෝ අටශ්‍රාස්දෙන වතාහිකකීඝ බැව් ආදීවූ තමාගේ සභාව සමඟ හටගත්තාවූ රූපයන්බැවින් ලක්ඛණ රූප නමුදුවෙයි. කම්මයින් ඒසින් උපදවනලදහෙයින් නිප්පන්න රූප නමුදුවෙයි. ඒකාරවනහෙයින් රූප රූප නමුදු වෙයි. ත්‍රිලක්ඛණයට නගා භාවනාකටයුතුහෙයින් සම්මසන රූප නමුදුවෙයි. අවශෙෂවූ දශරූපයෝ තුමූ කකීඝ බැව් ආදී සභාවෙන් පහවූහෙයින් අභාවරූපය, අලක්ඛණරූපය, අනිප්පන්නරූපය, අරූපරූපය, අසම්මසනරූපයයි කියාද ව්‍යවහාර කෙරෙත්.

"ආකාස ධාතුස" යනු ඔඛාසෙය්‍යක සත්වයන්ගේ ප්‍රතිසන්ධි කාලයෙහි පහළවන්නාවූ කායභාව වසතු දශක සඞ්ඛ්‍යාතවූ රූපකලාපයන් තුන්දෙන මිශ්‍රනොවීම පිණිසද ඔපපාතික ප්‍රතිසන්ධිඝණනාවූ සත්වයන්ගේ වතාහි චක්ඛු-සොත-ඝාණ-ජිව්හා-කාය-භාව-වසතු සඞ්ඛ්‍යාතවූ ප්‍රතිසන්ධියසමඟ පහලවන්නාවූ රූපකලාපයන් පස්දෙනාගේ ඔවුනොවුන් මිශ්‍රනොවීම පිණිසද එපරිද්දෙන් සියලු රූප කලාපයන්ගේ මිශ්‍රනොවීම පිණිස පවත්නාවූ පරිවෙජය හෙවත් වෙන්කිරීම පරිවෙජද රූප නම් නිප්පන්න රූපයන්ගේ නිරුඬ්වීම හටගැණීම ආකාස ධාතු හුගේ හටගැණීම නිරුඬ්වීමයයි දතයුතුයි. ඉදිරියට යාමයපසුව ඒමය යනාදී සියලු ක්‍රියාවෝ උපදවන්නාවූ සිතින් හවගන්නාවූ ධාතුහුගේ විකාරවීම සඞ්ඛ්‍යාතවූ ආකාරයයි කියනලද්දාවූ හස්ත පාදාදීන්ගේ ඇසෙලවීම කායවිඤ්ඤත්තිරූප නම්වෙයි. ඊට කුමක් හෙයින් කායවිඤ්ඤත්තියයි කියන්නේද යත්? දුර සිටින්නාවූ තෙතෙකුට යම් අභිප්‍රායක් අහවනු කැමතිකල්හි හස්තවලනාදි යෙන් තමාගේ අභිප්‍රාය හඟවනු ලැබෙයි. ඒ අභිප්‍රාය දැනගන්නාපුරුෂ තෙමේද වමලවූ ශරීරාඞ්ගයන් කරණකොටගෙණ මෙතෙම දෙනක්කරනාට නියොගකරන්නේයයි දැනගණියි. එහෙයින් කායවිඤ්ඤත්ති රූපයයි කියති. වාක් ප්‍රයොගය උපදවන්නාවූ සිත කරණකොටගෙණ හටගන්නාවූ පෘථ්වී ධාතු තොමෝ අක්ඛරොත්පත්තිස්ථානයෙහි පිහිටියාවූ කම්ජ පෘථ්වී

ධාතූන් හා ගැටුනුකල්හි තමාගේ අභිප්‍රායවූ වචනය මුඛයෙන් නික්මෙන්නේවෙයි. එහෙයින් ඒවායි ප්‍රයෝග සංඛ්‍යාතවූ පෘථිවී ධාතූන්ගේ විකාර වූ විඤ්ඤත්ති රූප නම්වෙයි. ඊට උපමා කම්:—යම්සේ බෙර ගසන්නාවූ පුරුෂ තෙමේ තමා විසින් අද හස්කරණලද්දාවූ තාලවෘන්තාදියද, වාදන දණ්ඩාත් බෙර මුහු නෙහි ගසන්නේවේද, එසේම්හි අභිප්‍රායකරණලද තාලවෘන්තාදිය නික්මෙයි. එපරිද්දෙන්ම යම් වචනයක් කියනු පිණිස චිත්ත වීථියක් උපන්කල්හි එහි සත් ජවනයන් හා එක්ව උපදනා චිත්තජ පෘථිවී ධාතුහු අවශෙෂ නිජභූතයන් හා සමග පරම්පරාවශෙයන් ගැටෙමින් අවුත් මුඛයෙහි අක්ඛරාතපත්ති සථානයෙහි පිහිටියාවූ කම්ජරූපකලාපයන් සමුට්ඨාවූ පෘථිවී ධාතූන් හා ගැටුනුකල්හි අභිමතවූ ශබ්දය මුඛයෙන් නික්මෙයි. එහෙයින් චිත්තජ පෘථිවී ධාතුව කඩිප්පුවක්මෙන්ද, කම්ජ පෘථිවී ධාතුව බෙර ඇසක්මෙන්ද, නොහොත් චිත්තජ පෘථිවී ධාතුව ඝණ්ටාවෙහි දිවතක්මෙන්ද, කම්ජ පෘථිවී ධාතුව ඝණ්ඨාවක්මෙන්ද, උපමා උපමෙය්‍ය සම්බන්ධකොට අර්ථ දතයුත් තේයි. මේ කාය විඤ්ඤත්ති වචීවිඤ්ඤත්ති රූපවය වනාහී වාතය හැපීමෙන් චලවන්නාවූ වෘක්ෂ ශාඛාදියෙහි හෝ වාතය ගැටීමෙන් වෘක්ෂාදියෙහි ඇතිවන ශබ්දයෙහි මෙන් වෘක්ෂාදියෙහි ඇතිවන ශබ්දයෙහි මෙන් මේ විඤ්ඤත්ති රූපවය නැත්තේයි. කුමක්හෙයින්ද යත්? චිත්තජ නොවන හෙයිනි.

බෙරවැයිම්-විකාශෑම් ආදී ශබ්ද චිත්තසමුට්ඨාන උතුජ නම් වෙයි. ධම්මරථ-නෑව් ආදීන්ගේ ගමනාදිය එසේම චිත්තසමුට්ඨාන වායොධාතුවෙන් හටගන්නේනයි. නිප්පන්නරූපයන්ගේ සැහැල්ලු බව ලහුතාරූප නම් වෙයි. නිප්පන්නරූපයන්ගේ මොළොක්බව මුදුතාරූප නම් වෙයි. ඒ ඒ ක්‍රියාවන්ගේ ඉවසීම කම්මඤ්ඤතා රූප නම් වෙයි. ලහුතා රූපය වනාහී නිරොගී පුරුෂයෙකුට සමානවෙයි. නොහොත් දවස මුලුල්ලෙහි රන්කරණලද අය සකඩියකට බදුවෙයි. මුදුතා රූපය වනාත් දවසක් මුලුල්ලෙහි මැඩගන්නාලද සම්කඩක් බදුවෙයි. කම්මඤ්ඤතාරූපය මොන වට පිඹගන්නාලද සවණ්ණියකට බදුවෙයි. ඒ රූපයන් තුන්දෙනා හා විඤ්ඤත්තිරූපවයද උපචයරූපය අනිච්චතාරූපය යන මේ රූපයෝ සත්දෙන නිප්පන්නරූපයන්ගේ විකාරවත හෙයින් විකාරරූප නම් වෙයි. "උපචය රූපඤ්" යනු ප්‍රතිසන්ධිකාලයෙහි කාය-භාව-වත්ථු යන කලාපයන් තුන්දෙනාගේ ප්‍රථමොත්පත්තිය උපචයරූප නම් වෙයි. ඒ රූපකලාපත්‍රයම ප්‍රතිසන්ධිචිත්තයාගේ ඨිතික්ඛණය. පටන් දිවිමුලුල්ලෙහි සියලුම ඛණයක් පාසාහට

ගැණීම් සන්තතිරූපනම් වෙයි. නිප්පන්නරූපයන්ගේ ආයුෂ කුඩා ක්ෂණ එක්පණසෙක් වෙයි. ඒ එක්පණස අතුරෙන් පළමුවන උත්පාදක්ෂණය උපචය රූපයට සමානවෙයි. අන්තිම භඞ්ගක්ෂණ රූපය අනිච්චතාරූපයට සමානවෙයි. මධ්‍යයෙහිවූ එකුන්පණස් ක්ෂණයෝ ජරතාරූපයට සමාන වෙයි. උප්පාද-ඨිති-භඞ්ගඝඞ්ඛ්‍යා තවූ ක්ෂණත්‍රයක් කායවිඤ්ඤත්ති වචීවිඤ්ඤත්තිරූපයන් දෙදෙනාගේ ආයුෂවෙයි. මෙසේ උපචය සන්තති ජරතා කායවිඤ්ඤත්ති වචීවිඤ්ඤත්ති රූපයන් පස්දෙන වර්ජිතකොට ඇත්තාවූ අවශෙෂ තෙවිසිරූපයෝම සත්තලොස් මහාක්ෂණයකට හෝ එක්පණස් කුඩා ක්ෂණයකට හෝ ආයුෂ ඇත්තාහුයයි දතයුතුයි. එහෙයින් සවවසංඛෙපයෙහි "තං සත්තරසචිත්තායුවිඤ්ඤත්ති ලකඛණං" යනු කීහ. මේ සියලු රූපයන් එසාතුකළ කල්හි අටවිස්සෙක් වෙති. අටවිසි රූපයෙහි එකොලොස් ප්‍රභෙදය නම්:—භූතරූපය, පසාදරූපය, විසයරූපය, භාවරූපය, හදය රූපය, ජීවිතරූපය, ආහාරරූපය, පරිවෙජ්දරූපය, විඤ්ඤත්ති රූපය, විකාරරූපය, ලක්ඛණරූපය යන මොවුන්ගේ වශයෙන් එකොලොස් වැදෑරුම් වෙයි. සිඤ්ඤරූපතෙමේ සහෙතුක අහෙතුක යන විප්‍රකාරයන් අතුරෙන් ලොභාදී හෙතු වශයෙන් නූපදනා හෙයින් අහෙතුකම වෙයි. සපපච්චය අපපච්චය යන විප්‍රකාරයන් අතුරෙන් කම්-චිත්ත-ඍතු-ආහාර යන සතර ප්‍රත්‍යයෙන් හටගන්නා හෙයින් සපපච්චයම වෙයි. එසේවුවත් මේ සතර ප්‍රත්‍යයෙන් එකවිට හටගන්නේ නොවෙයි. කම්යෙන් හටගන්නා රූපය, චිත්තයෙන් හටගන්නා රූපය, ඍතුවෙන් හටගන්නා රූපය, ආහාරයෙන් හටගන්නා රූපයයි වෙන්වශයෙන් ගොදැඟතයුතුයි. සාසව අනාසව යන විප්‍රකාරයෙන් චතුරාශ්‍රව යන්ට අරමුණුවන හෙයින් සාසවවෙයි. සඞ්ඛත අසඞ්ඛත යන විප්‍රකාරයෙන් ඔවකි කම්ාදී සතර ප්‍රත්‍යයෙන් සකස්කළ හෙයින් සඞ්ඛත නම් වෙයි. අනාශ්‍රවවූ අසඞ්ඛතවූ රූපයක් නම් නැත්තේයි. ලොකිය අලොකිය යන විප්‍රකාරයෙන් සංඝකාරලොකයට ඇතුළත්වන හෙයින් ලොකිය නම් වෙයි. අලොකිය නම් රූපයෙක් නැත්තේයි. කාමාවචර අකාමාවචර යන විප්‍රකාරයෙන් කාමතාෘෂ්ණාවට ගොචරවන ඉඟයන් සියලුම රූපය කාමාවචර නම් වෙයි. අකාමාවචර නම්වූ රූපයෙක් නම් නැත්තේයි. කාමාවචර චිත්තය රූපාවචර චිත්තයයි ව්‍යවහාර කරන්නාක්මෙන් කාමභූමියෙහි ගොඩහා සෙසින් හැසිරෙන හෙයින් කාමාවචර නම් වෙයි. අනාරම්මණ සාරම්මණ යන විප්‍රකාර චිත්තයන්මෙන් අරමුණු නොගන්නා හෙයින් සියලු රූපයම අනාරම්මණ

නම් වෙයි. සාරම්මණරූපයෙක් නම් නැත්තේයි. අපහාතබ්බ පහාතබ්බ යන චිත්‍රකාරයන් අතුරෙන් තදඩහදී ත්‍රිවිධාකාර යෙන් නොපැහිය යුතු බැවින් සියලුරූපය අපහාතබ්බ නම් වෙයි. ප්‍රහාතව්‍යරූපයෙක් නම් නැත්තේයි. මෙසේ එකවිධ ක්‍රම යෙන් සියලුම රූපය අවබොධ කටයුතුයි.

තදනන්තරව චිත්‍රකාරය දක්වනු ලැබේ:—පවප්‍රශාද රූපය වනාහී ඉදින් නොපෙනෙහි අපනුවූයෙහි නම් නොපෙනෙන කලිඹකරයකට බදුවෙයි. යනුවෙන් කියන්නාක් මෙන් අධ්‍යාත්මයට උපකාරවන හෙයින් අජ්ඣත්තික නම් වෙයි. අවශෙෂ සියලු රූපය අධ්‍යාත්මයට එසේ උපකාර නොවන හෙයින් බාහිර රූප නම් වෙයි. ප්‍රසාදරූප පසය, හදයරූපය යන මේ සඳෙන සපතවිඤ්ඤ ධාතූන්ට ඤ්‍රයවන හෙයින් වසතු රූප නම් වෙයි. අවශෙෂ සියලු රූප අවසතුරූප නම් වෙයි. පසාදවිඤ්ඤත්ති රූපයෝ අටදෙන වනාහි කුශලාකුශලකර්මය, චිත්තවෙතසිකය, කායවිඤ්ඤත්තිය යන මොවුන්ගේ පැවැත්මට මාරයන් බැවින් මාර රූප නම් වෙයි. අවශෙෂවූ සියලු රූපය අමාරරූප නම් වෙයි. හෙවත් චක්ඛුමාරනොමේ චක්ඛුමාරයෙහි හවඟන්නා හෙයින් සඤාළිස්චිත්තක්ඛණයන්ගේ නික්ම්මට මාරයක් වන බැවින් මාර රූප නම් වෙයි. සොත-ඝාණ-ජිවහා-කාය රූපයෝද එසේ මැයි. කායවිඤ්ඤත්ති රූපතෙමේ ත්‍රිවිධාකාර කායකර්මයන්ගේ පැවැත්මට මාරයක් වැනි හෙයින් මාර රූප නම් වෙයි. පසාද භාව-ජීවිතරූපයෝතුමූ ඉන්ද්‍රියභාවයෙන් යුක්තහෙයින් ඉන්ද්‍රියරූප නම් වෙයි. හෙවත් චක්ඛුදිශක කලාපයෙහි චක්ඛුප්‍රශාද රූප තෙමේ අවශෙෂ රූපයන් තවදෙන තමාගේ වසහයෙහි පවත්වයි. සෙසු සියලු ඉන්ද්‍රිය රූපයන්ගේ ඉන්ද්‍රියභාව එපරිද්දෙන්ම දතයුතුයි. අවශෙෂ සියලු රූපයන් අනින්ද්‍රිය නම්. පසාද-විසය සඞ්ඛ්‍යාතවූ දෙළොස් රූපයෝ තුමූ ඝට්ටනාභාවයෙන් යුක්ත හෙයින් ඔළාරික රූප නම් වෙයි. සමීපයෙහි පවත්නාක් මෙන් වන හෙයින් සන්තිකෙරූප නම් වෙයි. හැපීම් සහිතව පවත්නා හෙයින් සප්පටිඝරූප නම් වෙයි. අවශෙෂ සොළොස් රූපය, සූක්ෂමරූපය, දූරෙරූපය, අප්පටිඝරූපය යි කියත්. අරමුණුකිරීම් වශයෙන් තෘෂ්ණා දෘෂ්ටීන් විසින් ලන්කොට ගන්නාලද්දාවූ කුශලාකුශල කර්මයන්ගේ විපාකවූ රූපය උපාදිණ්ණ රූප නම් වෙයි. සෙසු සියලු රූපය අනුපාදිණ්ණ නම් වෙයි. අවවියි රූපයන් අතුරෙන් එකම රූපාලම්බණය දැක්කයුතු හෙයින් සනිද සඝක රූප නම්. සෙසු සත්විසිරූපය අනිදස්සන රූපනම්.

චක්ඛු--ශ්‍රෝත්‍ර දෙදෙන අරමුණුකරා නොපැමිණ හෝ අරමුණු තම තමන් කරා නොපැමිණ හෝ ආපාථ ගතවන හෙයින් අසම්පත්තවිෂයග්‍රාහී නම් වෙයි. අව සෙෂ ඝාණ-ජිව්හා- කාය යන තුන්දෙනා කරා ගොචරගත වූ පැමිණිකල්හි ආපාථගතවන හෙයින් ගොචරග්‍රාහී රූපනම් වෙත්. අවශෙෂ සියලු රූපය අගොචරග්‍රාහී නම් වෙයි. වණ්ණ-ගන්ධ-රස-ඕජා-භූත සතරය යන මේ රූපයෝ අටදෙන එනාහි වෙන් කොට නොගතහැකි හෙයින් අවිනිබ්භොග රූපනම් වෙයි. සුඛ ඨමක රූපය, ඔජට්ඨමකරූපය යන පරියාය නම්ද වෙත්. අව ශෙෂ රූප වෙන් වෙන්ව ලැබියහැකි බැවින් විනිබ්භොග රූප නම් වෙත්. සියලු පෘථිවී පර්වත ගඩගා සමුද්‍රාදියෙහි ඇති අති ත්‍රිය බඩරූපය මේ සුඛට්ඨක අවිනිබ්භොග රූපයයි දතයුතුයි. කාමාවචර කුශලාකුශල විඤ්ඤය, රූපාවචර කුශල්පසය යන මේ පඤ්චවිධ චිත්තයෝ තුමූ අඛ්‍යාකතමසන්තානයෙහි පටිසන්ධිචිත්තයා ගේ උත්පාදක්ෂණය පටන් සියලුම චිත්තයන්ගේ උපාදවත්‍රිනි භඞ්ග යන කුඩා ක්ෂණයක්පාසා හෙවත් නිරන්තරයෙන්ම කර්මජ රූපයන් උපදවති. මේ වනාහි සමානවාදයයි. අභයගිරි ජේත වන වාසීහු වනාහි:-චිත්තයාගේ උත්පාදක්ෂණයෙහි චුති-ඨිති-භඞ්ග යන ක්ෂණයන්හි කර්මජරූපයෝ නූපදනාහුයයි කියත්. එසේ කියන්නේ මක්නිසාදයත්? යමක ප්‍රකරණයෙහි නයදැන විශයෙන් වදාළ දෙශනාවෙක්හි සවභාව මාත්‍රය නොඇගීමෙන් එසේ කියන්නාහු වෙති. ඒ කර්මජරූපකලාපනවයෙහිම ජීවි තෙන්ද්‍රිය නවදෙනෙක් විද්‍යමාන වෙති: අවශෙෂවූ චිත්තජ-උතුජ-ආහාරජ රූපකලාපයෙහි ජීවිතෙන්ද්‍රියය කුමක් හෙයින් නැත් තේදයත්? පූර්වජාතියෙහි කළවූ යටකී පස්විසි වැදෑරුම් කුශලා කුශලකර්ම නැමති මව විසින් ප්‍රතිසන්ධිකාලයෙහි කර්මජ රූපයන් උපදවා වැදූහෙයි මව් නසින්නාක්මෙන් ප්‍රතිසන්ධිකර්මය නිරුඬ වෙයි. වැදූහෙයි මව් නැසුනු ලදරුවෙකු පොෂ්‍යය පිණිස කිරි මවක් අභිමතවිය යුතුවාක්මෙන්ම කර්මයෙහි කර්මජරූප උපදවා නිරුඬවීයිය බැවින් කිරිමවෙකුට සමානවූ ජීවිතෙන්ද්‍රියය ඇත්තේ වෙයි. අවශෙෂ තිජ කලාපයන්ගේ උත්පත්තියට කාරණාවූ මව්වරුන්ට උපමා ඇත්තාවූ චිත්ත-ඍතු-ආහාරසඞ්ඛ්‍යාත ප්‍රත්‍ය යෝ තුන්දෙන විද්‍යමානවන බැවින් අවශෙෂ තිජකලාපයන්ගේ ජීවත්වීමට ජීවිතෙන්ද්‍රියයෙන් ප්‍රයොජනයක් නොමැත්තේය. ඉදින් ප්‍රතිසන්ධිකාලයෙහි කර්මජරූපයන් උපදවන්නාවූ කුශලා කුශල කර්මබීජය ජීවත්ව තුබුයේ නම් ජීවිතෙන්ද්‍රියයෙන් ප්‍රයෝ ජනයක් නැත්තේ වේද, එහෙයින් කුශලා කුශල කර්මය ප්‍රති

සඤ්ඤය උපදවා කුමක් හෙයින් නිරුඬවන්නේද යත්? ලොක සෙහි අංකුරය උපදවන්නාවූ සියලු බීජ ජාතීහු අංකුරය උපදවා විනාශවීයාම ලොකසභාව ධම්මයක් බැවින් කුශලා කුශල කම්ම සංඛ්‍යාත බීජයද, ප්‍රතිසන්ධි නාමසකඛ කටත්තා රූපයන් උප දවා නිරුඬවීයාම යුකති යුකතවන්නේයි. ප්‍රතිසන්ධි විත්තයාගේ උත්පාදක්ෂණයෙහි ජලාබුජ සත්වයන්ගේ කාය භාව වත්ථුසං ඛ්‍යාත කලාපත්‍රයක්ද, ප්‍රතිසන්ධි විත්තයාගේ ඨිතික්ෂණයෙහි එම රූපකලාපත්‍රයක්ද, ප්‍රතිසන්ධි විත්තයාගේ භඞ්ගක්ෂණයෙහි රූපකලාපත්‍රයක්දැයි මෙසේ කම්ජරූපකලාපයෝ නවදෙනෙක් වෙති. ප්‍රතිසන්ධි විත්තයෙහි පවත් අනුලොමවශයෙන් ගිණූ කල්හි සතලොස්වන විත්තයාගේ නිරුඬයෙහි කායකලාප එක් පණසෙක්ද, භාවකලාප එක්පණසෙක්ද, වසතු කලාප එක්පණ සෙක්දැයි මෙතෙක් රූප කලාපයෝ සම්පිණ්ඩෙති, ප්‍රතිසන්ධි විත්තය හටගත් තැන් පටන් දෙවැත්තැනත් රැයක් සම්පිණ්ඩූ කල්හි චක්ඛුදශක කලාපයද, ඊලඟ සතියෙහි ශ්‍රොත්‍රදශක කලාපයද, ඊලඟ සතියෙහි ඝ්‍රාණදශක කලාපයද, ඊලඟ සති යෙහි ජිවහාදශක කලාපයදැයි මෙසේ කම්ජ රූපකලාපයෝ සත්දෙනෙක් සම්පිණ්ඩෙති. ඊට පසු මව්කුසෙ උපන් සත්වයාගේ ආමාශය යම් දවසක ඉවටහණින්ද, කම්ජ තෙජෝධාතු සංඛ්‍යාතවූ ඉතා උතුම් තෙජෝ ධාතු සහිතවූ කුම්ජනවක කලාපය පහළ වෙයි. මේ සියලු කම්ජ රූපයන්ගේ හටගැනීමවූ විත්තක්ෂණය පටන් සතලොස් වන විත්තක්ෂණය සම්පිණ්ඩූකල්හි එක එක කම්ජ රූපකලාපයෙන් එකුන් පණස් කලාප තෙනෙක් ධර මානව පවතික්; හටගණිමින් පවත්නා කලාපය හා නිරුඬ වෙමින් පවත්නා කලාපයද එක්කොටි එක්පණස් කලාපය බැගි කියයුතුයි. මෙසේ එකකම්ජ කලාපයෙන් එක් පණස බැගින් පැවැති වුති විත්තයට ආපසු හිඳුකල්හි සතලොස්වන විත්තක්ෂණය පටන් කම්ජ රූපයන්ගේ පිරිහීම පටන්ගෙණ චුති විත්තයාගේ භඞ්ගක්ෂණය හා සියලු කම්ජ රූපයන්ගේ නිරු ඬය එකක්ෂණිකවම වන්නේයි.

මේ කම්ජ රූපයන්ගේ විභාගයයි.

චිත්තජ රූපය වනාහි චිත්තයන්ගේ උත්පාදක්ෂණයෙහිම හටගන්නේයි. කම්ජ රූපයන්මෙන් ඨිතික්ෂණ භඞ්ගක්ෂණ දෙක්හි චිත්තජ රූපයෝ නූපදනාහුමැයි. එකකුදුවුවත් අරූපා

වශයෙන් පවත්නා සතරවැනි, දෙපස් විඤ්ඤාණ දසය, රහතුන්ගේ චුති චිත්තය යන පසළොස්වැදෑරුම් අවශේෂවූ පන්සැත්තැවක් චිත්ත යෝ තුමූ ප්‍රතිසන්ධි සිතට අනන්තරවූ උපදනා පළමුවන භවාඞ්ග චිත්තයාගේ උත්පාදක්ෂණය පටන් පළවෙනිකාර භවයෙහි හට ගන්නාවූ ඒ පන්සැත්තැවක් චිත්තක්ෂණයන්ගේ සියලු උත්පාදක්ෂණ යෙහිම අධ්‍යාත්ම සන්තානයෙහි චිත්තජ රූපය උපදවන්නාහු වෙති. රහතුන්ගේ චුති චිත්තය විනාශ නැවත ප්‍රතිසන්ධි නොගන්නාසේකොට රූප ජනක නොවන්නේය යනු අට්ඨවාදීන්ගේ මතය යි. එනකුදුවුවත් මූලටීකාචාර්ය ආනන්දඝෝෂාමීන් විසින් සිය ලුම සත්ත්වයන්ගේ චුති චිත්තයට අනන්තරවූ රූප ජනක වන්නේ සි යනු කියනලදී. යෙදෙන පරිද්දෙන් පරික්ෂාකොට අවබෝධ කළයුතුයි. අරූප විපාක සතරවනාහි රූප විරාග භාවනාබල යෙන් රූපයෙහි ඇලකිරීම සතර අරූප භූමියෙහි ඇතිවීමෙකොට කියනලද්දේ රූප ජනක ප්‍රත්‍යය නොවෙති. දෙපස් විඤ්ඤාණ දසයවනාහි කුමක්හෙයින් රූපජනක නොවන්නේද යත්? රූපයන්ගේ උත්පත්තියට වඩාත් චිත්තඒදී ධ්‍යානාඞ්ගයෝ තුමූ සාතිශය හෙතුවෙත්. දෙපස්විඤ්ඤාණයෙහි ධ්‍යානාඞ්ග නැති බැවින් රූප ජනක නොවෙයි. දෙපස් විඤ්ඤාණය හෙයින් කුමක්හෙයින් ධ්‍යානාඞ්ගනැත්තේද යත්? සුඛ සහගත කායවිඤ්ඤාණයෙහි සුඛ ධ්‍යානාඞ්ගයද, දුඃඛ සහගත කායවිඤ්ඤාණයෙහි දුඃඛ සඞ්ඛ්‍යාත අකුශල ධ්‍යානාඞ්ගයද, ඝසිතුප්පාදය නොවනසා සන්තීරණවශයෙහි ප්‍රීති ධ්‍යානාඞ්ගයද දෙපස්විඤ්ඤාණයෙහිම එකාග්‍රතා ධ්‍යානාඞ්ගයද මෙසේ යෙදීම ඇතිබැවින් කුමක්හෙයින් රූපජනක නොවන්නේද යත්? "චිත්තක්ඛණේ පඨමජ්ඣානාදිකා ඣානාඞ්ගා පඤ්ඤායන්ති" යනු පරිහාරයි. ඒ සුඛ දුඃඛ ප්‍රීති එකාග්‍රතාදෝ තුමූ චිත්තඒය පසුකොට ඇතිකල්හිම ධ්‍යානාඞ්ගතම් වෙත්. මේ පස් විඤ්ඤාණයෙහි ඇත්තාවූ සුඛාදී ධර්මයෝවනාහි චිත්තඒ සම්ප්‍රයුක්ත නොවනහෙයින් ධ්‍යානාඞ්ගයයි නොකියත්. එහෙයින් දෙපස් විඤ්ඤාණයෝ තුමූ රූප ජනක නොවෙත්යයි දනයුතුයි. සතරඅරූපාවචර විපාකයෝවනාහි කුමක්හෙයින් රූපජනක නොවන්නේද යත්? හෙමේ රූප නැත්තාවූ භූමියෙහි පවත්නාහෙයින් රූප ජනක නොවන්නේයි. නොහොත් අරූපධ්‍යානය ලබනු පිණිස කර්මස්ථාන භාවනාකරන්නාවූ යොගාවචර තෙමේ රූපය ඇතිකල්හි දණ්ඩාදාන ශස්ත්‍රාදාන වන්නේය. ඝාතනාදියෙන් සත්ත්වයන්ගේ ජීවිතේන්ද්‍රියය සිඳීමෙන් වධබන්ධනාදියෙන් සත්ත්වයන් හට ගන්නාවූ සියලු කායකර්ම වචීකර්මයෝ රූපයෙන්ම හට ගන්නාහුගයි රූපයෙන් වෙන්වූ භූමියක් ලබනු පිණිස අරූප

ඛ්‍යාන උපදවන්නේයි. එහෙයින් අරූපාවචර විපාක සතර එකාන්තයෙන් රූපජනක නොවන්නේයයි දතයුතුයි. මූලටීකා යෙහි ප්‍රතිසන්ධි චිත්තයද රූප ජනක නොවන්නේයයි කියන ලදී. කුමක්හෙයින ද? කම්ජ රූපයන් විසින් චිත්තජ රූප යන්ගේ සථානය ගන්නාලද බැවින්ද, ඒ භවයට ආගන්තුක බැවින්ද ප්‍රතිසන්ධි සඛ්‍යාතවූ ව්‍යාපාරාන්තරයක් අපේක්ෂා කරණහෙයින්ද ප්‍රතිසන්ධි චිත්තය රූපජනක නොවන්නේයි. එහ කුදුවුවත් ඒ ප්‍රතිසන්ධි සිතම ඒ භවයෙහි වසන තාක්කල් මූලුල් ලෙහි භවාඞ්ගවශයෙන් පවත්නාකල්හි චිත්තජ රූප උපදවන්නේයි. එහෙයින් ප්‍රතිසන්ධි චිත්තයද තමාගේ සහභාගිකවූ භවාඞ්ගයන් විසින් රූප උපදවනහෙයින් ප්‍රතිසන්ධි සිතද රූප ජනක ප්‍රත්‍යය භාවයෙන් නොමිදෙන්නේයි, මාගීයෙහි යන් නාවූ පුරුෂ තෙමේ මාගීකලාන්තය නිසා සෑම විසින් කටයුතු කෘත්‍යය නොකටහැකිවාක්මෙන් ප්‍රතිසන්ධි චිත්තය රූප ජනක නොවියයුතුයි. කම්ජ රූපය වනාහි එක එක චිත්තක්ෂණයේ උපාදඤති ඝන යන ක්ෂණත්‍රයෙහිම කම්ජ රූපයන් උපදවන්නාක්මෙන් චිත්තජ රූප උපදවන්නාවූ චිත්තය තමාගේ සිති ඝඩ කාලයෙහි චිත්තජ රූප නූපදවා උත්පාදක්ෂණයෙහිම කුමක්හෙයින් රූප උපදවන්නේද යත්? චිත්තජ රූප ඉපදවීමට වනාහි පූර්වචිත්තයෙන් ආසෙවන ප්‍රත්‍යය බලවත් උපකාරයවෙයි, පූර්වචිත්තයෙන් ආසෙවන ප්‍රත්‍යය ලැබීම වනාහි උත්පාදක්ෂණයට මුත් සිති ඝඩක්ෂණවයට නොලැබෙන්නේයි. මෙසේ පූර්වචිත්තයෙන් ලැබෙන්නාවූ ආසෙවන ප්‍රත්‍යය සිති ඝඩයන්ට නොලැබෙනහෙයින් සිති ඝඩක්ෂණයෙහි චිත්තජ රූප නොලැබෙන්නේයයි දතයුතුයි. රූප උපදවන්නාවූ පස් සැත්කෑවක් චිත්තයන් අතුරෙන් සවසි අවසාන ජවනයෝ තුමූ රූප ඊර්ය්‍යාපථ සඛ්‍යාතවූ අභසින්යාම පොළව කිමිද යාම නොයෙක්දේ මවා පෑම යනාදිය උපදවන්නේයි. ව්‍යවස්ථාපන චිත්තය හා එකූන්හිස් සාමාවචර ජවන්හුය, අභිඥා කුශල අභිඥා ක්‍රියා යන දෙසිතය යන මෙතෙක් චිත්තයෝ තුමූ රූප ඊර්ය්‍යා පථ සඛ්‍යාතවූ කායවිඤ්ඤත්ති වචීවිඤ්ඤත්තිහුද උපදවන්නාහුවෙත්. සොමනස් සහගත තෙලෙස් ජවනයෝ තුමූ රූප ඊර්ය්‍යාපථය හා කායවිඤ්ඤත්ති වචීවිඤ්ඤත්ති දෙදෙනය සිනාවය යන මෙතෙක්දේ උපදවන්නාහුවෙත්. අසුභව යක් චිත්තයන් වෙන් වෙන් වශයෙන් බෙදූ රූපය ඉපදවීම දක් වන්නාවූ තන්හි ලොභ මූලිකවූ සොමනස් සහගත චිත්තයෝ සතරදෙන කම්ජරූපය, චිත්තජරූපය, ඊර්ය්‍යාපථය, විඤ්ඤත්ති

රූපය, සිතාසිමය, යන පසක් උපදවත්. ලොභ මූලිකවූ උපෙක්ෂාසහගත චිත්තයෝ සතරදෙන වනාහි යටකී පවඩමීයන් අතුරෙන් සිතාව හැර අවශෙෂ සතර උපදවත්නාහුය. වෙෂ මූලික මොහමූලික චිත්තයෝ සසරදෙන වනාහි කම්ජ රූපය, චිත්තජ රූපය, ඊර්ය්‍යාපථය, විඤ්ඤත්ති රූපවය, යන මේ සතර ධම්ය උපදවන්නාහුවෙති. දෙපස් විඥානයන් හා අරූපාවචර සතර විපාකය යනමේ තුදුස් චිත්තයෝ තුවූ ඒ එකද රූපය කුත් නූපදවන්නාහුවෙති. මනොධාතුත්‍රිකය සන්තීරණත්‍රිකය යන චිත්තයෝ සදෙන යටකී සවඩම්යන් අතුරෙන් එකම චිත්තජ රූපමාත්‍රයක් උපදවන්නාහුය. ව්‍යවස්ථාපන චිත්තය වනාහි චිත්තජ රූපය ඊර්ය්‍යාපථය, විඤ්ඤත්තියය යන තුණ උදවන්නේවෙයි. හසිතුපපාද චිත්ත නෙමේ චිත්තජ රූපය, ඊර්ය්‍යාපථය, විඤ්ඤත්තිරූපය, සිතාවය, යන ධම් සතරදෙන උපදවන්නාහුය. රූපාවචර කුශල ක්‍රියා නෙමේ කම්ජරූපය, චිත්තජ රූපය, ඊර්ය්‍යාපථය, විඤ්ඤත්තිය, යන සතර ධම්ය උපදවත්. රූපාවචර විපාක නෙමේ චිත්තජරූපය, ඊර්ය්‍යාපථය, යන ධම්වය උපදවන්නාහුය. රූපාවචර ක්‍රියා නොවේ චිත්තජ රූපය, ඊර්ය්‍යාපථය, යන ධම්යුගලය උපදවත්. අරූපාවචර කුශල ක්‍රියා යන අටදෙන වනාහි චිත්තජ රූපය, ඊර්ය්‍යාපථය යන ධම් යුගලය උපදවන්නාහුවෙත් ලොකොත්තර කුශල විපාක යන අටදෙන වනාහි චිත්තජ රූපය, ඊර්ය්‍යාපථය, යන ධම්වය උපදවන්නාහුවෙති. අටමහා කුශලයෝවනාහි ලොභ මූලික අකුශල් අට බෙදූ ක්‍රමයෙන් අවිශෙෂයෙන් බෙදියයුතුයි. මහාවිපාක අටවනාහි රූපාවචර විපාක පවකයට සම්ප්‍රකාර යෙන් සමානයි. මහාක්‍රියා අටදෙන අතුරෙන් සොමනස් සහගත මහාක්‍රියාවෝ සතරදෙන චිත්තජ රූපය, ඊර්ය්‍යා පථය, විඤ්ඤත්තිය, සිතාවය, යන සතර උපදවන්නාහුවෙති. උපෙක්ෂා සහගත මහාක්‍රියා සතරදෙකවකාහි සිතාව හැර අවශෙෂ ධම්යන් උපදවන්කාහුවෙති. සියලු තැන්හිම විඤ්ඤත්ති රූපවය ලැබෙන්නේවිටම ඊර්ය්‍යා පථයද ලැබෙන්නේයි. කුමක් හෙයින යත්? අවිනිබ්භොග ශුද්ධාෂ්ටක රූපකලාපයෙහි පෘථ්වි ධාතුව වෙන්කොටගන්නාකල්හි අවශෙෂ ධම් සප්තකයද ලැබෙන්නාක්මෙන් විඤ්ඤත්ති රූප හා ඊර්ය්‍යාපථයද වෙන්කොට හැක්කෙක්මැයි. සිතාවගේ හෙතු ධම්යෝ වනාහි යටකී නසින් අවබොධකටයුතුයි.

හසිතොත්පාදය වනාහි බුදු පසේබුදු මහරහත් යන ආර්ය්‍ය යන්වම ලැබෙයි. බුදුන්ගේ සියලු කාය වචී මනොකම්මයෝ ඥාන

පුථුඛහම බැවින් මේ ඝසිතෝතපාදය බුදුන්ට නූපදීඝයි ඇතැම් ආචාඝ්‍යී මතඝයි. ඒ යුකයි යුකත නොවන්නේයි. කුමක්හෙයින ඝත්? චාවොදහතකරණලද ග්‍රන්ථඊක් ඝයිවිප්‍රචා ඝයෙහුදු ඝඤ්ඣායතා කළහැකිවාක්මෙන් ඝඊඥතාඥතඥයට අනුව මේඝසිතෝතපාදය උපදියි. එහෙයින් මේ ඝසිතෝත් පාදය බුදුවරඝන්ට උපදනාකල්හී ඥානඝ පසු පස්සෙයි ගමන් කරණබවද, අවඝශඝ රහතුන්ට ඥානවිප්‍රයුක්තවද උපදනා බව දහයුතුයි. කම්ජ රූප කලාපඝන්නේ සිතිකාලයෙහි එම කම්ජ රූපඝන් තුන්දෙනා කෙරෙහි විද්‍යමානවූ තෙජෝ ධාතු තොමෝ පවිඝන්නිහුගේ සිති කාලඝට පැමිණිකල්හි බහිඛා තෙජෝ ධාතු සඞ්ඛ්‍යාතවූ ඊතොඝණඝ ලැබුණුකල්හී අඛ්‍යඝනතර තෙජෝ ධාතුහුද උතුජ රූප උපදවත්මැයි. ප්‍රතිඝන්ධි විත්තඝා ගේ උත්පාදඝණයෙහි වනාහි කුමක්හෙයින් උතුජ රූප උපද වන්නාහුද ඝත්? පච්ඡාජාත ප්‍රත්‍යඝයෙන් උපකාර නොලැබූ හෙයින් ප්‍රතිඝන්ධි විත්තඝාගේ උතපාදඝණයෙහි උතුජ රූප නූපදවත්. නොහොත් කම්ජ තෙජෝ ධාතුව විසින් උතුජ රූපඝන් ගේ සථානඝ ගන්නාලද හෙයින් උතුජ රූප නූපදවත් ප්‍රතිඝන්ධි විත්තඝාඝගේ සිතිකාලඝට පැමිණියේ නවුදු ප්‍රථම භවාඟ විත්තඝ නූපන්හෙයින් පච්ඡාජාත ප්‍රත්‍යඝ වන්නාවූ සිතක් නූපන් 1 සිතිකාලයෙහි ද උතුජරූප නූපදවත්. අධ්‍යාත්මික උතුජරූප තෙමේ බාහිරඋතුජරූපයෙන් උපඝතම්භ ලැබීමෙන්ම රූප ඝාගේ සිතිකාලඝට පැමිණීමෙන්ම උතුජරූප උපදවත් මැයි. මහාභූතඝන්ගේ පරම්පරාඝතව රූපඝන්ගේ ඝටඝඇණීම් වනාහි මව්ඝගෙන් දියනියන් ද, දියනියන්හෙන් මිනිඹිරිඝ ද, පරම්පරා වශඝයෙන් ඝටඝගන්නාක් මෙන් පෘථ්වීධාතුවෙන් තවත් පෘථ්වි ධාතුවක් ද, එසින් තවත් පෘථ්වීධාතුවක් දී යි මෙසේ පරම්පරා වශඝයෙන් රූපකලාපඝන්ගේ ඝටඝඇණීම වන්නේ යි. ආහාරජ රූප තෙමේ බාහිර වූ ඔවිරඝඝ ලැබීමෙන් හෙවත් බාහිර වූ ආහාරරූපඝෙන් රැකුල් ලැබීමෙන්ම අධ්‍යාත්මික ආහාරජ රූපඝ උපදවන්නේ මැයි. අධ්‍යාත්මික ඝනතානඝෙහි විද්‍ය මාන වූ කම්ජකලාපඝෙහි ඔජාව ඝ, චිත්තජකලාපඝෙහි ඔජාව ඝ, උතුජකලාපඝෙහි ඔජාව ඝ, ඝන මේ ත්‍රිවිධාකාර වූ ඔජා කලාපඝෝ තුමූ තමතමාගේ සිතිකාලඝට පැමිණිකල්හි ම අධ්‍යාත්මික ඝනතානඝෙහි ආහාරජරූපඝන් උපදවන්නේ යි. ඒ ආහාරජරූපඝ ද බහිඛාඔජාව ලැබීමෙන්ම ඒ ඔජාව ශරීර

1 ඝසිතෝතපාද චිත්තඝ සඞ්ඛ්‍යාවූ ආචාඝ්‍යීවාද මත භෙද ඇත්තේ කමුදු සමීඥ බුදුවරඝෝ ඥානසම්ප්‍රයුක්ත සිතින්ම සිනහ පහළකරෙත්,

යෙහි පැනිර ගිය කල්හි ම අඛ්‍යවහිතභවඞ්ගයෝ රූප උපද වත්. අඛ්‍යවහිතභවඞ්ගරූපයන්ගේ ඨිතික්ඛණය යනු කුඩා ක්ෂණ එකුන්පණසක්• ඨිති කාලය යි කියත්. අධ්‍යාත්මික සන්තානයෙහි ඇත්තා වූ ඔජා කොමේ ඨිති කාලයට පැමිණියේ නමුදු ඔහිඩාහාරයෙන් උපස්තම්භ නොලැබුයේ නම් එකාන්තයෙන් රූප නුපදවත් මැ යි. ඊට උපමා නම්:—දිට්ඨධම්මවෙදනීය කම්මයෙන් උපස්තම්භිතවූ අපරාපරිය වෙදනාකම්ය මෙනි. ඔහිඩාඔජාව හා දිට්ඨධම්මවෙදනීයය ද අධ්‍යාත්මික ඔජාව හා අපරාපරියවේදනීයකර්මය ද උපමාඋපමේය වශයෙන් සම්බන්ධ කට යුතු යි.

හෘදය ඉන්ද්‍රිය රූපයෝ තුමූ කර්මයෙන් ම හටගන්නා හෙයින් එකාන්ත කර්මජරූපයෝ නවදෙනෙකි. අවිනිබ්භොග සුද්ධඨකකලාපය, ආකාසධාතුව, යන මේ රූපයෝ තුමූ රූප ජනක සතර ප්‍රත්‍යයෙන් ම හටගන්නාහු වෙති. එහෙයින් අනෙකාන්තික කර්මජරූපයෝ නවදෙනෙකැ යි කියා ද, අට ළොස් කර්මජරූපකෙනෙක් වෙත්. විඤ්ඤත්තිරූපවත් එකාඟි සිතින් ම හටගන්නා හෙයින් එකාන්ත චිත්තජරූපවයක් ම වෙයි. ශබ්දය හා ලහුතාදිත්‍රයද, අවිනිබ්භොග සුද්ධාෂ්ටක රූප ද, ආකාසධාතුවද, යන මේකී රූපයෝ තුමූ සතර ප්‍රත්‍ය යෙන් ම හටගන්නා හෙයින් අනෙකාන්තික චිත්තජරූපයෝ තෙළෙස්දෙනෙක් වෙත්. මෙසේ එකාන්ත චිත්තජරූපයෝ දෙදෙනාය. අනෙකාන්තික චිත්තජරූපයෝ තෙළෙස්දෙනාය, යන ගණන් දෙක පිඬු සැළ කල්හි පස්ළොස් චිත්තජරූප කෙනෙක් වෙත්. ශබ්ද තෙමේ චිත්තජ ශබ්දය උතුජ ශබ්දය යි විභාග වෙයි. එයින් අකාරාදි අක්ෂරයන්ගෙන් උපදින ශබ්ද තෙමේ චිත්තජ ශබ්දනම්. බඩබුරහැමය, මෙඝශබ්දය, වාත ශබ්දය නාදිය උතුජ ශබ්ද නම්. නෙරිවිණාඝණ්ටා ආදි ශබ්දයන් චිත්තය කාරණකොටගෙණ ම හටගන්නා හෙයින් චිත්තජවර්ග උතුජශබ්ද නම් වෙයි ශබ්දලහුතාදිත්‍රය, අවි නිබ්භොගසුද්ධඨකරූපය, ආකාස ධාතුව, යන මේ තෙළෙස් රූපයෝ තුමූ උතුජරූපයෝ නම්වෙත්. ලහුතාදිත්‍රය, අවි නිබ්භොගරූපය, ආකාසධාතුය, යන මේ දෙළොස් රූපයෝ තුමූ ආහාරජ රූප නම් වෙත්.

සියලු ම චිත්තජ උතුජරූපයෝ වනාහි සෙසු ප්‍රත්‍යවයෙන් ද උපදනා හෙයින් අනෙකාන්තික ම වෙත්. ලක්ඛණ රූප සතරදෙන වනාහි අටළොස් නිප්පන්නරූපයන්ගේ උපාදටඨි

නිහඬයන් ම වන හෙයින්ද වසතු දශකාදී රූපයන්ගේ සව භාව ලක්ෂණයක් හෙයින්ද අසවල් ප්‍රත්‍යයෙන් හටනත්තාහුය යි නො කියයුත්තාහුය. කුමක්හෙයින ගත්? උත්පාදක්ෂණයෙන් වෙන් වූ රූපයෙක් නැත්තේයි. එබඳුහින් කම්ජරූප චිත්තජ රූප උතුජරූප ආහාරජරූපයෝ තුමූ උපාදවතීති හඬහයන් හෙන් ම යුක්ත වන හෙයින් ඒ සියලු ම රූපකලාපයන් හා සමග ලක්ෂණ රූපයෝ ද සෙදියයුත්තාහුය. එහෙයින් පිළිවෙළින් දෙවිසය, එකුන් විස්සය සතලොසය සොළසයයි කියා ගණන් කවයුත්තාහුය. යම් චිත්තයන සෙදෙන්නා වූ චේතසික ධර්මයන් හා චිත්තය ත් එකොන්පාදය, එකනිරොධය, එකාලම්බණය, එකවසතුකය යි සතර සම්ප්‍රයෝග ලක්ෂණයන් යුක්තවන්නාක්මෙන් එකිඑකී රූපකලාප සෙදෙන්නා වූ රූපධර්මයන්ගේ එකට ඉපදීමය, එකව නිරුඬවීමය, පෘථිවී ධාත්වාදී එක් වසතුවක් නිශ්‍රය කර ගැණීමය චක්ඛුරාදී එක් වසතුවක් හා පැවතීම් ඇති බව්ය යන ලක්ෂණ සතරයින් උපලක්ෂිතවූ රූපකලාපයෝ එක්විස්සක් වෙති. ඒට උදාහරණ නම්:- චක්ඛුදශකකලාපයෙහි භූතචතුෂ්කය, වණ්ණාදිචතුෂ්කය, චක්ඛුප්‍රසාදය, ජීවිතෙන්ද්‍රියය යන රූපයෝ දසදෙන ඉදිරිපසු නොව එකක්ෂණිකව හටගෙණ නිරුඬ වන්නා වූ කල්හි ද, ඉදිරිපසු නො වී එකක්ෂණිකව නිරුඬ වෙත්. මේ දශකයෙහි පෘථිවී ධාතුව අවශෙෂරූපනවයට ආධාර හෙවත් නිශ්‍රය වෙයි. මේ දශකය එහි භූතව පවතියි. මේ ලක්ෂණ සතරින් සියලු එක්විසි කලාපයෝ ම සමාන වෙත් මැ යි.

චක්ඛුදශකකලාපයෙහි ඇති එක් මහාභූතයෙක් තෙමේ අවශෙෂ භූතත්‍රයට නිශ්‍රය වෙයි. ඒ මහාභූතයෝ තුන්දෙන අවශෙෂ භූතත්‍රයට නිශ්‍රයස්ථාන වෙයි. මේ සතර මහාභූතයන්ගෙන් අවශිෂ්ට වූ රූපයෝ සදෙන තුමූ උපාදුරූප නම් වෙත්. ඒ උපාදුරූපයෝ සදෙන සතර මහාභූතය නිශ්‍රය කොට හෙණ පවත්නාහු වෙත්. චක්ඛුදශකකලාපයෙන් අන්‍ය වූ මහාභූත නම් වූ ශ්‍රොත්‍රදශකකලාපයෙහි ඇති මහාභූතයන් අනිත් කලාපයෙහි ඇති මහාභූතයෙක් නිශ්‍රය නොව නො ගණියි. "සහ වුත්තිනො" යන පදයෙන් මේ රූපකලාපයෝ විසිඑකදෙන එක්ව පවත්නාහුය යි අර්ථ නො ගතයුතු යි. එසේ ම එකට උපදනේය. එකට නිරුඬවන්නේය යි කියා ද අර්ථ නො ගත යුත්තාහුය. එතකුදුවුවත් පාලියෙහි "එකුප්පාදා එකනිරොධා එකනිස්සයා සහවුත්තිනො එකවීසති රූපකලාපා" යන පාඨ

යෙන් මේ එක්විසි රූපකලාපයෝ එකවිට උපදනාහුය, එක විට නිරුඬවන්නාහුය එකනිශ්‍රයය එක්ව පවත්නාහුය යි යන අර්ථයක් හැඟේ. එතකුදුවුවත් ඒ ලක්ෂණ සතර එකම රූප කලාපයෙක් හි හටගන්නා වූ රූපයන්ට මුත් අන්‍යකලාපයක් හා ඒ අර්ථවතුෂ්කය නො යෙදෙත්ය යි දතයුතුයි. අවිනිබ්භොගකලාපය, ජීවිතෙන්ද්‍රියය, චක්ඛුප්පසාදය. යන දශයට චක්ඛුදි ශතකලාපය යි කියත්.

ඒ චක්ඛුදිශතකලාපය ද මහා නිද්දේසපාලියෙහි:- උකුණු හිසකට බදු වූ උපමා ඇත්තේය යි ආයුෂ්මත් සාරිපුත්‍රස්ථවිරයන්වහන්සේ විසින් වදරණ ලද්දේ යි. මෙහි වනාහි උකුණු හිසය යි කී කල්හි ඒ උකුණාගේ චක්ඛුශ්‍රෝත්‍ර ඝ්‍රාණ ජිහ්වා කාය සංඛ්‍යාත වූ කලාපපවකයන් ඇති බියයුතු හෙයින් උකුණු හිස් ප්‍රමාණය සිතලු සත්ත්වයන්ගේ චක්ඛුප්පසාදය සදහා නො වදුල බව ද, උකුණු හිසෙහි ඇත්තාවූ චක්ඛුප්පසාදකලාපය ඒ උකුණු හිසේ ප්‍රමාණයට කුඩාව ඇති බව ද, ආනන්දාදී යොදුන් සිය ගණන් දිගැති සත්ත්වයන්ගේ චක්ඛුප්පසාදය උකුණු හිසක් නො බියයුතු යි. එහෙයින් මහා නිර්දේශපාලියෙහි:- වර්තමානකාලික මනුෂ්‍යයන්ගේ චක්ඛුප්පසාදකලාපය උකා ගත්තේ වී නම් එය උකුණුහිසක් ප්‍රමාණ වෙයි. ඒ උකුණුහිසක් ප්‍රමාණ චක්ඛුප්පසාද යෙහි බොහෝකලාපයන් එකතුව උකුණුහිසක් ප්‍රමාණ බව ද දතයුතු යි.

ඒ චක්ඛුප්පසාද කලාපයෙහි චක්ඛුප්පසාදය උදුරා ශ්‍රොත්‍රය යෙදූ කල්හි ශ්‍රොත්‍රකලාපය ද, එය උදුරා ඝ්‍රාණය යෙදූ කල්හි ඝ්‍රාණ ප්‍රසාදකලාපය ද, එය උදුරා ජිහ්වාප්‍රසාදය යෙදූ කල්හි ජිහ්ව ප්‍රසාදකලාපය ද, එය උදුරා කායකලාපය යෙදූ කල්හි කාය ප්‍රසාද කලාපය ද, භාවවස්තූන් යෙදූ කල්හි භාවකලාපය ය, වත්ථුකලාපය, යන කලාපයෝ හටගන්නේ අවිනිබ්භාග ශුද්ධාෂ්ට කකලාපය සහා ජීවිතෙන්ද්‍රියය යෙදූ කල්හි ජීවිතනවකකලාපය වෙයි. ජම්බුවෘක්ෂය ආශ්‍රය කොට ගෙණ ජම්බුවිපය යි කියන්නාක් මෙන් චක්ඛුප්පසාදය නිසා චක්ඛුර්දශකකලාපය යි කියා ද, සෙසු කලාපාදීහු ද එසේ ම ඒ ඒ ප්‍රධාන රූපය නිසා කලාප නියමය ව්‍යවහාර කරන්නේ යි. එකාන්න කම්ජ රූපයෝ නව දෙනය, අනෙකාන්තික කම්ජ රූපනවදෙනය යි කම්ජ රූප යෝ අටලොස්දෙනෙක් වෙත්.

අවිනිබ්භොග ශුඛාෂ්ටකකලාපය එක් කලාපයෙක්වෙයි. ඒ ශුඛ, ෂ්ටකයට කායවිඤ්ඤත්තිය සෝදකාය විඤ්ඤත්තිය නවකකලාපය යි කියත්. ඒ ශුඛාෂ්ටකයට වචීවිඤ්ඤත්තිය හා ශබ්දය බහා වචී විඤ්ඤත්තිදශකය යි කියා ද, ඒ ශුඛාෂ්ටකයට ලහුතා මුදුතා කම්ම ඤ්ඤතා ඉන තුණ යොදු ලහුතාදී එකාදශකකලාපය යි කියා ද, එම ශුඛාෂ්ටකයට කායප්‍රඥප්තිය හා ලහුතාදී තුණ යොදු ලහුතාදී වාදශකය යි කියා ද, එම ශුඛාෂ්ටකයට ම වචීවිඤ්ඤප්තිය හා ලහුතාදී තුණ යොදු වචීවිඤ්ඤත්තිවාදශකය යි කියා ද, එම ශුඛාෂ්ටකයට වචීවිඤ්ඤත්තිය හා ශබ්දය ලහුතාදී තුණය ඉන මෙකී රූපයන් පස්දෙන බහා වචීවිඤ්ඤත්තිතෙරසකය යි කියා ද, මෙසේ චිත්තජ රූපකලාපයෝ සදෙනෙක්වෙත්. ශුඛාෂ්ටකය එක්කලාපයක් වෙයි. ශබ්ද නවකය එක්කලාපයක්වෙයි. ඒව ලහුතාදී තුන්දෙන එක් සොළොස්ලහුතාදී එකාදසක කලාපය යි කියා ද, ඒ ශුඛාෂ්ටකයටම සද්දලහුතාදී වතුෂ්කය බහා සද්දලහුතාදී වාදසකකලාපය යි කියා ද, මෙසේ උතුජ කලාපයෝ සතරදෙනෙක් වෙත්. ශුඛාෂ්ටකය එක් කලාපයෙක් වෙයි. ඒව ලහුතාදී තුණ එක් කොට ලහුතාදී එකාදසකකලාපය යි කියත්. මේ ආහාරජ කලාපයෝ දෙදෙනවෙත්. මෙ එක්විසි රූපකලාපයන් අතුරෙන් උතුජ සුඛවර්ණකලාපය, උතුජ සද්ද නවකකලාපය, ඉන කලාපදෙදෙන බහිඛ්‍යඤ්ඤාතඤෙහිද ලැබෙත්. හෙවත් පෘථිවී පර්වත සමුද්‍ර ඝඩහා ආදීවූ සියල්ලෙහි උතුජ සුඛවර්ණකලාපය ද, සමුද්‍රඝෝෂා මෙඝගර්ජනා ආදී අවි ඤ්ඤණකඤඤාණයෙහි පවත්නා වූ සියලු ශබ්දයෝ උතුජ ශබ්ද නවකකලාප නම් වෙයි.

මේ එක්විසි රූපකලාපයෝම කාමධාතුවෙහි සුදුසු පරිද්දෙන් ලැබෙත්. මේ එක්විසි රූපකලාපයන් අතුරෙන් අනුපාදිණ්ණකඤඤාණයෙහි නොඑහාත් පෘථිවිපර්වත ඝඩහා සමුද්‍රාදී සියලු අවකාශලෝකයෙහි උතුජ සුඛවර්ණකලාපය හා උතුජ සද්දනවකකලාපයදලැබේ. උපපාදිණ්ණක ඤඤාණයෙහි මේ සියල්ලම්ලැබේ. අවශෙෂ වූ ශබ්දයන් පිළිබඳව හටගන්නා වූ භෙරිවීණා දී ශබ්දය චිත්තජවචය උතුසමුට්ඨානික ශබ්දය යි. චිත්තජ ශබ්දය වනාහි මුඛයෙන් පිටත නොවන්නේය. එහෙයින් මුඛයෙන් පිටතට යන්නාවූ ශබ්දය චිත්තජවචය උතුසමුට්ඨාන ශබ්ද නම්. මේ එක්විසි රූපකලාපය ම කාමධාතුවෙහි පරිපූර්ණආයතනඇති සත්වයන්ටම නො අඩුව ලැබෙත්. සත්වයන් අතුරෙහුදු කාමධාතුවෙහි උපදනා ස්ත්‍රියෙක්ට නම් පුරුෂභාවකලාපය හැර විසිඅලාපයෙක් ද, කාමධාතුවෙහි උප

දනා පුරුෂයෙක් වී නම් ප්‍රථමකල්පික සත්ත්වයන් හැර අවශෙෂ විසිකලාපයක් ලැබේ. ප්‍රථමකල්පිකයන්ට වනාහි කාමරාගය ඉපදීම දක්වා භාවකලාපවය කැර එකුන්විසිකලාපයෙක් ම ලැබේ. ජාතිනපුංසක ජාතිපණ්ඩක උභතොබ්‍යඤ්ජනක සත්ත්වයන්ට ද භාවකලාපවය ම නොලැබෙන හෙයින් එකුන්විසිකලාපයෙක් ම ලැබෙන්ය යි දතයුතු යි.

පරිවෙජද ආකාසධාතුව රූපකලාපයන් වෙන්කරන ලක්ෂණ ඇතිහෙයින් වෙන්වෙන්ව ලැබේ යි. ලක්ෂණරූපයන් සතරදනා කෙරෙහි ද උපචයසන්තතිරූපවය වනාහි එක්ව හටගන්නේය. එක්ව නිරුඬවන්නේය. අනිච්චතාරූපය ද නිරුඬවන්නේ යි ජරතාරූපයෙහි වනාහි ඒ චතුර්විධලක්ෂණය නොලැබෙන්නේ යි. මෙසේ ආකාසධාතු උපචය සන්තති ජරතා අනිච්චතා යන රූපයන්ගේ කලාපබන්ධනය නොලැබේ යි. කුමක් හෙයිනයත්? රූපයන්ට සාධාරණ වූ ලක්ෂණය නැති හෙයි නැයි දතයුතු යි, නොහොත් අනිප්පන්නරූපයෝ තුමූ සෙසු චක්ඛුරාදී රූපයන් මෙන් වෙන්වෙන්ව නැති හෙයින් ආකාසධාතු ලක්ෂණරූපයන්ගේ කලාපබන්ධනය කෙරෙන්නේ යි. ඉදින් එසේ වී නම් ලහුතා මුදුතා කම්මඤ්ඤතා යන රූපත්‍රය හා විඤ්ඤත්තිරූපවය ද කුමක්හෙයින් කලාපාඛ්‍යවශයෙන් නියමකළේද යත්? ඒ රූපයෝ පස්දෙන වනාහි නිප්පන්නරූපයන් මෙන් වෙන්වෙන්ව නොලැබෙන්නේ නමුදු නිප්පන්නරූපයන් හා එක්ව හටගැණීමය, එක්ව නිරුඬවීමය, සමානනිශ්‍රයසථාන ඇති බවය සහ වෘත්තිය යන මේ සිඟලු රූපයන්ට ම සාධාරණ වූ ලක්ෂණචතුෂ්කයෙන් යුක්ත හෙයින් කලාපාඛ්‍යවශයෙන් නියම කරන්නේ යි.

ඒ රූපයන් පස්දෙන වනාහි ජාතිමත් වෘෂභයාය, පශ්චිමභවික වූ බොධිසත්ත්වයෝය, යන දෙදෙන හැර අන් කිසි සත්ත්වයෙක්හට මව්කුසින් බහිනිෂ්ක්‍රමණය හා සමග නොලැබෙන්නේ යි ඒ එසේ මැ යි. මහාබොධිසත්ත්වයන් වහන්සේ මව්කුසින් බිහිව පෘථිවියෙහි පිහිටීම හා සමග ලහුතා මුදුතා කම්මඤ්ඤතා යන රූපත්‍රය හා සාධාරණසඤ්ඤතාති විඤ්ඤත්තිවය ද එකවිට ම පහළව උත්තරදිසාභිමුඛව සත්තපදවීතිහාරයක් ගොස් "අග්ගොහමස්මි ලොකස්ස" යනාදීන් අසීතානුබ්‍යඤ්ජනාදකළෝ. ඊට උපමා දක්වන්නා වූ මහසෙරුන වහන්සේලා වනාහි:-"මුහුත්තජාතොව ගවම්පති යථා" යනාදීන් ගවයන් දහසකට නායකව උපදනා ගවශ්‍රෙෂ්ඨයා ම උපමා කරණ ලද්දේ යි. අවශෙෂ සියලු සත්ව

යන්ට බොධිසත්වයන්වහන්සේට මෙන් ලහුතාදී රූපපවකය සම්පූර්ණව නොලැබේ.

අවිනිබෙහාගරූපඅවය ශබ්දනවකකලාපයෙහි රූපනවය යන මේ සතළොස්රූපය උපචය සන්තති ජරතා අනිච්චතා යන ලක්ෂණරූප සතරින් ගුණිත කළ කල්හි අවසැවක් රූප ඔෝ වෙත්. ඒ අටසැවරූපයන්ගේ එක එක රූපයක් පෘථ්වීධාතු පසළොස්දෙනෙක් එක් ක්රියමෙන් අසූතුන්රූප කුමෙකක් වෙත්. ඒ අසූතුන්රූපයට පළමු කී සතළොස් රූපය ඔහා එක්සියයක්රූපයෝ වෙත්ය යි දතයුතු යි. මෙසේ ගණන් කිරීම අර්ථකථාචාරීන්ට විරුඬ බැවින් සියලු කල්හි ම එකානතයෙන් නො ලැබෙන්නේය යි දතයුතු යි. කාමභූමියෙහි අවවිසිරූපය ම ලැබෙන්නේ නම්වූ ප්රතිසන්ධිකාලයෙහි ජරතා රූපය. අනිච්චතාරූපය, ලහුතාදී රූපපවකය, ශබ්දය යන මෙතෙක් රූපයෝ නො ලැබෙත් එතකුදුවුවත් මව්කුස පැවැත්ම කාලයෙහි ලහුතාදී රූපපවකය හා ශබ්දය ත් හැර අවශෙෂ සියලු රූපයෝ ලැබෙත්. මව්කුසින් බිහි වූ වහාම ශබ්ද කලාපය හා යව කී නසින් ලහුතාදී රූපපවකය ද පිළිවෙළින් ලැබෙත්.

ගබ්භසෙය්යකසත්වයන්ට වත්ථු කලලඝනාවය, අර්බුදඝනාවය, පෙසිඝනාවය, ඝනඝනාවය, ප්රශාඛඝනාවය යි පවඝනාවයක් ඉක්ම ගිය කල්හි කෙසලොමඝත්තභාවය, චකඛු සොතඝාණජිවහාඝත්තභාවය යි මෙසේ සත්ඝත්තභාවයෙක් වන්නේය යි අර්ථකථාචාරීහු කියත්. මූලටීකායෙහි වත්ථු:-කලල දෙඝත්තභාවයෙක, අබ්බුදදෙඝත්තභාවයක, පෙසිදෙඝත්තභාවය, ඝනදෙඝත්තභාවය, පසාඛදෙඝත්තභාවයකැයි මෙසේ දඝසත්ත භාවයක් ඉක්ම ගිය කල්හි එකොළොස් වන සත්තභාවයෙහි චක්ඛුදී ශකය ද, දෙළොස් වන සත්තභාවයෙහි සොතදශකය ද, තෙළෙස්වන සත්තභාවයෙහි ඝාණදශකය ද, තුදුස්වන සත්තභාවයෙහි ජිවහාදශකය ද, මෙසේ ක්රමයෙන් පහළවන්නේය යි කියේය ගබ්භසෙය්යකප්රතිසන්ධි ගන්නා සත්වයන්ට ප්රතිසන්ධිය හා සමග ස්ත්රියෙක් වී නම් ස්ත්රීභාවදශකය හෝ පුරුෂයෙක් වී නම් පුම්භාවදශකය ද, භාවදශවස්තුදශකය, කායදශකය, යන රූපකලාපයෝ තුන්දෙනෙක් ප්රතිසන්ධිචිත්තයාගේ උත්පාදක්ෂණය හා සමග එකක්ෂණිකව පහළවන්නාහුය. මෙසේ කර්මජ රූපයන්ගේ පහළවීම සියලු චිත්තයන්ගේ උත්පාදක්ෂණ සිති ක්ෂණ භඞ්ගක්ෂණ යන සියලු ම ක්ෂණයෙහි ලැබෙත්. ප්රතිසන්ධි

සිතට අනතුරුව හටගන්නා වූ පළමු චිත්ත භවාඞ්ගචිත්තයාගේ උත්පාදක්ෂණය පටන් විත්තජ රූපය පහළවීමට පවත්නාක් සි.

ප්‍රතිසන්ධිචිත්තයාගේ උත්පාදක්ෂණය හා සමග පහළ වූ රූපකලාපත්‍රයෙහි ඇත්තාවූ තෙජෝධාතු සඞ්ඛ්‍යාත ඍතු තොමෝ සීතිකාලයට පැමිණි කල්හි පච්ඡාජාතප්‍රත්‍යය ලැබීමෙන් උතුජ රූපයන්ගේ ද හටගැණීම පවත්නාක් සි, ආහාරජ රූපය වනාහි මව හිසින් අනුභව කරණ ලද්දා වූ ආහාරඕජාව ළදරුවාගේ ආමාශයට පැමිණීමෙන් බාහිරආහාරය වූ එයින් රැකුල් ලැබීමෙන් ම ආහාරරූපය උපදවන්නට පවත්නාක් සි. එසේ ම සංසේදජ ඔපපාතික සත්ත්වයන්ගේ ඉඛයෙහි ශෙෂ්මය හටගත් තැන් පටන් ආහාරජ රූප උපදින්නට පවත්නාක් සි. මේසේ සමීචිත්ත ඍතු ආහාර යන සතර ප්‍රත්‍යයන්ගෙන් ප්‍රදීප ජ්වාලාවක් මෙන් ජීවිතානන්තය මුලුල්ලෙහි රූපකලාපයන්ගේ හටගැණීම අවිච්ඡින්නව පවතී සි. ප්‍රදීපොපමාවෙහි අභිප්‍රාය නම්:—ප්‍රදීපකපාලයෙක්හි තෙල් වත්කොට පහන දැල්වූ කල්හි තුන්යම් රාත්‍රිය මුලුල්ලෙහි ඒ ප්‍රදීපය නොනිමී පවත්නේ නම් පෙරයම දැල් වූ ප්‍රදීපජ්වාලාව ම රාත්‍රිය මුලුල්ලෙහි නොනිමී පැවතුනේය යි සිතත්. එසකුදුවුවත් ඒ ප්‍රදීපජ්වාලාවන්ගේ පැවැත්ම චිත්තක්ෂණ සතළොසකට ආයුෂ ඇත්තා වූ පහන් සිළුසමූහයන්හුගේ එක්වීමෙන් බලන්නවුන්ට එහි මෙතෙක් පහන්සිළු ඉක්ම ගියෝය. මේතෙක් පහන්සිළු උපන්නාහුය යි නොවැටහෙත් මැ සි. එසකුදුවුවත් එක ද පහන්සිළුවක් චිත්තක්ෂණ සතළොසකින් ඔබ්බට නොගොස් නිරුඛවන්නේ සි. අනිඝමිතදායුෂ ඇත්තා වූ පහන්සිළු බොහෝ ගණනක් හට ගණිමින් බොහෝ ගණනක් නිරුඛවෙමින් එක ම සන්තානයෙහි පවත්නා හෙයින් ප්‍රදීපජ්වාලාව තුම්යම් රාත්‍රිය මුලුල්ලෙහි එකාකාරව පැඬිති නිමී ගිය කල්හි ම දැන් ඉතින් පහණ නිවී ගියේය යි ව්‍යවහාර කරන්නාක්මෙන් ම ප්‍රතිසන්ධි සිත හා සමග එකොක්පාදා වූ රූපකලාපයෝ තුමූ සතළොස් චිත්තක්ෂණය කින් බිඳී ගොස් අනිත් අනිත් රූපකලාපකෙනෙක් එක ම සන්තානයෙහි උපදිමින් සියක්අවිරුද්දක් මුලුල්ලෙහි චිත්ත ක්ෂණ සතළොසින් සතළොසව ඇති වන්නාවූ ඛණිකමරණය නොදැන ඒ රූපයන්ගේ සන්තානවිච්ඡේද සඞ්ඛ්‍යාත වූ සමුච්ඡේදමරණය ම මරණය සි සලකන්නාහුය.

මෙසේ සමුච්ඡේදමරණය වන්නා වූ සත්වයාගේ චුතිචිත්තය පවත් ආපසු හිඳුණු කල්හි සතළොස් වන චිත්තක්ෂණයාගේ

උත්පාදක්ෂණය හා සමග කර්මජ රූපයන්ගේ පහළවීම වලක්වන්නේ ය. පළමු උපන් කර්මජ රූපයෝ ද චුතිචිත්තයට සමකාලීව ම නිරුද්ධ වෙති. චිත්තජ රූප ආහාරජ රූපයෝ වනාහි චුති චිත්තය පවත් සතළොස් චිත්තක්ෂණයක් පමණ කල් පැවති නිරුද්ධ වෙති. ඉන් මතු මෘතශරීරය යි ව්‍යවහාර කරන්නාවූ උතුජ රූපයෝ සෙස වෙත්. එම රූපයෝ වනාහි ඝණ්ඩාක් කල් සත්වයාගේ අසපිහු පවත්නාහු ද ඒතාක් කල් මුලුල්ලෙහි උතුජ රූපයෝ පවත්නාහු වෙත්. මේ වනාහි ඝඛහ ඝඝඝඝඝඝ ඝඝදජ ඝඝඝයන්ගේ පැවැත්මයි.

සෝවාන් ආදී මාර්ගඥයෙන් හමු කටයුතු හෙයින් කුදු මහත් භවයන් හෙවත් මනුෂ්‍යගතියෙහි දිව්‍යගතියද, දිව්‍යගතියෙන් බ්‍රහ්මගතිය ද, බ්‍රහ්මගතියෙන් නැඹිත දිව්‍යගතිය ද, එයින් මනුෂ්‍යගතිය ද, මනුෂ්‍යගතියෙන් අපායගතිය ද, යනාදී ක්‍රමයෙන් කුඩා භවයෙන් මහත් භවය ද, මහත් භවයෙන් කුඩා භවය ද, උඩුයටි නොට මසනා බිමෙන් වාතය යි කියන ලද්දා වූ තෘෂ්ණාවෙන් නික්ම ගිය හෙයින් නිර්වාණ සඞ්ඛ්‍යාත වූ ලෝකොත්තර ධර්මයන්ට අරමුණු වන්නා වූ යම් ධර්මයක් වේ ද ඒ ධර්මය නිර්වාණ නම් වෙයි. ඒ නිර්වාණධර්මය වනාහි අවශිෂ්ට වූ සඤ්ඤ ඇති හෙයින් සඋපාදිශෙෂනිර්වාණය, අවශිෂ්ට වූ සඤ්ඤ යක් නැති හෙයින් අනුපාදිශෙෂනිර්වාණධාතුය යි දෙවැදෑරුම් වෙයි. "තණ්හාදිට්ඨිඋපහතේන කම්මුනා අත්තභාවෝ ඵලඤ්ච වෙන ආදියතීති උපාදි-උපාදි එව සෙසෝ නත්ථි කිලෙසාතිඋපාදි සෙසෝ. නත්ථි උපාදි සෙසෝ එතස්සාති අනුපාදිසෙසෝ". යනු නිර්වචන යි. එහි අභිප්‍රාය නම්:— ක්ලේශයන්ගෙන් වෙන් වූ පඤ්චස්කන්ධය ප්‍රතිබද්ධ වූ නිර්වාණධාතුව සඋපාදිශෙෂය යි යනු ද, ඒ පඤ්චස්කන්ධයෙන් වෙන් වූ නිර්වාණධාතුව අනුපාදිශෙෂය යි යනු අභිප්‍රාය යි. එසින් සඋපාදිශෙෂ නිර්වාණධාතුව වනාහි ගිනි. ගානා දඬු දෙකක් එකට ඝෂණයෙන් ගවගන්නා වූ ගින්නක් මෙන් ද, අනුපාදිශෙෂ නිර්වාණධාතුව චක්‍රවර්තිරජහුගේ චක්‍රරත්නය මෙන් දැයි ආයුෂ්මත් නාගසේනස්ථවිරයන් වහන්සේ විසින් විදාරණ ලදී.

ඒ ගින්න වනාහි විඤ්ඤාණ වී නොයන්නාක් මෙන් ද, දස දිසාවන් අතුරෙන් අසවල් දිසාවෙහි පවත්නේය යි කොයහැකිවාක් මෙන් ද, ඒ නිර්වාණධර්මය ද විනාශ වන්නේය යි කියා හෝ අසවල් දිසායෙහි පවත්නේය යි කියා හෝ නොකියත්තේය යනු අභිප්‍රාය යි. විභඞ්ගඅට්ඨකථායෙහි:-"අරහතෝ ඛන්ධා පටිබද්ධමෙව" යනු කියන ලදී. එහෙයින් බුදුපසේබුදුමහරහත්

යන උත්තමයන්ගේ දැවිමෙන් ඇතිවන්නා වූ අබඇටයක් පම
ණ වූ ධාතුවකට පවා වැඳීම් ආදිය කරණකොටගෙණ සුගති
මොක්ෂ ප්‍රතිලාභය වින්නේ ය. ඒ නිර්‍වාණය වනාහි සියලු කෙ
ලෙසුන්ගෙන් සිස් වූ ගෙයින් සුඤ්ඤතය යි කියා ද රාගාදී
නිමිති රහිත ගෙයින් අනිමිත්තය යි කියා ද, කෙලෙසප්‍රාර්‍ථනා
වෙන් පහ වූ ගෙයින් අපණිහිතය යි කියා ද ව්‍යවහාර කෙ
රෙත්. හෙවත් මාර්ගවිපියෙහි පරිකර්‍ම උපචාර අනුලෝම ගොත්‍රභූ සඛ්‍යාත වූ පූර්‍වභාගප්‍රතිපදාවන් අතුරෙන් අනුලෝම චිත්ත
ය වනාහි සුඤ්ඤත වශයෙන් වැටහී ඒ අනුලෝමචිත්තය උපන්
නේ චිත්ත ඒ සිත හා එක්ව යෙදුනා වූ ප්‍රඥෛතසික සුඤ්ඤ
තානුපස්සනාවය යි කියා ද, එම විපියෙහි උපදනා මාර්ගචිත්තය
සුඤ්ඤතවිමොක්ෂමුඛ ය යි කියා ද, ඒ මාර්ගයට අරමුණුවන්නා වූ
නිර්‍වාණධාතුව සුඤ්ඤතනිර්‍වාණය යි කියා ද ව්‍යවහාර කෙරෙත්.
එපරිද්දෙන් ම කෙලෙස සඛ්‍යාත වූ නිමිත්තෙන් තොරව අනු
ලෝම සිත උපදනේ වේ ද, එකල්හී පෙර සේ ම අනිමිත්තානු
පස්සනා අනිමිත්තවිමොක්ෂ අනිමිත්තනිර්‍වාණය යි ව්‍යවහාර
කෙරෙත්. අපණිහිතානුපස්සනා අපණිහිතවිමොක්ෂ මුඛ අප්‍ර
ණිහිතනිර්‍වාණය ද මේ ක්‍රමයෙන් ම දතයුතු යි.

මෙසේ මේ පරිච්ඡේද සයකින් යථාප්‍රතිඥත සතරාකාර වූ
පරමාර්‍ථධර්‍මය ප්‍රතිඥත පරිද්දෙන් ම සම්පූර්‍ණ කරණ ලද්දේය යි
දතයුතු යි.

මෙසේ අභිධම්මත්ථ සංග්‍රහයෙහි රූපසංග්‍රහනාම වූ
සයවෙනි පරිච්ඡේදයනිමිත්තේ යි.

(ප)

සලක්ඛණා, ආරම්මණවිජානනය ථූලණය සඛීණබවය
සාන්තබවය යනාදී වූ තමතමාගේ කෘත්‍යය ලක්ෂණය හා සමග
හටගන්නා වූ; වාසත්තනි ඵලා, දෙසැත්තැවක් ප්‍රභේද ඇත්තා
වූ; වත්‍ථුධම්මා, සවභාවධර්‍මයෝ; මයා, මා විසින්; වුත්තා, කියන
ලද්දාහුය. දානි, (ඉදානි) දැන් වනාහි; තෙසං, ඒ දෙසැත්තැවක්
ප්‍රභේද වූ සවභාවධර්‍මයන්ගේ; සම්භවයං, රැස්කිරීම; යථායො
ගං, යෙදීමට සුදුසු පරිද්දෙන්; අහං, මම; පවක්ඛාමි, ප්‍රභේද
වශයෙන් කියමි. අකුසලඝඛඛහොව, අකුශල සංග්‍රහය ද; මිස්ස
කඝඛඛහොව, කුශලාකුශල අව්‍යාකෘතධර්‍මයන්ගේ මිශ්‍රක
සංග්‍රහයෙක් ද; බොධිපක්ඛිය ඝඛඛහොව, සත්තිස් බොධිපාක්ෂික

ධම්මයන්ගේ සංග්‍රහයෙක් ද; සබ්බසඞ්ගහෙහා ච, ඛන්ධාදතන සත්‍ය සංඛ්‍යාන වූ සත්ධම්මයන්ගේ සංග්‍රහයෙක් ද; ඉති, මෙසේ; චතුබ්බිධෙහා, සතරවැදෑරුම් වූ; සමුච්චය සඞ්ගහෙහා, සමුච්චය සංග්‍රහය තෙම්; වෙදිතබ්බා, දතයුත්තේ සි.

කථං, කෙසේ දතයුත්තේදයත්? අකුසලසඞ්ගහෙ, අකුසලසංග්‍රහයෙහි; (තාව විභාගෝ මියා වුච්චතෙ) යත්‍ර අධ්‍යාහාර සි. ආසවා, ආශ්‍රවයෝ තුමූ; කාමාසවෝ කාමාශ්‍රවයෙක් ද; භවාසවෝ, භවාශ්‍රවයෙක් ද; දිට්ඨාසවෝ, දෘෂ්ටාශ්‍රවයෙක් ද; අවිජ්ජාසවෝ, අවිද්‍යාශ්‍රවයෙක් ද; ඉති, මෙසේ; චත්තාරෝ හොන්ති, ආශ්‍රවධර්මයෝ සතරදෙනෙක් වෙත්.

ඔඝා, ඕඝයෝ තුමූ; කාමෝඝෝ, කාමෝඝයෙක් ද; භවෝඝෝ, භවෝඝයෙක් ද; දිට්ඨෝඝෝ, දෘෂ්ටිඕඝයෙක් ද; අවිජ්ජාඝෝ, අවිද්‍යාඕඝයෙක් ද; ඉති, මෙසේ; චත්තාරෝ (හොන්ති) සතර දෙනෙක් වෙත්.

යොගා, යෝගධර්මයෝ තුමූ; කාමයොගෝ, කාමයෝගයෙක් ද; භවයොගෝ, භවයෝගයෙක් ද; දිට්ඨියොගෝ, දෘෂ්ටියෝගයෙක් ද; අවිජ්ජායොගෝ, අවිද්‍යායෝගයෙක් ද; ඉති, මෙසේ චත්තාරෝ (හොන්ති) සතරක් වෙත්.

ගන්ථා, ග්‍රන්ථධර්මයෝ තුමූ; අභිජ්ඣාකායගන්ථෝ, අභිධ්‍යා කායග්‍රන්ථයෙක් ද; ව්‍යාපාදෙකායගන්ථෝ, ව්‍යාපාදකායග්‍රන්ථයෙක් ද; සීලබ්බතපරාමාසෝ කායගන්ථෝ සීලබ්බතපරාමාස කායග්‍රන්ථ යෙක් ද; ඉදං සච්චාභිනිවෙසෝ කායගන්ථෝ, ඉදා සත්‍යාභිනි වෙසකායග්‍රන්ථයෙක් ද; ඉති, මෙසේ; චත්තාරෝ (හොන්ති) සතරදෙනෙක් වෙත්.

උපාදානා, උපාදාන ධර්මයෝ තුමූ; කාමූපාදානං, කාමූපාදා නයෙක් ද; දිට්ඨූපාදානං, දෘෂ්ටිඋපාදානයෙක් ද; සීලබ්බතූපාදා නා, සීලබ්බතූපාදානයෙක් ද; අත්තවාදූපාදානං, අත්තවාදූපාදා නයෙක් ද; ඉති, මෙසේ; චත්තාරෝ (හොන්ති) සතරක් වෙත්.

නීවරණානි, නීවරණධර්මයෝ තුමූ; කාමච්ඡන්දනීවරණං, කාමච්ඡන්දනීවරණයෙක් ද; ව්‍යාපාදනීවරණං, ව්‍යාපාදනීවරණ යෙක් ද; පිනම්ඛනීවරණං, පිනම්ඛනීවරණයෙක් ද; උඛවච කුක්කුවනීවරණං, උඛවච්කුක්කුච්චනීවරණයෙක් ද; විචිකිච්ඡා නීවරණං, විචිකිච්ඡානීවරණයෙක් ද; අවිජ්ජානීවරණං, අවිද්‍යා නීවරණයෙක් ද; (ඉති, මෙසේ;) ඡ, (හොන්ති) සයක් වෙත්.

අනුසයා, අනුසයධම්මෝ තුම්හ; කාමරාගානුසයෝ, කාම රාගානුසයෙක්ක; භවරාගානුසයෝ, භවරාගානුසයෙක්ක; පටි ඝානුසයෝ, පටිඝානුසයෙක්ක; මානානුසයෝ, මානානුසයෙක්ක; දිට්ඨානුසයෝ, දිට්ඨිඅනුසයෙක්ක, විචිකිච්ඡානුසයෝ, විචිකිච්ඡා නුසයෙක්ක; අවිජ්ජානුසයෝ, අවිද්‍යානුසයෙක්ක; (ඉති, මෙසේ;) සත්ත (හොනති) සත්දෙනෙක් වෙත්.

(සුත්තනෙත්ත, සූත්‍රානත්තයෙහි; වුත්තානි,) යහු පාඨශේෂ යි. සංයොජනානි, සංයොජනධම්මෝ තුම්හ; කාමරාගසංයොජ නං, කාමරාගසංයොජනයෙක්ක; රූපරාගසංයෝජනං, රූපරාග සංයෝජනයෙක්ක; අරූපරාගසංයෝජනං, අරූපරාගසංයෝජ නයෙක්ක; පටිඝසංයොජනං, පටිඝසංයෝජනයෙක්ක; මාන සංයෝජනං, මානසංයෝජනයෙක්ක; දිට්ඨසංයෝජනං, දිට්ඨසං යෝජනයෙක්ක; සීලබ්බතපරාමාසසංයෝජනං, ශීලව්‍රතපරා මාශසංයෝජනයෙක්ක; විචිකිච්ඡාසංයෝජනං, විචිකිච්ඡාසංයෝ ජනයෙක්ක; උද්ධච්චසංයෝජනං, උද්ධච්චසංයෝජනයෙක්ක; අවි ජ්ජාසංයෝජනං, අවිද්‍යාසංයෝජනයෙක්ක; (ඉති, මෙසේ;) දස (හොනති) දසදෙනෙක් වෙත්.

අභිඛමෙම, විජම්පිටඨයෙහි වූ; වුත්තානි, වදාරණ ලද්දා වූ; අපරානි, අනිකුදු වූ; සංයොජනානි, සංයොජනධම්මෝ තුම්හ; කාමරාගසංයෝජනං, කාමරාගසංයෝජනයෙක්ක —පෙ— අවිජ්ජාසංයොජනං, අවිද්‍යාසංයෝජනයෙක්ක; (ඉති, මෙසේ;) දස (හොනති) දසප්‍රකාර වෙත්.

කිලෙසා, ක්ලේශධම්මෝ තුම්හ; ලොභෝ, ලෝභය ද; දෝසෝ වෙෂය ද; මොහෝ, මෝහය ද; මනෝ, මානය ද, දිට්ඨි, දෘෂ්ටිය ද; විචිකිච්ඡා, විචිකිච්ඡාව ද; පීතං, පීනය ද; උද්ධච්චං, උද්ධච්ච ය ද; අහිරිකං, අහිරිකය ද; අනොත්තප්පං, අනොත්තපපය ද; (ඉති, මෙසේ;) දස (හොනති) දසදෙනෙක් වෙත්.

පන, අථානන්තරයක් දක්වම්:—එහි, මේ අකුශල සංග්‍රහ යෙහි; ආසවාදිසු, ආශ්‍රවාදීන් අතුරෙන්; කාමභාවනාමෙන, කාමය යන නාමයින් හා භවය යන නාමයින් ද; තණ්හඤ්ඤා, ඒ කාමය යන නාමයාගේ නිශ්‍රයස්ථාන වූ හෙවත් රූපභවඅරූ පභවයන් ම නිශ්‍රයස්ථාන කොට ඇත්තා වූ; තණ්හා, තෘෂ්ණාව නොහොත් ලොභචෙතසිකය; අඩ්ඪපෙතා, කැමතිවන ලද් දිය. තථා පවත්තං, ඒ ඒ ආකාරයෙන්හටගත්තා වූ; දිට්ඨිගත මෙව, එක ම දෘෂ්ටිචෙතසිකය; සීලබ්බත පරාමාසා ච, සීලබ්බ

තපරමාසය යි කියා ද; ඉදං සච්චානි නිවෙසෙ ච, ඉදංසච්චා නිනිවෙසය යි කියා ද, අත්තවාදූපාදාන ච, අත්තවාදූපාදානය යි කියා ද, පවුච්චති, ප්‍රභෙද වශයෙන් කියනු ලැබේ.

වත්‍ථුතො, සභාව වශයෙන් නොහොත් ධම් වශයෙන්; ආසවොඝා ච, ආශ්‍රව-ඔඝධම්මයෝ ද; යොගා ච, යොගධම්මයෝ ද; ගන්‍ථා ච, ග්‍රන්ථධම්මයෝ ද; තයො, තුන්දෙනෙක්; වුත්තා, කියන ලදහ. උපාදානා, උපාදානයෝ තුමූ; දුවෙවුත්තා, දෙදෙනෙකැ යි කියනලද්දාහුය. නීවරණා, නීවරණධම්මයෝ තුමූ; අඤ්ඤියුං, අවදෙනෙක්වෙත්.

අනුසයා, අනුසයධම්මයෝ තුදූ; ඡළෙව හොන්ති, සදෙනෙක් ම වෙත්. සංයොජනා, සංයොජනයෝ තුමූ; නවම්තා, නවදෙනෙකැ යි දන්නා ලද්දාහුය. කිලෙසා, කෙලෙසයෝ, දස මතා, දසදෙනෙකැ යි දන්නා ලද්දාහුය. ඉති, මෙසේ; නවධා, නවප්‍රකාරයකින්; අයං පාපසඞ්ගහො, මේ අකුශලසංග්‍රහය; මයා වුත්තොතා, මා විසින් කියන ලද්දේද් යි.

———o———

(හා)

"චිත්තං චෙතසිකං රූපං නිබ්බානඤ්ච සබ්බථා" යන උද්දෙස ගාථාවෙහි දර්ශිනවූ සංක්ෂෙප සතර පරමාර්‍ථය ආදි පරිවෙජ්දයකින් විසතර වශයෙන් දක්වා දැන් වතාහි ඒ සතර පරමාර්‍ථධම්මය මිශ්‍ර සොබ දක්වනු කැමතිව "චාසත්තති විධා වුත්තා" යනාදී ගාථාව කිහ. තමතමාගේ සභාවයෙන් ලැබෙන පරමාර්‍ථධම්මයෝ දෙසැත්තැවක් වෙත්. ඒ කවරහුදයත්? අසූ නවයක් හෝ එකසිඇවිසිඑකක් හෝ අනන්තප්‍රමාණවූ ප්‍රභෙද හෝ වන්නාවූ සියලු චිත්තයෝ වනාහි ආරම්මණවිජානනලක්ෂණයෙන් එක් වැදැරැම් වූ හෙයින් එකකැ යි කියා ද, අනන්තා ප්‍රමාණප්‍රභෙද වන්නා වූ දෙපණස් චෛතසිකයෝ තුමූ අන්‍යොන්‍යවිරුඬලක්ෂණ ඇති හෙයින් ඥදපණසෙකැ යි ගත් කල්හී නාමධම්මයෝ තෙපණස්දෙනෙක් වෙති. නිප්පන්නරූපයෝ අට ලොස්දෙන ඔවුනොවුන්ගේ විරුඬ හෙයින් අටලොසෙකැ යි ගණන් ගත් කල්හි පළමුකි තෙපණස හා එක් කොට එක් සැත්තැවක් වෙත්. ආනන්තලක්ෂණයෙන් එක් වැදැරැම්වූ නිබ්බාණධම්මය ඒ එක්සැත්තැවට එක් කොට ගත් කල්හි සියලු සභාවධම්මයෝ දෙසැත්තැවක් වෙත්. අඤ්ඤතග්‍රහණ න්‍යායෙන් පිට කත්‍රයෙහි වදලා වූ සියලු ධම්මයෝ මේ දෙසැත්තැවෙහි ම ඇතු

ලත් වෙත්. ඒ දෙසැත්තෑවක් ධම්මයෝ සම්මිවසඝසංග්‍රහයෙහි විසතර වෙත්. ඒ සමුවසය සංග්‍රහයෙහි සතර සංග්‍රහයන් අතුරෙන් පළමු වන අකුශල සංග්‍රහය දක්වම්:—

එහි ආශ්‍රවයෝය, ඔඝධම්මයෝය, යොගධම්මයෝය, ග්‍රන්ථයෝය, උපාදානයෝය, නීවරණයෝය, අනුසයධම්මයෝය, සංයොජනධම්මයෝය, කෙලෙසධම්මයෝය යි නවප්‍රකාර වෙත්. ඔවුන් අතුරෙන් ආශ්‍රවධම්මතෙමේ කොයෙක් වර පෙරා ගන්නා ලද්දාවූ සුරාවකට බදු වේ යි. කුමක්හෙයිනයත්? සුරාපානය කළාවූ සත්ත්වයෝ තුමූ ප්‍රකෘතිසවභාව හැර උමතු වූවන් මෙන් සියලු අකට යුතු දුශ්චරිතයන්හි හැසිරෙත් ද, එපරිද්දෙන් ම කාමාසව භවාසව දිට්ඨාසව අවිජ්ජාසව යන මේ ධම්මයෝ සතරදෙන ද මද උපදවන අර්ථයෙන් ද ආශ්‍රවය යි කියත්. ඒ ආශ්‍රවධම්මයෝ තුමූ භූමි වශයෙන් නෙවසඤ්ඤානාසඤ්ඤයතනය දක්වා ද, ධම් වශයෙන් සෝවාන් මාර්ගය පෙරටුව උපදනා වූ කොත්‍රභූ චිත්තය දක්වා ද, පැහිර පවත්නාහු ය. තවද වණයකින් වහනය වන්නා වූ පුඝයක් මෙන් චක්ඛුරාදී වූ ණමුඛ සයකින් රූපාදී ආවිසථානයෙක්හි වහනය වන වහුරුවන අර්ථයෙන් ද, ආශ්‍රව නම් වෙත්. භූමිවශයෙන් භවාග්‍රය දක්වා ද ධම් වශයෙන් කොත්‍රභූචිත්තය දක්වා ද, වහනය වන්නා වූ අකුසල ධම්මයෝ තුමූ මේ සතරදෙන පමණක් නො වෙති. මානාදී වූ අවසෙස කෙලෙසයෝද භවාග්‍රය හා කොත්‍රභූචිත්තය දක්වා ද වහනය වෙමින් පවත්නාහු, නො වෙත් ද? එසේ වී නම් මේ ධම්මසතරදෙන පමණක් කුමක්හෙයින් ආශ්‍රව නම් වෙත් ද යත්? ඒ මානාදී ධම්මයෝ භවාග්‍රය හා ගොත්‍රභූචිත්තය දක්වා ද පවත්නාහු නුවුදු මේ කාමාදී ධම්මසතර ම රූසි වශයෙන් හෝ ප්‍රධාන වශයෙන් ආශ්‍රවය යි ව්‍යවහාර කෙරෙත්.

"ඔඝය" යනු මහත් වූ ගඩොඇල්ලයෙහි හටගන්නා වූ සැඩ පහර සමඟ පවත්නා වූ දියසුලිය යි. යම්සේ නඩොඇල්ලයෙක්හි වැටුනා වූ යම්කිසි ද්‍රව්‍යයක් සැඩපහරට අසුවූයේ නම් නඩොඇල්ල වෙන් සමුද්‍රතට වැද ඒ සමුද්‍රමධ්‍යයෙහි දියසුලියෙන් යට කොට ගෙණ ගොස් සමුද්‍ර පතුලෙහි ගසන්නේ වේ ද, එපරිද්දෙන් ම මේ කාමාදී සතර ඔඝයෙන් පහරණලද්දාවූ සත්වයා සංසාර සාගරයෙහි පත්ලට බදු වූ අවීචිමහානරකයෙහි ගෙණ ගොස් හිංසා කරන්නේ ය. එහෙයින් මේ කාමාදී ධම්මයන් සතරදෙන ම ඔඝය යි කියත්.

"යොගය" යනු ගවඇදී සිවිපාවුන් රථයෙහි යොදා බඳින්

නා වූ රාගැන් වැනිය යනාදීයෙන් යොගය යි කියත්. මේ සංසාර ගත සත්වයා හට නැමති රථයෙහි යොදන අශ්වයෙන් මේ ආශ්‍රවධර්මයන් ම යොගය යි ව්‍යවහාර කෙරෙත්.

"ග්‍රන්ථධර්මය" යනු මේ ප්‍රත්‍යාත්පන්න කය, අනාගත කය සඞ්ඛ්‍යාත වූ මතු හවය හා ද, නාමය හා රූප ධර්මය ද, එකට ගැටගසනාදීයෙන් ග්‍රන්ථයයි ව්‍යවහාර කෙරෙත්.

"උපාදානය" යනු දැඩි තෘෂ්ණාවට කියන නමකි. ගම්කිසි සොරෙක් අනුන්ගේ ගෙට වැද අන්ධකාරයෙහි අතපය ගානා කල්හි පවත්නා වූ ලොභය තණ්හා නම් වෙයි. ගම් වසතුවක් ඒ සොරාගේ අතට පත් කල්හි ගටගත්තා වූ ලොභය උපාදාන නම් වෙයි. මැඩියෙකු පසුපස්සෙහි ලුහුබඳින්නා වූ සර්පයෙක් හට උපදනා ලොභය තණ්හා නම් වෙයි. ඒ මැඩියා අල්වාගත් කල්හි උපදනා ලොභය උපාදාන නම් වෙයි. සංක්ෂේපයෙන් තමා විසින් සපයා ගත්තා ලද රන්රුවන් මුතු මැණික් ආදී වසතුවෙහි පවත්නා ලොභය උපාදාන නම් වෙයි. මිතු වෙලඳුම් ආදී කෘත්‍යය කොට මේතෙක් වසතුව ලබම්හ යි පැවති ලොභය තණ්හා නම් වෙයි. එසේ හෙයින් පටිච්චසමුප්පාදයෙහි "තණ්හාපච්චයා උපාදානං" යනු වදාළේ යි.

"නීවරණධර්මය" යනු ධ්‍යානාදී වූ කුශල ධර්මය හා ප්‍රඥා චක්ෂුසය වලක් වන හෙවත් ආවරණය කරන කෙලෙශධර්මයෝ අවදෙනෙක් තුමූ නීවරණධර්මයෝය යි ව්‍යවහාර කෙරෙත්. නො හොත් නිවන්දිග අවුරන්නා වූ අඟුල්අවක් වැනි ධර්මයෝ නීවරණධර්මයෝය යි කියත්.

"අනුශය" යනු "අනු සෙතෙතීති අනුසයා" යනු නිදීවන බැවින් මාගීයෙන් ප්‍රහීණ නො කළා වූ කෙලෙස යන් ආලම්බණ ප්‍රතිලාභයෙහි උපදනා හෙයින් අනුශය ධර්මය යි කියත්. නෙවසඤ්ඤානාසඤ්ඤායතනධ්‍යානය උපදවා ගත් යොගාවචර තෙමේ නෙවසඤ්ඤානාසඤ්ඤායතනතලයෙහි ඉපිද මහා කල්පසුළාසූදහසක් හෙවෙන තුරු කෙලෙස පරිවුඩානයෙන් වෙන්ව සිට ඒ බඹතලයෙන් චුතව කාමධාතුවට ආ කල්හි සෙසු කාමාවචරසත්වයන්ට මෙන් ම ඒ පුදුගලයාහට ලොභාදී සියලු කෙලෙසුන්ගේ උතුසන්නතාවය ඇති වෙයි. මේ වදාහි අනුශය කෙලෙසුන්ගේ ශක්තිය යි.

"සංයෝජනය" යනු දික්වූ රාගැණින් ගවයන් දිගවෙලි කර තැබීමක් මෙන් රූප රාග අරූප රාගාදී වූ කෙලෙසයන්ගේ

හවගැණීම යි. රූපභූමි අරූපභූමියෙහි වසන්නා වූ සත්ත්වයන්ගේ සංයොජනධම්මයෝ තුමූ ශාල්කණුවෙන් මුදු රැහැන් සමඟ හැරිය ගඩියන්ට බඳු වෙත්. ඒ හවයෝ වනාහි ශාල්කණුවෙන් ඇතව ගොත් නැණ කන්නාක් මෙන් කාමභූමියෙන් ඇත්ව රූපාවචරභූමියෙහි උපදනා සත්ත්වයන්ගේ සංයොජන ධම්මයෝ හව ත්‍රය නැමති ගාලෙහි බඳිනා වූ රැහැන්වලට බඳු වෙත්.

"කෙලෙසයෝය" යනු සත්ත්වයන් කිලුටුකරන තැවීමකරන ධම්මයෝ යි. ඒ කෙලෙසයන්ට වනාහි ගිණි ගෙණ දිලියෙන ගිනි අඟුරු උපමා කවයුතු යි. ගිනිඅඟුරු වනාහි තමා පිළිබඳ වූ දර සහ පිසන්නා වූ සහල්හාජනාදිය තවන්නාක් මෙන් හෙවත් හිංසා කරන්නාක් මෙන් මේ කෙලෙසධම්මයෝ ද තමා හා සම්ප්‍රයුක්ත ධම්මයන් හා තත්සමඞ්ගීසත්ත්වයන් ද පෙළත්. එහෙයින් කෙලෙසයන් ගිනි අඟුරු මෙන් ද, තත්සසම්ප්‍රයුක්ත සඵස්සාදී ධම්මයන් දර මෙන් ද, ඒ ගිනින් යුක්ත වූ පුද්ගලතෙමේ බඳුනක් මෙන් ද උපමා උපමෙය්‍යකටයුතු යි. යම් සිතෙකෑ දශකෙලෙසයන් අතුරෙන් යම් කෙලෙසයක් ඇත්තේද, ඒ කෙලෙස නැමති ගිනිඅඟුරු හෙතුකොටගෙණ අවශෙෂ සම්ප්‍රයුක්තධම්ම ත්‍රිමති දර දවන්නාහු වෙති. ඒ වඤ්චනාතෙජසින් පැසෙන්නා වූ බත් සැලියක් මෙන් ඒ ගිනින් යුක්ත පුද්ගලයා තවත්තේ හෝ හිංසා කරන්නේ යෝ වේ.

නිවරණයන් අතුරෙහි පීනය හා මිද්ධය ද, උද්ධච්චය හා කුක්කුච්චය ද, කුමක්හෙයින් එක ම නීවරණභාවයෙන් වදාළේදයත්? කෘත්‍යය ආකාර ප්‍රතිපක්ෂධම්මයන්ගේ සමානත්වය ඇති හෙයින් එක්ඵල නීවරණ භාවයෙන් වදාළේය යි දත යුතු යි. ඒ කෙසේදයත්? කුක්කුච්චපත්‍රයක් ගින්නට පෑ කල්හි හැකිලීමක් මෙන් පීනය ද, එසේ ම මිද්ධය ද හැකිලීම සවභාව කොට ඇත්තේයි. මෙසේ පීනමිද්ධ දෙදෙනාගේ කෘත්‍යය වශයෙන් එකාකාර බව ලැබෙන්නේ යි. පීනචෙතසිකය හෙතුකොටගෙණ සිත හැකිලෙන කල්හි ශරීරය ද හැකිළේ. හෙවත් ශරීරයාගේ අලසභාවය ද, ඇඟුම් ඇරීම ද, ඇඟමැලි කැඩීම ද වන්නේ යි. එසේ ම මිද්ධය කාරණකොටගෙණ අවිශෙෂතාමයක නියන් හැකිලෙන කල්හි ඒ සිතින් හටගන්නා වූ චිත්තජ රූපයන් ශරීරයෙහි පැතිර යාම හෙතුකොටගෙණ ශරීරය ද හැකිළෙයි. ඇඟුම් හැරීම් ඇඟමැලි කැඩීම් ආදිය වෙ යි. මෙසේ පීනමිද්ධදෙදෙනාගේ ආකාරය ද සමාන වෙ යි. පීනචෙතසිකය වීරිය්‍යචෙතසිකයාගේ සතුරුධම්මය වෙ යි. මිද්ධය ද එසේ ම වීරිය්‍යයාගේ සතුරු ධම්මයයි. පීනමිද්ධයෙන් යුක්ත වූ සසංඛාර

රික අකුශලපථකය නැවත නැවත උපදනා සුළු ඒ ඒ සිතින් හටගන්නා වූ චිත්තජ රූපයන් ශරීරයෙහි පැතිර යාම හෙතු කොටගෙණ කාමකායසම්බන්ධ වූ චේතනාසෛතසිකය නිරුඩ්ධ වීමෙන් රූපකාය ද එහාම නිද්‍රාවට පැමිණෙයි. එසේහෙයින් අභිධර්මාලිනී අට්ඨකථාවෙහි:—"සඞ්ඛාරා නිද්දූ චේතනාපධානා" යනාදිය කියනලද්දේ යි. මෙසේ පිනැම්ඹ දෙදෙනාගේ කෘත්‍යය සඞ්ඛ්‍යාත වූ ලක්ෂණය හා පිනැම්ඹ දෙන සිසින් එළවන ධර්මය ද, පිනැම්ඹ දෙදෙනාගේ සතුරුධර්මය ද, සමාන බැවින් එක නීවරණ භාවයෙන් වදාළේ යි.

උඩවව චේතනාසික තෙමේ නො සන්හුන් ආකාරයෙන් යුක්ත වූ හෙයින් නොයෙක් අරමුණෙහි සිත දමා ගැසීම ලක්ෂණ කොට ඇත්තේ යි. කුක්කුච්චචේතනාසිකය ද නො සන්හුන් පසුතැවිලි සවභාව ඇති හෙයින් යොයෙක් අරමුණෙහි සිත දමා ගැසීම ලක්ෂණ කොට ඇත්තේ යි. මේ වනාහි උඩවව කුක්කුච්චදෙදෙනාගේ කෘත්‍ය වශයෙන් සමානත්වය යි. උඩවව චේතනාසික තෙමේ නො සන්හුන් සවභාව ඇති හෙයින් ඉතා ලුහුඬු වූ කල්පණා කිරීම් ඵලවයි. කුක්කුච්චචේතනාසිකය ද නො සන්හුන් සවභාව ඇති හෙයින් ඉතා ලුහුඬු වූ කල්පණාව ඇති වෙයි. මේ වනාහි ඒ දෙදෙනාගේ ආකාර වශයෙන් සමානත්වය යි. උඩවව චේතනාසික තෙමේ එකාග්‍රතාවට ප්‍රතිපක්ෂ වෙයි. නොහොත් ධ්‍යාන සමාපත්තියට ප්‍රතිපක්ෂ වෙයි. කුක්කුච්චචේතනාසිකය ද එසේමැයි. මෙසේ උඩවව කුක්කුච්චදෙදෙනාගේ කෘත්‍යආකාරප්‍රතිපක්ෂධර්මයන්ගේ සමානත්වය ඇති හෙයින් එක ම නීවරණභාවයෙන් වදාරණ ලද්දේ යි. "එකධම්මා-පෙ-ටීකානය බලනු.

කාමය යන නාමය හා භවය යන නාමය ද අරමුණු වන්නා වූ භූමිය සඳහා ම කාමභව යන නාමයෙන් වදාරණ ලද්දේ යි. ලොභය, කාමභවය, රූපභවය, යන ව්‍යවහාරය වනාහි උපචාර වශයෙනැයි දතයුතු යි. කාම-භව යන නාමවයෙන් කියන ලද්දේ එක ම ලොභය යි දතයුතු යි. සීලබ්බතපරාමාසය, ඉදං සච්චාභිනිවෙසය, අත්තවාදූපාදානය, යන නාමත්‍රය කින් ම දක්වන ලද්දේ දිට්ඨිචෙතසිකය යි.

ධර්මවශයෙන් දිනාහි "කාමාසවෝ භවාසවෝ" යන දෙකින් ම එක ම ලොභය කියන ලදී. "දිට්ඨාසවය" යනු දෘෂ්ටිය යි "අවිජ්ජාසවෝ" යනු මොහය යි එහෙයින් මේ ආශ්‍රවයෝ සතරදෙන ධර්මයන් තුන්දෙනෙක් ම වෙති. කාමය භවමිශ්‍රය

යනු එක ම ලොභය යි. දිට්ඨිඔඝය යනු එක ම මිථ්‍යාදෘෂ්ටිය යි. අවිජ්ජාඔඝය යනු එක ම මෝහය යි. මෙසේ සතර ඔඝය ද ධම්මයෝ තුන්දෙනෙක් වෙති. "කාමයොගය භවයොගය" යනු එක ම ලොභය යි. දිට්ඨියොගය යනු එක ම මිථ්‍යාදෘෂ්ටිය යි. අවිජ්ජා යොගය යනු එක ම මෝහය යි. මෙසේ සතර යොගධම්මයෝ ද හකුළුවා ගත් කල්හි ධම්මයෝ තුන්දෙනෙක් වෙති. "අභිජ්ඣා කායගන්ථෝ" යනු එකම ලොභය යි. "ව්‍යාපාදෝ කායගන්ථෝ" යනු එක ම ද්වේෂය යි. "සීලබ්බතපරාමාසෝ කායගන්ථෝ" යනු ද. "ඉදංසච්චාභිනිවේසෝ කායගන්ථෝ" යනු ද, එක ම මිථ්‍යාදෘෂ්ටිය යි. මෙසේ ග්‍රන්ථධම්මයෝ සතරදෙන ද, හකුළුවා ගත් කල්හි ධම්මයෝ තුන්දෙනෙක් වෙති. කාමුපාදානය යනු ලොභය යි. දිට්ඨුපාදානය, සීලබ්බතුපාදානය, අත්තවාදුපාදානය යන තුන්දෙන ද එක ම මිථ්‍යාදෘෂ්ටිය යි නොහොත් මිථ්‍යා දෘෂ්ටියගේ සඞ්ගහ විශේෂයෝ යි. මේසේ සතර උපාදානයෝ ද හකුළුවා ගත් කල්හි ධම්මයෝ දෙදෙනෙක් ම වෙති. කාමච්ඡන්දනීවරණය යනු ලෝභය යි ව්‍යාපාදය යනු ද්වේෂය යි. පීනබිඩය යනු අකුශල චෛතසික දෙසකි උඛවවකුක්කුච්ච නීවරණය යනු අකුශල චෛතසික දෙසකි. අවිජ්ජානීවරණය යනු මෝහය යි. මේසේ නීවරණධම්මයෝ විසතර විශයෙන් අටදෙනෙක් දෙති. කාමරාගානුසය, භවරාගානුසය, යනු ලෝභයයි. පටිඝානුසය යනු ද්වේෂය යි. දිට්ඨානුසය යනු මිථ්‍යාදෘෂ්ටිය යි. විචිකිච්ඡානුසය යනු විචිකිච්ඡාචෛතසිකය යි. අවිජ්ජානුසය යනු මෝහය යි. මේසේ හකුළුවා ගත් කල්හි අනුසයධම්මයෝ සදෙනෙක් වෙති.

සූත්‍රානුක්‍රමයෙහි කාමරාගසංයෝජනය, රූපරාග සංයෝජනය, අරූපරාගසංයෝජනය, යන නාමත්‍රයෙන් එක ම ලොභය දක්වා යි. පටිඝසංයෝජනය යනු ද්වේෂය යි. මානසංයෝජනය යනු අකුශලමාන චෛතසිකයයි. දිට්ඨිසංයෝජනය, සීලබ්බත පරාමාසසංයෝජනය, යන සංයෝජනත්‍රයෙන් එක ම දෘෂ්ටි චෛතසිකය දක්වයි. "විචිකිච්ඡානුසංයෝජනය" යනු විචිකිච්ඡා ය යි. "උද්ධච්චසංයෝජනය" යනු උඛවවය යි. මෙසේ සූත්‍රානුක්‍රමයෙහ ආවා වූ දසසංයෝජනයෝ * හකුළුවා ගත් කල්හි අත් දෙනෙක් ම වෙයි. අභිධම්ක්‍රමයෙහි ආවා වූ සංයෝජනයෝ තුළ "කාමරාග-භවරාගසංයෝජනය" යනු එක ම ලොභ ය යි, "පටිඝ" යනු ද්වේෂය යි. "මාන" යනු මානය යි. "දිට්ඨි-සීලබ්බත පරාමාස" යනු එක ම මිථ්‍යාදෘෂ්ටිය යි, "විචිකිච්ඡා" යනු විචිකිච්ඡාව යි. "ඉස්සා" යනු අන් සැපත් නු රැස්නා ඊර්ෂ්‍යා චෛතස

* මෙහි අඟහිත ග්‍රහණ න්‍යායයයිද කියා නිබඳ.

සිකය යි. "මච්ඡරිය" යනු මාතසය්‍යී චෙතසිකය යි. "අවිජ්ජා සංයොජනං, යනු එක ම මෝහය යි. මෙසේ අටක් ම වෙති. ලෝභය, වෙෂය, මෝහය, මානය, දිෂිය, විචිකිච්ඡාය, ථිනය. උඛච්චය, අහිරිකය, අනොත්තප්පය, යන මේ ධම්මෝ දසදෙන දසකෙලෙශෝ නම් වෙති. ඒ කෙලෙශධම්මයන්ගේ නවය කියා අඩු වීමෙක් හෝ දසය කියා වැඩි වීමෙක් හෝ නැත්තේය. මේ කියලූ අකුශල ධම්මයන් නවප්‍රකාරයකින් සංග්‍රහ කොට ගත් හෙයින් අකුශල සංග්‍රහය යි කියත්.

අකුශල සංග්‍රහය නිමි

(ප)

මිස්සක සඞ්ගහෙ, මිශ්‍රකසංග්‍රහයෙහි (එවං විභාගෙ මයා වුච්චතෙ) යනු අධ්‍යාහාර යි. එවං, මේ වක්ෂ්‍යමානක්‍රමයෙන්, විභාගෙ, බෙදීම; මයා, මා විසින්; වුච්චතෙ, කියනු ලැබේ. හෙතු, හෙතුධම්මෝ තුමූ; ලොභො, ලොභහෙතුවය; දොසො, දොෂ හෙතුවය, මොහො, මොහහෙතුවය; අලොභො, අලොභ හෙතුවය; අදොසො, අදොසහෙතුවය; අමොහො, අමොහ හෙතුවය; ඉති, මෙසේ; ඡ හොනති, සදෙනෙක් වෙත්. ඣානඞ්ගානි, ධ්‍යානාඞ්ගයෝ තුමූ; විතක්කො, විතර්කධ්‍යානාඞ්ගය; විචාරො; විචාරධ්‍යානාඞ්ගය, පිති, ප්‍රීතිධ්‍යානාඞ්ගය; එකග්ගතා, එකාග්‍රතාධ්‍යානාඞ්ගය; සොමනස්සං, සෞමනස්‍ය ධ්‍යානාඞ්ගය; දොමනස්සං, දෞර්මනස්‍ය ධ්‍යානාඞ්ගය; උපෙක්ඛා, උපෙක්ෂාධ්‍යානාඞ්ගය; (ඉති, මෙසේ) සත්ත (හොනති) සත්දෙනෙක් වෙත්. මග්ගඞ්ගානි, මාර්ගාඞ්ගයෝ තුමූ; සම්මාදිට්ඨි, සම්මාදිට්ඨි මාර්ගාඞ්ගය;-පෙ-මිච්ඡා සමාධි, මිථ්‍යාසමාධි මාර්ගාඞ්ගය; (ඉති, මෙසේ;) වාදස (හොනති) දෙළොස්දෙනෙක් වෙත්. ඉන්ද්‍රියානි, ඉන්ද්‍රියධම්මයෝ තුමූ; චක්ඛුන්ද්‍රියං, චක්ෂුරින්ද්‍රිය;-පෙ-අනඤ්ඤඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියං, සෝවාන් මාර්ගඥානසංඛ්‍යාත වූ අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රිය; අඤ්ඤින්ද්‍රියං, සෝවාන් ඵලඥානය ආදි කොට ඇති අර්හත්මාර්ගඥානය අවසන් කොට ඇති සවැදෑරුම් මාර්ගඵලසංඛ්‍යාත වූ අඤ්ඤින්ද්‍රිය; අඤ්ඤතාවින්ද්‍රියං, අර්හත්ඵලඥානසංඛ්‍යාත වූ අඤ්ඤතාවින්ද්‍රිය; (ඉති, මෙසේ;) බාවීසති (හොනති) දෙවිසිඉන්ද්‍රිය ධම්මෙනෙක් වෙත් බලානි, බලධම්මයෝ තුමූ; සද්ධාබලං, ශ්‍රද්ධාබලය;-පෙ-අනොත්තප්පබලං, අනොත්තප්පබලය; (ඉති, මෙසේ;) නව, (හොනති) නවදෙනෙක් වෙත්. අධිපති, අධිපතිධම්මයෝ තුමූ; ඡන්දාධිපති, ඡන්දාධිපතිය;-පෙ-වීමංසාධිපති, වීමංසාධිපතිය යි;

(ඉති, **එවංසේ**; **චත්තාරෝ**) (හොන්ති) සතර දෙනෙක් වෙත්. ආහාරා, ආහාරයෝ තුමූ; නොහොත් නාමරූපයන් පවත්වන ධර්මයෝ තුමූ; කබලීකාරෝ ආහාරෝ, කබළු කොට අනුභව කරන ආහාරය; දුතියෝ, දෙවැනි වූ; එසෙසා, සපර්‍යාහාරය; තතියෝ, තුන්වැනි වූ; මනොසඤ්චෙතනා, මනොසඤ්චේතනාහාරය; චතුත්ථෝ, සතරවැනි වූ; විඤ්ඤාණං, විඤ්ඤාණාහාරය; (ඉති, මේසේ;) චත්තාරෝ, (හොන්ති) සතර දෙනෙක් වෙත්.

පන, විශෙෂාර්ථයක් ඛ්‍යම්:—එහි, මේ මිශ්‍රකසංග්‍රහයෙහි ඉන්ද්‍රියෙසු, දෙවිසි ඉන්ද්‍රියන් අතුරෙන්; සොතාපත්තිමග්ගඤාණං, සෝවාන් මාර්ගචිත්තසහගතෙහි යෙදුනා වූ ඥානය, අනඤ්ඤාතං, අනාදිමත් සංසාරයෙහි නො දන්නා ලද විරූ නිර්වාණධර්මය; අඤ්ඤස්සාමීති, දැන ගන්නෙමි යි පැවති; ඉන්ද්‍රියං, ඉන්ද්‍රියධර්මය යි. නොහොත් මාර්ගචිත්තසම්ප්‍රයුක්ත වූ සියලු ධර්මයන් වසඟ යෙහි පවත්වන අර්ථයෙන් ඉන්ද්‍රියධර්මය යි; (පවුච්චති,) ප්‍රභෙද වශයෙන් කියනු ලැබේ. අරහත්තඵලඤාණං, අර්හත්ඵල චිත්ත යෙහියෙදුනා වූ ඥානය; අඤ්ඤාතාවින්ද්‍රියං; අඤ්ඤා ව්‍යය යි කියන ලද්දා වූ රහතුන් වහන්සේගේ සියලු ධර්මයන් වසඟයෙහි පවත් වන අර්ථයෙන් අඤ්ඤාතාවින්ද්‍රිය යි; (පවුච්චති,) ප්‍රභෙද වශ යෙන් කියනු ලැබේ. මජ්ඣෙ, මේ සෝවාන් මාර්ග අර්හත්ඵල දෙදෙනාගේ මධ්‍යයෙහි වූ; ඡඤ්ඤාණානි, ඡවිශෙෂඥානයෝ; අඤ්ඤින්ද්‍රියානිති, අඤ්ඤින්ද්‍රියයෝය යි. පවුච්චන්ති, ප්‍රභෙද වශ යෙන් කියනු ලැබේවා. ජීවිතින්ද්‍රියඤ, ජීවිතින්ද්‍රියය වනාහි; රූපා රූප වසෙන, රූපජීවිතෙන්ද්‍රිය නාමජීවිතෙන්ද්‍රියයන්ගේ වශ ඥයන් නොහොත් නවවිදෘරූම් වූ සම්ජ රූපකලාපයන්ගේ ජීවිතය එකුන් අනුවක් චිත්තයන් ජීවත්කරවන ජීවිතෙන්ද්‍රිය චෛතසිකධර්මය යි; දුවිධා හොති, දෙවැදෑරුම් වෙයි. විපඤ්ච විඤ්ඤුඛෙසු, දෙපස් විඤ්ඤාණදසයෙහි; ඛීණාසවා නි, චිත්තකී පශ්චිම කොට ඇත්තා වූ ඛ්‍යාභාඛයෝ; න ලභන්ති, අවි තකී දෙපස් විඥානදශයෙහි නො ලැබියයුත්තාහුය. අවිරියෙසු විර්‍ය්‍ය රහිත වූ සොළොස් චිත්තයෙහි; බලානි, වීර්‍ය්‍යපශ්චිම කොට ඇත්තා වූ බලධර්මයෝ; න ලබ්භන්ති, වීර්‍ය්‍ය රහිත බැවින් නො ලැබියයුත්තාහු වෙත්. අහෙතුකෙසු; අටළොස් අහෙතුක චිත්තයෙහි; මග්ගඛගානි, හෙතුපශ්චිම කොට ඇත්තා වූ මාර්ග ඛගයෝ, න ලබ්භන්ති, හෙතු රහිත බැවින් නො ලැබියයුත්තාහු වෙත්. තථා, එපරිද්දෙන්; විචිකිච්ඡාචිත්තෙ, විචිකිච්ඡාසහගත චිත්තයෙහි; එකග්ගතා, එකග්‍රතා චෛතසික තෙමේ; මග්ගින්ද්‍රිය බලභාවං, මාර්ගඛගේන්ද්‍රිය බලභාවයට; ගච්ඡති, නො පැමිණේ.

දුහේතුකතිහේතුක ජවනෙසෙව, දුහේතුක ජවන් අටළොසය, ත්‍රිහේතුක ජවන් සුනිත්‍යය, යන මේතෙක් චිත්තයෙහි ම; ඝථා සමූහය, සමූහවචන පරිද්දෙන්, එකතුව, එන ම; අධිපති, අධිපතිධර්මයෙක්; ලබතැති, ලැබිය යුත්තේ සි.

වත්තුතෝ, සවත්ථුධම්ම වශයෙන්; හෙතු, හෙතූහු; ඡ්ඊරිතා, සදෙනෙකැ සි කියන ලද්දාහුය; ඣානඞ්ගා, සප්තඞ්ගානුඞ්ග යෝ; පවඊරිතා, හකුළුවා ගැණීමෙන් පැන්දෙනෙකැ සි කියන ලදහ. මග්ගඞ්ගා, දෙළොස් මැගී ඞ්ගයෝ; තව ඊරිතා, හකුළුවා ගැණීමෙන් නවදෙනෙකැ සි කියනලදහ. ඉන්ද්‍රියධම්මා ච, දෙවිසි ඉන්ද්‍රිය ධර්මයෝ වනාහී; සොළස ඊරිතා, හකුළුවාගැණීමෙන් සොළොස්දෙනෙකැ සි කියනලදහ. බලධම්මා, බලධර්මයෝ; නව ඊරිතා, අඩුවැඩි නොවන හෙයින් නවදෙනෙකැ සි කියන ලදහ.

අධිපති, අධිපතිධර්මයෝ; චත්තාරෝ වුත්තා, සතරෙකැ සි කියන ලදහ. තථා, එපරිද්දෙන්, ආහාරා, ආහාරධර්මයෝ; චත්තාරෝ වුත්තා, සතරකැ සි කියනලදහ. ඉති, මේසේ; සත්ත ධා, සප්තප්‍රකාරයකින්; කුසලාදිසමාකිණ්ණා, කුශලාකුශල අව්‍යාකෘත ධර්මයන්ගෙන් හෝ නාමරූපධර්මයන්ගෙන් සමාකීර්ණ වූ හෙවත් මිශ්‍ර වූ; මිස්සකසඞ්ගහා, මිශ්‍රකසංග්‍රහය; (නම) වුත්තෝ, මා විසින් කියනලද්දේ සි.

— — ○ — —

(හා)

මිශ්‍රකසංග්‍රහයෙහි හෙතු ධ්‍යානාඞ්ග මාර්ගාඞ්ග ඉන්ද්‍රිය බල අධිපති ආහාර වශයෙන් සප්ප්‍රකාරයක් ඇති වේ මේ සංග්‍රහය වනාහි කුමක් හෙයින් මිශ්‍රකසංග්‍රහ නම් වන්නේදයත්? කුශලාකුශල අව්‍යාකෘතනාමරූප යන සතර පරමාර්ථධර්මයන් ගේ ආකීර්ණ වූ සංග්‍රහයක් හෙයින් මිශ්‍රකසංග්‍රහ නම් වෙයි. ඔවුන් අතුරෙන් හෙතුසංග්‍රහය යනු ලෝභ-ද්වේෂ-මෝහ-අලෝභ අද්වේෂ-අමෝහ යන සවිදුරුම් ධර්මයන්ගේ සංග්‍රහය හෙතු සංග්‍රහය සංඛ්‍යාත මිශ්‍රකසංග්‍රහය නම් වෙයි. ඔවුන් අතුරෙන් ලෝභ-ද්වේෂ-මෝහ යන හෙතූහු තුන්දෙන ද්වේෂ අකුසලයන් ගේ මූලසඞ්ඛ්‍යාත හෙතූහු නම් වෙත්. අලෝභ-අද්වේෂ-අමෝහ සඞ්ඛ්‍යාත හෙතූහු තුන්දෙනා අතුරෙන් එක්විසිකුසල් හා සම්ප්‍රයුක්ත වූ හෙතූහු තුමූ කුසලහෙතූහු නම් වෙත්. විපාක-ක්‍රියා සින් සමග සෙදුනාවූ හෙතූහු තුමූ අව්‍යාකෘතහෙතූහු නම් වෙත්. තමා හා සමග ඒ එක්ව හටගත්තා වූ හෙතූහු තුමූ සම්ප්‍රයුක්ත

ධම්මයන්ගේ පිහිටීමට ආධාර වන හෙයින් මූලාදියෙන් හෙතු නම් වෙත්. ඊට උදාහරණයක් මෙසේ යි.

ත්‍රිහෙතුක ඤාණසම්ප්‍රයුක්ත කුශලවිපාක සිතින් ප්‍රතිසන්ධි ගත්තා වූ තැනැත්තාහට යහපත් මුල් බැස්සා වූ වෘක්ෂයක් හුනේ මූලයන්ගේ අනුසාරයෙන් පෘථිවිඔජාරසය ඇද ගණිමින් සාඛාග්‍රශාඛි මල්ඵල උපදවන්නාක් මෙන් ත්‍රිහෙතුක ඤාණසම්ප්‍රයුක්තමහාවිපාක නැමති වෘක්ෂයාගේ අලෝභ-අදෝස-අමෝහ නැමති මූලානුසාරයෙන් නොයෙක් නොයෙක් උපභොග පරිභොග සම්පත් ඤානගුණ නැමති පුෂ්පඵලපල්ලවයන්ගෙන් සම්පන්න වෙයි එපරිද්දෙන් ම දුහෙතුකලාමකකුශලානුභාවයෙන් උපෙක්ෂාසහගත සන්තීරණ නැමති අහෙතුකවිපාක සිත ප්‍රතිසන්ධි ගත්තා වූ දාසකරපොරිස්සාදී හීනමනුෂ්‍යයන්ගේ ඒ ප්‍රතිසන්ධි නැමැති වෘක්ෂයෙහි හෙතු නැති හෙයින් තම්තම්න්ගේ සා පිපාසා විනෝදනාදිය පවා සුදුසු ප්‍රත්‍යයක් නැති හෙයින් අනුන්ගේ දාස බවට පැමිණ දුක සේ ජීවිකාව කෙරෙයි. මේ උදාහරණයෙන් කුසලඅව්‍යාකෘත හෙතූන්ගේ ශක්තිය කල්පනා කටයුතු යි.

සහෙතුක චිත්තජ, සහෙතුක චිත්තජ රූපය, සහෙතුක ප්‍රතිසන්ධි කම්ජ රූපය යනාදී වූ ධම්මෝ තුමූ ඒ වෘක්ෂයාගේ ශාඛාපලාසපුෂ්පඵලාදියට බඳු වෙත්. යම් ගිය ජාතියෙහි කළා වූ ත්‍රිහෙතුක ඤානසම්ප්‍රයුක්තකුශලනම්ය වනාහි යහපත් සෑතුවෙහි හවඟත්තා වූ බිජුවටකට බඳු වෙයි. ඒ බිජුවටින් හට ගන්නා වූ අංකුරය මෙන් කාමසවගීරයෙහි හවඟන්තා වූ ත්‍රිහෙතුක ප්‍රතිසන්ධිවිපාකය දතයුතු ය. මේ ප්‍රතිසන්ධිවිපාකය වනාහි කුමක්හෙයින් මෙබඳු විශෙෂආනිශංස ඵලවත්නේද යත්? **'ජවනකඛණෙ තිණ්ණං චුතිකඛණෙ විඤඤං පටිසන්ධිකඛණෙ තිණ්ණඤඤානං අඤඤං හෙතුනං පච්චයා ඉති සම්පතතියා උපපතතියෙවා''** යනුපරිසමසිදුමාගී බැවින් බුදු-පසේබුදු-මහරහත් සක්විතිරජ ආදී වූ මහෙශාක්‍ය මනුෂ්‍යයන්ගේ හා දෙවියන්ගේ ප්‍රතිසන්ධි නැමති වෘක්ෂයෙහි රූපතලය දක්වා බැසගත්තාවූ මහත් වූ මූලයන් අවදෙනෙකුට බඳු වූ හෙතුධම්මඅවබෝධයෙන් යුක්ත වූ හෙයින් ඔවුන්ගේ ප්‍රතිසන්ධිවිපාකඵලයන් ආවෙය්‍ය අද්භූත විපාකානිශංස ඵලවත්නේ මැ යි. සිඛාවිකුම්භරථයන් වහන්සේගේ ප්‍රතිසන්ධිචිත්ත නැමති වෘක්ෂයාගේ රූපතලය දක්වා බැස ගත්තා වූ මූලයන් අවදෙනාගේ අනුසාරයෙන් දෙසැත්තෑවක් ප්‍රභෙද වූ ඤානයන් පිරිවර කොට ඇති සර්ව්ඥතාඤානය හා

වාත්‍රිංශද්වරමහාපුරුෂලක්ෂණ අශීත්‍යනුබ්‍යඤ්ජනයෙන් ප්‍රතිමණ්ඩිත ධම්කාය රූපකාය සඞ්ඛ්‍යාත වූ විපාකානිශංස හා පන්දහසක් අව්රුදු මුලුල්ලෙහි දිව්‍යබ්‍රහ්මයන්ගෙන් ලබන අනන්තාප්‍රමාණ වූ පූජාසත්කාර නැමති විපාකානිශංසයෝ ද ලැබෙත් යයි දතයුතු යි.

අවලෝස් අහෙතුකචිත්තය වනාහි "ජලනාළ සෙවාලස දිසා" යනු කී බැවින් වාතානුසාරයෙන් ඔබ්මොබ යා හැකි වූ දියසෙවෙල් බදු උපමා ඇති වෙත්. එහෙයින් අහෙතුක ප්‍රතිසන්ධීගත් සතර අපායෙහි වසන්නා වූ සත්ත්වයන්ට හා භූමිනිශ්‍රිත විනිපාතිකඅසුරාදී ඥානිප්‍රෙතකාලකණ්ණිමනුෂ්‍යාදීන්ගේ ද ප්‍රතිසන්ධිය වනාහී අහෙතුක බැවින් දියසෙවෙලට බදු උපමා ඇති වෙයි. ඥානිප්‍රෙතවිනිපාතිකඅසුරයෝ වනාහි මනුෂ්‍ය ජාතික නොවන බැවින් චාතුම්හාරාජිකභූම්යෙහි ඇතුලත් වෙති. කම්බලාසතරනාගභවනයෙහි දිව්‍යනාගයන්ගේ හා දිව්‍යගරුඩයන්ගේ ප්‍රතිසන්ධිය තිරිසන්අපායෙහි ම ඇතුලත් වන්නේයි. "ඡහෙතූ පවත්තිකාමසුගතියා" යනුවෙන් හෙතූනු සයෙකැයි කියේ නමුදු අලොභ-අදෝස-අමෝහසඞ්ඛ්‍යාත වූ හෙතූනු තුන්දෙන කුශලාව්‍යාකෘත වශයෙන් දෙවැදෑරුම් වන්නේ නමුදු නම් වශයෙන් සමාන හෙයින් අඟඟිතඤ්ඤණන්‍යායෙන් හකුළුවා ගෙණ හෙතූනු සදෙනකැයි කියන ලදි.

මේ හෙතු විභාගය යි.

—— ০ ——

ධ්‍යානාඞ්ගවිභාගය කෙසේයත්? "ධ්‍යානාඞ්ගය" යනු විතර්කය, විචාරය, ප්‍රීතිය, එකාග්‍රතාය, සෞමනස්සය, දෞමනස්සය, උපෙක්ෂාය, යන ධම්මයෝ සත්දෙනා යි. මේ විතර්කාදී ධම්මයෝ සත්දෙන කුශලාකුශල චිත්තයෙහි ද; අව්‍යාකෘතචිත්තයෙහි ද යෙදෙත්. එනකුදුවුවත් 'විතක්කසම්පයුත්තං ඣානඞ්ගන්ති පවුච්චති" යනුකී බැවින් දෙපස්විඤ්ඤණාදී චිත්තයෙහි විතර්කරහිත බැවින් ඒ අවිතර්කචිත්තයෙහි යෙදුනා වූ එකාග්‍රතා උපෙක්ෂාදී ධම්මයෝ වනාහි ධ්‍යානාඞ්ගයෝ ය යි නොකියත්. මේ ධම්මයෝ සත්දෙන වනාහි විතර්කවිචාරප්‍රීතිසහිත කොට ඇති කල්හි ම ධ්‍යානාඞ්ගය යි ව්‍යවහාර කෙරෙත්. 'ඣාන" ශබ්දයාගේ "පච්චනීක ධම්මෙ ඣාපෙති"ති= ඣානං. ආරම්මණං උපනිජ්ඣායතීති=ඣානං' යනුවෙන් විග්‍රහඅර්ථදෙකක් ඇත්තේ යි. ඒ දෙදෙනා අතුරෙන් මහග්ගතලෝකොත්තරාදි චිත්තයෙහි යෙදුනා වූ ධ්‍යානාඞ්ගයෝ තුමූ විග්‍රහාර්ථදෙකින් ම ධ්‍යානාඞ්ගයෝ නම් වෙත්. ඒ

කෙසේ යත්? රූපාවචරප්‍රථමධ්‍යාන කුශල චිත්ත යෙහි යෙදුනාවූ ධ්‍යානාඞ්ගපඤ්චක යෙන් පවත්නා වූ නීවරණ ධර්මයන් ක්‍රමයෙන් නැසෙනාසේ යෙන් ද, තොහොත් විෂ්කම්භනප්‍රහාණ වශයෙන් ප්‍රහීණ වී යෙන් ද, ධ්‍යානාලම්බණ සංඛ්‍යාත වූ කසිණප්‍රතිභාග නිමිත්ත ලම්බණය ලං කොට බලනාසේ යෙන් හෝ ගන්නාසේ යෙන් ධ්‍යානාඞ්ග නම් වේයි. ප්‍රථම ධ්‍යානචිත්ත යෙහි යෙදුනා වූ පන්සිස් ධර්මයන් අතුරෙන් විතර්කාදී ධ්‍යානාඞ්ගපඤ්චක ය කසිණනිමිත්ත බලනාසේ යෙන් ධ්‍යානාඞ්ගය සි කියා ද, අවශෙෂ වූ සප්තෛත්තාදි සම්ප්‍රයුක්ත ධර්ම ධ්‍යානාඞ්ගය සි කියා ද ව්‍යවහාර කෙරෙත්. යම්සේ උණුජල යෙහි දමන ලද්දා වූ පුෂ්පඵලාදිය තෙජෝධාතුශක්තියෙන් පිසන්නාක් මෙන් ධ්‍යානාඞ්ගචිත්ත නැමති උණුදිය යෙහි විතර්කාදී ධ්‍යානාඞ්ගපඤ්චක නැමති තෙජෝධාතුශක්තියෙන් සප්තෛත්තාදි වූ ධර්මයන්ට ද ධ්‍යානාඞ්ගශක්තිය ගන්වයි. මේසේ රූපධ්‍යානාදී මහග්ගත චිත්ත යෙහි යෙදුනා වූ විතර්කාදී ධ්‍යානාඞ්ගපඤ්චක ය අරමුණු නැඹීම හා පච්චනීවරණ ධර්මයන් දැවීම ද, එක ලක්ඛණ යෙහි සිඳ හැරීම බැවින් ධ්‍යානාඞ්ගය සි යට කී විග්‍රහ දෙකින්ම ව්‍යවහාර කෙරෙත්. අකුශල චිත්තාදි යෙහි යෙදුනා වූ ඒකාග්ගතාව සෞමනස්ස සහගත දිට්ඨිසම්ප්‍රයුක්ත පළමු වන අසංඛාරික අකුශල චිත්ත යෙහි යෙදුනාවූ සෞමනස්සය, විචාරය ප්‍රීතිය, යන ධර්මයෝ තුන්දෙන විතර්කය පශ්චිම කොට ඇති බැවින් ධ්‍යානාඞ්ගය සි කියත්. පටිඝසම්ප්‍රයුක්තචිත්ත යෙහි යෙදුනාවූ දෞර්මනස්ස විචාර දෙදෙන විතර්කය පශ්චිම කොට ඇති බැවින් අකුශලධ්‍යානාඞ්ගය සි කියත්. අවශෙෂ වූ උපෙක්ඛාසහගත සප්තඅකුශල චිත්ත යෙහි යෙදුනාවූ උපෙක්ඛාවිචාර දෙදෙන විතර්කය පශ්චිම කොට ඇති බැවින් අකුශලධ්‍යානාඞ්ගය සි කියත්. මේ අකුශලධ්‍යානාඞ්ගයන්ට වනාහි "ආරම්මණං උපනිජ්ඣායති" යන එක ම විග්‍රහයීය මුත් "පච්චනීකධම්මෙ ඣාපෙති" යන විග්‍රහය නො ලැබේ. දෙලොස් අකුශල චිත්ත යෙහි යෙදුනා වූ සෞමනස්සය, දෞර්මනස්සය, ප්‍රීතිය, විතර්කය, විචාරය උපෙක්ඛාය, යන ධ්‍යානාඞ්ගයෝ සදෙන ඒ ඒ අකුශල චිත්ත යාගේ අරමුණ ලං කොට බලනාසේ යෙන් හෝ ගන්නා සේ යෙන් හෝ ධ්‍යානාඞ්ගය සි කියත්. එසේ ම කාමාවචර කුශල චිත්ත යෙහි යෙදුනා වූ විතර්කවිචාර ප්‍රීති සොමනස්ස උපෙක්ඛා යන ධ්‍යානාඞ්ගපඤ්චක ය කුශලධ්‍යානාඞ්ගය සි කියා ද, පඤ්ච ක්‍රියා සම්ප්‍රයුක්ත වූ එම ධ්‍යානාඞ්ගපඤ්චක ය අව්‍යාකෘත ධ්‍යානාඞ්ගපඤ්චක ය සි කියා ද ව්‍යවහාර කෙරෙත්. එක්ෂණික්ෂණික ප්‍රභෙද විතර්ක විචාර ප්‍රීතීන් අතුරෙන් කුශලචිත්ත යෙහි යෙදුනා වූ ඒ ධර්මයෝ

තුන්දෙන කුශලධ්‍යානාඞ්ගය සි කියා ද, අකුශලචිත්තයෙහි යෙදුනා වූ එම ධර්මයෝ තුන්දෙන අකුශලධ්‍යානාඞ්ගය සි කියා ද, විපාක ක්‍රියා සම්ප්‍රයුක්ත වූ එම ධර්මයෝ තුන්දෙන අව්‍යාකෘත ධ්‍යානාඞ්ගය සි කියා ද ව්‍යවහාර නොවෙත්. සොමනස් උපෙක්ෂා දෙදෙනාගේ විභාගය ද එසේ මැ සි. දෙමහසඝ්‍යානාඞ්ගවය වනාහි අකුශලධ්‍යානාඞ්ග මැ සි. මේ සේ මේ සප්තධ්‍යානාඞ්ගයන්ගේ විභාගය යොගක්ෂම වූ චිත්තයන්ගේ වශයෙන් විසතර කට යුතු සි.

ධ්‍යානාඞ්ග විභාගය සි.

"මිථ්‍යාඞ්ගය" යනු "සම්මාදිට්ඨි-පෙ-සම්මාසමාධි, මිච්ඡාදිට්ඨි, මිච්ඡාසඞ්කප්ප, මිච්ඡාවායාම, මිච්ඡාසමාධි," යන මේ දෙළොස් දෙන මාර්ගාඞ්ගයෝ නම් වෙත්. දෙළොස්දෙනා අතුරෙන් සොමනස් සහගත දෘෂ්ටිසම්ප්‍රයුක්ත අකුශලචිත්තයෙහි යෙදුනා වූ මිථ්‍යාදෘෂ්ටිය, මිච්ඡාසඞ්කප්පය, මිච්ඡාවායාමය, මිච්ඡාසමාධිය යන අකුශලමාර්ගාඞ්ගයෝ සතරදෙනා සතර අපායට යන්නා වූ මාර්ගයාගේ අඞ්ග වන බැවින් යෝ සතර අපායට ගෙණ යන්නා වූ නැවකට බඳු වූ හෙයින් හෝ මාර්ගාඞ්ග නම් වෙත්. මිථ්‍යාදෘෂ්ටිය ප්‍රකටය. මිච්ඡාසඞ්කප්පය යනු අකුශල චිත්තයෙහි යෙදුනා වූ විතර්කචෛතසිකය සි. "මිථ්‍යාව්‍යායාමය" යනු එම චිත්තයෙහි යෙදුනා වූ වීර්‍යචෛතසිකය සි "මිථ්‍යාසමාධිය" යනු එම චිත්තයෙහි යෙදුනා වූ එකාග්‍රතා චෛතසිකය සි. මෙසේ දෙළොස් අකුශල චිත්තයන් අතුරෙන් දිට්ඨිගතසම්ප්‍රයුක්ත සතර චිත්තයෙහි අඤ්ඤමාර්ගාඞ්ගයෝ සතරඅතරදෙනා බැගින් ද, අවශෙෂ වූ අකුශල්දෙනෙහි මිච්ඡාවායාම, මිච්ඡාසඞ්කප්ප, මිච්ඡාසමාධි යන අපායමාර්ගාඞ්ගයෝ තුන්දෙන ද, සඵලාභයෙන් යෙදෙත්. එපරිදින් ම කාමාවචර මහාකුශල්අටෙහි යෙදුනා වූ සම්මාදිට්ඨි, සම්මාසඞ්කප්ප, සම්මාවායාම, සම්මාසති, සම්මාසමාධි, යන මාර්ගාඞ්ගයෝ පස්දෙන සුගතිමාර්ගයාගේ අඞ්ගවන බැවින් සුගතිමාර්ගාඞ්ගයෝ ය සි කියත්. ශීලපුණ්‍යක්‍රියා වශයෙන් පවත්නා වූ හෙවත් ආජීවෂට්මකශීලයෙහි එකඑක ශික්ෂාපදයක් පාසා ලැබෙන්නා වූ පාණාතිපාත අදින්නාදාන කාමෙසුමිච්ඡාචාරය යන ත්‍රිවිධවිරති සඞ්ඛ්‍යාත වූ සම්මාකම්මන්ත මාර්ගාඞ්ගය ද, මුසා, වාද පිසුණාවාච ඵරුසවාච සම්ඵප්පලාප යන චතුර්විධවිරති සඞ්ඛ්‍යාත වූ සම්මාවාචා මාර්ගාඞ්ගය ද, "මිච්ඡාජීව විරතියෙහි ලැබෙන්නා වූ සම්මාආජීවමාර්ගාඞ්ගයද, යන මේ ආජීවෂට්මක

ශීලයෙහි එකෙකි ශික්ෂාපදයක් පාසා වෙන්වෙන්ම ලැබියයුතු වූ "සම්මාකම්මන්ත, සම්මාවාචා සම්මාආජීව" යන මාර්ගාඞ්ගයෝ තුන්දෙන සප්තඅංගසුගතිමාර්ගයාගේ අඞ්ග වන හෙයින් සුගතී මාර්ගාඞ්ග නම් වෙත්.

රූපාවචර ප්‍රථමධ්‍යානචිත්තයෙහි ලැබියයුතු වූ "සම්මා දිට්ඨි සම්මාසඞ්කප්ප සම්මාවායාම සම්මාසති සම්මාසමාධි" යන පඤ්චමාර්ඞ්ගයන් හා විතියධ්‍යානකුශලචිත්තය-පෙ-පඤ්චමධ්‍යානක කුශලචිත්තය, ආකාසානඤ්චායතන-පෙ-නෙවසඤ්ඤානාසඤ්ඤායතන සංඛ්‍යාත වූ සතර අරූපාවචර චිත්තයෝ ද රූපධ්‍යාන අරූපධ්‍යානකුශලචිත්තයන් අටදෙනා සමඟ යෙදුනා වූ සම්මා දිට්ඨි සම්මාවායාම සම්මාසති සම්මාසමාධි යන සතර මාර්ගාඞ්ග යන් හා ප්‍රථමධ්‍යානකුශලචිත්තයෙහි යෙදුනා වූ මාර්ගාඞ්කපඤ්ච කය ද යන සුගතිමාර්ගාඞ්ගයෝ තුමූ සොළොස් රූපාවචරබ්‍රහ්ම ලෝකය, සතර අරූපබ්‍රහ්මලෝකය යන සුගතිමාර්ගාඞ්ගයාගේ අඞ්ග වන හෙයින් සුගතිමාර්ගාඞ්ග නම් වෙත්. මේ තවමහග්ගත චිත්තයෙහි "සම්මාවාචා සම්මාකම්මන්ත සම්මාආජීව" යන විරති සංඛ්‍යාත මාර්ගාඞ්ගයෝ නො ලැබෙත් මැ යි. කුමක්හෙයින්ද? චිත්තවිශුද්ධිසංඛ්‍යාත වූ ධ්‍යානයට පූර්භාගයෙහි පැවති ශීලවිශුද්ධියෙහි ත්‍රිවිධවිරතීන් ලැබියයුතු හෙයිනි. සෝවාන් සකෘදගාමි අනාගාමි අර්හත්සංඛ්‍යාත වූ සතරමාර්ගයෙහි ශුෂ්කවිදර්ශක යෝගාවචරයාහට හෝ ප්‍රථමධ්‍යානපාදකාදී වශයෙන් මාර්ගය ලබන්නා වූ සමථයානික යොගාවචරයාට හෝ සම්මාදිට්ඨි-පෙ-සම්මා සමාධි යන නිර්වාණ මාර්ගාඞ්කයෝ අටදෙන අනූනව ම ලැබෙත්. විතියධ්‍යානක පවත් අවශෙෂධ්‍යානයන් පාදක කිරීම් ආදී වශයෙන් මාර්ගය ලබන සමථයානික යොගාවචරයාහට සම්මා දිට්ඨිකප්පමාර්ගාඞ්ගය නො ලැබෙන හෙයින් මාර්ගාඞ්ගයෝ සත්දෙ නොක් ම ලැබෙති. මේඅයුරින් මාර්ගාඞ්ගය ලබන යොගාවචරයන්ගේ මාර්ගාඞ්ග අවදෙන හෝ සත්දෙන නිර්වාණය සඞ්ඛ්‍යාත එතරට ගමන් කරන්නා වූ නැවකට බඳු හෙයින් මාර්ගාඞ්ගයෝ ය යි කියත්. මේසේ දුගතිමාර්ගාඞ්ගය, සුගතිමාර්ගාඞ්ගය, නිර්වාණමාර්ගාඞ්ගය යන ත්‍රිවිධමාර්ගාඞ්ගයන්ගේ විභාගය දතයුතුයි.

මාර්ගාඞ්ග විභාගය යි.

ඉන්ද්‍රියධර්මයෝ වනාහි චක්ඛුන්ද්‍රිය, සොතින්ද්‍රිය, ඝාණින්ද්‍රිය ජිව්හින්ද්‍රිය, කායින්ද්‍රිය, ඉත්ථින්ද්‍රිය, පුරිසින්ද්‍රිය, ජීවිතින්ද්‍රිය, මනින්ද්‍රිය,

සුඛින්ද්‍රිය, දුක්ඛින්ද්‍රිය, සෝමනස්සින්ද්‍රිය, දෝමනස්සින්ද්‍රිය, උපෙක්ඛින්ද්‍රිය, සද්ධින්ද්‍රිය, විරියින්ද්‍රිය සතින්ද්‍රිය, සමාධින්ද්‍රිය, පඤ්ඤින්ද්‍රිය, අනඤ්ඤතඤ්ඤස්සාමීතින්ද්‍රිය, අඤ්ඤින්ද්‍රිය, අඤ්ඤාතාවින්ද්‍රිය, යනමොවුන්ගේ වශයෙන් දෙවිසි වැදෑරුම් වේ. "චක්ඛුවාරෙ ඉන්ද්‍රියං කරොති චක්ඛුවාරභාවෙන-න වාරිකෙහි අත්තනො ඉන්ද්‍රියභාවං පරමිස්සරියභාවං කාරයතීති=චක්ඛින්ද්‍රියං. තං හි තෙන රූප ගහණෙ අත්තනොසං අනු වත්තති, තෙ ච තං අනු වත්තන්ති, සෙසෙසුපි එසෙව නයො" යන විභඞ්ගඅට්ඨකථාවචනයෙන් චක්ඛින්ද්‍රියාදීන්ගේ ඉන්ද්‍රියාර්‍ථය දතයුතු යි. එහි අර්‍ථ මෙසේයි. යං ධම්මජාතං, යම් ධර්‍මස්වභාවක් තෙමේ; චක්ඛුවාරෙ, චක්ෂුර්‍වාරයෙහි; ඉන්ද්‍රියං, අධිපති බව; කාරෙති, කරවයි. චක්ඛුවාර භාවෙන, චක්ෂුර්‍වාර ස්වභාවයෙන්, තවාරිකෙහි, ඒ චක්ෂුර්‍වාරයෙහි හටගන්නා වූ චිත්තචෛතසිකයන් විසින්; අත්තනො, තමාගේ; ඉන්ද්‍රියභාවං, පරමිස්සරියභාවං, අතිශයින් ඊශ්වරභාවය; කාරයති, කරවනු ලබයි. ඉති, (තස්මා) එසේ හෙයින්; තං ධම්මජාතං, ඒ ධර්‍මස්වභාව තෙමේ; චක්ඛින්ද්‍රියං, චක්ඛින්ද්‍රිය නම් වේ. හි, ඒ එසේ මැයි. තං, ඒ චක්ඛින්ද්‍රිය තෙමේ; තවාරිකෙ, ඒ වාරයෙහි හටගන්නා වූ චිත්තචෛතසිකයන්; රූපගහණෙ, රූප ග්‍රහණයෙහිමැයි; අත්තානං, තමාකෙරෙහි; අනුවත්තති, අනුවර්‍තනය කරයි. තෙ ච තවාරිකා, ඒ වාරයෙහි හටගන්නා චිත්තචෛතසිකයෝ තුමූ; තං, ඒ චක්ඛින්ද්‍රියට; අනු වත්තන්ති, අනුවර්‍තනය කරති. සෙසෙසුපි, අවශෙෂ වූ ශ්‍රොත්‍රෙන්ද්‍රියාදියෙහි ද; එසෙව නයො, මේ ක්‍රමයම; වෙදිතබ්බො, දතයුත්තේය යනු පාඨයෙහි අර්‍ථයි. ඒ දෙවිසිඉන්ද්‍රියයන් ඝනරෙහි ආධාරණඅසාධාරණ වශයෙන් ද අර්‍ථවශයෙන් ද, ලක්ඛණාදීන්ගේ වශයෙන් ද, ක්‍රම වශයෙන් ද, භෙදභෙද වශයෙන් ද, තමතමාගේ කෘත්‍ය වශයෙන් ද, භවගන්නා භූමි වශයෙන් දැයි මෙසේ සත්ආකාරයකින් නිශ්චය දතයුත්තේ යි. ඒ ලක්ඛණාදීන් අතුරෙන් "චක්ඛතීති චක්ඛු" යනාදි වශයෙන් සඤ්ඤාණයෙයි කී ක්‍රමයෙන් අර්‍ථ දතයුත්තේ යි.

මේ දෙවිසි ඉන්ද්‍රියයන් අවසානයෙයි කී ඉන්ද්‍රියයන් තුන් දෙන අතුරෙන් අනඤ්ඤතඤ්ඤස්සාමීතින්ද්‍රිය වනාහි අර්‍හත්ඵලාඥාන ලැබීමට පෙර නොලැබූ විරූ නො දන්නා විරූ අමෘත සඞ්ඛ්‍යාත නිර්‍වාණය නොහොත් චතුස්සත්‍යය දැන ගන්නෙමි යි මෙසේ පිළිපන්නා වූ යොගාවචර පුද්ගලයාහට උපදනා ශෛක්ෂ්‍ය ඥානයින් ද, ඉන්ද්‍රියාර්‍ථ සමභව වන හෙයින් ද, නොහොත් ඉන්ද්‍රියශබ්දයාගේ

අර්ථය ලැබියයුතු හෙයින් ද, අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රිය යි කියත්. අඤ්ඤින්ද්‍රිය වනාහි:- භාග්‍යවාන් බුදුරජාණන් වහන්සේ දක්නා ලද්දාවූ පරිපූර්ණ වූ ශ්‍රේෂ්ඨ වූ නොයෙක් වර්ගයෙන් උතුම් වූ දක්නා ලද වතුස්සත්‍යය නැවත දක්නා හෙයින් ද, ඉන්ද්‍රියාර්ථය ලැබෙන හෙයින් ද, අඤ්ඤින්ද්‍රිය යි කියත්. තුන්වන අඤ්ඤාතාවින්ද්‍රිය චිත්තාභිවතුස්සත්‍යධර්මය දක්නා ලද්දාවූ අඤ්ඤාතාවීන්ද්‍රිය රහතුන් වහන්සේගේ හෙවත් නිමවා කරණ ලද ඥාතාඥාත්‍යය ඇත්තා වූ ආර්‍යයන් වහන්සේට උපදනා හෙයින් ද, ඉන්ද්‍රියාර්ථය සම්භව වන හෙයින් ද, අඤ්ඤාතාවින්ද්‍රිය යි කියන ලද්දේ යි. හාත්පසින් නිමවා කරණ ලද ජානනකෘත්‍යය ඇත්තා වූ අතීත්ඵලඥාන ප්‍රවෘත්ත නිමිත්ත කොට ගෙණ අඤ්ඤාතාවීඃබද තෙමේ ඒ අතීත්ඵල සම්මංගිපුද්ගලයා හෝ අතීත්ඵලසම්ප්‍රයුක්ත ධර්ම හෝ වාච්‍යවේ. ඒ අතීත්ඵලඥානා තෙමේ අඤ්ඤාතාවී භාවය වෙ යි. ඒ පරිනිෂ්ඨිතකෘත්‍යය ඇත්තා වූ ජානන තෙමේ ක්ෂීණාශ්‍රවභාවඃ වන හෙයින් ක්ෂීණාශ්‍රවයන්ට උපදනා හෙයින් අඤ්ඤාතාවීන්ද්‍රියය යි කියත්.

මේ ඉන්ද්‍රිය ශබ්දාර්ථය කවරේදයත්? ඉන්ද්‍ර නම් වූ කුශලා කුශලකර්මය ප්‍රකාශිතවූ ධර්මයාගේ සවභාව හෝ ඉන්ද්‍ර නම් වූ කුශලාකුශලනාමය ප්‍රකාශ කිරීම් සංඛ්‍යාත වූ ඉන්ද්‍රියශබ්දාර්ථයද, ඉන්ද්‍රලිඞ්ගාර්ථ නම් වූ ඉන්ද්‍රියාර්ථ නම් වේ. ඉන්ද්‍රදේශිතාර්ථය යනු ඉන්ද්‍ර නම් ඇති දෙයක් විසින් දේශිතවූ ධර්මයාගේ සවභාව හෝ නොහොත් දේශනා කරණ ලද්දේය යන අර්ථය හෝ ඉන්ද්‍රදේශිතාර්ථ ඉන්ද්‍රියාර්ථ නම් වේ. "ඉන්ද්‍රදිෂ්ටාර්ථය" යනු ඉන්ද්‍ර නම් වූ බුදුන් විසින් දක්නා ලද ධර්මයාගේ සවභාව හෝ දක්නා ලද්දේය යන අර්ථය හෝ ඉන්ද්‍රදිෂ්ටාර්ථ ඉන්ද්‍රියාර්ථ නම් වේ. "ඉන්ද්‍ර ඉෂ්ටඵල ඉන්ද්‍රියාර්ථය" යනු ඉන්ද්‍ර නම් වූ තමා විසින් සකස් කරණ ලද උපදවා ලද ධර්මයාගේ සවභාව හෝ සකස්කරණ ලද්දේය. උපදවන ලද්දේය යන අර්ථය හෝ ඉන්ද්‍රෂ්ටඵලඉන්ද්‍රියාර්ථ නම් වේ. "ඉන්ද්‍රජුෂ්ටඵලඉන්ද්‍රියාර්ථය" යනු ඉන්ද්‍ර නම් වූ සේවයන්ට ලක්වූයේ විසින් ආසෙවිතනිසෙවිතධර්මයාගේ සවභාව හෝ ආසෙවිතනිසෙවිතාර්ථය හෝ ඉන්ද්‍රජුෂ්ටඵලඉන්ද්‍රියාර්ථ නම්වේ. මෙසේ දක්වන ලද ඉන්ද්‍රලිඞ්ගාර්ථඉන්ද්‍රියාර්ථ, ඉන්ද්‍රදේශිතාර්ථ ඉන්ද්‍රියාර්ථ, ඉන්ද්‍රදිෂ්ටඵල ඉන්ද්‍රියාර්ථ, ඉන්ද්‍රෂ්ටඵලඉන්ද්‍රියාර්ථ, ඉන්ද්‍රජුෂ්ටඵල ඉන්ද්‍රියාර්ථ, යන මේ පවප්‍රකාර සියලු අර්ථසවභාව තෙමේ දෙවිස් ඉන්ද්‍රිය ධර්මයෙහි සුදුසු පරිද්දෙන් යෙදෙන්නේ යි.

මේ අර්ථය වනාහි "**ලිඛතීති ගමෙති සද්දාපෙතීති ලිඛං, ලිංගීයති වා එතෙනාති ලිඛං, කිං ලිඛතෙති?** කිව වා ලිංගියතීති=ඉන්දං, ඉන්දෙ වා, ඉන්දස්ස ලිඛං-ඉන්දලිඛං, ඉන්දලිඛස්ස අත්ථෝ, තං සභාවෝ-ඉන්දලිඛමත්ථෝ සජ්ජිතං උපපාදිතන්ති—සිද්ධං, ඉන්දෙන සිද්ධං-ඉන්දසිද්ධං. ජුද්ධා සෙවිතං, කම්මසංඛාතස්ස ඉන්දස්ස ලිඛානි සෙන්ත ච සිඛානීති? කම්මජානෙව යොජෙතබ්බානි, න අඤ්ඤානි, තෙ ච මෙ අත්ථා කමෙම එව යොජෙතබ්බා, ඉතරෙ ච භවන්ති යෙවානි, යථායොගන්ති ආහ, යන්ත විඤ්ඣිමාගීවිකායෙහි ආචා වූ ලිඛාතීපවචනය යි.

ලිඛෙතති- ගමෙති- සද්දාපෙති- දන්වා ද; ඉති, (තස්මා), එසේ කෙසින්; ලිඛං, ලිඛ නම් වේ. වා, නොහොත් එතෙන, මේ සඛාවධම්ම කරණකොට ගෙණ; ලිංගියති, දැන ගන්නා ලද්දේ ද; ඉති (තස්මා) එසේ දැන ගන්නා ශක්තියෙන්; ලිඛං, ලිඛ නම් වේ. කිං ලිඛෙතති? කුමක් දැන ගත්තේ ද යත්? වා, නොහොත්; කිව ලිංගියති? කොසේ දැන ගන්නා ලැබේ ද යත්? ඉති වෙ, ඉදින් මෙබඳු චොදනාවක් වී නම්; ඉන්දා, ඊශ්වර වූ මේ සමය; ලිඛෙතති, දැන ගණිවා; නොහොත් ඉන්දෙ, ඊශ්වර වූ කමීය; ලිංගියති, දැන ගන්නා ලැබේ ද; ඉන්දස්ස, ඊශ්වරවූ කමීය; ලිඛං, දන්වන්නේයි සේ සි; නොහොත් ඊශ්වර වූ කමීය දැන ගැණීමට ඇත්තා වූ හෙතුව; ඉන්දලිඛං, ඉන්දලිඛ නම් වේ. නොහොත් ඉන්දලිඛස්ස, ඊශ්වර වූ කමීයදන්වන්නා වූ ධම්යාගේ; අත්ථෝ, තං සභාවෝ, ඒ දැන්වීම සංඛ්‍යාත සවභාව; ඉන්දලිඛමත්ථෝ, ඉන්දලිඛභාවී නම් වේ. වා, නොහොත්; ඉන්ද ලිඛමෙව, අධිපති වූ කමීය හඟවන්නා වූ ම; ඉන්ද්‍රියසද්දස්ස, ඉන්ද්‍රිය ශබ්දයාගේ; අත්ථෝ, අර්ථ යි ඉන්දලිඛමත්ථෝ, ඊශ්වර වූ කමීය දැන ගැණීමට කාරණා වූ ඉන්ද්‍රිය ශබ්දයාගේ අර්ථය, සජ්ජිතං, සදන ලද්දේද; උපපාදිතං, උපදවන ලද්දේද; ඉති (තස්මා) එසේ කෙසින්; සිද්ධං, සිද්ධ නම් වේ, ඉන්දෙන, ඊශ්වර වූ කමීය විසින්; සිද්ධං, රචනා කරණ ලද්දේය. උපදවන ලද්දේ නුයි; ඉන්දසිද්ධං, ඉන්දසිද්ධ නම් වේ. ජුද්ධං, ජුද්ධ යනු; සෙවිතං, සේවනය කරණ ලද්දේ යි. කම්මසංඛාතස්ස, කමීය යි කියන ලද්දා වූ; ඉන්දස්ස, ඊශ්වර ධම්යාගේ, ලිඛානි, දැන ගැණීමට කාරණයෝ නුයි; කෙන ච, ඒ ඊශ්වර වූ කමීයෙයි නුදු; සිද්ධානි, උපදවන ලද්දාහුය; ඉති ඉම්නා අත්ථෙන, යන මේ අර්ථ කරණ කොට ගෙණ; කම්මජානෙව, කමීයෙන් ඇවඟන්නා වූ ඉන්ද්‍රියයෝ ම; යොජෙතබ්බානි, යෙදියයුත්තාහුය; අඤ්ඤානි, සෙසු ඉන්ද්‍රිය ධම්මයෝ; න යොජෙතබ්බානි, නො යෙදියයුත්තාහුය. **තෙ චෙ**

අත්ථා, ඒ ඉන්‍ද්‍රලිඞ්ග-සිඤ්ඤ සංඛ්‍යාත වූ අර්‍ථයෝ දෙදෙන; කවෙම් එව්, කම්මයෙහි ම; යොජේතබ්බා, යෙදියයුත්තාහුය; ඉතරෙ ච, මෙයින් අන්‍ය වූ ඉන්‍ද්‍රියාදී වූ අර්‍ථයෝ තුන්දෙන වනාහි; සගවති එව, භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි ම; යොජේතබ්බා, යෙදියයුත්තාහුය; ඉති (තසමා) එසේ හෙයින්; යථායොගං, යථායෝගං යනුවෙන්; ආචරියෝ, ධම්පාලාචාර්‍යයන් හෙමේ; ආහ, කියේ සි. "ඉන්‍ද්‍රලිඞ්ගාදීනා" යනාදියෙහි එකාරයට ඨකාරාදේශ කරණ ලද්දේසි.

ඉන්‍ද්‍රතෝ ලිඞ්ගසිඤ්ඤදෙසිතසිඤ්ජුසිඤ්සරියත්ථෙව වත්තබ්බා ඉන්‍ද්‍රසද්දතෝ ණ්‍යපච්චයෝ හොති. ඉන්ද්‍රියති එත්ථාති ඉන්‍ද්‍රං වුච්චති සම්මාසම්බුඩෝ. පරමිස්සරිය භාවතෝ කුසලා කුසලෙ ච කම්මං, තමෙමසු සාසන්ව ඉස්සරියභාවතෝ තසමා සම්මාසම්බුද්ධෝ චක්ඛාදීනි ඉන්‍ද්‍රං කුසලාකුසලකම්මං උල්ලිඞ්ගනති තෙන ව සිඤ්ඤානීති ඉන්ද්‍රියානීති සබ්බානෙව පන බාවිසතිඉන්ද්‍රියානි, ඉමෙසන්න භගවතා යථා භූතතෝ දෙසිතානීති ඉන්ද්‍රියානි, තථා ඉමෙන භගවතා දිඤ්ඤානීති ඉන්ද්‍රියානි, තෙ නෙව ච ඉමෙන භගවතා කානි චි ලොචරාසෙචනානි කානිචි භාවනාසෙවනානි දිඤ්ඤානීති ඉන්ද්‍රියානි, ආඛ්‍යාතත්ථ සඞ්ඛ්‍යාතත්ථ ඉන්ද්‍රියසඤ්ඤානානි ඉන්ද්‍රියානි, අපි ච ඉන්‍ද්‍රානි ඉන්ද්‍රියානි, අත්‍ර පනිදමපි උපලක්ඛණං, ඉන්‍ද්‍රස්සභාවෝ ඉන්‍ද්‍රං ඉන්‍ද්‍රියන්ති ච්ඡාහෙ ඉන්ද්‍රියනති පදං සකත්ථෙඤ්ඤමෙව වදති, තදෙව පදං දඞ්කාරස්ස ජකාරෙ කතෙ ච ඤාදිනෝ ච වදති. සඞ්ඛ්‍යානිරුළෙනීති සඤ්ඤ අත්ථෙ තුති" යනු සඤ්ඤනීති ඤඞ්ඛිතඤ්ඤ සි.

හි, විසතර කෙරෙමි:—සම්මාසම්බුඩෝ, චතුරාර්‍යසත්‍යස්‍ය අවිපරීතාකාරයෙන් අවබෝධ කළාවූ; භගවා, භාග්‍යවත්තෙමේ; පරමිස්සරියභාවතෝ, පරමෙශ්වර බවට පැමිණි හෙයින්; ඉතෙ, ඉන්‍ද්‍ර නම් වේ කුසලාකුසලව කම්මං, කුසලාකුසලකර්‍මය ද; කමෙමසු, කර්‍මයන් කෙරෙහි; සාසන්ව, ස්වාමිවෙක්හුගේ; ඉස්සරියභාවතෝ, ඓශ්වර්‍යයී බවෙක් නැති හෙයින්; ඉතෙ, ඉන්‍ද්‍ර නම් වේ. තෙන භගවතා කම්මස්ස ච ඉන්‍ද්‍රතා, ඒ භාග්‍යවත්හුගේ ද කර්‍මයාගේ ද ඉන්‍ද්‍රභාවය ඇති හෙයින්; එත්ථ, මේ ඉන්ද්‍රියයන් අතුරෙන්; තාව, පළමු කොට; කම්මසඤ්ඤනිතානි, කර්‍මය විසින් උපදවන ලද්දු වූ; ඉන්ද්‍රියානි, චක්ෂුරාදී ඉන්ද්‍රිය යෝ තුමූ; කුසලාකුසලකම්මං, කුශලාකුශලකර්‍මය; උල්ලිඞ්ගනති, යි සේ සි; සඤ්ඤපෙනති, හඟවත්ද; පකාසෙනති, ප්‍රකාශ කෙරෙත් ද; තෙන ච, ඒ කර්‍මය විසින් වූ ද; සිඤ්ඤනීති; උපදවන ලද්දාහු

නුයි; ඉන්ද්‍රියානි, ඉන්ද්‍රිය නම් වෙත්. ඉති, මේසේ; ඉන්‍දලිඞ්ග ඤෙන ච, ඉන්‍ද නම් වූ කම්ය ප්‍රකාශ කරණ සවභාව ඇති හෙයින් ද, නොහොත් ප්‍රකාශ කිරීම් සඞ්ඛ්‍යාත වූ අර්ථයන් ද,-ඉන්‍ද සිඤඤෙන ච, ඉන්‍ද නම් වූ කම්ය විසින් රචනා කරණ සවභාව ඇති කෙයින් ද; නොහොත් ඉන්‍ද නම් වූ කම්ය විසින් රචනා කිරීම් සඞ්ඛ්‍යාත වූ අර්ථයෙන් ද; (මේ වනාහි ඉන්‍දලිඞ්ගස්ස අත්ථොතං සහාවෝ. ඉන්‍දලිඞ්ගඤෝ=ඉන්‍දලිඞ්ගමේව වා ඉන්ද්‍රිය සද්‍දස්ස අත්ථොති= ඉන්‍දලිඞ්ගඤෝ, යන විශුද්ධිමාගීවිකාපාඨයට අනුව කියන ලදී. නොහොත් ඉන්‍දලිඞ්ගඤෙන ච, ඉන්‍ද නම් කම්ය ප්‍රකාශ කරණ සවභාව ඇති හෙයින්ද; නොහොත් භගවන සවභාව සංඛ්‍යාත සවභාවාර්ථයෙන් ද; (මේ වනාහි ලිඞ්ගශබ්දය භාවප්‍රධාන වශයෙන් කල්පනා කොට අත්ථශබ්දයාගේ සවභාවාර්ථය, ප්‍රකාශාර්ථය යන අර්ථයන් දෙදෙනාගෙණ කරන්නා වූ අර්ථයොජනාව සි.) ඉන්‍රියානි, ඉන්‍රිය නම් වෙත්. පන, එයින් අන්‍ය වූ; සබ්බානෙව එතානි, මේ සියලු දෙවිසි ඉන්‍රියයෝ; ඉමෙහන භගවතා, පරමෙස්වර භාග්‍යවත්හු විසින්, යථාභූතතෝ, තත් වූ සවභාව වශයෙන්; පකාසිතානි, ප්‍රකාශ කරණ ලද්දා හුය; අභිඤ්ඤාබුද්ධානි ච, විශිෂ්ටඥානයෙන් තමන්වහන්සේ විසින් අවබොධ කරණ ලද්දාහුය. ඉති, මේසේ; ඉන්දදෙසිතඛන්ධා ච, ඉන්ද නම් වූ භාග්‍යවත්හු විසින් දෙසියයුතුබැවින් ද, ඉන්දදිඤ්ඤෙන ච, ඉන්ද නම් වූ භාග්‍යවත්හු විසින් දක්නා ලද අර්ථයෙන් ද, ඉන්‍රියානි, ඉන්‍රිය නම් වෙත්. මුනින්දෙන, ෂට්විධ මුනීන්ට ඉන්‍ද වූ; තෙන භගවතා, ඒ භාග්‍යවත්හු විසින්; කානිචි, ඇතැම් ඉන්ද්‍රියයෝ; ගොචරාසෙවනාය, අරමුණු ආසෙවන යෙන් ද; කානිචි, ඇතැම් ඉන්ද්‍රියයෝ; භාවනාසෙවනාය, වැඩීම් ආසෙවනයෙන් ද; දිඨානීති, සෙවනය කරණ ලද්දාහුද, ඉති, මේසේ; ඉන්දජුඤ්ඤෙනාපි, ඉන්ද නම් වූ භාග්‍යවත්හු විසින් ගොචරාසෙවන-භාවනාසෙවන වශයෙන් සෙවනය කරණ ලද බැවි සංඛ්‍යාත සවභාවාර්ථයෙන් ද; ඉන්ද්‍රියානි, ඉන්ද්‍රිය නම් වෙත්. "තෙසං නිමි ං ආසෙවති" යනාදියෙහි අරමුණු කිරීම ආසෙවන නම් වන හෙයින් "කානිචි ගොචරාසෙවනාය" යනු කිහ. තස්ස භා මගඛං ආසෙවභාවනා" යනාදියෙහි භාවනා සෙවන නම් වන හෙයින් භාවිතව්‍ය වූ ශ්‍රඬාදීන් සඳහා "කානිචි භාවනාසෙවනාය" යනු කිහ. අපි ච, වැලිත්; ආධිපච්චය සම්මතෙන, අධිපති බැවි සඞ්ඛ්‍යාත වූ නොහොත් ඉන්ද්‍රිය ප්‍රත්‍යය භාවය සි කියා ලද්දා වූ ඉස්සරියඤෙන, ඓශ්වර්‍යභාව සඞ්ඛ්‍යාත වූ අර්ථයෙන්ද; එකානි, මේ චක්ඛුරාදී දෙවිසි ඉන්ද්‍රියධම්මයෝ

තුමූ; ඉන්ද්‍රියානි, ඉන්ද්‍රිය නම් වෙත්. මේ "ඉස්සරියඨේන" යන පෘථක් බලා ම; (තෙවහි) ඉන්දලිඞ්ගාදියෙහි; භාවප්‍රධාන බව කැපපෑ කෙළේ යි ඉත්ථින්ද්‍රිය පුරිසින්ද්‍රියයන්ගේ කම්මතම්හට ප්‍රධාන වන බව යෙවත් ඉත්ථිනාමාදියට උපකාර වන හෙයිනි එසකුදුවුවත් ඉන්ද්‍රියප්‍රත්‍යයෙන් උපකාර නො වන්නේ යි ය, ඒ එසේමැ යි. චක්ඛුවිඤ්ඤාණාදි පවත්තියං, චක්ඛුවිඤ්ඤාණාදීන්ගේ ඝට්ටනලක්ඛණවෙයි චක්ඛුරාදී ඉන්ද්‍රිය නොවේ; ත්‍රෙකෙක, තියුණු බව ඇතිසැල්හි; තෙසං, ඒ චක්ඛුර්විඤ්ඤාණාදීන්ගේ; තික්ඛත්තා, තියුණු බව වන හෙයින් ද, මන්දෙව, මඳවූ කල්හි, මන්දත්තා, මඳ වන හෙයින්; ඒකකාදීනං, ඒකක්ඛුරාදීන්ගේ; ආධිපච්චං, අධිපති බව; සිද්ධං, සිද්ධ යි. ඉති (තයමා) එසේ හෙයින්; ඉන්ද්‍රියානි ඉන්ද්‍රිය නම් වෙත්.

ඒ දෙවිසි ඉන්ද්‍රියයන් අතුරෙන් චක්ඛුප්පසාදරූපකලාපයෙහි ඇතුළත් වූ පඨවී ආපෝ තේජෝ වායෝ වණ්ණ ගන්ධ රස ඔජා ජීවිත යන රූපයෝ නවදෙන චක්ඛුප්පසාද සංඛ්‍යාත වූ රූපයට අනුව පවත්නා හෙයින් හෙවත් ඒ රූපයන් නවදෙනා කෙරෙහි චක්ඛුප්පසාදය අධිපති බව කරණ හෙයින් චක්ඛුන්ද්‍රිය නම් වේ. ශ්‍රොත්‍රකලාපඝාණජිව්හාකායය විත්තුකලාපය යන මෙතෙක් රූපකලාපයෙහි ද ශ්‍රොත්‍රප්‍රසාදාදිහු අධිපති බව කරණ හෙයින් ශ්‍රොත්‍රෙන්ද්‍රිය ඝ්‍රාණෙන්ද්‍රිය ජිව්හින්ද්‍රිය ය කායෙන්ද්‍රිය ය යි කියත්. ඉත්ථින්ද්‍රිය පුරිසින්ද්‍රිය කලාපවලයෙහි ඒ ස්ත්‍රීභාව පුරුෂභාව යෝ දෙදෙන ස්ත්‍රීලිඞ්ග ස්ත්‍රීනිමිත්ත ස්ත්‍රීකුත්තා ස්ත්‍රීආකප්ප යන්ට හා පුරිසලිඞ්ග පුරිසනිමිත්ත පුරිසකුත්ත පුරිසආකප්ප යන මොවුන්ට ද අධිපති බව කරණ හෙයින් ඉත්ථින්ද්‍රිය පුරිසින්ද්‍රිය ය යි කියත්. "සත්‍රීලිඞ්ගය" යනු ස්ත්‍රීන්ගේ ආකාරය යි. "ස්ත්‍රී නිමිත්තය" යනු ස්ත්‍රීන්ගේ පයෝධරාදී අවයවයෝ යි. ස්ත්‍රී කුත්තය යනු බාලඅවස්ථාවෙහි කුඩා කුළුආදියෙන් ක්‍රීඩා කිරීම් ආදිය යි. ස්ත්‍රීආකල්පය යනු ස්ත්‍රීන්ගේ හාවභාවලීලාදිය යි. පුරුෂලිඞ්ගාදියෙහි ද මේ ක්‍රමය යොදා ගතයුතු යි. ජීවිතෙන්ද්‍රිය යනු නාමරූපධර්මයන් පරිපාලනයෙහි සමර්ථවූ නාමජීවිතෙන්ද්‍රිය හා රූපජීවිතෙන්ද්‍රිය යි. මේ චක්ඛුරින්ද්‍රිය ශ්‍රොත්‍රින්ද්‍රිය ඝ්‍රාණින්ද්‍රිය ජිව්හින්ද්‍රිය කායින්ද්‍රිය ඉත්ථින්ද්‍රිය පුරිසින්ද්‍රිය ජීවිතෙන්ද්‍රිය යන ඉන්ද්‍රියයෝ අවදෙන රූපෙන්ද්‍රියයෝ නම් වෙත්. එතැන් පටන් දක්වන්නා වූ මනින්ද්‍රියාදිහු නාමෙන්ද්‍රියයෝ නම් වෙත්. හෙවත් සියලුම තමා හා සම්ප්‍රයුක්තාධර්මයන්ට ඊශ්වරභාවය කරණ හෙයින් මනින්ද්‍රිය නම් වෙයි. සුඛසහගත කායවිඤ්ඤාණ චිත්ත යෙහි යෙදුනා වූ වේදනාවෙතසිකය තමා එක්ව යෙදුනා වූ

චෛතසික ධර්මයන්ට ඊශ්වරභාවය කරණ හෙයින් සුඛෙන්ද්‍රිය නම් වේ. දුක් සහගත කායවිඥානචිත්තයෙහි යෙදුනා වූ වේදනාචෛතසිකය තමා හා සම්ප්‍රයුක්ත වූ ධර්මයන්ට ඊශ්වරභාවය කරණ හෙයින් දුක්ඛෙන්ද්‍රිය නම් වේ. දෙසැටක් සෞමනස් සහගත චිත්තයෙහි යෙදුනා වූ වේදනාචෛතසිකය ඒ චිත්තයෙහි යෙදුනා වූ අවශෙෂධර්මයන්ට ඊශ්වරභාවය කරණ හෙයින් සෞමනස්සින්ද්‍රිය නම් වේ. දෙමිනස් සහගත දෙසිතෙහි යෙදුනා වූ දෞර්මනස්වේදනා තොමෝ තමා හා සම්ප්‍රයුක්ත වූ අවශෙෂ ධර්මයන්ට ඊශ්වරභාවය කරණ හෙයින් දෞර්මනස්සින්ද්‍රිය නම් වේ. උපෙක්ෂාසහගත පස්පණස් චිත්තයෙහි යෙදුනා වූ වේදනාතොමෝ ඒ ඒ චිත්තයෙහි යෙදුනා වූ අවශෙෂ චෛතසික ධර්මයන්ට ඊශ්වරභාවය කරණ හෙයින් උපෙක්ඛින්ද්‍රිය නම් වේ. ධ්‍යානමාගී ඵලචිත්තයෙහි ශ්‍රද්ධා-වීර්‍ය්‍ය-සමාධි-ප්‍රඥා යන ධර්මයෝ පස් දෙන තමතමාගේ කෘත්‍යය පැමිණි කල්හි ඒ ඒ කෘත්‍යය සිද්ධ කරණ හෙයින් ඉන්ද්‍රිය ධර්මයෝ යි ව්‍යවහාර කෙරෙත් ඊට උපමා කවරයත්?

සිටුපුත්‍රයන් සතරදෙනෙක් සමඟ නගර සංචාරණයට යන්නා වූ රජ තොමෝ පළමුවෙනි සිටුපුත්‍රයාගේ ගෙට පැමිණි කල්හි රජු හා අවශෙෂ සිටුපුත්‍රයන් තුන්දෙන ද නිශ්ශබ්දව සිටි කල්හි ඒ ගෙට අධිපති සිටුපුත්‍ර තෙමේ තමන්ගේ දැසිදාස යන් ලවා ආගන්තුකව පැමිණි රජු හා සිටුපුත්‍රයන් තුන්දෙනා හට බත්බුලත් ආදියෙන් සංග්‍රහ කරව සි සිතයි. එසේ දින්නේම ශ්‍රද්ධාචෛතසිකය ධ්‍යානමාගීඵල චිත්තයෙහි අරමුණෙහි ප්‍රසන්න කරවීම් වැනියත් තමාගේ කෘත්‍යය කරණ හෙයින් සද්ධින්ද්‍රිය නම් වේ. එතනින් නැඟිට දෙවෙනි සිටුපුත්‍රයාගේ ගෙට ගිය කල්හි රජු හා අවශෙෂ සිටුපුත්‍රයෝ තුන්දෙන ද නිශ්ශබ්දවෙත්. ඒ ගේ හිමි සිටුපුත්‍ර තෙමේ ද තමාගේ දැසිදාසයන් ලවා බත්බුලත් සුවඳ විලවුන් ආදියෙන් සංග්‍රහ කරවන්නාක්මෙන් ධ්‍යානමාගීඵල චිත්තයෙහි යෙදුනා වූ විරියචෛතසිකය සත්‍යක් ප්‍රධානයන්ගේ විශෙෂයන් තමතමන්ගේ කෘත්‍යය සිද්ධ කරණ හෙයින් විරියින්ද්‍රිය නම් වේ. එතනින් නැඟිට තුන්වෙනි සිටුපුත්‍රයාගේ ගෙට පැමිණි කල්හි ද එසේම තුන්වෙනි සිටුපුත්‍ර තෙමේ ද සංග්‍රහ කරවන්නාක් මෙන් ධ්‍යානමාගීඵල චිත්තයෙහි යෙදුනාවූ සතිචෛතසිකය තෙමේ සතර සතිපට්ඨානයන්ගේ විශෙෂයෙන් ඊශ්වරභාවයෙන් තමාගේ කෘත්‍යය සිද්ධ කරණ හෙයින් සතින්ද්‍රිය නම් වේ. එතනින් නැඟිට සතරවෙනි සිටුපුත්‍රයාගේ ගෙට පැමිණි කල්හි ද රජු හා අවශෙෂ තුන්දෙන

තුෂ්ණීම්භූත වෙත්. ඒ නේ ගිම් සිටුපුත්‍ර තෙමේද පෙර මෙන් සංග්‍රහ කරවන්නාක් මෙන් ධ්‍යානමාගීඵලචිත්තයෙහි යෙදුනාවූ එකාග්‍රතාවෙතසිකය නම්ගේ ආනන්තර්‍ය සංඛ්‍යාත වූ මොනවට අරමුණෙහි පිහිටුවීම් සිඩ කාරණ හෙයින් සමාධීන්ද්‍රිය නම් වේ. එනහින් නැගිට රජතෙමේ පැමිණි කල්හී සිටුපුත්‍රයෝ සතර දෙන නිශ්ශබ්ද වෙත්. සිටුපුත්‍රයන්ගේ සංග්‍රහයට විඝුණන්නාවූ සංග්‍රහයක් රජ තෙමේ උත්සාහයට වශයෙන් කරවන්නාක් මෙන් ධ්‍යානමාගීඵලචිත්තයෙහි යෙදුනා වූ ප්‍රඥාවෙතසිකය ධර්මයන්ගේ යථාසභාවාවබෝධ කිරීම් වශයෙන් තමාගේ කෘත්‍යය සිඩ කරණ හෙයින් ප්‍රඥේන්ද්‍රිය නම් වේ.

අනාඥාස්‍යාමීතීන්ද්‍රිය යනු සෝවාන් මාගීචිත්තයෙහි යෙදුනා වූ ප්‍රඥාවෙතසිකය යි. ඒ ප්‍රඥාව මනාකි අනාදිමත් සංසාරයෙහි කිසි කලෙක නුදුටු විරූ අසංඛතධාතු සාඛ්‍යාත නිර්වාණධර්මය පළමුවෙනට දක්නා හෙයින් ද මාගීචිත්තයෙහි යෙදුනා වූ සත්තිස්බොධිපාක්ෂිකධර්මයන්ට ඊශ්වරභාවය කරණ හෙයින් ද අනාඥාස්‍යාමීතීන්ද්‍රිය නම් වේ. සෝවාන් ඵල චිත්තය-පෙ-අර්හත්මාගීචිත්තය යන මේ මාගීඵල සිත්සයෙහි යෙදුනා වූ ප්‍රඥාවෙතසිකයෝ සදෙන කෘත්‍යයෙන් නිර්වාණධර්මය දක්නා හෙයින් ද, ඒ ඒ චිත්තයෙහි යෙදුනා වූ සත්තිස්බොධිපාක්ෂික ධර්මයන්ට ඊශ්වරභාවය කරණ හෙයින් ද, අඥාස්‍යාමීතීන්ද්‍රිය යයි කියත්. මෙහි "අඥාස්‍යා" ශබ්දය සෝවාන් ඵලචිත්තය පටන් අර්හත්මාගීචිත්තය දක්වා සවැදෑරුම්වූ මාගීඵලචිත්තයෙහි යෙදුනා වූ ප්‍රඥාව වාච්‍යවන හෙයින් ප්‍රතිවේධාර්ථ අකාරය යි නොගෙණ සම්මාඤාර්ථාවකාර වූ අකාරය යි දතයුතු යි. මෙහි ආකාරයට ග්‍රහව කොට සදිසවෙනාවය කිරීමෙන් අඥාස්‍යා ශබ්දය සිඩ යි, අඥාස්‍යා ඉති" යනාදියෙහි සම්භාම පදයකැ යි නොදත යුතු යි. "අඥාස්‍යාතාවින්ද්‍රිය" යනු අර්හත්ඵලචිත්තයෙහි යෙදුනා වූ ප්‍රඥාවෙතසිකය යි. ඒ ප්‍රඥාවෙතසිකය වනාහි අඥාස්‍යාතාවී නම් වූ රහතුන් වහන්සේගේ ඉන්ද්‍රියයක් වන හෙයින් අඥාස්‍යා තාවින්ද්‍රිය නම් වේ. මේ දෙවිසි ඉන්ද්‍රියයන් අතුරෙන් රූපෙන්ද්‍රිය යන් අටදෙනාගේ හා කායේන්ද්‍රියයන් තුදුස්දෙනාගේ ද විශෙෂ නම්:—රූපෙන්ද්‍රියයෝ අටදෙන යට කී රූපකලාපාදියෙහි ඇතුලත් වූ රූපාදීන්ට මූල අවශෙෂධර්මයන්ට ඊශ්වරභාවය නොකෙරෙත්. තුදුස් නාමෙන්ද්‍රියයෝ වනාහි අනාගතනය සමනන්ත පධාන මහාප්‍රකරණයෙහි දෙශනා කර වදාළා වූ ඉන්ද්‍රියප්‍රත්‍යය ධර්මයන් කෙරෙහි ඇතුලත් වෙති.

ඉන්ද්‍රිය විභාගය යි.

—o—

"බලධර්මය" යනු අනුන්ගේ අධිපතිභාවය නො වලක්වා විරුද්ධ වූ ධර්මයන්ට හිංසා කරන්නා වූ ධර්මයෝ තුමූ බලධර්මයෝ නම් වෙත්. ඒ බලධර්මයෝ වනාහි යුද්ධසේනාවකට අධිපතිවන්නා වූ බලනායකයන් තවදෙනෙකුට බදු උපමා ඇති වෙත්. ඒ බලනායකයෝ වනාහි තමාගේ පක්ෂයෙහි සෙසු බලනායකයන්ගේ ශක්තිය මැඩ නො පවත්වා සතුරන්ගේ ශක්තිය ම මැඩපැවැත්වීමෙහි උත්සාහ කරති. එපරිද්දෙන් ම මේ බලධර්මයෝ තවදෙන වනාහි තමාගේ පක්ෂයෙහි සෙසු බලධර්මයන්ගේ ශක්තිය මැඩ නො පවත්වා අකුසලධර්මයන්ගේ ශක්තියම මැඩ පවත්වන්නාහු වෙති. සඩා, වීරිය, සති, සමාධි, පඤ්ඤා, හිරි, ඔත්තප්ප, යන බලධර්මයෝ සත්දෙන සුවිසි කාමාවචර ශෝභන චිත්තය, සත්විසි මහද්ගත චිත්තය, ලෝකොත්තර සිත් අටය, යන ධර්මයන් හා සම්ප්‍රයුක්තව තමතමාගේ සතුරුධර්මයන් නැසීමෙහි හෙවත් ශ්‍රද්ධාබලය අශ්‍රද්ධාබලය නැසීමට ද, වීරියබලය කුසීතභාවය නැසීමට ද, සතිබලය මුළාසතිය නැසීමට ද, සමාධිබලය විවික්ඛිප්පභාව නැසීමට ද, ප්‍රඥාබලය අවිද්‍යාව නැසීමට ද, හිරිබලය අහිරිකය නැසීමට ද, ඔත්තප්පබලය අනොත්තප්ප බලය නැසීමට ද, තමතමාගේ චිත්තයෙහි යෙදුනා වූ සඳහී වෙදනාදී චෛතසික ධර්මයෝ යොධභටයන් මෙහෙයවන්නෝ උත්සාහ කරන්නාහු වෙති. අහිරික අනොත්තප්ප යන මේ අකුසල පාක්ෂික බලධර්මයෝ දෙදෙන සියලු ද්වේෂාස් චිත්තයෙහි යෙදී කුශලපක්ෂයෙහි වූ ධර්මයන් නැසීමට උත්සාහ කරන්නාහු වෙති.

මේ බලධර්මයන්ගේ විනිශ්චය සී.

"අධිපති ධර්ම" යනු ඊශ්වරභාවයෙන් අධිපති නම් වෙත්. ඉන්ද්‍රියයන්ගේ හා අධිපති ධර්මයන්ගේ ද විශෙෂ කවරෙක්ද? යම් රජෙකුගේ යටත් වාසි අමාත්‍යයෝ සෙසු අමාත්‍යයන්ගේ ශක්තිය මැඩ නොපවත්වා තමතමාගේ කටයුතු කෘත්‍යය සිඩ කරන්නාක් මෙන් ඉන්ද්‍රිය ධර්මයෝ තුමූ අන්‍යයන්ගේ ශක්තිය මැඩ නොපවත්වා තමාගේ අධිපතිභාවය උපුලන්නේ වෙසි. ඊට උදාහරණයක් නම්:—චක්ඛුප්පසාදකලාපයෙහි ඇත්තා වූ චක්ඛු රිඤ්ඤිය ධර්මය ශ්‍රොත්‍රකලාපයෙහි ඇත්තා වූ ශ්‍රොත්‍රෙන්ද්‍රියයාගේ ශක්තිය මැඩ නො පවත්වා තමාගේ කලාපයෙහි ඊශ්වරභාවය සිඩකරෙ සී. අවශෙෂ වූ එක්විසි ඉන්ද්‍රියධර්මයෝ ද මෙසේ තම තමන්ට අයත් වූ ධර්මසමූහයෙහි ඊශ්වරභාවය සිඩකරමින් පවත්නාහුය. අධිපති ධර්මය වනාහි එසේ නොවෙසි. චක්‍රවර්ති රජ

කුගේ ශක්තිය මෙන් අනිත් සියලු ධර්මයන්ගේ අධිපතිභාවය මැඩපවත්වා තමාගේ අධිපතිභාවය ම සිද්ධ කෙරෙයි. ලොකයෙහි සක්විතිරජ පහළ වූ කල්හි සතරවකාදිවයින් වාසි වූ රජදරුවෝ ම ඒ සක්විතිරජහුගේ ආඥාවක්‍රයට යටත් වෙති. එපරිද්දෙන් ම ඥානසම්ප්‍රයුක්තචිත්තයෙහි යෙදුනා වූ ශ්‍රද්ධා, චිත්ත, විරිය, වීමංස යන අධිපතිධර්මයන් සතරදෙනා අතුරෙන් වීමංසා සඞ්ඛ්‍යාත ප්‍රඥාව අධිපතිප්‍රත්‍යය වන්නේ තම් එම චිත්තයෙහි යෙදුනා වූ අවශෙෂ අධිපතිධර්මයන් තුන්දෙනාගේ අධිපතිශක්තිය මැඩ පවත්වා ප්‍රඥාවගේ අධිපතිභාවය ම සිද්ධ කෙරෙයි. එහෙයින් චක්‍රවර්තිරජහුගේ බලය ද, අධිපතිධර්මයාගේ බලය ද, සමානය යි දතයුතු යි.

තවද ඒ ධර්මයන්ගේ අධිපතිභාවය ඉන්ද්‍රිය ධර්මයන්ගේ ඒශ්වරභාවය මෙන් නො වෙයි. ඉන්ද්‍රිය ධර්මයන්ගේ ඒශ්වරභාවය වනාහි එක ම රජෙකුගේ යටත් වාසි ඒ ඒ රාජකෘත්‍යය කරන්නා වූ අමාත්‍යයන් මෙනි. යම් සියි ගම් මුදලිකෙක් පෙම අනිත් ගම්මුදලියෙකුගේ රාජබලය මැඩ නොපවත්වා ම තමා රාජකෘත්‍යය කරන්නේ සි. එපරිද්දෙන් ම ඉන්ද්‍රිය ධර්මයෝ ද එක ම මානසිකචිත්තයෙහි යෙදුනා වූ ඉන්ද්‍රියධර්මයන් පස්දෙන අන්‍යයන්ගේ ඉන්ද්‍රියශක්තිය මැඩ නො පවත්වා තමතමාගේ කෘත්‍යය සිද්ධ කෙරෙති අධිපතිධර්මයෝ වනාහි එසේ නො වෙත්. චක්‍රවර්තිරජහුගේ බලයට සමාන වෙත්. යම් කලෙක සක්විති රජෙක් පහළ වී නම් අවශෙෂ වූ සියලු රජ්ජුන්ගේ අණ මැඩ පවත්වා සක්විති රජහුගේ අණසක පවත්වයි. එපරිද්දෙන් ම මෙ අධිපතිධර්මයා එකෂ චිත්තයෙක්හි යෙදුනු කල්හි එක් ධර්මයක් අධිපති ප්‍රත්‍යය වේ නම් අවශෙෂ ධර්මයෝ තුන්දෙන ඒ ධර්මයට ඔටන්ට ප්‍රත්‍යෝත්පන්නනාමයෙන් සිටිත්. එහෙයින් පඨාන මහාප්‍රකරණයෙහි "ඡන්දාධිපති ඡන්දඤ්ඤෙව උප්පජ්ජන්තා, ධම්මා තඤ්ච සමුට්ඨානානඤ්ච රූපානං අධිපතිපච්චයේන පච්චයෝ" යනාදීන් සතර අධිපතිධර්මයන්ගේ ම අධිපතිභාවය විදැරණලදි. ඒට උදාහරණයක් නම්:—ත්‍රිහෙතුක මිසාකුශල චිත්තයෙහි යෙදෙන්නා වූ අටතිස් චෛතසික ධර්මයන් අතුරෙන් යම් කලෙක ඡන්දය අධිපතිප්‍රත්‍යය වන්නේ නම් අවශෙෂ අධිපති තුන්දෙනා හා සෙසු ධර්මයෝ ද ප්‍රත්‍යෝත්පන්න නම් වෙත්. චිත්ත, විරිය, වීමංසා තුණ ද මෙසේ ම යෙදිය යුතුයි.

මේ අධිපතිධම් විභාගය යි.

—— o ——

"ආහාරය" යනු කබලීකාරාහාරය, ඵස්සාහාරය, මනෝ සඤ්චේතනාහාරය, විඤ්ඤාණාහාරය, යන සතරදෙනා යි. ආහාරය යනු පවත්වන්නාය යන අර්ථ යි. කබලීකාරාහාරය තෙමේ කුමක් පවත්වන්නේ ද යත්? කරජකායය සඞ්ඛ්‍යාත වූ රූප ධර්ම සමූහ තෙම කබලීකාරාහාරය විසින් පවත්වනු ලැබේ යි. අභ්‍යන්තරයෙහි ඇත්තා වූ ආහාරරූපය වනාහි බාහිර වූ කබලීකාරාහාරයෙන් උපස්තම්භ ලැබූ කල්හි ම අභ්‍යන්තර වූ ආහාරය පවත්වන්නේ වෙයි. එහෙයින් මනුෂ්‍ය ලෝකයෙහි උපන්නාවූ සියලු සත්ත්වයෝ තුමූ සතියක් කල් මුලුල්ලෙහි ආහාරෝපච්ඡේදය වී නම් වහා ම මියයන්ත් දිව්‍යලෝකයෙහි හෙවත් තව්තිසාභවනය චාතුම්මහාරාජිකය යන බිඳ්බාපදූසික මනෝපදූසික දෙවියන් ඇත්තා වූ දෙදෙව්ලොව බිඳ්බාපදූසික දෙවියන්ගේ සමානිප්‍රවාසය හෙතුකොටගෙණ ආහාරෝපච්ඡේදය වී නම් වහා ම මරණය වන්නේ යි. "සපර්‍යාහාරය" යනු සුඛ වේදනා දුක්ඛවේදනා උපෙක්ෂාවේදනා සංඛ්‍යාත වූ ත්‍රිවිධවේදනාව පවත්නා ලෙසින් ඵස්සාහාරය යි කියති. "මනෝසඤ්චේතනාහාරය" යනු ලොකොත්තර කුශල් චර්ජිතවූ එකුන්තිස් කුශලාකුශලචේතනාවෝ යි. ඒ කුශලාකුශලචේතනාවෝ තුමූ කාමරූප අරූප සඞ්ඛ්‍යාතවූ භවත්‍රයෙහි ප්‍රතිසන්ධිය ඵලවන හෙයින් මනෝසඤ්චේතනාහාරය යි කියත්. "විඤ්ඤාණාහාරය" යනු ප්‍රතිසන්ධි විඤ්ඤාණ යයි. ඒ ප්‍රතිසන්ධිවිඤ්ඤාණය හා එක්ව යෙදුනා වූ වේදනා, සඤ්ඤා, සඞ්ඛාර සංඛ්‍යාත වූ නාමත්‍රය හා කාය, හෘදය, වස්තු, සංඛ්‍යාත වූ කර්මජරූපකලාපත්‍රය ද ඵලවන හෙයින් පවත්වන හෙයින් විඤ්ඤාණාහාරය යි කියත්. තවද කබලීකාරාහාර සංඛ්‍යාත වූ කබළොන ආහාරපාකයන්ගෙන් හටගන්නා වූ ඕජා සංඛ්‍යාතවූ ආහාරසන්තතිය කොහොත් සත්සියයක් රසනාහර අනුභව යන්නා වූ බත්ආදි ආහාරයන්ගේ තෙලඝනය ආහාරය යි කියත්. ඒ ආහාරය වනාහි ඔජඨමකරූප සංඛ්‍යාත වූ සුඛඛික අවිනිබෝගරූපය පවත්ව යි. ඒ ආහාරරූපය වනාහි ප්‍රතිසන්ධිචිත්තය හා එකක්ෂණිකව පහළ වන්නා වූ කාය-හෘද-වස්තු සංඛ්‍යාත රූපකලාපත්‍රයෙහි අන්තර්ගත වූ ඔජාව අභ්‍යන්තර ආහාරජ රූපය උපදවන්නේ නො වේ ද යත්? ඒ එසේ මැයි. අභ්‍යන්තර වූ ඔජාවට බාහිර වූ ආහාරයෙන් ලැබෙන්නා වූ ඔජාවෙන් රැකුල් ලැබීම හෙතුකොටගෙණ ම අභ්‍යන්තර වූ ඔජාව ද ආහාරජරූපය උපදවයි. එහෙයින් මනුෂ්‍යයෙක් තෙමේ ඔවත් පරිසෙසින් දවසක් පවා බාහිර වූ ආහාරය අනුභව නො කෙළේ වී නම් අභ්‍යන්තර වූ ආහාරය දුර්ලභව මෙන්

සිදලූ ශරීරය ම අකම්මණ්‍යභාවයට පැමිණෙයි. එහෙයින් බාහිර වූ කබලිංකාරාහාරය ඔජාව අවවැනි කොට ඇත්තා වූ රූපකලාපය පවත්වන උපදවන අයුරෙයින් ආහාරය යි කියත්.

"ඵස්සාහාරය" යනු චක්ඛු-සොත-ඝාණ-ජිව්හා, කාය-මනො යන ෂට්වාරයන්ට රූප-ශබ්ද-ගන්ධ-රස-ඵොට්ඨබ්බ ධම්මයන අරමුණු හමුවූ කල්හි ඒ ඒ ආලම්බණය කරා ගොස් වැද ගන්නා ආකාරයෙන් පැවතීම ඵස්සාහාරය යි. ඒ කෙසේ වැද ගන්නේ ද යත්? ඇඹුල්කන්න පුරුෂයෙකුගේ මුඛයදෙස බලා සිටිනා පුරුෂයාගේ මුඛයෙහි ද, කෙල ඉනිම සිඩ වෙයි. උස ඇති වෘක්ෂයක්හුගේ කුඩා ඝාබාවන් කරා යම් පුරුෂයෙක් නගින කල්හි ඒ නැගීම බලමින් බිම සිටිනා පුරුෂයාගේ පාදයෝ වංචල වෙත්ද, එපරිද්දෙන් චක්ඛුර්විඤ්ඤාණචිත්තය ද ඉතා සියුම් වශයෙන් රූපාලම්බණයෙහි වැද ගණී. මෙසේ ආලම්බණ යන් කරා යාම් අයුරෙන් සුඛවේදනා දුඃඛවේදනා උපෙක්ඛාවේදනා සංඛ්‍යාත වූ ත්‍රිවිධවේදනා ඒ සපර්‍යාය විසින් පවත්වනු ලබයි. මේ චක්ඛුසම්ඵස්සාදී සපර්‍යායෝ සඳහන කබලිංකාරාහාරය මෙන් ම සත්ත්වයාගේ ජීවත්වීමට අසහාය වෙත්. ඊට කාරණා කවරේද යත්? යම් මනුෂ්‍යයෙක් තෙමේ චක්ඛුරාදී සදෙරින් රූපාදී සාරමුණු නො ගන්නේ වී නම් ඒ මනුෂ්‍ය තෙමේ වහා ම මියන්නේ යි. එහෙයින් ඵස්සාහාරය ද, මනුෂ්‍යයාගේ ජීවිතයට ප්‍රධාන උපකාරය වේ යි. "මනොසඤ්චේතනාහාරය" යනු දෙලොස් අකුශල චිත්තය සම්ප්‍රයුක්ත වූ චේතනාවදුලසය, අට මහාකුශලචිත්තයෙහි යෙදුනා වූ චේතනාවෝ අටදෙනය, රූපාරූපකුශලචිත්තයන් නවදෙනා හා සම්ප්‍රයුක්ත වූ චේතනාවෝ නවදෙනදූ යි යන මේ එකුන්විස්ස් චේතනාවෝ තුමූ මනොසඤ්චේතනාහාරය නම් වේ. ඒ එසේමැ යි. දෙලොස් අකුශලචේතනාවෝ තුමූ සයුර අපායෙහි ප්‍රතිසන්ධිවිඤ්ඤාණය උපදවත්. අට මහාකුශලචේතනාවෝ තුමූ සුගතිකාමහුම්යෙහි ප්‍රතිසන්ධිවිඤ්ඤාණය උපදවත්. නවමහග්ගතචේතනාවෝ තුමූ රූපි බඹතලයෙහි පටිසන්ධිවිඤ්ඤාණය උපදවත්. මෙසේ පටිසන්ධිවිඤ්ඤාණය උපදවන පවත්වන අයුරෙන් මනොසඤ්චේතනාහාරය යි කියත්. "විඤ්ඤාණාහාරය" යනු කාමාවචරප්‍රතිසන්ධිවිඤ්ඤාණයෝ දසදෙනය, රූපාරූපප්‍රතිසන්ධිවිඤ්ඤාණයෝ නවදෙනය, යන මේ එකුන්විසි ප්‍රතිසන්ධිවිඤ්ඤාණයෝ තුමූ එකවොකාරභවයෙහි රූපමාත්‍රයක්ද, චතුවොකාරභවයෙහි නාමමාත්‍රයක්ද, පඤ්චවොකාරභවයෙහි නාමරූප මාත්‍රයක්ද, උපදවන පවත්

වන අර්ථයෙන් විඤ්ඤාණාහාරය යි කියත්, මෙසේ සතරාහාර ආකාරය දතයුතු යි.

ආහාර විභාගය යි

—o—

මිශ්‍රක සංග්‍රහය නිමි.

—o—

(ප)

බොධිපක්ඛියසඞ්ගහෙ, බොධිපාක්ඛිකසංග්‍රහයෙහි; "එවං විභාගෙ මයා වුච්චති" යනු පාඨශෙෂ යි. සතිපට්ඨානා, සිව වන්හු තුමූ; කායානුපස්සනා සතිපට්ඨානං, කායානුපස්සනා සිව වන්ය; -පෙ- ධම්මානුපස්සනා සතිපට්ඨානං, ධම්මානුපස්සනා සිවවන් ය; ඉති, මෙසේ; චත්තාරෝ ඒවානති, සතරදෙනෙක් වෙත්. සම්මප්පධානා, සම්‍යක්ප්‍රධානයෝ තුමූ; උපපන්නානං, ඝටනත්තා වූ, පාපකානං, ලාමක වූ; අකුසලානං ධම්මානා, අකුශලධර්මයන්ගේ; පහානාය; ප්‍රහාණය පිණිස; වායාමෝ, උත්සාහයද;—අනුපපන්නානං, නූපන්නා වූ;-පෙ-හීයෙය්‍යාතාවා ය, බොහෝ බැව් පිණිස; වායාමෝ, ව්‍යායාමයද; ඉති, මෙසේ; චත්තාරෝ හොනති, සතර දෙනෙක් වෙත්. ඉද්ධිපාදා, ඍර්ද්ධිපාද යෝ තුමූ; ඡන්දිද්ධිපාදෙ, ඡන්දිද්ධිපාදය-පෙ-ජීමංසිද්ධිපාදෙ, වීමංසිද්ධිපාදය හෙවත් ප්‍රඥාවෙතසිකයද ඉති, මෙසේ; චත්තාරෝ හොනති, සතර දෙනෙක්වෙත්. ඉන්ද්‍රියානි, ඉන්ද්‍රිය ධර්මයෝ තුමූ; සද්ධින්ද්‍රියං, ශ්‍රද්ධෙන්ද්‍රියය-පෙ-ඉති, මෙසේ; පව හොනති, පස් දෙනෙක් වෙත්; බලානි, බලධර්මයෝ තුමූ, සද්ධාබලං, ශ්‍රද්ධා බලය,=පෙ=පඤ්ඤාබලං, ප්‍රඥාබලය; ඉති, මෙසේ; පව හොනති, පස්දෙනෙක් වෙත්.=බොජ්ඣඞ්ගා, බොධ්‍යඞ්ගයෝ තුමූ; ෂෝ හොත් මාගීඥානබොධියාගේ අඞ්ගයෝ තුමූ; සතිසම්බොජ්ඣඞ්ගා, සමෘති සම්බොධ්‍යඞ්ගය-පෙ- උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගා, උපෙක්ෂාසම්බොධ්‍යඞ්ගය; ඉති, මෙසේ; සත්ත හොනති, සත්දෙනෙක් වෙත්. මග්ගඞ්ගානි, මාගීඞ්ගයෝ තුමූ; සම්මාදිට්ඨි, සම්‍යක්දෘෂ්ටි මාගීඞ්ගය;-පෙ-සම්මාසමාධි, සම්‍යක් සමාධිමාගීඞ්ගය; ඉති, මෙසේ; අට හොනති, අවදෙනෙක් වෙත්. පන, අවීනාභාවයක් කියමි:-එවං, මේ බොධිපාක්ඛිකසංග්‍රහයෙහි; එකොව සම්මාසති, එකම සම්‍යක්සමෘතිය; චත්තාරෝ සතිපට්ඨානානි, සතරසිවටන් හුය යි; පවුච්චති, ප්‍රභෙද වශයෙන් කියනු ලැබේ නම්, එපරිද්දෙන්; එකොව සම්මාවායාමෝ, එකම සම්‍යක්ව්‍යායාමය,

චිත්තාරෝ සම්මප්පධානාති ච, සම්‍යක්ප්‍රධානයෝ සතරදෙනදැයි; පවුවවති. ප්‍රශ්නය විශ්‍රජනන් කියනු ලැබේ.

එතෙ, ඒ බොධිපාක්ෂිකධර්මයෝ තුමූ; සභාවතො, තම තමාගේ සවභාව වශයෙන්; ජානෙ ච, ඥානසෛතසිකයෙක් ද; චිත්තච, සිත ද; උපෙකඛා ච, තත්‍රමධ්‍යස්ථතාසෛතසිකයෙක් ද; සඛා ච, ශ්‍රද්ධාවය; පසාදි, ප්‍රශ්‍රබ්ධිය; පිතියො, ප්‍රීතිය, යන සෛතසිකයෝ ද; සම්මාදිට්ඨි ච, ප්‍රඥාසෛතසිකයෙක්ද; සඛ්‍ය පෙපා ච, චිත්තකීසෛතසිකයෙක් ද; වායාමෝ ච, වීර්‍ය්‍ය සෛතසිකයෙක් ද; විරතිත්තයච, විරතිසෛතසිකයන් තුන්දෙනාගේ සමූදයෙක් ද; සම්මාසති ච, සතිසෛතසිකයෙක් ද; සම්මාසමාධි ච, එකාග්‍රතාසෛතසිකයෙක් ද; ඉති, මෙසේ; චුද්දස හොහති, තුදුස්දෙනෙක් වෙත්. පහෙදෙන, ප්‍රභෙදයෙන්; සත්තතිංස හොනති, සත්තිස්දෙනෙක් වෙත්. ඉති, මෙසේ; තත්‍ර ඒ බොධිපාක්ෂික සංග්‍රහයෙහි, සත්තධා, සත්පරිද්දෙදකින්; සඛහො හොති, සංග්‍රහය වෙයි.

සඛකපප-පස්සඛි ච, චිතකී සෛතසිකය හා ප්‍රශ්‍රබ්ධිසෛත සිකය ද; පිතුපෙකඛා ච, ප්‍රීතිසෛතසිකය හා තත්‍රමධ්‍යස්ථතා සෛතසිකයෙක් ද; ඥානෙ ච, ඥානසෛතසිකයෙක්ද; චිත්තච, ලොකොත්තරචිත්තයෙක් ද; විරතිත්තයච, විරතිසෛතසික යන් තුන්දෙනාගේ සමූදයෙක් ද; ඉති, මෙසේ; නව, ධර්මයන් නවදෙනෙක් තුමූ; එකඛානා, එකස්ථානිකධර්මයෝ නම් වෙත්. හෙවත් එකෙකි ස්ථානයක් ඇත්තා වූ ධර්මයෝ නම් වෙත්. විරි යං, වීර්‍ය්‍යසෛතසිකය තෙමේ; නවඛානා, ස්ථානනවයක් ඇත්තේ වෙයි. සති, සමෘතිසෛතසිකය තෙමේ; අඨඛානා, අෂ්ටස්ථානයක් ඇත්තේ වෙයි. සමාධි, එකාග්‍රතාසෛතසිකය තෙමේ; චතුඛානා, සතරස්ථානයක් ඇත්තේ වෙයි. පඤ්ඤා, ප්‍රඥා තොමෝ; පඛ ඛානා, පඤ්චස්ථානයක් ඇත්තී වෙයි. සඛා, ශ්‍රද්ධා තොමෝ; දුඛානා, ස්ථානවයක් ඇත්තී වෙයි. ඉති, මෙසේ; උත්තම සත්තතිංසඛම්මානං, උතුම්වූ සත්තිස් බොධිපාක්ෂිකධර්මයන්ගේ; පවරෙ, උතුම් වූ; එසො විහාරො, මේ විහාරය තෙම; මයා වුත්තො, මා විසින් කියන ලදී

ලොකුත්තරෙ, ලොකොත්තරචිත්තයෙහි; සඛ්ඛ, සියලු බොධිපාක්ෂික ධර්මයෝ තුමූ; හොනති, වෙත්. සඛකපපපීතියො, චිතකීප්‍රීත්‍යසෛතසිකයෝ තුමූ; එා, සම්‍යක්ර ලොකොත්තර චිත්ත යෙක්හි; හෙවත් විසල්‍රයෙන්; න හොනති, නො වෙත්. ලොකි යෙපි, ලෞකිකකුශලචිත්තයෙහි ද; ඡබ්බිසුද්ධිපවත්තියං, ෂට්

විශුද්ධින්ගේ හටගැණීමක් ඇති කල්හි; ඤායයොගං, සුදුසු පරිදි දෙන්; මොහොතකි, වෙත්.

—o—

භාවිතය.

බොධිපාක්ෂිකසංග්‍රහයෙහි සතිපට්ඨානය-සම්‍යක්ප්‍රධානය-ඍර්ධිපාදය—ඉන්ද්‍රිය—බලය—බොජ්ඣඞ්ගය—මාර්ගාඞ්ගය යන මොවුන්ගේ වශයෙන් සත්වැදෑරුම් වේ. ඔවුන් අතුරෙන් සතිපට්ඨානය සතරවැදෑරුම්වේ. කුමක්හෙයින් සතරවැදෑරුම්වන්නේ ද යත්? අවබෝධරූපයන් අතුරෙන් එකෙකී රූපය අනිත්‍යාදී වශයෙන් නැවත නැවත දැකීම හෙවත් සිහි එලවීම කායානුපස්සනා සතිපට්ඨාන නම් වේ. වෙදනානුපස්සනා සතිපට්ඨානය යනු එකාසූවක් ලෞකිකවිත්තයෙහි යෙදුනා වූ එකාසූවක් වේදනාවන් අනිත්‍යදුඃඛඅනාත්ම වශයෙන් සිහි එලවීම වෙදනානුපස්සනා සතිපට්ඨාන නම් වේ. චිත්තානුපස්සනා සතිපට්ඨානය යනු එකාසූවක් ලෞකික චිත්තය අනිත්‍යාදි වශයෙන් නැවත නැවත බැලීම හෙවත් සිහි එලවීම චිත්තානුපස්සනා සතිපට්ඨාන නම් වේ. ධම්මානුපස්සනා සතිපට්ඨානය යනු එකාසූවක් ලෞකික චිත්තයෙහි යෙදුනා වූ එකාසූවක් ලෞකිකසංඥාවෝය-එම එකාසූවක් ලෞකිකචිත්තයෙහි යෙදුන සඳහීදී එක්පණයක් චෛතසිකයෝ ද, යන දෙපණස් ධර්මයන් අනිත්‍යාදී වශයෙන් නැවත නැවත බැලීම හෙවත් සිහි එලවීම ධම්මානුපස්සනා සතිපට්ඨාන නම් වේ. එහෙයින් සංක්ෂේපයෙන් සතර සතිපට්ඨානය යනු ලොකොත්තරමාර්ග සිත්සතරය—ඵල සිත්සතරය—නිර්වාණය, යන නවලොකොත්තරධර්මයන් හැර අවශෙෂ වූ තෙළොමක ධර්මයන් අනිත්‍යාදි වශයෙන් මෙනෙහි කොට සිහි එලවීමයි. එහෙයින් තෙළොමකධර්මය ආලම්බණ නම් වෙයි. සමෘතිවෙතසිකය ආලම්බණික නම් වෙයි. මෙසේ මේ සතර සතිපට්ඨාන ධර්මය වැඩීම හෙතුකොටගෙණ ධ්‍රුවසංඥාවය-සුඛසංඥාවය-ආත්මසංඥාවය යන සතර සංඥාවෝ මේ සතර සතිපට්ඨාන ධර්මය හෙතුකොටගෙණ ප්‍රහීණවෙත්. එහෙයින් සංක්ෂේපයෙන් නවලොකොත්තරධර්මය හැර අභිධර්මපිටකප්‍රකරණයෙහි වදාළාවූ සියලු ධර්මය මේ සතර සතිපට්ඨානයෙහි ඇතුලත්වෙයි මාර්ගඵල ලබන යොගාවචරයා විසින් මේ සඛඳහිකවූ සතිපට්ඨානධර්මය සත් හවුරුද්දක පටන් සතියක් දක්වා භාවනාවෙහි පුරුදු කටයුතු යි.

මේ සතිපට්ඨානයෙහි සංක්ෂේප විභාගය යි.

——o§o——

"සතර සම්‍යක් ප්‍රධානය" යනු එකම වීර්‍යචෛතසිකය අර මුණු වශයෙන් සතරාකාරයකින් පවතී. ඒ කෙසේ පවත්නේ ද යත්? තමාගේ සතන්හි පවත්නා අකුශලධර්මයන් ප්‍රහාණය කිරීම පිණිස උත්සාහ කිරීම එක් සම්‍යක්ප්‍රධානයෙකි. තමාගේ සන්තානයෙහි නූපන් අකුශලධර්මයන් නූපදනා පිණිස උත්සාහ කිරීම එක් සම්‍යක්ප්‍රධානයෙකි. තමාගේ සන්තානයෙහි නූපන් කුශලධර්මයන් උපදවනු පිණිස උත්සාහ වැඩීම එක් සම්‍යක්ප්‍රධානයෙකි. තමාගේ සන්තානයෙහි උපන් කුශලධර්මයන් අභිවෘද්ධියට පමුණුවනු පිණිස උත්සාහ වැඩීම එක් සම්‍යක් ප්‍රධානයෙකි. එසේ වීර්‍යචෛතසිකය වනාහි ආලම්බණ ප්‍රභෙදයෙන් සතරාකාර වන හෙයින් සතරසම්‍යක් ප්‍රධානය යි ව්‍යවහාර කෙරෙති. මෙහි වීර්‍යචෛතසිකය ආලම්බණීය නම් වෙයි උපන් අකුසල්ය-නූපන් අකුසල්ය-නූපන් කුසල් ඉපදවීමය-උපන් කුශල් වැඩි කිරීමය යන සතරාකාරධර්මයන් ඇති බැවින් ඒ ඒ ධර්මය අරමුණු කිරීම වශයෙන් පවත්නා හෙයින් සතරසම්‍යක්ප්‍රධානයෝ ආලම්බණ නම් වෙත්. මේ විර්‍යය චෛතසිකය ලෞකික චිත්තයෙහි යෙදෙන කල්හි එකම විරිය චෛතසිකය යි හිණීමට යේ. ලොකොත්තරචිත්තයෙහි යෙදෙන කල්හිම උපන් අකුශල් නැසීමය-නූපන් අකුශල් නූපදවීමය—නූපන් කුශල් ඉපදවීමය—උපන් කුශල් දියුණු කිරීමය, යන සතරාකාර කෘත්‍යයක් කරණ හෙයින් රාජ කෘත්‍යසතරක නියුක්ත වූ එකම රාජාමාත්‍යයෙක් මෙන් සතර කෘත්‍යයක් සිදු කරයි. එව කී සතිපට්ඨාන ධර්මය ද ලෞකික චිත්තයෙහි යෙදෙන කල්හි එකම සති චෛතසිකය යයි කියත්. ලොකොත්තර චිත්තයෙහි යෙදෙන කල්හි සතර කෘත්‍යයක් සිදුකරණ හෙයින් හෙවත් සතර ධර්මයක් අරමුණු කරණ හෙයින් සතර සතිපට්ඨානයෝ යයි කියත්. රාජාමාත්‍ය උපමාව සතිපට්ඨානයෙහි ද යෙදේ.

සතර සම්‍යක් ප්‍රධානය යි.

"සතර සෘද්ධිපාදයන්" අනුරෙන් ලොකොත්තරචිත්තයෙහි යෙදුනාවූ ඡන්දචෛතසිකය අදහස සමුඛකරණාධිපතියෙන් ඡන්දිද්ධිපාදයයි කියනි, විරිසිද්ධිපාදය යනු ගවකි සම්‍යක්ප්‍රධාන වීර්‍යය යම අදහස සමුඛකරණ අධිපතියෙන් විරිසිද්ධිපාදයයි ද කියත්. චිත්තිද්ධිපාදය යනු ලොකොත්තර චිත්තය යි. ඒ ලොකොත්තර චිත්තය වනාහි අදහස සමුඛකරණ අධිපතියෙන් චිත්තිද්ධිපාදයයි කියත්. වීමංසිද්ධිපාදය යනු ලොකොත්තර චිත්තයෙහි යෙදුනාවූ ප්‍රඥා චෛතසිකය යයි. ඒ ප්‍රඥා චෛතසිකය වනාහි අදහස සමුඛ

කරණ අවියෙන් විමැසිඩිපාද යයි කියත්. මේ සතරදෙන ලොකොත්තර චිත්තයෙහිම යෙදුන තල්හි සෘඩිපාදයෝ යයි කියත්.

සතර සෘඩිපාදය යි.

"පඤ්චෙන්ද්‍රිය"යනු ලොකොත්තර චිත්තයෙහි යෙදුනාවූ ශ්‍රද්ධා චෛතසිකය—වීර්‍යය්‍යචෛතසිකය—සතිචෛතසිකය— එකාග්‍රතා සඞ්ඛ්‍යාතවූ සමාධිචෛතසිකය—ප්‍රඥාචෛතසිකය, යන මේ ධර්මයෝ පස්දෙන ලොකොත්තර චිත්තයෙහි තම තමාගේ කෘත්‍ය යෙහි ඉන්ද්‍රියභාවයෙන් හෙවත් අධිපතිභාවයෙන් පවත්නා හෙයින් ඉන්ද්‍රිය ධර්මයෝ යයි කියත්. ඊට උපමාවක් මෙසේයි:-සිවු පුත්‍රයන් සතරදෙනෙකු සමඟ රාජ්‍යය ආරක්‍ෂාකරන රජෙක් තෙම රාත්‍රි දවස්හි නගරයෙහි තොරතුරු දැනගන්නා පිණිස නගර සංවරණයෙහි යෙදෙත්නේයි. එසේ නගර සංවරණය කරණ සමයෙහි පළමුවන වර පළමුවන සිවුපුත්‍රයාගේ ගෙට පස්දෙනම පැමිණෙති. ඉක්බිති ඒ ගෙට සවාටිවූ සිවුපුත්‍ර තෙමේ අවශෙෂ සිවුපුත්‍රයන් තුන්දෙන ඇතුළු මහරජගටද සුවද විලවුන් ඔත්බුලත් ආදියෙන් සංග්‍රහකරවයි. අවශෙෂ සතර දෙන තුෂ්ණීම්භූතව සිටිති. ඉක්බිති දෙවෙනි වර දෙවෙනි සිවු පුත්‍රයාගේ ගෙට පස්දෙනම පැමිණෙති. එසේ පැමිණි කල්හි ඒ ගෙට සවාම්වූ සිවුපුත්‍ර තෙමේ අවශෙෂ සතරදෙනහට සුවඳ විලවුන් ඔත් බුලත් ආදියෙන් සංග්‍රහකරවයි. අවශෙෂ සතරදෙන තුෂ්ණීම්භූතව සිටිති. ඉක්බිති තුන්වෙනි වර තුන්වෙනි සිවු පුත්‍රයාගේ ගෙට පස්දෙනම පැමිණෙයි. එසේ පැමිණි කල්හිද ඒ ගෙට සවාම්වූ සිවුපුත්‍ර තෙමේ අවශෙෂ සතරදෙනහට සුවඳ විලවුන් ආදියෙන් සංග්‍රහ කරවයි. ඉක්බිති එයින් නැගිට සතර වෙනි සිවුපුත්‍රයාගේ ගෙට පස්දෙනම පැමිණෙයි, එකල්හි උපරමේන්ම ඒ ගෙට සවාම්වූ සිවුපුත්‍ර තෙමේ අවශෙෂ සතර දෙනහට සුවඳ විලවුන් ආදියෙන් සංග්‍රහ කරවයි. ඉක්බිති පස්වන වාරයෙහි සිවුපුත්‍රයන් සතරදෙන සමඟ රජගෙට ආ කල රජ තෙමේ සිවුපුත්‍රයන්ට වඩා සියඇක්ගුණයකින් අධිකවූ සත්කාර සම්මානයන් සිවුපුත්‍රයන් සතරදෙනාට කරවන්නේ වෙයි. එපරිද්දෙන්ම ලොකොත්තර චිත්තයෙහි යෙදුනාවූ ශ්‍රද්ධා වීර්‍ය්‍ය සතිසමාධි යන චෛතසිකයෝ සතරදෙන තමතමන්ට අයත් වූ ඒ ඒ කෘත්‍යයන් මනාකොට නිෂ්කරවති. ප්‍රඥා චෛතසිකය නමැති මහරජෙකු මෙන් සියලු කටයුතු ඉතිරිවිතතයෙහි මනාසේ සිඳහරවයි. මේ උපමාව වඤ්ඣ ලිනී අවුවාවේ හා පටිසම්භිදාමාගී අවුවායෙහි ද ආයේය සි දතයුතුයි.

පඤ්චෙන්ද්‍රිය විභාගය යි.

ඉන්ද්‍රියයන්ට අනතුරුව සඞ්ඛබල-විරියබල-සතිබල-සමාධි බල-පඤ්ඤාබල වශයෙන් ඉන්ද්‍රියයන්ට කී ධම්මයෝම බලධම් නම් වෙත්. ඒ බලධම්යන්ගේ සභාව නම්:- අන්‍යයන්ගේ අධිපති භාවය නො වලක්වා පඤ්චනීවරණාදී සතුරු පාපධම්යන්ට හිංසාකරණ අර්ථයෙන් බලධම් නම් වෙයි. යම් දෙසතහක් යුඞ්කරන්නාවූ භූමිසෙහි බලනායකයෝ තුමූ තමතමන්ගේ අධිපතිභාවසෙහි පවත්වන යොධභටයන් මෙහෙයා සතුරුපක්ෂය විනාශ කරන්නාක් මෙන් සෝවාන් ආදී සතරමාගීචිත්තසෙහි යෙදුනු බලධම්යෝ ඔවුනොවුන්ගේ බලය මැඬ නො පවත්වාම සතුරු පාපධම්යන් නසත්. ශ්‍රද්ධා බලය විනාසී සෙසු සතර බලයන්ගේ ශක්තිය මැඬ නොපවත්වාම රාග ද්වේෂ මෝහාදී පාපධම්යන්ට හිංසාකරයි. අවශෙෂවූ සතරබල ධම්මයෝද එපරිදි දෙන්තම යම්හට සතුරුවූ පාපධම්යන්ගේ ශක්තිය විනාශ කෙරෙත්. එක්දහස් පන්සියයක් කෙලෂයන්හෙන් පිරිවරණ ලද්දාවූ පඤ්චනීවරණ ධම් නැමති සතුරන් පස්දෙනාගේ බලය මේ ලොකොත්තර චිත්ත නැමති ශූඞ්ඛභූමියෙහි සිට ශ්‍රද්ධාදී බලනායකයෝ පස්දෙනා ඒ පඤ්චනීවරණ ප්‍රධානවූ එක්දහස් පන්සියයක් නොලෙස් නැමැති සතුරන් හාත්පසින් විනාශ කෙරෙති.

පඤ්චබලය යි.

සප්ත බොඞ්ඣඞ්ගයන් අතුරෙන් "සතිසම්බොජ්ඣඞ්ගය" යනු සතිචෙතසිකයයි. "විරියසම්බොජ්ඣඞ්ගය" යනු වීර්‍යචෙතසිකය යි. "ධම්මවිචයසම්බොජ්ඣඞ්ගය" යනු ප්‍රඥාවයි. පීතිසම්බොජ්ඣඞ්ගය" යනු ප්‍රීතිචෙතසිකයයි. "පස්සද්ධිසම්බොජ්ඣඞ්ගය" යනු චෙතසික විභාගයෙහි කියන ලද්දාවූ කායපස්සද්ධි චිත්තපස්සද්ධි යන ධම්යෝ දෙදෙන එක්ව කෙලෙසුදරථය විනොදනය කරණ හෙයින් පස්සද්ධිසම්බොජ්ඣඞ්ගයයි කියත්. "සමාධිසම්බොජ්ඣඞ්ගය" යනු ලෞකොත්තර චිත්තයෙහි යෙදුනාවූ එකාග්‍රතා චෛතසික යයි. "උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගය" යනු තත්‍රමජ්ඣත්තතා චෛතසිකයයි. මේ ධම්යෝ සත්දෙන කුමක් හෙයින් සම්බොඣඞ්ඝ නම් වෙත් ද යත්? බොධි වුච්චති මග්ගඤාණං යනු කී බැවින් බොධ්‍ය යනු මාර්ගඥාන යයි. ඒ බොධි සඞ්ඛ්‍යාතවූ මාර්ගඥානයාගේ අවයව වූ ධම්යෝ සත්දෙන බොඣඞ්ඝ නම් වෙත්. "බොධියා බොධිස්ස වා අඞ්ගානි බොජ්ඣඞ්ගා" සි" නිරුක්ත බැවින් බොධි සඞ්ඛ්‍යාතවූ මාර්ගඥානයාගේ හෝ අඞ්ගයෝ තුවූ බොඣඞ්ඝ නම් වෙත්.

බොඣඞ්ඝ විභාගය යි.

"සම්මාදිට්ඨි" යනු ධර්මයන් අවිපරීතාකාරයෙන් දැකීම සිඳ කරණ හෙයින් මාර්ගඥානයෙහි යෙදුනා වූ ප්‍රඥා චෛතසිකය සම්මාදිට්ඨි මාර්ගාඞ්ගය යි කියත්. "සම්මාසඞ්කප්පය" යනු මාර්ග චිත්තයෙහි යෙදුනා වූ චිතකීචෛතසිකය යි. ඒ චිතකීචෛතසිකය ලෞකිකාත්තරචිත්තයෙහි යෙදුනු කල්හි සම්මාසඞ්කප්ප මාර්ගාඞ්ගය යි කියත්. සම්මාවාචා-සම්මාකම්මන්ත-සම්මාආජීව යන විරතිහු තුන්දෙන මාර්ගචිත්තයෙහි යෙදී සියලු දුශ්චරිත දුරු ජීවයන්ගෙන් අනුත්පාදනිරෝධයෙන් වැලැක්ම සිඳ කරණ හෙයින් සම්මාවාචා මාර්ගාඞ්ගය සම්මාකම්මන්තමාර්ගාඞ්ගය, සම්මා ආජීව මාර්ගාඞ්ගය යි කියත්. සම්මාවායාම-සම්මාසති-සම්මාසමාධි යන මාර්ගාඞ්ගයෝ තුන්දෙන ද ලෞකොත්තරචිත්තයෙහි යෙදුනා වූ වීරියචෛතසිකය, සතිචෛතසිකය, එකාග්ගතාචෛතසිකය යන මේධර්මයෝ තුන්දෙන සම්මාවායාම මාර්ගාඞ්ගය, සම්මා සති මාර්ගාඞ්ගය, සම්මාසමාධි මාර්ගාඞ්ගය යි කියත්. මේ ධර්මයෝ අවදෙන කුමක් හෙයින් මාර්ගාඞ්ග නම් වෙත් ද යත්? මහත්වූ දුඃඛස්කන්ධයක් එක් කොට බැඳ ගන්නා ලද පසුර සාගරයෙන් එතර වීමට උපකාර වන්නාක් මෙන් මේ මාර්ගාඞ්ගයෝ අවදෙන සංසාරසාගරයෙන් එතර වීමට කාරණා වන හෙයින් නිබ්බාණ මාර්ගයෙහි අඞ්ගයෝ ය, කාරණයෝ ය, යන අර්ථයෙන් මාර්ගාඞ්ග යෝ ය යි කියත්.

මේ සත්තිස් බොධිපාක්ඛිකධර්මයෝ වනාහි එකානතයෙන් ලෞකොත්තර චිත්තයෙහි ම ලැබත්. එවන් වෙන් වශයෙන් සත්ත්වයක් වන්නාහු නමුදු අඞ්ගිතග්‍රහණන්‍යාය වශයෙන් තොයෙක් ප්‍රභෙද වන්නා වූ ධර්මයෝ එකඑකකයින් සංග්‍රහ කොට ගත්කල්හි තුදුස් ධර්මකෙනෙක් ද වෙනස් වෙනස් ජාති වශයෙන් ජාති සතෙක් ද වෙත්. ඒ කවර ජාති සතක්ද යත්? සතිපඨ, ඣා, සම්‍යක්ප්‍රධාන, ඍර්ද්ධිපාද, ඉන්ද්‍රිය, බල, බොජ්ඣඞ්ග, මාර්ගාඞ්ග යන මොවුන්ගේ වශයෙන් ජාති සතෙක් වෙත්.

ඒ ඒ ධර්මයන් කෙරෙහි සම්මාසඞ්කප්පය, පස්සද්ධිසම්බොජ්ඣඞ්ගය, පීතිසම්බොජ්ඣඞ්ගය, උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගය, ඡන්දිද්ධිපාදය, චිත්තිද්ධිපාදය, සම්මාවාචාවිරතිය, සම්මාකම්මන්තවිරතිය, සම්මාආජීවවිරතිය, යන මේධර්මයෝ තවදෙන එකකෘත්‍යය හා එකසථානික ධර්මයෝ නම් වෙත්. වීරියචෛතසිකය සතර සම්‍යක්ප්‍රධාන වශයෙන් සතර කෘත්‍යයක් හා විරිසිද්ධිපාදය, විරිධින්ද්‍රිය, විරිඅබලය, විරියසම්බොජ්ඣඞ්ග, සම්මාවායාම මාර්ගාඞ්ග යනකෘත්‍යතවයක්සිඳ කරණහෙයින් නවකෘත්‍ය-නවසථානිකධර්ම

යක් නම් වෙයි. සමාධිසම්බොජ්ඣඞ්ගය, සම්මාසමාධි මාග්ගාඞ්ගය, යන අවස්ථාවෙක්හි වශ යෙයින් අෂ්ටස්ථානික-අෂ්ටකෘත්‍යයක් ඇති ධර්ම්‍ය නම් වෙයි. එකාග්‍රතාචෛතසික තෙමේ සමාධීන්ද්‍රිය, සමාධිබලය, සමාධිසම්බොජ්ඣඞ්ගය, සම්මාසමාධි මාග්ගාඞ්ගය, යන සතරවැනෙක්හි පවත්නා හෙයින් චතුස්ථානික-චතුෂ්කෘත්‍ය ඇති ධර්ම්‍ය නම් වෙයි, ප්‍රඥාචෛතසික තෙමේ විමංසිද්ධිපාදය, ප්‍රඥාබලය, ප්‍රඥෙන්ද්‍රියය, ධම්මවිචයසම්බොජ්ඣඞ්ගය, සම්මාදිට්ඨි මාග්ගාඞ්ගය යන පස් නැනක පවත්නා හෙයින් පඤ්චස්ථානික-පඤ්චකෘත්‍ය ඇති ධර්ම්‍ය නම් වෙයි. ශ්‍රද්ධාචෛතසික තෙමේ සද්ධින්ද්‍රිය සද්ධාබලය, යන දෙතැනෙක්හි පවත්නා හෙයින් ද්විස්ථානික-ද්විකෘත්‍ය ඇති ධර්ම්‍ය නම් වෙයි.

ඒකස්ථානිකධර්ම්‍යන්ගේ කෘත්‍ය නවය ද, නව ස්ථානිකධර්ම්‍යාගේ නවකෘත්‍යය ද, අෂ්ටස්ථානික ධර්ම්‍යාගේ කෘත්‍ය අට ද, පඤ්චස්ථානිකධර්ම්‍යාගේ කෘත්‍ය පස ද, චතුස්ථානිකධර්ම්‍යාගේ කෘත්‍ය සතර ද, ද්විස්ථානිකධර්ම්‍යාගේ කෘත්‍යවය ද, යන මෙතෙක් ධර්ම්‍යන් පිඬු කළ කල්හි සත්තිස් බොධිපාක්ෂිකධර්ම්‍යෝ ය යි කියත්.

ඒ සත්තිස් බොධිපාක්ෂිකධර්ම්‍යෝ තුමූ එකානතෙයන් ලොකොත්තරචිත්තයෙහි ලැබෙත්. ඒකෙසේ ලැබෙත් ද යත්? ශුෂ්ක විදර්ශීක ආර්ය්‍යයන් වහන්සේට හා ප්‍රථමධ්‍යානය පාදකාදි වශයෙන් විදර්ශීනා වඩා මාර්ගඵල ලබන්නා වූ සවිථානික ආර්ය්‍යයාහට ද සත්තිස් බොධිපාක්ෂිකධර්ම්‍යෝ ම අනූනාධිකව ලැබෙත්. එතකුදුවුවත් විතියඣ්‍යාන තෘතියඣ්‍යාන චතුර්ථඣ්‍යාන යන අවිතක්කධ්‍යානයන් පාදකාදී වශයෙන් භාවනා වඩා මාර්ගඵල ලබන්නා වූ ආර්ය්‍යයාහට සවිතක්කසවිචාර මාර්ග විරහිත වූ බොධිපාක්ෂික ධර්ම් සත්විස්දෙනෙක් ම ලැබෙත්. එපරිදිදෙන් ම නිස්ප්‍රීතික වූ රූපාවචරපඤ්චමධ්‍යානය හෝ අරූපධ්‍යාන සතරින් මූල අරූපධ්‍යානත්‍රය හෝ විදර්ශීනා වඩා මාර්ගඵල ලබන්නා වූ ආර්ය්‍යයන්ට සම්මාසඞ්කප්ප ප්‍රීතිසම්බොඣ්‍යාඞ්ග සංඛ්‍යාත වූ බොධිපාක්ෂිකධර්ම් දෙකින් විරහිතවූ පන්තිස් ධර්ම්යෙනෙක්ම ලැබෙත්.

මේ සත්තිස් බොධිපාක්ෂිකධර්ම්‍යන් අතුරෙන් සතිපඨ්ඨානාදි වූ යම් කිසි ධර්ම්‍යක් සීලවිසුද්ධි, චිත්තවිසුද්ධි, දිට්ඨිවිසුද්ධි, කඞ්ඛාවිතරණවිසුද්ධි, මග්ගාමග්ගඤාණදස්සනවිසුද්ධි, පටිපදාඤාණදස්සනවිසුද්ධි සඞ්ඛ්‍යාත වූ ලෞකික ඡවිසුද්ධීන් පුරුදු කරන්නා වූ

යොගාවචරයාගට ඒ ෂට්විඤ්ඤාණ වශයෙන් උපදනා කාමාවචර කුශලචිත්තයෙහි එක එකක් ම ලැබිය හැක්කේ යි. එහෙයින්:—

"සබ්බ ලොකුත්තරෙ හොන්ති නවාසඞ්ඛතපපත්තියො
ලොකියෙපි ඡළඞ්ගොගං ජබ්බිඤ්ඤාපපවත්තියං"

යනු අට්ඨවාචරින් විසින් කියන ලදී.

සත්තිස් බොධිපාක්ෂික ධර්ම විභාගය යි.

(ප)

සබ්බසුඛහෙ, සතිසංග්‍රහයෙහි; එවං විභාගෙ මයා වුච්චතෙ, යනු අව්‍යාහාර යි. ඛන්ධා, සඤ්ඤෝ තුමූ; රූපක්ඛන්ධො, රූපසඤ්ඤා; වෙදනාක්ඛන්ධො, වෙදනාසඤ්ඤා; සඤ්ඤක්ඛන්ධො, සංඥාසඤ්ඤා; සංඛාරක්ඛන්ධො, සංස්කාරසඤ්ඤා; විඤ්ඤාණක්ඛන්ධො, විඥානසඤ්ඤා: ඉති, මෙසේ; පඤ්ච හොන්ති, සඤ්ඤෝ පස්දෙනෙක් වෙත්. උපාදානක්ඛන්ධා, කාමූපාදානාදී සතර උපාදානයන්ට අරමුණු වූ සඤ්ඤෝ තුමූ; රූපූපාදානක්ඛන්ධො, රූපූපාදානසඤ්ඤා ද; වෙදනූපාදානක්ඛන්ධො, වෙදනූපාදානසඤ්ඤා ද; සඤ්ඤූපාදානක්ඛන්ධො, සඤ්ඤූපාදානසඤ්ඤා ද; සඞ්ඛාරූපාදානක්ඛන්ධො, සඞ්ඛාරූපාදානසඤ්ඤා ද; විඤ්ඤාණූපාදානක්ඛන්ධො, විඤ්ඤාණූපාදානසඤ්ඤා ද; ඉති, මෙසේ, පඤ්ච හොන්ති උපාදානසඤ්ඤෝ පස්දෙනෙක් වෙත්. ආයතනානි, ආයතනයෝ තුමූ; චක්ඛායතනං, චක්ඛායතනසඤ්ඤා ද;-පෙ-ධම්මායතනං, ධම්මායතනසඤ්ඤා ද, ඉති, මෙසේ; වාදස හොන්ති, දෙළෝස්දෙනෙක් වෙත්. ධාතූ ඨා, ධාතුහු තුමූ; චක්ඛුධාතු; චක්ෂුප්‍රශාද සඞ්ඛ්‍යාත වූ ධාතුව ද; සොතධාතු, ශ්‍රෝත්‍රප්‍රශාද සඞ්ඛ්‍යාත වූ ධාතුව ද; ඝාණධාතු, ඝ්‍රාණප්‍රශාද සංඛ්‍යාත වූ ධාතුව ද; ජිව්හාධාතු, ජිහ්වාප්‍රශාද සංඛ්‍යාත වූ ධාතුව ද; කායධාතු, කායප්‍රශාද සංඛ්‍යාත වූ ධාතුව ද; රූපධාතු, වර්ණායතන සංඛ්‍යාත වූ රූපධාතුව ද; සද්දධාතු, ශබ්දධාතුව ද; ගන්ධධාතු, ගන්ධාලම්බන සංඛ්‍යාත වූ ගන්ධධාතුව ද; රසධාතු රසාලම්බන සඞ්ඛ්‍යාත වූ රසධාතුව ද; ඵොට්ඨබ්බධාතු, ඵොට්ඨබ්බ ආපොධාතුව ජ්ජිත හුතත්‍රය සංඛ්‍යාත වූ සප්තධාතුව ද; චක්ඛුවිඤ්ඤාණධාතු, කුශලාකුශලවිපාක සංඛ්‍යාත චක්ෂුර්විඥානධාතුව ද; සොතවිඤ්ඤාණධාතු, එසේ ම ශ්‍රෝත්‍රවිඥානයුගල සංඛ්‍යාත වූ ශ්‍රෝත්‍රවිඥානධාතුව ද; ඝාණවිඤ්ඤාණධාතු, එසේම ඝ්‍රාණවිඥානධාතුවය සංඛ්‍යාත වූ ඝ්‍රාණවිඥානධාතුව ද; ජිව්හාවිඤ්ඤාණධාතු, එසේ ම ජිව්හාවිඤ්ඤාණයුගලය ද; කායවිඤ්ඤා

ණ්ඩාතු, එසේ ම කායවිඤ්ඤාණධාතු යුගලය ද; මනොධාතු, පව වාරාවජ්ජනය, සම්ප්‍රතිච්ඡනයුගලය, යන මනොධාතුව ද; ධම්ම ධාතු, ධම්මධාතුව ද; මනොවිඤ්ඤාණධාතු, ඒ තෙළෙස් චිත්තයන් හැර අවශෙෂ සියලු චිත්ත සංඛ්‍යාත වූ මනොවිඤ්ඤාණධාතුව ද; ඉති, මෙසේ; අඨාරස හොනති, ක්‍රමයෙන් අටළොස්දෙනෙක් වෙක්. අරියසච්චානි, ආර්‍යසත්‍යයෝ තුමූ; දුක්ඛං අරියසච්චං, දුක් සංඛ්‍යාත වූ ආර්‍යසත්‍යය ද; දුක්ඛසමුදයං, දුක්ඛයාගේ ඉප දීමට හෙතු වූ; අරියසච්චං, ආර්‍යසත්‍යය ද; දුක්ඛනිරොධං, දුඃඛ යාගේ වැලකීමට කාරණා වූ; අරියසච්චං, ආර්‍යසත්‍යය ද, දුක්ඛනිරොධගාමිනිපටිපදං, දුඃඛයාගේ දුරලකීමෙන් ලැබියයුතු වූ නිර්‍වාණයට පැමිණීමට හෙතු වූ ප්‍රතිපදා සංඛ්‍යාත වූ; අරිය සච්චං, ආර්‍යසත්‍යය ද; ඉති, මෙසේ; චත්තාරි හොනති, සතර දෙනෙක් වෙත්. පන, විශෙෂාර්‍ථයක් කියමි:—එත්ථ, මේ සති සංග්‍රහයෙහි; වෙදනාසිකා-සුඛුම්රූප-නිබ්බානවසෙන, දෙපණස් චෙතසිකාත, සුඛුමරූපසොළසඤ, නිර්‍වාණඤ යන මොවුන්ගේ වශයෙන්; එකූනඝනකධම්මා, එකුන්ඝැන්තැවක් ධර්‍මයෝ තුමූ; ධම්මායතන-ධම්මධාතු ඉතිව, ධම්මායතනයති ද-ධම්මධාතුයා සිදු; සඛං ගච්ඡන්ති, ගණනට නොහොත් ධම්මායතන-ධම්මධාතු සං ඛ්‍යාත ව්‍යවහාරයට යෙත්. මනායතනං එව, මනායතනඤ්ච; සත්තවිඤ්ඤාණධාතුවා සෙසා, සප්තවිඥානධාතූන්ගේ වශයෙන්; ඔජට්ඨකී, ප්‍රථෙද මේ.

රූපව, අටවිසිරූපඤ ද; වෙදනා ව, වෙදනාවෙතසිකඤ ද; සඤ්ඤා ව, සංඥාවෙතසිකඤ ද; සෙසචෙතසිකා ව, වෙද නාසංඥාවන්ගෙන් අවශිෂ්ට වූ සම්පණස් චෙතසිකයෝ ද; තථා, එපරිද්දෙන; විඤ්ඤාණඤ ව, එකුන්අනූවක් චිත්තයද; ඉති; මේසේ, එතෙ පව, මේ ධර්‍මයෝ පස්දෙන; පවඛන්ධාති, පව සඛන්ධයෝ ය සි; භාසිතා, තථාගත වරයන් විසින් වදරණ ලද්දා හුය.

තථා, එපරිද්දෙන්; තෙභූමකා, කාමරූපාරූප සංඛ්‍යාත භූමිත්‍රයෙහි හටගත්තා වූ; එතෙ ධම්මා, මේ ධර්‍මයෝ පස්දෙන; පඤ්චුපාදානඛන්ධාති, පවඋපාදානස්කන්ධයෝ ය සි; මතා, දන් නා ලද්දාහුය; නිබ්බානං, නිර්‍වාණධාතු ෂතමේ; භෙදභාවෙන, රූපාදීන් මෙන් ප්‍රත්‍යෙක්ෂාපපන්න-අතීත-අනාගත-අධ්‍යාත්ම-බාහිර-දූර-සන්තික-හීන-ප්‍රණීත--සුඛුම--ඔළාරික-සංඛ්‍යාතවූ--එකොළොස් ප්‍රභෙදයෙන් වෙනස් නො වන හෙයිනි; බඛ සඛහනාසඨං, සඛන්ධ සංඛ්‍යාත වූ හණනින් නිගීත කරණ ලද් දේ සි-හෙවත් පවසඛන්ධයෙන් වෙන්ව පවත්නේ සි.

ආයතනානි, ආයතනයෝ තුමූ; චාරුලක්ඛණහෙතුනා, ස දෙරස-සාරමූලකය යන ප්‍රභේදයෙන්; (චාදස හවන්ති) දෙළොස් දෙනෙක් වෙත්. ධාතුයෝ ච, ධාතූහු තුමූ ද; චාරුලක්ඛණතදුපප න්නපරිත්තයෙන, සදෙරස-සාරමූලකය-ඒ චාරුලක්ඛණයන් නිසා හවඟන්නා වූ විඤ්ඤණය යන මොවුන්ගේ ක්‍රමයෙන්; (අට්ඨාරස හවන්ති) අවළොස්දෙනෙක් වෙත්.

තෙහුමකා, හුම්ත්‍රයෙහි හටගත්තා වූ; වට්ටං, කම්වට- විප වට-කෙලෙස්වට සංඛ්‍යාත වූ වෘත්තධර්ම තෙමේ; දුක්ඛං, දුඃඛසත්‍ය නම්වේ. තණ්හා, ලෝභචෙතසික තෙමේ; සමුදයෝ හවේ, සමු දය නම් වේ. නිබ්බානං, අසංඛතධාතු තෙමේ; නිරොධෝ නාම හවේ, නිරෝධසත්‍ය නම් වේ. ලොකුත්තරෝ, ලෝකොත්තර යෙහිවූ; (මග්ගෝ, මාර්ගඛයන් අවදෙන;) මග්ගාවතෝ, මාර්ග සත්‍යය යි දන්නා ලදී. "මග්ගෝ ලොකුත්තරෝ මතෝ" යන් නෙහි-ලොකුත්තරෝ මග්ගෝ මතෝ, යනුවෙන් ඔඛ්‍යපදලොප ය යි දත යුතු යි.

මිශ්‍රයුත්තා ච, මාර්ගඛයන් අවදෙන හැර තත්සම්ප්‍ර යුක්තවූ මාර්ගීචිත්තෝත්පාදයෝ ද; ඵලාවෙව, ඵලචිත්තයෙහි ඉදුකා වූ ඒ මාර්ගඛය නුත් සමඟ ඵලචිත්තෝත්පාදයෝ ද; චතුඃචවවිනිස්සටා, චතුස්සත්‍යයෙන් නිර්ගත වූවාහුය; හෙවත් චතුස්සත්‍යයෙහි ඇතුලත් නොවූවාහුය; ඉති, මෙසේ; පවපප හෙදෙන, පවප්‍රභේදයකින්; සබ්බසඞ්ගහෝ, සර්වසංග්‍රහය; පවු තෝ, ප්‍රභේද වශයෙන් කියන ලදී.

අභිධම්මත්ථසඞ්ගහෙ, අභිධර්මාර්ථසංග්‍රහ නම් ප්‍රකරණයෙහි; සබ්බචිත්තසඞ්ගහවිභාගෝ නාම, සර්වචිත්තසංග්‍රහවිභාග නම් වූ; සත්තමෝ පරිච්ඡේදෝ, සත්වන පිරිසිඳීම; ඉති, මෙසේ සම්පූර්ණ වූයේ යි.

(හා)

සර්වසංග්‍රහයෙහි ඛන්ධ, ධාතු, ආයතන, සත්‍ය, යන සතරු කාරණයකින් සර්වඥයන් වහන්සේ විසින් ශතර පරමාර්ථය කුමක් නිසා සතරාකාරයකින් බෙදා වදාළේ ද යත්? සම්සිඳි වෘක්ෂාදි යක් රොපණය කිරීම නිසා ඵලදායී වූ පසින් යුක්ත වූ ආලවාලය සතරක් කරන්නාක් මෙන් විදර්ශනාප්‍රඥා සංඛ්‍යාත වූ ඵලක්ෂණ රොපණය කරණු පිණිස ඛන්ධආලවාලභූමිය, ආයතන ආලවාලභූමිය, ධාතුආලවාලභූමිය, සත්‍යආලවාලභූමිය යි මෙසේ

ආලම්බනය සතරක් නියම කර වදාරණ ලද්දේ යි. මහාකාරුණික වූ ස්ථිතප්‍රඥයන් වහන්සේ වනාහි ලොකවාසී සත්ත්වයන්ගේ සුඛාවහ වූ ධර්මදේශනා ප්‍රතිඵල ආදී ඒ ඒ කාරණය පිණිස එක ම ආලම්බනය හුම්මත් නොවදාරා කුමක් හෙයින් සතරක් ම වදාළේ ද යත්? ලොකයෙහි වනාහි දිව්‍ය බ්‍රහ්ම මනුෂ්‍යාදි සියලු සත්ත්වයෝ ත්‍රිවිධාකාර වෙත්. ඒ කවර ත්‍රිවිධාකාරයෙක් ද යත්? නාම මමූලක, රූපසමමූලක, නාම රූපසමමූලක යි. කියා නෝ සංක්ෂේපරුචික මධ්‍යමරුචික විස්තාරරුචික වශයෙන් හෝ ත්‍රිවිධාකාර වෙත්. නාමසමමූලක යනු ප්‍රකෘතියෙන් නාමයෙහි මූලා වූ සත්ත්වයෝ යි. ඛණ්ඩ දේශනාව වනාහි රූපය එකකින් හා නාමය සතරකින් ද බෙදා වදාළ හෙයින් නාමරූපසමමූලක සත්ත්වයන්ට සකඛණ්ඩ සඞ්ඛ්‍යාත වූ ආලවාලයෙහි විදර්ශනාප්‍රඥා සංඛ්‍යාත වෘක්ෂය රෝපණය කිරීමෙන් නො බෝ කලකින්ම සතරමග-සතරඵල-නිර්වාණ සඞ්ඛ්‍යාත අමාඵලයන් ලැබිය හැකි බැවින් නාමරූපසමමූලක සත්ත්වයන් කෙරෙහි මහාකරුණායෙන් යෙදී ඛණ්ඩදේශනාව කෙළේය යි දතයුතු යි. රූපසමමූලක සත්ත්වයන් කෙරෙහි මහාකරුණාව උපදවා ආයතනදේශනාව කෙළේ යි. ආයතනදේශනාවෙහි වනාහි රූපය අඞ්කාදිශප්‍රකාරයකින් හා නාමය එකාඞ්ගයකින් හෙවත් එක්හමාරකින් බෙදා වදාළ හෙයින් රූපයෙහි මූලා වූ සත්ත්වයන් සඳහා ආයතනදේශනාව කෙළේ යි. ආයතනදේශනාවෙහි වනාහි අඞ්කාදිශයකින් හෙවත් අඞ්ගයක් අධික කොට ඇති දෙශයකින් රූපය හා අඞ්ගයක් අධික කොට ඇති එකකින් නාමය ද බෙදා වදාළේ යි. ඒ කෙසේ යත්? ධම්මායතනයෙහි දෙපණස් චෛතසිකය, සූක්ෂ්මරූපසොළසය, නිර්වාණය, යන මෙයෙක් ධර්මයන් සඞ්ගෘහීත බැවින් සූක්ෂ්මරූපසොළසය යි කියන ලද්දා වූ අඞ්ග රූපයෙහි ඇතුලත් වන බැවින් අඞ්ග සහිත වූ දශයකින් රූපය බෙදා වදාළේ යි. ඒ ධම්මායතනයෙහි ම දෙපණස් චෛතසිකය, නිර්වාණය, යන නාමාඞ්ගය මනායතනය හා සමඟ ගත් කල්හි අඞ්ග සහිත වූ එකකින් නාමය බෙදා වදාළේ යි.

මෙසේ රූපසමමූලක සත්ත්වයන් කෙරෙහි මහාකරුණායෙන් යෙදී ආයතනදේශනාව කළ හෙයින් ආයතන සංඛ්‍යාත වූ ආලවාලයෙහි විදර්ශනාප්‍රඥා නැමති වෘක්ෂය රෝපණය කළා වූ යොගාවචරයන්ට නො බෝ කලකින් ම නවලෝකොත්තර ධර්ම නැමති අමාඵලය ලැබිය හැක්කේ යි. නාම-රූප සංඛ්‍යාත උභයසමමූලක සත්ත්වයන් කෙරෙහි උපන්නා වූ මහාකරුණාසමාපත්තිය හේතුකොට ගෙණ ධාතුදේශනාව වදාළේ යි. ධාතුදේශනාවෙහි වනාහි රූපය එකොළොසකින් හා නාමය සත

කින් ද බෙදා වදාළ හෙයින් හෙවත් එකුන් අනූවක් චිත්තය චක්ඛුවිඤ්ඤාණධාතු, සොතවිඤ්ඤාණධාතු, ඝාණවිඤ්ඤාණධාතු, ජිව්හාවිඤ්ඤාණධාතු, කායවිඤ්ඤාණධාතු, මනොධාතු, මනොවිඤ්ඤාණධාතු, යන සත්තවිඤ්ඤාණධාතුවකින් හා ධම්මධාතුවෙහි අඩියකින් ද, නාමය හා අවශෙෂ අඩිකාදශයකින් ද, රූපය බෙදා වදාළ හෙයින් උභයසම්මූළහ සඞ්ඛ්‍යත්ව අඨාරසධාතු නැමති ආලවාලයෙහි විදර්ශනාප්‍රඥා නැමති වෘක්ෂය රොපණය කිරීමෙන් හෙ බෝ කලකින් ම නව්වලොව්තුරා දහම් ඵලලාභය හැක්කේය. එසේ ම සංඛ්‍යෙපරුචිකයන් සඳහා ඛන්ධදෙශනාව ද මධ්‍යමරුචිකයන් සඳහා ආයතනදෙශනාව ද, විත්ථාරරුචිකයන් සඳහා ධාතුදෙශනාව ද, මෙසේ විනෙයජනයන්ගේ අදහස් පරිද්දෙන් හා දෙශනාවිලාශ සංඛ්‍යාත වූ බුඩවචනය සැරසීම පිණිස මෙසේ මේ ත්‍රිවිධාකාරදෙශනාව වදාළේ සි.

අවයාඋයෙහි සත්‍යදෙශනාව වනාහි ඛන්ධභූමියෙහි හෝ ආයතන භූමියෙහි හෝ ධාතුභූමියෙහි හෝ විදර්ශනාප්‍රඥව මුහුකුරුවන්නා වූ යොගාවචරයාහට ඒ විදර්ශනාඥානය මැනැක ප්‍රාප්තවූ කල්හි ඇවත්‍රයවර්තිවූ සියලු වෘත්ත දුඃඛය දුක්වශයෙන් දැන ගණිමින්, සමුදයසත්‍ය සංඛ්‍යාත වූ තෘෂ්ණාව ප්‍රහාණයකරමින්, නිරොධසත්‍ය සංඛ්‍යාත වූ නිර්වාණය ප්‍රත්‍යක්ෂ කරමින්, මාර්ගසත්‍ය සංඛ්‍යාත වූ ආර්‍යඅෂ්ටාඞ්ගිකමාර්ගය වඩමින් අභිඥාවෝ සිඳිය සමෘඞ්කරන්නේය සි කියා ද; මින් මත්තෙහි කටයුතු කෘත්‍යයක් නැතැ යි කියා ද අවබොධ කරන්නේ සි.

මේ අර්ථය වනාහී ප්‍රතිපත්‍යාවෙන් අවබොධ කටයුතු සි. ඝම්යේ තෙල් පහනක් දැල්වූ කල්හි අන්ධකාර නැසීම ය, ආලොකය පැතිර වීම ය, තෙල් ක්ෂය වීම ය, පහන්වැටිය දැවීමය සි යන මේ සතර කෘත්‍යය එකක්ෂණයෙහි සිඳ කරන්නාක් මෙන් මාර්ගඥාන නැමති පහන දැල්වූ කල්හි දුක හාන්පසින් දැනීම ය, ලොභය නැසීම ය, නිර්වාණධර්මය ප්‍රත්‍යක්ෂයෙන් දැකීම ය, මාර්ගසත්‍යය වැඩීම ය, යන මේ සතර කෘත්‍යය එකක්ෂණයෙහි සිඳ කරන්නේ සි. මේ සතර මාර්ගයෙහි ම සතර සාමඤ්ඤඵල කෘත්‍යය සිඳ කිරීම සමාන වන්නේ නමුදු සෝවාන් මාර්ගය ය, සකෘදාගාමි මාර්ගය ය, අනාගාමි මාර්ගය ය යන ත්‍රිවිධමාර්ගයන්හි කාරණත්‍රිත්වයෙක්හි විශුද්ධිලාභාදිකට බදු උපමා ඇතිවේ. ඝම්යේ වීදුලිය ගසන්නා වූ ක්ෂණයෙහි සියලු ද්‍රව්‍යසතුපදාර්ථයන් දක්නාක්මෙන් ද සෝවාන්-සකෘදාගාමි-අනාගාමි යන ත්‍රිවිධමාර්ගයෙහි චතුසත්‍ය ධර්මයන්ගේ කෘත්‍යය සිඳකොට නැවත වීදුලිය ක්ෂයවූ කල්හි අන්ධකාරයෙන් වැසියන්නාක් මෙන් නැවතත් චතු

සත්‍යයන්ගේ මුවහවීම සිඳ වෙයි. අතීත්මාගීසඤ්ඤයෙහි වන්නාවූ චතුස්සත්‍යාවබෝධය සුගතීහා උදාවූ කල්හි ගැඹුරුබහත වන තාක් සියලු පදාර්ථයන් දක්නාක් මෙන් ම ඒ මහරහතුන් වහන්සේට ඒ චතුස්සත්‍යය පිරිනිවන් පෑම දක්වා මුවහ නො වී පවත්නේය. එහෙයින් ම සූත්‍රාන්තවාතෘකාවෙහි:-"විජ්ජූපමා ධම්මා" යන පදයෙන් සෝවාන්-සකෘදාගාමි-අනාගාමි යන මාගීචිත්තඤ්ඤණයෝ තුන්දෙන ද, "වජිරූපමා ධම්මා" යන පදයෙන් අතීත්මාගී චිත්තඤ්ඤණය ද ලැබෙන්නේය යි දතයුතු යි.

පළමුවන විදර්ශනාභූමිය සකඤ්ඤභූමිය යි. ඒ සකඤ්ඤභූමියෙහි පඤ්චඤකඤ්ඤ, පවුපාදානඤකඤ්ඤ යි කුමක්හෙයින් දෙයාකාරයක් කොට වදාළේද යත්? "ඛන්ධසංග්‍රහය" යනු වට්ට-විවට්ටය යන උභයපක්ෂයෙහි සියලු ධර්මයන් ම සාමාන්‍යයෙන් සංග්‍රහ කොට පවසන්නා යි කියා ද, තෘෂ්ණාවට ගොචර වූ ඒ පවසන්නා හෙවත් කාමලොක-රූපලොක-අරූපලොක යන භවත්‍රයෙහි ඇතුලත් වූ ධර්මසමූහය උපාදානඤකඤ්ඤ යි කියා ද ව්‍යවහාරකරෙත්. "උපාදානඤකඤ්ඤ "යනු ලභට ඇද ගන්නා ලද සඤ්ඤය යන අර්ථ යි. කුමකින් ලභට ඇද ගන්නේ ද යත්? තෘෂ්ණා නැමති රැහැණින් බැඳ ඇද ගන්නේ ය යි දතයුතු යි. ඔවුන් අතුරෙන් රූපසඤ්ඤ යනු භූතරූප සතර ය, උපාදාය රූප සුවිස්ස ය, සහ අවිඤ්ඤත්තිරූපය යි. ඒ අවිඤ්ඤත්තිරූපයට කුමක් හෙයින් රූපසඤ්ඤ යි ව්‍යවහාර කරන්නේ ද යත්? මෙහි "ඛන්ධ" ශබ්දය මහාසාගරයට උදකසඤ්ඤ යි ව්‍යවහාර කරන්නාක් මෙන් රූපයන්ගේ රාශියට රූපසඤ්ඤ යි කියත්. මේ ව්‍යාමප්‍රමාණ වූ ශරීරයගි එතෙක් මහත් වූ රූපසඤ්ඤයක් කොයින් ලැබේ දැ යි නො සිතිය යුතු යි.

මේ සත්ත්ව විනාශි අසවල් බුදුන්ගේ කාලයෙහි අසවල් රජුගේ කාලයෙහි පළමුවෙන් හටගත්තේය යි නියමයෙක් නැත්තේය. එහෙයින්:—අනමතග්ගොයං භික්ඛවේ! සංසාරෝ පුබ්බා කොටි න පඤ්ඤායති" යනු වදාළේ යි. "අනමතග්ගය" යනු "න මතඅග්ගය" යනාර්ථ යි. හෙවත් අග්‍ර නො දතහැක්කේ ය යනාර්ථ යි. නොපැණෙන පුථිවිපරකොටිසඇති එක ම සත්ත්වයෙකුගේ එක ම කල්පයක් තුල මනුෂ්‍යඅතිරශ්චිනාදිඅත්තභාවයන්හි එක ම සත්ත්වයෙකුට අයිති වූ ඇටරාශිය හොඳක් කළේ වී නම් වෙපුල්ලපර්වතයට වඩා උස්වූ ඇටගොඩක් විය හැක්කේය. එහෙයින් එක ම සත්ත්වයෙකුගේ අනාදිමත් සංසාරයෙහි හටගත්තා වූ රූපසමූහය එක්තැනෙක්හි රැස්කෙළේ නම් සතර මහාසාගරයෙහි ජලයට අධික වෙයි. එහෙයින් රූප

සකඛ්ඛය යන නාමය අතීතානාගත ප්‍රත්‍යුත්පන්නවූ සියලු රූප ගන්ම් එක්කොටගෙණ රූපඛන්ධය යි කියති. වෙදනාසකඛ්ධ ය ද එක එක චිත්තයෙක්හි එක එක වෙදනාවක්ම ලැබෙන්නේ නමුදු එක් ජීවිතයක් තුල ලැබෙන්නාවූ වෙදනාවන්ට උපමා කළ හැකි ධර්මයක් නැත්තේයි එතෙමින් අතීතානාගත වර්ත මාන කාලත්‍රයෙහිම හටගන්නා වෙදනාවන් නුවණින් එක්කොට ගෙණ වේදනාඛන්ධය යි කියත්. සංඥස්කඛ්ධය ද එසේමැ යි. "සංඛ්කාරඛන්ධය" යනු චේතනා ප්‍රධානවූ සම්පයුක්ත ධර්ම සෙ නෙකි. ඒ ධර්මයෝද එක එකක් පාසා එක් ජීවිතයක්තුල හටගන් නාවූ ධර්මයන්ගේ සඛ්‍යාව ගණන් ඟාසාදුකයින් නොදත හැක්කේය. අතීත අනාගත වර්තමානවූ ඒ සියලුම සංස්කාරයන් නුව නින් එක් කොටගෙණ සංස්කාරස්කඛ්ධය යි කියත්. "විඤ්ඤාණ ඛන්ධය" යනු එකුන් අනූවක් විඤ්ඤාණයෝ යි. එක් සත්ත්වයෙක් හට එක් භවයෙක්හි හටගන්නාවූ විඤ්ඤාණයන්ටද උපමා කළ හැකි සඛ්‍යාවක් නැති හෙයින් ඒ සියල්ල එක්කොට ගෙණ විඤ්ඤාණ ඛන්ධය යි කියත්.

"පංචුපාදානස්කඛ්ධය" යනු සතිපට්ඨාන සූත්‍රයෙහි වදාළාවූ විදර්ශනා කරන යෝගාවචරයන් විසින් අනිත්‍යාදී වශයෙන් මෙ නෙහි කළ යුතුවූ ත්‍රෛභූමික ධර්මසමූහයයි. ඒ පංචුපාදානස් කඛ්ධයෙහි හා සාමාන්‍යපඤ්චස්කඛ්ධයෙහිද ඇති විශෙෂය නම්:— එකුන් අනූවක් වෙදනාවෝ වෙදනාස්කඛ්ධය යි කියාද, එකුන් අනූවක් සංඥාවෝ සංඥාස්කඛ්ධය යි කියාද, සම්පයුක්ත වෙත සික සංස්කාරධර්මයන්ගේ සංස්කාරස්කඛ්ධය යි කියාද, එකුන් අනූවක් විත්තයෝ විඤ්ඤාණස්කඛ්ධය යි කියාද, සාමාන්‍ය පඤ්චස්කඛ්ධයෙහි ව්‍යව හාර කෙරෙත්. උපාදානස්කඛ්ධ විභාගයෙහි:— එකාසූවක් ලෞ කික චිත්තයෙහි යෙදුනාවූ වෙදනාවෝ එකාසූව වෙදනුපාදාන ස්කඛ්ධය යි කියාද, එසේම එකාසූවක් ලෞකික සංඥාවෝ සඤ්ඤූ පාදානඛන්ධය යි කියාද, ඒ එකාසූවක් ලෞකික චිත්තයෙහි යෙදුනාවූ සම්පයුක්ත චෛතසිකය සංස්කාරූපාදානස්කඛ්ධය යි කියාද, එසාසූවක් ලෞකික චිත්තය විඤ්ඤාණූපාදානඛන්ධය යි කියාද ව්‍යවහාර කෙරෙත්.

මේ ස්කඛ්ධ උපාදානස්කඛ්ධ දෙදෙනාගේ විශෙෂ නම්:— අතී තානාගතාදී භෙදයන් නැති හෙයින් නිර්වාණ ධර්මාත්‍රයක් හැර අවශෙෂ සියලු පරමාර්ථ ධර්මයෝ පඤ්චස්කඛ්ධයෙහි ඇතුලත් වෙත්. පංචුපාදානස්කඛ්ධයෙහි විශෙෂ නම්:— විවට්ටධර්ම සඛ්‍යා තවූ සතරමාර්ගය, සතරඵලය, නිර්වාණය යන නවලෝකොත්තර

ධම්ම හැර අවශෙෂ සියලු පරමාර්ථ ධම්මෙෝ පංචුපාදානක්ඛන්ධයෙහි ඇතුළත් වෙත්. මේ ස්කන්ධ උපාදානස්කන්ධ දෙදෙනාගේ විශෙෂයයි.

චාදසායතනානඤ යනු චාරවූ ආයතනයෝ සදෙනයි, ඒ චාර යන්ට අරමුණුවන්නාවූ ආයතනයෝ සයදෙනයයි, මෙසේ වාදසායතනයෙක් වෙත්. මේ චාදසායතනයන්ට වනාහි චිත්ත චෙතසික රූප නිර්වාණ සඞ්ඛ්‍යාත සියලු පරමාර්ථ ධම්මෝම ඇතුළත් වෙත්.

"අට්ඨාරසධාතුයා" යනු වාරධාතු සදෙනයි, ආලම්බණධාතු සදෙනයි, ඒ ඒ වාරාලම්බණධාතූන් දෙලොස්දෙන ගැටීමෙන් හටගන්නාවූ විඤ්ඤාණධාතු සදෙනයයි දත යුතුයි. ඒට උපමාව නම්:—ගිනි ගන්නා දණ්ඩකි උත්තරාරණියත් හා අධරාරණියත්, එකට ගැටීමෙන් හින්න හටගන්නාක්මෙන් චක්ඛුරූප දෙදෙනාගේ එකට ගැටීමෙන් චක්ඛුවිඤ්ඤාණධාතුව උපදී. අවශෙෂ සතලොස් ධාතූහුද මේ ක්‍රමයෙන් යොදාගත යුතුයි. ආයතන ධාතු සංග්‍රහයෙහි වනාහි:-සොළොස් සූක්ෂ්මරූපත, දෙපණස් චෙතසිකත, නිර්වාණත යන මොහුන්ක ධම්මෙෝ ධම්මායතනයයි කියාද, ධම්මධාතුයයි කියාද, ව්‍යවහාර නොවෙත්. මෙසේ සාමාන්‍ය ස්කන්ධ සංග්‍රහයෙන් එකම නිර්වාණධාතුවද, උපාදානස්කන්ධ සංග්‍රහයෙන් නවලොකොත්තර ධම්මයද, සංග්‍රහ නොවන්නේ නමුදු ආයතන ධාතු සංග්‍රහයන්ට ඇතුළත් නොවන්නාවූ ධම්මෙක් නම් නැත්තේ මැයි. මෙසේ ස්කන්ධභූමියෙහි හෝ ආයතනභූමියෙහි හෝ ධාතුභූමියෙහි හෝ විදර්ශනාප්‍රඥාව පුරුදු කරන්නාවූ යොගාවචරයාගට මිසනකප්‍රාප්තවූ විදර්ශනා ප්‍රඥාවගේ සතර කෘත්‍යයක් ඉදිරිපසු නොවී එකක්ෂණයෙහි සිඛවනබව නොවෙහොත් විදර්ශනා ප්‍රඥාවගේ අනන්තර ඵලය දක්වනු පිණිස අවසානයෙහි සත්‍ය සංග්‍රහය දක්වනලදී.

"සත්‍යසංග්‍රහය" යනු යටකී පඤ්චස්කන්ධයෙහි ඇතුළත්වූ සියලු ධම්මයන් අතුරෙන් නිර්වාණය හා එකම තෘෂ්ණාවද සමුදය දිසි. ආදී මාර්ගඛය අවසානද හැර අවශෙෂ සියලු ධම්මසමූහය දුඃඛ සත්‍යයයි කියාද, එකම ලොභය සමුදය සත්‍යයයි කියාද, නිර්වාණය නිරොධසත්‍යයයි කියාද, සතරමාර්ගයෙහි යෙදුනාවූ සම්මා දිසි ආදී මාර්ගඛය අවසානද හෝ සත්දෙන මාර්ගසත්‍යයයි කියාද, ව්‍යවහාර කෙරෙති. "මහඟයුත්තා ඵලාවෙව වතුසච්චිකා සඛා" යනු කියෙහියින් සතරමාර්ග චිත්තයෙහි යෙදුනාවූ අෂ්ටාඞ්ගික මාර්ගය හැර අවශෙෂවූ එකුන්තිස් මාර්ගචෙතනාත්පාදයන් හා ඵල

චිත්තයෙහි යෙදුනාවූ සත්තිස් ධර්මයෝද යන මේකී ධර්මයෝ තුමූ සංස්කාර දුකින් යුක්තවූවාහු නමුදු චතුස්සත්‍යයෙන් විනිර් මුක්තයහ. දුක් ඉපදීමට කාරණා නොවන බැවින් සමුදය සත්‍ය යයි කියාද, නිර්‍ෝධධාතුවට අසම්බන්ධ බැවින් නිරෝධසත්‍ය යයි කියාද, සංසාරයෙන් එතරවීමට ප්‍රධාන උපකාර නොවන හෙයින් නියාණිකාඛ්‍යයෙන් මිථ්‍යා හෙයින් මාර්ගසත්‍යයයි කියාද, ව්‍යවහාර නොකට හැකි බැවින් චතුරාර්‍යසත්‍යයන් බැහැරකළාවූ ධර්මයෝ නම් වෙත්. මෙසේ ස්කන්ධසංග්‍රහය, උපාදාන ස්කන්ධ සංග්‍රහය, ආයතනසංග්‍රහය, ධාතුසංග්‍රහය, සත්‍යසංග්‍රහයයි පඤ්ච ප්‍රකාරයකින් සර්‍වසංග්‍රහය සම්පත කෙළේයි.

සමුච්චය සංග්‍රහ විභාග නම් වූ සත්වෙනි පරිච්ඡේදය නිමි.

(ප)

යෙසං, යම් සවභාවක් ඇති; සඞ්ඛතධම්මානං, එක් සැත්කෑ වක් සහෙතුක චිත්තයහ; මොහමූලිකද්වයිහෙතුහි, මොහ වර්ජිත කොට ඇති දෙපණස් චෛතසිකත්‍ව, සහෙතුක චිත්තජරූපය සහෙතුකප්‍රතිසන්ධිකම්ජරූපය යන මේ ආදිවූ ප්‍රත්‍යුත්පන්න ධර්මයන්ට; යෙධම්මා, යම් සත්‍යකාරවූ හෙතුප්‍රත්‍යාදිවූ ප්‍රත්‍යය ධර්මයෝ තුමූ; යථා, යම් හෙතුසත්‍යාදී වූ ප්‍රකාරයකින්; පවත්තා හොන්ති, උපකාරවෙත්ද; තං විභාගං, ඒ ප්‍රත්‍යුත්පන්න ධර්මයන්ට ප්‍රත්‍යය ධර්මයන්ගේ උපකාරශක්තිභෙදය; ඉහ, මේ අට වෙනි පරිච්ඡේදයෙහි; ඉදානි, දැන්; යථාරහං, සුදුසු පරිදි දෙන් අහං, මම; පවක්ඛාමි, ප්‍රභේද වශයෙන් කියම්. අහං" යන කතීෘව අධ්‍යාහාරයි. පටිච්චසමුප්පාදනයෝ ච, ප්‍රතීත්‍ය සමුත්පාද ක්‍රම යද; පඨානනයෝ ච, ප්‍රස්ථානක්‍රමය ද; ඉති, මේසේ; පච්චය සඞ්ගහෝ, ප්‍රත්‍යසංග්‍රහය; විධා, විප්‍රකාරයකින්; වෙදිතබ්බා, දැනගැනීත්තේයි. තත්‍ර, ඒ විප්‍රකාරක්‍රමයන් අතුරෙන්; අඛ්‍යාව ඝාවිජ්ජාවාක්‍යාරමත්තස්ස්‍යාපලක්ඛණතෝ, ඒ අවිද්‍යාදී වූ හෙතුධර්ම යන්ගේ හට්ගැණීම කරණකොට ගෙණ හටගන්නා සවභාවඇති සංස්කාරාදි ඵලධර්මයන්ගේ හටගන්නා ආකාරමාත්‍රයකින් සල කුණු කරණ ලද ක්‍රම නෙමේ; පටිච්චසමුප්පාදනයෝ, ප්‍රතීත්‍ය සමුත්පාද ක්‍රමය නම්වේ. පඨානනයෝ පන, ප්‍රස්ථානක්‍රමය වනාහි; ආගච්ඡවපච්චයසිද්ධිතෝ, වෙගෙසා පැවති ප්‍රත්‍යය සංඛ්‍යාත සිද්ධිය, ආරබ්භ, ඇරැඹ; පවුච්චති, කියනුලැබේ. උභයං පන,

මේ විප්‍රකාරක්‍රමය වනාහි; **වොමිස්සත්ථා**, මිශ්‍රකොට; ආචරියා, අජ්ඣේකථාවාදීවරත්‍රෝ තුමූ; ("ආචරියා" යනු විභූතිමාගීකතීය වූ බුද්ධඝෝෂාදිවරින්වහන්සේ **සඳහා** කිහු.) පපවෙනති, විස්තර **කෙරෙත්**. "**මඤ්ච පන විඤ්ඤාණං විඤ්ඤාණං දස්සසිස්සාම**" යනු අධ්‍යාහාරයි. අනුරුද්ධාචාර්යාදීවූ පශ්චිමාචාර්යවූ අපි වෙන **වෙන** ම දක්වම්හ යනාවේයි.

තවද, ඒ විප්‍රකාරක්‍රමයන් අනුවෙන්; "අවිජ්ජා-පෙ-සම්භවෝ හොතීති" "අවිජ්ජා-පෙ-සම්භවෝ හොති" යන; අයං තත්‍රයා මේ ක්‍රම තෙමේ; එහි, මේ ප්‍රත්‍යයසංග්‍රහයෙහි; පටිච්චසමුප්පාදනයෝ, ප්‍රතීත්‍යසමුත්පාදක්‍රම නම්වේ. අවිජ්ජාපච්චයා, චතුස්සත්‍ය ප්‍රතිවේධාදකලක්ෂණවූ මොහ සඞ්ඛ්‍යාත ධාතුයුගේ උපකාරයෙන්; සඞ්ඛාරා, පුඤ්ඤාභිසංඛාර අපුඤ්ඤාභිසංඛාර ආනෙඤ්ජාභිසංඛාරයෝ තුමූ; සම්භවන්ති, හටගණිත්. සඞ්ඛාරපච්චයා, **සංඛාර** සඞ්ඛ්‍යාත චෙතනාධාතුගේ උපකාරයෙන්; විඤ්ඤාණං, එකුන් විසි ප්‍රතිසන්ධි සඞ්ඛ්‍යාත විඤ්ඤාණ තෙමේ; වා, නොහොත් ලෞකික විපාක දෙතිසය යි කියනලද විඤ්ඤාණ තෙමේ; සම්භවති, පහළ වෙයි. පළමු වන විකල්පය ප්‍රතිසන්ධිකාලය සඳහාද, දෙවන විකල්පය ප්‍රවෘත්තිකාලය සඳහා ද යොදුගත යුතුයි. විඤ්ඤාණ පච්චයා, විඤ්ඤාණ සඞ්ඛ්‍යාත චෙතනාධාතුගේ උපකාරයෙන්; නාමරූපං, නාමය ද, රූපය ද, නාමරූපය ද; **සම්භවති**, පහළවේයි.

මේ "**නාමරූපං**" යන පදය නාමය රූපය නාමරූපය නාමරූපං, යනුවෙන් **සරූපෙකසෙස** සමාස කරණු "නාමය" යන්නෙන් අරූපඛන්ධයෙහි පහළ වන්නා වූ සතර නාමස්කන්ධය ද; "රූපඤ්ච" යනුවෙන් අඤ්ඤසඞ්ගහයෙහි පහළ වන්නා වූ එකම රූපස්කන්ධය ද; "නාමරූපය" යනුවෙන් **සකලොස්** රූපාවචරභූමිය, **සකොලොස්** කාමාවචරභූමිය යි කියනලද්දා වූ පවොකාරභවය ගැණේ. මේ නාමරූපශබ්දය **සරූපෙකසෙස** සමාස **නො** කෙරේ වීනම් අරූපලෝ අඤ්ඤලෝක්‍රන් නො ගැණේ. එතකුදුවුවත් මේ අනුරූ වූ "නාමරූපපච්චයා" යන පදයෙහි "නාමය රූපය නාමරූපං" යනුවෙන් වඤ්චසමාසමාත්‍රයක් මුත් "ඝටකී පදයට කී සරූපෙකසෙසය නො ලැබෙන්නේ යි.

නාමරූපපච්චයා, වේදනා සඤ්ඤා සංඛාර යන ස්කන්ධත්‍රය සංඛ්‍යාත නාමයාගේ හා රූපයාගේ උපකාරයෙන්; සළායතනං චක්ඛවායතනාදී ආයතනයෝ **සඳෙන** ද; නොහොත් ඝ්‍රාණායතන ජිව්හායතනයෝ ද; සම්භවන්ති, පහළ වෙත්. මේ "සළායතනං" යන පදය ද සළායතනය ජිව්හායතනාදි-සළායතනං, යනුවෙන්

ශරූපෙකසෙඤඤමාඝ කරණූ. සළායතනපච්චයා, සළායතනසංඛ්‍යාත හෙතුහුගේ උපකාරයෙන්; එසෙසා, චක්ඛුසම්ඵස්සාදී සවැදෑරුම් සපශී තෙමේ; සම්භවති, පහළ වෙයි. එසසපච්චයා, ස්පශී සංඛ්‍යාත හෙතුහුගේ උපකාරයෙන්; වෙදනා, චක්ඛුසම්ඵ සසජ්වෙදනාදී සවැදෑරුම් වේදනා හෝ නොහොත් සුඛදුඃඛෝ පෙක්ඛාවෙදනා සංඛ්‍යාත වූ ත්‍රිවිධාකාර වේදනාව හෝ; සම්භවති, පහළ වෙයි. වෙදනාපච්චයා, වේදනා සංඛ්‍යාත වූ හෙතුහුගේ උපකාරයෙන්; තණහා, කාමතණ්හාදී ත්‍රිවිධාකාරතෘෂ්ණාව හෝ රූපතණ්හාදී සවැදෑරුම් තෘෂ්ණාව හෝ; සම්භවති, පහළ වෙයි. තණහාපච්චයා, තෘෂ්ණා සංඛ්‍යාත හෙතුහුගේ උපකාරයෙන්; උපාදානං, කාමූපාදානාදී වූ සතරවැදෑරුම් උපාදානතෙමේ; සම්භවති, පහළ වෙයි. උපාදානපච්චයා, උපාදාන සංඛ්‍යාත හෙතුහුගේ උපකාරයෙන්; භවෝ, කම්භවය; උපපත්තිභවයයි කියන ලද්දා වූ විපාකභව තෙමේ; සම්භවති, පහළ වෙයි. භවපච්චයා භව සංඛ්‍යාත හෙතුහුගේ උපකාරයෙන්; ජාති, ප්‍රතිසන්ධිගැණීම; සම්භවති පහළ වෙයි. ජාතිපච්චයා, ජාති සංඛ්‍යාත හෙතුහුගේ උපකාරයෙන්; ජරාමරණං, ජරාව හා මරණයද, සම්භවති පහළ වෙයි. සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා, සොක කිරීම ය, හැඬීම ය, දුකට පැමිණීම ය, මානසික දුකට පැමිණීම ය, බලවත් ආයාසයට පැමිණීම ය, යන මොව්හු; සම්භවන්ති, පහළ වෙත්.

"ජරාමරණං" යන පදය විභක්ත්‍යන්තවද, "සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා" යන පදය සමාසාන්තවද, අර්ථ ගැණීමෙහි ප්‍රයෝජනය නම්:- ජාතිහුගේ නො වැලැක්වීය හැකි මුක්ඛ්‍යඵලය ජරාමරණය යි කියා ද, ජාතිහුගේ වැලැක්වීය හැකි වූ අමුක්ඛ්‍යඵලය "සොක-පෙ-උපායාසා" යන්නෙන් ද පහළ වෙත්. ජරාමරණ සංඛ්‍යාත වූ මුක්ඛ්‍යඵලය බුදුපසේබුදු මහරහතුන් විසිනු දු නො වැලැක්වීය හැක්කේය. සොකාදී අමුක්ඛ්‍යඵලය බුඩාදීන් විසින් වැලැක්වීය හැකිවෙයි. මේ අර්ථය සඳහා "ජරාමරණසොකපරිදෙව දුක්ඛදොමනස්සුපායාසා" යි එක සම්බන්ධසමාස නො කොට මධ්‍යයෙහි විභක්තිය දැක්වූයේ ය යි දතයුතු යි.

එසං, මේසේ කියන ලද ක්‍රමයෙන්; කෙවලස්ස, සුඛයෙන් අම්ශ්‍රකස්ස; නොහොත් කියලු; එතස්ස දුක්ඛක්ඛන්ධස්ස, මේ දුක් රාශීහුගේ: සම්භවෝ, හටගැණීම; හොති, පහළවෙයි. තත්‍ර, ඒ ප්‍රතීත්‍යසමුත්පාද ක්‍රමයෙහි; භගවා අඩා ව, අඛ්‍යංඛ්‍යාත කාලයෝ තුන්දෙනෙක් ද; වාදසඞ්ගානි ව, දෙමළාස් අඞ්ග සංඛ්‍යාත

කාරණාසෙනෙක් ද; වීසතාකාරුව, විංශති ප්‍රභෙද වූ ආකාර කොනෙක්ද; තිසන්තිව, ගැළපීම් තුණක්ද; චතුසංඛෙපා ව, සතර සංක්ෂෙප කොනෙක්ද; තොහොත් එකසම්බන්ධ කොටස් සතරක් ද; ත්‍රිනිවට්ටානි ව, පෙරලෙන්නාවූ වෘත්තයෝ තුන්දෙනෙක්ද; වෙ මූලානිව, මූලයෝ දෙදෙනෙක් ද; වෙදිතබ්බානි, දතයුත් තාහුය.

කථං, කෙසේ දතයුත්තාහුද යත්? අවිජ්ජාසංඛාරා, අවිද්‍යා සංස්කාරයෝ තුමූ; අතීතො අධා, අතීතකාල නම් වෙයි. ජාති ජරාමරණං, ජාතිජරාමරණ නෙමේ; අනාගතා අධා, අනාගත කාල නම් වෙයි. මජ්ඣෙ අට, මධ්‍යයෙහිවූ විඤ්ඤාණ, නාමරූප, සළායතන, ඵස්ස, වෙදනා, තණ්හා, උපාදාන, භවසංඛ්‍යාත ධර්මයෝ අටදෙන තුමූ; පච්චුප්පන්නා අධා, ප්‍රත්‍යුත්පන්නකාල නම්වෙයි. ඉති, මෙසේ; තයො අධා, අධ සංඛ්‍යාත කාලයෝ තුන්දෙන; වෙදිතබ්බා, දතයුත්තාහුය. අවිජ්ජා, අවිද්‍යාව ද; සංඛාරා, සංස්කාරයෝද; විඤ්ඤාණං, විඤ්ඤාණයද; නාමරූපං, නාමරූපයද; සළායතනං, ෂඩායතනයද, ඵස්සා, ස්පර්ශයද, වෙදනා, වේදනාවද; තණ්හා, තෘෂ්ණාවද; උපාදානං, උපාදාන යද; භවො, භවයද; ජාති, ජාතියද; ජරාමරණං, ජරාමරණයද; ඉති, මෙසේ; වාදඝඩනානි, දෙළොස් අඟයෝ; වෙදිතබ්බානි, දතයුත්තාහුය.

පන, අවීනාභාවාදියක් කියමි:—නොහොත් නීතාර්ථයෙන් අන්‍යවූ නෙය්‍යාර්ථය කියමි:—එහි, මේ ප්‍රතීත්‍යසමුත්පාද ක්‍රමයෙහි; සොකාදිවචනං, ශෝකාදිය කීරීම; නිස්සන්දඵල නිදස්සනං, ජාතිහුගේ අවුකඛ්‍යවූ විපාකපරම්පරා මාත්‍රයක් දැක්වීමම: හොති, වෙයි. (විසුං, වෙනම; අඞ්ගදස්සනං න හොති, අඟයක් දැක්වීමෙක් නොවෙයි.) පන, විශෙෂාර්ථයක් කියමි:-එහි, මේ දෙළොස් වැදෑරුම් අඟයන් අතුරෙන්; අවිජ්ජාසංඛාරඤාණෙන, අවිද්‍යා සංස්කාරයන්ගේ ගැණීමෙන්; තණ්හුපාදානභවාපි, තෘෂ්ණා උපාදාන කර්මභවයෝද; ගහිතා ගවනති, ගන්නා ලද්දාහු වෙත්. තථා, එපරිදිදෙන්ම; තණ්හුපාදානභවගහණෙන, තෘෂ්ණාඋපාදාන කර්මභවයන් ගැණීමෙන්ද; අවිජ්ජාසංඛාරා, අවිද්‍යාසංස්කාරයෝ; ගහිතා ගවනති, ගත්තාලද්දාහු වෙත්. ජාතිජරාමරණඤාණෙන ව, ජාතිජරාමරණයන්ගේ ගැණීමෙන්ද, විඤ්ඤාණාදී ඵලපවකං එව; විඤ්ඤාණාදී ඵලපඤ්ච; ගහිතං, ගත්තා ලද්දේ වෙයි. ඉති කත්වා, මෙසේ ගත්තාලද හෙයින්:—

අතීතෙ, අතීතභවයෙහි; පවත්තහෙතවො, හෙතූහු පස්දෙනෙක්ද; ඉදානි, දැන් ප්‍රත්‍යුත්පන්නභවයෙහි; ඵලපවකං, ඵල

පසක් ද; ඉදුනි, දැන්; ප්‍රත්‍යුත්පන්නභවයෙහි; පවහෙතවෝ, හෙතූනු පස්දෙනෙක්ද; ආයතිං, අනාගතභවයෙහි; ඵලපවකං, ඵලපසක්ද; ඉති, මෙසේ; විසතාකාරං, විසි ආකාරයෙක්ද; තිසඤ්චි ච, සඤ්ඥියෙක්ද; හෙවත් හෙතුඵලසඤ්ඤිය ඵලහෙතු සඤ්ඤිය හෙතුඵලසඤ්ඤියයි යන සඤ්ඥියෙක් ද: චතුසංඛෙපාව, සතර සංක්‍ෂෙප කෙනෙක්ද, හෙවත් අතීතහෙතුසංක්‍ෂෙපයෙක, ප්‍රත්‍යුත්පන්නඵලසංක්‍ෂෙපයෙක, ප්‍රත්‍යුත්පන්නහෙතුසංක්‍ෂෙපයෙක, ආයතිඵලසංක්‍ෂෙපයෙක් දැයි යන සතර සංක්‍ෂෙප කෙනෙක්ද; භවනති, වෙත්. අවිජ්ජාව, අවිද්‍යා තෘෂ්ණා ද; තණ්හූපාදානා ච, තෘෂ්ණාව හා උපාදානයෝ ද; කිලෙසවට්ටං, කෙලෙස්වට නම් වෙයි. සම්මහව සංඛාතෝ, සම්භවය යි කියන ලද්දාවූ; භවෙකදෙසෝ ච, භවයාගේ එකදෙශයෙක්ද; සංඛාරාව සංස්කාරයෝ ද, කම්මවට්ටං, කම්වට නම් වෙයි. උපපත්තිභව සංඛාතෝ, උපප්‍රාප්තිභවය යි කියන ලද්දාවූ; භවෙකදෙසෝ ච, භවයාගේ එකදෙශයෙක් ද; අවසෙසා ච, මෙහි නොකියන ලද් දාවූ විඤ්ඤාණ, නාමරූප, සළායතන, ඵස්ස, වෙදනා, ජාති ජරා මරණයෝද; විපාකවට්ටං, විපාකවට නම් වෙයි. ඉති, මෙසේ; තීණිවට්ටානි, තුන්වටකෙනෙක්; වෙදිතබ්බානි, දතයුත්තාහුය. අවිජ්ජා තණ්හාවසෙන ච, අවිද්‍යා තෘෂ්ණාවන්ගේ වශයෙන්: වෙ මූලානිව, මූලයෝ දෙදෙනෙක්ද; වෙදිතබ්බානි, දතයුත් තාහුය.

ච, සංඛාරවක්‍රයෙහි අන්‍ය වූ සංඛාරවක්‍රයාගේ බිඳීම දක් වමි:-සෙසමෙව මූලානං, ඒ අවිද්‍යාතෘෂ්ණා සංඛ්‍යාත මූලයන්ගේ ම; නිරොධෙන, අශේෂමාශේෂයෙන් නිරවශෙෂයෙන් නිරුඛකිරීම හෙතුකොටගෙණ; වට්ටං, ත්‍රිවිධවෘත්තය; නිරුජ්ඣති, නිරුඛණ්ඩි.

ජරාමරණමුච්ඡාය, ජරාමරණදෙසිත් මුළා පත්වීම හෙතු කොටගෙණ, අභිණ්හසෝ, නිරන්තරයෙන්; පිළිතානං, පිඬිත සත්වයන්ට; ආසවානං, කාමාදී චතුරාශ්‍රවයන්ගේ; සම්භවපදා, හට ගැණීමෙන්; අවිජ්ජා ච, නැවතත් අවිද්‍යාතොමෝ ද; පවඩ්ඪති, ප්‍රකර්ෂයෙන් වැඩේ.

ඉච්චවං, (ඉති එවං යථාවුත්තනයෙන) මේ යථොක්ත ක්‍රමයෙන් නෙවත් දෙලොස් වෙනි ජරාමරණ ඵලය හෙතුකොට ගෙණ අවිද්‍යාව හටගන්නා හෙයින්; ආබන්ධං, බැඳුනාවූ; අනාදිකං, මූලක්නැති; ශතහුමකං චට්ටං, ත්‍රෛහුමික විෘත්තය; පටිච්චසමුප්පාදෙති, හෙතුධර්මයාගේ ශක්තිය හෙතු කොටගෙණ ඵලධර්මයාගේ හටගැණීමය යි, මහාමුනි, මුනීන්ද්‍රවූ

සම්පයුත්තවහන්සේ; පඤ්චපසි, පඤ්චවා වදුලේසි. හෙවත් දෙශන සොව වදුලේසි

(හා)

"යෙසං සංඛතධම්මානං" යනාදී ගාථාවෙහි අභිප්‍රාය මෙසේසි. "සංඛත ධම්ම"යනු එක්සැත්කෑවක් සහෙතුක චිත්තය මොහමූලිකදෙසිතෙහි යෙදුනාවූ මොහය හැර අවශෙෂවූ දෙපණස් චෙතසිකය, සහෙතුක චිත්තජරූපය, අහෙතුක ප්‍රතිසන්ධි කම්ජරූපය, යන මෙතෙක් ධම්මෝ තුමූ; ඒ ඒ ප්‍රත්‍යයෙන්උකස් කළහෙයින් සංඛතයයි කියාද, ව්‍යවහාරවෙරෙක්, "ප්‍රත්‍යධම්මෝඝ" යනු (ලොභාදී) මොහාදිඅවැදැරුම් හෙතුධම්මාදී අනෙක ප්‍රකාරප්‍රත්‍යධම්මයෝයි. ඒ ප්‍රත්‍යධම්මයෝ තුමූ සංඛතධම්ම සංඛ්‍යාත ප්‍රත්‍යොත්පන්නධම්මන්ට හෙතුප්‍රත්‍යාදි ධම්මයන් ආකාරවකින් උපකාරවෙන්ද, ඒ ප්‍රත්‍යධම්මයන්ගේ හා ප්‍රත්‍යොත්පන්නධම්මයන්ගේද විභාගය මේ සම්මසනසංග්‍රහයට අනතුරු තන්හි ඒ ධම්මයන්ට සුදුසු පරිද්දෙන් මෙතැන් පටන් කියම්හයි යනු ප්‍රතිඥාගාථාවෙහි භාවිත යි. ඒ ප්‍රත්‍යසංග්‍රහය වනාහි ප්‍රතිත්‍යසමුත්පාදක්‍රමය, ප්‍රසථානක්‍රමයයි දෙවැදැරුම් වන්නේසි. ඔවුන් අතුරෙන් සද්භාවභාවිභාවාකාර මාත්‍රයෙහිත් හෙවත් ඒ ඇති කල්හි ඒ ඇති විමයයි කියන ලද නෙවත් අවිද්‍යාව ඇති කල්හි සංස්කාරය හටගන්නේය යි යන නත්භාවභාවිභාවාකාර මාත්‍රයෙහිත් හදුන් වනු ලබන ක්‍රමය නෙවත් සලකුණු ලබන ක්‍රමය හා අතද්භාව භාවිභාවාකාර මාත්‍ර සංඛ්‍යාත ඒ නැති කල්හි ඒ නැති විමය යි කියන ලද අනද්භාවභාවිභාවාකාරමාත්‍රයෙහිත් සලකුණුකරණ ලද ක්‍රමයද පටිච්චසමුප්පාද ක්‍රමය නම් වෙයි.

මේ පටිච්චසමුප්පාදක්‍රමයෙහි අවිද්‍යාව ප්‍රත්‍යය හා සංස්කාරය ප්‍රත්‍යොත්පන්නද වන්නාක් මෙන් සංස්කාරය ප්‍රත්‍යය හා විඥානය ප්‍රත්‍යොත්පන්නද වන හෙයින් මේ වාදඝට්ටකප්‍රත්‍යයාකාරයෙහි දෙවැළලුස්පදය ප්‍රත්‍යය හා නැවත ඒ දෙවැළලුස්පදය ම ප්‍රත්‍යොත්පන්නද වෙත්. එසේ ඒ අහිත් නත්තේ අවිද්‍යා සංඛ්‍යාත මොහයට උපකාරධම්මයෙක් නැත්තේ වී නම් ඒ අවිද්‍යාව අහෙතුඅප්‍රත්‍යධම්මයක් විඅයුතුය. එකල්හි අහෙතු ප්‍රත්‍යය මිථ්‍යාදෘෂ්ටියෙහි වැටෙයි. එසේ අහිත නොනතයුතුයි.

"ජරාමරණ මූවජ්ජය පිළිතාන මහිණ්ණතෝ,
ආසවානං සමුප්පාදා අවිජ්ජා ච පවත්තති"

යන ගාථාවෙහි කී නයින් ජාතිප්‍රත්‍යයෙන් හටගන්නා වූ ජරාමරණයෙන් හෙවත් ජරාමරණප්‍රත්‍යයෙන අවිද්‍යා නැතිති

ඵලඤාණවශෙන්නා හෙයින් අනාගම්වූ ඵලය ප්‍රත්‍යය ව පළමුවන හෙතුව ප්‍රත්‍යෝත්පන්න වන හෙයින් මේ සංඛාරවක්‍රය වනාහි හාත්පසින් බැඳි පවත්නේයි. පඨානයය වනාහි ආභවපච්චය සිතිය යි කියත්. මේ ආභවපච්චයසිතිය වනාහි සමහර අභය හිරිදිංසිහු නාණ්ඩකාලූ ආදියෙහි පැහැර දෙයනා කල හෙයින් ආභවපච්චයසිතිය යි කියත් ඔවුන්ගේ අදීදීම වනාහි ශ්‍රවණ මාත්‍රයෙන් ම පරිහාස කටයුතු අඳ්‍ය කිමක්වෙයි. පඨානක්‍රමය හෝ අනිත් ක්‍රමයක් හෝ නාණ්ඩකාලූ ආදියෙහි නො පැහැර දෙශනා කොළකොට හැක්කේයි. එසේ අසිහි ගන්නේ චිත්ත සිහලු නිවකධර්මය ම නාණ්ඩකාලූ ආදියෙහි පැහැර දෙශනා කල හෙයින් විවකත්‍රධර්මය ම ආභවපච්චයසිතිය යුතුයි. එනෙයින් නොවියත් හගිරිනඛයන්ගේ අසිහි කිම පණ්ඩිතයන්ට හා සෞත්පාදනයට කාරණා වෙයි. එසේ හෙයින් පටිච්චසමුප්පාද ප්‍රත්‍යයන්ගේ ම විවිධාකාර ප්‍රත්‍යය ධර්මයෝ ආභවපච්චයසිතිය යි දතයුතුයි

"අවිජ්ජා පච්චයා සංඛාරා" යන්නෙහි අවිද්‍යා සංඛ්‍යාත මොහය ප්‍රධාන හෙතුව වෙයි. සංස්කාරය ප්‍රධාන ඵලය වෙයි. මේ අවිද්‍යා සංඛ්‍යාත මොහය සහජාතප්‍රත්‍යය, අනන්තරප්‍රත්‍යය, සමනන්තරප්‍රත්‍යය, සහජාතප්‍රත්‍යය, අඤ්ඤමඤ්ඤප්‍රත්‍යය, නිස්සයප්‍රත්‍යය, උපනිස්සයප්‍රත්‍යය, යනාදීවූ විවිධාකාරයෙන් අවිද්‍යාව සංස්කාරයට උපකාර වන හෙයින් පටිච්චසමුප්පාදය ප්‍රධාන උපකාරවශයෙන්ද, පඨානක්‍රමය අප්‍රධාන උපකාර ධර්මයන්ගේ වශයෙන්ද, අසිහත් කල්හි කිසි අවිවිරෝධයෙක් නොවන්නේ මැයි. මේ පටිච්චසමුප්පාද පඨාන යන ක්‍රමවය වනාහි විශුද්ධිමාර්ග අට්ඨාදියෙහි මෙන් මිශ්‍රනොව අවිවණ්ණා කරන් නමුදු මේ ප්‍රකාරණයෙහි ඒ ඒ ප්‍රත්‍යයුග්මය වෙන් වෙන් කොට අසිහි කිරීම හැයි යනු භාවයි. "අවිද්‍යා" යනු විඳියං න විඳති. න විඳියං විඳති. යනාදී නොයෙක් ක්‍රමයෙන් අවිවණ්ණා කරන් නාහු නමුදු "අඤාවිරතිමය සංඛාරෙ සතත ජවාපෙති" යන වාක්‍යයෙන් වණ්ණාගම වණ්ණලොපාදී පවත්වනිරුක්ති නයින් * "අතත" ශබ්දයාගේ අකාරය හා "විරහිත" ශබ්දයාගේ විකාරය හා "ජවාපෙති" යන ශබ්දයාගේ ජකාරයද ඉගණ ඇදිසවේ භාවය කොට අවිජ්ජාය යි කියත්.

ඒ අවිද්‍යාව වනාහි සූත්‍රානුක්‍රමයෙන් දුඃඛාදී චතුරාර්ය සත්‍යය හා පූර්වානුදාදී සහරතැනද නො දැක්ම අවිද්‍යාවයි

* වණ්ණාගමා වණ්ණවිපත්තියෝච විකාරාපරඤ්ච වණ්ණවිකාර නාසෙඤ්ච ධාතුසාහනාදිනිරුත්තිඤ්ච යෙන යොගෙන දුවිඤ්ඤෙ පවත්තිං නිරුක්තෙති.

කියන් අභිධම්ක්‍රමයෙන් දෙලොස් අකුශල චිත්තයෙහි පවත්නා හෙයින් දෙලොස් වැදෑරුම්යයි කියත්. ඒ අවිද්‍යාප්‍රත්‍යය හෙතු කොටගෙණ හෙවත් අවිද්‍යාවගේ උපකාරයෙන් කාමාවචර රූපාවචර තෙලෙස් කුශලකර්ම සංඛ්‍යාතවූ පුණ්‍යාභිසංස්කාර යද, දෙලොස් අකුශලචෙතනා සංඛ්‍යාතවූ අපුණ්‍යාභිසංස්කාර යද; සතර අරූපාවචර කුශලචෙතනා සඞ්ඛ්‍යාතවූ ආනෙඤ්ජාභි සංස්කාරය ද, පහළ වෙත්. මේ සතරාකාර කුශලචෙතනාවන් අතුරෙන් මහාකුශල චෙතනා අටය, රූපාවචර කුශලචෙතනා පසය, අරූපාවචර කුශලචෙතනා සතරය, යන මෙතෙක් සංස්කාරයෝ වනාහි මහාකුශල් සිත් අටය, රූපාවචර කුශල්සිත් පසය, අරූපාවචර කුශල් සිත් සතරය යන සතළොස් ලෞකික කුශලචිත්තයන් හා යෙදුනා වූ චෙතනා චෛතසිකයෝ ය "අපුණ්‍යාභිසංස්කාරය" යනු දෙලොස් අකුශල චිත්තයෙහි යෙදුනාවූ චෙතනාවෝ දෙලොස්දෙනායි. මෙසේවුන් අතුරෙන් සත ළොස් ලෞකික කුශලචිත්තයෙහි එකාන්තයෙන් අවිද්‍යාව නොයෙදෙන්නේයි. දෙලොස් අකුශල චිත්තයෙහි වනාහි ඒ චෙතනා චෛතසිකයන් සමග එකාන්තයෙන් අවිද්‍යාව යෙදෙන්නේමය.

අවිද්‍යාව අනොන්‍යසම්බන්ධියෙන් යෙදෙන්නා වූ දෙලොස් අකුශලචිත්තයෙහි දෙලොස් චෙතනාවන්ට අඤ්ඤමඤ්ඤප්‍රත්‍ය ය, සහජාතප්‍රත්‍යය, හෙතුප්‍රත්‍යය, අනන්තරප්‍රත්‍යය, සමනන්තර ප්‍රත්‍යය, යනාදී පඨානාගත බොහෝ ප්‍රත්‍යාඛ්‍යාත උපකාර වන හෙයින් අකුශල සංස්කාරයන්ට අවිද්‍යාව උපකාර වේ වා. සතළොස් ලෞකික කුශල චිත්තයෙහි එකාන්තයෙන් අවිද්‍යාව නැත්තේ මය. එසේ නැත්තාවූ අවිද්‍යාව කෙසේ උපකාර වන්නේද යත්? මාගීයෙන් අප්‍රහීණවූ අනුසය වශයෙන් පවත්නා අවිද්‍යාවගේ උපකාරයෙන් කාමාවචර කුලශයන්ට උපනිශ්‍රය ප්‍රත්‍යයෙන් අවිද්‍යාව උපකාර වන්නේය. ඊට උපමා කවර යත්? පළිතයක් මුදුනෙහි සිව ගෙණ ප්‍රපාතයදෙස බලන්නාවූ පුරුෂ යාහට ඒ පළිතප්‍රපාතයෙහි දිව්‍යාඞ්ගනාවන් සිටින බව දැක ඒ දිව්‍යාඞ්ගනාවන් ලබා ගන්නා පිණිස පළිතයෙන් පනින්නේය. ඒ පළියයෙන් පැණීම හෙතුකොටගෙණ මතු විය යුතු ආදීනව අවිද්‍යාව හෙතුකොටගෙණ නොපෙණී යාමෙන් පළිතප්‍රපාත යට පැමිණ විනාශ වන්නාවූ අඥාන පුරුෂයා මෙන් සදිවා ලෝකයෙහි වසන්නාවූ දිව්‍යප්සරාවන් ලබා ගන්නා අදිසෙන් අවිද්‍යාව හෙතුකොටගෙණ කාමාවචර කුශල් රැස් කරන්නේය. ඒ පුරුෂ තෙමේ පළිතයෙන් පනින්නාක් මෙන් කාමලෝක යෙහි ඉපදීමට හෙතුවූ කාමාවචර කුශල් රැස්කොට සුගතියෙහි

ඉපිද පඤ්කම්සැප බිඳිනු පිණිස සත්ත්වඝාතන සුරාපාන පරස්ත්‍රී සෙවනාදී මහාසාවද්‍ය පව් කොට ඒ පාපඅන්ගේ විපාක විඳින පිණිස නැවත සතර අපායෙහි උපදනේහි. එහෙයින් දිවසිරි ලබා ගන්නා පිණිස කාමාවචර කුශල් රැස් කිරීම පවිත්‍රප්‍රපාත යෙහි සිටිනා දෙවඟනන් ලබනු පිණිස අඥානකම හෙතුකොට ගෙණ පවිත්‍රයෙන් පනින්නාවූ පුරුෂයෙකුට බදුවෙයි. එහෙයින් කාමාවචර කුශලයන්ට අවිද්‍යාව උපනිශ්‍රය ප්‍රත්‍යයෙන් උපකාර වෙයි.

අනික් පුරුෂයෙක් තෙමේ මිපැණියෙන් වැකුනු කඩුමුව හත ලෙවින්නාක් මෙන් හෙවත් කඩුමුවහත ලෙවීමෙන් දිවසිදිනා බව අවිද්‍යාව කරණකොටගෙණ නොදැකීමෙන් මිපැණියෙහි ආසාව මුල් කොට ගෙණ කඩුමුවහත ලෙවින්නාක්මෙන් පවත්‍රකාර වූ රූපාවචරධ්‍යාන උපදවා, මදකලක් බ්‍රහ්මලෝකයෙහි විඳිනාවූ සැපයෙහි ඇලුම්කොට ඒ බඹලොව ආයු පිරිහීමෙන් නැවතත් කාමධාතුවට පැමිණ සතර අපායට භාජන වන බව අවිද්‍යාවෙන් නොපෙණී රූපාවචර කුශල් රැස් කෙරෙයි. මෙසේ දුර සිට අවිද්‍යාව රූපාවචර කුශලයන්ට උපකාර වන හෙයින් උපනිශ්‍රය ප්‍රත්‍යයෙන් උපකාර වන්නේමැයි.

අනිකුදු මං මුළාවූ පුරුෂයෙක් තෙමේ පිශාචනගරයට යන්නාවූ මාගීයක් දැක මේ අභයපුරයට යන මාගීයකැයි සිතා අවිද්‍යාවෙන් මුළා වී පිශාචනගරයට වැද යකුන්ට බත් වෙයි. එපරිද්දෙන් සතර අරූපාවචර කුශල චෙතනාවන් රැස් කොට සදකාලික සැප විඳිමහයි සිතා සතර අරූපාවචර භවයෙහි ඉපිද බොහෝ කාලයක් මුදුල්ලෙහි කිසි අඩුවක් නැත්තාවූ සතර අරූතලයෙහි ප්‍රමාද වන්නේහි. මෙසේ අවිද්‍යාව ආනෙඤ්ජාභි සංස්කාර සංඛ්‍යාතවූ සතර අරූපාවචර චෙතනාවන්ට දුර සිට උපනිශ්‍රය ප්‍රත්‍යයෙන් උපකාර වන්නේ යි,

අපුණ්‍යාභි සංස්කාරයන්ට කෙසේ උපකාරවන්නේ ද යත්? විෂ මිශ්‍රවූ රසඅොජනයක් බොහෝ කල් ජීවත්වනු කැමති පුරුෂයෙක් අනුභව කරන්නාක් මෙන් ද, අඟුවිමූත්‍රපුණඛකුණ පාදියෙන් පිඩා කරණු ලබන පුරුෂයෙකු මෙන් ද, බොහෝ කලක් ජීවත් වනු පිණිස සත්ත්වඝාතන සුරාපානාදිය කොට රස මසවුලෙන් යුකතවූ භොජනය අනුභව කරයි. එසේ ම පරස්ත්‍රී පරපුරුෂ සෙවනාදියෙන් සිත පිනවීමෙහි උත්සාහකරයි. මෙසේ දෙලොස් අකුශල චෙතනාවන් හා අවිද්‍යාව අන්‍යොන්‍යසම්බන්ධ

යෙන් යෙදෙන ලෙසින් අඤ්ඤමඤ්ඤප්‍රත්‍යය, සහජාතප්‍රත්‍යය, හෙතුප්‍රත්‍යය ආදී නව ආකාරයකින් උපකාර වේ සි.

මේසේ අවිද්‍යා සංඛ්‍යාතවූ ප්‍රධාන හෙතුවෙන් චෙතනා සංඛ්‍යාතවූ ප්‍රධානඵලය ඇවිගැණීම තද්භාවභාවිභාවාකාර ලක්ෂණයවේ හෙතුප්‍රත්‍යය, අඤ්ඤමඤ්ඤප්‍රත්‍යය, සහජාතප්‍රත්‍ය ය ආදී නවාකාරයකින් උපකාර වීම ආහච්චපච්චයඝිති ලක්ෂණය වේ. හෙවත් විශෙෂ උපකාරයෝ ය සි දතයුතු සි. ඒසංස්කාර ප්‍රත්‍යයෙහි ප්‍රතිසන්ධි සංඛ්‍යාත එකුන්විසි ප්‍රතිසන්ධිවිපාකය ප්‍රවෘත්තිවිපාක වශයෙන් දෙතිස් ලෞකික විපාක විඤ්ඤාණයද, ඇවඟන්නෙ සි. හෙවින් චාදස අකුශල සංඛ්‍යාත අපුණ්‍යාභි සංස්කාරප්‍රත්‍යයෙන් නරයතිරශ්චික් ප්‍රේත අසුර සංඛ්‍යාත වූ සතර අපාය භූමියෙහි උපෙක්ෂා සහගත අකුශල විපාක සන්තීරණ සංඛ්‍යාතවූ එකම ප්‍රතිසන්ධි විපාක විඤ්ඤාණය පහළ වන්නේ සි. ප්‍රවෘත්ති කාලයෙහි චක්ඛාභි අවිච්චිමහානරකය ආදි කොට ඇති මහානරකයෙහි කුශල විපාකය අප්‍රකට නමුදු බුබ්බොලා හලාදියෙහි ධම්මඤ්ඤාණ වශයෙන් උපදනා ආලොකාදිය සමඛ නිව කුශල විපාක චක්ඛුර්විඤ්ඤාණය උපදින්නේසි.

ආයුෂ්මත් මහාමුගලන් තෙරුන් වහන්සේ තමන් වහන්සේගේ ඍර්ධි බලයෙන අවිචිමහානරකයෙහි හිනිහඳ මොහොතක් කල් වැඩ සිට තමන් වහන්සේගේ ශරීරය සියලු නිරිසතුන්ට පෙනේව සි අධිෂ්ඨාන කොට තමන් වහන්සේගේ ධම් කථාව ද සියලු නිරිසතුන්ට ඇසේව සි අධිෂ්ඨානයෙන් ධම්දෙශනා කළ කල්හි අවිචිමහානරකවාසි සියලු සතුන්ට කුසල විපාක චකඛුවිඤ්ඤණ සොතවිඤ්ඤණ සම්පටිච්ඡන සන්තීරණ චිත්තයෝ උපන්නාහුය. ප්‍රෙතලොකයෙහි ද එසේම බුබ්බාදි උතුමන්ගේ ඍඞ්ධ්‍යානුභාවයෙන් ධම්දෙශනාදිය කරණ කල්හි ඔවුනට ද කුශල විපාන චකඛුවිඤ්ඤණ සොතවිඤ්ඤණාදිය උපදී චක්‍රවර්තිරජතුගේ ඇතුළාභරණ අස්වාභරණය ආදි කොට ඇති සියලු උත්තම පරිභොග භාණ්ඩය සම්පත්තිය වඩනයන්ට ද, අපරාපරියවෙදනීය කම්මයන්ගේ කුශල විපාකයෝ ලැබෙත් මැ සි. දව්‍යනාගභවනය, ද්‍රව්‍යතරුඞ්ගභවනය, ආන ඥදනන්හි උපදනා සියලු යක්ඛයන්ගේ පටිසන්ධිය ද අපායපටිසන්ධිය වන්නේ නමුදු සියලු ප්‍රවෘත්තිවිපාකයෝ අටමහාකුශලයෙන් හටගත් අපරාපරියවෙදනීය කම්මයන්ගේ විපාකයෝ සි. එහෙයින් ඔවුන්වද දෙව් යන ට මෙන්ම දිව්‍යවිමාන කල්පවෘක්ෂ ධුරාභොජනාදිහු ලැබෙත් මැසි. අවමහාකුශලයන්ගේ ඉතා දුර්වල වූ කාමාවචර කුශල

චෙතනා සංඛ්‍යාත දුහෙතුකලෝභ කුශල සංස්කාරයන්ගේ හෙතුවෙන් මනුෂ්‍යලෝකයෙහි බොහෝ සෙයින් ශූද්‍රමනුෂ්‍යයන්ගේ ද ප්‍රතිසන්ධිය හා දසඅකුසලකර්මාදිය කරන්නාවූ හීනමනුෂ්‍යයන්ගේද ජාත්‍යන්ධ ජාතිබධිර ජාතිමූග ජාතිපණ්ඩක ජාතිදාස තොබ්‍යජනකාදී අඛණ්ඩකල සම්භවයන්ගේද, භූමිත්‍රීත්‍ව විනිපාතික අසුර සංඛ්‍යාත ඥාතිප්‍රේතමලයක්ෂාදීන්ගේ ප්‍රතිසන්ධිය ද, කුශලවිපාක උපේක්ෂාසන්තීරණ චිත්තයෙන් ප්‍රතිසන්ධිගෙණ ප්‍රවෘත්ති කාලයෙහි අහෙතුකකුශල විපාක අට හා අහෙතුක අකුශල විපාක සත ද යන මේ පසළොස් විපාකවිඥානය ලැබෙන්නේයි. අටමහාකුශලයන් අතුරෙන් ත්‍රිහෙතුක ලාමකකුශල කර්මයෝ සතරය, දුහෙතුක උත්කෘෂ්ට කුශල කර්මයෝ සතරය යි යන මේ සංස්කාරයන් අටදෙනාගේ උපකාරයෙන් ඥානවිප්‍රයුක්ත සතරප්‍රතිසන්ධි විපාකවිඥානයෝ ප්‍රතිසන්ධි වශයෙන් පහළ වෙත්. ප්‍රවෘත්තිකාලයෙහි වනාහි ඥානවිප්‍රයුක්ත මහාවිපාකයෝ සතරය, අහෙතුක කුශල විපාකයෝ අටය යි යන මේ දොළොස් විපාක විඥානයෙහෙනස් පහළ වෙත්.

මේ සතරවිපාකප්‍රතිසන්ධිය වනාහි සදිව්‍යලෝකයෙහි අලෝභාක්‍යදෙවියන්ගේ හා සිඟලු අසුරයන්ගේ ද මනුෂ්‍යලෝකයෙහි අලෝභාක්‍ය මිනිසුන්ගේ ප්‍රතිසන්ධිය වන්නේ යි. එහෙයින් ඔවුන්ට එම ආත්මභාවයෙහි ධ්‍යානමාර්ගඵලාදිය නො ලැබෙන්නේ මැයි. එහෙයින් ඔවුන්ට ඇත්තාවූ සෘර්ධිය අභිඥාබලයෙන් නොව පකිණ්ණට ඇත්තාවූ සෘර්ධිය මෙන් කර්මයෙන් හටගන්නේ යි. ත්‍රිහෙතුකමහාකුශලයන් සම්බන්ධ උත්කෘෂ්ටවූ සංස්කාර සතරදෙන හෙතුකොවගෙණ සදව්‍යලෝකයෙහි මහෝභාක්‍ය දෙවියන්ගේ හා මනුෂ්‍යලෝකයෙහි බුඛප්‍රත්‍යෙක බුඛ ආර්‍යශ්‍රාවක චක්‍රවර්ත්තිරාජාදී වූ සිඟලු උත්තමසත්ත්වයන්ගේ ප්‍රතිසන්ධිවිපාක විඥානය පහළවන්නේයි. ඔවුන්ගේ ප්‍රතිසන්ධි විඥානය වනාහි "අඤ්ඤතරං හෙතුනං පච්චයා ගතිසම්පත්තියා උපපත්තිසම්පත්තියා" යනු පටිසම්භිදාමාර්ගයෙහි වදාළ බැවින් ඒ කාමාවචරකුශලකර්මය රැස් කරන්නා වූ කල්හි උපදනා ප්‍රථම වීථියෙහි සෙදුනා වූ අලෝභ අදෝෂ අමෝහ යන හෙතුහු තුන්දෙනය, ඒ කර්මයෙන් සුගතිප්‍රතිසන්ධිය ගැණීමට සුදුසු වූ මරණාසන්නකාලයෙහි උපදනා ත්‍රිහෙතුක මහාකුශල චිත්තවීථියෙහි සෙදුනා වූ අලෝභඅදෝෂ අමෝහ යන හෙතුහු තුන්දෙනය, ඒ කර්මයෙන් සුගතිප්‍රතිසන්ධි ගන්නා වූ කල්හි උපදනා මහාවිපාක පටිසන්ධිවිඥානයෙහි සෙදුනා වූ අලෝභ අදෝෂ අමෝහ යන හෙතුහු තුන්දෙනය යන මේ හෙතුහු තවදෙනාගේ * උප

* නිකායසංග්‍රහයෙහි ලෝභ මෝහ වශයෙන් අටදෙනෙක් වෙත.

කාරයෙන් ඔවුන්ගේ ප්‍රතිසන්ධි විඤ්ඤාණසම්ප්‍රයුක්ත වන බැවින් පාරිහාරිකප්‍රඥා සංඛ්‍යාතවූ සමථවිදර්ශනා භාවනාබලයෙන් උපන්නාවූ ප්‍රඥාවෙන් ධ්‍යානලාභීඵල සංඛ්‍යාත උත්තරි මනුෂ්‍ය ධර්මය ම ලැබිය හැක්කේ ම ය, එහෙයින් පට්ඨානාභිධර්මාගමයෙහි "ආයුහනාභිසඞ්ඛාරනිමිත්තං නිකන්තිඅභිසඞ්ඛාරනිමිත්තං විඤ්ඤාණං පටිසන්ධික්ඛණේ තිණ්ණන්නං නිකන්තිඅභිසඞ්ඛාරනිමිත්තං විඤ්ඤාණං" අර්ථතඃ හේතුතඃ ප්‍රවර්තිසම්පත්තිතඃ උපපත්ති හෝති යනු වදාළේයි.

මේ "සංඛාරපච්චයා විඤ්ඤාණං" යන පදයෙහි විභාගයයි.

"විඤ්ඤාණපච්චයා නාමරූපං" යන තෘතීය පදයෙහි භාවය මෙසේයි. නාමඤ්ච රූපඤ්ච නාමරූපඤ්ච නාමරූපං" යනුවෙන් සරූපෙකසෙසසමාසය දත යුතු යි. මෙසේ සරූපෙකසෙසසමාස කිරීමෙන් කවර ප්‍රයෝජනයෙක්ද යත්? ඒ සමාසය නො කෙළේවී නම් පච්චෙකාරභවප්‍රතිසන්ධිය මුත් වතුර්වොකාරභවප්‍රතිසන්ධිය නො ලැබෙන්නේ මැයි. එහෙයින් "නාමඤ්ච රූපඤ්ච" යන පළමුවන පදය පඤ්චවොකාරභව වශයෙන්ද, 'නාමඤ්ච' යන පදය චතුර්වොකාරභව වශයෙන්ද රූපඤ්ච, යන පදය එක වොකාර භව වශයෙන්ද, ගොදගත යුතුයි. මෙහි විඤ්ඤාණපච්චයා නාමරූපං" යන වචනයෙන් විඤ්ඤාණප්‍රත්‍යයෙන් නාමරූපය හටගන්නේය යි කී කල්හි "සංඛාරපච්චයා විඤ්ඤාණං" යන පදයෙහි මෙන් හේතුඵල දෙදෙන භවදෙකෙක්හි ලැබෙන්නාක් මෙන් "විඤ්ඤාණපච්චයා නාමරූපං" යන පදයෙහි නො සිතිය යුතු යි. "සංඛාරපච්චයා" යනු මේ ජාතියෙහි රැස් කරණ ලද්දාවූ කුශලාකුශලකර්ම චේතනාවෝ ය. "සංඛාරපච්චයා විඤ්ඤාණං" යන පදයෙහි අනාගතභවයෙහි ලැබෙන්නා වූ හෙවත් මේ ජාතියෙහි රැස් කළාවූ කුශලාකුශලකර්මහේතුවෙන් අනාගත ජාතියෙහි හට ගන්නා වූ පටිසන්ධිප්‍රවෘත්ති විපාක විඤ්ඤාණය යි-අර්ථ ගන්නා හෙයින් හේතුඵලදෙදෙනාගේ ලැබීම භවදෙකෙක්හි වන්නාක් මෙන් "විඤ්ඤාණපච්චයා නාමරූපං" යන්නෙහි නො ලැබෙන්නේ මැ යි. එසේ වී නම් කෙසේ ලැබෙන්නේ ද යත්? අහසින් බිමට දමන්නාවූ උණ ලී මිටි තුණක් එකවිට අහසින් අවුත් භූමියෙහි පිහිටන්නා වූ කල්හි ඒ මිටිතුණ ඔවුනොවුන්ට උපකාර වී මෙන් භූමියෙහි යම්සේ කෙළින් පිහිටන්නාහු වෙත් ද එකල්හි ප්‍රත්‍යය වූ උණ ලී මිටිය හා ඵලයවූ මිටිදෙකද ඉදිරිපසු නො වී එකවිට භූමියෙහි පිහිටන්නාක් මෙන් පටිසන්ධිවිඤ්ඤා

ණය හා තත්සහගම්ප්‍රයුක්ත වූ වේදනාදී නාමස්කන්ධත්‍රයද, මනුෂ්‍ය ලෝකයෙහි ගබ්භසෙය්‍යකසත්ත්වයන්ට පටිසන්ධිවිඤ්ඤාණය හා සමග පහළ වන්නා වූ කාය, භාව, වත්ථු සංඛ්‍යාත රූපකලාපත්‍ර ය ද, මාතෘකුක්ෂි නැමති භූමියෙහි අඤ්ඤමඤ්ඤප්‍රත්‍යය, සහ ජාතප්‍රත්‍යය, සම්ප්‍රයුක්තප්‍රත්‍යය, අවිගතප්‍රත්‍යය, යන පඨාන ගත සතර ප්‍රත්‍යයකින් ඔවුනොවුන්ගෙන් ඔවුනොවුන්ට උප කාරව එකවට පිහිටන්නේය යි දතයුතු යි. එසේ අවබෝ ධ යුතු බැවින් "විඤ්ඤාණපච්චයා" යන්නෙන් ප්‍රතිසන්ධිවිඤ්ඤාණය ද "නාමරූපං" යන්නෙන් ඒ ප්‍රතිසන්ධිවිඤ්ඤාණය හා එක්ව ඉපදුනාවූ වේදනා සංඥා සංස්කාර යන නාමස්කන්ධත්‍රයද, කාය හා භාව වත්ථු සංඛ්‍යාතවූ රූපකලාපත්‍රය ද, යන මේ විඤ්ඤාණ, නාම, රූප, තුන්දෙන අතරින් බිමට දැමූ වෙණුකලාපත්‍රය ඔවුනොවුන් ඉදිරිපසු නොව එකවිට භූමියෙහි පිහිටන්නාක් මෙන් ම ප්‍රත්‍ය ය වූ විඤ්ඤාණය හා ප්‍රත්‍යෝත්පන්න වූ නාමරූපවය ද, කෙසා ශ්‍රයක් පමණකුදු ඉදිරිපසු නො වී එකවිට පිහිටන්නේ ය යි දත යුතු යි.

"කායකලාපය" යනු මේ ශරීරය භවගන්නා වූ මුල් ධාතු වයි. ඒ කලාපය ද පඨවී ආපෝ තේජෝ වායෝ වණ්ණ ගන්ධ රස ඔජා" යන ශුද්ධාෂ්ටකකලාපය හා ජීවිතෙන්ද්‍රියය, කායප්‍රසා දය, යන රූපදශයකින් යුක්ත කලාපයක් වේ යි. "භාවකලා පය" යනු ස්ත්‍රීභාවයක් වී නම් ස්ත්‍රීභාවරූපය හා සමග ද, පුරුෂ භාවයක් වී නම් පුරුෂභාවරූපය හා සමග ද, කායදශකයට කිහිපයක් මෙන් රූපදශකකලාපයක් වේ යි. "වත්ථුකලාපය" යනු හෘදය වත්ථුව හා සමග කායකලාපයට කිහිපයක් මෙන් දශකකලාපයක් වේ යි.

මේ රූපකලාපත්‍රයකින් යුක්ත වූ ම්වික්‍රුස භවගන්නා වූ මේ සත්ව තෙමේ පළමුවෙනි දවස්හී ශ්‍රීලඝවනයෙහි වසන්නාවූ එදවස් උපන් ජාතිමත් එළුවෙකුගේ බඩ මසිලක් ගෙණ ප්‍රසන්න වූ තලතෙලෙහි ගලා ඔසවා ගත් කල්හි ඒ ලෝමාග්‍රයට රැස් වෙන්නා වූ තෙල්බිඳක් සමානවන්නේය යි- "පඨමං කලලං හොති" යනාදී ඝකඛසංයුත්තකයෙහි වදාළ නාථා අටුවා යෙහි විස්තර කරණ ලද්දේ යි. එතකුදුවුවත් ඔපපාතික සත්ව යන්ගේ පහළවීම දහසයහැවිරිදි වයස් පමණ වූ තරුණවෙශ යක් ඛෑවින් සියලු රූපකලාපයන්ගේ පහළවීම ප්‍රතිසන්ධිවිඤ්ඤ නය හා සමග ඉදිරිපසු නො වී එකක්ෂණිකව සිඛවන්නේ යි. (මඤ්ඤූසාපජ්ඣටීකා,) මහාපදුමාදී පන්සිය යක් පසේබුදුවරුය,

පොක්ඛරණීති බ්‍රාහ්මණියා ය, යහාදි සංසෙදජසත්ත්වයන්ගේ ප්‍රතිසන්ධි කාලයෙහි ද, සිංහලු රූපකලාපයන් හා සමඟ ප්‍රතිසන්ධි විඤ්ඤාණය ඉදිරිපසු නොවී පහළවූහ. ගබ්භසෙය්‍යකසත්ත්වයන්ගේ ප්‍රතිසන්ධි කාලයෙහි රූපකලාපත්‍රයක් පහළවීම යෙහුයුක්තියාය වශයෙන් දතයුතු ය. කුමක්හෙයින ඇත්? නපුංසකපඬකඑළුහ තොබ්‍යඤ්ජනකාදි සත්ත්වයන්ගේ ප්‍රතිසන්ධි කාලයෙහි භාවකලාපය හැර අවශෙෂ රූපකලාපවය පහළවන හෙයිනි.

මෙ "විඤ්ඤාණපච්චයා නාමරූපං" යන පදයෙහි විභාගය යි.

—— ——

"නාමරූපපච්චයා සළායතනං" යනු පදයෙහි විභාග කෙසේ ඇත? නාමරූප සඞ්ඛ්‍යාත වූ ප්‍රතිසන්ධිවිඤ්ඤාණය තත්සම්ප්‍රයුක්තනාමස්කන්ධත්‍රය ඒ ප්‍රතිසන්ධිවිඤ්ඤාණයා හා සමඟ ඉදිරිපසු නොවී පහළ වන්නා වූ කාය-භාව-වත්ථු සඞ්ඛ්‍යාත වූ රූපය ද යන නාමරූපවය හෙතුකොටගෙණ චක්ඛු, සොත, ඝාණ, ජිව්හා කාය, මනො" යන ආයතනයෝ සදෙන හෝ ඡ්ඨායතන සංඛ්‍යාත වූ මනායතනය හෝ පහළවෙයි. ඒ හෙයින් පහළ වන්නාහුද ඇත්? ප්‍රතිසන්ධිවිඤ්ඤාණය හටගත් දවස පටන් සැත්තැසත්රැයක් ගිය කල්හි ගබ්භසෙය්‍යකසත්ත්වයන්ගේ චක්ඛුප්‍රසාදය ප්‍රධාන කොට ඇති රූපදශයකින් යුක්ත වූ චක්ඛුකලාපය ද, ඒ ලඟ සතියෙහි එසේම ශ්‍රොත්‍රප්‍රසාදය ප්‍රධාන කොට ඇති රූපදශයකින් යුක්ත වූ ශ්‍රොත්‍රකලාපය ද, ඒ ලඟ සතියෙහි ඝ්‍රාණප්‍රසාදය ප්‍රධානකොට ඇති රූපදශයකින් යුක්ත වූ ඝ්‍රාණ කලාපය ද, ඒ ලඟ සතියෙහි ජිව්හාප්‍රසාදය ප්‍රධාන කොට ඇති රූපදශයකින් යුක්තවූ ජිව්හාකලාපය ද, ක්‍රමයෙන් පහළවෙත්.

ගබ්භසෙය්‍යකසත්ත්වයන්ට එකෑහි ප්‍රතිසන්ධිය එක් කම්මයකින්ද හෙවත් කාය-භාව-වත්ථු නම රූපකලාපත්‍රයකින් යුක්තවූ ප්‍රතිසන්ධිවිඤ්ඤාණය එක් සමයකින් පහළවූවාට පසු ප්‍රතිසන්ධියෙන් සැත්තැසත්රැයක් නික්ම ගිය කල්හි සංසාරයෙහි දෙන ලද රූපදානමය කාමාවචර කුශලකර්මබලයෙන් හටගන්නා වූ මහාභූතයන්ගේ ප්‍රසාදය හෙවත් ඒ මහාභූතයන්හෙත් පෙරි එන්නාවූ පෙතලය සසම්භාරවඩිඪි සංඛ්‍යාත වූ ඕජාගණඩයෙහි ඉගවත්ණඩිලුළුමෙන් පරිච්ඡින්න වූ කාළමණඩලාකාරයන් මධ්‍යයෙහි අභිඤ්ඤෙය්‍ය සිව්යවුන්ගේ රූපයන් ඔලිබිඹු එන්නා වූ ප්‍රදෙශයෙහි හෙවත් මුංපියල්ලන් පමණ විශාල වූ ප්‍රදෙශයෙහි ඇස් පවලසත ගලා ගොස් පවත්නේය. ඒ ප්‍රසාදය එක් කොට හත් කල්හි මනුෂ්‍යයන්ගේ ඇසෙහි උකුණුනිසක් පමණ වන්නේය යි

කියත්. ඒ ප්‍රසාදය ආශ්‍රය කොට හෙණ පවත්නාවූ විඥානය චක්ඛුවිඤ්ඤාණයයි කියත්. ඒ චක්ඛ්වායතන සංඛ්‍යාතවූ සෙසු ප්‍රසාදය රූපදශකමය කාමාවචර කුශලකර්මයෙන් පහළවූයෙහින් ඒ චක්ඛායතනය නිසා පවත්නාවූ විඥානයෙන් රූප දක්නේ වේයි.

"ශ්‍රෝත්‍රායතනය" යනු චක්ඛ්වායතනය පහළවූ සතියට අනතුරුවයිහෙයි සංසාරයෙහි ශබ්දදශකය දීමෙන් රැස් කරගත් කාමාවචර කුශලකර්මබලයෙන් මේ ආත්මයෙහි පහළ වූ මහාභූතයන්ගේ ප්‍රසාද සංඛ්‍යාත වූ තෙලය ශ්‍රෝත්‍රවිලයතුල සිහින් නඹවන් රොම්මයෙන් හැවසී ගත් ඇඟිලි මුදුවකට බඳු සිය ඇති තහරයක් වැනි වූ වසතුවෙහි පැතිර පවත්නේය. සංසාරයෙහි ශබ්දදශකමය කුශලකර්මබලයෙන් පහළවූයෙහින් ශබ්දයන් ඇඳිනගන්නාවූ විඥානය ඒ ශ්‍රෝත්‍රප්‍රසාද සංඛ්‍යාත ශ්‍රෝත්‍රායතනය නිසා පවත්නේ සි. එසේම සංසාරයෙහි දෙනලද්දා වූ ගන්ධදශකමය කාමාවචර කුශලකර්මයන්ගේ බලයෙන් මේ ආත්මයෙහි පහළවූ මහාභූතයන්ගේ ප්‍රසාදතෙලය නැහැසිදුර ඇතුලත එළකුරයකට බඳු සවහන් ඇති ප්‍රදේශයෙහි පැතිර පවත්නේය. ජිව්හායතනය" යනු සංසාරයෙහි දෙනලද රසදශකමය කාමාවචර කුශල කර්මබලයෙන් මේ ආත්මයෙහි පහළවූ මහාභූතයන්ගේ ප්‍රසාදතෙලය කුල්ලකට බඳු සවහන් ඇති සසම්භාර ජිව්හාවගේ මුදුනෙහි පිහිටියාවූ තෙලුම්වල්පෙති අගක් බඳුවූ සවහන් ඇති රූපදිවයයි ව්‍යවහාරවූ කුඩාමස්වැදුල්ලෙහි පැතිර පවත්නේය. ඒ ජිව්හායතනසංඛ්‍යාත ජිව්හාප්‍රසාදය රසදශකමය කුශලකර්මබලයෙන් පහළවූයෙහින් රසාලම්බණය හැඳිනගන්නාවූ ජිව්හාවිඥාන සංඛ්‍යාත චිත්තසන්තතියේ පැවැත්මට උපකාර වන්නේ සි. ගබ්භසෙය්‍යක සත්වයන්ගේ කායායතන මනායතනවය ප්‍රතිසන්ධිකර්මයෙන් චක්ඛු සොත ඝාණ ජිව්හා යන ආයතනයෝ සතරදෙන ඝටකී නියාමයෙන් කර්ම සතරකින් ද පහළ වෙත්මැයි ඔපපාතිකසංසෙදජ සත්වයන්ට එනාහි උත්කෘෂ්ටකාමාවචර කුශලකර්මබලයෙන් ප්‍රතිසන්ධි විඥානය හා සමග මේ ෂඩායතනයෝම එකක්ෂණිකව පහළ වෙත් මැයි. අකුශලකර්මබලයෙන් අපායාදියෙහි උපදිනා සත්වයන්ට ද, ඒ ඒ ගතියට සුදුසු පරිදි දෙන් ඒ ඒ භවයෙහි ලැබිය යුතු ආයතනයෝ ප්‍රතිසන්ධිවිඥානය හා සමග එකක්ෂණිකව පහළ වෙත් මැයි මෙසේ නාම රූප ප්‍රත්‍යයෙන් ෂඩායතනයන්ගේ පහළවන ක්‍රමය දතයුතුයි.

"සළායතනා පච්චයා ඵස්සෝ" යන පදයෙහි විභාග කොසේ යත්? ඒ චක්ඛුසොත ඝාණ ජිව්හා කාය යන ආයතන යන් හෙතුකොටගෙණ චක්ඛුසම්ඵස්සය, සොතසම්ඵස්සය, ඝාණ සම්ඵස්සය, ජිව්හාසම්ඵස්සය, කායසම්ඵස්සය, මනොසම්ඵස්සය, යන ඝනාකාර සඵශය පහළ වෙයි. ඒ කෙසේ පහළ වන්නේද යත්? චක්ඛායතනය රූපාලම්බණයෙහි වැද ගැන්මෙන් චක්ඛු සම්ඵස්සය ද, ශ්‍රොත්‍රායතනය ශබ්දාලම්බණයෙහි වැද ගැන්මෙන් සොතසම්ඵස්සය ද, ඝාණායතනය ගන්ධාලම්බණයෙහි වැද ගැන් මෙන් ඝාණසම්ඵස්සය ද, ජිව්හායතනය රසාලම්බණයෙහි වැද ගැන්මෙන් ජිව්හාසම්ඵස්සය ද, කායායතනය ඵොට්ඨබ්බායතන යෙහි වැද ගැන්මෙන් කායසම්ඵස්සය ද, මනායතනය ධම්මාලම්බ ණයෙහි වැදගැන්මෙන් මනොසම්ඵස්සය ද; හවඟන්නේය යි දතයුතුයි.

"ඵස්සපච්චයා වේදනා" යන පදයෙහි විසතර නොසේ යත්? ඒසයාකාර සඵශයන් හෙතුකොටගෙණ චක්ඛුසම්ඵස්සජා වේදනාදි සත්‍යාකාරවේදනාව හටගන්නේයි. එහෙයින් ඵස්සයේ දනා දෙක නිශ්චයිගාවියෙකුට බදු උපමා ඇත්තේය යි දක් වන ලද්දේය. මේ චක්ඛුසම්ඵස්සාදී සඵශයන් සයදෙන නො ලැබෙන්නේ වී නම් සත්ත්වයෙක්හට ජීවත් නොවිය හැක්කේමය එහෙයින් චතුර්විධාහාරයන් අතුරෙන් ඵස්සාහාරය යි මේසප ශයට ව්‍යවහාර කෙරෙත්. යම්සේ මනුෂ්‍යත්වයකුගේ ජීවත්වීමට කබලිකාරාහාරය සංඛ්‍යාත ආහාරඔජාව උපකාර වන්නේ ද එපරිද්දෙන් ම රූපාලම්බණයක් දැකීමය, ශබ්දාලම්බණයක් ඇසි මය, ගන්ධාලම්බණයක් සිඹීමය, රසාලම්බණයක් රැසවිඳ ගැණී මය, සඵශ්‍යාලම්බණයන් විඳ ගැණීමය, ධම්මාලම්බණයන් මෙනෙහි කිරීමය යනමේ සයආකාර සඵශ සංඛ්‍යාත ආහාරය ද කබලිකාරා හාරය මෙන් ම සත්ත්වයන්ගේ ජීවත්වීමට උපකාර වන්නේ යි, නොඑහෙත් එකාසුවක් ලෞකික චිත්තයෙහි ඉඳුනු වෙදනා වෙතසිකයෝ තුමූ වෙදනා නම් වෙ යි. සඞ්ඛාර-විඤ්ඤාණ-නාම රූප-ඵස්ස-වේදනා යන මේ ධම්මයෝ පස්දෙන විප්‍රකාරයකින් බෙදූ දැක්වූ හෙයින් පළමුවන ක්‍රමය එනාහි පටිච්චසමුප්පාද විභඞ්ගපාලියෙහි සුත්‍රානන්ත භාජනියෙහි ආවා වූ ක්‍රමය යි. පස්වි ක්‍රමය එනාහි එම පාලියෙහි ම අභිධම්මභාජනිය ක්‍රමය හා ධාතු කථාපාලියෙහි ආවාවූ ක්‍රමය යි.

"වේදනා පච්චයා තණ්හා" යන පදයෙහි විභාග කෙසේ යත්? "තණ්හා" යනු ලොභ මූලික සිත් අවෙහි ඉඳුනාවූ ලොභ

චෛතසිකයෝ අටදෙන මේ පටිච්චසමුප්පාදයෙහි තණ්හා නම් වෙයි, ඒ තෘෂ්ණා තොමෝ පවකාම ගුණයෙහි ඇලෙන කාම තෘෂ්ණාවය, රූපාරූප භවයෙහි ඇලෙන ශාස්වතදෘෂ්ටිය සමග භවගත් භවතෘෂ්ණාවය, උවෙජ්ද දෘෂ්ටිය සමග භවගත් විභව තෘෂ්ණාවයයි ත්‍රිවිධාකාර වන්නේයි. පළමු පළමු භවගත් ලෝභ මූලික චිත්තයන් නිශ්‍රය කොට ගෙණ පසුව භවගන්නාවූ බල වත් ලෝභ මූලික සිත් අටෙහි යෙදුනු බලවත් වූ ලෝභ චෛතසිකය ද එම ලෝභ මූලික චිත්තයන් අතුරෙන් දෘෂ්ටිසම්ප්‍රයුක්ත අකුශල් සතරෙහි යෙදුනු දෘෂ්ටිචෛතසිකයෝ සතරදෙන ද යනමේ දැඩිලෝභය හා දැඩිවූ දෘෂ්ටිය ද යන ධර්මයෝ දෙදෙන උපාදාන නම් වෙත්. මෙසේ වෙදනා ප්‍රත්‍යයෙන් පළමු පළමු භවගන්නාවූ ලෝභ මූලික චිත්තයෙහි තෘෂ්ණාව ද, පසු පසුව භවගන්නා වූ බලවත් ලෝභමූලික චිත්තයෙහි භවගන්නාවූ ලෝභ දිට්ඨි දෙදෙන ද, උපාදානනම් වන හෙයින් "වෙදනා පච්චයා තණ්හා-තණ්හාපච්චයා උපාදානං" යනු කීහ.

ඒ බලවත් ලෝභ දිට්ඨි දෙදෙන හෙතුකොටගෙණ කම් භවය උපපත්තිභවය යි කියන ලද විප්‍රකාරභවය භවගන්නා හෙයින් "උපාදාන පච්චයා භවෝ" යි කීහ. ඒ විප්‍රකාර භවයන් අතුරෙන් සතලොස් ලෞකික කුශල්ය, දෙලොස් අකුශල්ය, යන එකුනතිස් චිත්තයෙහි යෙදුනු චෙතනාවෝ එකුන්තිස්දෙන කම්භව නම් වෙයි. දෙතිස් ලෞකික විපාක චිත්තය, නවසඞ්ප්‍රයුක්තවූ පන්තිස් චෛතසිකය, කම්ජරූපයෝ විසිදෙනය යන මෙතෙක් ධර්මයෝ තුමූ උපපත්තිභව නම් වේ. ඒ උපපත්තිභවය වනාහි කාමභවය, රූපභවය, අරූපභවය, සඤ්ඤීභවය, අසඤ්ඤී භවය, නෙවසඤ්ඤීනාසඤ්ඤීභවය, එකවොකාරභවය, චතුවොකාරභවය, පවවොකාරභවයයි නව වැදෑරුම්වේ.

"කාමභවය" යනු එකොළොස් කාමභූමියයි. රූපභවය යනු සොළොස් රූපාවචර භූමිය යි. අරූපභවය යනු සතර අරූපලය යි. "සඤ්ඤීභවය" යනු එකොළොස් කාමභූමිය, අසංඥලය හැර අවශෙෂ පසළොස් රූපලය ආකාශානඤ්චායතනය, විඤ්ඤාණඤ්චායතනය, ආකිඤ්ඤඤ්ඤායතනය යන මෙතෙක් භූමිහු සඤ්ඤීභව නම් වෙයි. "අසඤ්ඤීභවය" යනු එකම අසඤ්ඤී ලයයි. "නෙවසඤ්ඤීනාසඤ්ඤී භවය" ගනු භවාග්‍ර සංඛ්‍යාත සතරවෙනි අරූපලයයි. එකවොකාරභවය යනු අසංඥලයයි. චතුවොකාර භවය" යනු සතර අරූපලයයි. "පඤ්චොකාරභවය" යනු අවශෙෂ පසළොස් බ්‍රහ්මභූමිය හා එකොළොස් කාමභූමි

යයි. මේ නවසථානය වනාහි උපපත්තිභවයයි කියාද, නව සත්තාවාසයයි කියාද, ව්‍යවහාර කෙරෙත්. මෙසේ දැඩිවූතෘෂ්ණා දෘෂ්ටි සංඛ්‍යාත උපාදානයන්ගේ උපකාරයෙන් එකුන්තිස් කුශලාකුශල චෙතනා සංඛ්‍යාතවූ කම්භවය හා එකුන්තිස් චෙතනාවන්ගේ ප්‍රතිසන්ධි ප්‍රවෘත්ති විපාක දීමට සුදුසු එක්තිස් තලයකින් යුක්තවූ නවසත්තාවාසය යි කියනලද උපපත්ති භවය පහල වෙයි.

"භවපච්චයා ජාති" යන්නෙහි භවශබ්දයෙන් උපපත්ති භවය හැර කම්භවය පමණක් ගත යුතුයි. එහෙයින් එකුන්තිස් චෙතනා සංඛ්‍යාත කම්භවයාගේ උපකාරයෙන් එක්භවයෙක්හි ඇතුලත්වූ සස්කන්ධපරම්පරාවගේ පළමුවන භටගැණීම් සඛ්‍යාත ජාතිය පහළ වෙයි. ඒ ජාතිය වනාහි "ජාති ඔක්කන්ති අභිනිබ්බත්ති" යනාදී පඤ්චාය වචනයන්ගෙන් ව්‍යවහාර කෙරෙත්.

"ජාතිපච්චයා ජරාමරණං" යන්නෙහි අභිප්‍රාය මෙසේයි:— භවයෙහි හටගත් සස්කන්ධ සඛ්‍යාත ආත්මභාවයාගේ දත් වැටී මිය, හිසකේ පැසීම්ය, ඇඟරැළි කැඟීම්ය, ලේ ඉස් ඉනාශ්වීගොස් සැරයටියක් පිළිසරණකොට ගැණීම්ය, ශරීරය වෙව්ලීම්ය, තෑවූත් උත්තානසෙය්‍යක ළදරුවෙකු මෙන් ඇඳක් පිට උඩුබෑලිව සයනය කිරීම්ය, යනාදී ලක්ෂණයන්ගෙන් යුක්තවූ ජරාව හා එක් භවයකින් වෙන්කරණ ලද සස්කන්ධයන්ගේ බිඳීම්ය, භවයෙන් ගිලිහීම්ය, "යුනි වයොහානි ඉන්ද්‍රියානං මච්චුමරණං කාලකිරියා" යනාදී නොයෙක් පරියාය නාමයෙන් මරණය ව්‍යවහාර කෙරෙත්. "ජාතිපච්චයා ජරාමරණං" යනුවෙන් වදළ සමාසය වෙන්කොට "සෝක-පරිදේව-දුක්ඛ-දෝමනස්සුපායාසා" යන දෙවැනි වදළසමාස පදයකින් කුමක් හෙයින් වදළේද යත්? ජාතියාගේ ප්‍රධාන ඵලය උපන්නාවූ කිසි සත්වයෙක්හට නො වැළැක්විය හැකි බැවින් ඒ ධර්මයෝ දෙදෙන එක් සමාසයක් කොට බුදු පසේබුදු මහරහත් ආදී ඇතැම් උත්තම සත්වයන්ට නො ලැබෙන්නාවූ "සෝක-පරිදේව-දුක්ඛ-දෝමනස්සුපායාසා" යන ධර්මයෝ එක් සමාසයක් කොට ද වදළේයි. මෙසේ මේ ධර්මයන්ගේ ප්‍රධාන අප්‍රධාන මුඛ්‍ය අමුඛ්‍ය භාව සඛ්‍යාතවූ විරුද්ධ විශභාගාර්ථය හෙතුකොටගෙණ එකම සමාස පදයක් නො වදළේයයි දත යුතුයි.

මේ ජාති ජරා මරණ අර්ථයෝ තුන්දෙන 'ජාතිවිභඞ්ගාදී වූ ධාතුකථා පාලියෙහි වදළාක්මෙන් සඛ්ඛත ලක්ෂණවූ උපාදිති භඞ්ග සඛ්‍යාත අප්‍රකට ජාතිය හා ජරා මරණයෝ ද

ගතයුත්තාහුය. හෙවත් සියලු නාමරූප ධර්මයන්ගේ උපාදෙනින් හඬහ සඞ්ඛ්‍යාතවූ නිතර ඉපදීමය, නිතර සිදීමය, නිතර බිඳීම යයි කියනලද අප්‍රකට ජාති ජරා මරණයෝ වනාහි ලෝකයෙහි ජාති ජරා මරණ යයි නොසලකන හෙයින් ත්‍රිවිධ සඞ්ඛත ලක්ෂණයයි කියනලද "උප්පාදෙ පඤ්ඤත්ති වයොපඤ්ඤා යති ඨිතස්ස අඤ්ඤථත්තං පඤ්ඤායති" යනුවෙන් සූත්‍රා නතයෙහි වදාළ ජාති ජරා මරණයෝ මේ පටිච්චසමුප්පාදයෙහි ගතයුත්තාහුය. මෙහි වනාහි ලෝකයෙහි ප්‍රකටවූ සත්ත්වයාගේ උත්පත්තිය හා "ඛණ්ඩිච්චං පාලිච්චං වලිත්තචෙතා" යනාදීන් දක්වනලද ජරාවද, "චුති චවනතා මෙච්චු" යනාදීන් වර්ණිතා කරණලද මරණයද මෙහි ලැබෙන්නේයි. සච්චවිභඞ්ගයෙහි:— පටිච්චසමුප්පාදවිභඞ්ගය, සමෙමාහවිනොදනී අභිධර්මාවය, විශුද්ධි මාර්ගී අභිධර්මාවය, යන සථානත්‍රයෙහි ආවාවූ විසතරකථාව ඉගෙණ ගතයුතුයි. සිලක්ඛන්ධ වර්ගයෙහි බ්‍රහ්මජාලසූත්‍රාගත කථා ටීකාවන්හි "ජාතිති පදෙ පඨමප්පත්තස්ස පඤ්චක්ඛන්ධා දට්ඨබ්බා" යනු කීහ. එහි අර්ථ නම්:—එසේ පන, මේ පටිච්චසමුප්පාදපාලියෙහි වනාහි; සවිකාරා, ජාතිරූප සඞ්ඛ්‍යාතවූ විකාර රූපය සමග හට ගත්තාවූ; පඤ්චක්ඛන්ධා, පඤ්චස්කන්ධයෝ; ජාතිඉති දට්ඨබ්බා, ජාතියයි දත යුත්තියය. වාදසඞ්ගපටිච්චසමුප්පාදයෙහි නාමය හා රූපය එක්කොට ගෙණ නාම රූප සඞ්ඛ්‍යාතවූ සතරවෙනි අඞ්ගය හටගත්තාක්මෙන් ජරාව හා මරණය එක්කොට ගෙණ ජරා මරණ සඞ්ඛ්‍යාතවූ දෙලොස්වන අඞ්ගය හටගත්තේයි. බ්‍රහ්ම භූමියෙහි වනාහි ජාති ඇත්තේ නමුදු සොක-පරිදෙව-දුක්ඛ-දෙමනස්සුපායාසයෝ නැත්තාහු වෙත්. කුමක් හෙයිනයත්? ඒ ධර්මයන් කාමතෘෂ්ණාව පිළිබඳව හටගන්නා හෙයිනි. ශොකාදීහු තුමූ ජාතියගේ මුඛ්‍යඵලය නො වන හෙයින් වෙනම අඞ්ගයක් වශයෙන් නො දක්වන ලදහ. එසේ හෙයින් සොක-පරිදෙව-දුක්ඛ-දෙමනස්සුපායාසයෝ වනාහී ජරා මරණ සඞ්ඛ්‍යාත දෙලොස්වන අඞ්ගයෙහිම ඇතුලත් කටයුත්තාහු යයි අභිධර්මාචාරීහු කියත්. ශොකාදීහු වනාහි කුමක් හෙයින් කියන ලදහුද යත්? "ශොකාදයා චෙත්ථ භවචක්කස්ස අවිච්ඡෙදදස්සනත්ථං වුත්තා" යනු අටුවා බැවින් ශොකාදීන්ගේ හටගැණීම කරණ කොට ගෙණ ඒ ශොකාදීහු ප්‍රත්‍යයකොට ගෙණ අවිද්‍යාව හට ගන්නා හෙයින් පටිච්චසමුප්පාද චක්‍රයාගේ නොසිඳ පැවතීම දක්වනු පිණිස ශොකාදීහු වදාරණ ලද්දාහු යයි දත යුතුයි.

අවිද්‍යාව වනාහි ප්‍රත්‍යයක් නැතිව හටගන්නේවී නම් භව චක්‍රය සිදිනේ වෙයි. කෙලශවෘත්තය, කම්මවෘත්තය, විපාක

වෘත්තයක යන ත්‍රිවිධ වෘත්තයන් අතුරෙන් මේ අවිද්‍යා සඞ්ඛ්‍යාත කෙලඹවෘත්තයේ ආදියෙහි තබා දෙශනා කෙළේයි. එනකුදු වුවත් "**ආහාරසමුදයා අවිජ්ජාසමුදයෝ**" යනාදී දෙශනා පෙළෙහි ආ ක්‍රමයෙන් චතුරාශ්‍රවයන් හෙතුකොටගෙණ නැවත අවිද්‍යාව භවඟන්නා හෙයින් ඒ ආශ්‍රවයන් හා අවිද්‍යාව සම්බන්ධ වන්නේයි. ජරා මරණ සඞ්ඛ්‍යාතවූ අඞ්ගයට ඇතුළත් වන්නාවූ යොක-පරිදේව-දුක්ඛ-දෞමනස්ස-උපායාසයන් අතුරෙන් දෞමනස්ස සඟඟත දෙකින්හෙයි යෙදුනාවූ වෙදනා චෛතසික තෙමේ සෝක නම් වෙයි. "දෞමනස්සය" යනුද ඒව නමකි. සුහුති මිත්‍ර අඹුදරු ආදීන්ගේ විනාශයෙහි හටගත්නාවූ විපලාප චිත්තජ ශබ්ද තෙමේ පරිදේව නම් වේ. දුක්ඛ්‍යඟඟත කායවිඤ්ඤාණයෙහි යෙදුනු එකම දුක්ඛ වෙදනාව දුක්ඛ නම් වෙයි. දෞසමූලික දෙ සිතෙහි යෙදුනු වෙස චෛතසිකය උපායාස නම් වෙයි. මේසේ එකම දෞසමූලික චිත්තයෙහි යෙදෙන වෙදනා චෛතසිකය දෞමනස්සයයි කියාද එම චිත්තයෙහි යෙදෙන වෙස චෛතසික තෙමේ උපායාස යයිද නම් වෙයි. මේසේ ඒ ඒ ධර්මයන්ගේ සභාව ලක්ෂණ අවබෝධ කටයුතුයි.

යටොකත ක්‍රමයෙන් පටිච්චසමුප්පාදයෙහි අතීතාදී කාලත්‍ර යක් ඇති හෙයින් "**තත්ථ තයෝ අද්ධා වාදසඞ්ගානි විසතාකාරා නික්ඛිප චතුසඞ්ඛේපා තීණි වට්ටානි චෙමූලානි ච චෙදිතබ්බානි**-යනාදිය කිව. එහි අධ්වත්‍රය නම්:—අතීත-අනාගත-වර්තමාන" කාලත්‍රයයි දතයුතුයි. අත්ත අධ්ව නම්:—**අවිද්‍යාසංස්කාරයෝ** අතීත අධ්ව නම් වෙයි. ජාති-ජරා-මරණ-යන තුණ අනාගත අධ්ව නම් වෙයි. මධ්‍යයෙහි ධර්මයෝ අටදෙන ප්‍රත්‍යුත්පන්න අධ්ව නම් වෙයි. අවිද්‍යා සංස්කාර, විඤ්ඤාන, නාම, රූප, සළායතන, ඵස්ස, වේදනා, තණ්හා, උපාදාන, භව, ජාති, ජරා මරණ යන දෙළොස්දෙන වාදස අඞ්ගයෝ නම් වෙත්. මේ පටිච්චසමුප්පාදයෙහි වහාහි ඒ වාදස අඞ්ගයන්හෙන් අධිකවූ යොකය ආදි කොට ඇත්තාවූ උපායාසය අවසන්කොට ඇත්තාවූ ධර්මයෝ තුමූ ජාතියාගේ අමුඛ්‍යඵලය දක්වනු පිණිස කියන ලද්දේ යයි දතයුතුයි.

වාදශ අඞ්ගයන් අතුරෙන් අවිද්‍යා-සංස්කාර දෙදෙනාගේ ගැණීමෙන් නන්දාවෘත්තන්‍යායෙන් භවත් එකාබද්ධව පවත්නා හෙයින් තෘෂ්ණා, උපාදාන, භවයෝද ගන්නා ලද්දාහු වෙත්. ඒ තෘෂ්ණා උපාදාන භවයන්ගේ ගැණීම මෙකතුරකට ගෙණ යට කී නන්දාවෘත්තන්‍යායෙන් අවිද්‍යා-සංස්කාරයෝද ගන්නා ලද්දාහු

වෙත්. ජාති, ජරා, මරණයන්ගේ ගැණීමෙන් විඤ්ඤාණ, නාම රූප, සළායතන, ඵස්ස, වේදනා යන ධර්ම පවකයද ගන්නා ලද්දේසි. මේසේ නන්දුග්‍යාවෘත්තනන්‍යායෙන් තොකියන ලද්දාවූ ධර්ම යන්ගේ ගැණීම වන හෙයින් අතීතභවයෙහි හෙතුහු පස්දෙනය දැන් ප්‍රත්‍යුත්පන්නභවයෙහි ඵලපඤකය, ප්‍රත්‍යුත්පන්නභවයෙහි හෙතුපඤය, අනාගතභවයෙහි ඵලපඤයයි යන මේ ආකාරයෝ විඤ්ඤක්ද වෙත්. ඒ හෙතුඵලයන්ගේ සම්බන්ධය තුන් සථාන යක වන හෙයින් සන්ධිත්‍රයක්ද වේත්. ඒ සන්ධිත්‍රයෙන් වෙන් කරණ ලද්දාවූ සංඤ්ඤපදයෝ සතරක්ද වෙත්. අවිද්‍යාවය, තෘෂ්ණාවය, උපාදානය, යන මොව්හු තුන්දෙන කෙලඹවෘත්ත නම් වෙයි කම්භව යයි කියනලද්දාවූ භවයාගේ එක් ප්‍රදෙශයෙක් හා සංස්කාරයෝද කම්වෘත්ත නම් වෙයි. උපප්‍රාප්තිභව සඞ්ඛ්‍යාත වූ භවයාගේ එකදෙශයක් හා විඤ්ඤාණ-නාමරූප-සළායතන-ඵස්ස-වේදනා-ජාති-ජරා-මරණයෝ තුමූ විපාකවෘත්ත නම් වෙයි. මෙසේ ත්‍රිවිධවෘත්තයෝ දතයුත්තාහුය. අවිද්‍යා-තෘෂ්ණා දෙදෙන මේ භවචක්‍රයාගේ මූලයෝ නම් වෙත්. හෙවත් පූර්ව කෝටියට අවිද්‍යාව හා අපරාන්තයට භවතෘෂ්ණාවද මුල් වන්නා නාහුය. ඒ ත්‍රිප්‍රකාර මූලයන්ගේ අග්‍රතාමාශීය සඞ්ඛ්‍යාතවූ අසනි ප්‍රහාරයෙන් විනාශකරණ හෙයින් වෘත්ත සඞ්ඛ්‍යාතවූ සියලු දුකඛය නිරුඬවෙයි. ජරා මරණ සඞ්ඛ්‍යාතවූ මූර්ජාව මිහතුකොට ගෙණ හෙවත් නැවත නැවත උපදනා හෙයින් ඒ හෙතුකොට ගෙණ අවිද්‍යාව පවත්නේසි.

මේ පවිවවසමුප්පාදසථානයෙහි අවිද්‍යා තොමෝ සමුදයසත්‍ය නම් වෙයි. සංඛාර තෙමේ අවිද්‍යා සංඛ්‍යාතවූ සමුදය සත්‍ය යෙන් පහළවන්නාවූ විපාකභූතවූ සමුදයසත්‍ය නම් වෙයි. විඤ්ඤාණ තෙමේ සංඛාර සංඛ්‍යාතවූ සමුදයසත්‍යයෙන් හටගන්නාවූ දුඃඛසත්‍යනම් වෙයි. නාමරූප තෙමේ විඤ්ඤාණ සංඛ්‍යාතවූ දුඃඛ සත්‍යයෙන් හටගන්නාවූ විපාකභූතවූ දුඃඛසත්‍ය නම් වෙයි. සළායතන තෙමේ නාමරූප සංඛ්‍යාතවූ දුඃඛසත්‍යයෙන් හට ගන්නාවූ විපාකභූතවූ දුඃඛසත්‍ය නම් වෙයි. ඵස්ස තෙමේ තෙමේ සළායතන සංඛ්‍යාතවූ දුඃඛසත්‍යයෙන් හටගන්නාවූ විපාකභූතවූ දුඃඛසත්‍ය නම් වෙයි. වේදනා තොමෝ ඵස්ස සංඛ්‍යාතවූ දුඃඛසත්‍යයෙන් හටගන්නාවූ විපාකභූතවූ දුඃඛසත්‍ය නම් වෙයි. තෘෂ්ණා තොමෝ වේදනා සංඛ්‍යාතවූ දුඃඛසත්‍ය යෙන් හටගන්නාවූ සමුදයසත්‍ය නම් වෙයි. උපාදාන තෙමේ තෘෂ්ණා සංඛ්‍යාතවූ සමුදය සත්‍යයෙන් හටගන්නාවූ විපාකභූත

වූ සමුදයසත්‍ය නම් වෙයි. භව තෙමේ උපාදාන සංඛ්‍යාතවූ සමුදය සත්‍යයෙන් ගතගන්නාවූ සමුදයසත්‍යය දුඃඛත්‍යයෝ නම් වෙත්. ජාතිතොමෝ කම්භව සංඛ්‍යාතවූ සමුදයසත්‍යයෙන් ගතගන්නාවූ දුඃඛසත්‍ය නම් වෙයි. ජරාමරණ තෙමේ ජාති සංඛ්‍යාතවූ දුඃඛසත්‍යයෙන් ගතගන්නාවූ විපාකභූතවූ දුඃඛ සත්‍ය නම් වේ. මේ පටිච්චසමුප්පාදයෙහි මෙසේ දක්වන්ලද්දාවූ සත්‍යවිභාගය වනාහි පටිච්චසමුප්පාදවිභඞ්ග, අභිධම්මමහාඣනී පාලිය ආශ්‍රයකොට ගෙණ සමෙමාහවිතොදනී නම් අට්ඨකථාවෙහි ආවාවූ සූත්‍රානන්තභාජනීනය හා සදෘශවූ විභාග්‍යයි දත යුතුයි.

අවිද්‍යා තොමෝ රූපධම්ම්‍ය-නාමධම්ම්‍ය-චතුස්සත්‍යය-යකාදී වූ ධම්ම්‍යන් නො දක්නා හෙයින් අන්ධයෙකුගේ රූපයන් නොදැකීමක් මෙන් දතයුතුයි. සංස්කාර තෙමේ විෂමවූ භූමියෙහි ඒ අන්ධයාගේ පය පැකිලීමක් මෙන් දතයුතුයි. විඤ්ඤාණ තෙමේ ඒ අන්ධයාගේ පය පැකිලීමෙන් උඩුබැලිව වැටීමක් මෙන් දත යුතුයි. නාමරූප තෙමේ ඒ අන්ධයාගේ වැටීම හෙතුකොට ගෙණ ශරීරමයෙහි ගතගත් ගඩක් මෙන් දත යුතුයි. සළායතන තෙමේ පළමුවෙන් ගතගත් ඒ ගඩෙහි නැවත ගතගත්තාවූ බිබිලි සඳක් මෙන් දතයුතුයි. ඵස්සී තෙමේ පළමුවෙන් ගතගත් ඒ ගඩ හා නැවත ගතගත්තාවූ ඒ බිබිලි සඳද ඇස් අන්ධවූ හෙයින් ගම් කණු කට්ට ආදියක හැපීමක් මෙන් දතයුතුයි. වේදනා තොමෝ ඒ කණු කට්ට ආදියෙහි හැපීමෙන් ගතගත් බලවත්වූ දුකක්මෙන් දතයුත්තීය. තෘෂ්ණා තොමෝ ඒ ගඩයට පිළිගම් කරණු කැමැත්තක් මෙන් දතයුත්තීය. උපාදාන තෙමේ බලවත්වූ වේදනාව ඉවසාගත නොහී අපථ්‍යවූ විෂ බෙහෙතක් හැණීමක් මෙන් දතයුතුයි. භවතෙමේ අපථ්‍යවූ විෂබෙහෙත ගඩයෙහි ආලෙප කිරීමක් මෙන් දතයුතුයි. ජාති තොමෝ ඒ අපථ්‍යවූ විෂ බෙහෙත ආලෙප කිරීමෙන් ඒ ගඩ මහත්වීමක් මෙන් දතයුත්තීය. ජරා මරණ තෙමේ ඒ මහත්වූ ගඩ පිපිරීමක්මෙන් දත යුතුයි.

තවද මේ පටිච්චසමුප්පාදයෙහි එකඞ්ගනය, නානඞ්ගනය, අඞ්ගසංඛ්‍යානය, එවංධම්මතානය, යන සතරනයාය ක්‍රමයකින් දතයුතුයි. ඔවුන් අතුරෙන් "එකඞ්ගනය" යනු හෙතුඵල දෙදෙනාගේ සම්බන්ධය ඇති හෙයින් බිජුවට තෙමේ වෘක්ෂයාගේ හඬ ගැණීම ඵලයයි. ඒ බිජුවට තෙමේ වෘක්ෂයාගේ ගතගැණීම් සංඛ්‍යාතවූ හෙතුඵලදෙදෙනාගේ එකඞ්ගය ඇතිවාක් මෙන්ම අවිද්‍යාව හෙතුකොටගෙණ සංස්කාරය ද; සංස්කාරහෙතුවෙන්

විඤ්ඤාණාදය; යනාදී ක්‍රමයෙන් හෙතුඵල දෙදෙනාගේ එකසම්බන්ධ වෙන් හටනැඟීම එතත්ථාය නම් වෙයි. "නානත්ථාය" යනු අවිද්‍යාසංස්කාරාදීහු තුමූ පරම්පරාව නො සිඳ පවත්නාහු නමුදු ඔවුන්ට ඔවුනොවුන් වෙනස් වන්නාහු මැයි. හෙවත් අවිද්‍යාව සවභාව ප්‍රතිවිශාදක ලක්ඛණයෙන් යුක්තවෙයි. සංස්කාරය රාශිකරණ ලක්ඛණයෙන් යුක්තවෙයි. මේ ආදී ක්‍රමයෙන් අවිද්‍යාදී වාදඝාඛඝයන්ගේ ලක්ඛණය හා කෘත්‍යයද ආඝන්න කාරණය හා ඵලයද ඔවුනොවුන්ට ඔවුනොවුන් වෙනස්ව පවත්නාහු වෙති. මේ නානත්ථාය යයි. "අබ්‍යාපාරතය" යනු සංස්කාරාදී විපාකය මා විසින් උපදවනු ලබන්නෙමි යි—අවිද්‍යාවගේ කිසි ව්‍යාපාරයක් නැත්තේයි. මේ අවිද්‍යාවට කී නයින් ම අවශේෂ එකොළොස් අඞ්ගයන්ගේද ව්‍යාපාරයක් හෝ (උත්සාහයක්) හෝ නැත්තේයි. ඒ ඒ සවභාවය නියම වශයෙන් ඒ ඒ ධම්මයන්ගේ හටගැණීම් මාත්‍රයක් අබ්‍යාපාර නම් වෙයි, "එවං ධම්මතානත්ථාය" යනු මෙසේ ව්‍යාපාරයක් නැත්තේ නමුදු හෙතුවෙන් ඵලය හටගන්නේ නමුදු අනික් හෙතුවකින් අනික් ඵලයක්හුගේ හටගැණීමක් හෝ අනියම වශයෙන් නො වන්නේ මය. හෙවත් කිරෙන් දී හටගැණීමක් මෙන් ද, කිරෙන් තල තෙල් හට නො ගන්නාක්මෙන් ද, තලඇටයෙන් තලතෙල් හට ගන්නාක් මෙන්ද, වැලියෙන් තෙල් හට නො ගැණීමක් මෙන්ද අවිද්‍යාදී හෙතූන් කරණකොටගෙණ සංස්කාරාදි සුදුසු ඵලයක් හටගන්නේ මය. හෙවත් අවිද්‍යාවෙන් කුශලාකුශල කම්ය මුත් අනික් ධම්මයක් නුපදනා හෙයින්ද ඒ ඒ හෙතුහුගේ ඒ ඒ ඵලය නියම වශයෙන් හටගන්නා හෙයින් ඒ හටගැණීම "එවං ධම්මතානත්ථාය" නම් වෙයි. මෙසේ අවිද්‍යාදී වාදඝාඛඝය, විසි ආකාරය, ත්‍රිසන්ධිය, චතුතයෝ තුන්දෙනය, සංක්ෂේපයෝ සතර දෙනය, සත්‍යයෝ දෙදෙනය, යනාදීවූ විභාගය වෙන් වෙන් කොට අවබෝධ කටයුත්තේ යි.

මේ පටිච්චසමුප්පාද සංඛ්‍යාත වූ භවචක්‍රය අවබෝධ නො කරණ තාක් කල් මුලුල්ලෙහි. සංසාරය නො ඉක්ම වන්නේය යි දතයුතුයි. එහෙයින් එතසාවාහං භික්ඛවේ! ධම්මස්ස අඤ්ඤාණා අනනුබෝධා එවමයං පජා තන්තා ආකුලකජාතා ගුළගණ්ඨිකජාතා මුජ්ජබබජභූතා අපායං දුග්ගතිං විනිපාතං සංසාරං නාතිවත්තන්ති" යනු දීඝනිකාය මහානිදාන සූත්‍රයෙහි දේශනා කොට වදාළේ යි. එහි අර්ථ මෙසේ යි. ආනන්ද! ආනන්දයෙනි! එතස්ස ධම්මස්ස, ඒ ප්‍රතීත්‍ය සමුත්පාදධම්මය; අඤ්ඤාණා, නො

දුනීමෙන් අනනුබෝධා, අවබෝධ නොා කිරීමෙන්; අයං පජා, මේ ප්‍රජා තොමෝ; එවං, මෙසේ; තන්තා කුලකජාතා, අවුල් වූ නූල්වැලක් මෙන් වෙයි. ගුලගණ්ඨිකජාතා, ගුල නම් පක්ෂීන්ගේ කැදැල්ලකට බදු වූවා සේයි. මුජබබබජභූතා, මුදුතණ බබුස්තණ ශ්‍රේන් හඬරණ ලද්දා වූ රැහැණකට බදුවෙයි. මෙසේ වූ ප්‍රජා තොමෝ "අපායං දුග්ගතිං විනිපාතං සංසාරං නාතිවත්තති" යනු සම්බන්ධයි. නාමරූප සංඛ්‍යාතවූ භවාඞ්ගයෙහි හටගන්නාවූ පුළු කොට්ස නො පෙණෙන්නා වූ වෘත්තධර්ම සංඛ්‍යාත පටිච්චසමුප්පාද ධර්මචක්‍රයෙහි කාලත්‍රය, වාදසාඛ්‍යය, විසතාකාරය, සන්ධිත්‍රය, සංක්ෂේප සතරය, වෘත්තයෝ තුන්දෙනය, මූලයෝ දෙදෙනය, සත්‍යයෝ දෙදෙනය, යන මේ විශේෂ විභාග දත යුත්තේයි.

ඒ පටිච්චසමුප්පාදයෙහි "අවිජ්ජා, සංඛාර, තණ්හා, උපාදාන, භව," යන අතීතහෙතු පවකය යි කියන ලද්දා වූ ආකාර පඤ්ච. "විඤ්ඤාණ, නාමරූප, සළායතන, ඵස්ස, වේදනා" සංඛ්‍යානවූ ප්‍රත්‍යුත්පන්නඵල පඤ්චකයි කියන ලද්දාවූ ආකාර පඤ්චක. තණ්හා, උපාදාන, භව, අවිජ්ජා, සංඛාර" සංඛ්‍යාත වූ ප්‍රත්‍යුත්පන්නහෙතු පඤ්චකයි කියන ලද්දාවූ ආකාර පඤ්චක. "ජාති, ජරා මරණ" සංඛ්‍යාතවූ ශෝකාදී සවභාව ගැණීම වශයෙන් ගන්නා ලද්දාවූ" විඤ්ඤාණ නාමරූප, සළායතන, ඵස්ස වේදනා" සංඛ්‍යාතවූ අනාගත ඵලපඤ්චකයයි කියන ලද්දාවූ ආකාර පඤ්චක. මේසේ විංශතාකාරය දතයුතුයි.

මේසේ මේ හෙතු ඵලයන්ගේ හා ඵලහෙතූන්ගේ ද, නැවත ත් ඵලහෙතූන්ගේ ද සම්බන්ධත්‍රය සන්ධිත්‍රය යි. මේ හෙතු ඵල පඤ්චකයන්ගේ විතුඤ්ඤය සතර සංක්ෂේපය යි. "ජාති ජරා මරණ" යනු ප්‍රකට ජාති ප්‍රකට ජරා ප්‍රකට මරණද හෙළා විඤ්ඤාණ-නාමරූප-සළායතන-ඵස්ස-වේදනාවන්ගේ උපාදානීභාවය යන සන්ධිත්‍රයද හෙළා ජාති ජරා මරණය යි දතයුතු යි. අතීත හෙතූන් පස්දෙනා අතුරෙන් අවිජ්ජා සංඛාර දෙදෙන පටිච්චසමුප්පාදපාලියෙහි විදාරණ ලද්දේයි. තණ්හා, උපාදාන, භව, යන තුන්දෙනා අතීතාඞ්ගයෙහි නොවදාළේ නමුදු දිව්‍ය මනුෂ්‍ය යන්ගේ සිරියා උපභෝග පරිභෝග සම්පත්තීන්ගේ අනිත්‍යය දුඃඛ්‍ය අනාත්මසවභාවය අශුභසවභාවය විපරිණාම සවභාවය යන මේ සවභාවයන්ගේ හටගැනීම අවිද්‍යාවෙන් වැසී තිබෙන හෙයින් දිව්‍ය මනුෂ්‍යයන්ගේ සවඟී සම්පත් ආදියෙහි ඇලීම තණ්හා නම් වේ ඒ තණ්හාව දිවුණු කල්හි උපාදාන නම් වෙයි. ඒ උපාදානය හෙතුකොටගෙන කුසලාකුසලයන්ගේ රැස් කිරීම

භවනම් වෙයි. මෙසේ අවිද්‍යා-සංස්කාර දෙදෙන සෘජුව දෙශනා කළ හෙයින් තෘෂ්ණා-උපාදාන-භවයෝ ද ඒ අවිද්‍යා-සංස්කාර දෙදෙනාගෙන්ම ලැබෙන්නේය.

මේ අතීත හෙතූන් අතුරෙන් "තණ්හා, උපාදාන, භව" යන තුන්දෙන අවිද්‍යා-සංස්කාරයන් මෙන්ම පූර්භවයෙහි හට ගත් හේතුධර්මය යි දතයුතුයි. එහෙයින් සමෙමාහ විනොදනී අට්ඨාගෙහි:-"පුරිමකම්මභවස්මිං මොහෝ අවිජ්ජා, ආයූහනා සංඛාරා, නිකන්තී තණ්හා, උපගමනං උපාදානං, චෙතනා භවෝ, ඉති ඉමෙ පඨමම්පා පුරිමකම්මභවස්මිං ඉධ පටිසන්ධියා පච්චයා" යනුවෙන් පටිසම්භිදා මාගීයෙන් උදුරා ගෙණ සාධක වශයෙන් උදාහරණ කෙළේ යි. එහි අර්ථ මෙසේයි. පූරිම කම්ම භවස්මිං, පූර්ව කර්මභවය රැස් කරන්නා වූ කල්හි, මෝහෝ, මූලා බැවි සංඛ්‍යාත මොහ තෙමේ; අවිජ්ජා, අවිද්‍යා නම් වෙයි. ආයූහනා, රැස්කිරීම් සංඛ්‍යාත වූ පූර්වප්‍රයෝගයෙහි පැවති චෙතනා තොමෝ; සංඛාරා, සංස්කාරයෝ නම් වෙත්. නිකන්තී, රැස් කරණ ලද්දාවූ කර්මයාගේ විපාකවූ උපපත්ති භවයෙහි ඇලීම, තණ්හා, තෘෂ්ණා නම් වෙයි. උපගමනං, දඬිවශයෙන් අල්වා ගැණීම, උපාදානං, උපාදාන නම් වෙයි. චෙතනා, මූවන චෙතනාව පටන් පසු භාගයෙහි හටගන්නා වූ චෙතනා තොමෝ; භවෝ, භවනම් වෙයි. ඉති ඉමෙ පඨමම්පා, මෙසේ මේ පඨප්‍රකාරවූ ධර්මයෝ තුන්; පූරිමකම්මභවස්මිං, පූර්ජාතියෙහි කර්මය රැස් කරන්නාවූ කල්හි; ඉධ පටිසන්ධියා, මේ භවයෙහි ප්‍රතිසන්ධිහුගේ; පච්චයා හොන්ති, ප්‍රත්‍යයෝ වෙත්. මේ අතීතහෙතු පස්දෙනා අතුරෙන් "සංඛාර භව" යන දෙදෙනාගේ විශෙෂ නම්:-දනක් දෙම්හයි කල්පනා කොට මසක් හෝ අවුරුද්දක් හෝ මුලුල්ලෙහි දානවස්තු ආදිය සකස්කරන්නා වූ කල්හි නිරතුරු උපදින්නා වූ කාමාවචර කුශල චිතත සම්ප්‍රයුක්ත වූ පූර්වචෙතනා තොමෝ සංස්කාර නම් වෙයි. ඒ දානය පිළිගන්වන්නාවූ කල්හි උපදින්නාවූ මූවන චෙතනා තොමෝ භව නම් වෙයි. මේ එක් ක්‍රමයකි.

තවද එකම චිත්තක්ෂණයෙහි සත්ජවනයන් අතුරෙන් පළමුවන දෙවන තුන්වන සතරවන පස්වන සවන ජවනයන් සම්ප්‍රයුක්ත වූ චෙතනා තොමෝ සංස්කාර නම් වෙයි. සත්වන ජවනය සම්ප්‍රයුක්ත වූ චෙතනා තොමෝ භව නම් වෙයි. මේද එක් ක්‍රමයක.

තවද යම්කිසි ලෞකික කුශලාකුශල චෙතනා කෙනෙක් වෙත්ද, ඒ සියලුම ලෞකික කුශලාකුශල චෙතනාවෝ තුන්ව භව

නම් වෙයි. ඒ චිත්තයෙහි යෙදෙන්නාවූ අවශෙෂවූ සපශීදී චෙතසික ධම්මයන් හා සමග යෙදුනාවූ චිත්තක්ෂණයෝ සංඛාර නම් වෙත්-යන මේ අර්ථය පටිසම්භිදා මාර්ගයෙහි ආයේයි.

තවද යම්කිසි ලෞකික කුශලාකුශල කෙනෙක් චෙත්ද ඒ සියලු චෙතනාවෝ සංසකාර නම් වෙත්. ඒ චෙතනාව හා එක්ව යෙදුනාවූ අවශෙෂ චිත්තචෛතසිකයෝ තුමූ භව නම් වෙත් මේ අර්ථය වනාහි පටිච්චසමුප්පාද විභඞ්ග පාළියෙහි ආයේය. ප්‍රත්‍යොත්පන්නඵලපවඤ්ඣයනු පටිච්චසමුප්පාද පාළියෙහිඅප්‍රාප්ත වදලේයි. ඒමෙසේයි. "ඉධ පටිසන්ධිවිඤ්ඤාණං, ඔක්කන්තිනාමරූපං, පසාදා ආයතනං, ඵුඵොඵස්සා, වෙදයිතං වෙදනා, ඉති ඉමෙ පඨමම්මා ඉධූපපත්තිභවසම්භුරෙ කතස්ස කම්මස්ස පවත්තයන්ති" යනු කිම. ඉධ, මේ ප්‍රත්‍යොත්පන්නභවයෙහි; පටිසන්ධි, පූර්වජන්මභවවය එක්ක් මෙන් ඵලප්‍රත්‍යොත්පන්නවූ පටිසන්ධි සිත් තෙමේ; විඤ්ඤාණං, විඤ්ඤාණ නම්වේ. ඔක්කන්ති, අවුත් ඇතුලත් වීමක් මෙන් නාමරූපධම්මයන් මවිකුස්හි බැසගැන්මය; නාමරූපං, නාමරූප නම් වේ. පසාදෙ, චක්ඛුරාදී පඤ්ච ප්‍රකාර ආයතන තෙමේ; ආයතනං, ආයතන නම්වේ. ඵුඵොඵ, අරමුණට නැගීමක් මෙන් භවඟන්නාවූ ස්පශීචෛතසික තෙමේ; ඵස්සො, ඵස්ස නම් වේ. වෙදයිතං, ස්පශීය හා සමග භවඟන්නාවූ වෙදනා චෛතසික තෙමේ; වෙදනා, වෙදනා නම්වේ. ඉති ඉමෙ පඨමම්මා, මේ පඨප්‍රකාරවූ ධම්මයෝ තුමූ; පුරෙ කතස්ස පූර්වභවයෙහි රැස් කරණ ලද්දාවූ; කම්මස්ස පවත්තයා, කර්මයාගේ හෙතුහු වෙත්. ඉධ, මේ ප්‍රත්‍යොත්පන්න භවයෙහි; උපපත්ති භවසම්මිං, උපපත්තිභව සඞ්ඛ්‍යාතවූ මේ ලැබුන භවයෙහි; හොතෙති වෙත්. අතීත පඨහෙතුව දැක්වූ සඞ්ගහයෙහි මෙන්; ඉති ඉමෙ පඨමම්මා, මේ පඨප්‍රකාර ධම්මයෝ තුමූ; පඨව ා, ප්‍රත්‍යයෝ වෙත් යයි අර්ථ නොදියයුතේයි

මේ සථානය වනාහි ශබ්ද වශයෙන් සමානවූ අර්ථ වශයෙන් අසමානවූ පාඨයනැයි දතයුතුයි. "කම්මස්ස පවත්තයා" යන්නෙහි පළමුවෙනි අර්ථය අභෙදෙහෙදූප චාරවශයෙන් ගත යුතුයි. විකල්ප වශයෙන් "පවත්තයා" යන පදයාගේ අර්ථය උපකාර කිරීම් සඞ්ඛ්‍යාතවූ ශක්තිහෙතුවයයි දතයුතුයි. තිතීයාර්ථය වනාහි ශබ්දනිරුක්කාරනාණඞ්ගයෙහි දක්වන ලද්දාවූ "අන්නස්ස හෙතු අන්නස්ස කාරණා"යනාදී උදාහරණයෙහි මෙන්"කම්මස්ස" යන්නෙහි ෂෂ්ඨීවිභක්තියෙහි කරණාර්ථයෙහි වන්නේයයි දතයුතුයි. ප්‍රත්‍යොත්පන්න හෙතූන් පස්දෙනා අතුරෙන්" නෘෂණා,

උපාදාන, භව" යන තුන්දෙන මෙන් අවිද්‍යා-සංඛාරයෝ ද මේ ප්‍රත්‍යුත්පන්නභවයෙහි භවඟන්තවූ ධර්මයෝ ය යි දතයුතුයි. එහෙයින් "ඉධ පරිපාකතන්තා ආයතනානං මොහෝ-අවිජ්ජා ආයූහනා-සංඛාරා, නිකන්තී-තණ්හා, උපගමනං-උපාදානං, චේතනා-භවෝ, ඉති ඉමේ පවඩ්ඪමා කම්මභවසම්මිං ආයතිං පටිසන්ධියාපච්චයා"යනුවෙන් පටිසම්භිදා මාර්ගයෙහි වදාරණ ලද්දේයි ඉඛ, ප්‍රත්‍යුත්පන්නභවයෙහි; ආයතනානං, චක්ඛුරාදී ආයතනයන්ගේ; පරිපාකතන්තා, මිහිකිරීම් වන හෙයින් හෙවත් මිහිකිරීම හේතුකොටගෙණ; මොහෝ, ගවගන්තා නොදැනීම නොදැකීම මුවහකිරීමයයි කියන ලද්දාවූ මොහ තෙම; අවිජ්ජා, අවිද්‍යානම් වේ;ආයූහනා,පුඤ්ඤාභිසංඛාරාදී රැස්කරන්නාවූ චේතනා නොහෙමෝ; සඞ්ඛාරා, සඞ්ඛාර නම් වෙත්. නිකන්තී, රැස් කරණලද කර්මයාගේ විපාකඵල උපදවන්නෙහි ඇලීම් සඞ්ඛ්‍යාත තෘෂ්ණා නොහෙමෝ; තණ්හා, තණ්හා නම්වේ. උපගමනං, දැඩි වශයෙන් ලං කොට ගැන්ම හෙවත් දැඩි වශයෙන් ආමිශීභූත කොට ගැණීම; උපාදානං, උපාදාන නම් වේ. චේතනා, දන් දෙන්නාවූ කල්හි භවගන්නාවූ බුවන චේතනාදී වූ පසුපසුව භවගන්නාවූ චේතනා නොහෙමෝ; භවෝ, භව නම් වේ. ඉති ඉමේ පවඩ්ඪමා, මෙසේ මේ පවත්‍රකාර වූ ධර්මයෝ තුමූ, ඉඛ, මේ ප්‍රත්‍යුත්පන්නභවයෙහි; කම්මභවසම්මිං, කර්මභවයෙහි; "කසිර භාතෙ" යනු පාඨශේෂයි. කසිරභාතෙ, රැස් කරණ ලද කල්හී "ඉමේ පවඩ්ඪමා" යන්නෙහිද, "පච්චයා" යන්නෙහිද සම්බන්ධයි. ආයතිං පටිසන්ධියා, මතු භවයෙහි පටිසන්ධියාගේ; පච්චයා, උපකාරප්‍රත්‍යයෝයි.

පටිච්චසමුප්පාද පාලියෙහි වනාහි:-"තණ්හා, උපාදාන, භව" සඞ්ඛ්‍යාතවූ මේ ප්‍රත්‍යුත්පන්නහෙතුහු තුන්දෙනම් ආයේයි. අවිජ්ජා-සඞ්ඛාර ප්‍රත්‍යුත්පන්නහෙතුහු දෙදෙන නොආයේ යි. මු නවේතනා සඞ්ඛ්‍යාත වූ භවය ගැණීමෙන් පුඤ්ඤාභිසංඛ්‍යාතවූ සංස්කාරයද නොහොත් සත්වෙනි ජවනචේතනා සංඛ්‍යාත වූ භවය ගැණීමෙන් ප්‍රථමවිතීයාදී අට්ඨජවනචේතනා සංඛ්‍යාතවූ සංස්කාරය ද, නොහොත් ලෞකික කුශලාකුශල චේතනා සංඛ්‍යාතවූ භවය ගැණීමෙන් ඒ චේතනා සම්ප්‍රයුක්තවූ චිත්තෝත්පාද සංඛ්‍යාත වූ සංස්කාරයද, නොහොත් ලෞකික කුශලාකුශල චිත්තෝත්පාද සංඛ්‍යාතවූ භවය ගැණීමෙන් ඒ චිත්තෝත්පාදයන් හා සැපියුතුවූ චේතනා සංඛ්‍යාතවූ සංස්කාරයද, තණ්හා-උපාදානයන් ගැණීමෙන් ඔවුන් හා සම්ප්‍රයුක්තවූ

අවිද්‍යාවද, නොහොත් යම් අවිද්‍යාවක් කරණකොටගෙණ මුළා වීමෙන් කර්මය රැස්කරන්නේ වේ ද, ඒ කර්මයාගේ හෙතුභූතවූ අවිද්‍යාවද ගන්නා ලද හෙයින් ප්‍රත්‍යුත්පන්න හෙතුපලකය ගන්නේයි.

අවිද්‍යා-සංස්කාර යන දෙදෙන අතීතකාලයයි කුමක් හෙයින් කියන ලද්දහු ද යත්? පූර්ව පූර්වභවයෙහි භවඟත්තා වූ ධර්මරාශියක් වන හෙයින් අතීත කාලයයි කියත්, "විඤ්ඤාණ, නාමරූප, සළායතන, ඵස්ස, වේදනා, තණ්හා, උපාදාන, භව" යන මේ ධර්මයෝ අවදෙන ප්‍රත්‍යුත්පන්න කාලයයි කුමක් හෙයින් කියන ලදහු ද යත්? දැන් මේ භවයෙහි භවඟත්තාවූ ධර්මරාශියක් වනහෙයින් ප්‍රත්‍යුත්පන්න කාලයයි කියත්. "ජාති ජරාමරණ" යන ධර්මයෝ තිදෙන අනාගත කාලයයි කුමක් හෙයින් කියන ලදහු ද යත්? මතු භවයෙහි භවඟන්තාවූ ධර්ම සමූහයක් වන හෙයින් අනාගත කාලයයි කියත්. මෙසේ කාලත්‍රයක් ඇත්තේයි,

අවිද්‍යා-සංඛාර දෙදෙනා එක් සංක්ෂේපයෙක් වෙයි. විඤ්ඤාණ, නාමරූප, සළායතන, ඵස්ස, වේදනා යන පඤ්චකය එක් සංක්ෂේපයෙක් වෙයි. "තණ්හා, උපාදාන, භව' යන මේ තුන් දෙන එක් සංක්ෂේපයෙක් වෙයි. "ජාති, ජරාමරණ" යන තිදෙන එක් සංක්ෂේපයෙක් වෙයි. මෙසේ සතර සංක්ෂේපයෙක් ඇත්තේ වෙයි. පළමුවෙනි සංක්ෂේපය අතීතසංක්ෂේපය වෙයි. දෙවෙනි සංක්ෂේපය ප්‍රත්‍යුත්පන්න ඵල සංක්ෂේපය වෙයි. තුන්වෙනි සංක්ෂේපය ප්‍රත්‍යුත්පන්න හෙතුසංක්ෂේපය වෙයි. සතරවෙනි සංක්ෂේපය අනාගත ඵල සංක්ෂේපය වෙයි.

සංඛාරය හා විඤ්ඤාණයාගේ අතර එක් සන්ධියෙක. වේදනා-තණ්හා දෙදෙන අතර එක් සන්ධියෙක. භව-ජාති දෙදෙනාගේ අතර එක් සන්ධියෙකැයි මෙසේ සන්ධිත්‍රයක් වෙයි. පළමුවෙනි සන්ධිය අතීත හෙතුව හා ප්‍රත්‍යුත්පන්න ඵලයාගේ සම්බන්ධයයි. දෙවෙනි සන්ධිය ප්‍රත්‍යුත්පන්න ඵලය හා ප්‍රත්‍යුත්පන්න හෙතුහුගේ සම්බන්ධයයි. තුන්වෙනි සන්ධිය ප්‍රත්‍යුත්පන්න හෙතුන්ගේ හා අනාගත ඵලයාගේ සම්බන්ධයයි.

අවිද්‍යාතොමෝ පටිච්චසමුප්පාද පූර්වාන්තයෙහි ප්‍රධාන හෙතුව වන හෙයින් එක් මූලයෙක් වෙයි. තෘෂ්ණා තොමෝ පටිච්ච සමුප්පාදයාගේ අපරාන්තයෙහි ප්‍රධාන හෙතුව වන හෙයින් එක් මූලයෙක් වෙයි. මෙසේ පටිච්චසමුප්පාදයාගේ මූල දෙදෙන දතයුත්තාහුය.

අවිද්‍යාවය, තෘෂ්ණාවය, උපාදානය යන මේ ධර්මයෝ තුන් දෙන ක්ලේශ වෘත්තයයි. සංස්කාරය, කර්මභවය, යන මේ දෙ දෙන කර්මවෘත්තයයි. විඤ්ඤාණ, නාමරූප, සළායතන, ඵස්ස, වේදනා උපපත්තිභව, ජාති, ජරා මරණ යන මේ ධර්මයෝ අට දෙන විපාක වෘත්තයයි. මෙසේ පටිච්චසමුප්පාදයාගේ වෘත්ත යෝ තුන්දෙන දතයුත්තාහුය.

පටිච්චසමුප්පාද වාදශාඛයන් අතුරෙන් දෙලොස් අකුශල චිත්තයෙහි යෙදුනු මොහ චෛතසිකය අවිද්‍යා නම්වූ ලෞකික කුශලාකුශලචිත්තයෙහි යෙදුනු චෙතනා චෛතසිකයෝ එකුන් තිස්දෙන සඞ්ඛාර නම් වෙයි. ඒ සඞ්ඛාර තෙමේ "පුඤ්ඤාභිසංඛාර, අපුඤ්ඤාභිසඞ්ඛාර, ආනෙඤ්ජාභිසංඛාර" යයි ත්‍රිවිධාකාර වේ. ඔවුන් අතුරෙන් අටමහා කුශලචිත්තය, රූපාවචර කුශල චිත්තයෝ පස්දෙනය යන තෙළෙස් චිත්තයෙහි යෙදුනාවූ චෙත නාවෝ තෙළෙස්දෙන පුඤ්ඤාභිසංඛාර නම් වේ. දෙළොස් අකු ශල චිත්තයෙහි යෙදුනාවූ චෙතනාවෝ දෙළොස්දෙන අපුඤ්ඤාභි සංඛාර නම් වේ. අරූපාවචර කුශලචිත්තයෙහි යෙදුනාවූ චෙත නාවෝ සතරදෙන ආනෙඤ්ජාභිසංඛාර නම් වේ. මේ එක් ක්‍රම යකි. විකල්පවශයෙන් එකුන් අනුවක් චිත්තයෙහි යෙදුනාවූ හෙවත් සතිපට්ඨානසූත්‍රයෙහි වදාළාවූ සරාග, සදෝස, සමෝහාදීවූ එකුන් අනුවක් චිත්තයෙහි යෙදුනාවූ චෙතනාවෝ එකානූව සංඛාර නම් වෙත්.

සංඛාර ප්‍රත්‍යයෙන් භවඟන්නාවූ ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි විපාක විඥානයෝ දෙතිස්දෙන විඤ්ඤාණ නම් වේ. නොහොත් එකා නුවක් චිත්තයෝම විඤ්ඤාණ නම් වේ. ඒ විඤ්ඤාණතෙමේ සහ ජාත විඤ්ඤාණය, අභිසංඛාර විඤ්ඤාණය, පවත්තිජාත විඤ්ඤාණ යයි ත්‍රිවිධාකාර වේ. ඒ ත්‍රිවිධාකාර විඤ්ඤාණයන් අතුරෙන් සම් ප්‍රයුක්ත චාක්ෂුසාදීන්ගේය, චිත්තජරූපයෝය, ප්‍රතිසන්ධිකර්මජ රූපය යන මොවුන්ට උපකාරවන්නාවූ ප්‍රත්‍යුත්පන්නවූ එකා නුවක් චිත්තය සහජාත විඤ්ඤාණ නම් වේ. විපාකනාමායතන යෝය, ප්‍රතිසන්ධිකර්මජරූපය, අසංඥසත්ත්වකර්මජරූපය, ප්‍රවෘත්ති කර්මජරූපය, යන මොවුන් උපදවන අතීත කුශලාකුශල සිත් තෙමේ අභිසංඛාර විඤ්ඤාණ නම් වේ. පූර්ව පූර්ව චිත්තය හා එකොත්පාදව රූපයාගේ ඨිතිකාලයට පැමිණියාවූ එකජකාය, ද්විජකාය, ත්‍රිජකාය, චතුජකාය යන රූපධර්මයන්ට උපකාරවන් නාවූ සතර අරූපාවචර විපාකය හැර පශ්චිම පශ්චිමවූ පන් සැත්තැවක් චිත්තය පවත්තිජාත විඤ්ඤාණ නම් වේ.

ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි වශයෙන් පවත්නා ලෞකික විපාක චිත්ත යෙහි යෙදුනු වෛතසික නාමස්කන්ධයෝ තුන්දෙනය. අට ලොස් කම්ජරූපය, පසළොස් චිත්තජරූපය, යන මෙතෙක් ධර්මයෝ තුමූ විඤ්ඤාණප්‍රත්‍යයෙන් හටගත් නාමරූප නම්වෙත්. එනම් එකානූවක් චිත්තයෙහි යෙදුනාවූ දෙපණස් වෛතසිකය චතුජකාය සංඛ්‍යාතවූ කම්-චිත්ත-ඍතු-ආහාර යන සතරින් හටගත්තාවූ අටවිසිරූපය යන මෙතෙක් ධර්මයෝ තුමූ විඤ්ඤාණ ප්‍රත්‍යයෙන් හටගන්නාවූ නාමරූපය කී වේත්.

චක්ඛායතනය, සෝතායතනය, ඝාණායතනය, ජිව්හායතනය, කායායතනය, මනායතනය, යන අඩ්‍යාත්ම්කායතනයෝ සළෙන නාමරූප ප්‍රත්‍යයෙන් හටගත්තාවූ සළායතනයෝ නම් වෙත්.

ලෞකික විපාක චිත්තයෙහි යෙදුනු ඵස්සීවෛතසික සංඛ්‍යාතවූ චක්ඛුසම්ඵස්සය, සෝතසම්ඵස්සය, ඝාණසම්ඵස්සය, ජිව්හාසම්ඵස්සය, කායසම්ඵස්සය, මනොසම්ඵස්සය, යන මේ ස්පර්ශයෝ සළෙන ෂඩ්ආයතන ප්‍රත්‍යයෙන් හටගත් ස්පර්ශ නම් වේ. නොහොත් එකානූවක් ස්පර්ශවෛතසිකය යි කියන ලද චක්ඛුසම්ඵස්සය ආදී කෝට ඇති මනොසම්ඵස්සය, අවසන් කොට ඇත්තාවූ එකුන් අනූවක් ස්පර්ශයෝ තුමූ ඵස්සනම්වෙත්.

දෙතිස් ලෞකික විපාක චිත්තයෙහි යෙදුනාවූ වේදනා වෛතසිකයෝ දෙතිස්දෙන හෝ එකුන්අනූවක් චිත්තයෙහි යෙදුනු වේදනා වෛතසිකයෝ එකුන්අනූදෙන ස්පර්ශප්‍රත්‍යයෙන් හටගත් වේදනා නම්වේ

"සංඛාර, විඤ්ඤාණ, නාමරූප, ඵස්ස, වේදනා" යන ධර්මයෝ පස්දෙන දෙයාකාරයකින් බුදු දහම්වූ හෙයින් පටිච්චසමුප්පාද විභඞ්ග සූත්‍රාගත ඛාජනියෙහි ආවාවූ ක්‍රමයයි දතයුතුයි. පශ්චිම ක්‍රමයෙහි වනාහී එම පටිච්චසමුප්පාදවිභඞ්ගපාලියෙහි නොහොත් ධාතු කථා පාලියෙහි ආවාවූ ක්‍රමයයි දතයුතුයි. සව්වවිභඞ්ගය, පටිච්චසමුප්පාදවිභඞ්ගය, සම්මාඅවිජ්ජානිදානී අට්ඨවිධාවය, විභඞ්ගමාගී අට්ඨවාමය, යනාදී අර්ථ කථා ටීකාවන්හෙන් මෙහි විශෙෂ විභාග දතයුත්තේයි.

—०—

(ප)

හෙතුපච්චයෝ, (බුඟ ඇඹතු ආදී වෘක්ෂයන්ගේ මූලය ඒ වෘක්ෂයන්ගේ සථිරව පිහිටීමට උපකාර වන්නාක් මෙන් මොන

වට පිහිටීම සිඳකරන්නා වූ) හෙතු ආදී ධර්මයන් සදෙනාගේ උප කාරය ද; ආරම්මණපච්චයෝ, (රූකැන් සැරයටි ආදින් දුර්වලවූ වන්ගේ නැගිටීම්දී කෘත්‍යය සිඳ කිරීමට උපකාර වන්නාවූ මෙන් චිත්තචෛතසික ධර්මයන්ගේ නැගී සිටීම හා පැවතීමට උපකාර වන්නාවූ) රූපාදී ආරම්මණයන්ගේ උපකාරබව ද; අධිපති පච්චයෝ, (සක්විතිරජ තෙමේ අවශෙෂ රාජ-රාජමහා මාත්‍යාදීන්ගේ ශකතිය මැඩ පවත්වා රටවාසීන්ගේ සුඛසිද්ධිය පිණිස අධිපතිභාවයෙන් උපකාර වන්නාක් මෙන් අන්‍ය ධර්ම යන්ගේ අධිපතිභාවය මැඩ පවත්වා අධිපතිභාවයෙන් උපකාර වන්නා වූ අධිපතිප්‍රත්‍යයද; අනන්තරපච්චයෝ, (සක්විති රජ හුගේ දිවඹත බිම පුත්‍රරත්නයට අභිෂෙක කිරීම පිණිස උප කාර වන්නාක් මෙන් අනන්තරභාවයෙන් උපකාර වන්නා වූ අනන්තර ප්‍රත්‍යය ද; සමනන්තර පච්චයෝ, සක්විතිරජහුගේ පැවිදි බිම පුත්‍රරත්නයට රාජ්‍යලාභය පිණිස උපකාර වන්නාක් මෙන් නොඅඩාත් මහතෙරුන් වහන්සේගේ සංඝසභාගියන් කැ ගිව ගාම අනුතෙරුන් වහන්සේගේ මහාසප්පිරභාවයට උපකාර වන්නාක් මෙන් මොනවට අතරක් නැතිවීම් වශයෙන් උපකාර වන්නාවූ) සමනන්තර ප්‍රත්‍යය ද; සහජාතපච්චයෝ, ප්‍රදීපවට්ටි කාච දැල්වීම හා සමන ආලෝකය පැතිර ගාමට උපකාර වන්නාක් මෙන් එක්ව හටගැණීම් වශයෙන් උපකාර වන්නාවූ) සහ ජාතප්‍රත්‍යය ද; අඤ්ඤමඤ්ඤ පච්චයෝ, (ත්‍රිදණ්ඩාය හෙවත් පාතුණක් ඇත්තා වූ පීඨය පිහිටා සිටීමට එක් දණ්ඩක් අනික් දණ්ඩකට ද එක් පාදයක් අනික් පාදයකට ද උපකාර වන්නාක් මෙන් ඔවුනොවුන්ගේ පිහිටා සිටීමට ඔවුනොවුන්ගේ උපකාර සංඛ්‍යාත වූ) අඤ්ඤමඤ්ඤප්‍රත්‍යය ද; නිස්සය පච්චයෝ, (වෘක්ෂ ලතාදීන්ගේ පිහිටීමට මහාපෘථිවිය පිහිටවන්නාක් මෙන් ද, සිතියම් අක්ෂරාදිය පිහිටා සිටීමට වස්ත්‍රතාලපත්‍රාදිය උපකාර වන්නාක් මෙන් බලවත් නිශ්‍රය වශයෙන් උපකාර වන්නා වූ) නිශ්‍රය ප්‍රත්‍යය ද; උපනිස්සය පච්චයෝ, (වර්ෂාකාරම්භයේ වස්නා වූ ජලවර්ෂාව නිසා පවත්නාවූ වෘක්ෂාදීන්ට හා භූමිතලය පවී තය ආශ්‍රය කරන්නාවූ වෘක්ෂලතාදීන්ට භූමිරාශිය උපකාර වන්නාක් මෙන්ද බලවත්වූ නිශ්‍රය වශයෙන් උපකාර වන්නාවූ උපනිශ්‍රය ප්‍රත්‍යය ද; පුරෙජාතපච්චයෝ, (ප්‍රථම කල්පයෙහි පහ ලවූ චන්ද්‍ර සූර්‍යාදීහු තමාගේ ප්‍රකටව ඇත්තාවූ කාලයෙහි ආලෝ කය නිශ්‍රය කොට ඇති සත්වයන්ට උපකාර වන්නාක් මෙන් පෙරටුව ඉපදීම් වශයෙන් උපකාර වන්නාවූ) පුරෙජාත ප්‍රත්‍ය යය; පච්ඡා ජාතපච්චයෝ. (හිඳුලිහිණි පැවතුන්ට ඇත්තාවූ

ආහාරතෘෂ්ණාතොමෝ පසුව හටගන්නාවූ ඔවුනොවුන්ගේ ශරීර ය න්ට උපකාර වන්නාක් මෙන් ප්‍රත්‍යෘත්පන්නධර්ම පෙරටුව ඉපිද ප්‍රත්‍යග ධර්ම පසුව ඉපදීමෙන් උපකාර වන්නා වූ) පඤ්ච ජාතප්‍රත්‍යය ද; ආසෙවනපච්චයෝ, (පුළු පුළුව සුවඳ ගල්වන ලද වඳනකල්කාදිය පසුපසුව ගල්වන්නා වූ වඳනාදියෙන් සුගඤ්ධ බහුලත්වය වන්නාක් මෙන් ද; පළමු පළමු උගන්නා ලද ග්‍රන්ථය පසුපසුව උගන්නාවූ ග්‍රන්ථයන්ට උපකාර වන්නාක් මෙන් නැවත නැවත සෙවනය කිරීමෙන් උපකාර වන්නාවූ) ආසෙවන ප්‍රත්‍යය ද; කම්මපච්චයෝ, (මොනවට අව් ගස්වා කොටුගුල් ආදියෙහි සුරැකිව තබනලද බීජය අංකුරය හටගැණීම පිණිස සහස් කිරීම් වශයෙන් උපකාර වන්නාක් මෙන් එලධර්මයාගේ හට ගැණීමපිණිස සහස්කිරීම් වශයෙන් උපකාරවන්නාවූ) කම්ප්‍රත්‍ය ය ද; විපාකපච්චයෝ, (සිහිල් වූ මඳමාරුතය සිහිල් වූ ස්ථානයේ උන් පුරුෂයෙක්හට ශරීරවිඩා සන්සිඳවීම පිණිස උපකාර) වන්නාක් මෙන් නිරුත්සාහඥානහාවයෙන් උපකාර වන්නාවූ විපාකප්‍රත්‍යය ද; ආහාරපච්චයෝ, (පසුව දෙන්නා වූ බලකාරව් පුරුණගුණය සපිරව පිහිටා සිටීමට උපකාර වන්නාක් මෙන් උපස්තම්භ වශයෙන් පැවැත්වීම් වශයෙන් හෝ උපකාර වන්නාවූ) ආහාර ප්‍රත්‍යය ද; ඉන්ද්‍රියපච්චයෝ, (එක් රජෙක් යටතෙහි නොයෙක් රාජකාර්‍යයෙහි යෙදුනු රාජාමාත්‍යයෝ තුමූ ඔවුනොවුන්ගේ බලය මැඩ නොපවත්වා තමතමන්ගේ ස්ථානයෙහි ඊශ්වරභාවයෙන් උපකාර කරන්නාක් මෙන් අන්‍යවූ ධර්මයන්ගේ ඊශ්වරභාවය මැඩ නොපවත්වා තමතමාගේ ස්ථානයෙහි ඊශ්වර රභාවය කරන්නාවූ) ඉන්ද්‍රියප්‍රත්‍යය ද; ඣානපච්චයෝ, (පණිත යක් මුදුනට හෝ වෘක්ෂයක් මුදුනට හෝ නැගී බලන පුරුෂ තෙම දූරාරම්පසඤ්ඤය දැකීම කරණකොටගෙණ ඒ දැකීමෙහි අභිමත වූ පුරුෂයන්ට උපකාර වන්නාක් මෙන් ලං කොට බැලීම් වශයෙන් උපකාර වන්නාවූ) ඣානප්‍රත්‍යය ද; මග්ගපච්ච යෝ; (මෙතරින් එතරට තරණය කරන පුරුෂ තෙම මෙතරින් නික්ම යාමට හේතු වන්නාක් මෙන් ද; එතරින් මෙතරට තර ණය කරන පුරුෂ තෙමේ එතරින් නික්ම යාමට උපකාර වන්නාක් මෙන් ද නික්මයාම් වශයෙන් උපකාර වන්නා වූ) මාර්ග ප්‍රත්‍යය ද; සම්පයුත්තපච්චයෝ, (කිරි හිතෙල් මී සකුරු යන චතුම්ධුරරස තෙමේ ඔවුනොවුන් සම්බන්ධවීම් වශයෙන් උපකාර වන්නාක් මෙන් එක්ව යෙදීම් වශයෙන් උපකාර වන්නාවූ) සම් ප්‍රයුක්තප්‍රත්‍යය ද; විප්පයුත්තපච්චයෝ, (මධුර-අම්බිල-ඝට්ටක-ලවන තික්ත-කසට යන ෂට්රසය ඔවුනොවුන් මිශ්‍ර නොවීම්

වශයෙන් ඔවුනොවුන්ගේ රසයට උපකාර වන්නාක් මෙන් විපපයුක්තවශයෙන් උපකාර වන්නා වූ) විපපයුත්තප්පච්චය ද; අත්ථිපච්චයෝ, (හිමාලය පර්වතාදීන්ගේ වැඩිම පිණිස තමාගේ විද්‍යමාන භාවශයෙන් උපකාර කිරීමක් මෙන් ප්‍රකටව ඇත්තාවූ හෙවත් විද්‍යමානභාවයෙන් උපකාර කරන්නාවූ) අත්ථිප්පච්චය ද; නත්ථිපච්චයෝ, (රාත්‍රියගේ හෙවීම සූර්‍යයාගේ පහලවීමට උපකාර වන්නාක් මෙන් ද තෙල් පහණක් නිවීයාම අඬුකාරයාගේ පැතිරීමට උපකාර වන්නාක් මෙන්ද; අවිද්‍යමාන භාවයෙන් හෙවත් නාස්තිභාවයෙන් උපකාර වන්නාවූ) නාස්තිප්පච්චය ද; විගතපච්චයෝ, (සූර්‍යාලෝකය පහවීයාම චන්ද්‍රාලෝකය පහලවීමට උපකාර වන්නාක් මෙන් පහවීම වශයෙන් උපකාර වන්නාවූ) විගත ප්‍රත්‍යය ද; අවිගතපච්චයෝ, (මහාසමුද්‍රය තෙමේ තමා නිසා පවත්නා වූ මත්ස්‍යාදීන්ට හා සමුද්‍රය ආශ්‍රය කරන්නා වූ දිව්‍ය අසුරාදීන්ට ද ප්‍රීති සෞමනස්‍යය ඉපදීම පිණිස තමාගේ පහ නොවීමෙන් උපකාර වන්නාක් මෙන් තමාගේ සවභාව වශයෙන් පහ නොවීම් වශයෙන් උපකාර වන්නාවූ) අවිගත ප්‍රත්‍යය ද; ඉති, මෙසේ; චතුවීසතිපච්චයා සුවිසි ප්‍රත්‍යධර්මයෝ තුමූ; මහාපකරණෙ, අනන්තනයසමන්නත පට්ඨාන මහාප්‍රකරණයෙහි; උද්දෙසභාවෙන ඨිතා, උද්දේශභාවයෙන් සිටියාහුය. ඉතො, උද්දේශකයින් අන්‍ය වූ නිද්දේශනය දක්වමි:—

ජ්ඣා නාමඤ්ච-පෙ-පච්චයා කථං. නාමං, නාමතෙමේ; නාමරූපිකං, නාමරූප ධර්මයන්ට; පච්ඣා පච්චයෝ හොති, පස් ආකාරයකින් උපකාර වෙයි. පුන, නැවත; නාමං, නාම තෙමේ; රූපස්ස, රූපයට; එකධා පච්චයෝ හොති, එක් ආකාරයකින් උපකාරවෙයි. ච, නාමප්‍රත්‍යයෙන් අන්‍යවූ රූප ප්‍රත්‍යය දක්වමි:—රූපං, රූප තෙමේ; නාමස්ස, නාමයට; එකධා, එක්ප්‍රකාරයකින්; පච්චයෝ හොති, උපකාර වෙයි. පඤ්ඤත්ති නාමරූපානි, ප්‍රඥප්තිනාමරූපයෝ තුන්දෙන; නාමස්ස, නාමයට; දුවිධා, ව්‍රිප්‍රකාරයකින්; පච්චයාභොනති, උපකාරවෙත්. ච, සුඛ නයින් අන්‍යවූ මිශ්‍රනයය කියමි:-චතුං, නාමරූපච්ච; චතුස්ස, නාමරූපචතයට; නවධා පච්චයෝ හොති, නවප්‍රකාරයකින් උපකාර වෙයි. ඉති, මෙසේ; පච්චයා, ප්‍රත්‍යධර්මයෝ තුමූ හෙවත් උපකාරකධර්මයෝ තුමූ; ජ්ඣබ්බා ඨිතා, සයාකාරයකින් සිටියාහුය. කථං? කෙසේ ද යත්? ච, යනු තත්ප්‍රකටීකරණාර්ථයෙහි නිපාතයි.

අනන්තරනිරුද්ධා චිත්තචෙතසිකා ධම්මා, අනන්තරුප්පන්න නිරුද්ධවූ එකුන් අනූවක් චිත්තය දෙපණස් චෛතසිකය යන නාමස්කන්ධයෝ තුමූ; පච්චුප්පන්නානං, තමහට අනන්තරුව හටගන්නාවූ චිත්තචෛතසිකානං ධම්මානං, එකුන්අනූවක් චිත්තය දෙපණස් චෛතසිකය යන නාමස්කන්ධයන්; අනන්තර-සමනන්තර-නත්ථි-විගතවසෙන, අනන්තර ශක්තිය, සමනන්තර ශක්තිය, නැති ශක්තිය, විගත ශක්තිය, යන ඇතරුකාර ප්‍රත්‍යයන්ගේ ශක්තියෙන්; පච්චයා හොන්ති, උපකාර වෙත්. පුරිමානි ජවනානි, පළමුවූ උපන් ජවනයෝ මාගී ඵලජවනයන් වර්ජිත කොට ඇති එක්පණස් ජවන්හුය දෙපණස් චෛතසිකය යන නාමස්කන්ධයෝ; පච්ඡිමානං ජවනානං, පසුව උපදින ජවනයන්ට; ආසෙවන වසෙන ච, ආසෙවන ප්‍රත්‍යය ශක්තියෙන්ද; පච්චයා හොන්ති, උපකාරවෙත්. සහජාතා චිත්තචෛතසිකා ධම්මා, එක්ව හටගත් චිත්ත චෛතසිකධර්මයෝ; අඤ්ඤමඤ්ඤං, ඔවුනොවුන්ට; සම්පයුත්තවසෙන ඉතිව, සම්ප්‍රයුක්ත වශයෙන්දැයි; පච්චයා හොන්ති, උපකාරවෙත්; ඉති, මෙසේ; නාමං, නාමතෙම්; නාම සස එව, නාමයහටම; ඡ්ඣා, සහකාරයකින්; පච්චයෝ හොති උපකාරවේ.

හෙතුඛාතඛ්ඣමග්ගඛ්ඣානි, හෙතුධර්ම්ධ්‍යානාඞ්ගධර්ම මාගී්ඞ්ග ධර්මයෝ තුමූ; සහජාතානං නාමරූපානං, එක්ව හටගත් නාම රූපයන්ට; හෙතාදිවසෙන, හෙතුප්‍රත්‍යාදීන්ගේ වශයෙන්; පච්චයා හොන්ති, උපකාරවෙත්. සහජාතා, එක්ව හටගත්; චෙතනා, එකුන් අනූවක් චිත්තයෙහි යෙදුනු එකුන්අනූවක් චෛතනාවෝ තුමූ; සහජාතානං, එක්වහටගත්; නාමරූපානං, එකුන්අනූවක් චිත්තය චෙතනාවර්ජිතවූ එක්පණස් චෛතසිකය; චිත්තජ රූපය පවිසන්ධිකම්ජරූපය යන මොවුන්ට; කම්මවසෙන, කර්ම්ප්‍රත්‍ය වශයෙන්; පච්චයෝ හොති, උපකාරවෙයි. නානාක්ඛණිකා, වෙනස් වෙනස්වූ කාලයෙහි හටගත් නෙවත් අතීතකාලිකවූ; චෙතනා, කුශලාකුශල චෙතනාවෝ තෙයිස්දෙන; කම්මාභිනිබ්බත්තානං, කර්ම්සම්භව්‍යාත තමා හෙතුකොටගෙන උපන්නාවූ; නාම රූපානං, සතිස් විපාක නාමස්කන්ධයෝය; පටිසන්ධිකම්ජරූපය අසංඥසත්ත්වකම්ජරූපය ප්‍රවෘත්තිකම්ජරූපය යන මොවුන්ට; කම්ම වසෙන, නානාක්ඛණික කර්මශක්තියෙන්; පච්චයෝ හොති, උපකාර වේ. විපාකක්ඛන්ධා, සතිස් විපාක නාමස්කන්ධයෝ තුමූ; අඤ්ඤමඤ්ඤං, ඔවුනොවුන්ට; සහජාතානං, එක්ව හටගත්; රූපානඤ්ච, චිත්තජරූපය පවිසන්ධිකම්ජරූපය යන මොවුන්ටද, විපාකවසෙන, විපාකශක්තියෙන්; පච්චයා හොන්ති, උපකාර

වෙත්. ඉති, මෙසේ; නාමං, නාම්තෙමේ; නාමරූපානං, නාම රූපයන්ට; පඤ්ඩධා, පඤ්ප්‍රකාරයකින්; පච්චයෝ හොති, පසවේ; පච්ඡාජාතා, පසුපසුව හටගත්; චිත්තචෙතසිකා ධම්මා, පඤ්ච වොකාරභූමියෙහි හටගන්නා කල්හි අරූපවිපාක සතර වර්ජිතකොට ඇති ප්‍රථමඛණ්ඩාදී පසුපසුව හටගත්තාවූ අසූපස් චිත්තය දෙපණස් චෙතසිකය යන නාමසඤ්ඤියෝ තුමූ; පුරෙජාතස්ස, පෙරටුව හටගත්; ඉමිස්ස නාමස්ස, ප්‍රතිසන්ධි ආදි මේ පූර්වපූර්වචිත්තයන් හා සමඟ එකට උපදනා රූපයාගේ ස්ථිතිකාල යට පැමිණියාවූ එකජඛණය විජඛණය තිජඛණය චතුජඛණය යන මොවුන්ට; පච්ඡාජාතවසෙන, පච්ඡාජාතශක්තියෙන්; පච්චයා හොනති, පසහු වෙත්. ඉති, මෙසේ; නාමං, නාම්තෙමේ; රූපස්ස, රූපයට; එකඛාව, එක් ප්‍රකාරයකින්ම; පච්චයෝ හොති, පසවේ. ඡවිවත්ථුනි, ඡවිවිඤ්ඤාණාදිනි; තොහාත් මනුස්සක-අමනුස්සක-මජ්ඣිමායුකා වශයෙන් ත්‍රිවිධාකාර වස්තූන් අතුරෙන් මජ්ඣිමායුකව එක් අතීතඛණඛයඨිත්තු ගේ උත්පාදක්ඛණය හා සමඟ එකොත්පාදවූ චක්ඛුවත්ථුය සොතවත්ථුය ඝාණවත්ථුය ජිව්හාවත්ථුය කායවත්ථුය ප්‍රතිසන්ධ්‍යාදි පූර්වපූර්වචිත්තයන් හා සමඟ එකොත් පාදවූ හෘදය වසතුවය නිරොධ සමාපත්තියෙන් නැගී සිටිනා කල්හි පූර්වයෙන් හටගත් හෘදය වසතුවය මරණාසන්න කාල යෙහි චුතිචිත්තක්ඛණයෙහි පවත් ආපසු ගිණු කල්හි සතළොස් වන චිත්තයෙහි උත්පාදක්ඛණය හා සමඟ එකොත්පාදවූ හෘදය වසතුවද මෙකී සවැදෑරුම්වූ වසතුරූපයෝ; පවත්තියං, ප්‍රවෘත්ති කාලයෙහි; සන්තතියං විඤ්ඤාණධාතුයං, සන්තතිධාතුධාතුන්ට, පුරෙජාතවසෙන, වසතු පුරෙජාතශක්තියෙන්; පච්චයා හොනති, පසහුවෙත්: පඤ්චාලම්බණාදිව, රූපාදි පස්අරමුණුද; පඤ්ච විඤ්ඤාණවීථියා, චක්ඛුර්විඤ්ඤාණාදී පඤ්චවිඤ්ඤාණවීථියෙහි; පුරෙජාතවසෙන, පුරෙජාතප්‍රත්‍යය වශයෙන්; පච්චයා හොනති, පසහුවෙත්. ඉති, මෙසේ; රූපං, රූපයතෙම; නාමස්ස, නාමය හට; එකඛාව, එක්ප්‍රකාරයකින්ම; පච්චයෝ හොති, පසවේ.

ආලම්බණවසෙන ච, රූපාදී අරමුණු විසින්ද; උපනිස්සය වසෙනව. බලවත් නිශ්‍රය විසින්ද; ඉති, මෙසේ; විඛා, විප්‍රකාරයකින්; පඤ්ඤත්තති නාමරූපානි, ප්‍රඥප්තිනාමරූපයෝ; නාමස්ස එව, නාමයටම; පච්චයා හොනති, පසහු වෙත්.

තත්‍ර, ඒ ප්‍රඥප්ති නාමරූපයන් අතුරෙත්; ආලම්බණං, අරමුණ තෙමේ; රූපාදිවසෙන, රූපාදිවශයෙන්; ඡබ්බිධා හොති; සවැදෑරුම් වේ.

උපනිස්සයෝ පන, උපනිස්සය ප්‍රත්‍යයතෙම වනාහි; ආලම්බණූපනිස්සයෝ ච, ආරම්මණූපනිස්සයද; අනන්තරූප නිස්සයෝ ච, අනන්තරූප නිස්සයද, පකතූපනිස්සයොව ඉති, ප්‍රකෘතොපනිස්සය දැයි; තිවිධෝ හොති, ත්‍රිවිධ වේ.

රාගාදයෝ පන ධම්මා ච, රාගාදී ධර්මයෝද වනාහි; සද්ධා, දයෝ ච ධම්මා, ශ්‍රද්ධාදීවූ ධර්මයෝද; සුඛඤ්ච, සුඛයද; දුක්ඛඤ්ච, දුක්ඛයද; ඡොජ්ඣඤ්ච, බොජ්ඣයද; උතුච, හෙමන්තාදී ඍතුද; සෙනාසනඤ්ච, සෙනසුනද; ඝථාරහං, සුදුසුපරිද්දෙන්; අඤ්ඤතඤ්ච, තමාගේ සතන්හිද; බහිද්ධාච, බැහැරද; කුසලාදිධම්මානං, කුශලාදීධර්මයන්ටද; කම්මං, කුශලාදිකර්මයතෙම; විපාකානඤ්ච, විපාකයන්ටද; පකතූපනිස්සයෙන පච්චයා හොති, ප්‍රකෘතොප නිශ්‍රයෙන් පස වේ. ඉති, මෙසේ පකතූපනිස්සයෝ, ප්‍රකෘතොප නිශ්‍රය ප්‍රත්‍යයතෙම; බහුධා හොති, බහුප්‍රකාරයෙන් වේ.

අධිපති සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය ආහාර ඉන්ද්‍රිය විපප යුත්ත අත්ථි අවිගතවසෙන ඉති, අධිපති ප්‍රත්‍යයද, සහජාත ප්‍රත්‍ය ඨද, අඤ්ඤමඤ්ඤ ප්‍රත්‍යයද, නිශ්‍රය ප්‍රත්‍යයද, ආහාර ප්‍රත්‍යයද, ඉන්ද්‍රිය ප්‍රත්‍යයද, විප්‍රයුක්ත ප්‍රත්‍යයද, අත්ථි ප්‍රත්‍යයද, අවිගතප්‍රත්‍ය ඨද ඝන මොවුන්ගේ වශයෙන්දැයි; ඝථාරහං, සුදුසු පරිද්දෙන්; නවධා, නවප්‍රකාරයකින්; නාමරූපානි, නම් රූ දෙදෙන; නාම රූපානං, නාමරූපයන්ට; පච්චයා හොනති, ප්‍රත්‍යයෝ වෙත්.

තත්‍ථ, ඒ අධිපති ප්‍රත්‍යයාදී නවදෙන අතුරෙන්; ඔරුක්කං ආලම්බණා, ඔරුකොට ගන්නාලද අරමුණතෙම; ආලම්බණාධි පත්‍යවසෙන, ආරම්මණාධිපතිවශයෙන්; නාමානඤ්ච, නාමයන්ටද චතුබ්බිධොපි සහජාතාධිපති, සිව්වැදෑරුම්වූද සහජාතාධිපති ප්‍රත්‍යයතෙම; සහජාතවසෙන, සහජාත වසින්; සහජාතානං නාමරූපානඤ්ච ඉති, සහජාත නාමරූපයන්ටද; අධිපති ප්‍රත්‍ය යෙන් ප්‍රත්‍යයවේයයි; අධිපතිපච්චයා දුවිධෝ හොති, අධිපති ප්‍රත්‍යය තෙම දෙවැදෑරුම් වේ.

චිත්ත චෙතසිකා ධම්මා, චිත්ත චෛතසික ධර්මයෝ තුමූ; අඤ්ඤමඤ්ඤඤ්ච, ඔවුනොවුන්ටද; සහජාතරූපානඤ්ච, සහජාත රූපයන්ටද; මහාභූතා, පඨවී ආදී සතරමහාභූතයෝ; අඤ්ඤ මඤ්ඤඤ්ච, ඔවුනොවුන්ටද; උපාදරූපානඤ්ච, සූවිසි උපාදාය රූපයන්ටද; පටිසන්ධික්ඛණෙ, ප්‍රතිසන්ධි ක්ෂණයෙහි; වත්ථුවිපාකා, හෘදයාදී වසතු හා විපාක විඤ්ඤාණයෝ; අඤ්ඤමඤ්ඤංච, ඔවු

නොවුන්ටද; සහජාත ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යයවේවිසි; ඉති, මෙසේ; සහජාතපච්චයො තිවිධො හොති, සහජාත ප්‍රත්‍යයතෙමේ; ත්‍රිවිධ වේ.

චිත්ත' චෛතසිකා ධම්මා, චිත්තචෛතසික ධර්මයෝ තුමූ; අඤ්ඤමඤ්ඤප්‍රත්‍යය, ඔවුනොවුන්ටද; මහාභූතා, සතර මහාභූතයෝ; අඤ්ඤමඤ්ඤප්‍රත්‍යය, ඔවුනොවුන්ටද; පටිසන්ධික්ෂණ, ප්‍රතිසන්ධි ක්ෂණයෙහි; වත්ථුවිපාකා, වස්තුවිපාකයෝ; අඤ්ඤමඤ්ඤප්‍රත්‍යය, ඔවුනොවුන්ටද; අඤ්ඤාඤ්ඤ ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේනුයි; අඤ්ඤමඤ්ඤ පච්චයො තිවිධො හොති, අන්‍යෝන්‍ය ප්‍රත්‍යය තෙවැදෑරුම් වේ.

චිත්තචෙතසිකා ධම්මා, චිත්තචෛතසික ධර්මයෝ තුමූ; අඤ්ඤමඤ්ඤප්‍රත්‍යය, ඔවුනොවුන්ටද; සහජාතරූපානඤ්ච, සහජාත රූපයන්ටද; මහාභූතා, මහාභූතයෝ; උපාදාරූපානඤ්ච, උපාදාය රූපයන්ටද; ඡවත්ථූනි, ඝෘදයාදී ෂට්වස්තූනු; සත්තන්නං විඤ්ඤාණධාතූනං ඉතිව, සප්තවිඤ්ඤාණධාතූන්ටද; නිශ්‍රය ප්‍රත්‍ය යෙන් ප්‍රත්‍ය වේනුයි නිස්සය පච්චයො තිවිධො හොති, නිසපස තෙවැදෑරුම් වේ.

කබළිකාරො ආහාරො, කබළීකාරාහාරය තෙම; ඉමස්ස කායස්ස, මේ රූපකයටද; අරූපිනො ආහාරා, එස්සාදී නාමාහාර යෝ; සහජාතානං නාමරූපානං ඉතිව, සහජාතවූ නාමරූපයන් වද; ආහාර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේනුයි. ආහාර පච්චයො දුවි ධො හොති, අහරපස දෙවැදෑරුම් වේ.

පවපපඤ්ඤා, චක්ෂුරාදී පඤ්චප්‍රඥාදයෝ; පඤ්චන්නං විඤ්ඤාණ නඤ්ච, චක්ෂුර්විඥාණාදී පඤ්චවිඤ්ඤාණයන්ටද; රූපජීවිතින්ද්‍රියං. රූපජීවිතේන්ද්‍රියතෙම; උපාදින්නරූපානඤ්ච, කර්මජරූපයන්ටද; අරූපිනොඉන්ද්‍රියා, නාමෙන්ද්‍රියයෝ තුමූ; සහජාතානං නාමරූපා නං ඉතිව, සහජාත නාමරූපයන්ටද; ඉන්ද්‍රියප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේනුයි; ඉන්ද්‍රියපච්චයො තිවිධො හොති, ඉඳුරුපස තෙවැදෑරුම් වේ.

ඔඣානතික්ඛණෙ, ප්‍රතිසන්ධික්ෂණයෙහි; වත්ථු, කායාදී වස්තු තෙම; විපාකානංව, විපාකයන්ටද; චිත්තචෙතසිකා ධම්මා, චිත්තචෛතසික ධර්මයෝ තුමූ; සහජාත රූපානංව, සහජාත රූපයන්ටද, සහජාත වසෙන, සහජාතවශයෙන් ප්‍රත්‍යයවේ,

පච්ඡාජාතං, පසුව **හටගත්තාවූ**; චිත්ත චෙතසිකාධම්මා, **චිත්ත** චෛතසික ධර්මයෝ තුමූ; **පුරෙජාතස්ස**, පූර්වයෙහි හටගත්තාවූ; ඉමස්සකායස්ස, මේ කයට; පච්ඡාජාතවසෙන, පසුව හටගැණීම් වශයෙන් **ප්‍රත්‍යය වේ**. ඨිතියා, හෘදයාදී ආධාරස්තූහු; පවත්තියං, **පවත්නී**; සත්තන්නං විඤ්ඤාණධාතූනං, **සත්විනැනදාවුන්ට**; **පුරෙජාතවසෙන**, පෙරදැවිසින්; විප්පයුත්ත ප්‍රත්‍යයෙන් **ප්‍රත්‍යය වේවුනුයි**; විපපයුත්තපච්චයෝ තිවිධෝ හොති, **විප්‍රයුක්ත ප්‍රත්‍යය තෙම ත්‍රිවිධ වේ**.

සබ්බථා, සර්ව්‍රප්‍රකාරයෙන්; (වුත්තා, **මාවිසින් කියනලද**; තිවිධං, **තුන්වැදෑරැම්වූ**;) **සහජාතඤ්ච, සහජාත ප්‍රත්‍යයද**; (දුවිධං, විප්‍රකාරවූ;) **පුරෙජාතඤ්ච, පුරෙජාත ප්‍රත්‍යයද**; පච්ඡාජාතඤ්ච, පච්ඡාජාත ප්‍රත්‍යයද; කබළීකාරෝ ආහාරෝ; කබලීඞ්කාර ආහාරප්‍රත්‍යයද; රූපජීවිතඤ්ච, රූපජීවිතෙන්ද්‍රියයද; ඉති, **මෙසේ** පංචවිධෝ, පඤ්චැදෑරැම්වූ; අයං ධම්මෝ, **මේ ප්‍රත්‍යය ධර්ම** තෙමේ, අත්ථිපච්චයෝ හොති, අස්ති ප්‍රත්‍යය නම්වේ. අවිගත පච්චයෝච, අවිගතප්‍රත්‍යය නමුදුවෙයි.

පූර්වාචාර්යයෙහි විසතරාචාර්යයන් දක්වම්:—නොහොත් නිකායාචාර්යයෙන් අන්‍ය වූ තෙවන්නාචාර්යයන් දක්වම්:—සබ්බෙපි පච්චයා, සියලු සූත්‍රයෙහි ප්‍රත්‍යයෝම; ආරම්මණූපනිස්සය කම්මත්ථි පච්චයෙසු ච, ආරම්මණප්‍රත්‍යය උපනිශ්‍රය ප්‍රත්‍යය කර්ම්ප්‍රත්‍යය අස්තිප්‍රත්‍යය යන මේ සතර ප්‍රත්‍යයෙහිද, සමොධානං ගච්ඡන්ති; එකී භාවයට **හෙවත් සංග්‍රහයට යෙත්**. පන, විසෙසාචාර්යයන් දක්වම්:—එසේ, මේ ප්‍රසපාත ක්‍රමයෙහි; සබ්බථාපි, සර්ව්‍රප්‍රකාරයෙනුදු; මයාවුත්තං, **මාවිසින් කියනලද්දාවූ**; **සහජාතරූපඤ්ච**, "සහජාතරූපං" යනු පවතෙන, ප්‍රවෘත්තිකාලයෙහි; චිත්තසමුට්ඨානානඤ්ච, සිතින් හට ගත් රූපයන්ගේද; පවත්තියං, ප්‍රවෘත්තිකාලයෙහි; කවත්තා රූපානඤ්ච වසෙන, කර්ම්ජරූපයන්ගේද වශයෙන්; දුවිධං හොති, **විප්‍රකාර වන්නේයයි**; වෙදිතබ්බං, දතයුත්තේයි.

ඉති, (එවං යථාවුත්තනයෙන,) යම් යම් **කියනලද** ක්‍රමය කින්; සම්භවා, සම්භවවන පරිද්දෙන්; ඉති තෙකාලිකා ධම්මා, කාලත්‍රිත්තා ච සම්භවා—පෙ—චතුවීසති සබ්බථාති තෙ කාලිකා ච, අතීත අනාගත ප්‍රත්‍යුත්පන්න කාලත්‍රයවර්ත්තිවූද; කාලවිමුත්තාච, කාලත්‍රයෙන් මිදුනාවූද; අජ්ඣත්තඤ්ච අබ්‍යාත්මඝන්නානා යෙහි හටගත්තාවූද; බහිද්ධාච, බහිර්ධාඝන්නානයෙහි හටගත්තා වූද; තථා, **එපරිද්දෙන්**; **සඞ්ඛතාච**, ප්‍රත්‍යුත්පන්නවූද; අසඞ්ඛතාච, ප්‍රත්‍යුත්පන්න නුවූද; ධම්මා, ධර්ම්යෝ තුමූ; පඤ්ඤත්තිං

නාමරූපානං වසෙන, ප්‍රඥප්ති නාමරූපයන්ගේ වශයෙන්; සිතං සිටිනා හුයැ; සඛථා, සමීප්‍රකාරයෙන්; පඛානෙ, අනන්තනයඋමනන්ත මහාප්‍රඥාඅනුකරණයෙහි; පවවඛානාම, ප්‍රත්‍යක්ෂ නම්; චතුවීසති, සුවිසිදෙනෙක්; සිතා, සිටියාහු වෙත්; හෙවත් පවත්නාහු වෙත්.

තසේ, ඒ ප්‍රඥප්තිනාමරූපයන් අතුරෙන්; රූපධම්මා, රූපධර්මයෝ; රූපකඛන්ධො ච, රූපස්කන්ධයම වේ; විත්තචෙතසික සංඛාතා, විත්තචෙතසිකයයි කියනලද්දාවූ; අරූපිනෝ, නාමභූතවූ; චත්තාරෝ ඛන්ධා ච, සතරස්කන්ධෝද; නිබ්බානංච, නිර්‍වාණයද; ඉති, මෙසේ; පවවිධම්පි, පවප්‍රකාර ධර්මයද; අරූපනති ච, අරූපයයි කියාද; නාමනති ච, නාමයයි කියාද; පවුවවති, ප්‍රභෙදවශයෙන් කියනු ලැබේ. පන, නාමරූපයෙන්: අඤ්ඤවූ ප්‍රඥප්තිය දක්වම්:—"තඤඤා" යනු "තෙහි" යනාර්‍ථයි, තෙහි නාමරූපෙහි, ඒ නාමරූපයන් කෙරෙන් අවශිෂ්ටවූ; පඤ්ඤත්තති, ප්‍රඥප්ති තොමෝ; පඤ්ඤපියතතා, ප්‍රභේද වශයෙන් හඟවනු ලබන හෙයින්; පඤ්ඤත්තතීතිව, අනිත් ප්‍රඥප්තියයි කියාද; නොහොත් වාච්‍යප්‍රඥප්තියයි කියාද; පඤ්ඤපතතතෝ, ප්‍රභේදවශයෙන් හඟවන හෙයින්, පඤ්ඤත්තතීතිව, ශබ්ද ප්‍රඥප්තියයි කියාද නොහොත් වාචකප්‍රඥප්තියයි කියාද; ඉති, මෙසේ; දුවිධාභොති, විප්‍රකාර වෙයි.

කථං? (භොති) කෙසේ වේද යත්? පන, විස්තාරකෙරෙම්:—තං තං භූතවිපරිනාමාකාරං, ඒ ඒ පෘථිවීආදී මහාභූතයන්ගේ විපරිනාමාකාරය හෙවත් පෙරලෙන්නාවූ ආකාරය; උපාදාය, නිශ්‍රය කොටගෙණ; තථා තථා, ඒ ඒ ආකාරයෙන්; පඤ්ඤත්තතා, පණවනලද්දාවූ හෙවත් ප්‍රභෙද වශයෙන් හඟවන ලද්දාවූ; භූමිපබ්බතාදිකා ච, පෘථිවී පර්‍වතාදීවූ; සන්තාන ප්‍රඥප්තියද; සම්භාරසන්නිවෙසාකාරං, දැවදඬු ගල් ආදීවූ උපකරණයන්ගේ; රචනා ආකාරය; උපාදාය, නිශ්‍රයකොටගෙණ; තථා තථා, ඒ ඒ ආකාරයෙන්; පඤ්ඤත්තතා, පණවන ලද්දාවූ හෙවත් ප්‍රභෙද වශයෙන් හඟවන ලද්දාවූ; රථගරථසකටාදිකඛ, ගාඩිය රථය ගැලය සවය පටය යනාදීවූ සමූහප්‍රඥප්තියද; ඛන්ධපඨකං, ස්කන්ධපඨකය; උපාදාය, නිශ්‍රයකොටගෙණ; තථා තථා, ඒ ඒ ආකාරයෙන්; පඤ්ඤත්තතා, පණවනලද්දාවූ; පුරිස පුග්ගලාදිකා ච, පුරුෂයා ය, පුද්ගලයා ය යනාදීවූ ජාතිප්‍රඥප්තියද; චතුවත්තනාදිනං, සඳුකිරු තෘෂ්ණාත්‍රකාරකාවන්ගේ මහාමෙරුපර්‍වතයෙහි දක්ෂිණාවෘතව පෙරළියාම් ආදීවූ ආකාරය; උපාදාය, නිශ්‍රයකොට ගෙණ; තථා තථා, ඒ ඒ ආකාරයෙන්; පඤ්ඤත්තතා, පණවනලද්දාවූ; දිසාකාලාදිකාව, පූර්‍ව

පඤ්චවිඤ්ඤාණ දිහාප්‍රඥප්තියය ඤාණ්‍යාදි කාලප්‍රඥප්තියය බන් වෙසක් ආදි මාසප්‍රඥප්තියයද; අභ්‍රඡුඩාකාරය, ඒ ඒ රූපකලාපයෝ තුමූ සපගි නොසැරණ ලද්දාවූ ඡිද්‍රවිවරාදීනි ආකාරය; උපාදාය, නිශ්‍රය නොවගෙණ; තථා තථා, ඒ ඒ ආරම්මණයෙන්; පඤ්ඤත්තා, පණවන ලද්දාවූ; කූපගුහාදිකාව ලිං ගල්ලෙන් සිදුරු ආදීවූ ආකාශ ප්‍රඥප්තියද; තං තං භූතනිමිත්තාං, ඒ ඒ ආකාරයෙන් වැවෙන්නාවූ පෘථිවීඅසිණාදි නිමිත්තද; භාවනාවසෙනව, පරිකම්මාදී වශයෙන් ප්‍රභෙදවූ භාවනාපරම්පරා සඞ්ඛ්‍යාත විශෙෂයද; උපාදාය නිශ්‍රය නොවගෙණ; තථා තථා, ඒ ඒ ආකාරයෙන්; පඤ්ඤත්තා; පණවනා ලද්දාවූ; කසිණ නිමිත්තාදිකව, ඝිසුණු නිමිති-අසුභ නිමිති-උග්ගහනිමිති-ප්‍රතිභාගනිමිති-ආදීවූ නිමිත්ත ප්‍රඥප්තියද; ඉති, මෙසේ; එවමාදිප්පභෙදා, මේ ආදී ප්‍රභේද ඇත්තාවූ; පරමත්ථතො, අවිපරීතාථීවශයෙන්; අවිජ්ජමානාපි, ප්‍රකට නැත්තා වූද; අත්ථවශාදාකාරෙන, පරමාර්ථධර්මයාගේ ඡායාලොකය කට බදු ආකාරයෙන්; චිත්තුප්පාදානං, චිත්තචෛතසිකයන්ගේ ආලම්බණභූතා, අරමුණුවූ අර්ථප්‍රඥප්තිය; තං තං උපාදාය, ඒ ඒ ආකාරය නිශ්‍රය කොට ගෙණ; උපනිධාය, ඒ ඒ ආකාරය ලං කොට; කාරණං කත්වා, ඒ ඒ ආකාරය කාරණයක් කොට; තථා තථා, ඒ ඒ ආකාරයෙන්; පරිකප්පිතමානා, කල්පනාකරණ ලබන්නී; සංඛාතයි, සංඛ්‍යාවට ගන්නා ලැබේද හෙවත් ගණනට ගන්නා ලැබේද; සඤ්ඤායති, සම්මතවහරණ ලැබේද; වොහරීයති, ව්‍යවහාර කරණ ලැබේද; පඤ්ඤාපියති, ප්‍රභෙදවශයෙන් හඟවනු ලැබේද; ඉති තස්මා, එසේ නොසින්; පඤ්ඤත්තිඉති, ප්‍රඥප්ති යයි කියන්‍නද හෙවත් අර්ථප්‍රඥප්තියයි කියා හෝ; පවුච්චති, ප්‍රභෙද වශයෙන් කියනු ලැබේ. අයං පඤ්ඤත්තියි, මේ ප්‍රඥප්ති තොමෝ; පඤ්ඤාපියත්තා, ප්‍රභෙද වශයෙන් හඟවනු ලබන හෙයින්; පඤ්ඤත්තියි නාම, අර්ථප්‍රඥප්ති නම් වේ; නොහොත් වාච්‍යප්‍රඥප්ති නම් වේ.

පන, අර්ථප්‍රඥප්තියෙන් අන්‍යවූ; ශබ්දප්‍රඥප්තිය දක්වම්:— පඤ්ඤාපනතො, ප්‍රභෙද වශයෙන් හඟවන හෙයින්; පඤ්ඤත්තියි, ශබ්දප්‍රඥප්තිය; නාම-නාමඤ්ඤාදිනාමෙන, නාමය නාමකම්මය යනාදී නාමවිශෙෂයෙන්; කෙවත් නාමය නාමකම්මය නාමධෙය්‍යය නිරුත්තිය ඛ්‍යඤ්ජනය අභිලාපයයි කියන ලද්දාවූ සවැදෑරුම් නාමයෙන් නොහොත් අර්ථයෙහි කවන්නාවූ නාමයයි කියන ලද නාමාඛ්‍යාතයෙහි නාමමෙන් ප්‍රකාශකරණ ලද නාමකම්මය අර්ථයෙහි නාමමෙන් කබන ලද්දේයයි කියන ලද්දාවූ නාමධෙය්‍යය නිරුත්ති කොට කියන ලද විග්‍රහ සඞ්ඛ්‍යාතවූ නිරුත්තිය අර්ථය ප්‍රකාශකරණ

වාක්‍ය සංඛ්‍යාත ව්‍යංජනය අභිමුඛ අර්ථය වාචකවන්නාවූ ශබ්ද සංඛ්‍යාතවූ අභිලාපයයි කියනලද සඤ්ඤා නාමයෙන්; පරිදීපිකා, ප්‍රකාශ කරණ ලද්දීය. සා, සඤ්ඤා නාමයකින් දක්වන ලද්දාවූ ශබ්ද ප්‍රඥප්ති තොමෝ; විජ්ජමාන පඤ්ඤත්ති ව, පරමාර්ථ වශයෙන් ප්‍රකටව ඇත්තාවූ ප්‍රඥප්තියද; අවිජ්ජමාන පඤ්ඤත්ති ව, පරමාර්ථ වශයෙන් ප්‍රකට නැත්තාවූ ප්‍රඥප්තියද; විජ්ජමානෙන අවිජ්ජමානපඤ්ඤත්ති ව, පරමාර්ථවශයෙන් ප්‍රකටවඇතිව නැතිවන හෙයින් පරමාර්ථ වශයෙන් ප්‍රකටව නැත්තාවූ ප්‍රඥප්තියද; අවිජ්ජමානෙන විජ්ජමානපඤ්ඤත්ති ව, පරමාර්ථ වශයෙන් ප්‍රකටනැතිව ඇතිවන හෙයින් පරමාර්ථ වශයෙන් ප්‍රකට ඇත්තාවූ ප්‍රඥප්තියද; විජ්ජමානෙන විජ්ජමානපඤ්ඤත්ති ව, පරමාර්ථ වශයෙන් ප්‍රකටව ඇති හේයින් පරමාර්ථ වශයෙන් ප්‍රකටව ඇත්තාවූ ප්‍රඥප්තියද; අවිජ්ජමානෙන අවිජ්ජමානපඤ්ඤත්ති ව; පරමාර්ථ වශයෙන් ප්‍රකටව නැති හෙයින් නැත්තාවූ ප්‍රඥප්තියද, ඉති, මෙසේ; ඡබ්බිධා හොති, සවැදෑරුම් වූවා වෙයි.

පන, විසතර කෙරෙමි:—තත්‍ථ, ඒ සැවැදැරුම් ප්‍රඥප්තීන් අතුරෙන්; යදා, යම් කලෙක්හි; එතායං, ඒ රූප වෙදනාදීවූ ශබ්ද ප්‍රඥප්තිය කරණ‍ෙකාට ගෙණ; පරමත්ථතො, පරමාර්ථ වශයෙන්; විජ්ජමානං, ප්‍රකටව ඇති; රූපවෙදනාදිං, රූපවෙදනාදිය; පඤ්ඤපෙති, පණවත්ද; තදා, එකල්හි; අයං, මේ රූපවෙදනාදී ප්‍රඥප්ති තොමෝ; විජ්ජමානපඤ්ඤත්තිඉති, පරමාර්ථ වශයෙන් විද්‍යමානවූ ශබ්දප්‍රඥප්තියයි; පවුච්චති, ප්‍රභෙද වශයෙන් කියනු ලැබේ. පන, විද්‍යමාන ප්‍රඥප්තියෙන් අන්‍යවූ; අවිද්‍යමාන ප්‍රඥප්තිය දක්වම්:—යදා, යම්කලෙක්හි; එතායං ච, භූමිපබ්බතාදී ශබ්දප්‍රඥප්තිය කරණ‍ෙකාට ගෙණ; පරමත්ථතො, පරමාර්ථ වශයෙන්; අවිජ්ජමානං, ප්‍රකටව නැති; භූමිපබ්බතාදිං, භූමිපර්වතාදිය; පඤ්ඤපෙති, ප්‍රභෙද වශයෙන් ගණවත්ද; තදා, එකල්හි; අයං, මේ භූමිපර්වතාදීවූ ප්‍රඥප්තිය; අවිජ්ජමාන පඤ්ඤත්තිඉති, අවිද්‍යමාන ප්‍රඥප්තියයි; පවුච්චති, ප්‍රභෙද වශයෙන් කියනුලැබේ. පන, ඔවුන්ගෙන් අන්‍යවූ මිශ්‍රකනය දක්වම්:—උභින්නං, විද්‍යමාන ප්‍රඥප්ති අවිද්‍යමාන ප්‍රඥප්ති දෙකෙහිනාගේ; වොමිස්සකවසෙන, මිශ්‍රකිරීම් වශයෙන්; සෙසා, විද්‍යමානප්‍රඥප්ති-අවිද්‍යමානප්‍රඥප්ති දෙදෙනාගෙන් අවශිෂ්ටවූ; විජ්ජමානෙන අවිජ්ජමාන ප්‍රඥප්තිය අවිජ්ජමානෙන විජ්ජමානප්‍රඥප්තිය-විජ්ජමානෙන විජ්ජමාන ප්‍රඥප්තිය—අවිජ්ජමානෙන අවිජ්ජමානප්‍රඥප්තිය යන සතර දෙන; යථාක්කමං, පිළිවෙළින්; ඡළභිඤ්ඤා, "ඡඅභිඤ්ඤා යස්ස සො ඡළභිඤ්ඤෝ" යනු විග්‍රහ බැවින් ඡවිඅභිඥාවලය; ඉත්‍යත්ථෝ,

සත්‍රින්ගේ ශබ්දය; චක්ඛුවිඤ්ඤාණං, "චක්ඛුසම්ඵස්සජං චක්ඛු විඤ්ඤාණං" යනු විග්‍රහ බැවින් චක්ඛුවසතුව නිසා හටගන්නා වූ විඤ්ඤාණය; රාජපුත්තො, "රඤ්ඤා පුත්තො රාජපුත්තො" යනු විග්‍රහ බැවින් රජහුගේ පුත්‍රතෙමේ යයි ද; ඉති, වේදිතබ්බා, මෙසේ දතයුත්තේය.

වවත්ථානානුසාරෙන-පෙ-නිම්මිතානි: වවත්ථානානුසාරෙන, භූමිපබ්බතරූපවේදනාදී වාඩ්මය ශබ්දය අරමුණුකොටගෙණ; පවත්තානය, හටගත්තාවූ; සොතවිඤ්ඤාණවීථිය, ශ්‍රෝත්‍ර විඥාන වීථිය; තදනුවත්තික මනොවාර වීථිය යන දෙදෙනාගේ; නො නොත් මූලටීකාවාඃ ඥිමත වශයෙන් හෙවත් ශ්‍රෝත්‍ර වාරවීථිය තදනුවත්තිකමනොවාරවීථිය සුඛමනොවාරවීථිය යන විඥාණවීථි තුන්දෙනාගේ; පවත්තානානන්තරූපපන්නමනොවාරස්ස, හටගැණීමට අනතුරු තත්ගි නාම ප්‍රඥප්තිය කල්පනාකරණ කාරණා ඇත්තාවූ මනොවාරවිඤ්ඤාණපරම්පරාවගේ නොහොත් හට ගැණීමට අනතුරුව හටගත්තාවූ මේ භූමිපබ්බත රූපවේදනාදී නාම තෙමේ පෘථිවී පර්වත රූපවේදනාදීවූ අර්ථයාගේ නාමයයි කියා පූර්වයෙහි දැනගන්නාලද විරූ ප්‍රථමකල්පික ප්‍රඥවන්තයන්ගේ සංකෙත ප්‍රඥප්තිය නිශ්‍රය කොට ගත්තාවූ මනොවාරික විඥාණපරම්පරාවට; ඉගාවරා, අරමුණුවූ මනොවාරික විඥානපරම්පරාවෙන්; පරං, මත්තෙහි; ඨස්ස, යම් සම්මුති පරමාර්ථවශයෙන්; තතො, ඒ භූමිපබ්බතරූපවේදනාදීවූ නාම ප්‍රඥප්තිය ගත්තාවූ ප්‍රභේදවූ භූමිපබ්බතරූපවේදනාදීවූ නාම ප්‍රඥප්තියට; අනුසාරෙන, අනුවයාමෙන්; අත්ථා, සම්මුතිපරමාර්ථවශයෙන් ප්‍රභේදවූ භූමිපර්වතවේදනාදීවූ අර්ථප්‍රඥප්තිහු තුමූ; විඤ්ඤාඨන්ති, දැනගනු ලැබත්ද; සා අඨං පඤ්ඤත්තීති, ඒ භූමිපර්වතරූපවේදනාදී අක්ෂරාවලි සංඛ්‍යාත නාම ප්‍රඥප්තිය; ලොකසඞ්කෙතනිම්මිතා, ප්‍රථම කල්පික නුවණැත්තන්ගේ සංකෙත ප්‍රඥප්ති වශයෙන් සිඳුවූවා යයි; විඤ්ඤායා, දතයුත්තිය.

අභිධම්මත්ථ සඞ්ගහෙ, අභිධම්මාර්ථ සංග්‍රහනම්වූ ප්‍රකරණයෙහි; පවවත්ථානඞ්ගහවිභාගෙ නාම, ප්‍රත්‍යය සංග්‍රහවිභාගනම්වූ; අට්ඨමෙ පරිච්ඡෙදෙ, අටවෙනි පරිච්ඡේදය; ඉති, මෙසේ සම්පූර්ණ වූයේය.

අටවෙනි පරිච්ඡේදය නිමි.

(හා)

ඒ සුවිසි ප්‍රත්‍යයන් අතුරෙන් "ඡඛා කාමනතු කාමඝ්ඝ" ඝනාදී පාඨය කි හෙයින් නාමධර්මය නාමධර්මයට සඝාකාරයකින් ද; නාමරූප දෙදෙන එකතුව නාමරූප දෙදෙනාහට පස්ඇකාර යකින්ද, උපකාර වේ. නාමධර්ම තෙමේ රූපඝටද, රූපධර්ම තෙමේ නාමඝටද. එක් ඇකාරයකින් උපකාර වේ. ප්‍රඥප්ති නාම රූප දෙදෙන වනාහි නාමඝට දෙඝාකාරයකින්ද, නාමරූප දෙදෙන නාමරූපදෙදෙනාහට නවඅාකාරයකින්ද උපකාර වෙත්. මෙසේ සුවිසි ප්‍රත්‍යයධර්මයෝ සඝාකාරයකින් උපකාර වෙත්. "නාමඝ නාමධර්මයට උපකාර වන්නේයයි" යනු අනන්තර ප්‍රත්‍යය, සමනන්තරප්‍රත්‍යය, නඤ්ඤප්‍රත්‍යය, විගතප්‍රත්‍යය, ඇසෙවන ප්‍රත්‍යය, අඤ්ඤමඤ්ඤප්‍රත්‍යය, යනමේ සඝාකාරයකින් නාමධර්මය නාමධර්මයට උපකාරවෙයි. "නාමධර්ම තෙමේ නාමරූපදෙදෙනාහට පස්ඇකාරයකින් උපකාර වන්නේ කෙසේද යත්? හෙතු ප්‍රත්‍යය, ඣානප්‍රත්‍යය, මාර්ගප්‍රත්‍යය, කර්මප්‍රත්‍යය, විපාකප්‍රත්‍යය යන පස් ඇකාරයකින් නාමඝතෙම නාමරූපඝන්ට උපකාරවේ. නාමධර්මය තෙමේ රූපධර්මයට පවඡාජාත ප්‍රත්‍යය යන එකම ඇකාරයකින් උපකාර වෙයි. රූපධර්ම තෙමේ නාමධර්මයට පුරෙ ජාතප්‍රත්‍යයෙන් උපකාර වෙයි. ප්‍රඥප්තිනාමරූප දෙදෙන තුමූ නාමධර්මයට ආලම්බණවඝයෙන් හා උපනිස්සය වඝයෙන්දූයි යන දෙඝාකාරයෙන් උපකාර වෙත්.

ඒ ආලම්බණ උපනිස්සය දෙදෙන අතුරෙන් අරමුණතෙම රූප ශබ්ද ගන්ධ රස ස්ප්ශී ධර්ම වඝයෙන් සවැදෑරුම් වෙයි. උපනිශ්‍රය ප්‍රත්‍යය තෙම විතාහි ආරම්මණූපනිශ්‍රයද අනන්තරූප නිශ්‍රයද ප්‍රකෘතොපනිශ්‍රයදූයි කියා තුන්වැදෑරුම් වේ. ඒ තුණ අතුරෙන් ගරුවඝයෙන් ගන්නාලද අරමුණම ආරම්මණූපනිශ්‍රය නම්වේ. අනතුරුව නිරුඩවී යියාවූ චිත්තචෛතසික ධර්මයෝ අනන්තරූපනිශ්‍රය නම්.

රාගචෛතාදී වූ ධර්මයෝ ද ශ්‍රද්ධාශීලාදී වූ ධර්මයෝ ද සැපය ද දුක ද බාලකල්‍යාණ පුදගල සෙවනය ද ඝනපත් අඝනපත් බොදුන ද සැප නො සැප සෘතුවද සැප නොසැප සෙනසුන ද සුදුසු පරිදි දෙන තමාගේ වඝයෙන් ද බාහිර වූ අනුන්ගේ වඝයෙන්ද කුශලාදී ධර්මයන් ප්‍රත්‍යයවේ. කුශලාකුශල කර්මය තෙම විපාක ඝන්වද ප්‍රත්‍යය වේ නුයි ප්‍රකෘතොපනිශ්‍රයප්‍රත්‍යය යෙම බහු ප්‍රකාරයෙන්වේ.

නාම්රූපදෙදෙන්න වකාහි නාම්රූපදෙදෙනාහව අධිපති, සහජාත, අඤ්ඤමඤ්ඤ, නිස්සය, ආහාර, ඉන්ද්‍රිය, විපපයුත්ත, අත්ථි, අවිගත, යන නවාකාරගකින් උපකාර වෙත්. ඒ ප්‍රඥප්ති ධර්මයන් අතුරෙහුදු පෘථිවී පර්වතාදී ශබ්දප්‍රඥප්තිය ද, ගෙහරථ සකටාදි සමූහ ප්‍රඥප්තිය ද, සත්ත්ව පුරුෂ සත්ව පුද්ගලාදි ප්‍රඥප්ති යද, වඤ්චනීහාදියෙන් හටගන්නාවූ දිසාප්‍රඥප්තිය ද, කෘෂිණ අසුභාදි වූ නිමිත්තප්‍රඥප්තිය ද, යන ප්‍රඥප්තිත්‍රි තුම්ල පරමාර්ථ වශයෙන් ප්‍රකටව ඇත්තාවූ ප්‍රඥප්තිගණයි කියාද, පරමාර්ථ වශයෙන් ප්‍රකටව නැත්තාවූ ප්‍රඥප්තියයි කියාද, පරමාර්ථ වශයෙන් ප්‍රකටව ඇති හෙයින් පරමාර්ථ වශයෙන් ප්‍රකටව නැත්තාවූ ප්‍රඥප්තියයි කියාද, පරමාර්ථ වශයෙන් ප්‍රකටව නැතිව පරමාර්ථ වශයෙන් ප්‍රකටව ඇති ප්‍රඥප්තියයි කියාද, පරමාර්ථ වශයෙන් ප්‍රකටව ඇතිව පරමාර්ථ වශයෙන් ප්‍රකටව ඇත්තාවූ ප්‍රඥප්තියයි කියාද, පරමාර්ථ වශයෙන් ප්‍රකට නැතිව පරමාර්ථ වශයෙන් ප්‍රකටව නැත්තාවූ ප්‍රඥප්තියහි කියාද, මෙසේ ප්‍රඥප්තිය සවැදෑරුම්වේ. ඒ සවැදෑරුම් ප්‍රඥප්තින් අතුරෙන් රූපවෙදනාදී කාමයෝ තුම්ල පරමාර්ථ වශයෙන් ප්‍රකටව ඇත්තාවූ ප්‍රඥප්ති නම්වේ. භූමිපවීතා වෘක්ෂලතාදි ප්‍රඥප්ති සඞ්ඛ්‍යාතවූ නාමයෝ තුම්ල පරමාර්ථ වශයෙන් ප්‍රකටව නැත්තාවූ ප්‍රඥප්ති නම්වේ. ඡඩභිඤ්ඤාභි සුදත්තලාභා යන ප්‍රඥප්තියෙහි ඡඩභිඤ්ඤව යනු පරමාර්ථ වශයෙන් ප්‍රකටව ඇත්තාවූ ධර්මයෝ සදෙනෙක් වෙති. එතකුදුවුවත් මේ ධර්මයන් සෝදන ලැබුවාවූ සඞ්ඛ්‍යාත පුද්ගලාදි ඝණි වෙක් ප්‍රකටව නැති හෙයින් පරමාර්ථ වශයෙන් ප්‍රකටව ඇති පරමාර්ථ වශයෙන් ප්‍රකටව නැත්තාවූ ප්‍රඥප්ති නම්වේ. "ඉත්ථි සද්දෝ" යන්නෙහි සත්ත්වයි යම් සවභාව ධර්මයක් ප්‍රකටව නැත්තේයි. එතකුදුවුවත් ශබ්ද සඞ්ඛ්‍යාතවූ ධර්මයන් ප්‍රකටව ඇති බැවින් පරමාර්ථ වශයෙන් ප්‍රකටව නැති පරමාර්ථ වශයෙන් ප්‍රකටව ඇත්තාවූ ප්‍රඥප්ති නම්වේ. "චක්ඛුවිඤ්ඤාණං" යන ශබ්දයෙහි චක්ඛු යන ධර්මයක්ද විඤ්ඤාණං යන ධර්මයක්ද පරමාර්ථයෙහි ඇත්තෝයි. එහෙයින් පරමාර්ථ වශයෙන් ප්‍රකටව ඇති පරමාර්ථ වශයන් ප්‍රකටව ඇත්තාවූ ප්‍රඥප්ති නම්වේ. "රාජපුත්තෝ" යන ශබ්දයෙහි පරමාර්ථ වශයෙන් රාජ නම් වූ ද පුත්‍ර නම් වූ ද කෙනෙක් නැත්තේය. එහෙයින් පරමාර්ථ වශයෙන් ප්‍රකටව නැති පරමාර්ථ වශයෙන් ප්‍රකටව නැත්තාවූ ප්‍රඥප්ති නම් වේ.

වාග්ව්‍යවහාරයෙහි හටගත් ශ්‍රෝත්‍රවිඥාන විෂයට අනතුරුව උපන් නාමග්‍රහණ මනොවාරයට ගොවර වූ අරූපක්ඛ

වූ යම් නාම ප්‍රඥප්තියක්හුගේ අනුභාරයෙන් අනුවිඤ්ඤාණයෙන් ඒ නාමග්‍රහණයෙන් මත්තෙහි සම්මුති පරමාර්ථ භෙද ඇති අර්ථයෝ දැනගනු ලැබෙත්ද අර්ථය ඇඟවීමට හෙතුවූ පණ්ඩිත ලෝකයාගේ සලකුණෙන් සිදුවන ලද්දවූ අර්ථය ඇඟවීම ඇති ඒ මේ නාමප්‍රඥප්ති නොමෝ නැනවතුන් විසින් දතයුත් තිය. මෙහි "සොතවිඤ්ඤාණ විථියා" යන මේ පෙදින් තදනුවර්තික මනොවාර විථි නොමෝ ද සංග්‍රහකරගත්තේ ලද්දීවෙයි. එහෙයින් "ඝොසො" යන ශබ්ද දෙකින් හෙවත් අක්ඛරවසෙන් එකි එකී ශබ්දයක් ඇරැඹ ශ්‍රොත්‍රද්වාර විථිය තදනුවර්තික මනොද්වාර විථිය යන දෙදෙනාගේ විෂයෙන් ප්‍රත්‍යුත්පන්න අතීතාරම්මණ ඇති ජවනවාරයෝ දෙදෙනෙක් දෙදෙනෙක් වෙත්. එසින් මත්තෙහි අක්ඛරාවලිගත නාමය අඟවන්නාවූ එක් ජවනවාරයෙක, එසින් මත්තෙහි අර්ථාවබෝධක එක් ජවන වාරයෙක්දැයි මෙසේ චිත්තවීථිහු සදෙනෙක් ලැබෙන්නුයි මෙසේ අල්පාක්ඛර බහ්වක්ඛර වශයෙන් විථි ගණනා නොමෝ දතයුත් තිය, මේ ක්‍රමයෙන් රූප ගන්ධාදී ආරම්මණයන්හිදු එක් විඤ්ඤාණවීථියක්ද එක්තදනුවර්තික විථියක්ද එක් නාමඤ්ඤපක විථියක්ද, එක් අර්ථාවබෝධක විථියක්දැයි මෙසේ චිත්තවීථිහු සතර දෙනෙක් ලැබෙත්යයි දතයුත්තිය.

අභිධම්මාදී සඞ්ග්‍රහයෙහි ප්‍රත්‍යයසඞ්ග්‍රහ විභාග නම්වූ

අටවෙනි පරිච්ඡේදය නිමියේයි.

සම්පට්පඤ්ඤානං-පෙ-ඉථාකකමං.

(ප)

ඉතොපරං, මේ ප්‍රත්‍යයසංග්‍රහයෙන් මත්තෙහි; සම්පට්පඤ්ඤානං, සම්පට්විදාගීනාගයි කියන ලද්දවූ නොහොත් නිවරණප්‍රහාන කෙලෙසයන් සන්සිඳුවන අර්ථයෙන් සම්පට්වූ ද අනිත්‍ය දුඃඛ අනාත්ම සංඛ්‍යාතවූ විවිධාකාරයෙන් දැක්කයුතු හෙයින් විදර්ශනා නම් වූ ද; භාවනානං, විප්‍රකාර වූ භාවනාවන්ගේ; ද්විධං අපි, විප්‍රකාරවූද; කම්මට්ඨානං, කර්මස්ථානය නොහොත් විප්‍රකාරවූ භාවනාකර්මයට ස්ථානවන හෙයින් කර්මස්ථාන නම් වූ පෘථිවීකසිණාදිවූ ප්‍රඥප්තිය තෙභූමික සංඝඨාර සංඛ්‍යාතවූ ආලම්බණය නොහොත් පසුපසු වූ භාවනාකර්මයට ආසන්න කාරණා වන හෙයින් පුම්පුම්වූ භාවනාවන්ගේ පරම්පරා සංඛ්‍යාතවූ කර්මස්ථානය නොහොත් ධ්‍යානසුඛ ඵලසුඛ නිර්වාණසුඛාදීන්ට

කාරණාවූ භාවනා සඞ්ඛ්‍යාතවූ කම්මස්ථානය, යථාක්‍රමයෙන්, පිළිවෙළින්; අහං, යනු අධ්‍යාහාරයි. පවක්ඛාමි, ප්‍රභෙද වශයෙන් කියමි.

තත්‍ථ, ඒ සමථ භාවනා විදර්‍ශනා භාවනාවන් අතුරෙන්; සමථසඞ්ගහෙ, සමථසංග්‍රහයෙහි; තාව, පළමුකොට; "එවං විභාගෝ මයා වුච්චතෙ" යනු පාඨශෙෂයි. දසකසිණානි ච, දස කසිණ්ක්‍රෙනෙක්ද; දසඅසුභාව, දසඅසුභ ක්‍රෙනෙක්ද; දසඅනුස්සතියොව, දසඅනුස්සි ක්‍රෙනෙක්ද; චතස්සො අප්පමඤ්ඤායොව, සතර අප්‍රමාණය ක්‍රෙනෙක්ද; එකා සඤ්ඤා ව, හුදු සංඥාවෙක්ද; එකං වවත්ථානංව, හුදු ව්‍යවස්ථාපනයෙක්ද; චත්තාරො ආරුප්පාව, සතර ආරූප්‍යයෝද, ඉති, මෙසේ; සත්තවිධෙන, සත්ප්‍රකාරයකින්; සමථකම්මට්ඨාන සඞ්ගහො, සමථකර්‍මස්ථාන සංග්‍රහය; වෙදිතබ්බා, දතයුත්තේයි.

රාගචරිතාව, රාගප්‍රකෘතියෙක්ද; නොහොත් රාගයෙහි රමණය කිරීමද; හෙවත් යෙසු ධර්‍මයන් ක්‍රෙරෙන් රාගාධික වීමද; ද්‍වෙසචරිතාව, ද්‍වේෂප්‍රකෘතියද; නොහොත් වෙෂය අධිකබවද; මොහචරිතාව, මෝහප්‍රකෘතියද; සද්ධාචරිතාව, ශ්‍රද්ධාප්‍රකෘතියද; බුද්ධිචරිතාව, බුද්ධිප්‍රකෘතියද; හෙවත් නුවණැති බවද; විතක්කචරිතාව, විතර්‍කප්‍රකෘතියද; නොහොත් තන්අරමුණු කල්පනා කිරීමද; ඉති, මෙසේ ජ්ඣාධෙන, ධ්‍යානාරූඪයකින්; චරිතසඞ්ගහො, චරිතසංග්‍රහය; වෙදිතබ්බා, දතයුත්තේයි.

පරිකම්මභාවනා ච, පිරිකම් භාවනාවද; නොහොත් සකස් කරන්නාවූ භාවනාවද හෙවත් අප්පණාභාවනාවගේ පූර්‍වභාගයෙහි හටගන්නාවූ කාමාවචර භාවනාවද; උපචාරභාවනාව, උපචාර භාවනාවද නොහොත් තදඞ්ගප්‍රහාණයෙන් නීවරණයන් දුරු කළ කැන් පටන් ගොත්‍රභූ චිත්තය අවසන්කොට ඇත්තාවූ කාමාවචරභාවනාවද; අප්පණාභාවනා ව. අප්‍රත්‍යාවනාවද; නොහොත් මහද්ගත බවට පැමිණියාවූ අප්‍රත්‍යාවනාවද; ඉති, මෙසේ; තිසෙසා භාවිතා, භාවනාවෝ තුන්දෙනෙක්; වෙදිතබ්බා, දතයුත්තාහුය.

පරිකම්මනිමිත්තනව, පිරිකම් නිමිත්තද; නොහොත් පඨවී පඨවී යනාදී වශයෙන් භාවනාක්‍රියාව පරිකර්‍මභාවනාවගේ අරමුණුවූ කසිණමණ්ඩලාදිවූ පරිකර්‍ම නිමිත්තද; උග්ගහනිමිත්තව, උග්ගහනිමිත්තද නොහොත් ඇසින් දක්නාලද කලක් මෙන් මනොවාරික කුශල ජවනයන් විසින් ගන්නාලද අරමුණක්වූ

කසිණමණ්ඩලාදීවූ උග්ගහ නිමිත්තද; නොහොත් චක්ඛුවිඤ්ඤාණයෙන් දක්නාලද්දක් වැනිවූ මනොචාරික කුසලජවනයන් විසින් ගන්නාවූ ඉට්ඨාගීපුද්ගලයාගේ අරමුණුවූ කසිණමණ්ඩලාදී උග්ගහ නිමිත්තද; පටිභාගනිමිත්තව, ප්‍රතිභාගනිමිත්තද නොහොත් උග්ගහනිමිත්තය හා සදෘශවූ නිලවණ්ණාදී කසිණදෙශයන්ගෙන් මිදුනාවූ උපචාර අප්පණාභාවනාවන්ට අරමුණුවූ කසිණමණ්ඩල සඤ්ඤාත ප්‍රතිභාග නිමිත්තද; ඉති, මෙසේ; තිණ්ණිනිමිත්තානි ච, නිමිත්තිහු තුන්දෙනෙක්ද; වෙදිතබ්බානි, දතයුත්තාහුය.

කථං?, කෙසේ දතයුත්තාහුද? යත්; පඨවීකසිණඤ්ච, මහා පෘථිව්‍යම එකදෙශයෙක්හි නොසිට කෙළවරක් නැතිව පැතිරීම් වශයෙන් සකලාර්ථකසිණ නම්වූ පෘථ්වි කසිණයද; ආපොකසිණඤ්ච, ජලයම එක් ප්‍රදෙශයෙක්හි නොසිට කෙළවර නැතිව පැතිරීම් වශයෙන් සකලාර්ථ වශයෙන් කසිණ නම්වූ ආපොකසිණයද; තෙජොකසිණඤ්ච, වහ්නියම එක් ප්‍රදෙශයෙක්හි නොසිට කෙළවරක් නැති පැතිරීම් වශයෙන් සකලාර්ථයෙන් කසිණ නම්වූ තෙජොකසිණයද; වායොකසිණඤ්ච, වාතයම එක් ප්‍රදෙශයෙක්හි නොසිට කෙළවරක් නැතිව පැතිරීම් වශයෙන් සකලාර්ථයෙන් කසිණ නම්වූ වායොකසිණයද; නීලකසිණඤ්ච, නීලවණ්ණයම එක් ප්‍රදෙශයෙක්හි නොසිට කෙළවරක් නැතිව පැතිරීම් වශයෙන් සකලාර්ථයෙන් කසිණ නම්වූ නීලකසිණයද; පීතකසිණඤ්ච, සවණ්ණමය එක් ප්‍රදෙශයෙක්හි නොසිට කෙළවරක් නැතිව පැතිරීම් වශයෙන් සකලාර්ථයෙහි කසිණ නම්වූ පීතකසිණයද; ලොහිත කසිණඤ්ච, රත්තවණ්ණයම එක් ප්‍රදෙශයෙක්හි නොසිට කෙළවරක් නැතිව පැතිරීම් වශයෙන් කසිණ නම්වූ ලොහිතකසිණයද; ඔදාතකසිණඤ්ච, සෙතවණ්ණයම එක් ප්‍රදෙශයෙක්හි නොසිට කෙළවරක් නැතිව පැතිරීම් වශයෙන් සකලාර්ථයෙන් කසිණ නම්වූ ඔදාතකසිණයද; ආකාසකසිණඤ්ච, පරිසිඳගන්නාලද ආකාසය ම එක් ප්‍රදෙශයෙක්හි නොසිට කෙළවරක් නැතිව පැතිරීම් වශයෙන් සකලාර්ථයෙන් කසිණ නම්වූ පරිච්ඡින්න ආකාස කසිණයද; ආලොක කසිණඤ්ච, බිත්තිකවුලු ආදියෙන් වැටහෙන්නාවූ චක්ඛුසුඝ්‍යාදීන්ගේ ආලොකයම එක් ප්‍රදෙශයෙක්හි නොසිට පැතිරීම් වශයෙන් සකලාර්ථයෙන් කසිණ නම්වූ ආලොක කසිණයද; ඉති ඉමානි, මේ කසිණයෝ තුමූ; දසකසිණානි නාම, දසකසිණයෝ නම් වෙත්. (නොහොත්) ඉති ඉමානි දස, මෙවිහු දසදෙන; කසිණානි නාම, කසිණයෝ නම් වෙති.

උද්ධුමාතකඤ්ච, මලදවයෙන් පසුව වාතයෙන් පිරුණාවූ සම් පුබ්බඞ්ගමයෙන් ඉදිමීමෙන් පිළිකුල්වූ මලසිරුරද; විනීලකඤ්ච,

ශෙවතරකතවණ්ණාදිය හා මිශ්‍රවූ බොහෝ සෙයින් නීලවණ්ණය ඇති හෙයින් පිළිකුල් කටයුතු මලසිරුරද; විපුබ්බකව, පූයාව වැගිරීමෙන් පිළිකුල් කටයුතුවූ මලසිරුරද; විච්ඡිද්දකව, මඩ්‍ය ශෙන් සිදීමෙන් පිළිකුල් කටයුතුවූ මලසිරුරද; විකඛායිතකව, සොන සිඟාලාදීන් විසින් නොයෙක් ප්‍රකාරයෙන් කඩා කන බැඳින් පිළිකුල් කටයුතුවූ මල සිරුරද; විඡිත්තඡඞ්ගව, සොනසිඟාලාදීන් විසින් අනෙකප්‍රකාරයෙන් සැඩකඩ කොට දමන ලදුව පිළිකුල් කටයුතුවූ මලසිරුරද; හතවික්ඛිත්තකව, ඛාදකපදඝාතාදී ආවුදයෙන් ඇන දමන ලදුව පිළිකුල් කටයුතුවූ මලසිරුරද; ලොහිතකව, වැගිරෙන්නාවූ ලෙඝ ඇති බැවින් පිළිකුල් ඇති මලසිරුරද; පුලවකව, පනුවන්හෙන් පිරියිය හෙයින් පිළිකුල් කටයුතුවූ මලකුණද; අට්ඨිකව, පිළිකුල් කටයුතුවූ ඇටසැකිල්ලද නොමෙහොත් හුදු ඇටසක්ද; ඉතිඉමෙ දස, මේ දස ප්‍රකාරවූ ශරීරයෝ තුමූ; අසුභා නාම, අසුභතම් වෙත්.

බුඬානුස්සති ච, අරහං ඉතාදී බුදුහුගේ නවපෙදෙහි සඞ්ඛ්‍යා හිතවූ ගුණසමූහය නැවත නැවත මෙනෙහි කිරීමද; ධම්මානුස්ස තිච, සවාකඛාතතාදිවූ නවලොකොත්තර ධර්මයාගේ සවැදෑරුම්වූ ගුණසමූහය නැවත නැවත මෙනෙහි කිරීමද; සඞ්ඝානුස්සති ච, අඤ්ඤායී පුද්ගල මහසඞ්ඝයාගේ සුප්‍රතිපන්නතාදීවූ තවවිධ ගුණ නැවත නැවත මෙනෙහි කිරීමද; සීලානුස්සතිච, තමාගේ සන්තා නයෙහි විද්‍යමානවූ ශීලගුණය නැවත නැවත මෙනෙහි කිරීමද; චාගානුස්සතිච, තම තමාගේ ත්‍යාගධර්මය නැවත නැවත මෙනෙ හි කිරීමද; දෙවතානුස්සතිච, ශ්‍රද්ධාදී ගුණයෙන් සම්පූර්ණවූ දෙව තාවෝ තුමූ දෙවත්වයට පැමිණියාහුද යම් ගුණයෝ තුමූ මා කෙරෙහිද විද්‍යමානයයි මෙසේ දෙවියන් සාක්ෂිසථානයෙහි තබා දෙවියන්ගේ ශ්‍රද්ධාදී ගුණය හා සදෘශවූ තමාගේ ශ්‍රද්ධාදී ගුණය නැවත නැවත සිහිකිරීමද; උපසමානුස්සතිච, නිර්වාණ ධර්මයාගේ රාගකඛය විරාග තණ්හාකඛය ඉතාදී ගුණයන් නැවත නැවත සිහිකිරීමද; මරණානුස්සතිච, පූර්වයෙහි මෙබදු මෙබදු ගුණයෙන් සම්පූර්ණවූ මහාසම්මතාදී නරෙන්ද්‍රයන් පටන් ලොව්තුරා සර්ව ඥයන් වහන්සේ දක්වා සියල්ලෝම මරණයට පත්වූහ. ඒ මරණ ය ද එසාත්තයෙන් මටත් වන්නේයයි මෙසේ මරණය නැවත නැවත මෙනෙහි කිරීමද; කායගතාසතිච, හිසකේ ආදීවූ දෙතිස් කුණපය වණී ගඬ සණ්ඨාන ඔනාසාදී වශයෙන් පිළිකුලැයි නැවත නැවත මෙනෙහි කිරීමද; ආනාපානසතිච, ඇතුලට ගන්නාවූ වාතය හා පිටතට නික්මෙනවූ වාතය අරමුණුකොට මෙනෙහි

කිරීම්ද; යන ඉති ඉමා දස, මෙවිනු දසදෙන අනුස්සතියොතාම, නැවත නැවත මෙනෙහි කරණ හෙයින් අනුස්සති නම් වෙත්.

මෙත්තා ච, අනන්ත සුඛිත දුක්ඛිත සත්ත්වප්‍රඥප්තිය අරමුණු කොට ගෙණ යම්වූ මිත්‍රධර්මය පැවැත්වීමද; කරුණා ච, අනන්ත වූ දුක්ඛිත සත්ත්වප්‍රඥප්තිය අරමුණුකොට ගෙණ අනුකම්පා කරන්නාවූ කරුණාභාවනාවද; මුදිතා ච, අනන්තවූ සුඛිත සත්ත්වප්‍රඥප්තිය අරමුණුකොට ගෙණ සතුටුවීමද; උපෙක්ඛාව, අනන්තවූ සුඛිත දුක්ඛිත සත්ත්වප්‍රඥප්තිය අරමුණුකොට මධ්‍යස්ථව නැරඹීමද; ඉති ඉමාචතසෙසා, මේ භාවනාවෝ සතරදෙන තුමූ; අපමඤ්ඤා යොනාම, ප්‍රමාණාතික්‍රාන්ත සත්ත්වවිෂයෙහි පවත්වන හෙයින් අප්‍රමාණ නම්. බ්‍රහ්මවිහාරොතිව, බ්‍රහ්මයන්ගේ හා බුදුරදුන්ගේ ඉරියව් පැවැත්වීම වනහෙයින් බ්‍රහ්මවිහාරයයි කියාද; පවුච්චති, ප්‍රභේදවශයෙන් කියනු ලැබේ,

ආහාරෙ, තමා විසින් ගිලින ලද ආහාරයෙහි; පටික්කූල සඤ්ඤා, පිළිකූල්ය යි යන සංඥාව; එකා සඤ්ඤා නාම, එක් සංඥා නම්. චතුධාතුවවත්ථානං, පඨවී-ආපෝ-තෙජෝ-වායෝ-යන සතරධාතුව වෙන් කිරීම; එකං ව්වත්ථානං නාම, එකම ව්වත්ථාන නම්. ආකාසානඤචායතනාදයෝ ආකාසානඤචායතනාදීහු තුමූ නොකොත් සතර ආයතනයෝ තුමූ; එතානාරෝ ආරුප්පා නාම, ආරුප්පයෝ සතරදෙන නම්වෙති. ඉති, මෙසේ; සබ්බථාපි, සර්ව්‍රප්‍රකාරයෙනුදු; සමථනිද්දෙසෙ, සමථයන්ගේ දක්වීමෙහි; එතානිඑකතිංසකම්මට්ඨානානි හවනති, සමස්තයෙන් කම්මට්ඨාන තිස්එකක් වෙති. පන, විශෙෂාර්ථයක් දක්වම්:—

චරිතාසු, සවැදෑරුම් චරිතයන් අතුරෙන්; රාගචරිතස්ස, රාගප්‍රකෘති ඇත්තා වූ පුද්ගලයාහට නොහොත් රාගබහුල වූ පුරුෂයාහට; දසඅසුභාව, දසඅසුභකර්මස්ථානයෝ ද; කායගතා සති සංඛාතා, හිසකේ ආදීවූ කායකොට්ඨාසයෙහි සමාධිය යි කියන ලද්දා වූ; කොට්ඨාසභාවනා ච, හිසකේ ආදී වූ කායකොට්ඨාසයෙහි වැඩීම් සංඛ්‍යාත වූ භාවනාව ද; සපපාඨා, සත්ප්‍රාය වෙති. එතස්සා අපපමඤ්ඤායො, සතර අප්‍රමාණ්‍ය ධර්මයෝ ද; නීලාදීනි, නීලපීත ලෝහිතාවදාත සංඛ්‍යාත වූ; එතානාරි කසිණානි, සතර වර්ණකසිණයෝද; දෙසචරිතස්ස, වෙන ප්‍රකෘති වූ නොහොත් වෙන බහුලයාහට; සපපාඨානි, යොග්‍ය වූවාහු වෙති. ආනාපානං, ආනාපානසමාධිය; මොහචරිතස්ස, මොහප්‍රකෘති ඇත්තාහට ද; විතක්කචරිතස්ස ච, විතර්කප්‍රකෘති ඇත්තා වූ පුද්ගලයාහට ද; සපපාඨං, යොග්‍ය වේ. බුද්ධානුස්සති ආදයෝ, බුද්ධානුස්සති-ධම්මානුස්සති—සඞ්ඝානුස්සති-සීලානුස්සති-චාගානු

සසති-දෙවතානුස්සතිඤ්ච යි කියන ලද; ම්, අනුස්සතීහු සදෙන; සඞ්ඝචරිතස්ස, ශ්‍රඞ්ඝචරිතයාහට සපායෝ, සැපවෙත්. මරණ-උපසම-සඤ්ඤ, මරණානුස්සතිච උපසමානුස්සතිච, ආහාරයෙහි ප්‍රතිකූලසංඥාවය; වවත්ථානානි, වතුධාතු ව්‍යවස්ථානය යන මෝවිහු; බුද්ධචරිතස්ස, බුද්ධප්‍රකෘති ඇත්තාවූ පුද්ගලයාහට; සපපායානි, යොග්‍ය වෙත්. පන, අසාධාරණයෙන් අන්‍ය වූ සාධාරණ ක්‍රමය කියමි:—සෙසානි, කියන ලද්දවුන් කෙරෙන් අවශිෂ්ටවූ, සබ්බානිපි, සියලු ම, කම්මට්ඨානානි, දශප්‍රකාරවූ කර්මස්ථානයෝ තුමූ හෙවත් පඨවී ආපෝ තේජෝ වායෝ ආකාස ආලෝක වශයෙන් සැවැදෑරුම් වූ කසිණයෝය. සතර ආරූපයෝ ය යි කියන ලද්දා වූ දශකර්මස්ථානයෝ තුමූ; සබ්බඤ්ඤපි, සියලු චරිත ඇති පුද්ගලයන්ට ම; සපපායානි, යොග්‍ය වූවාහු වෙත්. තත්‍රාපි, ඒ කර්මස්ථානයන් අතුරෙ හුදු; කසිණෙසු, සවැදෑරුම් කසිණයන් අතුරෙන්; පුථුලං, මහත් වූ කසිණ මණ්ඩල තෙමේ; මෝහචරිතස්ස, මෝහචරිතයාහට; සපපායං, යොග්‍යය; බුද්ධකං, කුඩාවූ කසිණ මණ්ඩල තෙමේ; විතක්කචරිතස්සෙව, විතර්කීබහුල යාහටම; සපපායං, යොග්‍ය යි.

අයං, මේ කියන ලද්දේ වන්‍යහි; එත්ථ, මේ සමථනිර්දේශයෙහි; සපපාය භෙදෝ, යොග්‍ය වූ ප්‍රභෙදය යි.

සප්ප්‍රාය භෙදය නිමි.

—— ०१० ——

පන, සපපාය භෙදයෙන් අන්‍යවූ භාවනා භෙදය කියමි:—භාවනාසු, භාවනාවන් අතුරෙන්; සබ්බත්ථාපි, සියලු සමසතළිස් කර්මස්ථානයෙහිද; පරිකම්මභාවනා, පරිකර්මභාවනාව; ලබ්භතෙව, ලැබිය යුතු මැ යි. බුද්ධානුස්සතිආදිසු, බුද්ධානුස්මෘති ආදීවූ; අට්ඨසු කම්මට්ඨානෙසු, කර්මස්ථාන අවෙක්ෂි ද; සඤ්ඤ-වවත්ථානෙසුච්ඡති, ආහාරෙ පටික්කූලසඤ්ඤ වතුධාතුවවත්ථානයෙහිදැයි; ඉති, මෙසේ; දසසු කම්මට්ඨානෙසු, දසකර්මස්ථානයෙහි; උපචාරභාවනාව, උපචාරඝ්‍යානය මාත්‍රයක් ම; සම්පජ්ජති, පැමිණේ. නාපි අප්පණාභාවනා, අර්පණාභාවනාතෝමෝ නැත්තීය. සෙසෙසු කියන ලද කර්මස්ථාන දසයෙහිගෙන් අවශිෂ්ටවූ; සමතිංසකම්මට්ඨානෙසු පන, සමතිස් කර්මස්ථානයෙහි වනාහි; අප්පණාභාවනාපි, අර්පණා භාවනා තෝමෝ ද; සම්පජ්ජති, පැමිණෙයි. හෙවත් ඔබ්බවපි තත්‍රාපි, ඒ සමතිස් කර්මස්ථානයන් අතුරෙ හුදු; දසකසිණානිච, දසනසිණප්‍රඥප්තීහුද; ආකාසානඤ්ච, ආකාසානඤ්චායතන ද; පඤ්චකඣ්ඣානිකානි, රූපාවචරධ්‍යාන පස ම ලැබිය යුත්තාහුය. දස

අසුභා ච, දසඅසුභයෝ ද; කායගතාසති ච, කායගතාසතිය ද; පඨමජ්ඣානිකා, රූපාවචරප්‍රථමධ්‍යානය ම ලැබිය යුත්තාහුය. මෙත්තාදයො, මෙත්තා-කරුණා-මුදිතා යන බ්‍රහ්මවිහාරයෝ; තයො, තුන්දෙන; චතුක්කජ්ඣානිකා, ප්‍රථමධ්‍යාන චිතීයධ්‍යාන තෘතීයධ්‍යාන චතුර්ථධ්‍යානයෝ ලැබිය යුත්තාහු වෙත්. උපෙක්ඛා උපෙක්ඛාබ්‍රහ්මවිහාරභාවනා තොමෝ; පඤ්චමජ්ඣානිකා, පඤ්චම ධ්‍යානය ම ලැබිය යුත්තීවෙයි. ඉති, මෙසේ; ඡබ්බිසතිකම්මට්ඨානානි, සවිසි කම්මට්ඨානයෝ දැමූ; රූපාවචරජ්ඣානිකානි, රූපාවචරධ්‍යානයෝම ලැබිය යුත්තාහු වෙත්. පන, රූපාවචරධ්‍යානා ලම්බණයෙන් අන්‍යවූ අරූපධ්‍යානාලම්බණය කියම්:—චත්තාරෝ ආරුප්පා, ආකාසානඤ්චායතන-විඤ්ඤාණඤ්චායතන-ආකිඤ්චඤ්ඤායතන-නෙවසඤ්ඤානාසඤ්ඤායතන වශයෙන් සතරාකාර වූ අරූපයෝ තුමූ; අරූපජ්ඣානිකා, අරූපධ්‍යානාරම්මණයෝ නම්වෙත්.

අයං, මේ කියන ලද්දේ වනාහි; එත්, මේ සමථනිද්දේශයෙහි; භාවනා භෙදෙ, භාවනාවන්ගේ ප්‍රභේද ක්‍රමය යි.

භාවනා භෙදය නිම්.

—— o ‡ o ——

පන, භාවනාභෙදයෙන් අන්‍යවූ නිමිත්ත භෙදය කියම්:—භෙවත් ගොචරය කියම්:-නිමිත්තෙසු, නිමිත්තයන් අතුරෙන්; පරිකම්මනිමිත්තඤ්ච, පරිකම්මනිමිත්ත ද; භෙවත් "පඨවි පඨවි" යනාදීන් භාවනා කරන්නා වූ පරිකම්භාවනාවගේ අරමුණු වූ කසිණමණ්ඩලාදිය සංඛ්‍යාත පරිකම්නිමිත්ත ද; උග්ගහනිමිත්තඤ්ච උද්ග්‍රහනිමිත්ත ද නොහොත් චක්ඛුර්විඤ්ඤාණයෙන් දක්නා ලද් දක් මෙන් මනොචාරිකකුශල ජවනයන් විසින් ගන්නා ලද්දා වූ කසිණමණ්ඩලාදිය සංඛ්‍යාත උද්ග්‍රහනිමිත්ත ද; සබ්බම්පාපි, සිය ලුම සමසත්තිංස කම්මට්ඨානයෙහි ම: ඨාරහං, සුදුසු පරිද්දෙන්; පරියායෙන, පරියාය වශයෙන් භෙවත් උපචාර වශයෙන්; ලබ්භනති එව, ලැබෙත් මැ යි. පන, ලැබිය යුත්තෙන් අන්‍ය වූ නො ලැබිය යුත්ත දක්වම්:—පටිභාගනිමිත්තං, ප්‍රතිභාගනිමිත්තය නොහොත් උද්ග්‍රහනිමිත්තට බදුවූ නීලවණ්ණාදි කසිණ දෙශයන්ගෙන් මිදුනාවූ උපචාර අප්පණාභාවනාවන්ට අරමුණු වන්නාවූ කසිණමණ්ඩලාදි සංඛ්‍යාත ප්‍රතිභාගනිමිත්තය; කසිණා සුභකොට්ඨාස ආනාපානසෙසවල, දසකසිණප්‍රඥප්තිය දසඅසුභ ප්‍රඥප්තිය ඔසෘක් ආදිවූ කායගතාසතිකොට්ඨාස ප්‍රඥප්තිය ආහාරෙ ප්‍රතිකූලසඤ්ඤා ප්‍රඥප්තිය යන දෙවිස්සෙනිම; ලබ්භති, ලැබිය යුත්තේය; ඉති, ඒ එසේමැයි. තත්‍ථ, එදෙවිසිප්‍රඥප්තියෙහි; පටිභාගනිමිත්තං,

ප්‍රතිභාගනිමිත්තං; ආරබිය, අරමුණු කොට ගෙණ; උපචාර සමාධිව, උපචාර සමාධිය දැ; අප්පණාසමාධි ව, අප්පණාසමාධියද; පවත්තතෙති, හටගණිත්. කථං? (පවත්තතෙති,) කෙසේ හටගන් නාහුදැ? යත්; හි, විසතර කෙරෙම්:-ආදිකම්මිකස්ස, පළමු කොට කම්සථානභාවනා වඩන්නා වූ; පඨවී මණ්ඩලාදිසු, පෘථිවී කසිණ මණ්ඩලාදියෙහි; නිමිත්තං උග්ගණ්හන්තස්ස, අරමුණ ගන්නාවූ යොගාවචර පුද්ගලයාහට නොහොත් පුද්ගලයාගේ; තං ආලම්බණං, ඒ පෘථිවීකසිණාදි අරමුණ; පරිකම්මනිමිත්තන්ති, පරිකර්ම නිමිත්තය යි; පවුච්චති, ප්‍රභෙද වශයෙන් කියනු ලැබේ. සා ව භාවනා,ඒභාවනා තොමෝ ද;පරිකම්මභාවනා නාම,පරිකර්ම භාවනා නම්වේ. පන, පරිකම්මනිමිත්තෙන් අන්‍යවූ උද්ග්‍රහනිමිත්තං දක් වම්:-යදා, යම් කලෙක්හි; තං නිමිත්තං, ඒ පරිකර්මනිමිත්තය යි කියනලද්දවූ පෘථිවීකසිණමණ්ඩලාදි අරමුණ නොහොත් අරමුණු තෙමේ; චිත්තෙන, මනොවාරික සිත කරණකොටගෙණ; සමුග්ගහිතං හොති, මොනවට ගන්නා ලද්දේ වේද; චක්ඛුනා, චක්ෂුඃශා දයෙන් නොහොත් චක්ෂුර්විඥාන චිත්තයෙන්; පස්සන්තස්සෙව, දක්තෙක් හටමෙන්; මනොවාරස්ස, මනොවාරයට හෙවත් මනොවාරික චිත්තවීථියට, ආපාථං, ගමුබවට; ආගතං, පැමිණෙන්නේ වේ ද; තදා, එකල්හි; තමෙව ආලම්බණං, පෘථිවීකසිණාදී අරමුණම; උග්ගහනිමිත්තං නාම, උග්ගහනිමිත්ත නම්වේ. සා ව භාවනා, ඒ භාවනා තොමෝද; සමාධියති, මොනවට පිහිටයි.

පන, උග්ගහනිමිත්තෙන් අන්‍යවූ ප්‍රතිභාගනිමිත්ත කියම්:-තථා සමාහිතස්ස, ඒ ආකාරයෙන් පිහිටියා වූ හෙවත් මොනවට එකඟවූ යිත් ඇති යොගාවචරයාහට; තතො පරං, ඒ උග්ගහ නිමිත්ත වැටහීමෙන් මත්තෙහි; තස්මිං උග්ගහනිමිත්තෙ, ඒ උද්ග්‍රහනිමිත්තයෙහි; පරිකම්මසමාධිනා, පරිකර්මසමාධිය කරණ කොටගෙණ;භාවනං අනුයුඤ්ජන්තස්ස, භාවනාවට කැවත කැවත උත්සාහ කරන්නාවූ: එතස්ස, ඒ යොගී පුද්ගලයාහට; යදා, යම් කලෙක්හි; තප්පටිභාගං, ඒ උද්ග්‍රහනිමිත්ත හා සදෘශවූ; විඤ්ඤූ ධම්මවිමුත්තිං, දෙසැත්සැඟික් පරමාර්ථ ධර්මයන්ගෙන් මිදුනාවූ හෙවත් කසිණමණ්ඩලයෙහි ඇත්තාවූ කසිණදෙශයන්ගෙන් මිදුනාවූ; පඤ්ඤත්තිසංඛාතං, ප්‍රඥප්තියයි කියන ලද්දවූ; භාවනා මයං,භාවනාවෙන් නිපන්නාවූ; ආලම්බණං, පෘථිවීකසිණමණ්ඩ ලාදී අරමුණ; චිත්තෙ, මනොවාරික චිත්තයෙහි; සන්තිට්ඨතං, මොනවට රැස්වූයේ; සමපජ්ජිතං, මොනවටපිහිටියේ; හොති, වේද; තදා, එකල්හි; තං පටිභාගනිමිත්තං, ඒ ප්‍රතිභාගනිමිත්තය; සමු

පත්තනතෙ, මොනවට පහළුවූයේයයි; පවුව්වයි, ප්‍රභෙද වශ යෙන් කියනු ලැබේ.

තතො පඨාය, ඒ ප්‍රතිභාගනිමිත්ත වැටහුනු තැන් පටන්; පරිපඤ්චිපහිණා, සතුරුනිවරණ සංඛ්‍යාත භය නසන ලද්දාවූ; කාමාවචරසමාධි සංඛාතා, කාමාවචර සමාධිය යි කියන ලද් දාවූ; උපචාරභාවනා, උපචාරභාවිතා තොමෝ; නිප්පන්නා නාම හොති, නිපනනිනම් වෙයි. තෙවත් සම්පූණීවූවානම්වෙයි.

තතො පරං, ඒ උපචාරභාවනාවගේ සම්පූණී විමෙන් මත් තෙහි, තමෙව පටිභාගනිමිත්තං, ඒ ප්‍රතිභාගනිමිත්තම; උපචාර සමාධිනා, උපචාරසමාධිය කරණකොටගෙණ; සමාසෙවන්තස්ස මොනවට සෙවුනාවූ යොගාවචර පුද්ගලයාහට, රූපාවචර පඨ මජ්ඣානං, රූපාවචර ප්‍රථමධ්‍යාන තෙමේ; අප්පති, අපීණා වශ යෙන් පිහිටයි.

තතො පරං, ඒ ප්‍රථමධ්‍යානය ලැබීමෙන් මත්තෙහි; තමෙ වපඨමජ්ඣානං, ඒ ප්‍රථමධ්‍යානයම; ආවජ්ජතව, ආවජීනා වශි භාවයද; තොණොන් ප්‍රථම ධ්‍යානයාගේ පච්ඩඝයත් අතුරෙන් එකෙකී අරමුණෙහි හටගත්තාවූ මනොවාරාවජීනයට අනතුරු තන්හි සතරවරක් හෝ පස්වරක් හෝ ඣාමාවවජ්ජවන් ඉපිද දෙතුන් වරකට අධිකවූ භවාඩඝපාතනය නොවී මතු මතු ධ්‍යානාඩඝයන් ආවජීනා කිරීම වශයෙන් හටගැණීම් සංඛ්‍යාත ධ්‍යානාඩඝයන් ආවජීනා කිරීමෙහි පොහොසත් වූ යොගී පුද්ග ලයාගේ ශක්තියද; සමාපජ්ජතව, සමාපජ්ජතවශිතාවය ද යෙ වත් ධ්‍යානයට සමවදිනු කැමති යොගීහුගේ සවකාව සංඛ්‍යාතවූ හෙවත් සමවදිනු කැමති චිත්තයට අනතුරු තන්හි දෙතුන් භවාඩඝයකින් අධිඨ්‍යිය නොදී හටගන්නාවූ මනොවාරාවජීන යට අනතුරු තන්හි ධ්‍යානයට සමවැදීමෙහි පොහොසත්වූ යොගී පුද්ගලයාගේ ශක්තියද; අධිඨානව, අධිඨානවශිතාවයද; නොහොත් සැඵපහර බසින්නාවූ භඩහාවෙක්හි ජිඝ්‍රාතය නවත්වනු පිණිස සරහට බඳනාවූ මහත්වූ මිහිරක් මෙන් හටා ඩඹපරම්පරාව සිඳ යිනින් නියමකර ගන්නා කාලය මුලුල්ලෙහි අතරතුර භවාඩඝ නොඉපද ධ්‍යානචිත්තය ඉපද විමෙහි පොහොස ත් බැව් සංඛ්‍යාත අධිඨ්‍යානවශිතාවයද; උඨානව, උඨානවශි තාවයද හෙවත් ධ්‍යානයට සමවැදීමට මත්තෙන් මම අසවල් කාලයෙහි ධ්‍යානයෙන් නැගිටිමියි සිතින් කර ගත් නියමය නොසිඳීමවා ධ්‍යානයෙන් නැගී සිටීමෙහි පොහොසත් බැව් සං ඛ්‍යාත යොනිපුද්ගලයාගේ ශක්තියද; පච්චවෙක්ඛනාව, පච්ච වෙක්ඛනා වශිතාවයද; හෙවත් ප්‍රථමධ්‍යානයෙහි ධ්‍යානාඩඝවල

කයන් අතුරෙහි; එකෙකි ධ්‍යානාඞ්ග සංඛ්‍යාත අරමුණෙහි හට ගත් මනොවාරුවජ්ජිතයට අතතුරු තන්හි සතරපස් කාමාවචර ජවනයක් හා දෙතුන් භවාඞ්ගයක්ද උපදවා මතු මතු ධ්‍යානාඞ්ග ඇද එසේම ප්‍රත්‍යවෙක්ෂා කිරීමෙහි පොහොසත් වූ යොගී පුද්ගලයාගේ ශක්තිය ද; ඉති, මෙසේ; ඉමානි පඤ්ච වසිතානි, මේ පඤ්ච ප්‍රකාරවශිතාවන් කරණකොටගෙණ; වසීභූතං කත්වා, ධ්‍යානය තමාගේ වශගයෙහි පවත්වා; විතක්කාදිකං, විතර්කය ආදිකොට ඇති; ඔළාරිකඞ්ගපපහාණාය, ඖදාරිකාඞ්ගයන් ප්‍රහාණය කිරීම පිණිස, විචාරාදි සුබුමංගුපපත්තියා, විචාරාදි සියුම් අඞ්ගයන් නිපදවීම පිණිස; පදහතො, නැවත නැවත "පඨවි පඨවි" යනාදීන් පරිකර්මභාවනා කරන යොගීපුද්ගලයාහට; යථාක්කමං, පිළිවෙළින්; දුතියජ්ඣානාදයො, විතර්කාදීන් තුමූ; යථාරහං, සුදුසු පරිදි දෙන්; අපෙපන්ති, අපිණෝ වශයෙන් උපදින්.

ඉවෙවවං, (ඉති එවං යථාවුත්තනයෙන) යම් යම් කියනලද ක්‍රමයකින්; පඨවිකසිණාදිසු, පෘථ්වී කසිණය ආදීකොට ඇති නොහොත් දසකසිණ ප්‍රඥප්තිය දශඅසුභ ප්‍රඥප්තිය හිසකේ ආදී කායගතාසතිභාවනා ප්‍රඥප්තිය ආශ්වාස ප්‍රශ්වාසප්‍රඥප්තියයි කියනලද; වාවීසතිකම්මට්ඨානෙසු, දෙවිසි කර්මස්ථානයෙහි; පටිභාගනිමිත්තං ප්‍රතිභාගනිමිත්තය; උපලබ්භති, ලැබිය යුත්තේයි.

පන, අර්‍ථාන්තරයක් කියයි:—අවසෙසෙසු, කියනලද දෙවිසි කර්මස්ථානයන්හෙන් අවශිෂ්ටවූ අටළොස් කර්මස්ථානයන් අතුරෙන්; අපඤ්ඤත්තිසු, අප්‍රාමාණ්‍යයෝ; සත්තපඤ්ඤත්තියං, සුඛිත දුක්ඛිතසත්ව ප්‍රඥප්තියෙහි; පවත්තනති, හටගන්නාහුය. පන, රූපාලම්බණයෙන් අන්‍යවූ අරූපාලම්බණය දක්වයි:—නොහොත් රූපධ්‍යානයෙන් ලැබියයුතු ආලම්බණයෙන් අන්‍යවූ අරූපධ්‍යානාලම්බණය දක්වයි:—ආකාසවජ්ජිත කසිණෙසු, ආකාශ කසිණය විසින් තොරකොට ඇති නවකසිණයන් අතුරෙන්; යංකිඤ්චිකසිණං, යම්කිසි කිසුණක් නොහොත් යම්කිසි කසිණාලොකයක් අභිමතස්ථානයෙහි පතුරුවා; උග්ඝාටෙත්වා, ඒ කසිණාලොකය උගුළුවා; ලඛ්ඨාකාසං, ලබන ලද අනන්තාකාශ ප්‍රඥප්තිය; අනන්තවසෙන, "අනන්තෝ ආකාසෝ අනන්තෝ ආකාසෝ" යනුවෙන්; පරිකම්මං කරොන්තස්ස, නැවත නැවත පිරියම් භාවනාකරන්නාවූ යොගී පුද්ගලයාහට; පඨමාරූපං, ප්‍රථමාරූප්‍ය තෙමේ; අපෙපති, අපිණා වශයෙන් උපදනේයි. තමෙව පඨමාරූපවිඤ්ඤාණං, ඒ ප්‍රථමාරූප්‍ය විඥානය මෙවන් ආකාශානඤ්චායතනඣ්‍යානචිත්තය ම; අනන්තවසෙන, අනන්ත වශයෙන්; පරිකම්මං කරොන්තස්ස, "අනන්තං විඤ්ඤාණං අනන්තං

විඤ්ඤාණං" යනුවෙන් නැවත නැවත පිරිසුම් භාවනා කරන්නා වූ යෝගීපුද්ගලයාහට; දුතියාරූපං, දුතියාරූපං තෙමේ; මෙසේ විඤ්ඤාණඤ්චායතනධ්‍යාන තෙමේ; අප්පෙති, අප්පිණා වශයෙන් උපදී. පන, අතීතානන්තරයක් කියමි:—මෙවන් විතියාරූප්‍ය ධ්‍යානයෙන් අනන්තවූ තෘතීයාරූප්‍යධ්‍යානය කියමි:—තමේව පඨමාරූපවිඤ්ඤාණාභාවං, ඒ ප්‍රථමාරූප්‍යවිඤ්ඤාණයාගේ නැති බැව් සඞ්ඛ්‍යාත නත්ථිභාව ප්‍රඥප්තියම; "නත්ථිකිඤ්චි, නත්ථිකිඤ්චි-නත්ථිකිඤ්චි" යනුවෙන්; පරිකම්මං කරොනතස්ස, නැවත නැවත පිරිසුම් භාවනාකරණ යොගී පුද්ගලයාහට; තතියාරූපං, තෘතීයාරූප්‍ය ධ්‍යාන තෙමේ හෙවත් ආකිඤ්ඤායතන තෙමේ; අප්පෙති, අප්පිණා වශයෙන් උපදනේ ය. තතියාරූපං, තෘතීයාරූප්‍යවිඤ්ඤාණං; සන්තමේතං පණීතමේතං, "එතං සන්තං එතං පණීතං ඉති, එතං සන්තං එතං පණීතං" යනුවෙන්; පරිකම්මං කරොනතස්ස, පිරිසුම් භාවනාකරන්නාවූ යෝගී පුද්ගලයාහට; චතුත්ථාරූපං, චතුත්ථාරූප්‍යධ්‍යාන තෙමේ හෙවත් නෙවසඤ්ඤානාසඤ්ඤායතනධ්‍යාන තෙමේ; අප්පෙති, අප්පිණා වශයෙන් පිහිටයි.

අවසෙසෙසු, කියන ලද සමතිස් කම්ඨානයන්හෙන් අවශිෂ්ටවූ; දසසු කම්මට්ඨානෙසු ච, බුද්ධගුණ-ධම්මගුණ-සඞ්ඝගුණ-සීලගුණ- චාගගුණ-දෙවතාගුණ-නිච්චමරණානුස්සති-ප්‍රතිකූලසංඥා-ධාතුව්‍යවස්ථානයයි කියන ලද දසකම්ඨානයෙහිද; බුද්ධගුණාදිකං, බුදුගුණ ආදී කොට ඇති; ආලම්බණං ආරබහ, අරමුණක් ඵල්බ ගෙණ; පරිකම්මං කත්වා "සෝ භගවා ඉතිපි අරහං" "සොභගවා ඉතිපි සම්මාසම්බුද්ධෝ" යනාදී ක්‍රම යෙන් නැවත නැවත පිරිසුම් භාවනා කොට; තස්මිං නිමිත්තෙ, ඒ බුද්ධගුණාදී අරමුණ; සාධුකමූපගතෙ, මොනවට ගන්නා ලද කල්හි; තත්ථෙව, ඒ බුද්ධගුණාදී අරමුණෙහිම; පරිකම්මව, "සෝ භගවා ඉතිපි අරහං" යනාදී වශයෙන් නැවත නැවත කරන්නාවූ පරිකර්මභාවනාවද; සමාධියති, මොනවට පිහිටයි. උපචාරොව, උපචාරසමාධියද; සම්පජ්ජති, සම්භවයි. පන, විශෙෂාර්ථයක් කියමි:-අභිඤ්ඤාවසෙන, අභිඥාවන්ගේ වශයෙන්; පවත්තමානං, හටගණු ලබන්නා වූ; රූපාවචර පඨමජ්ඣානං, රූපාවචර පඨමධ්‍යාන තෙමේ; අභිඤ්ඤාපාදක පඨමජ්ඣානා, අභිඥාවගේ පාදයක් වැනිවූ රූපාවචර පඨමධ්‍යානයෙන්; වුට්ඨහිත්වා, නැගිට; අධිච්චෙය්‍යාදිකං, අධිෂ්ඨානාදිය; හෙවත් අධිෂ්ඨාන කට යුතුවූ නිර්මිත කටයුතුවූ සිය දහස් ගණන් කුමාරරූපාදිය; ආවජ්ජන්ත්‍වා, ආවර්ජනා කොට; පරිකම්මං කරොනතස්ස, "සතං හොමි සහස්සං හොමි" යනාදි ක්‍රමයෙන් නැවත නැවත පිරිසුම්

භාවනා කරන්නාවූ යොගීපුද්ගලයාහට; රූපාදීසු ආලම්බණෙසු, රූපාදී සවැදැරම් අරමුණෙහි; ඝට්ටනාහං,සුදුසු පරිද්දෙන්; අපෙපති, අපිණා වශයෙන් උපදනේසි. පූර්වාඛ්‍යයෙහි අවශිෂ්ටාංශය දක්වම්: —

අභිඤ්ඤා ච නාම, අභිඥා නම් වනාහි; නොහොත් මිශ්‍රිත වශයෙන්ද දතයුතු ඥානය වනාහි; ඉද්ධිවිධං, ඉර්ද්ධිවිධ අභිඥා ව ද; නොහොත් නානාප්‍රකාර ඉර්ද්ධිප්‍රාතිහාර්‍ය්‍ය දක්වීම් වශයෙන් උපදවත්නාවූ ඉර්ද්ධිවිධ අභිඥාවද; දිබ්බසෝතං, දිව්‍ය ශ්‍රෝත්‍ර අභිඥාවද හෙවත් දෙවියන්ගේ කණ බඳුවූ මෙහි සිට දිව්‍ය බ්‍රහ්මලෝකයෙහි ශබ්දය පවා ඇසීමෙහි සමර්ථ වූ දිව්‍යශ්‍රෝත්‍ර අභිඥාවද; පරචිත්තපජානනා, මෙරමා සිත් දැන ගන්නාවූ අභිඥාවද; පුබ්බෙනිවාසානුස්සති, පූර්වනිවාසානුස්මෘති ඥානයද; හෙවත් පෙර විසූ කඳපිළිවෙළ දැන ගන්නා සම්‍යක්ඥාන සමඟ පැවති අභිඥාවද; දිබ්බචක්ඛු, දිව්‍යචක්ෂුරභිඥානයද; නොහොත් දෙවියන්ගේ ඇසට බඳුවූ මේ මනුෂ්‍ය ලෝකයෙහි සිට දිව්‍යබ්‍රහ්මලෝකයෙහි පවා ඇත්තාවූ නීලපීතාදී රූපයන් දක්නා හැකිවූ දිව්‍යං චක්ෂුරභිඥානය ද; ඉති, මෙසේ; පඨමා හොති, පස් ප්‍රකාර වෙයි.

එසේ, මේ සමථකර්මස්ථාන ක්‍රමයෙහි; අයං, මේ කියන ලද්දේ වනාහි; ගොචර භෙදෙ, ආලම්බණයන්ගේ ප්‍රභේදයයි. සමථකර්මස්ථානතයෝ, සමථකර්මස්ථානක්‍රම තෙමේ; නිට්ඨිතෝ එව, නිමිණිවිය පැමිණියේමය.

සමථකර්මස්ථාන පදනීය නිමි.

———o———

(භා)

ඒ සමසතළිස් කර්මස්ථානයන් අතුරෙන් දසඅසුභය, ආහාරයෙහි ප්‍රතිකූලසංඥාවය, කායගතාසතිය, යන දෙළොස් කර්මස්ථානයෝ පිළිකුල් ආකාරයෙන් තෙවැනෙහ බැවින් අට්ඨකාමසවගීදයහි නැත්තාහු මැයි. අවශෙෂවූ අටවිසි කර්මස්ථානයෝ වනාහි සදිව්‍යලෝකයෙහි ඇත්තාහුමය. එතකුදුවුවත් බොහෝසෙයින්දෙවියන්ගේ ධ්‍යානඉපදවීමෙහි වායොකසිණයම අරමුණුවෙත්. කල්ප විනාශකාලයෙහි අවීචිය පටන් සියලු අපායභූමියෙහි හා පෘථිවියෙහි වාසයකරන්නාවූ සියලුසත්වයෝම අපරාපරියවෙදනීය කර්ම්බලයෙන් දිව්‍යලෝකයෙහි ඉපිද ඒ දිව්‍ය

ලොක විනාශය ලංවූ කල්හි වායොකසිණයෙන් චතුර්ධ්‍යානය උපදවා වෙහප්ඵලය දක්වා උපදනා බව විශුද්ධිමාර්ගයෙහි ආරේයි කුමක් හෙයින් සියලු දෙවියෝ ම වායොකසිණයෙන් ධ්‍යාන උපදවන්නාහුද යත්? සැපයෙහි ඇළෙනාවුන්ට වායොකසිණයට වඩා සුකරවූ කර්මස්ථානයෙක් නැත්තේය. එහෙයින් සියලු දෙවියෝ බොහෝසෙයින් වායොකසිණයෙන්ම ධ්‍යාන උපදවන්නාහු වෙති. ඒ සදිව්‍යලොකයෙහි නො ලැබෙන්නාවූ දෙලොස් කර්මස්ථානයන් කෙරෙහි ආනාපානසති කර්මස්ථානය බහා තෙලෙස් කර්මස්ථාන කෙනෙක් සොළොස් රූපාවචර බ්‍රහ්මලොකයෙහි නැත්තේහි. එහෙයින් බ්‍රහ්මලොකයෙහි අවශේෂවූ සත්විසි කර්මස්ථානයෝම ඇත්තාහුය. අසංඥසත්වතලයෙහි වනාහි සත් ප්‍රකාරයෙන්ම කර්මස්ථානයෙක් නැත්තේහි. සතර අරූපාවචර භූමියෙහි අකාසානඤ්චායතනාදී සතර අරූපකර්මස්ථානයෝ ම ඇත්තාහුය. අවශේෂවූ සතිස් කර්මස්ථාන කෙනෙක් නැත්තාහුය. මනුෂ්‍යලොකයෙහි වනාහි සතළිස් කර්මස්ථානයෝ ම ඇත්තාහුය. එහෙයින් අභිධම්මාවතාර නම් අර්ථකථා සංග්‍රහයෙහි:-

ගා ථා

අසුභානි දසාහාර සතිඤ්ච කායගතාසති
දෙවේසු නුප්පවත්තන්ති මාදෙසෙනානි සබ්බදා.
තානි වාදසවෙතානි ආනාපාන සතිම්පි ච
තෙරසෙව පවෙනානි බ්‍රහ්මලොකෙ න විජ්ජරෙ.
එපෙත්වා චතුරාරූපෙ සන්ති කිඤ්චි අරූපිසු
මනුස්සලොකෙ සබ්බානි පවත්තන්ති න සංසයා.

එහි අර්ථ සුබෝධයි. මේ ගාථාවෙන් වාග්වෝදගතකිරීමෙන් ග්‍රහණධාරණය සුකරවේ. ඒ සතළිස් කර්මස්ථානයන් අතුරෙන් දසකසිණප්‍රඥප්තිය, දසඅසුභප්‍රඥප්තිය, කායගතාසතිය අරමුණු වන්නාවූ දෙතිස් කායසංඛ්‍යාත ප්‍රඥප්තිය, ආනාපානසතියට අරමුණු වන්නාවූ ආශ්වාසප්‍රශ්වාස වාතය, මෛත්‍රී-කරුණා-මුදිතා-උපෙක්ෂා යන සතර බ්‍රහ්මවිහාරයන්ට අරමුණු වන්නාවූ අප්‍රමාණවූ දුඃඛිත සුඛිත සත්ත්වප්‍රඥප්තිය, ආකාසානඤ්චායතනයට අරමුණු වන්නාවූ ආකාසකසිණය හැර අවශේෂ තව කසිණයන් අතුරෙන් යම්කිසි කසිණයකින් උපදවා ගත්තාවූ කසිණාලෝකය ආකාසයෙහි අභිවිත ප්‍රදේශයෙහි පතුරුවා ඒ කසිණාලෝකය උද්ඝාටනය කොට ලබන ලද්දාවූ ආකාශප්‍රඥප්තිය, විඤ්ඤාණඤ්චායතනධ්‍යානයට අරමුණු වන්නාවූ මේ භවයෙහි හෝ සුගතිභවයෙහි හෝ සවකිඤ්චනත්ථානයෙහි උපදවන

ලද විරූ ආකාසානඤ්චායතන කුසලය මේ භවයෙහිම අධ්‍යාත්ම සන්තානයෙහි හටගත් විරූ ආකාසානඤ්චායතන ක්‍රියා සංඛ්‍යාතවූ මහද්ගත ධම්මාලම්බණය, ආකිඤ්ඤායතනධ්‍යානයට අරමුණු වන්නාවූ ආකාසානඤ්චායතන කුසල ක්‍රියාවන්ගේ නැති බැව්යයි කියන ලද නත්ථිභාව ප්‍රඥප්තිය, නෙවසඤ්ඤානාසඤ්ඤායතනධ්‍යානයට අරමුණු වන මේ භවයෙහි හෝ පූර්භවයෙහි හෝ හටගත් විරූ ආකිඤ්ඤායතන කුසලය, මේ භවයෙහිම අධ්‍යාත්ම සන්තානයෙහි හටගත් විරූ ආකිඤ්ඤායතන ක්‍රියා සංඛ්‍යාත මහද්ගතධම්මාලම්බණය, යන මේ සමතිස් කම්මට්ඨානයෙහිම පරිකම්-උපචාර-අප්පණාධ්‍යානභාවනා සංඛ්‍යාතවූ ත්‍රිවිධභාවනාව ලැබිය යුතු හෙයින් ඒ සමතිස් කම්මට්ඨානයෙහි මහද්ගතධ්‍යානය ලැබිය යුත්තේයි. ඔවුන් කෙරෙන් අවශිෂ්ටවූ බුද්ධානුස්සති ආදිවූ මරණානුස්සතිය අවසන්කොට ඇත්තාවූ අනුස්සතීහු අටය, ආහාරෙ පටික්කූලසඤ්ඤාවය, චතුධාතුව්වත්ථානයයි කියන ලද්දාවූ දසකම්මට්ඨානයෙහි උපචාරභාවනාව මුත් අප්පණාභාවනාව නොලැබිය යුතු හෙයින් මේ දසකම්මට්ඨානයෙහි මහද්ගතධ්‍යානය නොලැබිය හැක්කේය. එසේ වී නම් ඒ කම්මට්ඨාන යන් දසදෙනාගෙන් කවර ප්‍රයෝජනයෙක්ද යත්? මාගීඵල ලබනු කැමති යොගාවචරයන්ගේ සිත මනාකොට පිහිටුවීමෙන් උපචාරධ්‍යානය ලබා, මාගීඵලයන්ගේ ලැබීම සුකර වෙත්. එහෙයින් අභිධම්මත්ථසංග්‍රහයෙහි "භාවනාසු පන සබ්බපඨමාපි පඤ්චකම්මභාවනා ලබ්භමානාව කසිණ අසුභ බුද්ධානුස්සති ආදීසු අට්ඨසු සමාධිභාවනාසෙසුවාති, දසසු කම්මට්ඨානසු උපචාරභාවනාව සම්පජ්ජති කසිණ අසුභ, සෙසසු සමතිංසකම්මට්ඨානසු අප්පණාභාවනාපි සම්පජ්ජතීති" යනාදිය සිහිකටයුතුයි. නිමිත්තත්‍රය, භාවනාත්‍රය, යනමොවුන්ගේ විශෙෂය විශුද්ධිමාගීයෙහි ආ නයින් භාවනා වෙහි යෙදිය යුත්තේයි.

අනාගතයෙහි කම්මට්ඨාන දායක අර්ථකථාචාර්ය ත්‍රිපිටක, විනිපිටක, එකනිපිටකධර, සංගීතිහාණකයන් නැති වන බව දැන ප්‍රතිසම්භිදාප්‍රාප්තමහරහතුන් විසින් සකස්කරණලද භාවනාක්‍රමය විසුද්ධිමාගීයෙහි සඞ්ඛෙපිත බැවින් වර්තමාන කාලයෙහි එම විශුද්ධිමාගී අටුවාව කම්මට්ඨානදායක ආචාර්යවරයෙකුගේ සලකා පළමුකොට සීලවිශුද්ධිය මනාකප්‍රාප්තකොට තදනන්තරව ධ්‍යානභාවනා කිරීමෙහි උත්සාහ වැඩිය යුතුයි. එහෙයින් සංක්ෂෙපමාත්‍රයක් මෙහි දක්වනු ලැබේ.

පූර්භවයෙහි බුදුවරයෙකුගේ ශාසනයෙහි හෝ කම්මවාදී ක්‍රියාවාදී ශාසනයන් පිටත්හි අරහාදී ශාසනයන් වැනි බාහිර

ශාස්තෘශාසනයක හෝ ඍද්ධිප්‍රාතිහාර්‍යයෙන් හෝ ශාසනප්‍රාතිහාර්‍යයෙන් හෝ පැවිදිවෑ පෘථිවීකසිණයෙහි මහද්ගතධ්‍යානලාභිවෑ උපනිශ්‍රය අධිකාර ඇත්තාවූ කෘතපුණ්‍යයන්ට පෘථිවීකසිණ මණ්ඩලය නොකොට ම එදවස් සී සානා ලද කුඹුරෙක හෝ ගොයම් මඬිනා කමතෙක හෝ "පඨවී පඨවී" යයි භාවනා වඩා උග්ගහනිමිත්ත ප්‍රතිභාගනිමිත්තයන් ලැබීමෙන් ධ්‍යානය ලැබිය හැක්කේමය. එබඳු පිණැත්තන්ට කම්මට්ඨානදායක ආචාර්‍යයන් ගෙන් ප්‍රයෝජනනැත්තේය. පූර්වභවයෙහි බුද්ධශාසනයක හෝ බාහිරශාස්තෘශාසනයක හෝ ධ්‍යාන ඉපදවීමෙන් කළාවූ අධිකාර නැත්තේ නම් එබඳු යොගාවචරයා විසින් ආචාරීන් සමීප යෙහි හෝ විශුද්ධිමාර්ගීය ආචාර්‍යවරයෙක් මෙත් කොට හෝ දෙන ලද්දාවූ ක්‍රමය හෙවත් ආචාරීන් විසින් උගන්වන ක්‍රමය කෙසකින් පමණ කුදු නොපිරිහලා අරුණුවන් මැටිගෙණ අතිශයින් කුඩා කසිණමණ්ඩලය එක්වියත්සතරහුලක්ද, අතිශයින් මහත්වූ කසිණමණ්ඩලය ගොයම් මඩනාවූ කළුවිටක් පමණද කටයුත්තේය.

ඒ කසිණමණ්ඩලය වනාහි ගල්අතකින් හෝ සක්ගෙඩි ආදියෙන් හෝ පිරිමැද සමකොට දෙරියන්සමාරක් පමණවූ අත්පස ඇතුලෙහි ඒ කසිණමණ්ඩලය මුහුන බැලිවට තබන්නාවූ ආදර්ශමණ්ඩලයන් මෙන් තමාගේ මුහුණට කෙලින් තබා ඇසිපියා ගැසීම හෝ ඇස් මෙරවා බැලීම හෝ නොකොට සවිඥ ඇස්දෙක විවෘත කොට ඒ කසිණනිමිත්තගෙණ භාවනා කටයුත්තේයි. එසේ භාවනා වඩන කල්හී කසිණමණ්ඩලයෙහි අරුණුවන් පැහැයෙවත් සොට නොගෙණ පෘථිවීකසිණමණ්ඩලයෙහි පෘථිවීධාතුහුගේ කර්කශලක්ෂණය කල්පනා නොකොට එකාන්තයෙන් වණ්ණ නොසිඳ්මවා අරුණුවන් පෘථිවිය යන ලෝකව්‍යවහාර නාම්ප්‍රඥප්තියෙහි සිත නවත්වා ලොකයෙහි පෘථිවියයි පණවන ලද්දාවූ සසම්භාර පෘථිවිය නොහොත් ශුද්ධාෂ්ටකයෙන් යුත් පෘථිවීධාතුවම 'පඨවී පඨවී" යි වැඩිය යුත්තේයි.

එසේ වඩන්නාවූ තල්හි කලින් කල ඇස හරිමින්ද, කලින් කල ඇස පියමින්ද, උග්ගහනිමිත්ත ඉපදීම දක්වා නොයෙක් සිඳහැර ගණන් වාරයෙහි "පඨවී පඨවී" යයි වචනයෙන් කියමින් ප්‍රඥාති ඇසින් දක්නා ලද පෘථිවීකසිණ ආලම්බණතෙමේ පරිකම්නිමිත්ත නම්වේ. ඒ පරිකම්නිමිත්තෙහි වඩන භාවනාව පරිකම්භාවනා නම්වේ. මෙසේ නැවත නැවත භාවනා කරණ යොගාවචරයාහට යම් කලෙක ඇස වසා ප්‍රත්‍යවේක්ෂා කරණ කල්හි ඇස හැර බලන්නාවූ කාලය මෙන් ඒ පෘථිවීකසිණ අර

මුණු තෙමේ සවප්තයෙන් දකින්නාක් මෙන් මනොචාරයෙහි වැටහෙන්නේවේද එකල්හි උග්ගහනිමිත්ත උපන්නේ නම්වෙයි ඒ උග්ගහනිමිත්ත බලා කරණ භාවනාවද පරිකම්ම භාවනානම්වේ.

ඒ උද්ග්‍රහනිමිත්ත උපන් කාලය පටන් ඒ කසිණමණ්ඩලය දෙස නොබලා තමන් ඉන්නාවූ ඇතුළුගබඩ.දිනක හෝ ගල් ගුහාදියකට හෝ පැමිණ "නිසීදති පල්ලඞ්කං ආභුජිත්වා" කී ක්‍රමයෙන් පද්මාසනයෙන් වැඩසිඳ පිටකටුව කෙලින් තබා අභිමුඛ සපගී වන්නාවූ උත්තරොෂ්ඨයෙහි සිහිය එලවා තබා ඒ මනොචාරයෙහි වැටහුන උද්ග්‍රහනිමිත්ත අරමුණුකොටගෙණ "පඨවී පඨවී" යනාදීන් වැඩිය යුත්තේයි. එසේ භාවනා කරණ කල්හි යම් උපද්‍රවයක් හෙතුකොටගෙණ ඒ උද්ග්‍රහනිමිත්ත අතුරුදන් වීනම් නැවතත් කසිණමණ්ඩලය කරා අවුත් පෙර මෙන් භාවනා වඩා උද්ග්‍රහනිමිත්ත උපදවා ගෙණ තමාගේ සෙනාසන යට පැමිණ සුවසේ හිඳ නැවත නැවත භාවනා වැඩියයුත්තේයි.

මෙසේ භාවනා වඩන යොගාවචරයාහට ක්‍රමයෙන් කාම ඡන්දාදී නීවරණධම්මයෝ තුමූ දිගසෙවලින් ගැවසී ගත් ජලයෙහි නිරතුරු ඝට්ටිය ඔබා දිග උකාගැණිවෙන් දියසෙවල් ආදිය ඇත් වන්නාක් මෙන් නීවරණකෙලෙසයෝ ක්‍රමයෙන් ඇත් වන්නාහු වෙති. උපචාරසමාධියෙන් සිත එකඟවෙයි. ප්‍රතිභාගනිමිත්තද හටගන්නේ වෙයි. මෙසේ නීවරණයන් ඇත්ව හොස් ප්‍රතිභාගනිමිත්ත හටගන්නා කල්හි කරණ භාවනා තොමෝ උපචාර භාවනා නම් වෙයි. ඒ භාවනාවෙන් හටගන්නා කාමාවචර කුශලචිත්තවිථියෙහි යෙදුනාවූ එකාග්‍රතාවෝ උපචාරසමාධි නම් වෙත්. උද්ග්‍රහනිමිත්තය ප්‍රතිභාගනිමිත්තය යන දෙදෙනාගේ වෙනස නම්:—

අරුණුවන්මැවියෙන් සකස්කරණලද කසිණමණ්ඩලයෙහි යම් යම් දෙශයෙක් විද්‍යමාන වෙත් නම් උද්ග්‍රහනිමිත්තෙහිද ඒ දෙශයෝ පෙනෙන්නාහුමය. ප්‍රතිභාගනිමිත්ත වනාහි පැහැම්බියකින් මැන්කොට ගන්නා කැඩපතක් මෙන්ද, ඔප්නංනා ලද සක්ගෙඩියක් මෙන්ද, ඒ උද්ග්‍රහනිමිත්ත විවෘත කොට ගෙණ කණමැදිරි ආලොකයක් පමණවූ ඒ උද්ග්‍රහනිමිත්තයට වඩා සියක්වර දහස්වර පිරිසිදුවූ දෙසැත්තැවක් පරමාර්ථධම්මයන්ගෙන් මිදුනාවූ භාවනාමය සිතින් හටගත් ආලොකයක් වෙයි. එසේ වැටහෙන්නාවූ පෘථිවිනිසිණ ප්‍රඥප්ති සංඛ්‍යාත ප්‍රතිභාගනිමිත්තය ඛ්‍යවූ ධම්මුම්මණය උපන් යොගාවචර තෙමේ සක්විතිකුමරු වෙකු ගිහිගෙයි පිහිටි මඬකු මෙන් ඒ ප්‍රතිභාගනිමිත්ත මහත් ගෞරවයෙන් ආරක්ෂා කරන්නේවේ. කුමක් හෙයින යත්?

ඒ ප්‍රතිභාගනිමිත්ත අරමුණු කොට ගෙණ පඨමාභිඥා, අභිඤ්ඤා පත්ති හා සතරමඟ සතර ඵලය ලැබීමට ඒ ප්‍රතිභාගනිමිත්ත එකාන්තයෙන් උපකාර වන්නේයි.

ඉක්බිති ඒ ප්‍රතිභාගනිමිත්ත වඩම් සිතා "පඨවි පඨවි" යනාදීන් භාවනා කරණ කල්හි එකඟුලමාත්‍රයක් හෝ වැඟුල මාත්‍රයක් හෝ මහත්ව වැඩෙයි. එපමණ වැඩුනාවූ ප්‍රතිභාග නිමිත්තපරිත්තාලම්බණ නම්වෙයි. ශුක්ලාමාත්‍ර හෙවත් කුල්ලක් පමණවූ හෝ සරාවමාත්‍රවූ හෝ ඒ ප්‍රතිභාගනිමිත්තම මජ්ඣිම මාලම්බණ නම්වෙයි. එතැන් පටන් වක්‍රවාටය වැසෙන තාක් වඩන ලද්දාවූ කසිණාලෝකය අප්පමාණාලම්බණ නම්වෙයි මෙසේ උපදවා ගන්නාලද පෘථිවීකසිණප්‍රභෘති ප්‍රතිභාගනිමිති ධර්මී ලම්බණය අරමුණු කොටගෙණ ප්‍රථමධ්‍යානය ලබම්වා යන ධ්‍යානනිකාන්තිය උපදවා ගෙණ "පඨවි පඨවි" යනාදීන් භාවනා වඩන කල්හි ඒ අරමුණ ආවජ්ජනා කරන්නාවූ මනොද්වාරවජ්ජන චිත්තය හා "පරිකම්ම, උපචාර, අනුලෝම, ගොත්‍රභූ" යන නම් ඇත්තාවූ උපචාරසමාධි ඥානසම්ප්‍රයුක්ත මහාකුශල චිත්ත ක්ෂණ සතරක් පිළිවෙළින් ඉපිද පස්වෙනුව චිත්තකී-විචාර-ප්‍රීති-සුඛ-එකාග්‍රතා සංඛ්‍යාත ධ්‍යානාඞ්ගපඤ්චකයකින් යුක්තවූ ප්‍රථම ධ්‍යානඅප්පණාචිත්තය උපදනේයි. ඒ චිත්තයම අප්පණාවය, අප්පණා සමාධියයි කියා ව්‍යවහාර කෙරෙත්.

මේ ධ්‍යානචිත්තයෙහි යෙදුනාවූ අඞ්ගයෝ පස්දෙන ක්‍රම යෙන් පවනිවරණධර්ම්‍යන් දවන අග්නියෙන් හා කසිණප්‍රතිභාගනිමිත්ත ලංකොට බලන අග්නියෙන් ධ්‍යානයයි ව්‍යවහාර කෙරෙත්. ඒ අප්පණාචිත්තයට අනුරුව භවාඞ්ගචිත්තක්ෂණ කිපයක් ඉපිද නැවත භවාඞ්ග-භවාඞ්ගචලන-භවාඞ්ගුපච්ඡේද-මනොද්වාරාවජ්ජනය ඉපිද තදනන්තරව ප්‍රත්‍යවේක්ෂාජවන චිත්තයන් ගෙන් ඒ ධ්‍යානයෙහි ඇත්තාවූ චිත්තකීය ප්‍රත්‍යවේක්ෂා කරන්නාවූ එක් විථියක්ද, විචාර, ප්‍රීති, සුඛ, එකාග්‍රතා, යන සතර ප්‍රත්‍යවේක්ෂා කිරීම් වශයෙන් ප්‍රත්‍යවේක්ෂාජවනවීථි සතරක්ද, නැවත ධ්‍යානාඞ්ගපඤ්චකයම එක්කොට ප්‍රත්‍යවේක්ෂා කරන්නාවූ එක් විථියෙක්දැයි මෙසේ ප්‍රත්‍යවේක්ෂා වීථිහු සදෙනෙක් වෙත්. තදනන්තරව ඒ පෘථිවීකසිණාලම්බණයෙහි සමාපත්ති වීථිහුද ක්‍රමයෙන් උපදනාහු වෙත්, මේ ක්‍රමය නිශ්‍රය කොට ආපොකසිණාදී සියලු කම්මට්ඨානයෙහි නිර්වත්තන්‍ය හා භාවනාත්‍රයද ලැබෙන සැටි දත යුතුයි.

සමථකම්මට්ඨාන වීථිය යි.

—— ० ——

(ප)

පන, **සම්පත්තිසම්භාරයෙන්** අනූනවූ විදර්ශනාකර්මස්ථානය **ආරම්භ**:-විපස්සනාකම්මට්ඨානෙ, විදර්ශනාකර්මස්ථානයෙහි; සීලවිසුද්ධිව, චතුපාරිසුද්ධිසීලයාගේ පිරිසිදු බවද; චිත්තවිසුද්ධිව, උපචාර සමාධි අර්පණාසමාධි **චිත්තයා**ගේ පිරිසුදු බවද; දිට්ඨිවිසුද්ධිව, ලක්ඛණරූපවවත්ථානපදට්ඨානයන්ගේ වශයෙන් නාමරූපය පරිග්‍රහ කරන්නාවූ ඥානයාගේ පිරිසුදුබවද; **කංඛාවිතරණවිසුද්ධිව**, නාමරූපයන්ගේ හෙතුව පරිග්‍රහ කිරීම්වශයෙන් ශොඩ **සවිඛකාංක්ෂාව** එතර කරන්නාවූ ඥානයාගේ පිරිසුදු බවද; මග්ගාමග්ග ඤාණදස්සනවිසුද්ධිව, විදර්ශනාව කෙලෙසීමට කාරණවූ දසවැදැරුම් උපක්ලේශයන් පරිග්‍රහ කිරීම් වශයෙන් මේ මාගීය මේ අමාගීයයි දැක්මෙහි පොහොසත්වූ ඥානයාගේ පිරිසුදු බවද; පටිපදාඤාණදස්සනවිසුද්ධිව, උදයව්‍යය ඥානයාගේ පටන් **සත්‍යානුලෝමඤාණය** දක්වා නවවිධ විදර්ශනාඥානයයි කියනලද්දාවූ. මාගී සංඛ්‍යාතවූ ඥානදර්ශනවිසුද්ධිහුගේ ප්‍රතිපක්ඛ්‍යාන ඥානයාගේ පිරිසුදු බවද; ඤාණදස්සනවිසුද්ධිව, අසංඛත ධාතු සංඛ්‍යාත නිර්වාණය දැක්මෙහි පොහොසත්වූ මාගීඥානයාගේ පිරිසුදු බවද; ඉති, මෙසේ; සත්තවිධෙන, සප්තප්‍රකාරයකින්; විසුද්ධිසඞ්ගහො, විසුද්ධිසංග්‍රහය; වෙදිතබ්බා, දතයුත්තේයි.

අනිච්චලක්ඛණව, දතයුතුවූ අනෙකාකාර බවද; දුක්ඛලක්ඛණව, දතයුතුවූ දුඃඛලක්ෂණයද; අනත්තලක්ඛණව, දතයුතුවූ ආත්මයක් නොවෙයි යන ලක්ෂණයද; ඉති, මෙසේ; තීණිලක්ඛණානි, ලක්ෂණයෝ තුන්දෙනෙක්; වෙදිතබ්බානි, දතයුත්තාහුය.

අනිච්චානුපස්සනාව, අනිත්‍ය බව නැවත නැවත දැකීමද; දුක්ඛානුපස්සනාව, දුක් බව නැවත නැවත දැකීමද; අනත්තානුපස්සනාව, ආත්මයක් නොවන බව නැවත නැවත දැකීමද; ඉති, මෙසේ; තිස්සෝ අනුපස්සනා, අනුපස්සනාවෝ තුන්දෙන; වෙදිතබ්බා, දතයුත්තාහුය.

සම්මසනඤාණව, සක්කායාදීහු සමූහපරම්පරා වශයෙන් භූවනින් ඇල්වීම් වශයෙන් හටගන්නාවූ සම්මර්ශනඥානයද; උදයව්‍යයඤාණව, හටගැණීම් විනාශවීම් සඞ්ඛ්‍යාත උදයව්‍යය දෙක නැවත නැවත දැකීම් වශයෙන් හටගන්නා උදයව්‍යයඥානයද; භඞ්ගඤාණව, හටගැණීම හැර විනාශයයි පැවති ඥානයද; භයඤාණව, සංස්කාරයන් භයවශයෙන් නැවත නැවත දැකීම්වශයෙන් හටගන්නාවූ භයඥානයද; ආදීනවඤාණව, දක්නාලද හය ඇත්තාවූ සංස්කාරයන් අයුතු වශයෙන් දක්නාවූ භෙවත් දොස වශයෙන් වැටහෙන ආදීනවඥානයද; නිබ්බි

ඤාණය, දක්නාලද ආදීනව ඇති සංස්කාරයෙහි කලකිරීම් වශයෙන් හටගන්නා නිර්වේදඥානයද; මුච්චිතුකම්‍යතාඤාණය, කලකිරුණාවූ සංස්කාරයන්කෙරෙන් මිදෙනු කැමති බැව් ඇති මුච්චිතුකම්‍යතාඥානයද; පටිසඞ්ඛාඤාණය, මිදීමට ඇත්තාවූ හෙතුහුගේ සම්පූර්ණත්වය පිණිස නැවත සංස්කාරයන් පරිග්‍රහ කිරීම්වශයෙන් හටගන්නා පටිසඞ්ඛානඥානයද; සඞ්ඛාරුපෙක්ඛා ඤාණය, සංස්කාරධර්මයෙහි හැසිරීමක් හෝ ඇලීමක් හෝ නැති මධ්‍යස්ථාකාරයෙන් හටගන්නාවූ ඤාණයද; අනුලෝමඤාණය, ඉක්ම ගියාවූ සවවිදශීනඥානයන්ගේ කෘත්‍යය සිඳ කිරීමද; මත්තෙහි ඉපදියයුතු සත්තිස්බොධිපාක්ෂික ධර්මයන් හා ගැලපීමය යන කෘත්‍යය සිඳකරන්නාවූ අනුලෝමඥානයද; ඉති, මෙසේ; දසවිපස්සනාඤාණානි, විදශීනාඥානයෝ දසදෙනෙක්; වෙදිතබ්බානි, දත යුත්තාහුය.

සුඤ්ඤතෝ විමොක්ඛොව, ආත්මයෙන් හිස්වූ හෙයින් සංයෝජනාදීන්ගෙන් මිදෙන්නාවූ මාර්ගයද; අනිමිත්තෝ විමොක්ඛොව, නිත්‍යය නිමිත්තාදිය නැතිහෙයින් සංයෝජනාදීන්ගෙන් මිදෙන්නාවූ මාර්ගයද; අප්පණිහිතෝ විමොක්ඛොව, තෘෂ්ණා සඞ්ඛ්‍යාත වූ ප්‍රාර්ථනා නැති හෙයින් සංයෝජනාදීන්ගෙන් මිදෙන මාර්ගයද; ඉති, මෙසේ; තයෝ විමොක්ඛා, මේ විමොක්ෂ සඞ්ඛ්‍යාත මාර්ගයෝ තුන්දෙනෙක්; වෙදිතබ්බා, දත යුත්තාහුය.

සුඤ්ඤතානුපස්සනාව, ආත්මයෙන් හිස් බව නැවත නැවත දැකීමද; අනිමිත්තානුපස්සනාව, නිත්‍යනිමිත්තාදිය නැති බව නැවත නැවත දැකීම ද; අප්පණිහිතානුපස්සනාව, තෘෂ්ණා සඞ්ඛ්‍යාත ප්‍රාර්ථනාවෙන් වෙන් බව නැවත නැවත දැකීමද; ඉති, මෙසේ; තීණි විමොක්ඛමුඛානිච, සංයෝජනාදීන්ගෙන් මිදුනාවූ මාර්ගයාගේ හෙතුහු තුන්දෙන; වෙදිතබ්බානි, දත යුත්තාහුය.

කථං? වෙදිතබ්බානි, කෙසේ දැයුත්තාහුද යත්? පාණි මොක්ඛසංවරසීලව, තවා රක්නහු සතරඅපායාදී දුකින් මුදවන්නාවූ කායදුච්චරිතාදිය මුළුහ කිරීමය, කායකම්-වචිකම්යන් මොනවට. තවන චෙතනාවද, ඉන්ද්‍රියසංවරසීලව, චක්ඛුන්ද්‍රිය ශ්‍රොත්‍රේන්ද්‍රිය ඝ්‍රාණේන්ද්‍රිය ජිහ්වින්ද්‍රිය කායින්ද්‍රිය මනින්ද්‍රියයන් රූප-ශබ්ද-ගන්ධ-රස-ස්පර්ශ-ධර්මාලම්බණයන් කෙරෙන් මොනවට ආරක්ෂාකිරීම් වශයෙන් කායකම්-වචිකම්යන් මොනවට තැබීම් ලක්ෂණ කොට ඇත්තාවූ චෙතනාවද; ආජීවපාරිසුද්ධිසීලව, මිථ්‍යාජීවයෙන් වැලකීමෙන් දිවි පැවැත්වීම් වශයෙන් හටගන්

නාවූ කුශලධර්මයන් රක්‍ෂා කරන්නාවූ චේතනාවද; පච්චයසන්නිස්සිතසීලය, චිරාරාධිත සිච්පසය පරිභොග කිරීම මේ සංසාරවෘත්තයෙන් එතරවීම් සඞ්ඛ්‍යාතවූ ඵලය ඇති හෙයින් "පටිසඞ්ඛායොනිසෝ" යනාදී වශයෙන් ප්‍රත්‍යවේක්‍ෂා කිරීමෙන් කුශලධර්මයන් මෝනවට ආරක්‍ෂා කරණ චෙතනාවද; ඉති, මෙසේ; චතුපාරිසුද්ධිසීලං, සත්තරවැදෑරුම් වූ පාරිසුද්ධිසීල තෙමේ නොහොත් ඇවැත්. දෙසිමය ඉඳුරන් රැකිමය දැහැමින් සෙවීමය නැවත නැවත නුවනින් පැස්විකිමය යන මොවුන්ගේ වශයෙන් පිරිසිදු බැව් ඵලවත කුශලධර්මයන්ගේ පිහිටීමට ආධාරවෙතකා තෙමේ; සීලවිසුද්ධිනාම, සීලවිසුද්ධි නම්වේ.

උපචාරසමාධිව, අප්පණාසමාධිව, අප්පණාඣානයෙහි හවඟන් නාවූ එකාග්‍රතාවද; අප්පණාසමාධිව, අප්පණාඣානයෙහි හවඟන් නාවූ එකාග්‍රතාවද; ඉති, මෙසේ; දුවිධොපි සමාධි, විප්‍රකාරවූද සමාධි තෙමේ නොහොත් සිත එකඟකිරීම්; චිත්තවිසුද්ධි නාම, චිත්තවිසුද්ධි නම්වේ. හෙවත් චිත්තය නීවරණයන්ගෙන් මෙන්වූ බවට පැමිණවීමෙන් පිරිසිදු කරණ හෙයින් චිත්තවිසුද්ධි නම්වේ.

ලක්‍ඛණ-රස-පච්චුපට්ඨාන-පදට්ඨාන වශෙන, ලක්‍ඛණය රසය පච්චුපට්ඨානය පදට්ඨානය යන මොවුන්ගේ වශයෙන් නොහොත් ත්‍රෛභූමිකධර්මයන්ගේ සාධාරණ බැව් සඞ්ඛ්‍යාතවූ ලක්‍ඛණය, කෘත්‍යය සංඛ්‍යාතවූ රසය, වැටහෙන්නාවූ ආකාර සංඛ්‍යාතවූ පච්චුපට්ඨානය, සමීපයෙහි පවත්නාවූ හෙතු සංඛ්‍යාතවූ පදට්ඨානය යන මොවුන්ගේ වශයෙන් නොහොත් ත්‍රෛභූමික ධර්මයන්ගේ සභාව සංඛ්‍යාතවූ ලක්‍ඛණය, සම්පිණ්ඩන බැව් සංඛ්‍යාත රසය, ඵල සංඛ්‍යාතවූ පච්චුපට්ඨානය, ආසන්නකාරණ සංඛ්‍යාතවූ පදට්ඨානය යන මොවුන්ගේ වශයෙන්; නාමරූපපරිග්ගහොනාමරූපය සම්මර්ශනය කිරීම හෙවත් නාමරූපධර්මය නුවනින් අලලා පිරිමැදීම; දිට්ඨිවිසුද්ධිනාම, දිට්ඨිවිසුද්ධි නම් වේ.

ච, අනිකුදු විසුද්ධියක් දක්වමි:—තෙසමෙව, ඒ නාමරූපධර්මයන්ගේම; පච්චයපරිග්ගහොහි, මේ ධර්මය මෙනම හෙතුවයින් හවඟන්නේයයි යනාදී ඒ ඒ ධර්මයන්ගේ හෙතුව නුවනින් අල්වා පිරිමැදීම; කඞ්ඛාවිතරණවිසුද්ධි නාම. කඞ්ඛාවිතරණවිසුද්ධි නම් වේ. නොහොත් සොඩශවිධකාංක්‍ෂාව එතර කළහැකිවූ ඥාන යාගේ පිරිසිදු බව නම්වේ.

පන, කඞ්ඛාවිතරණවිසුද්ධියෙන් අන්‍යවූ මිශ්‍රාමිශ්‍රකෘත්‍ය දර්ශනවිසුද්ධිය කියම්:—තත්‍රා, ඒ නාමරූපධර්මයන්ගේ හෙතුව

පරිග්‍රහ කිරීමෙන්; පරං, මත්තෙහි; තථා පරිගහිතෙසු, ඒ ඒ ආකාරයෙන් සම්මර්ශනය කොට ගන්නා ලද්දාවූ හෙවත් වෙන් වෙන්වූ ලක්ෂණ-රස-පච්චුපට්ඨාන-පදට්ඨානයන් සම්මර්ශනයකොට ගන්නා ලද්දාවූ; සපච්චයෙසු, ප්‍රත්‍යය සමග හටගත්තාවූ; අනිත්‍යාදිභෙදභින්නෙසු, අනිත්‍යාදි ප්‍රභෙදයෙන් වෙනස්වූ; තෙභූමකසංඛාරෙසු, භූමිත්‍රයයෙහි හටගත්තාවූ සංස්කාරයෙහි; ඛන්ධාදිනයමාරබ්භ, සඤ්ඤාදී ක්‍රමය අරමුණු කොටගෙණ; කලාපවසෙන, සමූහපරම්පරා වශයෙන් හෙවත් රූපකලාපාදීන්ගේ වශයෙන්; සංඛිපිත්වා, සංක්ෂේපකොට; ඛයඨෙන, ගෙවෙන්නාවූ සවභාවයට පැමිණෙන ස්වභාවයෙන්; අනිච්චා, අනිත්‍ය නම් වෙයි. හෙවත් එකාන්තත්‍යයි නොසිතියයුත්තේය; භයඨෙන, භය සංඛ්‍යාතවූ හෙතුවෙන්; දුක්ඛා, දුක්ඛ නම්වෙයි. හෙවත් දුක්ඛයේ ඉවසිය යුත්තේය. අසාරකට්ඨෙන, ආත්මසංඛ්‍යාතවූ සාරය නැති ස්වභාවයෙන්; අනත්තා, අනාත්ම නම්වෙයි. මහවත් මම ද මාගේ ද නොවෙයි. ඉති, මෙසේ; අඛාන වසෙන වා, අතීතාදි කාලයන්ගේ වශයෙන් හෝ; සන්තතිවසෙන වා, අතීතාදීවූ ධර්මපරම්පරා වශයෙන් හෝ; ඛණවසෙනවා, අතීතාදී ක්ෂණ වශයෙන් හෝ; සම්මසනඤ්ඤණත, සම්මර්ශනඥානයෙන් හෙවත් නාමරූපධර්මයන් අල්විමසුතු නුවණින්; ලක්ඛණත්තයං, ලක්ෂණත්‍රය; සම්මසනතසස්ව, සම්මර්ශනය කරන්නාවූ යෝගීපුද්ගලයාගේද; තෙසෙව, ඒ තෙහුමික සංඛාර ධර්මයන් කෙරෙහිම; පච්චය වසෙනව, ප්‍රත්‍යයන්ගේ වශයෙන්ද, ඛණවසෙනව, ක්ෂණයන්ගේ වශයෙන්ද; උදයව්‍යයඤ්ඤණත, උදයව්‍යය ඤාණයෙන් හෙවත් සිඳලුධර්මයන්ගේ උපාද-භඞ්ග දෙක දැනගන්නාවූ නුවණ කරණ කොටගෙණ; උදයව්‍යයං, ධර්මයන්ගේ උපාද-භඞ්ගවය; සම්පුපස්සනතසස්ව, නැවත නැවත මොනවට දක්නාවූ යෝගීපුද්ගලයාගේද; නොනොත් යොගීපුද්ගලයාගෙ:—

ඔහාසොව, විදර්ශනා සිතින් හටගන්නාවූ ශරීරයෙන් නික්මෙන්නාවූ ආලෝක සංඛ්‍යාතවූ ඔභාසයද; පීතිව, විදර්ශනා චිත්තය සමඟහටගත්තාවූ බුද්ධ-ඛණික-ඔක්කන්තික-උබ්බග එරණ සංඛ්‍යාතවූ පවත්නාකාර ප්‍රීතියද හෙවත් සවලමාත්‍රවූ ප්‍රීතියද, එකෙණෙහි හටගන්නා ප්‍රීතියද, සමුදුර තෙර රැළමෙන් කඳට වැද වැද බිඳෙන ප්‍රීතියද, කය උඩට නගා අහස්හි පැනයන පමණට පැමිණියාවූ බලවත් ප්‍රීතියද, සකල ශරීරයෙහි පැතිරෙන්නාවූ ප්‍රීතියදැයි කියනලද පවත්නාකාර ප්‍රීතියද; පස්සඬිව, කායචිත්තදෙදෙනාගේ කෙලෙස විඩා සන්හිඳවීම ලක්ෂණකොට ඇත්තාවූ කායපස්සඬිචිත්තපස්සඬින්ගේ වශයෙන් හට

ගන්නාවූ චිත්‍රකාර පසඟින්ද; අධිමොක්ඛාව, බලවත්වූ ශ්‍රද්ධේන්ද්‍රිය සංඛ්‍යාත ඇදහිල්ලද; පග්ගහොව. සම්‍යක්ප්‍රධානවූ කෘත්‍යය සිද්ධකරන්නාවූ විරියඉන්ද්‍රියසම්මාව්‍යායාම සංඛ්‍යාත රැකුල්දීමද; සුඛව, අනිප්‍රණීතවූ සැපයද; ඤාණසම්පයුත්ත සහ සම්පියුක්තවූ චෛතසික සැපයද; සඤ්ඤාව, වජ්‍රපාණීහු විසින් විදුනා ලද අසනිවක්‍රඝනට බඳුවූ හෙවත් චක්‍රායුධයෙන් පැහැරීමක් බඳුවූ නිමිත්තලක්ඛණය දන්නා ඥානයද; උපධානව, සතිපට්ඨාන සංඛ්‍යාත විරකෘතාදින් නැවත සිහිකිරීමට පොහොසත්වූ සමෘතිහුගේ එළඹ සිටීමද, උපෙක්ඛාව, සම්ප්‍රයුක්තධර්මයන් හා සමව හටගත් උපෙක්ඛාසම්බොජ්ඣඞ්ග සංඛ්‍යාත තත්‍රමධ්‍යත්වතාපෙක්ෂාව හා මනොවාරවිචිත්තාවිත්තය සමඟ උපන් චෙතනා සංඛ්‍යාතවූ ආවජ්ජනුපෙක්ෂාවද යන චිත්‍රකාර උපෙක්ෂාවද; නිත්තනතිව, ඔහා සඟ මුල්ලකාට ඇති ධර්මතාවය උපන්කල්හි මට මින් පූර්වභාගයෙහි මෙබඳු සවභාව ඇත්තාවූ ආලෝකාදියක් නුපන් විරූප. එකාන්තයෙන් මට මාංශය උපන්නේ වනාසි ඉතාදීන් ඔහාසාදි යෙහි හටගන්නාවූ සිසුම් තෘෂ්ණාවද; ඉනි මෙසේ:

ඔහාසාදී විපස්සනූපක්කිලෙසෙ පරිපන්ථපරිඤ්ඤාභවෙන, ඔහාසාදිවූ විදර්ශනාඋපක්ලේශ සංඛ්‍යාතවූ සතුරන් නුවනින්ගැණීම වශයෙන් නොහොත් මට මේ උපන්නේ මාංශය නොදෙයි විදර්ශනා උපක්ලේශයයි දැනගැණීම් වශයෙන්; මග්ගාමග්ගලක්ඛණවව්ත්ථානං, මාර්ගයාගේ හා අමාර්ගයාගේ ලක්ෂණ පිරිසිඳ ගැනගන්නාවූ ඥානය; මග්ගාමග්ගඤාණදස්සනවිසුද්ධි නාම, මාර්ග මාර්ගඥාන දර්ශනවිශුද්ධි නම්වේ.

පන, ප්‍රතිපදඥානදර්ශනවිශුද්ධිය කියමි:—පරිපන්ථවිමුත්තස්ස, දශප්‍රකාරවිදර්ශනා උපක්ලේශයන්ගෙන් මිදුනාවූ; තස්ස, ඒ යොගීපුද්ගලයාගේ; උදයව්‍යයඤාණතො පට්ඨාය, උදයව්‍යය ඥානය උපන් තැන් පටන්, ඛාවානුලොම, සත්‍යානුලෝම ඥානය දක්වා; නිලක්ඛණං, ලක්ෂණය; විපස්සනාපරම්පරාය, විදර්ශනා වගේ පරම්පරා වශයෙන්; පවිපජ්ජනස්ස, පිළිපදනාවූ යොගීපුද්ගලයාගේ; නවවිපස්සනාඤාණානි, නවප්‍රකාරවූ විදර්ශනාඥානයෝ; පටිපදඤාණදස්සනවිසුද්ධි නාම, ප්‍රතිපදඥානදර්ශනවිශුද්ධි නම්වේ. හෙවත් උදයව්‍යය ඥානය පටන් සත්‍යානුලෝමඥානය දක්වා නවප්‍රකාරවූ විදර්ශනාඥානයයි කියන ලද මාර්ග සංඛ්‍යාතවූ ඤාණදස්සනවිසුද්ධිහුගේ ප්‍රතිපත්තියක්වූ ඥානදර්ශනයාගේ පිරිසිදු බව නම් වෙයි.

පන, ඤාණදස්සන විසුද්ධිය කියමි:-එවං, මෙසේ; පටිපජ්ජනස්ස, පිළිපදනාවූ ඒ පුද්ගලයාහට; විපස්සනාපරිපාකං,

විදශීනා සංඛ්‍යාත සංඛාරොපෙක්ඛාඥානයාගේ මිහිකිරීම; ආගමම, ලැබ; ඉදැනි, දැන් වනාහි; අපණා උපපජ්ජිස්සතීති, අ ඛිප්‍රණිත අපීණා සංඛ්‍යානවූ ලොකොත්තර මාගීතෙමේ ඉතිකින් උපදනේ යයි; (වත්තබබකඛණෙ) කියයුතු ක්ෂණයෙහි; භවඞ්ගං වොවජ්ජිත්වා, භවාඞ්ගප්‍රවාහය සිඳ ගෙණ; උපපන්නමනොවාරාවජ්ජනා, නානකරං, උපන් මනොවාරාවජ්ජනචිත්තයට අනතුරු තන්හි; වෙතිණි විපස්සනාචිත්තානි, දෙතුන් විදශීනා සිත් කෙනෙක් තුමූ; යං කිඤ්චි අනිච්චාදිලක්ඛණං, යම් කිසි අනිත්‍යාදීවූ ලක්ෂණයක් හෙවත් බුදුවන මහතානන්ට අනිත්‍යාදී ලක්ෂණත්‍රයම හෝ අවශෙෂ පසේබුදුරහත් ආදි ආර්‍යයන්ට ලක්ෂණත්‍රයෙන් එකක් හෝ; ආරබ්භ, අරඹණු කොට ගෙණ; පරිකම්මොපචාරානුලොමානාමෙන, පරිකර්මය උපචාරය අනුලොමය යන නමින්; පවත්තනති, හටගන්නාහු වෙත්. යං, සංඛාරයන් කෙරෙහි ඔඛ්‍යස්තව දක්නාවූ යම් ප්‍රඥාවක් නොමෝ; ඔඛාපත්තං, විදශීනාවයේ බුදුනට පැමිණියාවේද; සානුලොමං, සත්‍යානුලොම ඥානය සමග හටගත්තාවූ; සාඞ්ඛාරුපෙක්ඛා, සංඛාරයන් කෙරෙහි මඛ්‍යස්තව දක්නාවූ ඒ සංඛාරොපෙක්ෂා නොමෝ; වුට්ඨානගාමිනිවිපස්සනාතිව, ව්‍යුත්ථානගාමිනී විදශීනාය යි නොහොත් අපායාදියෙන් හා සංඛාරනිමිත්තාදියෙන්ද නැගිටීමය යි කියන ලද මාගීයට පැමිණීමට කාරණාවූ විදශීනාය යි; පවුච්චති, කියනු ලැබේ; තතො පරං, ඒ ව්‍යුත්ථානගාමිනී විදශීනා ජවනචිත්තය න් දෙදෙනෙකුගේ හෝ තුන්දෙනෙකුගේ හෝ ඉපදීමෙන් මත් තෙහි; ගොත්‍රභුචිත්තං, ගොත්‍රභු සිත්තෙමේ; නිබ්බානමාලම්බිත්වා, නිවන් ඵල්බලගෙණ; පුථුජ්ජනගොත්තං, පෘථග්ජනය න්ගේ ගොත්‍රය; අභිභවන්තංච, මැඩපවත්වමින්ද; අරියගොත්තං, ආර්‍යයන් ගේවංශයට; අභිසමෙහානන්තඤ්ච, පමුණුවමින්ද, හෙවත් ආර්‍ය ගොත්‍රය වඩිමින්ද; පවත්තති, හටගන්නේයි. තස්සානන්තරා වෙව, ඒ ගොත්‍රභුචිත්තයට අනතුරු තන්හිම; මග්ගො, ශ්‍රොතාපත්තිමාගී තෙමේ; දුක්ඛඤ්චව, පරිජානන්තා, දුඃඛසත්‍යය වෙන් වෙන් කොට දැන ගණිමින්; සමුදයඤ්චවං පජහන්තා, සමුදයසත්‍යය දුරුකරමින්; නිරොධඤ්චවං සච්ඡිකරොන්තා, නිරොධසත්‍යය පසක් කරමින්; මග්ගඤ්චවා, මාගීසත්‍යය; භාවනා වසෙන, වැඩීම් වශයෙන්; අපණාවිපි, අපීණාවීපියට; ඔතරති, බස්නේයි. තතො පරං, ඒ ශ්‍රොතාපත්තිමාගීචිත්තයෙන් මත්තෙහි; මෙ තීණි ඵලචිත්තානි, දෙතුන් ඵල සිත් කෙනෙක් තුමූ; පවත්තන්ති, හටගණ; "තීණි ඵලචිත්තානි" යනු "චින්නං තිණ්ණං ඵල චිත්තානං" යනාදීයි. දෙවරක් හෝ තුන්වරක්

හෝ සෝතාපත්ති ඵලචිත්තයන්ගේ "පවත්තිත්වා" යන්නෙහි ත්වා ප්‍රත්‍යය හෙවත් වීවාචකයි. පවත්තිත්වා, හටගන්නාහෙයින්; භවඞ්ගපාතොව හොති, භවඞ්ගපාතයම වෙයි. සුන, නැවත; භවඞ්ගං වොවජ්ජිත්වා, භවඞ්ගය සිඳ ගෙණ; පච්චවෙක්ඛණ ඤාණානි, ප්‍රත්‍යවෙක්ෂා ඥානයෝ නොහොත් මාගීඵලනිර්ණයන් ප්‍රත්‍යවෙක්ෂා කරන්නාවූ ඥානත්‍රය; පවත්තන්ති හටගන්නාහු වෙත්.

පණ්ඩිතා, ප්‍රාඥවූ ආර්‍ය්‍ය පුද්ගල තෙමේ; මග්ගඵල, මාගී ඵල; ඵලඤ්ච, ඵලත්‍රය; නිබ්බානඤ්ච, නිර්‍වාණයද; පච්චවෙක්ඛන්ති, ප්‍රත්‍යවෙක්ෂා කෙරේ. කිතෙ, ප්‍රහීණ කරණ ලද්දාවූ; කිලෙසෙව, ක්ලේශයන්ද; සෙසෙව අප්‍රහීණක්ලේශයන්ද; පච්චවෙක්ඛන්තිවා, ප්‍රත්‍යවෙක්ෂා කරන්නේ හෝ වෙයි. න වා, ප්‍රත්‍යවෙක්ෂා නොකරන්නේ හෝ වෙයි.

එවං, (ඉති වුත්තනයෙන) මෙසේ කියන ලද ක්‍රමයෙන්, ඡබ්බිසුද්ධිකමෙන, ෂට්විශුද්ධිත්වයේ පිළිවෙළින්; භාවෙතබ්බා; වැඩිය යුතුවූ, චතුබ්බිධා ඔඝෙහා, සතරවැදෑරුම් මාර්‍ගය; ඤාණදස්සනවිසුද්ධි නාම, ඤාණදර්ශනවිශුද්ධි නම් වෙයි හෙවත් නිර්‍වාණය දත යුතුවූ මාර්ගඥානයාගේ පිරිසුදු බැව් සංඛ්‍යාතවූ මාගී ඥාන නම් වේවා. පවුච්චති, ප්‍රභෙද වශයෙන් කියනු ලැබේ.

එත්ථ, මේ විදර්‍ශනාකර්මස්ථානයෙහි; අයං, මේ කියන ලද්දාවූ; ක්‍රම තෙමේ; විසුද්ධිභෙදෙ, සප්තවිශුද්ධීන්ගේ ප්‍රභෙදයයි.

තත්‍ථ, ඒ අනිච්චානුපස්සනාදීවූ උද්දෙශයෙහි නොහොත් ඒ විදර්‍ශනාත්‍රය විමෝක්ෂත්‍රය යන ධර්‍මයන් අතුරෙන්; අත්තානඤ්ච නිවෙසං, මමය මාගේයයි ගන්නාලද දෘඪග්‍රාහය; මුචනති, මුදන්නාවූ; අනත්තානුපස්සනා, ඔහුගේ නොවේයයි නැවත නැවත දැකීම ඇති 'අනාත්මානුදර්‍ශනා නොමෝ; සුඤ්ඤතානුපස්සනා නාම, සුඤ්ඤතානුපස්සනා නම් වූ නොහොත් ආත්මයෙන් සිස්වූ ආකාරයෙන් නැවත නැවත දැකීම නම්වූ; විමොක්ඛමුඛං හොති, විමෝක්ෂමුඛය වෙයි, හෙවත් ප්‍රතිඥාවූ ආත්මාභිනිවේශයෙන් මුදවන්නාවූ මාගීඵලයන්ගේ හේතුවවෙයි. විපල්ලාස නිමිත්තං, විපල්ලාස නිමිත්තය නොහොත් සඤ්ඤාවිපල්ලාස-චිත්ත විපල්ලාස-දිට්ඨිවිපල්ලාස සඞ්ඛ්‍යාතවූ නිමිත්තය නොහොත් විපරීත විමට කාරණාවූ සංඥා-චිත්ත-දෘෂ්ටි සඞ්ඛ්‍යාතවූ හේතුව; මුචනති, මුදන්නාවූ; අනිච්චානුපස්සනා, අනිත්‍යයයි නැවත නැවත දැකීම ඇති අනිත්‍යානුදර්‍ශනා නොමෝ; අනිමිත්තානුපස්සනා නාම

අනිමිත්තානුපස්සනා නම්වූ තොඟොත් විපල්ලාසනිමිත්තෙන් පහවූ ආකාරයෙන් නැවත නැවත දැකීම නම්; විමොක්ඛමුඛං හොති, විමොක්ෂමුඛය වෙයි. හෙවත් ප්‍රතිපක්ෂවූ විපල්ලාස මුඛයෙන් මුදවන්නාවූ මාර්ගඵලයන්ගේ හෙතුව වෙයි. තණ්හා, පණිධිං, කාමරූපාරූප ඇඛ්‍යාතවූ භවත්‍රයෙහි ඇලෙන්නාවූ තෘෂ්ණා ඇඛ්‍යාත ප්‍රාර්ථනාව; මූචනති, මුදන්නාවූ; දුක්ඛානුපස්සනා, දුකැයි නැවත නැවත දැකීම ඇති දුක්ඛානුදර්ශිනා තොමෝ; අපපණිහිතානුපස්සනා නාම, අප්‍රණිහිතානුදර්ශිනාතම්වූ තොඟොත් ප්‍රාර්ථනාඅයයි කියන ලද තෘෂ්ණාවෙන් පහවූ ආකාරයෙන් නැවත නැවත දැකීම නම්; විමොක්ඛමුඛං හොති, විමොක්ෂමුඛය වෙයි. හෙවත් ප්‍රතිපක්ෂවූ තෘෂ්ණා ප්‍රාර්ථනාවෙන් මිදුනාවූ මාර්ගඵලයන්ගේ හෙතුව වෙයි. තසමා, එතෙයින්; වුට්ඨානගාමිනී විපස්සනා, ව්‍යුත්ථානගාමිනී විදර්ශිනා තොමෝම; අනත්තතො, අනාත්ම වශයෙන්; යදි විපස්සති, ඉදින් දක්නේ නම් "එවං සති" යනු පාඨශෙෂයි. එවං සති, මෙසේ අනාත්මවශයෙන් දැකීම ඇති කල්හි; මඥා, අනතුරුව උපදනා ලොකොත්තර මාර්ගතෙමේ; සුඤ්ඤතො විමොක්ඛොනාම හොති, සුඤ්ඤත විමොක්ෂ නම් වෙයි. වුට්ඨානගාමිනී විපස්සනා, ව්‍යුත්ථානගාමිනී විදර්ශිනා තොමෝ; යදි අනිච්චතො විපස්සති, ඉදින් අනිත්‍ය වශයෙන් දක්නේ වේ නම්; (එවං සති, මෙසේ අනිත්‍ය වශයෙන් දැකීමක් ඇති කල්හි) මඥා, ලොකොත්තරමාර්ග තෙමේ; අනිමිත්තතා විමොක්ඛොනාම, අනිමිත්තවිමොක්ෂ නම්වෙයි. වුට්ඨානගාමිනී විපස්සනා, වුට්ඨානගාමිනී විදර්ශිනා තොමෝ; දුක්ඛතො, දුක් වශයෙන්; යදි විපස්සති, ඉදින් දක්නේ වීනම්, එවං සති, මෙසේ දුක් වශයෙන් දැකීමක් ඇති කල්හි; මඥා, ලොකොත්තරමාර්ගඵල තෙමේ; අපපණිහිතෝ විමොක්ඛොනාම, අප්‍රණිහිතවිමොක්ෂ නම්වෙයි. ඉති ව, මෙසේ ද; මඥා, ලොකොත්තරඵලය තෙමේ; විපස්සනාගමන වසෙන, විදර්ශනා සඞ්ඛ්‍යාතවූ පැමිණීමගේ හෙතු වශයෙන්; තීණි නාමානි, සුඤ්ඤතවිමොක්ෂය අප්‍රණිහිතවිමොක්ෂය අනිමිත්තවිමොක්ෂය යි යන නාම තුන්දෙනෙකුන්; ලභති, ලබයි. මඥාවිපියං, මාර්ගවිපියෙහි; ඵලව, දෙතුන්වරක් හවඟන්නාවූ ඵල සිත් තෙමේ; මඥා ගමන වසෙන, මාර්ග සඞ්ඛ්‍යාතවූ පැමිණීමගේ වශයෙන්; තථා, එසේම; තීණි නාමානි ලභති, නාමයන් තුන්දෙනෙකුන් ලබයි. පන, විශෙෂාර්ථයක් ඇත්තේ:—ඵලසමාපත්තිවිපියං, ඵලසමාපත්ති විපියෙහි; යථාවුත්තනයෙන, යථොක්තනයින්; විපස්සනාඤාණං, විදර්ශනා වඩන්නාවූ ඵලසඵපුග්ගලයන් සතරදෙනාගට; උපජ්ජ

මානං, උපදිනු ලබන්නාවූ: යථාසකං ඵලං වි, යම් යම් පරිදි දෙකින් ලබනලද මාගී සඞ්ඛ්‍යාතවූ හෙතුඵලයන්ගේ ඵලයද; විපස්සනාගමන වසෙන, විදර්‍ශනා සඞ්ඛ්‍යාතවූ පෑමිණීම වශයෙන් සුඤ්ඤතාදි විමොක්ඛානිච්, සූන්‍යතාදී විමෝක්ෂයයිද; පවුච්චති, කියනු ලැබේ. පන, අසාධාරණයෙන් අන්‍යවූ සාධාරණය කියමි:-සබ්බත්ථ, සියලු මාගීඵලසමාපත්ති විපියෙහි; සබ්බසං, සියලු මාගීඵලයන්ට; නාමතත්‍රයමපි, නාමත්‍රයද; හෙවත් සුඤ්ඤත-අනිමිත්ත-අපණිහිත විමොක්ෂය යන නාමත්‍රයද; ආලම්බණවසෙනව, අරමුණු ගැණීම් වශයෙන්ද; සරස වසෙනව, රාගාදීන්ගෙන් නිස්සීම ආදී තමතමාගේ කෘත්‍යය වශයෙන්ද; සමෙව ව, සදෘශවන්නේ මැයි.

එසේ, මේ විදර්‍ශීකාකමීසථානයෙහි; අයං, මේකියතලද්දේ වනාහි; විමොක්ඛභෙදං, විමෝක්ෂයන්ගේ ප්‍රභෙද ක්‍රමය යි.

——oio——

පන, විමොක්ඛභෙදයෙන් අන්‍යවූ පුද්ගලභෙදය කියමි:— එසේ, මේ විදර්‍ශනාකමීසථානයෙහි තොහොත් මේ සතර මාගී යන් අතුරෙන්; සොතාපත්තිමග්ගං භාවෙත්වා, සෝවාන්මාගීය වඩා; දිට්ඨි විච්ඡිකිලෙසා, දිට්ඨිවිචිකිච්ඡාවන්ගේ ප්‍රහාණය හෙතුකොට ගෙණ; පහීණාපායගමනෝ, ප්‍රහාණවූ අපායගමන් ඇති; සත්තක්ඛත්තුපරමෝ, සත්තක්ඛත්තුපරම නම්වූ; හෙවත් මනුෂ්‍යලෝක දිව්‍යලෝකයෙහිසත් වරක්ම ප්‍රතිසන්ධිගැණීම ඇති; සොතාපන්නෝ නාම හොති, සෝවාන් පුද්ගල නම් වෙයි. සකදාගාමිමග්ගං භාවෙත්වා, සකෘදාගාම්මාගීය වඩා; රාගදෝසමෝහානං, රාගවෙෂ මෝහයන්; තනුභාවත්තා, තුනී කළ හෙයින්; සකදාගාම් නාමහොති, සකෘදාගාමී නම්වෙයි සකිදෙව, එක් වරක්ම; ඉමං ලෝකං, මේ මිනිස්ලොව ට; ආගන්ත්වා හොති, එන්නෙක් වෙයි අනාගාමිමග්ගං භාවෙත්වා අනාගාම්මාගීය වඩා, කාමරාගව්‍යාපාදානං, කාමරාගව්‍යාපාදයන්; අනවසෙසපහාණෙන, ඉතිරි නොකොට නැසීමෙන්, අනාගාමි නාමහොති, අනාගාමී නම්වෙයි. ඉත්ථත්තං, මේ කාමධාතුවට; අනාගන්තා හොති, ප්‍රතිසන්ධිවශයෙන් නොඑන්නෙක් වෙයි. අරහත්තමග්ගං භාවෙත්වා, අර්හත්මාගීය වඩා, අනවසෙසකිලෙසපපහාණෙන, ඉතිරි නොසෙසකොට කෙලෙසුන් නැසීමෙන්; සබ්බාසවෙ, සියලු ආශ්‍රවයන් ඇත්තාවූ; ලොකෙ, ත්‍රිවිධලෝකයෙහි; අග්ගදක්ඛිණෙය්‍යෝ; උතුම් දක්ෂිණාව පිළිගැණීමට සුදුසුවූ හෙවත් පරලොව අදහා දෙන ලද දක්ෂිණාව පිළිගැණීමට සුදුසුවූ; අරහා නාම හොති, මහරහත් නම් වෙයි.

එහි, මේ විදර්ශනා කර්මස්ථානයෙහි; අයං, මේ කියන ලද්දේ; පුග්ගල භෙදෝ, පුද්ගල භෙදය යි.

පන, පුද්ගලභෙදයෙන් අන්‍යවූ සමාපත්තිභෙදය කියමි:- එහි, මේ විදර්ශනාකර්මස්ථානයෙහි භෙවත් නිරොධසමාපත්ති ඵලසමාපත්තීන් අතුරෙන් ඵලසමාපත්තිහු තුමූ; සඵල සමපි, සියලු ඵලස්ථ පුද්ගලයන්ටම; යථාසකඵල වසෙන, තමතමාට අයත්වූ ඵලයාගේ වශයෙන්; සාධාරණාව, සාධාරණම වෙත්. පන, සාධාරණයෙන් අන්‍යවූ අසාධාරණය කියමි:- නිරොධසමාපත්ති සමාපජ්ජනං, නිරොධසමාපත්ති යට සමවැදීම භෙවත් චිත්තචෛතසික චිත්තජ රූපයන්ගේ නිරුඩකිරීම සඞ්ඛ්‍යාතවූ නිරොධයට සමවැදීම; අනාගාමිත්ත වෙව, කාමරූපභූමියෙහි පිහිටියාවූ අර්හත්සමාපත්තිලාභී අනාගාමී පුද්ගලයන්ට හා; අරහන්තානව, එබදුවූ රහතුන්ටද; ලබ්භති, ලැබිය යුතුයි. තත්‍ථ, ඒ නිරොධසමාපත්තියෙහි; යථාකාමං, පිළිවෙළින්; පඨමජ්ඣානාදි මහග්ගතසමාපත්තිං සමාපජ්ජිත්වා, ප්‍රථමධ්‍යානාදී මහද්ගතසමාපත්තීන්ට සමවැද; වුට්ඨාය, එම ධ්‍යානසමාපත්තියෙන් නැගිට; තත්‍ථ ගතෙ, ඒ ධ්‍යාන සමාපත්තියෙහි අන්තගීතවූ; සඞ්ඛාරධම්මෙ, සංස්කාරධර්මයන්; තත්‍ථ තත්‍ථෙව, ඒ ඒ ධ්‍යානයෙහිම; විපස්සනෙනා, විදර්ශනාකරන්නාවූ අනාගාමී රහත් පුද්ගල තෙමේ; යාව ආකිඤ්චඤ්ඤායතනං ගන්ත්වා, ආකිඤ්චඤ්ඤායතනධ්‍යාන කුශල ක්‍රියාව දක්වා ගොස් භෙවත් සමවැදීම් වශයෙන් ගොස්; තතොෙ පරං, එයින් මත් තෙහි; අධිඨෙය්‍යාදිකං, අධිෂ්ඨාන කටයුතු ද භෙවත් ශරීරය අසමඟ්ඩිවූ තමාගේ පාඝිච්ඡ ආදී පරිෂ්කාර විහාරාදිය ගිනි සොරභයාදියෙන් විනාශ කොවේවයි අධිෂ්ඨාන කිරීමය, සඞ්ඝයාගේ ප්‍රතිමානනය භෙවත් අඩගැම ප්‍රත්‍යවෙක්ෂා කිරීමය, බුදුන්ගේ ආමන්ත්‍රණය ප්‍රත්‍යවෙක්ෂා කිරීමය සත්දවසක් ඇතුලත කර්මජරූපයන් උපදවන්නාවූ ජීවිතෙන්ද්‍රිය රූපකලාප විනාශ ත්‍යාවේවයි. අධිඨාන කොට; පුබ්බකිච්චං කත්වා, සතර පූජා කෘත්‍යය කොට; නෙවසඤ්ඤානාසඤ්ඤායතනං, අනාගාමීහු නෙව සඤ්ඤානාසඤ්ඤායතන කුශල ධ්‍යානයට හා රහත්හු එම ක්‍රියා ධ්‍යානයටද; සමාපජ්ජති, සමවදනේයි. චිත්තං අපඝණ්ඩ්වතානං, නෙවසඤ්ඤානාසඤ්ඤායතන කුශල ක්‍රියා ජවනයන් දෙදෙ නෙකුන්ගෙන්; පරතො, මත්තෙහි; තස්ස, ඒ ආර්‍ය්‍ය පුද්ගලයාගේ; චිත්තඝනතති, චිත්තපරම්පරා තොමෝ; වොච්ඡිජ්ජති, විශෙෂයෙන් සිදේ. තතො, ඒ චිත්ත පරම්පරාවගේ සිඳීමෙන්

මත්තෙහි; නිරොධසමාපත්තෙහා නාම හොති, නිරොධයට සම වන්නේ නම් වෙයි. පන, අනාගාමියන්ගේ කියම්:-වුට්ඨානකාලෙ, නිරොධසමාපත්තියෙන් නැගිටිනා කල්හි; අනාහාමිනෝ, අනාගාමී පුද්ගලයාහට; අනාගාමි ඵලචිත්තං, අනාගාමි ඵලචිත්ත වද; අරහතෝ, රහත්හට; අරහත්තඵලචිත්තං, අර්හත්ඵල චිත්තයද; එකවාරමෙව පවත්තිත්වා, එක් වරක්ම පැවත; භවඞ්ග පාතෙ හොති, භවාඞ්ගපාතය වෙයි. තතො පරං, ඒ භවාඞ්ග පාතයෙන් මත්තෙහි; පඤ්චවෙකඛණද්වාරං, ප්‍රත්‍යවෙක්ෂාජවන චිත්තය උපදියි.

එත්ථ, මේ විදර්ශනාකර්මස්ථානයෙහි; අයං, මේ කියන ලද්දේ වනාහි; සමාපත්තිභෙදෙ, සමාපත්තීන්ගේ ප්‍රභෙදයයි.

විපස්සනා කම්මට්ඨානභෙදො, විදර්ශනා කර්මස්ථානක්‍රම භෙදෙ; නිසිතොව, නිශ්චාවට පැමිණියේ මැයි.

පන, විශෙෂාර්ථයක් කියම්:-හෙවත් උත්පෝද්ඝාදයක් වම්:-ඝාසතෙ, භෙසජ්ජානීඝ ඝාසතභෙසජි; පටිපත්තිරහස්සාදං, ධ්‍යානසුඛ-ඵලසුඛ සඞ්ඛ්‍යාතවූ ප්‍රතිපත්තීන්ගේ රහස්වාදය, පත්ථයනෙනත, ප්‍රාර්ථනා කරන්නාවූ කුලපුත්‍රයා විසින්; ඉවෙව වං, යම් කියන ලද ක්‍රමයෙන්; උත්තමං, උතුම්වූ හෙවත් නිව රණෙකලඝයන් පහකිරීමෙහි පොහොසත්වූ; භාවනාවයං, සමථ භාවනා-විදර්ශනාභාවනා සංඛ්‍යාත භාවනාවය; භාවෙතබ්බං, වැඩිය යුත්තේයි.

අභිධම්මත්ථ සඞ්ගහෙ, අභිධම්මාර්ථ සංග්‍රහ නම් ප්‍රකරණ යෙහි; කම්මට්ඨානසඞ්ගහවිභාගො නාම, කර්මස්ථානසංග්‍රහ විභාග නම්වූ; නවමෝ පරිච්ඡෙදෝ, නවවන පරිච්ඡේදය; ඉති, මෙසේ; සම්පූර්ණ කරණ ලද්දේයි.

වාරිත්තසෙයාගිත, මනා සිරිතින් හෙබියාවූ; විසාලකුලෝ දයෙන, ප්‍රසිද්ධ කුලයෙහි උපන්නාවූ; සද්ධාභිවුද්ධ, ශ්‍රද්ධාවෙන් වැඩුනාවූ; පරිසුද්ධගුණොදයෙන, පිරිසිදු ගුණයන්ගේ පහළවීම ඇත්තාවූ; නම්බවහයෙන, නම්බ නම් උපාසකයා විසින්; පරානුකම්පං පණ්ඩාය, පරානුකම්පා පිණිස; යං පකීතං, යම් ප්‍රකරණ යක් කළහොත් යහපතැයි ප්‍රාර්ථනා කරණ ලද්දේද; තං, ඒ ප්‍රකරණය; පරිනිට්ඨිතං, හාත්පසින් සම්පූර්ණ කරණ ලද්දේයි.

විපුලෙන, බොහෝවූ; තෙන පුඤ්ඤෙන, මේ පොතකළ ඒ පිණෙන්; පඤ්ඤවදත, ආර්‍යාමාගීප්‍රඥාවෙන් පිරිසුදුවූ; ගුණ

ශොභිත, සිලාදිගුණයෙන් හෙබියාවූ; ලජ්ජී භික්ඛූ, **ලජ්ජා** ඇති භික්ෂූහු; ඛඤ්ඤුඛිවාසං, ධනාඥන්ට වාසස්ථානවූ නොඅොත් ශ්‍රී කාන්තාවට අධිවාසස්ථානවූ; උදිතොදිතං, අතිප්‍රසිද්ධවූ; තුමූල සොමං, තුමූලඅොම නම් විහාරය; පුඤ්ඤවිභවොදය, **පුණ්‍ය**සම්පත්තියට උදය සංඛ්‍යානවූ; මඩ්ඝලාය, මඩ්ඝලාය පිණිස; ආයු ගණනං, කල්පාන්තය දක්වා; මඤ්ඤනතු, හගිත්වා.

අනුරුඛාවරියෙන, අනුරුඛාචාර්‍යයන් වහන්සේ විසින්; රචිතං, රචනා කරණලද; අභිධම්මත්ථ සඞ්ගහං නාම, අභිධර්‍මාර්‍ථ සංග්‍රහ නම්වූ; පකරණං, **ප්‍රකරණය** නම; ඉති නිට්ඨිතං, **මෙසේ සම්පූර්ණ** වූයේයි.

(භා)

සමඝතළිස් "තො" ප්‍රත්‍යයාගේ අර්ථ මෙලෙස්සි:—"රූපං **අනිච්චතො දුක්ඛතො** රොගතො ගණ්ඩතො සල්ලතො අඝතො ආබාධතො පරතො පලොකතො ඊතිතො උපද්දවතො භයතො උපසග්ගතො චලතො පභඞ්ගුතො අද්ධුවතො අතාණතො අලෙනතො අසරණතො රිත්තතො තුච්ඡතො සුඤ්ඤතො අනත්තතො ආදීනවතො විපරිණාමධම්මතො අසාරකතො අඝ මූලකතො වධකතො විභවතො සාසවතො සඞ්ඛතතො මාර ඕඝතො ජාතිධම්මතො ජරාධම්මතො ව්‍යාධිධම්මතො මරණ ධම්මතො සොකධම්මතො පරිදෙවධම්මතො උපායාසධම්මතො සංකිලෙසික ධම්මතො"නි යනු සමඝතළිස් "තො" ප්‍රත්‍යයයි.

එහි අර්ථ මෙසේයි:—රූපං රූපසඤ්ඤය; අනිච්චතො, අත කාන්ත වශයෙන්ද; **දුක්ඛතො, දුස්** වශයෙන්ද; රොගතො, අවඅනුවක් **රොගයන්**ගේ උත්පත්තිස්ථාන වශයෙන්ද; ගණ්ඩ තො, කෙලශ සංඛ්‍යාත පූය වඤ්චනය වන හෙයින් ගඩක් වශ යෙන්ද; සල්ලතො, තෘෂ්ණාදෘෂ්ටීන් කරණකොටගෙණ; විදු නාර්‍ථයෙන් හුලක් වශයෙන්ද; අඝතො, අභිවාර්‍ඤ්ඤයක් නැත්තාවූ අකුශලයන්ගේ උත්පත්තිස්ථානවූ සාධු සත්පුරුෂ යන් විසින් ගරහන ලද්දාවූ වස්තුවක් වශයෙන්ද; ආබාධතො, රොගයන්ගේ හටගැණීම් වශයෙන්ද; පරතො, තමාගේ වශ යට නොපැමිණීම් වශයෙන්ද; පලොකතො, ජරා-ව්‍යාධි-මරණ යන්හෙන් විනාශ වීම හැකි වශයෙන්ද; ඊතිතො, බොහෝවූ විනාශයක් ඵලවීම් වශයෙන්ද; උපද්දවතො, දෙතිස් කම්කටුළු ආදීන්ගේ හටගැණීම් වශයෙන්ද; භයතො, සියලුම භය හට ගැණීමට ස්ථාන වශයෙන්ද; උපසග්ගතො, අයහපත්වූ නිමිති

වශයෙන්ද; වලතෝ, ජරා-ව්‍යාධි-මරණයන්ගෙන් චංචලවීම් වශයෙන්ද; පභඞ්ගුතෝ, තමාගේ උත්සාහය මෙරමාගේ උත්සාහය ප්‍රකෘතිස්වභාවය යන මේ ත්‍රිවිධාකාරයෙන් භිතාශවීම් වශයෙන්ද; අද්ධුවතෝ, සදාකාලික නොවීම් වශයෙන්ද; අතාණතෝ හසින් පහව්මට සථාන නොවන හෙයින්ද; අලෙනතෝ, සිසලු භය ඉක්ම වීම පිණිස සැඟවීමට සථාන නොවන හෙයින්ද; අසරණතෝ, තමා නිශ්‍රයකොට ගන්නවුන්ට පිහිට නොවිය හැකි වශයෙන්ද; රිත්තතෝ, දෘෂ්ටිවශයෙන් කල්පනා කරණ ලද්දවූ සදාකාලික ආත්මයෙන් හිස්වූ හෙයින්ද; තුච්ඡතෝ, එසේම ආත්ම හිස්වූ දුකින් පිරිවරා ගත් හෙයින්ද; සුඤ්ඤතෝ ආත්ම යෙන් ශූන්‍යවූ හෙයින්ද; අනත්තතෝ, ආත්ම සංඛ්‍යාත සාරය නැති බැවින්ද; ආදීනවතෝ, අනෙකානත්ත බවය දුක් බවය විපරීත බවය යනාදී ආදීනවය ඇති හෙයින්ද, විපරිනාම ධම්මතෝ, ජරා-ව්‍යාධි-මරණාදියෙන් පෙරලෙන්නාවූ සභාව ඇති හෙයින්ද; අසාරකතෝ, ආත්මාදී කිසි සාරධම්මයක් නැති හෙයින්ද; අඝමූලකතෝ, අඝ සංඛ්‍යාතවූ අකුශලයන්ගේ හට ගැණීමට මූල්වන හෙයින්ද; වධකතෝ, වැලිකෙළියෙහි පවත් මිත්‍රව පසුපස්සෙහි යන මිත්‍රවධකයෙකු මෙන්ද; විභවතෝ, විභවදෘෂ්ටි-විභවතණ්හාවන්ගේ හටගැණීමට කාරණා වශයෙන්ද; සාසවතෝ, චතුරාශ්‍රවයන්ට අරමුණුවීම් වශයෙන්ද; සංඛතතෝ, හෙතුධම්මයන් උපදවන ලද හෙයින්ද; මාරාමිසතෝ, මෘත්‍යුමාර ක්ලෙශමාරාදීන්ගේ ආමිශයක් වශයෙන්ද; ජාතිධම්මතෝ, ඉපදීම සභාවයෙහිම ඇතිහෙයින්ද; ජරාධම්මතෝ, දිරීම සභාව කොට ඇති හෙයින්ද; ව්‍යාධිධම්මතෝ, ලෙඩවීම සභාව කොට ඇතිහෙයින්ද; මරණධම්මතෝ, මැරීම සභාවකොට ඇතිහෙයින්ද; සොකධම්මතෝ, ශොකකිරීම සභාව කොට ඇති හෙයින්ද; පරිදෙව ධම්මතෝ, වැලපීම සභාව කොට ඇති හෙයින්ද; උපායාස ධම්මතෝ, බලවත් ආයාස ඇති බැවි සභාව කොට ඇති හෙයින්ද; සංකිලෙසික ධම්මතෝ, බලවත්වූ තෑවීම සභාව කොට ඇති හෙයින්ද නෙවත් කෙලෙසීම ඇති හෙයින්ද පසසයි, විවිධාකාරයෙන් දක්නේ වෙයි.

මේ සතළිස් "තෝ" ප්‍රත්‍යය ඇති විදර්ශනාභාවනාව වනාහි පටිසම්භිදා මාගීපාලියෙහි විදර්ශනාකථායෙහිද, විශුද්ධිමාගීයෙහි සම්මර්ශනඥානකථායෙහිද සමානව ආයේයි. මහානිදේශපාලියෙහි "තෝ" ප්‍රත්‍යය දෙසාළිස්සක් ආයේයි. ඒ කෙසේ යත්? "අසරණතෝ" යන පදයට අනතුරුව "අසරණීභූතතෝ" යන පදයද; ආදීනවතෝ යන දෙපදයක්ද දක්නා ලැබෙයි. මේ සත

ළිස් ආකාරයෙන් දැකීම වනාහි සම්මසනඤ්ඤාණයයි කියාද; සම්මසනඤ්ඤාණමේවස්ථානයයි කියාද; සම්මසනඤ්ඤාණ අනුලෝමඤ්ඤාණනිඤ්ඤානයයි කියාද ව්‍යවහාර කරණු ලැබේ. රූප ස්කන්ධය මේ සතළිස් ආකාරයෙන් බලන්නාක්මෙන් වේදනා ස්කන්ධය, සංඥාස්කන්ධය, සම්පයුක්ත චේතසික නමැති සංස්කාර ස්කන්ධය, විඤ්ඤාණස්කන්ධය, යන සතර නාමස්කන්ධයද, සතළිස් සතළිස් ආකාරයෙන් වෙන වෙනම බැලිය යුත්තේයි.

මේ පඤ්චස්කන්ධයෙහි සම්මසනඤ්ඤාණයෙන් බලන හෙයින් විදර්ශනාකර්මස්ථානයෝ දෙසියකැයි කියාද, අනුලෝම ඤ්ඤාණනිඤ්ඤානයෝ දෙසියයකැයි කියාද ව්‍යවහාර කරණ ලද්දේයි. ඒ "තෝ" ප්‍රත්‍යය සම්මසනඤ්ඤාණයෙහි අනිත්‍ය-දුඃඛ-අනාත්ම යන ලක්ෂණත්‍රයට නගා විදර්ශනා කිරීම පිණිස දෙශනා කළ හෙයින් අනිච්චතෝ, පලොකතෝ, වලතෝ, පභඞ්ගුතෝ, අද්ධුවතෝ, විපරිණාමධම්මතෝ, අසාරකතෝ, විනවතෝ සඞ්ඛතතෝ, මරණධම්මතෝ, යනමේ දසපදය අනිත්‍යලක්ෂණය අනිත්‍යානුදර්ශනය යනමේ විස්තාරය පිණිස දෙශනාකළ හෙයින් ඒ දශප්‍රකාරවූ "තෝ" ප්‍රත්‍යයාන්තයෝ දසදෙන සකල පඤ්චකය හා ගුණ කොට අනිත්‍යානුපස්සනාවෝ පණස්දෙනෙක් වෙත්. පරතෝ, රිත්තතෝ, තුච්ඡතෝ සුඤ්ඤතෝ, අනත්තතෝ යන පස්පදය අනාත්මලක්ෂණ අනාත්මානුපස්සනාව පිණිස දෙශනාකළ හෙයින් ඒ "තෝ" ප්‍රත්‍යයාන්තපඤ්චකය පඤ්චස්කන්ධයෙන් ගුණිතකොට අනත්තානුපස්සනාවෝ පස්විසිදෙනෙක් වෙත්. අවශෙෂවූ දුක්ඛතෝ රොගතෝ ගණ්ඩතෝ ඉත්‍යාදීවූ "තෝ" ප්‍රත්‍යාන්ත පස්විසිපදයෝ තුමූ; දුක්ඛලක්ඛණ, දුක්ඛානුපස්සනාව පිණිස දෙශනා කළ හෙයින් ඒ පස්විසිපදය පඤ්චස්කන්ධයෙන් ගුණිතකොට දුක්ඛානුපස්සනාවෝ එක්සියපස්විස්සක්වෙත්. මෙසේ අනිත්‍යානුපස්සනා ඤාතයෝ පණසෙක, දුක්ඛානුපස්සනාඤාතයෝ එක්සිය පස්විස්සෙක, අනත්තානුපස්සනාඤාතයෝ පස්විස්සෙකැයි යන මොවුන්ගේ වශයෙන් විදර්ශනඤාන සංඛ්‍යාතවූ අනුලෝමඤ්ඤාණනිඤ්ඤාන දෙසියය හවඟන්නා ක්‍රමය විශුද්ධිමාර්ගයෙහි ප්‍රකාශකෙළේයි.

මෙසේ අනිත්‍ය-දුක්ඛ-අනාත්මවූ නාමරූපධර්ම දෙදෙනා අතුරෙන් නැවක් නිශ්‍රය කොටගෙණ සමුද්‍රයෙහි ගමන් කරන්නාවූ මනුෂ්‍යයෝ තුමූ ඒ නැව නිසා පවත්නාක්මෙන්ද, ඒ නැව මිනිසුන්ගේ උපකාරයෙන් පවත්නාක්මෙන්ද, මේ රූප ස්කන්ධය නිශ්‍රය කොටගෙණ විඤ්ඤාණචෙතසික සංඛ්‍යාතවූ නාම

කාය පවතී, ඒ නැව පදින්නාවූද; පළුපත අල්ලන්නාවූද මිනිසුන් හෙතුකොටගෙණ ඒ නැව මහාසමුද්‍රයෙහි ගමන් කරන්නාක්මෙන් විතත වෛතසිකවූ නාමස්කන්ධ සතර කාරණා කොටගෙණ රූපස්කන්ධය පවතී. රූපස්කන්ධය නැවකටද, වේදනා-සඤ්ඤා-සංඛාර යන ස්කන්ධ තුණ නැවපදින්නා පුරුෂයන්ටද, විඤ්ඤාණස්කන්ධය පළුපත අල්ලන්නාවූ මහනැවියාටද උපමා වන බැවින් ඒ නැව නිසා පුරුෂයෝ සතරදෙනාද, ඒ පුරුෂයන් නිශ්‍රයකොටගෙණ නැවද, ඔවුනොවුන්ට ඔවුනොවුන් උපකාර වීමෙන් පවත්නා හෙයින් යම් කෘණයෙක්හි නැව විනාශවිනම් ඒ පුරුෂයෝ සතරදෙනාද, ඒ පුරුෂයන් විනාශවිනම් නැවද එකාන්තයෙන් විනාශ වන්නේසි. එහෙයින් පුරුතකාවාරීන් විසින්:—

ගාථා.

යථාපි නාවං නිස්සාය මනුස්සා යන්ති අණ්ණවේ;
එවමේව රූපං නිස්සාය නාමකායෝ පවත්තති.

යථාපි මනුස්සේ නිස්සාය නාවා නච්ඡති අණ්ණවේ;
එවමෙව නාමං නිස්සාය රූපකායෝ පවත්තති.

යමකං නාමං රූපඤ්ච උභෝ අඤ්ඤඤ්ඤනිස්සිතා;
එකස්මිං හි භිජ්ජමානෙ උභෝ භිජ්ජන්ති පච්චයා.

යනු වදාළේසි.

කත්‍රු? සත්තෝති පඤ්ඤත්ති මාරදිට්ඨිනත්ථි තෙ
සුඛසඞ්ඛාර පුඤ්ජොයං නසිඛ සත්තූප ලබ්භති.

යනුද දෙශනා කෙළේසි.

පදාර්ථ.

ඛන්ධේසු, පවත්තකන්ධයන් අතුරෙන්; කං, කවර කෙනෙක්; සත්තෝති, සත්වයයි කියා; ජානාති ත්‍රු; දානගන්නේද යන්? පවත්තස්කන්ධයන් අතුරෙන් එක් ස්කන්ධය කුදු සත්වයයි නොගත යුතුගයි කී නියාසි. අඤ්ඤං, පවත්තකන්ධයෙන් අන්‍යවූ; එකොසත්තෝ, එක්තරා සත්වයෙක් තෙමේ; අත්ථි, ඇතැයි කියා; පවෙවසි, හඟින්නෙහිමී නම්; තෙ, තොපට; මාරදිට්ඨි ගතං හොති, වශවර්ත්තිමාරයාගේ ආයුධ සංඛ්‍යාතවූ මිථ්‍යාදෘෂ්ටිය වන්නේසි. අයං, මේ සත්ව තෙමේ වනාහි; සුඛසඞ්ඛාරපුඤ්ජෝ, ආත්ම සඞ්ඛ්‍යාත සාරයෙන් හිස්වූ හුදු සංස්කාර රාශියක් වෙයි. ඉධ, මේ පවත්තකන්ධ සංඛ්‍යාතවූ නාමරූපධර්මයෙහි; සත්තෝ සත්වයෙකු; න උපලබ්භති, නොලැබිය යුත්තේසි.

ගා ථා.

යථාපි අඞ්ගසම්භාරා හොති සද්දෝ රථෝ ඉති
එවං ඛන්ධේසු සන්තේසු හොති සත්තෝති සම්මුති.

අඞ්ගසම්භාරා, රථවක්‍ර රථතෙම් ආදීවූ අවයවයන් හෙතු කොටගෙන; රථෝ ඉති සද්දෝ, රථය යන ව්‍යවහාර ප්‍රඥප්තිය; හොති යථා, යම්සේවේද; එවං, එපරිද්දෙන්; ඛන්ධේසු සන්තේසු, පවස්කඳයන් විද්‍යමානකල්හී; සත්තෝති, සත්වය යන ප්‍රඥප්තිය; හොති, වෙයි.

මේ ගාථාවෙහි අභිප්‍රාය මෙසේයි:—නිම්වලලු දුවඅක්ෂරාදී රථාවයවයන් නිසා රථය යන ශබ්ද ව්‍යවහාරය ඇතිවේද, ඒ අවයවයන්ගෙන් අන්‍යවූ රථයක් නම් නැත්තේවේද, එපරිද්දෙන්ම රූපාදී ස්කන්ධපඤ්චකය එක් ප්‍රකාරයකින් රැසිහුතවූ කල්හී "බ්‍රහ්ම" යන ප්‍රඥප්තියද, අනිත් ප්‍රකාරයකින් රැසිහුතවූ කල්හී "දෙවතා" යන ප්‍රඥප්තියද, අනිත් ප්‍රකාරයකින් රැසිහුතවූ කල්හී මනුෂ්‍ය යන ප්‍රඥප්තියද, එසේම ස්ත්‍රිය, පුරුෂයාය, රජතුය, කුමාරිය, යනාදී සියලු ප්‍රඥප්තීහු පවතිත්. ඒ පවස්කඳය වෙන්ව ගිය කල්හී ස්ත්‍රී පුරුෂාදී සියලු ප්‍රඥප්තීහුම විනාශ වෙති. මේ ආදී ක්‍රමයෙන් විදර්ශනාඤාණය පුරුදු කිරීමෙන් යම් කලෙක ආත්මදෘෂ්ටිය විනාශවේද, එකල්හී සතර අපා දොර වසා ලද්දාවූ සමෙඛාධිපරායණවූ චුල්ලසෝතාපන්න නම් වන බව "ඉමිනා පන සුත්තේන සමන්නාගතෝ ච්පස්සකෝ බුද්ධසාසනෙ ලබ්භති ලබ්භ පතිට්ඨං නියතෝ සම්බොධිපරායණෝ චුල්ලසෝතාපන්නෝ නාම හොති" යි. විශුද්ධිමාර්ග-කඞ්ඛාවිතරණ විසුද්ධියෙහි දක්වනලදී.

මේ ඥානය වනාහි:-කඞ්ඛාවිතරණ විසුද්ධිඤාණය, ධම්මට්ඨිතිඤාණය, සම්මාදිට්ඨඤාණය, ධම්මානුපස්සනාඤාණය යන සතර නමකින් යුක්තවූ විදර්ශනාඥානය උපන්නාවූ යොගාවචර තෙමේ ඊට අනතුරුව එකාන්තයෙන් සෝවාන් මාර්ගඥානය ලැබිය යුතු හෙයින් චුල්ලසෝතාපන්නයයි ව්‍යවහාර කෙරෙත්, යම්සේ මහත්වූ ආවාටමුඛයක් දෙසට වෙනයෙන් දිවන පුරුෂයෙක් ආවාට මුඛයෙහි තොනැවතිය හැකිව ආවාටයෙහි වැටෙන්නාක්මෙන්ම මේ ඥානය උපන් යොගාවචර තෙමේ සෝවාන් මාර්ගයට නොපැමිණ මේ ඥානයෙහි තොනවත්නෝයයි දත යුතුයි.

විදර්ශනාකර්මස්ථානයෙහි සිලවිසුඬි ආදීවූ සප්තවිසුඬියක් සම්පාදනය කටයුතුයි. ඒ කර්මස්ථාන වැඩීමට පූර්වභාගයෙහි සිල

විසුද්ධි සංඛ්‍යාතවූ සීලයාගේ පිරිසිදු බව සැපවිය යුත්තේය. ඊට අනතුරුව චිත්තයාගේ පිරිසිදුබව සැපවිය යුත්තේය. තදනන්තරව දෘෂ්ටීහුගේ පිරිසිදු බවද, ඊට අනතුරුව සැකය එතරකිරීමද, තදනන්තරව මාර්ගය දේ මෙහෝ අමාර්ගයදේ හෝරිති විමංසනය කරමින් උපදින මග්ගා මග්ගඤාණදස්සන විසුද්ධියද, සැප විය යුත්තේය. ඊට අනතුරුව ඒ මාර්ගයාගේ ප්‍රතිපදාව පිරිසිදුකට යුතුයි. තදනන්තරව සෝවාන් ආදි මාර්ගඥානය ඉපදවිය යුතුයි.

මේ සප්තවිශුද්ධීන් අතුරෙන් සීලවිසුද්ධි ආදී සදෙන ලෞකික කුශලධර්මයෝ වෙයි. ඤාණදස්සන විසුද්ධිය ලෝකෝත්තර වෙයි. ඒ පූර්භාගවූ ෂට්විශුද්ධියෙන් සම්පූර්ණවූ කල්හි අනිත්‍යලක්ෂණය දුඃඛලක්ෂණය අනාත්මලක්ෂණයයි කියා ලක්ෂණත්‍රයක්ද; අනිත්‍යානුපස්සනා දුක්ඛානුපස්සනා අනත්තානුපස්සනායයි අනුපස්සනාවෝ තුන්දෙනෙක් වෙති. මෙසේ ලක්ෂණත්‍රය ආරොපණය කොට ත්‍රෛභූමිකධර්මයන් නැවත නැවත දක්නා කල්හි ලබන ලද්දාවූ ඥානයෝ වනාහි සම්මර්ශනඤාණය, උදයව්‍යයඥානය, භඞ්ගඥානය, භයඥානය, ආදීනවඥානය, නිර්විදාඥානය, මුච්චිතුකම්‍යතාඥානය, පටිසංඛාඥානය, සංඛාරුපෙක්ඛාඥානය, අනුලෝමඥානය, යන දශවිධාර්යදර්ශනඥාන කෙනෙක් ඒ මාර්ගඥානයට පූර්භාගයෙහි උපදනාහු වෙති.

ඒ ත්‍රිවිධ විදර්ශනාවන් හෙතුකොටගෙණ ලබන ලද්දාවූ විමෝක්ෂය වනාහි සුඤ්ඤතවිමෝක්ෂය, අනිමිත්තවිමෝක්ෂය, අප්පණිහිතවිමෝක්ෂයයි ත්‍රිවිධාකාරවෙයි. සුඤ්ඤතානුපස්සනාය, අනිමිත්තානුපස්සනාය, අප්පණිහිතානුපස්සනායයි අනුපස්සනාවෝ තුන්දෙනෙක් වෙත්. මේ විදර්ශනාඥානය හා විමෝක්ෂත්‍රයද අනුපස්සනාවෝ තුන්දෙනද එකාවබෝධ කවයුතුයි හේ කෙසේ යත්? "අනිච්චං, දුක්ඛං අනත්තා" යනුවෙන් තිලකුණු භාවනා කරන්නාවූ ආර්‍යයන්ට ඒ ලක්ෂණත්‍රයෙන් එකක්ම වැටහී අධිගමලාභය වන්නේයි. ඉදින් අනිත්‍යයයි වැටහී මාර්ගය ලබන්නේවී නම් ගොත්‍රභූඥානයට පූර්භාගයෙහි උපදනා අනුලෝමචිත්තයෙහි යෙදුනාවූ ප්‍රඥාචෛතසිකය අනිත්‍යානුපස්සනා-විමෝක්ෂමුඛ නම් වෙයි. ගොත්‍රභූචිත්තයට අනතුරුව ලබන්නාවූ මාර්ගචිත්තය අනිමිත්තවිමෝක්ෂ නම් වෙයි. මෙසේම සෙසු දෙපදමයහිද අනුපස්සනාවන්ගේ හා විමෝක්ෂයන්ගේ ද නම් ලබන්නාවූ ක්‍රමය අවබෝධ කටයුතුයි.

ඒ සප්තවිශුද්ධීන් අතුරෙන් "සීලවිසුද්ධිය" යනු භික්ෂූන්ට වනාහි ප්‍රාතිමෝක්ෂයෙහි ආවාවූ සප්තාපත්තිස්කන්ධය එක් දුකුළා

ඇවතකුදු මදීනය නොකොට උගුවූ කොරවූ විෂ ඇත්තාවූ සපී යෙකු මෙන් මහත් උත්සාහයෙන් ශීලය සම්පූර්ණ කිරීම භික්ෂු සීලවිසුද්ධියයි. හෙරණුන්ට වනාහි දසසිල්-දසපරිජි-දසසික-දස නාසනා-දසදඹුවම් ආනාදී සම්පණස් සංවර හා සෙඛියා-වත්ත කඛ්ඩකයෙහි ආවාවූ සියලු සීලයන්ගේ පරිපූර්ණ කිරීම හෙර ණසීලයයි. ගෘහස්ථඋපාසකයන්ට වනාහි පවසීලය-දසප්‍රකාර දුශ්චරිතය ආනාදීවූ සියලු සංවරය ගිහිගොඩක් මෙන් වැටහී මහත් උත්සාහයෙන් සීලයන් රැස් කිරීම ගෘහස්ථ සීලයයි.

මෙසේ ප්‍රාතිමෝක්ෂසංවර සීලය පුරා තදනන්තරව චක්ඛු-සොත-ඝාණ-ජිව්හා-කාය-මනෝ ආන සද්දෙර රජ්ජුන්ගේ හාණ්ඩා ගාරය රක්ෂාවූ රාජපුරුෂයන් මෙන් මහත් භයින් රක්ෂා කිරීම ඉන්ද්‍රියසංවරසීල නම්වෙයි. භික්ෂුසාමණේරයන් විසින් අඥාකුල දූෂණයෙන් හා එක්විසි අන්වේෂනයෙන් ලබනලද සිව්පසයගිනි මෙණ දිලියෙන මහත්වූ යවටක් මෙන් අත්හැර සපදානචාරි කාවෙන් දැහැමෙන් ලබන ලද සිව්පසය පරිභෝග කිරීම ආජී වපාරිසුඞ්ඛි ශීලයයි. ගෘහස්ථයන් විසින් ත්‍රිවිධකායකර්මය, චතුර් විධවාක්කර්මය ආන සප්තදුශ්චරිතයෙන් ලබන ලද පසය දුරින් දුරුකොට දැහැමින් සෙමින් ලබන ලද්දවූ ප්‍රත්‍යයපරිභෝග කිරීම ආජීවපාරිසුඞ්සීලයයි. භික්ෂුසාමණේරයන් විසින් "පටි සංඛා යොනිසෝ" ආනාදින් ප්‍රත්‍යවෙක්ෂා කොට සිව්පසපරි භොගය ප්‍රත්‍යයසන්නිශ්‍රිත සීලයයි. ගෘහස්ථයන් විසින් ආහාරෙ පටික්කූල සංඥාදින්ගේ වශයෙන් ආහාරයෙහි තෘෂ්ණාවෙන් නොඇලී පරිභොග කිරීම ගෘහස්ථ ප්‍රත්‍යය සන්නිශ්‍රිත ශීලයයි. මෙසේ මේඝතරාකාර සීලයෙහි සංවර නිඝාකිරීම සීලවිසුඞ්ධි නම් වෙයි දතයුතුයි.

"චිත්තවිසුද්ධිය" ආනු උපචාරසමාධි අප්පණාසමාධිහුයි. උප චාරසමාධිය ආනු ධ්‍යානාංගී ඵලයන්ගේ සම්පයට පැමිණියාවූ කාමාවචර භාවනාමය පුණ්‍යක්‍රියාවයි. උපචාර අප්පණාසමාධි න්ගේ වශයෙන් කාමච්ඡන්දී පඤ්චනීවරණධර්මයන් විෂ්කම්භන ප්‍රහාණ වශයෙන් වලක්වා සිත පිරිසුදු කිරීම චිත්තවිසුඞ්ධියයි.

"දිට්ඨිවිසුඞ්ධි" ආනු **ලක්ඛණ**-රස-පච්චුපට්ඨාන-පදට්ඨානය න්ගේ වශයෙන් වේදනා-සඤ්ඤා-සංඛාර-විඤ්ඤාණ සංඛ්‍යාතවූ තෙපණස් නාමධර්මය හා විකාර වන අර්ථයෙන් රූපනම්වූ අට ලෝසක් ප්‍රභෙදවූ රූපධර්මයන්ගේද ආනමේ එක්සැත්කැවක් නාමරූපධර්මයන් අතුරෙන් සපයි තෙමේ අරමුණෙහි වැදගැයේව

ලක්ඛණකොට ඇත්තේය. යනාදී වශයෙන් ලක්ඛණ-රස-පච්චු පට්ඨාන-පදට්ඨානයන්ගේ වශයෙන් එකි එකි ධර්මයක් පාසා නුවණින් පරීක්ෂා කරණ කල්හි අනිත්‍යය, දුක් උපදවන හෙයින් දුකය, වසඟයෙහි නොපවත්නා බැවින් අනාත්මයයි මෙසේ ත්‍රිලක්ෂණාරොපණය කොට නාමරූපධර්මයන් කෙරෙහි නිත්‍යය සුඛය ආත්මය යන විපරීත දෘෂ්ටි පහකරණ අර්ථයෙන් දිට්ඨිවිසුද්ධි නම්වෙයි.

"කඞ්ඛාවිතරණ විසුද්ධි" යනු මේ නාමරූප ධර්මවල ශක්‍ර බ්‍රහ්මස්වරාදී මහානුභාවසම්පන්න දෙවියෙකු විසින් මවන ලද්දේ නොවෙයි. ස්ත්‍රීපුරුෂ සත්ත්වජීවාදී ප්‍රඥප්තිමාත්‍රයක අවිද්‍යාව ආදිකොට ඇති ජරාමරණය අවසන් කොට ඇති අග දෙලසකින් යුක්තවූ විසි ආකාරයකින් හා සන්ධිත්‍රයකින්ද, සතර සංක්ෂේපයකින් හා වෘත්තත්‍රයකින්ද, මූලවශයකින්ද යුක්තවූ හෙතුඵල සම්බන්ධයෙන් පවත්නාවූ ධර්මපුඤ්ජමාත්‍රයෙක්මය. ඊශ්වරාදී දෙවියෙකු විසින් හෝ ආත්මාදිකාරකයෙක් විසින් හෝ කාරණ ලද්දේත් නොවෙයි. පූර්වජාතියෙන් මේ ජාතියට ආවේ දෝ හෝ මේ ජාතියෙන් අනික් ජාතියට යන්නේ දෝ හෝ යි යනාදීන් පැවති සොළොස් වැදෑරුම් සැකය දුරු කිරීමෙන් පිරිසුදු කරන්නාවූ ඤාණය කඞ්ඛාවිතරණ විසුද්ධි නම්වේ.

මහාමහඤාණදස්සන විසුද්ධිය යනු ඒ කඞ්ඛාවිතරණ විසුද්ධියෙන් මත්තෙහි ඒ ඒ ආකාරයෙන් නුවණින් හන්නාලද අතීතාදී භෙදභින්නවූ සප්‍රත්‍යයවූ නෙත්‍රභූමික සංස්කාර ධර්මයන් කෙරෙහි ස්කන්ධාදී නය පටන් ක්ෂණ වශයෙන් හකුළුවා ගෙවී යන අර්ථයෙන් අනිත්‍ය නම්වෙයි. භය කරණ අර්ථයෙන් දුක් නම් වෙයි. ආත්මසාර විරහිත හෙයින් නිස්සාර වෙයි. මේසේ කාල වශයෙන් හා සන්තති වශයෙන්ද උපාදඝනනිභඛ සංඛ්‍යාතවූ ක්ෂණයන්ගේ වශයෙන්ද, ලක්ෂණත්‍රය බලන්නාවූ යොගාවචරයාහට ඒ විදර්ශනානුභාවයෙන් ශරීරයෙන් නික්මෙන්නාවූ ආලෝකය, අතිශයින් සතුටු වන්නාවූ ප්‍රීතිය, කාය චිත්ත දෙදෙනාගේ සන්සිඳීම වන්නාවූ පස්සද්ධිය, අරමුණු නිශ්චය කරණ අධිමොක්ෂය, චිත්තයට සංග්‍රහ කරන්නාවූ පග්‍රහය, කායචිත්ත දෙදෙනාගේ සැපය, විදර්ශනාවෙහි ආරොපණය කළාවූ ඥානය ප්‍රධානවූ උපස්ථානය, මැදහත්ව කැරඹීම් සංඛ්‍යාතවූ උපෙක්ෂාවය, සියුම් තෘෂ්ණා සංඛ්‍යාතවූ නිකාන්තිය යන මේ විදර්ශනාවට අන්තරාය කරවූ උපක්ලේශයන්, දැසෙන උපන් කල්හී මේ වනාහී මාගීය නොවෙයි, එකාන්තයෙන් විදර්ශනා

වශයෙන් උපක්ලේශයයි දන ගන්නාවූ ඥානය මහාමේඝාභාසඤාණ දස්සන විසුද්ධි නම් වෙයි.

පරිපදාඤාණදස්සනවිසුද්ධිය යනු ඒ විදර්ශීනා උපක්ලේශ යන්හෙන් විත්තය මිදුනු කල්හී උදයව්‍යයඥානය පටන් අනුලෝමඥානය දක්වා ක්‍රමයෙන් පරිග්‍රහ කරන්නාවූ ඤාණයාගේ පිරිසිදු බව පරිපදාඤාණදස්සන විසුද්ධි නම්වේ.

ඤාණදස්සනවිසුද්ධිය යනු යටකී ක්ලේශ සංඛ්‍යාත උපක්ලේශයන්හෙන් මිදුනාවූ විදර්ශීනා ඥානය මැනැවින් කල්හී මනොවාරාවජ්ජන සිතක් ඉපිද අනිත්‍යාදී ත්‍රිලක්ෂණයන් අතුරෙන් එක්තරා ලක්ෂණයක් අරමුණුකොටගෙණ උපචාර-අනුලෝම යන විත්තක්ෂණත්‍රයක් ඉපිද පෘථග්ජන ගොත්‍රය මැඩීමින් ආර්‍යගොත්‍රය එඩමින් ගොත්‍රභූ සිත එක් වරක් උපදී. තදනන්තරව ශ්‍රොතාපත්තිමාර්ග සිත් තෙමේ දුඃඛසත්‍යය වෙන් වෙන් කොට දැකීමය, සමුදය සත්‍යය දුරුකිරීමය, නිරොධ සත්‍යය ප්‍රත්‍යක්ෂකිරීමය, මාර්ගසත්‍යය වැඩීමය යන කෘත්‍යය සිඛකෙරෙමින් ඕඝවිත්තය අපිණාවිපියට බස්නේයි. තදනන්තරව ඵෝවාන් ඵල සිත් තෙමේ දෙවරක් හෝ තුන් වරක් හෝ ඉපද භවාඞ්ග ශ්‍රොත්‍රයෙහි වැටේ.

දශවිධ විදර්ශනාඥානයාගේ අභිප්‍රාය කෙසේද යත්?

යම් පුද්ගලයෙක් තෙමේ ආවර්ජ්‍යයන් සම්පයෙහි කාම රූපදෙක ඉහෙණ පවත්කඬය, ඡවිවාරය, ඡඩ්ඞාලඞ්ගණය, ඡවි විඥානය, ඡවිසම්පයුක්ත, ඡවිවේදනාය, ඡවිසංඥාය, ඡවිචේතනාය, ඡවිත්තෘඞ්ගණාවය, චිත්තකී සඳෙනය, විචාර සඳනය, ධාතු සඳෙනය, දඝකඛිණය, චත්තිංසාකාරය, ද්වෙලෝස් ආයතනය, අටලෝස් ධාතුය, චතුඝසත්‍යය, ඉන්ද්‍රිය නවය, භව තුනය, නවඝතන්‍රාවඝය, ධ්‍යානඅටය, පටිචඝසමුප්පාදධම්මදෙළඝය, යඤ්ච ඛෝ ධම්මසමුදයාගේ සියලු විභාග ඉහෙණ අතීත අනාගත ප්‍රත්‍යුත්පන්න යන කාලත්‍රයෙහි පැවති සියලු නාමරූප ධම්මසමුදය ලක්ෂණත්‍රයාරොපණය කොට නුවණින් මෙනෙහි කිරීම සම්මශීනඥානනම්වෙයි.

එසේ සම්මශීනය කරනකල්හී නාමරූපධම්මයන්ගේ හට ගැණීම හා විනාශවීම දැකීම්වශයෙන් උපදින ඥානය උදයව්‍යය ඥාන නම් වෙයි.

තදනන්තරව නාමරූපධම්මයන්ගේ උත්පත්තිය හැර භඞ්ග මාත්‍රයක් දක්නා කල්හි නොහොත් සියලු ධම්මයන්ගේ විනාශය දක්නා කල්හි උපදනා ඥානය භඞ්ගඥාන නම් වෙයි.

ඒට අනතුරු සියලු සංස්කාර ධර්මයන් ඉපිද ඉපිද විනාශ වීම් දැකීම් වශයෙන් උපදනා ඥානය භඞ්ගඤාණ නම් වෙයි.

තදනන්තරව සියලු සංස්කාර ධර්මයන් අනිත්‍ය දුඃඛ අනාත්ම යන ලක්ෂණත්‍රයෙන් යුක්තව පෑවතීම් වශයෙන් දක්නා ඥානය ආදීනව ඥානය නම් වෙයි.

එබඳු ආදීනව ඇති ඒ සංස්කාරධර්මයන් කෙරෙහි කලකිරීම් වශයෙන් උපදනා ඥානය නිර්විදාඥාන නම් වෙයි.

ඉක්බිති ඒ ආදීනවයන්ගෙන් යුක්තවූ සංස්කාරධර්මයන්ගෙන් දුලට අසුවූ පසිඳෙක් ඒ දුලින් මිදීමට කැමැත්තක් මෙන් උපදනා ඥානය මුච්චිතුකම්‍යතාඥාන නම් වෙයි.

තදනන්තරව මේ සංස්කාර ධර්මයන්ගෙන් කෙසේ මිදෙන්නෙම් දෝ හෝයි කල්පනාකිරීම් වශයෙන් උපදනා ඥානය පටිසංඛානුපස්සනා නම් වෙයි.

ඒ පටිසංඛානුපස්සනාවෙහි ඇලීමක් හෝ සයවීමක් හෝ කාරණයක් නොවෙයි, සියලු සඞ්ඛතයෝම නිමිත්ත සඞ්කිය කොට ඇත්තාහුයහි මැදහත්ව නැරඹීම් වශයෙන් උපදනා ඥානය සංඛාරුපෙක්ඛානුපස්සනා නම් වෙයි.

ඒ සංඛාරුපෙක්ඛානුපස්සනාඥාන ඉපදීමෙන් මත්තෙහි සතර සතිපට්ඨානය, සතර සම්‍යක්ප්‍රධානය, සතරඍද්ධිපාදය, පඤ්චේන්ද්‍රියය, පඤ්චබලය, සප්තබොධ්‍යඞ්ගය, ආර්‍යාෂ්ටාංගිකමාර්ගයයි කියනලද සත්තිස් බෝධිපාක්ෂික ධර්මයන්ගේ ලැබීමට උපකාර කිරීම් වශයෙන් උපදනා ඥානය අනුලෝම ඥානනම් වෙයි. මෙසේ දශවිදශීනාඥානය දතයුතුයි.

විමොක්ෂයෝ තුන්දෙනය යනු:-සියලු සංස්කාරධර්මයන් ආත්මසාරයෙන් සිස්වූයේයයි භාවනා කරන්නාවූ යොගාවචරයෝ තුමූ ආත්ම සංඛ්‍යාත නිමිත්තෙන් හෙවත් කාරණයෙන් පහවන හෙයින් ඔවුන්ගේ විදශීනාභාවනාව සුඤ්ඤතවිමොක්ෂ නම් වෙයි.

සියලු සංස්කාර ධර්මයෝ අනිත්‍යභාවයි විදශීනාවඩින පුද්ගලයන් එකාන්තය නිත්‍යය යන විපරීතනිමිත්තෙන් පහවන හෙයින් ඔවුන්ගේ විදශීනා භාවනාව අනිමිත්ත විමොක්ඛ නම් වෙයි.

සියලු සංස්කාරධර්මය දුක්ඛයයි විදසුන්වඩින යොගාවචරයන් පවනාම සැපය උතුම් සැපයයි ඇලෙන තෘෂ්ණාවෙන් පහවන හෙයින් ඔවුන්ගේ විදශීනාව අප්පණිහිත විමොක්ඛ නම් වෙයි. මෙසේ විමොක්ඛත්‍රය දතයුතුයි.

පුද්ගලභෙදය යනු කෙසේද යත්? සෝවාන් මාගීය වඩන ආර්‍යපුද්ගල තෙම දෘෂ්ටිසම්ප්‍රයුක්ත අකුශල් සිත් සතරය, විචිකිච්ඡාසහගත අකුශලය, යන අකුශල් පස සමුච්ඡේදප්‍රහාණ වශයෙන්ද, අපායගමනීය වූ සෙසු අකුශලයන්ගේ අපායගමනීය ශක්තිය තුනී කරණ හෙයින් ඒ සෝවාන් තෙමේ නැවත අපායොත්පත්තියට කොපැමිණෙන්නාවූ සම්බොධිපරායණ සෝවාන් පුද්ගල නම් වෙයි. ඒ සෝවාන් පුද්ගල තෙමේ එකබීජිය, කොලඞ්කාලය, සත්තක්ඛත්තුපරමය යි ත්‍රිවිධ කෘ රයි. ශකෘදාගාම්මාගීය වඩන ආර්‍ය තෙම සප්තකාමසවගීයෙහි ඕදාරික විපාක දිය හැකිවූ කාමරාගව්‍යාපාදයන්ගේ තුනී බව කිරීමෙන් මේ මිනිස් ලොව එක්වරක්ම එන සුළු බැවින් ශකෘදාගාම් නම් වේයි. අනාගාම්මාගීය වඩන ආර්‍යපුද්ගල තෙමේ කාමරාගව්‍යාපාදයන් නිරවශෙෂයෙන් ප්‍රහාණය කිරීමෙන් නැවත කාමධාතුවට නොපැමිණෙන හෙයින් අනාගාම් නම් වෙයි. අර්හත්මාගීය වඩන ආර්‍ය පුද්ගල තෙමේ "රූපරාග, අරූපරාග, මාන, උද්ධච්ච, අවිජ්ජා" යන පවත්තබන්ධනාගිය පංචොරම්භාගිය සංයොජන ප්‍රධානවූ එක්දහස් පන්සියයක් කෙලෙසුන් නිරවශෙෂයෙන් නසන හෙයින් සියලු ලෝවැස්සන්ගේ පූජාවන් පිළිගැණීමට සුදුසුවූ අර්හත් නම් වෙයි. මෙසේ සෝවාන් ආදී සතරමාගීය සතරඵලය යන ප්‍රභෙදයෙන් ධර්මවශයෙන් පුද්ගලයෝ අටදෙනෙක් වෙත්.

මේ පුද්ගල භෙදයයි.

සමාපත්තිභෙදය යනු මේ අෂ්ටාර්‍ය පුද්ගලයන්ට අයත් සමාපත්තීහු වනාහි ඵලසමාපත්තිය නිරොධසමාපත්තියයි විස්තාර වෙයි. සෝවාන් පුද්ගල තෙමේ සෝවාන් මාගීඵලිතයෙහිම මාගීඵල අනතුරුවම ඵලසමාපත්තිය වෙයි. ඒ ඵලසමාපත්ති ආර්‍යපුද්ගල තෙමේ ශකෘදාගාම් මාගීඵල ලැබීම දක්වා අභීක්ෂණ කාලයෙහි ඉහාත්මයෙහි නිදන් සැපඵදීම් වශයෙන් විදර්ශනාභාවනාවෙන්ම හෝ සෝවාන් ඵල සිත උපදවයි. ඉක්බිති අතරතුර භවාඞ්ගයක් නූපදවා අහොරාත්‍රියක් මුළුල්ලෙහිදු භවාඞ්ගප්‍රවාහයක් බිඳුනා කලක් මෙන් සෝවාන් ඵල සිත් නිපදවයි. සෙසු මාගීත්‍රයෙහිද මෙසේ මැයි.

නිරොධසමාපත්තිය වනාහි සියුම්වූ භාවනාඵල ඇති බැවින් සෝවාන් ශකෘදාගාම් දෙදෙනාහට නොලැබෙයි. අනාගාම් අර්හත් යන දෙදෙන වනාහි අෂ්ටසමාපත්තිලාභීනොවූ ශුෂ්කවිදර්ශීකයෝ

නම් ඔවුන්ටද නිරෝධසමාපත්තිය නොලැබේ. අනාගාමීඅර්හත් පුද්ගලයෝ දෙදෙන වනාහි අවසමාපත්තිලාභීවූවාහුනම් ඔවුන්ට නිරෝධසමාපත්තිය ලැබෙන්නේකි. ඒකෙස් ලැබෙන්නේද යත්? සමාපත්තිලාභී අනාගාමී පුද්ගල තෙමේ පළමු කොට අධිෂ්ඨානාදී පූර්වකෘත්‍යයකොට නිමවා රූපාවචර ප්‍රථමධ්‍යානයට සමවැද එයින් නැගිට ඒ ධ්‍යානධර්ම අනිත්‍යාදී වශයෙන් සම්මර්ශනය කොට ක්‍රමයෙන් වතුර්ථධ්‍යානය දක්වා සවිදිමින් ගොස් ආකාශානඤ්චායතන ධ්‍යානය පවත් ත්‍රිවිධ අරූප ධ්‍යානයටද සමවැද තෙවසඤ්ඤානාසඤ්ඤායතනධ්‍යානයට දෙවරක් සමවැද සතරනාමස්කන්ධය නිරුද්ධ කරයි. ඉක්බිති ඒ ආර්‍ය්‍ය තෙමේ නිරෝධයට සමවැදුන්නේයයි කියත්. ඉක්බිති සතියක් මුලුල්ලෙහි සතර නාමස්කන්ධයන්ගෙන් තොරව ඉඳ යථාපරිච්ඡින්න කාලයෙහි නිරෝධයෙන් නැගිවිනු කැමති නල්හි අනාගාමී ඵල චිත්තය එක් වරක් ඉපිද එතැන් පවත් භවාඞ්ගය පවත් හන්නේයි. අර්හත් පුද්ගලයාගේ නිරෝධයෙහි ක්‍රියා සිත් හා අර්හත් ඵල සිත් ත්‍රිත්‍රයක් වෙනසි.

මේ සමාපත්ති භේදය යි.

අභිධම්මාවතාර සඞ්ග්‍රහයෙහි කර්මස්ථාන සඞ්ග්‍රහ විභාග නම්වූ
නවවෙනි පරිච්ඡේදය නිමි.

අනුරුද්ධාචාර්‍යයන් වහන්සේ විසින් රචනා කරණ ලද අභිධම්මාවතාර සඞ්ග්‍රහ නම් ප්‍රකරණයෙහි පරමාර්ථ ප්‍රදීපනම් පදාර්ථ සහිත විසතර භාවසන්නය නිමි.

සිවමසතු.

පූතිමච්ඡං කුසග්ගෙන
යෝ නරෝ උපනය්හති;
කුසාපි පූතිං වායන්ති
එවං බාලූපසෙවනා.

ඉමිනා පුඤ්ඤකම්මෙන
යාව නිබ්බානපත්තියා;
සතං සමාගමෝ හොතු
මා ඉව බාලසමාගමෝ.

සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු